LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සුචිකරණ දත්ත
කෘතිය: සභාපති මාඕ සේතුංගේ තෝරාගත් යුද්ධ ලිපි
කතෘ/පරිවර්තක: මාඕ සේතුං/ආනන්ද කුමාර
ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-25
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-25, V2:2019-05-31
පිටු ගණන: 466
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

LIBERATIONBASE

මාඕ සේතුංගේ
තෝරාගත්
යුද්ධ ලිපි

ප්‍රජා ප්‍රකාශකයෝ
කොළඹ, 1970

පළමුවැනි මුද්‍රණය: 1970

ප්‍රකාශකයාගේ සටහන

මාඕ සේතුංගේ තෝරාගත් යුද්ධ ලිපි සිංහලට නැඟුවේ පීකිං නුවර විදේශ භාෂා මුද්‍රණාලය මගින් 1968දී ප්‍රසිද්ධ කර තිබෙන ඒ පොතේ ඉංග්‍රීසි පිටපතේ පළමුවැනි සාක්කු මුද්‍රණයෙහි ඇතුළත් ලිපි ඇසුරෙනි. ලිපි සමග යොද තිබෙන අධෝලිපි සහ සටහන් ද ඒ මුද්‍රණයෙහි ම එන ඒවා ය.

කොළඹ 10 ජයන්ත වීරසේකර මාවතේ අංක 19 දරණ තැන ප්‍රජා ප්‍රකාශකයෝ සමාගමේ සේවයේ නියුක්ත මීගොඩ පතිරණගේ දයානන්ද (මුද්‍රණ ශිල්පියා) විසින් එම ස්ථානයේ පිහිටි ප්‍රජා මුද්‍රණාලයේ මුද්‍රණය කරනලදුව ප්‍රජා ප්‍රකාශකයෝ (ප්‍රකාශකයා) විසින් ප්‍රසිද්ධ කරනලදී.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

කෘතිය: සභාපති මාඕ සේතුංගේ තෝරාගත් යුද්ධ ලිපි
කතෘ/පරිවර්තක: මාඕ සේතුං/ආනන්ද කුමාර
ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-25
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-25, V2:2019-05-31
පිටු ගණන: 466
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

[illegible] රණ මණ්ඩලය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය ([illegible]47, අප්‍රේල් 15) 375

[illegible] යුද්ධයේ දෙවැනි අවුරුද්ද සඳහා උපායමාර්ගය ([illegible]47, සැප්තැම්බර් 1) 378

[illegible] මහජන විමුක්ති හමුදවේ ප්‍රකාශනය (1947, ඔක්තෝබර්) 386

ප්‍රධාන [illegible]නය නීති තුන සහ අවධානය පිණිස කරුණු අට නැවත නිකුත් කිරීම ගැන — චීන මහජන විමුක්ති හමුදවේ ප්‍රධාන මූලස්ථානයේ උපදේශය (1947, ඔක්තෝබර් 10) 395

වර්තමාන තත්වය සහ අප සතු කර්තව්‍යයෝ (උපුටාගත් කොටස්) (1947, දෙසැම්බර් 25) 397

හමුදවෙහි ප්‍රජාතන්ත්‍රවාදි ව්‍යාපාරය (1948, ජනවාරි 30) 406

වයඹදිග ශ්‍රෙෂ්ඨ ජයග්‍රහණය ගැන සහ විමුක්ති හමුදවේ අළුත් වර්ගයේ මතවාදි අධ්‍යාපන ව්‍යාපාරය ගැන (1948, මාර්තු 7) 408

ලියාඕශි–ශෙන්යාං යුද්ධව්‍යාපාරය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය (1948, සැප්තැම්බර් සහ ඔක්තෝබර්) 416

හුආයි–හායි යුද්ධව්‍යාපාරය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය (1948, ඔක්තෝබර 11) 424

චීනයේ යුද්ධ තත්වයෙහි බාරදූර වෙනස්වීම (1948, නොවැම්බර් 14) 428

පිපිං–තියන්සින් යුද්ධව්‍යාපාරය සඳහා සටන් ව්‍යාපාර සංකල්පය (1948, දෙසැම්බර් 11) 431

විප්ලවය කෙළවර තෙක් ගෙන යන්න (1948, දෙසැම්බර් 30) 437

හමුදව වැඩ කරන බලපිරිසක් බවට හරවන්න (1949, පෙබරවාරි 8) 448

රට පුරා ම ඉදිරියට ගමන් කරන්නට හමුදවට දුන් ආඥාව (1949, අප්‍රේල් 21) 451

චීන මහජන විමුක්ති හමුදවේ නිලප්‍රකාශය (1949, අප්‍රේල් 25) 46[illegible]

LIBERATIONBASE

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

කෘතිය: සභාපති මාඕ සේතුංගේ තෝරාගත් යුද්ධ ලිපි
කතෘ/පරිවර්තක: මාඕ සේතුං/ආනන්ද කුමාර
ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ
පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-25
ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-25, V2:2019-05-31
පිටු ගණන: 466
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

LIBERATIONBASE

චීනයෙහි රතු දේශපාලන බලය පවතින්ට හැකි වන්නේ ඇයි?

1928, ඔක්තෝබර 5

1. අභ්‍යන්තර දේශපාලන තත්වය

කුඔමින්තාං පක්ෂයේ අළුත් යුදදෙටුවන්ගේ වර්තමාන පාලනක්‍රමය නගර වල කොම්ප්‍රදෝරු පංක්තියේ ත් ගම්බද පෙදෙසෙහි ඉඩම්හිමි පංක්තියේ ත් පාලනක්‍රමයක් ව පවතී; එය කම්කරු පංක්තිය ත් ගොවි-ජනයා ත් වඩාත් නිර්දය ආර්ථික සූරාකෑමකට සහ දේශපාලන පීඩනයකට භාජන කරමින්, පිටරටවල් සමග සිය සබඳකම් වලදී අධිරාජ්‍යවාදයට යටත් වී පවතින, සියරටෙහි පරණ යුදදෙටුවන් වෙනුවට අළුත් යුදදෙටුවන් ඇති කරගෙන පවතින පාලනක්‍රමයකි. කොම්ප්‍රදෝරු සහ ඉඩම්හිමි පංක්ති ක්වංතුං පළාතෙහි ආරම්භ වූ ධනේශ්වර-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ නායකත්වය අයුතු ලෙස අල්ලාගෙන එය වහා ම ප්‍රති-විප්ලවයේ මගට හරවන විට, එම විප්ලවය ගොසින් තිබුණේ බාගයක් දුර පමණකි; රට පුරා ම කම්කරුවන්, ගොවියන්, සාමාන්‍ය ජනයා අතර සෙසු කොටස් සහ, ධනේශ්වරපංක්තිය[1] පවා, ප්‍රති-විප්ලවවාදී පාලනය යටතේ කල්ගෙවා ඇත, දේශපාලන හෝ ආර්ථික නිවහල්බව අබමල් රෝණක් පමණ වත් ලබාගෙන නැත.

වියාං කායි-ශෙක්, ක්වාංසි යුදදෙටුවන්, පෙං යූ-ශියාං සහ යෙන් ශි-ශාන්[2] යන අළුත් කුඔමින්තාං යුදදෙටුවන් සිව් කල්ලිය, පීකිං සහ තියන්සින් නගර අල්ලා ගැනීමට කලින්, චාං ත්සෝ-ලින්[3]ට විරුද්ධ ව තාවකාලික මිතුරු-හවුලක් සකස් කරගත්හ. මේ නගර අල්ලාගත් වහා ම මේ මිතුරු-හවුල බිඳී ගොස්, සිව් කල්ලිය අතර දරුණු අරගලයකට මග

මේ ලිපිය හුනාන්-චියාංසි දේශසීමා ප්‍රදේශයේ දෙවැනි පක්ෂ සම්මේලනය සඳහා සහෝදර මාඕ සේතුං විසින් කෙටුම්පත් කරනලද, මුලින් ම "දේශසීමා ප්‍රදේශයේ පක්ෂ සංවිධාන වල දේශපාලන ගැටළු සහ වැඩ" යි නම් කළ යෝජනාවේ කොටසක් විය.

පැදුණේ ය; දූන් වියාං කල්ලිය සහ ක්වාංසි කල්ලිය අතර යුද්ධයක් ඇවිලී-ගෙන යමින් තිබේ. චීනයෙහි යුදදෙටු කල්ලි අතර පවතින ප්‍රතිවිරෝධයෝ ත් අරගලයෝ ත් අධිරාජ්‍යවාදී බලවතුන් අතර පවතින ප්‍රතිවිරෝධයන් සහ අරගලයන් පිළිබිඹු කරති. එහෙයින්, යම් තාක් කල් චීනය අධිරාජ්‍යවාදී බලවතුන් අතර බෙදී පවතී ද, ඒ තාක් කල් කවර වටාපිටා තත්වයක් යටතේ වුව සමාදනයකට එළඹෙන්නට විවිධ යුදදෙටු කල්ලි වලට බැරි ය; ඔවුන් කවර සමගිසම්මුතියකට එළඹුණත්, එය හුදෙක් තාවකාලික වෙනවා ඇත. අද ඇති කරගන්නා තාවකාලික සමගිසම්මුතියක් හෙට වඩාත් ලොකු යුද්ධයක් හටගන්වයි.

චීනයට ධනේශ්වර-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක් ඉතා ම අවශ්‍ය ය; මේ විප්ලවය සම්පූර්ණ කළ හැක්කේ නිර්ධනපංක්තියේ නායකත්වය යටතේ පමණකි. ක්වංතුං පළාතෙන් ආරම්භ වී යැංසී ගඟ දෙසට පැතිරී ගිය 1926-27 තේ විප්ලවයේදී ස්ථිර නායකත්වයක් දීමට නිර්ධනපංක්තිය අසමත් වූ නිසා; නායකත්වය කොම්ප්‍රදෝරු සහ ඉඩම්හිමි පංක්ති විසින් අල්ලා ගනු ලැබී ය, විප්ලවය වෙනුවට ප්‍රති-විප්ලවය ඇති විය. ධනේශ්වර-ප්‍රජාතන්ත්‍ර-වාදී විප්ලවය එසේ තාවකාලික පරාජයකට භාජන විය. මේ පරාජය චීන නිර්ධනපංක්තියට සහ ගොවිජනතාවට බර පහරක් විය, චීන ධනේශ්වර-පංක්තියට ද පහරක් විය (එහෙත් කොම්ප්‍රදෝරු සහ ඉඩම්හිමි පංක්ති වලට පහරක් නො වී ය). එසේ වී නමුත් ඉකුත් මාස කීපය තුළ, උතුර ත් දකුණ ත් යන දෙකේ ම, කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ නගර වල කම්කරුවන්ගේ සංවිධාන කළ ස්ට්‍රයික් ද ගම්බදපෙදෙසෙහි ගොවියන්ගේ කැරලිගැසීම් ද වැඩී ඇත්තේ ය. බඩගින්න ත් සීතල ත් යුදදෙටු හමුද වල සෙබළුන් අතර මහත් නොසන්සුන්කමක් ඇති කරගෙන යයි. ඒ අතර, වොං චිං-වෙයි සහ චෙන් කුං-පෝ ප්‍රමුඛ කල්ලිය විසින් උසිගන්වනු ලැබ, ධනේශ්වරපංක්තිය වෙරළබඩ ප්‍රදේශ වල ත් යැංසී ගඟ දිගට ත් සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක්[4] ඉදිරියට මෙහෙයවමින් සිටී. මෙය අළුත පැනනැඟුණු දෙයකි.

කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ත් අපේ පක්ෂයේ මධ්‍යම කාරක-සභාවේ ත් නිර්දේශයන් අනුව, චීනයේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට අඩංගු වන දෙය නම් ජාතික විප්ලවය සම්පූර්ණ කරන සේ චීනයෙහි අධිරාජ්‍යවාදයේ ත් එහි යුදදෙටු අතකොලු වල ත් පාලනය පෙරළාදැමීම ද, ඉඩම්හිමි පංක්තිය විසින් ගොවියන් රදළ ක්‍රමයට සූරාකෑම නැති කර දමන සේ ඉඩම් ලබා ගැනීමේ විප්ලවය කරගෙන යාම ද වේ. 1928 මැයි මාසයෙහි ත්සිනාන් සමූහඝාතනය[5] කළ තැන් සිට එබඳු විප්ලවවාදී ව්‍යාපාරයක් දවසින් දවස ම වැඩීගෙන ගොස් තිබේ.

II. චීනයෙහි රතු දේශපාලන බලය පහළ වීමට සහ විනාශ නො වී ඉතිරි වීමට හේතු[6]

සුදු පාලනක්‍රමයක් විසින් සම්පූර්ණයෙන් ම වට කරනු ලැබූ රතු දේශ-පාලන බලය යටතේ තිබෙන ප්‍රදේශ එකක් හෝ වැඩි ගණනක් රටක් තුළ බොහෝ කලක් විනාශ නො වී ඉතිරි වී පැවතීම ලොව අන් කිසි ම තැනක කිසි කලෙක නො වූ විරූ ආශ්චර්යයකි. මේ අසාමාන්‍ය ආශ්චර්යයට විශේෂ හේතු තිබේ. ඊට පවතින්ට ත් වර්ධනය වෙන්ට ත් හැකි වන්නේ යම් යම් කොන්දේසි යටතේ පමණකි.

පළමු ව, කිසි ම අධිරාජ්‍යවාදී රටක වත් කෙළින් ම අධිරාජ්‍යවාදී පාලනය යටතේ තිබෙන විජිතයක වත් එය සිදු විය නො හැකි ය.[7] සිදු විය හැක්කේ ආර්ථික වශයෙන් නොදියුණු වූ ද, අර්ධ-විජිත වූ සහ අනියම් ලෙස අධිරාජ්‍යවාදී පාලනය යටතේ තිබෙන්නා වූ ද චීනයෙහි පමණකි. කවර හෙයින් ද යත් මේ අසාමාන්‍ය ආශ්චර්යය සිදු විය හැක්කේ තවත් අසාමාන්‍ය ආශ්චර්යයක්, එනම්, සුදු පාලනක්‍රමය තුළ යුද්ධය, සමග එක් වී පමණක් නිසා ය. සමූහාණ්ඩුවේ මුල් අවුරුද්දේ (1912) සිට ම, පරණ සහ අළුත් යුදදෙටුවන්ගේ විවිධ කල්ලි, එතෙරින් අධිරාජ්‍යවාදය විසින් ද සියරටෙහි කොම්ප්‍රදෝරු සහ ඉඩම්හිමි පංක්ති විසින් ද අනුබල දෙනු ලැබ, එකිනෙකට විරුද්ධ ව අනවරත යුද්ධ කරගෙන ගොස් තිබීම අර්ධ-විජිත චීනයේ අංගලක්ෂණයකි. එබඳු ආශ්චර්යයක් අධිරාජ්‍යවාදී රටවල් අතර එක ම රටක වත්, ඒ වගේ ම කෙළින් ම අධිරාජ්‍යවාදී පාලනය යටතේ පවතින කිසි ම විජිතයක වත්, දක්නට නැත; දක්නට ඇත්තේ අනියම් අධිරාජ්‍යවාදී පාලනය යටතේ පවතින චීනය වැනි රටක පමණකි. එය සිදුවීමට කරුණු දෙකක් වග කියයි; එනම්, (එක්සත් කළ ධනවාදී අර්ථක්‍රමයක් නො ව) ප්‍රාදේශික වශයෙන් බෙදී පවතින කෘෂිකාර්මික අර්ථක්‍රමයක් සහ, රට බෙදගෙන සූරාකෑම පිණිස තමතමාගේ බලය පවතින පරිමණ්ඩල වෙන් කර ගැනීමේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය ය. සුදු පාලනක්‍රමය තුළ දිගින් දිගට ම භේද සහ යුද්ධ පැවතීම සුදු පාලනක්‍රමය විසින් වටලනු ලැබ ඒ මැද්දේ කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ කුඩා රතු ප්‍රදේශ එකක් හෝ වැඩි ගණනක් පහළ වී අල්ලාගෙන සිටීමට තත්වයක් සපයා දෙයි. හූනාන් සහ චියාංසි පළාත් වල දේශසීමාවන්හි කොටස් කඩාගෙන පිහිටුවා තිබෙන ස්වාධීන පාලනක්‍රමය එබඳු කුඩා ප්‍රදේශ රාශිය අතුරෙන් එකකි. දුෂ්කර හෝ උග්‍ර අවස්ථාවන්හි, ඇතැම් සහෝදරවරු රතු දේශ-පාලන බලය විනාශ නො වී ඉතිරි වී පැවතීම ගැන බොහෝ විට සැක ඇති කර ගනිති, අශුභවාදී වෙති. හේතුව නම් එය පහළ වීමේ ත් විනාශ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නො වී ඉතිරි වී පැවතීමේ ත් නිවැරදි හේතු විස්තරය ඔවුන් විසින් සොයාගෙන නො තිබීම ය. චීනයේ සුදු පාලනක්‍රමය තුළ භේද සහ යුද්ධ කිසි කලෙක නතර නො වන බව අප විසින් වටහා ගනිතොත්, රතු දේශපාලන බලය පහළවීම ත්, විනාශ නො වී ඉතිරි වී පැවතීම ත් දිනපතා වැඩීම ත් ගැන කිසි සැකයක් අපට ඇති නො වෙනවා ඇත.

දෙවැනි ව, චීනයේ රතු දේශපාලන බලය පළමුවෙන් පහළ වී, බොහෝ කලක් අල්ලාගෙන සිටින්ට හැකි වී තිබෙන ප්‍රාන්ත සෙචුආන්, ක්වෙයිචව්, යුන්නාන් සහ උතුරු පළාත් වැනි ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ බලපෑමට අසු නො වූ ප්‍රාන්ත නො ව, 1926යේ සහ 1927තේ ධනේශ්වර–ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය පැවති කාලයේ කම්කරු, ගොවි සහ සෙබළ සමූහයන් මහත් ගණනින් නැඟී සිටියා වූ හූනාන්, ක්වංතුං, හූපේ සහ චියාංසි පළාත් වැනි ප්‍රාන්ත ය. මේ පළාත් වල බොහෝ කොටස් වල වෘත්තිය සමිති සහ ගොවි සංගම් පුළුල් පරිමාණයකින් පිහිටුවනු ලැබී ය, කම්කරු පංක්තිය ත් ගොවිජනයා ත් විසින් ඉඩම්හිමි පංක්තියට සහ ධනේශ්වරපංක්තියට විරුද්ධ ව බොහෝ ආර්ථික සහ දේශපාලන අරගල කරනු ලැබී ය. මෙන්න මේ නිසා ය ජනතාව තුන් දිනක් ම කැන්ටන් නගරයෙහි දේශපාලන බලය අල්ලාගෙන සිටියේ ත්, හායිෆෙං සහ ලූෆෙං වල ද, නැගෙනහිර සහ දකුණු හූනාන් පළාතේ ද, හූනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි ද හූපේ පළාතේ හූආංආන්[8] හි ද ගොවියන්ගේ ස්වාධීන පාලනක්‍රම පහළ වූයේ ත්. වර්තමාන රතු හමුදව සම්බන්ධයෙන්, එය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පුහුණුවකට භාජන වූ ද කම්කරු සහ ගොවි බහුජන සමූහයන්ගේ බලපෑම යටතට පැමිණියා වූ ද ජාතික විප්ලවවාදී හමුදවෙන් බිඳී ගිය කොටසකි. රතු හමුදව සෑදෙන මූලික කොටස් කිසි ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පුහුණුවක් ලබා නැත්තා වූ හෝ කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ බලපෑම යටතට පැමිණ නැත්තා වූ යෙන් ශි–ශාන්ගේ සහ චාං ත්සෝ–ලින්ගේ හමුද වැනි හමුද වලින් එන්නට පුළුවන්කමක් නැත.

තුන්වැනි ව, කුඩා ප්‍රදේශ වල ජනතාවගේ දේශපාලන බලයට බොහෝ කලක් පවතින්ට පුළුවන් ද යන්න රඳා පවතින්නේ රට පුරා ම විප්ලවවාදී තත්වය දිගට ම වර්ධනය වේ ද යන්න උඩ ය. එය වර්ධනය වේ නම්, එවිට කුඩා රතු ප්‍රදේශ නිසැකයෙන් ම දිගු කලක් පවතිනවා ඇත; එමතු නො ව, නො වැළකිය හැකි ලෙස ම රට පුරා දේශපාලන බලය දිනාගැනීම පිණිස තිබෙන බොහෝ බලවේග අතුරෙන් එකක් වෙනවා ඇත. රට පුරා ම විප්ලවවාදී තත්වය දිගට ම වර්ධනය නො වී තරමක් දිගු කලකට ඇණහිටින්නේ නම්, එවිට වැඩි කලක් පවතින්ට කුඩා රතු ප්‍රදේශ වලට කොහෙත් ම බැරි වෙනවා ඇත. ඇත්ත වශයෙන්, කොම්ප්‍රදෝරු සහ ඉඩම් හිමි පංක්ති වල ද ජාත්‍යන්තර

ධනේශ්වරපංක්තියේ ද ශ්‍රෙණී තුළ දිගට ම ඇති වෙන භේද සහ යුද්ධ ත් සමග චීනයෙහි විප්ලවවාදී තත්වය දිගට ම වර්ධනය වේගෙන යයි. එහෙයින් කුඩා රතු ප්‍රදේශ නිසැකයෙන් ම බොහෝ කලක් පවතිනවා ඇත, දිගට ම පළල් වෙමින්, රට පුරා ම දේශපාලන බලය අල්ලාගැනීමේ දිනුම්–කණුව කරා අනුක්‍රමයෙන් ළඟා වෙනවා ද ඇත.

සිව්වැනි ව, සෑහෙන ශක්තියක් ඇති නිත්‍ය රතු හමුදවක පැවැත්ම රතු දේශපාලන බලයේ පැවැත්ම පිණිස අවශ්‍ය කොන්දේසියක් වේ. අපට සිටින්නේ ප්‍රාදේශික රතු මුරභටයන්[9] පමණක් නම්, නිත්‍ය රතු හමුදවක් නොමැත්තේ නම්, එවිට අපට නිත්‍ය සුදු බලසේනාවන් සමග පොරඇල්ලිය නො හැකි ය, පොරඇල්ලිය හැකි වන්නේ ඉඩම්හිමි-යන්ගේ භේවායන් සමග පමණකි. එහෙයින්, කම්කරු සහ ගොවි බහුජන සමූහයන් උනන්දුවෙන් වැඩ කරන විට පවා, සෑහෙන ශක්තියක් ඇති නිත්‍ය බලසේනාවන් අපට සිටිත් නම් විනා, කල් පවතින සහ දිනපතා වැඩෙන ස්වාධීන පාලනක්‍රමයක් තබා ස්වාධීන පාලනක්‍රමයක් වත් ඇති කරන්ට නිශ්චය වශයෙන් ම බැරි ය. ''අවි බලයෙන් කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ස්වාධීන පාලනක්‍රම පිහිටුවීම'' පිළිබඳ අදහස කොමියුනිස්ට් පක්ෂය විසින් ද ස්වාධීන පාලනක්‍රමය යටතේ තිබෙන ප්‍රදේශ වල කම්කරු සහ ගොවි බහුජන සමූහයන් විසින් ද සම්පූර්ණයෙන් ම වටහාගෙන අල්ලාගත යුතු වැදගත් අදහසක් බව එයින් නිගමනය වේ.

පස්වැනි ව, රතු දේශපාලන බලය දිගින් දිගට ම පැවතීම සහ වර්ධනය වීම පිණිස ඉහත සඳහන් කොන්දේසි වලට අමතර ව තවත් වැදගත් කොන්දේසියක් උවමනා කරයි; එනම්, කොමියුනිස්ට් පක්ෂ සංවිධානය ශක්තිමත් විය යුතු බව සහ එහි ප්‍රතිපත්තිය නිවැරදි විය යුතු බව ය.

III. හූනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි ස්වාධීන පාලනක්‍රමය සහ අගෝස්තු පරාජය

යුද්දෙටුවන් අතර පවතින භේද සහ යුද්ධ සුදු පාලනක්‍රමයේ බලය දුර්වල කරයි. එසේ කුඩා ප්‍රදේශ වල රතු දේශපාලන බලය නැඟීම පිණිස ඉඩප්‍රස්තා සැලසෙයි. එහෙත් යුද්දෙටුවන් අතර සටන් හැම ද ම කෙරෙන්නේ නැත. යම් විටෙක පළාත් එකක හෝ වැඩි ගණනක සුදු පාලනක්‍රමය තාව-කාලික ස්ථාවරභාවයක් ඇති ව පවතී ද, එහි පාලක පංක්ති නො වැළකිය හැකි ලෙස ම එක්කාසු වී, රතු දේශපාලන බලය විනාශ කිරීමට තමන්ට හැකි වැඩි ම දේ කරයි. රතු දේශපාලන බලය පිහිටුවීම ත් අල්ලාගෙන සිටීම ත්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

පිණිස අවශ්‍ය කොන්දේසි සියල්ල සම්පූර්ණ නො වූ ප්‍රදේශ වල, ඒ බලය සතුරා විසින් පෙරළාදමනු ලැබීමේ අනතුරට ලක් වී පවතී. පසුගිය අප්‍රියෙල් මාසයට කලින් තිබුණු හිතකර අවස්ථාවන්හි කැන්ටන්, හායිෆෙං සහ ලූෆෙං, හුනාන්-චියාංසි දේශසීමා ප්‍රදේශය, දකුණු හුනාන් පළාත, ලිලිං සහ හුආංආන් වැනි ස්ථාන වල පහළ වූ රතු පාලනක්‍රම බොහෝ ගණනක් සුදු පාලනක්‍රමය විසින් එකකට පසු එකක් වශයෙන් පොඩිපට්ටම් කරනු ලැබුවේ මේ හේතුව නිසා ය. අප්‍රියෙල් මාසයේ සිට හුනාන්-චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි ස්වාධීන පාලනක්‍රමය තිබුණේ දකුණෙහි තාවකාලික වශයෙන් ස්ථාවර වූ පාලන බලයකට මුහුණ පාමින් ය; අප "මැඩලනු" පිණිස, හුනාන් සහ චියාංසි පළාත් සාමාන්‍යයෙන් රෙජමේන්තු අටක්, නවයක් හෝ වැඩි ගණනක් — ඇතැම් විට දහඅටක් තරම් — පිටත්කර එවන්ට විය. එසේ වී නමුත් රෙජමේන්තු හතරකට ත් අඩු බලසේනාවක් ඇති ව, අපි, අපේ ස්වාධීන පාලනක්‍රමය යටතේ තිබුණු භූමිප්‍රදේශය දිනපතා ම විශාල කරමින්, ඉඩම් ලබාගැනීමේ විප්ලවය ගැඹුරු කරමින්, ජනතාවගේ දේශපාලන බලය පිළිබඳ සංවිධානයන් ව්‍යාප්ත කරමින් සහ රතු හමුදාව ත් රතු මුරභට සේනාව ත් පළල් කරමින් පූරා මාස හතරක් ම සතුරා හා සටන් කළෙමු. මෙය කළ හැකි වූයේ හුනාන්-චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි (ප්‍රාදේශික සහ හමුදා) කොමියුනිස්ට් පක්ෂ සංවිධාන වල ප්‍රතිපත්ති නිවැරදි වූ නිසා ය. පක්ෂයේ දේශසීමා ප්‍රදේශ විශේෂ කොමිටියේ ත් හමුද කොමිටියේ ත් ප්‍රතිපත්ති එකල මෙසේ විය:

> සතුරාට විරුද්ධ ව ස්ථිර ලෙස අරගල කරන්න, ලෝශියාඕ කඳු වැටියේ[10] මැද කොටසෙහි දේශපාලන බලය පිහිටුවන්න, පළායාමේ ධර්මයට විරුද්ධ වන්න.
>
> ස්වාධීන පාලනක්‍රමය යටතේ තිබෙන ප්‍රදේශ වල ඉඩම් ලබාගැනීමේ විප්ලවය ගැඹුරු කරන්න.
>
> හමුද පක්ෂ සංවිධානයේ ආධාරය ඇති ව ප්‍රාදේශික පක්ෂ සංවිධානය වර්ධනය කිරීම ඉදිරියට මෙහෙයවන්න, නිත්‍ය හමුදාවේ ආධාරය ඇති ව ප්‍රාදේශික සන්නද්ධ බලසේනාවන් වර්ධනය කිරීම ඉදිරියට මෙහෙයවන්න.
>
> කාලය සුදුසු වූ විට තමන්ට අභිමුඛ ව සිටින සතුරා හා සටන් කරනු පිණිස රතු හමුද සේනාංග එක්රැස් කරන්න, එකින් එක විනාශ කරනු ලැබීම වළකනු පිණිස බලසේනා බෙදනවාට විරුද්ධ වන්න.
>
> ස්වාධීන පාලනක්‍රමය යටතේ තිබෙන ප්‍රදේශය පළල් කරනු පිණිස රළ පෙළක් මෙන් ඉදිරියට යාමේ ප්‍රතිපත්තිය යොදන්න, සැහැසි ලෙස ඉදිරියට යමින් පළල් වීමේ ප්‍රතිපත්තියට විරුද්ධ වන්න.

මේ නිසි උපක්‍රම ද, අපේ අරගලයට හිතකර භූමිභාගයක් ද, හුනාන් පළාතේ සිට ආක්‍රමණය කළ හටකණ්ඩායම් සහ චියාංසි පළාතේ සිට ආක්‍රමණය කළ හටකණ්ඩායම් අතර ප්‍රමාණවත් උචිත සම්බන්ධයක් නොමැතිවීම ද හේතු කොටගෙන, අප්‍රියෙල් සිට ජූලි තෙක් සිව් මස තුළ ජයග්‍රහණ ගණනක් ම දිනාගන්ට අපි සමත් වීමු. අපට වඩා කීප ගුණයක් ශක්තිමත් වුව ද, සතුරා අපේ පාලනක්‍රමය විනාශ කරන්ට තබා එය නො කඩවා පළල් වීම වළකන්ට වත් අසමත් විය; අපේ පාලනක්‍රමය හුනාන් සහ චියාංසි පළාත් කෙරෙහි සද්-වැඩිවන බලපෑමක් කරන සුලු විය. අගෝස්තු පරාජයට එක ම හේතුව වූයේ, ඇතැම් සහෝදරවරුන්, ඒ වකවනුව පාලක පංක්ති වලට තාවකාලික ස්ථාවරභාවයක් තිබුණු වකවනුවක් බව වටහාගන්ට අසමත් ව, පාලක පංක්ති තුළ දේශපාලන භේද පවතින වකවනුවකට යෝග්‍ය වූ උපායමාර්ගයක් යොදා, දේශසීමා ප්‍රදේශය ත් දකුණු හුනාන් පළාත ත් යන දෙකෙහි ම පරාජය සිදු කරමින්, සැහැසි ලෙස ඉදිරියට යාමක් පිණිස අපේ බලසේනාවන් බෙදීම ය. හුනාන් පළාත් කොමිටියේ නියෝජිතයා වූ සහෝදර තු ශියු-චිං සැබෑ තත්වය හොඳින් වටහාගන්ට අසමත් විය, පක්ෂයේ විශේෂ කොමිටියේ, හමුද කොමිටියේ සහ යුංශින් උප-පළාත් කොමිටියේ ඒකාබද්ධ රැස්වීමේ යෝජනා නො සලකා හැරියේ ය; ඔහු හුදෙක් හුනාන් පළාත් කොමිටියේ නියෝගය යාන්ත්‍රික ලෙස බලෙන් ම ක්‍රියාවේ යෙදී ය, අරගලයෙන් මග හැර ආපසු ගෙදර යන්ට උවමනා වී සිටි රතු හමුදාවේ 29වැනි රෙජමේන්තුවේ මත පිළිරුව් දුන්නේ ය; ඔහු කළ වරද පමණට වඩා බරපතල ය. මේ පරාජයෙන් පැනනැංග තත්වයෙන් ගොඩ එන්ට හැකි වූයේ පක්ෂයේ විශේෂ කොමිටිය ත් හමුද කොමිටිය ත් සැප්තැම්බර් මාසයට පසුව ගත් වැරදි නිවැරදි කිරීමේ පියවර වල ප්‍රතිඵලයක් වශයෙනි.

IV. හුනාන්-චියාංසි දේශසීමා ප්‍රදේශයේ ස්වාධීන පාලනක්‍රමය හුනාන්, හූපේ සහ චියාංසි පළාත් වල රඟපාන කොටස

හුනාන්-චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි තිබෙන, නින්කාං ස්වකීය මධ්‍යස්ථානය කොටගත්, කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ සන්නද්ධ ස්වාධීන පාලනක්‍රමයේ වැදගත්කම නිශ්චය වශයෙන් ම දේශසීමා ප්‍රදේශයේ උප-පළාත් කීපයට පමණක් සීමා වී නැත; මේ පාලනක්‍රමය හුනාන්, හූපේ සහ චියාංසි යන පළාත් තුනෙහි කම්කරුවන් සහ ගොවියන් කැරලිගැසීම මගින් ඒ පළාත් වල දේශපාලන බලය අල්ලාගැනීමේ ක්‍රියාවලියේදී ලොකු කොටසක් රඟපානවා ඇත. හුනාන්, හූපේ සහ චියාංසි පළාත් වල අනුක්‍රමයෙන් පැතිරීගෙන යන කැරලිගැසීම් සම්බන්ධයෙන් දේශසීමා ප්‍රදේශයෙහි පක්ෂයට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තිබෙන ඉතා වැදගත් වැඩ මේවා ය: දේශසීමා ප්‍රදේශයෙහි ඉඩම් ලබාගැනීමේ විප්ලවයේ ත් ජනතාවගේ දේශපාලන බලයේ ත් බලපෑම හුනාන් සහ වියාංසි පළාත් වල පහළ ගංගාධාර තෙක් ද, හූපේ පළාත තරම් ඈතට ද ව්‍යාප්ත කිරීම; පළාත් තුනෙහි ඉදිරියට ඇති වේන මහ කැරලිගැසීමේදී තමාට භාර කටයුත්ත මුදුන්පත් කිරීමට රතු හමුදවට හැකි වන සේ නිතර ම ඒ හමුදව පළල් කිරීම සහ අරගලය තුළින් එහි තත්වය දියුණු කිරීම; උප–පළාත් වල සිටින ප්‍රාදේශික සන්නද්ධ බලසේනාවන්, ඒ කියන්නේ, රතු මුරභටයන් සහ කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ කැරලි කණ්ඩායම්, විශාල කිරීම සහ දැනට ඉඩම්-හිමියන්ගේ හේවායන් සමග ත් කුඩා සන්නද්ධ සේනාංග සමග ත් සටන් කරන්ට ද අනාගතයේදී දේශසීමා ප්‍රදේශයෙහි දේශපාලන බලය සුරක්ෂිත කරන්ට ද ඔවුන්ට හැකි වන සේ, ඔවුන්ගේ තත්වය දියුණු කිරීම; දේශසීමා ප්‍රදේශයේ වැඩ කොටස බාර ගැනීමට දේශසීමා ප්‍රදේශයට ම අයත් සේවක-පිරිසක් ඇති වන සේ ත්, එපමණක් නො ව දේශසීමා ප්‍රදේශය විසින් රතු හමුදව සඳහා ද ස්වාධීන පාලනක්‍රමයේ පුළුල් වන භූමිප්‍රදේශය සඳහා ද සේවකපිරිස් සපයන සේ ත්, ප්‍රාදේශික වැඩ රතු හමුදවේ සේවකපිරිසේ ආධාරය උඩ රැඳී පවතින ප්‍රමාණය අනුක්‍රමයෙන් අඩු කිරීම.

V. ආර්ථික ගැටළු

අත්‍යවශ්‍ය දේ සහ කාසි හිඟකම සුදු වටලෑම ඇතුළත සිටින හමුදවට ත් ජනතාවට ත් ඉතා ලොකු ගැටළුවක් වී තිබේ. සතුරා කිටිකිටියේ ඇති කර තිබෙන අවහිරය නිසා, ලුණු, රෙදිපිළි සහ බෙහෙත් වැනි අත්‍යවශ්‍ය දේ ඉකුත් අවුරුද්ද මුළුල්ලේ ම ස්වාධීන දේශසීමා ප්‍රදේශය තුළ බෙහෙවින් ම හිඟ වී ත් මිල වැඩි වී ත් තිබුණි; එයින්, කම්කරුවන්, ගොවියන් සහ සුළු ධනේශ්වරපංක්තිය[1] අතර සමූහයන්ගේ ද, එසේ ම රතු හමුදවේ සෙබළුන්ගේ ද ජීවිත, ඇතැම් විට උග්‍ර අඩියකට පවා, අවුල්පවුල් විය. සතුරා සමග සටන් කිරීමට ත්, එසේ සටන් කරන අතර ම තමන්ට අවශ්‍ය දේ සපයා ගැනීමට ත් රතු හමුදවට සිදු වී ඇත. ධාන්‍ය කොටසට අමතර වශයෙන් එක් අයකුට දිනකට ශත පහ බැගින් වැටෙන සේ ගෙවනු ලබන කෑම ආධාර මුදල ගෙවන්ට පවා රතු හමුදවට අරමුදල් නැත; සෙබළුන්ට සෑහෙන තරම් කන්ට බොන්ට නැත, බොහෝ දෙනා ලෙඩ වී සිටිති, රෝහල් වල සිටින තුවාලකරුවන්ගේ තත්වය වඩාත් ම නරක ය. රට පුරා ම දේශපාලන බලය අල්ලා ගැනීමට පෙර එවැනි දුෂ්කරතා ඇති වීම ඇත්තෙන් ම වැළැක්විය නො හැකි ය. එසේ ද වුව, ඒවා එක්තරා ප්‍රමාණයකට මැඩපැවැත්වීමට, ජීවිතය දැනට වඩා තරමක් පහසු කිරීමට සහ, විශේෂයෙන් රතු හමුදවට අවශ්‍ය දේ දැනට වඩා ප්‍රමාණවත් ලෙස සැපයීමට බලවත් උවමනාවක් ඇත්තේ ය.

දේශසීමා ප්‍රදේශයෙහි පක්ෂයට ආර්ථික ගැටළු ගැන ක්‍රියා කරන්ට නිසි මං සොයා ගැනීමට හැකි වෙතොත් මිස, සතුරාගේ පාලනය ස්ථාවර ව පවතින සංසන්දනාත්මක වශයෙන් දීර්ඝ වූ කාලය තුළ ස්වාධීන පාලනක්‍රමයට මහත් දුෂ්කරතා ඇති වෙනවා ඇත. මේ ආර්ථික ගැටළු සෑහෙන ප්‍රමාණයකට විසඳීම කෙරෙහි හැම පක්ෂ සාමාජිකයකුගේ ම අවධානය යොමු වීම නිසැකයෙන් ම සුදුසු ය.

VI. යුද කඳවුරු ගැටළුව

දේශසීමා ප්‍රදේශයෙහි පක්ෂයට තවත් වැඩක් තිබේ; එනම්, ලිං පහේ[2] සහ වියුලුංහි යුද කඳවුරු තහවුරු කිරීම ය. ලිං පහේ කඳු ප්‍රදේශය පිහිටියේ යුංශින්, ලිංශියන්, නින්කාං සහ සුයිචුආන් උප–පළාත් එකට සන්ධි වන තැන ය; වියුලුං කඳු ප්‍රදේශය පිහිටියේ යුංශින්, නින්කාං, චාලිං සහ ලියන්හුආ උප–පළාත් එකට සන්ධි වන තැන ය; මේ දෙකට ම භූනිර්මාණය අතින් වාසි තිබේ, මේ දෙක ම දැනට දේශසීමා ප්‍රදේශයට පමණක් නො ව, අනාගතයේදී හුනාන්, හූපේ සහ වියාංසි පළාත් වල ඇති වන කැරලිගැසීම් සඳහා ද වැදගත් යුද කඳවුරු වේ; මෙය ජනතාවගේ අනුබලය මෙන් ම වෙසෙසින් දුර්ගම වූ ත් යුද කටයුතු අතින් වැදගත් වූ ත් භූමිභාගයක් ද අපට තිබෙන ලිං පහ සම්බන්ධයෙන් වෙසෙසින් ම සැබෑ ය. මේ කඳවුරු තහවුරු කිරීමට තිබෙන මග නම්, පළමුකොට, සෑහෙන තරම් ආරක්ෂක කටයුතු ගොඩනැඟීම ය; දෙවැනිව, සෑහෙන තරම් ධාන්‍ය ගබඩා කිරීම ය; තුන්වැනිව, සංසන්දනාත්මක වශයෙන් හොඳ රතු හමුද රෝහල් පිහිටුවීම ය. දේශසීමා ප්‍රදේශයෙහි පක්ෂය මේ වැඩ තුන සාර්ථක ලෙස කරන්නට වෙර දැරිය යුතු ය.

ස ට හ න්

[1]"ධනේශ්වරපංක්තිය" යන පාඨයෙන්, සහෝදර මාඕ සේතුං අදහස් කරන්නේ ජාතික ධනේශ්වරපංක්තිය යි. මේ පංක්තිය ත් මහ කොම්ප්‍රදෝරු ධනේශ්වරපංක්තිය ත් අතර ඇති වෙනස ගැන ඔහු කරන දීර්ඝ විස්තරය දැනගැනීම පිණිස ඔහුගේ "ජපන් අධිරාජ්‍යවාදයට විරුද්ධ උපක්‍රම ගැන" යන ලිපිය (මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු. පීකිං, 1965, 1වැනි කාණ්ඩය, පිටු 153-78) සහ "චීන විප්ලවය සහ චීන කොමියුනිස්ට පක්ෂය" යන ලිපිය (මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු , පීකිං 1965, IIවැනි කාණ්ඩය, පිටු 305-34) බලන්න.

[2]මෙ යුදදෙවුවන් සිව කල්ලිය එකතු වී චාං ත්සෝ-ලින්ට විරුද්ධ ව සටන් කොට, 1928 ජූනි මාසයෙහි පීකිං සහ තියන්සින් නගර අල්ලාගත්හ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

[3]පෙංකියන් යුදදෙවූ කල්ලියේ ප්‍රමුඛයා වූ චාං ත්සෝ-ලින්, 1924දී දෙවැනි චිහ්ලි-ෆෙංකියන් යුද්ධයේදී වූ පෙයි-යූ පරාජය කළ පසු උතුරු චීනයේ ඉතා ම බලවත් යුදදෙවූවා විය. 1926දී, වූ පෙයි-පූ තම මිත්‍රපාක්ෂිකයා වශයෙන් ඇති ව, ඔහු ඉදිරියට ගමන් කොට පීකිං නුවර අල්ලාගත්තේ ය. 1928 ජූනි මාසයෙහි, ඊසානදිග පෙදෙසට පසුබසිමින් දුම්රියෙන් ගමන්කරමින් සිටියදී, ඔහු, තමා අතකොලුවක් වී සිටි ජපන් අධිරාජ්‍යවාදින් විසින් දුම්රියේ සඟවා තබනලද බෝම්බයකින්, අතරමගදී මරුමුවට පත් විය.

[4]මේ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය පැනනැගුණේ 1928, මැයි 3වැනි ද ජපන් ආක්‍රමණිකයන් ත්සිනාන් අල්ලාගත් පසු සහ චියාං කායි-ශෙක් එළිපිට ම සහ බියසැක නැති ව ජපානය සමග සමගිසම්මුතියකට එළඹී පසු ය. 1927කේ ප්‍රති-විප්ලවවාදි කුමන්ත්‍රණයට එක් වූ ජාතික ධනේශ්වරපංක්තිය තුළ, තමාගේ ම පලප්‍රයෝජන තකා ක්‍රියා කළ එක් කොටසක් අනු-ක්‍රමයෙන් චියාං කායි-ශෙක්ගේ පාලනක්‍රමයට විරුද්ධ පිරිසක් බවට සකස් වෙන්ට විය. මේ ව්‍යාපාරයෙහි උනන්දුවෙන් වැඩ කළ වෙං චිං-වෙයි, චෙන් කුං-පෝ සහ වෙනත් අය ගෙන් සැදුණු එකී බඩවඩාගන්නා ප්‍රති-විප්ලවවාදින් කණ්ඩායම කුඕමින්තාං පක්ෂය තුළ ''ප්‍රති-සංවිධාන කල්ලිය'' වශයෙන් ප්‍රකට වූ පිරිස බවට සකස් විය.

[5]1928දී, චියාං කායි-ශෙක්, බ්‍රිතාන්‍ය සහ එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් අනුබල දෙනු ලැබ, චාං ත්සෝ-ලින්ට පහර දෙනු පිණිස උතුර බලා ගමන් කළේ ය. ජපන් අධිරාජ්‍ය-වාදියෝ එවිට, බ්‍රිතාන්‍ය සහ ඇමරිකන් බලපෑම උතුරු දෙසට පැතිරීම ඇණහිටවනු පිණිස, ශාන්ටුං පළාතේ අගනුවර වන ත්සිනාන් අල්ලාගෙන, ත්‍යන්සින්-පූකව් දුම්රිය මග කපා දැමූහ. මැයි 3වැනි ද අතික්‍රමණය කරමින් සිටි ජපන් භටකණ්ඩායම් ත්සිනාන් නුවරදී චීන ජාතික-යන් විශාල ගණනක් ඝාතනය කළහ. මෙය ත්සිනාන් සමූහඝාතනය වශයෙන් ප්‍රකට විය.

[6]චීනයේ රතු දේශපාලන බලයේ සංවිධානාත්මක ආකාරය සෝවියට් දේශපාලන බලයේ ආකාරය වැනි විය. සෝවියට් සභාවක් 1905හේ විප්ලවයේදී රුසියන් කම්කරු පංක්තිය විසින් ඇති කළ දේශපාලන සංස්ථාවක් වන නියෝජක මණ්ඩලයක් වෙ. ලෙනින් සහ ස්ටැලින්, මාක්ස්වාදි න්‍යායයේ පදනම මත, ධනවාදයෙන් සමාජවාදයට මාරුවීමට තිබෙන ඉතා ම යෝග්‍ය සමාජ සහ දේශපාලන සංවිධාන ආකාරය සෝවියට් සමූහාණ්ඩුවක් වේ යන නිගමනය ඇති කළහ. ලෙනින්ගේ ත් ස්ටැලින්ගේ ත් බෝල්ෂෙවික් පක්ෂයේ නායකත්වය යටතේ, 1917තේ රුසියන් ඔක්තෝබර සමාජවාදි විප්ලවය එබඳු සමාජවාදි සෝවියට් සමූහාණ්ඩුවක්, නිර්ධනපංක්තියේ ආඥාදායකත්වයක්, ලෝක ඉතිහාසයෙහි පළමු වරට ඇති කළේ ය. චීනයෙහි 1927තේ විප්ලවය පරාජය වූ පසු, චීන කොමියුනිස්ට් පක්ෂය විසින්, ප්‍රධාන වශයෙන් සහෝදර මාඕ සේතුං විසින්, නායකත්වය දෙනලද බහුජනයාගේ විප්ලවවාදි පැනනැඟීම් වලදී නොයෙක් තැන් වල මහජන දේශපාලන බලයේ ආකාරය වශ-යෙන් නියෝජක මණ්ඩල පිළිගනු ලැබී ය. චීන විප්ලවයේ ඒ අවස්ථාවේ දේශපාලන බලය එහි ස්වභාවයෙන් නිර්ධනපංක්තිය විසින් නායකත්වය දෙනලද අධිරාජ්‍ය-විරෝධි, රදළ-විරෝධි, නව-ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවයේ මහජන ප්‍රජාතන්ත්‍රවාදි ආඥාදායකත්වයක් විය; එය සෝවියට් සංගමයේ නිර්ධනපංක්ති ආඥාදායකත්වයට වෙනස් විය.

[7]IIවැනි ලෝක යුද්ධය පැවති කාලයේ, කලින් බ්‍රිතාන්‍යයේ, එක්සත් ජනපදයේ, ප්‍රන්-සයේ සහ ඕලන්දයේ අධිරාජ්‍යවාදි පාලනය යටතේ පැවති බොහෝ විජිත රටවල් ජපන් අධි-රාජ්‍යවාදය විසින් අල්ලාගනු ලැබී ය. මේ රටවල් වල කම්කරුවන්, ගොවියන් සහ නාගරික සුළු ධනේශ්වරපංක්තිය යන මොවුන් ගෙන් සැදුණු බහුජනතාව ත් ජාතික ධනේශ්වර-පංක්තියේ සාමාජිකයෝ ත්, ඒ ඒ රටවල් වල කොමියුනිස්ට් පක්ෂ විසින් නායකත්වය දෙනු-ලැබ, එක් අතකින් බ්‍රිතාන්‍ය, එක්සත් ජනපද, ප්‍රන්ස සහ ඕලන්ද අධිරාජ්‍යවාදින් ද අනික් අතින් ජපන් අධිරාජ්‍යවාදීන් ද අතර තිබුණු ප්‍රතිවිරෝධයන් ගෙන් ප්‍රයෝජන ගනිමින්, පැසිස්ට්

ආක්‍රමණයට විරුද්ධ ව පළල් එක්සත් පෙරමුණක් සංවිධානය කළහ, ජපන්-විරෝධි කඳවුරු ප්‍රදේශ ගොඩනැගූහ, ජපනුන්ට විරුද්ධ ව කටුක ගොරිල්ලා සටන් කරගෙන ගියහ. මෙසේ IIවැනි ලෝක යුද්ධයට කලින් තිබුණු දේශපාලන තත්වය වෙනස් වෙන්ට විය. IIවැනි ලෝක යුද්ධයේ අවසානයේදී ජපන් අධිරාජ්‍යවාදින් මේ රටවල් වලින් පළවා හරිනු ලැබූ කල, එක්සත් ජනපදයේ, බ්‍රිතාන්‍යයේ, ප්‍රන්සයේ සහ ඕලන්දයේ අධිරාජ්‍යවාදියෝ තම විජිත පාලනය නැවතත් ඇති කරන්ට උත්සාහ කළහ; එහෙත් ජපන්-විරෝධි යුද්ධ කාලයේ සැලකියයුතු තරම් ශක්තිමත් වූ සන්නද්ධ බලසේනාවන් ගොඩනගාගෙන සිටි මේ විජිත ජනතාවෝ පරණ ජීවිත ක්‍රමයට ආපසු යාම ප්‍රතික්ෂේප කළහ. එමතු නොව, සෝවියට් සංගමය ශක්තිමත් වී තිබුණු නිසා ද, එක්සත් ජනපදය හැර සෙසු සියලු අධිරාජ්‍යවාදි බලවත් ආණ්ඩු යුද්ධයේදී පෙරළාදමා හෝ දුර්වල වී තිබුණු නිසා ද, අවසාන වශයෙන් අධිරාජ්‍යවාදි පෙරමුණ ජයග්‍රාහි චීන විප්ලවය මගින් චීනයෙහි බිඳ දමනු ලැබූ නිසා ද, ලොව හැම තැන ම අධිරාජ්‍යවාදි ක්‍රමය ගැඹුරට ම චංචල වී තිබුණේ ය. එහෙයින්, චීනයෙහි මෙන් ම, පෙරදිග විජිත රටවල් සියල්ලේ ම, නැතහොත් යටත්පිරිසෙයින් ඉන් සමහරක, ජනතාවන්ට, ලොකු සහ කුඩා විප්ලවවාදි කඳවුරු ප්‍රදේශ ත් විප්ලවවාදි පාලනක්‍රම ත් බොහෝ කලක් ම පවත්වා ගෙන යාමට ත්, ගම්බදපෙදෙසේ සිට නගර වටලන සහ ඉක්බිති නගර ඇල්ලීමට ඉදිරියට යමින් රට පුරා ම ජය දිනා ගන්නා දීර්ඝ-කාල විප්ලවවාදි යුද්ධ කරගෙන යාමට ත් පුළුවන් වී තිබෙ. කෙළින් ම අධිරාජ්‍යවාදි පාලනය යටතේ පවතින විජිත වල ස්වාධීන පාලනක්‍රම පිහිටු-වීම පිළිබඳ ප්‍රශ්නය ගැන 1928දී සහෝදර මාඕ සේතුං දැරූ මතය තත්වයේ ඇති වූ වෙනස්වීම් වල ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් වී ඇත.

[8]1927දී චියාං කායි-ශෙක් සහ වෙං චිං-වෙයි එකකුට පසු එකකු වශයෙන් විප්ලවයට ද්‍රෝහි වීමට හැරුණු පසු කොමියුනිස්ට් නායකත්වය යටතේ ජනතාව විසින් නොයෙක් තැන් වලදී ප්‍රති-විප්ලවයේ බලවේගයන්ට විරුද්ධ ව දියත් කළ මුල් ම ප්‍රති-ප්‍රහාර මෙවා ය. 1927, දෙසැම්බර් 11වැනි ද, කැන්ටන් නුවර කම්කරුවෝ ත් විප්ලවවාදි සෙබළු ත් එක්සත් වී පැන-නැඟීමක් කොට, මහජන දේශපාලන බලය පිහිටුවූහ. ඔව්හු අධිරාජ්‍යවාදය විසින් කෙළින් ම අනුබල දෙන ලද ප්‍රති-විප්ලවවාදි බලසේනාවන්ට විරුද්ධ ව දරුණු ලෙස සටන් කළ නමුදු ශක්තිය අතින් වූ අසමානත්වය ඉතා ලොකු වූ නිසා පරාජය වූහ. ක්වංතුං පළාතේ නැගෙනහිරි වෙරළේ පිහිටි හායිපෙං සහ ලූපෙංහි ගොවියන්, කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයකු වූ සහෝදර පෙං පායිගේ නායකත්වය යටතේ, 1923-25 කාලයේදී බලවත් විප්ලවවාදි ව්‍යාපාර-යක් අරඹා තිබුණි; මේ ව්‍යාපාරය ජාතික විප්ලවවාදි හමුදාව විසින් චෙන් චියුං-මිං ප්‍රමුඛ ප්‍රති-විප්ලවවාදී කල්ලියට විරුද්ධ ව කැන්ටන්හි සිට දියත් කරන ලද නැගෙනහිරි යුද්ධ-ව්‍යාපාර දෙකේ ජයග්‍රහණයට බෙහෙවින් උපකාරවත් විය. 1927, අප්‍රියෙල් 12වැනි ද චියාං කායි-ශෙක් විප්ලවය පාවා දුන් පසු, මේ ගොවියෝ අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර යන මාස වල පැනනැඟීම් තුනක් කොට, විප්ලවවාදි පාලනක්‍රමයක් පිහිටුවූහ; එය 1928 අප්‍රියෙල් මාසය තෙක් අල්ලාසිටියේ ය. නැගෙනහිරි හූනාන් පළාතේ කැරලිකාර ගොවියෝ 1927 සැප්තැම්බර-යේදී ලියූයාං, පිංචියාං, ලිලිං සහ චූචව් ඇතුළත් ප්‍රදේශයක් අල්ලාගත්හ, ඒ දවස් වල ම වාගේ, ඊසානදිග හූපේ පළාතේ ශියාඕකාන්, මාචෙං සහ හුආංආන් යන පෙදෙස් වල දස දහස් ගණන් ගොවියෝ සන්නද්ධ පැනනැඟීමක් කොට, හුආංආන් උපපළාත් නුවර දින තිහකට වැඩි කලක් අල්ලාගෙන සිටියහ. දකුණු හූනාන් පළාතේ, යිචාං, චෙන්චව්, ලෙයියාං, යුංශිං සහ ත්ශේසිං යන උප-පළාත් වල ගොවියෝ 1928 ජනවාරියේදී අවි අතට ගෙන නැඟී සිට, තුන් මසක් ම අල්ලාසිටි විප්ලවවාදි පාලනක්‍රමයක් පිහිටුවූහ.

[9]රතු මුරභටයෝ විප්ලවවාදි කඳවුරු ප්‍රදේශ වල බහුජනයාගේ සන්නද්ධ සේනාංග වූහ; එහි සාමාජිකයෝ නිතිපතා කරන නිෂ්පාදක වැඩ ද කරගෙන ගියහ.

[10]ලෝශියාඕ කඳුවැටිය චියාංසි සහ හූනාන් පළාත් වල දේශසීමා ඔස්සේ පිහිටි විශාල කඳුවැටියකි. චිංකාං කඳු පිහිටියේ එහි මැද කොටසේ ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

[11] "සුළු ධනේශ්වරපංක්තිය" යන පාඨයෙන් සහෝදර මාඕ සේතුං අදහස් කරන්නේ ගොවියන් නො වන සෙසු කොටස් වලට අයත් මිනිසුන්, එනම්, හස්තකර්මාන්තකාරයන්, සුළු වෙළඳුන්, නොයෙක් වර්ගයේ වෘත්තීය පුද්ගලයන් සහ සුළු-ධනේශ්වර උගතුන් ය. චීනයෙහි ඔවුන් සාමාන්‍යයෙන් වාසය කරන්නේ නගර වල ය; එහෙත් ගම්බද පෙදෙසෙහි ද, සෑහෙන ගණනක් සිටිති.

[12] ලිං පහ වශයෙන් නම් කර තිබෙන්නේ චිංකාං කඳු වල පිහිටි ලොකු ලිඳ, කුඩා ලිඳ, ඉහළ ලිඳ, මැද ලිඳ සහ පහළ ලිඳ යන ගම් ය. ඒවා පිහිටියේ බටහිරි චියාංසි පළාතේ යුංශින්, නිංකාං සහ සුයිචුආන් ද නැගෙනහිරි හුනාන් පළාතේ ලිංශියන් ද යන උප-පළාත් අතර ය.

චිංකාං කඳු වල අරගලය

1928, නොවැම්බර් 25

හුනාන්-චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි ස්වාධීන පාලනක්‍රමය සහ අගෝස්තු පරාජය

ශ්වේත පාලනක්‍රමයක් විසින් වටකරනු ලැබ ඒ මැද්දේ රතු දේශපාලන බලය යටතේ පවතින කුඩා ප්‍රදේශ එකක් හෝ වැඩි ගණනක් බිහි වී ඇති අද ලෝකයේ තිබෙන එක ම රට චීනය යි. මේ ආශ්චර්යයට එක් හේතුවක් චීනයේ කොම්ප්‍රදෝරු සහ ඉඩම්හිමි පංක්ති තුළ පවතින අනවරත භේද සහ යුද්ධ තුළ රඳා තිබෙන බව විශ්ලේෂණයේදී අපට පෙනෙයි. මේ භේද සහ යුද්ධ නො කඩ ව පවතින තාක්, කම්කරුවන්ගේ ත් ගොවියන්ගේ ත් ස්වාධීන සන්නද්ධ පාලනක්‍රමයකට විනාශ නො වී ඉතිරි වී පැවතීමට සහ වැඩීමට පුළුවන්කම තිබේ. ඊට අමතර ව, එය විනාශ නො වී ඉතිරි වී පැවතීම ත් වැඩීම ත් පිණිස මතු දක්වන කොන්දේසි අවශ්‍ය වේ; (1) හොඳ බහුජන පදනමක්, (2) හොඳ පක්ෂ සංවිධානයක්, (3) තරමක් ශක්තිමත් රතු හමුදාවක්, (4) යුද්ධ සටන්ව්‍යාපාර වලට හිතකර භූමිභාගයක් සහ, (5) නඩත්තු වීමට සෑහෙන ආර්ථික වත්පොහොසත්කම්.

ස්වාධීන පාලනක්‍රමයක්, පාලක පංක්තියේ පාලනක්‍රමය තාවකාලික වශයෙන් ස්ථාවර ව පවතින විට එක් උපායමාර්ගයක් ද, එය භේද වී පවතින විට වෙනත් උපායමාර්ගයක් ද යොදමින්, වට කරගෙන සිටින පාලක පංක්ති වලට විරුද්ධ ව යොදන සිය උපායමාර්ගය වෙනස් කළ යුතු ය. හුනාන් සහ හූපේ පළාත් වල ලි ත්සුං-රන් සහ තාං ශෙං-චි[1] අතර ත්, ක්වංතුං පළාතේ වාං පා-කුළුයි සහ ලි චි-ශෙන්[2] අතර ත් යුද්ධ පැවති කාලයේදී මෙන්, පාලක පංක්ති භේද වී සිටින කාලපරිච්ඡේදයකදී අපේ උපායමාර්ගය සංසන්දනාත්මක වශයෙන් සැහැසි විය හැකි ය, යුද්ධ ව්‍යාපාර මගින් කඩා ගන්නා ප්‍රදේශය සංසන්දනාත්මක වශයෙන් විශාල

මෙය සහෝදර මාඕ සේතුං විසින් චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව වෙත ඉදිරිපත් කරනලද වාර්තාවක් විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විය හැකි ය. කෙසේ වෙතත්, ධවල භීතිය පහර දෙන කල විශ්වාසය තබා ගෙන සිටින්නට ආරක්ෂා සහිත කිසිවක් අපට තිබෙන ලෙස ප්‍රධාන දිස්ත්‍රික්ක වල සවිසක්තිමත් අඩිතාලමක් දැමීමට අපි සැලකිලිමත් විය යුත්තෙමු. මේ අවුරුද්දේ අප්‍රියෙල් මාසයට පසු දකුණු පළාත් වල වූවාක් මෙන් පාලක පංක්ති වල පාලනක්‍රමය සංසන්දනාත්මක වශයෙන් ස්ථාවර වී පවතින කාලපරිච්ඡේදයකදී, අපේ උපායමාර්ගය අනුක්‍රමයෙන් ඉදිරියට යාමේ උපායමාර්ගයක් විය යුතු ය. එබඳු කාලපරිච්ඡේදයකදී, යුද්ධ කටයුතු අතින් කළ හැකි ඉතා ම නරක දෙය නම් සැහැසි ලෙස ඉදිරියට යාමක් සඳහා අපේ බලසේනාවන් බෙදීම ය; (ඉඩම් බෙදා දීම, දේශපාලන බලය පිහිටුවීම, පක්ෂය පළල් කිරීම සහ ප්‍රාදේශික සන්නද්ධ බලසේනාවන් සංවිධානය කිරීම යන) ප්‍රාදේශික වැඩ අතින් කළ හැකි ඉතා ම නරක දෙය නම් අපේ සේවකපිරිස තැන් තැන් වලට විසුරුවා හැරීම ත් ප්‍රධාන දිස්ත්‍රික්ක වල සවිසක්තිමත් අඩිතාලමක් දැමීම නො සලකා හැරීම ත් ය. කුඩා රතු ප්‍රදේශ බොහෝ ගණනක් ලැබූ පරාජයන්ට හේතු වී ඇත්තේ එක්කෝ උචිතමනා කරන විෂයමූල තත්වයන් නො තිබීම ය, නැත් නම් උපක්‍රම අතින් කළ මනෝමූල වැරදි ය. උපක්‍රම අතින් කළ වැරදි කර තිබෙන්නේ, හුදෙක් පාලක පංක්ති වල පාලනක්‍රමය තාවකාලික වශයෙන් ස්ථාවර ව පවතින කාලපරිච්ඡේදය සහ එය භේද වී පවතින කාලපරිච්ඡේදය යන කාලපරිච්ඡේද දෙ වර්ගය පැහැදිලි ලෙස වෙන් කොට හඳුනා ගැනීමට බැරි වූ නිසා ම ය. තාවකාලික ස්ථාවරභාවය පැවති කාලපරිච්ඡේදයකදී, ඇතැම් සහෝදරවරු, හුදෙක් ඉඩම්හිමියන්ගේ භේවායන් යොදවා පමණක් නො ව නිත්‍ය භටකණ්ඩායම් යොදා කරන ඒකරාශී කළ සටන්ව්‍යාපාර මගින් ද පහර දෙන්ට සතුරාට හැකි ය යන සත්‍ය කාරණය නො පෙනෙන්නාක් මෙන්, සැහැසි ලෙස ඉදිරියට යාමක් සඳහා අපේ බලසේනාවන් බෙදීමට පක්ෂ ව කතා කළහ, විශාල ප්‍රදේශ ආරක්ෂා කිරීම රතු මුරභටයන්ට පමණක් බාර කර හැර යන්ට පවා යෝජනා කළහ. ප්‍රාදේශික වැඩ වලදී, ඔව්හු ප්‍රධාන දිස්ත්‍රික්ක වල සවිසක්තිමත් අඩිතාලමක් දැමීම සම්පූර්ණයෙන් ම අතපසු කළහ, අපට කරන්ට පුළුවන් ද බැරි ද යන වග නො තකමින් සීමා රහිත ලෙස පළල් වීමට උත්සාහ කළහ. යම්කිසිවෙක් යුද්ධ සටන්ව්‍යාපාර වලදී අනුක්‍රමයෙන් ඉදිරියට යාමේ ප්‍රතිපත්තියකට හෝ ප්‍රාදේශික වැඩ වලදී අනභිභවනීය තත්වයක් ඇති කරගන්නා සේ ප්‍රධාන දිස්ත්‍රික්ක වල සවිසක්තිමත් අඩිතාලමක් දැමීමට අපේ පරිශ්‍රමය යොමු කිරීමේ ප්‍රතිපත්තියකට හෝ පක්ෂ ව කතා කළේ නම්, ඔව්හු ඔහු ''භණ්ඩිට්කාරයෙක්'' ය' යි නම් කළහ. පසුගිය අගෝස්තුවේදී හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශය ත් දකුණු හුනානයේදී සිව්වැනි රතු හමුදාව ත් ලැබූ පරාජයන්ගේ මුල් හේතුව වූයේ ඔවුන්ගේ ඒ වැරදි අදහස් ය.

හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි අපේ වැඩ පටන්ගත්තේ ගිය අවුරුද්දේ ඔක්තෝබරයෙහි ය. ආරම්භයේදී, උප–පළාත් වල අපේ පක්ෂ

සංවිධාන සියල්ල ම ක්‍රියා විරහිත වී තිබුණි. ප්‍රාදේශික සන්නද්ධ බලසේනාවෝ, චිංකාං කඳු වලට නුදුරු තැන යුආන් වෙන්–සායි සහ වෝං ත්සෝ යටතේ සිටි, එක් සේනාංගයකට හොඳට ම අබලන් රයිපල් හැට බැගින් තිබුණු, සේනාංග දෙකකින් පමණක් සමන්විත වූහ; ඒ අතර යුංශින්, ලියන්හුආ, චාලිං සහ ලිංශියන් යන උප–පළාත් වල ගොවියන්ගේ ආත්මාරක්ෂක බළකායයෝ ඉඩම්හිමි පංක්තිය විසින් මුළුමනින් ම නිරායුධ කරනු ලැබ සිටියහ. බහුජනයාගේ විප්ලවවාදි උද්‍යෝගය ඔබා හිර කර තිබුණි. මේ අවුරුද්දේ පෙබරවාරි වන විට, නිංකාං, යුංශින්, චාලිං සහ සුයිචුආන් යන උප–පළාත් වල උප–පළාත් පක්ෂ කොමිටි ඇති වී තිබුණි, ලිංශියන් උප–පළාතේ විශේෂ දිස්ත්‍රික්ක පක්ෂ කොමිටියක් ඇති වී තිබුණි, ලියන්හුආ වල පක්ෂ සංවිධානයක් ක්‍රියා කරන්ට සහ වානාන් උප–පළාත් කොමිටිය සමග සබඳකම් ඇති කරගන්ට පටන් ගනිමින් තිබුණි. ලිංශියන් හැර සියලු ම උප–පළාත් වලට ප්‍රාදේශික සන්නද්ධ සේනාංග කීපයක් සිටියේ ය. නිංකාං, චාලිං, සුයිචුආන් සහ යුංශින් වල, විශේෂයෙන් පසුව කී උප–පළාත් දෙකෙහි, ඉඩම්හිමියන්ට විරුද්ධ ව ගොරිල්ලා පැනනැඟීම් හොඳ ගණනක් ඇති විය; එයින් බහුජනයා අවදි වූහ; සියල්ල ම තරමක් දුරට සාර්ථක විය. ඒ වකවානුවේදී ඉඩම් ලබා ගැනීමේ විප්ලවය එතෙක් ම ඒ තරම් දුරට ගෙනගොස් තිබුණේ නැත. දේශපාලන බල මණ්ඩල කම්කරුවන්ගේ, ගොවියන්ගේ සහ සෙබළුන්ගේ ආණ්ඩු ය'යි කියනු ලැබී ය. හමුදාවෙහි සෙබළුන්ගේ කොමිටි[3] පිහිටුවනු ලැබී ය. සේනාංග වෙන වෙන ම මෙහෙවර පිණිස ගිය කල, ඒවා විධානය කරනු පිණිස ක්‍රියා කොමිටි පිහිටුවනු ලැබී ය. එකී උප–පළාත් වල පක්ෂයේ නායක මූලව වූයේ සරත් අස්වනු පැනනැඟීම්[4] පැවති කාලයේ හුනාන් පළාත් කොමිටිය විසින් පත්කරනලද (මාඕ සේතුං ලේකම් වශයෙන් සිටි) පෙරමුණු කොමිටිය යි. මාර්තු මුල හරියේදී, දකුණු හුනාන් විශේෂ කොමිටියේ ඉල්ලීම පිට, පෙරමුණු කොමිටිය නැති කොට, එය (හෝ තිං–යිං ලේකම් වශයෙන් සිටි) කොට්ඨාශ පක්ෂ කොමිටිය වශයෙන් ප්‍රතිසංවිධාන කරනු ලැබී ය; එය එසේ හමුදාවේ පක්ෂ සංවිධාන පමණක් බාර, ප්‍රාදේශික පක්ෂ සංවිධාන කෙරෙහි බලයක් නැති, මුළුවක් බවට පත් විය. මේ අතර, මාඕ සේතුංගේ බලසේනාවෝ, දකුණු හුනානයේ විශේෂ කොමිටියේ ඉල්ලීම පිට, දකුණු හුනානයට යවනලදහ; විපාකය වශයෙන් හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශය මසකට වැඩි කලක් සතුරා අතට පත් විය. මාර්තු අවසානයේදී දකුණු හුනානයේ පරාජය සිදු විය; අප්‍රියෙල් මාසයේදී චූ තේ යටතේ සිටි බලසේනාවෝ ත් මාඕ සේතුං යටතේ සිටි බලසේනාවෝ ත්, දකුණු හුනානයේ ගොවි හමුදාව සමග එකතු වී, නිංකාං වලට ආපසු ගමන් කොට, දේශසීමා ප්‍රදේශයෙහි ස්වාධීන පාලනක්‍රමය නැවත පිහිටුවන්ට පටන් ගත්හ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අප්‍රියෙල් මාසයේ සිට හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි ස්වාධීන පාලනක්‍රමය දකුණෙහි තාවකාලික වශයෙන් ස්ථාවර වූ පාලන බලයකට මුහුණ දෙමින් පැවතියේ ය; හුනාන් සහ චියාංසි පළාත්, අප "මැඩලනු" පිණිස, ප්‍රතිගාමී බලසේනාවන්, යටත්පිරිසෙයින් රෙජමේන්තු අටක් හෝ නවයක්, ඇතැම් විට දහඅටක් තරම්, පිටත් කර එවන්ට විය. එසේ වී නමුත් රෙජමේන්තු හතරකට ත් අඩු බලසේනාවක් ඇති ව, අපි, අපේ ස්වාධීන පාලනක්‍රමය යටතේ තිබුණු භූමිප්‍රදේශය දිනපතා ම විශාල කරමින්, ඉඩම් ලබාගැනීමේ විප්ලවය ගැඹුරු කරමින්, ජනතාවගේ දේශපාලන බලය ව්‍යාප්ත කරමින්, රතු හමුදාව සහ රතු මුරහට සේනාවන් පළල් කරමින්, පූරා මාස හතරක් ම සතුරා හා සටන් කළෙමු. මෙය කළ හැකි වූයේ දේශසීමා ප්‍රදේශයෙහි (ප්‍රාදේශික සහ හමුදා) පක්ෂ සංවිධාන වල ප්‍රතිපත්ති නිවැරදි වූ නිසා ය. පක්ෂයේ (මාඕ සේතුං ලේකම් වශයෙන් සිටි) දේශසීමා ප්‍රදේශ විශේෂ කොමිටියේ ත් (චෙන් යී ලේකම් වශයෙන් සිටි) හමුදා කොමිටියේ ත් ප්‍රතිපත්ති එකල මෙසේ විය:

සතුරාට විරුද්ධ ව ස්ථිර ලෙස අරගල කරන්න, ලෝශියාඕ කඳු වැටියේ මැද කොටසෙහි දේශපාලන බලය පිහිටුවන්න, පළායාමේ ධර්මයට විරුද්ධ වන්න.

ස්වාධීන පාලනක්‍රමය යටතේ තිබෙන ප්‍රදේශ වල ඉඩම් ලබාගැනීමේ විප්ලවය ගැඹුරු කරන්න.

හමුදා පක්ෂ සංවිධානයේ ආධාරය ඇතිව ප්‍රාදේශික පක්ෂ සංවිධානය වර්ධනය කිරීම ඉදිරියට මෙහෙයවන්න, නිත්‍ය හමුදාවේ ආධාරය ඇතිව ප්‍රාදේශික සන්නද්ධ සේවාවන් වර්ධනය කිරීම ඉදිරියට මෙහෙයවන්න.

සංසන්දනාත්මක වශයෙන් ශක්තිමත් පාලන බලයක් තිබෙන හුනාන් පළාතට විරුද්ධ ව ආරක්ෂා වන තත්වයක සිටින්න, සංසන්දනාත්මක වශයෙන් දුර්වල පාලන බලයක් තිබෙන චියාංසි පළාතට විරුද්ධ ව පහර දීමට බහින්න.

යුංශින් උප-පළාත වර්ධනය කිරීමට මහත් පරිශ්‍රම දරන්න, එහි ජනතාවගේ ස්වාධීන පාලනක්‍රමයක් පිහිටුවා, දිග්ගැසුණු අරගලයක් පිණිස සූදනම් වන්න.

කාලය සුදුසු වූ විට තමන්ට අභිමුඛ ව සිටින සතුරා හා සටන් කරනු පිණිස රතු හමුදා සේනාංග එක්රැස් කරන්න, එකින් එක විනාශ කරනු ලැබීම වළකනු පිණිස බලසේනා බෙදනවාට විරුද්ධ වන්න.

ස්වාධීන පාලනක්‍රමය යටතේ තිබෙන ප්‍රදේශය පළල් කරනු පිණිස රළ පෙළක් මෙන් ඉදිරියට යාමේ ප්‍රතිපත්තිය යොදන්න, සැහැසි ලෙස ඉදිරියට යාමෙන් පළල් වීමේ ප්‍රතිපත්තියට විරුද්ධ වන්න.

මේ නිසි උපක්‍රම ද, අපේ අරගලයට හිතකර වූ දේශසීමා ප්‍රදේශයේ භූමිභාගය ද, හුනාන් පළාතේ සිට ආක්‍රමණය කළ හටකණ්ඩායම් සහ චියාංසි පළාතේ සිට ආක්‍රමණය කළ හටකණ්ඩායම් අතර ප්‍රමාණවත් උචිත සම්බන්ධයක් නොමැතිවීම ද හේතු කොටගෙන අප්‍රියෙල් සිට ජූලි තෙක් සිව් මස තුළ යුද්ධ ජයග්‍රහණ ගණනක් දිනාගන්ට ත් ජනතාවගේ ස්වාධීන පාලනක්‍රමය පළල් කරන්ට ත් අපි සමත් වීමු. අපට වඩා කීප ගුණයක් ශක්තිමත් වුව ද, සතුරා අපේ පාලනක්‍රමය විනාශ කරන්ට තබා, එය පළල් වීම වළකන්ට වත් අසමත් විය. අපේ පාලනක්‍රමය හුනාන් සහ චියාංසි පළාත් කෙරෙහි සද්-වැඩි වන බලපෑමක් කරන සුලු විය. අගෝස්තු පරාජයට එක ම හේතුව වූයේ, ඇතැම් සහෝදරවරුන්, ඒ වකවනුව පාලක පංක්ති වලට තාවකාලික ස්ථාවරභාවයක් තිබුණු වකවනුවක් බව වටහාගන්ට අසමත් ව, පාලක පංක්ති තුළ දේශපාලන භේද පවතින වකවනුවකට යෝග්‍ය වූ ප්‍රතිපත්තියක් යොදා, දේශසීමා ප්‍රදේශය ත් දකුණු හුනාන් පළාත ත් යන දෙකෙහි ම පරාජය සිදු කරමින්, දකුණු හුනානය වෙත සැහැසි ලෙස ඉදිරියට යාමක් පිණිස අපේ බලසේනාවන් බෙදීම ය. හුනාන් පළාත් කොමිටියේ නියෝජිතයා වූ තු ශියු-චිං ද, පළාත් කොමිටිය විසින් පත්කරනු ලැබ සිටි දේශසීමා ප්‍රදේශ විශේෂ කොමිටියේ ලේකම් යාං කායි-මිං ද සැබෑ තත්වය හොඳින් වටහාගන්ට අසමත් වූහ; මාඕ සේතුං, වාන් ශි-ශියන් සහ බලවත් ලෙස අකැමැත්ත පළ කර සිටි සෙසු සහෝදරවරුන් සිටියේ ඈත යුංශින් වල ය යන සත්‍ය කාරණය වාසියක් කරගනිමින්, ඔව්හු, හුනාන් පළාත් කොමිටියේ මත අනුමත නො කළ පක්ෂයේ හමුදා කොමිටිය, විශේෂ කොමිටිය සහ යුංශින් උප-පළාත් කොමිටිය යන මේවායේ ඒකාබද්ධ රැස්වීමේ යෝජනා නො තකා හැරියහ. ඔව්හු දකුණු හුනාන් පළාතට ගමන් කිරීමට හුනාන් පළාත් කොමිටිය දී තිබුණු නියෝගය හුදෙක් යාන්ත්‍රික ලෙස බලෙන් ක්‍රියාවේ යෙදූහ, අරගලයෙන් මග හැර ආපසු ගෙදර යාමට රතු හමුදාවේ (යිචාංහි ගොවියන් ගෙන් සැදුණු) 29වැනි රෙජමේන්තුව පළ කළ ආසාවට ඉඩ ඇරියහ, එසේ දේශසීමා ප්‍රදේශය ත් දකුණු හුනාන් පළාත ත් යන දෙකෙහි ම පරාජය සිදු කළහ.

මුලින් ම, ජූලි මැදදී, වූ ශාං යටතේ හුනානයෙන් ආ 8වැනි හමුදාව නිංකාං අතික්‍රමණය කොට, යුංශිං තුළට කාගෙන ගොස්, අප සමග සටන් වදින්නට සෙවූ නමුත් එය නිෂ්ඵල විය (අපේ මිනිසුන් අතුරු පාරකින් පැමිණ ඔවුන්ට පහර දෙන්ට උත්සාහ කළ නමුත් ඔව්හු මග ඇරුණෝ ය); ඉක්බිති, ඒ හමුදාව අපට අනුබල දුන් බහුජනයාට බිය වූයෙන්, ලියන්හුආ ඔස්සේ චාලිං වලට කඩිමුඩියේ පසුබැස්සේ ය. ඒ අතර, ලිංශියන් සහ චාලිං වලට පහර දෙනු පිණිස නිංකාං වල සිට ඉදිරියට ගමන් කරමින් සිටි රතු හමුදාවේ ප්‍රධාන බලඇණිය ලිංශියන් වලට පැමිණි කල තම සැලැස්ම වෙනස් කොට දකුණු හුනානය දෙසට හැරුණු අතර, වොං චුන් සහ චින් හාන්-තිං යටතේ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සිටි 3වැනි හමුදාවේ රෙජමේන්තු 5කින් ද හූ වෙන්-තෞ යටතේ සිටි 6වැනි හමුදාවේ රෙජමේන්තු 6කින් ද සැදුණු, චියාංසි පළාතෙන් ආ සතුරු බලසේනාවෝ යුංශින් වලට ඒකාබද්ධ ප්‍රහාරයක් දියත් කළහ. ඒ අවස්ථාවෙහි යුංශින් වල අපට සිටියේ එක රෙජමේන්තුවක් පමණකි; එය, ජනතාව අතර පුළුල් සමූහයන් විසින් සලසා දුන් ආවරණය යටතේ, හැම පැත්තෙන් ම දුන් ගොරිල්ලා ප්‍රහාරයන් මගින් මේ රෙජමේන්තු 11 ම විසිපස් දිනක් තරම් දිගු කලකට යුංශින් උප-පළාත් නගරයේ සිට ලි තිහක අරයක් ඇතුළත හිර කර තබා ගත්තේ ය. අන්තිමේදී සතුරාගේ දරුණු පහර නිසා අපට යුංශින් නැති විය; ඊට ටික දිනකට පසු ලියන්හුආ සහ නිංකාං ද නැති විය. ඒ මොහොතෙහි චියාංසි සතුරු බලසේනාවන් අතර උන්හිටිගමන් ම අභ්‍යන්තර අසමගිකම් පැනනැංගේ ය; හූ වෙන්-තෞ යටතේ සිටි 6වැනි හමුදාව කලබලයෙන් ඉවත් වී ගොස්, චාංශු වලදී චෝං චුන්ගේ 3වැනි හමුදාව සමග නො පමා ව ම සටන් වැදුණි. එවිට අනිත් චියාංසි රෙජමේන්තු 5 කලබල වී යුංශින් උප-පළාත් නගරයට ඉවත් වී ගියේ ය. අපේ ප්‍රධාන බලඇණිය දකුණු හූනානයට නො ගොස් සිටියේ නම්, මේ සතුරු සේනාව පරදා පළවා හරින්ට ත්, ස්වාධීන පාලනක්‍රමයට අයත් ප්‍රදේශය චියාන්, ආන්ෆූ සහ පිංශියාං ඇතුළත් වන සේ පළල් කරන්ට ත්, එය පිංචියාං සහ ලියූයාං සමග ඈඳන්ට ත් මුළුමනින් ම පුළුවන්කම තිබුණි. එහෙත් ප්‍රධාන බලඇණිය නො සිටි හෙයින් ද, ඉතිරි වී සිටි එක් රෙජමේන්තුව පමණට වඩා හෙම්බත් වී සිටි හෙයින් ද, යූආන් වෙන්-ත්සායි සහ වෝං ත්සෝ යටතේ සිටි සේනාංග දෙක සමග එක් වී චිංකාං කඳු ආරක්ෂා කිරීම පිණිස මිනිසුන් ගෙන් කොටසක් එහි නතර කොට, මා ඉතිරි අය රැගෙන ප්‍රධාන බලඇණිය මුණගැසී ආපසු එන ලෙස ඊට ආරාධනා කරනු පිණිස කුළුයිතුං වලට යා යුතු ය'යි තීරණය කරනු ලැබී ය. ඒ වන විට ප්‍රධාන බලඇණිය දකුණු හූනානයේ සිට කුළුයිතුං බලා පසුබසිමින් සිටියේ ය; අගෝස්තු 23වැනි ද අපේ සේනාවෝ එහිදී එකට එක්වූහ.

රතු හමුදාවේ ප්‍රධාන බලඇණිය ජූලි මැදදී ලිංශියන් වලට පැමිණි කල, දේශපාලන වශයෙන් වැනෙමින් සිටියා වූ ද, දකුණු හූනානයේ තම ගෙවල් දොරවල් බලා ආපසු යන්ට උවමනා වී සිටියා වූ ද 29වැනි රෙජමේන්තුවේ නිලධාරි ත් මිනිස්සු ත් අණට කීකරු වීම ප්‍රතික්ෂේප කළහ; ඒ අතර 28වැනි රෙජමේන්තුව දකුණු හූනානයට යනවාට විරුද්ධ විය, ඔවුන්ට දකුණු චියාංසි පළාතට යන්ට උවමනා විය; ඒ මේ කුමක් වුවත්, යුංශින් වලට ආපසු යන්ට නම් උවමනා නො වී ය. තූ ශියු-චිං 29වැනි රෙජමේන්තුව වැරදි අදහස් දරද්දී ඒ රෙජමේන්තුවට දිරි දුන් නිසා ත්, ඔවුන්ගේ අදහස් වෙනස් කරන්ට හමුදා කොමිටිය අසමත් වූ නිසා ත්, ප්‍රධාන බලඇණිය ජූලි 17වැනි ද ලිංශියන්හි සිට චෙන්චව් බලා ගමනාරම්භ කළේ ය. ජූලි 24වැනි ද චෙන්චව්හිදී පාන් ශි-ශෙං යටතේ සිටි සතුරු බලසේනාවන් සමග කළ

සූණ්ඩු සටනකදී, ප්‍රධාන බලඇණිය මුලදී ජය ගත් නමුදු පසුව පරාජය වී සටනින් ඉවත් විය. එතැනදී, 29වැනි රෙජමේන්තුව තම හිතුමනාපයට ක්‍රියා කරමින්, ගම්පළාත් බලා යිචාං දෙසට කඩිමුඩියේ ගමන් කරන්ට වූයෙන්, ප්‍රතිඵලය වශයෙන් එක් කොටසක් ලෝචාංහිදී හූ පෙං-චාංගේ පල්හොරුන් විසින් මුලසුන් කර දමනු ලැබී ය, තවත් කොටසක් චෙන්චව්-යිචාං ප්‍රදේශයෙහි සිසිකඩ ව ගියේ ය. එද මෙද ඔවුන් ගැන කිසි ම දෙයක් අසන්ට නො ලැබුණි; ඒ දවසේ යළි ත් එක්තැන් කරගත්තේ මිනිසුන් සියයකට නොවැඩි ගණනකි. වාසනාවකට මෙන්, ප්‍රධාන බලසේනාව වූ 28වැනි රෙජමේන්තුව එතරම් විශාල අලාභහානි විඳ නො සිටියේ ය; අගෝස්තු 18වැනි ද ඒ රෙජමේන්තුව කුළුයිතුං අල්ලා ගත්තේ ය. අගෝස්තු 23වැනි ද චිංකාං කඳු වලින් පැමිණි භටකණ්ඩායම මේ රෙජමේන්තුවට එකතු විය; ඒකාබද්ධ බලසේනාවෝ චුංයී සහ ශාංයූ පාරෙන් චිංකාං කඳු වලට ආපසු යා යුතු ය'යි තීරණය කරනු ලැබී ය. අප චුංයී වලට සේන්දු වූ කල, බැටෑලියන් අණදෙන්නකු වූ යූආන් චුං-චුආන් පාබල කොම්පඤ්ඤයක් ද කාලතුවක්කු කොම්පඤ්ඤයක් ද කැටුව පළාගියේ ය; මේ කොම්පඤ්ඤ දෙක ආපසු ගෙන එනු ලැබූ නමුදු, මේ ක්‍රියාවේදී අපේ රෙජමේන්තු අණදෙන්නා වූ චෝං අර්-චෝගේ ජීවිතය නැති විය. අපේ මිනිසුන් ආපසු එමින් සිටියදී, එහෙත් එතෙක් ම තමන් යමින් සිටි තැනට සැපත් නො වී සිටියදී, හූනාන් සහ චියාංසි පළාත් වලින් පැමිණි සතුරු සේනාංග අගෝස්තු 30වැනි ද චිංකාං කඳු වලට පහර දීමට ඒ ඉඩප්‍රස්තාව අල්ලා ගති. කඳවුර ආරක්ෂා කිරීමෙහි යෙදී සිටි භටයෝ, ගණනින් එක් බැටෑලියමකට ද අඩු වුව ත්, තමන් සිටි වාසි සහිත භූමිස්ථාන වලින් ප්‍රයෝජන ගනිමින්, ආපසු සටන් කොට, සතුරා පරදා පළවා හැර කඳවුර බේරා ගත්හ.

අපේ අගෝස්තු පරාජයේ හේතු මතු දක්වන පරිදි විය: (1) වැනෙමින් සිටි සහ ගෙදර යන්ට ආසාවෙන් පෙළෙමින් සිටි ඇතැම් නිලධාරින්ගේ සහ මිනිසුන්ගේ සටන් හැකියාව නැති වී තිබුණු අතර, දකුණු හූනාන් පළාතට යන්ට අකැමැත්තෙන් සිටි චෙන අය තුළ උද්‍යෝගය නැති වී තිබුණි; (2) අපේ මිනිස්සු ගිනිගෙන දැවෙන ග්‍රීෂ්ම සෘතු උෂ්ණත්වයෙහි දීර්ඝ ගමන් වල යෙදී හෙම්බත් වී සිටියහ; (3) ලිංශියන්හි සිට ලි සිය ගණනක් ඈත ගොස් සිටියෙන්, අපේ මිනිස්සු දේශසීමා ප්‍රදේශය සමග සම්බන්ධය නැති වී තනි වූහ; (4) දකුණු හූනානයේ බහුජනයා ඒ වන තුරු ත් අවදි වී නො සිටියෙන්, ඒ යුදගමන හුදු යුද්ධ සාහසිකවාදයක් බව ඔප්පු විය; (5) සතුරාගේ තත්වය ගැන අපට තොරතුරු ලැබී තිබුණේ නැත; (6) සූදනම් වීම ප්‍රමාණවත් වුණේ නැත, නිලධාරින්ට ත් මිනිසුන්ට ත් ඒ සටන් ව්‍යාපාරයේ අභිප්‍රාය තේරුණේ නැත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ස්වාධීන පාලනක්‍රමය යටතේ තිබෙන ප්‍රදේශයෙහි දැනට පවතින තත්වය

මේ අවුරුද්දේ අප්‍රියෙල් මාසයේ සිට රතු ප්‍රදේශ අනුක්‍රමයෙන් ව්‍යාප්ත කර තිබේ. අප විසින් කියාංසි සතුරු සේනාවන් සිව්වැනි වරට ත් පරාජය කරමින් ජූනි 23වැනි ද (යුංශින් සහ නිංකාං අතර දේශසීමාවන්හි පිහිටි) ලුංයුආන්කෞහිදී කරනලද සටනට පසු, දේශසීමා ප්‍රදේශය නිංකාං, යුංශින් සහ ලියන්හුආ යන උප–පළාත් තුන ද, කියාන් සහ ආන්ෆූ වලින් කුඩා කොටස් ද, සුයිචුආන් වල උතුරු කොටස ද, ලිංශියන් වල නිරිතදිග කොටස ද ඇතුළත් කරගනිමින්, එහි වර්ධනයේ ඉහළ ම තැනට පත් විය. රතු ප්‍රදේශ වල ඉඩම් වලින් වැඩි කොටස බෙදා දී තිබුණි. ඉතිරි කොටස බෙදා දීගෙන යමින් තිබුණි. දේශපාලන බල මණ්ඩල දිස්ත්‍රික්ක වල ත්, නියම්-ගම් වල ත් හැම තැන ම පිහිටුවනු ලැබී ය. උප–පළාත් ආණ්ඩු නිංකාං, යුංශින්, ලියන්හුආ සහ සුයිචුආන් යන උප–පළාත් වල පිහිටුවනු ලැබී ය, දේශසීමා ප්‍රදේශ ආණ්ඩුවක් සකස් කරනු ලැබී ය. කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ කැරලි බලඇණි ගම් වල සංවිධානය කරනු ලැබී ය, රතු මුරභට සේනාවෝ දිස්ත්‍රික්ක සහ උප–පළාත් මට්ටම් වලින් සකස් කරනලදහ. ජූලි මාසයේදී කියාංසි සතුරු බලසේනාවෝ පහර දෙන්ට වූහ, අගෝස්තු මාසයේදී හුනාන් සහ කියාංසි සතුරු බලසේනාවෝ එකමුතු වී චිංකාං කඳු වලට පහර දුන්හ. දේශසීමා ප්‍රදේශයෙහි සියලු උප–පළාත් නගර සහ තැනි සතුරා විසින් අල්ලාගනු ලැබී ය, සතුරාගේ හිවල්ලු — එනම්, සාම සංරක්ෂණ බළකායයන් සහ ඉඩම්හිමියන්ගේ භේවායෝ — පිස්සු-වෙන් මෙන් හැසුරුණෝ ය, ධවල භීතිය නගර වල ත් ගම්බදපෙදෙසෙහි ත් හැම තැන ම දරුණු ලෙස පැතිරී ගියේ ය. පක්ෂ සහ ආණ්ඩු සංවිධාන අතුරෙන් වැඩි ගණනක් ඇදවැටුණි. පොහොසත් ගොවියෝ ත්, පක්ෂය තුළ සිටි අවස්ථාවාදියෝ ත් මහත් ගණනින් සතුරාගේ පැත්තට ගියහ. අගෝස්තු 30වැනි ද චිංකාං කඳු වල සටන කරන තුරු ම, හුනාන් සතුරු බලසේනාවෝ ලිංශියන් වලට නො පසුබැස්සෝ ය; එහෙත් කියාංසි බලසේනාවෝ ඒ වන තුරු ත් උප–පළාත් නගර සියල්ල ද ගම් වලින් වැඩි ගණනක් ද අල්ලා-ගෙන සිටියහ. කෙසේ වෙතත්, නින්කාං වල බටහිරි සහ උතුරු දිස්ත්‍රික්ක ද, පිළිවෙලින් යුංශින් වල උතුරු, බටහිරි සහ දකුණු කොටස් වල පිහිටි තියන්ලුං, ශියාඕශිචියාං සහ වාන්නියන්ශාන් දිස්ත්‍රික්ක ද, ලියන්හුආ වල ශාංසි දිස්ත්‍රික්කය ද, සුයිචුආන් වල චිංකාංශාන් දිස්ත්‍රික්කය ද, ලිංශියන් වල ත්සිංශිකාං සහ තායුආන් දිස්ත්‍රික්ක ද ඇතුළත් කඳු ප්‍රදේශ අල්ලා-ගන්ට සතුරාට කවදා වත් නො හැකි විය. ජූලි සහ අගෝස්තු මාස වල, විවිධ උප–පළාත් වල රතු මුරභටයන් සමග උචිත ලෙස සම්බන්ධ වී, රතු හමුදාවේ එක් රෙජමේන්තුවක්, අන්තිමේදී එය කඳු වලට ආපසු යන්ට පෙර,

රයිපල් තිහක් පමණක් නැති කරගනිමින්, ලොකු කුඩා සටන් විශාල ගණනක් කළේ ය.

අපේ මිනිසුන් චුංයී සහ ශාංයූ ඔස්සේ චිංකාං කඳු කරා ආපසු ගමන් කරමින් සිටියදී, දකුණු කියාංසි පළාතෙන් ආ සතුරු බලසේනාව, එනම්, ලියු ශි–යි යටතේ සිටි ස්වාධීන 7වැනි ඩිවිසනය, සුයිචුආන් තෙක් ම අප ලුහුබැන්දේ ය. සැප්තැම්බර් 13වැනි ද අපි ලියු ශි–යි පරාජය කළෙමු, රයිපල් සිය ගණනක් අල්ලා ගතිමු, සුයිචුආන් ගතිමු. සැප්තැම්බර් 26වැනි ද අපි චිංකාං කඳු වලට ආපසු පැමිණියෙමු. ඔක්තෝබර 1වැනි ද, නිංකාං වලදී, අපි චෞ හුන්–යුආන් විසින් අණ දෙනු ලැබූ ශියුං ශි–හුයිගේ බ්‍රිගේඩ අතුරෙන් එකක් හා සටන් වැදී එය පරදා, මුළු නිංකාං උප–පළාත ම ආපසු අල්ලා ගතිමු. ඒ අතර, කුළුයිතුංහි නතර කර සිටි, යෙන් චුං–ජු යටතේ සිටි හුනාන් සතුරු බලසේනාවන්ට අයත් මිනිස්සු 126 දෙනෙක් අපේ පැත්තට පැමිණියාහු, පි චාන්–යුන් අණදෙන්නා වශයෙන් ඇති ව විශේෂ වැඩ බැටැලියමක් බවට සංවිධානය කරනලදහ. නොවැම්බර් 9වැනි ද අපි ලුංයුආන්කෞ වලදී සහ නිංකාං උප–පළාත් නගරයේදී චෞගේ බ්‍රිගේඩයේ එක් රෙජමේන්තුවක් පරදා පළවා හැරියෙමු. ඊළඟ දිනයෙහි අපි ඉදිරියට ගමන් කොට යුංශින් අල්ලා-ගත් නමුත්, ඊට ටික දිනකට පසු නිංකාං වලට ආපසු ගියෙමු. දැනට, දකුණේ සුයිචුආන් උප–පළාතේ චිංකාං කඳු වල දකුණු බෑවුම් වල සිට උතුරේ ලියන්හුආ උප–පළාතේ දේශසීමාව තෙක් ව්‍යාප්ත වූ අපේ ප්‍රදේශය, උතුරේ සිට දකුණට දිවෙන පටු නො බිඳුණු බිම් තීරයක් තනමින්, මුළු නිංකාං උප–පළාත ද, සුයිචුආන්, ලිංශියන් සහ යුංශින් උප–පළාත් වලින් කොටස් ද ඇතුළත් කරගනී. කෙසේ වෙතත්, ලියන්හුආ උප–පළාතේ ශාංශි දිස්ත්‍රික්කය ද, යුංශින් උප–පළාතේ තියන්ලුං සහ වාන්නියන්ශාන් දිස්-ත්‍රික්ක ද මේ නො බිඳුණු තීරය සමග තරයේ ඈඳී නැත. සතුරා යුද්ධ ප්‍රහාර සහ ආර්ථික අවහිරය මගින් අපේ කඳවුරු ප්‍රදේශය විනාශ කරන්ට උත්සාහ කරමින් සිටී: අපි දැන් ඔහුගේ ප්‍රහාරයන් පරාජය කිරීමට සූදනම් වෙමින් සිටිමු.

යුද්ධ ප්‍රශ්න

දේශසීමා ප්‍රදේශයෙහි අරගලය තනිකර ම යුද්ධමය අරගලයක් වන හෙයින්, පක්ෂය ත් බහුජනයා ත් යන දෙගොල්ල ම යුද්ධයට සූදනම් කළ තත්වයක තිබිය යුතු ම ය. සතුරා ගැන කෙසේ ක්‍රියා කළ යුතු ද, කෙසේ සටන් කළ යුතු ද යනු අපේ දිනපතා ජීවිතයෙහි කේන්ද්‍රීය ගැටළුව වී ඇත. ස්වාධීන පාලනක්‍රමයක් සන්නද්ධ පාලනක්‍රමයක් විය යුතු ය. එබඳු ප්‍රදේශයක් යම් තැනක පිහිටියේ ද, එහි සන්නද්ධ බලසේනාවන් නො වෙත් නම් හෝ

LIBERATION BASE
https://liberationbase.wordpress.com

ප්‍රමාණවත් නො වෙත් නම්, නැතහොත් සතුරා ගැන ක්‍රියා කරන විට වැරදි උපක්‍රම යොදනු ලැබේ නම්, සතුරා එම ප්‍රදේශය වහා ම අල්ලා ගන්නවා ඇත. අරගලය දිනක් පාසා ම වඩ වඩා දරුණු වෙමින් යන හෙයින්, අපේ ගැටළු අතිශයින් ම සංකීර්ණ සහ බැරෑරුම් වී ඇත.

දේශසීමා ප්‍රදේශයෙහි රතු හමුදාවට මිනිසුන් ලබාගෙන ඇත්තේ (1) කලින් චාඕචව් සහ ස්වාතව් වල යේ තිං සහ හෝ ලුං යටතේ සිටි භටකණ්ඩායම්,[5] (2) කලින් වූචාං නුවර තිබුණු ජාතික ආණ්ඩුවේ මුරභට රෙජමේන්තුව[6], (3) පිංචියාං සහ ලියුයාං උප-පළාත් වලින් පැමිණි ගොවියන්[7], (4) දකුණු හුනාන් පළාතෙන් පැමිණි ගොවියන්[8] සහ ශුයිකොඖශාන් වලින් පැමිණි කම්කරුවන්[9], (5) ශූ කේ-ශියාං, තාං ශෙං-චි, පායි චුං-ශි, චූ පෙයි-තේ, චූ ශාං සහ ශියුං ශි-හුයි යටතේ සිටි බලසේනාවන් ගෙන් අල්ලා ගත් මිනිසුන් සහ (6) දේශසීමා ප්‍රදේශයෙහි උප-පළාත් වල ගොවියන් යන මොවුන් ගෙන් ය. කෙසේ වෙතත්, අවුරුද්දකට වැඩි කලක් සටන් කිරීමෙන් පසු කලින් යේ තිං සහ හෝ ලුං විසින් අණ දෙනු ලැබූ භටයන්, මුරභට රෙජමේන්තුව සහ පිංචියාං සහ ලියුයාං වලින් පැමිණි ගොවියන් යන මොවුන් ගෙන් ඉතිරි වී සිටින්නේ තුනෙන් එක් කොටසක් පමණකි. දකුණු හුනානයෙන් පැමිණි ගොවියන් අතර ද මැරුම් කෑ අයගේ ත් තුවාල වූ අයගේ ත් ගණන බරපතල වී ඇත. මෙසේ මුලින් කී කොටස් හතර මේ දක්වා ම සිව්වැනි රතු හමුදාවේ කොඳුඇටය වශයෙන් සිටින නමුදු, ඔවුන්ගේ ගණන දැන් අන්තිමට කී කොටස් දෙකේ ගණනට වඩා බෙහෙවින් ම අඩු වී ඇත. එමතු නො ව, පසුව කී දෙ කොටසේ සිටින ගොවියන්ගේ ගණන අල්ලා ගත් සෙබළුන්ගේ ගණනට වඩා අඩු ය; මේ අඩුව අල්ලාගනු ලබන සෙබළුන් ගෙන් පුරවන්නේ නැත් නම්, මිනිස්බලය අතින් බරපතල ගැටළුවක් ඇති වෙන්ට ඉඩ තිබේ. එය එසේ කළත්, රයිෆල් වැඩි වෙන වේගයෙන් මිනිස්සු වැඩි වෙන්නේ නැත. රයිෆල් පහසුවෙන් නැති නො වේ; නමුත් මිනිස්සු තුවාල වෙති, මැරුම් කති, ලෙඩ වෙති, නැතහොත් පළා යති; එහෙයින් වඩා පහසුවෙන් නැති වෙති. අපට ආන්යුආන්[10] වලින් කම්කරුවන් එවීමට හුනාන් පළාත් කොමිටිය පොරොන්දු වී සිටී; එය එසේ කරනවා ඇතැ'යි අපි මහත් ඕනෑ-කමින් බලාපොරොත්තු වෙමු.

පංක්ති මුල සම්බන්ධයෙන්, රතු හමුදාව කොටසකින් කම්කරුවන් ගෙන් සහ ගොවියන් ගෙන් ද, කොටසකින් නන්නත්තාර-නිර්ධනීන් ගෙන් ද සමන්විත ය. ඇත්තෙන් ම, පසුව කී කොටසින් පමණට වඩා තබාගැනීම නුවණට හුරු නො වේ. එහෙත් ඔවුන්ට සටන් කළ හැකි ය; මරණ සහ අනතුරු ගණන වැඩි වෙමින් දිනපතා ම සටන් සිදුවෙමින් යන බැවින්, අඩුව පිරවීමට ඔවුන් අතුරෙන් පවා මිනිසුන් ලබා ගැනීම දැනට ම පහසු දෙයක් නො වේ. මේ වටාපිටා තත්වයන් තුළ තිබෙන එක ම විසඳුම නම් දේශපාලන පුහුණුව දැඩි කිරීම ය.

රතු හමුදාවේ සෙබළුන් අතුරෙන් වැඩිදෙනා එන්නේ කුලියට සේවය කරන හමුද වලින් ය; එහෙත් ඔවුන් රතු හමුදාව තුළට පැමිණි කල ඔවුන්ගේ චරිතය වෙනස් වේ. පළමුකොට ම, රතු හමුදාව කුලියට සේවය කිරීමේ ක්‍රමය නැති කර තිබේ; එය තමන් සටන් කරන්නේ තමන් ම උදෙසා සහ ජනතාව උදෙසා මිස අන් කිසිවකු උදෙසා නො වේ ය යන හැඟීම මිනිසුන්ට දී තිබේ. මේ වන තෙක් ම නිතිපතා වැටුප් ගෙවීමේ ක්‍රමයක් රතු හමුදාවට නැත; ධාන්‍ය ද, කෑම පිසින තෙල්, ලුණු, දර සහ එළවළු සඳහා මුදල් ද, අතේ වියදමට සුළු මුදලක් ද දෙනු ලැබේ. දේශසීමා ප්‍රදේශයෙහි උපන් අය වන රතු හමුද නිලධාරින් සහ මිනිසුන් සියලු දෙනාට ම ඉඩම් වෙන් කොට පවරා දී තිබේ, එහෙත් රටේ වෙනත් කොටස් වලින් පැමිණ සිටින අයට ඉඩම් පවරා දීම තරමක් අමාරු ය.

දේශපාලන අධ්‍යාපනය ලැබීමෙන් පසු, රතු හමුදාවේ සෙබළු පංක්ති-හැඟීමෙන් යුක්ත වී සිටිති, ඉඩම් බෙදා දීම, දේශපාලන බලය පිහිටුවීම, කම්කරුවන් සහ ගොවියන් අතට ආයුධ දීම යනාදියේ සාරධර්ම ඉගෙන-ගෙන සිටිති; තමන් සටන් කරන්නේ තමන් උදෙසා බව, කම්කරු පංක්තිය සහ ගොවිජනයා උදෙසා බව, ඔව්හු දනිති. එහෙයින් කටුක අරගලයේ අමාරුකම් කිසි කන්කෙඳිරියක් නැති ව ඉවසන්ට ඔවුන්ට හැකි ය. එක් එක් කොම්පඤ්ඤයට, බැටැලියමට හෝ රෙජමේන්තුවට ඊට ම අයත් සෙබ-ළුන්ගේ කොමිටියක් තිබේ: මේ කොමිටිය සෙබළුන්ගේ පලප්‍රයෝජන නියෝජනය කරයි, දේශපාලන සහ බහුජන වැඩ කරගෙන යයි.

පක්ෂ නියෝජිතයන් සිටීමේ ක්‍රමය[11] නැති නො කළ යුතු බව අත්දැකී-මෙන් ඔප්පු වී තිබේ. පක්ෂ ශාඛා සංවිධානය කරන්නේ කොම්පඤ්ඤ පදනමක් පිට බැවින්, කොම්පඤ්ඤ මට්ටමෙන් පක්ෂ නියෝජිතයකු සිටීම විශේෂයෙන් ම වැදගත් ය. සෙබළුන්ගේ කොමිටි දේශපාලන පුහුණුව දීගෙන යන බවට වග බලාගැනීමට ත්, බහුජන ව්‍යාපාර වල වැඩට මග පෙන්වීමට ත්, ඒ සමග ම පක්ෂ ශාඛාවේ ලේකම් වශයෙන් සේවය කිරීමට ත් ඔහුට තිබේ. කොම්පඤ්ඤ පක්ෂ නියෝජිතයා වඩා හොඳ වන පමණට කොම්පඤ්ඤය වඩා යහපත් වන බව ද, මේ වැදගත් දේශපාලන කොටස රඟපාන්ට කොම්පඤ්ඤයේ අණදෙන්නාට අමාරු බව ද, සත්‍ය කරුණු වලින් පෙනීගොස් තිබේ. පහළ මට්ටමේ කාඩර්වරුන් අතර සිදු වන මරණ හා අනතුරු ගණන බරපතල බැවින්, අල්ලා ගත් සතුරු සෙබළු බොහෝ විට ඉතා කෙටි කලකින් ප්ලැටූන් නායකයන් හෝ කොම්පඤ්ඤ අණදෙන්නන් බවට පත් වෙති; පෙබරවාරියේදී හෝ මාර්තුවේදී අල්ලා ගත් අය අතුරෙන් සමහරු දැනට ම බැටැලියන් අණදෙන්නන් වී සිටිති. අපේ හමුදාවට රතු හමුදාව ය'යි කියන නිසා, පක්ෂ නියෝජිතයන් හමුදාවට නැතුවාට කමක් නැතැ'යි පෙනෙන්ට ඉඩ තිබේ; එහෙත් එය ලොකු වරදකි. එක් අවස්ථාවක දකුණු හුනානයේ 28වැනි රෙජමේන්තුව මේ ක්‍රමය නැති කළ නමුත්,

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

පසුව එය නැවත ත් ඇති කරනු ලැබී ය. පක්ෂ නියෝජිතයන් "අධ්‍යක්ෂ-වරුන්" වශයෙන් අළුතෙන් නම් කිරීමෙන්, ඔවුන්, අල්ලා ගත් සෙබළුන් විසින් තරයේ පිළිකුල් කරන කුඕමින්තාං හමුදාවේ අධ්‍යක්ෂවරුන් සමග පටලවා ගැනීමට ඉඩ තිබේ. නම වෙනස් කිරීමෙන් ක්‍රමයේ ස්වභාවයෙහි වෙනසක් ඇති නො වේ. එහෙයින් වෙනසක් නො කරන්ට අපි තීරණය කර සිටිමු. පක්ෂ නියෝජිතයන් අතර සිදු වන මරණ හා අනතුරු ගණන බරපතල ය; පුහුණු කිරීම සහ පුරප්පාඩු පිරවීම පිණිස අප විසින් පංක්ති පටන් ගෙන තිබෙන අතර, මධ්‍යම කාරකසභාව ත් හූනාන් සහ චියාංසි පළාත් කොමිටි ත් පක්ෂ නියෝජිතයන් වශයෙන් සේවය කළ හැකි සහෝදරවරුන් අඩු ම ගණනේ තිස් දෙනකුන් වත් අපට එවනවා ඇතැ'යි අපි බලාපොරොත්තු වෙමු.

සාමාන්‍යයෙන් සොල්දාදුවකුට සටන් කරන්ට හැකි වීමට පෙර හය මසක හෝ අවුරුද්දක පුහුණුවක් උවමනා කරයි; නමුත් ඊයේ බන්දා ගත් අපේ සෙබළු කිසි ම පුහුණුවක් නො ලබා ම මෙන් අද සටන් කළ යුතු වෙති. යුද්ධ ශිල්පය අතින් දිළිඳු වූ ඔව්හු හුදු ධෛර්යය මත පමණක් සටන් කරති. විවේකය සහ පුහුණුව පිණිස දිගු කාලපරිච්ඡේද ලබා දීම කරන්ට බැරි දෙයක් නිසා, කළ යුතු එක ම දෙය කරන්ට පුළුවන් නම් උත්සාහ කොට ඇතැම් සටන් නො කොට මග හැර, එසේ පුහුණුව පිණිස කාලය ලබා-ගැනීම ය. අපට දැනට පහළ-පෙළේ නිලධාරින් වශයෙන් පුහුණුව ලබමින් සිටින මිනිසුන් 150 දෙනකුන් ගෙන් යුත් බළකායක් සිටී; මේ පුහුණු කිරීමේ පංක්තිය නිත්‍ය ආයතනයක් කිරීමට අපි අදහස් කරමු. මධ්‍යම කාරක-සභාව ත් පළාත් කොමිටි දෙක ත් ජ්ලැටූන් නායකයාගේ සහ කොම්පඤ්ඤ අණදෙන්නාගේ සිට ඉහළට තව තව ත් නිලධාරින් අපට එවනවා ඇතැ'යි අපි බලාපොරොත්තු වෙමු.

සෙබළුන්ගේ ද්‍රව්‍යමය තත්වයන් ගැන සොයා බලා, ඒ තත්වයන් සාමාන්‍ය කම්කරුවාගේ ත් ගොවියාගේ ත් තත්වයන්ට වඩා ටිකක් වත් යහපත් කරන්නට ය' යි හූනාන් පළාත් කොමිටිය අපට කියා ඇත. ඇත්ත වශයෙන් ඒ තත්වයෝ ඊට වඩා නරක ය. ධාන්‍ය කොටසට අමතර ව, එක් මිනිසකුට කෑම පිසින තෙල්, ලුණු, දර සහ එළවළු සඳහා දවසකට ලැබෙන්නේ සත පහක් පමණකි; මෙය ද දිගට ම දීගෙන යාම අමාරු ය. මේ දේ සඳහා යන මාසික වියදම පමණක් රිදී ඩොලර් දස දහසකට වැඩි වේ; මේ මුදල ලබාගන්නේ තනිකර ම ප්‍රාදේශීය කෲර පාලකයන්ගේ ධනය බලයෙන් ගැනීම මගින් ය.[12] දැන් අපට මිනිසුන් පන් දහසකින් සමන්විත මුළු හමුදාව ම සඳහා සීත ඍතුවට අදින ඇඳුම් වල යටට අල්ලන පුළුන් තට්ටු තිබෙන නමුත් තවම රෙදිපිළි හිඟ ය, කාලගුණය සීත නමුත් අපේ මිනිසුන් බොහෝ දෙනා තවම ඇඳගෙන ඉන්නේ තුනී වස්ත්‍ර දෙ පොටක් පමණකි. වාසනාවකට මෙන්, අපට දුක් කරදර විඳ හොඳට පුරුදු ය.

එපමණක් නො ව, අපි සියලු දෙනා ම එක ම විධියේ දුක් කරදර හවුලේ විඳිමු; හමුදාවේ අණදෙන්නාගේ සිට කෝකියා තෙක් හැම දෙනා ම ජීවත් වන්නේ, ධාන්‍ය කොටස හැරුණු කල, දවසකට ශත පහ ගණනේ දෙන ආහාර ආධාර මුදලෙන් ය. අතේ වියදමට දෙන මුදල සම්බන්ධයෙන්, හැම එක්කෙනාට ම ලැබෙන්නේ, එය ශත විස්ස වුව ත්, ශත හතළිහ වුව ත්, එක ම ගණනකි.[13] විපාකය වශයෙන් කිසිවකුට විරුද්ධ ව කීමට මැසිවිල්ලක් සෙබළුන්ට නැත.

හැම සටනකට ම පසු තුවාලකරුවෝ ගණනක් සිටිති. එසේ ම කුපෝෂණයෙන්, සීතලට අසුවීමෙන් හෝ වෙනත් හේතු නිසා බොහෝ නිලධාරි ත් මිනිස්සු ත් ලෙඩ වී සිටිති. කඳු වල තිබෙන අපේ රෝහල් චීන ප්‍රතිකාර සහ බටහිර ප්‍රතිකාර යන දෙක ම කරයි; එහෙත් වෙදුන් සහ බෙහෙත් හිඟ ය. දැනට ම මේ රෝහල් වල ලෙඩ්ඩු අටසියයකට වඩා සිටිති. අපට බෙහෙත් ද්‍රව්‍ය ලබා දෙන්ට හූනාන් පළාත් කොමිටිය පොරොන්දු වූ නමුත්, මේ වන තුරු අපට මොකවත් ම ලැබී නැත. මධ්‍යම කාරකසභාව ත් පළාත් කොමිටි දෙක ත් බටහිර පුහුණුව ලත් වෙදුන් කීප දෙනකුන් ද, අයිඩින් තොගයක් ද අපට එවනවා ඇතැ'යි අපි තවමත් බලාපොරොත්තු වෙමින් සිටිමු.

පක්ෂය විසින් රඟපාන කොටස හැරුණු කල, එබඳු දිළිඳු ද්‍රව්‍යමය තත්වයන් ද එබඳු නිතර නිතර කරන සටන් ද තිබියදී පවා දිගට ම වැඩය ගෙනයන්ට රතු හමුදාවට හැකි වී තිබෙන හේතුව එය ප්‍රජාතන්ත්‍රවාදය භාවිතාවේ යෙදීම ය. නිලධාරින් මිනිසුන්ට ගහන්නේ නැත; නිලධාරින්ට ත් මිනිසුන්ට ත් සමාන සංග්‍රහ ලැබේ; රැස්වීම් පවත්වා තමන්ට කියන්ට තිබෙන දේ කීමට සෙබළුන්ට නිදහස තිබේ; වැඩකට නැති සිරිත් විරිත් නැති කර දමා ඇත; ගණන්හිලව් කාටත් පරීක්ෂා කර බැලීමට විවෘත ය. කන බොන දේ පිළියෙළ කිරීමේ වැඩ කරන්නේ සෙබළුන් ම ය; කෑම පිසින තෙල්, ලුණු, දර සහ එළවළු සඳහා දවසකට ලැබෙන ශත පහෙන්, දිනකට එක් අයකුට දළ වශයෙන් තඹ හයක් හෝ හතක් වැටෙන සුළු ගණනක් අතේ වියදම පිණිස ඉතිරි කරගන්ට ඔවුන්ට හැකි ය; ඊට "කෑම කොටහෙන් කරන ඉතුරුව්"යි කියනු ලැබේ. මේ සියල්ල සෙබළුන්ට මහත් තෘප්තියක් ගෙන දෙයි. අපේ හමුදාව ත් කුඕමින්තාං හමුදාව ත් අහසට පොළොව මෙන් වෙනස් බව අළුත අල්ලා ගත් සෙබළුන්ට වෙසෙසින් ම හැඟේ. රතු හමුදා-වෙහි ද්‍රව්‍යමය තත්වයන් සුදු හමුදාවේ ද්‍රව්‍යමය තත්වයන්ට සමාන නො වන නමුත්, තමන් ආධ්‍යාත්මික වශයෙන් නිදහස් වූ ලෙසක් ඔවුන්ට හැඟේ. ඊයේ සුදු හමුදාවේදී කිසි ම ධෛර්යයක් නො තිබුණු සෙබළු ම අද රතු හමුදාවේදී ඉතා නිර්භීත වෙති; ප්‍රජාතන්ත්‍රවාදයේ විපාකය එබඳු ය. රතු හමුදාව සියලු ම අල්ලා ගත් සෙබළුන් ඔවුන් මේ පැත්තට පැමිණි මොහොතේ ම අමුතු මිනිසුන් බවට හරවන උදුනක් වැනි ය. චීනයෙහි ජනතාවට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තරම් ම හමුදවට ද ප්‍රජාතන්ත්‍රවාදය උවමනා ය. අපේ හමුදවේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය කුලියට සේවය කරන රදළ හමුදව දුබල කොට බිඳ හෙළීම පිණිස වැදගත් අවියකි.[14]

පක්ෂ සංවිධානයට දැන් කොම්පඤ්ඤ ශාඛාව, බැටැලියන් කොමිටිය, රෙජමේන්තු කොමිටිය සහ හමුද කොමිටිය ය'යි මට්ටම් හතරක් තිබේ. කොම්පඤ්ඤයක, එක් එක් ස්ක්වොඩයෙහි කණ්ඩායමක් බැගින් ඇති, ශාඛාව තිබේ. ''පක්ෂ ශාඛාව කොම්පඤ්ඤ පදනමක් මත සංවිධානය කර ඇත''; මෙය බිඳී කඩ කඩ වී යන්නේ නැති ව ඒ තරම් දුෂ්කර සටන් කරගෙන යන්ට රතු හමුදවට හැකි වී තිබෙන වැදගත් හේතුවකි. අවුරුදු දෙකකට උඩදී, අප කුඕමින්තාං හමුදවෙහි සිටි කාලයේ, අපේ පක්ෂයට සෙබළුන් අතර සංවිධානාත්මක මුල් තිබුණේ නැත; යේ තිංගේ හටයන්[15] අතර පවා එක් රෙජමේන්තුවකට තිබුණේ එක් පක්ෂ ශාඛාවක් පමණකි; කිසි බරපතල පරීක්ෂාවකට ඔරොත්තු දී සිටීමට අපට බැරි වුණේ ඒ නිසා ය. අද රතු හමුදවෙහි පක්ෂයට අයත් නැති මිනිසුන්ගේ ගණනට සමාන කර බලන කල පක්ෂයට අයත් මිනිසුන්ගේ ගණන තුනට එකක් පමණ වේ; නැතහොත් මිනිසුන් හතර දෙනකුන්ට එක් පක්ෂ සාමාජිකයකු බැගින් සිටින සාමාන්‍ය ගණනකි. නොබෝ ද, පණහට–පණහේ අනුපාතයක්[16] ඇති කරන සේ, සටන් කරන සෙබළුන් අතරට තව තව ත් පක්ෂ සාමාජිකයන් බන්ද ගැනීමට අපි තීරණය කළෙමු. දැනට කොම්පඤ්ඤ ශාඛා වලට හොඳ පක්ෂ ලේකම්වරු හිඟ ය; දැනට සිටින තැන් වල තව-දුරට ත් ක්‍රියා කරන්ට බැරි අය අතුරෙන් ක්‍රියාකාරකයන් ගණනක් අපට එවන ලෙස අපි මධ්‍යම කාරකසභාවෙන් ඉල්ලමු. දකුණු හුනානයෙන් පැමිණි කාඩර්වරුන් සියලු දෙනා ම පාහේ හමුදවෙහි පක්ෂයේ වැඩ කරමින් සිටිති. එහෙත් අගෝස්තුවේදී දකුණු හුනානයෙහි පසුබසිමින් සිටි අතර ඔවුන් අතුරෙන් සමහරුන් සීසීකඩ ව ගිය නිසා, අපට දැන් වැඩිපුර මිනිස්සු නැත.

ප්‍රාදේශික සන්නද්ධ බලසේනාවෝ රතු මුරභටයන් ගෙන් ද, කම්කරුවන්ගේ ත් ගොවියන්ගේ ත් කැරලිකාර බලඇණි වලින් ද සමන්විත ය. හෙළි සහ පතරොම්–තුවක්කු වලින් සන්නද්ධ වූ මේ බලඇණි, එක් නියම්ගමකට ජනගහණයේ වෙනස අනුව වෙනස් වන ශක්තියක් ඇති එක් බලඇණියක් බැගින් සිටින සේ, නියම්ගම් පදනමක් උඩ සංවිධානය කරනු ලැබේ. ඊට අයත් වැඩ නම් ප්‍රති–විප්ලවය මර්දනය කිරීම, නියම්ගම් ආණ්ඩුව ආරක්ෂා කිරීම සහ සතුරා පැමිණි කල සටනේදී රතු හමුදවට සහ රතු මුරභටයන්ට ආධාර කිරීම ය. කැරලිකාර බලඇණි ආරම්භ වූයේ යුංශින්හිදී රහස් සේනාවක් වශයෙනි; එහෙත් අප මුළු උප–පළාත ම අල්ලා ගත් පසු ඒවා එළියට ඇවිත් සිටී. මේ සංවිධානය දැන් දේශසීමා ප්‍රදේශයෙහි සෙසු උප-පළාත් වලට ද ව්‍යාප්ත කර තිබේ; නම නො වෙනස් ව පවතී. රතු

මුරභටයන්ගේ අවි ප්‍රධාන වශයෙන් රවුම්–පහේ රයිපල් ය; එහෙත් රවුම්-නවයේ සහ තනි–රවුමේ රයිපල් වගයක් ද ඒවාට ඇතුළත් ය. මුළු එකතුව රයිපල් 683ක් කරමින්, නිංකාංහි 140ක් ද, යුංශින්හි 220ක් ද, ලියන්හුආහි 43ක් ද, චාලිංහි 50ක් ද, ලිංශියන්හි 90ක් ද, සුයිචුආන්හි 130ක් ද, වානාන්හි 10ක් ද රයිපල් තිබේ. රයිපල් වලින් වැඩි ගණනක් සපයා ඇත්තේ රතු හමුදව විසින් ය; එහෙත් සුළු ගණනක් රතු මුරභටයන් විසින් ම සතුරා ගෙන් අල්ලාගනු ලැබී ය. සාම සංරක්ෂණ බළකාය වලට ත් ඉඩම්-හිමියන්ගේ හේවායන්ට ත් විරුද්ධ ව නිතර ම සටනේ යෙදෙමින්, උප-පළාත් වල රතු මුරභටයන් අතර වැඩිදෙනා තමන්ගේ සටන් හැකියාව ස්ථිර ලෙස වැඩි කරගනිමින් සිටිති. මැයි 21වැනි ද සිද්ධිය[17] ට කලින්, සියලු ම උප–පළාත් වල සිටියෝ ගොවි ආත්ම–ආරක්ෂක බළකායයෝ ය. යූශියන්හි 300ක් ද, චාලිංහි 300ක් ද, ලිංශියන්හි 60ක් ද, සුයිචුආන්හි 50ක් ද, යුංශින්හි 80ක් ද, ලියන්හුආහි 60ක් ද, නිංකාංහි (යුආන් වෙන්–ත්සායිගේ මිනිස්සු) 60ක් ද, චිංකාං කඳු වල (වොං ත්සෝගේ මිනිස්සු) 60ක් ද වශයෙන් මුළු ගණනින් රයිපල් 970ක් තිබුණි. ඒ සිද්ධියට පසු, කිසි හානියක් නො වී ඉතිරි වූ යුආන්ගේ ත් වොංගේ ත් මිනිසුන් අත තිබුණු රයිපල් හැරුණු කල, ඉතිරි වූයේ සුයිචුආන්හි රයිපල් 6ක් සහ ලියන්හුආහි රයිපල් 1ක් පමණකි; සෙසු සියල්ල ම ඉඩම්හිමියන් විසින් අල්ලාගනු ලැබී ය. අවස්ථාවාදි ක්‍රියා-මාර්ගයේ ප්‍රතිඵලයක් වශයෙන් තම රයිපල් රැකගෙන සිටීමට ගොවි ආත්ම-ආරක්ෂක බළකාය වලට නො හැකි විය. දැනට උප–පළාත් වල රතු මුරභටයන්ට තිබෙන රයිපල් ගණන තව ම ඉතා මදි ය; ඉඩම්හිමියන්ට තිබෙන ගණනට වඩා අඩු ය; රතු හමුදව දිගට ම ඔවුන්ට අවි සපයමින් ආධාර කළ යුතු ය. රතු හමුදව, ජනතාව සන්නද්ධ කිරීමට ආධාර කරනු පිණිස, තමාගේ සටන් හැකියාව අඩු කරගන්නේ නැති ව, හැම දෙයක් ම කළ යුතු ය. රතු හමුදවේ එක් බැටැලියමක්, එකක රයිපල් 75 බැගින් ඇති කොම්පඤ්ඤ හතරකින් සමන්විත විය යුතු ය'යි අපි නියම කරගෙන සිටිමු; විශේෂ, වැඩ කොම්පඤ්ඤය, මැසින්–තුවක්කු කොම්පඤ්ඤය, අගල්–කෙටිකාලතුවක්තු කොම්පඤ්ඤය, රෙජමේන්තු මූලස්ථානය සහ බැටැලියන් මූලස්ථාන තුන යන මේවායේ රයිපල් ද ගණන් ගන්නා විට, එක් රෙජමේන්තුවකට රයිපල් 1075ක් තිබෙනවා ඇත. සටනේදී අල්ලා ගන්නා රයිපල් ප්‍රාදේශික බලසේනාවන් සන්නද්ධ කරනු පිණිස හැකි තරම් දුරට යෙදිය යුතු ය. රතු මුරභටයන්ගේ අණදෙන්නෝ උප–පළාත් වලින් රතු හමුදවේ පුහුණු වීමේ බළකායට එවනු ලැබ තම පුහුණුව අවසන් කළ අය විය යුත්තාහ. රතු හමුදව ප්‍රාදේශික බලසේනාවන්ට අණ දීම පිණිස පිටස්තර ප්‍රදේශ වලින් මිනිසුන් යැවීම වඩ වඩා අඩු කළ යුතු ය. චූ පෙයි–තේ ඔහුගේ සාම සංරක්ෂණ බළකායයන් සහ හේවායන් සන්නද්ධ කරගෙන යන අතර, දේශසීමා උප–පළාත් වල ඉඩම්හිමියන්ගේ සන්නද්ධ බල-සේනාවෝ සැලකියයුතු තරම් විශාල ය, සටන් හැකියාවකින් යුක්ත ය. මේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිසා අපේ ප්‍රාදේශික රතු බලසේනාවන් විශාල කිරීම වඩා ත් ම අත්‍යවශ්‍ය වේ.

රතු හමුදුව සඳහා මූලික ප්‍රතිපත්තිය ඒකරාශී වීම ය, රතු මුරභටයන් සඳහා එය විසිරී සිටීම ය. ප්‍රතිගාමී පාලනක්‍රමය තාවකාලික වශයෙන් ස්ථාවර ව පවතින වර්තමාන අවස්ථාවෙහි, රතු හමුදවට පහර දීම පිණිස අතිවිශාල බලසේනාවන් රැස් කිරීමට සතුරාට හැකි ය, විසිරී සිටීම රතු හමුදුවේ වාසිය පිණිස නො වෙනවා ඇත. අපේ අත්දැකීම අනුව, බල-සේනාවන් විසිරී සිටීම නිසා හැම විට ම පාහේ පරාජයට පත් වෙන්ට සිදු වී තිබේ; ඒ අතර ගණනින් අඩු, සමාන හෝ ටිකක් වැඩි සතුරු සේනාවක් හා සටන් කරනු පිණිස බලසේනාවන් ඒකරාශී කිරීමෙන් බොහෝ විට ජය ලැබී තිබේ. දිගින් පළලින් දෙකෙන් ම ලි දහස් ගණනක් පැතුරුණු, පමණට වඩා විශාල ප්‍රදේශයක ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කරන ලෙස මධ්‍යම කාරකසභාව අපට උපදෙස් දී ඇත; මෙය බාගවිට අපේ ශක්තිය පමණට වඩා වැඩියෙන් තක්සේරු කිරීම නිසා විය හැකි ය. රතු මුරභටයන් හට විසිරී සිටීම වාසි සහිත ය; ඔව්හු දැන් සියලු ම උප-පළාත් වල තමන් කරන සටන්ව්‍යාපාර වලදී මේ ක්‍රමය යොදති.

සතුරු බලසේනාවන් වෙත එල්ල කළ ප්‍රචාරක වැඩ අතර ඉතා ම සාර්ථක ක්‍රමය නම් අල්ලා ගත් සෙබළුන් නිදහස් කිරීම සහ තුවාලකරුවන්ට වෛද්‍ය ප්‍රතිකාර දීම ය. සතුරු බලසේනා වල සෙබළුන්, ප්ලැටූන් නායකයන්, නැතහොත් කොම්පඤ්ඤ හෝ බැටැලියන් අණදෙන්නන් අල්ලා ගත් කල, අපි වහා ම ඔවුන් අතර ප්‍රචාරක වැඩ කරගෙන යමු; නතර වෙන්ට කැමති අය සහ යන්ට කැමති අය වශයෙන් ඔවුන් දෙ කොටසකට බෙදු, පසුව කී කොටසේ අයට ගමන් වියදම් දී යන්ට ඉඩ දෙනු ලැබේ. මෙය ‘කොමියුනිස්ට් පල්හොරු දකින දකින හැම එක්කෙනා ම මරා දමති’’ යන සතුරාගේ අපහාසයේ පල්ල සැණින් බිඳ දමයි. යාං චි-ශෙංගේ 9වැනි ඩිවිසනයේ සඟරාව වන **දස දින සමාලෝචනය** මේ පියවර ගැන ලියමින්, ‘‘කොතරම් දුෂ්ට ද!’’ යි මවිත විය. රතු හමුද සෙබළු සිරකරුවන් ගැන ලොකු සැල-කිල්ලක් දක්වති, ඔවුන් සඳහා උණුසුම් සුබපැතුම් උත්සව පිළියෙළ කරති; ‘‘අපේ අළුත් සහෝදරයන් සඳහා පවත්වන සුබ-පැතුම් උත්සව’’ හැම එකකදී ම, සිරකරුවෝ හදපත්ලෙන් නැඟෙන කෙළෙහිගුණය පවසන කතා පවත්වමින් අනුකූලතාව දක්වති. සතුරු තුවාලකරුවන්ට වෛද්‍ය ප්‍රතිකාර කිරීමෙන් ද ලොකු ප්‍රතිවිපාකයක් ඇති වේ. සතුරාගේ පැත්තේ සිටින ලි වෙන්-පින් වැනි දක්ෂ මිනිස්සු මෑතක සිට සිරකරුවන් මරා දැමීම නතර කිරීමෙන් ද තුවාලකරුවන්ට වෛද්‍ය ප්‍රතිකාර දීමෙන් ද අප අනුකරණය කර ඇත. එසේ ද වුව, අපේ මිනිස්සු ඊළඟ ම සටනේදී, තමන්ගේ ආයුධ ත් රැගෙන එමින්, නැවත අපට එකතු වෙති; දැනට දෙ වතාවක් ම මෙසේ සිදු වී ඇත. අම්තර ව, අපි ලිඛිත ප්‍රචාරක වැඩ ද, නිදසුන් වශයෙන් සටන්පාඨ

ඇඳීම, හැකි තරම් කරමු. අප යන හැම තැන ම, අපි සටන්පාඨ වලින් බිත්ති වසමු. එහෙත් අඳින්ට පුළුවන් මිනිස්සු අපට හිඟ ය; මධ්‍යම කාරක-සභාව ත් පළාත් කොමිටි දෙක ත් අපට කීප දෙනකුන් එවනවා ඇතැ’යි අපි බලාපොරොත්තු වෙමු.

යුද කඳවුරු සම්බන්ධයෙන්, පළමුවැනි කඳවුර වන චිංකාං කඳු පිහිටියේ නිංකාං, ලිංශියන්, සුයිචුආන් සහ යුංශින් යන උප-පළාත් හතර එකට සන්ධි වන තැන ය. නිංකාං උප-පළාතේ උතුරු බෑවුමේ පිහිටි මාඕපිං සහ සුයිචුආන් උප-පළාතේ දකුණු බෑවුමේ පිහිටි හුආංආඕ අතර දුර ලි 90කි. යුංශින් උප-පළාතේ නැගෙනහිරි බෑවුමේ පිහිටි නාශාන් සහ ලිංශියන් උප-පළාතේ බටහිරි බෑවුමේ පිහිටි ශුයිකෞ අතර දුර ලි 80කි. (යුංශින් උප-පළාතේ පිහිටි) නාශාන්හි සිට (ඒ උප-පළාතේ ම පිහිටි) ලුංයු-ආන්කෞ, (සියල්ල ම නිංකාං උප-පළාතේ පිහිටි) ශින්චෙං, මාඕපිං, තාලුං, (සියල්ල ම ලිංශියන් උප-පළාතේ පිහිටි) ශීතු, ශුයිකෞ, ශියාත්සුන්, (සියල්ල ම ශුයිචුආන් උප-පළාතේ පිහිටි) යිංපාන්ශු, තායිචියාපු, තාපෙන්, තුයිත්සේචියන්, හුආංආඕ, චූතෞචියාං සහ වෙ-ආඕ තෙක් ද, ආපසු නාශාන් තෙක් ද විහිදෙන විෂ්කම්භය ලි 550ක් වේ. කඳු වල ලොකු ලිඳ, කුඩා ලිඳ, ඉහළ ලිඳ, මැද ලිඳ, පහළ ලිඳ, සපිං, ශියාචුආං, ශිංචව්, ත්සාඕපිං, පායිනිහු සහ ලෝපූ යන ස්ථානයන්හි කුඹුරු සහ ගම් තිබේ. මේ ස්ථාන සියල්ල ම කලින් පල්හොරුන් ගෙන් සහ යුදහමුදුවෙන් පළාගියවුන් ගෙන් ගහණ වී පැවති, නමුත් දැන් අපේ කඳවුරු ප්‍රදේශය බවට හරවා ඇත. එහි ජනගහණය දෙදහසකට අඩු ය, වී අස්වැන්න පිකල් දස දහසකට අඩු ය; එහෙයින් හමුදවට උවමනා කරන ධාන්‍ය සියල්ල ම නිංකාං, යුංශින් සහ සුයිචුආන් යන උප-පළාත් වලින් සැපයිය යුතු ව තිබේ. කඳු වල පිහිටි යුද කටයුතු අතින් වැදගත් සියලු දුර්ගමාර්ග රක්ෂිත කර තිබේ. අපේ රෝහල්, කොට්ට-මෙට්ට ඇතිරිලි හා ඇඳුම් මහන වැඩපොළවල්, යුද්ධායුධ කාර්යාංශය සහ රෙජමේන්තු පසුමුණු කාර්යාල යන මේ සියල්ල ම තිබෙන්නේ මෙහි ය. දැනට කඳු වලට ධාන්‍ය ගෙන එන්නේ නිංකාං වලින් ය. සපයන දේ සෑහෙන තරම් අපට තිබේ නම්, මෙහි කඩාවදින්ට සතුරාට කවද වත් බැරි ය. දෙවැනි කඳවුර වන චියුලුං කඳු පිහිටියේ නිංකාං, යුංශින්, ලියන්හුආ සහ චාලිං යන උප-පළාත් සතර එකට සන්ධි වන තැන ය. එය, චිංකාං කඳු වලට වඩා වැදගත්කමින් අඩු නමුත්, උප-පළාත් හතරේ ප්‍රාදේශික සන්නද්ධ සේනාවන් සඳහා ඇත ම පසුමුණු කඳවුර වශයෙන් සේවය කරයි; එය ද රක්ෂිත කර තිබේ. සුදු පාලනක්‍රමය විසින් වටලනු ලැබූ ස්වාධීන රතු පාලනක්‍රමයක් කඳු වලින් සැලසෙන යුද කටයුතු අතින් ඇති වාසි ප්‍රයෝ-ජනයට ගැනීම අත්‍යවශ්‍ය ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉඩම් ප්‍රශ්න

දේශසීමා ප්‍රදේශ වල ඉඩම් තත්වය. දළ වශයෙන් කියන කල, ඉඩම් වලින් සියයට 60කට වඩා ඉඩම්හිමියන්ට ද සියයට 40කට අඩුවෙන් ගොවියන්ට ද අයිති ව තිබුණේ ය. චියාංසි කොටසෙහි, ඉඩම් අයිතිය ඉතා ම වැඩියෙන් ඒකරාශි වී තිබුණේ සුයිචුආන් උප–පළාතෙහි ය; එහි ඉඩම් වලින් සියයට 80ක් පමණ ඉඩම්හිමියන් සතු ව තිබුණි. ඊළඟට ආවේ සියයට 70ක් පමණ අයිති ව තිබුණු යුංශින් උප–පළාත ය. චානාන්, නිංකාං සහ ලියන්හුආ යන උප–පළාත් වල අයිතිකාර–ගොවියන් වැඩි ගණනක් සිටි නමුත් ඉඩම් වලින් ලොකු කොටස, එනම්, මුළු ප්‍රමාණයෙන් සියයට 60ක් පමණ, අයිති ව තිබුණේ ඉඩම්හිමියන්ට ම ය; ඒ අතර ගොවියන්ට අයිති ව තිබුණේ සියයට 40ක් පමණකි. හුනාන් කොටසෙහි, චාලිං සහ ලිංශියන් යන උප–පළාත් දෙකේ ම ඉඩම් වලින් සියයට 70ක් පමණ ඉඩම්හිමියන් සතු විය.

අතරමැද පංක්තිය පිළිබඳ ප්‍රශ්නය. ඉඩම් තත්වය මෙසේ වන කල, සියලු ම ඉඩම් අල්ලාගෙන, නැවත බෙදා දීම පිණිස වැඩිදෙනාගේ අනුබලය දිනාගන්ට පුළුවනි.[18] ගම්බද ජනගහණය ලොකු සහ මැද ඉඩම්හිමියන්ගේ පංක්තිය, කුඩා ඉඩම්හිමියන්ගේ සහ පොහොසත් ගොවියන්ගේ අතරමැද පංක්තිය, මැද සහ දිළිඳු ගොවියන්ගේ පංක්තිය ය'යි දළ වශයෙන් පංක්ති තුනකට බෙදී ඇත. පොහොසත් ගොවියන්ගේ පලප්‍රයෝජන බොහෝ විට කුඩා ඉඩම්හිමියන්ගේ පලප්‍රයෝජන හා එකට පටලැවී ඇත. පොහොසත් ගොවියන් සතු ඉඩම් ප්‍රමාණය හුදෙක් මුළු ප්‍රමාණයෙන් සියයට සුළු ගණනකි; එහෙත් කුඩා ඉඩම්හිමියන්ගේ ඉඩම් ද ගණන් ගතිතොත්, ප්‍රමාණය සැලකිය යුතු තරම් වේ. බාගවිට රටේ හැම තැන ම තත්වය අඩු වැඩි වශයෙන් මේ වගේ ම ය. දේශසීමා ප්‍රදේශ වල යොදා තිබෙන ඉඩම් ප්‍රතිපත්තිය ඉඩම් සම්පූර්ණයෙන් අල්ලාගෙන, නිරවශේෂ ලෙස බෙදා දීම ය; ඒ හේතුවෙන්, රතු ප්‍රදේශයෙහි ලොකු සහ මැද ඉඩම්හිමි පංක්තිය ත් අතරමැද පංක්තිය ත් යන දෙකට ම පහර දෙනු ලැබේ. ප්‍රතිපත්තිය එසේ ය; එහෙත් එය ඇත්ත වශයෙන් ක්‍රියාවේ යොදන කල අපට අතරමැද පංක්තියෙන් අවහිරකම් ගොඩකට මුහුණ පාන්ට සිදු වී ඇත. විප්ලවයේ මුල් දින වල අතරමැද පංක්තිය පෙනීමට දිළිඳු ගොවි පංක්තියට යටත් විය; එහෙත් ඇත්ත වශයෙන් ඔවුහු ඉඩම් බෙදා දීම පමා කිරීමේ කාරිය පිණිස දිළිඳු ගොවියන් බිය වැද්දීමට තමන්ගේ පාරම්පරික සමාජ තත්වයෙන් සහ වරිගයේ බලයෙන් අයුතු ප්‍රයෝජන ගත්හ. තවදුරට ත් පමා කරන්ට කොහෙත් ම බැරි වූ තැන, ඔව්හු තමන්ට ඇත්ත වශයෙන් ම අයිති ඉඩම් ප්‍රමාණය වසං කළහ, නැතහොත් හොඳ ඉඩම් තබාගෙන නරක ඉඩම් දුන්හ. මේ වකවනුවේදී දිළිඳු ගොවියෝ, බොහෝ කලක් තිස්සේ පෑගෙමින් සිටි නිසා ත් විප්ලවයේ ජයග්‍රහණය අඩමාන ය'යි සිතුණු නිසා ත්, නිතර ම අතරමැද පංක්තියට

ඉඩ දී අයින් ගැසූහ, ප්‍රබල ලෙස ක්‍රියා කරන්ට එඩිතර නුවූහ. ගම් වල අතරමැද පංක්තියට විරුද්ධ ව ප්‍රබල ලෙස ක්‍රියා කරන්නේ විප්ලවය නැඟගෙන යන විට පමණකි; නිදසුන් වශයෙන්, උප–පළාත් එකක හෝ කීපයක දේශපාලන බලය අල්ලා ගත් කල, ප්‍රතිගාමී හමුදාව කීප වටයක් පරාජයට පත් වූ කල සහ රතු හමුදාවේ වික්‍රමය නැවත නැවත ත් පළ වූ කල පමණකි. ඉඩම් බෙදා දීම පමා කිරීම ත් අයිති ඉඩම් වසං කිරීම ත් ඉතා ම බරපතල ලෙස කළ අවස්ථා ඇති වූයේ අතරමැද පංක්තිය ඉතා ම විශාල වූ යුංශින් උප–පළාතේ දකුණු කොටසෙහි ය. මේ ප්‍රදේශයෙහි ඉඩම් බෙදා දීම ඇත්තට ම කළේ ජූනි 23වැනි ද ලුංයුආන්කෞහිදී රතු හමුදාව සිය ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය දිනාගත් පසු සහ දිස්ත්‍රික්ක ආණ්ඩුව ඉඩම් බෙදා දීම පමා කිරීම ගැන කීප දෙනකුන්ට දඬුවම් කළ පසු පමණකි. එහෙත් රදළ පවුල් ක්‍රමය හැම උප–පළාතක ම තවම පවතින නිසා ත්, එක් ගමක හෝ ගම් සමූහයක පවුල් සියල්ල ම එක් වරිගයකට අයත් නිසා ත්, මිනිසුන්ට තම පංක්තිය ගැන හැඟීමක් ඇති වීමට ද ගම් වල වරිග හැඟීම පිටුදැකීමට ද සෑහෙන දිගු කලක් ගත වෙනවා ඇත.

ධවල භීතිය යටතේ අතරමැද පංක්තිය පිටුපෑම. විප්ලවය නැඟී ගිය කාලයේ ප්‍රහාරයට ලක් වී සිටි හෙයින්, ධවල භීතිය පහර දෙන්ට වූ ඇසිල්ලේ ම අතරමැද පංක්තිය පිටුපා සතුරාගේ පැත්තට ගියේ ය. යුංශින්හි සහ නිංකාංහි විප්ලවවාදී ගොවියන්ගේ ගෙවල් ගිනි තබන්ට ප්‍රතිගාමී භටයන් කැඳවාගෙන ගියේ කුඩා ඉඩම්හිමියන් සහ පොහොසත් ගොවියෝ ම ය. ප්‍රතිගාමීන්ගේ නියෝග පිට, ඔව්හු, කිසි ම බියක් සැකයක් නැති ව ම, ගෙවල් දවා අළු කළහ, මිනිසුන් සිරබාරයට ගත්හ. රතු හමුදාව නිංකාං, ශින්චෙං, කූචෙං සහ ලුංශි ප්‍රදේශයට ආපසු පැමිණි කල, දහස් ගණනක් ගොවියෝ, කොමියුනිස්ට්වාදීන් ඔවුන් මරනවා ඇත යන ප්‍රතිගාමී ප්‍රචාරයට රැවටී, ප්‍රතිගාමීන් සමග යුංශින් වලට පළා ගියහ. "පිටුපා ගිය ගොවියන් මරන්නේ නැතැ" යි ද "පිටුපා ගිය ගොවියන් ඔවුන්ගේ අස්වනු කපා ගැනීමට ආපසු එතොත් ආදරයෙන් පිළිගන්නවා" ය'යි ද අප ප්‍රචාරය කරගෙන ගියාට පසුව පමණකි ඔවුන් අතුරෙන් සමහරුන් සෙමිහිට ආපසු ආවේ.

මුළු එකක් වශයෙන් රටේ විප්ලවය බැසගෙන යන විට, අපේ ප්‍රදේශ වල තිබෙන ඉතා ම දුෂ්කර ගැටළුව අතරමැද පංක්තිය තරයේ ග්‍රහණය කරගෙන සිටීම ය. මේ පංක්තිය ද්‍රෝහි වීමට ප්‍රධාන හේතුව ඊට විප්ලවයෙන් පමණට වඩා බර පහරක් වැදී තිබීම ය. එහෙත් මුළු එකක් වශයෙන් රටේ විප්ලවය නැඟගෙන යන විට, දිළිඳු ගොවි පංක්තිය විශ්වාසය තබන්නට යමක් තමාට ඇති හෙයින් වඩා එඩිතර වෙයි; ඒ අතර අතරමැද පංක්තිය බිය වීමට යමක් තමාට ඇති හෙයින් හිතුමතයට නටන්ට එඩිතර නො වෙයි. ලි ත්සුං–රන් සහ තාං ශෙං–චි අතර යුද්ධය හුනාන් පළාතට පැතුරුණු කල,

https://liberationbase.wordpress.com

(ඒ වන විට රතු හමුදව චාලිං වලින් සුයිචුආන් වලට ඉවත් වී ගොස් සිටී නමුදු) චාලිං වල කුඩා ඉඩම්හිමියෝ ගොවියන්ගේ හිත් සතුටු කරන්ට උත්සාහ කළහ, සමහරු අළුත් අවුරුදු තෑග්ගක් වශයෙන් ඔවුන්ට ඌරුමස් පවා එවූහ. එහෙත් යුද්ධය අවසන් වූ පසු, එවැනි දේ ගැන කිසිවකුට කිසි කලෙක නැවත අසන්ට ලැබුණේ නැත. දැන් රට පුරා ම ප්‍රති-විප්ලවයේ නැඟීමක් ඇති වී තිබෙන නිසා, සුදු ප්‍රදේශ වල අතරමැද පංක්තිය, බර පහරවල් කා සිටින හෙයින්, සම්පූර්ණයෙන් ම මෙන් මහ ඉඩම්හිමි පංක්තියට හේත්තු වී සිටී, දිළිඳු ගොවි පංක්තිය තනි වී සිටී. මෙය ඇත්තෙන් ම බරපතළ ප්‍රශ්නයකි.[19]

අතරමැද පක්ංතිය පිටුපෑමේ හේතුවක් වශයෙන් දිනපතා ජීවිතයේ පීඩාව. රතු සහ සුදු ප්‍රදේශ දැන් යුද වැදී සිටින රටවල් දෙකක් මෙන් එකිනෙකට මුහුණ ලා පවතී. සතුරා කිටි කිටියේ වට කොට අවහිර කරගෙන සිටින නිසා ත්, අප සුළු ධනේශ්වරපංක්තිය ගැන වැරදි ලෙස ක්‍රියා කර තිබෙන නිසා ත්, ප්‍රදේශ දෙක අතර වෙළඳාම සම්පූර්ණයෙන් ම මෙන් නතර වී ඇත; ලුණු, රෙදි සහ බෙහෙත් වැනි අවශ්‍ය දේ හිඟ ය, මිල වැඩි ය; දැව, තේ සහ තෙල් වැනි කෘෂිකර්මයෙන් නිපදවන දේ පිට යවන්ට බැරි ය; එහෙයින් එය ගොවියන් කාසි වලින් ලබන ආදායම කපා දමා ඇත, මුළු එකක් වශයෙන් ජනතාව කෙරෙහි බල පා ඇත. එබඳු දුක් කරදර විඳ දරා ගන්ට දිළිඳු ගොවියෝ වඩා සමත් ය, එහෙත් ඒවා තවදුරට ත් විඳ දරා ගන්ට බැරි වෙන විට අතරමැද පංක්තිය මහ ඉඩම්හිමියන්ගේ පැත්තට යයි. චීනයේ ඉඩම්හිමි පංක්තිය තුළ ත් යුදදෙටුවන් අතර ත් භේද සහ යුද්ධ දිගට ම පවතිතොත් මිස, එසේ ම රට පුරා ම විප්ලවවාදි තත්වයක් වර්ධනය වෙතොත් මිස, කුඩා ස්වාධීන රතු පාලනක්‍රම මහත් ආර්ථික පීඩනයට භාජන වෙනවා ඇත, ඒවාට වැඩි කලක් අල්ලා සිටීමට හැකි වේ ද යනු සැක සහිත ය. එබඳු ආර්ථික අමාරුකම් ඉවසන්ට බැරි වන්නේ අතරමැද පංක්තියට පමණක් ම නො ව, කිසියම් දවසක කම්කරුවන්ට, ගොවියන්ට සහ රතු හමුදවේ මිනිසුන්ට පවා එය දරන්ට බැරි තරම් බව ඔප්පු වෙන නිසා ය. යුංශින් සහ නිංකාං උප-පළාත් වල, එක් අවධියක කෑම උයන්ට ලුණු නැති විය; වෙන දේ ගැන සඳහන් නො කොට ම, රෙදි සහ බෙහෙත් සැපයීම මුළුමනින් ම කපා දමනු ලැබී ය. දැන් නැවත ලුණු ලබා ගත හැකි ය, එහෙත් මිල ඉතා වැඩි ය. රෙදි සහ බෙහෙත් තවම ලබා ගන්ට නැත: (දැනට සියල්ල ම අපේ ප්‍රදේශ තුළ පිහිටි) නිංකාං, බටහිර යුංශිං සහ උතුරු සුයිචුආන් යන පෙදෙස් වල බහුල වශයෙන් නිපදවන දැව, තේ සහ තෙල් පිට යවා ගන්ට බැරි ය.[20]

ඉඩම් බෙදා දීම නිශ්චය කරන මිම්ම. ඉඩම් බෙදා දීම පිණිස ඒකකය වශයෙන් ගන්නේ නියම්ගම ය. ගොවිතැන් කරන ඉඩම් අඩු කඳුකර පෙදෙස් වල, නිදසුන් වශයෙන්, යුංශිං වල ශියාඕචියාං දිස්ත්‍රික්කයෙහි, ඇතැම් විට ඒකකය වශයෙන් නියම්ගම් තුනක් හතරක් එකට ගනු ලැබේ; එහෙත්

එවැනි අවස්ථා බෙහෙවින් ම විරල විය. සියලු ම පදිංචිකරුවන්ට, පිරිමින්ට සහ ගැහැණුන්ට ත් මහල්ලන්ට සහ තරුණ අයට ත්, සමාන කොටස් ලැබුණේ ය. නිශ්චය කිරීමේ මිම්ම වශයෙන් ශ්‍රම-ශක්තිය ගන්නා මධ්‍යම කාරකසභාවේ සැලැස්ම අනුව දැන් වෙනසක් කර තිබෙන හෙයින්, ශ්‍රම-ශක්තිය තිබෙන තැනැත්තකුට ශ්‍රම-ශක්තිය නැති තැනැත්තකුට දෙන ඉඩම් ප්‍රමාණය මෙන් දෙ ගුණයක් දෙනු ලැබේ.[21]

අයිතිකාර-ගොවියන්ට දෙන සහන පිළිබඳ ප්‍රශ්නය. මේ ප්‍රශ්නය ගැන තවම විස්තර වශයෙන් සාකච්ඡා කර නැත. නිශ්චය කිරීමේ මිම්ම වශයෙන් නිෂ්පාදනය කිරීමට තිබෙන හැකියාව ගත යුතු ය'යි, ඒ කියන්නේ 'මිනිස්බලය සහ (ගොවි මෙවලම් වැනි) ප්‍රාග්ධනය වැඩියෙන් තිබෙන අයට වැඩියෙන් ඉඩම් දිය යුතු ය'යි, අයිතිකාර-ගොවියන් අතර පොහොසත් ගොවියන් ඉල්ලා තිබේ. සමෝසමේ බෙදීම වත් ශ්‍රම-ශක්තිය අනුව බෙදීම වත් තමන්ගේ වාසිය පිණිස නො වේ ය යන හැඟීම ඔවුන් තුළ ඇත. වැඩිවැඩියෙන් මහන්සි වීමට තුමූ කැමති ය'යි ද, ඒ මහන්සිය ත් තමන්ගේ ප්‍රාග්ධනය ත් එකතු කළ විට වඩා විශාල අස්වනු ලබා දෙන්ට තමන්ට හැකි වේ ය'යි ද ඔවුන් අඟවා තිබේ. හැම දෙනාට ම දෙන තරම් ම ඉඩම් ප්‍රමාණයක් ඔවුන්ට ද දුන්නොත් සහ ඔවුන් යොදන වැඩිපුර මහන්සිය සහ අතිරේක ප්‍රාග්ධනය ගණන් නො ගෙන (ප්‍රයෝජනයට නො ගෙන) සිටියොත්, ඔවුන් අකැමැති වෙනවා ඇත. මෙහි ඉඩම් බෙදා දීම තවම ත් කරගෙන යන්නේ මධ්‍යම කාරකසභාව විසින් පණවා තිබෙන ක්‍රමයට ම ය. එහෙත් මේ ප්‍රශ්නය තව දුරට ත් සාකච්ඡා කිරීම සුදුසු ය; නිගමනයන්ට එළඹී කල වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ.

ඉඩම් බද්ද. නිංකාං වල බද්දේ ප්‍රමාණය අස්වැන්නෙන් සියයට 20කි; හෙවත් මධ්‍යම කාරකසභාව විසින් නියම කර තිබෙන ප්‍රමාණයට සියයට 5ක් වැඩි ය; බදු එකතු කිරීම දැනට ම පටන්ගෙන කරගෙන යන හෙයින් වෙනසක් කිරීම නුවණට හුරු නො වේ; එහෙත් බදු ප්‍රමාණය ලබන අවුරුද්දේ වෙනස් කරනු ලැබේ. ඊළඟට අපේ පාලනක්‍රමය යටතේ තිබෙන සුයිචුආන්, ලිංශියන් සහ යුංශින් යන උප-පළාත් වල සියල්ල ම කඳුකර ප්‍රදේශ වූ කොටස් වගයක් තිබේ; එහි ගොවියන් ඉතා දුඃඛිත හෙයින් කිසි ම බද්දක් අය කිරීම නුවණට හුරු නැත. ආණ්ඩුවේ ත් රතු මුරභටයන්ගේ ත් වියදම් පිරිමසා ගැනීම පිණිස සුදු ප්‍රදේශ වල ප්‍රාදේශික කෲර පාලකයන්ගේ ධනය බලෙන් ගැනීම මත විශ්වාසය තබා සිටින්ට අපට සිදු වී ඇත. රතු හමුදවට අවශ්‍ය දේ සැපයීම සම්බන්ධයෙන්, දැනට නිංකාං වල ඉඩම් බද්දෙන් සහල් සපයා ගනු ලැබේ, ඒ අතර ප්‍රාදේශික කෲර පාලකයන්ගේ ධනය බලෙන් ගැනීමෙන් පමණක් ම කාසි සොයා ගනු ලැබේ. ඔක්තෝබරයෙහි සුයිචුආන්හි අප ගෙනගිය ගොරිල්ලා සටන් ව්‍යාපාර වලදී, අපි යුආන් දස දහසකට වඩා එකතු කර ගතිමු; එය අපට කලකට සෑහේ; එය වියදම් වූ පසු කළ හැකි කුමක් ද 'යි අපි බලමු.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

දේශපාලන බලය පිළිබඳ ප්‍රශ්නය

මහජන දේශපාලන බලය උප-පළාත්, දිස්ත්‍රික්ක සහ නියම්ගම් මට්ටමෙන් හැම තැන ම පිහිටුවා තිබේ; එහෙත් ඇත්තට ම වඩා නමට පමණකි. බොහෝ තැන් වල කම්කරුවන්ගේ, ගොවියන්ගේ සහ සෙබළුන්ගේ මණ්ඩල නැත. නියම්ගම් ආණ්ඩු වල, දිස්ත්‍රික්ක ආණ්ඩු වල හෝ උප-පළාත් ආණ්ඩු වල පවා විධායක කොමිටි එක්වැනි ව ම කිසියම් වර්ගයක බහුජන රැස්වීමකදී තෝරා පත් කරන ලදී. එහෙත් ප්‍රශ්න සාකච්ඡා කරන්ට වත් බහුජනයා දේශපාලන වශයෙන් පුහුණු කිරීමට ආධාර දෙන්ට වත් ක්ෂණික උද්‍යෝගයෙන් පෙළඹී කැඳවන බහුජන රැස්වීම් වලට බැරි ය; එමතු නො ව, ඒවා උගතුන් විසින් හෝ බඩවඩාගන්නන් විසින් හෝ ඔවුන්ට ඕනෑ හැටියට හසුරුවනු ලැබීමට හොඳට ම ඉඩ තිබේ. ඇතැම් තැන් වල මණ්ඩලයක් තිබෙන බව ඇත්ත ය; එහෙත් එය සලකන්නේ විධායක කොමිටිය තෝරා පත් කිරීම පිණිස තිබෙන හුදු තාවකාලික මුළුවක් ලෙස පමණකි; තෝරා පත් කිරීම අවසන් වූ වහා ම, බලය කොමිටිය විසින් ඒකාධිකාරයක් කරගනු ලැබේ, මණ්ඩලය ගැන ඉන් පසු කවදා වත් නැවත අසන්ට නො ලැබේ. නමට ඔබින කම්කරුවන්ගේ, ගොවියන්ගේ සහ සෙබළුන්ගේ මණ්ඩල නැතිවා ම නො වේ, එහෙත් ඒවා ඇත්තේ ඉතා සුළු ගණනකි. හේතුව නම් මේ අළුත් දේශපාලන ක්‍රමය ගැන ප්‍රචාරක වැඩ සහ අධ්‍යාපනය නොමැති වීම ය. හිතුවක්කාර ලෙස අණ කිරීමේ නරක රදළ පුරුද්ද ජනතාවගේ, එසේ ම සාමාන්‍ය පක්ෂ සාමාජිකයන්ගේ පවා, සිත් වල කොතරම් ගැඹුරු ලෙස මුල් බැස තිබේ ද යත්, එය එක පාරට ම පිසදැමිය නො හැකි ය; මොකක් හරි පැනනැංග විට, ඔවුහු පහසු මග තෝරා ගනිති, කරදරකාරි ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමයට කැමති නො වෙති. ප්‍රජාතන්ත්‍රවාදි මධ්‍යගතවාදය බහුජන සංවිධාන තුළ පුළුල් ලෙස ත් සාර්ථක ලෙස ත් භාවිතාවේ යෙදිය හැකි වන්නේ එහි ආනුභාවය විප්ලවවාදි අරගලයේදී පළ වූ විට සහ එය තමන්ගේ බලවේග ක්‍රියාකාරිභාවයට පත් කිරීමට තිබෙන ඉතා ම හොඳ විධිය බව ත් තමන්ගේ අරගලයේදී එය ලොකු ම උදව්වක් වන බව ත් බහුජනයා තේරුම් ගත් විට පමණකි. කලින් කර තිබෙන වැරදි අනුක්‍රමයෙන් නිවැරදි කරනු පිණිස අපි සියලු ම මට්ටම් වල මණ්ඩල සඳහා (මධ්‍යම කාරකසභාව විසින් කෙටුම්පත් කර තිබෙන කටු-සටහන පදනම කරගෙන) විස්තර සහිත අංගසම්පූර්ණ නීතියක් කෙටුම්පත් කරගෙන යමු. රතු හමුදාවෙහි, සෙබළුන්ගේ සාකච්ඡාසභා නැති ව කොමිටි පමණක් තිබීමේ වරද නිවැරදි කරනු පිණිය, සෙබළුන්ගේ නියෝජිතයන්ගේ සාකච්ඡාසභා දැන් නිත්‍ය පදනමක් පිට සහ සියලු ම මට්ටම් වලින් පිහිටුවා-ගෙන යමින් තිබේ.

දැනට, ''කම්කරුවන්ගේ, ගොවියන්ගේ සහ සෙබළුන්ගේ ආණ්ඩුව'' යන්නෙන් බහුජන සමූහයා සාමාන්‍යයෙන් තේරුම් ගන්නේ විධායක

කොමිටිය යි; මණ්ඩලයේ බලතල ගැන ඔවුන් තවම නො දන්නා නිසා සහ නියම බලය නම් විධායක කොමිටිය පමණකි' යි ඔවුන් සිතන නිසා ය. පිටි-පසින් මණ්ඩලයක් නැති විධායක කොමිටියක් බොහෝ විට බහුජනයාගේ අදහස් උදහස් ගැන කිසි ම තැකීමක් නො කොට ක්‍රියා කරයි; ඉඩම් බලෙන් අල්ලාගෙන නැවත බෙදා දීම ගැන පැකිළීම සහ සමගිසම්මුති ඇති කර-ගැනීම ත්, අරමුදල් නාස්ති කිරීම හෝ වංචා කිරීම ත්, සුදු බලසේනාවන් ඉදිරියේ බියෙන් හැකිළීම හෝ ඕනෑවට එපාවට මෙන් සටන් කිරීම ත් පිළිබඳ නිදසුන් හැම තැන ම තිබේ. එපමණක් නො ව, කොමිටිය පූර්ණ සැසියකින් රැස්වන්නේ ඉඳහිට ය, සියලු කටයුතු එහි ස්ථාවර කොමිටිය විසින් තීරණය කොට කරනු ලැබේ. දිස්ත්‍රික්ක සහ නියම්ගම් ආණ්ඩු වල ස්ථාවර කොමිටිය පවා රැස්වන්නේ කලාතුරකිනි; කටයුතු තීරණය කරන්නේ ත් කරනු ලබන්නේ ත් කාර්යාලයේ වැඩ කරන පුද්ගලයන් සිව් දෙනා, එනම්, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ රතු මුරභටයන්ගේ (හෝ කැරලිකාර බලඇණි වල) අණදෙන්නා විසින් වෙන වෙන ම ය. මෙසේ ප්‍රජාතන්ත්‍රවාදි මධ්‍යගතවාදය ආණ්ඩුවේ වැඩ වල පවා නිතිපතා පව-තින භාවිතාවක් බවට පත් වී නැත.

මුල් දින වල කුඩා ඉඩම්හිමියෝ ත් පොහොසත් ගොවියෝ ත්, වෙසෙසින් නියම්ගම් මට්ටමේ, ආණ්ඩු කොමිටි වලට රිංගා ගැනීමට පොර-කැවෝ ය. රතු රිබන්පටි බැඳගෙන, බොරු උද්‍යෝගයක් පළ කරමින්, ඔව්හු කපටිකමින් ආණ්ඩු කොමිටි තුළට හොරෙන් ම රිංගාගෙන, දිළිඳු ගොවි සාමාජිකයන් සුළු කොටසක් රඟපාන තත්වයකට දමමින්, හැම දෙයක ම පාලන බලය අල්ලා ගත්හ. ඔවුන් පන්නා දමන්ට පුළුවන් වන්නේ අරගලය යන අතර ඔවුන්ගේ වෙස්මුහුණු කැඩී ගිය විට සහ දිළිඳු ගොවියන් තම බලය තහවුරු කර ගත් විට පමණකි. බහුල ව පැතිරී නැති නමුත්, කටයුතු එලෙස පවතින තත්වයක් ස්ථාන සෑහෙන ගණනක තිබේ.

පක්ෂයට බහුජන සමූහයන් අතර මහත් ගරුත්වයක් සහ බලයක් තිබේ, ආණ්ඩුවට ඊට වඩා හුඟක් අඩු ය. හේතුව නම් පහසුව තකා පක්ෂය බොහෝ දේ ගැන කෙළින් ම ක්‍රියා කරමින්, ආණ්ඩුවේ මණ්ඩල පැත්තකට තල්ලු කර දැමීම ය. එබඳු අවස්ථා බොහෝ ගණනක් තිබේ. සමහර තැන් වල ආණ්ඩුවේ සංවිධාන තුළ නායක පක්ෂ සාමාජිකයන්ගේ කණ්ඩායම් නැති අතර, වෙනත් තැන් වල ඒවා තිබෙන නමුත් හරිහැටි ක්‍රියා නො කරයි. මෙතැන් සිට පක්ෂය ආණ්ඩුවට නායකත්වය දීමේ සිය වැඩය ඉටු කළ යුතු ය; ප්‍රචාරක වැඩ හැර, පක්ෂයේ ප්‍රතිපත්ති සහ පක්ෂය අනුමත කරන පියවර ක්‍රියාවේ යෙදිය යුත්තේ ආණ්ඩුවේ සංවිධාන තුළින් ය. කෙළින් ම ආණ්ඩුව මත අණ පැටවීමේ කුඕමින්තාං පක්ෂයේ වැරදි පුරුද්දෙන් වැළකී සිටිය යුතු ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පක්ෂ සංවිධානය පිළිබඳ ප්‍රශ්න

අවස්ථාවාදයට විරුද්ධ අරගලය. මැයි 21වැනි ද සිද්ධිය අවට කාලයේදී දේශසීමා ප්‍රදේශයේ උප-පළාත් වල පක්ෂ සංවිධාන අවස්ථාවාදීන් විසින් ග්‍රහණය කරගෙන සිටි බව කියන්ට ඉඩ තිබේ. ප්‍රති-විප්ලවය ආරම්භ වූ විට, ස්ථිර අරගලය තිබුණේ ඉතා ස්වල්ප වශයෙනි. ගිය අවුරුද්දේ ඔක්තෝබරයෙහි, රතු හමුදාව (කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ විප්ලවවාදී හමුදාවේ 1වැනි හමුදාවේ 1වැනි ඩිවිසනයේ 1වැනි රෙජමේන්තුව) දේශසීමා ප්‍රදේශයේ උප-පළාත් වලට පැමිණි කල, ඉතිරි වී සිටියේ සැනගොස් සැඟවී සිටි පක්ෂ සාමාජිකයෝ ටික දෙනෙක් පමණකි: සතුරා විසින් පක්ෂ සංවිධාන මුළුමනින් ම විනාශ කර තිබුණි. ගිය නොවැම්බරයේ සිට අප්‍රියෙල් තෙක් වකවානුව පක්ෂය නැවත ගොඩනැඟීමේ වකවානුවක් විය, මැයි මාසයේ සිට වකවානුව මහත් පළල් වීමක් ඇති වූ වකවානුවක් වී තිබේ. එහෙත් පසුගිය දෙළොස් මස තුළ අවස්ථාවාදය දිගට ම බහුල ලෙස ප්‍රකට වී ඇත. සතුරා ළඟා වන විට, ඇතැම් සාමාජිකයෝ, සටන් කරන්ට තරම් චිත්ත-ශක්තියක් නැති ව, ඈත කඳු වල සැඟවුණෝ ය; ඔවුන් ඊට කීවේ "හොරෙන් ම පහර දෙන්ට සැඟවී රැක සිටීම" කියා ය. වෙනත් සාමාජිකයෝ, ඉතා උනන්දුවෙන් නමුත්, අන්ධ ලෙස කැරලි ගසන්ට වූහ. මේ දෙක ම සුළු-ධනේශ්වර මතවාදය ප්‍රකාශ වූ අයුරු ය. දිගු කලක් තිස්සේ අරගලය තුළින් පන්නරය ලැබූ පසු සහ පක්ෂය-තුළ අධ්‍යාපනය ලැබූ පසු, එබඳු දේ නිතර නිතර සිදු වීම අඩු වී තිබේ. ගිය අවුරුද්දේ, මේ සුළු-ධනේශ්වර මතවාදය ම රතු හමුදාව තුළ ද පැවතුණේ ය. සතුරා ළඟා වන විට, එක්කෝ ඉවක්බවක් නැති ව සටන් කිරීමට හෝ කලබලයෙන් පළා යන්ට හෝ යෝජනා කරනු ලැබී ය. ගත යුත්තේ මොන විධියේ යුද්ධ පියවරක් ද යන්න ගැන ඇති වූ සාකච්ඡා වලදී බොහෝ විට එක ම පුද්ගලයා ගෙන් මේ අදහස් දෙක ම නික්මිණි. දිගින් දිගට කළ පක්ෂය-තුළ අරගලය තුළින් ද, සැබෑ සිදුවීම් වලින්, නිදසුන් වශයෙන්, ඉවක්බවක් නැති ව කළ සටන් වලදී සිදු වූ අලාභ හානි වලින් සහ කලබලයෙන් පළා යන විට සිදු වූ ඇබැද්දි වලින්, උගෙන ගත් පාඩම් තුළින් ද, මේ අවස්ථාවාදී මතවාදය අනුක්‍රමයෙන් නිවැරදි කර තිබේ.

ප්‍රාදේශිකවාදය. දේශසීමා ප්‍රදේශයෙහි අර්ථක්‍රමය කෘෂිකාර්මික ය; ඇතැම් තැන් තවම ත් පවතින්නේ අත්-වංගෙඩි යුගයෙහි ය (කඳුකර ප්‍රදේශ වල වී කෙටීම පිණිස තවම ත් සාමාන්‍ය වශයෙන් ලී වංගෙඩිය පාවිච්චි කරනු ලැබේ, තැනි වල ගල් වංගෙඩි සුලභ ව තිබේ). හැම තැන ම සමාජ සංවිධානයේ ඒකකය එක ම පෙළපත් නම ඇති මිනිසුන් ගෙන් සැදුණු වරිගය යි. ගම් වල පක්ෂ සංවිධාන වල, බොහෝ විට සිදු වන දෙයක් නම් ශාඛා රැස්වීමක් වරිගයේ රැස්වීමක් වැනි දෙයක් බවට පත් වීම ය; ශාඛා එක ම පෙළපත් නම දරන සහ අහළ පහළ එකට වාසය

LIBERATIONBASE

කරන සාමාජිකයන් ගෙන් යුක්ත වීම නිසා ය. මේ වටාපිටා තත්වයන් තුළ "සටන්කාමී බෝල්ශෙවික් පක්ෂයක්" ගොඩනැඟීම ඇත්තෙන් ම ඉතා අමාරු ය. කොමියුනිස්ට්වාදීන් එක් ජාතියක් සහ තවත් ජාතියක් අතර හෝ එක් පළාතක් සහ තවත් පළාතක් අතර හෝ තද වෙන් කිරීමේ ඉරක් නාඳින බව, නැතහොත් විවිධ උප-පළාත්, දිස්ත්‍රික්ක සහ නියම්ගම් අතර තද ඉරක් නො ඇඳිය යුතු බව, එබඳු සාමාජිකයන්ට කී කල එය ඔවුන්ට නො වැටහේ. උප-පළාත් අතර, එසේ ම එක ම උප-පළාතේ දිස්ත්‍රික්ක සහ නියම්ගම් අතර පවා, සබඳකම් තුළ ප්‍රාදේශිකවාදය බරපතල ප්‍රමාණයකට පවතී. ප්‍රාදේශිකවාදය නැති කිරීමේදී, හේතුයුක්ති පහදා දීමෙන් කළ හැකි වන්නේ උඩත්පිරිසෙයින් සීමා සහිත වූ ප්‍රතිඵල ලැබීම පමණකි; කිසිසේත් ප්‍රාදේශික වූ දෙයක් නො වන සුදු පීඩනයෙන් ඊට වඩා හුඟක් දේ සිදු වේ. නිදසුන් වශයෙන්, මිනිසුන්ගේ ප්‍රාදේශිකවාදය අනුක්‍රමයෙන් බිඳවැටෙන්නේ පළාත් දෙකක් එකතු වී ගෙනයන ප්‍රති-විප්ලවවාදී "ඒකාබද්ධ පීඩන" ව්‍යාපාරයන් නිසා, අරගලයේදී පොදු ඉරණමකට කොටස්කරුවන් වෙන්ට ඔවුන්ට සිදු වන විට පමණකි එබඳු බොහෝ පාඩම් වල ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශිකවාදය පිරිහීගෙන යයි.

ගම්කාරයන් සහ පිටගම්කාරයන් පිළිබඳ ප්‍රශ්නය. දේශසීමා උප-පළාත් වල තවත් අපූරු අංගලක්ෂණයක් තිබේ; එනම්, ගම්කාරයන් සහ පිට-ගම්කාරයන් අතර පවතින භේදය යි. ගම්කාරයන් සහ තම මුතුන්මිත්තන් අවුරුදු සිය ගණනකට පෙර උතුරෙන් අවුත් පදිංචිවූවන් වන පිටගම්කාරයන් අතර බොහෝ කලක් තිස්සේ ඉතා පළල් භේදයක් පැවතී ඇත; ඔවුන්ගේ පාරම්පරික වෛරය මුල් බැසගත් තත්වයක පවතී; එය ඇතැම් විට දරුණු සට්ටණ වශයෙන් පුපුරා හැළෙයි. දස ලක්ෂ කීපයක් වන පිටගම්කාරයෝ පූචියන්-ක්වංතුං දේශසීමාවේ සිට හුනාන්-චියාංසි දේශසීමාව ඔස්සේ දිගට ම දකුණු හූපේ දක්වා විහිදුණු කලාපයක වාසය කරති. කඳුකර ප්‍රාන්ත වල වෙසෙන මේ පිටගම්කාරයන්ට තැනි වල වෙසෙන ගම්කාරයන් විසින් තාඩන පීඩන කර ඇත, ඔවුන්ට කිසි කලෙක කිසි ම දේශපාලන අයිතිවාසිකමක් තිබී නැත. ඔව්හු, තම හිස එසවීමට දිනය තමන්ට පැමිණ ඇතැ'යි සිතමින්, ඉකුත් අවුරුදු දෙකේ ජාතික විප්ලවය සතුටින් පිළිගත්හ. එහෙත් අවාසනාවකට මෙන් විප්ලවය ව්‍යර්ථ විය, ඔව්හු දිගට ම ගම්කාරයන්ගේ තාඩන පීඩන වලට භාජන වෙමින් සිටිති. අපගේ ම ප්‍රදේශය තුළ ද ගම්කාරයන් සහ පිටගම්කාරයන් පිළිබඳ ගැටළුව නිංකාං, සුයිචුආන්, ලිංශියන් සහ චාලිං යන මේ පෙදෙස් වල පවතී; නිංකාං වල එය ඉතා ම බරපතල ය. කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ නිංකාං වල ගම්කාරයන් අතර සිටින විප්ලවවාදියෝ, පිටගම්කාරයන් ද සමග එකතු වී, 1926-27 කාලයේදී ගම්කාර ඉඩම්හිමියන්ගේ දේශපාලන බලය පෙරළාදමා, මුළු උප-පළාතේ ම පාලන බලය අල්ලා ගත්හ. ගිය

https://liberationbase.wordpress.com

අවුරුද්දේ ජූනියේදී වූ පෙයි-තේ යටතේ වූ චියාංසි ආණ්ඩුව විප්ලවයට විරුද්ධ ව හැරුණේ ය; සැප්තැම්බරයේදී නිංකාං වලට විරුද්ධ ව ඇරඹූ ''මැඩලීමේ'' ව්‍යාපාරයේදී, ඉඩම්හිමියෝ වූගේ හටකණ්ඩායම් සඳහා මගපෙන්වන්නන් වශයෙන් ක්‍රියා කළහ, යළිත් වරක් ගම්කාරයන් සහ පිටගම්කාරයන් අතර සට්ටණය ඇවිස්සූහ. න්‍යායයෙන් නම්, ගම්කාරයන් සහ පිටගම්කාරයන් අතර ඇති මේ භේදය සූරාකනුලබන කම්කරු සහ ගොවි පංක්ති තුළට නො පැතිරිය යුතු ය, කොමියුනිස්ට් පක්ෂය තුළට නම් ඒ තරම් වත් නො පැතිරිය යුතු ය. එහෙත් එය පැතිරෙයි. එය බොහෝ කලක් තිස්සේ පරම්පරාගත ව පැවත ඒමේ බලයෙන් අල්ලාගෙන සිටී. උදහරණයක් මෙන්න. දේශසීමා ප්‍රදේශයෙහි අගෝස්තු පරාජයට පසු, ගම්කාර ඉඩම්හිමියන් ප්‍රතිගාමී හටකණ්ඩායම් තමන් කැටුව ගෙන එමින් ද, පිටගම්කාරයෝ ගම්කාරයන් පොලුගසන්ට යති'යි යන කටකතාව පතුරුවමින් ද නිංකාං වලට ආපසු පැමිණි කල, ගම්කාර ගොවියෝ වැඩි දෙනා පිටු පා ගියහ, සුදු රිබන්පටි බැඳගෙන, ගෙවල් ගිනි තබන්ට ත් කඳු සෝදිසි කරන්ට ත් සුදු හටකණ්ඩායම් වලට මග පෙන්වූහ. වැලිත් ඔක්තෝබරයේදී සහ නොවැම්බරයේදී රතු හමුදාව සුදු හටකණ්ඩායම් පළවා හැරිය කල, ගම්කාර ගොවියෝ ප්‍රතිගාමීන් සමග පැන ගියහ, ඔවුන්ගේ දේපොළ පිටගම්කාරගොවියන් විසින් අල්ලාගනු ලැබී ය. පක්ෂය තුළ පිළිබිඹු වන මේ තත්වය බොහෝ විට තේරුමක් නැති සට්ටණ වලට මග පාදයි. අපේ විසඳුම, එක් අතකින්, ''පිටු පා ගිය ගොවියන් මරන්නේ නැතැ''යි ද ''පිටු පා ගිය ගොවියන්ට ද ඔවුන් ආපසු පැමිණි කල ඉඩම් දෙනවා'' ය'යි ද ප්‍රකාශ කිරීම ය; ඒ ඉඩම්හිමියන්ගේ බලපෑමෙන් මිදී, කිසි බියක් සැකයක් නැති ව ආපසු ගම්රටවල් බලා එන්ට ඔවුන්ට උදව් කරනු පිණිස ය; අනික් අතින්, අපේ උප-පළාත් ආණ්ඩු ලවා පිටගම්කාර ගොවියන් විසින් අල්ලාගෙන තිබෙන දේපොළක් වේ නම් ඒවා ආපසු දෙන ලෙස ඔවුන්ට නියෝග කරවීම සහ ගම්කාර ගොවියන් ආරක්ෂා කරන බවට නිවේදන පත්‍ර ඇලවීම ය. පක්ෂය තුළ, සාමාජික පිරිසේ මේ කොටස් දෙක අතර සමගිය ඇතිකගැනීම පිණිස අධ්‍යාපන වැඩ අධික කළ යුතු ය.

බඩවඩාගන්නන් පිටුපෑම. (ජූනි මාසයෙහි) විප්ලවවාදි තත්වය නැගෙන ගිය විට, බොහෝ බඩවඩාගන්නෝ පක්ෂය එළිපිට ම සාමාජිකයන් බන්දගැනීමට පටන් ගැනීමෙන් අයුතු ප්‍රයෝජනයක් ගනිමින් හොරෙන් ම පක්ෂය තුළට රිංගා ගත්හ; එහි ප්‍රතිඵලය වශයෙන් දේශසීමා ප්‍රදේශයෙහි සාමාජිකපිරිස දස දහසකට වැඩි ගණනකට නැංගේ ය. ශාඛා වල ත් දිස්ත්‍රික්ක කොමිටි වල ත් නායකයන් වැඩි වශයෙන් අළුත් සාමාජිකයන් වූ නිසා, හොඳ පක්ෂය-තුළ අධ්‍යාපනයක් දීම කරන්ට බැරි වැඩක් විය. ධවල භීතිය පහර දෙන්ට වූ ඇසිල්ලේ ම, බඩවඩාගන්නෝ පිටු පා ගොස්, අපේ සහෝදරවරුන් වට කර අල්ලා ගැනීම පිණිස ප්‍රති-විප්ලවවාදින් හට

මගපෙන්වන්නන් වශයෙන් සේවය කළහ; සුදු ප්‍රදේශ වල පක්ෂ සංවිධාන වැඩි ගණනක් ඇදවැටුණි. සැප්තැම්බර මාසයට පසු, පක්ෂය තම ගේ ඇතුළේ ම තිබුණු කුණුකසළ අතුපතුගා පවිත්‍ර කිරීමක් තදබල ලෙස කොට, සාමාජිකත්වය සඳහා දැඩි පංක්ති සුදුසුකම් නියම කළේ ය. යුංශින් සහ නිංකාං උප-පළාත් වල සියලු ම පක්ෂ සංවිධාන විසුරුවා හැර නැවත ලියාපදිංචිකිරීමක් අරඹනු ලැබී ය. ගණනින් බෙහෙවින් අඩු වූ නමුදු, සාමාජිකපිරිස සටන් හැකියාව අතින් වැඩී ඇත. කලින් සියලු පක්ෂ සංවිධාන තිබුණේ එළිපිට ය; එහෙත් සැප්තැම්බරයේ සිට, ප්‍රතිගාමීන් පැමිණි කල සිය වැඩකටයුතු කරගෙන යාමට පක්ෂය සූදනම් කර තබනු පිණිස රහස් සංවිධාන ගොඩනහා තිබේ. ඒ අතර ම, සුදු ප්‍රදේශ වලට රිංගාගෙන, සතුරු කඳවුරු තුළ ම වැඩ කරගෙන යන්ට අප විසින් හැම පරිශ්‍රමයක් ම දරා ඇත. එහෙත් අසල් නගර වල පක්ෂ සංවිධානය සඳහා තවම අඩිතාලම් දමා නැත. ඊට හේතු, පළමුකොට, නගර වල සතුරාගේ ශක්තිය වැඩි වීම ය; දෙවැනිව, අපේ හමුදාව නගර අල්ලා ගත් විට ධනේශ්වරපංක්තියේ පලප්‍රයෝජන වලට පමණට වඩා හානි කරන හෙයින් එහි අඩිය ගසාගෙන සිටීම පක්ෂ සාමාජිකයන්ට දුෂ්කර වීම ය. අපි දැන් මේ වැරදි නිවැරදි කරගෙන යමින්, නගර වල පක්ෂ සංවිධාන ගොඩනැඟීමට අපට හැකි වැඩි ම දේ කරමින් සිටිමු; එහෙත් මේ දක්වා එතරම් ප්‍රතිඵල ලැබී නැත.

පක්ෂයේ නායක මණ්ඩල. ශාඛා විධායක මණ්ඩලය ශාඛා කොමිටිය ය'යි අළුතෙන් නම් කර ඇත. ශාඛාවට ඉහළින් දිස්ත්‍රික්ක කොමිටිය ද, ඊට ඉහළින් උප-පළාත් කොමිටිය ද වේ. විශේෂ වටාපිටා තත්වයන් ඇති තැන් වල, දිස්ත්‍රික්ක සහ උප-පළාත් මට්ටම් අතර විශේෂ දිස්ත්‍රික්ක කොමිටියක් සකස් කරනු ලැබේ; යුංශින් උප-පළාතේ පෙයිශියාං විශේෂ දිස්ත්‍රික්ක කොමිටිය සහ ගිනිකොන්දිග විශේෂ දිස්ත්‍රික්ක කොමිටිය නිදසුන් ය. දේශසීමා ප්‍රදේශයෙහි උප-පළාත් කොමිටි පහක් ම තිබේ; ඒ නිංකාං, යුංශින්, ලියන්හුආ, සුයිචුආන් සහ ලිංශියන් යන උප-පළාත් වල ය. චාලිං වල උප-පළාත් කොමිටියක් තිබුණු නමුත්, එහි කළ වැඩ මුල් බැසගත්තේ නැති නිසා, ගිය ශීත සෘතුවේදී ත් මේ වසන්තයේදී ත් පිහිටුවනු ලැබූ සංවිධාන බොහොමයක් සුද්දන් විසින් පොඩිපට්ටම් කරනු ලැබී ය; ඒ හේතුවෙන්, ඉකුත් හය මස තුළ අපට වැඩ කරන්ට හැකි වී තිබෙන්නේ නිංකාං සහ යුංශින් අසළ කඳුකර ප්‍රාන්ත වල පමණකි; එහෙයින් චාලිං උප-පළාත් කොමිටිය විශේෂ දිස්ත්‍රික්ක කොමිටියක් බවට වෙනස් කර ඇත. චාලිං ඔස්සේ පමණක් ළඟා විය හැකි යූසියන් සහ ආන්ජන් උප-පළාත් වලට සහෝදරවරුන් යවනලද නමුත්, ඔව්හු කිසිවක් මුදුන්පත් නො කොට ආපසු ඇවිත් සිටිති. වානාන් උප-පළාත් කොමිටිය ජනවාරියේදී සුයිචුආන් වලදී අප සමග එක් ව පැවැත්වූ ඒකාබද්ධ රැස්වීමට පසු හය මසකට වැඩි කලක් සුද්දන් විසින් අපෙන් කපා දමා තිබුණි; අපට නැවත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සබඳකම් ඇති කරගන්ට හැකි වූයේ සැප්තැම්බරයේදී, රතු හමුදව ගෝරිල්ලා සටන්ව්‍යාපාරයේදී වානාන් වලට ළඟා වූ කල පමණකි. වානාන් වලින් විප්ලවවාදී ගොවියන් අසූ දෙනෙක් අපේ මිනිසුන් සමග චිංකාං කඳු වලට ආපසු ආහ; ඔව්හු වානාන් රතු මුරභටයන් වශයෙන් සංවිධානය කරනලදහ. ආන්පූ වල පක්ෂ සංවිධානයක් නැත. යුංශින් වලට යාව පිහිටි චියාන් වල උප–පළාත් කොමිටිය අප හා සම්බන්ධයක් ඇති කරගත්තේ දෙ වතාවක් පමණකි, අපට කිසි ම ආධාරයක් දුන්නේ ද නැත; එය ඉතා අද්භූත ය. කුළුයිතුං උප–පළාතේ ශාකියන් ප්‍රදේශයෙහි ඉඩම් බෙදා දීම දෙ වතාවක් ම, එනම් මාර්තුවේදී සහ අගෝස්තුවේදී, කරගෙන යනු ලැබී ය; පක්ෂ සංවිධාන ගොඩනහා, ලුංශි වල ශිඅර්තුංහි ස්වකීය මධ්‍යස්ථානය ඇති දකුණු හුනාන් විශේෂ කොමිටිය යටතේ තබා ඇත. උප–පළාත් කොමිටි වලට ඉහළින් හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයේ විශේෂ කොමිටිය තිබේ. මැයි 20වැනි ද දේශසීමා ප්‍රදේශයේ පළමුවැනි පක්ෂ සම්මේලනය නිංකාං උප–පළාතේ මාඕපිං වලදී පවත්වනු ලැබී ය; එය, මාඕ සේතුං ලේකම් වශයෙන් ඇති ව, මිනිසුන් විසිතුන් දෙනකුන් පළමුවැනි විශේෂ කොමිටියේ සාමාජිකයන් වශයෙන් තෝරා පත් කළේ ය. ජූලි මාසයේදී හුනාන් පළාත් කොමිටිය යාං කායි–මිං එව් ය; ඔහු වැඩබලන ලේකම් විය. සැප්තැම්බරයේදී, යාං ලෙඩ විය, තාන් වෙන්–ලින් ඔහුගේ තැන ගත්තේ ය. අගෝස්තුවේදී, රතු හමුදවේ ප්‍රධාන බලඇණිය දකුණු හුනාන් පළාතට ගොස් සිටියදී සහ සුදු බලසේනාවන් දේශසීමා ප්‍රදේශයට වැරෙන් පීඩනය කරමින් සිටියදී, අපි යුංශින් වලදී හදිස්සි රැස්වීමක් පැවැත්වීමු. ඔක්තෝබරයේදී රතු හමුදව නිංකාං වලට ආපසු පැමිණි පසු, දේශසීමා ප්‍රදේශයේ දෙවැනි පක්ෂ සම්මේලනය මාඕපිං වල පැවැත්විණි. ඔක්තෝබර 14වැනි ද පටන්ගත් ස්වකීය තුන්–දින සැසියේදී, ඒ සම්මේලනය "දේශසීමා ප්‍රදේශයේ පක්ෂ සංවිධාන වලට තිබෙන දේශපාලන ගැටළු සහ වැඩ" යන යෝජනාව ඇතුළු ව යෝජනා ගණනක් සම්මත කළේ ය, දෙවැනි විශේෂ කොමිටියේ සාමාජිකයන් වශයෙන් මතු දක්වන පුද්ගලයන් දහනව දෙනා තෝරා පත් කළේ ය: තාන් වෙන්–ලින්, චූ තේ, චෙන් යි, ලුං චාඕ–චිං, චූ චාං–චියේ, ලියූ තියන්–චියන්, යූආන් පාන්–චූ, තාන් සූ–ත්සුං, තාන් පිං, ලි චූඒ–පෙයි, සුං යි–යුඒ, යූආන් වෙන්–ත්සායි, වොං ත්සෝ–නුං, චෙන් චෙං–රන්, මාඕ සේතුං, වාන් ශි–ශියන්, වොං ත්සෝ, යාං කායි–මිං සහ හෝ තිං–යිං. තාන් වෙන්–ලින් (කම්කරුවෙක්) ලේකම් වශයෙන් ද, චෙන් චෙං–රන් (උගතෙක්) නියෝජ්‍ය ලේකම් වශයෙන් ද ඇති ව පස් දෙනකුන් ගෙන් යුත් ස්ථාවර කොමිටියක් පිහිටුවනු ලැබී ය. රතු හමුදවේ සිව්වැනි හමුදවේ හයවැනි පක්ෂ සම්මේලනය නොවැම්බර 14වැනි ද පවත්වනු ලැබී ය; එය සාමාජිකයන් විසිතුන් දෙනකුන් ගෙන් යුත් හමුද කොමිටියක් තෝරා පත් කළේ ය; ඔවුන් ගෙන් පස් දෙනෙක් චූ තේ ලේකම් වශයෙන් ඇති ව ස්ථාවර කොමිටියක් බවට පත් වූහ. දේශසීමා ප්‍රදේශ විශේෂ කොමිටිය ත් හමුද කොමිටිය ත් යන දෙක ම පෙරමුණු කොමිටියට යටත් ය. පෙරමුණු කොමිටිය මධ්‍යම කාරකසභාව විසින් නම් කරනලද පහත සඳහන් සාමාජිකයන් පස් දෙනා ගෙන් යුතු ව නොවැම්බර් 6වැනි ද ප්‍රති–සංවිධානය කරනලදී: මාඕ සේතුං, චූ තේ, ප්‍රාදේශික පක්ෂ මූලස්ථානයේ ලේකම් (තාන් වෙන්–ලින්), කම්කරු සහෝදරයෙක් (සුං චියාඕ–ශෙං) සහ ගොවි සහෝදරයෙක් (මාඕ කෝ–වෙන්); මාඕ සේතුං ලේකම් වශයෙන් පත් විය. දැනට, මේ කොමිටිය විසින් ලේකම් මණ්ඩලයක් ද, ප්‍රචාරක අංශයක් ද, සංවිධාන අංශයක් ද, කම්කරු ව්‍යාපාර අධිකාරියක් ද, යුද්ධ කටයුතු අධිකාරියක් ද පිහිටුවා තිබේ. පෙරමුණු කොමිටිය ප්‍රාදේශික පක්ෂ සංවිධාන භාර ව සිටී. ඇතැම් විට හටකණ්ඩායම් සමග එහෙ මෙහෙ යන්ට පෙරමුණු කොමිටියට සිදු වන නිසා, විශේෂ කොමිටිය තබා ගැනීම අවශ්‍ය ය. අපේ මතය අනුව නිර්ධනපංක්ති මතවාදී නායකත්වය පිළිබඳ ප්‍රශ්නය ඉතා වැදගත් ය. නිර්ධනපංක්තියේ මතවාදී නායකත්වය නොමැත්තේ නම්, දේශසීමා ප්‍රදේශයේ උප–පළාත් වල තිබෙන තනිකර ම ගොවියන් ගෙන් ම මෙන් සැදුණු පක්ෂ සංවිධාන නොමග යන්ට පුළුවනි. උප–පළාත් නගර සහ සෙසු ලොකු නගර වල කම්කරු ව්‍යාපාරය කෙරෙහි කිට්ටුවෙන් ම අවධානය යොමු කිරීම හැරුණු කල, අපි ආණ්ඩුවේ මණ්ඩල තුළ කම්කරුවන් නියෝජනය වී සිටින ප්‍රමාණය වැඩි කළ යුත්තෙමු. පක්ෂයේ සියලු ම මට්ටම් වල නායක මණ්ඩල තුළ කම්කරුවන්ගේ ත් දිළිඳු ගොවියන්ගේ ත් සමානුපාතය ද වැඩි කළ යුතු ය.

විප්ලවයේ ලක්ෂණය පිළිබඳ ප්‍රශ්නය

අපි චීනය ගැන කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ යෝජනාවට සම්පූර්ණයෙන් ම එකඟ වෙමු. චීනය තවම සිටින්නේ ධනේශ්වර–ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ අවස්ථාවෙහි බවට කිසි ම සැකයක් නැත. චීනයෙහි අනූන ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක් පිණිස වන වැඩසටහනට, බාහිර වශයෙන්, පූර්ණ ජාතික විමුක්තිය අත්පත් කරගන්නා සේ අධිරාජ්‍යවාදය පෙරළාදැමීම ද, අභ්‍යන්තර වශයෙන්, නගර වල කොම්ප්‍රදෝරු පංක්තියේ බලය සහ බලපෑම ලොප් කර දැමීම, ගම් වල රදළ සබඳකම් නැති කර දැමීම පිණිස ඉඩම් ලබාගැනීමේ විප්ලවය සම්පූර්ණ කිරීම සහ යුදදෙටුවන්ගේ ආණ්ඩුව පෙරළාදැමීම ද ඇතුළත් ය. සමාජවාදයට පරිවර්තනය වීම පිණිස නියම අඩිතාලමක් දැමීමට අපට හැකි වීමට පෙර අපි එබඳු ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක් තුළින් යා යුත්තෙමු. ගත වූ අවුරුද්ද තුළ අපි බොහෝ තැන් වල සටන් කර සිටිමු, විප්ලවවාදී වඩදිය පාර මුළු එකක් වශයෙන් රටේ බැසගෙන යන බව තියුණු ලෙස තේරුම් ගෙන සිටිමු. කුඩා ප්‍රදේශ කීපයක රතු දේශපාලන බලය

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

පිහිටුවා තිබෙන අතර, මුළු එකක් වශයෙන් ගත් කල රටේ ජනතාවට සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් නැත, කම්කරුවන්ට, ගොවියන්ට **සහ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදීන්ට** පවා කතා කිරීමේ සහ රැස්වීමේ නිදහස **නැත, ඉතා ම** දරුණු අපරාධය කොමියුනිස්ට් පක්ෂයට බැඳීම වේ. රතු **හමුදාව කොතැන** ගියත් එතැන බහුජනයා උදාසීන ය, අයින් ගසා සිටිති; **ඔවුන් හෙමින්** හෙමින් ක්‍රියාවට බහින්නේ අපේ ප්‍රචාරක වැඩ වලට පසු ව **පමණකි.** අප කොයි විදියේ සතුරු සේනාංග වලට මූණ පෑවත්, ඒවායේ **මිනිසුන්** කැරලි ගසන හෝ අපේ පැත්තට පැන එන හෝ අවස්ථාවක් නැති **තරම්** ය, අප සටන් කොට ම දෙකින් එක විසඳා ගත යුතු ය. මැයි 21වැනි ද **සිද්ධියට පසු** "කැරලිකරුවන්" ඉතා ම ලොකු ගණන බන්ද ගත් සතුරාගේ 6වැනි හමුදාව සම්බන්ධයෙන් ද මෙය එසේ ම ය. තනිවීමක් පිළිබඳ තියුණු හැඟීමක් අපට ඇත, එය අවසන් වේ ය 'යි අපි පුලපුලා සිටිමු. විප්ලවය රට පුරා ම නැඟි නැඟී යන ඇළලෙන වඩදිය රැල්ලක් බවට හරවන්ට අපට හැකි වන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය පිණිස, නගරබද සුළු ධනේශ්වරපංක්තිය ද පටලවා ගන්නා වූ, දේශපාලන හා ආර්ථික අරගලයක් දියත් කිරීමෙන් පමණකි.

මේ අවුරුද්දේ පෙබරවාරිය දක්වා අපි සුළු ධනේශ්වරපංක්තිය කෙරෙහි වන අපේ ප්‍රතිපත්තිය හොඳින් ක්‍රියාවේ යෙදුවෙමු. මාර්තුවේදී දකුණු හුනාන් විශේෂ කොමිටියේ නියෝජිතයා නිංකාං වලට පැමිණ, දකුණට බරවීම ගැන, දිගට හරහට ගිනිතිබීම ත් මිනිසුන් මැරීම ත් නො කිරීම ගැන සහ "සුළු ධනේශ්වරපංක්තිය නිර්ධනීන් බවට හැරවීමේ ත් ඉක්බිති ඔවුන් විප්ලවය තුළට බලෙන් ම ඇදගැනීමේ" ත් ඊනියා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදන්ට අසමත් වීම ගැන අප විවේචනය කළේ ය; එතැනදී පෙරමුණු කොමිටියේ නායකත්වය ප්‍රති–සංවිධානය කරනු ලැබී ය, ප්‍රතිපත්ති වෙනස් කරනු ලැබී ය. අප්‍රියෙල් මාසයෙහි, අපේ මුළු හමුදාව ම දේශසීමා ප්‍රදේශයට පැමිණි පසු ද, එතරම් ගිනිතිබීමක් සහ මිනිසුන් මැරීමක් නම් නො වී ය; නමුත් සුළු නගර වල මැද වෙළඳුන්ගේ දේපොළ බලෙන් ගැනීම ත් ගම්බද පෙදෙසෙහි කුඩා ඉඩම්හිමියන් ගෙන් සහ පොහොසත් ගොවියන් ගෙන් බලෙන් ම මුදල් එකතු කිරීම ත් දැඩි ලෙස ක්‍රියාත්මක කරනු ලැබී ය. දකුණු හුනාන් විශේෂ කොමිටිය විසින් ඉදිරියට දමනලද "සියළු ම පැක්ටෙරි කම්කරුවන්ට" යන සටන්පාඨයට ද මහත් ප්‍රචාරයක් දෙනලදී. සුළු ධනේශ්වරපංක්තියට පහර දීමේ මේ අති–වාම ප්‍රතිපත්තිය ඔවුන් වැඩි දෙනා ඉඩම්හිමියන්ගේ පැත්තට පැන්නුවේ ය; එහි ප්‍රතිඵලය වශයෙන් ඔව්හු සුදු රිබන්පටි බැඳගෙන අපට විරුද්ධ ව ඉදිරිපත් වූහ. මේ ප්‍රතිපත්තිය අනු-ක්‍රමයෙන් වෙනස් කිරීම ත් සමග, තත්වය ස්ථිර ලෙස දියුණු වෙමින් පවතී. විශේෂයෙන් සුයිචුආන් වල හොඳ ප්‍රතිඵල ලබාගෙන තිබේ; එහි උප-පළාත් නගරයේ සහ වෙනත් වෙළඳ නගර වල වෙළෙන්දෝ තවදුරට ත් අපට මූණ නො දී මග අරින්නේ නැත; හුඟ දෙනෙක් රතු හමුදාව ගැන හොඳ කියති. (තුන් දිනකට වරක් මහ දවල් පවත්වන) ත්සාඕලින්ශු වල පොළට මිනිසුන් විසි දහසක් පමණ ඇදී එති; එය පෙර සියලු වාර්තා බිඳ හෙළන පැමිණීමකි. මෙය අපේ ප්‍රතිපත්තිය දැන් නිවැරදි බවට දෙස් දෙයි. ඉඩම්හිමියෝ ජනතාව මත ඉතා බර බදු සහ ගාස්තු පැටවූහ; සුයිචුආන් වල කලබල සංසිඳවීමේ මුරභටයෝ[22] හුආංආඕ වල සිට ත්සාඕලින් තෙක් ලි හැත්තෑවක් මග දිගට පස් පොළකදී රේන්ද ගාස්තු අය කළහ; කිසි ම ගොවිතැන් ද්‍රව්‍යයක් ගාස්තු අය කිරීමෙන් නිදහස් නො වී ය. අපි කලබල සංසිඳවීමේ මුරභටයන් තළා දැමීමු, මේ රේන්ද නැති කර දැමීමු, එසේ සියලු ම ගොවියන්ගේ ද, එමෙන් ම කුඩා සහ මැද වෙළඳුන්ගේ ද අනුබලය දිනා ගතිමු.

සුළු ධනේශ්වරපංක්තියේ පලප්‍රයෝජන ගණනට ගන්නා වූ දේශපාලන වැඩසටහනක් නිකුත් කරන්නට ය'යි මධ්‍යම කාරකසභාව අපට කියයි; මුළු ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සඳහා කම්කරුවන්ගේ පලප්‍රයෝජන ත්, ඉඩම් ලබාගැනීමේ විප්ලවය ත්, ජාතික විමුක්තිය ත් ගණනට ගන්නා වූ වැඩ-සටහනක්, පොදු මගපෙන්වීම පිණිස, මධ්‍යම කාරකසභාව විසින් සකස් කළ යුතු ය'යි අපි යෝජනා කරමු.

මුඛ්‍ය වශයෙන් කෘෂිකාර්මික අර්ථක්‍රමයක් තිබෙන රටක් වන චීනයෙහි විප්ලවයේ විශේෂ අංගලක්ෂණයක් නම් කැරලි ගැසීම වර්ධනය කරනු පිණිස යුද්ධ ක්‍රියා උපයෝගී කරගැනීම ය. මධ්‍යම කාරකසභාව යුද්ධ වැඩ වලට මහත් පරිශ්‍රමයක් යෙදීම යුතු ය'යි අපි අනුමත කරමු.

අපේ ස්වාධීන පාලනක්‍රමය පිහිටුවා තිබෙන තැන පිළිබඳ ප්‍රශ්නය

උතුරු ක්වංතුං පළාතේ සිට හුනාන්–චියාංසි දේශසීමාව ඔස්සේ දකුණු හූපේ පළාත තුළට විහිදෙන ප්‍රදේශය මුළුමනින් ම ලෝශියාඕ කඳු වැටිය ඇතුළත පිහිටියේ ය. අප විසින් මුළු කඳු වැටිය ම සැළකිල්ලෙන් සෝදිසි කර බලා ඇත; එහි විවිධ කොටස් සසඳා බලන කල පෙනී යන්නේ, මැද කොටස, නිංකාං ස්වකීය මධ්‍යස්ථානය වශයෙන් ඇති ව, අපේ සන්නද්ධ ස්වාධීන පාලනක්‍රමයට ඉතා ම යෝග්‍ය බව ය. උතුරු කොටසේ භූමිභාග අප විසින් පහර දෙන තත්වය ගැනීම පිණිස වත් ආරක්ෂා වී සිටින තත්වය ගැනීම පිණිස වත් ඒ තරම් සුදුසු නැත; එය සතුරාගේ ලොකු දේශපාලන මධ්‍යස්ථාන වලට හොඳට ම කිට්ටු ය. හැර ද, අප ඉක්මනින් ම චාංසා නගරය හෝ වූහාන් නගරය හෝ අල්ලා ගැනීමට සැලැස්ම කරතොත් මිස, ලියුයාං, ලිලිං, පිංශියාං සහ තුංකු ප්‍රදේශයෙහි ලොකු බලසේනා නතර කිරීම මහත්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

අවදනම් සහිත ය. දකුණු කොටසේ භූමිභාගය උතුරු කොටසේ භූමිභාගයට වඩා හොඳ ය; එහෙත් එහි අපේ බහුජන පදනම මැද කොටසෙහි තරම් හොඳ නැත; එසේ ම අපට හුනාන් සහ චියාංසි පළාත් වලට මැද කොටසේ සිට කරන්ට පුළුවන් තරම් ලොකු දේශපාලන බලපෑමක් ඒ කොටසේ සිට කරන්ට බැරි ය; මැද කොටසේ සිට ගන්නා කවර පියවරක් හෝ ඒ පළාත් දෙකේ පහළ ගංගා මිටියාවත් කෙරෙහි බල පෑ හැකි ය. මැද කොටසට පහත සඳහන් වාසි තිබේ: (1) අප විසින් අවුරුද්දකට වැඩි කලක් තිස්සේ දියුණු කරගෙන එන, බහුජන පදනමක්; (2) පක්ෂ සංවිධාන සඳහා තරමක් හොඳ අඩිතාලමක්; (3) අවුරුද්දකට වැඩි කලක් තිස්සේ ගොඩනගා-ගෙන එන, අරගලයෙහි ලා මනා පළපුරුද්දක් ඇති ප්‍රාදේශික සන්නද්ධ බලසේනාවෝ; මුදුන්පත් කර තිබෙන දුර්ලභ දෙයක් වන මෙය, සිව්වැනි රතු හමුදාව සමග එක් වූ කල, කවර සතුරු බලවේගයක් අබිමුවෙහි වුව විනාශ නො කළ හැක්කක් බව ඔප්පු වෙනවා ඇත; (4) කදිම යුද කඳවුරක් වන චිංකාං කඳු සහ, සියලු ම උප-පළාත් වල අපේ ප්‍රාදේශික සන්නද්ධ බලසේනාවන් සඳහා කඳවුරු; (5) පළාත් දෙක කෙරෙහි සහ ඒවායේ ගංගා වල පහළ මිටියාවත් කෙරෙහි මේ කොටස විසින් කළ හැකි බලපෑම; මේ බලපෑම දකුණු හුනාන් පළාතට හෝ දකුණු චියාංසි පළාතට හෝ තිබෙන දේශපාලන වැදගත්කමට වඩා ලොකු දේශපාලන වැදගත්කමක් මේ කොටසට ලබා දෙයි; ඒ පළාත් දෙකෙන් කවරක හෝ බලපෑම පැතිරී යා හැක්කේ ඒ පළාත් වලට ම පමණකි, නැතහොත් ඒ පළාත් වල ම ඉහළ ගංගා මිටියාවත සහ ප්‍රත්‍යන්ත ප්‍රදේශය කරා පමණකි. මැද කොටසට ඇති අවාසිය නම්, එය බොහෝ කලක සිට ස්වාධීන පාලනක්‍රමය යටතේ පැවතී තිබෙන හෙයින් ද, සතුරාගේ විශාල "වටලෑමේ සහ මැඩලීමේ" බල-සේනාවන්ට මුහුණ ලා තිබෙන හෙයින් ද, එහි ආර්ථික ගැටළු, වෙසෙසින් කාසි හිඟකම, අතිශයින් ම දුෂ්කර වීම ය.

මෙහි ක්‍රියා කරගෙන යාමට සැලැස්මක් සම්බන්ධයෙන්, හුනාන් පළාත් කොමිටිය ජූනි සහ ජූලි මාස වල සති කීපයක් ඇතුළත එකිනෙකට වෙනස් සැලැස්ම තුනක් අනුමත කොට ඉදිරිපත් කළේ ය. පළමු ව, යුආන් තේ-ශෙං ඇවිත් ලෝශියාඕ කඳු වැටියේ මැද කොටසෙහි දේශපාලන බලය පිහිටුවීමට අප කර තිබුණු සැලැස්ම අනුමත කළේ ය. ඉක්බිති තු ශියු-චිං ද යාං කායි-මිං ද ඇවිත්, කිසි ම පැකිළීමක් නැති ව රතු හමුදාව දකුණු හුනාන් පළාත දෙසට ගමන් කළ යුතු ය'යි ද, රතු මුරභටයන් හා එක් වී දේශසීමා ප්‍රදේශය රකිනු පිණිස රයිපල්භටයන් දෙසියයක් පමණක් ඇති බලසේනාවක් රඳවා යා යුතු ය'යි ද බල කර කියා සිටියෝ ය; "හරියට ම හරි" ප්‍රතිපත්තිය මෙය ය'යි ඔව්හු කීහ. තුන් වැනි වරට, යන්තම් දස දිනක් පහු වෙත් ම, අපට දිගට හරහට දෙස් නැඟීම හැරුණු කල, රතු හමුදාව නැගෙනහිරි හුනානය බලා ගමනාරම්භ කළ යුතු ය'යි බල කර කියා සිටි

ලියුමක් ද රැගෙන යුආන් තේ-ශෙං නැවත ත් ආවේ ය; මෙය යළිත් "කිසි ම පැකිළීමක් නැති ව" ක්‍රියාවේ යෙදිය යුතු "හරියට ම හරි ප්‍රතිපත්තිය" වශයෙන් විස්තර කරනු ලැබී ය. මේ දරදඬු නිර්දේශය අප හරි ම අසීරු තත්වයකට පත් කළේ ය; මන්ද යත්, ඒවා නො පිළිපැද සිටීම අකීකරු-කමක් විය හැකි වූ අතර පිළිපැදීමේ තේරුම නියත පරාජය විය හැකි වූ නිසා ය. දෙවැනි පණිවිඩය ලැබුණු කල, පක්ෂයේ හමුද කොමිටිය ත්, දේශසීමා ප්‍රදේශ විශේෂ කොමිටිය ත් යුංශින් උප-පළාත් කොමිටිය ත් රැස් වී ඒකාබද්ධ සැසියක් පවත්වා, දකුණු හුනාන් පළාත දෙසට ගමන් කිරීම අනතුරු සහිත ය'යි කල්පනා කළ හෙයින්, පළාත් කොමිටියේ උපදෙස් ක්‍රියාත්මක කිරීමට විරුද්ධ ව තීරණයක් ගත්තේ ය. එහෙත් ඊට ටික දිනකට පසු, තු ශියු-චිං සහ යාං කායි-මිං, පළාත් පක්ෂ කොමිටියේ සැලැස්ම අතනාරිමින් සහ 29වැනි රෙජමේන්තුව ගෙදර යන්ට ආසාවෙන් පෙළිපෙළී සිටීම අයුතු වාසියක් කරගනිමින්, චෙන්චව් උප-පළාත් නගරයට පහර දෙන්ට රතු හමුදාව ඇදගෙන ගොස්, එසේ දේශසීමා ප්‍රදේශය ත් රතු හමුදාව ත් යන දෙකට ම පරාජය ලබා දුනි. රතු හමුදාවට එහි මිනිසුන් ගෙන් අඩක් පමණ නැති විය; දේශසීමා ප්‍රදේශයෙහි ගණන් නැති ගෙවල් ගිනි තබනලදී, මෙපමණ ය'යි නො කිය හැකි තරම් මිනිස්සු සමූහඝාතනය කරනලදහ; උප-පළාත් එකින් එක ම සතුරා අතට පත් විය, ඉන් සමහරක් මේ දක්වා ම ආපසු ලබාගෙන නැත. නැගෙනහිරි හුනාන් පළාතට ගමන් කිරීම සම්බන්ධයෙන්, හුනාන්, හූපේ සහ චියාංසි යන පළාත් වල පාලක ඉඩම්හිමියන් අතර භේදයක් පවතී නම් මිස, රතු හමුදාවේ ප්‍රධාන බල-සේනාවන් එසේ එහි යාම සත්තකින් ම නුවණට හුරු නො වේ. ජූලි මාසයේදී අප දකුණු හුනානයට ගමන් කළේ නැත් නම්, දේශසීමා ප්‍රදේශ-යෙහි අගෝස්තු පරාජය වළකා ලීමට අපට පුළුවන්කම තිබුණේ ය; එපමණක් නො ව යුංශින් වල සිටි සතුරු බලසේනාවන් තළා දමා, චියාන් සහ ආන්පු යට කරගෙන යමින්, ඉදිරියට ගිය අපේ මුරභටයන්ට පිංශියාං වලට ළඟා වී ලෝශියාඕ කඳු වැටියේ උතුරු කොටසේ සිටි 5වැනි රතු හමුදාව සමග සබඳකම් ඇති කරගැනීමට හැකි කරනු පිණිස චියාංසි පළාතේ වාංසු වල කුඔමින්තාං පක්ෂයේ 6වැනි හමුදාව සහ චොං චුන්ගේ කුඔමින්තාං බලසේනාවන් අතර පැවති සටන් වලින් ප්‍රයෝජන ගන්ට ද අපට පුළුවන්-කම තිබුණේ ය. ඒ හැම දෙයක් ම එසේ සිදු වුණත්, අපේ ප්‍රධාන මූලස්ථානය සඳහා නිසි තැන නිංකාං වල ම විය යුතු විය; නැගෙනහිරි හුනාන් පළාතට යැවිය යුතු ව තිබුණේ ගොරිල්ලා සේනා පමණකි. ඉඩම්හිමියන් අතර සටන් ඇවිලී නො තිබුණු නිසා ද, හුනාන් දේශසීමාවේ පිංශියාං, චාලිං සහ යූශියන් වල බලසම්පන්න සතුරු බලසේනාවන් සිටි නිසා ද, අපි අපේ ප්‍රධාන බලසේනාවන් උතුරු දෙසට ගමන් කරවීමු නම්, අප කරන්නේ සතුරාට ඔහුගේ ඉඩප්‍රස්තාව ලබා දීම වන්නට තිබුණි. නැගෙනහිරි හෝ දකුණු හුනානයට ගමන් කිරීමක් ගැන සලකාබලන ලෙස මධ්‍යම කාරකසභාව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අපට කියා තිබුණි; එහෙත් ඒ දෙ මගින් කොයි මග ත් ඉතා අනතුරු සහිත විය. නැගෙනහිරි හූනාන් පළාතට යන්ට යෝජනා කළ යුදගමන නො ගිය නමුත්, දකුණු හූනාන් පළාතට ගිය යුදගමන ව්‍යර්ථ වූ බව ඔප්පු වී ඇත. මේ වේදනාදායක අත්දැකීම සැම විට ම සිහියේ තබා ගැනීම වටී.

අපි තවම ඉඩම්හිමි පංක්තියේ පාලනක්‍රමය භේද වූ කාලපරිච්ඡේදයක ගනා සිටිමු; දේශසීමා ප්‍රදේශය වටේ ම රඳවා සිටින සතුරාගේ "මැඩලීමේ" බලසේනාවෝ ගණනින් තවම රෙජමේන්තු දහයකට වැඩි ය. එහෙත් කාසි ලබා ගැනීමේ මං දිගට ම සොයා ගන්ට අපට හැකි වේ නම් (ආහාර සහ ඇඳුම් දැන් ලොකු ගැටළුවක් නො වේ), එවිට, දේශසීමා ප්‍රදේශයෙහි අපේ වැඩ සඳහා දමා තිබෙන අඩිතාලම ඇති ව, මේ සතුරු බලසේනාවන් සමග, මීට වඩා විශාල බලසේනාවන් සමග පවා, ඔට්ටු වෙන්ට අපට පුළුවනි. දේශසීමා ප්‍රදේශය සම්බන්ධයෙන්, රතු හමුදුව ඉවත් වී ගිය හොත්, මේ ප්‍රදේශය, අගෝස්තුවේදී භාජන වූවාක් මෙන් ම, එක විට ම විනාශයට භාජන වෙනවා ඇත. අපේ රතු මුරභටයෝ සියලු දෙනා ම නම් මුල්පිස දමනු නො ලබනවා ඇත; ඒ වුණත් පක්ෂයට සහ අපේ බහුජන පදනමට අඩපණ වෙන පහරක් වදිනවා ඇත; අපට අඩිය ගසාගෙන සිටීමට පුළුවන් විය හැකි තැන් කඳු වල තිබෙන නමුත්, තැනි වල නම් අගෝස්තුවේදී සහ සැප්තැම්බරයේදී මෙන් අප සියලු දෙනාට ම සැඟවී සිටිමින් වැඩ කරගෙන යන්ට සිදු වෙනවා ඇත. රතු හමුදුව ඉවත් වී නො ගියොත්, එවිට, දැනට ම ත් අපට තිබෙන අඩිතාලම් මත ගොඩනගාගෙන යමින්, අවට පෙදෙස් වලට අනුක්‍රමයෙන් පැතිරෙන්ට අපට හැකි වෙනවා ඇත, අපේ මතු බලාපොරොත්තු ඉතා ප්‍රභාමත් වෙනවා ඇත. රතු හමුදුව විශාල කරන්ට අපට උවමනා නම්, තිබෙන එක ම මග, හූනාන් සහ චියාංසි පළාත් වල සතුරු සේනාවන් අතර පලප්‍රයෝජන අතින් ඇති වෙනස්කම් ද, හැම පැත්තෙන් ම තමන් ආරක්ෂා කරගැනීමට ඔවුන්ට ඇති උවමනාව ද, ඒ නිසා තම බලසේනාවන් ඒකරාශි කිරීමට ඔවුන්ට ඇති බැරිකම ද අරගලයේදී අපේ ප්‍රයෝජනයට යොදා ගනිමින්, හොඳ බහුජන පදනමක් අපට තිබෙන චිංකාං කඳු අවට පෙදෙසෙහි, එනම්, නිංකාං, යූංශින්, ලිංශියන් සහ සුයිචුආන් යන උප-පළාත් වල, සතුරා දිග්ගැසුණු අරගලයකට පටලවාගෙන සිටීම ය. අපට ජය ගන්ට පුළුවන් නම් මිස කිසි ම සටනක් නො කරමින්, නිවැරදි උපක්‍රම යෙදීම මගින් අනුක්‍රමයෙන් රතු හමුදුව විශාල කරගැනීමට ත් අවිආයුධ සහ මිනිසුන් අල්ලා ගැනීමට ත් අපට හැකි ය. රතු හමුදුවේ ප්‍රධාන බලඇණිය දකුණු හූනාන් පළාතට ගිය සිය යුදගමන නො ගියේ නම්, අප්‍රියෙල් සහ ජූලි අතර දේශසීමා ප්‍රදේශයෙහි බහුජනයා අතර කර තිබුණු ප්‍රාරම්භක වැඩ නිසා, අගෝස්තුවේදී ඒ හමුදුව නිසැකයෙන් ම විශාල කරන්ට ඉඩ තිබුණි. ඒ වරද කළ නමුත්, රතු හමුදුව භූමිභාගය හිතකර වූ ත් මිනිසුන් මිතුරු වූ ත් දේශසීමා ප්‍රදේශයට ආපසු ඇවිත් සිටී; දැන් පවා මතු බලාපොරොත්තු නරක

නැත. සිය අවිආයුධ ගණන වැඩි කරගැනීමට ත් හොඳ මිනිසුන් පුහුණු කිරීමට ත් රතු හමුදුවට හැකි වන්නේ දේශසීමා ප්‍රදේශය වැනි තැන් වල සටන් කිරීමට ඇති අධිෂ්ඨානය තුළින් සහ සටන් කිරීමේදී දුක් කරදර විඳීමට ඇති ශක්තිය තුළින් පමණකි. රතු කොඩිය දේශසීමා ප්‍රදේශයෙහි පුරා අවුරුද්දක් ම ලෙලදෙමින් තබාගෙන ඇත. එය හූනාන්, හූපේ සහ චියාංසි පළාත් වල, සත්තකින් ම මුළු රටේ ම, ඉඩම්හිමි පංක්තියේ දරුණු වෛරය දනවා ඇත; එහෙත් එය අවට පළාත් වල කම්කරුවන්ගේ, ගොවියන්ගේ සහ සෙබළුන්ගේ බලාපොරොත්තු ස්ථිර ලෙස ම උසස් කරයි. සෙබළුන් ගැන කල්පනා කර බලමු. යුදදෙටුවන් දේශසීමා ප්‍රදේශයට විරුද්ධ ව කරන "පල්හොරුන්-මැඩලීමේ" යුද්ධව්‍යාපාරය තමන්ගේ ප්‍රධාන වැඩය කරගන්නා නිසා ත්, "පල්හොරුන් මැඩලීමට අවුරුද්දක් ම ගෙවා ඇත, ඩොලර් දශලක්ෂයක් ම වියදම් කර ඇත" (ලූ ති-පිං) යන ප්‍රකාශය හෝ රතු හමුදුවට "රයිපල් 5000ක් තිබෙන මිනිස්සු 20,000ක් සිටිති" (වොං චුන්) යන ප්‍රකාශය හෝ වැනි ප්‍රකාශයන් කරන නිසා ත්, ඔවුන්ගේ සෙබළුන්ගේ ද කළකිරීමට පත් වී සිටින කනිෂ්ඨ නිලධාරින්ගේ ද අවධානය අනුක්‍රමයෙන් අප වෙත හැරෙයි; ඔවුන් වැඩි වශයෙන් සතුරා ගෙන් බිඳී ඇවිත් අපගේ ශ්‍රේණි වලට එකතු වී, එසේ අළුත් මිනිසුන් ලබා ගැනීමේ තවත් මගක් රතු හමුදුවට සපයා දෙනවා ඇත. හැර ද, රතු කොඩිය දේශසීමා ප්‍රදේශයෙහි කිසි කලෙක පහළ නො දමනලද්දේ ය යන සත්‍ය කාරණය කොමියුනිස්ට් පක්ෂයේ ශක්තිය ත් පාලක පංක්ති වල බංකලොත්බව ත් එක විට ම පෙන්නුම් කරයි; වැලිත් මෙය රට පුරා ම පතළ දේශපාලන වැදගත්කමක් සහිත ය. එහෙයින්, ලෝශියාඕ කඳු වැටියේ මැද කොටසෙහි රතු දේශපාලන බලය ගොඩනගා පළල් කිරීම ඒකාන්තයෙන් ම අවශ්‍ය ය, නිවැරදි ය යන මතය, අපි, සැම විට ම දැරූ පරිදි, දැනුත් දරමු.

ස ට හ න්

[1]මේ යුද්ධය සිදු වුණේ 1927, ඔක්තෝබරයේදී ය.

[2]මේ යුද්ධය සිදුවුණේ 1927, නොවැම්බරයේදී සහ දෙසැම්බරයේදී ය.

[3]රතු හමුදුවෙහි සෙබළුන් ගේ නියෝජක සාකච්ඡාසභා සහ සෙබළුන්ගේ කොමිටි පිළිබඳ ක්‍රමය පසු ව නැති කර දමනලදී. 1947දී, මහජන විමුක්ති හමුදුව හමුදුමිනිසුන්ගේ සාකච්ඡාසභා සහ සෙබළුන්ගේ කොමිටි ක්‍රමයක් ආරම්භ කළේ ය; දෙක ම කාඩර්වරුන්ගේ නායකත්වය යටතේ ය.

[4]සුප්‍රසිද්ධ සරත් අස්වනු පැනනැඟීම 1927 සැප්තැම්බරයේදී හූනාන්-චියාංසි දේශසීමාවේ පිහිටි ශියුශුයි, පිංශියාං, පිංචියාං සහ ලියුයාං යන උප-පළාත් වල මහජනයාගේ සන්නද්

ලසේනාවන් විසින් සහෝදර මාඕ සේතුංගේ නායකත්වය යටතේ අරඹනු ලැබී ය; පළමුවැනි මකරුවන්ගේ සහ ගොවියන්ගේ විප්ලවවාදි හමුදවේ 1වැනි ඩිවිසනය සෑදුණේ ඒ බල-සේනාවන් ගෙන් ය. සහෝදර මාඕ සේතුං මේ බලසේනාව චිංකාං කඳු වලට ගෙන යේ ය; එහි විප්ලවවාදි කඳවුරක් පිහිටුවනු ලැබී ය.

[5]මුලින් සහෝදර යේ තිංගේ සහ හෝ ලුංගේ විධානය යටතේ සිටි මේ හටකණ්ඩායම 927, අගෝස්තු 1වැනි ද නාන්චාං පැනනැඟීම කළේ ය. ක්වංතුං පළාතේ චාඕචව් සහ ස්වාතව් ැල්ලීමට ඉදිරියට යද්දී ඔවුහු පරාජය කරනු ලැබූහ; වූ තේ, ලින් පියාඕ සහ චෙන් යි විසින් ායකත්වය දෙනලද ඇතැම් සේනාංග ගොරිල්ලා සටන් කරගෙන යාම පිණිස චියාංසි පළාත සේ දකුණු හූනාන් පළාතට ඉවත් වී ගියේ ය. ඔවුහු 1928 අප්‍රියෙල් මාසයේදී චිංකාං කඳු ලදී සහෝදර මාඕ සේතුංගේ බලසේනාවන්ට එකතු වූහ.

[6]1927තේ විප්ලවවාදි දින වල වූචාං නුවර ජාතික ආණ්ඩුවේ මූරහට රෙජමේන්තුවේ ාඩර්වරුන් අතර වැඩිදෙනා කොමියුනිස්ට පක්ෂයේ සාමාජිකයෝ වූහ. 1927 ජුලි අවසාන-යේදී, චොං චිං-වෙයි සහ ඔහුගේ සගයන් විප්ලවය පාවා දුන් පසු, මේ රෙජමේන්තුව නාන්චාං නුවර පැනනැඟීමට එකතු වීම පිණිස වූචාං නුවර හැර ගියේ ය. විප්ලවවාදි බලසේනාවන් ඒ න විට නාන්චාං නුවර සිට දකුණ බලා පිටත් වූ බව අතර මගදී දැනගත් මේ රෙජමේන්තුව ිංචියාංහි සහ ලියුයාංහි සිටි ගොවි සන්නද්ධ බලසේනාවන්ට එකතු වීම පිණිස බටහිරි යාංසි පළාතේ ශියුශුයි බලා හැරුණේ ය.

[7]1927තේ වසන්තයේදී හූනාන් පළාතේ පිංචියාං සහ ලියුයාං ප්‍රදේශයෙහි සැලකියයුතු ශක්තියකින් යුතු ගොවි සන්නද්ධ බලසේනාවෝ සකස් කරනලදහ. මැයි 21වැනි ද, ශූ කේ-ශියාං චාංසා නුවරදී ප්‍රති-විප්ලවවාදි කුමන්ත්‍රණයක් කොට, විප්ලවවාදි බහුජනයා සමූහ-ඝාතනය කළේ ය. ගොවි සන්නද්ධ බලසේනාවෝ එවිට ප්‍රති-විප්ලවවාදින්ට ආපසු පහර දීම පිණිස මැයි 31වැනි ද චාංසා නුවරට ගමන් කරන්ට වූ නමුත්, අවස්ථාවාදි චෙන් තු-ශියු විසින් වළකනු ලැබ, ආපසු හැරුණෝ ය. එතැනදී කොටසක් ගොරිල්ලා සංග්‍රාමයෙහි යෙදෙනු පිණිස ස්වාධීන රෙජමේන්තුවක් බවට ප්‍රති-සංවිධානය කරනු ලැබී ය. අගෝස්තු වැනි ද ඇති වූ නාන්චාං පැනනැඟීමට පසු, මේ සන්නද්ධ ගොවියෝ චියාංසි පළාතේ ශියුශුයි සහ තුංකු වලදී ත් හූනාන් පළාතේ පිංචියාං සහ ලියුයාං වලදී ත් කලින් වූචාං නුවර ජාතික ආණ්ඩුවේ සිටි මූරහට රෙජමේන්තුව සමග එකතු වී, චියාංසි පළාතේ පිංශියාං වල සන්නද්ධ බිම්අඟුරු පතල්කරුවන් සමග උචිත ලෙස සම්බන්ධ වී සරත් අස්වනු පැනනැඟීම කළහ. ඔක්තෝබරයේදී සහෝදර මාඕ සේතුං මේ බලසේනාවන් චිංකාං කඳු වලට ගෙන ගියේ ය.

[8]1928වෙ මුල් දින වල, සහෝදර චූ තේ දකුණු හූනාන් පළාතෙහි විප්ලවවාදි ගොරිල්ලා සටන් මෙහෙයවමින් සිටියදී, ගොවි ව්‍යාපාරය ඒ වන විට ත් තරයේ මුල් ඇද තිබුණු යිචාං, චවන්චව්, ලෙයියාං, යුංශිං සහ ත්සේශිං යන උප-පළාත් වල ගොවි හමුද සංවිධානය කරනු-ලැබී ය. අනතුරු ව සහෝදර චූ තේ සහෝදර මාඕ සේතුං යටතේ සිටි බලසේනාවන් සමග එකතු වීම පිණිස ඔවුන් චිංකාං කඳු වලට ගෙන ආවේ ය.

[9]හූනාන් පළාතේ චාංනිංහි පිහිටි ශුයිකෞශාන් එහි තිබෙන ඊයම් පතල් නිසා සුප්‍රකට ය. 1922දී එහි සිටි පතල් කම්කරුවෝ කොමියුනිස්ට පක්ෂය විසින් නායකත්වය දෙනු ලැබ වෘත්තීය සමිතියක් පිහිටුවා ගෙන, අවුරුදු ගණනාවක් ම ප්‍රති-විප්ලවයට විරුද්ධ ව අරගල කරගෙන ගියහ. පතල් කම්කරුවන් අතර බොහෝ දෙනා 1927තේ සරත් අස්වනු පැනනැඟීමට පසු රතු හමුදවට බැඳුණෝ ය.

[10]චියාංසි පළාතේ පිංශියාං උප-පළාතේ පිහිටි, කම්කරුවන් දෙළොස් දහසක් සේවයේ යෙදී සිටි අන්යුආන් බිම්අඟුරු පතල් හාන්-යේ-පිං යකඩ සහ වානේ සමාගමට අයත් විය.

1921 සිට දිගට ම චීන කොමියුනිස්ට පක්ෂයේ හූනාන් පළාත් කොමිටිය විසින් යවනල සංවිධායකයන් විසින් එහි පක්ෂ සංවිධාන සහ පතල් කම්කරුවන්ගේ සමිතියක් පිහිටුව ලැබී ය.

[11]1929දී රතු හමුදවෙහි සිටි පක්ෂ නියෝජිතයෝ දේශපාලන කොමසාරිස්වරු' අළුතෙන් නම් කරනලදහ. 1931දී කොම්පැඤ්ඤ දේශපාලන කොමසාරිස්වරු දේශපාල උපදේශකයෝ'යි අළුතෙන් නම් කරනලදහ.

[12]ප්‍රාදේශික කෲර පාලකයන්ගේ ධනය බලෙන් ගැනීම හමුදව වියහියදම් වලි කොටසක් දැරීම පිණිස යෙදූ තාවකාලික පියවරක් විය. කඳවුරු ප්‍රදේශ පළල් වීම ත් හමුද විශාල වීම ත් නිසා බදු අයකිරීම මගින් හමුදවේ වියදම් දැරීම කළ හැකි සහ අවශ්‍ය දෙයක් වි

[13]ඒ කාලයේ අවශ්‍ය දෙයක් වූ, කාටත් එක තරමට කාසි ගෙවීමේ සිරිත රතු හමුදවෙ අවුරුදු බොහෝ ගණනක් ම වලංගු ව පැවතිණි. කෙසේ වෙවා, පසු කාලයෙහි නිලධාරි මිනිස්සු ත් ශ්‍රේණිය අනුව මදක් වෙනස් වූ ගෙවීම් ලැබූහ.

[14]රතු හමුදවේ මුල් වකවනුවේදී, ප්‍රජාතන්ත්‍රවාදය අවධාරණය නො කොට, අළු හමුදවට බන්ද ගත් ගොවියන්ගේ සහ අපේ ශ්‍රේණි වලට බැඳුණු අල්ලා ගත් සුදු හටයන්ගෙ විප්ලවවාදී උද්‍යොගය පුබුදු කළ නො හැකි වන්නට ඉඩ තිබුණු නිසා ත්, අපේ කාඩර්වරුන් බෝවී තිබුණු ප්‍රතිගාමී හමුද වල යුදදෙටු ගතිපැවතුම් නැති කර දැමීම නො කළ හැකි වන්න ඉඩ තිබුණු නිසා ත්, මෙහිදී සහෝදර මාඕ සේතුං විප්ලවවාදි හමුදවෙහි ප්‍රජාතන්ත්‍රවාද නිශ්චිත ප්‍රමාණයක් තිබීමේ අවශ්‍යතාව ගැන විශේෂයෙන් ම බර කොට කියයි. ඇත්තෙන් ම හමුදව තුළ ප්‍රජාතන්ත්‍රවාදය යුද්ධ විනය දුර්වල කිරීමට නො ව ශක්තිමත් කිරීමට ඉවහල් වි යුතු හෙයින්, එය ඒ විනයේ සීමාවන් නො ඉක්මවිය යුතු ය. එහෙයින්, අවශ්‍ය ප්‍රමාණයෙ ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කළ යුතු වන අතර, අවිනයගරුකත්වයට සමාන වන අති-ප්‍රජාතන්ත්‍ර වාදය පිණිස කරන ඉල්ලීමට විරුද්ධ ව සටන් කළ යුතු ය. රතු හමුදවේ මුල් දින වල එස අවස්ථාවකදී එබඳු අවිනයගරුකත්වය බරපතල ලෙස සැලකිල්ලට භාජන වූ කරුණක් බව පත් විය. හමුදවෙහි අති-ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධ ව සහෝදර මාඕ සේතුං කළ අරගල දැනගැනීම පිණිස මේ පොතේ 51-64 තෙක් පිටු වල පළ වන "පක්ෂය තුළ තිබෙන වැර අදහස් නිවැරදි කිරීම ගැන" නමැති ලිපිය බලන්න.

[15]1926දී උතුරු යුදගමන යන විට සහෝදර යේ තිං ස්වාධීන රෙජමේන්තුවකට අණ දුන්නේ ය. ස්වකීය න්‍යෂ්ටිය වශයෙන් කොමියුනිස්ටවාදින් සිටි ඒ රෙජමේන්තුව ශූරවී බලසේනාවක් වශයෙන් සුප්‍රසිද්ධ විය. විප්ලවවාදි හමුදව විසින් වූචාං අල්ලා ගත් පසු, එ 24වැනි ඩිවිසනය බවට ද, ඉක්බිති නාන්චාං පැනනැඟීමට පසු 11වැනි හමුදව බවට ද පළල කරනු ලැබී ය.

[16]පක්ෂයට අයත් නැති මිනිසුන් දෙ දෙනකුන්ට එක් පක්ෂ සාමාජිකයකු සිටීමේ අනු පාතය ප්‍රමාණවත් බව ඊට පසු ව රතු හමුදව තුළ ලත් අත්දැකීමෙන් පෙනී ගියේ ය. මේ සමානුපාතය සාමාන්‍යයෙන් රතු හමුදව තුළ ද, පසු ව මහජන විමුක්ති හමුදව තුළ ද පවත්ව ගනු ලැබී ය.

[17]චියාං කායි-ශෙක් සහ චොං චිං-වෙයි විසින් පොළඹවනු ලැබ, ශූ කේ-ශියාං සහ හෝ චියන් ඇතුළු ව හූනාන් පළාතේ හමුද අණදෙන්නෝ 1927, මැයි 21වැනි දින චාංශ නුවර පිහිටි වෘත්තීය සමිති වල, ගොවි සංගම් වල සහ වෙනත් විප්ලවවාදි සංවිධාන වල පළාත්බද මූලස්ථාන වලට කඩාපැනීමක් කරන ලෙස අණ කළහ. කොමියුනිස්ටවාදියෝ ප විප්ලවවාදි කම්කරුවන් සහ ගොවියෝ ත් සිරභාරයට ගෙන, සමූහයන් වශයෙන් මර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දමන ලදහ. මෙය චොං චිං-චෙයි ප්‍රමුඛ චූහාන් කල්ලිය සහ වියාං කායි-ශෙක් ප්‍රමුඛ නැන්කිං කල්ලිය යන ප්‍රති-විප්ලවවාදී කුඔමින්තාං කල්ලි දෙක එළිපිට ම හවුල්වීමෙ සංඥාවක් විය.

[18] සියලු ම ඉඩම් අල්ලා ගෙන නැවත බෙදා දීම 1928දී හූනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි ප්‍රකාශයට පත් කළ ඉඩම් නීතියේ එක් නියමයක් විය. ඉඩම්හිමියන්ගේ ඉඩම් පමණක් අල්ලාගන්නවා වෙනුවට සියලු ම ඉඩම් අල්ලා ගැනීම ඉඩම් ලබාගැනීමෙ විප්ලවය ගැන පළපුරුද්දක් නො තිබීමෙන් පැනනැඟුණු වරදක් බව සහෝදර මාඕ සේතුං පසු ව පෙන්වා දුනි. 1929 අප්‍රියෙල් මාසයේදී සම්මත කළ, චියාංසි පළාතේ ශිංකුඕ උප-පළාතේ ඉඩම් නීතියෙහි, "සියලු ම ඉඩම් අල්ලාගන්න" යන නියමය "රජයේ ඉඩම් සහ ඉඩම්හිමි පංක්තියේ ඉඩම් අල්ලාගන්න" බවට වෙනස් කරනු ලැබී ය.

[19] ගම්බදපෙදෙසෙහි අතරමැද පංක්තිය මේ පැත්තට දිනා ගැනීමෙ වැදගත්කම සලකා, සහෝදර මාඕ සේතුං නො පමා ව ම ඒ පංක්තිය ගැන පමණට වඩා කර්කශ ලෙස ක්‍රියා කිරීමෙ වැරදි ප්‍රතිපත්තිය නිවැරදි කළේ ය. මේ ලිපිය හැරුණු කල, රතු හමුදවේ සිව්වැනි හමුදවේ හයවැනි පක්ෂ සම්මේලනයට (1928, නොවැම්බර්) ඉදිරිපත් කළ "ඉවක්බවක් නැති ව ගිනිතිබීම සහ මිනිසුන් මැරීම තහනම් කිරීම" සහ "මැද සහ කුඩා වෙළඳුන්ගේ පලප්‍රයෝජන ආරක්ෂා කිරීම" යන යෝජනා ද ඇතුළු ව වෙනත් යෝජනා, "ටිකින් ටික කිසියම් දේපොළක් ගොඩනහාගෙන සිටින නගර වල වෙළඳුන් පාලකයන්ට කීකරු ව වැඩ කරන තාක් ඔවුන්ට ඔවුන්ගේ පාඩුවේ ඉන්ට ඉඩ දිය යුතු ය"යි ප්‍රකාශ කළ සිව්වැනි රතු හමුදවේ 1929 ජනවාරි ප්‍රකාශනය, 1929 අප්‍රියෙල් මාසයෙහි සම්මත කළ ශිංකුඕ උප-පළාතේ ඉඩම් නීතිය (මීට මුලින් යොදා ඇති සටහන බලන්න) යනාදියෙහි මේ පංක්තිය කෙරෙහි අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය ගැන සහෝදර මාඕ සේතුංගේ අදහස් ඉදිරිපත් කර තිබේ.

[20] විප්ලවවාදී යුද්ධය පැතිරී යාම ත්, විප්ලවවාදී කඳවුරු ප්‍රදේශ ව්‍යාප්ත වීම ත්, විප්ලවවාදී ආණ්ඩුව විසින් කර්මාන්ත සහ වාණිජ්‍යය ආරක්ෂා කිරීමෙ ප්‍රතිපත්තිය සම්මත කිරීම ත් සමග, මේ තත්වය වෙනස් කරන්ට පුළුවන් විය, ඇත්ත වශයෙන් පසු ව වෙනසක් සිදු විය. තීරණාත්මක දෙය වූයේ ජාතික ධනේශ්වරපංක්තියේ කර්මාන්ත සහ වාණිජ්‍යය ස්ථිර ලෙස ආරක්ෂා කිරීම ත් අති-වාම ප්‍රතිපත්ති වලට විරුද්ධ වීමත් ය.

[21] ශ්‍රම-ශක්තිය ඉඩම් බෙදා දීම පිණිස යෝග්‍ය නිශ්චය කිරීමෙ මිම්මක් නො වේ. රතු ප්‍රදේශ වල ඇත්ත වශයෙන් ඉඩම් නැවත බෙදා දුන්නේ එක් එක් මිනිසා වශයෙන් ගෙන ඒ පදනම පිට සමාන ලෙස ය.

[22] කලබල සංසිඳවීමෙ මුරභටයෝ එක්තරා වර්ගයක ප්‍රති-විප්ලවවාදී සන්නද්ධ බල සේනාවක් වූහ.

පක්ෂය තුළ තිබෙන වැරදි අදහස් නිවැරදි කිරීම ගැන

1929, දෙසැම්බර්

පක්ෂයේ නිවැරදි ක්‍රියාමාර්ගය භාවිතාවෙහි යෙදීමට මහත් සේ බාධා කරන නිර්ධනපංක්ති අදහස් නො වන නොයෙක් විධියේ අදහස් සිව්වැනි රතු හමුදවේ කොමියුනිස්ට් පක්ෂ සංවිධානය තුළ පවතී. මේ අදහස් නිරවශේෂයෙන් ම නිවැරදි කළ හොත් මිස, චීනයේ ශ්‍රෙෂ්ඨ විප්ලවවාදී අරගලයේදී සිව්වැනි හමුදවට පැවරී තිබෙන කර්තව්‍යයන්ට උර දෙන්නට ඒ හමුදවට පුළුවන්කමක් නැත. මේ පක්ෂ සංවිධානය තුළ එබඳු වැරදි අදහස් උපදින තැන රැඳී තිබෙන්නේ, සත්තකින් ම, එහි මූලික ඒකක සෑදී ඇත්තේ වැඩි වශයෙන් ගොවියන් ගෙන් සහ සුළු–ධනේශ්වර මූලක් ඇති වෙනත් කොටස් වලින් ය යන සත්‍ය කාරණයෙහි ය; එසේ වී නමුත් මේ වැරදි අදහස් වලට විරුද්ධ ව සිතාමතා පිළියෙළ කරගත් අධිෂ්ඨාන සහගත අරගලයක් කිරීමෙහි ලා ත් පක්ෂයේ නිවැරදි ක්‍රියාමාර්ගය ගැන සාමාජිකයින්ට අධ්‍යාපනයක් දීමෙහි ලා ත් පක්ෂයේ නායක මණ්ඩල කෙරෙහි වන අදක්ෂතාව ද ඒ අදහස් පැවතීමට සහ වැඩීමට වැදගත් හේතුවක් වේ. මධ්‍යම කාරකසභාවේ සැප්තැම්බර් ලියමනේ ජීවගුණයට අනුකූල ලෙස, මේ සම්මේලනය, සිව්වැනි හමුදවෙහි පක්ෂ සංවිධානය තුළ පවතින නිර්ධනපංක්ති අදහස් නො වන නොයෙක් විධියේ අදහස් ප්‍රකට වන අයුරු ද, ඒ අදහස් උපදින තැන් ද, ඒවා නිවැරදි කරන ක්‍රම ද මෙයින් පෙන්වා දෙයි, ඒ අදහස් නිරවශේෂයෙන් ම මුලිනුපුටා දමන ලෙස සියලු සහෝදරවරුන් ගෙන් ඉල්ලා සිටී.

මේ ලිපිය රතු හමුදවේ සිව්වැනි හමුදවේ නවවැනි පක්ෂ සම්මේලනය සඳහා සහෝදර මාඕ සේතුං විසින් කෙටුම්පත් කළ යෝජනාවකි. චීන ජනතාවගේ සන්නද්ධ බලසේනාවන් ගොඩනැඟීම දුෂ්කර ක්‍රියාවලියක් විය. (ජපානයට විරුද්දකම් පෑමෙ යුද්ධය පැවති කාලයේ අටවැනි මාර්ග හමුදව සහ අළුත් සිව්වැනි හමුදව බවට පත් වූ ද, දැන් මහජන විමුක්ති හමුදව වන්නා වූ ද) චීන රතු හමුදව ඇති කළේ නාන්චාං පැනනැඟීම කළ දින වල 1927, අගෝස්තු 1වැනි ද ය; 1929, දෙසැම්බර් වන විට එය අවුරුදු දෙකකට වැඩි කලක් පැවතී තිබුණි. මේ කාලපරිච්ඡෙදය තුළ රතු හමුදවෙහි කොමියුනිස්ට් පක්ෂ සංවිධානය බොහෝ දේ ඉගෙනගත්තේ ය, නොයෙක් වැරදි අදහස් වලට විරුද්ධ ව සටන් කිරීමේදී සරු අත්දැකීම් රැසක්

https://liberationbase.wordpress.com

තනිකර යුද්ධය ම මුල් කරගෙන බලන විධිය ගැන

තනිකර යුද්ධය ම මුල් කරගෙන බලන විධිය රතු හමුදවේ සහෝදරවරුන් ගණනාවක් අතර බෙහෙවින් ම වර්ධනය වී ඇත. එය මතු දක්වන පරිදි ප්‍රකට වේ:

1. මේ සහෝදරවරු යුද්ධ කටයුතු ත් දේශපාලනය ත් එකිනෙකට ප්‍රතිපක්ෂ දේ ලෙස සලකති, කට තු යනු හුදෙක් දේශපාලන වැඩ මුදුන්පත් කරන්ට තිබෙන එක් විධියක් බව පිළිගැනීම ප්‍රතික්ෂේප කරති. ''ඔබ යුද්ධ කටයුතු අතින් හොඳ නම්, ස්වභාවයෙන් ම ඔබ දේශපාලනය අතින් ද හොඳ ය; ඔබ යුද්ධ කටයුතු අතින් හොඳ නැත් නම්, ඔබ දේශපාලනය අතින් ද හොඳ වෙන්ට බැරි ය'', යි කියා ත් සමහරු කියති — මෙය තව පියවරක් ඉදිරියට යමින්, යුද්ධ කටයුතු දේශපාලනයට ඉහළින් තබා ඒවාට ප්‍රධාන තැනක් දීම වේ.

2. රතු හමුදවට අයත් වැඩය, සුදු හමුදවට අයත් වැඩය මෙන් ම, සටන් කිරීම පමණක් ය'යි ඔව්හු කල්පනා කරති. චීන රතු හමුදව විප්ලවයේ දේශපාලන වැඩ කරගෙන යාමට තිබෙන සන්නද්ධ මූළුවක් බව ඔවුන්ට නො වැටහේ. විශේෂයෙන් වර්තමාන අවස්ථාවෙහි, රතු හමුදව ඇත්තෙන් ම සටන් කිරීමට ම සීමා නො විය යුතු ය; සතුරාගේ යුද්ධ ශක්තිය විනාශ කිරීම පිණිස සටන් කිරීම හැරුණු කල, එය බහුජනයා අතර ප්‍රචාරක කටයුතු කරගෙන යාම, බහුජනයා සංවිධානය කිරීම, ඔවුන් සන්නද්ධ කිරීම, විප්ලවවාදි දේශපාලන බලය පිහිටුවීමට ඔවුන්ට උදව් කිරීම සහ පක්ෂ සංවිධාන පිහිටුවීම වැනි වැදගත් වැඩ වලට උර දිය යුතු ය. රතු හමුදව සටන් කරන්නේ නිකම් සටන් කරන්ට ඕනෑ නිසා ම නො ව බහුජනයා අතර ප්‍රචාරක කටයුතු කරගෙන යාම, ඔවුන් සංවිධානය කිරීම, ඔවුන් සන්නද්ධ කිරීම සහ විප්ලවවාදි දේශපාලන බලය පිහිටුවීමට ඔවුන්ට උදව් කිරීම පිණිස ය, මේ පරමාර්ථ නොමැති ව, සටන් කිරීමේ තේරුම නැති වේ, රතු හමුදව තිබීමේ හේතුව නැති වේ.

3. එහෙයින්, සංවිධානාත්මක වශයෙන්, මේ සහෝදරවරු දේශපාලන වැඩ කරන රතු හමුදවේ කාර්යාංශ යුද්ධ වැඩ කරන කාර්යාංශ වලට යටත් කරති, ''හමුද මූලස්ථානය බාහිර කරුණු ගැන ක්‍රියා කළාදෙන්'' යන සටන්පාඨය ඉදිරියට දමති. මේ අදහසට වර්ධනය වෙන්ට ඉඩ දුන්නොත්, බහුජනයා ගෙන් ඈත් වීමේ ත්, හමුදව විසින් ආණ්ඩුව පාලනය කිරීමේ ත් නිර්ධනපංක්ති නායකත්වයෙන් ඉවත් වීමේ ත් අනතුර එයින් ඇති වෙන්ට ඉඩ තිබේ — එය කුඕමින්තාං හමුදව මෙන් ම යුදදෙටුවාදයේ මග ගැනීම වෙනවා ඇත.

4. ඒ අතර ම, ප්‍රචාරක වැඩ කිරීමේදී ඔව්හු ප්‍රචාරක කණ්ඩායම් වල වැදගත්කම නො තකා හරිති. බහුජනයා සංවිධානය කිරීම පිළිබඳ ප්‍රශ්නයේදී, ඔව්හු හමුදවෙහි සෙබළුන්ගේ කොමිටි සංවිධානය කිරීම ත් ප්‍රාදේශික කම්කරුවන් සහ ගොවියන් සංවිධානය කිරීම ත් නො සලකා හරිති. ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රචාරක වැඩ ත් සංවිධානාත්මක වැඩ ත් යන දෙක ම අතරමං වේ.

5. ඔව්හු සටනක් ජය ගත් විට උඩඟු වෙති, සටනක් පැරදුණු විට කලකිරෙති.

6. ආත්මාර්ථකාමී පංගුපේරුවාදය — ඔවුන් සිතන්නේ සිව්වැනි හමුදව ගැන ම පමණකි, ප්‍රදේශයේ බහුජනයා සන්නද්ධ කිරීම රතු හමුදව සතු වැදගත් වැඩක් බව න්ට නො වැටහේ. මෙය ලොකු කළ ආකාරයකින් තිබෙන ''කුඩා කණ්ඩායම්'' මානසිකත්වය වේ.

7. සිව්වැනි හමුදවෙහි තමන්ගේ සීමා සහිත වටාපිටාවෙන් ඔබ්බට දකින්ට අසමත් ව, සහෝදරවරුන් ටික දෙනෙක් අන් කිසි ම විප්ලවවා බලසේනාවක් ඇත්තේ නැතැ'යි විශ්වාස කරති, ශක්තිය රැක ගැනීමේ ත් ක්‍රියාවෙන් මගඇරීමේ ත් අදහසට ඔවුන් තරයේ ම ඇලී සිටින්නේ එහෙයිනි. මෙය අවස්ථාවාදයෙන් ඉතුරු වී තිබෙන දෙයකි.

8. සමහර සහෝදරවරු, මනෝමූල සහ විෂයමූල තත්වයන් ගණන් නො ගනිමින්, විප්ලවවාදි ඉක්මන්කාරකම නමැති රෝගයෙන් පෙළෙති; ඔව්හු බහුජනයා අතර කරන වැඩ සියුම් ලෙස ත් සවිස්තර ලෙස ත් කරන්ට වෙහෙස මහන්සි නො වෙති, මුළාවන් ගෙන් පිරී, ලොකු ලොකු දේ පමණක් කරන්ට බලාපොරොත්තු වෙති. මෙය කුමන්ත්‍රණවාදයෙන්[1] ඉතිරි වී තිබෙන දෙයකි.

තනිකර යුද්ධය ම පෙරදැරි කරගෙන බලන විධිය හටගන්නා මුල් මෙසේ ය:

1. පහළ දේශපාලන මට්ටමක්. හමුදව තුළ දේශපාලන නායකත්වය සතු කොටස පිළිගැනීමට ත් රතු හමුදව ත් සුදු හමුදව ත් මූලික වශයෙන් වෙනස් බව පිළිගැනීමට ත් බැරිකම ඇති වන්නේ මෙයින් ය.

ලබා ගත්තේ ය යෝජනාව මේ අත්දැකීම සම්පිණ්ඩනය කළේ ය. මූළුමනින් ම මාක්ස්-ලෙනින්වාදි පදනමක් මත ගොඩනැඟෙන්ට ත් පරණ වර්ගයේ හමුදවල් වල සියලු බලපෑම් නැති කර දමන්ට ත් එය රතු හමුදවට හැකි කළේ ය. එය සිව්වැනි හමුදවේ පමණක් නො ව එකකට පසු එකක් වශයෙන් රතු හමුදවේ සෙසු සියලු සේනාංග වල ද ක්‍රියාත්මක කරනු ලැබී ය; මේ අයුරින් මුළු චීන රතු හමුදව ම හැම අතින් ම ජනතාවගේ අව්‍යාජ හමුදවක් බවට පත් විය. ඉකුත් තිස් වසක් පමණ වන කාලය තුළ චීන ජනතාවගේ සන්නද්ධ බලසේනාවෝ ඔවුන්ගේ පක්ෂ වැඩකටයුතු සහ දේශපාලන වැඩ වලදී ඉමහත් දියුණුවක් සලසාගෙන සහ අළුත් දේ ඇති කරගෙන සිටිති: ඒවා දැන් ඉතා වෙනස් චිත්‍රයක් ඉදිරිපත් කරයි; එනමුත් මූලික ක්‍රියාමාර්ගය තවම මේ යෝජනාවෙහි පැණවූ ක්‍රියාමාර්ගය ලෙස ම පවතී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

2. කුලී–භේවායින්ගේ මානසිකත්වය. පසුගිය සටන් වලදී අල්ලා-ගන්නාලද බොහෝ සිරකරුවෝ රතු හමුදවට බැඳී සිටිති; එබඳු කොටස් කුලියට සේවය කිරීමේ අදහස කැපී පෙනෙන ලෙස සටහන් වූ මනෝ-භාවයක් තමන් සමග ගෙන එති; එමගින් තනිකර යුද්ධය ම මුල් කරගෙන බලන විධිය සඳහා පහළ ශ්‍රේණීන් අතර පදනමක් සපයති.

3. මුලින් සඳහන් කළ හේතු දෙකෙන් තුන්වැන්නක් ඇති වේ; එනම් යුද්ධ ශක්තිය කෙරෙහි ඕනෑවට වඩා විශ්වාසය තබා ගැනීම සහ බහුජන සමූහයාගේ ශක්තිය කෙරෙහි විශ්වාසය නොමැති වීම ය.

4. යුද්ධ වැඩ වලට උනන්දුවෙන් යොමු වීමට සහ ඒවා ගැන සාකච්ඡා කිරීමට පක්ෂයට බැරි වීම ද සහෝදරවරුන් ගණනක් අතර තනිකර යුද්ධය ම මුල් කරගෙන බලන විධිය ඇති වීමට කාරණයක් වේ.

නිවැරදි කිරීමේ ක්‍රම මතු දක්වන පරිදි ය:

1. අධ්‍යාපනය මගින් පක්ෂය තුළ දේශපාලන මට්ටම උසස් කරන්න, තනිකර යුද්ධය ම මුල් කරගෙන බලන විධියේ න්‍යායික මුල් විනාශ කරන්න, රතු හමුදව සහ සුදු හමුදව අතර මූලික වෙනස පැහැදිලි ව තේරුම් ගන්න. ඒ සමග ම, අවස්ථාවාදයෙන් ද කුමන්ත්‍රණවාදයෙන් ද ඉතිරි වී තිබෙන දේ නැති කර දමන්න; සිව්වැනි හමුදවේ ආත්මාර්ථකාමී පංගු-පේරුවාදය බිඳ දමන්න.

2. නිලධාරීන්ගේ සහ මිනිසුන්ගේ දේශපාලන පුහුණුව ද, විශේෂ-යෙන් කලින් සිරකරුවන් ව සිටි අයගේ අධ්‍යාපනය ද දැඩි කරන්න. ඒ සමග ම, රතු හමුදවට බැඳෙන්ට අරගලයෙහි ලා පළපුරුද්ද ඇති කම්කරුවන් සහ ගොවියන් හැකි තරම් දුරට තෝරා ගනිමින්, එසේ තනිකර යුද්ධය ම මුල් කරගෙන බලන විධිය සංවිධානාත්මක වශයෙන් දුර්වල කිරීමට, නැතහොත් මුලිනුපුටා දැමීමට පවා, ප්‍රාදේශික ආණ්ඩු වලට ඉඩ දෙන්න.

3. පක්ෂ සංවිධාන කෙරෙහි ද, රතු හමුදවේ නිලධාරීන් සහ මිනිසුන් කෙරෙහි ද බල පානු වස්, රතු හමුදවෙහි පක්ෂ සංවිධාන විවේචනය කිරීමට ප්‍රාදේශික පක්ෂ සංවිධාන ත් රතු හමුදව ම විවේචනය කිරීමට බහුජන දේශපාලන බල මණ්ඩල ත් උනන්දු කරන්න.

4 පක්ෂය උනන්දුවෙන් යුද්ධ වැඩට යොමු විය යුතු ය, ඒවා සාකච්ඡා කළ යුතු ය. සියලු ම වැඩ සාමාන්‍ය සාමාජිකයන් විසින් කරගෙන යාමට පටන් ගැනීමට පෙර පක්ෂය විසින් සාකච්ඡා කොට තීරණය කළ යුතු ය.

5. රතු හමුදව සතු වැඩ ද, එහි යුද්ධ අවයවය සහ දේශපාලන අව-යවය අතර සබඳකම ද, රතු හමුදව සහ බහුජන සමූහයා අතර සබඳකම ද, සෙබළුන්ගේ කොමිටි සතු බලතල හා වැඩකටයුතු ද, ඒවාට යුද්ධ සහ

දේශපාලන සංවිධාන සමග ඇති සබඳකම ද පැහැදිලි ලෙස පෙන්වා දෙන රතු හමුද නීති රීති කෙටුම්පත් කරන්න.

අති–ප්‍රජාතන්ත්‍රවාදය ගැන

රතු හමුදවේ සිව්වැනි හමුදව මධ්‍යම කාරකසභාවේ නිර්දේශ පිළිගත් තැන් සිට, අති–ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රකට වන අවස්ථා බෙහෙවින් ම අඩු වී තිබේ. උදාහරණ වශයෙන්, පක්ෂ තීරණ දන් තරමක් හොඳට ක්‍රියාවේ යොදනු ලැබේ; රතු හමුදව "ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය පහළ සිට ඉහළට" භාවිතාවේ යෙදිය යුතු ය යන ඉල්ලීම, නැතහොත් "සියලු ප්‍රශ්න පළමු-කොට පහළ මට්ටම් වල අය විසින් සාකච්ඡා කළාදෙන්, ඊට පසු ඉහළ මට්ටම් වල අය තීරණය කළාදෙන්" යන ඉල්ලීම වැනි වැරදි ඉල්ලීම් දන් නම් කිසිවකු විසින් ඉදිරිපත් කරන්නේ නැත. කෙසේ වේවා, ඇත්ත වශයෙන්, මේ අඩුවීම හුදෙක් තාවකාලික ය, මතුපිටට සීමා වී ඇත; අති-ප්‍රජාතන්ත්‍රවාදී අදහස් දනට ම නැති කර දමා ඇති බවක් එයින් අදහස් නො වේ. වෙන වචන වලින්, අති–ප්‍රජාතන්ත්‍රවාදය තවම ත් බොහෝ සහෝදරවරුන්ගේ සිත් තුළ මුල් බැසගෙන තිබේ. පක්ෂ තීරණ ක්‍රියාවේ යෙදීමට අදිමදි කිරීමේ ගතිය ප්‍රකාශ වන නොයෙක් විධියේ කතා ඊට සාක්ෂි ය.

නිවැරදි කිරීමේ ක්‍රම මතු දක්වන පරිදි ය:

1. න්‍යායය පිළිබඳ පරිමණ්ඩලයෙහි, අති–ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් විනාශ කරන්න. පළමුකොට, අති–ප්‍රජාතන්ත්‍රවාදයේ අනතුර රැඳී තිබෙන්නේ එය, පක්ෂය සතු සටන් කර්තව්‍යයන් ඉටු කිරීමට පක්ෂය අසමත් කරමින් ද, එමගින් විප්ලවය පරදින්නට සලසමින් ද, පක්ෂ සංවිධානයට අලාභහානි සිදු කරන්නේ ය, නැතහොත් පක්ෂ සංවිධානය මුළුමනින් ම විනාශ කිරීම පවා කරන්නේ ය, පක්ෂයේ සටන් කිරීමේ හැකියාව දුර්වල කරන්නේ ය, නැතහොත් ඒ හැකියාව මුළුමනින් ම යටින් බිඳින්නේ ය යන සත්‍ය කාරණය තුළ බව පෙන්වා දිය යුතු ය. ඊළඟට, අති–ප්‍රජාතන්ත්‍රවාදය හටගන්නා මුල විනය කෙරෙහි සුළු ධනේශ්වරපංක්තිය තුළ තිබෙන පුද්ගලවාදී අප්‍රසාදය බව පෙන්වා දිය යුතු ය. මේ චරිතලක්ෂණය පක්ෂය තුළට ගෙන ආ කල, එය දේශපාලන වශයෙන් ද සංවිධානාත්මක වශයෙන් ද අති–ප්‍රජාතන්ත්‍රවාදී අදහස් බවට වර්ධනය වේ. මේ අදහස් නිර්ධනපංක්තියේ සටන් කර්තව්‍ය-යන් හා කොහෙත් ම ගැලපෙන්නේ නැත.

2. සංවිධානය පිළිබඳ පරිමණ්ඩලය තුළ, මධ්‍යගත කළ මගපෙන්වීම යටතේ ප්‍රජාතන්ත්‍රවාදය භාවිතාවේ යෙදීම සහතික කරන්න. එය කළ යුත්තේ මතු දක්වන මං ඔස්සේ ය:

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

(1) පක්ෂයේ නායක මණ්ඩල, ඒවා නායකත්වයේ මධ්‍යස්ථාන වශයෙන් තහවුරු කරගනු වස්, මගපෙන්වීමේ නිවැරදි ක්‍රියාමාර්ගයක් දිය යුතු ය, ගැටළු පැනනැංග කල විසඳුම් සොයා ගත යුතු ය.

(2) නිවැරදි මගපෙන්වීමක් කිරීමට විෂයමූල පදනමක් තිබෙන සේ, ඉහළ මණ්ඩල බහුජනයාගේ ජීවිතය ත් පහළ මණ්ඩල තුළ තිබෙන තත්වය ත් හොඳහැටි දැනහැඳිනගෙන සිටිය යුතු ය.

(3) කවර මට්ටමක වේවා කිසිම පක්ෂ සංවිධානයක් ගැටළු විසඳීමේදී අපරීක්ෂාකාරී තීරණයන් නො කළ යුතු ය; තීරණයකට එළඹි කල, එය ස්ථිර ලෙස ක්‍රියාවේ යෙදිය යුතු ය.

(4) පක්ෂයේ ඉහළ මණ්ඩල විසින් කරනු ලබන කිසියම් වැදගත්කමක් ඇති සියලු තීරණ නො පමා ව ම පහළ මණ්ඩල සහ පක්ෂයේ සාමාන්‍ය සාමාජිකයන් වෙත පැමිණවිය යුතු ය. එය කළ යුතු ක්‍රමය නම් ක්‍රියාකාරකයන්ගේ, නැතහොත් පක්ෂ ශාඛා වල පොදු සාමාජිකපිරිසේ, එසේත් නැතහොත් (වටාපිටා තත්වයන් ගෙන් අවසර ලැබේ නම්) කොලම්[2] වල පවා පොදු සාමාජිකපිරිසේ රැස්වීම් කැඳවීම සහ එබඳු රැස්වීම් වලදී ඒ තීරණ වාර්තා කිරීමට මිනිසුන් පංගාර්තු කිරීම ය.

(5) පක්ෂයේ ඉහළ මණ්ඩල වල නිර්දේශයන්ගේ තේරුම අනූන ලෙස වටහා ගැනීම පිණිස ත් ඒවා ක්‍රියාවේ යොදන ක්‍රම තීරණය කිරීම පිණිස ත් පක්ෂයේ පහළ මණ්ඩල සහ පක්ෂයේ සාමාන්‍ය සාමාජිකපිරිස ඒ නිර්දේශයන් විස්තර සහිත ව සාකච්ඡා කළ යුතු ය.

සංවිධානාත්මක විනය නොතැකීම ගැන

සිව්වැනි හමුදාවේ පක්ෂ සංවිධානය තුළ සංවිධානාත්මක විනය නොතැකීම මතු දක්වන පරිදි ප්‍රකට වේ:

අ. අඩු–පිරිස වැඩි–පිරිසට අවනත නො වීම. උදාහරණ වශයෙන්, අඩු-පිරිසක්, තමන් ඉදිරිපත් කළ යෝජනාව ඡන්දයෙන් අහක ගිය බව දුටු විට, පක්ෂ තීරණ අවංක ලෙස ක්‍රියාවේ නො යොදති.

නිවැරදි කිරීමේ ක්‍රම මතු දක්වන පරිදි ය:

1. රැස්වීම් වලදී, තමන්ගේ අදහස් හැකි තරම් සම්පූර්ණ ලෙස පැවසීමට රැස්වීමට සහභාගි වන සියලු දෙනාට ම දිරි දිය යුතු ය. කවර මතභේදයකදී වුව සමගිසම්මුතියක් ඇති කරගැනීම වත් ඇත්ත වසං කරන අයුරින් කරුණු තේරුම් කිරීම වත් නො කොට, හරි දේ ත් වැරදි දේ ත් පැහැදිලි කළ යුතු ය. පැහැදිලි නිගමනයකට එළඹෙනු පිණිස, එක් රැස්වීමකදී බේරුම් නො කළ

හැකි වන දෙයක්, වැඩට බාධාවක් නො වේ නම්, තවත් රැස්වීමකදී සාකච්ඡා කළ යුතු ය.

2. පක්ෂ විනය රැකීමට උවමනා කරන එක් දෙයක් නම් අඩු–පිරිස වැඩි–පිරිසට අවනත විය යුතු බව ය. අඩු–පිරිසේ මතය ප්‍රතික්ෂේප කරනු ලැබී නම්, වැඩි-පිරිස විසින් සම්මත කළ තීරණයට අඩු–පිරිස අනුබල දිය යුතු ය. අවශ්‍ය නම්, ඒ කරුණ නැවත සලකාබැලීම පිණිස ඊළඟ රැස්වීමේදී ඉදිරියට ගෙනෙන්ට අඩු–පිරිසට හැකි ය; එහෙත් එ පමණක් විනා ඒ අඩු–පිරිස මොන ම අන්දමකින් වත් තීරණයට විරුද්ධ ව ක්‍රියා නො කළ යුතු ය.

ආ. සංවිධානාත්මක විනය ගැන නො තකමින් කරන විවේචනය.

1. පක්ෂය–තුළ විවේචනය පක්ෂ සංවිධානය ශක්තිමත් කිරීම පිණිස ත්, එහි සටන් කිරීමේ හැකියාව වැඩි කිරීම පිණිස ත් තිබෙන අවියකි. රතු හමුදාවේ පක්ෂ සංවිධානය තුළ, කෙසේ වේවා, විවේචනය සැම විට ම මේ ලක්ෂණයෙන් යුක්ත නො වේ, ඇතැම් විට පුද්ගලික පහරදීමකට හැරේ. ප්‍රතිඵලයක් වශයෙන්, එයින් පක්ෂ සංවිධානයට ත් එසේ ම පුද්ගලයන්ට ත් හානියක් ම සිදු වේ. මෙය සුළු–ධනේශ්වර පුද්ගලවාදය ප්‍රකට වන පිළිවෙලකි. නිවැරදි කිරීමේ ක්‍රමය නම් විවේචනයේ අභිප්‍රාය පංක්ති සටනේදී ජය අත්පත් කරගනු වස් පක්ෂයේ සටන් කිරීමේ හැකියාව වැඩි කිරීම බව ත් එය පුද්ගලික පහර දීමේ විධියක් ලෙස පාවිච්චි නො කළ යුතු බව ත් තේරුම් ගැනීමට පක්ෂ සාමාජිකයන්ට ආධාර කිරීම ය.

2. බොහෝ පක්ෂ සාමාජිකයන් ඔවුන් කරන විවේචන කරන්නේ පක්ෂය තුළ නො ව පක්ෂයෙන් පිට ය. හේතුව නම් පොදු සාමාජිකපිරිස පක්ෂ සංවිධානයේ (එහි රැස්වීම් යනාදියේ) වැදගත්කම තවම හරි හැටි වටහාගෙන නො සිටීම සහ සංවිධානය ඇතුළත කරන විවේචනය ත් ඉන් පිටතදී කරන විවේචනය ත් අතර වෙනසක් නො දැකීම ය. නිවැරදි කිරීමේ ක්‍රමය නම් පක්ෂ සාමාජිකයන් පක්ෂ සංවිධානයේ වැදගත්කම තේරුම් ගන්නා සේ ත් පක්ෂ කොමිටි ගැන හෝ සහෝදරයන් ගැන හෝ කරන තම විවේචන පක්ෂ රැස්වීම් වලදී ම කරන සේ ත් ඔවුන්ට අධ්‍යාපනයක් දීම ය.

ඒකාන්ත සමානතාවාදය ගැන

ඒකාන්ත සමානතාවාදය එක් අවස්ථාවකදී රතු හමුදාව තුළ හොඳට ම බරපතල දෙයක් බවට පත් විය. මෙන්න උදාහරණ කීපයක්. තුවාල වූ සෙබළුන්ට ගෙවන ආධාර මුදල පිළිබඳ කාරණයේදී, සුළු වශයෙන් තුවාල වූ අය සහ බරපතල ලෙස තුවාල වූ අය අතර ප්‍රභේදයක් කරනවාට විරුද්දකම්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

තිබුණේ ය, සියලු දෙනාට ම සමාන ලෙස ආධාර මුදල් ගෙවිය යුතු ය යන ඉල්ලීම නඟනු ලැබී ය. නිලධාරින් අසුන් පිට නැඟී ගමන් කරන කල, එය සලකනලද්දේ ඔවුන් සතු රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය දෙයක් වශයෙන් නො ව අසමානතාවේ සලකුණක් ලෙස ය. සපයන ද්‍රව්‍ය ඒකාන්තයෙන් ම සමාන ලෙස බෙදා දිය යුතු ය'යි ඉල්ලාසිටින ලදී, විශේෂ අවස්ථාවන්හි ටිකක් වැඩි පුර වෙන් කර දෙනවාට විරුද්ධත්වයක් තිබුණි. හාල් ඇදීමේදී, වයස හෝ කායික තත්වය කුමක් වුව ත්, සියලු දෙනා ම එක ම තරමේ බරක් තම කර පිටින් ගෙන යා යුතු ය යන ඉල්ලීම කරනලදී. වාඩි වෙන් කර දීමේදී සමානතාව තිබිය යුතු ය'යි ඉල්ලාසිටිනලදී. වඩා ලොකු කාමර වල සිටීම ගැන මූලස්ථානයට නින්දා අපහාස කරනු ලැබී ය. ඉදහිට කරන වාඩිය සුද්දපවිත්තර කිරීම ආදි අමතර රාජකාරි පැවරීමේදී ත් සමානත්වය තිබිය යුතු ය'යි ඉල්ලාසිටිනලදී, අනික් මිනිසාට වඩා ටිකක් වැඩිපුර කිරීමට අකැමැත්තක් තිබුණි. එය කොතරම් දුර ගියේ ද යත හොත්, තුවාල වූ මිනිසුන් දෙ දෙනකුන් සිටි විට තිබුණේ එක් ගිලන්-මැස්සක් පමණක් නම්, එයා කලින් ගෙනයන්ට ඉඩ දීමට මෙයා කැමති නො වූ නිසා ත් මෙයා කලින් ගෙනයන්ට ඉඩ දීමට එයා කැමති නො වූ නිසා ත් කාව වත් ගෙන යා නො හැකි විය. මේ උදාහරණ වලින් පෙන්වන විධියේ ඒකාන්ත සමානතාවාදය රතු හමුදාවේ නිලධාරින් සහ මිනිසුන් අතර තවම ත් ඉතා බරපතල ලෙස පවතී.

ඒකාන්ත සමානතාවාදය, දේශපාලන කරුණු වලදී අති-ප්‍රජාතන්ත්‍රවාදය මෙන් ම, හස්තකර්මාන්ත සහ කුඩා ගොවි අර්ථක්‍රමයකින් නිෂ්පාදනය වන දෙයක් වේ — ඇති එක ම වෙනස එකක් ද්‍රව්‍යමය කටයුතු වලදී ප්‍රකට වන අතර අනික දේශපාලන කටයුතු වලදී ප්‍රකට වීම පමණකි.

නිවැරදි කරන ක්‍රමය: ධනවාදය නැති කිරීමට පෙර, ඒකාන්ත සමානතාවාදය කුඩා දේපොළ-හිමියන් වශයෙන් ගොවියන් තුළ තිබෙන හුදු මුළාවක් බව ද, සමාජවාදය යටතේ ත් ද්‍රව්‍යමය දේ බෙදාහරිනු ලබන්නේ "හැම එක්කෙනා ගෙන් ම ඔහුගේ ශක්තිය අනුව, හැම එක්කෙනාට ම ඔහුගේ වැඩ අනුව" යන ප්‍රතිපත්තිය උඩ මෙන් ම වැඩ වල ඕනෑඑපාකම් පිරිමැසීමේ ප්‍රතිපත්තිය උඩ හෙයින්, සමාජවාදය යටතේ පවා ඒකාන්ත සමානතාව තිබෙන්ට බැරි බව ද අප විසින් පැහැදිලි කර දිය යුතු ය. රතු හමුදාවෙහි ද්‍රව්‍යමය දේ බෙදා දීම, නිලධාරින්ට ත් මිනිසුන්ට ත් සමාන වැටුප් ගෙවීමේ ප්‍රශ්නයේදී මෙන් ම, බොහෝ දුරට සමාන විය යුතු ය; අරගලයේ වර්තමාන වටාපිටා තත්වයන්ට මෙය උවමනා කරන නිසා ය. එහෙත් හේතුයුක්තිය ඉක්මවා ගිය ඒකාන්ත සමානතාවාදයට නම් විරුද්ධ විය යුතු ම ය; එය අරගලයට උවමනා නො කරන නිසා ය; අනික් අතට, එය අරගලයට බාධා කරන නිසා ය.

මනෝමූලවාදය ගැන

මනෝමූලවාදය ඇතැම් පක්ෂ සාමාජිකයන් අතර බරපතල ප්‍රමාණයකට පවතී; එයින් දේශපාලන තත්වය විශ්ලේෂණය කිරීමට ත් වැඩට මගපෙන්වීමට ත් මහත් හානි සිදු වේ. හේතුව නම් දේශපාලන තත්වයක් ගැන කරන මනෝමූල විශ්ලේෂණයේ ත් වැඩට කරන මනෝමූල මගපෙන්වීමේ ත් නො වැළකිය හැකි ප්‍රතිඵලය එක්කෝ අවස්ථාවාදය, නැත්නම් කුමන්ත්‍රණවාදය වීම ය. මනෝමූල විවේචනය, අසංවර ප්‍රතිෂ්ඨා විරහිත කතාබහ හෝ සැකමුසුබව සම්බන්ධයෙන්, පක්ෂය තුළ පවතින එබඳු පුරුදු වලින් ප්‍රතිපත්ති විරහිත වාදභේද ඇති වේ, පක්ෂ සංවිධානය යටින් බිඳෙයි.

පක්ෂය-තුළ විවේචනය සම්බන්ධයෙන් මතක් කළ යුතු තවත් කාරණයක් නම් ඇතැම් සහෝදරවරුන් තමන්ගේ විවේචනය කරන විට ප්‍රධාන ප්‍රශ්න නො සලකා හරිමින් සුළු සුළු කරුණු කෙරෙහි තමන්ගේ අවධානය යොමු කරන බව ය. විවේචනයට අයත් ප්‍රධාන වැඩය දේශපාලන සහ සංවිධානාත්මක වැරදි පෙන්වා දීම බව ඔවුන්ට නො වැටහේ. පුද්ගලික අඩුලුහුඬුකම් සම්බන්ධයෙන්, ඒවා දේශපාලන සහ සංවිධානාත්මක වැරදි වලට සම්බන්ධ නම් මිස, ඕනෑවට වඩා ඒවා හාරා අවුස්සා අදාළ සහෝදරයන්ට හිරිහැර කරන්ට උවමනාවක් නැත. එමතු නො ව, එබඳු විවේචන වර්ධනය වුණොත්, පක්ෂ සාමාජිකයන් මුළුමනින් ම සුළු සුළු වැරදි ගැන ම සිත යොමු කරන්ට පුරුදු වීමේ ත් හැම දෙනා ම බයාදු ගතියක් සහ ඕනෑවට වඩා පරෙස්සම් වීමේ ගතියක් ඇති කරගෙන පක්ෂයේ දේශපාලන කාර්තව්‍යයන් අමතක කිරීමේ ත් මහත් අනතුර ඇති වේ.

නිවැරදි කිරීමේ ප්‍රධාන ක්‍රමය නම් පක්ෂ සාමාජිකයන්ගේ සිතීම ත් ඔවුන්ගේ පක්ෂ ජීවිතය ත් පුරා ම දේශපාලන සහ විද්‍යාත්මක ජීවගුණයක් පැතිර පවතින සේ ඔවුන්ට අධ්‍යාපනයක් දීම ය. මේ අරමුණ උදෙසා අපි (1) දේශපාලන තත්වයක් විශ්ලේෂණය කිරීමේදී ත් පංක්ති බලවේග තක්සේරු කිරීමේදී ත්, මනෝමූල විශ්ලේෂණයක් සහ තක්සේරුවක් කරනවා වෙනුවට, මාක්ස්-ලෙනින්වාදී ක්‍රමය යොදන සැටි පක්ෂ සාමාජිකයන්ට උගැන්විය යුත්තෙමු; (2) අරගලයේ උපක්‍රම සහ වැඩ කරන ක්‍රම නිශ්චය කරන සේ ත්, නියම තත්වයන් ගැන විමසා බැලීමක් නො කරතොත් අද්භූත කල්පනාවල් සහ කුමන්ත්‍රණවාදය නමැති වළට තමන් වැටෙන්ට පුළුවන් බව තේරුම් ගැනීමට සහෝදරයන්ට ආධාර කරන සේ ත්, පක්ෂ සාමාජිකයන්ගේ අවධානය සමාජ, ආර්ථික විමසා බැලීම් සහ හැදෑරීම් කෙරෙහි/යොමු කරවිය යුත්තෙමු; (3) පක්ෂය-තුළ විවේචනයේදී, මනෝමූලවාදී නො වීමට, හිතුවක්කාර නො වීමට සහ විවේචනය බාල්දු අඩියකට පත් නො කිරීමට පරෙස්සම් විය යුත්තෙමු; කියන දේ සත්‍ය කරුණු පදනම කරගෙන කිය යුතු ය, විවේචනය දේශපාලනය කේන්ද්‍රය කරගෙන ඒ වටා කළ යුතු ය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

පුද්ගලවාදය ගැන

රතු හමුදු පක්ෂ සංවිධානය තුළ පුද්ගලවාදය දෙසට බරවෙන ගතිය මතු දක්වන පරිදි ප්‍රකට වේ:

1. පලි ගැනීම. ඇතැම් සහෝදරවරු, සෙබළ සහෝදරයකු විසින් පක්ෂය තුළදී විවේචනය කරනු ලැබීමෙන් පසු, පක්ෂයෙන් පිටතදී ඔහු ගෙන් පලි ගන්ට ඉඩප්‍රස්තා ලැබෙන තුරු බලා සිටිති; පලි ගැනීමේ එක් විධියක් නම් ප්‍රශ්නයට සම්බන්ධ සහෝදරයාට ගැහීම හෝ නින්ද අපහාස කිරීම ය. ඔව්හු පක්ෂය තුළදී ත් පලි ගන්ට මාන බලති. "උඹ මේ රැස්වීමේදී මාව විවේචනය කළා; මීළඟ රැස්වීමේදී උඹෙන් ඒකෙ වාඩුව ගන්ට මගක් මම ත් බලන්නම්." එසේ පලි ගැනීමේ ගති ඇති වන්නේ පංක්තියේ ත් මුළු එකක් වශයෙන් පක්ෂයේ ත් පලප්‍රයෝජන නො සලකා හරිමින්, තනිකර ම පුද්ගලික කල්පනාවල් මුල් කර ගැනීමෙන් ය. එහි ඉලක්කය සතුරු පංක්තිය නො වේ, අපේ ම ශ්‍රෙණීන් තුළ සිටින පුද්ගලයෝ ය. එය සංවිධානය ත් එහි සටන් කිරීමේ හැකියාව ත් දුර්වල කරන මළකඩ වේ.

2. "කුඩා කණ්ඩායම්" මානසිකත්වය. ඇතැම් සහෝදරවරු තමන්ගේ ම කුඩා කණ්ඩායමේ පලප්‍රයෝජන පමණක් සැලකිල්ලට ගනිති, පොදු පලප්‍රයෝජනය නො සලකා හරිති. මෙය මතුපිටින් බලන කල පුද්ගලික පලප්‍රයෝජන ලුහුබැඳීමක් මෙන් නො පෙනෙන නමුත්, ඇත්ත වශයෙන් එය ඉතා ම පටු පුද්ගලවාදයට නිදසුනක් වේ, බලවත් ලෙස මළකඩ බැඳීමේ සහ ප්‍රධාන දෙයින් අහකට ඇදී යාමේ ගුණයක් එහි ඇත. "කුඩා කණ්ඩායම්" මානසිකත්වය රතු හමුදුව තුළ හොඳට ම තිබුණේ ය; විවේචනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තත්වය තරමක් හොඳ වී තිබෙන නමුදු, තවම ත් ඉතිරි වී පවතින යම් යම් දේ තිබේ, ඒවා පිටුදැකීමට තව-දුරට ත් පරිශ්‍රම දැරීම උවමනා කෙරේ.

3. "සේවක" මානසිකත්වය. තමන් සාමාජිකයන් වී සිටින පක්ෂය ත් රතු හමුදුව ත් යන දෙක ම විප්ලවයේ කර්තව්‍යයන් කරගෙන යාමට තිබෙන උපකරණ බව ඇතැම් සහෝදරවරුන්ට වැටහෙන්නේ නැත. තමන් ද විප්ලවය කරන්නන් බව තේරුම් නො ගන්නා ඔව්හු තමන්ගේ වගකීම හුදෙක් තමන්ගේ තනි තනි ප්‍රධානයන්ට ය, විප්ලවයට නො වේ ය'යි සිතති. මේ විප්ලවයේ "සේවකයකු" ගේ උනන්දුවෙන් තොර මානසිකත්වය ද පුද්ගලවාදය ප්‍රකට වන පිළිවෙලකි. විප්ලවය උදෙසා කොන්දේසි විරහිත ව වැඩ කරන ක්‍රියාකාරකයන් එතරම් ගණනක් නොමැත්තේ මන්ද යනු එයින් පැහැදිලි වේ. එය නැති කර දැමුවේ නැත් නම්, ක්‍රියාකාරකයන්ගේ ගණන නො වැඩෙනවා ඇත, විප්ලවයේ මහත් බර කුඩා පිරිසකගේ කර පිට වැටී තිබෙනවා ඇත; එයින් අරගලයේ යහපතට හානි සිදු වේ.

4. විනෝදකාමය. තමන්ගේ පුද්ගලවාදය විනෝදකාමය මගින් ප්‍රකාශයට පත් කරන මිනිස්සු සෑහෙන ගණනක් ද රතු හමුදුවෙහි සිටිති. තමන්ගේ සේනාංග මහ නගර වලට ගමන් කරනවා ඇතැ'යි ඔව්හු සැම විට ම පුල පුලා සිටිති. ඔවුන්ට එහි යන්ට උවමනා කරන්නේ වැඩ කරන්ට නො වේ, විනෝද වෙන්ට ය. ඔවුන් කැමති ම නැති දෙය ජීවිතය දුෂ්කර වූ රතු ප්‍රදේශ වල වැඩ කිරීම ය.

5. උකටලීබව. ඇතැම් සහෝදරවරු කිසියම් දෙයක් තමන්ගේ සිතුම් පැතුම් වලට පටහැනි වී යන හැම විට ම උකටලී බවට පත් වී වැඩ නො කර නිකම් සිටිති. මෙය ප්‍රධාන වශයෙන් අධ්‍යාපනයක් නොමැතිකමේ හේතුවෙන් වන නමුදු, ඇතැම් විට එය නායකත්වය විසින් කටයුතු කරගෙන යන, වැඩ පවරන සහ විනය ක්‍රියාවේ යොදන නොනිසි පිළිවෙලේ හේතුවෙන් ද වේ.

6. හමුදුව හැරයාමේ අභිලාෂය. රතු හමුදුවේ වැඩ වලින් ප්‍රාදේශික වැඩ වලට මාරු කරන ලෙස ඉල්ලන මිනිසුන්ගේ ගණන වැඩි වේගෙන යයි. මෙයට හේතුව මුළුමනින් ම පුද්ගලයන් වෙත ම නො ව, (1) රතු හමුදුවෙහි ජීවිතයේ ද්‍රව්‍යමය දුෂ්කරතා, (2) දීර්ඝ ලෙස අරගල කිරීමෙන් පසු ඇති වන තෙහෙට්ටුව සහ (3) නායකත්වය නොනිසි ලෙස කටයුතු කරගෙන යාම, වැඩ පැවරීම හෝ විනය ක්‍රියාවේ යෙදීම යන කරුණු වෙත ද රැඳී ඇත.

නිවැරදි කිරීමේ ක්‍රමය නම් මුලින් ම මතවාදී වශයෙන් පුද්ගලවාදයේ වැරදි හරිගස්සන සේ අධ්‍යාපනය ශක්තිමත් කිරීම ය. ඊළඟට, කටයුතු කරගෙන යාම ත්, වැඩ පැවරීම ත්, විනය ක්‍රියාවේ යෙදීම ත් නිසි ලෙස කිරීම ය. මීට අමතර ව, රතු හමුදුවේ ද්‍රව්‍යමය ජීවිතය දියුණු කිරීම පිණිස මං සොයා ගත යුතු ය, ද්‍රව්‍යමය තත්වයන් දියුණු කරනු පිණිස විවේකය ත් ප්‍රකෘතිමත් වීම ත් සඳහා ලබා ගත හැකි හැම ඉඩප්‍රස්තාවකින් ම ප්‍රයෝජන ගත යුතු ය. පුද්ගලවාදය, එහි සමාජ මූල අතින්, සුළු-ධනේශ්වර සහ ධනේශ්වර අදහස් පක්ෂය තුළ පිළිබිඹු වීමක් බව අපේ අධ්‍යාපන වැඩ වලදී අපි පහදා දිය යුත්තෙමු.

තැනින් තැන ඇවිදින කැරලිකාර පිරිස් වල මතවාදය ගැන

රතු හමුදුවෙහි සිටින නන්නත්තාර පුද්ගලයන්ගේ ගණන වෙනත් අය හා සම කර බලන විට විශාල නිසා ත්, චීනයෙහි, වෙසෙසින් දකුණු පළාත් වල, නන්නත්තාරේ යන මිනිසුන් මහත් සමූහයන් වශයෙන් සිටින

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

නිසා ත්, තැනින් තැන ඇවිදින කැරලිකාර පිරිස් වල දේශපාලන මතවාදය රතු හමුදවෙහි පහළ වී ඇත. මේ මතවාදය මතු දක්වන පරිදි ප්‍රකට වේ: (1) තැනින් තැන ඇවිදිමින් කරන ගොරිල්ලා ක්‍රියා මගින් පමණක් අපේ දේශපාලන බලපෑම වැඩි කරගන්ට සමහර අයට උවමනා කරයි; එහෙත් කඳවුරු ප්‍රදේශ ගොඩනැඟීමේ ත් ජනතාවගේ දේශපාලන බලය පිහිටුවීමේ ත් දුෂ්කර වැඩය බාර ගැනීමෙන් ඒ බලපෑම වැඩි කරගන්ට ඔව්හු කැමති නැත. (2) රතු හමුදව පළල් කිරීමේදී, සමහර අය ප්‍රාදේශික රතු මුර-භටයන් සහ ප්‍රාදේශික භටකණ්ඩායම් පළල් කොට, එසේ රතු හමුදවේ ප්‍රධාන බලසේනාවන් වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ගයට වඩා ''මිනිසුන් කුලියට ගැනීමේ සහ අශ්වයින් මිළයට ගැනීමේ'' ද ''පැන එන අය බන්ද ගැනීමේ සහ කැරලිගසන්නන් පිළිගැනීමේ''[3] ද ක්‍රියාමාර්ගය අනුගමනය කරති. (3) බහුජනයා සමග එකතු වී දුෂ්කර අරගල කරගෙන යන්ට ඉවසිල්ල සමහර අයට නැත; ඔවුන්ට උවමනා කරන්නේ මහ නගර වලට ගොස් හිත බඩ පුරා කන්ට බොන්ට පමණකි. තැනින් තැන ඇවිදින කැරලිකරුවන්ගේ මතවාදය ප්‍රකට වන මේ හැම විධියක් ම ස්වකීය නිසි කර්තව්‍යයන් ඉටු කිරීමේදී රතු හමුදවට බරපතල අවහිරයක් වේ; ඒ නිසා එය මුලිනුපුටා දැමීම රතු හමුදවේ පක්ෂ සංවිධානය තුළ ගෙනයන මතවාදි අරගලයේ වැදගත් අරමුණක් වේ. හුඅං චාඕ[4] හෝ ලි චුඅං[5] වර්ගයේ තැනින් තැන ඇවිදින කැරලිකරුවන්ගේ ක්‍රම වලට අද තිබෙන තත්වයන් යටතේ ඉඩක් නැති බව තේරුම් ගත යුතු ය.

නිවැරදි කිරීමේ ක්‍රම මතු දක්වන පරිදි ය:

1, අධ්‍යාපනය දැඩි කරන්න. වැරදි අදහස් විවේචනය කරන්න, තැනින් තැන ඇවිදින කැරලිකාර පිරිස් වල මතවාදය මුලිනුපුටා දමන්න.

2. නන්නත්තාරේ යන අය ඒ ඒ දේ බලන විධියට විරුද්ධ ව ක්‍රියා කරනු පිණිස රතු හමුදවේ මූලික කොටස් අතර ත් ළඟදී අල්ලාගෙන බන්ද ගත් අය අතර ත් අධ්‍යාපනය දැඩි කරන්න.

3. රතු හමුදව සෑදී තිබෙන පිළිවෙල වෙනස් කරන සේ අරගලයේ යෙදී අත්දැකීම් ලබා සිටින ක්‍රියාශීලී කම්කරුවන් සහ ගොවියන් එහි ශ්‍රේණි තුළට ඇද ගන්න.

4. සටන්කාමී කම්කරු සහ ගොවි බහුජන සමූහයන් අතුරෙන් රතු හමුදවේ අළුත් සේනාංග ඇති කරන්න.

කුමන්ත්‍රණවාදයෙන් ඉතිරි වී තිබෙන දේ ගැන

රතු හමුදවෙහි පක්ෂ සංවිධානය කුමන්ත්‍රණවාදයට විරුද්ධ ව දැනට ම ත් අරගල කර ඇත. එහෙත් තවම උවමනා තරම් දුරට කර නැත. එහෙයින්

මේ මතවාදයෙන් ඉතිරි වී තිබෙන දේ තවම රතු හමුදව තුළ පවතී. ඒවා ප්‍රකට වන විධි මෙසේ ය: (1) මනෝමූල සහ විෂයමූල තත්වයන් ගැන සැලකීමක් නැති ව අන්ධ ලෙස ක්‍රියා කිරීම; (2) නගර සඳහා තිබෙන පක්ෂයේ ප්‍රතිපත්ති අදක්ෂ ලෙස සහ අනිස්ථිර ලෙස භාවිතාවේ යෙදීම; (3) විශේෂයෙන් පරාජයක් ලැබූ අවස්ථාවන්හි, යුද්ධ විනය පිරිහීම; (4) ඇතැම් සේනාංග විසින් කරන ගෙවල් ගිනිතිබීමේ ක්‍රියා සහ (5) පැනයන්නන්ට වෙඩි තිබීමේ ත් ශාරීරික දඬුවම් දීමේ ත් සිරිත් — මේ දෙකේ ම කුමන්ත්‍රණවාදයේ රහ යන්තමට ඇත්තේ ය. එහි සමාජ මුල් අතින්, කුමන්ත්‍රණවාදය නන්නත්තාර–නිර්ධනපංක්ති මතවාදය ත් සුළු–ධනේශ්වර මතවාදය ත් එකට එකතු වී සැදුණු දෙයකි.

නිවැරදි කිරීමේ ක්‍රම මතු දක්වන පරිදි ය:

1. කුමන්ත්‍රණවාදය මතවාදි වශයෙන් මුලිනුපුටා දමන්න.

2. කුමන්ත්‍රණවාදි හැසිරීම නීති, රීති සහ ප්‍රතිපත්ති මගින් නිවැරදි කරන්න.

ස ට හ න්

[1]1927 දී විප්ලවය පැරදුණු පසු ටික කලකට, ''වාම'' කුමන්ත්‍රණවාදය දෙසට බරවන ගතියක් කොමියුනිස්ට් පක්ෂය තුළ පැනනැගිණි. චීන විප්ලවය ''නොනවතින විප්ලවයක්'' වශයෙන් ද, චීනයෙහි විප්ලවාදි තත්වය ''නොනවතින නැඟීමක්'' වශයෙන් ද සලකමින්, කුමන්ත්‍රණවාදි සහෝදරවරු පිළිවෙලකට කරන පසුබැසීමක් සංවිධානය කිරීම ප්‍රතික්ෂේප කළහ; අණදෙනවාදයේ ක්‍රම යොදමින් ද, පක්ෂ සාමාජිකයන් සුළු ගණනක් සහ බහුජනයා අතර සුළු කොටසක් කෙරෙහි විශ්වාසය තබමින් ද, සාර්ථක වීමේ බලාපොරොත්තුවක් නැති ප්‍රාදේශික පැනනැගීම් මාලාවක් රට පුරා ම ඇති කිරීමට වැරදි ලෙස ප්‍රයත්න දැරූහ. එබඳු කුමන්ත්‍රණවාදී වැඩකටයුතු 1927 තේ අවසාන හරියේදී බහුල ව පැතිරී ගිය නමුත් 1928 ටේ මුල හරියේදී අනුක්‍රමයෙන් අඩු වී ගියේ ය. එහෙත් කුමන්ත්‍රණවාදයට පක්ෂපාත අදහස් ඇතැම් සහෝදරවරුන් අතර එතෙකුත් ඉතිරි වී පැවතියේ ය.

[2]ගොරිල්ලා සංවිධාන ක්‍රමයෙහි කොලමක් යන්න නිත්‍ය හමුදවෙහි ඩිවිසනයකට සමාන විය. එහෙත් එහි භටසංඛ්‍යාව නිත්‍ය ඩිවිසනයක භටසංඛ්‍යාවට වඩා බෙහෙවින් ම නමනීය විය, සාමාන්‍යයෙන් ඊට වඩා හුඟක් කුඩා විය.

[3]මේ චීන වාග්ව්‍යවහාර දෙකෙන් චීන ඉතිහාසයෙහි එන ඇතැම් කැරලිකරුවන් තම බලසේනාවන් පළල් කරගැනීමට යෙදූ ක්‍රම සඳහන් වෙයි. මේ ක්‍රම භාවිතාවේ යෙදීමේදී, තත්වයට වඩා ගණන ගැන ම සැලකිල්ල දක්වනලද හෙයින්, ශ්‍රේණි තර කරගැනීම පිණිස නොයෙක් විධියේ මිනිස්සු විචාරයෙන් තොර ව බන්ද ගන්නාලදහ.

[4]හුඅං චාඕ තාං රජපෙළපතේ අවසාන සමයයෙහි ඇති වූ ගොවි කැරලි වල නායකයා විය. ක්‍රි: ව: 875 දී, තමා උපන් දිස්ත්‍රික්කය වූ ත්සාඕචව් (දැන් ශාන්ටුං පළාතේ හොත්සේ උප පළාත) වලින් පටන් ගනිමින්, හුඅං සන්නද්ධ ගොවියන් අධිරාජ බලසේනාවන්ට විරුද්ධ ව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙහෙයවා සටන් ජයගෙන, "දෙව්ලොවට පහර දෙන සෙන්පතියා"යි තමාට නම් පට්බැඳගත්තේ ය. අවුරුදු දහයක් ඇතුළත ඔහු කහ, යැංසි, හුආයි සහ මුතු යන ගංගා මිටියාවත් වල පිහිටි පළාත් අතුරෙන් වැඩි ගණනක් යට කරගෙන ගොස්, ක්වාංසි පළාත තරම් ඈතට ගියේ ය. ඔහු අවසානයේ තුංකුආන් දුර්ගය බිඳගෙන ඉදිරියට ගොස්, අධිරාජ අගනුවර වූ වාංආන් (දැන් ශෙන්සි පළාතේ සියාං) අල්ලාගෙන, චී අධිරාජයා වශයෙන් අභිෂේක ලැබී ය. තමන් අතර ම ඇති වූ අඬදබර ත්, තාං බලසේනාවන්ට සිටි හැන් ජාතික නො වන ගෝත්‍රිය මිත්‍රපාක්ෂිකයන් දුන් ප්‍රහාර ත් නිසා, වාංආන් අත්හැර තමා උපන් දිස්ත්‍රික්කයට පසුබසින්ට හුආංට බලෙන් ම සිදු විය; ඔහු එහිදී සිය පණ හානි කර ගත්තේ ය. ඔහු කළ දස අවුරුද්දක යුද්ධය චීන ඉතිහාසයෙහි ඉතා ම ප්‍රකට ගොවි යුද්ධ අතුරෙන් එකකි. "බදු සහ ගාස්තු බරින් මිරිකී මිරිකී සිටි සියලු ම මිනිස්සු ඔහු වටා එක්රොක් වූහ", යි රජපෙළපතේ ඉතිහාසකාරයන් විසින් වාර්තා කර ඇත. එහෙත් ඔහු කිසි දවසෙක තරමක් වත් තහවුරු කළ කඳවුරු ප්‍රදේශ පිහිටුවන්නේ නැති ව හුදෙක් තැනින් තැන ඇවිද ඇවිද යුද්ධ කරගෙන ගිය නිසා, ඔහුගේ බලසේනාවන්ට "තැනින් තැන ඇවිදින කැරලිකාර පිරිස්" යි කියනු ලැබී ය.

[5]ලී ත්සු-චෙං වුආං රජ (කිසිවකට බය නැති රජ) යන්නේ කෙටි ක්‍රමය වන ලී වුආං උතුරු ශෙන්සි පළාතේ මිචි පෙදෙසේ උපන්නෙකි; ඔහු මිං රජපෙළපත පෙරළා දමන්ට මුල් වූ ගොවි කැරැල්ලේ නායකයා විය. මේ කැරැල්ල පළමුවෙන් ආරම්භ වූයේ 1628දී උතුරු ශෙන්සි පළාතෙහි ය. කාඕ යිං-ශියාං විසින් නායකත්වය දෙනලද බලසේනාවන්ට බැඳුණු ලී හොනාන් සහ අන්හ්වෙයි පළාත් ඔස්සේ සටන් කරගෙන ගොස් ආපසු ශෙන්සි පළාතට ම ආවේ ය. 1636දී කාඕ මිය ගිය පසු, ලී ඔහුගේ තැන ගෙන, වුආං රජු බවට පත් වී, ශෙන්ශි, සෙචුආන්, හොනාන් සහ හූපේ පළාත් වලට වදිමින් පිටවමින් සටන් කරගෙන ගියේ ය. අන්තිමේදී 1644දී ඔහු අධිරාජ අගනුවර වූ පීකිං නුවර අල්ලාගත්තේ ය; එතැනදී අන්තිම මිං අධිරාජයා සිය පණ හානි කරගත්තේ ය. ඔහු බහුජනයා අතර පතළ කළ ප්‍රධාන සටන්පාඨය වූයේ "වුආං රජුට අනුබල දෙන්න, කිසි ම ධාන්‍ය බද්දක් නො ගෙවන්න" යනු යි. තම මිනිසුන් අතර විනය ක්‍රියාත්මක කරනු පිණිස වූ ඔහුගේ තවත් සටන්පාඨයක් මෙසේ විය: "කාව මරා දමතත් එය මගේ පියා මරා දමනවා වගෙයි; කොයි ස්ත්‍රිය දූෂණය කළත් එය මගේ මව දූෂණය කරනවා වගෙයි." මෙසේ ඔහු බහුජනයාගේ අනුබලය දිනාගත්තේ ය; ඔහු ගෙනගිය ව්‍යාපාරය රට පුරා ඇවිලෙමින් පැතුරුණු ගොවි කැරලි වල ප්‍රධාන ප්‍රවාහය විය. ඔහු ද තරමක් වත් තහවුරු කළ කඳවුරු ප්‍රදේශ පිහිටුවන්නේ නැති ව තැනින් තැන ඇවිද්ද නිසා, අන්තිමේදී එකමුතු වී ඔහුට පහර දීමට චිං හටකණ්ඩායම සමග කුමන්ත්‍රණය කළ මිං සෙන්පතියකු වූ වූ සාන්-කුඑයි විසින් පරාජය කරනු ලැබී ය.

එක ගිනිපුපුරකින් ලැව්ගින්නක් අවුළුවන්ට පුළුවනි

1930, ජනවාරි 5

දැනට පවතින තත්වය නිවැරදි ලෙස තක්සේරු කරන සැටි ත් ඒ එක්ක ම පැනනඟින කුමක් කළ යුතු ද යන ප්‍රශ්නය බේරුම් කරන සැටි ත් අපේ පක්ෂයේ සිටින ඇතැම් සහෝදරවරු තවම නො දනිති. විප්ලවවාදී වඩදිය නැඟීමක් වළකන්ට බැරි බව ඔවුන් විශ්වාස කරන නමුදු, එය අත ළඟ ම පවතින බව නම් ඔව්හු විශ්වාස නො කරති. එහෙයින්, ඔව්හු චියාංසි පළාත අල්ලාගැනීමේ සැලැස්ම අනුමත නො කරති, පූචියන්, ක්වංතුං සහ චියාංසි යන පළාත් වල දේශසීමාවන්හි පිහිටි ප්‍රදේශ තුනෙහි තැනින් තැන ඇවිදිමින් කරන ගොරිල්ලා ක්‍රියාවන් පමණක් අනුමත කරති; ඒ අතර ම, ගොරිල්ලා ප්‍රදේශ වල රතු දේශපාලන බලය පිහිටුවීම කොතරම් වැදගත් ද'යි ගැඹුරු අවබෝධයක් ඔවුන්ට නැති නිසා, රතු දේශපාලන බලය තහවුරු කිරීම සහ පළල් කිරීම තුළින් රට පුරා පැතුරුණු විප්ලවවාදී වඩදිය නැඟීම ඉක්මන් කිරීමේ අදහස ගැන ගැඹුරු අවබෝධයක් ඔවුන්ට නැත. විප්ලවවාදී වඩදිය නැඟීම තවම ඉතා ඈත තිබෙන දෙයක් නිසා, වෙහෙස වී වැඩ කරමින් දේශපාලන බලය පිහිටුවන්ට යත්න දැරීම අපතේ යන මහන්සියක් ය'යි ඔවුන් සිතන්නාක් මෙන් පෙනේ. එසේ කරනවා වෙනුවට, තැනින් තැන ඇවිදිමින් ගොරිල්ලා ක්‍රියාවන් කිරීමේ වඩා පහසු ක්‍රමය මගින් අපේ දේශපාලන බලපෑම ව්‍යාප්ත කරන්නට ඔවුන්ට උවමනා කරයි; රටේ හැම තැන ම බහුජනයා අපේ පැත්තට දිනා ගත් කල, හෝ තරමක් දුරට දිනා ගත් කල, රතු හමුදාව ද සහභාගි වීමෙන් රට පුරා ම පැතුරුණු මහා විප්ලවයක් බවට පත් විය හැකි රට පුරා ම පැතුරුණු සන්නද්ධ පැනනැඟීමක් දියත් කරන්නට ඔවුන්ට උවමනා කරයි. අප විසින් පළමුකොට රට පුරා ම පැතුරුණු පරිමාණයකින් සියලු ම ප්‍රාන්ත වල බහුජනයා අපේ පැත්තට දිනා ගත යුතු ය, ඉක්බිති දේශපාලන බලය පිහිටුවිය යුතු ය යන ඔවුන්ගේ න්‍යායය චීන විප්ලවයේ සැබෑ තත්වයට අනුරූප නො වේ. මේ න්‍යායය පහළ වන්නේ

මෙය එකල පක්ෂය තුළ පැවති යම් යම් අශුභවාදි මත විවේචනය කරමින් සහෝදර මාඕ සේතුං විසින් ලියනලද ලියමනකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රධාන වශයෙන් චීනය වනාහි බොහෝ අධිරාජ්‍යවාදී බලවතුන් තමතමන්ට අල්ලා ගැනීම පිණිස පොරකමින් සිටින අර්ධ-විජිත රටක් බව පැහැදිලි ලෙස තේරුම් ගන්ට බැරි වීමෙන් ය. යමෙක් මෙය පැහැදිලි ලෙස තේරුම් ගනී ද, ඔහු, පළමුකොට, පාලක පංක්ති තුළ දිගින් දිගට ම ඒ මේ අත පටලැවුණු යුද්ධ-කෝලාහල පැවතීමේ අසාමාන්‍ය ආශ්චර්යය චීනයෙහි පමණක් දක්නට ඇත්තේ මන්ද, මේ යුද්ධ-කෝලාහල ස්ථිර ලෙස ම දරුණුකමින් වැඩි වන්නේ ත් පැතිරෙන්නේ ත් මන්ද, එක්සත් කළ පාලන ක්‍රමයක් කිසි දවසක තිබී නැත්තේ මන්ද යනු තේරුම් ගන්නවා ඇත. දෙවැනි ව, ඔහු ගොවි ප්‍රශ්නයේ බරපතලකම ත්, එහෙයින් ගම්බද පැනනැඟීම් රට පුරා ම පැතුරුණු වර්තමාන පරිමාණයෙන් වර්ධනය වී ඇත්තේ මන්ද කියා ත් තේරුම් ගන්නවා ඇත. තුන්වැනි ව, ඔහු කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන බලය පිළිබඳ සටන්පාඨයේ නිවැරදිබව තේරුම් ගන්නවා ඇත. සිව්වැනි ව, ඔහු, එය ත් චීනයෙන් පිට දක්නට නැති දෙයක් ම වූ ද, මුලින් කී එක (එනම්, පාලක පංක්ති තුළ දිගින් දිගට ම ඒ මේ අත පට-ලැවුණු යුද්ධකෝලාහල පවතින්නේ චීනයෙහි ම පමණකි යන්න) අනුව එන එකක් වූ ද, තවත් අසාමාන්‍ය ආශ්චර්යයක්, එනම්, රතු හමුදාවේ සහ ගොරිල්ලා සේනාවන්ගේ පැවැත්ම සහ වර්ධනය ත්, ඒ සමග ම, සුදු පාලන-ක්‍රමය විසින් වට ලා තිබෙන කුඩා රතු ප්‍රදේශ වල පැවැත්ම සහ වර්ධනය ත් තේරුම් ගන්නවා ඇත; පස්වැනි ව, ඔහු අර්ධ-විජිත චීනයෙහි රතු හමුදාව, ගොරිල්ලා සේනාවන් සහ රතු ප්‍රදේශ පිහිටුවීම ත් පළල් කිරීම ත් නිර්ධනපංක්තියේ නායකත්වය යටතේ කරන ගොවි අරගලයේ උසස් ම ආකාරය බව, අර්ධ-විජිත ගොවි අරගලය වැඩීගෙන යාමෙන් නො වැළැකිය හැකි ලෙස ම ඇති වන ප්‍රතිඵලය බව සහ, රට පුරා ම විප්ලවවාදී වඩදිය නැඟීම ඉක්මන් කිරීමට තිබෙන නිසැකයෙන් ම ඉතා ම වැදගත් සාධකය බව තේරුම් ගන්නවා ඇත. හයවැනි ව, ඔහු මේ රට පුරා පැතුරුණු විප්ලව-වාදී වඩදිය නැඟීම ඉක්මන් කිරීමේ කර්තව්‍යය මුදුන්පත් කරලීමට හුදෙක් තැනින් තැන ඇවිදිමින් ගොරිල්ලා ක්‍රියාවන් කරන්ට කැඳවන ප්‍රතිපත්තියට බැරි බව ත්, ඒ අතර වූ තේ සහ මාඕ සේතුං විසින් ද එසේ ම පාං චි-මින්[1] විසින් ද අනුගමනය කරන ප්‍රතිපත්ති වර්ගය — ඒ කියන්නේ, කඳවුරු ප්‍රදේශ පිහිටුවීමේ ප්‍රතිපත්තිය, ක්‍රමානුකූල ව දේශපාලන බලය පිහිටුවීමේ ප්‍රතිපත්තිය, ඉඩම් ලබාගැනීමේ, විප්ලවය ගැඹුරු කිරීමේ ප්‍රතිපත්තිය, පළමු-කොට නියම්ගම් රතු මුරහට කණ්ඩායම්, ඊළඟට දිස්ත්‍රික්ක රතු මුරහට කණ්ඩායම්, ඊළඟට උප-පළාත් රතු මුරහට කණ්ඩායම්, ඊළඟට ප්‍රාදේශික රතු හමුද හටකණ්ඩායම් ආදී වශයෙන් දිගට ම නිත්‍ය රතු හමුද හටකණ්ඩායම් දක්වා යන විස්තීර්ණ ක්‍රියාවලියක් මගින් ජනතාවගේ සන්නද්ධ සේනාවන් පළල් කිරීමේ ප්‍රතිපත්තිය, රළ පෙළක් මෙන් ඉදිරියට යමින් දේශපාලන බලය පතුරුවා ලීමේ ප්‍රතිපත්තිය යනාදිය — නිසැකයෙන් ම නිවැරදි බව ත් තේරුම් ගන්නවා ඇත. රටේ හැම තැන ම විප්ලවවාදී බහුජනයාගේ

විශ්වාසය ගොඩනැඟිය හැකි වන්නේ, සෝවියට් සංගමය එය ලොව මුළුල්ලෙහි ම ගොඩනගා තිබෙන්නාක් මෙන්, මෙසේ පමණකි. ප්‍රතිගාමී පාලක පංක්ති වලට ඉමහත් දුෂ්කරතා ඇති කරලිය හැකි වන්නේ ද, ඔවුන්ගේ අඩිතාලම් සෙලවිය හැකි වන්නේ ද, ඔවුන් අභ්‍යන්තර වශයෙන් බිඳී විසිරී යාම ඉක්මන් කළ හැකි වන්නේ ද මෙසේ පමණකි. අනාගතයේ කරන්ට තිබෙන ශ්‍රේෂ්ඨ විප්ලවය සඳහා ප්‍රධාන අවිය වන රතු හමුදව නිර්-මාණය කරන්ට ඇත්ත වශයෙන් ම හැකි වන්නේ මෙසේ පමණකි. කොටින් විප්ලවවාදී වඩදිය නැඟීම ඉක්මන් කළ හැකි වන්නේ මෙසේ පමණකි.

විප්ලවවාදී ඉක්මන්කාරකමින් පෙළෙන සහෝදරවරු විප්ලවයේ මනෝමූල බලවේග[2] පමණට වැඩියෙන් තක්සේරු කරති, ප්‍රති-විප්ලවයේ බලවේග පමණට අඩුවෙන් තක්සේරු කරති. එබඳු තක්සේරු කිරීමක් ඇති වෙන්නේ ප්‍රධාන වශයෙන් මනෝමූලවාදයෙන් ය. අවසානයේදී, එය නිසැක-යෙන් ම කුමන්ත්‍රණවාදය කරා පමුණුවයි. අනික් අතට, විප්ලවයේ මනෝමූල බලවේග පමණට අඩුවෙන් තක්සේරු කිරීම සහ ප්‍රති-විප්ලවයේ බලවේග පමණට වැඩියෙන් තක්සේරු කිරීම ද නොනිසි තක්සේරු කිරීමක් වෙනවා ඇත, නියතයෙන් ම වෙන වර්ගයක නරක ප්‍රතිඵල ඇති කරනවා ඇත. එහෙයින්, චීනයෙහි දේශපාලන තත්වය විනිශ්චය කිරීමේදී, මතු දක්වන කරුණු තේරුම් ගැනීම අවශ්‍ය ය:

1. චීනයෙහි විප්ලවයේ මනෝමූල බලවේග දැන් දුර්වල නමුත්, ප්‍රතිගාමී පාලක පංක්ති වල සියලු සංවිධාන (එනම් දේශපාලන බල මණ්ඩල, සන්නද්ධ බලසේනා, දේශපාලන පක්ෂ යනාදිය) ද, ඒ සියල්ල චීනයේ නොදියුණු සහ අබල දුබල සමාජ ආර්ථික නිර්මිතිය මත රැඳී තිබෙන හෙයින්, එසේ ම දුර්වල ය. මෙය, බටහිර යුරෝපයේ රටවල් වල විප්ලවයේ මනෝමූල බලවේග බාගවිට දැනට චීනයෙහි මනෝමූල බලවේග වලට වඩා තරමක් ප්‍රබල නමුත් ඒ රටවල් වල ප්‍රතිගාමී පාලක පංක්ති වල බලවේග ද ඊට වඩා බොහෝ ගුණයක් ප්‍රබල වන හෙයින්, එහි විප්ලවය එක විට ම ඇති වෙන්ට බැරි මන්ද යනු පැහැදිලි කිරීමට ආධාරයක් වේ. චීනයෙහි, විප්ලවයේ මනෝමූල බලවේග දැනට දුර්වල නමුත් ප්‍රති-විප්ලවයේ බලවේග ද ඒ හා සමකර බලන විට දුර්වල නිසා විප්ලවය නිසැකයෙන් ම ඊට වඩා වේගයෙන් වඩදිය නැඟීමක් දෙසට ගමන් කරනවා ඇත.

2. විප්ලවයේ මනෝමූල බලවේග සත්තකින් ම 1927දී විප්ලවය පරාජයට පත් වූ තැන් සිට බෙහෙවින් දුර්වල වී ඇත. ඉතිරි වී තිබෙන බලවේග ඉතා කුඩා ය; බාහිර පෙනීම අනුව පමණක් විනිශ්චය කරන සහෝදරවරුන්ට අශුභවාදී හැඟීමක් ඇති වීම ස්වාභාවික ය. එහෙත් අපි හරය ගෙන ඒ අනුව විනිශ්චය කරමු නම්, එය වෙන ම කතන්දරයක් වේ. මෙහිදී අපට "එක ගිනිපුපුරකින් ලැව්ගින්නක් අවුළුවන්ට පුළුවනි" යන පැරණි චීන කියමන යොදන්ට හැකි ය. වෙන වචන වලින්, අපේ බලවේග,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දූනට කුඩා නමුත්, සීඝ්‍රයෙන් වැඩෙනවා ඇත. චීනයෙහි ඉස්මතු වී පවතින තත්වය තුළ, ඒවායේ වැඩීම, මැයි 30 ව්‍යාපාරයෙන්[3] ද ඊට අනතුරු ව ඇති වූ ශ්‍රෙෂ්ඨ විප්ලවයෙන් ද සම්පූර්ණයෙන් ම ඔප්පු වී තිබෙන පරිදි, සිදු වෙන්ට පුළුවන්වා පමණක් නො ව වළකන්ට බැරි ද වේ. අපි යමක් දෙස බලන විට, එහි හරය පරීක්ෂා කර බැලිය යුත්තෙමු; එහි බාහිර පෙනීමට සැලකිය යුත්තේ හුදෙක් එළිපත්ත ළඟ සිටින පෙරගමන්කරුවකුට සලකන හැටියට ය; අපි එළිපත්ත පැන්න වහා ම, ඒ දෙයේ හරය ග්‍රහණය කර ගත යුත්තෙමු;. විශ්ලේෂණය කිරීමේ එක ම විශ්වාස කටයුතු සහ විද්‍යාත්මක ක්‍රමය මෙය වේ.

3 එපරිද්දෙන් ම, ප්‍රති-විප්ලවවාදි බලවේග තක්සේරු කිරීමේදී, අපි කිසි කලෙක හුදෙක් ඒවායේ බාහිර පෙනීම දෙස ම නො බැලිය යුත්තෙමු, ඒවායේ හරය පරීක්ෂා කළ යුත්තෙමු. හූනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි අපේ ස්වාධීන පාලනක්‍රමයේ මුල් වකවනුවේදී, ඇතැම් සහෝදරවරු හූනාන් පළාත් කොමිටිය විසින් කළ වැරදි තක්සේරුව ඇත්තට ම විශ්වාස කොට, පංක්ති සතුරා හුණුවිටක් තරම් වත් නො වටිනා සේ සැළකූහ; අද දක්වා ම විහිළු කතා වශයෙන් පවතින ''හොඳට ම වැනෙන'' සහ ''හරියට ම කුලප්පු වී සිටින'' යන විශේෂණ වාක්‍යාංශ දෙක ඒ කාලයේ (1928වේ මැයි සිට ජූනි තෙක්) ලූ ති-පිං[4] නමැති හූනාන් පාලකයා තක්සේරු කිරීමේදී හූනාන් පළාත් කොමිටිය විසින් පාවිච්චි කරනලදී. එබඳු තක්සේරුවක් අවශ්‍යයෙන් ම දේශපාලන පරිමණ්ඩලයෙහි කුමන්ත්‍රණවාදය කරා පැමිණවී ය. එහෙත් ඒ අවුරුද්දේ නොවැම්බර් මාසයේ සිට 1929යේ පෙබරවාරි මාසය තෙක් සිව් මස තුළ, (චියාං කායි-ශෙක් සහ ක්වාංසි යුද-දෙටුවන් අතර යුද්ධයට පෙර,)[5] චිංකාං කඳු වලට විරුද්ධ ව කළ සතුරාගේ තුන්වැනි ''ඒකාබද්ධ මැඩලීමේ යුදගමන''[6]ට මුහුණ පා සිටියදී, ඇතැම් සහෝදරවරු ''කොපමණ කලක් රතු කොඩිය ලෙලදෙමින් තබා ගන්ට අපට හැකිවේවි ද?'' යන ප්‍රශ්නය ඇසූහ. සත්‍ය කරුණක් වශයෙන්, චීනයෙහි බ්‍රිතාන්‍යය ත් එක්සත් ජනපදය ත් ජපානය ත් අතර අරගලය ඒ වන විට හොඳට ම එළිපිට සිදු වෙමින් තිබුණි, චියාං කායි-ශෙක්, ක්වාංසි කල්ලිය සහ ෆෙං යූ-ශියාං අතර ඒ මේ අත පටලැවුණු යුද්ධ-කෝලාහල ඇතිවීමේ තත්වයක් හැඩගැසෙමින් තිබුණි; එහෙයින් එය ඇත්ත වශයෙන් ම ප්‍රති-විප්ලවවාදි වඩදිය බැහැගෙන යන්ට ත් විප්ලවවාදි වඩදිය යළි නඟින්ට ත් පටන්ගෙන තිබුණු කාලය විය. එහෙත් අශුභවාදි අදහස් දක්නට තිබුණේ රතු හමුදව සහ ප්‍රාදේශික පක්ෂ සංවිධාන තුළ පමණක් නො වේ; මධ්‍යම කාරකසභාව පවා බාහිර පෙනීම විසින් නොමග යවනු ලැබ, අශුභවාදි ස්වරයක් නඟා ගත්තේ ය. මධ්‍යම කාරකසභාවේ පෙබරවාරි ලියමන ඒ කාලයේ පක්ෂය තුළ කරනලද අශුභවාදි විශ්ලේෂණය පිළිබඳ සාක්ෂියක් වේ.

4. අද පවතින විෂයමූල තත්වය තවම කෙබඳු ද යත් තමන් ඉදිරියේ තිබෙන දෙයේ මතුපිට පෙනීම පමණක් දකින, හරය නො දකින සහෝදර-වරුන් නොමග යන්ට ඉඩ තිබේ. වෙසෙසින්, රතු හමුදවෙහි වැඩ කරන අපේ සහෝදරවරු, බලවත් සතුරු සේනාවන් විසින් සටනේදී තමන් පරාජය කරනු ලැබූ කල හෝ වටලනු ලැබූ කල හෝ ලුහුබඳිනු ලැබූ කල, බොහෝ විට, චීනයෙහි ත් මුළු එකක් වශයෙන් ලෝකයෙහි ත් පවතින තත්වයෙන් ශුභවාදය පිණිස කිසි ම හේතුවක් නො ලැබෙන්නා සේ ද, තව බොහෝ කලකට විප්ලවයට ජය ලැබීමේ බලාපොරොත්තුවක් නැත්තා සේ ද, තමන් සිටින ඒ මොහොතට අයත් විශේෂිත සහ සීමා සහිත තත්වය නො දැනු-වත් ව ම මෙන් පොදු දෙයක් කොට සහ පමණට වඩා ලොකු කොට සලකති. ඔවුන් ඒ ඒ දේ නිරීක්ෂණය කිරීමේදී බාහිර පෙනීම අල්ලා-ගැනීමේ ත් හරය පැත්තකට තල්ලු කර දැමීමේ ත් හේතුව ඔවුන් හැම දෙයක් ම ඇතුළත් තත්වයේ හරය ගැන විද්‍යාත්මක විශ්ලේෂණයක් නො කර තිබීම ය. චීනයෙහි ඉක්මනින් ම විප්ලවවාදි වඩදිය නැඟීමක් ඇති වේ ද යන ප්‍රශ්නය තීරණය කළ හැකි වන්නේ විප්ලවවාදි වඩදිය නැඟීමක් කරා පමුණුවන ප්‍රති-විරෝධයෝ ඇත්ත වශයෙන් ම වර්ධනය වෙත් ද කියා නිශ්චය කරනු පිණිස විස්තර වශයෙන් පරීක්ෂා කර බැලීමක් කිරීමෙන් පමණකි. ලෝකයෙහි අධිරාජ්‍යවාදි රටවල් අතර ද, අධිරාජ්‍යවාදි රටවල් සහ ඒවා සතු විජිත අතර ද, අධිරාජ්‍යවාදීන් සහ ඔවුන්ගේ ම රටවල් වල නිර්ධනපංක්තිය අතර ද ප්‍රතිවිරෝධයන් වර්ධනය වේගෙන යන හෙයින්, චීනය යටත් කරගැනීම පිණිස පොරකන්ට ලොකු උවමනාවක් අධිරාජ්‍ය-වාදීන් හට ඇත්තේ ය. චීනය ගැන අධිරාජ්‍යවාදීන් අතර ඇති පොරය, එය වඩ වඩා දැඩි වන කල, අධිරාජ්‍යවාදය සහ මුළු චීන ජාතිය අතර ඇති ප්‍රති-විරෝධය ත් අධිරාජ්‍යවාදීන් අතර ම ඇති ප්‍රතිවිරෝධ ත් යන දෙක ම එක විට චීන පොළොව මත වර්ධනය කරයි, එමගින් චීනයේ විවිධ ප්‍රතිගාමි පාලක කල්ලි අතර දිනක් පාසා ම පළල් වන සහ අධික වන ඒ මේ අත පටලැවුණු යුද්ධ-කෝලාහල ඇති කරයි, ඔවුන් අතර ඇති ප්‍රතිවිරෝධයන් දිගට ම වර්ධනය වීමට සලසයි. ප්‍රතිගාමි පාලක කල්ලි අතර ඇති ප්‍රති-විරෝධයන් — යුදදෙටුවන් අතර ඇති වන ඒ මේ අත පටලැවුණු යුද්ධ-කෝලාහල — පසුපස්සේ වඩ වඩා බර අයබදු පැනවීම එයි; එය අයබදු ගෙවන පුළුල් බහුජන සමූහයන් සහ ප්‍රතිගාමි පාලකයන් අතර ප්‍රතිවිරෝධය ස්ථිර ලෙස ම තියුණු කරයි. අධිරාජ්‍යවාදය සහ චීනයේ ජාතික කර්මාන්ත අතර ඇති ප්‍රතිවිරෝධය පසුපස්සේ චීන කර්මාන්තහිමියන්ට අධිරාජ්‍යවාදීන් ගෙන් සහන ලබාගැනීමට බැරි වීම එයි; එවිට චීන ධනපතියන් චියරු ලෙස කම්කරුවන් සූරාකෑමෙන් යන එන මගක් සොයාගැනීමට මාන බලන්ට ත් කම්කරුවන් ඊට විරුද්ධකම් පාන්ට ත් වන හෙයින්, එය චීන ධනේශ්වර-පංක්තිය සහ චීන කම්කරු පංක්තිය අතර ප්‍රතිවිරෝධය තියුණු කරයි. අධිරාජ්‍යවාදීන් කරන වාණිජ්‍ය ආක්‍රමණය, චීන වෙළඳ-ධනපතියන් කරන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොල්ලකෑම, ආණ්ඩුව වඩ වඩා බර අයබදු පැනවීම යනාදිය පසුපස්සේ ඉඩම්හිමි පංක්තිය සහ ගොවිජනයා අතර ප්‍රතිවිරෝධය ගැඹුරු වීම එයි; ඒ කියන්නේ, ඉඩම්බදු සහ ගිනිපොලිය මගින් කරන සූරාකෑම බරපතල වන බව ත්, ඉඩම්හිමියන් කෙරෙහි ගොවියන්ගේ වෛරය වැඩෙන බව ත් ය. පිටරටින් ගෙනෙන බඩු වලින් ඇති වන පීඩනය ත්, කම්කරු සහ ගොවි බහුජනයාගේ මිල දී ගැනීමේ ශක්තිය ක්ෂය වීම ත්, ආණ්ඩුවේ අයබදු පැනවීම වැඩි වීම ත් නිසා, චීනයේ තනන බඩු විකුණන අය සහ ස්වාධීන නිෂ්පාදකයන් අතර බංකලොත්බවට පත් වන අයගේ ගණන තව තව ත් වැඩි වේ. ප්‍රතිගාමී ආණ්ඩුව, කෑම බීම ආදිය සහ අරමුදල් හිඟ නමුත් කෙළවරක් නැති ව 'තම හමුදුවන් පළල් කරමින්, එසේ යුද්ධ–කෝලාහල ව්‍යාප්ත කරන නිසා, සෙබළ සමූහයන් නිතර ම සිටින්නේ අගහිඟකමින් පෙළෙන තත්වයක ය. ආණ්ඩුවේ අයබදු පැනවීම වැඩි වීම ත්, ඉඩම්හිමියන් ඉල්ලා සිටින ඉඩම්බදු සහ පොලිය නැඟීම ත්, යුද්ධයෙන් සිදුවන විනාශයන් දිනපතා ම පැතිරීම ත් නිසා, හැම තැන ම සාගතය හා මංපැහැරීම් පවතී; ගොවි බහුජනයාට ත් නගරබද දුප්පත් මිනිසුන්ට ත් පණ රැක ගන්ට බැරි තරම් ය. පාසල් වලට මුදල් නැති නිසා, බොහෝ ශිෂ්‍යයෝ තම අධ්‍යාපනය කඩාකප්පල් වේ දෝ හෝ'යි බියෙන් තැවෙති; නිෂ්පාදනය නොදියුණු නිසා, බොහෝ උපාධිධාරීන්ට රක්සාවක් ලැබීමේ බලාපොරොත්තුව නැත. අප මේ සියලු ප්‍රතිවිරෝධයන් තේරුම් ගත් කල, චීනය අද වැටී සිටින්නේ කෙබඳු බලාපොරොත්තු සුන් වූ දරුණු තත්වයකට ද, කෙබඳු ආකූල ව්‍යාකූල තත්වයකට ද කියා අපට පෙනෙනවා ඇත. අධිරාජ්‍යවාදීන්ට, යුදදෙටුවන්ට සහ ඉඩම්හිමියන්ට විරුද්ධ විප්ලවය නමැති වඩදියේ නැඟීමක් නො වැළකිය හැකි බව ත්, එය ඉතා ඉක්මනින් ම එන බව ත්, අපට එසේ ම පෙනෙනවා ඇත. මුළු චීනය පුරා ම වියලි කෝටුම්ටි විසිරී ඇත, ඒවා ඉක්මනින් ම ගිනි ඇවිලෙනවා ඇත. "එක ගිනිපුපුරකින් ලැව්ගින්නක් අවුළුවන්ට පුළුවනි" යන කියමන දැනට පවතින තත්වය වර්ධනය වන අන්දම උචිත ලෙස විස්තර කරයි. එක "ගිනිපුපුරක්" "ලැව් ගින්නක්" අවුළුවන්ට පෙර වැඩි කලක් නො යන බව තේරුම් ගැනීමට අප විසින් කළ යුත්තේ බොහෝ තැන් වල වර්ධනය වන කම්කරුවන්ගේ වැඩවර්ජන, ගොවියන්ගේ පැනනැඟීම්, සෙබළුන්ගේ කැරලිගැසීම් සහ ශිෂ්‍යයන්ගේ වැඩවර්ජන දෙස බැලීම පමණකි.

ඉහතින් කී දෙයෙහි ලුහුඬු අදහස 1929, අප්‍රියෙල් 5වැනි ද පෙරමුණු කොමිටිය විසින් මධ්‍යම කාරකසභාව වෙත යවනලද ලියමනෙහි දැනට ම ත් අඩංගු වී ඇත; ඒ ලියමනේ කොටසක් මෙසේ ය:

> මධ්‍යම කාරකසභාවේ [1929 පෙබරවාරි 9වැනි ද දිනය දරණ] ලියමන විෂයමූල තත්වය ත් අපේ මනෝමූල බලවේග ත් ගැන හුහක් ම අශුභවාදී වූ තක්සේරුවක් කරයි. චිංකාං කඳු වලට විරුද්ධ ව

> ඇරඹූ කුඔමින්තාං පක්ෂයේ තුන්වැනි "මැඩලීමේ" යුද්ධව්‍යාපාරය ප්‍රති–විප්ලවයේ වඩදිය නැඟුණු ඉහළ ජල මට්ටම විය. එහෙත් එය එතැනදී නතර විය; එතැන් සිට ප්‍රති–විප්ලවයේ වඩදිය අනුක්‍රමයෙන් බැස ගොස් ඇති අතර විප්ලවයේ වඩදිය අනුක්‍රමයෙන් නැඟී ඇත. අපේ පක්ෂයේ සටන් කිරීමේ හැකියාව ත් සංවිධානාත්මක ශක්තිය ත් මධ්‍යම කාරකසභාව විසින් විස්තර කර තිබෙන දුරට දුර්වල වී තිබෙන නමුත්, ඒවා සීඝ්‍රයෙන් පෙර තිබුණු තත්වයට පත් වෙනවා ඇත, ප්‍රති-විප්ලවයේ වඩදිය අනුක්‍රමයෙන් බැස යන විට පක්ෂයේ සහෝදරවරුන් අතර තිබෙන උදාසීනබව ඉක්මනින් ම පහ වෙනවා ඇත. බහුජනයා සත්තකින් ම අපේ පැත්තට එනවා ඇත. කුඔමින්තාං පක්ෂයේ සමූහඝාතන ප්‍රතිපත්තියෙන් සිදු වන එක ම සේවය, කියමනට කියන හැටියට "මාළුවා ගැඹුරු දියට පැන්නීම"[7] පමණකි; ප්‍රතිසංස්කරණවාදය තවදුරට ත් බහුජනයාගේ සිත් අලවන්නේ නැත. බහුජනයා ඉක්මනින් ම කුඔමින්තාං පක්ෂය ගැන තිබෙන තමන්ගේ මුළාවන් ඉවත දමනවා සහතික ය. බිහිවෙමින් එන තත්වය තුළ, බහුජනයා තම පැත්තට දිනාගැනීමෙහි ලා කොමියුනිස්ට් පක්ෂය සමග තරග කරන්ට වෙන කිසි ම පක්ෂයකට බැරි වෙනවා ඇත. පක්ෂයේ හයවැනි ජාතික සම්මේලනය[8] විසින් සම්මත කරනලද දේශපාලන ක්‍රියාමාර්ගය ත් සංවිධානාත්මක ක්‍රියාමාර්ගය ත් නිවැරදි ය; ඒ කියන්නේ, වර්තමාන අවස්ථාවෙහි විප්ලවය සමාජවාදී නො ව ප්‍රජාතන්ත්‍රවාදී බව ය, පක්ෂය සතු [මෙහිදී "මහ නගර වල" යන වචන මුලින් එකතු කළ යුතු ව තිබුණි][9] වර්තමාන කර්තව්‍යය බහුජනයා අපේ පැත්තට දිනා ගැනීම සහ වහා ම පැනනැඟීම් ඇති නො කිරීම ය. එසේ ද වුව විප්ලවය සීඝ්‍රයෙන් වර්ධනය වෙනවා ඇත, සන්නද්ධ පැනනැඟීම් පිණිස අප කරන ප්‍රචාරක කටයුතු වලදී ත් සූදනම් වීම් වලදී ත් අපි සක්‍රිය ආකල්පයක් ගත යුත්තෙමු. වර්තමාන ආකූල ව්‍යාකූල තත්වයේදී බහුජනයාට නායකත්වය දෙන්ට අපට හැකි වන්නේ සක්‍රිය සටන්පාඨ සහ සක්‍රිය ආකල්පයක් මගින් පමණකි. එබඳු ආකල්පයක් ගැනීමෙන් පමණකි තම සටන් කිරීමේ හැකියාව නැවත ඇති කරගන්ට පක්ෂයට හැකි වන්නේ . . . . විප්ලවයේදී ජය ලබන්ට තිබෙන එක ම යතුර නිර්ධනපංක්ති නායකත්වය යි. පක්ෂයට නිර්ධනපංක්ති අඩිතාලමක් ගොඩනැඟීම ත් ප්‍රධාන දිස්ත්‍රික්ක වල කර්මාන්ත ව්‍යවසායයන්හි පක්ෂ ශාඛා පිහිටුවීම ත් දැනට පක්ෂයට තිබෙන වැදගත් සංවිධානාත්මක කටයුතු වේ; එහෙත් ඒ අතර ම නගර වල අරගලයට ආධාර කිරීම පිණිස ත් විප්ලවවාදී වඩදිය නැඟීම ඉක්මන් කිරීම පිණිස ත් කලින් ම තිබිය යුතු ප්‍රධාන දේ නම් විශේෂිත වශයෙන් ම ගම්බදපෙදෙසෙහි අරගලය වර්ධනය කිරීම, කුඩා ප්‍රදේශ වල රතු දේශපාලන බලය

LIBERATION BASE

https://liberationbase.wordpress.com

පිහිටුවීම සහ, රතු හමුදව ඇති කිරීම හා පළල් කිරීම ය. එහෙයින් නගර වල අරගලය අතහැර දැමීම වරදක් විය හැකි වුව ත්, අපේ මතය අනුව, ගොවි ශක්තිය කම්කරුවන්ගේ ශක්තිය ඉක්මවා ගොස් විප්ලවයට හානි සිදු කරනවා ඇතැ'යි සිතමින් අපේ පක්ෂ සාමාජිකයන් අතර කිසිවකු ගොවි ශක්තිය වැඩෙනවාට බිය වීම ද වරදක් වෙනවා ඇත. කවර හෙයින් ද යත්, අර්ධ–විජිත චීනයෙහි විප්ලවයේදී ගොවි අරගලයට කම්කරුවන්ගේ නායකත්වය නො ලැබුණොත් ඒ අරගලය සැම විට ම ව්‍යර්ථ විය යුතු ම වන නමුත්, ගොවි අරගලය කම්කරුවන්ගේ බලවේග ඉක්මවා යතොත් එයින් කිසි කලෙක විප්ලවයට හානි නො වන නිසා ය.

රතු හමුදවේ සටන් උපක්‍රම සම්බන්ධයෙන් ද මතු දක්වන පිළිතුර ලිපියෙහි අඩංගු විය:

> රතු හමුදව රැක ගැනීම සහ බහුජනයා අවදි කිරීම පිණිස, අපේ බලසේනාවන් ඉතා කුඩා සේනාංග බවට බෙද ඔවුන් ගම්බදපෙදෙස පුරා විසුරුවා හරින ලෙස ත්, චූ තේ සහ මාඕ සේතුං හමුදවෙන් ඉවත් කරගන්නා ලෙස ත්, එසේ ප්‍රධාන ඉලක්ක වසං කරන ලෙස ත් මධ්‍යම කාරකසභාව අපට කියයි. මෙය අසත්වාදී මතයකි. 1927–28වෙ සීතසෘතුවේදී, සතුරාට ඉලක්කයක් ඉදිරිපත් නො කරන්ට උත්සාහ කරන අතර ම බහුජනයා අවදි කරනු වස් කැමති කැමති ලෙස ක්‍රියා කරන්ට සහ ගොරිල්ලා උපක්‍රම යොදන්ට එක් එක් කොම්පඤ්ඤයට හෝ බැටැලියමට ඉඩ දෙමින්, අපේ බලසේනාවන් ගම්බදපෙදෙස පුරා විසුරුවා හැරීමට අපි සැලැස්ම කළෙමු; අප බොහෝ වතාවක් මේ දේ කරන්ට උත්සාහ කර බැලූ නමුත්, ඒ හැම වතාවේ ම එය ව්‍යර්ථ විය. හේතු මේවා ය: (1) රතු හමුදවේ ප්‍රධාන සේනාවේ සිටින සෙබළුන් වැඩි දෙනා වෙන ප්‍රදේශ වලින් පැමිණි අය වෙති; ඔවුන්ට ඇත්තේ රතු මුරහටයන්ගේ පසුබිමට වෙනස් පසුබිමකි; (2) කුඩා සේනාංග වලට බෙදීමේ ප්‍රතිඵලය වන්නේ නායකත්වය දුර්වල වීම ත් අහිතකර වටාපිටා තත්වයන් සමග ඔට්ටු වීමට අසමත් වීම ත් ය; එයින් පහසු වෙන් ම පරාජය කරා මග පැදේ; (3) සේනාංග සතුරා විසින් එකින් එක විනාශ කරනු ලැබීමට ඉඩ තිබේ; (4) වටාපිටා තත්වයන් වැඩි වැඩියෙන් අහිතකර වන පමණට අපේ බලසේනාවන් ඒකරාශි කිරීම ත් නායකයන් අරගලයෙහි ලා ස්ථිර වීම ත් වැඩි වැඩියෙන් උවමනා වේ; සතුරාට විරුද්ධ ව අභ්‍යන්තර සමගිය ඇති කරගැනීමට අපට හැකි වන්නේ එසේ පමණක් නිසා ය. ගොරිල්ලා සටන්ව්‍යාපාර පිණිස අපේ බලසේනාවන් බෙදීම නුවණට හුරු වන්නේ හිතකර තත්වයන් තුළ පමණකි, අහිතකර තත්වයන් ඇති විට සිටිය යුතු පරිදි, නායකයන් හැම විට ම ශ්‍රේණින් සමග සිටීම උවමනා නො වන්නේ එවිට පමණකි.

> මේ ඡේදයේ ඇති දුර්වලකම නම් බලසේනාවන් බෙදීමට විරුද්ධ ව ඉදිරිපත් කර තිබෙන හේතු නිෂ්ක්‍රිය ලක්ෂණයකින් යුක්ත වීම ය; එය කොහෙත් ම ප්‍රමාණවත් නො වේ. අපේ බලසේනාවන් ඒකරාශි කිරීම පිණිස ඇති සක්‍රිය හේතුව නම් සංසන්දනාත්මක වශයෙන් විශාල සතුරු සේනාංග මුල්පිස දැමීමට ත් නගර අල්ලා ගැනීමට ත් අපට හැකි වන්නේ බලසේනාවන් ඒකරාශි කිරීමෙන් පමණක් ම වීම ය. අප විසින් සංසන්දනාත්මක වශයෙන් විශාල සතුරු සේනාංග මුල්පිස දමා නගර අල්ලාගත් පසු පමණකි, විශාල පරිමාණයකින් බහුජනයා අවදි කිරීමට ත් යාබද උපපළාත් ගණනක් පුරා පැතුරුණු දේශපාලන බලය පිහිටුවීමට ත් අපට හැකි වන්නේ. එසේ පමණකි පුළුල් ලෙස පැතුරුණු ගැටීමක් ("අපේ දේශපාලන බලපෑම ව්‍යාප්ත කිරීම" ය'යි අප කියන දේ) ඇති කිරීමට ත් විප්ලවයේ වඩදිය නැඟෙන දිනය ඉක්මන් කරන්නට සාර්ථක ලෙස සේවයක් ඉටු කිරීමට ත් අපට හැකි වන්නේ. නිදසුන් වශයෙන්, ගිය අවුරුද්දට කලින් අවුරුද්දේ හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි අප පිහිටුවූ පාලනක්‍රමය ත් ගිය අවුරුද්දේ බටහිරි පූචියන් පළාතේ අප පිහිටුවූ පාලනක්‍රමය[10] ත් යන දෙක ම අපේ බලසේනාවන් ඒකරාශි කිරීම පිළිබඳ මේ ප්‍රතිපත්තියෙන් ඇති වූ දෙය විය. මෙය පොදු මූලධර්මයකි. එහෙත් අපේ බලසේනාවන් බෙදිය යුතු වේලාවල් නැද්ද? ඔව්, තිබේ. පෙරමුණු කොමිටියෙන් මධ්‍යම කාරකසභාවට යැවුණු ලියමන, කෙටි අරයක් ඇතුළත හරියේ බලසේනාවන් බෙදීම ඇතුළු ව, රතු හමුදව සඳහා ගොරිල්ලා උපක්‍රම ගැන කියයි:

> ඉකුත් අවුරුදු තුනේ අරගලයෙන් අප ලබාගෙන තිබෙන උපක්‍රම සත්තකින් ම පුරාණ හෝ නූතන, චීන හෝ විදේශීය, සෙසු සියලු උපක්‍රම වලට වෙනස් ය. අපේ උපක්‍රම මගින් සදු පළල් වන පරිමාණයකින් අරගල කරනු පිණිස බහුජනයා අවදි කළ හැකි ය; කොතරම් බලවත් වුව ද, කිසි ම සතුරකුට අප හා ඔට්ටු විය නො හැකි වේ. අපේ වනාහි ගොරිල්ලා උපක්‍රම ය. ඒවා ප්‍රධාන වශයෙන් මතු දක්වන අංග වලින් යුක්ත ය:
>
> "බහුජනයා අවදි කිරීමට අපේ බලසේනාවන් බෙදන්න, සතුරා ගැන ක්‍රියා කිරීමට අපේ බලසේනාවන් ඒකරාශි කරන්න."
>
> "සතුරා ඉදිරියට එන විට, අපි පසුබසිමු; සතුරා කඳවිටි ගසාගෙන සිටින විට, අපි හිරිහැර කරමු; සතුරා වෙහෙසට පත් වූ විට, අපි පහර දෙමු; සතුරා පසුබසින විට, අපි ලුහුබඳිමු."
>
> "ස්ථාවර කඳවුරු ප්‍රදේශ[11] ව්‍යාප්ත කරනු පිණිස, රළින් රළ ඉදිරියට යාමේ ප්‍රතිපත්තිය යොදන්න; බලවත් සතුරකු විසින් ලුහුබඳිනු ලබන කල, අවට වටේට යාමේ ප්‍රතිපත්තිය යොදන්න."

LIBERATION BASE

https://liberationbase.wordpress.com

''හැකි තරම් කෙටි ම කලක් ඇතුළත හැකි තරම් හොඳ ම ක්‍රම මගින් බහුජනයා හැකි තරම් වැඩි ම ගණනක් අවදි කරන්න.''

මේ උපක්‍රම දැලක් එළීම වැනි ය; කොයි මොහොතේ හෝ දැල එළන්නට, නැතහොත් අකුළා ඇද ගන්නට අපට පුළුවන් විය යුතු ය. අපි බහුජනයා අපේ පැත්තට දිනාගැනීම පිණිස එය විහිදෙන්ට එළමු, සතුරා ගැන ක්‍රියා කිරීම පිණිස අකුළා ඇද ගනිමු. ඉකුත් අවුරුදු තුනේ ම අප යෙදූ උපක්‍රම එබඳු ය.

මෙහි ''දැල විහිදෙන්ට එළීම'' යන්නේ අදහස අවට කෙටි අරයක් ඇතුළත හරියේ බලසේනාවන් බෙදීම ය. උදාහරණ වශයෙන්, අප විසින් හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි යුංශින් උප–පළාත් නගරය පළමු වරට අල්ලා ගත් අවස්ථාවේ, අපි 29වැනි සහ 31වැනි රෙජමේන්තු වල බලසේනාවන් යුංශින් උප–පළාතේ සීමාවන් ඇතුළත බෙදීමු. යළිත්, යුංශින් නගරය අප විසින් තුන්වැනි වරට ත් අල්ලා ගත් අවස්ථාවෙහි, අපි 28වැනි රෙජමේන්තුව ආන්පු උප–පළාතේ දේශසීමාවට ද, 29වැනි රෙජමේන්තුව ලියන්හුආවට ද, 31වැනි රෙජමේන්තුව චියාන් උප–පළාතේ දේශසීමාවට ද පිටත් කර යැවීමෙන් අපේ බලසේනාවන් තවත් වරක් බෙදීමු. එසේ ම, යළිත්, ගිය අප්‍රියෙල් මාසයේදී සහ මැයි මාසයේදී දකුණු චියාංසි පළාතේ උප–පළාත් වලදී ත්, ගිය ජූලියේදී බටහිරි පූචියන් පළාතේ උප–පළාත්-වලදී ත් අපි අපේ බලසේනාවන් බෙදීමු. පුළුල් අරයක් ඇතුළත හරිය පුරා අපේ බලසේනාවන් බෙදීම සම්බන්ධයෙන්, එසේ කළ හැකි වන්නේ වටාපිටා තත්වයන් සංසන්දනාත්මක වශයෙන් හිතකර වීම සහ නායකත්වය දෙන මණ්ඩල තරමක් ශක්තිමත් වීම යන කොන්දේසි දෙක උඩ පමණකි. කවර හෙයින් ද යත් අපේ බලසේනාවන් බෙදීමේ අභිප්‍රාය බහුජනයා අපේ පැත්තට දිනා ගැනීම පිණිස ත්, ඉඩම් ලබාගැනීමේ විප්ලවය ගැඹුරු කිරීම හා දේශපාලන බලය පිහිටුවීම පිණිස ත්, රතු හමුදාව සහ ප්‍රාදේශික සන්නද්ධ සේනාංග පළල් කිරීම පිණිස ත් අප වඩා හොඳ තත්වයකට පත් කර ගැනීම වන නිසා ය. මීට අවුරුදු දෙකකට පෙර අගෝස්තුවේදී චෙන්චව් නුවරට පහර දෙන්ට ගොස් අපේ බලසේනාවන් හුනාන්–චියාංසි දේශ-සීමාවෙහි බෙදූ සිටියදී සිදු වූණාක් මෙන්, මේ අභිප්‍රාය මුදුන්පත් කර ගන්ට බැරි විට හෝ අපේ බලසේනාවන් බෙදීමෙන් පරාජයට මග පෑදීම ත් රතු හමුදාව දුර්වල වීම ත් සිදු විය හැකි විට හෝ අපේ බලසේනාවන් නො බෙදීම වඩා හොඳ ය. එහෙත්, ඉහත සඳහන් කළ කොන්දේසි දෙක ඇත් නම්, අප අපේ බලසේනාවන් බෙදිය යුතු බවට කිසි ම සැකයක් නැත; එවිට බල-සේනාවන් බෙදීම ඔවුන් ඒකරාශි කරනවාට වඩා වාසිදායක වන නිසා ය.

මධ්‍යම කාරකසභාවේ පෙබරවාරි ලියමන හරි ජීවගුණයෙන් යුක්ත නො වී ය, සිව්වැනි හමුදාවේ පක්ෂ සාමාජිකයන් ගණනක් කෙරෙහි නරකට බලපෑවේ ය. මධ්‍යම කාරකසභාව ඒ කාලයේ චියාං කායි–ශෙක් සහ ක්වාංසි

යුදදෙටුවන් අතර යුද්ධයක් අවශ්‍යයෙන් ම ඇති නො වෙනවා ඇතැ'යි පවසමින් චක්‍රලේඛයක් ද නිකුත් කළේ ය. එතැන් සිට, කෙසේ වෙතත්, මධ්‍යම කාරකසභාවේ තක්සේරු කිරීම් සහ නිර්දේශ මුඛ්‍ය වශයෙන් නිවැරදි වී ඇත. එය වැරදි තක්සේරු කිරීම අඩංගු වූ චක්‍රලේඛය නිවැරදි කරමින් තවත් චක්‍රලේඛයක් දැනට ම නිකුත් කර තිබේ. එය රතු හමුදාවට එවූ ලියමන නම් නිවැරදි කර නැති නමුත්, ඊට අනතුරු ව එවූ නිර්දේශ එම අශුභවාදී ස්වරයෙන් ම වචනයට නඟා නැත, රතු හමුදාවේ සටන්ව්‍යාපාර ගැන එහි මත දැන් අපේ මත හා සැසඳේ. එතෙකුදු වුව මේ ලියමනෙන් ඇතැම් සහෝදරවරුන් කෙරෙහි ඇති වූ නරක විපාකය තවම ත් පවතී. එහෙයින්, කිසියම් කරුණු පහදා දීමක් කිරීම තවම ත් අවශ්‍ය ය යනු මගේ හැඟීම වේ.

අවුරුද්දක් ඇතුළත චියාංසි පළාත ගැනීමේ සැලැස්ම ද ගිය අප්‍රියෙල් මාසයෙහි පෙරමුණු කොමිටිය විසින් මධ්‍යම කාරකසභාවට යෝජනා කරනලදී; එසේ කිරීමට තීරණයක් පසු ව යුතු නුවරදී කරනලදී. මධ්‍යම කාරකසභාව වෙත යැවූ ලියමනෙහි මතු දක්වන හේතු දෙනලදී:

> චියාං කායි–ශෙක්ගේ ත් ක්වාංසි යුදදෙටුවන්ගේ ත් හමුදාවෝ කියු-චියාං අසල ඔවුනොවුන්ට ළං වෙමින් සිටිති, ලොකු සටනක් ඔන්න මෙන්න කියා ඇත. බහුජන අරගලය නැවත පටන්ගැනීම ත්, ඒ එක්කම පාලක ප්‍රතිගාමීන් අතර ප්‍රතිවිරෝධයන් පැතිරීම ත් නිසා විප්ලවයේ වඩදිය නැඟීමක් ඉක්මනින් ම ඇති විය හැකි ය. මේ වටාපිටා තත්ව-යන් යටතේ අපේ වැඩ කෙසේ පිළිවෙල කළ යුතු ද යන්න ගැන කියනවා නම්, දකුණු පළාත් සම්බන්ධයෙන්, ක්වංතුං සහ හුනාන් පළාත් වල කොම්ප්‍රදෝරුවරුන්ගේ ත් ඉඩම්හිමියන්ගේ ත් සන්නද්ධ බලසේනාවන් හුඟක් ශක්තිමත් බව ද, එමතු නො ව, හුනානයෙහි, පක්ෂය කළ කුමන්ත්‍රණවාදී වැරදි කරණකොටගෙන, පක්ෂය තුළ ත් ඉන් පිටත ත් අපට තිබුණු බහුජන අනුගාමිකත්වය මුළුමනින් ම වගේ අපට නැති වී තිබෙන බව ද අපේ හැඟීම වේ. කෙසේ වෙතත්, පූචියන්, චියාංසි සහ චෙචියාං යන පළාත් තුනෙහි තත්වය වෙනස් ය. පළමුවැනි ව, යුද්ධ කටයුතු අතින් සතුරා එහි ඉතා ම දුර්වල ය. චෙචියාං පළාතෙහි සිටින්නේ චියාං පෝ–චෙං[12] යටතේ එක් කුඩා පළාත්බද බලසේනාවක් පමණකි. පූචියන් පළාතෙහි, සියල්ල ම ගත් කල, මුළු ගණනින් රෙජමේන්තු දහහතරක් වන සතුරු භටකණ්ඩායම් පහක් සිටින නමුත්, කුඕ පෙං–මිංගේ භටකණ්ඩායම දැනට ම වනසා දමා ඇත; චෙන් කුඕ–හුයි සහ ලූ ශිං–පාං[13] යටතේ සිටින භටයෝ සුළු සටන් හැකියාවක් ඇති පල්හොරු ය; වෙරළ ඔස්සේ නතර කර සිටින නාවිකභට බ්‍රිගේඩ දෙක කිසි දිනක සටන් කිරීමක් දැක නැත, නිසැකයෙන් ම ඔවුන්ගේ සටන් හැකියාව උසස් නො වේ; මොකක් හෝ සටනක් දිය හැක්කේ චාං චෙන්[14] ට පමණක් ම ය; එහෙත් පූචියන් පළාත් කොමිටිය කර තිබෙන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විශ්ලේෂණය අනුව, ඔහුට පවා සිටින්නේ සාපේක්ෂක වශයෙන් ශක්තිමත් රෙජමේන්තු දෙකක් පමණි. ඊට අමතර ව, පූචියන් පළාත දැන් පවතින්නේ සම්පූර්ණයෙන් ම ආකුල ව්‍යාකුල සහ භේදභින්න වූ තත්වයක ය. චියාංසි පළාතෙහි, චූ පෙයි–තේ[15] ගේ සහ ශියුං ශි–හුයි[16]ගේ විධාන දෙක යටතේ රෙජමේන්තු දහසයක් තිබේ; ඒවා පූචියන් පළාතේ හෝ වෙචියාං පළාතේ සන්නද්ධ බලසේනාවන්ට වඩා ශක්තිමත් නමුත්, හුනාන් පළාතේ ඒවාට වඩා හුඟක් ම ශක්තියෙන් අඩු ය. දෙවැනි ව, මේ පළාත් තුනේ කර තිබෙන කුමන්ත්‍රණවාදී වැරදි ගණනින් අඩු ය. වෙචියාං පළාතේ තත්වය ගැන අපේ වැටහීම පැහැදිලි නැත, නමුත් චියාංසි සහ පූචියන් පළාත් වල පක්ෂයේ සංවිධානාත්මක සහ බහුජන පදනම හුනාන් පළාතේ පදනමට වඩා තරමක් හොඳ ය. උදහරණ වශයෙන් චියාංසි ගනිමු. උතුරු චියාංසි පළාතෙහි තේහාන්, ශියුශුයි සහ තුංකු යන ස්ථානයන්හි කිසියම් පදනමක් අපට තවම තිබේ; බටහිරි චියාංසි පළාතෙහි නිංකාං, යුංශින්, ලියන්හුආ සහ සුයිචුආන් යන ස්ථානයන්හි පක්ෂයට ත් රතු මුරභටයන්ට ත් කිසියම් ශක්තියක් තවම තිබේ; දකුණු චියාංසි පළාතෙහි චියාන්, යුංපෙං සහ ශිංකුඕ යන උප-පළාත් වල රතු හමුදවේ 2වැනි සහ 4වැනි රෙජ-මේන්තු ස්ථිර ලෙස ම ශක්තියෙන් වැඩීගෙන යන හෙයින්, මතු බලාපොරොත්තු වඩාත් ම ප්‍රභාමත් ය; එපමණක් නො ව, පාං චි–මින් යටතේ සිටින රතු හමුදව කිසිසේත් ම මුල්පිස දමා නැත. මේ සියල්ල නාන්චාං නුවරට පැති කීපයකින් ළඟා විය හැකි තත්වයක අප තබයි. කුඕමින්තාං යුදදෙටුවන් අතර දිගින් දිගට යන යුද්ධ–කෝලාහල පවතින වකවනුව තුළ, අප චියාංසි පළාත ත් බටහිරි පූචියන් පළාත සහ බටහිරි වෙචියාං පළාත ත් අල්ලා ගැනීම පිණිස චියාං කායි–ශෙක් සහ ක්වාංසි කල්ලිය සමග පොර ඇල්ලිය යුතු බව අපි මෙයින් මධ්‍යම කාරකසභාව වෙත අනුමත කරමු. මේ සැලැස්ම සම්පූර්ණ කිරීම පිණිස එක් අවුරුද්දක කාලසීමාවක් ඇති ව, අපි මේ පළාත් තුනේ රතු හමුදව විශාල කළ යුත්තෙමු, බහුජනයාගේ ස්වාධීන පාලනක්‍රමයක් ඇති කළ යුත්තෙමු.

චියාංසි පළාත පිණිස පොර ඇල්ලීමට කළ මේ යෝජනාව වැරදුණේ එක් අවුරුද්දක කාලසීමාවක් පැණවීමෙන් පමණකි. පළාතේ ම පැවති තත්වයන් පමණක් නො ව, රට පුරා ම විප්ලවයේ වඩදිය නැඟීමක් ඉක්ම-නින් ම ඇති වෙනවා ඇතැ'යි යන මතු බලාපොරොත්තුව ද ඊට පදනම විය. කවර හෙයින් ද යත්, ඉක්මනින් ම විප්ලවයේ වඩදිය නැඟීමක් ඇති වේ ය'යි අපට ඒත්තු ගොස් තිබුණා නම් මිස, අපට අවුරුද්දකින් චියාංසි පළාත ගත හැකි ය'යි නිගමනය කරන්ට අපට පුළුවන්කමක් නො තිබුණු නිසා ය. යෝජනාවෙහි වූ එක ම දුර්වලකම එය එක් අවුරුද්දක කාල

සීමාවක් පැණවීම ය; එය එසේ නො කළ යුතු ව තිබුණි; එයින් සිදු වූයේ ''විප්ලවයේ වඩදිය නැඟීමක් ඉක්මනින් ම ඇති විය හැකි ය'' යන ප්‍රකාශ-යෙහි ''ඉක්මනින්'' යන වචනයට ඉක්මන්කාරකමේ රහක් දීම ය. චියාංසි පළාතෙහි මනෝමූල සහ විෂයමූල තත්වයන් සම්බන්ධයෙන්, ඒවා කෙරෙහි අපේ අවධානය යොමු කිරීම හොඳට ම සුදුසු ය. මධ්‍යම කාරකසභාවට යැවූ ලියමනෙහි විස්තර කර තිබෙන මනෝමූල තත්වයන් හැරුණු කල, විෂයමූල තත්ව තුනක් දැන් පැහැදිලි ලෙස ම පෙන්වා දිය හැකි ය. පළමු-වැනි ව, චියාංසි පළාතේ අර්ථක්‍රමය මුඛ්‍ය වශයෙන් රදළ ය, වෙළඳ–ධනපති පංක්තිය සංසන්දන වශයෙන් දුර්වල ය, ඉඩම්හිමියන්ගේ සන්නද්ධ සේනාවෝ අන් කවර දකුණු පළාතක හෝ සේනාවන්ට වඩා දුර්වල ය. දෙවැනි ව, චියාංසි පළාතට ඊට ම අයත් පළාත්බද භටකණ්ඩායම් නැත, සැම විට ම එය රකිනු පිණිස නතර කර සිටින්නේ වෙන පළාත් වලින් එවූ භටකණ්ඩායම් ය. ''කොමියුනිස්ට්වාදීන් මැඩලීම'' පිණිස හෝ ''පල්හොරුන් මැඩලීම'' පිණිස එහි එවා සිටින මේ භටකණ්ඩායම් ප්‍රදේශයේ තත්වයන් හොඳින් දන්නේ හඳුනන්නේ නැත, ඔවුන්ගේ පලප්‍රයෝජන ඔවුන් ප්‍රාදේශික භටකණ්ඩායම් වුණා නම් පටලැවෙන තරමට කෙළින් ම පටලැවී නැත, පටලැවී ඇත්තේ ඊට වඩා හුඟක් අඩුවෙනි; සාමාන්‍යයෙන් ඔවුන් තුළ උද්‍යෝගයක් නැත. තුන්වැනි ව, හොංකොං දූපතට කිට්ටු වූ ත් හැම අතින් ම වගේ බ්‍රිතාන්‍ය ග්‍රහණය යටතේ පවත්නා වූ ත් ක්වංතුං පළාත මෙන් නො ව, චියාංසි පළාත අධිරාජ්‍යවාදීන්ගේ බලපෑමෙන් සංසන්ද-නාත්මක වශයෙන් හුඟක් ඈත ය. අප මේ කරුණු තුන හොඳින් වටහා ගත් කල, අන් කිසි ම පළාතකට වඩා චියාංසි පළාතෙහි ගම්බද පැනනැඟීම් බහුල වන්නේ ත්, රතු හමුද සහ ගොරිල්ලා සේනාංග ගණනින් බොහෝ වන්නේ ත් මන්ද යනු තේරුම් ගන්ට අපට හැකි වේ.

''විප්ලවයේ වඩදිය නැඟීමක් ඉක්මනින් ම ඇති විය හැකි ය'' යන ප්‍රකාශයෙහි එන ''ඉක්මනින්'' යන වචනය එසේ නම් අප විසින් විස්තර කළ යුත්තේ කෙසේ ද? මෙය සහෝදරවරුන් අතර පොදු ප්‍රශ්නයකි. මාක්ස්-වාදියෝ ජෙන–කියන්නෝ නො වෙත්. ඔවුන් කළ යුත්තේ ත්, සත්තකින් ම ඔවුන්ට කළ හැකි වන්නේ ත්, අනාගත වර්ධනයන් සහ වෙනස්වීම් සිදුවන සාමාන්‍ය අත පෙන්නුම් කිරීම පමණකි; ඔවුන් යාන්ත්‍රික පිළිවෙලකට දිනය ත් පැය ත් නියම නො කළ යුතු ය. එසේ කරන්ට ඔවුන්ට බැරි ය. එහෙත් චීනයෙහි විප්ලවයේ වඩදිය නැඟීමක් ඉක්මනින් ම ඇති වේ ය'යි මා කියන කල, මා කතා කරන්නේ ඇතැම් මිනිසුන්ගේ වචන වලින් කියතොත් ''වෙන්ට පුළුවන්'' කිසියම් දෙයක් ගැන නො වන බව, මායාවක් වැනි වූ ත්, අත්පත් කරගත නො හැකි වූ ත්, ක්‍රියාව පිණිස කිසි වැදගත්-කමක් නොමැති වූ ත් කිසියම් දෙයක් ගැන නො වන බව, අවධාරණයෙන් ම කියමි. එය වෙරළේ සිට බලන කල කුඹ–හිස පෙනෙන්ට පටන්ගෙන තිබෙන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඈත මුහුදේ එන නැවක් වැනි ය; එය කඳු මුදුනක සිට බලන කල දිදුලන රැස් දහර පෙනෙන්ට පටන්ගෙන තිබෙන පෙරදිග අහසේ උදා හිරු වැනි ය; එය සිය මව් කුසයෙහි ඉවසිලි රහිත ව දඟලමින් සිටින දූන් දූන් බිහි වෙන්ට යන දරුවකු වැනි ය.

ස ට හ න්

[1]චියාංසි පළාතේ යියාං වල උපන්නකු වූ ද, චීන කොමියුනිස්ට පක්ෂයේ හයවැනි මධ්‍යම කාරකසභාවේ සාමාජිකයකු වූ ද සහෝදර ෆාං චි-මින් ඊසානදිග චියාංසි පළාතේ රතු ප්‍රදේශයේ ත් දසවැනි රතු හමුදාවේ ත් ආරම්භකයා විය. 1934දී ඔහු ජපන් ආක්‍රමණිකයන්ට විරුද්ධකම් පෑම පිණිස උතුර බලා ගමන් කරද්දී රතු හමුදාවේ පෙරමුණු බළඇණියට නායකත්වය දුන්නේ ය. 1935 ජනවාරියේදී ඔහු ප්‍රති-විප්ලවවාදි කුඕමින්තාං හටකණ්ඩායම් සමග කළ සටනකදී අල්ලාගනු ලැබී ය, ජූලියේදී චියාංසි පළාතේ නාන්චාං නුවරදී දිවි පුදන වීරයකු සේ මරණයට කැප විය.

[2]විප්ලවයේ මනෝමූල බලවේග යන්නෙන් අදහස් වන්නේ විප්ලවයේ සංවිධානය කළ බලවේග ය.

[3]මැයි 30 ව්‍යාපාරය 1925, මැයි 30 වැනි ද ශැංහයි නුවරදී බ්‍රිතාන්‍ය පොලිසිය විසින් චීන ජනතාව සමූහඝාතනය කිරීමට විරෝධය පළ කිරීම පිණිස පැනනැඟුණු රට පුරා පතළ අධිරාජ්‍ය විරෝධි ව්‍යාපාරය විය.

[4]කුඕමින්තාං යුද්දෙටුවකු වූ ලූ ති-පිං 1928දී හූනාන් පළාතේ කුඕමින්තාං ආණ්ඩුකාරයා විය.

[5]නැන්කිං නුවර කුඕමින්තාං යුද්දෙටුවා වූ චියාං කායි-ශෙක් ද ක්වාංසි පළාතේ කුඕමින්තාං යුද්දෙටුවන් වූ ලි ත්සුං-රන් සහ පායි චූං-ශී ද අතර 1929යේ මාර්තු-අප්‍රියෙල් මාස වල ඇති වූ යුද්ධය.

[6]1928 අවසානයේ සිට 1929 මුල තෙක් හූනාන් සහ චියාංසි පළාත් වල කුඕමින්තාං යුද්දෙටුවන් විසින් චිංකාං කඳු වල රතු හමුදාවේ කඳවුරු ප්‍රදේශයට කළ තුන්වැනි අතික්‍රමණය.

[7]මෙ උද්ධෘතපාඨය තම ජනයා පරහිතනිරත පාලකයකු සෙවීමට එළවන කෲර පාලකයකු "මාළුවා ගැඹුරු දියට පන්නන" දියබල්ලකුට සමාන කළ මෙන්සියස් ගෙන් ය.

[8]චීන කොමියුනිස්ට පක්ෂයේ හයවැනි ජාතික සම්මේලනය පවත්වනලද්දේ 1928 ජූලියේ ය. 1927දී ලැබූ පරාජයට පසු, චීනයේ විප්ලවය එහි ස්වභාවයෙන් ධනේශ්වර-ප්‍රජාතන්ත්‍රවාදී ව, එනම්, අධිරාජ්‍ය-විරෝධි ව සහ රදළ-විරෝධි ව, පවතින බව ද, නො වැළකිය හැකි ලෙස ම ඇති වන විප්ලවයේ අළුත් වඩදිය නැඟීම එකෙක් අත ළඟ ම නො වූ නිසා, විප්ලවය පිණිස පොදු ක්‍රියාමාර්ගය විය යුත්තේ බහුජනයා මේ පැත්තට දිනාගැනීම බව ද එම සම්මේලනය පෙන්වා දුන්නේ ය. හයවැනි සම්මේලනය චෙන් තු-ශියුගේ 1927තේ දක්ෂිණ යටත්විම්වාදය දිය කර දැමී ය, 1927 අවසානයේදී සහ 1928 මුලදී පක්ෂය තුළ ඇති වූ "වාම" කුමන්ත්‍රණවාදය ද ප්‍රතික්ෂේප කළේ ය.

[9]වරහන් ඇතුළේ තිබෙන ප්‍රකාශය කර්තෘ විසින් එකතු කර තිබේ.

[10]බටහිරි පූචියන් පළාතේ පිහිටුවනලද පාලනක්‍රමය ඇති වූයේ 1929දී, චිංකාං කඳු වල සිටි රතු හමුදාව අළුත් විප්ලවවාදි කඳවුරු ප්‍රදේශයක් ඉදිකිරීම පිණිස නැගෙනහිර දෙසට නික්ම ගොස්, ඒ පළාතේ බටහිරි කොටසෙහි ලුංයන්, යුංතින් සහ ශාංහාං යන උප-පළාත් වල ජනතාවගේ විප්ලවවාදි දේශපාලන බලය පිහිටුවූ අවස්ථාවේ ය.

[11]ස්ථාවර කඳවුරු ප්‍රදේශ කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ රතු හමුදාව විසින් පිහිටුවනලද සාපේක්ෂක වශයෙන් ස්ථාවර වූ විප්ලවවාදි කඳවුරු ප්‍රදේශ විය.

[12]චියාං පෝ-චෙං එකල චෙචියාං පළාතෙහි කුඕමින්තාං ආණ්ඩුවේ සාම සංරක්ෂණ බළකායයේ අණදෙන්නා විය.

[13]චෙන් කුඕ-හුයි සහ ලූ ශිං-පාං පූචියන් පළාතේ නම්දරාපු පල්හොරු දෙදෙනෙක් වූහ; ඔවුන්ගේ බලපිරිස් කුඕමින්තාං හමුදාවට ඈදාගෙන තිබුණි.

[14]චාං චෙන් කුඕමින්තාං හමුදාවේ ඩිවිසන් අණදෙන්නෙක් විය.

[15]කුඕමින්තාං යුද්දෙටුවකු වූ වූ පෙයි-තේ එකල චියාංසි පළාතේ කුඕමින්තාං ආණ්ඩුකාරයා විය.

[16]ශියුං ශි-හුයි එකල චියාංසි පළාතේ කුඕමින්තාං හමුදාවේ ඩිවිසන් අණදෙන්නෙක් විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

චීනයේ විප්ලවවාදි යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු

1936, දෙසැම්බර්

පරිච්ඡේද 1

යුද්ධය හදරන හැටි

1. යුද්ධයේ නීති වැඩෙන සුලු ය

LIBERATION BASE

යුද්ධයේ නීති යුද්ධයකට මග පෙන්වන කවරකු විසින් හෝ හැදෑරිය යුතු සහ විසඳිය යුතු ගැටළුවකි.

විප්ලවවාදි යුද්ධයේ නීති විප්ලවවාදි යුද්ධයකට මග පෙන්වන කවරකු විසින් හෝ හැදෑරිය යුතු සහ විසඳිය යුතු ගැටළුවකි.

චීනයේ විප්ලවවාදි යුද්ධයේ නීති චීනයේ විප්ලවවාදි යුද්ධයට මග පෙන්වන කවරකු විසින් හෝ හැදෑරිය යුතු සහ විසඳිය යුතු ගැටළුවකි.

අපි දැන් යුද්ධයක යෙදී සිටිමු; අපේ යුද්ධය විප්ලවවාදි යුද්ධයකි; අපේ විප්ලවවාදි යුද්ධය කරන්නේ මේ අර්ධ-විජිත අර්ධ-රදළ චීන රටෙහි ය. එහෙයින්, අපි සාමාන්‍ය වශයෙන් යුද්ධයේ නීති පමණක් නො ව, විප්ලවවාදි යුද්ධයේ විශේෂිත නීති ද, චීනයේ විප්ලවවාදි යුද්ධයේ ඊට ත් වඩා විශේෂිත නීති ද හැදෑරිය යුත්තෙමු.

සහෝදර මාඕ සේතුං මේ කෘතිය ලිවේ දෙවැනි විප්ලවවාදි සිවිල් යුද්ධයේ අත්දැකීම සම්පිණ්ඩනය කිරීමට ය; ඔහු එය උතුරු ශෙන්සි පළාතේ රතු හමුද විද්‍යාලයේදී පැවැත්වූ කම දේශන සඳහා පාවිච්චි කළේ ය. සම්පූර්ණ කර තිබුණේ පරිච්ඡේද පහක් පමණකි. උපාය-මාර්ගික පහරදීම, දේශපාලන වැඩ සහ වෙනත් ගැටළු ගැන පරිච්ඡේද සියාන් සිද්ධිය නිසා ඔහු කාර්යබහුල ව සිටියෙන් නිමවා නො තිබිණි. දෙවැනි විප්ලවවාදි සිවිල් යුද්ධය පැවති කාලයේදී යුද්ධ කටයුතු පිළිබඳ ප්‍රශ්න ගැන පක්ෂය තුළ පැවති ප්‍රධාන මතභේදයක ප්‍රතිඵලයක් වූ මේ කෘතිය, යුද්ධ කටයුතු වලදී එක් ක්‍රියාමාර්ගයකට විරුද්ධ ව අනික් ක්‍රියාමාර්ගයක් ප්‍රකාශ කරයි. 1935 ජනවාරියේදී ත්සුන්යි නුවර පවත්වනලද මධ්‍යම කාරකසභාවේ දේශපාලන

ඔබ යමක් කරන කල, එහි සැබෑ වටාපිටා තත්වයන් ද, එහි ස්වභාවය ද, වෙනත් දේට එහි ඇති සබඳකම් ද ඔබට තේරෙනවා නම් මිස, එය පාලනය කරන නීති ඔබට නො වැටහෙන බව, නැතහොත් එය කරන සැටි ඔබට නො වැටහෙන බව, නැතහොත් එය හොඳින් කරන්නට ඔබට බැරි වෙන බව කවුරු ත් දන්නා දෙයකි.

යුද්ධය වනාහි පංක්ති අතර, ජාතීන් අතර, රාජ්‍යයන් අතර හෝ දේශ-පාලන කණ්ඩායම් අතර ප්‍රතිවිරෝධයන් එක්තරා අවස්ථාවකට වර්ධනය වූ කල, ඒ ප්‍රතිවිරෝධයන් විසඳීම පිණිස තිබෙන උසස් ම අරගල ආකාරය වේ; එය පුද්ගලික දේපළ ත් පංක්ති ත් පහළ වූ ද සිට ම පැවතී ඇත. යුද්ධයේ සැබෑ වටාපිටා තත්වයන් ද, එහි ස්වභාවය ද, වෙනත් දේ වලට එහි ඇති සබඳකම් ද ඔබට තේරෙනවා නම් මිස, ඔබට යුද්ධයේ නීති නො වැට-හෙනවා ඇත, නැතහොත් යුද්ධයකට මග පෙන්වන සැටි නො වැටහෙනවා ඇත, නැතහොත් ජය දිනාගන්ට බැරි වෙනවා ඇත.

විප්ලවවාදි යුද්ධයකට, එය විප්ලවවාදි පංක්ති යුද්ධයක් වුව ද, විප්ලව-වාදි ජාතික යුද්ධයක් වුව ද, සාමාන්‍ය වශයෙන් යුද්ධයකට අයත් වටාපිටා තත්වයන්ට සහ ස්වභාවයට අමතර වශයෙන්, ඊට ම අයත් විශේෂිත වටාපිටා තත්වයෝ ද ස්වභාවයක් ද ඇත. එහෙයින්, යුද්ධයේ සාමාන්‍ය නීති හැරුණු කල, ඊට ම අයත් විශේෂිත නීති ද ඊට තිබේ. එහි විශේෂිත වටාපිටා තත්වයන් සහ ස්වභාවය ඔබට තේරෙනවා නම් මිස, එහි විශේෂිත නීති ඔබට තේරෙනවා නම් මිස, විප්ලවවාදි යුද්ධයකට සාර්ථක ලෙස මග පෙන්වන්ට ත්, එය සාර්ථක ලෙස කරගෙන යන්ට ත් ඔබට බැරි වෙනවා ඇත.

චීනයේ විප්ලවවාදි යුද්ධය, එය සිවිල් යුද්ධය වුව ද, ජාතික යුද්ධය වුව ද, චීනයේ විශේෂිත පරිසරය තුළ කරනු ලබන හෙයින්, එය සාමාන්‍ය වශයෙන් යුද්ධය ත් සාමාන්‍ය වශයෙන් විප්ලවවාදි යුද්ධය ත් යන දෙකෙන් ම වෙන් කොට දක්වන ඊට ම අයත් විශේෂිත වටාපිටා තත්වයෝ ත් ස්වභාවය ත් ඊට ඇත. එහෙයින්, සාමාන්‍ය වශයෙන් යුද්ධයේ නීති ත් සාමාන්‍ය වශයෙන් විප්ලවවාදි යුද්ධයේ නීති ත් හැරුණු කල, ඊට ම අයත් විශේෂිත නීති ඊට ඇත. ඔබට ඒවා තේරෙනවා නම් මිස, චීනයේ විප්ලවවාදි යුද්ධයේදී ජය දිනාගන්ට ඔබට බැරි වෙනවා ඇත.

බියුරෝවේ විශාල කළ රැස්වීම යුද්ධ ක්‍රියාමාර්ගය පිළිබඳ මතභේදය බෙරුම් කළේ ය, සහෝදර මාඕ සේතුංගේ මත ස්ථිර කළේ ය, වැරදි ක්‍රියාමාර්ගය ප්‍රතික්ෂේප කළේ ය. 1935 ඔක්තෝබරයේදී මධ්‍යම කාරකසභාව උතුරු ශෙන්සි පළාතට ගියේ ය; දෙසැම්බරයේදී සහෝදර මාඕ සේතුං දෙවැනි විප්ලවවාදි සිවිල් යුද්ධයේදී පක්ෂයේ දේශපාලන ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් පැවති ගැටළු ක්‍රමානුකූල ව විසඳූ "ජපන් අධිරාජ්‍යවාදයට විරුද්ධ ව යොදන උපක්‍රම ගැන" නමැති වාර්තාවක් ඉදිරිපත් කළේ ය. ඔහු චීනයේ විප්ලවවාදි යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු ක්‍රමානුකූල ලෙස පැහැදිලි කරනු පිණිස ඊට අවුරුද්දකට පසු 1936දී මේ කෘතිය ලිවේ ය.

https://liberationbase.wordpress.com

එහෙයින්, අපි සාමාන්‍ය වශයෙන් යුද්ධයේ නීති හැදෑරිය යුත්තෙමු; අපි විප්ලවවාදි යුද්ධයේ නීති ද හැදෑරිය යුත්තෙමු; අවසාන වශයෙන්, අපි චීනයේ විප්ලවවාදි යුද්ධයේ නීති ද හැදෑරිය යුත්තෙමු.

ඇතැම් අය බොහෝ කලකට උඩදී අප විසින් බිඳ හෙළනලද වැරදි මතයක් දරති. සාමාන්‍ය වශයෙන් යුද්ධයේ නීති නිකමට මෙන් හැදෑරීම සෑහේ ය'යි, නැතහොත් වඩාත් ඇති සැටියෙන් ම කියතොත්, ප්‍රතිගාමී චීන ආණ්ඩුව විසින් හෝ චීනයෙහි ප්‍රතිගාමී යුද්ධ විද්‍යායතන විසින් හෝ ප්‍රසිද්ධ කර තිබෙන යුද්ධ අත්පොත් නිකමට මෙන් අනුගමනය කිරීම සෑහේ ය'යි, ඔව්හු කියති. මේ අත්පොත් වලින් උදක් කරන්නේ සාමාන්‍ය වශයෙන් යුද්ධයේ නීති දීම බව ත්, එමතු නො ව ඒවා මුළුමනින් ම පිටරටවල් වලින් පිටපත් කර තිබෙන බව ත්, අප ඒවා ආකාරයෙන් හෝ අඩංගු–දෙයින් පොඩ්ඩක් වත් වෙනස් නො කොට එසේ ම පිටපත් කොට භාවිතාවේ යොදතොත්, අප කරන්නේ ''සපත්තු වලට ගැලපෙන්ට කකුල් කපා'' ගෙන, පරාජයට පත් වීම බව ත්, ඔවුන්ට නො පෙනේ. ඔවුන්ගේ තර්කය මෙසේ ය: ලෙයින් මිල ගෙවා අත්පත් කරගෙන තිබෙන දැනුම පලක් නැති වන්නේ මන්ද? එසේ අත්පත් කරගෙන තිබෙන කලින් ලැබුණු අත්දැකීම් අප විසින් ආදරයෙන් මතක තබාගත යුතු බව සැබෑ නමුත්, අපේ ම ලෙයින් මිල ගෙවා අත්පත් කරගෙන තිබෙන අත්දැකීම් ද අප විසින් ආදරයෙන් මතක තබාගත යුතු බව වටහා ගන්ට ඔව්හු අසමත් වෙති.

වෙන අය අප විසින් බොහෝ කලකට උඩදී එසේ ම බිඳ හෙළනලද දෙවැනි වැරදි මතයක් දරති. උදක් රුසියාවෙහි විප්ලවවාදි යුද්ධයේ අත්දැකීම හැදෑරීම සෑහේ ය'යි, නැතහොත් වඩාත් ඇති සැටියෙන් ම කියතොත්, උදක් සෝවියට් සංගමයෙහි සිවිල් යුද්ධයට මග පෙන් වූ නීති සහ සෝවියට් යුද්ධ සංවිධානයන් විසින් ප්‍රසිද්ධ කර තිබෙන යුද්ධ අත්පොත් අනුගමනය කිරීම සෑහේ ය'යි, ඔව්හු කියති. මේ නීති සහ අත්පොත් සෝවියට් සංගමයෙහි සිවිල් යුද්ධයේ ත් රතු හමුදාවේ ත් විශේෂිත අංගලක්ෂණ ගැබ් කර ගන්නා බව ත්, අප ඒවා කිසි ම වෙනස් කිරීමකට ඉඩ නො දී පිටපත් කොට භාවිතාවේ යොදතොත්, අප කරන්නේ ඒත් ''සපත්තු වලට ගැලපෙන්ට කකුල් කපා'' ගෙන, පරාජයට පත්වීම බව ත් ඔවුන්ට නො වැටහේ. ඔවුන්ගේ තර්කය මෙසේ ය: අපේ යුද්ධය ත්, සෝවියට් සංගමයෙහි යුද්ධය මෙන් ම, විප්ලවවාදි යුද්ධයක් වන හෙයින් ද, සෝවියට් සංගමය ජය දිනාගත් හෙයින් ද, සෝවියට් ආදර්ශය අනුගමනය කරනවා විනා කළ හැකි වෙන දෙයක් කෙසේ තිබිය හැකි ද? සෝවියට් සංගමයෙහි යුද්ධ අත්දැකීම ඉතා ම මෑතදී ලබාගත් විප්ලවවාදි යුද්ධ අත්දැකීම වන නිසා ද, එය ලෙනින්ගේ සහ ස්ටැලින්ගේ මගපෙන්වීම යටතේ අත්පත් කරගත් නිසා ද, අප එය විශේෂයෙන් අගය කොට සැලකිය යුතු වන අතර, චීන විප්ලවයට සහ චීන රතු හමුදාවට විශේෂිත වූ බොහෝ සාධක තිබෙන නිසා චීනයේ

විප්ලවවාදි යුද්ධයේ අත්දැකීම ද අප එසේ ම ආදරයෙන් මතක තබාගත යුතු බව වටහාගන්ට ඔව්හු අසමත් වෙති.

තවත් අය පෙර සේ ම බොහෝ කලකට උඩදී අප විසින් බිඳ හෙළනලද තුන්වැනි වැරදි මතයක් දරති. ඉතා ම අගනා අත්දැකීම නම් 1926–27තේ උතුරු යුදගමනේ[1] අත්දැකීම ය'යි, අප එයින් උගත යුතු ය'යි, නැතහොත් වඩාත් ඇති සැටියෙන් ම කියතොත්, මහ නගර අල්ලා ගැනීම පිණිස කෙළින් ම ඉස්සරහට කාගෙන යාමෙහි ලා අප උතුරු යුදගමන අනුකරණය කළ යුතු ය'යි, ඔව්හු කියති. උතුරු යුදගමනේ අත්දැකීම හැදෑරිය යුතු වන අතර, අපේ වර්තමාන යුද්ධයේ වටාපිටා තත්වයන් ඊට වෙනස් නිසා, ඒ අත්දැකීම යාන්ත්‍රික ලෙස පිටපත් කොට භාවිතාවේ නො යෙදිය යුතු බව වටහාගන්ට ඔව්හු අසමත් වෙති. අපි උතුරු යුදගමනින් අදට ගැලපෙන දේ පමණක් ගත යුත්තෙමු, වර්තමාන තත්වයන්ගේ ආලෝකයෙන් අපේ ම වන දෙයක් සකස් කර ගත යුත්තෙමු.

මෙසේ විවිධ වූ යුද්ධ වලට මගපෙන්වීම පිණිස ඇති විවිධ වූ නීති ඒ යුද්ධ වල විවිධ වූ වටාපිටා තත්වයන් — එනම් ඒවායේ කාලය, ස්ථානය සහ ස්වභාවය අතින් ඇති වෙනස්කම් — මගින් නිශ්චය කරනු ලැබේ. කාල සාධකය සම්බන්ධයෙන්, යුද්ධය ත් යුද්ධ වලට මග පෙන්වීම පිණිස ඇති නීති ත් යන දෙක ම වර්ධනය වේ; එක් එක් ඉතිහාසීය අවස්ථාවට ඊට ම අයත් විශේෂ අංගලක්ෂණ තිබේ; එහෙයින් එක් එක් ඉතිහාසීය අවස්ථාවෙහි යුද්ධයේ නීති වලට ඒවාට ම අයත් විශේෂ අංගලක්ෂණ තිබේ, ඒ නීති වෙන අවස්ථාවකදී යාන්ත්‍රික ලෙස භාවිතාවේ යෙදිය නො හේ. යුද්ධයේ ස්වභාවය සම්බන්ධයෙන්, විප්ලවවාදි යුද්ධය ත් ප්‍රති–විප්ලවවාදි යුද්ධය ත් යන දෙකට ම ඒවාට අයත් විශේෂ අංගලක්ෂණ තිබෙන හෙයින්, ඒ යුද්ධ පාලනය කරන නීති වලට ඒවාට ම අයත් අංගලක්ෂණ තිබේ; එකකට ගැලපෙන නීති යාන්ත්‍රික ලෙස අනිකට මාරු කරන්ට බැරි ය. ස්ථානය පිළිබඳ සාධකය සම්බන්ධයෙන්, එක් එක් රටට හෝ ජාතියට, විශේෂයෙන් ලොකු රටකට හෝ ජාතියකට, ඊට ම අයත් අංගලක්ෂණ තිබෙන හෙයින්, එක් එක් රට හෝ ජාතිය සඳහා යුද්ධයේ නීති වලට ද ඒවාට ම අයත් අංගලක්ෂණ තිබේ; මෙහිදී ද එකකට ගැලපෙන නීති යාන්ත්‍රික ලෙස අනිකට මාරු කරන්ට බැරි ය. වෙනස් ඉතිහාසීය අවස්ථාවන්හි ඇති වන, ස්වභාවය අතින් වෙනස් වන, වෙනස් ස්ථානයන්හි වෙනස් ජාතින් විසින් කරනු ලබන යුද්ධ වලට මග පෙන්වීම පිණිස වන නීති හැදෑරීමේදී, අපි එක් එක් යුද්ධයේ අංගලක්ෂණ ත් වර්ධනය ත් කෙරෙහි අවධානය යොමු කළ යුත්තෙමු, යුද්ධය පිළිබඳ ගැටළුව වෙත යාන්ත්‍රික විධියකට යොමු වෙනවාට විරුද්ධ විය යුත්තෙමු.

මෙ පමණක් ම නො වේ. මුලදී කුඩා සේනාවකට පමණක් අණ දීමට සමත් වන අණදෙන්නෙක් ලොකු සේනාවකට අණ දෙන්නට සමත් බවට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පත් වන්නේ නම්, එය ඔහු තුළ ප්‍රගතියක් සහ වර්ධනයක් ඇති වී තිබෙන බව අඟවයි. එක් ප්‍රදේශයක ක්‍රියා කරගෙන යාම ත් ප්‍රදේශ බොහෝ ගණනක ක්‍රියා කරගෙන යාම ත් අතර ද වෙනසක් තිබේ. මුලදී තමා හොඳින් දන්නා ප්‍රදේශයක් තුළ පමණක් ක්‍රියා කිරීමට සමත් වන අණදෙන්නෙක් වෙන ප්‍රදේශ බොහෝ ගණනක ද ක්‍රියා කිරීමට සමත් බවට පත් වන්නේ නම්, එය ද එසේ ම ඔහු තුළ ප්‍රගතියක් සහ වර්ධනයක් ඇති වී තිබෙන බව අඟවයි. සතුරාගේ පැත්තේ ද අපේ ම පැත්තේ ද සිදු වන ශිල්පීය, උපක්‍රමික සහ උපායමාර්ගික වර්ධනයන් කරණකොටගෙන, නිශ්චිත යුද්ධයක් ඇතුළත ද වටාපිටා තත්වයෝ අවස්ථාවෙන් අවස්ථාවට වෙනස් වෙති. යුද්ධයක් පහළ අවස්ථාවන්හි පවතින විට ඒ යුද්ධයෙහි අණදීම කරන්නට සමත් වන අණදෙන්නෙකු ඒ යුද්ධයේ ඉහළ අවස්ථාවන්හිදී ද අණදීම කරන්නට සමත් වෙතොත්, එය ද ඔහු තුළ වැඩිමනත් ප්‍රගතිය සහ වර්ධනය ඇති වී තිබෙන බව අඟවයි. යුද්ධයක් වර්ධනය වේගෙන යන අතර හුදෙක් එක්තරා ප්‍රදේශයකදී සහ එක්තරා අවස්ථාවකදී එක්තරා ප්‍රමාණයක සේනාවකට පමණක් අණදීමට සමත් ව සිටින අණදෙන්නෙක් තමා ප්‍රගතියක් සලසා ගෙන නැති බව ද වර්ධනය වී නැති බව ද පෙන්වයි. එක් දස්කමකින් හෝ එබිකම් කර බලන සිදුරක් තුළින් පෙනෙන දෙයින් හෝ තෘප්තියට පැමිණ, කිසි කලෙක කිසි ම ප්‍රගතියක් සලසා ගන්නේ නැති සමහර අය සිටිති; ඔවුන් නිශ්චිත ස්ථානයකදී සහ කාලයකදී විප්ලවයෙහි ලා කිසියම් කොටසක් රඟපාන්නට ඉඩ තිබේ; එහෙත් එය වැදගත් කොටසක් නො වේ. අපට උවමනා කරන්නේ වැදගත් කොටසක් රඟපෑ හැකි යුද්ධයට මග පෙන්වන අය ය. යුද්ධයට මග පෙන්වීම පිණිස ඇති සියලු නීති ඉතිහාසය වර්ධනය වන කල සහ යුද්ධය වර්ධනය වන කල වර්ධනය වේ; වෙනස් නො වන කිසිවක් නැත.

2. යුද්ධයේ අරමුණ යුද්ධය නැති කිරීම ය

යුද්ධය, මිනිසුන් අතර අන්‍යෝන්‍ය ඝාතනයේ මේ රකුසා, මිනිස් සමාජයේ ප්‍රගතිය විසින් අන්තිමේදී නැති කර දමනවා ඇත, එ ද ඒ තරම් ඈත අනාගතයේදී නො වේ. එහෙත් එය නැති කර දමන්ට තිබෙන්නේ එක් මගක් පමණි; එනම්, යුද්ධයට යුද්ධයෙන් විරුද්ධ වීම, ප්‍රති-විප්ලවවාදී යුද්ධයට විප්ලවවාදී යුද්ධයෙන් විරුද්ධ වීම, ජාතික ප්‍රති-විප්ලවවාදී යුද්ධයට ජාතික විප්ලවවාදී යුද්ධයෙන් විරුද්ධ වීම සහ, ප්‍රති-විප්ලවවාදී පංක්ති යුද්ධයට විප්ලවවාදී පංක්ති යුද්ධයෙන් විරුද්ධ වීම ය. ඉතිහාසය දන්නේ යුක්තිසහගත යුද්ධ ය, අයුක්තිසහගත යුද්ධ ය'යි දෙ වර්ගයක යුද්ධ පමණකි. අපි යුක්තිසහගත යුද්ධ වලට අනුබල දෙමු, අයුක්තිසහගත යුද්ධ වලට විරුද්ධ වෙමු. සියලු ප්‍රති-විප්ලවවාදී යුද්ධ අයුක්තිසහගත ය, සියලු

විප්ලවවාදී යුද්ධ යුක්තිසහගත ය. මිනිස්වර්ගයාගේ යුද්ධ යුගය අපේ ම පරිශ්‍රමයන් මගින් අවසානයකට පත් කරනු ලබනවා ඇත; නිසැකයෙන් ම අප කරන යුද්ධය අන්තිම සටනේ කොටසක් වේ. එහෙත් එසේ ම නිසැකයෙන් ම අප මුහුණ පා සිටින යුද්ධය සියලු යුද්ධ කෙරෙන් ඉතා ම විශාල වූ ත් ඉතා ම කෲරතර වූ ත් යුද්ධයේ කොටසක් වෙනවා ඇත. අයුක්තිසගහත ප්‍රති-විප්ලවවාදී යුද්ධ කෙරෙන් ඉතා ම විශාල වූ ත් ඉතා ම කෲරතර වූ ත් යුද්ධය අප මත්තෙහි එල්ලෙමින් තිබේ, අප යුක්තිසහගත යුද්ධයක පතාකය ඔසවන්නේ නැත් නම් මිනිස්වර්ගයා ගෙන් සුවිශාල වැඩිපිරිස විනාශ වෙනවා ඇත. මිනිස්වර්ගයාගේ යුක්තිසහගත යුද්ධයේ පතාකය මිනිස්වර්ගයාගේ විමුක්තියේ පතාකය වේ. චීනයේ යුක්තිසහගත යුද්ධයේ පතාකය චීනයේ විමුක්තියේ පතාකය වේ. මිනිස්වර්ගයා අතුරෙන් සහ චීන ජනතාව අතුරෙන් සුවිශාල වැඩිපිරිස විසින් කරනු ලබන යුද්ධයක් නිසැකයෙන් ම යුක්තිසහගත යුද්ධයක්, මිනිස්වර්ගයාගේ සහ චීනයේ විමුක්තිය පිණිස බාර ගත් ඉතා ම උත්තුංග සහ උදාරතර කාර්යභාරයක්, ලෝක ඉතිහාසයෙහි නව යුගයක් කරා යන පාලමක්, වේ. මිනිස් සමාජය පංක්ති සහ රාජ්‍ය නැති කර දමනු ලබන තැන කරා ඉදිරියට ගිය කල, ප්‍රති-විප්ලවවාදී හෝ විප්ලවවාදී, අයුක්තිසහගත හෝ යුක්තිසහගත, යුද්ධ තවදුරට ත් නො තිබෙනවා ඇත; එය මිනිස්වර්ගයා හට සදා සාමයේ යුගය වෙනවා ඇත. විප්ලවවාදී යුද්ධයේ නීති පිළිබඳ අපේ අධ්‍යයනය පැනනඟින්නේ සියලු යුද්ධ නැති කර දැමීමට ඇති අභිලාෂයෙන් ය; කොමියුනිස්ට්වාදින් වන අප ත් සියලු ම සූරාකන පංක්ති ත් අතර වෙනස රැඳී තිබෙන්නේ මෙතැන ය.

3. උපායමාර්ගය යනු මුළු එකක් වශයෙන් ගත් යුද්ධ තත්වයක නීති හැදෑරීම ය

යම් තැනෙක යුද්ධයක් පවතී ද, එතැන මුළු එකක් වශයෙන් යුද්ධ තත්වයක් පවතී. මුළු එකක් වශයෙන් යුද්ධ තත්වය මුළු ලොව ම වසා සිටීමට ඉඩ තිබේ, මුළු රටක් ම වසා සිටීමට ඉඩ තිබේ, නැතහොත් තනි ගොරිල්ලා කලාපයක් හෝ ප්‍රධාන යුද්ධව්‍යාපාර පවතින තනි පෙරමුණක් හෝ වසා සිටීමට ඉඩ තිබේ. ස්වකීය විවිධ පැති සහ අවස්ථාවන් ගැන මහත් සැලකිල්ලෙන් හා ඕනෑකමින් විස්තීර්ණ ලෙස කල්පනා කර බැලීමක් අත්කරගන්නා වූ කවර යුද්ධ තත්වයක් වේවා මුළු එකක් වශයෙන් යුද්ධ තත්වයක් වේ.

උපායමාර්ගය පිළිබඳ විද්‍යාව සතු කර්තව්‍යය වනුයේ මුළු එකක් වශයෙන් ගැනෙන යුද්ධ තත්වයක් පාලනය කරන, යුද්ධයකට මග පෙන්වීම පිණිස ඇති නීති හැදෑරීම ය. යුද්ධව්‍යාපාර පිළිබඳ විද්‍යාව ත් උපක්‍රම පිළිබඳ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

විද්‍යාව ත්[2] සතු කර්තව්‍යය වනුයේ මුළු එකෙන් කොටසක් වන යුද්ධ තත්වයක් පාලනය කරන, යුද්ධයකට මග පෙන්වීම පිණිස ඇති නීති හැදෑරීම ය.

යුද්ධව්‍යාපාරයක හෝ උපක්‍රමික සටන්ව්‍යාපාරයක හෝ අණදෙන්නා විසින් උපායමාර්ගය පිළිබඳ නීති එක්තරා ප්‍රමාණයකට තේරුම් ගැනීම අවශ්‍ය වනුයේ මන්ද? මුළු එක තේරුම් ගැනීමෙන් කොටස ගැන ක්‍රියා කිරීම පහසු වෙන නිසා ය, කොටස මුළු එකට යටත් නිසා ය. උපායමාර්ගික ජයග්‍රහණය නිශ්චය වන්නේ උපක්‍රමික සාර්ථකභාවයන් ගෙන් පමණක් ම ය යන මතය වැරදි ය; ඒ මතය යුද්ධයකදී ජය ලැබීම හෝ පරාජය වීම සියල්ලට ම පළමුවෙන් තත්වය මුළු එකක් වශයෙන් ද, එහි විවිධ අවස්ථා ද නිසි ලෙස ගණනට ගනු ලැබේ ද යන්න පිළිබඳ ප්‍රශ්නයකි යන සත්‍ය කාරණය අමතක කරන නිසා ය. තත්වය මුළු එකක් වශයෙන් ද එහි විවිධ අවස්ථා ද ගණනට ගැනීමෙහි බරපතල අඩුපාඩු හෝ වැරදි තිබේ නම්, යුද්ධය පරදිනවා සිකුරු ය. ''නොසැලකිල්ලෙන් එක ඉත්තකු ඇදීමෙන් මුළු සෙල්ලම ම පරදී'' යන්නෙන් සඳහන් වන්නේ මුළු එකක් වශයෙන් තත්වය කෙරෙහි බලපාන ඇදීමක් ය, මුළු තත්වයට ම තීරණාත්මක වන ඇදීමක් ය; කොටසකට අදාල ස්වභාවයක් ඇති ඇදීමක්, මුළු තත්වයට ම තීරණාත්මක නො වන ඇදීමක් නො වේ. දම් ඇදීමේදී යම් සේ ද, යුද්ධයේදී ත් එසේ ම ය.

එහෙත් මුළු එකක් වශයෙන් තත්වයට එහි කොටස් වලින් වෙන් වී, ඒ කොටස් වලින් ස්වාධීන වූවක් වෙන්ට බැරි ය; කවර හෙයින් ද යත් එය සෑදී තිබෙන්නේ එහි සියලු ම කොටස් වලින් නිසා ය. ඇතැම් විට මුළු එකක් වශයෙන් තත්වය කෙරෙහි බරපතල ලෙස බල පාන්නේ නැති ව යම් යම් කොටස් විනාශයට හෝ පරාජයට භාජන වෙන්ට ඉඩ තිබේ; ඒ ඒවා ඊට තීරණාත්මක නො වන නිසා ය. උපක්‍රමික සටන්ව්‍යාපාර වලදී හෝ යුද්ධව්‍යාපාර වලදී හෝ ලැබෙන පරාජයන් හෝ අසාර්ථක වීම්, ඒවා තීරණාත්මක වැදගත්කමකින් යුක්ත නො වන නිසා, මුළු එකක් වශයෙන් යුද්ධ තත්වයේ පරිහාණියක් කරා මග පාදන්නේ නැත. එහෙත් මුළු එකක් වශයෙන් යුද්ධ තත්වය තනන යුද්ධව්‍යාපර වලින් වැඩි ගණනක් හෝ තීරණාත්මක යුද්ධව්‍යාපාර එකක් දෙකක් හෝ පැරදීම නිසා මුළු තත්වය ම වහා ම වෙනස් වේ. මෙහි, ''යුද්ධව්‍යාපාර වලින් වැඩි ගණනක්'' හෝ ''යුද්ධව්‍යාපාර එකක් දෙකක්'' තීරණාත්මක ය. යුද්ධය පිළිබඳ ඉතිහාසයෙහි, එක් සටනකදී ලැබුණු පරාජයෙන් ජයග්‍රහණ මාලාවකින් ලැබී තිබුණු වාසි අහෝසි වී ගිය අවස්ථා තිබේ; එසේ ම, පරාජයන් බොහෝ ගණනකට පසු එක් සටනකදී ලැබුණු ජයග්‍රහණයෙන් අළුත් තත්වයක් විවෘත වූ අවස්ථා ද තිබේ. ඒ අවස්ථාවන්හි ''ජයග්‍රහණ මාලාව'' සහ ''පරාජයන් බොහෝ ගණන'' ස්වභාවය අතින් කොටසකට අදළ විය, මුළු එකක් වශයෙන් තත්වයට තීරණාත්මක නො වී ය; ඒ අතර ''එක් සටනකදී ලැබුණු පරාජය'' හෝ ''එක් සටනකදී ලැබුණු ජයග්‍රහණය'' තීරණාත්මක කොටසක් රඟපෑවේ ය. මුළු එකක් වශයෙන් තත්වය ගණනට ගැනීමේ වැදගත්කම මේ සියල්ලෙන් පැහැදිලි වේ. මුළු මහත් විධානය බාර ව සිටින තැනැත්තාට ඉතා ම වැදගත් වනුයේ මුළු එකක් වශයෙන් යුද්ධ තත්වය ගැන බලාකියා ගැනීම කෙරෙහි සිත යොමු කිරීම ය. ප්‍රධාන කරුණ නම්, වටාපිටා තත්වයන් අනුව, තම යුද්ධ සේනාංග සහ සේනාවන් කණ්ඩායම් කිරීම, යුද්ධව්‍යාපාර අතර සබඳකම්, විවිධ සටන්ව්‍යාපාර අවස්ථා අතර සබඳකම්, මුළු එකක් වශයෙන් අපේ වැඩකටයුතු සහ මුළු එකක් වශයෙන් සතුරාගේ වැඩකටයුතු අතර සබඳකම් යන මේ ගැටළු ගැන ඔහු ම සැලකිලිමත් විය යුතු බව ය — මේ සියළු ගැටළු ඔහුගේ ලොකු ම සැලකිල්ල ත් පරිශ්‍රමය ත් ඉල්ලයි; ඔහු ඒවා නො තකා සිටියොත් සහ දෙවැනි තැනට ගැනෙන ගැටළු වල ම ඇලී ගිලී සිටියොත්, බාධක වළකන්ට ඔහුට අමාරු ය.

මුළු එක සහ කොටස අතර පවතින සබඳතාව උපායමාර්ගය ත් යුද්ධව්‍යාපාරය ත් අතර සබඳතාවට පමණක් නො ව යුද්ධව්‍යාපාරය ත් උපක්‍රම ත් අතර සබඳතාවට ද අයත් ය. ඩිවිසනයක සටන්ව්‍යාපාර ත් එහි රෙජමේන්තු වල සහ බැටෑලියම් වල සටන්ව්‍යාපාර ත් අතර සබඳකමෙහි ද, කොම්පඤ්ඤයක සටන්ව්‍යාපාර ත් එහි ප්ලැටූන සහ ස්ක්වොඩ් වල සටන්ව්‍යාපාර ත් අතර සබඳකමෙහි ද උදහරණ සොයාගන්ට තිබේ. කවර මට්ටමක හෝ අණදෙන නිලධාරියා තම අවධානය යොමු කළ යුත්තේ තමා ක්‍රියා කරගෙන යන මුළු තත්වයෙහි තිබෙන ඉතා ම වැදගත් සහ තීරණාත්මක ගැටළුව හෝ ක්‍රියාව කෙරෙහි ය, වෙන ගැටළු හෝ ක්‍රියාවන් කෙරෙහි නො වේ.

වැදගත් සහ තීරණාත්මක වන දෙය නිශ්චය කළ යුත්තේ සාමාන්‍ය හෝ සිතින් සිතා ගත් කල්පනාවල් මගින් නො ව, ඇත්තට ම තිබෙන වටාපිටා තත්වයන් අනුව ය. යුද්ධ සටන්ව්‍යාපාරයකදී උන්හිටිගමන් වේගයෙන් පහර දිය යුතු අත සහ තැන තෝරා ගත යුත්තේ ඒ මොහොතෙහි ඇති සතුරාගේ සැබෑ තත්වය, භූමිභාගය සහ, අපේ ම බලවේගයන්ගේ ශක්තිය අනුව ය. සපයන කෑම බීම සුලබ ව තිබෙන කල සෙබළුන් පමණට වඩා නො කන බොන බවට වග බලා ගත යුතු ය, සපයන කෑම බීම හිඟ වන කල ඔවුන් බඩගින්නේ නො තබන්නට ද පරෙස්සම් විය යුතු ය. සුදු ප්‍රදේශ වල එක් තොරතුරු කැල්ලක් පිට වූ පමණකින් ම ඊළඟ සටනකදී පරාජය සිදු විය හැකි ය, එහෙත් රතු ප්‍රදේශ වල එසේ තොරතුරු කැල්ලක් පිට වීම බොහෝ විට ඉතා බරපතල කරුණක් නො වේ. මහ අණදෙන්නන් ඇතැම් සටන් වලට පුද්ගලිකව ම සහභාගි වීම ත් වෙනත් ඒවාට සහභාගි නො වීම ත් අවශ්‍ය ය. යුද්ධ පාසලකට, ඉතා ම වැදගත් ප්‍රශ්නය අධ්‍යක්ෂවරයකු සහ උපදේශකයන් තෝරාගැනීම ත් පුහුණු කිරීමේ වැඩසටහනක් සම්මත කර ගැනීම ත් ය. බහුජන රැස්වීමකට, ප්‍රධාන දෙය රැස්වීමට පැමිණෙන්ට බහුජනයා උනන්දු කිරීම ත් සුදුසු සටන්පාඨ ඉදිරියට දැමීම ත් ය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සැබෑ ජීවිතයේදී, අපට ''සඳ-ජයග්‍රාහී සෙන්පතියෝ'' ඉල්ලා සිටිය නො හැකි ය; ඔව්හු ඉතිහාසයෙහි ඉතා විරල ය. අප විසින් ඉල්ලා සිටිය හැක්කේ බය නැත්තා වූ සහ දැනුම් තේරුම් ඇත්තා වූ ද යුද්ධයක් කරගෙන යන අතර සාමාන්‍යයෙන් තමන් කරන සටන් ජය ගන්නා වූ ද සෙන්පතියෝ ය, ප්‍රඥාව ධෛර්යය සමග බද්ධ කරන සෙන්පතියෝ ය. ප්‍රඥාව ත් ධෛර්යය ත් ඇත්තකු වීමට, කෙනෙක් ක්‍රමයක්, උගෙනීමේදී මෙන් ම උගත් දේ භාවිතාවේ යෙදීමේදී ද යොදන ක්‍රමයක්, අත් කරගත යුතු ය.

කුමන ක්‍රමය ද? ක්‍රමය සතුරා සිටින තත්වයේ සහ අප සිටින තත්වයේ සියලු පැති හොඳට දැන හැඳින ගැනීම පිණිස, දෙ පාර්ශ්වයේ ම ක්‍රියාවන් පාලනය කරන නීති සොයා දැනගැනීම පිණිස සහ, මේ නීති අපේ ම සටන්-ව්‍යාපාරවලදී ප්‍රයෝජන ගැනීම පිණිස ය.

බොහෝ රටවල් වල නිකුත් කර තිබෙන යුද්ධ අත්-පොත් ''වටාපිටා තත්වයන්ට අනුව මූලධර්මයන් නමනීය ලෙස භාවිතාවේ යෙදීමේ'' අවශ්‍යතාව ත් පරාජයක් ලැබුණු අවස්ථාවකදී ගත යුතු පියවර ත් පෙන්වා දෙයි. ඒවා කලින් සඳහන් කළ කරුණ පෙන්වා දෙන්නේ මූලධර්ම පමණට වඩා දරදඬු ලෙස භාවිතාවේ යෙදීම මගින් මනෝමූල ලෙස වැරදි කිරීමෙන් වැළකෙන්නට අණදෙන්නකු හට අවවාද කරනු පිණිස ය; දෙවැනි ව සඳහන් කළ කරුණ පෙන්වා දෙන්නේ ඔහු මනෝමූල වැරදි කළ පසු හෝ විෂයමූල වටාපිටා තත්වයන්හි අනපේක්ෂිත සහ අනිවාර්ය වෙනස්වීම් සිදු වූ පසු හෝ ඇති වන තත්වය සමග ඔට්ටු වීමට ඔහුට හැකි කරනු පිණිස ය.

මනෝමූල වැරදි කරනු ලබන්නේ මන්ද? යුද්ධයකදී හෝ සටනකදී සේනාවන් පිළිවෙල කර තබන හෝ විධානය කරනු ලබන අන්දම නිශ්චිත අවස්ථාවක හෝ ස්ථානයක හෝ තත්වයන්ට නො ගැලපෙන නිසා ය, මනෝමූල විධානය විෂයමූල තත්වයන්ට නො ගැලපෙන, නැතහොත් වෙනස් ව පවතින, නිසා ය; වෙන වචන වලින් කියතොත්, මනෝමූලකය සහ විෂයමූලකය අතර ප්‍රතිවිරෝධය විසඳා නැති නිසා ය. තමන් කරන්නේ කුමක් වුව ද එවැනි තත්වයන් ඇති වීම වළක්වන්නට මිනිසුන්ට අමාරු ය; එහෙත් සමහර මිනිස්සු අන්‍යයන්ට වඩා තමන් දක්ෂ බව ඔප්පු කරති. කවර වැඩකදී වුව අප සංසන්දනාත්මක වශයෙන් උසස් දක්ෂතාවක් ඉල්ලා සිටින්නාක් මෙන් ම, යුද්ධයේදී ද අපි වැඩි වැඩියෙන් ජය, නැතහොත්, අනික් අතට, අඩු අඩුවෙන් පරාජය ඉල්ලා සිටිමු. මෙහිදී ගැටළුව නම් මනෝමූලකය ත් විෂයමූලකය ත් එකිනෙක සමග උචිත ලෙස ගැලපෙන්ට සැලසීම ය.

උපක්‍රම අතින් උදාහරණයක් ගනිමු. පහර දීමට තෝරා ගත් තැන සතුරාගේ අංශයන් අතුරෙන් එකක වේ නම් ද, එය හරියට ම ඔහුගේ දුර්වල ස්ථානය වන තැන ම පිහිටියේ නම් ද, එහි ප්‍රතිවිපාකය වශයෙන්

උන්හිටිගමන් වේගයෙන් දෙන පහර සාර්ථක වේ නම් ද, එවිට මනෝමූලකය විෂයමූලකය හා අනුරූප වේ; ඒ කියන්නේ, අණදෙන්නා කළ ඔත්තු සෙවීම, විනිශ්චය සහ තීරණය සතුරාගේ සැබෑ තත්වය ත් සේනා වින්‍යාසය ත් සමග අනුරූප වී ඇති බව ය. පහර දීමට තෝරා ගත් තැන වෙන අංශයක හෝ හරි මැද වේ නම් ද, ප්‍රහාරය බලාපොරොත්තු නුවූ අවහිරයකට මුහුණ පා, ඉස්සරහට යාමක් නො වේ නම් ද, එවිට එබඳු අනුරූප වීමක් නොමැත්තේ ය. පහර දෙන්නට නියම කරගත් වේලාව හරි නම් ද, අතිරේක සේනාවෝ උවමනාවට වඩා පමා වී හෝ උවමනාවට වඩා කලින් හෝ පාවිච්චි නො කරනු ලබත් නම් ද, සටනෙහි සෙසු සියලු සේනා වින්‍යාසයන් සහ ක්‍රියාවෝ සතුරාට නො ව අපට හිතකර ලෙස වෙත් නම් ද, එවිට සටන පුරා ම මනෝමූල විධානය විෂයමූල තත්වය සහ සම්පූර්ණයෙන් අනුරූප වේ. සටන් වැදී සිටින්නන් අවි ගෙන සිටින්නා වූ සහ තම රහස් එකිනෙකා ගෙන් සඟවා තබන්නා වූ පණ ඇති මිනිසුන් සමූහයන් වන යුද්ධයකදී හෝ සටනකදී, එසේ සම්පූර්ණයෙන් ම වන අනුරූප වීමක් අතිශයින් ම දුර්ලභ ය; මෙය පණ නැති වස්තු ගැන හෝ සිරිත් පරිදි කරන දේ ගැන හෝ ක්‍රියා කරනවාට වඩා උදක් ම වෙනස් දෙයකි. එහෙත් අණදෙන්නා කරන මග පෙන්වීම සැබෑ තත්වය සමග මූලාය වශයෙන් අනුරූප වේ නම්, ඒ කියන්නේ, මග පෙන්වීමෙහි ඇතුළත් තීරණාත්මක දේ සැබෑ තත්වයන් සමග අනුරූප වේ නම්, එවිට ජයග්‍රහණය පිණිස පදනමක් ඇත්තේ ය.

අණදෙන්නකුගේ නිවැරදි සේනා වින්‍යාසයන් ඇති වන්නේ ඔහුගේ නිවැරදි තීරණ කෙරෙන් ය, ඔහුගේ නිවැරදි තීරණ ඇති වන්නේ ඔහුගේ නිවැරදි විනිශ්චයන් කෙරෙන් ය, ඔහුගේ නිවැරදි විනිශ්චයන් ඇති වන්නේ නිරවශේෂ හා අවශ්‍ය ඔත්තු සෙවීමකින් සහ ඔත්තු සෙවීම මගින් ලබාගත් නොයෙක් වර්ගයේ දත්ත ගැන හොඳට සිතා බලා ඒවා එකට පිරිද්දීමෙන් ය. ඔහු යෙදිය හැකි වූ ත් යෙදීම අවශ්‍ය වූ ත් සියලු ඔත්තු සෙවීමේ ක්‍රම යොදයි; රොඩුබොඩු ඉවත දමමින් හා හරවත් දේ තෝරා ගනිමින් ද, බොරු දේ අහක් කරමින් සහ සැබෑ දේ තබා ගනිමින් ද, එකකින් අනිකට සහ පිටතින් ඇතුළට යමින් ද, සතුරාගේ තත්වය ගැන රැස් කර ගත් තොරතුරු ගැන සිතා බලයි; ඉක්බිති ඔහු තමාගේ ම පැත්තේ පවතින තත්වයන් සැලකිල්ලට ගෙන, දෙ පැත්ත ම සහ ඒවායේ පරස්පර-සම්බන්ධනයන් ගැන අධ්‍යයනයක් කරයි; එමගින් තම විනිශ්චයන්ට එළඹෙයි, තම හිත හදා ගනියි, තම සැලැස්ම සකස් කරයි. යුද්ධ උපායඥයකු උපායමාර්ගික සැලැස්මක්, යුද්ධ-ව්‍යාපාර සැලැස්මක් හෝ සටන් සැලැස්මක් සකස් කරන්නට පෙර, ඔහු තත්වයන් දැනගැනීම පිණිස ගමන් කරන මුළු ක්‍රියාවලිය එසේ ය. එහෙත් මෙසේ කරනු වෙනුවට නොසැලකිලිමත් යුද්ධ උපායඥයෙක් ඔහුගේ යුද්ධ සැලැස්ම ඔහුගේ ම මතිමාත්‍ර මත සකස් කරයි; එහෙයින් ඔහුගේ සැලැස්ම

LIBERATION BASE

https://liberationbase.wordpress.com

හිතින් හිතාගත් ඒවා ය, සත්තාව හා අනුරූප නො වේ. තනිකර උද්‍යෝගය මත පමණක් විශ්වාසය තබා වැඩ කරන අපරීක්ෂාකාරි යුද්ධ උපායඥයෙක් නියත වශයෙන් ම සතුරා විසින් කපටිකමින් රවටනු ලබනවා ඇත, නැතහොත් සතුරාගේ තත්වයේ කිසියම් මතුපිටට සීමා වූ හෝ අඩාල අංගයකින් පොළඹවනු ලබනවා ඇත, එසේ ත් නැතහොත් තමා යටතේ සිටින්නන් කරන සැබෑ දැනුම හෝ ගැඹුරු වැටහෙන නුවණ හෝ පදනම නො කර ගත් වගකීමෙන් තොර යෝජනාවන් ගෙන් ඇදී යනවා ඇත; එහෙයින් ඔහු ගල් බිත්තියක හැපෙයි; කවර හෙයින් ද යත්, හැම යුද්ධ සැලැස්මක් ම අවශ්‍ය ඔත්තු සෙවීම ත් සතුරාගේ තත්වය, තමාගේ ම තත්වය සහ ඒවායේ පරස්පර-සම්බන්ධනය ගැන සැලකිලිමත් ලෙස කල්පනා කර බැලීම ත් පදනම කරගෙන සකස් කළ යුතු බව ඔහු නො දන්නා නිසා ය, නැතහොත් දැනගන්නට ඔහුට උවමනා නැති නිසා ය.

තත්වයක් දැනගැනීමේ ක්‍රියාවලිය යුද්ධ සැලැස්මක් සකස් කිරීමට කලින් පමණක් නො ව ඊට පසු ව ද පවතී. සැලැස්ම ක්‍රියාවට යෙදූ මොහොතේ සිට සටන්ව්‍යාපාරයේ අවසානය තෙක්, එය ක්‍රියාවේ යොදගෙන යන විට, තත්වය දැනගැනීමේ තවත් ක්‍රියාවලියක් පවත්නේ ය; එනම් භාවිතාවේ ක්‍රියාවලිය යි. මේ ක්‍රියාවලිය පවත්නා අතර, ඊට කලින් තිබුණු ක්‍රියාවලියේදී සකස් කළ සැලැස්ම සත්තාව හා අනුරූප වේ ද' යි අළුතෙන් පරීක්ෂා කර බැලීම අවශ්‍ය ය. එය සත්තාව හා අනුරූප නො වේ නම්, නැතහොත් එය සම්පූර්ණයෙන් එසේ නො වේ නම්, එවිට අපේ අළුත් දැනුමේ ආලෝකයෙන්, අළුත් විනිශ්චයන් සකස් කර ගැනීම, අළුත් තීරණයන් ගැනීම සහ අළුත් තත්වයන්ට ඔබින ලෙස මුල් සැලැස්ම වෙනස් කිරීම අවශ්‍ය වන්නේ ය. හැම සටන්ව්‍යාපාරයකදී ම පාහේ සැලැස්ම අඩාල වශයෙන් වෙනස් කරනු ලැබේ, ඇතැම් විට සම්පූර්ණයෙන් ම පවා වෙනස් කරනු ලැබේ. එබඳු වෙනස්කිරීම් උවමනා බව නො තේරෙන, නැතහොත් ඒ වෙනස්කිරීම් කරන්ට අකැමති, එහෙත් අන්ධ ලෙස ක්‍රියා කරන, අපරීක්ෂාකාරි මිනිසෙක් නො වැළකිය හැකි ලෙස ම තම හිස ගල්බිත්තියක ගසා ගන්නවා ඇත.

ඉහත කී දේ උපායමාර්ගික ක්‍රියාවකට, යුද්ධව්‍යාපාරයකට හෝ සටනකට අදාල වේ. කෘතහස්ත යුද්ධ පුරුෂයෙක්, ඔහු නිහතමානි සහ ඉගෙනගැනීමට කැමති කෙනෙක් නම්, තමාගේ ම සේනාවන්ගේ ලක්ෂණය (අණදෙන්නන්, භටයන්, ආයුධ, ද්‍රව්‍යෝපකරණ යනාදිය සහ ඒවායේ මුළු එකතුව) ද, සතුරු සේනාවන්ගේ ලක්ෂණය (එපරිද්දෙන් ම, අණදෙන්නන්, භටයන්, ආයුධ, ද්‍රව්‍යෝපකරණ යනාදිය සහ ඒවායේ මුළු එකතුව) ද, දේශපාලනය, අර්ථපාලනය, භූමිශාස්ත්‍රය සහ කාලගුණය වැනි යුද්ධයට සම්බන්ධ සෙසු සියලු තත්වයන් ද හොඳට දැන හැඳින ගැනීමට සමත් වෙනවා ඇත; එබඳු යුද්ධ පුරුෂයකුට යුද්ධයකට හෝ සටන්ව්‍යාපාරයකට මග

පෙන්වීමෙහි ලා වඩා හොඳ වැටහීමක් තිබෙනවා ඇත, ඔහු ජය දිනා ගැනීමට වැඩියෙන් ඉඩ ඇත්තේ ය. ඔහු මේ දේ මුදුන්පත් කරගන්නවා ඇත්තේ, ඔහු, බොහෝ කාලයක් තිස්සේ, සතුරාගේ පැත්තේ සහ අපේ ම පැත්තේ තත්වය දැනගෙන තිබෙන නිසා, ක්‍රියාවේ නීති අනාවරණය කරගෙන සිටින නිසා සහ මනෝමූලකය ත් විෂයමූලකය ත් අතර ප්‍රතිවිරෝධය විසඳා තිබෙන නිසා ය. මේ දැනගැනීමේ ක්‍රියාවලිය අතිශයින් ම වැදගත් ය; අත්දැකීම් ලැබීමේ එවැනි දීර්ඝ වකවනුවක් නොමැති ව, මුළු යුද්ධයේ නීති තේරුම් ගැනීම ත් ග්‍රහණය කර ගැනීම ත් අමාරු වෙනවා ඇත. ආධුනිකයකුට හෝ කඩදසි මත පමණක් සටන්-කරන්නකුට හෝ ඇත්ත වශයෙන් ම සමත් උසස්-පෙළේ අණදෙන්නකු වන්නට බැරි ය; යුද්ධයේදී සැබෑවට ම සටන් කිරීම මගින් ඉගෙනගත් කෙනකුට පමණකි එසේ විය හැක්කේ.

මූලධර්මයන්ගේ ස්වභාවයෙන් වන සියලු යුද්ධ නීති සහ යුද්ධ න්‍යාය ආදියෙහි සිටි හෝ අපේ කාලයෙහි සිටින මිනිසුන් විසින් සම්පිණ්ඩනය කරනලද අතීත යුද්ධ වල අත්දැකීම් ය. අපි, අතීත යුද්ධ වලින් ලැබුණු උරුමයක් වන, ලෙයින් මිල ගෙවා උගත් මේ පාඩම් බැරෑරුම් ලෙස හැදෑරිය යුත්තෙමු. ඒ එක් කරුණකි. එහෙත් තවත් එකක් තිබේ. අපි මේ නිගමන, ප්‍රයෝජනවත් දේ ස්වීකරණය කරමින්, ප්‍රයෝජනයක් නැති දේ බැහැර කරමින් සහ, විශේෂිත ලෙස අපේ ම වන දේ එකතු කරමින්, අපේ ම අත්දැකීමෙන් උරගා බැලිය යුත්තෙමු. පසුව කී එක ඉතා වැදගත් ය, නො එසේ නම් අපට යුද්ධයකට මග පෙන්වීම නො කළ හැකි ය.

කියවීම උගෙනීම වේ, එහෙත් භාවිතාවේ යෙදීම ද උගෙනීම වේ; වැලිත් එය වඩාත් වැදගත් වර්ගයේ උගෙනීම ය. අපේ ප්‍රධාන ක්‍රමය සංග්‍රාමය තුළින් සංග්‍රාමය උගෙනීම ය. පාසල් යාමට ඉඩප්‍රස්තාවක් නො ලැබුණු කෙනකුට පවා සංග්‍රාමය ඉගෙනගන්ට හැකි ය — යුද්ධයකදී සටන් කරමින් ඉගෙනගන්ට ඔහුට හැකි ය. විප්ලවවාදි යුද්ධයක් බහුජන කාර්යභාරයකි; එය බොහෝ විට පළමුකොට උගෙන, ඉක්බිති කිරීම පිළිබඳ කරුණක් නො වේ, කිරීම සහ ඉක්බිති උගෙනීම පිළිබඳ කරුණකි; කවර හෙයින් ද යත් කිරීම ම උගෙනීම වන හෙයිනි. සාමාන්‍ය රටවැසියා සහ සෙබළා අතර පරතරයක් ඇත, එහෙත් එය මහා ප්‍රාකාරයක් නො වේ; එය ඉක්මනින් වැසිය හැකි ය; එය වසන්නට තිබෙන මග විප්ලවයට, යුද්ධයට, හවුල් වීම ය. උගෙනීම ත් භාවිතාවේ යෙදීම ත් පහසු නො වේ ය' යි කීමෙන් අප අදහස් කරන්නේ, නිරවශේෂ ලෙස උගෙනීම ත් දක්ෂ ලෙස භාවිතාවේ යෙදීම ත් අමාරු බව ය සාමාන්‍ය මිනිසුන්ට ඉක්මනින් සෙබළුන් විය හැකි ය' යි කීමෙන් අප අදහස් කරන්නේ, එළිපත්ත පැනීම දුෂ්කර නො වන බව ය. මේ ප්‍රකාශ දෙක එකට දමා කියතොත්, ''හිත ඇත්නම් කෙනකුට ලොවේ කරන්ට අමාරු දෙයක් නැත'' යන චීන ආප්තෝපදේශය අප විසින් උපුටා දක්විය හැකි ය. එළිපත්ත පැනීම දුෂ්කර නො වේ; ප්‍රගුණ කිරීම ද, කෙනකු ඒ වැඩයට හිත යොදා, උගෙනීමට හපන් වෙතොත්, පුළුවන් වේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යුද්ධයේ නීති, සෙසු සියලු දේ පාලනය කරන නීති මෙන් ම, අපේ සිත් තුළ ඇති වන විෂයමූල සත්තාවන්ගේ පිළිබිඹු ය; සිතින් පිටත තිබෙන හැම දෙයක් ම විෂයමූල සත්තාව ය. ඒ අනුව උගෙනීමට සහ දැනගැනීමට තිබෙන දේට සතුරාගේ පැත්තේ ත් අපේ පැත්තේ ත් කරුණු පවතින තත්වය ඇතුළත් වේ; ඒ දෙක ම අධ්‍යයනයේ විෂයය වශයෙන් සැලකිය යුතු වන අතර, සිත (සිතීමේ හැකියාව) පමණක් අධ්‍යයනය කරන කර්තෘ වේ. සමහර අය තමන් ම දැනගැනීමට හපන් ය, සතුරා දැනගැනීමට හපන් නැත; අන් සමහර අය එහි අනික් පැත්ත වෙති: ඒ එක ගොල්ලකට වත් යුද්ධයේ නීති උගෙනීමේ සහ භාවිතාවේ යෙදීමේ ප්‍රශ්නය විසඳීමට බැරි ය. පුරාණ චීනයේ ශ්‍රේෂ්ඨ යුද්ධ විද්‍යාඥයා වූ සුන් වූ ත්සුගේ පොතේ මෙවැනි කියමනක් තිබේ: ''සතුරා ත් දැනගන්න, ඔබ ත් දැනගන්න; එවිට ඔබට පරාජය වීමේ අනතුරක් නොමැති ව සටන් සියයක් වුව ත් කළ හැකි ය;''[3] එය උගෙනීමේ අවස්ථාව සහ භාවිතාවේ යෙදීමේ අවස්ථාව යන දෙක ම ගැන ත්, විෂයමූල සත්තාවේ වර්ධනය පිළිබඳ නීති දැනගැනීම සහ අපට මුහුණ ලා සිටින සතුරා දමනය කරනු වස් මේ නීති අනුව අපේ ම ක්‍රියාව තීරණය කිරීම යන දෙක ම ගැන ත් සඳහන් කරයි. අප මේ කියමන සැහැල්ලු කොට නො ගත යුතු ය.

යුද්ධය ජාතීන්, රාජ්‍යයන්, පංක්තීන් හෝ දේශපාලන කණ්ඩායම් අතර උසස් ම අරගල ආකාරය වේ; යුද්ධයේ සියලු නීති යුද්ධ කරන ජාතීන්, රාජ්‍යයන්, පංක්තීන් හෝ දේශපාලන කණ්ඩායම් විසින් තමන්ට ම ජය අත්පත් කර ගැනීමේ කාරිය පිණිස භාවිතාවේ යොදනු ලැබේ. අවිවාදයෙන් ම, යුද්ධයේදී ජය හෝ පරාජය මුඛ්‍ය වශයෙන් නිශ්චය කරනු ලබන්නේ දෙ පැත්තේ යුද්ධමය, දේශපාලන, ආර්ථික සහ ස්වාභාවික තත්වයන් විසින් ය. එහෙත් මේවායින් ම පමණක් නො වේ. යුද්ධයට මග පෙන්වීමෙහි ලා එක් එක් පැත්තට තිබෙන මනෝමූල ශක්තිය විසින් ද එය නිශ්චය කරනු ලබයි. යුද්ධයක් ජය ගැනීමට දරන ස්වකීය ආයාශයේදී, යුද්ධ පුරුෂයන්ට ද්‍රව්‍යමය තත්වයන් විසින් පණවා තිබෙන සීමාවන්ට උඩින් පැන යන්ට බැරි ය; කෙසේ වේවා, මේ සීමාවන් ඇතුළත, ජයග්‍රහණය පිණිස වෙර දරන්නට ඔහුට හැකි ය, ඔහු වෙර දැරිය යුතුම ය. යුද්ධ පුරුෂයකු සඳහා ක්‍රියා කිරීමේ වේදිකාව විෂයමූල ද්‍රව්‍යමය තත්වයන් මත ගොඩනඟනු ලබයි; එහෙත් ඒ වේදිකාව මත, නාදයෙන් හා වර්ණයෙන් ද බලයෙන් සහ සෞන්දර්යයෙන් ද පූර්ණ බොහෝ නාටක රඟදැක්වීමට මග පෙන්වන්ට ඔහුට හැකි ය. එහෙයින්, විෂයමූල ද්‍රව්‍යමය අඩිතාලම්, එනම්, යුද්ධමය, දේශපාලන. ආර්ථික සහ ස්වාභාවික තත්වයන්, දෙනු ලැබූ කල, අපේ රතු හමුදු අණදෙන්නෝ ජාතික සහ පංක්ති සතුරන් මැඩීම පිණිස ත් මේ දුෂ්ට ලෝකය විපර්යාස කිරීම පිණිස ත් ස්වකීය බලපරාක්‍රමය විදහා පෑ යුත්තාහ, ස්වකීය සේනාවන් මෙහෙයවිය යුත්තාහ. යුද්ධය විධානය කිරීමෙහි ලා අපේ මනෝමූල ශක්තිය අභ්‍යාසයෙහි යෙදිය

හැකි සහ යෙදිය යුතු තැන මෙතැන ය. අපි ගොන්කම් කරන දඩබ්බරයකු වීමට අපේ රතු හමුදු අණදෙන්නන් කිසිවකුට ඉඩ නො දෙමු; අපේ රතු හමුදුවේ හැම අණදෙන්නකු ම බය නැති සහ දැනුම් තේරුම් ඇත්තා වූ ත් සර්වවිජය ධෛර්යය සහ මුළු යුද්ධය පවත්නා තුරු ඇති වන හැරීම් පෙරළීම් කවරක් වුව ද තත්වය හසුරුවා ගැනීමේ ශක්තිය ඇත්තා වූ ත් වීරයකු වීම් අපට නිශ්චය වශයෙන් ම උවමනා ය. යුද්ධය නමැති සාගරයෙහි පිහිනන ඔහු එහි නො ගිලිය යුතුවා පමණක් ම නො වේ, නියම ගණනට අත් ගසමින් නිසැකව ම පරතෙරට ළඟා වන බවට වග බලා ගත යුතු ද වේ. යුද්ධයට මග පෙන්වීමට තිබෙන නීති, යුද්ධය නමැති සාගරයෙහි පිහිනීමේ කලාව වන්නේ ය.

අපේ ක්‍රම ගැන මෙපමණ ය.

පරිච්ඡේද II

චීන කොමියුනිස්ට පක්ෂය සහ චීනයේ විප්ලවවාදි යුද්ධය

LIBERATIONBASE

1924දී පටන්ගත් චීනයේ විප්ලවවාදි යුද්ධය අවස්ථා දෙකක් තුළින් ගමන් කර ඇත; පළමුවැන්න 1924 සිට 1927 තෙක් විය, දෙවැන්න 1927 සිට 1936 තෙක් වේ; ජපානයට විරුද්ධ ව කරන ජාතික විප්ලවවාදි යුද්ධයේ අවස්ථාව දැන් ආරම්භ වෙනවා ඇත. මේ විප්ලවවාදි යුද්ධය එහි අවස්ථා තුනේදී ම කර තිබෙන්නේ ත්, කරන්නේ ත්, මත්තට කරනු ලබන්නේ ත් චීන නිර්ධනපංක්තියේ සහ එම පංක්තියේ පක්ෂය වන චීන කොමියුනිස්ට පක්ෂයේ නායකත්වය යටතේ ය. චීනයේ විප්ලවවාදි යුද්ධයේදී සිටින ප්‍රධාන සතුරෝ නම් අධිරාජ්‍යවාදය ත් රදළ බලවේගයෝ ත් ය. චීන ධනේශ්වරපංක්තිය යම් යම් ඉතිහාසීය සන්ධිස්ථාන වලදී විප්ලවවාදි යුද්ධයට සහභාගි වෙන්ට ඉඩ තිබෙන නමුත්, ඒ පංක්තියේ ආත්මාර්ථකාමිත්වය ත් දේශපාලන හා ආර්ථික ස්වාධීනත්වයෙන් තොර බව ත් නිසා ඒ පංක්තිය චීනයේ විප්ලවවාදි යුද්ධය පූර්ණ ජයග්‍රහණයේ මගට පමුණුවන සේ ඊට නායකත්වය දීමට අකැමැති ය, අසමත් ය. චීනයේ ගොවිජනතාවට සහ නාගරික සුළු ධනේශ්වරපංක්තියට අයත් බහුජනයා විප්ලවවාදි යුද්ධයට උනන්දුවෙන් සහභාගි වෙන්ට ත් එය පූර්ණ ජයග්‍රහණය කරා ගෙනයන්ට ත් කැමති ය. ඔව්හු විප්ලවවාදි යුද්ධයෙහි ප්‍රධාන බලවේගයෝ වෙති; ' එහෙත් කුඩාපරිමාණයේ (භාණ්ඩ) නිෂ්පාදකයන් වීම නිසා, ඔව්හු ඔවුන්ගේ දේශපාලන දෘෂ්ටියෙන් සීමා සහිත වෙති (රක්ෂාව නැති බහුජනයා අතර සමහරු අරාජ්‍යවාදි අදහස් ඇත්තෝ වෙති); ඒ නිසා යුද්ධයේදී නිවැරදි නායකත්වය

https://liberationbase.wordpress.com

දීමට ඔව්හු අසමත් වෙති. එහෙයින්, නිර්ධනපංක්තිය දේශපාලන වේදිකාව මත පහළ වී සිටින යුගයක, චීනයේ විප්ලවවාදී යුද්ධයට නායකත්වය දීමේ වගකීම නො වැළකිය හැකි ලෙස ම චීන කොමියුනිස්ට් පක්ෂයේ කර පිට වැටෙයි. මේ යුගයෙහි, කවර විප්ලවවාදී යුද්ධයක් වේවා නිර්ධනපංක්තියේ සහ කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් තොර වේ නම්, නැතහොත් ඒ නායකත්වයට පටහැනි ව යන්නේ නම්, එය නියතයෙන් ම පරාජයෙන් අවසන් වෙනවා ඇත. අර්ධ–විජිත චීනයෙහි සියලු ම සමාජ තට්ටු සහ දේශපාලන කණ්ඩායම් අතුරෙන්, පටු අදහස් වලින් සහ ආත්මාර්ථකාමයෙන් වැඩියෙන් ම නිදහස් වූ ද, දේශපාලන වශයෙන් ඉතා ම දූරදර්ශී වූ ද, ඉතා ම හොඳින් සංවිධානය වී සිටින්නා වූ ද, ලොව මුළුල්ලෙහි පෙරමුණු පංක්තිය වන නිර්ධනපංක්තියේ සහ එහි දේශපාලන පක්ෂයේ අත්දැකීමෙන් විවෘත මනසකින් උගෙනීමට ත් මේ අත්දැකීම තමන්ගේ ම ව්‍යායාමයේදී ප්‍රයෝජනයට ගැනීමට ත් වැඩියෙන් ම සූදානම් ව සිටින්නා වූ ද සමාජ තට්ටුව සහ දේශපාලන කණ්ඩායම නිර්ධනපංක්තිය ත් කොමියුනිස්ට් පක්ෂය ත් ය. එහෙයින් ගොවි ජනතාවට, නාගරික සුළු ධනේශ්වරපංක්තියට සහ ධනේශ්වරපංක්තියට නායකත්වය දෙන්ට හැකි වන්නේ ත්, ගොවි ජනතාවගේ සහ සුළු ධනේශ්වරපංක්තියේ පටු අදහස්, රක්ෂාව නැති බහුජනයාගේ විනාශකාරිභාවය සහ, එසේ ම (කොමියුනිස්ට් පක්ෂය ස්වකීය ප්‍රතිපත්තිය අතින් වරදක් නො කරතොත්) ධනේශ්වරපංක්තියේ වැනෙන සුලු ගුණය සහ කරන දෙයක් පරිපූර්ණ ලෙස නො කිරීමේ ගුණය මැඩපවත්වන්ට හැකි වන්නේ ත් — විප්ලවය ත් යුද්ධය ත් ජයග්‍රහණයේ මගට පමුණුවන්ට හැකි වන්නේ, නිර්ධනපංක්තියට සහ කොමියුනිස්ට් පක්ෂයට පමණකි.

මූලික වශයෙන් කතා කරන කල, 1924–27තේ විප්ලවවාදී යුද්ධය කරනලද්දේ ජාත්‍යන්තර නිර්ධනපංක්තිය සහ චීන නිර්ධනපංක්තිය ත්, ඒ පංක්ති වල පක්ෂ ත් චීන ජාතික ධනේශ්වරපංක්තිය සහ ඒ පංක්තියේ පක්ෂ කෙරෙහි දේශපාලන බලපෑමක් කළා වූ ද ඒවා සමග දේශපාලන සහයෝගයකට පිවිසී සිටියා වූ ද තත්වයන් යටතේ ය. කෙසේ වේවා, පළමුකොට ම මහ ධනේශ්වරපංක්තිය ද්‍රෝහී බවට හැරුණු නිසා ත්, ඒ අතර ම විප්ලවවාදී ශ්‍රේණින් තුළ සිටි අවස්ථාවාදීන් විප්ලවයේ නායකත්වය සිය කැමැත්තෙන් ම පාවා දුන් නිසා ත්, විප්ලවවාදී යුද්ධය උග්‍ර සන්ධිස්ථානයේදී ව්‍යර්ථ විය.

1927තේ සිට මේ දක්වා පවතින ඉඩම් ලබාගැනීමේ විප්ලවවාදී යුද්ධය කර තිබෙන්නේ අළුත් තත්වයන් යටතේ ය. මේ යුද්ධයේදී සිටින සතුරා අධිරාජ්‍යවාදය පමණක් ම නො වේ, මහ ධනේශ්වරපංක්තියේ ත් මහ ඉඩම් හිමියන්ගේ ත් මිතුරු–හවුල ද සතුරෙක් වේ. වැලිත් ජාතික ධනේශ්වරපංක්තිය මහ ධනේශ්වරපංක්තියේ වලිගයක් වී ඇත. මේ විප්ලවවාදී යුද්ධය

ඒ කෙරෙහි ඒකාන්ත නායකත්වය පිහිටුවාගෙන සිටින කොමියුනිස්ට් පක්ෂය විසින් ම පමණක් නායකත්වය දෙනු ලබයි. විප්ලවවාදී යුද්ධය ස්ථිර ලෙස ම අවසානය දක්වා ගෙනයාමට හැකි කරන ඉතා ම වැදගත් කාරණය මේ ඒකාන්ත නායකත්වය යි. ඒ නායකත්වය නොමැතිව, විප්ලවවාදී යුද්ධය එතරම් දැඩි උත්සාහයකින් කරගෙන යන්ට පුළුවන් වේ ය'යි සිතන්ට වත් බැරිය.

චීන කොමියුනිස්ට් පක්ෂය ධෛර්යමත් ලෙස සහ ස්ථිර ලෙස චීනයේ විප්ලවවාදී යුද්ධයට නායකත්වය දී ඇත, එය සැම කල්හි ම ජනතාවගේ පලප්‍රයෝජන ආරක්ෂා කිරීම සඳහා ත් ඔවුන්ගේ නිදහස සහ විමුක්තිය උදෙසා ත් විප්ලවවාදී යුද්ධයේ ඉදිරි–පෙරමුණේ ම සටන් කරන ජනතාවගේ මිතුරා බව පුරා පසළොස් අවුරුද්දක්[4] ම මුළු ජාතියට ම පෙන්නුම් කර ඇත.

ස්වකීය දුෂ්කර අරගල මගින් ද, ස්වකීය වීරෝදාර සාමාජිකයන් සිය දහස් ගණනකගේ ත් ස්වකීය වීරෝදාර කාඩර්වරුන් දහස් ගණනකගේ ත් ජීවිත පරිත්‍යාගය මගින් ද, චීන කොමියුනිස්ට් පක්ෂය රට පුරා ම කෝටි ගණන් මිනිසුන් අතර අධ්‍යාපනයක් දීමේ ශ්‍රේෂ්ඨ කොටසක් රඟ පා ඇත. ස්වකීය විප්ලවවාදී අරගල වලදී පක්ෂය අත්පත් කර ගත් ශ්‍රේෂ්ඨ ඓතිහාසික ජයග්‍රහණ චීනය ජාතික සතුරකු විසින් අතික්‍රමණය කරනු ලබන මේ උග්‍ර සන්ධිස්ථානයේදී ඇ නො නැසී පැවතීම ත් ඇගේ විමුක්තිය ත් පිණිස කලින් ම තිබිය යුතු දෙය සපයා ඇත; වැලිත් කලින් ම තිබිය යුතු මේ දෙය නම් ජනතාව අතර සුවිශාල වැඩිපිරිසේ විශ්වාසය බුක්ති විඳින, අවුරුදු බොහෝ ගණනක් තිස්සේ උරගා බැලීමෙන් පසු ඔවුන් විසින් තෝරාගෙන තිබෙන දේශපාලන නායකත්වයක් තිබීම ය. අද, ජනතාව අන් කවර දේශපාලන පක්ෂයක් හෝ කියන දේට වඩා කැමැත්තෙන් කොමියුනිස්ට් පක්ෂය කියන දේ පිළිගනිති. ඉකුත් අවුරුදු පහළොව තුළ චීන කොමියුනිස්ට් පක්ෂය කළ දුෂ්කර අරගල නිසා නො වේ නම්, පරාධීන වීමේ අළුත් තර්ජනය ඉදිරියෙහි චීනය බේරා ගන්ට කොහෙත් ම නුපුළුවන් වෙනවා ඇත.

වෙන් තු–ශියුගේ දක්ෂිණ අවස්ථාවාදය[5] ත් ලි ලි–සාන්ගේ "වාම" අවස්ථාවාදය[6] ත් යන වැරදි දෙක හැර, තව වැරදි දෙකක් විප්ලවවාදී යුද්ධය කරගෙන යන අතර චීන කොමියුනිස්ට් පක්ෂය විසින් කර තිබේ, පළමුවැනි වරද වූයේ 1931–34රේ "වාම" අවස්ථාවාදය[7] යි; එහි ප්‍රතිඵලය වූයේ ඉඩම් ලබාගැනීමේ විප්ලවවාදී යුද්ධයේදී බරපතල අලාභයන් සිදුවීමෙන්, අප විසින් සතුරාගේ පස්වැනි "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාරය පරාජය කරනවා වෙනුවට, අපට අපේ කඳවුරු ප්‍රදේශ නැති වීම ත්, රතු හමුදාව දුර්වල වීම ත් ය. 1935හේ ජනවාරියේදී ත්සුන්යි නුවර පැවැත්වූ මධ්‍යම කාරකසභාවේ දේශපාලන මණ්ඩලයේ විශාල කළ රැස්වීමේදී මේ වරද

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

නිවැරදි කරනලදී. දෙවැනි වරද වූයේ 1935–36යේදී ඇති වූ වාං කුඕ–තාඕගේ දක්ෂිණ අවස්ථාවාදය[8] යි; එය කොතරම් දුරට වැඩුණේ ද යත් එය පක්ෂයේ ත් රතු හමුදුවේ ත් විනය යටින් බින්දේ ය, රතු හමුදුවේ ප්‍රධාන බලසේනාවන්ගේ කොටසකට බරපතල අලාභ හානි සිදු කළේ ය. එහෙත්, මධ්‍යම කාරකසභාවේ නිවැරදි නායකත්වයට ත් රතු හමුදුවෙහි පක්ෂ සාමාජිකයන්ගේ, අණදෙන්නන්ගේ සහ සටන්කරුවන්ගේ දේශපාලන හැඟීමට ත් ස්තුති වන්නට මේ වරද ද අන්තිමේදී නිවැරදි කරනලදී. සත්තකින් ම මේ සියලු වැරදි අපේ පක්ෂයට, අපේ විප්ලවයට සහ යුද්ධයට හානිකර විය. එහෙත් අන්තිමේදී අපි ඒවා ජය ගත්තෙමු. එසේ කිරීමේදී අපේ පක්ෂය ත් රතු හමුදව ත් අයෝමය බවට පත් වී ඇත, වඩා ත් ශක්තිසම්පන්න වී ඇත.

චීන කොමියුනිස්ට් පක්ෂය ප්‍රබෝධකර, උත්කෘෂ්ඨ සහ විජයග්‍රාහී විප්ලවවාදි යුද්ධයට නායකත්වය දී ඇත, දිගට ම නායකත්වය දෙයි. මේ යුද්ධය චීනයේ විමුක්තියේ පතාකය පමණක් නො වේ; ජාත්‍යන්තර විප්ලවවාදි වැදගත්කමක් ද ඊට ඇත්තේ ය. ලොව හැම තැන ම විප්ලවවාදි ජනයාගේ ඇස් අප වෙත යොමු ව පවතී. මේ අළුත් අවස්ථාවේදී, එනම් ජපන්–විරෝධි ජාතික විප්ලවවාදි යුද්ධය පිළිබඳ අවස්ථාවේදී, අප චීන විප්ලවයට එය පරිපූර්ණ වන තැන තෙක් ම නායකත්වය දී, පෙරදිග ත් මුළු ලොවේ ත් විප්ලවය කෙරෙහි ගැඹුරු බලපෑමක් කරමු. අපට නිවැරදි මාක්ස්වාදි දේශපාලන ක්‍රියාමාර්ගයක් මෙන් ම නිවැරදි මාක්ස්වාදි යුද්ධ ක්‍රියාමාර්ගයක් ද උවමනා බව අපේ විප්ලවවාදි යුද්ධයෙන් ඔප්පු වී තිබේ; පසළොස් අවුරුද්දක විප්ලවය ත් යුද්ධය ත් එබඳු දේශපාලන සහ යුද්ධ ක්‍රියාමාර්ග හැඩගසා තිබේ. මෙතැන් සිට, යුද්ධයේ අළුත් අවස්ථාවේදී, ජාතික සතුරා පරාජය කිරීමේ අපේ අරමුණ මුදුන්පත් කිරීමට අපට හැකි වන සේ, මේ ක්‍රියාමාර්ග අළුත් වටාපිටා තත්වයන් තුළ තව දුරට ත් වර්ධනය කරනු ලැබේ ය' යි, අඩු තැන් පුරවනු ලැබේ ය' යි, ආඪ්‍ය කරනු ලැබේ ය' යි අපි විශ්වාස කරමු. නිවැරදි දේශපාලන සහ යුද්ධ ක්‍රියාමාර්ග බිහි වී වර්ධනය වන්නේ ඉබේ ඉබේ ම සහ සන්සුන් ලෙස නො ව අරගලය කරගෙන යන අතර පමණක් බව ඉතිහාසය අපට කියයි. මේ ක්‍රියාමාර්ග එක් අතකින් ''වාම'' අවස්ථාවාදය සමග ත්, අනික් අතින් දක්ෂිණ අවස්ථාවාදය සමග ත් සටන් කළ යුතු ය. විප්ලවයට සහ විප්ලවවාදි යුද්ධයට අලාභහානි සිදුකරන මේ අනර්ථකර අතට බර වෙන ගති සමග සටන් කරමින් ඒවා නිරවශේෂයෙන් ම ජය ගන්නේ නැති ව, මේ යුද්ධයේදී නිවැරදි ක්‍රියාමාර්ගයක් ස්ථාපිත කොට ජය දිනාගන්ට කොහෙත් ම නුපුළුවන් වෙනවා ඇත, මෙන්න මේ හේතුව නිසා ය මේ පොඩි පොතේදී මා නිතර නිතර වැරදි මත ගැන සඳහන් කරන්නේ.

පරිච්ඡේද III

චීනයේ විප්ලවවාදි යුද්ධයේ අංගලක්ෂණ

1. විෂයයේ වැදගත්කම

චීනයේ විප්ලවවාදි යුද්ධයට ඊට ම අයත් අංගලක්ෂණ තිබෙන බව නො පිළිගන්නා, නො දන්නා, නැතහොත් දැනගන්ට උවමනා නො කරන අය කුඹමින්තාං බලසේනාවන්ට විරුද්ධ ව රතු හමුදව විසින් කරන යුද්ධය සාමාන්‍ය වශයෙන් ගත් යුද්ධය සමග හෝ සෝවියට් සංගමයේ සිවිල් යුද්ධය සමග හෝ සමාන කර ඇත. ලෙනින් සහ ස්ටැලින් විසින් මග පෙන්වනලද සෝවියට් සංගමයෙහි සිවිල් යුද්ධයේ අත්දැකීමට ලොව පුරා පතළ වැදගත්කමක් තිබේ. චීන කොමියුනිස්ට් පක්ෂය ඇතුළු ව, සියලු ම කොමියුනිස්ට් පක්ෂ මේ අත්දැකීම ත් ලෙනින් සහ ස්ටැලින් විසින් එ ගැන කර තිබෙන න්‍යායාත්මක සම්පිණ්ඩනය ත් තම මාර්ගදේශකය වශයෙන් සලකයි. එහෙත් ඒ අත්දැකීම අප විසින් අපේ ම තත්වයන්ට යාන්ත්‍රික ලෙස යෙදිය යුතු ය'යි මෙයින් අදහස් නො වේ. චීනයේ විප්ලවවාදි යුද්ධයට, එහි පැති බොහෝවක් අතින්, එය සෝවියට් සංගමයේ සිවිල් යුද්ධයෙන් වෙන් කොට පෙන්වන අංගලක්ෂණ තිබේ. සත්තකින් ම මේ අංගලක්ෂණ ගණන් නො ගැනීම හෝ ඒවා තිබෙන බව නැතැ'යි කීම හෝ වැරදි ය. මේ කාරණය අපේ දස අවුරුද්දක යුද්ධයේදී සම්පූර්ණයෙන් සනාථ වී ඇත.

අපේ සතුරා ද එවැනි ම වැරදි කර තිබේ. රතු හමුදවට විරුද්ධ ව සටන් කිරීම පිණිස වෙන බලසේනාවන් හා සටන් කිරීමේදී යොදන උපායමාර්ගයට ත් උපක්‍රම වලට ත් වෙනස් උපායමාර්ගයක් සහ උපක්‍රම අවශ්‍ය බව ඔහු තේරුම් නො ගත්තේ ය. නොයෙක් අතින් තමාට ඇති වැඩි බලය මත විශ්වාසය තබාගෙන, ඔහු අප සැහැල්ලු ලෙස සලකමින්, ඔහුගේ පරණ සංග්‍රාම ක්‍රම වල ම ඇලී සිටියේ ය. 1933දී දියත් කළ ඔහුගේ සිව්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයට පෙර ත් ඒ යුද්ධව්‍යාපාරය පවත්නා අතර ත් තත්වය මෙය ම විය; එහි ප්‍රතිඵලය වශයෙන් ඔහු පරාජයන් වැලකට ම භාජන විය. කුඹමින්තාං හමුදවෙහි මේ ගැටළුව වෙත අළුත් පිළිවෙලකට යොමු වීමේ යෝජනාවක් කළේ පළමුවැනි ව ලියු වෙයි–යුආන් නමැති ප්‍රතිගාමී කුඹමින්තාං සෙනෙවියා ය, ඊළඟට තායි යුජ් ය. ඔවුන්ගේ අදහස අන්තිමේදී චියාං කායි–ශෙක් විසින් පිළිගනු ලැබී ය. ලූශාන් නුවර චියාං කායි–ශෙක්ගේ නිලධාරීන් පුහුණු කිරීමේ බළකාය[9] ඇති වූයේ ත් පස්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයේදී භාවිතාවේ යෙදූ ප්‍රතිගාමී අළුත් යුද්ධ මූලධර්ම[10] විකාශනය කරනු ලැබුවේ ත් එසේ ය.

LIBERATION BASE

https://liberationbase.wordpress.com

එහෙත් සතුරා රතු හමුදවට විරුද්ධ ව කරන සටන්ව්‍යාපාර වලට ඔබින ලෙස තම යුද්ධ මූලධර්ම වෙනස් කළ විට, ''පරණ විධි'' වලට ආපසු ගිය මිනිස්සු කණ්ඩායමක් අපේ ශ්‍රේණි තුළ පහළ වූහ. ඔව්හු සාමාන්‍ය පිළිවෙලට ගැලපෙන විධි වලට ආපසු යා යුතු ය'යි බල කර කියා සිටියහ, එක් එක් ප්‍රශ්නයේදී විශේෂිත වටාපිටා තත්වයන් විභාග කර බැලීම ප්‍රතික්ෂේප කළහ, රතු හමුදව ලේ හළා කළ සටන් පිළිබඳ ඉතිහාසයේදී ලබා ගත් අත්දැකීම ඉවත් දැමූහ, කුඹමින්තාං හමුදවේ ශක්තිය මෙන් ම අධිරාජ්‍යවාදයේ ත් කුඹමින්තාං පක්ෂයේ ත් ශක්තිය සුළු කොට තැකූහ, සතුරා විසින් යොදනලද ප්‍රතිගාමී අළුත් මූලධර්ම දෙස පොට්ට ඇසකින් බැලූහ. ප්‍රතිඵලයක් වශයෙන්, ශෙන්සි–කාන්සු දේශසීමා ප්‍රදේශය හැර සෙසු සියලු විප්ලවවාදි කඳවුරු ප්‍රදේශ නැති විය, රතු හමුදව මිනිසුන් 3,00,000කින් දස දහස් කීපයකට හීන කරනු ලැබී ය, චීන කොමියුනිස්ට් පක්ෂයේ සාමාජික–සංඛ්‍යාව 3,00,000කින් දස දහස් කීපයකට අඩු විය, කුඹමින්තාං ප්‍රදේශ වල පක්ෂ සංවිධාන සියල්ල ම පාහේ විනාශ කරනු ලැබී ය. කොටින්, අපි දරුණු දඬයක් ගෙව්මු; එය එහි වැදගත්කමින් ඓතිහාසික විය. මේ මිනිස්සු කණ්ඩායම තුමූ මාක්ස්–ලෙනින්වාදියෝ ය'යි කියා ගත්හ; එහෙත් ඇත්ත වශයෙන් ඔවුන් මාක්ස්–ලෙනින්වාදයෙන් අංශුමාත්‍රයක් වත් ඉගෙනගෙන තිබුණේ නැත. මාක්ස්වාදයේ ඉතා ම සාරමය දෙය, මාක්ස්වාදයේ සජීව ආත්මය, වාස්තුවික තත්වයන් ගැන කරන වාස්තුවික විශ්ලේෂණය වේ ය'යි ලෙනින් කීවේ ය.[11] අපේ මේ සහෝදරවරුන්ට අමතක වූයේ අන්න ඒ කාරණය ම යි.

එහෙයින්, චීනයේ විප්ලවවාදි යුද්ධයේ අංගලක්ෂණ තේරුම් ගන්නේ නැති ව, ඒ යුද්ධයට මග පෙන්වමින් එය ජයග්‍රහණය කරා ගෙනයන්ට කොහෙත් ම බැරි බව කෙනකුට පෙනෙයි.

2. චීනයේ විප්ලවවාදි යුද්ධයේ අංගලක්ෂණ මොනවා ද?

එසේ නම් චීනයේ විප්ලවවාදි යුද්ධයේ අංගලක්ෂණ මොනවා ද?

ප්‍රධාන ඒවා සතරක් ඇතැ'යි මම සිතමි.

පළමුවැන්න චීනය දේශපාලන වශයෙන් සහ ආර්ථික වශයෙන් අසම ලෙස වර්ධනය වී තිබෙන්නා වූ ද, 1924–27තේ විප්ලවය තුළින් ගොස් තිබෙන්නා වූ ද සුවිශාල අර්ධ–විජිත රටක් වීම ය.

චීනයේ විප්ලවවාදි යුද්ධයට වර්ධනය වී ජය අත්පත් කර ගත හැකි බව මේ අංගලක්ෂණයෙන් පෙන්නුම් කරයි. 1927තේ අවසානයේදී ත් 1928වේ මුලදී ත්, චීනයෙහි ගොරිල්ලා සංග්‍රාමය පටන් ගත් පසු නොබෝ කලකින්,

හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි චිංකාං කඳු වල සිටි ඇතැම් සහෝදරවරුන් ''කොපමණ කලක් රතු කොඩිය ලෙලදෙමින් තබාගන්ට අපට හැකි වේ ද?'' යන ප්‍රශ්නය නැඟූ විට අපි මෙය (හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයේ පළමුවැනි පක්ෂ සම්මේලනයේදී[12]) පෙන්වා දුනිමු. මෙය ඉතා ම මූලික ප්‍රශ්නයක් වූ නිසා ය. විනාශ නො වී ඉතිරි වී වර්ධනය වෙන්ට චීනයේ කඳවුරු ප්‍රදේශ වලට ත් චීන රතු හමුදවට ත් හැකි වේ ද යන මේ ප්‍රශ්නයට පිළිතුරු නො දී, අපට එක පියවරකින් වත් ඉදිරියට යන්ට පුළුවන් කමක් තිබුණේ නැත. 1928දී පවත්වනලද චීන කොමියුනිස්ට් පක්ෂයේ හයවැනි ජාතික සම්මේලනය මේ ප්‍රශ්නයට යළිත් පිළිතුරු දුන්නේ ය. එතැන් සිට චීන විප්ලවවාදි ව්‍යාපාරයට නිවැරදි න්‍යායාත්මක පදනමක් තිබී ඇත.

අපි දැන් මේ අංගලක්ෂණය විශ්ලේෂණය කරමු.

චීනයේ දේශපාලන සහ ආර්ථික වර්ධනය අසම ය — දුර්වල ධනවාදි අර්ථක්‍රමයක් අති විශාල අර්ධ–රදළ අර්ථක්‍රමයක් සමග එකට පවතී; නූතන කර්මාන්තමය සහ වාණිජ්‍ය නගර කීපයක් එක තැන ම පල්වෙන සුවිශාල ගම්බදපෙදෙසක් සමග එකට පවතී; කර්මාන්තමය කම්කරුවන් දස ලක්ෂ ගණනක් පරණ ක්‍රමය යටතේ වෙහෙසෙන ගොවියන් සහ හස්තකර්මාන්තකාරයන් කෝටි ගණනක් සමග එකට සිටිත්; මධ්‍යම ආණ්ඩුව ග්‍රහණය කරගෙන සිටින මහ යුදදෙටුවෝ පළාත් ග්‍රහණය කරගෙන සිටින කුඩා යුදදෙටුවන් සමග එකට සිටිති; දෙ වර්ගයක ප්‍රතිගාමී හමුදා, එනම් චියාංකායි–ශෙක් යටතේ සිටින ඊනියා මධ්‍යම හමුදව සහ පළාත් වල යුදදෙටුවන් යටතේ සිටින ''නානාවිධ භටකණ්ඩායම්'', එකට සිටිති; දුම්රිය පාරවල්, දුම්නැව් මාර්ග සහ මෝටර් වාහන යන පාරවල් කීපයක් අත්කරත්ත පාරවල් සහ බොහෝවක් පයින් වත් ගමන් කළ නො හැකි අඩි–පාරවල් විශාල ගණනක් සමග එකට පවතී.

චීනය අර්ධ–විජිත රටකි — අධිරාජ්‍යවාදි බලවතුන් අතර අසමගිය චීනයෙහි පාලක කණ්ඩායම් අතර අසමගිය ඇති කරන සුළු ය. රටවල් කීපයක් විසින් ග්‍රහණය කරගෙන සිටින අර්ධ–විජිත රටක් ද තනි රටක් විසින් ග්‍රහණය කරගෙන සිටින විජිතයක් ද අතර වෙනසක් තිබේ.

චීනය සුවිශාල රටකි — ''නැගෙනහිර කළුවර වන විට, බටහිර එළිය වේ; දකුණෙහි දේ කළුවර වන විට, උතුරෙහි තවම එළිය තිබේ.'' එහෙයින් උපායශීලී ව යුද්ධසේනාවන් හසුරුවන්ට ඉඩ නැතැ'යි අයකු හිතට කරදර ගන්ට උවමනා නැත.

චීනය ශ්‍රේෂ්ඨ විප්ලවයක් තුළින් ගොස් ඇත — මෙය රතු හමුදව වැඩුණු බීජුවට සපයා දී ඇත, රතු හමුදවේ නායකයා, එනම්, චීන කොමියුනිස්ට්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පක්ෂය, සපයා දී ඇත, විප්ලවයකට සහභාගි වීමේ අත්දැකීම බහුජනයාට සපයා දී ඇත.

එහෙයින්, චීනයේ විප්ලවවාදි යුද්ධයේ පළමුවැනි අංගලක්ෂණය දේශපාලන වශයෙන් සහ ආර්ථික වශයෙන් අසම ලෙස වර්ධනය වී තිබෙන, විප්ලවයක් තුළින් ගොස් තිබෙන, සුවිශාල අර්ධ–විජිත රටක ඒ යුද්ධය කරනු ලැබීම ය' යි අපි කියමු. මේ අංගලක්ෂණය අපේ දේශපාලන උපාය-මාර්ගය සහ උපක්‍රම මෙන් ම අපේ යුද්ධ උපායමාර්ගය සහ උපක්‍රම ත් මූලික වශයෙන් නිශ්චය කරයි.

දෙවැනි අංගලක්ෂණය අපේ සතුරා ලොකු ය, බලවත් ය යනුයි.

රතු හමුදවේ සතුරා වන කුඕමින්තාං පක්ෂය සම්බන්ධයෙන් කරුණු පවතින සැටි කෙසේ ද? එය දේශපාලන බලය අල්ලාගෙන සිටින, සිය බලය තරමක් දුරට ස්ථාවර කරගෙන සිටින පක්ෂයකි. එය ලෝකයේ ප්‍රධාන අධිරාජ්‍යවාදි රාජ්‍යයන්ගේ අනුබලය ලබාගෙන ඇත. එය ස්වකීය හමුදව අළුතෙන් හැඩ ගසා ඇති හෙයින්, ඒ හමුදව චීන ඉතිහාසයෙහි අන් කවර හමුදවකට හෝ වෙනස් වූ ද, මුළු එකක් ලෙස ගත් කල නූතන රාජ්‍යයන්ගේ හමුදවන්ට සමාන වූ ද හමුදවක් බවට පත් වී ඇත; මේ හමුදවට රතු හමුදවට වඩා හොඳ අවිආයුධ සහ යුද්ධ භාණ්ඩොපකරණ සපයනු ලබයි, එය චීන ඉතිහාසයෙහි අන් කවර හමුදවකට හෝ වඩා, එසේ ත් නැතහොත් අන් කවර රටක හෝ ස්ථාවර හමුදවකට වඩා, විශාල ය. කුඕමින්තාං හමුදව ත් රතු හමුදව ත් අතර විශාල වෙනසක් තිබේ. කුඕමින්තාං පක්ෂය චීනයේ දේශපාලනයෙහි, අර්ථක්‍රමයෙහි, ගමනාගමනයෙහි හා පණිවිඩ හුවමාරුවෙහි සහ සංස්කෘතියෙහි ප්‍රධාන ස්ථාන හෝ ජීව–නාල ග්‍රහණය කරගෙන සිටී; එහි දේශපාලන බලය රට පුරා ම පතළ ය.

චීන රතු හමුදව මෙසේ අභිමුඛ ව සිටින්නේ විශාල වූ ත් බලවත් වූ ත් සතුරකුට ය. මෙය චීනයේ විප්ලවවාදි යුද්ධයේ දෙවැනි අංගලක්ෂණය වේ. එය අවශ්‍යයෙන් ම රතු හමුදවේ යුද්ධ සටන්ව්‍යාපාර නොයෙක් අතින් සාමාන්‍ය වශයෙන් ගත් යුද්ධ වල සටන්ව්‍යාපාර වලින් ද, සෝවියට් සංගම-යෙහි සිවිල් යුද්ධයේ හෝ උතුරු යුදගමනේ සටන්ව්‍යාපාර වලින් ද වෙනස් කරයි.

තුන්වැනි අංගලක්ෂණය රතු හමුදව කුඩා ය, දුර්වල ය යනුයි.

ගොරිල්ලා සේනාංග වශයෙන් පටන් ගත් චීන රතු හමුදව ඇති වූයේ පළමුවැනි ශ්‍රේෂ්ඨ විප්ලවයේ පරාජයට පසු ය. මෙය සිදු වූයේ චීනයෙහි ප්‍රතිගාමිත්වයේ වකවනුවකදී මෙන් ම ලෝකයේ ප්‍රතිගාමි ධනපති රට වල සාපේක්ෂක වශයෙන් දේශපාලන සහ ආර්ථික ස්ථාවරභාවයක් පැවති වකවනුවකදී ය.

අපේ දේශපාලන බලය පවතින්නේ විසිරුණු සහ හුදකලා කඳුකර හෝ දුරුකතර ප්‍රාන්තයන්හි ය, බැහැරින් කිසි ම ආධාරයක් නො ලබන්නේ ය. විප්ලවවාදි කඳවුරු ප්‍රදේශ වල ආර්ථික සහ සංස්කෘතික තත්වයෝ කුඕමින්තාං ප්‍රදේශ වල තත්වයන් හා සසඳන විට නො දියුණු ය. විප්ලව-වාදි කඳවුරු ප්‍රදේශ වලට ඇතුළත් වන්නේ ගම්බද දිස්ත්‍රික්ක සහ කුඩා නගර පමණකි. මේ ප්‍රදේශ ආරම්භයේදී අතිශයින් ම කුඩා විය, එතැන් සිට එතරම් විශාල ව වැඩී නැත. එමතු නො ව, ඒවා අනිස්ථිර ය, ස්ථිර නො වේ; රතු හමුදවට ඇත්ත වශයෙන් තහවුරු කළ කඳවුරු නැත.

රතු හමුදව සංඛ්‍යාව අතින් කුඩා ය, එහි අවිආයුධ දුබල ය, ආහාර, ඇඳඇතිරිලි කොට්ට මෙට්ට ආදිය සහ ඇඳුම් වැනි සපයන–දේ ලබාගැනීම අතින් ඒ හමුදවට මහත් දුෂ්කරතා ඇත්තේ ය.

මේ අංගලක්ෂණය මීට කලින් සඳහන් කළ එක හා සසඳන විට තියුණු වෙනසක් පෙන්වයි. රතු හමුදවේ උපායමාර්ගය ත් උපක්‍රම ත් නැඟී තිබෙන්නේ මේ තියුණු වෙනසින් ය.

සිව්වැනි අංගලක්ෂණය කොමියුනිස්ට් පක්ෂ නායකත්වය සහ ඉඩම් ලබාගැනීමේ විප්ලවය යි.

මේ අංගලක්ෂණය පළමුවැනි අංගලක්ෂණයේ නො වැළැක්විය හැකි ප්‍රති-විපාකය යි. එය අංග දෙකක් හටගන්වා ඇත. එක් අතකින්, චීනයේ විප්ලවවාදි යුද්ධය ඇති වී තිබෙන්නේ චීනයෙහි ත් ධනපති ලෝකය මුළුල්ලෙහි ත් ප්‍රතිගාමිත්වයේ වකවනුවක් තුළ ය යනු සත්‍ය කාරණය වුව ද, ඒ යුද්ධය කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ පවතින හෙයින් ද ගොවිජනතාවගේ අනුබලය ලබන හෙයින් ද ජය ලබන්නට පුළුවන්කම තිබේ. මේ අනුබලයට ස්තුති වන්නට, අපේ කඳවුරු ප්‍රදේශ කුඩා නමුත්, දේශපාලන වශයෙන් ඉතා බලවත් ය, යෝධ කුඕමින්තාං පාලනක්‍රමයට ස්ථිර ලෙස ම විරුද්ධ ව නැඟී සිටින්නේ ය; ඒ අතර ම යුද්ධමය වශයෙන් ඒවා කුඕමින්තාං ප්‍රහාරයන්ට මහත් දුෂ්කරතා ඇති කරයි. කුඩා නමුත්, රතු හමුදවට, කොමියුනිස්ට් පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන එහි සාමාජිකයන් ඉඩම් ලබාගැනීමේ විප්ලවයෙන් බිහි වී සිටින හෙයින් සහ තමන්ගේ ම පලප්‍රයෝජන උදෙසා සටන් කරන හෙයින් ද, එහි අණදෙන්නන් සහ සටන්කරුවන් දේශපාලන වශයෙන් සමගි වී සිටින හෙයින් ද, සටන් කිරීමේ මහත් හැකියාවක් තිබේ.

අනික් අතට, කුඕමින්තාං පක්ෂය පෙන්නුම් කරන්නේ මීට වඩා තියුණු ලෙස වෙනස් තත්වයකි. එය ඉඩම් ලබාගැනීමේ විප්ලවයට විරුද්ධ වන හෙයින්, ගොවිජනතාව ගෙන් අනුබලයක් නො ලබයි. කුඕමින්තාං පක්ෂයට විශාල හමුදවක් සිටින නමුත්, මුලදී කුඩා නිෂ්පාදකයන් ව සිටි තම සෙබළුන් ද පහළ–පෙළේ නිලධාරීන් බොහෝ දෙනා ද පක්ෂය වෙනුවෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කැමැත්තෙන් ම සිය දිවි අනතුරට පත් කරගැනීමට පොළඹවන්ට ඒ පක්ෂයට බැරි ය. එහි නිලධාරීන් සහ මිනිස්සු දේශපාලන වශයෙන් බෙදී සිටිති, එයින් එහි සටන් හැකියාව හීන වේ.

3. මේ අංගලක්ෂණයන් කෙරෙන් ඇති වන අපේ උපායමාර්ගය සහ උපක්‍රම

මෙසේ චීනයේ විප්ලවවාදී යුද්ධයේ ප්‍රධාන අංගලක්ෂණ සතර නම්: දේශපාලන වශයෙන් සහ ආර්ථික වශයෙන් අසම ලෙස වර්ධනය වී තිබෙන්නා වූ ද ශ්‍රේෂ්ඨ විප්ලවයක් තුළින් ගොස් තිබෙන්නා වූ ද සුවිශාල අර්ධ–විජිත රටක්, විශාල බලවත් සතුරෙක්, කුඩා දුර්වල රතු හමුදවක් සහ, ඉඩම් ලබාගැනීමේ විප්ලවය යන මේවා ය. මේ අංගලක්ෂණ චීනයේ විප්ලවවාදී යුද්ධයට මග පෙන්වීම පිණිස ක්‍රියාමාර්ගය ද, එසේ ම ඒ යුද්ධයේ උපායමාර්ගික සහ උපක්‍රමික මූලධර්ම බොහෝවක් ද නිශ්චය කරයි. වැඩී තම සතුරා පරාජය කරන්ට චීන රතු හමුදවට පුළුවන් බව පළමුවැනි සහ සිව්වැනි අංගලක්ෂණ වලින් නිගමනය වේ. මහත් වේගයෙන් වැඩෙන්ට හෝ ඉක්මනින් තම සතුරා පරාජය කරන්ට චීන රතු හමුදවට කොහෙත් ම බැරි බව දෙවැනි සහ තුන්වැනි අංගලක්ෂණ වලින් නිගමනය වේ; වෙන වචන වලින්, යුද්ධය දිග්ගැස්සෙනවා ඇත, වැරදි විධියට ක්‍රියා කළොත් එය පරදින්ට පවා ඉඩ තිබේ.

චීනයේ විප්ලවවාදී යුද්ධයේ අංග දෙක මේවා ය. ඒවා එක විට ම පවතී; ඒ කියන්නේ මෙය යි: හිතකර සාධක ත් තිබේ, දුෂ්කරතා ත් තිබේ. මෙය චීනයේ විප්ලවවාදී යුද්ධයේ මූලික නීතිය වේ; එයින් වෙන නීති රැසක් ඇති වේ. අපේ අවුරුදු දහයක යුද්ධයේ ඉතිහාසය මේ නීතියේ සත්‍යතාව ඔප්පු කර තිබේ. යමෙක් ඇස් ඇත්තේ වේ නමුත් මේ මූලික නීතිය දක්නට අසමත් වේ ද, ඔහුට චීනයේ විප්ලවවාදී යුද්ධයට මග පෙන්වන්ට බැරි ය, රතු හමුදව ජයග්‍රහණයන් කරා ගෙනයන්ට බැරි ය.

මූලධර්මය පිළිබඳ මතු දක්වන කරුණු සියල්ල ම අප විසින් නිවැරදි ලෙස බේරුම් කළ යුතු බව පැහැදිලි ය:

> අප උපායමාර්ගික වශයෙන් යොමු වන අත නිවැරදි ලෙස නිශ්චය කරන්න, පහරදීමෙහි යෙදී සිටින විට සාහසිකවාදයට විරුද්ධ වෙන්න, ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට හණමිටිවාදයට විරුද්ධ වෙන්න, එක් තැනකින් තව තැනකට මාරු වෙන විට පළායාමේ ධර්මයට විරුද්ධ වෙන්න.

රතු හමුදවේ සටන්ව්‍යාපාර වල ගොරිල්ලා ලක්ෂණය පිළිගන්නා අතර ම, රතු හමුදව තුළ ගොරිල්ලා–වාදයට විරුද්ධ වෙන්න.

දිග්ගැසුණු යුද්ධව්‍යාපාර වලට සහ ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ උපායමාර්ගයකට විරුද්ධ වෙන්න, දිග්ගැසුණු යුද්ධයක් පිළිබඳ උපායමාර්ගය සහ ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ යුද්ධ-ව්‍යාපාර අනුමත කරන්න.

ස්ථිර සටන් පේළි වලට සහ ස්ථානගත සංග්‍රාමයට විරුද්ධ වෙන්න, අනිස්ථිර සටන් පේළි වලට සහ ජංගම සංග්‍රාමයට පක්ෂ වෙන්න.

උදක් සතුරා පළවා හැරීම පිණිස සටන් කිරීමට විරුද්ධ වෙන්න, සතුරා මුලසුන් කරලීමට සටන් කිරීම අනුමත කරන්න.

එක විට දෙ දිසාවකට "මුෂ්ටි" දෙකකින් ගැසීමේ උපායමාර්ගයට විරුද්ධ වෙන්න, එක විට එක දිසාවකට "මුෂ්ටි" එකකින් ගැසීමේ උපායමාර්ගය අනුමත කරන්න.[13]

විශාල පසුමුණු සේවා සංවිධානයක් පවත්වාගෙන යාමේ ප්‍රතිපත්තියට විරුද්ධ වෙන්න, කුඩා සංවිධාන පිළිබඳ ප්‍රතිපත්තිය අනුමත කරන්න.

ඒකාන්ත වශයෙන් මධ්‍යගත කළ විධානයට විරුද්ධ වෙන්න, සාපේක්ෂක වශයෙන් මධ්‍යගත කළ විධානයට පක්ෂ වෙන්න.

තනිකර යුද්ධය ම මුල් කරගෙන බලන විධිය සහ තැනින් තැන ඇවිදින කැරලිකරුවන්[14]ගේ පිළිවෙලවල් වලට විරුද්ධ වෙන්න, රතු හමුදව චීන විප්ලවයේ ප්‍රචාරකයකු සහ සංවිධායකයකු බව පිළිගන්න.

පල්හොරුන්ගේ විධි[15] වලට විරුද්ධ වෙන්න, දැඩි දේශපාලන විනය අනුමත කරන්න.

යුදදෙටුවන්ගේ විධි වලට විරුද්ධ වෙන්න, හමුදව තුළ නිසි සීමාවන් ඇතුළත ප්‍රජාතන්ත්‍රවාදය ද අණට ගරු කරන විනයක් ද යන දෙකට ම පක්ෂ වෙන්න.

කාඩර්වරුන් ගැන වැරදි, නිකායවාදී ප්‍රතිපත්තියකට විරුද්ධ වෙන්න, කාඩර්වරුන් ගැන නිවැරදි ප්‍රතිපත්තිය අනුමත කරන්න.

තනි වීමේ ප්‍රතිපත්තියට විරුද්ධ වෙන්න, දිනා ගත හැකි සියලු මිත්‍ර පාක්ෂිකයන් මේ පැත්තට දිනා ගැනීමේ ප්‍රතිපත්තිය ස්ථිර කරන්න.

රතු හමුදව එහි පරණ අවස්ථාවේ ම තබා ගැනීමට විරුද්ධ වෙන්න, එය අළුත් අවස්ථාවකට වර්ධනය කිරීමට වෙර දරන්න.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

උපායමාර්ගය පිළිබඳ ගැටළු ගැන අප කරන මේ සාකච්ඡාවේ අභිප්‍රාය දස අවුරුද්දක් ම ලේ වගුරමින් කළ චීනයේ විප්ලවවාදී යුද්ධයේදී ලබා ගත් ඉතිහාසීය අත්දැකීමේ ආලෝකයෙන් මේ කරුණු සැලකිල්ලෙන් තෝරා බේරා පහදා ගැනීම ය.

පරිච්ඡේද IV

''වටලෑම සහ මැඩලීම'' සහ ඊට විරුද්ධ ප්‍රති-යුද්ධව්‍යාපාර — චීනයේ සිවිල් යුද්ධයේ ප්‍රධාන රටාව

අපේ ගොරිල්ලා යුද්ධය පටන් ගත් ද සිට ගත වී තිබෙන දස අවුරුද්ද තුළ, හැම ස්වාධීන රතු ගොරිල්ලා සේනාංගයක් ම, හැම රතු හමුද සේනාංගයක් ම හෝ හැම විප්ලවවාදී කඳවුරු ප්‍රදේශයක් ම සතුරා විසින් නිතිපතා ම ''වටලෑම සහ මැඩලීම''ට භාජන කර තිබේ. සතුරා රතු හමුදව සලකන්නේ දරුණු සතකු ලෙස ය, ඌ පෙනෙන්ට එන ඇසිල්ලේ ම අල්ලාගන්ට ඔහු මාන බලයි. ඔහු සඳහට ම රතු හමුදව ලුහුබඳියි, සදහට ම එය වට කරන්ට උත්සාහ කරයි. අවුරුදු දහයක් තිස්සේ ම මේ සංග්‍රාම රටාව වෙනස් වී නැත; සිවිල් යුද්ධය නතර වී ජාතික යුද්ධයකට තැන ලැබුණොත් මිස, සතුරා වඩා දුබල ප්‍රතිමල්ලයා ත් රතු හමුදව වඩා ප්‍රබල ප්‍රතිමල්ලයා ත් බවට පත් වන දිනය වන තුරු මේ රටාව මෙසේ ම පවතිනවා ඇත.

රතු හමුදවේ සටන්ව්‍යාපාර ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ව කරන ප්‍රති-යුද්ධව්‍යාපාර වල ආකාරය ගනී. අපට ජයග්‍රහණය යන්නෙන් ප්‍රධාන වශයෙන් අදහස් වන්නේ ''වටලෑම සහ මැඩලීම'' සමග සටන් කිරීමෙන් ලබන ජයග්‍රහණය යි; එනම්, උපායමාර්ගික ජයග්‍රහණය සහ යුද්ධව්‍යාපාර වලදී ලබන ජයග්‍රහණ යි. එක් එක් ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයට විරුද්ධ ව කරන සටන, සාමාන්‍යයෙන් ලොකු කුඩා සටන් කීපයක් හෝ විසි තිස් ගණන් පවා අඩංගු වන එක් ප්‍රති-යුද්ධව්‍යාපාරයක් වේ. සටන් බොහෝ ගණනක් ජය ගෙන තිබෙන්ට පුළුවන් නමුත්, ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයක් මූලික වශයෙන් සිඳ බිඳ දමනලද්දේ නම් මිස, උපායමාර්ගික ජයග්‍රහණයක් ගැන වත් මුළු එකක් වශයෙන් ප්‍රති-යුද්ධව්‍යාපාරයේදී ලැබූ ජයග්‍රහණයක් ගැන වත් කතා කරන්ට අපට බැරි ය. රතු හමුදවේ යුද්ධ පිළිබඳ දස අවුරුද්දේ ඉතිහාසය ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ප්‍රති-යුද්ධව්‍යාපාර වල ඉතිහාසයකි.

සතුරාගේ ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර වලදී ත් ඒවාට විරුද්ධ රතු හමුදවේ ප්‍රති-යුද්ධව්‍යාපාර වලදී ත්, පහරදීම සහ ආරක්ෂාවීම

යන සටන් ආකාර දෙක ම යොදනු ලැබේ; මෙහිදී පුරාණ සහ නූතන, චීනයෙහි හෝ වෙන තැනක, අන් කවර යුද්ධයකට හෝ වඩා වෙනසක් නැත. කෙසේ වෙතත්, චීනයේ සිවිල් යුද්ධයේ විශේෂ අංගලක්ෂණය නම් බොහෝ කලක් මුළුල්ලෙහි මේ ආකාර දෙක මාරුවෙන් මාරුවට නැවත නැවත ත් යෙදීම ය. එක් එක් ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයේදී, සතුරා රතු හමුදවේ ආරක්ෂාවීමට විරුද්ධ ව පහරදීම යොදයි, රතු හමුදව ඔහුගේ පහරදීමට විරුද්ධ ව ආරක්ෂාවීම යොදයි; මෙය ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ප්‍රති-යුද්ධව්‍යාපාරයක පළමුවැනි අවස්ථාව වේ. ඉක්බිති සතුරා රතු හමුදවේ පහරදීමට විරුද්ධ ව ආරක්ෂාවීම යොදයි, රතු හමුදව ඔහුගේ ආරක්ෂාවීමට විරුද්ධ ව පහරදීම යොදයි; මෙය ප්‍රති-යුද්ධව්‍යාපාරයේ දෙවැනි අවස්ථාව වේ. හැම ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයකට ම මේ අවස්ථා දෙක තිබේ; ඒවා දිගු කලක් මුළුල්ලෙහි මාරුවෙන් මාරුවට යෙදේ.

දිගුකලක් මුළුල්ලෙහි මාරුවෙන් මාරුවට නැවත නැවත ත් යෙදීම යන්නෙන් අප අදහස් කරන්නේ මේ සංග්‍රාම රටාව සහ මේ සටන් ආකාරයන් නැවත නැවත ත් ඇති වීම ය. මෙය කාටත් පැහැදිලි සත්‍ය කාරණයකි. ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයක් සහ ඊට විරුද්ධ ප්‍රති-යුද්ධව්‍යාපාරයක් — නැවත නැවත ත් ඇති වන යුද්ධයේ රටාව මෙසේ ය. එක් එක් යුද්ධව්‍යාපාරයේදී සටන් ආකාරය මාරුවීම සතුරා අපේ ආරක්ෂාවීමට විරුද්ධ ව පහරදීම යොදන සහ අප ඔහුගේ පහරදීමට අපේ ආරක්ෂාවීමෙන් මුහුණ දෙන පළමුවැනි අවස්ථාවෙන් ද, සතුරා අපේ පහරදීමට විරුද්ධ ව ආරක්ෂාවීම යොදන සහ අප ඔහුගේ ආරක්ෂාවීමට අපේ පහරදීමෙන් මුහුණ දෙන දෙවැනි අවස්ථාවෙන් ද යුක්ත වේ.

යුද්ධව්‍යාපාරයක හෝ සටනක හෝ අඩංගු දෙය සම්බන්ධයෙන්, එය හුදෙක් එක ම දේ නැවත නැවත සිදු වීම නො වේ, එක් එක් වතාවේ එය වෙනස් ය. මෙය ද සත්‍ය කාරණයකි, කාටත් පැහැදිලි ය. මේ සම්බන්ධයෙන්, එක් එක් යුද්ධව්‍යාපාරය සහ එක් එක් ප්‍රති-යුද්ධව්‍යාපාරය සමග පරිමාණය වඩ වඩා විශාල වීම ත්, තත්වය වඩ වඩා ව්‍යාකූල වීම ත්, සටන් කිරීම වඩ වඩා දැඩි වීම ත් රීතියක් බවට පත් වී ඇත.

එහෙත් නැඟීම් සහ බැසීම් නැති බවක් මෙයින් අදහස් නො වේ. සතුරාගේ පස්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයට පසු, රතු හමුදව බෙහෙවින් ම දුර්වල විය, දකුණේ කඳවුරු ප්‍රදේශ සියල්ල ම නැති විය. වයඹදිගට තැන් මාරු කර සිටින හෙයින්, දැන් රතු හමුදව අල්ලාගෙන සිටින්නේ දකුණේදී එය අල්ලාගෙන සිටියාක් මෙන් අභ්‍යන්තර සතුරාට තර්ජනයක් වන ඉතා වැදගත් තැනක් නො වේ; එහි ප්‍රතිඵලයක් වශයෙන් ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර වල පරිමාණය කුඩා වී ඇත, තත්වය වඩා නිරාකූල වී ඇත, සටන් දැඩි බවෙන් අඩු වී ඇත.

LIBERATION BASE

https://liberationbase.wordpress.com

රතු හමුදවට පරාජයක් වන්නේ කුමක් ද? උපායමාර්ගික වශයෙන් කතා කරන කල, පරාජයක් ඇති වන්නේ ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ප්‍රති–යුද්ධව්‍යාපාරයක් සම්පූර්ණයෙන් ම ව්‍යර්ථ වූ විට ය; එහෙත් එවිට පවා පරාජය අඩාල සහ තාවකාලික එකක් පමණකි. කවර හෙයින් ද යත් සිවිල් යුද්ධයේදී පූර්ණ පරාජයක් වෙනවා ඇත්තේ රතු හමුදව මුළුමනින් ම විනාශ කරනු ලැබීම පමණක් නිසා ය; එහෙත් මෙය කවදා වත් සිදු වී නැත. ව්‍යාප්ත කඳවුරු ප්‍රදේශ නැති වීම ත් රතු හමුදව තැන් මාරු කිරීම ත් තාවකාලික සහ අඩාල පරාජයක් විය. මේ අඩාල පරාජය නිසා පක්ෂ සාමාජිකපිරිසෙන්, සන්නද්ධ බලසේනාවන් ගෙන් සහ කඳවුරු ප්‍රදේශ වලින් සියයට 90ක් ම නැති වූ නමුත්, එය අවසාන සහ පූර්ණ පරාජයක් නො වී ය. මේ තැන් මාරු කිරීම අප අපේ ආරක්ෂාවීම දිගට ම ගෙනයාමක් ය'යි ද, සතුරා කරන ලුහුබැඳීම ඔහු ඔහුගේ පහරදීම දිගට ම ගෙනයාමක් ය'යි ද, අපි කියමු. ඒ කියන්නේ මෙය යි: සතුරාගේ ''වටලෑම සහ මැඩලීම'' ත් අපේ ප්‍රති-යුද්ධව්‍යාපාරය ත් අතර අරගලය යන විට අප ආරක්ෂාවීමේ අවස්ථාවෙන් පහරදීමේ අවස්ථාවට පරිවර්තනය වෙනවා වෙනුවට සතුරාගේ පහරදීමෙන් අපේ ආරක්ෂාවීම බිඳ හෙළන්ට අපි ඉඩ හැරියෙමු; එහෙයින් අපේ ආරක්ෂාවීම පසුබැසීමක් බවට ද සතුරාගේ පහරදීම ලුහුබැඳීමක් බවට ද පරිවර්තනය විය. එහෙත් රතු හමුදව අළුත් ප්‍රදේශයකට පැමිණි කල, උදහරණ වශයෙන් අප චියාංසි පළාතෙන් සහ වෙනත් නොයෙක් ප්‍රාන්ත වලින් ශෙන්සි පළාතට මාරු වූ කල, ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර නැවත අළුතෙන් ම ඇති වෙන්ට පටන් ගත්තේ ය. රතු හමුදවේ උපායමාර්ගික පසුබැසීම (දීර්ඝ ගමන) එහි උපායමාර්ගික ආරක්ෂාවීම දිගට ම ගෙනයාමක් වූ බව ත්, සතුරාගේ උපායමාර්ගික ලුහුබැඳීම ඔහුගේ උපායමාර්ගික පහරදීම දිගට ම ගෙනයාමක් වූ බව ත් අප කියන්නේ ඒ නිසා ය.

පුරාණ හෝ නූතන, චීනයෙහි හෝ එතෙර සෙසු සියලු යුද්ධ වලදී මෙන් ම, චීන සිවිල් යුද්ධයේදී ද ඇත්තේ මූලික සටන් ආකාර දෙකක් පමණි; එනම් ප්‍රහරණය සහ ආරක්ෂණය යි. චීනයේ සිවිල් යුද්ධයේ විශේෂ අංගලක්ෂණය වනුයේ, කිලෝමීටර් දස දහසකට වැඩි ගණනක ශ්‍රේෂ්ඨ උපායමාර්ගික තැන් මාරුව පිළිබඳ ආශ්චර්යය (දීර්ඝ ගමන)[16] ත් ඇතුළු ව, ආරක්ෂණය සහ ප්‍රහරණය යන සටන් ආකාර දෙක දිගු කලක් තිස්සේ මාරුවෙන් මාරුවට යෙදෙමින් ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර ත් අපේ ප්‍රති–යුද්ධව්‍යාපාර ත් දිගු කලක් තිස්සේ නැවත නැවත ඇති වීම ය.

සතුරාට ලැබෙන පරාජයක් ද බොහෝ දුරට එසේ ම ය. සතුරාගේ ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය බිඳිනු ලබන කල සහ අපේ ආරක්ෂාවීම පහරදීමක් බවට පත් වන කල, සතුරා ආරක්ෂාවීමට හැරෙන කල සහ තවත් ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයක් දියත් කිරීමට

පෙර ඔහු විසින් ප්‍රතිසංවිධානයක් කළ යුතු වන කල, එය ඔහුට උපායමාර්ගික පරාජයක් වේ. සතුරා මුළු රට ම පාලනය කරන නිසා ත්, අපට වඩා හුඟක් ප්‍රබල නිසා ත්, අපට කරන්ට සිදු වුණාක් වැනි කිලෝමීටර දස දහසකට වැඩි ගණනක උපායමාර්ගික තැන් මාරුවක් කරන්ට ඔහුට සිදු වී නැත. එහෙත් ඔහුගේ බලසේනාවන් කොටස් වශයෙන් තැන් මාරුකිරීම් කර ඇත. සමහර අවස්ථාවන්හි, යම් යම් කඳවුරු ප්‍රදේශ වල රතු හමුදව විසින් වට කරනු ලැබූ සුදු රක්ෂස්ථාන වල සිටි සතුරු බලසේනාවෝ අපේ වටලෑම බිඳගෙන ගොස්, අළුත් පහරදීම් සංවිධානය කිරීම පිණිස සුදු ප්‍රදේශ වලට පසුබැස ඇත. සිවිල් යුද්ධය දිග්ගැසුණොත් සහ රතු හමුදවේ ජයග්‍රහණ වඩ වඩා ව්‍යාප්ත වුව හොත්, මේ විධියේ දේවල් තව තව ත් ඇති වෙනවා ඇත. එහෙත් සතුරාට ජනතාවගේ ආධාරය නොමැති නිසා ත් ඔහුගේ නිලධාරින් සහ මිනිසුන් සමගි නැති නිසා ත්, රතු හමුදව අත්පත් කරගත් විධියේ ම ප්‍රතිඵල අත්පත් කරගන්ට සතුරාට බැරි ය. ඔහු රතු හමුදව අනුකරණය කරමින් ඉතා ඈතට තැන් මාරුවක් කරන්ට ගියොත්, ඔහු සහතික වශයෙන් ම මුල්පිස දමනු ලබනවා ඇත.

1930දී ලි ලි–සාන් ක්‍රියාමාර්ගය පැවති වකවනුවේදී, සහෝදර ලි ලි–සාන් චීනයේ සිවිල් යුද්ධයේ දිග්ගැසුණු ස්වභාවය තේරුම් ගන්ට අසමත් විය; ඒ හේතුව නිසා මේ යුද්ධය පවතින අතර බොහෝ කලක් මුළුල්ලෙහි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර ත් ඒවායේ පරාජය ත් නැවත නැවත ඇති වේ යන නීතිය තේරුම් නො ගත්තේ ය (ඒ වන විට හුනාන්–චියාංසි දේශසීමා ප්‍රදේශයෙහි තුනක් ද ෆූචියන් පළාතේ දෙකක් ද ඇති වී තිබුණි). එහෙයින්, විප්ලවයට සීඝ්‍ර ජයක් අත්පත් කරගැනීමට ප්‍රයත්නයක් දරමින්, ඔහු වූහාන් නුවරට පහර දෙන ලෙස එතෙක් ම සිය ළදරුවියේ සිටි රතු හමුදවට අණ කළේ ය, රට පුරා ම සන්නද්ධ පැනනැඟීමක් අරඹන්නට ද අණ කළේ ය. එසේ ඔහු ''වාම'' අවස්ථාවාදයේ වරද කළේ ය.

එපරිද්දෙන් ම, 1931–34රේ ''වාම'' අවස්ථාවාදියෝ ද ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර නැවත නැවත ඇති වීමේ නීතිය විශ්වාස නො කළහ. හූපේ–හොනාන්–අන්හ්වෙයි දේශසීමාව දිගට පිහිටි අපේ කඳවුරු ප්‍රදේශයේ සිටි ඇතැම් වගකිවයුතු සහෝදරවරු, කුඔමින්තාං හමුදව එහි තුන්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයේ පරාජයට පසු හුදු උදව්කාර බලසේනාවක් බවට පත් වී ඇතැ'යි ද, රතු හමුදවට තව දුරට ත් පහර දීමේදී ප්‍රධාන බලසේනාව වශයෙන් පිටියට බහින්ට අධිරාජ්‍යවාදින්ට ම සිදු වෙනවා ඇතැ'යි ද කියා සිටිමින්, ''උදව්කාර බලසේනා'' න්‍යායයක් පිළිගෙන සිටියහ. මේ තක්සේරුව පදනම කරගත් උපායමාර්ගය වූයේ රතු හමුදව වූහාන් නුවරට පහර දිය යුතු බව යි. මූලධර්මයෙන්, මෙය නාන්චාං නුවරට ද රතු හමුද පහරක් දිය යුතු ය'යි හඬ ගා සිටි, කඳවුරු ප්‍රදේශ එකට ඈඳීමේ වැඩට සහ සතුරා ඇතුළට ම එන්නට පෙළඹවීමේ උපක්‍රමයට

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

විරුද්ධ ව සිටි, පළාතක අගනුවර ත් සෙසු ප්‍රධාන නගර ත් අල්ලා ගැනීම ඒ පළාතේ ජය ලැබීමට පටන් ගන්නා තැන වශයෙන් සැලකූ, ''පස්වැනි 'වටලෑමේ සහ මැඩලීමේ' යුද්ධව්‍යාපාරයට විරුද්ධ ව කරන සටන විප්ලවයේ මග ත් විජිතවාදයේ මග ත් අතර තීරණාත්මක සටන නියෝජනය කරයි'' යන මතය දැරූ, චියාංසි පළාතේ සිටි සහෝදරවරුන්ගේ අදහස් සමග ගැලපුණි. හූපේ–හොනාන්–අන්හ්වෙයි දේශසීමා ප්‍රදේශයෙහි සිව්වැනි 'වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයට විරුද්ධ ව කළ අරගල වලදී ත්, චියාංසි පළාතේ මධ්‍යම ප්‍රදේශයෙහි පස්වැන්නට විරුද්ධ ව කළ අරගල වලදී ත් යොදනලද වැරදි ක්‍රියාමාර්ගයේ ප්‍රභව ස්ථානය වූයේ මේ ''වාම'' අවස්ථාවාදය යි; එය මේ දරුණු සතුරු යුද්ධව්‍යාපාර ඉදිරියෙහි රතු හමුදව අසරණ බවට පත් කළේ ය, චීන විප්ලවයට අතිවිශාල අලාභයන් සිදු කළේ ය.

කිසි ම වටාපිටා තත්වයක් යටතේ රතු හමුදව ආරක්ෂාවීමේ ක්‍රම නො යෙදිය යුතු ය යන මතය ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර නැවත නැවත ඇති වන බව නො පිළිගත් මේ ''වාම'' අවස්ථාවාදයට කෙළින් ම සම්බන්ධ විය; එය ද මුළුමනින් ම වැරදි විය.

විප්ලවයක් හෝ විප්ලවවාදි යුද්ධයක් පහරදීමක් වේ යන කියමන සත්තකින් ම නිවැරදි ය. විප්ලවයක් හෝ විප්ලවවාදි යුද්ධයක් එහි බිහිවීමේදී ත්, කුඩා බලවේගයක් වීමේ සිට ලොකු බලවේගයක් වීම තෙක්, දේශපාලන බලය නොමැතිවීමේ සිට දේශපාලන බලය අල්ලාගැනීම තෙක්, රතු හමුදවක් නොමැතිවීමේ සිට රතු හමුදවක් ඇති කිරීම තෙක්, විප්ලවවාදි කඳවුරු ප්‍රදේශ නොමැතිවීමේ සිට ඒවා පිහිටුවීම තෙක් එහි වැඩීමේදී ත්, පහරදීමේ තත්වයෙහි විය යුතු ය, හණමිටිවාදි නො විය හැකි ය, හණමිටිවාදය දෙසට බර වෙන ගතියට විරුද්ධ විය යුතු ය.

මුළුමනින් ම නිවැරදි එක ම කියමන නම් විප්ලවයක් හෝ විප්ලවවාදි යුද්ධයක් පහරදීමක් වේ, එහෙත් ආරක්ෂණය ත් පසුබැසීම ත් ඊට ඇතුළත් ය යනු යි. පහර දෙනු පිණිස ආරක්ෂා වීම, ඉදිරියට යාම පිණිස පසුබැසීම, පෙරමුණට විරුද්ධ ව යනු පිණිස අංශ වලට විරුද්ධ ව යාම, කෙළින් මගට වැටෙනු පිණිස වටෙන් වටෙන් යන මගක් ගැනීම — බොහෝ ප්‍රපංචයන්ගේ, වෙසෙසින් යුද්ධමය ව්‍යාපාරයන්ගේ, වර්ධනය සිදු වන ක්‍රියාවලියේදී මෙය නො වැළකිය හැකි ය.

ඉහත සඳහන් කළ කියමන් දෙක අතුරෙන්, පළමුවැන්න දේශපාලන පරිමණ්ඩලයේදී නිවැරදි විය හැකි ය, එහෙත් යුද්ධමය පරිමණ්ඩලයට මාරු කළ විට එය වැරදි වේ. එමතු නො ව එය දේශපාලන වශයෙන් නිවැරදි වන්නේ එක් තත්වයකදී (එනම් විප්ලවය ඉදිරියට යන කල) පමණකි, වෙන තත්වයකට (එනම් විප්ලවය පසුබැසීමෙහි පවතින අවස්ථාවකට, 1906දී රුසියාවෙහි[17] මෙන් සහ 1927දී චීනයෙහි මෙන් සමස්ත පසුබැසීමක හෝ

1918දී බ්‍රෙස්ට්–ලිටොව්ස්ක් ගිවිසුමේ[18] කාලයේදී රුසියාවෙහි මෙන් අඩාල පසුබැසීමක හෝ පවතින අවස්ථාවකට) මාරු කළ විට වැරදි වේ. මුළුමනින් ම නිවැරදි සහ සැබෑ වන්නේ දෙවැනි කියමන පමණකි. ආරක්ෂාවීමේ යුද්ධමය විධිවිධාන යෙදීමට යාන්ත්‍රික ලෙස විරුද්ධ වූ 1931–34රේ ''වාම'' අවස්ථාවාදය බොළඳ සිතීමක් විනා අනිකක් නො වේ.

නැවත නැවත ත් ඇති වන ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර පිළිබඳ රටාව කෙළවරකට පත් වන්නේ කවදා ද? මගේ මතය අනුව, සිවිල් යුද්ධය දිග්ගැස්සුණොත්, බලවේගයන්ගේ සමබරතාවෙහි මූලික වෙනසක් සිදු වූ කල මේ නැවත නැවත වීම නතර වෙනවා ඇත. රතු හමුදව සතුරාට වඩා ප්‍රබල වූ විට එය නතර වෙනවා ඇත. එවිට අප සතුරා වටලා මැඩලනවා ඇත, ඔහු ප්‍රති–යුද්ධව්‍යාපාරයන් පිහිට කොට ගන්නවා ඇත; එහෙත් රතු හමුදව ස්වකීය ප්‍රති–යුද්ධව්‍යාපාරයන්හිදී අත්පත් කරගත් තත්වය ම අත්පත් කරගැනීමට දේශපාලන සහ යුද්ධමය කරුණු ඔහුට ඉඩ නො දෙනවා ඇත. ඒ වන විට නැවත නැවත ත් ඇති වන ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර පිළිබඳ රටාව, සම්පූර්ණයෙන් ම නො වේ නම් බොහෝ දුරට හෝ, කෙළවරකට පත් වේ ය'යි ස්ථිර වශයෙන් ම කිව හැකි ය.

පරිච්ඡේද V

උපායමාර්ගික ආරක්ෂාවීම

මේ ශීර්ෂය යටතේ පහත සඳහන් ගැටළු සාකච්ඡා කරන්ට මම කැමැත්තෙමි: ''(1) ක්‍රියාකාරි සහ අක්‍රියාකාරි ආරක්ෂණය; (2) ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර සමග සටන් කිරීමට සූදනම් වීම; (3) උපායමාර්ගික පසුබැසීම; (4) උපායමාර්ගික පෙරළා–පහරදීම; (5) පෙරළා–පහරදීම පටන්ගැනීම; (6) භටකණ්ඩායම් ඒකරාශි කිරීම; (7) ජංගම සංග්‍රාමය; (8) ඉක්මනින් තීරණයක් ලබා ගැනීමේ යුද්ධය සහ (9) මූලසුන් කිරීමේ යුද්ධය.

1. ක්‍රියාකාරි සහ අක්‍රියාකාරි ආරක්ෂණය

ආරක්ෂණය ගැන කරන සාකච්ඡාවකින් අප පටන් ගන්නේ මන්ද? චීනයේ 1924–27තේ පළමුවැනි ජාතික එක්සත් පෙරමුණ ව්‍යර්ථ වූ පසු, විප්ලවය ඉතා ම දැඩි, ඉතා ම නිර්දය පංක්ති යුද්ධයක් බවට පත් විය.

LIBERATIONBASE

සතුරා මුළු රට ම පාලනය කළ අතර, අපට සිටියේ කුඩා සන්නද්ධ බලසේනා පමණකි; ඒ හේතු කොට ගෙන, ආරම්භයේ සිට ම ඔහුගේ "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාර වලට විරුද්ධ ව කටුක අරගලයක් කරන්ට අපට සිදු විය. අපේ පහරදීම් ඒ යුද්ධව්‍යාපාර බිඳීමට අප දැරූ පරිශ්‍රමයන් හා සමග කිට්ටුවෙන් පිරිද්දී ඇත, අපේ ඉරණම අපට එසේ ඒවා බිඳින්ට පුළුවන් ද බැරි ද යන්න මත මුළුමනින් ම රැඳී පවතී. "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාරයක් බිඳීමේ ක්‍රියාවලිය සාමාන්‍යයෙන් වක්‍ර ය, කෙනකු සිතන පතන පරිදි සෘජු නො වේ. මූලික වූ ත්, එසේ ම බැරෑරුම් වූ ත්, ගැටළුව නම් අපේ ශක්තිය පිරිහෙන්ට නො දී රැක ගනිමින් සතුරා පරාජය කරන්ට ඉඩප්‍රස්තාවක් ලැබෙන තුරු බලාපොරොත්තුව සිටින්නේ කෙසේ ද යනුයි. එහෙයින් උපායමාර්ගික ආරක්ෂාවීම ස්වකීය සටන්ව්‍යාපාර වලදී රතු හමුදුව ඉදිරියේ තිබෙන ඉතා ම ව්‍යාකූල වූ ත් ඉතා ම වැදගත් වූ ත් ගැටළුව වේ.

අපේ අවුරුදු දහයක යුද්ධයේදී උපායමාර්ගික ආරක්ෂාවීම සම්බන්ධයෙන් නොමගයාම් දෙකක් බොහෝ විට ඇති විය; එකක් සතුරා සුළු කොට සැලකීම ය, අනික ඔහු ගැන බිය පත් වීම ය.

සතුරා සුළු කොට සැලකීමේ විපාකයක් වශයෙන්, බොහෝ ගොරිල්ලා සේනාංග පරාජයට භාජන විය; කිහිප අවස්ථාවකදී රතු හමුදුව සතුරාගේ "වටලෑම සහ මැඩලීම" බිඳින්ට අසමත් විය.

විප්ලවවාදී ගොරිල්ලා සේනාංග පළමු වරට ඇති වූ කල, ඒවායේ නායකයෝ බොහෝ විට සතුරාගේ තත්වය ත් අපේ ම තත්වය ත් නිවැරදි ලෙස තක්සේරු කරන්ට අසමත් වූහ. යම් යම් තැන් වල උන්හිටිගමන් කළ සන්නද්ධ පැනනැඟීම් හෝ සුදු භටකණ්ඩායම් අතර කැරලිගැසීම් හෝ සාර්ථක ලෙස සංවිධානය කරන්ට ඔවුන් සමත් වී සිටි නිසා, ඔවුන් දුටුවේ ක්ෂණික වශයෙන් හිතකර වූ වටාපිටා තත්වයෝ පමණකි, නැතහොත් ඇත්ත වශයෙන් තමන් අභිමුඛ ව සිටි බරපතල තත්වය තේරුම් ගන්ට සමත් වුණේ නැත; එහෙයින් ඔව්හු සාමාන්‍යයෙන් සතුරා අඩුවෙන් තක්සේරු කළහ. එමතු නො ව, තමන්ගේ ම දුර්වලකම් (එනම්, අත්දැකීම් නොමැතිකම සහ බලපිරිස් වල කුඩාකම) ගැන අවබෝධයක් ඔවුන්ට නො තිබිණි. සතුරා ප්‍රබල විය, අපි දුර්වල වීමු යනු විෂයමූල සත්‍ය කරුණක් විය; එසේ ද වුව සමහර අය එ ගැන සිතා බැලීම ප්‍රතික්ෂේප කළහ, ප්‍රහරණය ගැන ම කතා කළා මිසක් ආරක්ෂණය හෝ පසුබැසීම ගැන කවද වත් කතා නො කළහ; එසේ ඔව්හු ආරක්ෂණය පිළිබඳ කාරණයෙහි ලා තමන් මානසික වශයෙන් අසන්නද්ධ කර ගත්හ, එහෙයින් තමන්ගේ ක්‍රියාවන් වැරදි මගට යොමු කළහ. මේ කරුණු හේතු කොටගෙන බොහෝ ගොරිල්ලා සේනාංග පරාජයට පත් විය.

මේ හේතුව කරණකොටගෙන, සතුරාගේ "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාර බිඳීමට රතු හමුදුව අසමත් වූ අවස්ථා පිළිබඳ උදාහරණ නම්, රතු හමුදුව කුඕමින්තාං හමුදුව හුදු උදව්කාර සේනාවකි යන න්‍යායය උඩ ක්‍රියා කළ අවස්ථාවන් වූ, 1928දී ක්වංතුං පළාතේ හායිපෙං–ලූපෙං ප්‍රදේශයේදී එය ලැබූ පරාජය[19] ත්, 1932දී හූපේ–හොනාන්–අන්හ්වෙයි දේශසීමා ප්‍රදේශයේදී සතුරාගේ "වටලෑම සහ මැඩලීම"ට විරුද්ධ ව ගෙනගිය සිව්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී ඊට ක්‍රියා කිරීමේ නිදහස නැති වී යාම ත් ය.

සතුරා ගැන බිය පත්වීම හේතු කොටගෙන සිදු වූ ඇබැද්දි පිළිබඳ නිදසුන් බොහෝ ය.

ඔහු අඩුවෙන් තක්සේරු කළ අය පසෙකින් සිටියදී, ඇතැම් අය ඔහු බෙහෙවින් ම වැඩියෙන් තක්සේරු කළහ, එසේ ම අපේ ශක්තිය බෙහෙවින් ම අඩුවෙන් තක්සේරු කළහ; එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔව්හු කොහෙත් ම හරි නැති පසුබැසීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ, ආරක්ෂණය පිළිබඳ කාරණයෙහි ලා එපරිද්දෙන් ම තමන් මානසික වශයෙන් අසන්නද්ධ කර ගත්හ. මෙහි ප්‍රතිඵලය වූයේ ඇතැම් ගොරිල්ලා සේනාංග පරාජයට පත් වීම ය, නැතහොත් යම් යම් රතු හමුද යුද්ධව්‍යාපාර ව්‍යර්ථ වීම ය, නැතහොත් කඳවුරු ප්‍රදේශ නැති වීම ය.

කඳවුරු ප්‍රදේශයක් නැති වීම පිළිබඳ ඉතා ම සිත්කාවදින උදාහරණය වූයේ "වටලෑම සහ මැඩලීම"ට විරුද්ධ ව ගෙනගිය පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී චියාංසි පළාතෙහි මධ්‍යම කඳවුරු ප්‍රදේශය නැති වීම ය. මෙහි මේ වරද ඇති වූයේ දක්ෂිණවාදී මතයකින් ය. නායකයෝ කොටියකුට මෙන් සතුරාට බිය වූහ, හැම තැන ම ආරක්ෂක වැඩපිළිවෙලවල් ඇති කළහ, හැම පියවරකදී ම ආරක්ෂාවීමේ සටන් කළහ, අපේ වාසියට සිටින්ට ඉඩ තිබුණු දෙයක් වූ සතුරාගේ පසුමුණ කරා ඉදිරියට ගොස් එහිදී ඔහුට පහර දීම වත්, නැතහොත් අපේ බලසේනාවන් ඒකරාශි කොට සතුරු භටකණ්ඩායම් වනසා දමන සේ ඇතුළට ම එන ලෙස බය නැති ව ඔවුන් පෙළඹවීම වත් කරන්ට එඩිතර නුවූහ. ප්‍රතිඵලයක් වශයෙන්, මුළු කඳවුරු ප්‍රදේශය ම නැති විය, කිලෝමීටර 12,000කට වැඩි දීර්ඝ ගමන යාමට රතු හමුදුවට සිදු විය. කෙසේ වෙවා, මේ විධියේ වැරදි වලට කලින් සතුරා අඩුවෙන් තක්සේරු කිරීමේ "වාම" වරදක් කිරීම පුරුද්දක් ව තිබුණේ ය. 1932දී ප්‍රධාන නගර වලට පහර දීමේ යුද්ධ සාහසිකවාදය ඊට පසුව සතුරාගේ පස්වැනි "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාරය හා ඔට්ටු වීමේදී යොදනලද අක්‍රියාකාරි ආරක්ෂණය පිළිබඳ ක්‍රියාමාර්ගයට මුල් හේතුව විය.

සතුරා ගැන බිය පත් වීමේ ඉතා ම අන්තයට ගිය උදාහරණය "වාං කුඕ-තාඕ ක්‍රියාමාර්ගයේ" පසුබැසීම්වාදය විය. කහ ගඟට බටහිරදී සිව්වැනි පෙරමුණු රතු හමුදුවේ බටහිරි කොලම ලැබූ පරාජය[20] මේ ක්‍රියාමාර්ගය අවසාන වශයෙන් බංකලොත්වීම සලකුණු කළේ ය.

LIBERATIONBASE

ක්‍රියාකාරි ආරක්ෂණය පහරදීමේ ආරක්ෂණය වශයෙන් හෝ තීරණාත්මක සටන්වැදීම් මගින් කරන ආරක්ෂණය වශයෙන් ද ප්‍රකට ය. අක්‍රියාකාරි ආරක්ෂණය හුදු ආරක්ෂාවීමේ ආරක්ෂණය වශයෙන් හෝ හුදු ආරක්ෂණය වශයෙන් ද ප්‍රකට ය. අක්‍රියාකාරි ආරක්ෂණය ඇත්ත වශයෙන් බොරු ආරක්ෂණ වර්ගයකි; එක ම සැබෑ ආරක්ෂණය ක්‍රියාකාරි ආරක්ෂණය යි, පෙරළා පහර ගැහීමේ ත් පහරදීමට බැහීමේ ත් අභිප්‍රායයෙන් කරන ආරක්ෂණය යි. මා දන්නා පමණින්, උපායමාර්ගයේදී වේවා, උපක්‍රම වලදී වේවා, අක්‍රියාකාරි ආරක්ෂණයට විරුද්ධ නො වන, පුරාණ හෝ නූතන, චීන හෝ විදේශීය, වටිනාමක් ඇති කිසි ම යුද්ධ අත්පොතක් වත් සිහිබුද්ධිය ඇති කිසි ම යුද්ධ විශේෂඥයෙක් වත් නැත. අක්‍රියාකාරි ආරක්ෂණය යන්තරයක් මෙන් මහත් ඕනෑකමින් අගය කරන්නේ අංගසම්පූර්ණ මෝඩයෙකි, නැත්නම් පිස්සෙකි. කෙසේ වේවා, එබඳු දේ කරන මිනිස්සු මේ ලෝකයේ සිටිති. එය යුද්ධයේදී වරදක් වේ, යුද්ධමය කටයුතු වලදී හණමිටිවාදය ප්‍රකට වීමක් වේ; අපි ඊට ස්ථිර ලෙස ම විරුද්ධ විය යුත්තෙමු.

වඩා අළුත් සහ සීඝ්‍රයෙන් වර්ධනය වන අධිරාජ්‍යවාදි රටවල් වල, එනම්, ජර්මනියෙහි සහ ජපානයෙහි, යුද්ධ විශේෂඥයෝ උපායමාර්ගික පහරදීමේ වාසි ගැන බෙර ගසති, උපායමාර්ගික ආරක්ෂාවීමට විරුද්ධ ව පෙරට එති. මේ වර්ගයේ යුද්ධමය චින්තනයක් චීනයේ විප්ලවවාදි යුද්ධයට කොහෙත් ම නො ගැලපේ. ආරක්ෂාවීමේ ඇති බරපතල දුර්වලකමක් නම් එය පොදු ජනයාගේ චිත්තධෛර්යය ප්‍රබෝධ කරනවා වෙනුවට එය සෙලවීම ය'යි මේ යුද්ධ විශේෂඥයෝ තරයේ ම කියා සිටිති. මෙය යෙදෙන්නේ පංක්ති භේද උග්‍ර ව පවතින්නා වූ ද, යුද්ධයෙන් පල ලබන්නේ බලයෙහි සිටින ප්‍රතිගාමී පාලක තට්ටු හෝ ප්‍රතිගාමී දේශපාලන කණ්ඩායම් පමණක් වන්නා වූ ද රටවල් වලට ය. එහෙත් අපේ තත්වය ඊට වෙනස් ය. අප පීඩිතයන් ද ආක්‍රමණයට ගොදුරු වී සිටින්නන් ද වන නිසා, විප්ලවවාදි කඳවුරු ප්‍රදේශ ආරක්ෂා කිරීමේ ත් චීනය ආරක්ෂා කිරීමේ ත් සටන්පාඨයෙන්, එක හඬවතඬ එක හිතක් ඇති ව සටන් කිරීමට ජනතාව අතර ඉමහත් වැඩි පිරිස එක්රොක් කරන්ට අපට පුළුවනි. සිවිල් යුද්ධය පැවති කාලයෙහි සෝවියට් සංගමයේ රතු හමුදව සිය සතුරන් පරාජය කළේ ද ආරක්ෂාවීමේ සටන් ආකාරය යෙදීමෙන් ය. අධිරාජ්‍යවාදි රටවල් ප්‍රහරණය පිණිස සූද්දන් සංවිධානය කළ විට, යුද්ධය කරනලද්දේ සෝවියට් සභා ආරක්ෂා කිරීමේ සටන්පාඨය යටතේ ය; ඔක්තෝබර පැනනැඟීම සූදනම් කරගෙන යන විට පවා, මිනිසුන් යුද්ධය පිණිස උනන්දු කළේ ද අගනුවර ආරක්ෂා කිරීමේ සටන්පාඨය යටතේ ය. හැම යුක්තිසහගත යුද්ධයකදී ම ආරක්ෂාවීම දේශපාලන වශයෙන් පිටස්තර පුද්ගලයන් කෙරෙහි ඔවුන් නිසොල්මන් කරන සුළු විපාකයක් ඇති කරනවා පමණක් නො වේ, එය බහුජනයා අතර නොදියුණු කොටස් යුද්ධයට සම්බන්ධ වීමට එක්රොක් කිරීමට ද හැකි කරයි.

සන්නද්ධ පැනනැඟීමක් පටන් ගත් කල ප්‍රහරණය මොහොතකට වත් නතර නො කළ යුතු ය'යි මාක්ස් කී කල[21], ඔහු අදහස් කළේ, සතුරා නො දැනුවත් ව ම කැරැල්ලකින් අසුකරගත් බහුජන සමූහයන් ප්‍රතිගාමී පාලකයන් හට ඔවුන්ගේ දේශපාලන බලය තබා ගන්ට හෝ ආපසු ලබා ගන්ට කිසි ම ඉඩප්‍රස්තාවක් නො දිය යුතු බව ය, ජාතියේ ප්‍රතිගාමී පාලක බලවේගයන්ට පහර ගැසීම පිණිස ඔවුන් සූදනමක් නැති ව සිටින මේ මොහොත අල්ලාගත යුතු බව ය, ඒ වන විට දිනාගෙන තිබෙන ජයග්‍රහණ වලින් සෑහීමට පත් වී නිකම් සිටීම, සතුරා අඩුවෙන් තක්සේරු කිරීම, තමන් දෙන පහරවල් වල වේගය අඩු කිරීම හෝ ඉදිරියට තෙරපී යන්ට පැකිළීම සහ, එසේ, විප්ලවයට පරාජය ගෙන දෙමින්, සතුරා විනාශ කිරීමට තිබෙන ඉඩප්‍රස්තාව ලිස්සා යන්ට ඉඩ දීම නො කළ යුතු බව ය. මෙය හරි ය. කෙසේ වේවා, බලයෙන් වැඩි සතුරකු සමග අප සටන් වැදී සිටින විට, විප්ලවවාදින් වන අප, අප මහත් අසීරු තත්වයකට පත් වී සිටින විට පවා, ආරක්ෂාවීමේ පියවර නො ගත යුතු බවක් එයින් අදහස් නො වේ. ඒ විධියට සිතනවා ඇත්තේ පල් ම පල් මෝඩයෙක් පමණකි.

මුළු එකක් වශයෙන් ගත් කල, අපේ යුද්ධය කුඕමින්තාං පක්ෂයට විරුද්ධ ව පහරදීමක් වී ඇත; එහෙත් යුද්ධමය වශයෙන් එය සතුරාගේ "වටලෑම සහ මැඬලීම" බිඳීමේ ආකාරයක් ගෙන තිබේ.

යුද්ධමය වශයෙන් කතා කරන කල, අපේ සංග්‍රාමය ආරක්ෂාවීම ත් පහරදීම ත් මාරුවෙන් මාරුවට යෙදීමෙන් යුක්ත වේ. අපේ ප්‍රශ්නයේදී පහරදීම ආරක්ෂාවීමට පසු ව විය යුතු ය'යි කීවත් කලින් විය යුතු ය'යි කීවත් එයින් වෙනසක් ඇති නො වේ; කාරණයට ඇතුළත් නියම දෙය "වටලෑම සහ මැඬලීම" බිඳීම වන නිසා ය. "වටලෑමේ සහ මැඬලීමේ" යුද්ධව්‍යාපාරයක් බිඳින තුරු ආරක්ෂාවීම දිගට ම පවතී; එතැනදී පහරදීම පටන් ගනී; මේවා එක ම දෙයේ අවස්ථා දෙකක් පමණකි; එබඳු එක් සතුරු යුද්ධව්‍යාපාරයක් පසුපස්සේ කිට්ටුවෙන් ම තවත් එකක් එයි. අවස්ථා දෙකෙන්, ආරක්ෂාවීම ඉතා ම ව්‍යාකූල වූ ත් ඉතා ම වැදගත් වූ ත් එක වේ. "වටලෑම සහ මැඬලීම" බිඳින්නේ කෙසේ ද'යි ගණන් නැති ගැටළු ඊට ඇතුළත් ය. මෙහි ලා මූලික ප්‍රතිපත්තිය ක්‍රියාකාරි ආරක්ෂණය වෙනුවෙන් නැඟී සිටීම සහ අක්‍රියාකාරි ආරක්ෂණයට විරුද්ධ වීම ය.

අපේ සිවිල් යුද්ධයේදී, රතු හමුදවේ ශක්තිය සතුරාගේ ශක්තිය ඉක්මවා සිටි කල, අපට සාමාන්‍ය වශයෙන් උපායමාර්ගික ආරක්ෂාවීම තව දුරට ත් උවමනා නො වෙනවා ඇත. එවිට අපේ ප්‍රතිපත්තිය වන්නේ උපායමාර්ගික පහරදීම පමණකි. මේ වෙනස්වීම බලවේගයන්ගේ සමබරතාව අතින් ඇති වන අංගසම්පූර්ණ වෙනස්වීමක් මත රඳා පවතී. ඒ කාලය වන විට ඉතිරි වන ආරක්ෂාවීමේ විධිවිධාන මුළු යුද්ධ තත්වයෙන් කොටසකට සීමා වූ ලක්ෂණයකින් යුක්ත ඒවා පමණක් වෙනවා ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

2. ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර වලට විරුද්ධ ව සටන් කිරීමට සූදනම් වීම

සැලැස්ම කළ සතුරු ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයකට විරුද්ධ ව අවශ්‍යයෙන් ම කළ යුතු සූදනම් වීම් ප්‍රමාණවත් පරිදි අප විසින් කර තිබෙතොත් මිස, අපට සත්තකින් ම අක්‍රියාකාරි තත්වයකට වැටෙන්ට බලෙන් ම සිදු වෙනවා ඇත. කලබලයෙන් සටනකට මූණ දීම ජය ලැබිය හැකි දෑ'යි නිසැක ව නො දන සටන් කිරීම වේ. එහෙයින්, සතුරා ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයක් සූදනම් කරන විට, අපේ ප්‍රති-යුද්ධව්‍යාපාරය අප විසින් සූදනම් කිරීම ඒකාන්තයෙන් ම අවශ්‍ය ය. අපේ ශ්‍රෙණි තුළ සිටින ඇතැම් අය එක් කලෙක විරුද්ධ ව සිටියාක් මෙන්, එබඳු සූදනම් වීමකට විරුද්ධ ව සිටීම ළාමක ය, හාස්‍යජනක ය.

මතභේදයක් පහසුවෙන් ඇති විය හැකි දුෂ්කර ගැටළුවක් මෙහි තිබේ. අප අපේ පහරදීම අවසන් කොට, ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ව අපේ ප්‍රති-යුද්ධව්‍යාපාරය සූදනම් කරන අවධියට මාරු විය යුත්තේ කොයි වේලාවේ ද? අප ජයග්‍රාහි ලෙස පහරදීමේ ත් සතුරා ආරක්ෂාවීමේ ත් යෙදී සිටින විට, ඊළඟ ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය පිණිස ඔහුගේ සූදනම් වීම් කරගෙන යන්නේ රහසේ ය; එහෙයින්, ඔහුගේ පහරදීම කොයි වේලාවේ පටන් ගනීවි දෑ'යි දනගැනීම අපට අමාරු ය. අපේ ප්‍රති-යුද්ධව්‍යාපාරය සූදනම් කිරීමේ වැඩය උවමනාවට වඩා කලින් පටන් ගත්තොත්, එයින් අපේ පහරදීමෙන් ලැබෙන වාසි අඩු වෙනවා නියත ය, ඇතැම් විට රතු හමුදව ත් ජනතාව ත් කෙරෙහි යම් යම් හානිකර විපාක පවා ඇති වෙනවා ඇත. කවර හෙයින් ද යත් සූදනම් වීමේ අවධියේදී යෙදිය යුතු ප්‍රධාන විධිවිධාන නම් ඉවත් වී යාම පිණිස කරන යුද්ධමය සූදනම ත් ඒ සඳහා දේශපාලන වශයෙන් උනන්දුව ඇති කිරීම ත් වන නිසා ය. ඇතැම් විට, අප උවමනාවට වඩා කලින් සූදනම් වීමට පටන් ගත්තොත්, මෙය සතුරා එන තුරු බලා සිටීමක් බවට හැරෙනවා ඇත; සතුරා පෙනෙන්ට නො එමින් බොහෝ කලක් බලාගෙන සිටීමෙන් පසු, අපේ පහරදීම අළුත් කරන්ට අපට සිදු වෙනවා ඇත. සමහර විට, අපේ අළුත් පහරදීම පටන් ගනිත් ම සතුරා ඔහුගේ පහරදීම ආරම්භ කරමින්, අප අමාරු අඩියකට දමනවා ඇත. එහෙයින් අපේ සූදනම් කිරීම පටන් ගැනීමට නිසි මොහොත තෝරා ගැනීම වැදගත් ගැටළුවකි. නිසි මොහොත නිශ්චය කළ යුත්තේ සතුරාගේ තත්වය ත් අපේ ම තත්වය ත් යන දෙක ම ද, ඒ දෙක අතර සබඳකම ද ගැන නිසි සැලකිල්ල ඇති ව ය. සතුරාගේ තත්වය දනගනු පිණිස, අපි ඔහු සිටින දේශපාලන, යුද්ධමය සහ මුදල් තත්වය ගැන ද, ඔහුගේ ප්‍රදේශයෙහි මහජන මතය පවතින තත්වය ගැන ද තොරතුරු රැස් කරගත යුත්තෙමු. එබඳු තොරතුරු විශ්ලේෂණය කිරීමේදී අපි සතුරාගේ මුළු ශක්තිය ම සපුරා ගණනට ගත

යුත්තෙමු, ඔහුගේ අතීත පරාජයන්ගේ ප්‍රමාණය ලොකු කොට නො සැලකිය යුත්තෙමු; එහෙත් අනික් අතට අපි ඔහුගේ අභ්‍යන්තර ප්‍රති-විරෝධයන්, ඔහුගේ මුදල් දුෂ්කරතා, ඔහුගේ අතීත පරාජයන්ගේ විපාකය යනාදිය ගණන් ගැනීම ද බැරි නො කළ යුත්තෙමු. අපේ පැත්ත සම්බන්ධ-යෙන්, අපි අපේ අතීත ජයග්‍රහණයන්ගේ ප්‍රමාණය ලොකු කොට නො සැලකිය යුත්තෙමු, එහෙත් ඒවායේ විපාකය සම්පූර්ණයෙන් ගණන් ගැනීම ද බැරි නො කළ යුත්තෙමු.

කෙසේ වෙවා, සූදනම් වීමේ කාලය නියම කිරීම සම්බන්ධයෙන්, සාමාන්‍යයෙන් කියන කල, ඒවා උවමනාවට වඩා වේලාසනින් පටන් ගැනීම උවමනාවට වඩා පමා වී පටන් ගන්නවාට වඩා හොඳ ය. කවර හෙයින් ද යත් කලින් කී එක නිසා සිදුවන පාඩු දෙවැන්න නිසා සිදුවන පාඩු වලට වඩා කුඩා නිසා ත්, සූදනම් වී සිටීම උවදුර වළකයි, අප මූලික වශයෙන් අනභිභවනීය තත්වයකට පත් කරයි යන වාසිය ඊට ඇති නිසා ත් ය.

සූදනම් වීමේ අවධියේදී තිබෙන අත්‍යවශ්‍ය ගැටළු නම් රතු හමුදව ඉවත් කරගැනීමට කටයුතු සූදනම් කිරීම, දේශපාලන වශයෙන් උනන්දුවට පත් කිරීම, අළුතෙන් මිනිසුන් බන්දගැනීම, මුදල් සහ ආහාර පානාදිය සැපයීමට කටයුතු පිළියෙළ කිරීම සහ දේශපාලන වශයෙන් පිටස්තර පුද්ගලයන් ගැන ක්‍රියා කිරීම යන මේවා ය.

රතු හමුදව ඉවත් කරගැනීමට කටයුතු සූදනම් කිරීම යන්නෙන් අප අදහස් කරන්නේ එය ඉවත් කරගැනීම හිරිහැරයක් වන දිසාවකට එය ගමන් නො කරන බවට හෝ පහර දීමේදී එය ඕනෑවට වඩා ඈතට ඉදිරියට නො යන බවට හෝ එය අධික වෙහෙසට පත් නො වන බවට හෝ වග බලාගැනීම ය. විශාල-පරිමාණයේ සතුරු පහරදීමක් ඇති වෙන්ට යන ළඟදී රතු හමුදවේ ප්‍රධාන බලසේනාවන් ගත සිත යොමු කළ යුතු දේ මේවා ය. එබඳු වේලාවකදී, රතු හමුදව සටන් ප්‍රදේශ තෝරාගැනීම සහ සූදනම් කිරීම ත්, ආහාරපානාදිය සපයා ගැනීම ත්, තම බලසේනාවන් විශාල කිරීම සහ පුහුණු කිරීම ත් සැලැස්ම කරන්නට ප්‍රධාන වශයෙන් තම අවධානය යොමු කළ යුතු ය.

''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ව කරන අරගලයේදී දේශපාලන වශයෙන් උනන්දුවට පත් කිරීම මූලික වැදගත්කමක් ඇති ගැටළුවක් වේ. ඒ කියන්නේ මෙය යි: සතුරාගේ පහරදීම වැළකිය නො හැකි බව සහ ඉතා ආසන්න බව ද, එයින් ජනතාවට බරපතල හානි සිදු වෙනවා ඇති බව ද අපි රතු හමුදවට ත් කඳවුරු ප්‍රදේශයේ ජනතාවට ත් පැහැදිලි ලෙස, ස්ථිර ලෙස සහ සම්පූර්ණයෙන් ම කිව යුත්තෙමු; එහෙත් ඒ අතර ම අපි සතුරාගේ දුර්වලකම් ගැන ද, රතු හමුදවට හිතකර සාධකයන් ගැන ද, ජය ගැනීමට අප තුළ ඇති යටපත් නො කළ හැකි අධිෂ්ඨානය ගැන ද, අපේ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සාමාන්‍ය වැඩපිළිවෙල ගැන ද ඔවුන්ට කිව යුත්තෙමු. අපි සතුරාගේ ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයට විරුද්ධ ව සටන් කරමින්, කඳවුරු ප්‍රදේශය ආරක්ෂා කරන ලෙස රතු හමුදවට ත් මුළු ජනගහණයට ත් ආයාචනය කළ යුත්තෙමු. යුද්ධ රහස් සම්බන්ධ වූ තැන් වල හැර, දේශපාලන වශයෙන් උනන්දුවට පත් කිරීම එළිපිට ම කරගෙන යා යුතු ය; එමතු නො ව, විප්ලවවාදී ව්‍යායාමයට අනුබල දෙන්ට ඉඩ තිබෙන සියල්ලන් වෙත ම එය ව්‍යාප්ත කිරීමට හැම පරිශ්‍රමයක් ම දැරිය යුතු ය. මෙහි ලා ප්‍රධාන පුරුක නම් කාඩර්වරුන්ට ඒත්තු ගැන්වීම ය.

අළුත් සෙබළුන් බන්දගැනීම කල්පනාවට ගත යුතු කරුණු දෙකක් පදනම කරගෙන කළ යුතු ය; පළමුවැන්න, ජනතාවගේ දේශපාලන හැඟීමේ මට්ටම සහ ජනගහණයේ ප්‍රමාණය යි; දෙවැන්න, රතු හමුදවේ ඒ අවස්ථාවෙහි පවත්නා තත්වය සහ මුළු ප්‍රති-යුද්ධව්‍යාපාරයේදී එහි මිනිසුන් නැසෙන්ට ඉඩ තිබෙන ප්‍රමාණය යි.

මුදල් සහ ආහාර පිළිබඳ ප්‍රශ්න ප්‍රති-යුද්ධව්‍යාපාරයට ඉමහත් ලෙස වැදගත් බව කියන්ට උවමනා නැත. අපි දිගින් දිගට යන සතුරු යුද්ධ-ව්‍යාපාරයක් ඇති වෙන්ට ඉඩ තිබෙන බව ගණනට ගත යුත්තෙමු. සතුරාගේ ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයට විරුද්ධ ව කරන මුළු අරගලය සඳහා — ප්‍රධාන වශයෙන් රතු හමුදවේ, එනමුත් විප්ලවවාදී කඳවුරු ප්‍රදේශයේ ජනතාවගේ ද — අඩු ම ද්‍රව්‍යමය අවශ්‍යතාවන් පිළිබඳ ඇස්තමේන්තුවක් සකස් කිරීම අවශ්‍ය ය.

දේශපාලන වශයෙන් පිටස්තර පුද්ගලයන් සම්බන්ධයෙන් අපි පරෙස්සමින් සිටීමට අමතක නො කළ යුත්තෙමු, එහෙත් ඔවුන් විසින් කළ හැකි ද්‍රෝහිකම් ගැන නො නිසි ලෙස බිය සැක ඇති කරගනිමින් අධික ආරක්ෂක විධිවිධාන යෙදීම ද නො කළ යුත්තෙමු. ඉඩම්හිමියන්, වෙළෙඳුන් සහ පොහොසත් ගොවියන් අතර ප්‍රභේදයක් කළ යුතු ය; ප්‍රධාන කරුණ නම්, ඔවුන් ගැන ඇහැ ගහගෙන සිටීමට බහුජන සමූහයන් සංවිධානය කරන අතර ම, ඔවුන්ට දේශපාලන වශයෙන් කරුණු පහදා දෙමින්, ඔවුන්ගේ මධ්‍යස්ථතාව දිනාගැනීම ය. සිරබාරයට ගැනීම වැනි දැඩි පියවර ගත යුත්තේ ඉතා ම භයානක පුද්ගලයන් ඉතා ටික දෙනාට විරුද්ධ ව පමණී.

''වටලෑම සහ මැඩලීම'' ට විරුද්ධ ව කරන අරගලයක් කොතෙක් දුරට සාර්ථක වේ ද යනු සූදනම් වීමේ අවධියේ කර්තව්‍යයන් මුදුන්පත් කර තිබෙන ප්‍රමාණය හා කිට්ටුවෙන් සබඳ ව පවතී. සතුරා අඩුවෙන් තක්සේරු කිරීම හේතු කොටගෙන සූදනම් වීමේ වැඩ අතපසු කිරීම ත් සතුරාගේ ප්‍රහාරයන් ගැන බියෙන් ඇළලීම හේතු කොටගෙන කුලප්පු වීම ත් හානිකර ප්‍රවණතා වේ; මේ දෙකට ම තරයේ ම විරුද්ධ විය යුතු ය. අපට උවමනා

කරන්නේ උද්‍යෝගයෙන් පිරුණු නමුත් සන්සුන් චිත්ත තත්වයක් සහ අධික නමුත් පිළිවෙලක් සහිත වැඩ ය.

3. උපායමාර්ගික පසුබැසීම

උපායමාර්ගික පසුබැසීමක් යනු බලයෙන් වැඩි හමුදවකට මුහුණ පාන්ට සිදු වන බලයෙන් අඩු හමුදවක්, ඒ බලයෙන් වැඩි හමුදවේ පහරදීම ඉක්මනින් ම සිඳ බිඳ දමන්ට තමාට බැරි බව පෙනී ගිය කල, තම ශක්තිය රැක ගැනීමේ ත් සතුරා පරාජය කිරීමට වේලාව එන තුරු ඉවසිල්ලෙන් බලා සිටීමේ ත් අභිප්‍රායයෙන් ගන්නා වූ සැලැස්ම කළ උපායමාර්ගික පියවරකි. එහෙත් යුද්ධ සාහසිකවාදියෝ එබඳු පියවරකට මුරණ්ඩු ලෙස විරුද්ධ වෙති, ''දොරටුවෙන් පිටතදී ම සතුරා සටනට පටලවා ගැනීම'' අනුමත කරමින් කතා කරති.

බොක්සිංකාරයන් දෙ දෙනකුන් සටන් කරන විට, දක්ෂ බොක්සිංකාරයා සාමාන්‍යයෙන් මුලදී ටිකක් ඉඩ දෙමින් පස්සට යන බව ද, ඒ අතර මෝඩ බොක්සිංකාරයා දරුණු ලෙස ඉදිරියට පැන පැන පටන්ගැන්මේදී ම තම බලපුළුවන්කාරකම් සියල්ල පාවිච්චි කොට ඉවර කරගන්නා බව ද, අවසානයේදී ඔහු ඉඩ දී පස්සට ගිය මිනිසා විසින් බොහෝ විට පරදවනු ලබන බව ද අපි සියලු දෙනා ම දනිමු.

ශුයි හු චුආන්[22] නමැති නවකතාවෙහි, සරඹ ඇදුරු හුං, චායි චින්ගේ වත්තේදී ලින් චුං හට සටනකට අභියෝග කරමින්, ''වරෙන් බලන්න! වරෙන් බලන්න! වරෙන් බලන්න!'' යි කෑගායි. අන්තිමේදී හුංගේ දුර්වල තැන දැක ඔහු එක පහරින් බිම හෙළන්නේ පසුබසින ලින් චුං ය.

වසන්ත සහ සරත් යුගයෙහි, ලූ සහ චි රාජ්‍යයන්[23] යුද වැදී සිටියදී, චී භටයන් වෙහෙසට පත් වීමට පෙර ම ඔවුන්ට පහර දෙන්ට ලූ රාජ්‍යයේ චුආං ඈපාට උවමනා වූ නමුත් ත්සාඕ කුළුයි ඔහු වැළැක්කී ය. එසේ පහර දෙනවා වෙනුවට ඔහු ''සතුරා වෙහෙසට පත් වූ විට අපි පහර දෙමු'' යන උපක්‍රමය යෙදූ කල, ඔහු චී හමුදව පරාජය කළේ ය. මෙය දුර්වල බලසේනාවක් ප්‍රබල බලසේනාවක් පරාජය කිරීම ගැන චීනයේ යුද්ධ ඉතිහාසයෙන් ලැබෙන විශිෂ්ට ආදර්ශයකි. ත්සෝචියු මිං[24] නමැති ඉතිහාසඥයා විසින් දී තිබෙන විස්තරය මෙන්න:

> වසන්තයේදී චී භටකණ්ඩායම් අප අතික්‍රමණය කළහ. ඈපා සටන් කරන්ට හැදුවේ ය. ත්සාඕ කුළුයි ඔහු බැහැදකින්ට අවසර ඉල්ලා සිටියේ ය. ඔහුගේ අසල්වැස්සෝ ''මෙය මස්-කන නිලධාරින්ගේ පලහිලව්වකි, කුමට ද එයට පටලැවෙන්නේ?''යි කීහ. ත්සාඕ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

''මස්-කන්නෝ මෝඩයෝ ය; කල්තබා සැලැස්ම කරන්ට ඔවුන්ට බැරි ය,''යි පිළිතුරු දුනි. එහෙයින් ඔහු ඇපා හමුවිය. ''ඔබ සටන් කරන විට ඔබ විශ්වාසය තබන්නේ කුමක් මත ද?''යි ඔහු ඇසී ය. ''මම කිසි විටෙක මගේ ආහාර සහ වස්ත්‍ර සියල්ල මගේ ම ආස්වාදය පිණිස තබාගන්ට එඩිතර නො වෙමි, ඒවා අනික් අය සමග බෙදාහදා ගනිමි,''යි ඇපා පිළිවදන් දිනි. ''එබඳු අල්ප වූ දනයක් සියල්ලන් වෙත ළඟා විය නො හැකි ය. ජනතාව ඔබ පස්සේ නො එනවා ඇතැ,''යි ත්සාඕ කී ය. ''මම කිසි විටෙක දෙවියන්ට පිදිය යුතු පමණට වඩා අඩුවෙන් පුද සතුන්, ජේඩ් හෝ පට ඔවුන්ට පුද නො කරමි. මම යහපත් වූ භක්ති ඇත්තෙමි,''යි ඇපා කීවේ ය. ''එබඳු අල්ප වූ භක්තියක් විශ්වාසය නො දිනයි. දෙවියෝ ඔබට ආශීර්වාද නො කරති,''යි ත්සාඕ කී ය. ''ලොකු කුඩා සියලු නඩු වල විස්තර පුද්ගලික ව ම සොයා බලන්ට අසමත් නමුදු, මම සැම විට ම සත්‍ය කරුණු ඉල්ලා සිටිමි,''යි ඇපා කී ය. ''ඔබගේ ජනයා කෙරෙහි ඔබගේ ඇල්ම එයින් පෙනෙයි. සටන් දීමට ඔබට හැකි ය. ඔබ එසේ කරන කල, ඔබ පස්සේ ඒමට අවසර මම යදිමි,''යි ත්සාඕ කී ය. ඇපා ත් ඔහු ත් එක ම අස්රියේ ගමන් කළහ. සටන චාංශාඕහිදී යොමු විය. ඇපා පහර දෙනු පිණිස බෙරය ගසන්ට සූදනම් වෙත් ම, ''දැන් ම එපා,''යි ත්සාඕ කී ය. චී රාජ්‍යයේ මිනිසුන් තෙ වරක් ම බෙරය ගැසූ පසු, ''දැන් අපට බෙරය ගසන්ට පුළුවනි,''යි ත්සාඕ කී ය. චී රාජ්‍යයේ හමුදාව පළවා හරිනු ලැබී ය. ලුහුබඳින්ට ඇපාට උවමනා විය. ''දැන් ම එපා,'' යි ත්සාඕ යළි කී ය. ඔහු රථයෙන් බැස සතුරාගේ රෝද-පාරවල් පරීක්ෂා කළේ ය, ඉක්බිති රථයේ අත්-දණ්ඩ මත නැඟී ඈත බැලී ය. ''දැන් අපට පුළුවනි ලුහුබඳින්ට!''යි ඔහු කී ය. චී භටකණ්ඩායම් ලුහුබැඳීම එසේ ඇරඹිණි. ඔහු එබඳු දැනමුතුකම් දුන්නේ මන්දැ'යි ජයග්‍රහණයෙන් පසු ඇපා ත්සාඕ ගෙන් විමසී ය. ත්සාඕ මෙසේ පිළිතුරු දුනි: ''සටනක් රඳා තිබෙන්නේ ධෛර්යය මත ය. පළමුවැනි බෙර හඬ ඇසෙත් ම, ධෛර්යය නැඟෙයි, දෙවැන්නේදී එය එබී යයි, තුන්වැන්නේදී එය සිඳී යයි. සතුරාගේ ධෛර්යය සිඳී ගිය කල, අපේ ධෛර්යය එතෙක් ම නැඟී තිබුණෙන් අපි දිනුවෙමු. මහා රාජ්‍යයක් කරන දේ තේරුම් ගැනීම අමාරු ය, සැඟවී සිට දෙන පහරක් ගැන මම බිය වීමි. එහෙත් මා සතුරාගේ රෝද-පාරවල් පරීක්ෂා කොට ඒවා ඒ මේ අත කැපී ඇති බව දුටු කල සහ ඈත බලා ඔහුගේ පතාක ඇකිලී වැටෙන බව දුටු කල, මම ලුහුබඳින්ට උවදෙස් දුනිමි.''

එය දුර්වල රාජ්‍යයක් ප්‍රබල රාජ්‍යයකට විරුද්දකම් පෑමේ අවස්ථාවක් විය. කථාව සටනකට පෙර දේශපාලන වශයෙන් සූදනම් කිරීම — ජනතාවගේ විශ්වාසය දිනා ගැනීම — ගැන කියයි; එය පෙරළා-පහරදීමට හැරෙන්ට හිතකර වූ යුදපිටියක් — චාංශාඕ — ගැන කියයි; එය පෙරළා-පහරදීම පටන් ගැනීමට හිතකර වේලාව — සතුරාගේ ධෛර්යය සිඳී යන විට සහ තමාගේ ම ධෛර්යය නැඟී තිබෙන විට බව — අඟවයි; එය ලුහුබැඳීම පටන් ගැනීමට නිසි මොහොත — සතුරාගේ රෝද-පාරවල් ඒ මේ අත කැපී තිබෙන විට සහ ඔහුගේ පතාක ඇකිලී වැටෙන විට බව — පෙන්නුම් කරයි. සටන ලොකු එකක් නො වූ නමුත්, එය උපායමාර්ගික ආරක්ෂාවීම පිළිබඳ මූලධර්ම දෘෂ්ටාන්තයෙන් දක්වයි. මේ මූලධර්ම උඩ ජය දිනාගත් ගණන් නැති අවස්ථා චීනයේ යුද්ධ ඉතිහාසයෙහි අඩංගු ය. චූ සහ හාන් රාජ්‍යයන් අතර ඇති වූ චෙංකාඕ සටන,[25] ශින් සහ හාන් රාජ්‍යයන් අතර ඇති වූ කුන්යාං සටන[26], යුආන් ශාඕ සහ ත්සාඕ ත්සාඕ අතර ඇති වූ කුආන්තු සටන[27], වූ සහ වෙයි රාජ්‍යයන් අතර ඇති වූ චීපී සටන[28], වූ සහ ශූ රාජ්‍යයන් අතර ඇති වූ යීලිං සටන[29] සහ චින් සහ ත්සින් රාජ්‍යයන් අතර ඇති වූ පෙයිශුයි සටන[30] වැනි සුප්‍රකට සටන් වලදී, ඒ එක් එක් අවස්ථාවේදී පොර වැටී සිටි පාර්ශ්වයෝ අසමාන වූහ; දුර්වල පාර්ශ්වය, මුලදී තරමක් ඉඩ දී පසුබැස, සතුරා පහර ගැසූ පසු පමණක් පහර ගැසීමෙන් ස්වාමිත්වය ලබාගෙන, එසේ ප්‍රබල පාර්ශ්වය පරාජය කළේ ය.

අපේ යුද්ධය පටන් ගත්තේ 1927 සරත් කාලයෙහි ය; එකල අපට කිසි ම පළපුරුද්දක් තිබුණේ නැත. නාන්චාං පැනනැඟීම[31] සහ කැන්ටන් පැනනැඟීම[32] ව්‍යර්ථ විය, සරත් අස්වනු පැනනැඟීමේදී[33] හූනාන්-හූපේ-චියාංසි දේශසීමා ප්‍රදේශයේ රතු හමුදාව ද පරාජයන් කීපයක් ම විඳ, හූනාන්-චියාංසි දේශසීමාවේ චිංකාං කඳු වලට තැන් මාරු කළේ ය. නාන්චාං පැනනැඟීමේ පරාජයේදී විනාශ නො වී ඉතිරි වූ සේනාංග ද ඊළඟ අප්‍රියෙල් මාසයේ දකුණු හූනාන් පාරෙන් චිංකාං කඳු වලට ආවේ ය. කෙසේ වේවා, 1928 මැයි වන විට, ස්වභාවයෙන් සරල වූ ත් ඒ කාලයේ තත්වයන්ට යෝග්‍ය වූ ත් ගොරිල්ලා සංග්‍රාමයේ මූලික ප්‍රතිපත්ති, එනම්, ''සතුරා ඉදිරියට එන විට, අපි පසුබසිමු; සතුරා වාඩි ලා ගත් විට, අපි හිරිහැර කරමු; සතුරා වෙහෙසට පත් වූ විට, අපි පහර දෙමු; සතුරා පසුබසින විට, අපි ලුහුබඳිමු'' යන සොළොස්-අකුරු සූත්‍රය, විකාශය කර තිබුණි. සොළොස්-අකුරු සූත්‍රයක් ලෙස පිළියෙළ කළ මේ යුද්ධ මූලධර්ම ලි ලි-සාන් ක්‍රියාමාර්ගයට කලින් මධ්‍යම කාරකසභාව විසින් පිළිගනු ලැබී ය. පසු ව අපේ සටන්ව්‍යාපාර පිළිබඳ මූලධර්ම තව පියවරක් වර්ධනය කරනු ලැබී ය. චියාංසි කඳවුරු ප්‍රදේශයෙහි ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ව අප ගෙනගිය පළමුවැනි ප්‍රති-යුද්ධව්‍යාපාරයේ කාලයේදී, ''සතුරා ඇතුළට ම එන්ට පෙළඹවීම'' පිළිබඳ මූලධර්මය ඉදිරිපත් කරනු ලැබී ය; එ මතු නො ව, සාර්ථක ලෙස භාවිතාවේ ද යොදනු ලැබී ය. සතුරාගේ තුන්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය පරාජය කළ කාලය වන විට, රතු හමුදාව සඳහා සටන්-ව්‍යාපාර පිළිබඳ මූලධර්ම මුළු මාලාවක් ම හැඩගැසී තිබුණි. මෙය අඩංගු-දෙයින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බෙහෙවින් ම ආශ්‍රය කරනු ලැබූ, ආකාරයෙන් බොහෝ වෙනස්වීම් වලට භාජන වූ අපේ යුද්ධ මූලධර්ම වල වර්ධනයේ අළුත් අවස්ථාවක් සලකුණු කළේ ය; ඒ ඒවා මූලික වශයෙන් සොළොස්-අකුරු සූත්‍රයෙහි තිබුණු ලෙසින් ම තිබුණේ වී නමුත්, මුලින් ම තිබුණු තම සරල ස්වභාවය ඉක්ම වී ය යන ප්‍රධාන තේරුමෙන් ය. සොළොස්–අකුරු සූත්‍රය ''වටලෑම සහ මැඬලීම'' ට විරුද්ධ ව සටන් කිරීම පිණිස වූ මූලික ප්‍රතිපත්ති ඇතුළත් කරගත්තේ ය; එය උපායමාර්ගික ආරක්ෂාවීම ත් උපායමාර්ගික පහරදීම ත් යන අවස්ථා දෙක ඇතුළත් කරගත්තේ ය; ආරක්ෂාවීම ඇතුළත, එය උපායමාර්ගික පසුබැසීම ත් උපායමාර්ගික පෙරළා–පහරදීම ත් යන අවස්ථා දෙක ඇතුළත් කර ගත්තේ ය. පසු ව ආ දෙය මේ සූත්‍රයේ වර්ධනයක් පමණක් විය.

එහෙත් 1932 ජනවාරියේ සිට පටන් ගනිමින්, මූලධර්මය අතින් බරපතල වැරදි අඩංගු යෝජනාවක් වූ පක්ෂයේ ''පළමුකොට පළාත් එකක හෝ වැඩි ගණනක විප්ලවයේ ජයග්‍රහණය පිණිස කරන අරගලය ගැන යෝජනාව'' ප්‍රසිද්ධ කළ පසු, ''වාම'' අවස්ථාවාදියෝ මේ නිවැරදි මූලධර්මයන්ට පහර දුන්හ, අන්තිමේදී, මුළු තොගය ම අවලංගු කර දමා, ඊට පටහැනි ''අළුත් මූලධර්ම'' හෝ ''නිත්‍ය මූලධර්ම'' මුළු තොගයක් පැණවූහ. එතැන් සිට, පරණ මූලධර්ම නිත්‍ය මූලධර්ම වශයෙන් නො සැලකිය යුතු විය, ''ගොරිල්ලා–වාදය'' වශයෙන් ඉවත දැමිය යුතු විය. ''ගොරිල්ලා–වාදය'' කෙරෙහි විරෝධය පුරා තුන් අවුරුද්දක් ම රජකම් කළේ ය. පළමුවැනි අවස්ථාවේදී එය යුද්ධ සාහසිකවාදය විය, දෙවැනි අවස්ථාවේදී එය යුද්ධ හණමිටිවාදයට හැරුණි, අවසාන වශයෙන්, තුන්වැනි අවස්ථාවේදී එය පළායාමේ ධර්මය බවට පත් විය. 1935 ජනවාරියේදී, ක්වෙයිචව් පළාතේ ත්සුන්යි නුවරදී මධ්‍යම කාරකසභාව විසින් දේශපාලන මණ්ඩලයේ විශාල කළ රැස්වීම පවත්වන තුරු ම මේ වැරදි ක්‍රියාමාර්ගය බංකලොත් වූ බව ප්‍රකාශ කිරීම වත් පරණ ක්‍රියාමාර්ගයේ නිවැරදිබව නැවත ස්ථිර කිරීම වත් නො වී ය. එහෙත් කොතරම් ලොකු මිලක් ගෙවා ද!

''ගොරිල්ලා–වාදය''ට තරයේ ම විරුද්ධ වූ සහෝදරවරුන් තර්ක කළේ මතු දක්වන පිළිවෙලට ය. භූමිප්‍රදේශයෙන් හුඟ හරියක් අත හැර දමන්ට අපට සිදු වන නිසා සතුරා ඇතුළට ම එන්ට පෙළඹවීම වැරදි ය. මේ අන්දමට කළ සටන් දිනනලද්දේ වී නමුත්, දැන් තත්වය ඊට වෙනස් නැද්ද? එමතු නො ව, භූමිප්‍රදේශය අත හැර දමන්නේ නැති ව ම සතුරා පරාජය කිරීම වඩා හොඳ නැද්ද? සතුරා ඔහුගේ ප්‍රදේශයේදී ම, නැතහොත් ඔහුගේ ප්‍රදේශය ත් අපේ ප්‍රදේශය ත් අතර දේශසීමාවේදී ම, පරාජය කර දැමීම ඊටත් වඩා හොඳ නැද්ද? පරණ පුරුදු වල ''නිත්‍ය'' වූ කිසිවක් නො වී ය, ඒවා ගොරිල්ලාභටයන් විසින් පමණක් යොදන ක්‍රම විය. දැන් අපේ ම රජය පිහිටුවා තිබේ, රතු හමුදාව නිත්‍ය හමුදාවක් බවට පත් වී ඇත. චියාං කායිශෙක්ට විරුද්ධ ව අප කරන සටන දෙ රජයක් අතර, මහා හමුදා දෙකක් අතර, යුද්ධයක් බවට පත් වී ඇත. ඉතිහාසය යළි යළි ත් එපරිද්දෙන් ම නො විය යුතු ය, ''ගොරිල්ලා–වාදය'' පිළිබඳ හැම දෙයක් ම මුළුමනින් ම අහක දැමිය යුතු ය. අළුත් මූලධර්ම ''සම්පූර්ණයෙන් ම මාක්ස්වාදී'' වන අතර පරණ ඒවා ඇති කර තිබුණේ කඳු වල සිටි ගොරිල්ලා සේනාංග විසින් ය; කඳු වල මාක්ස්වාදය තිබුණේ නැත. අළුත් මූලධර්ම පරණ මූලධර්ම වල ප්‍රතිපක්ෂය වේ. ඒවා මෙසේ ය: ''දහයකට විරුද්ධ ව එකකු පොරට අරින්න, සියයකට විරුද්ධ ව දහයක් පොරට අරින්න. නිර්භීත ලෙස ත් අධිෂ්ඨාන සහගත ව ත් සටන් කරන්න, වේගයෙන් ලුහුබඳිමින් ජය පැහැරගන්න''; ''සියලු ම පෙරමුණු වල පහර දෙන්න''; ''ප්‍රධාන නගර අල්ලාගන්න''; ''එක විට දෑතකට 'මුෂ්ටි' දෙකකින් පහර දෙන්න''. සතුරා පහර දුන් කල, ඔහු ගැන ක්‍රියා කළ යුතු ක්‍රම මෙසේ ය: ''දෙරටුවෙන් පිටතදී සතුරා සටනට පටලවා ගන්න'', ''පළමුවෙන් ම පහර දීමෙන් ස්වාමිත්වය ලබා ගන්න'', ''අපේ හැළි වළං බිඳින්ට ඉඩ නො දෙන්න'', ''එක බිම් අඟලක් වත් අත නාරින්න'', ''බලසේනාවන් මාර්ග හයකට බෙදන්න''. යුද්ධය ''විප්ලවයේ මග ත් විජිතවාදයේ මග ත් අතර තීරණාත්මක සටනක්'', වේගවත් කෙටි පහරවල් ඇනගෙන යන යුද්ධයක්, යුදමුරගෙවල් සංග්‍රාමයක්, වෑහැරීමේ යුද්ධයක්, ''දිග්ගැසුණු යුද්ධයක්'' විය. තවද, විශාල පසුමුණු සේවා සංවිධානයක් සහ ඒකාන්තයෙන් ම මධ්‍යගත කළ විධානයක් පවත්වාගෙන යාමේ ප්‍රතිපත්තිය ද විය. අවසාන වශයෙන්, විශාල–පරිමාණයේ ''ගෙවල් ඇරයාමක්'' විය. මේ ඉද් නො පිළිගත් කවරකුට වේවා දඬුවම් කළ යුතු විය, අවස්ථාවාදියෙකි'යි හංවඩු ගැසිය යුතු විය; මේ ආදි නොයෙක් දේ කළ යුතු විය.

කිසි ම සැකයක් නැති ව මේ සියලු ම න්‍යාය ත් භාවිතා ත් වැරදි විය. ඒවා මනෝමූලවාදය විනා අනිකක් නො වී ය. හිතකර වටාපිටා තත්වයන් යටතේ මේ මනෝමූලවාදය සුළු–ධනේශ්වර විප්ලවවාදී පිස්සුව සහ ඉක්මන්කාරකම වශයෙන් ප්‍රකට විය; එහෙත් විපත්ති කාල වලදී, තත්වය වඩ වඩා නරක් වේගෙන යන විට, එය පිළිවෙලින් දරුණු අනවධානය බවට, හණමිටිවාදය බවට සහ පළායාමේ ධර්මය බවට වෙනස් විය. ඒවා හිතුවක්කාරයන්ගේ ත් තකතිරුවන්ගේ ත් න්‍යාය සහ භාවිතා විය; මාක්ස්වාදයේ රසය ඒවායේ යන්තම් වත් ගෑවී තිබුණේ නැත; සත්තකින් ම ඒවා මාක්ස්වාද–විරෝධී විය.

මෙහිදී අපි චියාංසි පළාතෙහි ''සතුරා ඇතුළට ම එන්ට පෙළඹවීම'' ය'යි ද, සෙචුආන් පළාතෙහි ''පෙරමුණ හැකිළීම'' ය'යි ද කියනලද උපායමාර්ගික පසුබැසීම ගැන පමණක් සාකච්ඡා කරමු. ප්‍රබල හමුදාවක් සමග සටන් කරන දුබල හමුදාවක් විසින් යුද්ධයේ මුල් අවස්ථාවේදී යෙදිය යුතු ප්‍රතිපත්තිය මෙය බව පෙර සිටි කිසි ම යුද්ධ න්‍යායධරයකු විසින් වත් යුද්ධ භාවිතාවේ යෙදී සිටියකු විසින් වත් කිසි කලෙක නැතැ'යි කියා නැත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

උපායමාර්ගික වශයෙන් ආරක්ෂාවීමේ සටන්ව්‍යාපාර වල යෙදී සිටින විට මුලදී සාමාන්‍යයෙන් තීරණාත්මක සටන් නො කර මග අරින බව ත්, තීරණාත්මක සටන් කරන්නට සොයන්නේ තත්වයන් හිතකර වූ විට පමණක් බව ත් විදේශීය යුද්ධ විශේෂඥයකු විසින් කියා ඇත. එය මුළුමනින් ම නිවැරදි ය, ඊට එකතු කිරීමට කිසිවක් අපට නැත.

උපායමාර්ගික පසුබැසීමේ අරමුණ යුද්ධ ශක්තිය රැක ගනිමින් පෙරළා–පහරදීම පිණිස සූදනම් වීම ය. පසුබැසීම අවශ්‍ය වන්නේ ප්‍රබල සතුරකු වේගයෙන් පහර දෙමින් ඉදිරියට එන විට අඩියක් වත් නො පසුබැසීමේ නො වැළකිය හැකි තේරුම තම බලසේනාවන් රැක ගැනීම අනතුරට පත් කිරීම වන නිසා ය. එසේ ද වුව, අතීතයේදී, බොහෝ අය, පසුබැසීම ''කේවල ආරක්ෂාව පිළිබඳ අවස්ථාවාදී ක්‍රියාමාර්ගයක්'' ය'යි කල්පනා කරමින්, පසු-බැසීමට මුරණ්ඩු ලෙස විරුද්ධ වූහ. ඔවුන්ගේ ඒ විරෝධය මුළුමනින් ම වැරදි වූ බව අපේ ඉතිහාසයෙන් ඔප්පු වී තිබේ.

පෙරළා–පහරදීමක් පිණිස සූදන්ම් වීමට, අප පෙරළා–පහරදීමේ අවස්-ථාවට යන්නට පෙර, බලවේගයන්ගේ සමබරතාවෙහි වෙනසක් ඇති කරනු වස්, අපි අපට හිතකර වන නමුත් සතුරාට අහිතකර වූ තත්වයන් තෝරාගත යුත්තෙමු, නැතහොත් නිර්මාණය කළ යුත්තෙමු.

LIBERATIONBASE

අපේ අතීත අත්දැකීම් අනුව, තත්වය අපට හිතකර ය, සතුරාට අහිත-කර ය'යි අප විසින් සැලකිය හැකි වීමට පෙර ත් පෙරළා–පහරදීමට බහින්නට අපට හැකි වීමට පෙර ත්, පසුබැසීමේ අවස්ථාවේදී අප විසින් සාමාන්‍යයෙන් මතු දක්වන කරුණු අතුරෙන් අඩු ගණනේ දෙකක් වත් අත් කර ගත යුතු ය. මේ කරුණු මේවා ය:

(1) ජනගහණය උනන්දුවෙන් රතු හමුදවට අනුබල දෙයි.

(2) භූමිභාගය සටන්ව්‍යාපාර වලට හිතකර ය.

(3) රතු හමුදවේ සියලු ම ප්‍රධාන බලසේනාවෝ ඒකරාශි වී සිටිති.

(4) සතුරාගේ දුර්වල තැන් සොයාගෙන ඇත.

(5) සතුරා වෙහෙසට පත් වූ ත් චිත්තශක්තියෙන් පිරිහුණා වූ ත් අඩියකට වට්ටවනු ලැබ සිටී.

(6) සතුරා වැරදි කිරීමට පොළඹවා ඇත.

පළමුවැනි කරුණ, එනම්, ජනගහණය උනන්දුවෙන් දෙන අනුබලය, රතු හමුදවට ඉතා ම වැදගත් එක වේ. එහි තේරුම කඳවුරු ප්‍රදේශයක් තිබීම ය. එමතු නො ව, මේ කරුණ ඇති විට, 4වැනි, 5වැනි සහ 6වැනි කරුණු ඇති කරගැනීම පහසු ය. එහෙයින්, සතුරා පූර්ණ–පරිමාණයේ පහරදීමක් දියත් කරන විට, රතු හමුදව සාමාන්‍යයෙන් සුදු ප්‍රදේශයෙන් කඳවුරු ප්‍රදේශයට පසුබසී; ඒ ජනගහණය සුදු හමුදවට විරුද්ධ ව රතු හමුදවට අනුබල දීමෙහි ලා ඉතා ම උනන්දුවෙන් ක්‍රියා කරන්නේ එහි නිසා ය. තවද, කඳවුරු ප්‍රදේශයක දේශසීමාවන් සහ මධ්‍යම දිස්ත්‍රික්ක අතර ද වෙනසක් ඇත; මධ්‍යම දිස්ත්‍රික්ක වලදී සතුරා ට තොරතුරු ලැබෙන මං වඩා හොඳින් අවහිර කරන්ට, ඔත්තු බැලීම, ප්‍රවාහණ කටයුතු සහ සටනට සහභාගි වීම වඩා හොඳින් කරන්ට, මේ ආදි නොයෙක් දේ කරන්ට ජනතාවට හැකි ය. එසේ අප චියාංසි පළාතෙහි පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර වලට විරුද්ධ ව සටන් කළ කාලයේ, ''පසු-බැසීම අවසන් කරන තැන්'' වශයෙන් තෝරාගත් සියලු ස්ථාන පිහිටියේ පළමුවැනි කරුණ වන මහජන අනුබලය විශිෂ්ට වූ හෝ හොඳට ම හොඳ වූ ප්‍රදේශ වල ය. අපේ කඳවුරු ප්‍රදේශ වල මේ අංගලක්ෂණය රතු හමුදවේ සටන්ව්‍යාපාර සාමාන්‍ය සටන්ව්‍යාපාර වලට වඩා හුඟක් වෙනස් කළේ ය, අනතුරු ව යුදමුරගෙවල් ඉදිකරගෙන කරන සංග්‍රාමය පිළිබඳ ප්‍රතිපත්තියේ පිහිට සෙවීමට සතුරාට සිදු වූ ප්‍රධාන හේතුව වූයේ ය.

ඇතුල් පේළි වල සිට සටන් කරගෙන යාමෙන් ලැබෙන එක් වාසියක් නම් තමාට හිතකර වූ භූමිභාගයක් තෝරා ගැනීමට ත් තමාට උවමනා කරන හැටියට සටන් කළ යුතු තත්වයකට පහරදෙන හමුදව බලෙන් ම පත් කරන්ට ත් පසුබසින හමුදවට එයින් පුළුවන් වීම ය. ප්‍රබල හමුදවක් පරාජය කරනු වස්, දුර්වල හමුදවක් සටන් බිමක් වශයෙන් හිතකර භූමි-භාගයක් සැලකිල්ලෙන් තෝරා ගත යුතු ය. එහෙත් මේ කරුණ පමණක් ම මදි ය, ඒ සමග තවත් ඒවා තිබිය යුතු ය. මෙයින් පළමුවැන්න මහජන අනුබලය යි. ඊළඟ එක පහර දෙනු ලැබිය හැකි තත්වයක සිටින සතුරෙකි; නිදසුන් වශයෙන්, වෙහෙසට පත් වී සිටින හෝ වැරදි කර සිටින සතුරෙකි, නැතහොත් ඉදිරියට ගමන් කරමින් සිටින සටන් කිරීමේ හැකියාවෙන් සංසන්දනාත්මක වශයෙන් දිළිඳු සතුරු කොලමකි. මේ කරුණු නොමැති විට, අපට විශිෂ්ට භූමිභාගයක් හමු වී තිබෙතත්, එය නො තකමින්, ඒ කරුණු ඇති කරගනු පිණිස පසුබසින්ට අපට සිදු වේ. සුදු ප්‍රදේශ වල හොඳ භූමිභාග නම් අඩුවක් නැත, එහෙත් මහජනයා උනන්දුවෙන් දෙන අනුබලය නමැති හිතකර කරුණ එහි අපට නැත. අනික් කරුණු තවම මුදුන්පත් වී නැත් නම් තම කඳවුරු ප්‍රදේශය කරා පසුබැසීම විනා වෙන කළ යුතු දෙයක් රතු හමුදවට නැත. සුදු ප්‍රදේශ සහ රතු ප්‍රදේශ අතර ඇති වෙනස්කම් වලට සමාන වූ වෙනස්කම් සාමාන්‍යයෙන් කඳවුරු ප්‍රදේශයක දේශසීමා සහ මධ්‍යම දිස්ත්‍රික්ක අතර ද පවතී.

ප්‍රාදේශික සේනාංග සහ සතුරා හිරකර ගෙන සිටින බලසේනාවන් හැර, අපේ සියලු ම පහර දෙන භටකණ්ඩායම්, ප්‍රතිපත්තියක් වශයෙන්, ඒකරාශි කළ යුතු ය. උපායමාර්ගික වශයෙන් ආරක්ෂාවීමෙහි යෙදී සිටින සතුරකුට පහර දෙන කල, රතු හමුදව සාමාන්‍යයෙන් ස්වකීය බලසේනාවන් විසිරී

https://liberationbase.wordpress.com

සිටින්ට සලසයි. සතුරා පූර්ණ-පරිමාණයේ පහරදීමක් දියත් කළ වහා ම, රතු හමුදව ''මධ්‍යස්ථානය දෙසට පසුබැසීමක්'' කරයි. පසුබැසීම සඳහා තෝරාගනු ලබන පසුබැසීම අවසන් කරන තැන සාමාන්‍යයෙන් කඳවුරු ප්‍රදේශයේ මධ්‍යම කොටසෙහි වේ; එහෙත්, වටාපිටා තත්වයන් අනුව උචිතනා වන පරිදි, ඇතැම් විට එය ඉදිරි කොටස් වල හෝ පසු කොටස් වල ද වේ. මධ්‍යස්ථානය දෙසට කරන එබඳු පසුබැසීමක් මගින් රතු හමුදවේ සියලු ප්‍රධාන බලසේනාවෝ ඒකරාශි කළ හැකි වෙති.

බලවත් හමුදවක් හා සටන් කරන දුර්වල හමුදවක් සඳහා අත්‍යවශ්‍ය තවත් කරුණක් නම් සතුරාගේ වඩා දුර්වල සේනාංග පහරදීම පිණිස තෝරා ගැනීම ය. එහෙත් සතුරාගේ පහරදීම පටන් ගන්නා විට ඉදිරියට ගමන් කරන ඔහුගේ කොලම් අතුරෙන් ඉතා ම බලවත් එක කොයි එක ද, ඉතා ම බලවත් දෙවැනි එක කොයි එක ද, ඉතා ම දුර්වල එක කොයි එක ද, ඉතා ම දුර්වල දෙවැනි එක කොයි එක ද කියා අපි සාමාන්‍යයෙන් නො දනිමු; එහෙයින් ඔත්තු සෙවීමේ ක්‍රියාවලියක් උචිතනා කරයි. මේ සඳහා බොහෝ විට සැහෙන කාලයක් ගත වේ. උපායමාර්ගික පසුබැසීම අවශ්‍ය වන තවත් හේතුවකි එය.

පහර දෙන සතුරා අපට වඩා ගණනින් බොහෝ වැඩි නම් සහ හුඟක් ම ශක්තිමත් නම්, බලවේගයන්ගේ සමබරතාවෙහි වෙනසක් ඇති කරන්ට අපට හැකි වන්නේ සතුරා අපේ කඳවුරු ප්‍රදේශය ඇතුළට ම කාගෙන ඇවිත් එහි ඔහු සඳහා තිබෙන සියලු කටුක රස වින්දට පසු පමණකි. චියාං කායි-ශේක්ගේ බ්‍රිගේඩ අතුරෙන් එකක සෙනෙවි මණ්ඩලයේ ප්‍රධානයා තුන්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය පවතින අතර කීවාත් මෙන්, ''අපේ මහත මිනිස්සු කෙට්ටු වන තුරු වැහැරී සිටිති, අපේ කෙට්ටු මිනිස්සු මැරෙන තුරු වැහැරී සිටිති.'' නැතහොත්, කුඕමින්තාං පක්ෂයේ ''වටලෑමේ සහ මැඩලීමේ'' හමුදවේ බටහිරි මාර්ග හමුදවේ ප්‍රධාන අණ-දෙන්නා වූ වෙන් මිං-ශූගේ වචන වලින් කියතොත්, ''හැම තැන ම ජාතික හමුදව අඳුරේ අතපත ගාමින් යයි, ඒ අතර රතු හමුදව මහ දවාලේ ගමන් කරයි.'' ඒ වන විට සතුරු හමුදව, තවම ප්‍රබල නමුත්, හුඟක් දුර්වල වී ඇත, එහි සෙබළු වෙහෙසට පත් වී ඇත, එහි චිත්තශක්තිය පිරිහී යමින් ඇත, එහි දුර්වල තැන් බොහෝවක් එළිදරව් වී ඇත, එහෙත් රතු හමුදව, දුර්වල නමුත්, තම ශක්තිය රැකගෙන සිටී, තම උද්‍යොගබලය රැස් කරගෙන සිටී, විඩාවට පත් සතුරා එන තුරු පහසුවෙන් සිටිමින් බලා සිටී. එවැනි වේලාවකදී දෙ පාර්ශ්වය අතර එක්තරා සමතාවක් ඇති කර ගැනීමට, නැතහොත් සතුරාගේ ඒකාන්ත වැඩි-බලය සාපේක්ෂක වැඩි-බලය බවට සහ අපේ ඒකාන්ත අඩු-බලය සාපේක්ෂක අඩු-බලය බවට හැරවීමට, එසේ ම, ඉඳහිට සතුරාට වඩා වැඩි-බලයක් ඇති කර ගැනීමට පවා, සාමාන්‍යයෙන් පුළුවන් වේ. චියාංසි පළාතෙහි තුන්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයට විරුද්ධ ව සටන් කරන විට, රතු හමුදව (කඳවුරු ප්‍රදේශයේ පසු කොටසෙහි

ඒකරාශි වීම පිණිස) අන්තිම සීමාව තෙක් පසුබැසීමක් කළේ ය; එය එසේ නො කළේ නම්, සතුරා පරාජය කරන්ට ඊට පුළුවන්කමක් තිබුණේ නැත; සතුරාගේ ''වටලෑමේ සහ මැඩලීමේ'' බලසේනාවන් එවිට ප්‍රමාණයෙන් රතු හමුදව මෙන් දස ගුණයකට වඩා ලොකු වූ නිසා ය. ''සතුරා ඔදයෙන් පිරී සිටින විට ඔහු මග අරින්න, ඔහු විඩාවට පත් වී ඉවත් ව යන විට පහර දෙන්න,'' යි සුන් වූ ත්සු කී කල, ඔහු සඳහන් කළේ සතුරාගේ වැඩි-බලය අඩු කරනු පිණිස ඔහු වෙහෙසට පත් කිරීම සහ ඔහුගේ චිත්තශක්තිය පිරි-හෙළීම ගැන ය.

අවසාන වශයෙන්, පසුබැසීමේ අරමුණ වැරදි කරන්ට සතුරා පෙළඹවීම හෝ ඔහු කරන වැරදි සොයා දැනගැනීම ය. සතුරු අණදෙන්නකු කොතරම් බුද්ධිමත් වුව ද, සාපේක්ෂක වශයෙන් දිගු කාලසීමාවක් ඇතුළත මොකක් හෝ වරදක් නො කර සිටින්ට ඔහුට බැරි වෙන බව ත්, එහෙයින් ඔහු අපට ඉතිරි කර තබන කඩුලු වලින් ප්‍රයෝජන ගන්ට අපට හැම විට ම හැකි වෙන බව ත් තේරුම් ගත යුතු ය. අප ද ඇතැම් විට වැරදි ලෙස ගණන් බලා සතුරා විසින් ප්‍රයෝජන ගත හැකි කඩුලු ඔහුට දෙන්නාක් මෙන්, සතුරා ද වැරදි කරන්ට ඉඩ තිබේ. ඊට අමතර ව, අපේ ම ක්‍රියාවන් මගින්, නිදසුන් වශයෙන්, සුන් වූ ත්සු කියන හැටියට, ''බොරු පෙනීමක් මවා පෑම'' මගින්, ඒ කියන්නේ, නැගෙනහිරට පහර දෙන්ට යන ලෙසක් බොරුවට පෙන්වමින් බටහිරින් පහර දීමෙන්, සතුරා වැරදි කිරීමට පොළඹවන්ට ද අපට හැකි ය. අප මේ දෙය කරන්ට නම්, පසුබැසීම අවසන් කරන තැන නිශ්චිත ප්‍රදේශ-යකට තරයේ ම සීමා කරන්ට බැරි ය. ඇතැම් විට අප කලින් නිශ්චය කර ගත් ප්‍රදේශයට පසුබැස සිටින නමුත් ප්‍රයෝජන ගැනීමට කඩුලු තවම හමු නො වී නම්, තවත් දුරට පසුබැස සතුරා අපට කඩුල්ලක් තනා දෙන තුරු බලා සිටින්ට අපට සිදු වේ.

පසුබැසීමෙන් අප සොයන හිතකර කරුණු සාමාන්‍යයෙන් ඉහත සඳහන් කළ පරිදි වේ. එහෙත් මේ සියලු කරුණු ඇති වන තුරු පෙරළා-පහරදීමක් දියත් නො කළ හැකි බවක් මෙයින් අදහස් නො වේ. ඒ සියල්ල එක වර ම තිබීම වෙන්ට පුළුවන් දෙයක් වත් අවශ්‍ය දෙයක් වත් නො වේ. එහෙත් බලවත් හමුදවකට විරුද්ධ ව ඇතුල් පේළි වල සටන් කරගෙන යන දුර්වල බලසේනාවක් සතුරාගේ නියම තත්වය අනුව අවශ්‍ය වන විධියේ කරුණු ඇති කර ගැනීමට වෙර දැරිය යුතු ය, මීට පටහැනි සියලු මත වැරදි ය.

පසුබැසීම අවසන් කරන තැන තීරණය කිරීම මුළු එකක් වශයෙන් තත්වය මත රැඳිය යුතු ය. තත්වයෙන් කොටසකට පමණක් සම්බන්ධ කොට සලකන කල අප විසින් පෙරළා-පහරදීම ඇරඹීමට හිතකර ය'යි පෙනෙන තැනක් තත්වය මුළු එකක් වශයෙන් ගෙන බලන කල ද වාසිදයක නො වේ නම්, එතැන තෝරා ගැනීමට තීරණය කිරීම වැරදි ය. කවර හෙයින් ද යත්

LIBERATION BASE
https://liberationbase.wordpress.com

අපේ පෙරළා–පහරදීම පටන්ගන්නා විට ඉනික්බිති ව ඇති විය හැකි දේ අප විසින් සැලකිල්ලට ගත යුතු නිසා සහ අපේ පෙරළා–පහරදීම් සැම විට ම කොටසකට සීමා වූ පරිමාණයකින් පටන් ගන්නා නිසා ය. ඇතැම් විට පසුබැසීම අවසන් කරන තැන, චියාංසි පළාතෙහි ''වටලෑම සහ මැඩලීම'' ට විරුද්ධ ව කළ අපගේ දෙවැනි සහ සිව්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයන්හිදී ත් ශෙන්සි–කාන්සු ප්‍රදේශයෙහි අපේ තුන්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී ත් කළාක් මෙන් කඳවුරු ප්‍රදේශයෙහි ඉදිරි කොටසෙහි නියම කළ යුතු ය. සමහර අවස්ථාවන්හි එය චියාංසි පළාතෙහි අපේ පළමුවැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී මෙන් කඳවුරු ප්‍රදේශයේ මැද කොටසෙහි විය යුතු ය. වෙනත් අවස්ථාවන්හිදී, එය චියාංසි පළාතෙහි අපේ තුන්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී මෙන් කඳවුරු ප්‍රදේශයේ පසු කොටසෙහි නියම කළ යුතු ය. මේ සියලු ම අවස්ථාවන්හිදී තීරණය ගන්නාලද්දේ අඩාල තත්වය මුළු එකක් වශයෙන් තත්වය සමග සම්බන්ධ කොට ය. එහෙත් චියාංසි පළාතෙහි පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය පවතින විට, අපේ හමුදව පසුබැසීම ගැන කිසි ම කල්පනාවක් නො කළේ ය; එය අඩාල තත්වය වත් මුළු තත්වය වත් ගණනට නො ගත් නිසා ය; මෙය ඇත්ත වශයෙන් කලබලකාරී සහ මෝඩ කල්කිරියාවකි. තත්වයක් තැනෙන්නේ සාධක ගණනකින් ය; තත්වයක කොටසක් සහ මුළු තත්වය අතර සබඳකම ගැන කල්පනා කරන විට, අප අපේ විනිශ්චයන් ඇති කරගත යුත්තේ, අඩාල තත්වය ත් මුළු තත්වය ත් යන දෙකෙහි ම ප්‍රකට වන පරිද්දෙන්, සතුරාගේ පැත්තේ සහ අපේ පැත්තේ සාධක අප විසින් පෙරළා–පහරදීමක් ඇරඹීම පිණිස එක්තරා ප්‍රමාණයකට හිතකර වේ ද යන්න පදනම කරගෙන ය.

කඳවුරු ප්‍රදේශයක පසුබැසීම අවසන් කරන තැන් සාමාන්‍යයෙන් තුන් වර්ගයකට බෙදිය හැකි ය; කඳවුරු ප්‍රදේශයේ ඉදිරි කොටසෙහි ඇති තැන්, මැද කොටසෙහි ඇති තැන් සහ පසු කොටසෙහි ඇති තැන් වශයෙනි. කෙසේ වෙතත්, මෙහි අදහස සුදු ප්‍රදේශ වල සටන් කිරීම මුළුමනින් ම ප්‍රතික්ෂේප කිරීම ද? නැත. අප සුදු ප්‍රදේශ වල සටන් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ සතුරු ''වටලෑම සහ මැඩලීම'' පිළිබඳ විශාල–පරිමාණයේ යුද්ධ ව්‍යාපාරයක් ගැන ක්‍රියා කරන්ට අපට ඇති විට පමණකි. අපේ ශක්තිය රැකගැනීමේ ත් සතුරා පරාජය කිරීමට ඉවසිල්ලෙන් කල් බලමින් සිටීමේ ත් ප්‍රතිපත්තිය උඩ ක්‍රියා කරමින්, අප කඳවුරු ප්‍රදේශයට පසුබැසීම සහ සතුරා ඇතුළට ම එන්නට පෙළඹවීම වෙනුවෙන් කතා කරන්නේ සතුරාගේ ශක්තිය ත් අපේ ශක්තිය ත් අතර ලොකු අසමතාවක් පවතින විට පමණකි; කවර හෙයින් ද යත් අපේ පෙරළා–පහරදීම සඳහා හිතකර කරුණු ඇති කර ගැනීමට හෝ සොයාගැනීමට අපට හැකි වන්නේ එසේ කිරීමෙන් පමණක් නිසා ය. තත්වය එතරම් බරපතල නො වේ නම්, නැතහොත් එය කොතරම් බරපතල ද යත් කඳවුරු ප්‍රදේශයේදී පවා තම පෙරළා–පහරදීම පටන්ගැනීමට

රතු හමුදවට බැරි නම්, නැතහොත් පෙරළා–පහරදීම හොඳින් නො කැරෙන්නේ නම් සහ තත්වයෙහි වෙනසක් ඇති කරලීම පිණිස තව දුරට ත් පසුබැසීමක් අවශ්‍ය වේ නම්, එවිට, මේ වර්ගයේ අත්දැකීම් අපට ලැබී ඇත්තේ ඉතා මඳ වශයෙන් වුව ද, පසුබැසීම අවසන් කරන තැන සුදු ප්‍රදේශය තුළ ම නියම කළ හැකි ය'යි, යටත්පිරිසෙයින් න්‍යායාත්මක වශයෙන් හෝ, අප විසින් පිළිගත යුතු ය.

සාමාන්‍යයෙන්, සුදු ප්‍රදේශයක් තුළ ද පසුබැසීම අවසන් කරන තැන් වර්ග තුනකට බෙදිය හැකි ය: (1) අපේ කඳවුරු ප්‍රදේශය ඉදිරිපිට පිහිටි තැන්, (2) එහි අංශ වල පිහිටි තැන් සහ, (3) ඊට පිටිපසින් පිහිටි තැන් ය. මෙන්න පළමුවැනි වර්ගය ගැන නිදසුනක්.

> චියාංසි පළාතෙහි ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ව කළ අපේ පළමුවැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය පවතින අතර, (ලි ලි–සාන් ක්‍රියාමාර්ගය සහ බෝ–චි කණ්ඩායම[34] නිසා ඇති වූ දුෂ්කර ගැටළු දෙක වූ) රතු හමුදව තුළ අසමගිය ත් ප්‍රාදේශික පක්ෂ සංවිධානය තුළ භේදය ත් නිසා නො වී නම්, අප චියාන්, නාන්පෙං සහ චාංශු අතර සකස් වන ත්‍රිකෝණය තුළ අපේ බලසේනාවන් ඒකරාශි කොට, පෙරළා–පහරදීමක් දියත් කරන්ට අපට ඉඩ තිබුණු බව සිතිය හැකි ය. කවර හෙයින් ද යත් කාන් ගඟ සහ පූ ගඟ අතර ප්‍රදේශයේ සිට ඉදිරියට ගමන් කරමින් සිටි සතුරු බලසේනාව ශක්තිය අතින් රතු හමුදවට වඩා ඒ තරම් ම හුඟක් බලවත් නුවූ නිසා ය (40,000කට විරුද්ධ ව 1,00,000කි). එහි මහජන අනුබලය කඳවුරු ප්‍රදේශයෙහි මෙන් උනන්දු නුවූ නමුදු, භූමි-භාගය හිතකර විය; එමතු නො ව, වෙන් වෙන් මාර්ග දිගේ ඉදිරියට එමින් සිටි බලසේනාවන් එකින් එක සිඳ බිඳ දැමීමට පුළුවන්කම තිබුණේ ය.

දැන් දෙවැනි වර්ගය ගැන උදහරණයක් පිණිස ය.

> චියාංසි පළාතෙහි අපේ තුන්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය පවත්නා අතර, සතුරාගේ පහරදීම එතරම් විශාල පරිමාණයකින් නො වී නම්, සතුරාගේ කොලම් අතුරෙන් එකක් පූචියන්–චියාංසි දේශසීමාවෙහි චියන්නිං, ලිචුආන් සහ තායිනිං වල සිට ඉදිරියට ආවේ නම්, ඒ කොලම අප විසින් පහර දිය නො හැකි තරම් බලවත් නො වී නම්, ජුයිචින් ඔස්සේ ශිංකුඕ තෙක් ලි දහසක් දුර වට පාරක ගමන් කරන්නේ නැතිව, තම බලසේනාවන් බටහිර පූචියන් පළාතේ සුදු ප්‍රදේශය තුළ එක්රැස් කොට, පළමුකොට ඒ කොලම සිඳ බිඳ දමන්ට රතු හමුදවට ඉඩ තිබුණු බව එසේ ම සිතිය හැකි ය.

අවසාන වශයෙන්, තුන්වැනි වර්ගය ගැන උදහරණයකි.

> චියාංසි පළාතෙහි ඒ තුන්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය ම පවතින අතර, සතුරාගේ ප්‍රධාන බලසේනාව බටහිර දෙසට ගමන් කරනවා වෙනුවට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

> දකුණු දෙසට ගමන් කළේ නම්, තව තව ත් දකුණට යන ලෙස සතුරා පොළඹවනු වස් (සුදු ප්‍රදේශයක් වූ) හුයිචාං–ශුන්වූ–අන්යුආන් ප්‍රදේශයට ඉවත් වී යාමට අපට බලෙන් ම සිදු වීමට ඉඩ තිබුණේ ය; එවිට උතුරු දෙසට කාගෙන යමින් කඳවුරු ප්‍රදේශයේ ඇතුළට ම යන්ට රතු හමුදාවට පුළුවන්කම තිබුණේ ය, ඒ වන විට කඳවුරු ප්‍රදේශයේ උතුරෙහි සිටි සතුරු බලසේනාව එතරම් විශාල නො වන්නට ඉඩ තිබුණේ ය.

කෙසේ වේවා, ඉහත දැක්වූ සියල්ල ඇත්තට ම අත්දුටු දේ පදනම නො කරගත් අනුමාන උදාහරණ වේ; ඒවා සැලකිය යුත්තේ විශේෂ දේ ලෙස ය, ඒවා සාමාන්‍ය ප්‍රතිපත්ති වශයෙන් ගෙන සංග්‍රහ නො කළ යුතු ය. සතුරා විශාල–පරිමාණයේ ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයක් දියත් කරන විට, අපේ සාමාන්‍ය ප්‍රතිපත්තිය වන්නේ ඔහු ඇතුළට ම එන්නට පෙළඹවීම, අප කඳවුරු ප්‍රදේශය තුළට ඉවත් වී යාම සහ එහිදී ඔහු හා සටන් කිරීම ය; මෙය ඔහුගේ පහරදීම සිඳ බිඳ දැමීමට අපට තිබෙන ඉතා ම නිසැක ක්‍රමය වන නිසා ය.

''දෙරටුවෙන් පිටතදී සතුරා සටනට පටලවා ගැනීම'' වෙනුවෙන් කතා කරන අය; පසුබැසීමේ තේරුම භූමිප්‍රදේශය නැති කර ගැනීම, ජනතාව මත විපත්ති පැමිණවීම (ඔවුන් ඊට කියන හැටියට, ''අපේ හැළි වළං පොඩි-පට්ටම් කරන්ට ඉඩ දීම'') සහ, කඳවුරු ප්‍රදේශයෙන් පිට අහිතකර ප්‍රතිවිපාක හටගැන්වීම ය'යි තර්ක කරමින්, උපායමාර්ගික පසුබැසීමට විරුද්ධ වෙති. අපේ පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය පවත්නා අතර, අප එක අඩියක් පසුබසින හැම වරක ම සතුරා ඔහුගේ යුදමුරගෙවල් එක අඩියක් ඉස්සරහට තල්ලු කරනවා ඇතැ'යි ද, එහෙයින් අපේ කඳවුරු ප්‍රදේශ දිගට ම පටු වෙනවා ඇතැ'යි ද, නැති වූ භූමිය ආපසු ලබාගන්ට අපට මගක් නැති වෙනවා ඇතැ'යි ද, ඔව්හු තර්ක කළහ. සතුරා අපේ භූමිප්‍රදේශය ඇතුළට ම එන්නට පෙළඹවීම අතීතයේදී ප්‍රයෝජනවත් වූවා විය හැකි නමුත්, සතුරා යුද-මුරගෙවල් සංග්‍රාමය පිළිබඳ ප්‍රතිපත්තිය යොදාගෙන සිටින ඔහුගේ පස්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයට විරුද්ධ ව එය පලක් නැති වෙනවා ඇත; මේ යුද්ධව්‍යාපාරය ගැන ක්‍රියා කරන්ට තිබෙන එක ම පිළිවෙල විරුද්දකම් පෑම පිණිස අපේ බලසේනාවන් බෙදා, සතුරා වෙත කෙටි වේගවත් පහරවල් ඇනගෙන යාම ය'යි ඔව්හු කීහ.

එබඳු මත වලට පිළිතුරක් දීම පහසු ය, අපේ ඉතිහාසය දැනට ම පිළිතුරු දී ඇත. භූමිප්‍රදේශ නැති වීම සම්බන්ධයෙන්, බොහෝ විට නැති වීම වැළැක්විය හැකි වන්නේ නැති වීමෙන් ම පමණකි; මෙය ''ගැනීම පිණිස දීම'' පිළිබඳ ප්‍රතිපත්තිය වේ. අපට නැති වන්නේ භූමිප්‍රදේශ නම් ද, අපට ලැබෙන්නේ සතුරා අබිබවා ජයග්‍රහණය ත්, ඒ එක්ක ම අපේ භූමිප්‍රදේශය ආපසු ලැබීම සහ පළල් වීම ත් නම් ද, එවිට එය අතට වාසි ගනුදෙනුවක් වේ.

ජාවාරමක් කරන විට, ගැනුම්කාරයාගේ මුදල් ටිකක් ''නැති වන්නේ'' නැත් නම්, බඩු ලබාගන්ට ඔහුට බැරි ය; විකුණන්නාගේ බඩු ටිකක් ''නැති වන්නේ'' නැත් නම්, මුදල් ලබාගන්ට ඔහුට බැරි ය. විප්ලවවාදී ව්‍යාපාරයකදී සිදු වන පාඩු වලට විනාශය ඇතුළත් වේ; ලැබෙන ලාභය ප්‍රගතිශීලි ලක්ෂණයකින් යුත් සංවර්ධනය යි. නින්ද සහ විවේකය නිසා කාලය නැති වීමක් සිදු වේ, එහෙත් හෙට කරන වැඩ පිණිස ශක්තිය ලැබේ. යම්කිසි මෝඩයකු මෙය තේරුම් නො ගෙන නිදාගන්ට බැරි ය'යි කියා සිටිතොත්, පසු දින ඔහුට ඇඟට කිසි පණක් නැති වේ; මෙය අතට පාඩු ගනුදෙනුවකි. පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී අප පැරදුණේ මෙවැනි ම හේතු නිසා ය. අපේ භූමිප්‍රදේශයෙන් කොටසක් අත හැර දමන්ට අදිමදි කිරීමේ ප්‍රතිඵලය වූයේ එය සම්පූර්ණයෙන් ම නැති වීම ය. ඇබිසීනියාව ද සතුරා හා මුහුණට මුහුණ ලා සටන් කළ විට, ඇගේ පරාජයේ එක ම හේතුව එය නො වූ නමුත්, ඇගේ භූමිප්‍රදේශ සියල්ල ම ඇට නැති විය.

ජනතාව මත අලාබ හානි පැමිණවීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ද එය ම සැබෑ වේ. ඔබ ටික කලකට ඇතැම් ගෙවල් වල හැළි වළං පොඩිපට්ටම් කරන්ට ඉඩ දිය නො හැකි ය'යි කියා සිටිතොත්, ඔබ කරන්නේ බොහෝ කලක් මුළුල්ලෙහි සියලු ම මිනිසුන්ගේ හැළි වළං පොඩිපට්ටම් කරගෙන යන්ට සිද්ද කිරීම ය. ඔබ ටික කලක් පවතින අහිතකර දේශපාලන ප්‍රති-විපාකයන් ගැන බිය වන්නෙහි නම්, ඔබට සිදු වන්නේ දිගු කලක් පවතින අහිතකර දේශපාලන ප්‍රතිවිපාකයන් ගෙන් ඊට මිල ගෙවීමට ය. ඔක්තෝබර විප්ලවයට පසු, රුසියන් බෝල්ශෙවික්වරුන් ''වාම කොමියුනිස්ට්වාදීන්'' ගේ අදහස් උඩ ක්‍රියා කොට ජර්මනිය සමග සාම ගිවිසුම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළා නම්, අළුත බිහි වූ සෝවියට්–සභා ඉක්මනින් ම මැරීයාමේ අනතුරට පත් වෙන්ට ඉඩ තිබුණි.[35]

පෙනීමට විප්ලවවාදී වූ එබඳු ''වාම'' මත හටගන්නේ සුළු–ධනේශ්වර උගතුන්ගේ විප්ලවවාදී ඉක්මන්කාරකමෙන් මෙන් ම කුඩා ගොවි නිෂ්-පාදකයන්ගේ පටු හණමිටිවාදයෙන් ය. එබඳු මත දරන අය ගැටළු දෙස බලන්නේ එක පැත්තකට සීමා වී පමණකි; මුළු එකක් වශයෙන් තත්වය විස්තීර්ණ ලෙස දැකීමට ඔව්හු අසමත් වෙති; ඔව්හු අද දවසේ පලප්‍රයෝජන හෙට දවසේ පලප්‍රයෝජන සමග හෝ කොටසේ පලප්‍රයෝජන මුළු එකේ පලප්‍රයෝජන සමග හෝ ඈඳන්නට අකැමැති වෙති, කොටසකට සීමා වූ දෙය සහ තාවකාලික දෙය මරු වැළඳගන්නා සේ වැළඳගනිති. සත්තකින් ම, කොටසකට සීමා වූ දෙය සහ තාවකාලික දෙය, කාලයේ ඇත්තට ම තිබෙන වටාපිටා තත්වයන් තුළ, එවේලාවේ පවත්නා මුළු තත්වය ත් මුළු එකවනුව ත් සඳහා හිතකර වන විට — විශේෂයෙන් ම තීරණාත්මක වන විට — අපි ඒවා තරයේ ම අල්ලා ගත යුත්තෙමු; නො එසේ නම් අපි ඒ ඒ දේ ලිස්සා යාමට ඉඩ දීම ත් ඒවා ගැන කිසිවක් නො කර සිටීම ත් වෙනුවෙන්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

කතා කරන අය වන්නෙමු. පසුබැසීම අවසන් කරන තැනක් තිබිය යුත්තේ ඒ නිසා ය. අපි කුඩා නිෂ්පාදකයාගේ දුරදිග නො පෙනෙන ගතිය අනුව නො යා යුත්තෙමු. අපි බෝල්ශෙවික්වාදීන්ගේ ප්‍රඥාව උගත යුත්තෙමු. නග්න ඇස ප්‍රමාණවත් නො වේ, දුරදක්නයේ ත් අණුදක්නයේ ත් උදව්ව අපට තිබිය යුතු ය. මාක්ස්වාදි ක්‍රමය දේශපාලන හා යුද්ධ කරුණු වලදී අපේ දුර-දක්නය ත් අණුදක්නය ත් වේ.

සත්තකින් ම, උපායමාර්ගික පසුබැසීමට ඊට ම අයත් දුෂ්කරතා තිබේ. පසුබැසීම පටන් ගැනීමට වේලාව නිශ්චය කර ගැනීම, පසුබැසීම අවසන් කරන තැන තෝරාගැනීම, කාඩර්වරුන්ට සහ ජනතාවට දේශපාලන වශයෙන් ඒත්තු ගැන්වීම — මේවා විසඳිය යුතු වන දුෂ්කර ගැටළු ය.

පසුබැසීම පටන්ගන්නා වේලාව නියම කිරීමේ ප්‍රශ්නය ඉතා වැදගත් ය. චියාංසි පළාතෙහි ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ව කළ අපගේ පළමු-වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී පසුබැසීම එය කළ වේලාවේ ම නො කරනලද නම්, ඒ කියන්නේ, එය පමා කරනලද නම්, ඉතා ම අඩු වශයෙන් අපේ ජයග්‍රහණයේ ප්‍රමාණය කෙරෙහි වත් එය බලපාන්ට ඉඩ තිබුණේ ය. ඇත්ත වශයෙන් ම, නිසි වේලාවට කලින් කරන පසුබැසීම ත් පමා වී කරන පසුබැසීම ත් යන දෙකෙන් ම පාඩු සිදු වේ. එහෙත් සාමාන්‍යයෙන් කියන කල, නිසි වේලාවට කලින් කරන පසුබැසීමකට වඩා පමා වී කරන පසු-බැසීමකින් සිදු වන පාඩු වැඩි ය. මුලපිරුමේ ශක්තිය සම්පූර්ණයෙන් 'අපට ම තබා ගැනීමට හැකි වන නිසි වේලාවට යොදගත් පසුබැසීමක්, අප අපේ පසුබැසීම අවසන් කරන තැනට සේන්දු වී, අපේ බලසේනාවන් අළුතෙන් කණ්ඩායම් කරගෙන, විඩාවට පත් සතුරා එන තුරු පහසුවෙන් සිටිමින් බලා සිටින විට, පෙරළා–පහරදීමට හැරෙනු පිණිස අප හට මහත් ආධාර-යක් වේ. චියාංසි පළාතෙහි සතුරාගේ පළමුවැනි, දෙවැනි සහ සිව්වැනි යුද්ධව්‍යාපාර සිඳ බිඳ දමන විට, විශ්වාස සහගත ව ද කලබලයක් නැති ව ද ඔහු ගැන ක්‍රියා කරන්ට අපට හැකි විය. දෙවැනි යුද්ධව්‍යාපාරයේදී එතරම් සුණුවිසුණු වන පරාජයක් විඳීමෙන් පසු සතුරා එපමණ ඉක්මනින් අළුත් පහරදීමක් දියත් කරනවා ඇතැ'යි අප බලාපොරොත්තු නුවූ නිසා (අප අපේ දෙවැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය අවසන් කළේ 1931, මැයි 29වැනි ද ය, චියාං කායි–ශෙක් ඔහුගේ තුන්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධ-ව්‍යාපාරය පටන් ගත්තේ ජූලි 1වැනි ද ය), නැවත එක්රැස් වනු පිණිස කඩිමුඩියේ වට පාරෙන් ලොකු දුරක් ගමන් කරන්නට සිදු වීමෙන් රතු හමුදාව බෙහෙවින් විඩාවට පත් වූයේ තුන්වැනි යුද්ධව්‍යාපාරයේදී පමණකි. පසුබැසීමේ වේලාව නියම කිරීම තීරණය කරන්නේ අප කලින් සාකච්ඡා කළ ප්‍රති–යුද්ධව්‍යාපාරයේ සූදනම් වීමේ අවධියේ වේලාව නියම කරන පිළිවෙලට ම ය; ඒ කියන්නේ, මුළුමනින් ම අප රැස් කරගෙන තිබෙන අවශ්‍ය තොරතුරු වල ත් සතුරාගේ පැත්තේ සහ අපේ ම පැත්තේ සාමාන්‍ය තත්වය පිළිබඳ තක්සේරුව ත් පදනම කරගෙන ය.

උපායමාර්ගික පසුබැසීම ගැන අත්දැකීමක් කාඩර්වරුන්ට සහ ජනතාවට ඊට කලින් ලැබී නැති විට ද, උපායමාර්ගික පසුබැසීමක් ගැන තීරණය කිරීමේ බලය පුද්ගලයන් කිහිප දෙනකුන් අතට හෝ තනි පුද්ගලයකු අතට හෝ පවරා දී ඒ අතර ම කාඩර්වරුන්ගේ විශ්වාසය බුක්ති විඳීමට හැකි වන තරමට හමුද නායකත්වයේ ගරුත්වය උසස් නො වන විට ද, උපායමාර්ගික පසුබැසීමේ අවශ්‍යතාව කාඩර්වරුන්ට සහ ජනතාවට ඒත්තු ගැන්වීම අතිශ-යින් ම දුෂ්කර ය. කාඩර්වරුන් අත්දැකීමෙන් තොර වූ නිසා ද, උපාය-මාර්ගික පසුබැසීම කෙරෙහි විශ්වාසයක් ඔවුන් තුළ නො තිබුණු නිසා ද, අපේ පළමුවැනි සහ සිව්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාර වල ආරම්භයේදී ත් පස්වැනි යුද්ධව්‍යාපාරය පැවති මුළු කාලය තුළ ත් මහත් දුෂ්කරතා මුණ ගැසුණි. පළමුවැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය පැවති කාලයේ, ලි ලි–සාන් ක්‍රියාමාර්ගයේ බලපෑම යටතේ, කාඩර්වරුන් ඔවුන්ට එහි වරද ඒත්තු යන තුරු ම පක්ෂ ව සිටියේ පසුබැසීමට නො ව ප්‍රහරණයට ය. සිව්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී කාඩර්වරු, යුද්ධ සාහසිකවාදයේ බලපෑම යටතේ, පසුබැසීමට කටයුතු සූදනම් කරනවාට විරෝධය පළ කළහ. පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී, ඔව්හු පළමුකොට සතුරා ඇතුළට ම එන්ට පොළඹවනවාට විරුද්ධ වූ යුද්ධ සාහසිකවාදි මතයෙහි තරයේ ම ඇලී සිටියහ; එහෙත් පසුව යුද්ධ හණමිටි-වාදයට හැරුණාහ. ටිබෙට් හා හුයි මිනිසුන්[36] වෙසෙන ප්‍රාන්ත වල අපේ කඳවුරු ප්‍රදේශ පිහිටුවන්ට කොහෙත් ම බැරි බව දුවගෙන ගොස් ගල් බිත්තියක හැපෙන තුරු ම නො පිළිගත් චාං කුඕ–තාඕ ක්‍රියාමාර්ගයට ඇලී සිටියවුන් පිළිබඳ ප්‍රශ්නය තවත් එකකි. අත්දැකීම කාඩර්වරුන්ට අත්‍යවශ්‍ය ය; අසාර්ථකභාවය සත්තකින් ම සාර්ථකභාවයේ මව ය. එහෙත් අනික් මිනි-සුන්ගේ අත්දැකීම් වලින් විවෘත මනසක් ඇති ව උගෙනීම ද අවශ්‍ය ය; සියලු ම කරුණු වලදී තමාගේ ම පුද්ගලික අත්දැකීම අවශ්‍ය ය'යි තරයේ කියා සිටීම ත්, පුද්ගලික අත්දැකීමක් නොමැති විට, තමාගේ ම මතයෙහි මුරණ්ඩු ලෙස ඇලී සිටීම සහ අනික් මිනිසුන්ගේ අත්දැකීම අහක දැමීම ත් හුදු ''පටු අනුභූතිවාදය'' වේ. මේ හේතුව නිසා අපේ යුද්ධයට සිදු වී තිබෙන පාඩු සුළුපටු නො වේ.

මිනිසුන්ට අත්දැකීම් නොමැතිවීමේ හේතුවෙන්, උපායමාර්ගික පසු-බැසීමේ අවශ්‍යතාව ගැන ඔවුන් තුළ විශ්වාසයක් නොතිබීම චියාංසි පළාතෙහි අපේ පළමුවැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදීට වඩා අන් කවර කලෙක වත් මහත් නො වී ය. ඒ කාලයේ චියාන්, ශිංකුඕ සහ යුංපෙං යන උප–පළාත් වල ප්‍රාදේශික පක්ෂ සංවිධාන ත් බහුජන සමූහයා ත් සියලු දෙනා ම රතු හමුදාව ඉවත් වී යනවාට විරුද්ධ වූහ. එහෙත් පළමුවැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේ අත්දැකීමෙන් පසු, ඊළඟට ඇති වූ ප්‍රති–යුද්ධව්‍යාපාර වලදී එබඳු ගැටළු ඇති නො වී ය. හැම දෙනා ම කඳවුරු ප්‍රදේශයෙහි භූමිප්‍රදේශ නැති වීම ත් ජනතාව දුක් හිරිහැර වලට භාජන වීම ත් තාවකාලික බව ඒත්තු ගත්හ,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සතුරාගේ ''වටලෑම සහ මැඩලීම'' සිඳ බිඳ දමන්ට රතු හමුදුවට හැකි බවට විශ්වාස සහගත වූහ. කෙසේ වේවා, ජනතාව තුළ විශ්වාසය ඇද්ද නැද්ද යන්න කාඩර්වරුන් තුළ විශ්වාසය ඇද්ද නැද්ද යන්න හා කිට්ටුවෙන් බැඳී පවතී; එහෙයින් සියල්ලට ම පළමුව කළ යුතු වැඩය කාඩර්වරුන්ට ඒත්තු ගැන්වීම ය,

උපායමාර්ගික පසුබැසීමේ එක ම අරමුණ පෙරළා–පහරදීමට හැරීම ය; එය හුදෙක් උපායමාර්ගික ආරක්ෂාවීමේ පළමුවැනි අවස්ථාව වේ. මුළු උපායමාර්ගයෙහි තීරණාත්මක පුරුක වනුයේ ඊළඟට එළඹෙන පෙරළා–පහරදීමේ අවස්ථාවේදී ජය දිනා ගත හැකි ද යනු යි.

4. උපායමාර්ගික පෙරළා–පහරදීම

ඒකාන්ත වැඩි–බලයක් ඇත්තා වූ සතුරකුගේ පහරදීම පරාජය කරනු පිණිස අපි අපේ උපායමාර්ගික පසුබැසීම කරගෙන යන අතර ඇති කළ තත්වය කෙරෙහි, අපට හිතකර වූ ත් සතුරාට අහිතකර වූ ත් ඔහුගේ පහරදීම පටන් ගන්නා විට තිබුණු තත්වයට වෙනස් වූ ත් තත්වයක් කෙරෙහි, විශ්වාසය තබමු. එබඳු තත්වයක් සකස් කිරීමට බොහෝ මූලික කරුණු අවශ්‍ය වේ. මේ සියල්ල ගැන ඉහතින් විස්තර කර ඇත.

කෙසේ වේවා, මේ කරුණු ද, අපට හිතකර වූ සහ සතුරාට අහිතකර වූ තත්වයක් ද තිබීමෙන් අප දැනට ම ඔහු පරාජය කර ඉවර බවක් අදහස් නො වේ. එබඳු කරුණු ද එබඳු තත්වයක් ද අපට ජය ලබන්නට සහ ඔහු පරාජය කරන්නට පුළුවන්කමක් ඇති කර දෙයි; එහෙත් ඇත්තට ම ලැබූ ජයක් හෝ කළ පරාජයක් නො වෙයි; ඒ කරුණු ත් තත්වය ත් තවම එක් හමුදුවකට හෝ ඇත්තට ම ජය වත් පරාජය වත් ගෙන දී නැත. ජය හෝ පරාජය ඇති කරලීමට හමුදු දෙක අතර තීරණාත්මක සටනක් අවශ්‍ය ය. ජයග්‍රාහකයා කොයි හමුදුව ද පරාජිතයා කොයි එක ද යන ප්‍රශ්නය බේරුම් කළ හැකි වන්නේ තීරණාත්මක සටනකට පමණි. උපායමාර්ගික පෙරළා–පහරදීමේ අවස්ථාවේදී තිබෙන එක ම කර්තව්‍යය මෙය වේ. පෙරළා–පහරදීම දීර්ඝ ක්‍රියාවලියකි, එය ආරක්ෂාවීමේ යුද්ධව්‍යාපාරයක ඉතා ම සිත්ගන්නා සුලු, ඉතා ම වේගබලසම්පන්න සහ, එසේ ම අවසාන අවස්ථාව ද වේ. ක්‍රියාකාරි ආරක්ෂණය'යි කියන දෙයින් ප්‍රධාන වශයෙන් සඳහන් වන්නේ තීරණාත්මක සටන්–වැදීමක ස්වභාවයෙන් වන මේ උපායමාර්ගික පෙරළා–පහරදීම ය.

කරුණු ත් තත්වය ත් ඇති කරනු ලබන්නේ උපායමාර්ගික පසුබැසීමේ අවස්ථාවේදී පමණක් ම නො වේ; පෙරළා–පහරදීමේ අවස්ථාවේදී ද දිගට ම

ඇති කරනු ලබයි. ස්වරූපයෙන් වේවා, ස්වභාවයෙන් වේවා, පසුව කී අවස්ථාවේදී ඒවා කලින් කී අවස්ථාවේදී වූ ලෙස ම නො වේ.

ස්වරූපයෙන් ද ස්වභාවයෙන් ද එලෙස ම විය හැක්කේ, උදහරණ වශයෙන්, සතුරු හටකණ්ඩායම් වඩා ත් විඩාවට පත් වී සහ වඩා ත් ක්ෂය වී සිටිනවා ඇත යන සත්‍ය කාරණය යි; එය හුදෙක් කලින් අවස්ථාවේදී සිදු වෙන්ට පටන් ගත් ඔවුන්ගේ විඩා පත් වීම ත් ක්ෂය වීම ත් දිගට ම සිදු–වේගෙන යාමකි.

එහෙත් මුළුමනින් ම අළුත් කරුණු ද මුළුමනින් ම අළුත් තත්වයක් ද බිහි වනු නියත ය. එසේ, සතුරා එක් පරාජයක් හෝ වැඩි ගණනක් වින්ද කල, අපට වාසිදයක වූ ත් ඔහුට අවාසිදයක වූ ත් කරුණු ඔහුගේ විඩාව යනාදියට පමණක් සීමා නො වෙනවා ඇත, අළුත් සාධකයක් එකතු වෙනවා ඇත; එනම් ඔහු පරාජයන් විඳ සිටී යනු යි. තත්වයෙහි ද අළුත් වෙනස්වීම් සිදු වෙනවා ඇත. සතුරා තම හටකණ්ඩායම් අපිළිවෙලකට හසුරුවන්ට ත් යම් යම් දේ කරන්ට යන බවක් බොරුවට පෙන්වන්ට ත් පටන් ගන්නා කල, පිළිමල් හමුදු දෙකේ සාපේක්ෂක ශක්තිය ස්වභාවයෙන් ම තව දුරට ත් කලින් සේ ම නො පවතිනවා ඇත.

එහෙත් එක් පරාජයක් හෝ වැඩි ගණනක් විඳ සිටින්නේ සතුරාගේ බලසේනාවන් නො ව අපේ ම බලසේනාවන් නම්, එවිට කරුණු ත් තත්වය ත් දෙක ම අනික් අතට වෙනස් වෙනවා ඇත. ඒ කියන්නේ මෙය යි: සතුරාට ඇති අවාසි අඩු වෙනවා ඇත, ඒ අතර අපේ පැත්තේ අවාසි පහළ වෙනවා ඇත, වැඩෙන්ට පවා පුළුවන. යළිත් එය ද මුළුමනින් ම අළුත් සහ වෙනස් දෙයක් වෙනවා ඇත.

කොයි පැත්තට හෝ ලැබෙන පරාජයක්, පැරදුණු පැත්ත විසින්, තම ප්‍රතිපාක්ෂිකයා කෙරෙහි පීඩනය ඇති කරන අටියෙන්, තම විනාශය වළකාලීම පිණිස ද, තමාට අහිතකර වූ ත් සතුරාට හිතකර වූ ත් අළුත් කරුණු වලින් සහ අළුත් තත්වයෙන් තමා මුදවා ගනු පිණිස ද, තමාට හිතකර වන්නා වූ ත් තම ප්‍රතිපාක්ෂිකයාට අහිතකර වන්නා වූ ත් කරුණු සහ තත්වයක් නැවත ඇති කරනු පිණිස ද දරන අළුත් පරිශ්‍රමයක් කරා කෙළින් ම හා සීඝ්‍රයෙන් මග පාදයි.

දිනන පැත්තේ පරිශ්‍රමය හරියට ම ඊට ප්‍රතිපක්ෂ දෙය වෙනවා ඇත. තම ජයග්‍රහණයෙන් ප්‍රයෝජන ගනිමින් සතුරාට ඊට ත් වඩා ලොකු අලාබ හානි සිදු කිරීමට ද, තමාට හිතකර ව පවතින කරුණු තවත් වැඩි කර ගැනීමට සහ තම තත්වය තව දුරට ත් දියුණු කර ගැනීමට ද, සතුරා ඔහුට අහිතකර කරුණු වලින් සහ අහිතකර තත්වයෙන් අත්මිදීම සහ විනාශයෙන් බේරීම සාර්ථක විය නො දීමට ද ඒ පැත්ත වෙර දරනවා ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙසේ, කොයි පැත්තට වේවා, තීරණාත්මක සටන පිළිබඳ අවස්ථා-වේදී කරන අරගලය මුළු යුද්ධයේදී හෝ මුළු යුද්ධව්‍යාපාරයේදී හෝ ඉතා ම දුෂ්කර වූ ත් ඉතා ම ආයාශකර වූ ත් අරගලය මෙන් ම ඉතා ම දැඩි, ඉතා ම ව්‍යාකූල සහ ඉතා ම වෙනස් වන සුලු අරගලය වේ; විධානය පිළිබඳ අදහස පෙරදැරි කරගෙන බලන කල එය ඉතා ම අමාරු සහ අසීරු කාලය වේ.

පෙරළා–පහරදීමේ අවස්ථාවේදී, ගැටළු රැසක් ම ඇත; ඉන් ප්‍රධාන වනුයේ පෙරළා–පහරදීම පටන්ගැනීම, භටකණ්ඩායම් ඒකරාශි කිරීම, ජංගම සංග්‍රාමය, ඉක්මනින් ම විසඳුමක් ලබා ගැනීමේ යුද්ධය සහ මුලසුන් කිරීමේ යුද්ධය යි.

පෙරළා–පහරදීමකදී වේවා, පහරදීමකදී වේවා, මේ ගැටළු පිළිබඳ මූලධර්ම ඒවායේ මූලික ලක්ෂණයෙන් වෙනස් වන්නේ නැත. මේ තේරුමෙන් පෙරළා–පහරදීමක් ද පහරදීමක් ම ය'යි අප විසින් කියන්ට ඉඩ තිබේ.

එසේ නමුත්, එය පහරදීමක් ම නො වේ. පෙරළා–පහරදීමේ මූලධර්ම භාවිතාවේ යොදන්නේ සතුරා පහරදීමෙහි යෙදී සිටින විට ය. පහරදීමේ මූලධර්ම භාවිතාවේ යොදන්නේ සතුරා ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට ය. මේ තේරුමෙන් පෙරළා–පහරදීම ත් පහරදීම ත් අතර යම්යම් වෙනස්කම් තිබේ.

මේ හේතුව නිසා, උපායමාර්ගික ආරක්ෂාවීම ගැන කතා කරන පරිච්ඡේදයෙහි පෙරළා–පහරදීම ගැන කළ සාකච්ඡාවට සටන්ව්‍යාපාර පිළිබඳ විවිධ ගැටළු සියල්ල ඇතුළත් කර තිබෙන නමුදු, එසේ ම උපායමාර්ගික පහරදීම ගැන පරිච්ඡේදයේදී පුනරුක්තිය වළකනු පිණිස වෙන ගැටළු ගැන පමණක් සාකච්ඡා කරනු ලබන නමුදු, සැබෑ භාවිතාවට ආ කල පෙරළා–පහරදීම ත් පහරදීම ත් අතර ඇති සමානකම් වත් අසමානකම් වත් අප විසින් නො සලකා නො සිටිය යුතු ය.

5. පෙරළා–පහරදීම පටන්ගැනීම

•පෙරළා–පහරදීමක් පටන්ගැනීමේ ප්‍රශ්නය ''මුල් සටන'' හෝ ''ආමුඛය'' පිළිබඳ ප්‍රශ්නය වේ.

අයකු සිටින්නේ උපායමාර්ගික ආරක්ෂාවීමෙහි වේවා, හෝ උපාය-මාර්ගික පහරදීමෙහි වේවා, මුල් සටනේදී පරෙස්සම් විය යුතු ය'යි, ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට වඩා ත් වෙසෙසින් එසේ කළ යුතු ය'යි, බොහෝ ධනේශ්වර යුද්ධ විශේෂඥයෝ අවවාද කරති. අතීතයේදී අප ත් මෙය බැරෑරුම් කරුණක් ලෙස බර කොට පවසා ඇත. ච්යාංසි පළාතෙහි සතුරු ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර පහට විරුද්ධ ව අප

ගෙනගිය සටන්ව්‍යාපාර අපට ආඪ්‍ය අත්දැකීම් ලබා දී ඇත; එය හැදෑරීම අපට ප්‍රයෝජනවත් නො වන්නේ නො වේ.

තම පළමුවැනි යුද්ධව්‍යාපාරයේදී, සතුරා, කියාන්–ච්යාන්නිං සටන්-පේළියේ සිට රතු හමුදාවේ කඳවුරු ප්‍රදේශයට විරුද්ධ ව දකුණු දෙසට ඉදිරියට ගමන් කරනු පිණිස, කොලම් අටකට බෙදූ මිනිසුන් 100,000ක් යෙදී ය. මිනිසුන් 40,000ක් පමණ සිටි රතු හමුදාව ච්යාංසි පළාතේ නිංතු උප–පළාතේ හුආංපි සහ ශියාඕපු ප්‍රදේශයෙහි ඒකරාශි වී සිටියේ ය.

තත්වය මෙසේ විය:

(1) ''මැඩලීමේ'' බලසේනාවෝ මිනිසුන් 100,000කට වැඩි නුවූහ; ඔවුනතුරෙන් කිසිවෙක් ච්යාං කායි–ශෙක්ගේ ම භටයෝ නුවූහ; සාමාන්‍ය තත්වය ඉතා බරපතල නො වී ය.

(2) කියාන් ආරක්ෂා කරමින් සිටි, ලෝ ලින් යටතේ වූ සතුරු ඩිවිසනය බටහිර දෙසට කාන් ගඟ හරහා නවත්වා සිටියේ ය.

(3) කුං පිං–පාන්, චාං හුයි–ත්සාන් සහ තාන් තාඕ–යුආන් යටතේ වූ සතුරු ඩිවිසන් තුන කියානයට ගිනිකොන් දෙසින් ද නිංතුවට වයඹ දෙසින් ද පිහිටි පූතියන්–තුංකු–ලුංකාං–යුආන්තෞ කොටස කරා ඉදිරියට ගමන් කොට එය අල්ලාගෙන සිටියේ ය. චාං හුයි–ත්සාන්ගේ ඩිවිසනයේ ප්‍රධාන සේනාව ලුංකාංහි ද, තාන් තාඕ–යුආන්ගේ ඩිවිසනයේ ප්‍රධාන සේනාව යුආන්තෞහි ද වූහ. බෝ–වි කණ්ඩායම විසින් නොමග යවනු ලැබ සිටි වැසියන් කලකට රතු හමුදාව කෙරෙහි අවිශ්වාසයෙන් සහ ඊට විරුද්ධ ව සිටි නිසා, පූතියන් සහ තුංකු සටන්බිම වශයෙන් තෝරා ගැනීම නුවණට හුරු නො වී ය.

(4) ලියු හෝ–තිං යටතේ වූ සතුරු ඩිවිසනය සිටියේ ඉතා ඈත පූචියන් පළාතේ සුදු ප්‍රදේශයෙහි චියන්නිංහි ය; ඒ ඩිවිසනය ච්යාංසි පළාත තුළට වැදීම නො වන සුලු විය.

(5) මාඕ පිං–වන් සහ ශු කේ–ශියාං යටතේ වූ සතුරු ඩිවිසන් දෙක කුආංචාං සහ නිංතු අතර පිහිටි තෞපි–ලෝගෞ–තුංශාඕ කොටසට ඇතුල් වී සිටියේ ය. තෞපි සුදු ප්‍රදේශයක් විය, ලෝගෞ ගොරිල්ලා කලාපයක් විය, බෝ–වි කණ්ඩායමේ කොටස් සිටි තුංශාඕ තොරතුරු හොරෙන් පිටවීමට ඉඩ තිබුණු ස්ථානයක් විය. එමතු නො ව, අප මාඕ පිං–වන්ට සහ ශු කේ–ශියාංට පහර දී, ඉක්බිති බටහිර දෙසට කාගෙන යන්ට තැත් කළා නම්, චාං හුයි–ත්සාන්, තාන් තාඕ–යුආන් සහ කුං පිං–පාන් යටතේ සිටි සතුරු ඩිවිසන් තුන, අපට ජය දිනාගැනීම අමාරු කරමින් ද, පැනනැඟී තිබුණු ප්‍රශ්නය අවසාන විසඳුමකට ගෙන එන්ට කොහෙත් ම බැරි කරමින් ද, තම බලසේනාවන් එකට එක් කරන්ට ඉඩ තිබුණි.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

(6) සතුරාගේ ප්‍රධාන බලසේනාව තැනූ, චාං හුයි–ත්සාන් සහ තාන් තාඕ–යුආන් යටතේ සිටි ඩිවිසන් දෙක මේ "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාරයේ ප්‍රධාන අණදෙන්නා වූ ද චියාංසි පළාතේ ආණ්ඩුකාරයා වූ ද ලු ති–පිංට අයත් හටකණ්ඩායම් විය; චාං හුයි–ත්සාන් ක්ෂේත්‍ර අණදෙන්නා විය. මේ ඩිවිසන් දෙක මුල්පිස දැමීම යුද්ධව්‍යාපාරය සිඳ බිඳ දැමූ තරම් වෙනවා ඇත. එක් ඩිවිසනයකට මිනිස්සු දහහතර දහසක් පමණ සිටියහ, චාංගේ ඩිවිසනය දෙ තැනක් අතර බෙදනු ලැබ සිටියේ ය; එහෙයින් අප වරකට එක් ඩිවිසනයකට පහර දුනි නම් ඒකාන්ත වැඩි–බලය අපට තිබෙනවා ඇත.

(7) චාං සහ තාන් ඩිවිසන් වල ප්‍රධාන බලසේනාවන් නවත්වා සිටි ලුංකාං–යුආන්තෞ කොටස අපේ සේනාවන් ඒකරාශි වී සිටි තැන් වලට කිට්ටු විය, අප ළඟා වන බව හෙළි විය නො දෙන්නට හොඳ මහජන අනුබලයක් එහි විය.

(8) ලුංකාංහි භූමිභාගය යහපත් විය. යුආන්තෞ පහර දෙන්නට පහසු නො වී ය. එහෙත් සතුරා අපට පහර දෙන්නට ශියාඕපු කරා ඉදිරියට ගමන් කළොත්, එහි ද අපට යහපත් භූමිභාගයක් ලැබෙනවා ඇත.

(9) ලුංකාං කොටසෙහි හටයන් විශාල ම ගණන රැස් කරන්ට අපට පුළුවන්කම තිබුණි. ලුංකාංහි සිට නිරිත දිගට ලි සියයකට අඩු දුරින් පිහිටි ශිංකුඕහි, සතුරාගේ පසුමුණෙහි උපායශීලී ව ක්‍රියා කළ හැකි ව සිටි මිනිසුන් දහසකට වැඩි ගණනකින් යුත් ස්වාධීන ඩිවිසනයක් අපට සිටියේ ය.

(10) අපේ හටකණ්ඩායම් සතුරාගේ පෙරමුණ මැදින් කඩා බිඳගෙන යමින් එය විවර කළේ නම්, නැගෙනහිරට සහ බටහිරට සිටි ඔහුගේ කොලම් පුළුල් ලෙස වෙන් කරනු ලැබූ කණ්ඩායම් දෙකකට කපනු ලබනවා ඇත.

යථෝක්ත හේතු මුල් කරගෙන, අපි අපේ පළමුවැනි සටන චාං හුයි–ත්සාන්ගේ ප්‍රධාන බලසේනාවට විරුද්ධ ව විය යුතු ය'යි තීරණය කළෙමු; අපි ඔහුගේ බ්‍රිගේඩ අතුරෙන් දෙකකට සහ ඔහුගේ ඩිවිසන් මූලස්ථානයට සාර්ථක ලෙස පහර දී, එක ම එක මිනිසකුට වත් අශ්වයකුට වත් ගැලවී යන්ට ඉඩ නො දෙමින්, මිනිසුන් නව දහසකින් සමන්විත මුළු බලසේනාව ම මුලසුන් කළෙමු, ඩිවිසන් අණදෙන්නා ද අල්ලා ගතිමු. මේ එක් ජයග්‍රහණය තාන්ගේ ඩිවිසනය තුංශාඕ දෙසට පළා යන ලෙස ත් ශූගේ ඩිවිසනය තෞපි දෙසට පළා යන ලෙස ත් බිය පත් කළේ ය. අපේ හටකණ්ඩායම් එවිට තාන්ගේ ඩිවිසනය ලුහුබැඳ ගොස්, ඉන් අඩක් මුල්පිස දැමී ය. අපි (1930 දෙසැම්බර් 27වැනි දින සිට 1931 ජනවාරි 1වැනි දින තෙක්) පස් දවසක් තුළ සටන් දෙකක් කළෙමු; පූතියන්, තුංකු සහ තෞපි යන ස්ථානයන්හි සිටි සතුරු බලසේනාවෝ, පරදිති'යි බිය වෙමින්, අපිළිවෙලින් පසුබැස්සාහ. "වටලෑමේ සහ මැඩලීමේ" පළමුවැනි යුද්ධව්‍යාපාරය මෙසේ අවසන් විය.

දෙවැනි යුද්ධව්‍යාපාරයේදී තත්වය මෙසේ විය:

(1) ගණනින් 200,000ක් වූ "මැඩලීමේ" බලසේනාවන් සිටියේ නාන්චාං නුවර මූලස්ථානය ඇති ව හෝ යිං–චින්ගේ විධානය යටතේ ය.

(2) පළමුවැනි යුද්ධව්‍යාපාරයේදී මෙන් ම, බලසේනා අතුරෙන් කිසිවක් චියාං කායි–ශෙක්ගේ ම හටකණ්ඩායම් නො වී ය. ඒවා අතර ත්සායි තිං–කායි යටතේ සිටි 19වැනි මාර්ග හමුදුව ත්, සුන් ලියන්–චුං යටතේ සිටි 26 වැන්න ත්, චූ ශාඕ–ලියාං යටතේ සිටි 8 වැන්න ත් බලවත් හෝ සෑහෙන තරම් බලවත් වූ අතර සෙසු සියල්ල තරමක් දුබල විය.

(3) බෝ–චි කණ්ඩායම තුරන් කර දමා තිබිණි, කඳවුරු ප්‍රදේශයෙහි මුළු ජනගහණය ම රතු හමුදුවට අනුබල දුනි.

(4) උතුරේ සිට අළුත අවුත් සිටි වෝං චින්–යූ යටතේ වූ 5වැනි මාර්ග හමුදුව අප කෙරෙහි බියෙන් පසු විය; සාමාන්‍යයෙන් කියන කල, එහි වම් අංශයෙහි කුඕ හුආ–ත්සුං සහ හාඕ මෙං–ලිං යටතේ වූ ඩිවිසන් දෙක ද එසේ ම විය.

(5) අපේ හටකණ්ඩායම් පළමු කොට පූතියන් වලට පහර දී, ඉක්බිති නැගෙනහිරට පිසගෙන හරහා ගියේ නම්, කඳවුරු ප්‍රදේශය පූචියන්–චියාංසි දේශසීමාවෙහි චියන්නිං–ලිචුආන්–තායිනිං කොටස තෙක් පළල් කරන්ට ත්, ඊළඟ "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාරය සිඳ බිඳ දැමීමට ආධාර කරනු පිණිස සැපයිය යුතු දේ අත් කර ගන්ට ත් අපට හැකි වෙන්ට තිබුණි. එහෙත් අපි බටහිර දෙසට ඇනගෙන ගියෙමු නම්, අප කාන් ගඟ අපට හරස් ව සිටින තැන කරා පැමිණීමෙන්, සටනින් පසු පළල් වීමට ඉඩක් අපට නො ලැබෙන්ට ඉඩ තිබුණි. සටනින් පසු නැවත නැගෙනහිරට හැරීමෙන් අපේ හටකණ්ඩායම් වෙහෙසට පත් වෙන්ට ත් කාලය නාස්ති වෙන්ට ත් ඉඩ තිබුණි.

(6) (ගණනින් මිනිසුන් 30,000ට වැඩි වූ) අපේ හමුදුව පළමුවැනි යුද්ධව්‍යාපාරයේදීට වඩා තරමක් කුඩා වුව ද, ප්‍රකෘතිමත් වීම ත් ක්‍රියාශක්තිය ගොඩනඟා ගැනීම ත් පිණිස ඊට සිව් මසක් කල් ලැබී තිබිණි.

මේ හේතු මුල් කරගෙන, අපේ පළමුවැනි සටන වශයෙන්, පූතියන් කෞටසෙහි (මුළු ගණනින් රෙජමේන්තු 11ක් වූ) වෝං චින්–යූගේ ත් කුං පිං–පාන්ගේ ත් බලසේනාවන් හා සටන් වැදීමට අපි තීරණය කළෙමු. මේ සටන දිනූ ඉක්බිති, අපි එකකුට පසු එකකු වශයෙන් කුඕ හුආ–ත්සුං, සුන් ලියන්–චුං, චූ ශාඕ–ලියාං සහ ලියු හෝ–තිං යන මොවුන්ට පහර දුනිමු.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

(1931 මැයි 16 සිට මැයි 30 තෙක්) පසළොස් දිනක් තුළ අපි ලි හත් සියයක් ගමන් කළෙමු, සටන් පහක් කළෙමු, විසි දහසකට වඩා රයිපල් අල්ලාගතිමු, සතුරාගේ ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය හොඳට ම සිඳ බිඳ දැමීමු. වොං චින්-යූ හා සටන් කරන විට, අප සිටියේ ත්සායි තිං-කායි සහ කුඕ හුආ-ත්සුං යටතේ වූ සතුරු බලසේනා දෙකට මැදි වී, පසුව කී එකෙන් ලි දහයක් තරම් ද, මුලින් කී එකෙන් ලි හතළිහක් තරම් ද ඈත ය; ''අප පිටවෙන තැනක් නැති පටු මගකට වැටීගෙන යනවා''ය'යි සමහර අය කී නමුත්, අපි කොහොම හරි එගොඩ වුනෙමු. මෙය ප්‍රධාන වශයෙන් කඳවුරු ප්‍රදේශයෙහි අපට ලැබුණු මහජන අනුබලය ත් සතුරු සේනාංග අතර උචිත සම්බන්ධය නො තිබීම ත් හේතු කොට ගෙන විය. කුඕ හුආ-ත්සුංගේ ඩිවිසනය පරාජය කරනු ලැබූ පසු, හාඕ මෙං-ලිංගේ ඩිවිසනය රෑ ම යුංපෙං වලට ආපසු පළා ගොස්, එසේ විනාශයෙන් ගැලවී ගත්තේ ය.

තුන්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයේදී තත්වය මෙසේ විය:

(1) චියාං කායි-ශෙක් පුද්ගලික ව ම ප්‍රධාන අණදෙන්නා වශයෙන් පිටියට බැස්සේ ය. ඔහු යටතේ එකකු — වම, දකුණ සහ මැද ය'යි — එක් කොලමක් බැගින් භාර ව සිටි උප අණදෙන්නෝ තිදෙනෙක් වූහ. මැද කොලම, චියාං කායි-ශෙක් මෙන් ම නාන්චාං නුවර තම මූලස්ථානය ඇති ව සිටි හෝ යිං-චින් විසින් අණ දෙනු ලැබී ය; දකුණු කොලම කියාන් නුවර මූලස්ථානය ඇති ව සිටි චෙන් මිං-ශූ විසින් ද, වම් කොලම නාන්පෙං නුවර මූලස්ථානය ඇති ව සිටි වූ ශාඕ-ලියාං විසින් ද අණ දෙනු ලැබී ය.

(2) ''මැඩලීමේ'' බලසේනාවෝ ගණනින් 3,00,000ක් වූහ: මූළු ගණනින් මිනිසුන් 1,00,000ක් පමණ වූ ප්‍රධාන බලසේනාවෝ චියාං කායි-ශෙක්ගේ ම හටකණ්ඩායම් වූහ; පිළිවෙලින් චෙන් චෙං, ලෝ චෝ-යිං, චාඕ කුආන්-තාඕ, වෙයි ලි-හුආං සහ චියාං තිං-වන් විසින් අණ දෙනලද (එකක රෙජමේන්තු 9 ක් බැගින් සිටි) ඩිවිසන් 5කින් සමන්විත වූහ. මේ හැර, චියාං කුආං-නායි, ත්සායි තිං-කායි සහ හාන් තේ-චින් යටතේ (මුළු ගණනින් මිනිසුන් 40,000ක් වූ) ඩිවිසන් 3ක් විය. ඊළඟට සුන් ලියන්-චුංගේ 20,000ක හමුදව විය. මීට අමතර ව, එසේ ම චියාංගේ ම හටකණ්ඩායම් නො වූ, ඊට වඩා දුර්වල වෙන බලසේනාවෝ ත් සිටියහ.

(3) මේ ''මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයේදී සතුරාගේ උපායමාර්ගය වූයේ ''කෙළින් ම ඇතුළට කාගෙන යාම'' ය; එය ඔහු දෙවැනි යුද්ධ-ව්‍යාපාරයේදී යෙදූ ''හැම පියවරකදී ම තහවුරු කිරීමේ'' උපායමාර්ගයට බෙහෙවින් ම වෙනස් විය. අරමුණ වූයේ රතු හමුදව කාන් ගඟට හරස් කොට පස්සට තෙරපාගෙන ගොස්, එහිදී එය මුලසුන් කර දැමීම ය.

(4) දෙවැනි සතුරු යුද්ධව්‍යාපාරයේ අවසානය ත් තුන්වැන්නේ ආරම්භය ත් අතර වූයේ එක් මසක විවේකකාලයක් පමණකි. සතුරා ක්ෂිප්‍ර දිසාවකින් තදින් ම තෙරපන්නට පටන් ගන්නා විට, (එවේලාවේ 30,000කින් පමණ ප්‍රබල වූ) රතු හමුදවට දුෂ්කර සටන් රැසක් කිරීමෙන් පසු කිසි ම විවේකයක් ලැබී තිබුණේ වත් අඩුපාඩු දේ නැවත සපයා තිබුණේ වත් නැත; එය දකුණු චියාංසි කඳවුරු ප්‍රදේශයේ බටහිරි කොටසෙහි ශිංකුඕහි ඒකරාශි වීම පිණිස ලි දහසක වට පාරකින් පැමිණියා පමණකි.

මේ තත්වය තුළ අප පළමුවෙන් තීරණය කළ සැලැස්ම වූයේ වානාන් පාරෙන් ශිංකුඕ වලින් ඉවත් වී ගොස්, පූතියන්හිදී කඩාබිඳගෙන පැන යාමක් කොට, ඉක්බිති සතුරාගේ පසුමුණු ගමනාගමන මාර්ග හරහා බටහිරේ සිට නැගෙනහිරට පිසගෙන යාම ත්, එසේ දකුණු චියාංසි පළාතේ අපේ කඳවුරු ප්‍රදේශය තුළට ගැඹුරු නමුත් පලක් නැති කාවැදීමක් කරන්නට සතුරාගේ ප්‍රධාන බලසේනාවන්ට ඉඩ දීම ත් ය; අපේ සටන්ව්‍යාපාරයේ මුල් අවධිය විය යුතු වූයේ මෙය යි. ඊළඟට සතුරා නො වැළැකිය හැකි ලෙස ම ඉතා විඩා පත් වී, උතුරු දෙසට ආපසු හැරුණු කල, අප ඔහුගේ පහර දිය හැකි සේනාංග වලට පහර දෙනු පිණිස ඒ ඉඩප්‍රස්තාව ඩැහැගත යුතු විය; අපේ සටන්ව්‍යාපාරයේ දෙවැනි අවධිය විය යුතු වූයේ එය යි. මේ සැලැස්මේ හදවත වූයේ සතුරාගේ ප්‍රධාන බලසේනාවන් ගෙන් මග ඇරීම සහ ඔහුගේ දුබල තැන් වලට පහර දීම ය. එහෙත් අපේ බලසේනාවන් පූතියන් බලා ඉදිරියට ගමන් කරන අතර, සතුරා විසින් අප දක්නාලදින්, ඔහු චෙන් චෙං සහ ලෝ චෝ-යිං යටතේ වූ ඩිවිසන් දෙක යුහුව එහි එවී ය. අපේ සැලැස්ම වෙනස් කොට ශිංකුඕ උප-පළාතේ බටහිරි කොටසේ කාඕශිංශූ වෙත ආපසු යන්ට අපට සිදු විය; එවිට වර්ග ලි සියයකට ද අඩු අවට හරිය ත් සමග එය අපේ හටකණ්ඩායම් වලට ඒකරාශි වීමට තිබුණු එක ම තැන විය. ඒකරාශි වූ දිනට පසු දින අපි නැගෙනහිරි ශිංකුඕ උප-පළාතේ ලියන්තාං, දකුණු යුංපෙං උප-පළාතේ ලියාංත්සුන් සහ උතුරු නිංතු උප-පළාතේ හුආංපි දෙසට නැගෙනහිර අතට ඇනගෙන යන්ට තීරණය කළෙමු. එද රෑ ම, අඳුරෙන් ආවරණය ලැබ, අපි චියාං තිං-වන්ගේ ඩිවිසනය ත් චියාං කුආං-නායි, ත්සායි තිං-කායි සහ හාන් තේ-චින් යන මොවුන්ගේ බලසේනා ත් අතර වූ ලි-හතළිහේ කපොල්ල තුළින් ගොස්, ලියන්තාං දෙසට හැරුණෙමු. දෙවැනි දිනයෙහි, අපි (තමාගේ ඩිවිසනයට මෙන් ම හාඕ මෙං-ලිංගේ ඩිවිසනයට අණ දීම බාර ව සිටි) ශාංකුආන් යුන්-ශියාං යටතේ වූ පෙරමුණු සේනාංග සමග පොඩි පොඩි සටන් කළෙමු. පළමුවැනි සටන තුන්වැනි දිනයෙහි ශාංකුආන් යුන්-ශියාංගේ ඩිවිසනය සමග ද, දෙවැනි සටන සිව්වැනි දිනයෙහි හාඕ මෙං-ලිංගේ ඩිවිසනය සමග ද කරනලදී; තුන් දිනක ගමනකින් පසු හුආංපි වෙත ළඟා වූ අපි අපේ තුන්වැනි සටන මාඕ පිං-වන්ගේ ඩිවිසනයට

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

විරුද්ධ ව කළෙමු. අපි මේ සටන් තුන ම ජයගෙන, රයිපල් දස දහසකට වඩා අල්ලාගතිමු. මෙතැනදී බටහිර දෙස සහ දකුණු දෙස බලා ඉදිරියට යමින් සිටි සියලු ප්‍රධාන සතුරු බලසේනාවෝ නැගෙනහිර දෙසට හැරුණෝ ය. හුආංපි එල්ලය කරගෙන, ඔව්හු එහිදී එකට මුණගැසී සටන් වදින අටියෙන් දරුණු වේගයකින් එන්නට වූවෝ ඒකසණ මහා වළල්ලකින් අප වටලා පැති කීපයකින් අප කරා ළඟා වෙන්ට වූහ. අපි එක් අතකින් චියාං කුආං–නායි, ත්සායි තිං–කායි සහ හාන් තේ–චින් යන මොවුන්ගේ ද, අනික් අතින් චෙන් චෙංගේ සහ ලෝ චෝ–යිංගේ ද බලසේනාවන් අතර වූ ලී–චිස්සේ කපොල්ල තුළ පිහිටි උස් කඳු අතුරෙහි ලිස්සා ගොස්, එසේ, නැගෙනහිරින් බටහිරට ආපසු පැමිණ, ශිංකුඕ උප–පළාතේ දේශසීමාවන් ඇතුළත නැවත රැස් වීමු. සතුරා මේ කාරණය සොයා දැනගෙන යළිත් බටහිරට ඉදිරියට ගමන් කරන්ට පටන් ගත් කාලය වන විට, අපේ බලසේනාවන්ට දෙ සතියක විවේකයක් ලැබී ඉවර ය; එසේ වී නමුත් කුසගින්නෙන් පෙළෙමින්, හෙම්බත් වී සහ චිත්තශක්තියෙන් පිරිහී සිටි සතුරු බලසේනාවෝ සටන් කිරීමට නුසුදුසු වූවෝ පසුබැසීමට තීරණය කළෝ ය. ඔවුන්ගේ පසුබැසීම වාසියක් කරගනිමින්, අපි චියාං කුආං–නායිගේ, ත්සායි තිං–කායිගේ, චියාං තිං–වන්ගේ සහ හාන් තේ–චින්ගේ බලසේනාවන්ට පහර දී, චියාං තිං–වන්ගේ එක් බ්‍රිගේඩයක් ද හාන් තේ–චින්ගේ මුළු ඩිවිසනය ද මුල්පිස දැමීමු. චියාං කුආං–නායි සහ ත්සායි තිං–කායි යටතේ සිටි ඩිවිසන් සම්බන්ධයෙන්, සටනේ ප්‍රතිඵලය ඇණහිටීමක් වූයෙන්, ඔව්හු පැන ගියහ.

සිව්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයේදී තත්වය මෙසේ විය. සතුරා කොලම් තුනකින් කුආංචාං කරා ඉදිරියට එමින් සිටියේ ය; නැගෙනහිරි කොලම ඔහුගේ ප්‍රධාන බලසේනාව වූ අතර, ඔහුගේ බටහිරි කොලම සකස් කළ ඩිවිසන් දෙක අපට විවෘත ව තිබුණි, අපේ බලසේනාවන් ඒකරාශි වී සිටි ප්‍රදේශයට ඉතා කිට්ටු ද විය. මෙසේ පළමුකොට දකුණු යිහුආං උප–පළාතේදී ඔහුගේ බටහිරි කොලමට පහර දීමේ ඉඩප්‍රස්තාව අපට ලැබුණි; එක පහරින් ම අපි ලි මිං සහ චෙන් ශි–චී යටතේ වූ ඩිවිසන් දෙක මුලසුන් කළෙමු. සතුරා එවිට ඔහුගේ මැද කොලමට අනුබල දෙනු පිණිස නැගෙනහිරි කොලමෙන් ඩිවිසන් දෙකක් එවා, තව දුරට ත් ඉදිරියට ගමන් කළෙන්, දකුණු යිහුආං උප–පළාතේදී ඩිවිසනයක් මුල්පිස දමන්ට අපට යළිත් හැකි විය. මේ සටන් දෙකේදී අපි රයිපල් දස දහසකට වඩා අල්ලාගතිමු; මේ ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය, මුඛ්‍ය වශයෙන්, සිඳ බිඳ දැමීමු.

තම පස්වැනි යුද්ධව්‍යාපාරයේදී සතුරා යුදමුරගෙවල් තැනීමේ තම අළුත් උපායමාර්ගයේ අනුසාරයෙන් ඉදිරියට ගමන් කොට, පළමුකොට ලිචුආන් අල්ලා ගති. එහෙත්, ලිචුආන් ආපසු ලබාගැනීමට ත් කඳවුරු ප්‍රදේශයෙන් පිටතදී සතුරා හා සටන් වැදීමට ත් උත්සාහ කිරීමේදී, අපි

ලිචුආන් වලට උතුරෙන් සතුරු බලස්ථානයක් වූ ද, එමතු නො ව, සුදු ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ශියාඕශි වලදී පහරක් දුනිමු. ඒ සටන ජය ගන්ට අසමත් ව, අපි, ශියාඕශි වලට ගිනිකොන් දෙසින් සුදු ප්‍රදේශය තුළ පිහිටි සතුරු බලස්ථානයක් ම වූ ත්සේශිචියාඕ වෙත අපේ ප්‍රහරණය මාරු කළෙමු; යළි ත් අපි පැරදුනිමු. ඉක්බිති, සටන් වදින්ට සොයමින් අපි සතුරාගේ ප්‍රධාන බලසේනාවන් සහ ඔහුගේ යුදමුරගෙවල් අතර වටේට කැරකෙන්නට වී, සම්පූර්ණ අක්‍රියාකාරි තත්වයකට පත් කරනු ලැබීමු. පුරා අවුරුද්දක් ම පැවති, ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ව කළ අපගේ පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය මුළුල්ලෙහි ම, අපි මුලපිරුමක් හෝ කාගෙන යන ගුණයක් පොඩ්ඩක් වත් නො පෙන්වීමු. අන්තිමේදී අපේ චියාංසි කඳවුරු ප්‍රදේශයෙන් ඉවත් වී යන්ට අපට සිදු විය.

සතුරාගේ විශාල වූ ත් බලවත් වූ ත් ''මැඩලීමේ'' බලසේනාවක් සිඳ බිඳ දැමීමට නම්, පෙරළා–පහරදීමේදී කරන පළමුවැනි සටන ආරක්ෂාවීමෙහි යෙදී සිටින රතු හමුදවට ඉතා ම වැදගත් බව ''වටලෑම සහ මැඩලීම'' ට විරුද්ධ ව කළ මේ ප්‍රති–යුද්ධව්‍යාපාර පහේදී අපේ හමුදව ලැබූ අත්දැකීමෙන් ඔප්පු වේ. පළමුවැනි සටනේදී ලැබෙන ජය හෝ පරාජය, දිගට ම අන්තිම සටන්–වැදීම දක්වා ම, මුළු තත්වය කෙරෙහි ඉමහත් ලෙස බලපායි. එහෙයින් අපි මතු දක්වන නිගමන වලට එළඹෙමු.

පළමුකොට, පළමුවැනි සටන දිනිය යුතු ම ය. අප පහර ගැසිය යුත්තේ සතුරාගේ තත්වය, භූමිභාගය සහ මහජන අනුබලය යන සියල්ල ම ඔහුට නො ව අපට හිතකර ව පවතින විට ත් දිනිය හැකි බව අපට නිශ්චය වශයෙන් ම සහතික විට ත් පමණකි. නො එසේ නම් අප පසුබා අපේ වේලාව එන තුරු පරෙස්සමින් බලා සිටීම වඩා හොඳ ය. සෑම විට ම ඉඩප්‍රස්තා ඇති වෙනවා ඇත; අප කලබලයෙන් සටනට මූණ පෑ යුතු නැත. අපේ ප්‍රථම ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී අප මුලින් ම සැලැස්ම කළේ තාන් තාඕ–යුආන්ගේ හටකණ්ඩායම් වලට පහර ගැසීමට ය; අප දෙ වතාවක් ම ඉදිරියට ගිය නමුත්, ඔවුන් යුආන්තෞ කඳු මුදුන් වල ඔවුන් සිටි හැම අතින් ම බලවත් ස්ථානයෙන් හෙලවුණේ වත් නැති නිසා, ඒ හැම වතාවේ ම අප ම මෙල්ල වී පස්ස ගහන්ට අපට සිදු විය. දින කීපයකට පසු අපි අපේ පහරින් ඊට වඩා බිඳ වැටෙන සුලු වූ චාං හුයි–ත්සාන්ගේ හටකණ්ඩායම් තෝරා ගතිමු. අපේ දෙවැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී අපේ හමුදව තුංකු කරා ඉදිරියට ගමන් කළේ ය; අපි, එහි, චෝං චින්–යූගේ මිනිසුන් පූතියන්හි ඔවුන්ගේ බලස්ථානය හැර එන තුරු බලා සිටීමේ එක ම කාරිය සඳහා, තොරතුරු හොරෙන් පිටවීමේ අවදානම පවා තිබුණේ වී නමුත්, දින විසිපහක් ම සතුරාට නුදුරු ව කඳවිටි ගසාගෙන සිටියෙමු; යුහු ව පහර දීමට කළ සියලු නොඉවසිලිමත් යෝජනා ප්‍රතික්ෂේප කළ අපි අන්තිමේදී අපේ අරමුණ මුදුන්පත් කරගතිමු. අපේ තුන්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී, අප අවට හැම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පැත්තෙන් ම කුණාටුව හමන්ට වී තිබුණේ වී නමුත්, එසේ ම අපි ලි දහසක් දිග වට ගමනක් ඇවිත් සිටි නමුත්, සතුරාගේ එක් අංශයකින් ගොස් ඒ අංශයෙන් ඔහු වට කිරීමේ අපේ සැලැස්ම ඔහුට අනාවරණය වූ නමුත්, අපි එසේ ද වුව ඉවසිල්ලෙන් වැඩ කරමින්, ආපසු හැරී, අපේ උපක්‍රමය මැදින් කඩාබිඳගෙන එළියට පැනගැනීමකට වෙනස් කොට, අන්තිමේදී පළමුවැනි සටන ලියන්තාංහිදී සාර්ථක ලෙස කළෙමු. අපේ සිව්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී, නාන්පෙං වලට දුන් අපේ පහර ව්‍යර්ථ වූ පසු, අපි කිසි ම පැකිළීමක් නැති ව ඉවත් වී ගොස්, සතුරාගේ දකුණු අංශයට කරකැවී, තුංශාඕ ප්‍රදේශයෙහි අපේ බලසේනාවන් නැවත රැස් කරගතිමු; එතැනදී අපි දකුණු ඩිහුආං උප–පළාතේදී අපේ ශ්‍රෙෂ්ඨ ජයග්‍රාහී සටන දියත් කළෙමු. පළමුවැනි සටනේ වැදගත්කම කොහෙත් ම නො පිළිගන්නාලද්දේ පස්වැනි ප්‍රති–යුද්ධ ව්‍යාපාරයේදී පමණකි. ලිවුආන් යන තනි උප–පළාත් නගරය නැති වීමෙන් සන්ත්‍රාසයට පත් වී, අපේ බලසේනාවෝ එය ආපසු ලබාගැනීමට ප්‍රයත්නයක් දරමින් සතුරා මුණගැසීමට උතුරට ගමන් කළහ. ඉක්බිති, (සතුරු ඩිවිසනයක් මුලසුන් කොට දැමීමෙන්) ජයග්‍රහණයකින් කෙළවර වූ, ශුන්කෞහි කළ බලාපොරොත්තු නුවූ සටන පළමුවැනි සටන ලෙස සැලකුවේ වත් නියතයෙන් ම ඇති වෙන්ට තිබුණු වෙනස්වීම් කල්තබා දුටුවේ වත් නැත; ඒ වෙනුවට කළේ සාර්ථක වන බවට කිසි ම සහතිකයක් නැති ව ශියාඕශි නුවරට කලබලයෙන් පහර දීම ය. මෙසේ තිබූ පළමුවැනි අඩියේදී ම මුලපිරුම නැති වී ගියේ ය; එය ඇත්තෙන් ම සටන් කරන්ට තිබෙන ඉතා ම නරක සහ ඉතා ම තකතිරු පිළිවෙල ය.

දෙවැනි ව, පළමුවැනි සටන පිණිස වන සැලැස්ම මුළු යුද්ධව්‍යාපාරය පිණිස වන සැලැස්මට ආමුඛය, ඒ සැලැස්මේ ආත්මීය කොටසක්, විය යුතු ය. මුළු යුද්ධව්‍යාපාරය පිණිස හොඳ සැලැස්මක් නැති ව ඇත්ත වශයෙන් ම හොඳ පළමුවැනි සටනක් කරන්ට කිසිසේත් ම බැරිය. ඒ කියන්නේ මෙය යි: පළමුවැනි සටනේදී ජය දිනාගත් නමුත්, ඒ සටන මුළු එකක් වශයෙන් යුද්ධව්‍යාපාරයට ආධාරයක් වෙනවාට වඩා හානියක් වේ නම්, එබඳු ජයග්‍රහණයක් සැලකිය යුත්තේ පරාජයක් ලෙස ය (පස්වැනි යුද්ධව්‍යාපාරයේදී ශුන්කෞහිදී කළ සටන පිළිබඳ අවස්ථාවේදී මෙනි). එහෙයින්, පළමුවැනි සටන කරන්ට පෙර අයෙක් දෙවැනි, තුන්වැනි, සිව්වැනි සහ අන්තිම සටන පවා කරන්නේ කෙසේ ද යන්න ගැන සාමාන්‍ය අදහසක් ඇති කරගත යුතු ය, අප ඊළඟ සටන් එක එකක් ම ජය ගත්තොත්, හෝ පැරදුණොත්, මුළු එකක් වශයෙන් සතුරාගේ තත්වයෙහි ඇති වන වෙනස්වීම් මොනවා දැ'යි කල්පනා කළ යුතු ය. ප්‍රතිඵලය හරියට ම අප අපේක්ෂා කරන පරිදි ම නො වන්නට ඉඩ තිබේ — ඇත්තෙන් ම, එය නිශ්චය වශයෙන් ම එසේ නො වෙනවා ඇත; එහෙත් අපි හැම දෙයක් ම දෙ පැත්තේ ම පවතින සාමාන්‍ය තත්වය අනුව මහත් සැලකිල්ලෙන් ද ඇත්තට ම තිබෙන

සැටියෙන් ගෙන ද සිතා බැලිය යුත්තෙමු. මුළු එකක් වශයෙන් තත්වය හොඳින් වටහාගන්නේ නැති ව, දම්ලැල්ලේ ඇත්තෙන් ම හොඳට ඉත්තන් ඇදීමක් කරන්ට කොහෙත් ම බැරි ය.

තුන්වැනි ව, යුද්ධයේ ඊළඟ උපායමාර්ගික අවස්ථාවේදී කුමක් සිදුවේ ද කියා ත් අයකු විසින් කල්පනා කළ යුතු ය. උපායමාර්ගයට මග පෙන්වන කවරෙක් වේවා, පෙරළා–පහරදීම ගැන පමණක් ම තම සිත කය යොමු කරන්නේ නම් ද, එය සාර්ථක වූ පසු, එසේ ත් නැත් නම් එය ව්‍යර්ථ වුව හොත්, ගත යුතු පියවර නො සලකා සිටින්නේ නම් ද, ඔහු තම යුතුකම ඉටු නො කරන්නේ ය. එක් නිශ්චිත උපායමාර්ගික අවස්ථාවකදී, ඊළඟට එන අවස්ථා, නැතහොත්, අඩු ම වශයෙන්, ඒ එක්ක ම එන අවස්ථාව වත්, ඔහු විසින් කල්පනාවට ගත යුතු ය. අනාගතයේදී විය හැකි වෙනස්වීම් කල්තබා දැක්ම උගහට වුව ද, අයකු වඩ වඩා ඈතට ඉදිරිය බලන පමණට ඒ ඒ දේ වඩ වඩා නො පැහැදිලි ව පෙනෙන නමුදු, සාමාන්‍ය වශයෙන් ගණන් බැලීමක් කළ හැකි ය, ඈත තිබෙන මතු බලාපොරොත්තු ගැන තක්සේරුවක් කිරීම අවශ්‍ය ය. දේශපාලනයේදී මෙන් ම යුද්ධයේදී ත්, අයකු යන ගමන් ම එක් වරකට එක් පියවරක් පමණක් සැලැස්ම කිරීම ඒ ඒ දේට මග පෙන්වන හානිකර පිළිවෙලක් වේ. එක් එක් පියවරට පසු, ඇත්ත වශයෙන් ම ඇති වන වෙනස්වීම් පරීක්ෂා කොට බලා, අයකුගේ උපායමාර්ගික සහ සටන්-ව්‍යාපාරික සැලැස්ම ඒ අනුව වෙනස් කිරීම හෝ දියුණු කිරීම අවශ්‍ය ය; නො එසේ නම් අයකු අනතුර ගැන නො තකමින් කෙළින් ම ඉදිරියට දුවයාමේ වරද කරන්ට ඉඩ ඇත. ඒ එසේ වුව ද, එහි සාමාන්‍ය කටුසටහනින් ගෙන සිතාමතා බලන ලද්ද වූ ද, මුළු උපායමාර්ගික අවස්ථාවක්, නැතහොත් උපායමාර්ගික අවස්ථා කීපයක් පවා, ඇතුළත් කරගන්නා වූ ද දිගු–කල් සැලැස්මක් තිබීම ඒකාන්තයෙන් ම අත්‍යවශ්‍ය ය. එබඳු සැලැස්මක් සකස් කරන්ට බැරි වීම නිසා සැකයෙන් පැකිළෙන්ට වීමේ ත් තමාගේ අතපය බඳින්ට ඉඩ දීමේ ත් වරද කරා මග පෑදෙනවා ඇත; එයින් ඇත්ත වශයෙන් හොඳක් සිදු වන්නේ සතුරාගේ උපායමාර්ගික අරමුණු වලට ය; එසේ ම එය අයකු අක්‍රියාකාරි තත්වයකට පත් කරයි. සතුරාගේ ඉහළ ම අණ දෙන මණ්ඩලය උපායමාර්ගික තියුණු බුද්ධියෙන් තොර නො වන බව සිත තබා ගත යුතු ය. අප සතුරාට වඩා ටිකක් ඉහළින් සිටින්ට අප පුහුණු කර ගත් කල පමණකි උපායමාර්ගික ජයග්‍රහණ ලබා ගත හැකි වන්නේ. එසේ කිරීමට අසමත් වීම ය සතුරාගේ පස්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය පැවති කාලයේ ''වාම'' අවස්ථාවාදී ක්‍රියාමාර්ගය යටතේ ද, වාං කුඕ–තාඕ ක්‍රියාමාර්ගය යටතේ ද උපායමාර්ගික මගපෙන්වීමේදී කළ වැරදි වලට ප්‍රධාන හේතුව වූයේ. කොටින්, පසුබැසීමේ අවස්ථාවේදී අපි පෙරළා–පහරදීමේ අවස්ථාව දෙස ඉදිරිය බැලිය යුත්තෙමු, පෙරළා–පහරදීමේ අවස්ථාවේදී අපි පහරදීමේ අවස්ථාව දෙස ඉදිරිය බැලිය යුත්තෙමු, පහරදීමේ අවස්ථාවේදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අපි යළි ත් පසුබැසීමේ අවස්ථාවක් දෙස ඉදිරිය බැලිය යුත්තෙමු. එසේ නො කොට ඒ මොහොතේ කල්පනාවට ගත යුතු දේට පමණක් අප සීමා කරගැනීම පරාජය කැඳවීම වේ.

පළමුවැනි සටන දිනිය යුතු ම ය. මුළු යුද්ධව්‍යාපාරය සඳහා සැලැස්ම ගණනට ගත යුතු ම ය. ඊළඟට එන උපායමාර්ගික අවස්ථාව ද ගණනට ගත යුතු ම ය. අප පෙරළා–පහරදීමක් අරඹන විට, එනම්, අප පළමුවැනි සටන කරන විට, අප විසින් කිසි විටෙක අමතක නො කළ යුතු මූලධර්ම තුන මේවා ය.

6. හටකණ්ඩායම් ඒකරාශි කිරීම

හටකණ්ඩායම් ඒකරාශි කිරීම පහසු දෙයක් සේ පෙනෙන නමුත්, භාවිතාවේදී ඉතා අමාරු ය. ඉතා ම හොඳ පිළිවෙල කුඩා බලසේනාවක් පරාජය කිරීමට ලොකු බලසේනාවක් යෙදීම බව කවුරු ත් දනිති; එසේ ද වුව, බොහෝ අය එසේ කරන්ට අසමත් වෙති, එසේ කරනවා වෙනුවට බොහෝ විට තම බලසේනාවන් බෙදති. හේතුව නම් එබඳු යුද්ධ නායකයන්ට උපායමාර්ගය ගැන ඔළුවක් නො තිබීම සහ ඔවුන් ව්‍යාකූල වටාපිටා තත්වයන් නිසා ඔළුව අවුල් කර ගැනීම ය; එහෙයින්, ඔව්හු මේ වටාපිටා තත්වයන් ඉදිරියේ අසරණ වෙති, තමන්ගේ මූලපිරුම නැති කරගනිති, අක්‍රියාකාරි ලෙස ප්‍රතික්‍රියා කිරීම පිළිසරණ කොට ගනිති.

යුද්ධ නායකයකුට සියල්ලට ම වඩා උවමනා කරන දෙය නම්, වටාපිටා තත්වයන් කොතරම් ව්‍යාකූල, බරපතල සහ කටුක වුව ත්, තමාගේ විධානය යටතෙහි සිටින බලසේනාවන් සංවිධානය කිරීමෙහි සහ යෙදීමෙහි ලා ස්වාධීන ව ක්‍රියා කරන්ට හැකියාව යි. ඔහු බොහෝ විට සතුරා විසින් බලෙන් ම අක්‍රියාකාරි තත්වයකට පත් කරනු ලබන්ට ඉඩ තිබේ; එහෙත් වැදගත් දෙය නම් යුහුව මූලපිරුම නැවත ලබා ගැනීම ය. එසේ කරන්ට අසමත් වීමේ විපාකය වන්නේ පරාජය යි.

මූලපිරුම මනඃකල්පිත දෙයක් නො වේ, වාස්තුවික සහ ද්‍රව්‍යමය වේ. මෙහි ලා ඉතා ම වැදගත් දෙය නම් හැකි තරම් විශාල වූ ද සටන්කාමී ජීවගුණයෙන් පිරුණා වූ ද සන්නද්ධ සේනාවක් රැක ගැනීම සහ රැස් කිරීම ය.

මූලපිරුම සම්පූර්ණයෙන් ක්‍රියාවේ යෙදීමට පහරදීමේ සංග්‍රාමයේදීට වඩා බොහෝ අඩුවෙන් ඉඩකඩ ලැබෙන ආරක්ෂාවීමේ සංග්‍රාමයේදී අක්‍රියාකාරි තත්වයකට වැටීම පහසු ය. කෙසේ වෙතත්, ආකාරයෙන් අක්‍රියාකාරි වූ ආරක්ෂාවීමේ සංග්‍රාමය අඩංගු–දෙයින් ක්‍රියාකාරි විය හැකි ය, ආකාරයෙන්

අක්‍රියාකාරි ව පවතින අවස්ථාවෙන් ආකාරය ත් අඩංගු–දෙය ත් යන දෙකෙන් ම ක්‍රියාකාරි වන අවස්ථාවට හැරවිය හැකි ය. පෙනෙන හැටියට නම් සම්පූර්ණයෙන් ම සැලැස්ම කළ උපායමාර්ගික පසුබැසීමක් කරනු ලබන්නේ බලකිරීම යටතේ ය; එහෙත් ඇත්ත වශයෙන් එය කරන්නේ සතුරා පරාජය කරනු පිණිස අපේ ශක්තිය රැකගෙන අපේ වේලාව එන තුරු ඉවසිල්ලෙන් බලා සිටීම පිණිස ය, සතුරා ඇතුළට ම එන්නට පොළඹා, අපේ පෙරළා–පහරදීම සඳහා සූදානම් වීම පිණිස ය. අනික් අතට, (ශියාඕශි සටනේදී මෙන්) පසුබැසීම ප්‍රතික්ෂේප කිරීම ත් කඩිමුඩියේ සටන් වැදීමට ඉදිරිපත් වීම ත් මූලපිරුම ලබාගන්ට දරන බැරෑරුම් පරිශ්‍රමයක් සේ පෙනෙන්ට පුළුවන් නමුත්, ඇත්ත වශයෙන් එය අක්‍රියාකාරි ය. උපායමාර්ගික පෙරළා–පහරදීමක් අඩංගු–දෙයින් පමණක් නො ව ආකාරයෙන් ද ක්‍රියාකාරි ය, එය පසුබැසීමේ වකවානුවේ අක්‍රියාකාරි ලීලාව ඉවත දමයි. සතුරා සම්බන්ධයෙන්, අපේ පෙරළා–පහරදීම ඔහු ඔහුගේ මූලපිරුම අත් හැර දැමීමට සලසන්නට ත් ඔහු අක්‍රියාකාරි තත්වයකට පත් කරන්නට ත් අප දරන පරිශ්‍රමය නියෝජනය කරයි.

හටකණ්ඩායම් ඒකරාශි කිරීම, ජංගම සංග්‍රාමය, ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ යුද්ධය සහ මුලසුන් කිරීමේ යුද්ධය යන මේ සියල්ල මේ අරමුණ සපුරා මුදුන්පත් කරලීම පිණිස අවශ්‍ය කරුණු වේ. මේවා අතුරෙන්, හටකණ්ඩායම් ඒකරාශි කිරීම පළමුවැන්න ත් ඉතා ම අවශ්‍ය එක ත් වේ.

සතුරා ත් අප ත් අතර පවතින තත්වය අනික් අතට හැරවීමේ කාරිය පිණිස මේ ඒකරාශි කිරීම අවශ්‍ය වේ. පළමුකොට, ඊට අයත් කාරිය ඉදිරියට ගමන් කිරීම ත් පසුබැසීම ත් සම්බන්ධයෙන් පවතින තත්වය අනික් අතට හැරවීම ය. කලින් ඉදිරියට ගමන් කරමින් සිටියේ සතුරා ය, පසු-බසිමින් සිටියේ අපි ය; දැන් අප ඉදිරියට ගමන් කරන සහ ඔහු පසුබසින තත්වයක් අපි සොයමු. අප අපගේ හටකණ්ඩායම් ඒකරාශි කොට, සටනක් ජය ගත් කල, එවිට ඒ සටනේදී අපි යථොක්ත අභිප්‍රාය ඉටු කරගනිමු: මෙය මුළු යුද්ධව්‍යාපාරය කෙරෙහි බලපායි.

දෙවැනි ව, ඊට අයත් කාරිය ප්‍රහරණය සහ ආරක්ෂණය සම්බන්ධයෙන් පවතින තත්වය අනික් අතට හැරවීම ය. ආරක්ෂාවීමේ සංග්‍රාමයේදී කලින් නියම කරගත් පසුබැසීම අවසන් කරන ස්ථානය කරා පසුබැසීම මූලික වශයෙන් අක්‍රියාකාරි, හෝ ''ආරක්ෂණ'' අවස්ථාවට අයත් ය. පෙරළා–පහරදීම ක්‍රියාකාරි, හෝ ''ප්‍රහරණ'' අවස්ථාවට අයත් ය. උපායමාර්ගික ආරක්ෂාවීම පිළිබඳ අවස්ථාව මුළුල්ලේ ම පෙරළා–පහරදීමෙහි තිබෙන ආරක්ෂාවීමේ ලක්ෂණය නැති නො වන නමුදු, පසුබැසීම හා සම කරන කල එය ඒ වන විට ත් ආකාරයෙන් පමණක් නො ව අඩංගු–දෙයින් ද සිදු වී ඇති වෙනස්වීමක් නියෝජනය කරයි. පෙරළා–පහරදීම උපායමාර්ගික ආරක්ෂාවීම ත් උපාය-මාර්ගික පහරදීම ත් අතර සංක්‍රමණීය ය, උපායමාර්ගික පහරදීමට ආමුඛයක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වැනි ස්වභාවයෙන් යුක්ත ය; හටකණ්ඩායම් ඒකරාශි කරනු ලබන්නේ පෙරළා-පහරදීමේ කාරිය උදෙසා ම ය.

තුන්වැනි ව, ඊට අයත් කාරිය ඇතුල් සහ පිට සටන් පේළි සම්බන්ධයෙන් පවතින තත්වය අනික් අතට හැරවීම ය. උපායමාර්ගික වශයෙන් ඇතුල් සටන් පේළි වල ක්‍රියා කරන හමුදවකට බොහෝ අවාසි විදින්ට සිදු වේ; ''වටලෑම සහ මැඩලීම''ට අභිමුඛ ව සිටින හෙයින්, රතු හමුදව පිළිබඳ ප්‍රශ්නයේදී මෙය වෙසෙසින් ම එසේ වේ. එහෙත් යුද්ධව්‍යාපාර වලදී සහ සටන් වලදී, මේ තත්වය වෙනස් කරන්ට අපට හැකි ය, අප විසින් ඒකාන්තයෙන් ම එය වෙනස් කළ යුතු ම ය. සතුරා විසින් අපට විරුද්ධ ව කරන ලොකු ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරයක් අප විසින් සතුරාට විරුද්ධ ව කරන කුඩා වූ ත් වෙන් වූ ත් ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර ගණනක් බවට හරවන්ට අපට හැකි ය. උපායමාර්ගය පිළිබඳ මට්ටමෙන් සතුරා විසින් අපට විරුද්ධ ව එල්ල කරනලද හැම පැත්තෙන් ම එක ම තැනකට යොමු කළ ප්‍රහරණය, යුද්ධව්‍යාපාර සහ සටන් පිළිබඳ මට්ටමෙන් අප විසින් සතුරාට විරුද්ධ ව එල්ල කරනලද හැම පැත්තෙන් ම එක ම තැනකට යොමු කළ ප්‍රහරණයන් බවට හරවන්ට අපට හැකි ය. උපායමාර්ගය අතින් අප කෙරෙහි සතුරාට ඇති වැඩි-බලය යුද්ධව්‍යාපාර සහ සටන් වලදී ඔහු කෙරෙහි අපට ඇති වැඩි-බලය බවට හරවන්ට අපට හැකි ය. උපායමාර්ගික වශයෙන් බලවත් තත්වයක සිටින සතුරා යුද්ධව්‍යාපාර සහ සටන් වලදී දුර්වල තත්වයකට දමන්ට අපට හැකි ය. ඒ අතර ම අපේ උපායමාර්ගික වශයෙන් දුර්වල තත්වය යුද්ධව්‍යාපාර සහ සටන් වලදී බලවත් තත්වයක් බවට හරවන්නට ද අපට හැකි ය. ඇතුල්-පේළි සටන්ව්‍යාපාර තුළ පිට-පේළි සටන්ව්‍යාපාර, ''වටලෑම සහ මැඩලීම'' තුළ වටලෑම සහ මැඩලීම, මං ඇහිරීම තුළ මං ඇහිරීම, ආරක්ෂාවීම තුළ පහරදීම, අඩු-බලය තුළ වැඩි-බලය, දුර්වලකම තුළ ශක්තිය, අවාසිය තුළ වාසිය සහ අක්‍රියාකාරිතාව තුළ මුලපිරුම ය'යි අප කියන්නේ මෙය යි. උපායමාර්ගික ආරක්ෂාවීමේදී ජය දිනාගැනීම මූලික වශයෙන් මේ පියවර — හටකණ්ඩායම් ඒකරාශි කිරීම — මත රඳා පවතී.

චීන රතු හමුදවේ යුද්ධ පුරාවෘත්තයන්හි, මෙය බොහෝ විට මතභේදයට පාත්‍ර වූ වැදගත් ප්‍රශ්නයක් වී ඇත. 1930, ඔක්තෝබර 4වැනි ද කියාන්හි සටනේදී, අපේ ඉදිරි-ගමන සහ ප්‍රහරණය පටන් ගත්තේ අපේ බලසේනාවන් සම්පූර්ණයෙන් ඒකරාශි කිරීමට පෙර ය; එහෙත් වාසනාවකට මෙන් සතුරු බලසේනාව (තෙං යිංගේ ඩිවිසනය) සිය කැමැත්තෙන් ම පළා ගියේ ය; අපේ ප්‍රහරණය ම පමණක් ගත් කල, එය විපාකදයක නො වී ය.

1932 සිට පටන් ගනිමින්, ''සියලු ම පෙරමුණු වල පහර දෙනු'' යන සටන්පාඨය විය; එයින් ඉල්ලා සිටියේ කඳවුරු ප්‍රදේශයේ සිට හැම

LIBERATIONBASE

අතට ම — උතුරට, දකුණට, නැගෙනහිරට සහ බටහිරට — පහර දීම ය. මෙය උපායමාර්ගික ආරක්ෂාවීම සඳහා පමණක් නො ව උපායමාර්ගික පහරදීම සඳහා පවා වැරදි ය. සතුරා ත් අප ත් අතර පවතින බලවේගයන්ගේ පූර්ණ සමබරතාවෙහි මූලික වෙනසක් ඇති නො වී පවත්නා තෙක්, උපායමාර්ගය සහ උපක්‍රම යන දෙකට ම ආරක්ෂාවීම සහ පහරදීම ත්, හිර කර තිබීමේ ක්‍රියා සහ උන්හිටිගමන් දෙන වේගවත් ප්‍රහාර ත් ඇතුළත් වේ; ''සියලු ම පෙරමුණු වල පහරදීම්'' ඇත්ත වශයෙන් අතිශයින් ම දුර්ලභ ය. මේ සටන්පාඨය යුද්ධ සාහසිකවාදය කැටුව යන යුද්ධ සමානතාවාදය ප්‍රකාශ කරයි.

1933දී යුද්ධ සමානතාවාදය අටුවා කළ අය, උපායමාර්ගික වශයෙන් වැදගත් දිසා දෙකක එක විට ම ජය ලබන්ට සොයනු පිණිස, '' 'මුෂ්ටි' දෙකකින් පහර ගැසීමේ'' ත් රතු හමුදවේ ප්‍රධාන බලසේනාවන් දෙකට බෙදීමේ ත් න්‍යායය ඉදිරිපත් කළහ. ප්‍රතිඵලයක් වශයෙන්, එක මුෂ්ටියක් නිකම් ම තිබුණු අතර අනික සටන් කරමින් වෙහෙසට පත් විය; අපි ඒ කාලයේ දිනා ගත හැකි ව තිබුණු ලොකු ම ජයග්‍රහණය දිනාගන්ට අසමත් වීමු. මගේ මතය අනුව, අප බලවත් සතුරකුට මූණ දෙන විට, අප අපේ හමුදව, එහි ප්‍රමාණය කවරක් වුවත්, එක වරකට එක් ප්‍රධාන දිසාවකට පමණක් විනා දෙකකට නො යෙදිය යුතු ය. දිසා දෙකක හෝ වැඩි ගණනක ගෙන යන සටන්ව්‍යාපාර වලට මා චෝදනා කරනවා නො වේ; එහෙත් කවර නිශ්චිත වෙලාවක වේවා තිබිය යුත්තේ එක් ප්‍රධාන දිසාවක් පමණකි. කුඩා සහ දුර්වල බලපිරිසක් වශයෙන් සිවිල් යුද්ධයේ පොරපිටියට පිවිසි චීන රතු හමුදව එද සිට තම බලවත් ප්‍රතිමල්ලවයා යළි යළි ත් පරාජය කොට, ලොව විස්මය පත් කළ ජයග්‍රහණ දිනාගෙන ඇත; එය එසේ කර ඇත්තේ වැඩි වශයෙන් ඒකරාශි කළ ශක්තිය යෙදීම මත විශ්වාසය තිබීමෙන් ය. ඒ හමුදවේ ශ්‍රෙෂ්ඨ ජයග්‍රහණ අතුරෙන් කවරකට වුව ද මේ කරුණ ඔප්පු කළ හැකි ය. ''දහයකට විරුද්ධ ව එකකු පොරට තබන්න, සියයකට විරුද්ධ ව දහයක් පොරට තබන්න''යි අප කියන කල, අප කතා කරන්නේ උපායමාර්ගය ගැන ය, මුළු යුද්ධය ගැන ය, බලවේගයන්ගේ හැම දෙයක් ම ඇතුළත් සමබරතාව ගැන ය; උපායමාර්ගික අදහසින් අප කරගෙන ඇවිත් තිබෙන්නේ එය ම යි. කෙසේ වේවා, අපි, කිසි කලෙක අප විසින් එසේ නො කළ යුතු, යුද්ධව්‍යාපාර සහ උපක්‍රම ගැන එලෙස කතා නො කරමු. පෙරළා-පහරදීම් වලදී වේවා, පහරදීම් වලදී වේවා, අපි සතුරු බලසේනාවන් කෙරෙන් එක් කොටසකට පහර ගැහීම පිණිස හැම විට ම ලොකු බලසේනාවක් ඒකරාශි කළ යුත්තෙමු. 1931 ජනවාරියෙහි චියාංසි පළාතේ තිංතු උප-පළාතේ තුංශාඕ ප්‍රදේශයෙහි තාන් තාඕ-යූආන්ට විරුද්ධ ව ද, 1931 අගෝස්තුවෙහි චියාංසි පළාතේ ශිංකුඕ උප-පළාතෙහි කාඕශිංශු ප්‍රදේශයෙහි 19වැනි මාර්ග හමුදවට විරුද්ධ ව ද, 1932 ජූලියෙහි ක්වංතුං පළාතේ නාන්ශියුං උප-පළාතේ ශුයිකෞශු ප්‍රදේශයෙහි චෙන් චි-තාංට විරුද්ධ ව ද, 1934 මාර්තුවෙහි චියාංසි පළාතේ ලිචුආන් උප-පළාතේ

https://liberationbase.wordpress.com

තුආන්ත්සුන් ප්‍රදේශයෙහි වෙන් වෙංට විරුද්ධ ව ද අප කළ සටන් වලදී මෙන්, අප අපේ භටකණ්ඩායම් ඒකරාශි නො කළ හැම වරක ම අපි අමාරුවේ වැටුනෙමු. අතීතයේදී, ශුයිකෞශු සටන සහ තුආන්ත්සුන් සටන වැනි සටන් සාමාන්‍යයෙන් ජයග්‍රහණ ලෙස හෝ මහා ජයග්‍රහණ ලෙස පවා සලකනු ලැබී ය (මුලින් කී සටනේදී වෙන් චි–තාං යටතේ වූ රෙජමේන්තු විස්සක් ද පසුව කී සටනේදී වෙන් වෙං යටතේ වූ රෙජමේන්තු දෙළහක් ද අපි පළවා හැරියෙමු); එහෙත් අපි කිසි විටෙක එබඳු ජයග්‍රහණ සතුටින් නො පිළිගතිමු, එක්තරා තේරුමකින් ඒවා පරාජයන් ලෙස පවා සැලකීමු. කවර හෙයින් ද යත්, අපේ මතය අනුව, සිරකරුවන් හෝ යුද්ධයේදී අල්ලා ගත් ද්‍රව්‍ය නැති විට, නැතහොත් සිදු වූ අලාභයන්ට වඩා ඒවා ලොකු නො වන විට, සටනක වැදගත්කමක් නැති නිසා ය. අපේ උපායමාර්ගය ''දහයකට විරුද්ධ ව එකකු පොරට තබන්න'' යනු යි; අපේ උපක්‍රමය ''එකකුට විරුද්ධ ව දහයක් පොරට තබන්න'' යනු යි — මෙය සතුරා කෙරෙහි ස්වාමිත්වය ලබා ගනු පිණිස අපේ මූලික මූලධර්ම අතුරෙන් එකකි.

යුද්ධ සමානතාවාදය 1934දී ''වටලෑම සහ මැඩලීම''ට විරුද්ධ ව කළ අපේ පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී එහි අන්තිම කෙළවරට පත් විය. ''බලසේනාවන් මාර්ග හයකට බෙදීමෙන්'' සහ ''සියලු ම පෙරමුණු වල විරුද්දකම් පෑමෙන්'' සතුරාට පහර ගහන්ට අපට හැකි වේ ය'යි කල්පනා කළ නමුත්, ඒ වෙනුවට සිදු වූයේ සතුරා අපට පහර ගැහීම ය; හේතුව වූයේ භූමිප්‍රදේශ නැති වීම ගැන බිය වීම යි. ස්වභාවයෙන් ම, අයකු අනික් දිසාවන්හි (සතුරා) හිර කර තබාගැනීමේ බලසේනාවන් පමණක් ඉතිරි කර තබා, ප්‍රධාන බලසේනාවන් එක් දිසාවෙක ඒකරාශි කරන විට භූමිප්‍රදේශ නැති වීම වළකන්ට අයකුට පුළුවන්කමක් නැති තරම් ය. එහෙත් මේ අලාභය තාවකාලික ය, අඩාල ය, වේගයෙන් පහර දෙන ස්ථානයේදී ලබන ජයග්‍රහණයෙන් එය හිලව් වේ. එබඳු ජයග්‍රහණයක් දිනා ගත් පසු, හිර කරගෙන සිටින බලසේනාවන් සිටින ප්‍රදේශයෙහි නැති වූ භූමිප්‍රදේශය ආපසු ලබාගත හැකි ය. සතුරාගේ පළමුවැනි, දෙවැනි, තුන්වැනි සහ සතරවැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාර නිසා භූමිප්‍රදේශ නැති වීම සිදු විය — වෙසෙසින් තුන්වැනි යුද්ධ ව්‍යාපාරයේදී, රතු හමුදාවේ චියාංසි කඳවුරු ප්‍රදේශය සම්පූර්ණයෙන් ම වාගේ නැති විය; එහෙත් අන්තිමේදී අපි අපේ භූමිප්‍රදේශය ආපසු ලබා ගත්තා පමණක් නො ව පළල් ද කර ගතිමු.

කඳවුරු ප්‍රදේශයෙහි ජනතාවගේ ශක්තිය අගය කරන්ට බැරි වීම නිසා බොහෝ විට රතු හමුදාව කඳවුරු ප්‍රදේශයෙන් පමණට වඩා ඈතට ගෙන යාම ගැන අයුතු බියක් පහළ වී තිබේ. 1932දී රතු හමුදාව පූචියන් පළාතේ චාංචව් නුවරට පහර දීමට බොහෝ දුරක් ගමන් කළ අවස්ථාවේ ත්, 1933දී අපේ සිව්වැනි ප්‍රති–යුද්ධ ව්‍යාපාරයේදී ලත් ජයග්‍රහණයට පසු පූචියන් වලට පහර දීමට ආපසු හැරුණු අවස්ථාවේදී ත් මෙය සිදු විය. පළමුවැනි

අවස්ථාවේදී සතුරා මුළු කඳවුරු ප්‍රදේශය ම අල්ලනවා ඇතැ'යි ද, දෙවැනි අවස්ථාවේදී ඔහු එයින් කොටසක් අල්ලනවා ඇතැ'යි ද බියක් තිබුණි; ඒ හේතු කොටගෙන, අපේ බලසේනාවන් ඒකරාශි කරනවාට විරෝධයක් ද ආරක්ෂණය පිණිස බලසේනා බෙදිය යුතු ය'යි කියා සිටීමක් ද විය; එහෙත් අන්තිමේදී මේ සියල්ල වැරදි බව ඔප්පු විය. සතුරා සම්බන්ධයෙන්, ඔහු අපේ කඳවුරු ප්‍රදේශය තුළට ඉදිරියට ගමන් කරන්ට බය ය, එහෙත් ඔහුගේ ඇසට ප්‍රධාන අනතුර ලෙස පෙනෙන්නේ සුදු ප්‍රදේශය තුළට කාගෙන ගිය රතු හමුදාවකි. ඔහුගේ අවධානය සෑම විට ම රතු හමුදාවේ ප්‍රධාන බලසේනාව යන එන තැන වෙත ම යොමු වී පවතී; ඔහු කඳවුරු ප්‍රදේශය වෙත යොමුවීම පිණිස ඔහුගේ ඇස් කලාතුරකින් විනා ඒ ප්‍රධාන බලසේනාව කෙරෙන් ඉවතට නො ගනී. රතු හමුදාව ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට පවා, එය සතුරාගේ අවධානයේ කේන්ද්‍රය වී පවත්නේ ය. ඔහුගේ හැම දෙයක් ම ඇතුළත් සැලැස්මේ කොටසක් නම් අපේ කඳවුරු ප්‍රදේශයේ ප්‍රමාණය කුඩා කිරීම ය; එහෙත් රතු හමුදාව ඔහුගේ කොලම් අතුරෙන් එකක් මුලසුන් කිරීම පිණිස තම ප්‍රධාන බලසේනාව ඒකරාශි කරතොත්, වඩා ත් ලොකු අවධානයක් රතු හමුදාව වෙත යොමු කරන්ට ත් ඊට විරුද්ධ ව වඩා ත් විශාල බලසේනාවන් ඒකරාශි කරන්ට ත් සතුරාගේ ඉහළ ම අණදෙන මණ්ඩලයට බලෙන් ම සිදු වෙනවා ඇත. එහෙයින් කඳවුරු ප්‍රදේශයක ප්‍රමාණය කුඩා කිරීම සඳහා වන සතුරාගේ සැලැස්ම කඩාකප්පල් කරන්ට පුළුවන්කම තිබේ.

තවද, ''යුදමුරගෙවල් සංග්‍රාමය මගින් කරගෙන යන පස්වැනි 'වටලෑමේ සහ මැඩලීමේ' යුද්ධව්‍යාපාරයේදී, අපට ඒකරාශි කළ බලසේනාවන් ඇති ව ක්‍රියා කරන්ට කොහෙත් ම බැරි ය, අප විසින් කළ හැකි එක ම දෙය ආරක්ෂණය පිණිස ත් වේගවත් කෙටි පහරවල් ඇනගෙන යාම පිණිස ත් බලසේනාවන් බෙදීම ය,'' යි කීම ද වැරදි ය. වරකට ලි 3ක්, 5ක්, 8ක් හෝ 10ක් ඉස්සරහට තල්ලු වී, නතර වන හැම තැනක ම යුදමුරගෙවල් ඉදි කිරීම පිළිබඳ සතුරාගේ උපක්‍රමය මුළුමනින් ම එකකට පසු එකක් වශයෙන් හැම තැනකදී ම ආරක්ෂාවීමේ සටන් කරගෙන ගිය රතු හමුදාවේ භාවිතාවේ ප්‍රතිඵලය විය. අපේ හමුදාව ඇතුල් පේළි වල තැනක් තැනක් පාසා ම ආරක්ෂා වීමේ උපක්‍රමය අත හැර දමා, හැකි විට ත් අවශ්‍ය විට ත්, ආපසු හැරී සතුරාගේ ඇතුල් පේළි වෙත කාගෙන ගියේ නම්, තත්වය සත්තකින් ම මීට වෙනස් වෙන්ට ඉඩ තිබුණි. බලසේනාවන් ඒකරාශි කිරීම පිළිබඳ මේ මූලධර්මය සතුරාගේ යුදමුරගෙවල් සංග්‍රාමය පරාජය කිරීමට තිබෙන මග ම වේ.

අප අනුමත කරන වර්ගයේ බලසේනා ඒකරාශි කිරීම මහජනයාගේ ගොරිල්ලා සංග්‍රාමය අත හැර දැමීම අදහස් නො කරයි. ලි ලි–සාන් ක්‍රියාමාර්ගයෙන් අනුමත කළාක් මෙන් කුඩා–පරිමාණයේ ගොරිල්ලා සංග්‍රාමය අත හැර දමා ''හැම රයිපලයක් ම රතු හමුදාව තුළ ඒකරාශි කිරීම'' වැරදි බව

LIBERATION BASE

https://liberationbase.wordpress.com

ඔප්පු වී දැන් බොහෝ කල් ය. විප්ලවවාදි යුද්ධය මුළු එකක් වශයෙන් ගෙන කල්පනා කරන කල, මහජනයාගේ ගොරිල්ලාභටයන්ගේ සටන්ව්‍යාපාර ත් රතු හමුදාවේ ප්‍රධාන බලසේනාවන්ගේ සටන්ව්‍යාපාර ත් මිනිසකුගේ දකුණු අත සහ වම් අත මෙන් එකිනෙක ඌනපූරණය කරයි; අපට සිටින්නේ මහජනයාගේ ගොරිල්ලාභටයන් නොමැතිව රතු හමුදාවේ ප්‍රධාන බලසේනාවන් පමණක් නම්, අපි එක් අතක් පමණක් ඇති යෝධයකු වැනි වෙමු. හරියට ම කියන කල, වෙසෙසින් යුද්ධ සටන්ව්‍යාපාර සම්බන්ධයෙන්, අප කඳවුරු ප්‍රදේශයෙහි ජනතාව සාධකයක් ලෙස ගෙන කතා කරන විට අප අදහස් කරන්නේ අපට සන්නද්ධ ජනතාවක් සිටින බව ය. සතුරා අපේ කඳවුරු ප්‍රදේශයට ළඟා වීමට බිය වන ප්‍රධාන හේතුව එය යි.

දෙවැනි තැනට වැටෙන දිසාවන්හි සටන්ව්‍යාපාර ගෙන යනු පිණිස රතු හමුදා බළඇණි යෙදීම ද අවශ්‍ය ය; රතු හමුදාවේ සියලු ම බලසේනාවෝ ඒකරාශි කළ යුතු නො වෙත්. අප අනුමත කරමින් කතා කරන වර්ගයේ ඒකරාශි කිරීමට පදනම වී ඇත්තේ යුදබිමෙහි ඒකාන්ත හෝ සාපේක්ෂක වැඩි-බලය ලැබීම සහතික කිරීමේ මූලධර්මය යි. බලවත් සතුරකු හා ඔට්ටු වීමට හෝ ඉතා වැදගත් යුදබිමක සටන් කිරීමට හෝ, ඒකාන්ත වශයෙන් ම වැඩි-බලය ඇති බලසේනාවක් අපට සිටිය යුතු ම ය; නිදසුන් වශයෙන්, අපේ ප්‍රථම ප්‍රති-යුද්ධව්‍යාපාරයේ පළමුවැනි සටනේදී, 1930, දෙසැම්බර් 30වැනි ද චාං හුයි-ත්සාන් යටතේ සිටි මිනිසුන් 9000 හා සටන් කරනු පිණිස 40,000ක බලසේනාවක් ඒකරාශි කරනු ලැබී ය. වඩා දුර්වල සතුරකු හා ඔට්ටු වීම පිණිස හෝ එතරම් වැදගත් නො වන යුදබිමක සටන් කිරීම පිණිස හෝ, සාපේක්ෂක වශයෙන් වැඩි-බලය ඇති බලසේනාවක් ප්‍රමාණවත් ය; නිදසුන් වශයෙන්, අපේ දෙවැනි ප්‍රති-යුද්ධව්‍යාපාරයේ අන්තිම සටනේදී, 1931, මැයි 29වැනි ද චියන්නිංහිදී ලියු හෝ-තිංගේ මිනිසුන් 7000ක ඩිවිසනය හා සටන් කරනු පිණිස යොදනලද්දේ රතු හමුදා මිනිස්සු 10,000ක් පමණ ය.

ඒ කියන්නේ හැම අවස්ථාවක ම අපට සංඛ්‍යාව අතින් වැඩි-බලයක් තිබිය යුතු ම ය කියා නො වේ. ඇතැම් වටාපිටා තත්වයන් තුළ, සාපේක්ෂක හෝ ඒකාන්ත අඩු-බලයක් ඇති බලසේනාවක් ඇති ව අප සටනට යන්ට ඉඩ තිබේ. එක්තරා ප්‍රදේශයක තරමක් කුඩා රතු හමුදා බලසේනාවක් පමණක් අපට සිටින විට (එය අපට ඊට වඩා හටකණ්ඩායම් සිටින නමුත් ඔවුන් ඒකරාශි කර නොතිබීමක් නො වේ), සාපේක්ෂක වශයෙන් අඩු-බලයක් ඇති බලපිරිසක් ඇතිව සටනට පිවිසීමේ ප්‍රශ්නය ගනිමු. එවිට, මහජන අනුබලය, භූමිභාගය සහ කාලගුණය බෙහෙවින් ම අපට හිතකර වන්නා වූ තත්වයන් තුළ වඩා ප්‍රබල සතුරාගේ ප්‍රහරණය සිඳ බිඳ දැමීම පිණිස, සතුරාගේ එක් අංශයක කොටසකට හදිස්සි ප්‍රහාරයක් දීම සඳහා අපේ රතු හමුදා බලසේනාවේ ප්‍රධාන කොටස ඒකරාශි කිරීම ත්, ඒ අතර ගොරිල්ලාභටයන් හෝ කුඩා බළඇණි යොදා ඔහුගේ මධ්‍යය සහ ඔහුගේ අනික් අංශය හිර කර

තබා ගැනීම ත් අවශ්‍ය වේ; මේ අයුරින් ජය දිනා ගත හැකි ය. සතුරාගේ අංශයේ මේ කොටසට අප දෙන හදිස්සි ප්‍රහාරයේදී, අඩු-බලය ඇති බලසේනාවකට විරුද්ධ ව වැඩි-බලය ඇති බලසේනාවක් යෙදීමේ, ටික දෙනා පරදවනු පිණිස බොහෝ දෙනා යෙදීමේ, මූලධර්මය එතෙක් ම යෙදෙයි. අප ඒකාන්ත අඩු-බලයක් ඇති බලසේනාවක් ඇතිව සටනට බහිමින්, උදහරණ වශයෙන්, ගොරිල්ලා බලපිරිසක් විශාල සුදු හමුදා බලපිරිසකට හදිස්සි ප්‍රහාරයක් දෙමින්, ඒ හමුදාවේ එක් කුඩා කොටසකට පමණක් පහර දෙන විට ද ඒ මූලධර්මය ම යෙදෙන්නේ ය.

තනි සටන් ප්‍රදේශයක ක්‍රියා කරනු පිණිස විශාල බලසේනාවක් ඒකරාශි කිරීම භූමිභාගය, පාරවල්, සපයන දේ සහ වාඩි පහසුකම් යන මේවායේ සීමාවන්ට යටත් ය යන තර්කය සම්බන්ධයෙන්, එය වටාපිටා තත්වයන්ට අනුව තක්සේරු කළ යුතු ය. මේ සීමාවන් රතු හමුදාව කෙරෙහි සහ සුදු හමුදාව කෙරෙහි බල පාන ප්‍රමාණයෙහි වෙනසක් ඇත; ඒ සුදු හමුදාව විසින් විඳ දරාගන්ට හැකිවාට වඩා දුක් හිරිහැර විඳ දරාගන්ට රතු හමුදාවට පුළුවන් නිසා ය.

බොහෝ දෙනා පරද්දනු පිණිස අපි ටික දෙනා යොදමු — මෙය අපි මුළු එකක් වශයෙන් චීනයේ පාලකයන්ට කියමු. ටික දෙනා පරද්දනු පිණිස අපි බොහෝ දෙනා යොදමු — මෙය අපි යුදබිමෙහි වෙන වෙන ම සිටින එක් එක් සතුරු බලසේනාවට කියමු. එය දැන් රහසක් නො වේ; සාමාන්‍යයෙන් මේ වන විට සතුරා අපේ පිළිවෙල හොඳින් දැනගෙන සිටී. කෙසේ වෙතත්, අපේ ජයග්‍රහණයන් වළකන්ට වත් තම පරාජයන් ගෙන් බේරෙන්ට වත් ඔහුට බැරි ය; අප කොයි වේලාවේ කොතැනදී ක්‍රියා කරනවා ද'යි ඔහු නො දන්නා නිසා ය. මෙය අපි රහසක් වශයෙන් තබා ගනිමු. රතු හමුදාව සාමාන්‍යයෙන් ක්‍රියා කරන්නේ හදිස්සි ප්‍රහරණයන් මඟින් ය.

7. ජංගම සංග්‍රාමය

ජංගම සංග්‍රාමය ද, නැත හොත් ස්ථානගත සංග්‍රාමය ද? අපේ පිළිතුර ජංගම සංග්‍රාමය යනු යි. අපට විශාල හමුදාවක් හෝ මතු ප්‍රයෝජනයට වෙන් කර තබනලද යුද්ධෝපකරණ හෝ නැති තාක්, එක් එක් කඳවුරු ප්‍රදේශයෙහි සටන කරගෙන යන්ට තනි රතු හමුදා බලසේනාවක් පමණක් සිටින තාක්, ස්ථානගත සංග්‍රාමය සාමාන්‍යයෙන් අපට නිෂ්ඵල ය. අප හට, ස්ථානගත සංග්‍රාමය ආරක්ෂණයේදී මෙන් ම ප්‍රහරණයේදී ත් සාමාන්‍යයෙන් යෙදිය නො හැකි ය.

සතුරා බලවත් ය, ඒ අතර රතු හමුදාව කාර්මික උපකරණ වලින් අඩුපාඩු සහිත ය යන සත්‍ය කාරණය හේතු කොටගෙන ඇති වන රතු හමුදාවේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සටන්ව්‍යාපාර වල කැපී පෙනෙන අංගලක්ෂණයක් නම් ස්ථිර සටන් පෙළි නොමැතිවීම ය.

රතු හමුදාවේ සටන් පෙළි එය ක්‍රියා කරගෙන යන දිසාව විසින් නිශ්චය කරනු ලැබේ. එය ක්‍රියා කරගෙන යන දිසාව බොහෝ විට මාරු වෙන නිසා, එහි සටන් පෙළි අනිස්ථිර ය. නිශ්චිත කාල සීමාවක් ඇතුළත ප්‍රධාන දිසාව වෙනස් වන්නේ නැති නමුත්, එහි සීමාව තුළ දෙවැනි තැන ගන්නා දිසා කොයි මොහොතේ හෝ මාරු විය හැකි ය; එක් දිසාවක අපට අවහිරයක් ඇති කර තිබෙන බව අපට පෙනී ගිය කල, අප වෙන දිසාවකට හැරිය යුතු ය; කලකට පසු, ප්‍රධාන දිසාවෙහි ද අපට අවහිරයක් කර ඇති බව අපට පෙනී ගියොත්, අප එය ද වෙනස් කළ යුතු ම ය.

විප්ලවවාදි සිවිල් යුද්ධයකදී, ස්ථිර සටන් පෙළි තිබෙන්ට බැරි ය; සෝවියට් සංගමයෙහි ද එය එසේ විය. සෝවියට් හමුදාව ත් අපේ හමුදාව ත් අතර ඇති වෙනස නම් ඒ හමුදාවේ සටන් පෙළි අපේ සටන් පෙළි තරම් ම අනිස්ථිර නො වීම ය. කවර යුද්ධයකදී වේවා, ඒකාන්ත වශයෙන් ම ස්ථිර වූ සටන් පෙළි තිබෙන්ට බැරි ය; ජය හා පරාජය, ඉදිරියට යාම හා පසුබැසීම වරින් වර වෙනස් වෙන නිසා, එවැන්නක් තිබෙන්ට බැරි ය. එහෙත් යුද්ධ සාමාන්‍යයෙන් කැරෙන පිළිවෙලෙහි සාපේක්ෂක වශයෙන් ස්ථිර වූ සටන් පෙළි දක්නට ලැබේ. ඊට විශේෂ වූ දේ සිදු වන්නේ, වර්තමාන අවස්ථාවේදී චීන රතු හමුදාව පිළිබඳ ප්‍රශ්නයේදී මෙන්, හමුදාවක් තමාට වඩා හුඟක් ශක්ති-සම්පන්න සතුරකුට මුහුණ පා සිටින තැනක පමණකි.

සටන් පෙළි වල අනිස්ථිරතාව නිසා අපේ කඳවුරු ප්‍රදේශ වල ප්‍රමාණයේ අනිස්ථිරතාව ඇති වේ. අපේ කඳවුරු ප්‍රදේශ නිතර ම පළල් වෙයි, හැකිලෙයි; බොහෝ විට එක් කඳවුරු ප්‍රදේශයක් වැටෙන කල අනිකක් පැනනඟී. භූමිප්‍රදේශයේ මේ අනිස්ථිරතාව මුළුමනින් ම යුද්ධයේ අනිස්ථිර-තාවේ ප්‍රතිඵලයක් වේ.

යුද්ධයේ ත් අපේ භූමිප්‍රදේශයේ ත් අනිස්ථිරතාව අපේ කඳවුරු ප්‍රදේශ වල සියලු සංවර්ධන ක්ෂේත්‍රයන්හි අනිස්ථිරතාව ඇති කරයි. අවුරුදු ගණනක් ඇතුළත් වන සංවර්ධන සැලැස්ම තිබීම ප්‍රශ්නයෙන් පිට ය. සැලැස්ම නිතර නිතර වෙනස් කිරීමට සිදුවීම දවසේ වැඩට ඇතුළත් ය.

මේ අංගලක්ෂණය තේරුම් ගැනීම අපේ වාසිය පිණිස වේ. අපි ඒ අංගලක්ෂණය පදනම කරගෙන අපේ සැලැස්ම සම්පාදනය කළ යුත්තෙමු, කිසි ම පසුබැසීමක් නැති ව ඉදිරියට ම යන යුද්ධයක් ගැන මුළාවන් ඇති ව නො සිටිය යුත්තෙමු, අපේ භූමිප්‍රදේශයේ හෝ අපේ හමුදාවේ පසුමුණු ප්‍රදේශ වල හෝ කිසියම් තාවකාලික අනිස්ථිරතාවක් නිසා කලබැගෑනියට නො පත් විය යුත්තෙමු, නැතහොත් දීර්ඝ–කාල සවිස්තර සැලැස්ම කෙටුම්පත් කරන්ට උත්සාහ නො කළ යුත්තෙමු. අපි අපේ සිතීම ත් අපේ වැඩ ත්

එන එන හැටියකට ගළපා ගත යුත්තෙමු, වාඩි වී සිටීමට මෙන් ම ගමන් කිරීමට ද සූදානම් ව සිටිය යුත්තෙමු, සැම විට ම ගමනට උවමනා කරන අපේ කෑම සලාක කොටස් සූදානම් කර තබා ගත යුත්තෙමු. අද තිබෙන අනිස්ථිර ජීවිත පිළිවෙල තුළ වෙහෙස ගැනීමෙන් පමණකි හෙට අපට සාපේක්ෂක ස්ථාවරභාවයක් ද, අන්තිමේදී සම්පූර්ණ ස්ථාවරභාවය ද අත් කර ගත හැකි වන්නේ.

අපේ පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය යට කරගත් ''නිත්‍ය සංග්‍රාමය'' පිළිබඳ උපායමාර්ගය අටුවා කළ අය මේ අනිස්ථිරතාව නො පිළිගත්හ, ඔවුන් ''ගොරිල්ලා–වාදය''යි කී දෙයට විරුද්ධ වූහ. අනිස්ථිරතාවට විරුද්ධ වූ සහෝදරවරුන් කටයුතු පාලනය කළේ ඔවුන් මහා රජයක පාලකයන් වූ කලක මෙනි; ප්‍රතිඵලය වූයේ සුවිශේෂ වූ ත් සුවිශාල වූ ත් අනිස්ථිර තාවකි — ලි 25,000ක දීර්ඝ ගමන ය.

අපේ කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදි සමූහාණ්ඩුව රජයකි, එහෙත් අද එය මෙතෙක් ම සපුරා වැඩුණු රජයක් නො වේ. අද අප තවම සිටින්නේ සිවිල් යුද්ධයේ උපායමාර්ගික වශයෙන් ආරක්ෂාවීමේ වකවනුවෙහි ය, අපේ දේශපාලන බලයේ ආකාරය තව ම සපුරා වැඩුණු රජයක ආකාරයෙන් බොහෝ ඈත් ය, අපේ හමුදාව තවම සංඛ්‍යාව ත් කාර්මික උපකරණ ත් යන දෙකෙන් ම සතුරාට වඩා බෙහෙවින් ම පහළ ය, අපේ භූමිප්‍රදේශය තවම කුඩා ය, අපේ සතුරා නිතරම අප විනාශ කරන්ට අප පස්සේ පන්නයි, එසේ කරන තුරු ඔහුට කවදා වත් නින්ද නො යනවා ඇත. මේ සත්‍ය කරුණු පදනම කරගෙන අපේ ප්‍රතිපත්තිය පහදා පණවන කල, අපි පොදු වශයෙන් ගොරිල්ලා–වාදය ප්‍රතික්ෂේප නො කළ යුත්තෙමු, රතු හමුදාවේ ගොරිල්ලා ලක්ෂණය අවංක ව පිළිගත යුත්තෙමු. මෙ ගැන ලජ්ජා වීමෙන් පලක් නැත. එය ලජ්ජාවක් නො වෙනවා පමණක් නො වේ, අපේ වෙනස පැහැදිලි ව පෙන්වන අංගලක්ෂණය, අපේ ප්‍රබල ස්ථානය සහ සතුරා පරාජය කරන්ට අපට තිබෙන විධිය මේ ගොරිල්ලා ලක්ෂණය ම වේ. අපි එය ඉවත දැමීමට සූදානම් ව සිටිය යුත්තෙමු, එහෙත් අද ම එසේ කරන්ට අපට බැරි ය. අනාගතයේදී මේ ගොරිල්ලා ලක්ෂණය නියත වශයෙන් ම ලජ්ජා වීමට සහ ඉවත දැමීමට නිසි දෙයක් බවට පත් වෙනවා ඇත; එහෙත් අද එය කියන්ට බැරි තරම් වටී. අපි ඊට ඇලී සිටිය යුත්තෙමු.

''ඔබට දිනන්ට පුළුවන් විට සටන් කරන්න, ඔබට දිනන්ට බැරි විට මග ඇර යන්න'' — අද අපේ ජංගම සංග්‍රාමය විස්තර කරන ජනප්‍රිය පිළිවෙල මෙය යි. අප තරම් ම මග ඇර යන මිනිසුන් සිටින්නේ ටික දෙනකුන් වුවත්, සටන් කිරීම පමණක් අනුමත කරන, කිසි විටෙක මග ඇර යාම අනුමත නො කරන යුද්ධ විශේෂඥයෙක් ලෝකයේ කොතැනක වත් නැත. අපි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සාමාන්‍යයෙන් සටන් කරමින් ගෙවන කාලයට වැඩි කාලයක් ගමනේ යෙදෙමින් ගෙවමු. සාමාන්‍ය ගණනින් අප මසකට සෑහෙන තරමේ එක් සටනක් කළ හොත් අප කරන හැටි හොඳට ම හොඳ ය. අපේ "ගමන්" සියල්ල ම "සටන් කිරීමේ" අභිප්‍රාය උදෙසා ය; අපේ උපායමාර්ගය ත් උපක්‍රම ත් සියල්ල ම ගොඩනඟා තිබෙන්නේ "සටන් කිරීම" මත ය. ඒ එසේ වුව ද, සටන් කිරීම අපට නුවණට හුරු නො වන අවස්ථා තිබේ. පළමුකොට අපට අභිමුඛ ව සිටින බලසේනාව පමණට වඩා විශාල වන විට සටන් කිරීම නුවණට හුරු නො වේ; දෙවැනි ව, අපට අභිමුඛ ව සිටින බලසේනාව, එතරම් විශාල නුවූ වත්, වෙන සතුරු බලසේනාවන්ට ඉතා කිට්ටු ව සිටින කල ද සටන් කිරීම ඇතැම් විට නුවණට හුරු නො වේ; තුන්වැනි ව, හුදකලා වී නැත්තා වූ ද, අගල් කැණගෙන ප්‍රබල ලෙස රක්ෂිත වී සිටින්නා වූ ද සතුරු බලසේනාවක් සමග සටන් කිරීම සාමාන්‍යයෙන් නුවණට හුරු නො වේ; සිව්වැනි ව, ජය ලැබේ ය'යි බලාපොරොත්තුවක් නැති සටනක දිගට ම යෙදී සිටීම නුවණට හුරු නො වේ; මේ තත්වයන් අතුරෙන් කවරකදී වුව අපි මග ඇර යන්ට සූදනමින් සිටිමු. එසේ මග ඇර යාමට අවසර ඇත, එය අවශ්‍ය ය. කව්ර හෙයින් ද යත් මග ඇර යාමේ අවශ්‍යතාව අප විසින් පිළිගෙන තිබෙන්නේ සටන් කිරීමේ අවශ්‍යතාව අප විසින් පිළිගෙන තිබීම පදනම කරගෙන නිසා ය. රතු හමුදවේ ජංගම සංග්‍රාමයේ මූලික අංගලක්ෂණය රැඳී ඇත්තේ මෙහි ය.

ජංගම සංග්‍රාමය ප්‍රාථමික ය; එහෙත් හැකි තැනදී ත් අවශ්‍ය තැනදී ත් අපි ස්ථානගත සංග්‍රාමය ද ප්‍රතික්ෂේප නො කරමු. උපායමාර්ගික ආරක්ෂාවීමෙහි යෙදී සිටින අතර කරන සතුරා හිර කර තබාගැනීමේ සටනකදී නිශ්චිත මුඛ්‍ය ස්ථාන තරයේ ම ආරක්ෂණය කිරීම පිණිස ද, උපායමාර්ගික පහරදීමෙහි යෙදී සිටින අතර හුදකලා වූ ත් ආධාර ලැබීමෙන් කපා දමනු ලැබ සිටින්නා වූ ත් සතුරු බලසේනාවක් අපට මුණ ගැසුණු විට ද, ස්ථානගත සංග්‍රාමය යෙදිය යුතු බව පිළිගත යුතු ය. එබඳු ස්ථානගත සංග්‍රාමය මගින් සතුරා පරාජය කිරීමෙහි ලා සැලකිය යුතු තරම් අත්දැකීම් අපට ලැබී ඇත; අපි බොහෝ සතුරු නගර, යුදමුරගෙවල් සහ බලකොටු බිඳ විවෘත කර සිටිමු. තරමක් හොඳට බලකොටු බැඳ තර කළ සතුරු ක්ෂේත්‍ර ස්ථාන තුළින් බිඳගෙන ගොස් සිටිමු. අනාගතයේදී අපි අපේ පරිශ්‍රමයන් වැඩි කොට මේ අතින් ඇති අපේ මදිපාඩුකම් වලට පිළියම් කරන්නෙමු. වටපිටා තත්වයන් අනුව අවශ්‍ය වන විට සහ ඉඩ ලැබෙන විට අපි ස්ථානගත සංග්‍රාමය සත්තකින් ම අනුමත කළ යුත්තෙමු. වර්තමාන අවස්ථාවෙහි, අප විරුද්ධ වන්නේ ස්ථානගත සංග්‍රාමය සාමාන්‍ය වශයෙන් යෙදීමට හෝ එය ජංගම සංග්‍රාමය සමග සම තත්වයට යෙදීමට ය; ඊට අවසර දිය නො හැකි ය.

දස අවුරුද්දක් තිස්සේ කරන සිවිල් යුද්ධයේදී, රතු හමුදවේ ගොරිල්ලා ලක්ෂණයෙහි, රතු හමුදවට ස්ථිර සටන් පේළි නොමැතිවීමෙහි, එහි කඳවුරු

ප්‍රදේශ වල අනිස්ථිරතාවෙහි, හෝ කඳවුරු ප්‍රදේශ වල සංවර්ධන වැඩ වල අනිස්ථිරතාවෙහි කිසි ම කිසි වෙනස්වීමක් ඇති වී නැද්ද? ඔව්, වෙනස්වීම් ඇති වී තිබේ. චිංකාං කඳු වල සිටි දවස් වල සිට චියාංසි පළාතෙහි "වටලෑම සහ මැඩලීමට" ට විරුද්ධ ව කළ අපේ පළමුවැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය දක්වා වකවනුව, රතු හමුදව එහි ළදරු වියේ සිටි හෙයින් ද, කඳවුරු ප්‍රදේශ එතෙක් ම ගොරිල්ලා කලාප වූ හෙයින් ද, පළමුවැනි අවස්ථාව, එනම්, ගොරිල්ලා ලක්ෂණය ත් අනිස්ථිරතාව ත් හොඳට ම ප්‍රකට ව පෙනුණු අවස්ථාව, විය. පළමුවැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේ සිට තුන්වැන්න තෙක් වූ වකවනුව අඩංගු කර ගත් දෙවැනි අවස්ථාවෙහි, රතු හමුදවේ පළමුවැනි පෙරමුණු හමුදව සකස් කර තිබුණෙන් ද දසලක්ෂ කීපයක ජනගහණයක් සහිත කඳවුරු ප්‍රදේශ පිහිටුවා තිබුණෙන් ද, ගොරිල්ලා ලක්ෂණය ත් අනිස්ථිරතාව ත් යන දෙක ම සැලකිය යුතු තරම් අඩු වී තිබුණි. තුන්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේ අවසානයේ සිට පස්වැන්න දක්වා වකවනුව අඩංගු කර ගත් තුන්වැනි අවස්ථාවෙහි, ගොරිල්ලා ලක්ෂණය ත් අනිස්ථිරතාව ත් තව දුරට අඩු විය. මධ්‍යම ආණ්ඩුවක් සහ විප්ලවවාදී යුද්ධ අධිකාරියක් පිහිටුවා තිබුණි. සිව්වැනි අවස්ථාව වූයේ දීර්ඝ ගමන ය. කුඩා පරිමාණයකින් ගොරිල්ලා සංග්‍රාමය ත් අනිස්ථිරතාව ත් වැරදි ලෙස ප්‍රතික්ෂේප කිරීම නිසා විශාල පරිමාණයකින් ගොරිල්ලා සංග්‍රාමය ත් අනිස්ථිරතාව ත් කරා මග පෑදී තිබුණි. දැන් අපි පස්වැනි අවස්ථාවේ සිටිමු. පස්වැනි "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාරය සිඳ බිඳ දැමීමට අපට බැරි වූ නිසා ද, මේ මහත් අනිස්ථිරතාව නිසා ද, රතු හමුදව සහ කඳවුරු ප්‍රදේශ බෙහෙවින් කුඩා වී ඇත; එහෙත් අපි වයඹදිග පෙදෙසෙහි අපේ දෙ පය ගසාගෙන සිටිමු, මෙහි අපේ කඳවුරු ප්‍රදේශය වන ශෙන්සි–කාන්සු–නිංසියා දේශසීමා ප්‍රාන්තය තහවුරු කරගෙන සහ වර්ධනය කරගෙන සිටිමු. රතු හමුදවේ ප්‍රධාන බලසේනාවන් වන පෙරමුණු හමුද තුන එක්සත් කළ විධානයක් යටතට පත් කොට ඇත; එය පෙර නුවූ විරූ දෙයකි.

අපේ උපායමාර්ගයේ ස්වභාවය අනුව සලකන කල, චිංකාං පර්වත වල සිටි දිනයන්හි සිට අපේ සිව්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය තෙක් වකවනුව එක් අවස්ථාවක් වී ය'යි ද, පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේ වකවනුව තව අවස්ථාවක් වී ය' යි ද, දීර්ඝ ගමනේ සිට මේ වන තෙක් වකවනුව තුන්වැනි අවස්ථාව වේ ය' යි ද, අප විසින් කීමට ඉඩ තිබේ. පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී අතීතයේ නිවැරදි ප්‍රතිපත්තිය වැරදි ලෙස ඉවත දමනු ලැබී ය; අද අප පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී යෙදූ වැරදි ප්‍රතිපත්තිය නිවැරදි ලෙස ඉවත දමා, කලින් තිබුණු නිවැරදි ප්‍රතිපත්තිය නැවත පණගන්වා ගෙන සිටිමු. කෙසේ වේවා, අප විසින් පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයෙහි වූ හැම දෙයක් ම අහක දමා නැත, ඊට කලින් වූ හැම දෙයක් ම නැවත පණගන්වා ද නැත. අප නැවත පණගන්වා ඇත්තේ අතීතයෙහි තිබුණු හොඳ දේ පමණකි, ඉවත දමා ඇත්තේ පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරය පැවති වකවනුවේ වැරදි පමණකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගොරිල්ලා–වාදයට පැති දෙකක් තිබේ. එකක් අනිත්‍යතාව යි; එනම්, අමධ්‍යගතතාව, ඒකාකාරත්වයක් නොමැතිවීම, දැඩි විනයක් නො තිබීම සහ, වැඩ කරන සරල ක්‍රම යි. මේ අංගලක්ෂණ ලියලුවේ රතු හමුදාවේ ළදරුබවෙන් ය; ඉන් සමහරක් ඒ කාලයේ උවමනා කළ දේ ම විය. රතු හමුදාව වඩා උසස් අවස්ථාවකට පැමිණෙන කල, අපි එය වඩා මධ්‍යගත කරනලද්දක්, වඩා ඒකීය කරනලද්දක්, වඩා විනය ගරුක වූවක් සහ තම වැඩ වඩා පරිපූර්ණ ලෙස කරන්නක් — කොටින්, ලක්ෂණයෙන් වඩා නිත්‍ය වූවක් — කරන සේ ඒ අංගලක්ෂණ අනුක්‍රමයෙන් ද හැඟීම් සහිත ව ද ලොප් කර දැමිය යුත්තෙමු. සටන්ව්‍යාපාර වලට මග පෙන්වීමේදී ත්, අපි උසස් අවස්ථාවකදී තව දුරට ත් උවමනා නො කරන විධියේ ගොරිල්ලා අංගලක්ෂණ ද අනුක්‍රමයෙන් සහ හැඟීම් සහිත ව අඩු කළ යුත්තෙමු. මේ අතින් ප්‍රගතිය සලසා ගැනීම ප්‍රතික්ෂේප කිරීම සහ පරණ අවස්ථාවට මුරණ්ඩු ලෙස ඇලී සිටීම අයෝග්‍ය ය, හානිකර ය, විශාල–පරිමාණයේ සටන්ව්‍යාපාර වලට අනර්ථදායක ය.

ගොරිල්ලා–වාදයේ අනික් පැත්ත ජංගම සංග්‍රාමය පිළිබඳ මූලධර්මය, උපායමාර්ගික සහ උපක්‍රමික යන සටන්ව්‍යාපාර දෙකේ ම ඇති දැනට තවම අවශ්‍ය ව පවතින ගොරිල්ලා ලක්ෂණය, අපේ කඳවුරු ප්‍රදේශ වල අනිවාර්ය අනිස්ථිරතාව, කඳවුරු ප්‍රදේශ වල සංවර්ධනය සැලැස්ම කිරීමේදී තිබෙන නැමෙන සුලු ගතිය සහ, රතු හමුදාව ගොඩනැඟීමේදී නියම කාලයට පෙර එය නිත්‍යතාවට පත් කිරීම ප්‍රතික්ෂේප කිරීම යන මේවායින් යුක්ත වේ. මේ සම්බන්ධයෙන්, ඉතිහාසයේ සත්‍ය කරුණු නැතැ'යි කීම, ප්‍රයෝජනවත් දේ ඉතිරි කර තබා ගැනීමට විරුද්ධ වීම සහ, තවම අත පොවන හරියක නො වන්නා වූ ද සැබෑ වැදගත්කමක් නොමැත්තා වූ ද ''අළුත් අවස්ථාවක්'' දෙසට අන්ධ ලෙස කඩාබිඳගෙන දුවනු පිණිස වර්තමාන අවස්ථාව කලබලයෙන් අත හැර යාම යන මේවා ත් අපේ වර්තමාන සටන්ව්‍යාපාර වලට එසේ ම අයෝග්‍ය ය, අවාසිදායක ය, හානිකර ය.

රතු හමුදාව කාර්මික වශයෙන් සජ්ජිත කිරීම ත් සංවිධානය කිරීම ත් සම්බන්ධයෙන් අපි දැන් අළුත් අවස්ථාවක් කරා හොඳට ම ළං වී සිටිමු. අපි මේ අළුත් අවස්ථාවට මාරු වෙන්ට සූදානම් වී සිටිය යුත්තෙමු, අප සූදානම් නො වීම අපේ අනාගත සංග්‍රාමයට වරදක් සහ හානියක් වෙන්ට පුළුවන. අනාගතයේදී, රතු හමුදාවෙහි කාර්මික සහ සංවිධානාත්මක තත්වයන් වෙනස් වූ කල සහ රතු හමුදාව ගොඩනැඟීම අළුත් අවස්ථාවකට පිවිසි කල, එහි සටන්ව්‍යාපාර ගෙනයන දිසාවන් සහ සටන් පේළි වඩා ස්ථාවර වෙනවා ඇත, වැඩි වැඩියෙන් ස්ථානගත සංග්‍රාමය ඇති වෙනවා ඇත; යුද්ධයේ, අපේ භූමිප්‍රදේශයේ සහ අපේ සංවර්ධන වැඩ වල අනිස්ථිරතාව බෙහෙවින් ම අඩු වී, අන්තිමේදී අතුරුදන් වෙනවා ඇත; අප සතුරාගේ

වැඩි–බලය සහ ඔහු අගල් කැණගෙන තරයේ අරක්ගෙන සිටින ස්ථාන වැනි වර්තමාන සීමාකිරීම් වලින් තව දුරට ත් සම්බාධිත නො වෙනවා ඇත.

දැනට අපි එක් අතකින් ''වාම'' අවස්ථාවාදයේ ආධිපත්‍යය පැවති වකවානුවේදී ගත් වැරදි පියවර වලට ද, අනික් අතින් සිය ළදරු–වියේදී රතු හමුදාව කෙරෙහි වූ, එහෙත් දැන් අනවශ්‍ය වන, අනිත්‍ය අංගලක්ෂණ බොහෝවක් නැවත පණගන්වනවාට ද විරුද්ධ වෙමු. එහෙත් අපි රතු හමුදාව නො වෙනස් ව ම තම ජයග්‍රහණයන් දිනා ගත්තේ හමුදාව ගොඩනැඟීම පිළිබඳ වූ ත් උපායමාර්ගය සහ උපක්‍රම පිළිබඳ වූ ත් යම් අගනා මූලධර්ම රාශියක් මගින් ද ඒ මූලධර්ම යථා තත්වයට පත් කිරීමෙහි ලා ස්ථිර විය යුත්තෙමු. අද සතුරා දමා ජය දිනා ගනු පිණිස ත්, අනාගතයේදී අළුත් අවස්ථාවට මාරු වීමට සූදානම් වනු පිණිස ත්, අපි අතීතයෙන් ලැබෙන සියලු හොඳ දේ ක්‍රමානුකූල වූ ද, වඩා උසස් ලෙස වර්ධනය කළා වූ ද, වඩා ආඪ්‍ය වූ ද යුද්ධමය ක්‍රියාමාර්ගයක් තුළ සම්පිණ්ඩනය කළ යුත්තෙමු,

ඔත්තු බැලීම, විනිශ්චය, තීරණය, සටනට පිළිවෙල වීම, විධානය, සැඟවී සිටීම, ඒකරාශි වීම, ඉදිරියට ගමන් කිරීම, සේනා වින්‍යාසය, ප්‍රහරණය, ලුහුබැඳීම, උන්හිටි ගමන් කරන ප්‍රහරණය, ස්ථානගත ප්‍රහරණය, ස්ථානගත ආරක්ෂණය, පුණ්ඩු සටන, පසුබැසීම, රාත්‍රි සටන්, විශේෂ සටන්ව්‍යාපාර, බලවතා මගහැර දුබලයාට පහර දීම, සතුරාගේ අතිරේක සේනාවන්ට පහර ගසනු පිණිස ඔහු වට කර තිබීම, ව්‍යාජ ප්‍රහරණය, ගුවන්යානාවන් ගෙන් ආරක්ෂාවීම, සතුරු බලසේනා කීපයක් අතර ක්‍රියා කිරීම, සටන්ව්‍යාපාර මග හැර යාම, එක පිට ම කරගෙන යන සටන්ව්‍යාපාර, පසුමුණක් නොමැතිව ක්‍රියා කරගෙන යාම, විවේක ගැනීමේ සහ ශක්තිය ගොඩනඟාගැනීමේ උවමනාව වැනි ගැටළු රැසක් ජංගම සංග්‍රාමය කරගෙන යාමට පැටලී ඇත. මේ ගැටළු වලින් රතු හමුදාවේ ඉතිහාසයෙහි විශේෂිත අංග රැසක් ප්‍රදර්ශනය විය; මේ අංග යුද්ධව්‍යාපාර පිළිබඳ විද්‍යාවේදී ක්‍රමවත් ලෙස විස්තර කොට සම්පිණ්ඩනය කළ යුතු ය; මම මෙහිදී ඒවාට නො බහිමි.

8. ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ යුද්ධය

උපායමාර්ගික වශයෙන් දිග්ගැසුණු යුද්ධයක් ද ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ යුද්ධව්‍යාපාර හෝ සටන් ද එක ම දෙයේ පැති දෙකක්, සිවිල් යුද්ධ වලදී සමාන ලෙස ත් එක විට ම ත් අවධාරණය කළ යුතු වූ ද අධිරාජ්‍ය–විරෝධී යුද්ධ වලදී ත් යෙදිය හැකි වූ ද මූලධර්ම දෙකක්, වේ.

ප්‍රතිගාමී බලසේනාවන් ඉතා බලවත් නිසා, විප්ලවවාදී බලසේනාවන් වැඩෙන්නේ අනුක්‍රමයෙන් පමණකි; මේ සත්‍ය කාරණය අපේ යුද්ධයේ දිග්ගැසුණු ස්වභාවය නිශ්චය කරයි. මෙහිදී නොඉවසිලිමත් ගතිය හානිකර ය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

''ඉක්මනින් විසඳුමක් ලබා ගැනීම'' වෙනුවෙන් කතා කිරීම වැරදි ය. අප කර තිබෙන්නාක් මෙන් දස අවුරුද්දක් ම විප්ලවවාදි යුද්ධයක් කිරීම වෙන රටවල් වල විස්මයජනක දෙයක් වෙන්ට ඉඩ තිබේ; එහෙත් අපට නම් එය ''කකුල්-අටේ රචනාවක'' ආරම්භක කොටස — ''තේමාව ඉදිරිපත් කිරීම, විස්තාර කිරීම සහ එහි මූලික විවරණය''[37] — වැනි ය, ත්‍රාසජනක කොටස් බොහෝවක් තවම එන්ට තිබේ. අනාගත සිද්ධීන්ගේ වර්ධනය දේශීය සහ ජාත්‍යන්තර තත්වයන්ගේ බලපෑම යටතේ බෙහෙවින් ම වේග-වත් කරනු ලබනවාට සැකයක් නැත. ජාත්‍යන්තර සහ දේශීය තත්වයෙහි දැනට ම වෙනස්වීම් ඇති වී තිබෙන නිසා ද, වඩාත් විශාල වෙනස්වීම් වේගෙන එන නිසා ද, අප සෙමින් සෙමින් වර්ධනය වීමේ සහ හුදකලා ව සටන් කිරීමේ අතීත තත්වය ඉක්මවා වැඩී සිටින බව කිව හැකි ය. එහෙත් අපි එක රැයින් ම සාර්ථක වීම බලාපොරොත්තු නො විය යුත්තෙමු. ''උදේ කෑමට කලින් සතුරා අතුගා දැමීම''ට කරන අපේක්ෂණය අභිවාදනීය ය; එහෙත් එසේ කිරීමට ඇත්තට ම සැලැස්ම සම්පාදනය කිරීම නරක ය. චීනයේ ප්‍රතිගාමී බලසේනාවන්ට බොහෝ අධිරාජ්‍යවාදි බලවතුන් ගෙන් අනුබල ලැබෙන හෙයින්, චීනයේ විප්ලවවාදි බලසේනාවන් අපේ අභ්‍යන්තර සහ බාහිර සතුරන්ගේ ප්‍රධාන ස්ථාන බිඳීමට ප්‍රමාණවත් තරම් ශක්තිය ගොඩ-නඟා ගන්නා තුරු ද, ජාත්‍යන්තර විප්ලවවාදි බලසේනාවන් විසින් ජාත්‍යන්තර ප්‍රතිගාමී බලසේනා වැඩි කොටසක් තළා දමන තුරු හෝ හිර කර තබන තුරු ද, අපේ විප්ලවවාදි යුද්ධය දිගට ම දිග්ගැසුණු එකක් ව පවතිනවා ඇත. දිගු කලක් අල්ලා සිටින සංග්‍රාමය පිළිබඳ අපේ උපාය-මාර්ගය සකස් කිරීමේදී මේ කාරණයෙන් පටන්ගෙන ඉදිරියට යාම අපේ උපායමාර්ගයට මග පෙන්වන වැදගත් මූලධර්ම අතුරෙන් එකකි.

යුද්ධව්‍යාපාර සහ සටන් සම්බන්ධයෙන් සැබෑ වන්නේ එහි අනික් පැත්ත ය — මෙහිදී මූලධර්මය වන්නේ දිග්ගැසුණුබව නො ව ඉක්මනින් විසඳුමක් ලබා ගැනීම යි. යුද්ධව්‍යාපාර වලදී සහ සටන් වලදී ඉක්මනින් විසඳුමක් සොයනු ලැබේ; මෙය හැම කල්හි ම සහ හැම රටවල් වලදී ම සැබෑ ය. මුළු එකක් වශයෙන් යුද්ධයකදී ද, හැම කල්හි ම සහ හැම රටවල් වල ම ඉක්මනින් විසඳුමක් සොයනු ලැබේ; දිගින් දිගට යන යුද්ධයක් හානිකර ය'යි කල්පනා කරනු ලැබේ. කෙසේ වෙතත්, චීනයේ යුද්ධය ගැන ලොකු ම ඉවසිල්ලකින් ක්‍රියා කළ යුතු ය, එය දිග්ගැසුණු යුද්ධයක් සේ සලකා සංග්‍රහ කළ යුතු ය. ලි ලි-සාන් ක්‍රියාමාර්ගය පැවති කාලයේ, සමහර අය අප වැඩ කරගෙන ගිය විධිය ''හෙවනැලි බොක්සිං උපක්‍රම'' වැනි ය'යි කියමින් ඊට සරදම් කළහ (එයින් අදහස් කළේ ලොකු නගර අල්ලන්ට යන්ට පෙර පස්සට යමින් ඉස්සරහට එමින් බොහෝ සටන් කිරීමේ අපේ උපක්‍රම යි), අපේ කෙස් පැහෙන තුරු විප්ලවයේ ජයග්‍රහණය දකින්ට අපට බැරි වෙනවා ඇතැ'යි කීහ. එබඳු නොඉවසිලිමත් ගතියක් වැරදි බව බොහෝ

කලකට උඩදීම ඔප්පු විය. එහෙත් ඔවුන්ගේ විවේචනය උපායමාර්ගයට නො ව යුද්ධව්‍යාපාර සහ සටන් වලට යොදනලද්දේ වී නම්, එය හරියට ම හරි වන්නට තිබුණි; ඒ මතු දක්වන හේතු නිසා ය. පළමුකොට, තම ආයුධ සහ වෙසෙසින් තම වෙඩිබෙහෙත් නැවත නැවත සපයා ගත හැකි තැන් රතු හමුදවට නැත; දෙවැනිව, සුදු බලසේනාවන් බොහෝ හමුදවන් ගෙන් සමන්විත වී සිටින අතර, රතු හමුද තිබෙන්නේ එකක් පමණකි; එය එක් එක් ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය සිඳ බිඳ දමනු වස් පිට පිට යුහු යුහු ව එක් සටන්ව්‍යාපාරයකට පසු අනිකක් කරනු පිණිස සූදනම් කළ යුතු ය; සුදු හමුද ඉදිරියට ගමන් කරන්නේ වෙන වෙන ම නමුත් ඒවා අතුරෙන් වැඩි ගණනක් එකිනෙකට තරමක් කිට්ටුවෙන් ගමන් කරයි, ඉන් එකකට පහර දීමේදී ඉක්මනින් විසඳුමක් ලබා ගන්ට අපට බැරි වුණොත්, සෙසු සියල්ල අප මත එක විට කඩා පනිනවා ඇත. මේ හේතු නිසා අප විසින් ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ සටන් කළ යුතු ව තිබේ; සටනක් පැය කීපයකින් හෝ, දවසකින් දෙකකින් අවසන් කිරීම අප සාමාන්‍යයෙන් කරන දෙයකි. සතුරා වට කරගෙන සිටින අපේ සටන්ව්‍යාපාර වලදී එක්තරා ප්‍රමාණයක දිග්ගැසුණුබවක් පිණිස අප සූදනම් ව සිටින්නේ අපේ සැලැස්ම ''සතුරාගේ අතිරේක ආධාර සේනාවන්ට පහර ගසනු පිණිස ඔහු වට කරගෙන සිටීම'' වන විට සහ අපේ අභිප්‍රාය වට කළ සතුරාට නො ව ඔහුගේ අතිරේක ආධාර සේනාවන්ට පහර ගැසීම වන විට පමණකි; එහෙත් එවිට පවා අප සොයන්නේ අතිරේක ආධාර සේනාවන්ට විරුද්ධ ව ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමට ය. අප උපායමාර්ගික වශයෙන් ආරක්ෂා-වීමෙහි යෙදී සිටින විට සහ අල්ලාගෙන සිටින පෙරමුණක ස්ථාන දැඩි ලෙස රකිමින් සිටින විට, එසේත් නැතහොත්, අප, උපායමාර්ගික පහර-දීමකදී, ආධාර ලැබීමෙන් කපා දමනු ලැබ තනි වී සිටින සතුරු බලසේනාවන්ට පහර දෙමින් සිටින විට හෝ අපේ කඳවුරු ප්‍රදේශ තුළ සුදු රක්ෂස්ථාන උපුටා දමමින් සිටින විට, දිග්ගැසුණු සටන්ව්‍යාපාර පිළිබඳ සැලැස්මක් යුද්ධව්‍යාපාර හෝ සටන් වලදී බොහෝ විට යොදනු ලැබේ. එහෙත් මේ වර්ගයේ දිග්ගැසුණු සටන්ව්‍යාපාර ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ තම සටන් වලදී ප්‍රධාන රතු හමුද බලසේනාවට අවහිරයක් වෙනවාට වඩා ආධාරයක් වේ.

හුදෙක් උවමනා කළ පමණකින් ම ඉක්මනින් විසඳුමක් ලබා ගත නො හැකි ය, ඊට බොහෝ විශේෂිත කරුණු අවශ්‍ය වේ. ප්‍රධාන වශයෙන් උවමනා කරන දේ මේවා ය: ප්‍රමාණවත් පරිදි කරන සූදනම, නිසි මොහොත අල්ලා-ගැනීම, වැඩි බලයක් ඇති බලසේනාවන් ඒකරාශි කිරීම, වටලෑමේ සහ අංශයකින් වට කිරීමේ උපක්‍රම, හිතකර භූමිභාග, සතුරා ගමන් කරමින් සිටින විට හෝ ඔහු නතර වී සිටින නමුත් එතෙක් ම තමා සිටින තැන් තහවුරු කරගෙන නැති විට ඔහුට පහර ගැසීම. මේ උවමනා කරන දේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉටු වේ නම් මිස, යුද්ධව්‍යාපාරයකදී හෝ සටනකදී හෝ ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමට කොහෙත් ම බැරි ය.

සතුරු ''වටලෑමක් හා මැඩලීමක්'' සිඳ බිඳ දැමීම ප්‍රධාන යුද්ධව්‍යාපාරයකි; එහෙත් එහි ලා යෙදෙන්නේ ද ඉක්මනින් විසඳුමක් ලබා ගැනීම පිළිබඳ මූලධර්මය ම ය, දිග්ගැස්සුණුබව පිළිබඳ මූලධර්මය නො වේ. කඳවුරු ප්‍රදේශයක මිනිස්බලය, මුදල් අතින් ඇති වත්පොහොසත්කම් සහ යුද්ධ ශක්තිය දිග්ගැස්සුණුබවට ඉඩ නො දෙන නිසා ය.

ඉක්මනින් විසඳුමක් ලබා ගැනීම සාමාන්‍ය මූලධර්මය වන අතර, අපි නොනිසි නොඉවසිලිමත් ගතියට ද විරුද්ධ විය යුත්තෙමු. විප්ලවවාදී කඳවුරු ප්‍රදේශයක යුද්ධමය සහ දේශපාලන නායකත්වය දෙන උසස් ම මණ්ඩලය, ස්වකීය කඳවුරු ප්‍රදේශයෙහි වටාපිටා තත්වයන් සහ සතුරාගේ තත්වය සැලකිල්ලට ගනිමින්, ඔහුගේ ඔළමොළ ගතිය නිසා බියපත් නො වී, විඳ දරා ගත හැකි දුක් කරදර නිසා උදාසීන නො වී, නැතහොත් සිදු වන ඇබැද්දි නිසා කලකිරීමට පත් නො වී, ඕනෑ කරන ඉවසිල්ල ත් උහුලා සිටීමේ ශක්තිය ත් ඇති ව සිටීම මුළුමනින් ම අවශ්‍ය ය. වියාංසි පළාතෙහි පළමුවැනි සතුරු ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය සිඳ බිඳ දැමීමට මුල් සටනේ සිට අවසාන සටන තෙක් ගත වූයේ එක් සතියක් පමණකි; දෙවැන්න යන්තම් දෙ සතියකින් සිඳ බිඳ දමනලදී; තුන්වැන්න සිඳ බිඳ දැමීමට පෙර තුන් මසක් ම ඇද්දි ඇද්දී ගියේ ය; සිව්වැන්නට ගත වූණේ සති තුනකි; පස්වැන්න පුරා අවුරුද්දක් ම අපේ විඳ දරා ගැනීමේ ශක්තිය වෙහෙසුවේ ය. සතුරාගේ පස්වැනි යුද්ධව්‍යාපාරය සිඳ බිඳ දමන්ට බැරි වූ පසු ඔහුගේ වටලෑම කඩාගෙන එළියට පැනගන්ට අපට බලෙන් ම සිදු වූ විට, අපි අයුතු ඉක්මන්කාරකමක් පළ කළෙමු. ඒ අවස්ථාවේ තිබුණු වටාපිටා තත්වයන් තුළ, අපට, විවේකය සහ ප්‍රතිසංවිධානය පිණිස හටකණ්ඩායම් වලට කාලයක් දෙමින්, තව මාස දෙකක් හෝ තුනක් අල්ලාගෙන සිටින්ට හොඳට ම පුළුවන්කම තිබුණි. එසේ කරනලද නම් සහ, අප කඩාගෙන එළියට පැනගත් පසු නායකත්වය ඊට වඩා ටිකක් නුවණැති වී නම්, ප්‍රතිඵලය බෙහෙවින් ම වෙනස් වෙන්ට ඉඩ තිබුණි.

ඒ සියල්ල නිසා, යුද්ධව්‍යාපාරයක් පවත්නා කාලය හැකි හැම මගකින් ම කෙටි කිරීමේ මූලධර්මය වලංගු ව පවතී. ඇතුල් පේළි වලදී (ඒ කියන්නේ, කඳවුරු ප්‍රදේශ තුළදී) සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදිය හැකි ශක්තිය විනාශ කිරීම ත් ඔහුගේ ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය ඉක්මනින් පරාජය කිරීම ත් සහතික කරනු වස්, හටකණ්ඩායම් ඒකරාශි කිරීම, ජංගම සංග්‍රාමය යනාදියෙහි ලා අප අපේ වැඩි ම පරිශ්‍රමය යෙදීම යුද්ධව්‍යාපාර සැලැස්ම සහ සටන් සැලැස්ම මගින් ඉල්ලා සිටිය යුතු ය; එහෙත් අපේ ඇතුල් පේළි වලදී යුද්ධව්‍යාපාරය අවසන් කළ නො හැකි බව පෙනී

යන තැනකදී, අපි අපේ බාහිර පේළි වලදී (ඒ කියන්නේ සතුරාගේ ඇතුල් පේළි වලදී) සතුරා පරාජය කරනු වස් ඔහුගේ වටලෑම කඩාගෙන එළියට පැන ඒ බාහිර පේළි වලට මාරුවෙන්නට ප්‍රධාන රතු හමුදා බලසේනාව යෙදිය යුත්තෙමු. දැන් සතුරා ඔහුගේ යුදමුරගෙවල් සංග්‍රාමය උසස් අඩියකට දියුණු කර ඇති හෙයින්, මෙය අප සටන් කරගෙන යන සාමාන්‍ය ක්‍රමය වෙනවා ඇත. අපේ පස්වැනි යුද්ධව්‍යාපාරය පටන්ගෙන දෙ මසකට පසු, ෆූචියන් සිද්ධිය[38] ඇති වූ කාලයේ, රතු හමුදාවේ ප්‍රධාන බලසේනාවන්, අපේ උපායමාර්ගික ආරක්ෂාවීම උපායමාර්ගික පහරදීමකට හරවමින් ද, සතුරාගේ මර්මස්ථාන වලට තර්ජනය කරමින් ද, යුදමුරගෙවල් නො තිබුණු සුවිශාල ප්‍රදේශයන්හි සටන් වදින්ට සොයමින් ද, චෙච්යාං මධ්‍යස්ථානය වශයෙන් තිබුණු චියාංසු–චෙච්යාං–අන්හ්වෙයි–චියාන්සි ප්‍රාන්තය තුළට කිසි සැකයක් නැති ව ම වැදී, හැන්චව්, සූචව්, නැන්කිං, වූහූ, නාන්චාං සහ පූචව් යන නගර අතර ප්‍රදේශය පුරා දිගට හරහට පිසගෙන යා යුතු ව තිබුණි. එබඳු මාර්ග වලින් අපට දකුණු චියාංසි පළාතට ත් බටහිරි ෆූචියන් පළාතට ත් පහර දෙමින් සිටි සතුරාට තම මර්මස්ථාන රැක ගැනීම පිණිස ආපසු හැරෙන්ට බල කිරීමට ත්, චියාංසි පළාතෙහි කඳවුරු ප්‍රදේශයට ඔහු දෙමින් සිටි ප්‍රහාරය බිඳීමට ත්, ෆූචියන් මහජන ආණ්ඩුවට ආධාර දීමට ත් පුළුවන්කම තිබුණි — අපට සත්තකින් ම මේ මගින් ඒ ආණ්ඩුවට ආධාර කරන්ට පුළුවන්කම තිබුණි. මේ සැලැස්ම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෙයින්, සතුරාගේ පස්වැනි ''වටලෑමේ සහ මැඩලීමේ'' යුද්ධව්‍යාපාරය බිඳින්ට බැරි විය, ෆූචියන් මහජන ආණ්ඩුව නො වැළකිය හැකි ලෙස ම ඇදවැටුණි. අවුරුද්දක් සටන් කළ පසු ව පවා, අප චෙච්යාං පළාත බලා ඉදිරියට ගමන් කිරීම අනුචිත බවට පත් වී තිබුණු නමුත්, අපේ ප්‍රධාන බලසේනාවන් හූනානය දෙසට ගමන් කරවීමෙන්, ඒ කියන්නේ හූනානය තුළින් ක්වෙයිචව් පළාතට යනවා වෙනුවට මැද හූනානයට කාගෙන යමින්, වෙන දිසාවක උපායමාර්ගික පහරදීමක් කිරීමට හැරෙන්ට අපට පුළුවන්කම තිබුණි; මේ අයුරින් සතුරා චියාංසි පළාතෙන් හූනාන් පළාතට උපායෙන් ගෙන්වාගෙන, එහිදී ඔහු විනාශ කරන්ට ඉඩ තිබුණි. මේ සැලැස්ම ත් ප්‍රතික්ෂේප කරනලද හෙයින්, සතුරාගේ පස්වැනි යුද්ධව්‍යාපාරය බිඳීමේ සියලු බලාපොරොත්තු අන්තිමේදී සුන් වී ගියේ ය; දීර්ඝ ගමන යන්ට පටන්ගැනීම විනා කළ හැකි වෙන දෙයක් අපට තිබුණේ නැත.

9. මුලසුන් කිරීමේ යුද්ධය

අද රතු හමුදාව වෙනුවෙන් ''වැහැරීමේ තරගයක්'' අනුමත කරමින් කතා කිරීම අනුචිත ය. මකර රජුන් අතර ම මිස මකර රජකු සහ හිඟන්නකු අතර ''වස්තු තරගයක්'' හාස්‍යජනක වෙනවා ඇත. තම සපයන–දේ සියල්ල ම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පාගේ සතුරා ගෙන් ම ලබා ගන්නා රතු හමුදවට, මූලික ප්‍රතිපත්තිය වන්නේ මුලසුන් කිරීමේ යුද්ධය යි. සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදිය හැකි ශක්තිය මුලසුන් කිරීමෙන් පමණකි ඔහුගේ "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධ-ව්‍යාපාර සිඳ බිඳ දමන්ට ත් අපේ විප්ලවවාදී කඳවුරු ප්‍රදේශ පළල් කරන්ට ත් අපට හැකි වන්නේ. තුවාල කිරීම සහ මැරීම සතුරා මුලසුන් කිරීමේ මගක් වේ; නො එසේ නම් එහි තේරුමක් නැත. සතුරාට තුවාල හා මරණ සිදු කිරීමේදී අපි අපට ත් අලාබ හානි සිදු කර ගනිමු; එහෙත් අපි ඔහුගේ සේනාංග මුලසුන් කිරීමෙන් අපේ අඩුපාඩු සම්පූර්ණ කර ගනිමු; එමගින්, අපට සිදු වන පාඩු පිරිමසා ගැනීම පමණක් නො ව අපේ හමුදවේ ශක්තිය වැඩි කර ගැනීම ද කරමු. මහත් ශක්තියක් ඇති සතුරකු හා කරන තරගයකදී සතුරා පළවා හරින සටනක් මූලික වශයෙන් තීරණාත්මක නො වේ. මුලසුන් කිරීමේ සටනක්, අනික් අතට, කවර සතුරකු කෙරෙහි වුව මහත් වූ ත් ක්ෂණික වූ ත් ගැටීමක් සිදු කරයි. මිනිසකුගේ ඇඟිලි දහය ම තුවාල කිරීම එක ඇඟිල්ලක් කපා දැමීම තරම් විපාකදයක නො වේ; සතුරු ඩිවිසන් දහයක් පළවා හැරීම ඉන් එකක් මුලසුන් කිරීම තරම් විපාකදයක නො වේ.

සතුරාගේ පළමුවැනි, දෙවැනි, තුන්වැනි සහ සිව්වැනි "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාර ගැන ක්‍රියා කිරීම සඳහා අපේ ප්‍රතිපත්තිය වූයේ මුලසුන් කිරීමේ යුද්ධය යි. එක් එක් යුද්ධව්‍යාපාරයේදී මුලසුන් කළ බල-සේනාවෝ ඔහුගේ මුළු ශක්තියෙන් කොටසක් පමණක් වූහ; එසේ ද වුව මේ සියලු "වටලෑමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාර සිඳ බිඳ දමනලදී. කෙසේ වේවා, අපේ පස්වැනි ප්‍රති–යුද්ධව්‍යාපාරයේදී ඊට ප්‍රතිපක්ෂ ප්‍රතිපත්තිය අනුගමනය කරනලදී; එය ඇත්ත වශයෙන් තම අරමුණු මුදුන්පත් කරගන්ට සතුරාට ආධාරයක් විය.

මුලසුන් කිරීමේ යුද්ධය වැඩි බලයක් ඇති බලසේනාවන් ඒකරාශි කිරීම ත් වටකිරීමේ සහ අංශයකින් වටකිරීමේ උපක්‍රම යෙදීම ත් අවශ්‍ය කරයි, අපට පසු ව කී එක නැති ව මුලින් කී එක නො කළ හැකි ය. මහජන අනුබලය, හිතකර භූමිභාගය, බිඳ හෙළිය හැකි සතුරු සේනාවක් සිටීම සහ හදිස්සියෙන් ම කඩාපැනීමේ වාසිය වැනි කරුණු මුලසුන් කිරීමේ කාරිය පිණිස නැති ව ම බැරි ය.

එක් සතුරු බලසේනාවක් නිකම් පළවා හැරීම හෝ ගැලවී යන්ට ඊට ඉඩ දීම තේරුමක් ඇති දෙයක් වන්නේ, මුළු එකක් වශයෙන් සටනේදී හෝ යුද්ධව්‍යාපාරයේදී, අපේ ප්‍රධාන බලසේනාව තම මුලසුන් කිරීමේ සටන්-ව්‍යාපාර වෙන සතුරු බලසේනාවකට විරුද්ධ ව ඒකරාශි කරමින් සිටිනවා නම් පමණකි, නො එසේ නම් එහි තේරුමක් නැත. මෙහිදී සිදුවන පාඩු ලැබෙන ලාභ නිසා තේරුමක් ඇති දෙයක් වේ.

අපේ ම යුද්ධ කර්මාන්තය පිහිටුවීමේදී අපි ඒ මත අපේ විශ්වාසය තබා සිටීමට අපට ඉඩ නො දිය යුත්තෙමු. අපේ මූලික ප්‍රතිපත්තිය අධිරාජ්‍ය-වාදී රටවල් වල ත් අපේ දේශීය සතුරාගේ ත් යුද්ධ කර්මාන්ත කෙරෙහි විශ්වාසය තබාගෙන සිටීම යි. හාන්යාං නුවර මෙන් ම ලන්ඩන් නුවර යුද්ධායුධ කම්හල් වල නිපදවන දේට අයිතිවාසිකමක් අපට තිබේ; එමතු නො ව, ඒවා සතුරාගේ ප්‍රවාහණ බළකායයන් විසින් අප වෙත ගෙනවුත් බාර දෙනු ලැබේ. මෙය සන්සුන් සත්‍යය වේ, එය කොලොප්පමක් නො වේ.

ස ට හ න්

[1]උතුරු යුදගමන යනු 1926 මැයි-ජූලි මාස වලදී ක්වංතුං පළාතේ සිට උතුරට ගමන් කළ විප්ලවවාදී හමුදව විසින් උතුරු යුදදෙටුවන්ට දඬුවම් දෙනු පිණිස දියත් කරනලද යුද්ධය විය. චීන කොමියුනිස්ට පක්ෂය නායකත්වයට සහභාගි වී සිටී, පක්ෂයේ බලපෑම යටතේ වූ (එකල හමුදවේ දේශපාලන වැඩ වැඩිහරියක් තිබුණේ කොමියුනිස්ට පක්ෂ සාමාජිකයන්ගේ බාරේ ය), උතුරු යුදගමන් හමුදව කම්කරුවන් සහ ගොවියන් අතර පුළුල් සමූහයන්ගේ උණුසුම් අනුබලය දිනා ගත්තේ ය. 1926යේ දෙවැනි භාගයේදී ත් 1927තේ පළමුවැනි භාගයේදී ත් ඒ හමුදව යැංසි ගඟ සහ කහ ගඟ ඔස්සේ පිහිටි පළාත් වැඩි ගණනක් අල්ලා-ගෙන, උතුරු යුදදෙටුවන් පරාජය කළේ ය. 1927තේ අප්‍රේල් මාසයේදී විප්ලවවාදී හමුදව තුළ සිටි චියාං කායි-ශෙක් යටතේ වූ ප්‍රතිගාමී කල්ලිය විසින් කළ පාවාදීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ විප්ලවවාදී යුද්ධය ව්‍යර්ථ විය.

[2]උපායමාර්ග විද්‍යාව, යුද්ධව්‍යාපාර විද්‍යාව සහ උපක්‍රම විද්‍යාව යන සියල්ල ම චීන යුද්ධ විද්‍යාවේ සංයුක්ත කොටස් ය. උපායමාර්ග විද්‍යාව මුළු එකක් වශයෙන් යුද්ධ තත්වය පාලනය කරන නීති ගැන උගන්වයි. යුද්ධව්‍යාපාර විද්‍යාව යුද්ධව්‍යාපාර පාලනය කරන නීති ගැන උගන්වයි, යුද්ධව්‍යාපාර වලට මග පෙන්වීම පිණිස යොදනු ලබයි. උපක්‍රම විද්‍යාව සටන් පාලනය කරන නීති ගැන උගන්වයි, සටන් වලට මග පෙන්වීම පිණිස යොදනු ලබයි.

[3]සුන් ත්සු වශයෙන් ද ප්‍රසිද්ධ සුන් වූ ත්සු හෙවත් සුන් වූ ක්‍රි: පූ: 5වැනි සියවසේ විසූ චීන සෙබළකු සහ යුද්ධ විද්‍යාඥයෙක් විය. ඔහු පරිච්ඡේද දහතුනකින් යුක්ත යුද්ධය ගැන සංග්‍රහයක් වූ සුන් ත්සු නමැති පොත ලීවේ ය. මෙහි උපුටා දක්වා ඇති පාඨය "ප්‍රහරණයේ උපායමාර්ගය" නම් වූ 3වැනි පරිච්ඡේදයෙනි.

[4]සහෝදර මාඕ සේතුං 1936දී මේ ලිපිය ලියන කල, 1921 ජූලි මාසයේදී චීන කොමි-යුනිස්ට පක්ෂය පිහිටුවා හරියට ම පසළොස් අවුරුද්දක් ගත වී තිබුණි.

[5]චෙන් තු-ශියු මැයි 4 ව්‍යාපාරය අවට කාලයේදී රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදියෙක් විය. පසුව, ඔක්තෝබර සමාජවාදී විප්ලවයේ බලපෑම යටතේ ඔහු චීන කොමියුනිස්ට පක්ෂය ආරම්භ කළ අය අතුරෙන් එකෙක් විය. පක්ෂය ආරම්භ කොට හය වසක් ගතවන තුරු, ඔහු මධ්‍යම කාරකසභාවේ නායක පදවිය දැරුවේ ය. ඔහුගේ සිතීම බොහෝ කලක සිට බලවත් ලෙස දක්ෂිණවාදී වී තිබුණි. 1924-27 විප්ලවයේ අවසාන භාගයේදී, ඒ සිතීම යටත්වීම්වාදී ක්‍රියාමාර්ගයක් බවට වර්ධනය විය. චෙන් තු-ශියු විසින් නියෝජනය වූ යටත්වීම්වාදියෝ "පක්ෂය ගොවි බහුජනයාට, නාගරික සුළු ධනේශ්වරපංක්තියට සහ මැද ධනේශ්වර-පංක්තියට නායකත්වය දීම සිය කැමැත්තෙන් ම අත හැර දැම්මෝ ය, වෙසෙසින් ම පක්ෂය

සන්නද්ධ සේනාවන්ට නායකත්වය දීම අත හැර දැම්මෝ ය, එසේ විප්ලවයේ පරාජය සිදු කළෝ ය.'' (''වර්තමාන තත්වය සහ අප සතු කර්තව්‍යයෝ'',මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, විදේශ භාෂා මුද්‍රණාලය, පීකිං, 1961, IVවැනි කාණ්ඩය, 171වැනි පිටුව). 1927තේ පරාජයෙන් පසු, චෙන් තු-ශියු සහ වෙනත් යටත්වීම්වාදියෝ අතලොස්සක් විප්ලවයේ අනාගතය ගැන විශ්වාසය නැති කර ගෙන, විසුරුවාහැරීම්වාදින් බවට පත් වූහ. ඔව්හු ප්‍රතිගාමී ට්‍රොට්ස්කිවාදි මගක් ගෙන, ට්‍රොට්ස්කිවාදින් සහ එකතු වී පක්ෂ-විරෝධි කුඩා කණ්ඩායමක් සකස් කළහ. ඒ නිසා 1929, නොවැම්බරයේදී චෙන් තු-ශියු පක්ෂයෙන් නෙරපනු ලැබී ය. ඔහු 1942 දී මළේ ය.

[6]යාමානායෙයන් '' ලි ලි-සාන් ක්‍රියාමාගීය'' වශයෙන් ප්‍රකට, ලි ලි-සාන්ගේ ''වාම'' අවස්ථාවාදය යන්නෙන් සඳහන් වන්නේ 1930 ජූනියේ සිට පටන් ගනිමින් සිව් මසක් පමණ පක්ෂය තුළ පැවතුණා වූ ද, එකල චීන කොමියුනිස්ට පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ ලොකු ම බලපෑමක් තිබුණු නායකයා වූ සහෝදර ලි ලි-සාන් විසින් නියෝජනය වූ ද ''වාම'' අවස්ථා-වාදි ක්‍රියාමාගීය යි. ලි ලි-සාන් ක්‍රියාමාගීයට මතු දක්වන අංගලක්ෂණ තිබුණේ ය; එය පක්ෂයේ හයවැනි ජාතික සම්මේලනයේ ප්‍රතිපත්තිය කඩ කළේ ය; එය විප්ලවය සඳහා බහුජන ශක්තිය ගොඩනැගිය යුතු බව නො පිළිගත්තේ ය, විප්ලවයේ වර්ධනය අසම බව නො පිළිගත්තේ ය; එය බොහෝ කලක් යන තුරු අප ප්‍රධාන වශයෙන් ගම්බද කඳවුරු ප්‍රදේශ ඇති කිරීමට අපේ අවධානය යොමු කළ යුතු ය, නගර වට කිරීමට ගම්බද පෙදෙස් පාවිච්චි කළ යුතු ය, රට පුරා ම විප්ලවයේ උස් වඩදිය රැල්ලක් නැංවීම පිණිස මේ කඳවුරු පාවිච්චි කළ යුතු ය යන සහෝදර මාඕ සේතුංගේ අදහස් ''ගොවි මානසිකත්වයක අංගලක්ෂණය වූ අතිශයින් ම වැරදි . . . ප්‍රාදේශිකවාදයක් සහ හණම්ටිවාදයක්'' ලෙස සැලකී ය; එය රටේ සියලු ම කොටස් වල වහා ම පැනනැඟීම් ඇති කරනු පිණිස කටයුතු සූදනම් කළ යුතු ය යන මතය දැරී ය. මේ වැරදි ක්‍රියාමාර්ගය පදනම කරගෙන, සහෝදර ලි ලි-සාන් රට මුළුල්ලේ ප්‍රධාන නගර වල වහා ම සන්නද්ධ පැනනැඟීම් සංවිධානය කිරීම පිණිස සාහසිකවාදි සැලැස්-මක් සම්පාදනය කළේ ය. ඒ අතර ම, ඔහු, චීන විප්ලවය පොදු වශයෙන් පටන් ගැනීම ලෝක විප්ලවය පොදු වශයෙන් පටන් ගැනීමක් කරා නො වැළැකිය හැකි ලෙස ම මග පාදනවා ඇතැ'යි ද ලෝක විප්ලවය එසේ පටන් නො ගෙන චීන විප්ලවය සාර්ථක නො විය හැකි ය'යි ද යන මතය දරමින්, ලෝක විප්ලවයේ වර්ධනයේ අසමතාව පිළිගැනීම ප්‍රතික්ෂේප කළේ ය; ඔහු එසේ ම, පළාත් එකක හෝ කීපයක ජයග්‍රහණයේ ආරම්භයන් සමාජවාදි විප්-ලවයට පරිවර්තනය වීමේ ආරම්භය සලකුණු කරනවා ඇත යන මතය දරමින්, චීනයේ ධනේශ්වර-ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවයේ දිග්ගැසුණු ස්වභාවය පිළිගැනීම ද ප්‍රතික්ෂේප කළේ ය; එසේ අනුචිත ''වාම'' සාහසිකවාදි ප්‍රතිපත්ති ගණනක් සකස් කළේ ය. සහෝදර මාඕ සේතුං මේ වැරදි ක්‍රියාමාගීයට විරුද්ධ විය; පක්ෂයේ කාඩර්වරුන් සහ සාමාජිකයන් අතර පුළුල් සමූහයා ද ඒ ක්‍රියාමාර්ගයේ වැරදි හරිගැස්සිය යුතු ය'යි ඉල්ලා සිටියහ. 1930 සැප්තැම්බරයෙහි පැවති පක්ෂයේ හයවැනි මධ්‍යම කාරකසභාවේ තුන්වැනි පූර්ණ සැසියේදී, සහෝදර ලි ලි-සාන්, පෙන්වා දී තිබුණු වැරදි බාරගෙන, මධ්‍යම කාරකසභාවෙහි තම නායක පදවිය අත හැරියේ ය. දිගු කලක් තිස්සේ සහෝදර ලි ලි-සාන් තම වැරදි මත නිවැරදි කළේ ය, එහෙයින් පක්ෂයේ හත්වැනි සම්මේලනයේදී ඔහු යළිත් මධ්‍යම කාරකසභාවට තෝරා පත් කරනු ලැබී ය.

[7]1930 සැප්තැම්බරයේදී පවත්වනලද පක්ෂයේ හයවැනි මධ්‍යම කාරකසභාවේ තුන්වැනි පූර්ණ සැසිය සහ ඊට අනතුරු ව ඇති වූ මධ්‍යම නායකත්වය ලි ලි-සාන් ක්‍රියාමාර්ගය අවසන් කරලීමට බොහෝ සක්‍රිය පියවර යෙදී ය. එහෙත් පසු ව, ප්‍රායෝගික විප්ලවවාදි අරගල-යෙහි ලා පළපුරුදුකම් නො තිබුණු පක්ෂ සහෝදරවරුන් ගණනක්, චෙන් ශාඕ-යූ (වොංමිං) සහ චින් පාං-ශියන් (පෝ කු) යන සහෝදරවරුන් ප්‍රමුඛත්වයේ ඇති ව, මධ්‍යම නායකත්වය විසින් ගන්නාලද පියවර වලට විරුද්ධ ව ඉදිරිපත් වූහ. ක්‍රියාමාර්ග දෙක හෙවත් චීන

කොමියුනිස්ට් පක්ෂය තවදුරට ත් බෝල්ශෙවික්වාදි කිරීම පිණිස කරන අරගලය නමැති පොඩි පොතෙහි, ඔව්හු, එකල පක්ෂය තුළ තිබුණු ප්‍රධාන අනතුර වූයේ ''වාම අවස්ථාවාදය'' නො ව ''දක්ෂිණ අවස්ථාවාදය'' ය'යි විශේෂ අවධාරණයකින් යුතු ව තිරකොට කියා සිටියහ; තමන්ගේ ම වැඩකටයුතු හේතු යුක්ති සහගත ය'යි පෙන්වීමට, ඔව්හු ලි ලි-සාන් ක්‍රියාමාර්ගය ''දක්ෂිණවාදි'' ක්‍රියාමාර්ගයක් වශයෙන් ''විවේචනය'' කළහ, ලි ලි-සාන් ක්‍රියාමාර්ගය ත් වෙනත් ''වාම'' අදහස් සහ ප්‍රතිපත්ති ත් අළුත් වෙසකින් දිගට ම ගෙන ගිය, නැවක පණ-ගැන් වූ හෝ වර්ධනය කළ අළුත් දේශපාලන වැඩසටහනක් ඉදිරියට දැමූ ඔව්හු, සහෝදර මාඕ සේතුංගේ නිවැරදි ක්‍රියාමාර්ගයට විරුද්ධ ව සිටියහ. ''චීනයේ විප්ලවවාදි යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු'' නමැති මේ ලිපිය සහෝදර මාඕ සේතුං විසින් ලියනලද්දේ ප්‍රධාන වශයෙන් මේ අළුත් ''වාම'' අවස්ථාවාදි ක්‍රියාමාර්ගයේ යුද්ධමය වැරදි විවේචනය කරනු පිණිස ය. මේ ක්‍රියාමාර්ගය 1931 ජනවාරියෙහි පැවැති හයවැනි මධ්‍යම කාරකසභාවේ සිව්-වැනි පූර්ණ සැසියේ සිට මධ්‍යම කාරකසභාව විසින් 1935 ජනවාරියේදී ක්වෙයිචව් පළාතේ ත්සුන්යි නුවරදී කැඳවනලද දේශපාලන මණ්ඩලයේ රැස්වීම තෙක් පක්ෂය තුළ ප්‍රමුඛ විය; ඒ රැස්වීම මේ වැරදි ක්‍රියාමාර්ගයේ ප්‍රමුඛත්වය අවසන් කොට, සහෝදර මාඕ සේතුං ප්‍රමුඛ අළුත් මධ්‍යම නායකත්වය පිහිටෙව්වේ ය. මේ වැරදි ''වාම'' ක්‍රියාමාර්ගය විශේෂයෙන් ම දීර්ඝ කාලයක් (හතර අවුරුද්දක්) පක්ෂය යට කර ගෙන තිබුණේ ය, පක්ෂයට ත් විප්ලවයට ත් විනාශදායක ප්‍රතිවිපාක සහිත වූ අතිශයින් ම බර අලාබ හානි සිදු කළේ ය. චීන කොමියුනිස්ට පක්ෂයට, චීන රතු හමුදවට සහ එහි කඳවුරු ප්‍රදේශ වලට සියයට 90ක අලාභයක් සිදු කරනු ලැබී ය, විප්ලවවාදී කඳවුරු ප්‍රදේශ වල කෝටි ගණන් ජනයා කුඕමින්තාං පක්ෂයේ කෲර පීඩනයට භාජන වීමට සලසනු ලැබූහ, චීන විප්ලවයේ ප්‍රගතිය අවහිර කරනු ලැබී ය. වැරදි කළ සහෝදරවරුන් අතර ඉමහත් වැඩිපිරිස අත්දැකීමෙන් ඉගෙනගැනීමේ දීර්ඝ ක්‍රියාවලියක් තුළින් තම වැරදි තේරුම් ගෙන, ඒවා නිවැරදි කරගෙන ඇත, පක්ෂය ත් ජනතාව ත් උදෙසා බොහෝ හොඳ වැඩ කර ඇත. සහෝදර මාඕ සේතුංගේ නායකත්වය යටතේ ඔව්හු දැන් පොදු දේශපාලන අවබෝධයක පදනම මත පක්ෂය තුළ සිටින සෙසු සහෝදරවරුන් සමූහයා සමග එක්සත් වී සිටිති.

[8]චාං කුඕ-තාඕ චීන විප්ලවයෙන් පළාගිය ද්‍රෝහියෙක් විය. විප්ලවයෙන් තමාට වාසි ලැබීමට කල්පනා කරමින්, ඔහු තම තරුණ කාලයේදී චීන කොමියුනිස්ට පක්ෂයට බැඳුණේ ය. පක්ෂය තුළ ඔහු බොහෝ වැරදි කළේ ය. අවසන් වූයේ බරපතල අපරාධ කරමින් ය. හොඳට ම ප්‍රසිද්ධ දේ වශයෙන්, 1935දී ඔහු රතු හමුදව උතුරු දෙසට ගමන් කරනවාට විරුද්ධ විය, රතු හමුදව පරාජයවාදි ලෙස ත් දියකරහැරීම්වාදි ලෙස ත් සෙචුආන්-සිකාං දේශසීමාවේ සුළු ජාතීන් වෙසෙන ප්‍රදේශ වලට ඉවත් වී යා යුතු ය'යි කියා සිටියේ ය (සිකාං පළාත 1955 දී අවලංගු කරනලදී; දැන් එයින් කොටසක් සෙචුආන් පළාතේ ද, අනික් කොටස ටිබෙට ස්ව-තන්ත්‍ර ප්‍රාන්තයේ ද අධිකරණ පාලන බලය යටතේ පවතී); ඔහු පක්ෂයට සහ මධ්‍යම කාරක-සභාවට විරුද්ධ ව එළිපිට ම ද්‍රෝහි වැඩකටයුතු වල යෙදුණේ ය, තමාගේ ම බොරු මධ්‍යම කාරකසභාවක් පිහිටෙව්වේ ය, පක්ෂයේ ත් රතු හමුදවේ ත් සමගිය අවුල්පවුල් කළේ ය, එහි සිව්වැනි පෙරමුණු හමුදවට බර අලාභ හානි සිදු කළේ ය. සහෝදර මාඕ සේතුං සහ මධ්‍යම කාරකසභාව ඉවසිල්ලෙන් දුන් අධ්‍යාපනය හේතු කොටගෙන, සිව්වැනි පෙරමුණු හමුදව ත් එහි බොහෝ වූ කාඩර්වරු ත් මධ්‍යම කාරකසභාවේ නිවැරදි නායකත්වය යටතට ආපසු අවුත්, අනතුරු ව කළ අරගලවලදී ගෞරවනීය කොටසක් රඟ පෑහ. කෙසේ වෙතත්, චාං කුඕ-තාඕ තමා හික්මවිය නො හැකි පුද්ගලයකු බව ඔප්පු කළේ ය, 1938 වසන්තයේදී ශෙන්සි-කාන්සු-නිංසියා දේශසීමා ප්‍රාන්තයෙන් තනි ව ම පැනගොස්, කුඕමින්තාං රහස් පොලිසියට බැඳුණේ ය.

[9]ලූශාන්හි නිලධාරින් පුහුණු කිරීමේ බළකාය යනු කොමියුනිස්ට්-විරෝධි යුද්ධ කාඩර්-වරුන් පුහුණු කිරීම පිණිස චියාං කායි-ශෙක් විසින් 1933 ජූලියේදී චියාංසි පළාතේ, කියුචියාංහි

LIBERATION BASE
https://liberationbase.wordpress.com

ලූශාන් කන්දේ පිහිටුවන ලද සංවිධානයක් විය. වියාං කායි-ශෙක්ගේ සන්නද්ධ සේනාවන්ට අයත් නිලධාරි ජර්මන්, ඉතාලි සහ ඇමරිකන් ජාතික උපදේශකයන් ගෙන් පැසිස්ට යුද්ධ සහ දේශපාලන පුහුණුව ලබනු පිණිස මාරුවෙන් මාරුවට එහි යවනලදහ.

[10]මෙ අළුත් යුද්ධ මූලධර්ම වියාං කායි-ශෙක් නඩයේ "යුදමුරගෙවල් සංග්‍රාමය" පිළිබඳ ප්‍රතිපත්තිය වැඩි වශයෙන් සම්පාදනය කළේ ය; ඒ ප්‍රතිපත්තිය අනුව ඒ නඩය අනුක්‍රමයෙන් ඉදිරියට ගමන් කරමින්, හැම පියවරකදී ම අගල් කැණගෙන බලපවුරු බැඳගෙන තමන් සුරක්ෂිත කර ගත්හ.

[11]වී. අයි. ලෙනින්ගේ "කොමියුනිස්ටවාදය" (1920, ජුනි 12) බලන්න. එහි, ලෙනින්, බෙලා කුන් නමැති හන්ගේරියානු කොමියුනිස්ට පක්ෂ නායකයා විවේචනය කරමින්, ඔහු "මාක්ස්වාදයේ ඉතා ම සාරමය දෙය, මාක්ස්වාදයේ සජීව ආත්මය, එනම් වාස්තුවික තත්වයන් පිළිබඳ වාස්තුවික විශ්ලේශණය, අතහැර දමන්නේ ය", යි කීවේ ය.

[12]හුනාන්-වියාංසි දේශසීමා ප්‍රදේශයේ පළමුවැනි පක්ෂ සම්මේලනය 1928, මැයි20වැනිද නිංකාං උප-පළාතේ මාඕපිං නුවරදී පවත්වනලදී.

[13]විස්තරයක් පිණිස මේ පොතේ 149-150 වැනි පිටු බලන්න,

[14]තැනින්තැන ඇවිදින කැරලිකරුවන් ගැන දනගැනීමට, මේ පොතේ "පක්ෂය තුළ තිබෙන වැරදි අදහස් නිවැරදි කිරීම ගැන" යන ලිපියට යොදා තිබෙන, 63-64වැනි පිටු වල පළ වන 4වැනි සහ 5වැනි සටහන් බලන්න.

[15]"පල්හොරුන්ගේ විධි" යන්නෙන් සඳහන් කරන්නේ විනය, සංවිධානය සහ පැහැදිලි දේශපාලන මගපෙන්වීම නොමැතිවීමේ ප්‍රතිඵලය වශයෙන් ඇති වන කඩාවඩාගැනීම සහ කොල්ලකෑම ය.

[16]ලි 25,000ගේ (කිලෝමීටර් 12,500යේ) දීර්ඝ ගමන රතු හමුදාව විසින් වියාංසි පළාතේ සිට උතුරු ශෙන්සි පළාතට ගිය ගමන ය. 1934, ඔක්තෝබරයේදී, චීන කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ රතු හමුදාවේ (එනම්, මධ්‍යම රතු හමුදාව වශයෙන් ද ප්‍රකට, රතු හමුදාවේ පළමුවැනි පෙරමුණු හමුදාවේ) පළමුවැනි, තුන්වැනි සහ පස්වැනි හමුද කණ්ඩායම් බටහිරි ෆූචියන් පළාතේ චාංතිං සහ නිංහුආ වලින් ද, දකුණු වියාංසි පළාතේ ජුයිචින්, යුතු සහ වෙනත් ස්ථාන වලින් ද පිටත් වී, ප්‍රධාන උපායමාර්ගික තැන්-මාරුකිරීමක් පටන් ගති. සදහට ම හිමෙන් වැසුණු කඳු සහ හසරක් නැති මහ තණබිම් තරණය කරමින් ද, නො කිය හැකි තරම් දුක් ගැහැට විඳිමින් ද, සතුරා නැවත නැවත ත් කළ වටලෑම්, ලුහුබැඳීම්, අවහිර කිරීම් සහ අතර මගදී ගමනට හරස් කැපීම් ව්‍යර්ථ කරමින් ද, ෆූචියන්, වියාංසි, ක්වංතුං, හුනාන්, ක්වාංසි, ක්වෙයිචව්, සෙචුආන්, යුන්නාන්, සිකාං, කාන්සු සහ ශෙන්සි යන පළාත් එකොළොස හරහා ගමන්කිරීමේදී, රතු හමුදාව මේ ගමනෙහි යෙදී ලි 25,000ක් (කිලෝමීටර් 12,500ක්) මග ගෙවා අන්තිමේදී 1935 ඔක්තෝබරයෙහි උතුරු ශෙන්සි පළාතේ විප්ලවවාදි කඳවුරු ප්‍රදේශයට ජයග්‍රාහි ලෙස සේන්දු විය.

[17]රුසියාවෙහි විප්ලවවාදි වඩදිය රැල්ල අනුක්‍රමයෙන් බැස ගිය 1905 දෙසැම්බර් පැන-නැඟීම පරාජය වූ පසු එළඹුණු වකවානුව. සෝවියට සංගමයේ (බෝල්ශෙවික්ස්) කොමියු-නිස්ට පක්ෂයේ ඉතිහාසය, කෙටි පාඩම් පෙළ, 3වැනි පරිච්ඡේදය, 5වැනි සහ 6වැනි කොටස් බලන්න.

[18]බ්‍රෙස්ට-ලිටොව්ස්ක් සාම ගිවිසුම 1918 මාර්තුවේදී සෝවියට් රුසියාව ත් ජර්මනිය ත් අතර නිමවනු ලැබී ය. එතෙක් තමාගේ ම හමුදාවක් නො සිටි අළුත බිහි වූ සෝවියට් සමූහාණ්ඩුවට පහර දීමක් පටන් ගැනීමෙන් ජර්මන් අධිරාජ්‍යවාදින් වළකනු පිණිස තාවකාලික පසුබැසීමක් කිරීමට ප්‍රත්‍යක්ෂ ලෙස ම වැඩි-බලයක් ඇති සතුරු බලසේනාවන්ට අභිමුඛ ව සිටි විප්ලවවාදි බලසේනාවන්ට සිදු විය. මේ ගිවිසුම නිමවීමෙන් නිර්ධනපංක්තියේ දේශ-පාලන බලය තහවුරු කිරීමට ද, සිය අර්ථක්‍රමය ප්‍රති-සංවිධානය කිරීමට ද, රතු හමුදාව ගොඩනැඟීමට ද සෝවියට සමූහාණ්ඩුවට කාලය ලැබුණි. එය ගොවිජනතාව කෙරෙහි තම නායකත්වය පවත්වා ගැනීමට ත්, 1918-20දී සුදු මුරභටයන් විසින් සහ, බ්‍රිතාන්‍යය, එක්සත් ජනපදය, ප්‍රන්සය, ජපානය, පෝලන්තය හා වෙන රටවල් විසින් කළ සන්නද්ධ මැදිහත්වීම පරාජය කිරීමට උවමනා තරම් ශක්තිය ගොඩනහා ගැනීමට ත් නිර්ධනපංක්තියට හැකි කළේ ය.

[19]1927, ඔක්තෝබර් 30වැනි ද, ක්වංතුං පළාතේ හායිපෙං-ලූපෙං ප්‍රදේශයේ ගොවියෝ චීන කොමියුනිස්ට පක්ෂයේ නායකත්වය යටතේ තම තුන්වැනි කැරැල්ල පටන් ගත්හ. ඔව්හු හායිපෙං, ලූපෙං සහ අවට ප්‍රදේශය අල්ලා ගත්හ, රතු හමුදාවක් සංවිධානය කළහ, කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදි දේශපාලන බලය පිහිටුවූහ. ඔව්හු, සතුරා අඩුවෙන් තක්සේරු කිරීමේ වරද කළ නිසා පසු ව පරාජය කරනු ලැබූහ.

[20]රතු හමුදාවේ සිව්වැනි පෙරමුණු හමුදාව ත් දෙවැනි පෙරමුණු හමුදාව ත් 1936 සරත් ඍතුවේදී එකට එක්වී, සිකාං පළාතේ ඊසානදිග කොටසේ සිට උතුරු දෙසට මාරු වී ගියහ. චාං කුඕ-තාඕ එකල එතෙක් ම තම පක්ෂ-විරෝධී මග ත්, පසුබැසීම සහ දිය කර හැරීම පිළිබඳ තම ප්‍රතිපත්තිය ත් අත නැර ම ගෙන සිටියේ ය. ඒ අවුරුද්දේ ම ඔක්තෝබරයෙහි, දෙවැනි සහ සිව්වැනි පෙරමුණු හමුද කාන්සු පළාතට සේන්දු වූ කල, ඔහු කහ ගඟ තරණය කොට චිංහායි පළාත බලා බටහිර දෙසට ඉදිරියට ගමන් කරනු පිණිස බටහිර කොලම සංවිධානය කරන මෙන්, මිනිසුන් 20,000කට වැඩි ගණනකින් සමන්විත වූ, සිව්වැනි පෙරමුණු හමුදාවේ කලින් ඉදිරියට ගොස් සිටි සේනාංග වලට අණ කළේ ය. මේ කොලම 1936 දෙසැම්බරයේදී කළ සටන් වලදී පහරකා පරාජයට පත් වූ තරම් විය, 1937 මාර්තුවේදී සම්පූර්ණයෙන් ම පරාජය කරනු ලැබී ය

[21]කාර්ල් මාක්ස් විසින් ඇල්. කුගිල්මාන් වෙත පැරිස් කොමියුනය ගැන යවනලද 1871 අප්‍රේල් I2 වැනි දින දතම දරණ ලියමන බලන්න.

[22]ශුයි හූ චුආන් (වගුරුබිම් වල වීරයෝ) ගොවි යුද්ධයක් විස්තර කරන සුප්‍රසිද්ධ චීන නවකතාවකි. මේ නවකතාව (14වැනි සියවසේ) යුආන් රජපෙළපතේ අවසානය සහ මිං රජ-පෙළපතේ ආරම්භය අවට කාලයෙහි ජීවත් වූ ශි නායි-ආන් විසින් ලියනලදැ'යි කියනු ලැබේ. ලින් චුං සහ වායි චින් යන දෙදෙනා ම මේ නවකතාවෙහි වීරයෝ ය. වායි චින්ගේ වත්තේ සරඹ ඇදුරා හුං විය.

[23]ලූ සහ චී වසන්ත සහ සරත් යුගයෙහි (ක්‍රි: පූ: 722-481) රදළ රාජ්‍ය දෙකක් විය. චී වර්තමාන ශාන්තුං පළාතෙහි මැද කොටසේ පිහිටි විශාල රාජ්‍යයක් විය, ලූ දකුණු කොටසේ පිහිටි කුඩා රාජ්‍යයක් විය. චුආං ඇපා ක්‍රි: පූ: 693 සිට 662 තෙක් ලූ රාජ්‍යයේ රජකම් කළේ ය.

[24]ත්සෝචියු මිං, චෞ රජපෙළපතේ පැරණි පුරාවෘත්තයක් වූ, ත්සෝ චුආන් නමැති ග්‍රන්ථයේ කර්තෘ විය. උපුටා දක්වා ඇති ඡේදය සඳහා ත්සෝ චුආන්හි "චුආං ඇපාගේ දසවැනි වස" (ක්‍රි: පූ: 684) යන කොටස බලන්න.

[25]හොනාන් පළාතේ වර්තමාන චෙංකාඕ උප-පළාතේ වයඹදිග පෙදෙසේ පිහිටි චෙංකාඕ නමැති පුරාණ නගරය ඉමහත් යුද්ධමය වැදගත්කමක් ඇත්තේ විය. එය ක්‍රි: පූ: 203දී ලියු පාං නැමති හාන් රජු සහ ශියාං යූ නමැති චූ රජු අතර සටන් ඇති වූ තැන විය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

මුලදී ශියාං යූ විසින් ශිංයාං සහ වෙංකාඕ අල්ලා ගනු ලැබී ය, ලියු පාංගේ හටකණ්ඩායම් පළවා හරිනලද තරම් විය. ලියු පාං, ශියාං යූගේ හටකණ්ඩායම් ශේශුයි ගඟ තරණය කරමින් ගඟ මැදට පැමිණෙන තිසි මොහොත එළඹෙන තුරු බලා සිට, එහිදී ඔවුන් තළා දමා වෙංකාඕ නුවර ආපසු අල්ලාගත්තේ ය.

[26]හොනාන් පළාතේ වර්තමාන යේශියන් උප-පළාතේ උතුරු පෙදෙසෙහි පිහිටි කුන්යාං නමැති පැරණි නගරය ක්‍රි: ව: 23දී, නැගෙනහිරි හාන් රජපෙළපතේ ආරම්භකයා වූ ලියු ශියු විසින් ශින් රජපෙළපතේ අධිරාජයා වූ වෙං මාංගේ හටකණ්ඩායම් පරාජය කළ ස්ථානය විය. දෙ පස අතර මිනිසුන්ගේ ගණන අතින් සුවිශාල අසමානකමක් තිබිණි; වෙං මාංගේ 4,00,000කට විරුද්ධ ව සිටි ලියු ශියුගේ බලසේනාවන්ගේ මුළු ගණන මිනිසුන් 8000 සිට 9000 තෙක් විය. එහෙත් සතුරා අඩුවෙන් තක්සේරු කළ මාංගේ සෙනෙවියන් වූ වෙං ශුන්ගේ ත් වෙං යීගේ ත් නොසැලකිලිමත්කමින් ප්‍රයෝජන ගනිමින්, ලියු ශියු තෝරා-ගත් භටයන් 3000ක් පමණක් ඇතිව වෙං මාංගේ ප්‍රධාන බලසේනාවන් පළවා හැරියේ ය. ඔහු මේ ජයග්‍රහණය පසුපස්සේ ම යමින් සතුරු හටකණ්ඩායම් වල ඉතිරි කොටස් ද තළා දැමී ය.

[27]හොනාන් පළාතේ වර්තමාන චුංමෞ උප-පළාතේ ඊසානදිග පිහිටා තිබුණු කුආන්තු ක්‍රි: ව; 200දී ත්සාඕ ත්සාඕගේ සහ යුආන් ශාඕගේ හමුදවන් අතර සටන් ඇති වූ ස්ථානය විය. යුආන් ශාඕට 100,000ක හමුදවක් සිටි අතර, ත්සාඕ ත්සාඕට සිටියේ සුළු සේනාවකි; ඔහුට සපයන-ද්‍රව්‍ය ද හිඟ විය. සතුරා සුළු කොට සැලකූ යුආන් ශාඕගේ හටකණ්ඩායම් සෝ-දිසිමත්බවෙන් තොර ව සිටීම වාසියක් කරගනිමින්, ත්සාඕ ත්සාඕ ඔවුන් වෙත උන්හිටි-ගමන් හදිස්සි පහරක් දී ඔවුන්ගේ සපයන-ද්‍රව්‍ය ගිනි තබනු පිණිස තම කඩිසර ගමනින් යන සෙබළුන් පිටත් කළේ ය. යුආන් ශාඕගේ හමුදව අවුල් වූ තත්වයකට වැටුණි; එහි ප්‍රධාන බලසේනාව මුල්පිය දමනු ලැබී ය.

[28]වූ රාජ්‍යය සුන් චුආන් විසින් ද වෙයි රාජ්‍යය ත්සාඕ ත්සාඕ විසින් ද පාලනය කරනු ලැබී ය. චිහ්පි, හූපේ පළාතේ චියායුවට ඊසාන දිගින්, යැංසි ගංගාවේ දකුණු ඉවුරේ පිහිටා ඇත. ක්‍රි: ව: 208දී ත්සාඕ ත්සාඕ, සුන් චුආන්ට පහරක් ගැසීම පිණිස, 800,000කින් ප්‍රබලය'යි ඔහු විසින් ප්‍රකාශ කරනලද, මිනිසුන් 500,000කට වැඩි ගණනකින් යුත් හමුදවක් ගෙන-ගියේ ය. සුන් චුආන්, ත්සාඕ ත්සාඕගේ ප්‍රතිමල්ලයා වූ ලියු පෙයි සමග සන්ධාන වී, 30,000ක සේනාවක් රැස් කර ගත්තේ ය. ත්සාඕ ත්සාඕගේ හමුදව වසංගත රෝගයන් ගෙන් පෙළෙන බව ත් දිය මත යාත්‍රා කරන ගමන් සටන් කිරීමට නුපුරුදු බව ත් දැනගෙන, සුන් චුආන්ගේ සහ ලියු පෙයිගේ මිත්‍ර බලසේනාවෝ ත්සාඕ ත්සාඕගේ නැව් හමුදවට ගිනි තබා සතුරා තළා දැමූහ.

[29]හූපේ පළාතේ, වර්තමාන අයිචාං නුවරට නැගෙනහිරින් පිහිටි යීලිං නුවර, ක්‍රි: ව: 222දී වූ රාජ්‍යයේ සෙනෙවියකු වූ ලූ සුන් විසින් ශූ රාජ්‍යයේ පාලකයා වූ ලියු පෙයිගේ හමුදව පරාජය කළ ස්ථානය විය. ලියු පෙයිගේ හටකණ්ඩායම් යුද්ධයේ පටන්ගැනීමේදී පිට පිට ම ජයග්‍රහණ දිනා ගනිමින්, යීලිං නුවර තෙක් වූ රාජ්‍යයේ භූමිප්‍රදේශය තුළට ලි පන්සියයක් හෝ හයසියයක් කාගෙන ගියේ ය. යීලිං රකිමින් සිටි ලූ සුන්, ලියු පෙයි "දන්නා තරම් දේ කර අවසන් වන තුරු සහ ඔහුගේ හටකණ්ඩායම් හෙම්බත් වී චිත්තශක්තියෙන් පිරිහෙන තුරු" සත් මසකට වැඩි කලක් සටන් නො කොට මග හැරියේ ය. ඉක්බිති ඔහු ඔවුන්ගේ කූඩාරම් වලට ගිනි ලෑමට හිතකර සුළඟකින් ප්‍රයෝජනය ගනිමින් ලියු පෙයිගේ හටකණ්ඩායම් තළා දැම්මේ ය.

[30]ක්‍රි: ව: 383දී, නැගෙනහිරි ත්සින් රජපෙළපතේ සෙනෙවියකු වූ ශියේ ශුආන් අන්හ්-වෙයි පළාතේ පෙයිශුයි ගඟ වෙතදී චින් රාජ්‍යයේ පාලකයා වූ පූ චියන් පරාජය කළේ ය, පූ චියන්ට 6,00,000ට අධික පාබල සේනාවක් ද, 2,70,000ක අසරු සේනාවක් ද, 30,000ට

වැඩි මුර බළකායක් ද සිටි අතර, නැගෙනහිරි ත්සින් රාජ්‍යයේ ගොඩ සහ ගංගා බලසේනාවෝ 80,000ක් පමණක් වූහ. හමුදවන් පෙයිශුයි ගඟ දෙ පස ඉවුරු දිගේ පෙළගැසී සිටි කල්හි, ශියේ ශුආන්, සතුරු හටකණ්ඩායම්වල පමණ ඉකුත් කළ ආත්ම-විශ්වාසය සහ උඩඟුකම වාසියක් කරගනිමින්, නැගෙනහිරි ත්සින් හටකණ්ඩායම් වලට ගඟ තරණය කොට අවුත් සටන කරන්නට ඉඩ ඇති වන සේ පූ චියන්ගේ හටකණ්ඩායම් පස්සට ගන්නා ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේ ය. පූ චියන් ඊට එකඟ විය; එහෙත් ඔහු ඉවත් වී යාමට අණ දුන් කල, ඔහුගේ හටකණ්ඩායම් තැතිගෙන පළායන්ට වූයෙන් නතර කරගත නො හැකි විය. මේ ඉඩප්‍රස්තාව අල්ලාගෙන, නැගෙනහිරි ත්සින් හටකණ්ඩායම් ගඟ තරණය කොට, පහරදීමක් දියත් කොට, සතුරා තළා දැමී ය.

[31]චියාංසි පළාතේ අගනුවර වන නාන්චාං නගරය චියාං කායි-ශෙක්ගේ ත් වෙං චිං-වෙයිගේ ත් ප්‍රති-විප්ලවයට විරුද්ධ ව සටන් කරනු වස් සහ 1924-27තේ විප්ලවය දිගට ම ගෙනයනු වස් චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ 1927, අගෝස්තු 1වැනි දින සුප්‍රසිද්ධ පැනනැඟීම ඇති වූ තැන ය. චෞ එන්-ලායි, චූ තේ, හෝ ලුං සහ යේ තිං යන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද මේ පැනනැඟීමට භටයෝ තිස් දහසකට වැඩියෙන් සහභාගි වූහ. කැරලිකාර හමුදව සැලැස්ම කර තිබුණු පරිදි අගෝස්තු 5වැනි ද නාන්චාං නුවරින් ඉවත් වී ගියේ ය; එහෙත් ක්වංතුං පළාතේ චාඕචව් සහ ස්වාතව් නගර කරා ළඟා වමින් සිටියදී පරාජයකට පත් විය. චූ තේ, චෙන් යී සහ ලින් පියාඕ සහෝදරවරුන් විසින් නායකත්වය දෙනු ලැබ, හටකණ්ඩායම් අතුරෙන් කොටසක් පසු ව මග දිගට සටන් කරමින් චිංකාං කඳු වලට අවුත්, සහෝදර මාඕ සේතුං යටතේ සිටි පළමුවැනි කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ විප්ලවවාදී හමුදවේ 1වැනි ඩිවිසනය සමග එකතු විය

[32]මේ පොතේ "චීනයෙහි රතු දේශපාලන බලය පවතින්ට හැකි වන්නේ ඇයි?" යන ලිපියට යොදා තිබෙන, 11වැනි පිටුවේ පළවන 8වැනි සටහන බලන්න.

[33]සරත් අස්වනු පැනනැඟීම ගැන දැනගැනීම පිණිස මේ පොතේ "චිංකාං කඳු වල අරගලය" යන ලිපියට යොදා තිබෙන, 47වැනි පිටුවේ පළවන 4වැනි සටහන බලන්න.

[34]බෝ. වි. ("බෝල්ශේවික්ස්-විරෝධ" යන්නේ මුල් අකුරු ය) කණ්ඩායම රතු ප්‍රදේශ වල රහසින් වැඩ කළ කුඕමින්තාං ඒජන්තවරුන්ගේ ප්‍රති-විප්ලවවාදී සංවිධානයක් විය.

[35]1952දී මොස්කව් නුවර වි. භා. ප්‍ර. ම. විසින් ප්‍රසිද්ධ කරන ලද, වී. අයි. ලෙනින්ගේ, කාණ්ඩ දෙකකින් යුත් තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, IIවැනි කාණ්ඩයේ 1වැනි කොටසේ "චෙන ම සහ ඈඳාගැනීම්වාදී සාමයක් වහා ම නිමවීමේ ප්‍රශ්නය ගැන තීසසය", "අද්භූත යි, අතිසෝර යි", "බරපතල පාඩමක් සහ බරපතල වගකීමක්", "යුද්ධය සහ සාමය ගැන වාර්තාව" යන ලිපි ද, සෝවියට් සංගමයේ (බෝල්ශෙවික්ස්) කොමියුනිස්ට් පක්ෂයේ ඉතිහාසය, කෙටි පාඩම් මාලාව, 7වැනි පරිච්ඡේදයේ 7වැනි කොටස ද බලන්න.

[36]මෙහි සඳහන් කරන ප්‍රාන්ත සෙචුආන්, කාන්සු, චිංහායි සහ සින්චියාං පළාත් වල ටිබෙට් සහ හුයි ජාතික මිනිසුන් වෙසෙන ප්‍රාන්ත ය.

[37]"කකුල්-අටේ රචනාව" 15වැනි සියවසේ සිට 19වැනි සියවස තෙක් රදළ චීනයෙහි අධිරාජ්‍ය තරග විභාගයන් සඳහා නියම කර තිබුණු රචනා ආකාරය විය. රචනාවේ ප්‍රධාන දේහය, එක් ඡේදයක් කොටස් දෙකකින් යුක්ත ව, මුල් ඡේදය, මැද ඡේදය, පසු ඡේදය සහ අවසන් කිරීමේ ඡේදය යන ඡේද හතරකින් සැදිණි. මෙහිදී සහෝදර මාඕ සේතුං විප්ලවය එහි විවිධ අවස්ථා තුළින් වර්ධනය වීම නිරූපණය කරනු පිණිස මේ වර්ගයේ රචනාවන්හි තේමාව වර්ධනය කරන පිළිවෙල උපමාවක් වශයෙන් පාවිච්චි කරයි. කෙසේ වෙතත්, සහෝදර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මාඕ සේතුං "කකුල්-අතේ රචනාව" යන පාඨය සාමාන්‍ය වශයෙන් යොදන්නේ සිද්ධාන්ත-වාදයට සරදම් කරනු පිණිස ය.

[38] 1933 නොවැම්බරයේදී, චීනය පුරා ම පතළ වූ ජනතාවගේ ජපන්-විරෝධ ව්‍යාපාරයේ උන්නතියේ බලපෑම යටතේ, කුඕමින්තාං ආණ්ඩුවේ 19වැනි මාර්ග හමුදාවේ නායකයෝ, ලි චි-ශන් යටතේ සිටි කුඕමින්තාං බලසේනාවන් හා සන්ධාන වී, චියාං කායි-ශෙක් ප්‍රසිද්ධියේ ම අත්හැර දමා පූචියන් පළාතෙහි "චීන සමූහාණ්ඩුවේ මහජන විප්ලවවාදි ආණ්ඩුව" පිහිටුවා, චියාං කායි-ශෙක්ට පහර දීම ත් ජපානයට විරුද්ධකම් පෑම ත් පිණිස රතු හමුදාව සමග සම්මුතියක් නිමවූහ. මේ අතුරු සිද්ධිය පූචියන් සිද්ධිය වශයෙන් සඳහන් කරනු ලැබේ. කෙසේ වෙවා, 19වැනි මාර්ග හමුදාව ත් පූචියන් මහජන ආණ්ඩුව ත් චියාං කායි-ශෙක්ගේ හටකණ්ඩායම් දුන් පහරින් බිඳ වැටුණි.

ජපානයට විරුද්ධ ගොරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු

1938, මැයි

පරිච්ඡේද I

ගොරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ප්‍රශ්නය නඟන්නේ ඇයි?

ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයේදී, නිත්‍ය සංග්‍රාමය මූලික වේ, ගොරිල්ලා සංග්‍රාමය අතිරේක වේ. මේ කාරණය දැනට ම නිවැරදි ලෙස බේරුම් කර ඇත. මෙසේ, ගොරිල්ලා සංග්‍රාමයෙහි ඇත්තේ උපක්‍රම පිළිබඳ ගැටළු පමණකි'යි පෙනී යයි, එසේ නම් උපායමාර්ගය පිළිබඳ ප්‍රශ්නය නඟන්නේ ඇයි?

චීනය ගොරිල්ලා සංග්‍රාමය විසින් රඟ පෑ යුතු ව තිබෙන කොටස කෙටි දුරප්‍රමාණයන් තුළ නිත්‍ය හමුදාවේ යුද්ධව්‍යාපාරයන්ට කෙළින් ම අනුබල දීමට සීමා වී තිබෙන කුඩා රටක් වී නම්, සත්තකින් ම උපක්‍රමික ගැටළු පමණක් තිබෙනවා ඇත, උපායමාර්ගික ගැටළු නො තිබෙනවා ඇත. අනික් අතට, චීනය සෝවියට් සංගමය තරම් ප්‍රබල රටක් වී නම් ද, අතික්‍රමණය කරන සතුරා ඉක්මනින් පළවා හැරිය හැකි වේ නම් ද, නැතහොත්, ඔහු පළවා හරින්ට ටික කලක් ගත විය හැකි නමුත් විශාල ප්‍රදේශ අල්ලාගන්ට ඔහුට බැරි වේ නම් ද, එවිට ද ගොරිල්ලා සංග්‍රාමය යුද්ධව්‍යාපාර වලදී හුදෙක් අනුබල දීමේ කොටසක් රඟපානවා ඇත, ස්වභාවයෙන් ම උපායමාර්ගික ගැටළු නො ව උපක්‍රමික ගැටළු පමණක් ඊට ඇතුළත් වෙනවා ඇත.

ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයේ මුල් දවස් වල, පක්ෂය තුළ ත් ඉන් පිට ත් සිටි බොහෝ අය ගොරිල්ලා සංග්‍රාමය රඟපාන වැදගත් උපාමාර්ගික කොටස සුළු කොට තැකූහ. නිත්‍ය සංග්‍රාමය මත, විශේෂයෙන් කුඕමින්තාං බලසේනාවන්ගේ සටන්ව්‍යාපාර මත, පමණක් තම බලාපොරොත්තු රැඳවූහ. සහෝදර මාඕ සේතුං මේ මතය බිඳිමින්, ජපන්-විරෝධී ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය වන නිවැරදි මග පෙන්වනු පිණිස මේ ලිපිය ලිවේ ය. ප්‍රතිඵලයක් වශයෙන්, 1937දී,විරුද්දකම් පෑමේ යුද්ධය පටන් ගන්නා විට මිනිසුන් 40,000කට වඩා වැඩි ගණනක් සිටි අටවැනි මාර්ග හමුදාව ත් අළුත් සිව්වැනි හමුදාව ත් 1945දී

https://liberationbase.wordpress.com

කෙසේ වේවා, කුඩා රටක් වත් සෝවියට් සංගමය වැනි රටක් වත් නො වන, විසාල වූ ත් දුර්වල වූ ත් රටක් වන, චීනය පිළිබඳ ප්‍රශ්නයේදී ගොරිල්ලා සංග්‍රාමයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළුව පැනනගින්නේ ම ය. මේ විසාල සහ දුර්වල රට කුඩා සහ ප්‍රබල රටක් විසින් පහර දෙනු ලබන නමුත්, විසාල සහ දුර්වල රට පවතින්නේ ප්‍රගතිය පිළිබඳ යුගයක ය; මුළු ගැටළුව ම ඇති වන තැන මෙය වේ. මෙන්න මේ වටාපිටා තත්වයන් තුළ ය විසාල ප්‍රදේශයන් සතුරා විසින් අල්ලාගෙන ඇත්තේ ත්, යුද්ධය දිග්ගැසුණු එකක් බවට පත් වී ඇත්තේ ත්. සතුරා අපේ මේ විසාල රටේ විසාල ප්‍රදේශ අල්ලාගෙන සිටී; එහෙත් ජපානය කුඩා රටකි, ඈට උවමනා තරම් සෙබළු නැත, අල්ලාගෙන සිටින ප්‍රදේශයන්හි බොහෝ කපොලු ඉතිරි කර තබන්ට ඈට සිදු වේ; එහෙයින් අපේ ජපන්–විරෝධි ගොරිල්ලා සංග්‍රාමය මූලික වශයෙන් නිත්‍ය භටකණ්ඩායම් වල යුද්ධව්‍යාපාරයන්ට අනුබල දීමට ඇතුල් පේළි වල කරන සටන්ව්‍යාපාර වලින් නො ව බාහිර පේළි වල කරන ස්වාධීන සටන්ව්‍යාපාර වලින් යුක්ත වේ; එමතු නො ව, චීනය ප්‍රගතිශීලී ය; ඒ කියන්නේ මෙය යි: ඈට, කොමියුනිස්ට් පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන තරසර හමුදවක් ද පුළුල් බහුජන සමූහයෝ ද සිටිති; එබැවින්, අපේ ජපන්–විරෝධි ගොරිල්ලා සංග්‍රාමය කොහෙත් ම කුඩා–පරිමාණයේ එකක් නො වේ, ඇත්ත වශයෙන් ම විශාල–පරිමාණයේ සංග්‍රාමයක් වේ. උපායමාර්ගික ආරක්ෂාවීම, උපායමාර්ගික පහරදීම යනාදිය වැනි මුළු ගැටළු මාලාවක් ම පැනනගින්නේ එහෙයිනි. යුද්ධයේ දිග්ගැසුණු ස්වභාවය ත් ඒ සමග ඇති වන දරුණුකම ත් නිසා, ගොරිල්ලා සංග්‍රාමය විසින් සාමාන්‍ය ගණයට අයත් නො වන කර්තව්‍ය රාශියක් බාර ගැනීම අත්‍යවශ්‍ය වී ඇත; කඳවුරු ප්‍රදේශ, ගොරිල්ලා සංග්‍රාමය ජංගම සංග්‍රාමය බවට වර්ධනය කිරීම, යනාදිය වැනි ගැටළු ඇති වන්නේ එහෙයිනි. මේ සියලු හේතු කරණකොටගෙන, ජපානයට විරුද්ධ ව කරන චීනයේ ගොරිල්ලා සංග්‍රාමය උපක්‍රම වල සීමාවන් බිඳගෙන එළියට පැන, උපායමාර්ගයේ දොරටුවට තට්ටු කරන්ට වී ඇත; එය උපායමාර්ගය පිළිබඳ දෘෂ්ටිකෝණයේ සිට පරීක්ෂා කර බලන ලෙස ඉල්ලා සිටී. අපේ විශේෂ අවධානය යොමු වීමට නිසි කරුණ නම් එබඳු ව්‍යාප්ත වූ මෙන් ම දිග්ගැසුණු මේ ගොරිල්ලා සංග්‍රාමය මුළු යුද්ධ ඉතිහාසයෙහි ම හොඳට ම අළුත් දෙයක් වීම ය. මෙය අප දැන් සිටින්නේ නවසිය තිස්වැනි සහ නවසිය හතළිස් වැනි වර්ෂයන්හි ය, අපට දැන් කොමියුනිස්ට් පක්ෂය සහ රතු හමුදව ඇත්තේ ය යන සත්‍ය කාරණය හා බැඳී පවතී. කාරණයේ හදවත රැඳී තිබෙන්නේ මෙතැන ය. අපේ සතුරා බාගවිට තවම ත් යුආන් රජපෙළපත විසින් සුං රජපෙළපත ජය ගැනීම, චිං රජපෙළපත විසින් මිං රජපෙළපත ජය ගැනීම, බ්‍රිතාන්‍යය විසින් උතුරු ඇමරිකාව සහ ඉන්දියාව අල්ලාගැනීම, ලතින් රටවල් විසින් මැද සහ දකුණු ඇමරිකාව අල්ලාගැනීම යනාදිය අනුකරණය කිරීමේ ප්‍රණීත සිහිනය මහත් ආසාවෙන් දැක දැක සිටිනවා විය යුතු ය. එහෙත් එබඳු සිහින අද–දවසේ චීනයෙහි ප්‍රායෝගික වටිනාකමකින් තොර ය; එකී ඉතිහාසීය අවස්ථාවන්හි නො තිබුණු යම් යම් සාධක අද චීනයෙහි තිබෙන නිසා ය; ඉන් එකක් නම් හොඳට ම අළුත් ආශ්චර්යයක් වන ගොරිල්ලා සංග්‍රාමය යි. අපේ සතුරා මේ සත්‍ය කාරණය නො සලකා හැරියොත්, ඔහු සත්තකින් ම විපතට පත් වෙනවා ඇත.

අපේ ජපන්–විරෝධි ගොරිල්ලා සංග්‍රාමය, මුළු එකක් වශයෙන් විරුද්ද-කම් පෑමේ යුද්ධයේදී අතිරේක තැනක් ගන්නේ වේ නමුත්, උපායමාර්ගය පිළිබඳ දෘෂ්ටිකෝණයේ සිට පරීක්ෂා කර බැලිය යුතු වන හේතු මේවා ය.

එසේ කල, විරුද්දකම් පෑමේ යුද්ධයේ සාමාන්‍ය උපායමාර්ගික මූලධර්ම ගොරිල්ලා සංග්‍රාමයට නො යොදන්නේ මන්ද?

අපේ ජපන්–විරෝධි ගොරිල්ලා සංග්‍රාමයෙහි උපායමාර්ගය පිළිබඳ ප්‍රශ්නය, සත්තකින් ම, මුළු එකක් වශයෙන් විරුද්දකම් පෑමේ යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ප්‍රශ්නය හා කිට්ටුවෙන් ඈඳී තිබේ; ඒවාට පොදු වූ බොහෝ දේ තිබෙන නිසා ය. අනික් අතට, ගොරිල්ලා සංග්‍රාමය නිත්‍ය සංග්‍රාමයට වෙනස් ය, ඊට ම අයත් අමුතු දේ ඊට ඇත; ඒ අනුව ගොරිල්ලා සංග්‍රාමයේ උපායමාර්ගය පිළිබඳ ප්‍රශ්නයට අමුතු මූලද්‍රව්‍ය රාශියක් ඇතුළත් වේ. විරුද්දකම් පෑමේ යුද්ධයේ උපායමාර්ගික මූලධර්ම සාමාන්‍ය වශයෙන් ගෙන කිසි වෙනසක් නො කොට, ඊට ම අයත් අමුතු දේ සහිත ගොරිල්ලා සංග්‍රාමයට යෙදීම කොහෙත් ම නො කළ හැකි ය.

පරිච්ඡේද II

යුද්ධයේ පදනම් මූලධර්මය තමා රැක ගැනීම සහ සතුරා විනාශ කිරීම යි

ගොරිල්ලා සංග්‍රාමයෙහි උපායමාර්ගය පිළිබඳ ප්‍රශ්නය ගැන නියම වශයෙන් ම සාකච්ඡා කරන්ට පෙර, යුද්ධයේ මූලික ගැටළුව ගැන වචන කීපයක් කියන්ට උවමනා ය.

යුද්ධමය ක්‍රියාවන්ට මග පෙන්වන සියලු ම මූලධර්ම එක් පදනම් මූල-ධර්මයකින් වැඩෙයි; එනම් තමාගේ ම ශක්තිය රැක ගැනීමට ත් සතුරාගේ

ජපානය යටත් වූ කාලය වන විට දස ලක්ෂයක මහා හමුදවක් බවට වැඩුණේ ය, විප්ලවවාදි කඳවුරු ප්‍රදේශ බොහෝ ගණනක් පිහිටෙව්වේ ය, යුද්ධයේදී ශ්‍රේෂ්ඨ කොටසක් රඟපෑවේ ය; එසේ මේ වකවනුව මුළුල්ලේ ම, ජපානයට යටත් වීමට හෝ දේශ-ව්‍යාප්ත සිවිල් යුද්ධයක් දියත් කිරීමට හෝ චියාං කායි-ශෙක් බිය පත් කළේ ය. 1946දී, චියාං කායි-ශෙක් දේශ-ව්‍යාප්ත සිවිල් යුද්ධයක් දියත් කළ විට, අටවැනි මාර්ග සහ අළුත් සිවවැනි හමුදවන් ගෙන් සකස් කරන ලද මහජන විමුක්ති හමුදව ඔහුගේ ප්‍රහරණයන් ගැන ක්‍රියා කරන්ට හැකි තරම් ප්‍රබල විය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ශක්තිය විනාශ කිරීමට ත් හැකි තරම් වැඩි ම පරිශ්‍රමයක් දැරීම ය. විප්ලවවාදී යුද්ධයකදී, මේ මූලධර්මය පදනම් දේශපාලන මූලධර්ම හා කෙළින් ම ඈඳී තිබේ. නිදසුන් වශයෙන්, චීනයේ ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයේ පදනම් දේශපාලන මූලධර්මය, එනම්, එහි දේශපාලන අරමුණ, ජපන් අධිරාජ්‍යවාදය පන්නා දමා, ස්වාධීන, නිදහස් සහ ප්‍රීතිබර නව චීනයක් ඉදි කිරීම යි. යුද්ධමය ක්‍රියාව වශයෙන් මේ මූලධර්මයේ තේරුම අපේ මව්බිම ආරක්ෂා කිරීමට සහ ජපන් අතික්‍රමණිකයන් පන්නා දැමීමට සන්නද්ධ-බලය පාවිච්චි කිරීම වේ. මේ අරමුණ මුදුන්පත් කරගනු පිණිස, සන්නද්ධ සේනාංගයන්ගේ සටන්ව්‍යාපාර එක් අතකින් තමන්ගේ ම ශක්තිය රැක ගැනීමට ත් අනික් අතින් සතුරාගේ ශක්තිය විනාශ කිරීමට ත් තමන්ට හැකි වැඩි ම දේ කිරීමේ ආකාරය ගනී. එසේ නම් යුද්ධයේදී වීරෝදර ලෙස ජීවිත පරිත්‍යාග කිරීමට දිරි දීම යුක්ති සහගත ය'යි අප කියන්නේ කෙසේ ද? හැම යුද්ධයක් ම එක්තරා මිලක්, ඇතැම් විට බෙහෙවින් ම අධික මිලක්, බලෙන් ම ලබා ගනී. මෙය ''තමා රැක ගැනීම''ට ප්‍රතිවිරුද්ධ නො වේ ද? ඇත්ත වශයෙන්, කිසි ම ප්‍රතිවිරෝධයක් මෙහි නැත; වඩා ත් හරියට ම කියතොත්, ජීවිත-පරිත්‍යාගය ත් ආත්ම-ආරක්ෂාව ත් යන දෙකම එකිනෙකට ප්‍රතිපක්ෂ සහ ඌනපූරක වේ. කවර හෙයින් ද යත් එබඳු ජීවිත-පරිත්‍යාග සතුරා විනාශ කිරීම පිණිස පමණක් නො ව තමා රැක ගැනීම පිණිස ද අත්‍යවශ්‍ය වන නිසා ය — අඩාල සහ තාවකාලික ''නො-රැකීම'' (පරිත්‍යාගය, නැතහොත්, මිල ගෙවීම) පොදු සහ නිත්‍ය රැකීම උදෙසා අවශ්‍ය ය. යුද්ධමය ක්‍රියාවන්ට මග පෙන්වන මූලධර්ම මාලාව ලියලන්නේ මේ පදනම් මූලධර්මයෙන් ය; වෙඩි තිබීමේ (තමා රැක ගැනීමට රැකවරණ සලසා ගැනීමේ සහ, සතුරා විනාශ කිරීමට වෙඩි-ශක්තියෙන් පූර්ණ ප්‍රයෝජනය ගැනීමේ) මූලධර්මයන්ගේ සිට උපායමාර්ගය පිළිබඳ මූලධර්මය තෙක් — ඒ සියල්ල ම තුළට මේ පදනම් මූලධර්මයේ ජීවගුණය කාවැදී හාත්පස පැතිරී ඇත. සියලු ශිල්පීය, උපක්‍රමික සහ උපායමාර්ගික මූලධර්ම මේ පදනම් මූලධර්මය භාවිතාවේ යෙදීම නියෝජනය කරයි. තමා රැක ගැනීමේ ත් සතුරා විනාශ කිරීමේ ත් මූලධර්මය සියලු යුද්ධමය මූලධර්ම වල පදනම වේ.

පරිච්ඡේද III

ජපානයට විරුද්ධ ගොරිල්ලා සංග්‍රාමයෙහි උපායමාර්ගය පිළිබඳ විශේෂිත ගැටළු හයක්

දැන් අපි අප රැකගැනීමේ ත් සතුරා විනාශ කිරීමේ ත් පරමාර්ථය මුදුන්පත් කරගන්ට අපට හැකි වීමට පෙර ජපානයට විරුද්ධ ව කරන

ගොරිල්ලා සටන්ව්‍යාපාර වලදී කවර ප්‍රතිපත්ති හෝ මූලධර්ම යෙදිය යුතු ව තිබේ දැ'යි බලමු. විරුද්දකම් පෑමේ යුද්ධයේදී (සහ සෙසු සියලු විප්ලවවාදී යුද්ධ වලදී) ගොරිල්ලා සේනාංගයන් සාමාන්‍යයෙන් කිසි ම දෙයක් නැති තත්වයෙන් වැඩී කුඩා බලවේගයකින් විසාල බලවේගයක් බවට පළල් වන හෙයින්, ඔව්හු තමන් රැකගත යුත්තාහ; එමතු නො ව, ඔව්හු පළල් විය යුත්තාහ. එහෙයින් ප්‍රශ්නය නම් අප රැක ගැනීමේ සහ පළල් කර-ගැනීමේ ත් සතුරා විනාශ කිරීමේ ත් පරමාර්ථය මුදුන්පත් කරගන්ට අපට හැකි වීමට පෙර කවර ප්‍රතිපත්ති හෝ මූලධර්ම යෙදිය යුතු ව තිබේ ද යනු යි.

සාමාන්‍යයෙන් කියන කල ප්‍රධාන මූලධර්ම මතු දක්වන පරිදි වේ: (1) ආරක්ෂාවීම තුළ පහරදීම් ද, දිග්ගැසුණු යුද්ධය තුළ ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ සටන් ද, ඇතුල්-පේළි සටන්ව්‍යාපාර තුළ බාහිර-පේළි සටන්ව්‍යාපාර ද කරගෙන යන විට මූලපිරුම, නැමෙන සුලු බව සහ සැලැස්ම කිරීම යන මේවායින් ප්‍රයෝජන ගැනීම; (2) නිත්‍ය සංග්‍රාමය සමග උචිත ලෙස සම්බන්ධ වීම; (3) කඳවුරු ප්‍රදේශ පිහිටුවීම; (4) උපායමාර්ගික ආරක්ෂාවීම සහ උපායමාර්ගික පහරදීම; (5) ගොරිල්ලා සංග්‍රාමය ජංගම සංග්‍රාමය බවට වර්ධනය කිරීම සහ (6) විධානයේ නිවැරදි සම්බන්ධතාව. මේ කරුණු හය ජපානයට විරුද්ධ ව කරන ගොරිල්ලා සංග්‍රාමය සඳහා උපායමාර්ගික වැඩසටහනේ සර්වය සම්පා-දනය කරයි; ඒවා අපේ බලසේනාවන් රැකගැනීම සහ පළල් කිරීම පිණිස ත්, සතුරා විනාශ කිරීම සහ පළවා හැරීම පිණිස ත්, නිත්‍ය සංග්‍රාමය සමග උචිත ලෙස සම්බන්ධ වීම සහ අවසාන ජයග්‍රහණය දිනාගැනීම පිණිස ත් අවශ්‍ය විධි වේ.

පරිච්ඡේද IV

ආරක්ෂාවීම තුළ පහරදීම් ද, දිග්ගැසුණු යුද්ධය තුළ ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ සටන් ද, ඇතුල්-පේළි සටන්ව්‍යාපාර තුළ බාහිර-පේළි සටන්ව්‍යාපාර ද කරගෙන යන විට මුලපිරුම, නැමෙන සුලු බව සහ සැලැස්ම කිරීම

මෙහිදී මේ විෂය ගැන ශීර්ෂ හතරක් යටතේ සාකච්ඡා කළ හැකි ය: (1) ආරක්ෂාවීම සහ පහරදීම අතර ත්, දිග්ගැසුණු බව සහ ඉක්මනින් විසඳුමක් ලබා ගැනීම අතර ත්, ඇතුල් පේළි සහ බාහිර පේළි අතර ත් සබඳතාව; (2) සියලු සටන්ව්‍යාපාර වලදී මූලපිරුම ගැනීම;

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

(3) බලසේනාවන් නැමෙන සුලු බවෙන් යුතු ව ක්‍රියාවේ යෙදීම සහ
(4) සියලු සටන්ව්‍යාපාර වලදී සැලැස්ම කිරීම.

පළමුවැන්නෙන් පටන් ගනිමු.

අපි විරුද්දකම් පෑමේ යුද්ධය මුළු එකක් වශයෙන් ගනිමු නම්, ජපානය ප්‍රබල රටක් ය, පහර දෙමින් සිටින්නී ය; ඒ අතර චීනය දුර්වල රටක් ය, තමා ආරක්ෂා කරගනිමින් සිටින්නී ය, යන සත්‍ය කාරණය අපේ යුද්ධය උපායමාර්ගික වශයෙන් ආරක්ෂාවීමේ සහ දිග්ගැසුණු යුද්ධයක් කරයි. සටන් කරගෙන යන පේළි සම්බන්ධයෙන්, ජපන්නු බාහිර පේළි වල සටන් කරගෙන යති, අපි ඇතුල් පේළි වල සටන් කරගෙන යමු. මෙය තත්වයේ එක් පැත්තක් වේ. එහෙත් හරියට ම එහි අනික් පැත්ත වන තව පැත්තක් තිබේ. සතුරු බලසේනාවෝ (අවිආයුධ වලින්, ඔවුන්ගේ මිනිසුන්ගේ ඇතැම් ගුණාංග වලින් සහ වෙන යම් යම් සාධක වලින්) ප්‍රබල වන නමුදු, ගණනින් කුඩා ය; එසේ වී නමුත් අපේ බලසේනාවෝ (එලෙස ම, අවිආයුධ වලින්, අපේ මිනිසුන්ගේ ඇතැම් ගුණාංග වලින් සහ වෙන යම් යම් සාධක වලින්) දුර්වල වන නමුදු, ගණනින් ඉතා විසාල ය. මෙය, සතුරා අපේ රට අතික්‍රමණය කරමින් සිටින පිටස්තර ජාතියක් වන අතර අපි අපේ ම පොළොව මත ඔහුගේ අතික්‍රමණයට විරුද්දකම් පාමින් සිටිමු යන සත්‍ය කාරණය ද එකතු කර ගත් විට, මතු දක්වන උපායමාර්ගය නිශ්චය කරයි. උපායමාර්ගික ආරක්ෂාවීම තුළ උපක්‍රමික පහරදීම් ද, උපායමාර්ගික වශයෙන් දිග්ගැසුණු යුද්ධයක් තුළ ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ යුද්ධව්‍යාපාර සහ සටන් ද, උපායමාර්ගික වශයෙන් ඇතුල් පේළි තුළ බාහිර පේළි වල යුද්ධව්‍යාපාර සහ සටන් ද කළ හැකි ය, කිරීම අවශ්‍ය ය. මුළු එකක් වශයෙන් විරුද්දකම් පෑමේ යුද්ධයේදී යෙදිය යුතු උපායමාර්ගය එබඳු වේ. එය නිත්‍ය සංග්‍රාමය ත් ගොරිල්ලා සංග්‍රාමය ත් යන දෙක ම සඳහා සැබෑ ව පවතී. ගොරිල්ලා සංග්‍රාමය වෙනස් වන්නේ ප්‍රමාණයෙන් සහ ආකාරයෙන් පමණකි. ගොරිල්ලා සංග්‍රාමයේදී පහරදීම් සාමාන්‍යයෙන් උන්හිටිගමන් දෙන හදිස්සි ප්‍රහාරයන්ගේ ආකාරය ගනී. නිත්‍ය සංග්‍රාමයේදී ද උන්හිටිගමන් දෙන ප්‍රහාරයෝ යෙදිය හැකි ය, යෙදිය යුතු ය; එනමුත්, එහි ඇති උන්හිටිගමන් ලක්ෂණයේ තරම අඩු ය. ගොරිල්ලා සංග්‍රාමයේදී, සටන්ව්‍යාපාර ඉක්මනින් ම විසඳුමකට ගෙන ඒමේ උවමනාව ඉමහත් ය, යුද්ධව්‍යාපාර සහ සටන් වලදී අප සතුරා වට කරන අපේ බාහිර–පේළි වළල්ල ඉතා කුඩා ය. මේ සියල්ල එය නිත්‍ය සංග්‍රාමයෙන් වෙනස් කරයි.

මෙසේ, තමන්ගේ සටන්ව්‍යාපාර වලදී ගොරිල්ලා සේනාංගයන් බලසේනාවන් වැඩි ම ගණනක් ඒකරාශි කළ යුතු වන බව, රහසින් සහ සීඝ්‍රයෙන් ක්‍රියා කළ යුතු වන බව, උන්හිටිගමන් සතුරාට පහර දිය යුතු වන බව සහ සටන් ඉක්මනින් ම විසඳුමකට ගෙන ආ යුතු වන බව ද,

ඔවුන් අක්‍රියාකාරි ආරක්ෂණය, දිග්ගැස්සීම සහ සටන්වැදීමට පෙර බලසේනාවන් විසිරි සිටින්ට සැලසීම තරයේ ම නො කළ යුතු බව ද පෙනී යයි. සත්තකින් ම, ගොරිල්ලා සංග්‍රාමයට උපායමාර්ගික ආරක්ෂාවීම පමණක් නො ව උපක්‍රමික ආරක්ෂාවීම ද ඇතුළත් වේ. පසුව කී එක, වෙනත් දේ අතර, සටන් කරගෙන යන අතර කරන (සතුරා) හිරකරගෙන සිටීමේ සහ බාහිර–මුරපොළවල් වල රැකවල් ලා සිටීමේ ක්‍රියා ත්, සතුරා බෙලහීන කිරීම සහ වෙහෙසට පත් කිරීම සඳහා පටු කඳු–කපොලු, යුද්ධොපයමාර්ගය අතින් වැදගත් තැන්, ගංගා සහ ගම් යන ස්ථානයන්හිදී විරුද්දකම් පෑම පිණිස බලසේනාවන් වින්‍යාස කිරීම ත්, ඉවත් වී යාමට රැකවරණ සැලසීමේ ක්‍රියා ත් අඩංගු කර ගනී. එහෙත් ගොරිල්ලා සංග්‍රාමයේ පදනම් මූලධර්මය විය යුත්තේ පහරදීම යි; ගොරිල්ලා සංග්‍රාමය එහි ලක්ෂණයෙන් නිත්‍ය සංග්‍රාමයට වඩා පහර දෙන සුලු ය. එමතු නො ව, පහරදීම උන්හිටිගමන් දෙන ප්‍රහාරයන්ගේ ආකාරය ගත යුතු ය; ගොරිල්ලා සංග්‍රාමයේදී අපේ බලසේනාවන් ආඩම්බර ලෙස උවමනාවෙන් ම ප්‍රදර්ශනය කරමින් අප එළිදරව් කරගැනීමට නිත්‍ය සංග්‍රාමයේදී තරම් වත් අවසර නො දිය හැකි ය. ආධාර ලැබීමෙන් කපා දමා ඇති හුදකලා වූ කුඩා සතුරු සේනාවකට පහරක් දෙන අවස්ථාවකදී මෙන්, ඇතැම් අවස්ථාවන්හි කරන ගොරිල්ලා ගහගැනීම් දින කීපයක් ම කරගෙන යන්ට ඉඩ ඇති නමුදු, ගොරිල්ලා සටන්ව්‍යාපාර වලදී සාමාන්‍ය වශයෙන් නිත්‍ය සංග්‍රාමයේදීටත් වඩා ඉක්මනින් සටන් විසඳුමකට පත් කළ යුතු බව සතුරා ප්‍රබල ය, අපි දුර්වල ය යන සත්‍ය කාරණයෙන් අවශ්‍යයෙන් ම නිගමනය වේ. එහි විසුරුණු ලක්ෂණය නිසා, ගොරිල්ලා සංග්‍රාමය හැම තැන ම පැතිරී යා හැකි ය; සතුරාට හිරිහැර කිරීම, ඔහු හිරකරගෙන සිටීම සහ ඔහු අවුල්පවුල් කර දැමීම වැනි, ගොරිල්ලා සංග්‍රාමය සතු බොහෝ කර්තව්‍යයන්හිදී ත් බහුජන වැඩ වලදී ත්, ගොරිල්ලා සංග්‍රාමයේ මූලධර්මය බලසේනාවන් විසිරී සිටින්ට සැලසීම ය; එහෙත් ගොරිල්ලා සේනාංගයක් හෝ ගොරිල්ලා සේනාවක් හෝ සතුරා විනාශ කිරීමෙහි යෙදී සිටින විට, වෙසෙසින් සතුරු ප්‍රහරණයක් බිඳින්ට වෑයම් කරන විට, තම ප්‍රධාන බලසේනාවන් ඒකරාශි කළ යුතු ය. ''සතුරු බලසේනාවෙන් කුඩා කොටසකට පහර ගැහීම පිණිස ලොකු බලසේනාවක් ඒකරාශි කරනු'' යන්න ගොරිල්ලා සංග්‍රාමයේදී යුදපිටියේ කරන සටන් ක්‍රියාවන්ගේ මූලධර්මය වී පවතී.

මෙසේ, අපි විරුද්දකම් පෑමේ යුද්ධය මුළු එකක් වශයෙන් ගනිමු නම්, අපට අපේ උපායමාර්ගික ආරක්ෂාවීමේ අරමුණ මුදුන්පත් කරගෙන, අන්තිමේදී ජපන් අධිරාජ්‍යවාදය පරාජය කරන්ට හැකි වන්නේ නිත්‍ය සංග්‍රාමය ත් ගොරිල්ලා සංග්‍රාමය ත් යන දෙකේදී ම කරන බොහෝ වූ පහරදීමේ යුද්ධව්‍යාපාර වල ත් සටන් වල ත් සංචිත ප්‍රතිවිපාකය තුළින් බව, එනම්, පහරදීමේ ක්‍රියාවන්හිදී ලබන බොහෝ ජයග්‍රහණයන්ගේ සංචිත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රතිවිපාකය තුළින් බව, එසේ ම පෙනී යයි. උපායමාර්ගික පෙරළා–පහරදීමක් දියත් කොට ජපන් අතික්‍රමණිකයන් චීනයෙන් පිටට එළවා දමන්ට හැකි වනු වස්, ජාත්‍යන්තර තත්වයෙහි වෙනස්වීම් ද සතුරා අභ්‍යන්තර වශයෙන් ඇදවැටීම ද ඉක්මන් කරන හෝ බලාපොරොත්තු ව සිටින අතර විරුද්දකම් පෑමට අපට ඇති හැකියාව වැඩි කර ගැනීමට කාලය ලබා ගැනීම අදහස් කරන්නා වූ, උපායමාර්ගික දිග්ගැස්සුණු බව පිළිබඳ අපේ පරමාර්ථය මුදුන්පත් කරගන්ට අපට හැකි වන්නේ ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ බොහෝ යුද්ධව්‍යාපාර වල ත් සටන් වල ත් සංචිත ප්‍රතිවිපාකය, එනම්, පහරදීමේ යුද්ධව්‍යාපාර සහ සටන් වලදී ඉක්මනින් විසඳුමක් ලබා ගැනීම මගින් අත් කර ගත් බොහෝ ජයග්‍රහණයන්ගේ සංචිත ප්‍රතිවිපාකය, තුළින් පමණකි. අපි, උපායමාර්ගික ආරක්ෂාවීමේ අවස්ථාවේදී වේවා, උපායමාර්ගික පෙරළා–පහරදීමේ අවස්ථාවේදී වේවා, හැම යුද්ධව්‍යාපාරයකදී ම හෝ හැම සටනකදී ම, සතුරු බලසේනා සියල්ල ම නො වේ නම් ඒවායින් කොටසක් වත් වටලමින්, අප වැටලූ බලසේනා සියල්ල ම නො වේ නම් ඒවායින් කොටසක් වත් විනාශ කරමින්, වැටලූ බලසේනා විසාල සංඛ්‍යාවන් වශයෙන් අල්ලාගන්ට අපට බැරි නම් ඒවාට බරපතල තුවාල හා මරණ සිදු කරමින්, සතුරු බලසේනා වටලා විනාශ කරනු පිණිස වැඩි–බලය ඇති බලසේනා ඒකරාශි කොට, බාහිර–පේළි සටන්ව්‍යාපාර කළ යුත්තෙමු. එබඳු මුලසුන් කිරීමේ සටන් බොහෝ ගණනක සංචිත ප්‍රතිවිපාකය මගින් පමණකි, සතුරා ත් අප ත් අතර ඇති පරස්පර තත්වය වෙනස් කිරීමට ද, ඔහුගේ උපායමාර්ගික වටලෑම — ඒ කියන්නේ, බාහිර-පේළි සටන්ව්‍යාපාර පිළිබඳ ඔහුගේ වැඩපිළිවෙල — නිරවශේෂයෙන් ම සිඳ බිඳ දැමීමට ද, අවසාන වශයෙන්, ජාත්‍යන්තර බලවේග සහ ජපන් ජනතාවගේ විප්ලවවාදී අරගල සමග උචිත ලෙස සම්බන්ධ වී, ජපන් අධිරාජ්‍යවාදීන් වටකොට ඔවුන් කපෝති කර දමන පහර ඔවුන්ට දීමට ද අපට හැකි වන්නේ. මේ ප්‍රතිඵල අත්පත් කරගත යුතු ව තිබෙන්නේ, ගොරිල්ලා සංග්‍රාමය දෙවැනි තැන ගන්නා සේවයක් ඉටු කරමින්, ප්‍රධාන වශයෙන් නිත්‍ය සංග්‍රාමය මගින් ය. කෙසේ වේවා, ඒ දෙකට ම පොදු වන දෙය නම් ප්‍රධාන ජයග්‍රහණයක් සෑදෙන්නට පොඩි ජයග්‍රහණ රාශියක් සංචය වීම ය. විරුද්දකම් පෑමේ යුද්ධයේදී ගොරිල්ලා සංග්‍රාමය සතු ශ්‍රේෂ්ඨ උපායමාර්ගික කොටස රැඳී තිබෙන්නේ මෙහි ය.

දැන් අපි ගොරිල්ලා සංග්‍රාමයෙහි මුලපිරුම, නැමෙන සුලු බව සහ සැලැස්ම කිරීම ගැන සාකච්ඡා කරමු.

ගොරිල්ලා සංග්‍රාමයේදී මුලපිරුම නම් කුමක් ද?

කවර යුද්ධයකදී හෝ, ප්‍රති–පාක්ෂිකයෝ සටන්බිමක වේවා, සටන් ප්‍රදේශයක වේවා, යුද්ධ කලාපයක වේවා, නැතහොත් මුළු යුද්ධයෙහි ම වේවා, මුලපිරුම ලබා ගැනීම පිණිස තරග කරති; මුලපිරුමේ තේරුම හමුදවක් සඳහා ක්‍රියා කිරීමේ නිදහස තිබීම වන නිසා ය. මුලපිරුම නැති වීමෙන් අක්‍රියාකාරී තත්වයකට බලෙන් ම පත් කරනු ලබන සහ ක්‍රියා කිරීමේ නිදහස නැති වන හමුදවක් පරාජය වීමේ හෝ විධ්වංශනය කරනු ලැබීමේ අනතුරට මුහුණ පායි. ස්වභාවයෙන් ම, මුලපිරුම ලබා ගැනීම උපායමාර්ගික ආරක්ෂාවීමේ සහ ඇතුල්–පේළි සටන්ව්‍යාපාරවලදී වඩා දුෂ්කර ය, පහරදීමේ බාහිර–පේළි සටන්ව්‍යාපාරවලදී වඩා පහසු ය. කෙසේ වේවා, ජපන් අධිරාජ්‍යවාදයට මූලික දුර්වලකම් දෙකක් තිබේ; එනම්, ඊට භටයන් හිඟ වීම ත්, එය විදේශීය භූමියක් මත සටන් කරන්නේ ය යන සත්‍ය කාරණය ත් ය. එමතු නො ව, එය චීනයේ ශක්තිය අඩුවෙන් තක්සේරු කිරීම ත් ජපන් යුදවාදීන් අතර පවත්නා අභ්‍යන්තර ප්‍රතිවිරෝධ ත් නිසා, කඩින් කඩ අතිරේක ආධාර බලසේනාවන් එවීම, උපායමාර්ගික උචිත සම්බන්ධයක් නොමැතිවීම, පහරදීම පිණිස ප්‍රධාන දිසාවක් ඉඳහිට නො තිබීම, ඇතැම් සටන්ව්‍යාපාරවලදී ලැබෙන ඉඩප්‍රස්තාවන් අල්ලා ගැනීමට අසමත් වීම සහ වට කළ බලසේනාවන් මුල්පිස දමන්ට අසමත් වීම වැනි, විධානයේදී කරන බොහෝ වැරදි ඇති වී ඇත; මේ සියල්ල ම ජපන් අධිරාජ්‍යවාදයේ තුන්වැනි දුර්වලකම ලෙස සලකනු හැකි ය. මෙසේ, පහරදීමෙහි යෙදී සිටීමේ ත් බාහිර පේළි වල සටන් කරගෙන යාමේ ත් වාසිය ජපන් යුදවාදීන්ට තිබෙන නමුත්, ඔවුන්ට භටයන් හිඟවීම (ඔවුන්ගේ කුඩා භූමිප්‍රදේශය, කුඩා ජනගහණය, ප්‍රමාණවත් නො වන වත්පොහොසත්කම්, රදළවාදී අධිරාජ්‍යවාදය යනාදිය) නිසා ද, ඔවුන් සටන් කරන්නේ විදේශීය පොළවක ය යන සත්‍ය කාරණය (ඔවුන්ගේ යුද්ධය අධිරාජ්‍යවාදී සහ ම්ලේච්ඡ යුද්ධයක් වීම) නිසා ද, විධානයෙහි ලා ඔවුන් කරන ගොන්කම් නිසා ද, ඔවුන් හට අනුක්‍රමයෙන් මුලපිරුම නැති වේගෙන යයි. ජපානය වර්තමාන අවස්ථාවේදී යුද්ධය අවසන් කරන්ට කැමති වන්නේ නැත, එසේ කරන්ට ඇට පුළුවන් වන්නේ ත් නැත; ඇගේ උපායමාර්ගික පහරදීම තවම කෙළවරකට පත් වී ද නැත; එහෙත්, සාමාන්‍ය වශයෙන් කරුණු බර වේගෙන යන පිළිවෙලින් පෙනී යන පරිදි, ඇගේ පහරදීම යම් යම් සීමාවන් තුළ හිර වී තිබේ: එය ඇගේ දුර්වලකම් තුනේ නො වැළැක්විය හැකි විපාකය යි; ඈ විසින් මුළු චීනය ම ගිලගන්නා තෙක් කාල නියමයක් නැති ව යුද්ධය කරගෙන යන්ට ඇට බැරි ය. කිසියම් දිනෙක තමා හොඳට ම අක්‍රියාකාරී වූ තත්වයකට වැටී සිටින බව ජපානයට පෙනී යන බවට සලකුණු දැන් ම දක්නට ඇත. අනික් අතට, චීනය යුද්ධය පටන් ගන්නා අවස්ථාවේ සිටියේ තරමක් අක්‍රියාකාරී වූ තත්වයක ය; එහෙත්, අත්දැකීම් ලබාගෙන, ඈ දැන් ජංගම සංග්‍රාමය පිළිබඳ අළුත් ප්‍රතිපත්තියට, යුද්ධව්‍යාපාර සහ සටන් වලදී පහරදීම පටන් ගැනීමේ, ඉක්මනින් විසඳුමක් ලබා ගන්ට සෙවීමේ සහ බාහිර පේළි වල සටන් කිරීමේ ප්‍රතිපත්තියට, හැරෙමින් සිටී; ගොරිල්ලා සංග්‍රාමය පුළුල් ලෙස වර්ධනය කිරීමේ ප්‍රතිපත්තිය ත් සමග ගත් කල, මෙය මුලපිරුම ලබා ගැනීමේ තත්වයක් ගොඩනඟාගන්ට දිනක් පාසා ම චීනයට ආධාර කරයි.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

මුලපිරුම පිළිබඳ ප්‍රශ්නය ගොරිල්ලා සංග්‍රාමයේදී වඩාත් ම වැදගත් ය. කවර හෙයින් ද යත්, ගොරිල්ලා සේනාංග පසුමුණක් නැතිව, තමන්ගේ දුබල බලසේනාවන් සතුරාගේ ප්‍රබල බලසේනාවන්ට මුහුණ දෙමින්, (සේනාංග අළුත සංවිධානය කළ ඒවා වන විට) අත්දැකීම් නොමැතිව, වෙන් වෙන් ව සිටිමින් ආදි වශයෙන් සටන් කරමින්, ඉතා දුෂ්කර වූ වටාපිටා තත්වයන් තුළ ක්‍රියා කරගෙන යන නිසා ය. ඒ එසේ වුව ද, ගොරිල්ලා සංග්‍රාමයේදී මුලපිරුම ගොඩනගාගන්ට පුළුවන්කම තිබේ; එහි ලා අත්‍යවශ්‍ය කරුණ නම් සතුරාගේ දුර්වලකම් තුන අල්ලාගැනීම ය. (යුද්ධය මුළු එකක් වශයෙන් ගෙන බලන කල) සතුරාට භටයන් හිඟ වීම වාසියක් කර ගනිමින්, සුවිසාල ප්‍රදේශ තමන්ගේ සටන් කරගෙන යන ක්ෂේත්‍ර ලෙස අභීත ව පාවිච්චි කරන්ට ගොරිල්ලා සේනාංග වලට හැකි ය; සතුරා පිටින් ආ අතික්‍රමණිකයෙකි, ඔහු ඉතා ම ම්ලේච්ඡ ප්‍රතිපත්තියක් ලුහුබඳී යන සත්‍ය කාරණය වාසියක් කර ගනිමින්, දස ලක්ෂ ගණන් මිනිසුන්ගේ අනුබලය අභීත ලෙස තමන්ට ලබාගන්ට ගොරිල්ලා සේනාංග වලට හැකි ය; සතුරාගේ විධානයෙහි ඇති ගොන්කම් වාසියක් කර ගනිමින්, තමන්ගේ විචක්ෂණතාව සම්පූර්ණයෙන් ම ක්‍රියාවේ යොදන්ට ගොරිල්ලා සේනාංග වලට හැකි ය. නිත්‍ය හමුදාව ද සතුරාගේ මේ සියලු දුර්වලකම් අල්ලාගෙන, ඔහු පරාජය කරනු පිණිස ඒවායින් හොඳට ප්‍රයෝජන ගත යුතු වන අතර, ගොරිල්ලා සේනාංග විසින් එසේ කිරීම වඩා ත් වැදගත් වේ. ගොරිල්ලා සේනාංග වල ම දුර්වලකම් සම්බන්ධයෙන්, අරගලය කරගෙන යන විට ඒවා අනුක්‍රමයෙන් අඩු කර ගත හැකි ය. එමතු නො ව, මේ දුර්වලකම් ඇතැම් විට මුලපිරුම ලබා ගැනීම පිණිස උවමනා ම කරන තත්වය තනයි. උදාහරණ වශයෙන්, ගොරිල්ලා සේනාංගයන් කුඩා නිසා ම ය, ඔවුන් ගැන කිසි ම දෙයක් කරන්ට සතුරා අපොහොසත් ව සිටියදී, සතුරු පේළි වලට පිටිපසින් තමන් ගෙනයන සටන්ව්‍යාපාර වලදී ගුප්ත ලෙස පහළ වෙන්ට සහ අතුරුදන් වෙන්ට ත්, එසේ සුවිසාල නිත්‍ය හමුදාවන්ට කිසි කලෙක භුක්ති විඳින්ට බැරි විධියේ ක්‍රියා කිරීමේ නිදහසක් භුක්ති විඳින්ට ත්, ඔවුන්ට පුළුවන්කම ඇත්තේ.

සතුරා කිහිප දිසාවකින් එක ම තැනකට යොමු කළ පහරක් දෙන කල, ගොරිල්ලා සේනාංගයකට මුලපිරුම ක්‍රියාවේ යෙදිය හැකි වන්නේ අමාරුවෙන් ය; ඉතා පහසුවෙන් එය නැති වී යන්ට ද පුළුවනි. එබඳු අවස්ථා-වකදී, ඒ සේනාංගය කරන තක්සේරු කිරීම් සහ බලසේනා වින්‍යාස කිරීම් වැරදි නම්, එය අක්‍රියාකාරි තත්වයකට වැටෙන්ට ත්, එහි විපාකය වශයෙන් එක ම තැනට යොමු කරගෙන එන සතුරු ප්‍රහාරය සිඳ බිඳ දැමීමට අසමත් වෙන්ට ත් ඉඩ ඇත්තේ ය. සතුරා ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට සහ අප පහරදීමෙහි යෙදී සිටින විට ද මෙය සිදු වෙන්ට ඉඩ තිබේ. කවර හෙයින් ද යත් මුලපිරුම ලැබෙන්නේ (අපේ ම සහ සතුරාගේ ද) තත්වය

ගැන කරන නිවැරදි තක්සේරුවක ත් යොදන නිවැරදි යුද්ධමය සහ දේශපාලන විධිවිධාන වල ත් ප්‍රතිඵලයක් වශයෙන් නිසා ය. විෂයමූල තත්වයන්ට අනුරූප නො වන අශුභවාදි තක්සේරුවක් සහ එයින් ඇති වන අක්‍රියාශීලි විධිවිධාන නිසා නිසැකයෙන් ම ලැබෙන ප්‍රතිඵලය නම් මුලපිරුම නැති වී යාම ත් අයකු අක්‍රියාකාරි අඩියකට වැටීම ත් ය. අනික් අතට, විෂය-මූල තත්වයන්ට අනුරූප නො වන්නා වූ පමණට වඩා ශුභවාදි තක්සේරුවක් සහ එයින් ඇති වන අවදානම් සහිත (අයුතු ලෙස අවදානම් සහිත) විධිවිධාන නිසා ද ලැබෙන ප්‍රතිඵලය මුලපිරුම නැති වී යාම ත් අන්තිමේදී අයකු අශුභ-වාදින් වැටෙන අඩියට සමාන අඩියකට වැටීම ත් ය. මුලපිරුම සහජ බුද්ධියේ ගුණයක් නො ව, බුද්ධිමත් නායකයකු විෂයමූල තත්වයන් විවෘත මනසකින් හදරා, නිවැරදි ලෙස තක්සේරු කිරීම මගින් ද නිවැරදි යුද්ධමය සහ දේශපාලන විධිවිධාන යෙදීම මගින් ද අත් කරගන්නා දෙයකි. එයින් නිගමනය වන්නේ මුලපිරුම තනා සූදනම් කර තිබෙන දෙයක් නො ව හැඟීම් සහිත ව පරිශ්‍රම දරා අත් කර ගත යුතු දෙයක් බව ය.

කිසියම් වැරදි තක්සේරුවක් සහ විධිවිධානයක් මගින් හෝ, ඉතා අධික පීඩනය මගින් හෝ, අක්‍රියාකාරි අඩියකට බලෙන් ම වැටෙන්නට සිදු වූ කල, ගොරිල්ලා සේනාංගයක් එයින් අත්මිදෙන්ට වෙර දැරිය යුතු ය. මෙය කෙසේ කළ හැකි ද යනු වටාපිටා තත්වයන් මත රඳා පවතී. බොහෝ අවස්ථාවන්හි ''මග හැර යාම'' අවශ්‍ය ය. මග හැර යන්ට පුළුවන්කම ගොරිල්ලා සේනාං-ගයක සුවිශේෂ අංගලක්ෂණයකි. මග හැර යාම අක්‍රියාකාරි අඩියකින් ගොඩ ඒමේ ත් මුලපිරුම නැවත ලබා ගැනීමේ ත් ප්‍රධාන ක්‍රමය වේ. එහෙත් එය එක ම ක්‍රමය නො වේ. සතුරා ඉතා ම ලොකු උද්‍යෝගයකින් ක්‍රියා කරන්නා වූ ද අප ඉතා ම ලොකු අමාරුකම් වලට මැදි වී සිටින්නා වූ ද මොහොත බොහෝ විට කරුණු ඔහුට විරුද්ධ ව ත් අපට හිතකර ව ත් හැරෙන්ට පටන් ගන්නා මොහොත ම වේ. බොහෝ විට ''තව ටික වේලාවක් අල්ලාගෙන සිටීමේ'' ප්‍රතිඵලයක් වශයෙන් හිතකර තත්වයක් නැවත ඇති වී, මුලපිරුම නැවත අත්පත් වේ.

ඊළඟට අපි නැමෙන සුලු බව ගැන කතා කරමු.

නැමෙන සුලු බව මුලපිරුම නියම වශයෙන් ප්‍රකාශයට පත් වීමකි. බලසේනාවන් නැමෙන සුලු ලෙස ක්‍රියාවෙහි යෙදීම ගොරිල්ලා සංග්‍රාමයේදී නිත්‍ය සංග්‍රාමයේදීට ත් වඩා අත්‍යවශ්‍ය ය.

තම බලසේනාවන් නැමෙන සුලු ලෙස ක්‍රියාවෙහි යෙදීම සතුරා ත් අප ත් අතර පවතින තත්වය වෙනස් කිරීමේ ද මුලපිරුම ලබාගැනීමේ ද ඉතා ම වැදගත් විධිය බව ගොරිල්ලා අණදෙන්නෙක් තේරුම් ගත යුතු ය. ගොරිල්ලා සංග්‍රාමයේ ස්වභාවය කෙබඳු ද යත් ගොරිල්ලා බලසේනාවෝ අතේ තිබෙන වැඩය අනුව ද, සතුරාගේ තත්වය, භූමිභාගය සහ ප්‍රාදේශික

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ජනගහණය වැනි වටාපිටා තත්වයන් අනුව ද නැමෙන සුලු ලෙස ක්‍රියාවෙහි යෙදිය යුතු වෙත්; බලසේනාවන් ක්‍රියාවෙහි යෙදීමේ ප්‍රධාන විධි විසිරී සිටින්ට සැලසීම, ඒකරාශි කිරීම සහ තැන් මාරු කිරීම ය. තම බලසේනාවන් ක්‍රියා-වෙහි යෙදීමේදී, ගොරිල්ලා අණදෙන්නෙක් තම දැල එළන මස්මරන්නකු වැනි වේ; ඔහු ඒ දැල පුළුල් ලෙස එළන්නට මෙන් ම අකුලා ඇදගන්නට ද සමත් විය යුතු ය. තම දැල එළන කල, මස්මරන්නකු විසින් ජලයේ ගැඹුර, දියපාරේ වේගය සහ අවහිරයන් ඇති නැති බව නිශ්චය කළ යුතු වේ; එපරිද්දෙන් ම, තම සේනාංග විසිරී සිටින්ට සලසන විට, ගොරිල්ලා අණ-දෙන්නෙක් තත්වය ගැන නොදත්කමෙන් හෝ වැරදි ලෙස ගණන් බැලූ ක්‍රියාව මගින් හෝ අලාභහානි නො සිදු කර ගන්නට සැලකිලිමත් විය යුතු ය. මස්මරන්නා තම දැල අකුලා ඇදගැනීම පිණිස යොත තදින් අල්ලා-ගෙන සිටිය යුතු ය; එපරිද්දෙන් ම, ගොරිල්ලා අණදෙන්නෙක් තම සියලු ම බලසේනාවන් සමග සම්බන්ධතාව සහ පණිවිඩ හුවමාරුව පවත්වා ගත යුතු ය, තම ප්‍රධාන බලසේනාවන් ගෙන් සෑහෙන කොටසක් අත ළඟ තබා ගත යුතු ය. මස්මැරීමේදී නිතර නිතර තැන් මාරු කිරීමක් අවශ්‍ය වන්නා සේ ම, ගොරිල්ලා සේනාංගයකට ද නිතර නිතර තැන් මාරු කිරීමක් අවශ්‍ය වේ. විසිරී සිටින්ට සැලසීම, ඒකරාශි කිරීම සහ තැන් මාරු කිරීම ගොරිල්ලා සංග්‍රාමයේදී නැමෙන සුලු ලෙස බලසේනාවන් ක්‍රියාවේ යෙදීමේ විධි තුන වේ.

සාමාන්‍යයෙන් කියන කල, ගොරිල්ලා සේනාංග විසිරී සිටින්ට සැලසීම, නැතහොත් "මුළු එක කොටස් වලට කැඩීම", කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන්: (1) සතුරා ආරක්ෂාවීමෙහි යෙදී සිටින නිසා සහ ක්‍රියාව පිණිස අපේ බලසේනාවන් එක්රැස් කිරීමේ අවසරයක් තාවකාලික වශයෙන් නොමැති වීම නිසා පුළුල් පෙරමුණු ප්‍රහාරයකින් සතුරාට තර්ජනය කරන්ට අපට උවමනා වන කල, (2) සතුරාගේ බලසේනාවන් දුර්වල ව සිටින ප්‍රදේශයක් පුරා ම ඔහුට හිරිහැර කරන්ට සහ ඔහුගේ වැඩ අවුල් කරන්ට අපට උවමනා වූ කල, (3) සතුරාගේ වටලෑම බිඳගෙන පැන යන්ට අපට බැරි කල සහ හැකි තරම් අප්‍රකට ලෙස ලිස්සා යන්ට අප උත්සාහ කරන කල, (4) අප භූමිභාගය විසින් හෝ සපයන-දේ වලින් හෝ සීමා වී සිටින කල හෝ, (5) අප පුළුල් ප්‍රදේශයක් පුරා බහුජන වැඩ කරගෙන යන කල ය. එහෙත් වටාපිටා තත්වයන් කවරක් වුව ද, ක්‍රියාව පිණිස විසිරී යන කල අපි මතු දක්වන දේ කෙරෙහි අවධානය යොමු කළ යුත්තෙමු: (1) අප විසින් කිසි විටෙක ඒකාන්තයෙන් ම සමාන ලෙස බලසේනාවන් විසිරී සිටින්ට සැල-සීමක් නො කළ යුතු ය; ඇති විය හැකි කිසියම් හදිස්සි තත්වයකට මූණ දිය හැකි වන සේ ත් විසිරී සිටිමින් කරගෙන යන කර්තව්‍යයට ගුරුත්ව කේන්-ද්‍රයක් තිබෙන සේ ත්, බලසේනාවන් ගෙන් තරමක් විසාල කොටසක් ඔවුන් හසුරුවන්ට පහසු ප්‍රදේශයක තබාගත යුතු ය; (2) අප විසින් විසිරී සිටීමට සලසනලද සේනාංග වලට පැහැදිලි ලෙස පහද පණවනලද කර්තව්‍ය,

ක්‍රියාවේ යෙදෙන ක්ෂේත්‍ර, ක්‍රියාව පිණිස කාල සීමා, නැවත රැස්වීමට තැන් සහ සම්බන්ධතාව පවත්වා ගන්නා මාර්ග සහ ක්‍රම පැවරිය යුතු ය.

බලසේනාවන් ඒකරාශි කිරීම, නැතහොත් "කොටස් මුළු එකක් බවට එකතු කිරීම", සතුරා පහරදීමෙහි යෙදී සිටින විට ඔහු විනාශ කිරීමට හෝ, ඇතැම් විට ඔහු ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට ඔහුගේ නතර වී සිටින බලසේනාවන් ගෙන් සමහරක් විනාශ කිරීමට හෝ, සාමාන්‍යයෙන් යොදන ක්‍රමය වේ. බලසේනාවන් ඒකරාශි කිරීම යන්නෙන් අදහස් වන්නේ ඒකාන්ත වශයෙන් ඒකරාශි කිරීම නො වේ; බලසේනාවන් ගෙන් කොටසක් සතුරා හිර කර තබා ගැනීම, ඔහුට හිරිහැර කිරීම හෝ ඔහු අවුල් පවුල් කර දැමීම පිණිස, නැතහොත් බහුජන වැඩ කරගෙන යාම පිණිස, වෙනත් දිසාවන්හි ප්‍රයෝජනය සඳහා තබා ගන්නා අතර හෝ පිටත් කර යවන අතර ප්‍රධාන බලසේනාවන් එක් වැදගත් දිසාවක රැස් කිරීම ය.

වටාපිටා තත්වයන්ට අනුව බලසේනාවන් නැමෙන සුලු ලෙස විසිරී සිටින්ට සැලසීම හෝ ඒකරාශි කිරීම ගොරිල්ලා සංග්‍රාමයේදී ප්‍රධාන ක්‍රමය වන නමුදු, අපේ බලසේනාවන් නැමෙන සුලු ලෙස වෙන තැනකට ගෙනයන (හෝ මාරු කරන) සැටි ද අපි දන සිටිය යුත්තෙමු. ගොරිල්ලා භටයන් ගෙන් බරපතල ලෙස තර්ජනයක් එල්ල වන බව සතුරාට හැඟෙන කල, ඔහු ඔවුන්ට පහර දෙනු පිණිස හෝ ඔවුන් මැඩලනු පිණිස හෝ භට-කණ්ඩායම් එවනවා ඇත. එහෙයින් තත්වය මැනගන්ට ගොරිල්ලා සේනාංගයන්ට සිදු වෙනවා ඇත. නුවණට හුරු නම්, ඔව්හු තමන් සිටින තැන සිටිමින් ම සටන් කළ යුත්තාහ; නැත්නම්, ඔව්හු මඳකුදු පමා නො වී වෙන තැනකට මාරු විය යුත්තාහ. ඇතැම් විට, සතුරු සේනාංග එකින් එක තළා දමනු වස්, එක් තැනකදී සතුරු බලසේනාවක් විනාශ කර සිටින ගොරිල්ලා සේනාංග දෙවැනි සතුරු බලසේනාවක් විනාශ කර දමන සේ වහා ම වෙන තැනකට මාරුවෙන්ට ඉඩ තිබේ; ඇතැම් විට, එක් තැනක සටන් කිරීම නුවණට හුරු නො වන බව පෙනී ගොස්, යුහුව ඒ සටනින් ඉවත් වී වෙන තැනක සතුරා සමග සටන් කරන්ට ඔවුන්ට සිදු විය හැකි ය. එක්තරා තැනක සතුරාගේ බලසේනාවන් විශේෂයෙන් ම බරපතල තර්ජනයක් එල්ල කරත් නම්, ගොරිල්ලා සේනාංග එතැන පමා නො විය යුතු ය, විදුලි වේගයෙන් ඉවත් වී යා යුතු ය. සාමාන්‍යයෙන් තැන් මාරු කිරීම රහසින් ද සීඝ්‍රයෙන් ද කළ යුතු ය. සතුරා රැවටීම, නොමග යැවීම සහ මුලා කිරීම පිණිස, ඔව්හු නිතර ම, නැගෙනහිරට පහර දෙන බවක් බොරුවට අඟවා බටහිරට පහර දීම, වරෙක දකුණෙහි ද වරෙක උතුරෙහි ද පෙනී සිටීම, ගසා-දුවන ප්‍රහාර සහ රාත්‍රී ක්‍රියාවන් වැනි, කූට උපාය යෙදිය යුත්තාහ.

විසිරී සිටීමට සැලසීම, ඒකරාශි කිරීම සහ සිටින තැන් මාරු කිරීම යන මේවායේ නැමෙන සුලු ගතිය ගොරිල්ලා සංග්‍රාමයේදී මූලසිරුම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඇත්තට ම ප්‍රකාශ වීමක් වන අතර, නො නැමෙන සුලු ගතිය සහ උදසීන බව නො වැළකිය හැකි ලෙස ම අක්‍රියාකාරිත්වය කරා පමුණුවා, අනවශ්‍ය පාඩු සිදු කරයි. එහෙත් අණදෙන්නකු තමා බුද්ධිමත් බව ඔප්පු කරන්නේ හුදෙක් තම බලසේනාවන් නැමෙන සුලු ලෙස ක්‍රියාවේ යෙදීමේ වැදගත්කම පිළිගැනීමෙන් නො ව, විශේෂිත වටාපිටා තත්වයන්ට අනුව යථා කාලයෙහි ඔවුන් විසිරී සිටින්ට සැලසීමෙහි, ඒකරාශි කිරීමෙහි හෝ වෙන තැන් වලට මාරු කිරීමෙහි ලා ඇති දක්ෂතාව මගින් ය. වෙනස්වීම් වටහාගැනීමේ ත් ක්‍රියා කිරීමට නිසි මොහොත තෝරාගැනීමේ ත් මේ බුද්ධිය පහසුවෙන් අත් කර ගත හැකි නො වේ; එය ලබා ගත හැක්කේ ඉක්මනින් වටහා ගත හැකි මනසක් ඇති ව අධ්‍යයනය කරන, අනලස් ලෙස විමසා බලන සහ කල්පනා කර බලන අය විසින් පමණකි. නැමෙන සුලු බව හැඟීමෙන් පෙළඹී ක්‍රියා කිරීම බවට හැරීම වළකනු පිණිස වටාපිටා තත්වයන් ගැන විචක්ෂණ ලෙස කල්පනා කර බැලීම අත්‍යවශ්‍ය ය.

අවසාන වශයෙන්, අපි සැලැස්ම කිරීමට එමු.

සැලැස්ම කිරීමක් නොමැතිව, ගොරිල්ලා සංග්‍රාමයේදී ජය ලබන්ට කොහෙත් ම බැරි ය. ගොරිල්ලා සංග්‍රාමය එහෙන් මෙහෙන් අපිළිවෙලට කරගෙන යා හැකි ය යන කවර අදහසකින් හෝ පෙන්නුම් කරන්නේ එක්කෝ චපල ආකල්පයකි, නැතහොත් ගොරිල්ලා සංග්‍රාමය ගැන නොදත්කම ය. මුළු එකක් වශයෙන් ගොරිල්ලා කලාපයක, නැතහොත් ගොරිල්ලා සේනාංගයක හෝ සේනාවක, සටන්ව්‍යාපාර පටන් ගැනීමට කලින් හැකි තරම් අනූන ලෙස සැලැස්ම කිරීමක්, හැම ක්‍රියාවක් සඳහා ම කල්තබා සූදනම් වීමක්, කළ යුතු ය. තත්වය හොඳින් තේරුම් ගැනීම, කරන්ට තිබෙන වැඩ නියම කිරීම, බලසේනාවන් වින්‍යාස කිරීම, යුද්ධ සහ දේශපාලන පුහුණුව දීම, සපයන-දේ ලබා ගැනීම, උපකරණ හොඳ තත්වයෙන් තබා ගැනීම, ජනතාව දෙන ආධාර වලින් නිසි ප්‍රයෝජන ගැනීම යනාදි මේ සියල්ල ම ගොරිල්ලා අණදෙන්නන් සතු වැඩ කොටසකි; ඔව්හු ඒවා සැලකිල්ලෙන් සිතාමතා බැලිය යුතු ය, බාරදූර ලෙස ඉටු කළ යුතු ය, හරි වැරදි පිරික්සා බැලිය යුතු ය. ඔවුන් එසේ කරන තුරු මූලපිරුමක් තිබෙන්ට බැරි ය, නැමෙන සුලු බවක් තිබෙන්ට බැරි ය, පහරදීමක් තිබෙන්ට බැරි ය. ඇත්ත, නිත්‍ය සංග්‍රාමයේ තත්වයන් ගෙන් ඉඩ ලැබෙන තරම් උසස් ප්‍රමාණයකට සැලැස්ම කිරීමට ගොරිල්ලා සංග්‍රාමයේ තත්වයන් ගෙන් ඉඩ ලැබෙන්නේ නැත, ගොරිල්ලා සංග්‍රාමයේදී ඉතා අනූන ලෙස සැලැස්ම කරන්ට උත්සාහ කිරීම වරදක් වෙන්ට ඉඩ ඇත. එහෙත් සතුරා හා සටන් කිරීම විහිළුවක් නො වන බව තේරුම් ගත යුතු ය; එනිසා, විෂයමූල තත්වයන් ගෙන් අවසර ලැබෙන තරම් අනූන ලෙස සැලැස්ම කිරීම අවශ්‍ය වේ.

ඉහතින් සඳහන් කළ කරුණු ගොරිල්ලා සංග්‍රාමයේ උපායමාර්ගික මූලධර්ම අතුරෙන් පළමුවැන්න, එනම් ආරක්ෂාවීම තුළ පහරදීම ද, දිග්ගැසුණු යුද්ධය තුළ ඉක්මනින් විසඳුමක් ලබාගැනීමේ සටන් ද, ඇතුල්-පේළි සටන්ව්‍යාපාර තුළ බාහිර-පේළි සටන්ව්‍යාපාර ද කරගෙන යාමේදී මූලපිරුම, නැමෙන සුලු බව සහ සැලැස්ම කිරීම යන මේවා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ මූලධර්මය, පැහැදිලි කිරීමට ආධාර වේ. එය ගොරිල්ලා සංග්‍රාමයේ උපායමාර්ගයෙහි ප්‍රධාන ගැටළුව ය. මේ ගැටළුව විසඳීමෙන් යුද්ධමය විධානයට අදළ වූ පමණින් ගොරිල්ලා සංග්‍රාමයේදී ජය ලැබීම ගැන ප්‍රධාන සහතිකය ලැබේ.

මෙහි විවිධ කරුණු රැසක් ගැන විස්තර කර තිබෙන නමුදු, ඒ සියල්ල යුද්ධව්‍යාපාර වලදී ත් සටන් වලදී ත් පහරදීම වටා කැරකෙයි. මූලපිරුම තීරණාත්මක ලෙස ග්‍රහණය කර ගත හැකි වන්නේ පහරදීමකදී ලබන ජයග්‍රහණයට පසු ව පමණකි. හැම පහරදීමේ සටන්ව්‍යාපාරයක් ම අපේ මූලපිරුම උඩ සංවිධානය කළ යුතු ය, බල කරනු ලබන නිසා දියත් නො කළ යුතු ය. බලසේනාවන් ක්‍රියාවේ යෙදීමෙහි ලා නැමෙන සුලු ගතිය පහරදීමට බහින්ට දරන ප්‍රයත්නය වටා කැරකෙයි; එසේ ම සැලැස්ම කිරීම අවශ්‍ය වන්නේ ප්‍රධාන වශයෙන් පහරදීමේ සටන්ව්‍යාපාර වලදී සාර්ථකභාවය සහතික කරනු වස් ය. උපක්‍රමික ආරක්ෂණය පිණිස ගන්නා පියවර පහරදීමකට කෙළින් ම හෝ වටින් පිටින් හෝ අනුබල දීමෙහි ලා ඒවා සතු කොටසින් වියෝග වී ඇත් නම්, ඒ පියවර තේරුමක් නැති වේ. ඉක්මනින් විසඳුමක් ලබාගැනීම යන්නෙන් පහරදීමක් කරගෙන යන වේගය ගැන සඳහන් වේ, බාහිර-පේළි යන්නෙන් පහරදීමක් පැතිරී පවතින හරිය ගැන සඳහන් වේ. පහරදීම සතුරා විනාශ කිරීමේ එක ම විධිය සහ තමා රැකගැනීමේ ප්‍රධාන විධිය ද වන අතර, හුදු ආරක්ෂණයට සහ පසුබැසීමට හැකි වන්නේ තමා රැකගැනීමේදී තාවකාලික වූ ත් අඩාල වූ ත් කොටසක් රඟපාන්ට පමණකි; සතුරා විනාශ කිරීම පිණිස ඒවා කොහෙත් ම පලක් නැත.

ඉහතින් සඳහන් කළ මූලධර්මය නිත්‍ය යුද්ධය ත් ගොරිල්ලා යුද්ධය ත් යන දෙකට ම මූලික වශයෙන් එක ම වේ; එය එක්තරා ප්‍රමාණයකට වෙනස් වන්නේ එය ප්‍රකාශයට පත් වන ආකාරයෙන් පමණකි. එහෙත් ගොරිල්ලා යුද්ධයේදී මේ වෙනස සැලකිල්ලට ගැනීම වැදගත් ද අවශ්‍ය ද වේ. ආකාරයෙන් ඇති මේ වෙනස ම ය ගොරිල්ලා යුද්ධයේ සටන්ව්‍යාපාර ගෙන යන ක්‍රම නිත්‍ය යුද්ධයේ සටන්ව්‍යාපාර ගෙන යන ක්‍රම වලින් වෙන් කොට දක්වන්නේ. අප මේ මූලධර්මය ප්‍රකාශයට පත් වන වෙනස් ආකාර දෙක පටලවා ගත්තොත්, ගොරිල්ලා යුද්ධයේදී ජය ලබන්ට කොහෙත් ම බැරි වෙනවා ඇත.

පරිච්ඡේද V

නිත්‍ය යුද්ධය සමග උචිත ලෙස සම්බන්ධ වීම

ගොරිල්ලා සංග්‍රාමයෙහි උපායමාර්ගය පිළිබඳ දෙවැනි ගැටළුව එය නිත්‍ය සංග්‍රාමය සමග උචිත ලෙස සම්බන්ධ කිරීම ය. එය සටන්ව්‍යාපාරික

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

මට්ටමෙන් ගොරිල්ලා සංග්‍රාමය ත් නිත්‍ය සංග්‍රාමය ත් අතර පවතින සබඳකම ඇත්ත වශයෙන් පවතින ගොරිල්ලා සටන්ව්‍යාපාර වල නියම ස්වභාවය අනුව පැහැදිලි කිරීම පිළිබඳ කාරණයක් වේ. මේ සබඳකම් පිළිබඳ අවබෝධයක් සතුරා පරාජය කිරීම සාර්ථක ලෙස කරනු හැකි වීම පිණිස ඉතා වැදගත් ය.

ගොරිල්ලා සංග්‍රාමය ත් නිත්‍ය සංග්‍රාමය ත් අතර උචිත සම්බන්ධකම් තුන් වර්ගයක් ඇත; උපායමාර්ගයේදී, යුද්ධව්‍යාර වලදී සහ සටන් වලදී ඇති වන සම්බන්ධය යි.

මුළු එකක් වශයෙන් ගත් කල, සතුරා අබලන් කරන, ඔහු සිටින තැන ම හිර කර තබන, ඔහුගේ සැපයීම් මාර්ග කඩා බිඳ දමන සහ රට පුරා ම නිත්‍ය බලසේනාවන් සහ ජනතාව ප්‍රබෝධයට පත් කරන, සතුරු පේළි වලට පිටිපසින් කරන්නා වූ ගොරිල්ලා සංග්‍රාමය උපායමාර්ගයෙහි ලා නිත්‍ය සංග්‍රාමය සමග උචිත ලෙස සම්බන්ධ වී පවතී. ඊසානදිග පළාත් තුනේ ගොරිල්ලා සංග්‍රාමය පිළිබඳ ප්‍රශ්නය ගනිමු. සත්තකින් ම දේශව්‍යාප්ත විරුද්දකම් පෑමේ යුද්ධයට කලින් උචිත සම්බන්ධය පිළිබඳ ප්‍රශ්නය පැනනැගුනේ නැත; එහෙත් යුද්ධය පටන් ගත් තැන් සිට එබඳු උචිත සම්බන්ධයක වැදගත්කම ප්‍රත්‍යක්ෂ වී ඇත. එහි ගොරිල්ලාභටයන් විසින් මරනු ලබන හැම සතුරු සෙබළෙක් ම, ඔවුන් සතුරා ලවා වියදම් කරවන හැම උණ්ඩයක් ම, ඔවුන් මහා ප්‍රාකාරයෙන් දකුණට ඉදිරියට එන්ට නො දී නතර කරන හැම සතුරු සෙබළෙක් ම විරුද්දකම් පෑමේ මුළු ශක්තියට එකතු කරන කොටසක් ලෙස සැලකිය හැකි ය. එමතු නො ව, ඒවායින් මුළු සතුරු හමුදව සහ සකල ජපානය කෙරෙහි චිත්තශක්තිය පිරිහෙළන ප්‍රතිවිපාකයක් ද, අපේ මුළු හමුදව සහ ජනතාව කෙරෙහි චිත්තධෛර්යය වඩන ප්‍රතිවිපාකයක් ද ඇති කරන බව පැහැදිලි ය. පීපිං–සුයියුආන්, පීපිං–හැන්කව්, තියන්සින්–පූකව්, තාතුං–පූවව්, චෙංතිං–තයියුආන් සහ ශැංහයි–හැංචව් දුම්රිය මාර්ග දිගට ගොරිල්ලා සංග්‍රාමය විසින් උපායමාර්ගික උචිත සම්බන්ධයෙහි ලා රහපාන කොටස වඩාත් පැහැදිලි ය. සතුරා උපායමාර්ගික පහරදීමෙහි යෙදී සිටින විට, ගොරිල්ලා සේනාංග අපේ වර්තමාන උපායමාර්ගික ආරක්ෂාවීමේදී නිත්‍ය බලසේනාවන් සමග උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කිරීමේ කාර්යය ඉටු කරනවා පමණක් නො වේ; සතුරා ඔහුගේ උපායමාර්ගික පහරදීම අවසන් කොට තමා දිනා ගත් දේ රැකගැනීමට හැරුණු විට, ඔහු අල්ලාගෙන සිටින භූමිප්‍රදේශය කෙරෙහි වන ඔහුගේ ග්‍රහණය කඩා බිඳ දැමීම පිණිස ඔවුන් නිත්‍ය බලසේනාවන් සමග උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කරනවා පමණක් නො වේ; නිත්‍ය බලසේනාවන් උපායමාර්ගික පෙරළා–පහරදීම දියත් කළ විට, සතුරු බලසේනාවන් පන්නා දමා නැති වූ භූමිප්‍රදේශ ආපසු ලබා ගැනීමේදී ත් ඔවුන් නිත්‍ය බලසේනාවන් සමග උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කරනවා ඇත. උපායමාර්ගික උචිත සම්බන්ධයේදී ගොරිල්ලා

සංග්‍රාමය රහපාන ශ්‍රේෂ්ඨ කොටස අමතක නො කළ යුතු ය. ගොරිල්ලා සේනාංග ත් නිත්‍ය බලසේනා ත් යන දෙකේ ම අණදෙන්නෝ මේ කොටස පැහැදිලි ලෙස තේරුම් ගත යුත්තාහ.

ඊට අමතර ව, ගොරිල්ලා සංග්‍රාමය යුද්ධව්‍යාපාර වලදී නිත්‍ය සංග්‍රාමය සමග උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කිරීමේ කාර්යය ද ඉටු කරයි. නිදසුන් වශයෙන්, තයියුආනයට උතුරෙන්, ශින්කෞහි යුද්ධව්‍යාපාරයේදී, ගොරිල්ලාභටයෝ, තාතුං–පූවව් දුම්රිය මාර්ගය ත් පිංශිංකුආන් සහ යාංපාංකෞ ඔස්සේ දුවන මෝටර් රථ මාර්ග ත් විනාශ කිරීමෙන්, යෙන්මෙන්කුආනයට උතුරෙන් ද දකුණෙන් ද උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කිරීමෙහි ලා විශිෂ්ට කොටසක් රහපෑවෝ ය. නැතහොත් තවත් නිදසුනක් ගනිමු. සතුරා පෙංලිංතු අල්ලාගත් පසු, ඒ වන විට ශාන්සි පළාත පුරා ම පුළුල් ලෙස පැතිරී තිබුණු සහ මුඛ්‍ය වශයෙන් නිත්‍ය බලසේනාවන් විසින් කරගෙන යනලද ගොරිල්ලා සංග්‍රාමය, ශාන්සි පළාතේ කහ ගඟට බටහිරින් ද හෝනාන් පළාතේ කහ ගඟට දකුණින් ද, ආරක්ෂාවීමේ යුද්ධව්‍යාපාරය හා උචිත ලෙස සම්බන්ධ වීම මගින් ඊට ත් වඩා ශ්‍රේෂ්ඨ කොටසක් රහ පෑවේ ය. යළි, සතුරා දකුණු ශාන්ටුං පළාතට පහර දුන් කල, උතුරු චීනයේ පළාත් පහේ ගොරිල්ලා සංග්‍රාමය අපේ හමුදාවේ යුද්ධව්‍යාපාර හා උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කිරීම මගින් මහත් කොටසක් ඉටු කළේ ය. මේ විධියේ කර්තව්‍යයන් ඉටු කිරීමේදී, සතුරු පේළි වලට පිටිපසින් එක් එක් ගොරිල්ලා කඳවුරේ නායකයෝ, නැතහොත් තාවකාලික වශයෙන් එහි යවනලද ගොරිල්ලා සේනාවක අණදෙන්නෝ, තමන්ගේ බලසේනාවන් හොඳින් වින්‍යාස කළ යුත්තාහ, කලට සහ තැනට ඔබින විවිධ උපක්‍රම යොදමින්, සතුරා අබලන් කරනු වස්, ඔහු සිටින තැන ම හිර කර තබනු වස්, ඔහුගේ සැපයුම් මාර්ග කඩා බිඳ දමනු වස්, ඇතුල් පේළි වල යුද්ධව්‍යාපාර ගෙන යන අපේ හමුදවන් ප්‍රබෝධමත් කරනු වස් සහ, එසේ යුද්ධව්‍යාපාරය සමග උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කිරීමේ තම යුතුකම ඉටු කරනු වස්, සතුරාගේ ඉතා ම වැදගත් සහ පහසුවෙන් ම බිඳ හෙළිය හැකි ස්ථානයන්ට විරුද්ධ ව උද්‍යෝගයෙන් ක්‍රියා කළ යුත්තාහ. එක් එක් ගොරිල්ලා කලාපය හෝ සේනාංගය නිත්‍ය බලසේනාවන්ගේ යුද්ධව්‍යාපාර සමග උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කිරීම ගැන කිසි ම අවධානයක් යොමු නො කොට තනි ව ම ක්‍රියා කරගෙන යතොත්, එය සාමාන්‍ය උපායමාර්ගයේදි එක්තරා කොටසක් රහපාන්ට ඉඩ ඇති නමුත්, උපායමාර්ගික උචිත සම්බන්ධයේදී එය රහපාන කොටසේ වැදගත්කම බෙහෙවින් ම අඩු වෙනවා ඇත. සියලු ගොරිල්ලා අණදෙන්නෝ මේ කරුණ කෙරෙහි බැරෑරුම් ලෙස අවධානය යොමු කළ යුත්තාහ. යුද්ධව්‍යාපාර වලදී උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කිරීම පිණිස, සියලු විසාල ගොරිල්ලා සේනාංගයන්ට සහ ගොරිල්ලා සේනාවන්ට රේඩියෝ උපකරණ තිබීම ඒකාන්තයෙන් ම අවශ්‍ය ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අවසාන වශයෙන්, සටන් වලදී, එනම් යුදබිමෙහි ඇත්තට ම කරන ගහ-ගැනීමේදී, නිත්‍ය බලසේනා සමග උචිත ලෙස සම්බන්ධ වී ක්‍රියා කිරීම ඇතුල්-පේළි යුදබිමක් අවට පෙදෙසෙහි සිටින සියලු ගොරිල්ලා සේනාංග සතු කර්තව්‍යය වේ. සත්තකින් ම, මෙය අදාළ වන්නේ නිත්‍ය බලසේනාවන්ට කිට්ටුවෙන් ක්‍රියා කරන ගොරිල්ලා සේනාංග වලට හෝ තාවකාලික ගොරිල්ලා මෙහෙයයන් පිණිස යවනලද නිත්‍ය භටයන් ගෙන් සැදුණු සේනාංග වලට හෝ පමණකි. එබඳු අවස්ථාවන්හි, ගොරිල්ලා සේනාංගයක් නිත්‍ය බලසේ-නාවන්ගේ අණදෙන්නා විසින් පවරනු ලබන කවර කර්තව්‍යයක් හෝ ඉටු කළ යුතු වේ; එය සාමාන්‍යයෙන් සතුරාගේ බලසේනාවන් ගෙන් කොටසක් සිටින තැන ම හිර කර තබා ගැනීම, ඔහුගේ සැපයුම් මාර්ග කඩා බිඳ දැමීම, ඔත්තු බැලීම කරගෙන යාම, හෝ නිත්‍ය බලසේනාවන්ට මගපෙන්වන්නන් සේ ක්‍රියා කිරීම වේ. එසේ පැවරීමක් නොමැතිව වුව ද, ගොරිල්ලා සේනාංගය තමාගේ ම මුලපිරුම පිට මේ කර්තව්‍යයන් කරගෙන යා යුතු ය. යන්නෙ එන්නෙ වත් සටන් කරන්නෙ වත් නැති ව නිකම් වාඩි වී බලා සිටීම, නැතහොත් සටන් කරන්නෙ නැති ව එහෙ මෙහෙ යාම ඊම, ගොරිල්ලා සේනාංගයකට ඉවසිය නො හැකි ආකල්පයක් වෙනවා ඇත.

පරිච්ඡේද VI

කඳවුරු ප්‍රදේශ පිහිටුවීම

ජපන්-විරෝධි ගොරිල්ලා සංග්‍රාමයෙහි උපායමාර්ගයේ තුන්වැනි ගැටළුව නම්, යුද්ධයේ දිග්ගැසුණු ස්වභාවය ත් දරුණුකම ත් නිසා වැදගත් සහ අත්‍යවශ්‍ය වන කඳවුරු ප්‍රදේශ පිහිටුවීම ය. අපේ නැති වූ භූමිප්‍රදේශ ආපසු ලබාගැනීමට දේශ-ව්‍යාප්ත උපායමාර්ගික පෙරළා-පහරදීම පටන් ගන්නා තුරු බලා සිටින්ට සිදු වෙනවා ඇත; ඒ වන විට සතුරාගේ පෙරමුණ මධ්‍ය චීනයේ ඇතුළට ම ව්‍යාප්ත වී, චීනය උතුරේ සිට දකුණට දෙකට කපා තිබෙනවා ඇත, අපේ භූමිප්‍රදේශයෙන් කොටසක්, හෝ වඩා ලොකු කොටසක් පවා, සතුරාගේ අතට වැටී, ඔහුගේ පසුමුණ වෙනවා ඇත. සතුරා විසින් අල්ලාගත් මේ සුවිසාල ප්‍රදේශය පුරා ම ගොරිල්ලා සංග්‍රාමය ව්‍යාප්ත කරන්නට, සතුරාගේ පසුමුණ අපේ පෙරමුණක් කර ගන්නට සහ, ඔහු අල්ලාගෙන සිටින භූමිප්‍රදේශය මුළුල්ලේ නතර වීමක් නැති ව සටන් කරමින් සිටීමට ඔහුට බල කරන්නට අපට සිදු වෙනවා ඇත. අපේ උපායමාර්ගික පෙරළා-පහරදීම දියත් කරන කාලය එන තුරු සහ අපේ නැති වූ භූමිප්‍රදේශ ආපසු ලබා නො ගෙන තිබෙන තුරු, කොපමණ දිගු කලක් ගතවේ ද'යි කෙනකුට නිශ්චය වශයෙන් කියන්ට බැරි නමුත්, සත්තකින් ම

සෑහෙන දිගු කලක් සතුරාගේ පසුමුණෙහි අත නෑර ගොරිල්ලා සංග්‍රාමයෙහි යෙදී සිටීම අවශ්‍ය වෙනවා ඇත. යුද්ධය දිග්ගැසුණු එකක් වෙනවා ඇත්තේ මේ නිසා ය. වැලිත් අල්ලාගත් ප්‍රදේශයන්හි තමා දිනාගෙන තිබෙන දේ සුරක්ෂිත කරනු වස්, සතුරා ඔහුගේ ගොරිල්ලා-විරෝධි පියවර වැඩි කරනවා නියත ය; වෙසෙසින් ඔහුගේ උපායමාර්ගික පහරදීම නතර කළ පසු, ඔහු ගොරිල්ලාභටයන් නිර්දය ලෙස මර්දනය කරන්ට පටන් ගන්නවා නියත ය. මෙසේ දිග්ගැසුණු බවට දරුණුකම ද එකතු වූ කල, කඳවුරු ප්‍රදේශ නොමැති ව සතුරු පේළි වලට පිටිපසින් ගොරිල්ලා සංග්‍රාමය දිගට ම අල්ලාගෙන සිටින්ට කොහෙත් ම බැරි වෙනවා ඇත.

එසේ නම්, මේ කඳවුරු ප්‍රදේශ මොනවා ද? ඒවා තම උපායමාර්ගික කර්තව්‍යයන් ඉටු කිරීමේදී ත්, තමන් ආරක්ෂා කර ගැනීමේ හා ව්‍යාප්ත කර ගැනීමේ ද සතුරා විනාශ කිරීමේ සහ පන්නා දැමීමේ ද අරමුණ මුදුන්පත් කිරීමේදී ත්, ගොරිල්ලා බලසේනාවන් හේත්තු වී සිටින උපායමාර්ගික කඳවුරු ය. එබඳු උපායමාර්ගික කඳවුරු නැතිව, අපේ උපායමාර්ගික කර්තව්‍ය අතුරෙන් කිසිවක් කරගෙන යාමේදී හෝ යුද්ධයේ අරමුණ මුදුන්පත් කිරීමේදී හෝ විශ්වාස තබා රැඳී සිටීමට කිසි ම දෙයක් අපට නො තිබෙනවා ඇත. ගොරිල්ලා සංග්‍රාමය පසුමුණක් නොමැතිව කරගෙන යාම සතුරු පේළි වලට පිටිපසින් කරන ගොරිල්ලා සංග්‍රාමයේ ලක්ෂණයක් වේ; ඒ ගොරිල්ලා බලසේනාවන් රටේ සාමාන්‍ය පසුමුණෙන් කැපී වෙන් වී සිටින නිසා ය. එහෙත් කඳවුරු ප්‍රදේශ නොමැතිව බොහෝ කලක් පවතින්ට වත් වැඩෙන්ට වත් ගොරිල්ලා සංග්‍රාමයට බැරි ය. කඳවුරු ප්‍රදේශ, ඇත්-තෙන් ම, එහි පසුමුණ වේ.

''ඇවිදින කැරලිකාර'' වර්ගයේ බොහෝ ගොරිල්ලා යුද්ධ ඉතිහාස-යෙහි දක්නට ලැබේ; එහෙත් ඉන් එකක් වත් කිසි කලෙක සාර්ථක නො වී ය. දියුණු ගමනාගමන සහ සන්නිවේදන හුවමාරු සේවයන් ද කාර්මික-විද්‍යාවක් ද ඇති මේ වර්තමාන යුගයෙහි, කෙනකුට ඇවිදින කැරලිකරුවන් කළ අන්දමට සටන් කිරීමෙන් ජය දිනා ගත හැකි වේ ය'යි කල්පනා කිරීම වඩා ත් හේතු විරහිත වෙනවා ඇත. කෙසේ වේවා, මේ ඇවිදින-කැරලිකාර අදහස දුගී බවට පත් ගොවියන් අතර තවම පවතී; එය ගොරිල්ලා අණ-දෙන්නන්ගේ සිත් තුළ කඳවුරු ප්‍රදේශ අවශ්‍ය වත් වැදගත් වත් නො වේ යන මතය බවට පත් වේ. එහෙයින්, ගොරිල්ලා අණදෙන්නන්ගේ සිත් තුළින් මේ අදහස තුරන් කර දැමීම කඳවුරු ප්‍රදේශ පිහිටුවීමේ ප්‍රතිපත්තියක් ගැන තීරණය කරනු පිණිස කල්තබා තිබිය යුතු දෙයක් වේ. කඳවුරු ප්‍රදේශ ඇති කරනවා ද නැද්ද, ඒවා වැදගත් ය'යි සලකනවා ද නැද්ද යන ප්‍රශ්නය, වෙන වචන වලින්, කඳවුරු ප්‍රදේශ පිහිටුවීමේ අදහස ත් ඇවිදින කැරලිකාරයන් මෙන් සටන් කිරීමේ අදහස ත් අතර ගැටුම, සියලු ම ගොරිල්ලා සංග්‍රාම වලදී පැනනගී; එක්තරා ප්‍රමාණයකට, අපේ ජපන්-විරෝධි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගොරිල්ලා සංග්‍රාමය ද ඊට වෙනස් වූවක් නො වේ. එහෙයින් ඇවිදින-කැරලිකාර මතවාදයට විරුද්ධ අරගලය නො වැළකිය හැකි ක්‍රියාවලියකි. ගොරිල්ලා සංග්‍රාමය දිගු කලක් මුළුල්ලේ පවත්වා ගැනීමට හිතකර වූ තත්වයන් ඇති වෙනවා ඇත්තේ මේ මතවාදය නිරවශේෂයෙන් ම ජය ගෙන, කඳවුරු ප්‍රදේශ පිහිටුවීමේ ප්‍රතිපත්තිය මුලපුරා භාවිතාවේ යෙදීමෙන් පමණකි.

දැන් කඳවුරු ප්‍රදේශ වල අවශ්‍යතාව ත් වැදගත්කම ත් පැහැදිලි වී තිබෙන හෙයින්, අපි කඳවුරු ප්‍රදේශ පිහිටුවීමට ආ කල තේරුම් ගෙන විසඳිය යුතු වන මතු දක්වන ගැටළු වලට බසිමු. මේ ගැටළු නම් කඳවුරු ප්‍රදේශ වර්ග, ගොරිල්ලා කලාප සහ කඳවුරු ප්‍රදේශ, කඳවුරු ප්‍රදේශ පිහිටුවීමට අවශ්‍ය තත්ව, ඒවා තහවුරු කිරීම හා ව්‍යාප්ත කිරීම සහ, අප ත් සතුරා ත් එකිනෙකා වටලන ආකාර යන මේවා ය.

1. කඳවුරු ප්‍රදේශ වර්ග

ජපන්-විරෝධී ගොරිල්ලා සංග්‍රාමයෙහි කඳවුරු ප්‍රදේශ ප්‍රධාන වශයෙන් තුන් වර්ගයකට අයත් වේ; කඳු වල තිබෙන ඒවා, තැනි වල තිබෙන ඒවා සහ ගංගා-විල්-මෝදර ප්‍රාන්ත වල තිබෙන ඒවා වශයෙනි.

කඳුකර ප්‍රාන්තයන්හි කඳවුරු ප්‍රදේශ පිහිටුවීමේ වාසිය පැහැදිලි ය; චාංපායි[1], වූතායි[2], තායිහාන්[3], තායිශාන්[4], යෙන්ශාන්[5], මාඕශාන්[6] කඳු වල පිහිටුවා ඇති, පිහිටුවාගෙන යන හෝ පසු ව පිහිටුවනු ලබන කඳවුරු ප්‍රදේශ සියල්ල මේ වර්ගයට අයත් ය. ඒ සියල්ල ම ජපන්-විරෝධී ගොරිල්ලා සංග්‍රාමය ඉතා ම දිගු කලක් පවත්වාගෙන ගිය හැකි තැන් ය, විරුද්දකම් පෑමේ යුද්ධය සඳහා වැදගත් රක්ෂස්ථාන ය. අපි සතුරු පේළි වලට පිටිපසින් පිහිටි සියලු ම කඳුකර ප්‍රාන්තයන්හි ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කළ යුත්තෙමු, කඳවුරු ප්‍රදේශ පිහිටුවිය යුත්තෙමු.

සත්තකින් ම, තැනි කඳු වලට වඩා සුදුසුකමින් අඩු ය; එහෙත් එහි ද ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කරන්ට ත් කිසියම් කඳවුරු ප්‍රදේශයක් පිහිටුවන්ට ත් බැරිකමක් කොහෙත් ම නැත. ඇත්තෙන් ම, හෝපෙයි පළාතේ ත්, උතුරු සහ වයඹදිග ශාන්ටුං පළාතේ ත් තැනි වල බහුල ව පැතිරී ඇති ගොරිල්ලා සංග්‍රාමය තැනි වල ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කළ හැකි බව ඔප්පු කරයි. එහි කඳවුරු ප්‍රදේශ පිහිටුවා, ඒවා බොහෝ කලක් පවත්වාගෙන යා හැකි බවට සාක්ෂි තවම නැති නමුත්, තාවකාලික කඳවුරු ප්‍රදේශ පිහිටුවන්ට හැකි බව ඔප්පු වී ඇත; කුඩා සේනාංග සඳහා හෝ කලින් කල ප්‍රයෝජනය ගැනීම සඳහා හෝ කඳවුරු ප්‍රදේශ පිහිටුවන්ට පුළුවන් විය යුතු ය. එක් අතකින්, තමා මනාප ලෙස පාවිච්චි කළ හැකි තරම්

හටකණ්ඩායම් සතුරාට නැත, ඔහු නිරුපම කෲරත්වය පිළිබඳ ප්‍රතිපත්තියක් ලුහුබඳියි; අනික් අතින්, චීනයට සුවිසාල භූමිප්‍රදේශයක් ඇත, ජපානයට විරුද්දකම් පාන මිනිස්සු මහත් ගණනින් සිටිති; එහෙයින් තැනි වල ගොරිල්ලා සංග්‍රාමය පතළ කිරීමට ත් තාවකාලික කඳවුරු ප්‍රදේශ පිහිටුවීමට ත් අවශ්‍ය විෂයමූල තත්වයෝ සම්පූර්ණ වෙති. දක්ෂ යුද්ධමය විධානයක් දෙනු ලැබේ නම්, එහි කුඩා ගොරිල්ලා සේනාංග සඳහා කඳවුරු, දීර්ඝ-කාලීන නමුත් ස්ථිර නො වන කඳවුරු, පිහිටුවන්ට සත්තකින් ම පුළුවන් විය යුතු ය.[7] පුළුල් ලෙස කතා කරන කල, සතුරා ඔහුගේ උපායමාර්ගික පහරදීම අතර මග නතර කොට තමා අල්ලාගත් ප්‍රදේශ සුරක්ෂිත කර ගැනීමේ අවස්ථාවට පිවිසි කල, ඔහු නිසැකයෙන් ම සියලු ම ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ වෙත රෞද්‍ර ප්‍රහාරයන් දියත් කරනවා ඇත; වැලිත් ස්වභාවයෙන් ම ඒ ප්‍රහාරයන්ගේ පීඩාව පළමුවෙන් ම විඳින්ට සිදු වන්නේ තැනි වල පිහිටි කඳවුරු ප්‍රදේශ වලට ය. තැනි වල ක්‍රියාවෙහි යෙදී සිටින ලොකු ගොරිල්ලා සේනාවන්ට එහි බොහෝ කලක් සටන් කරගෙන යන්ට බැරි වෙනවා ඇත; වටාපිටා තත්වයන් අනුව උවමනා වන අන්දමට, නිදසුන් වශයෙන්, හෝපෙයි තැන්නේ සිට වූතායි සහ තායිහාං කඳු වලට, ශාන්ටුං තැන්නේ සිට තායිශාන් කන්දට සහ නැගෙනහිරින් ශාන්ටුං අර්ධද්වීපයට මෙන්, අනුක්‍රමයෙන් කඳු අතරට නැඟ යන්ට සිදු වෙනවා ඇත. එහෙත් අපේ ජාතික යුද්ධයේ වටාපිටා තත්වයන් තුළ සුවිසාල තැනි පුරා විවිධ උප-පළාත් වල රැඳී සිටිමින්, අනිස්ථිර පිළිවෙලකට, ඒ කියන්නේ, තම කඳවුරු තැනින් තැනට මාරු කරමින්, සටන් කරගෙන යන්ට ගණන් නැති කුඩා ගොරිල්ලා සේනාංග වලට කොහෙත් ම නො හැකි නො වේ. ග්‍රීෂ්මසෘතුවේදී උස් වගාවන් නමැති "නිල් තිරය" ද සීතසෘතුවේදී දිය මිදුණු ගංගාවන් ද වාසියක් කර ගනිමින් සෘතු අනුව ගොරිල්ලා සංග්‍රාමය කරගෙන යන්ට නිශ්චිත වශයෙන් ම පුළුවන්කම තිබේ. සතුරාට දැන් වෙන වෙන දේට යොදන්නට වැඩිපුර ශක්තිය නැති නිසා ද, එසේ ශක්තිය තිබෙන කල පවා හැම දේට ම යෙදෙන්නට ඔහුට කිසි කලෙක හැකි නො වන නිසා ද, වර්තමානය සඳහා, තැනි වල හැම තැන ම ගොරිල්ලා සංග්‍රාමය පතුරුවා ලීමේ සහ තාවකාලික කඳවුරු ප්‍රදේශ පිහිටුවීමේ ත්, අනාගතය සඳහා, සෘතු අනුව පමණක් වුව ද, කුඩා සේනාංග මගින් ගොරිල්ලා සංග්‍රාමය පවත්වාගෙන යාමට සූදනම් කිරීමේ සහ ස්ථිර නො වූ කඳවුරු ප්‍රදේශ ඇති කිරීමේ ත් ප්‍රතිපත්තිය ගැන තීරණයක් කිරීම අප හට ඒකාන්තයෙන් ම අවශ්‍ය වේ.

විෂයමූල වශයෙන් කතා කරන කල, ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කිරීමට ත් කඳවුරු ප්‍රදේශ පිහිටුවීමට ත් ගංගා-විල්-මෝදර ප්‍රාන්තයන්හි තිබෙන ඉඩකඩ කඳු වල තිබෙනවාට වඩා අඩු නමුත් තැනි වල තිබෙනවාට වඩා වැඩි ය. අපේ ඉතිහාසය පිරී තිබෙන "මුහුදු-කොල්ලකාරයන්" සහ "දිය-පල්ලෙහාරුන්" විසින් කරනලද සිත්කාවදින සටන් ද, රතු හමුද

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

කාලයෙහි අවුරුදු ගණනාවක් ම හුංහු විල වටා ගෙන ගිය ගොරිල්ලා සංග්‍රාමය ද යන දෙක ම ගංගා-විල්-මෝදර ප්‍රාන්තයන්හි ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කිරීමට ත් කඳවුරු ප්‍රදේශ පිහිටුවීමට ත් තිබෙන ඉඩකඩ ගැන දෙස් දෙයි. කෙසේ වේවා, මේ දක්වා, ජපානයට විරුද්දකම් පෑමෙහි යෙදී සිටින දේශපාලන පක්ෂ ත් බහුජනයා ත් මේ ඉඩකඩ කෙරෙහි යොමු කර ඇත්තේ මඳ අවධානයකි. මනෝමූල තත්වයන් තවම නොමැති නමුත්, අපි නිසැකයෙන් ම අපේ අවධානය මේ ඉඩකඩ වෙත හරවා, එගැන වැඩ කරන්ට පටන් ගත යුත්තෙමු. අපේ දේශ-ව්‍යාප්ත ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කිරීමේ එක් අංශයක් වශයෙන්, අපි යැංසී ගඟට උතුරෙන් හුංත්සේ විල් ප්‍රාන්තයෙහි ද, යැංසී ගඟට දකුණෙන් තායිහු විල් ප්‍රාන්තයෙහි ද, ගංගාවන් ඔස්සේ සහ මුහුදුකරයේ පිහිටි සතුරා අල්ලාගෙන සිටින ප්‍රදේශ වල සියලු ගංගා-විල්-මෝදර ප්‍රාන්තයන්හි ද ගොරිල්ලා සංග්‍රාමය විපාකදායක ලෙස සංවිධානය කළ යුත්තෙමු; අපි එබඳු තැන් වල සහ ඒවා අසළ නිත්‍ය කඳවුරු ප්‍රදේශ ඇති කළ යුත්තෙමු. මේ අංශය අමතක කර දැමීමෙන්, අප ඇත්තට ම කරන්නේ සතුරාට ජල ප්‍රවාහණ පහසුකම් සලසා දීම ය; මෙය විරුද්දකම් පෑමේ යුද්ධය පිණිස වන අපේ උපායමාර්ගික සැලැස්මෙහි ඇති විවරයකි; එය යථා කාලයෙහි පිරවිය යුතු ය.

2. ගොරිල්ලා කලාප සහ කඳවුරු ප්‍රදේශ

සතුරු පේළි වලට පිටිපසින් ගෙන යන ගොරිල්ලා සංග්‍රාමයේදී, ගොරිල්ලා කලාප සහ කඳවුරු ප්‍රදේශ අතර වෙනසක් ඇත. වූතායි කඳු ප්‍රාන්තයේ ඇතැම් උප-පළාත් (එනම්, ශාන්සි-චහාර්-හෝපෙයි දේශසීමා ප්‍රදේශය) ද, එසේ ම තායිහාං සහ තායිශාන් කඳු ප්‍රාන්ත වල ඇතැම් තැන් ද මෙන්, සතුරා විසින් වට කර ඇති නමුත් මැද කොටස් අල්ලාගෙන නැති, නැතහොත් ආපසු අල්ලාගෙන ඇති, ප්‍රදේශ ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කිරීමේදී ගොරිල්ලා සේනාංග වලට පහසුවෙන් ප්‍රයෝජන ගැනීම පිණිස තනා සූදනම් කර තිබෙන කඳවුරු වේ. එහෙත් මේ ප්‍රදේශයන්හි වෙන තැන් වල තත්වය වෙනස් ය; නිදසුන් වශයෙන් බටහිරි හෝපෙයි සහ දකුණු චහාර් පළාත් වලින් කොටස් ඇතුළත්, වූතායි කඳු ප්‍රාන්තයේ නැගෙනහිරි සහ උතුරු කොටස් වල සහ, පාඕතිං වලට නැගෙනහිරින් ද ත්සාංචව් වලට බටහිරින් ද බොහෝ තැන් වල මෙනි. ගොරිල්ලා සංග්‍රාමය පටන් ගත් කල, මේ ස්ථාන සම්පූර්ණයෙන් අල්ලාගන්ට ගොරිල්ලාභටයන්ට බැරි විය, ඔවුන්ට හැකි වූයේ නිතර නිතර කඩාවැදීම් කරන්ට පමණකි; ඒවා ගොරිල්ලාභටයන් එහි සිටින කල ඔවුන් විසින් ද, ඔවුන් යන්ට ගිය කල රූකඩ පාලනය විසින් ද අත්පත් කරගෙන තිබෙන්නා වූ ත්, එහෙයින් තවම ගොරිල්ලා කඳවුරු නො ව ගොරිල්ලා කලාප ය'යි කිව හැකි වූ ත් ප්‍රදේශ ය. එබඳු වූ ගොරිල්ලා කලාප ගොරිල්ලා සංග්‍රාමයේ අවශ්‍ය ක්‍රියාවලිය තුළින්

ගිය කල, ඒ කියන්නේ, එහි සතුරු භටකණ්ඩායම් මහත් ගණනින් මුලසුන් කර දැමූ හෝ පරාජය කර දැමූ කල, රූකඩ පාලනය විනාශ කර දැමූ කල, බහුජනයා ක්‍රියාශීලී වීමට පුබුදු කරනු ලැබූ කල, ජපන්-විරෝධී බහුජන සංවිධාන සකස් කරනු ලැබූ කල, මහජනයාගේ ප්‍රාදේශික සන්නද්ධ බල-සේනාවන් වර්ධනය කරනු ලැබූ කල සහ, ජපන්-විරෝධී දේශපාලන බලය පිහිටුවූ කල, කඳවුරු ප්‍රදේශ බවට විපර්යාස කරනු ලබනවා ඇත. අපේ කඳවුරු ප්‍රදේශ පළල් කිරීම යන්නෙන් අප අදහස් කරන්නේ දැනට ම පිහිටුවා තිබෙන කඳවුරු වලට මෙබඳු වූ ප්‍රදේශ එකතු කිරීම ය.

ඇතැම් තැන් වල, උදහරණ වශයෙන්, නැගෙනහිරි හෝපෙයි පළාතෙහි, ගොරිල්ලා සටන්ව්‍යාපාර පවතින මුළු ප්‍රදේශය ම මුල සිට ම ගොරිල්ලා කලාපයක් වශයෙන් පැවතී ඇත. එහි රූකඩ පාලනය බොහෝ කල් සිට ස්ථාපිත ව පවතින්නේ ය; ආරම්භයේ සිට ම ප්‍රාදේශික පැනනැඟීම් වලින් වැඩී සිටින මහජනයාගේ සන්නද්ධ බලසේනා ත් වූතායි කන්දෙන් යවනලද ගොරිල්ලා සේනාංග ත් යන දෙක ම සඳහා සටන්ව්‍යාපාර පවතින මුළු ප්‍රදේශය ම ගොරිල්ලා කලාපයක් වී ඇත. තම වැඩකටයුතු පටන් ගත් මුලදී, ඔවුන් විසින් කළ හැකි වූයේ එහි තරමක් හොඳ තැන් තාවකාලික පසුමුණු හෝ කඳවුරු ප්‍රදේශ වශයෙන් තෝරා ගැනීම ය. සතුරු බල-සේනාවන් විනාශ කර දමන තුරු සහ ජනතාව පුබුදු කිරීමේ වැඩය සම්පූර්ණයෙන් ම කරගෙන යන තුරු, එබඳු තැන් ගොරිල්ලා කලාප වලින් සංසන්දනාත්මක වශයෙන් ස්ථාවර වූ කඳවුරු ප්‍රදේශ බවට විපර්යාස නො වෙනවා ඇත.

මෙසේ ගොරිල්ලා කලාපයක් කඳවුරු ප්‍රදේශයක් බවට විපර්යාස කිරීම දුෂ්කර නිර්මාණාත්මක ක්‍රියාවලියක් වේ; ඒ ක්‍රියාවලියේ මස්තකප්‍රාප්තිය සතුරා විනාශ කිරීම ත් බහුජනයා පුබුදු කිරීම ත් කොතෙක් දුරට කරනු ලැබේ ද යන්න මත රඳා පවතී.

බොහෝ ප්‍රාන්ත දිගු කලක් ම ගොරිල්ලා කලාප වශයෙන් පවතිනවා ඇත. මේ ප්‍රාන්ත දිගට ම තම ග්‍රහණයෙහි තබා ගන්ට සතුරා කොතරම් උත්සාහ කළත්, එහි ස්ථාවර රූකඩ පාලනයන් ඇති කරන්ට ඔහුට පුළුවන් වන්නේ නැත; ඒ අතර, අප එහි ගොරිල්ලා සංග්‍රාමය කොතරම් වර්ධනය කළත්, ජපන්-විරෝධී දේශපාලන බලය පිහිටුවීමේ අරමුණ මුදුන්පත් කරන්ට අපට ද පුළුවන් වන්නේ නැත. මේ වර්ගයේ උදහරණ සතුරා විසින් අල්ලාගෙන තිබෙන දුම්රියමාර්ග ඔස්සේ පිහිටි ප්‍රාන්ත වල ත්, විශාල නගර අවට පෙදෙස් වල ත්, තැනි වල ඇතැම් ප්‍රදේශ වල ත් දක්නට ඇත.

සතුරා විසින් ගැරිසන් කොට (එනම් බළමුළු නතර කොට තරයේ රක්ෂිත කොට) තිබෙන ලොකු නගර, දුම්රිය ස්ථාන සහ තැනි වල ප්‍රදේශ සම්බන්ධයෙන්, එහි ගොරිල්ලා සංග්‍රාමය ව්‍යාප්ත විය හැක්කේ සංසන්දනාත්මක

LIBERATION BASE

https://liberationbase.wordpress.com

වශයෙන් ස්ථාවර රූකඩ පාලනයන් තිබෙන මේ ස්ථාන වල ඇතුළට ම නො ව අද්දරට පමණකි. මෙය තව වර්ගයක තත්වයකි.

අපේ නායකත්වයේ වැරදි නිසා හෝ බලවත් සතුරු පීඩනය නිසා හෝ ඉහතින් විස්තර කළ තත්වය අනික් පැත්තට හැරෙන්ට ඉඩ තිබේ; එනම්, ගෙරිල්ලා කඳවුරක් ගෙරිල්ලා කලාපයක් බවට හැරෙනු හැකි ය, ගෙරිල්ලා කලාපය සතුරා විසින් සංසන්දනාත්මක වශයෙන් ස්ථාවර ලෙස අල්ලාගෙන සිටින ප්‍රදේශයක් බවට හැරෙනු හැකි ය. එබඳු වෙනස්වීම් සිදු වෙන්ට පුළුවන් දේ ය; ගෙරිල්ලා අණදෙන්නන් ඒ ගැන විශේෂ සෝදිසියකින් සිටීම සුදුසු ය.

එහෙයින්, ගෙරිල්ලා සංග්‍රාමයේ ද, අප ත් සතුරා ත් අතර පවතින අරගලයේ ද ප්‍රතිඵලයක් වශයෙන්, සතුරා අල්ලාගෙන සිටින මුළු භූමි-ප්‍රදේශය මතු දක්වන තුන් ගණයට වැටෙනවා ඇත: පළමුකොට, අපේ ගෙරිල්ලා සේනාංග සහ අපේ දේශපාලන බල මණ්ඩල විසින් අල්ලා-ගෙන තිබෙන ජපන්–විරෝධී කඳවුරු; දෙවැනි ව, ජපන් අධිරාජ්‍යවාදය සහ එහි රූකඩ ආණ්ඩු විසින් අල්ලාගෙන තිබෙන ප්‍රදේශ; තුන්වැනි ව, දෙ පැත්ත ම විසින් අල්ලාගන්ට පොරකන අතරමැද කලාප, එනම් ගෙරිල්ලා කලාප. පළමුවැනි සහ තුන්වැනි ගණයේ ප්‍රදේශ පුළුල් කළ හැකි තරම් පුළුල් කිරීමේ ත් දෙවැනි ගණය පටු කළ හැකි තරම් පටු කිරීමේ ත් යුතුකම ගෙරිල්ලා අණදෙන්නන්ට තිබේ. මෙය ගෙරිල්ලා සංග්‍රාමයේ උපායමාර්ගික කර්තව්‍යය වේ.

3. කඳවුරු ප්‍රදේශ පිහිටුවීමට අවශ්‍ය තත්ව

කඳවුරු ප්‍රදේශයක් පිහිටුවීමට තිබිය යුතු මූලික තත්ව නම් ජපන්-විරෝධී සන්නද්ධ බලසේනා සිටිය යුතු බව, සතුරාට පරාජයන් සිදු කිරීම පිණිස මේ සන්නද්ධ බලසේනා යෙදිය යුතු බව සහ, ක්‍රියාවට බහින ලෙස ජනතාව පුබුදු කිරීම ඔවුන් විසින් කළ යුතු බව ය. මෙසේ කඳවුරු ප්‍රදේශයක් පිහිටුවීම සියල්ලට ම පෙරාතු ව සන්නද්ධ බලසේනාවක් ගොඩනැගීම පිළිබඳ කාරණයකි. ගෙරිල්ලා යුද්ධයේ නායකයෝ ගෙරිල්ලා සේනාංග එකක් හෝ වැඩි ගණනක් ගොඩනැගීමට තම මුළු ශක්තිය මිඩංගු කළ යුත්තාහ, අරගලය කරගෙන යන අතර ඒවා අනුක්‍රමයෙන් ගෙරිල්ලා සේනා බවට හෝ නිත්‍ය භටකණ්ඩායම් වලට අයත් සේනාංග සහ සේනා බවට පවා වර්ධනය කළ යුත්තාහ. සන්නද්ධ බලසේනාවක් ගොඩනැගීම කඳවුරු ප්‍රදේශයක් පිහිටුවීමට යතුර වේ; සන්නද්ධ බල-සේනාවක් නැති නම්, නැතහොත් සන්නද්ධ බලසේනාව දුර්වල නම්, කිසි ම දෙයක් කරන්ට බැරි ය. මෙය පළමුවැනි තත්වය වේ.

කඳවුරු ප්‍රදේශයක් පිහිටුවීම පිණිස නැති ව ම බැරි දෙවැනි තත්වය නම් සන්නද්ධ බලසේනාව සතුරා පරාජය කරනු පිණිස ජනතාව සමග උචිත ලෙස සම්බන්ධ කොට යෙදිය යුතු බව ය. සතුරු ග්‍රහණය යටතේ පවතින සියලු ම තැන් ගෙරිල්ලා නො ව සතුරු කඳවුරු ප්‍රදේශ ය; පැහැදිලි ලෙස ම, සතුරා පරාජය කළ හොත් විනා ඒවා ගෙරිල්ලා කඳවුරු ප්‍රදේශ බවට විපර්යාස නො කළ හැකි ය. අප සතුරාගේ ප්‍රහාරයන් පසුබස්වා ඔහු පරාජය කළ හොත් විනා, ගෙරිල්ලාභටයන් විසින් අල්ලා-ගෙන තිබෙන තැන් පවා සතුරු ග්‍රහණය යටතට පත් වෙනවා ඇත; එවිට කඳවුරු ප්‍රදේශ පිහිටුවන්ට කොහෙත් ම බැරි වෙනවා ඇත.

කඳවුරු ප්‍රදේශයක් පිහිටුවීම පිණිස නැති ව ම බැරි තුන්වැනි තත්වය නම් ජපානයට විරුද්ධ ව අරගල කරනු සඳහා බහුජනයා අවදි කිරීමට අපේ සන්නද්ධ බලසේනාවන් ඇතුළු අපේ සියලු ම ශක්තීන් යෙදීම ය. මේ අරගලය කරගෙන යන අතර, අපි ජනතාව සන්නද්ධ කළ යුත්තෙමු; එනම්, ආත්මාරක්ෂක බළකාය සහ ගෙරිල්ලා සේනාංග සංවිධානය කළ යුත්තෙමු. මේ අරගලය කරගෙන යන අතර, අපි බහුජන සංවිධාන ඇති කළ යුත්තෙමු; අපි කම්කරුවන්, ගොවියන්, තරුණයන්, ස්ත්‍රීන්, ළමයින්, වෙළෙඳුන් සහ වෘත්තීය පුද්ගලයන් — ඔවුන්ගේ දේශපාලන හැඟීම සහ සටන් කිරීමේ උද්‍යෝගයේ ප්‍රමාණය අනුව — ජපන් ආක්‍රමණයට විරුද්ධ අරගලය පිණිස අවශ්‍ය විවිධ බහුජන සංවිධානයන් බවට සංවිධානය කළ යුත්තෙමු, අපි ඒවා අනුක්‍රමයෙන් පළල් කළ යුත්තෙමු. සංවිධානය නොමැතිව, තම ජපන්–විරෝධී ශක්තිය ක්‍රියාවට නැඟීමට ජනතාවට නො හැකි ය. මේ අරගලය කරගෙන යන අතර, අපි එළිපිට සහ සැඟවී සිටින ද්‍රෝහීන් උපුටා දැමිය යුත්තෙමු; එය ජනතාවගේ ශක්තිය මත හේත්තු වීමෙන් පමණක් මුදුන්පත් කළ හැකි කර්තව්‍යයකි. මේ අරගලයේදී, තමන්ගේ ප්‍රාදේශික ජපන්–විරෝධී දේශපාලන බල මණ්ඩල පිහිටුවීම පිණිස හෝ තහවුරු කිරීම පිණිස ජනතාව පුබුදු කිරීම වෙසෙසින් ම වැදගත් ය. මුලින් තිබුණු චීන දේශපාලන බල මණ්ඩල සතුරා විසින් විනාශ කර දමා නැති තැන් වල, අපි පුළුල් බහුජන සමූහයන්ගේ අනුබලය ඇතිව ඒවා ප්‍රතිසංවිධානය කොට, ශක්තිමත් කළ යුත්තෙමු; ඒවා සතුරා විසින් විනාශ කර දමා ඇති තැන් වල, අපි බහුජන සමූහයන්ගේ පරිශ්‍රමයන් මගින් ඒවා නැවත ගොඩනැඟිය යුත්තෙමු. ඒවා ජපන්–විරෝධී ජාතික එක්සත් පෙරමුණේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදීම පිණිස තිබෙන දේශපාලන බල මණ්ඩල ය, ඒවා අපේ එක ම සතුරා වන ජපන් අධිරාජ්‍යවාදයට ත්, එහි හිවලුන් වන ද්‍රෝහීන්ට සහ ප්‍රතිගාමීන්ට ත් විරුද්ධ ව සටන් කරනු පිණිස ජනතාවගේ සකල බලවේගයන් එක්සත් කළ යුතු ය.

ගෙරිල්ලා යුද්ධය සඳහා කඳවුරු ප්‍රදේශයක් ඇත්තට ම පිහිටුවිය හැකි වන්නේ මේ තත්ව තුන අනුක්‍රමයෙන් සම්පූර්ණ වීම ත් සමග පමණකි;

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

එනම්, ජපන්–විරෝධි සන්නද්ධ බලසේනාවන් ගොඩනැගූ පසු, සතුරා පරාජය කළ පසු සහ, ජනතාව පුබුදු කළ පසු පමණකි.

භූගෝලවිද්‍යාත්මක සහ ආර්ථික තත්වයන් ගැන ද සඳහන් කළ යුතු ම ය. මුලින් කී එක සම්බන්ධයෙන්, කඳවුරු ප්‍රදේශ වර්ග ගැන මීට කලින් ඇති කොටසෙහි අප දැනට ම වෙනස් තුන් ගණයක් ගැන සාකච්ඡා කර ඇත; මෙහිදී අප විසින් සඳහන් කළ යුත්තේ එක් ප්‍රධාන අවශ්‍යතාවක් ගැන පමණකි; එනම්, ප්‍රදේශය ව්‍යාප්ත එකක් විය යුතු බව ය. හැම පැත්තෙන් ම, හෝ තුන් පැත්තකින්, සතුරා විසින් වට කරනු ලැබ තිබෙන තැන් වල, කඳුකර ප්‍රාන්ත ස්වභාවයෙන් ම බොහෝ කලක් අල්ලා සිටිය හැකි කඳවුරු ප්‍රදේශ පිහිටුවීම පිණිස ඉතා ම හොඳ තත්වයන් ඉදිරිපත් කරයි; එහෙත් ප්‍රධාන කාරණය නම් ගොරිල්ලාභටයන්ට උපායශීලි ලෙස හැසිරෙන්ට උවමනා තරම් ඉඩ තිබිය යුතු බව ය, එනම් ප්‍රදේශ පැතුරුණු ඒවා විය යුතු බව ය. පැතුරුණු ප්‍රදේශයක් ඇතොත්, ගංගා–විල්–මෝදර ප්‍රාන්ත ගැන නො කියා ම, තැනි වල පවා ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කරන්ට හා අල්ලා සිටින්ට හැකි ය. බොහෝ දුරට, චීනයේ භූමිප්‍රදේශයේ විශාලත්වය ත් සතුරාට හටකණ්ඩායම් හිඟ වීම ත් චීනයෙහි ගොරිල්ලා සංග්‍රාමයට මේ තත්වය සලසා දෙයි. ගොරිල්ලා සංග්‍රාමය කරන්ට ඇති ඉඩකඩ සම්බන්ධයෙන් නම්, මෙය වැදගත්, මූලික වූ පවා, තත්වයකි; මේ තත්වය නොමැති බෙල්ජියම වැනි කුඩා රටවල් වලට මේ ඉඩකඩ ඇති නැති තරම් ය.[8] චීනයෙහි, මේ තත්වය ලබා ගැනීමට වෙහෙස දැරිය යුතු දෙයක් නො වේ; එය ගැටළුවක් වන්නේ ද නැත; එය කායික වශයෙන් එහි තිබේ, ප්‍රයෝජන ගනු ලබන තුරු බලා සිටිනවා පමණකි.

කායික වශයෙන් පිහිටා ඇති අන්දම සම්බන්ධයෙන් නම්, ආර්ථික තත්වයෝ, භූගෝලවිද්‍යාත්මක තත්වයන් හා සදෘශ වෙති. කවර හෙයින් ද යත් අප දැන් සාකච්ඡා කරන්නේ සතුරකු දක්නට නැති කාන්තාරයක නො ව සතුරු පේළි වලට පිටිපසින් කඳවුරු ප්‍රදේශ පිහිටුවීම ගැන නිසා ය; සතුරාට රිංගා ආ හැකි හැම තැනක ම චීන පදිංචිකරුවෝ දැනට ම සිටිති, නඩත්තු වීම පිණිස ආර්ථික පදනමක් දැනට ම ඇත; එසේ හෙයින් කඳවුරු ප්‍රදේශ පිහිටුවීම පිණිස ආර්ථික තත්වයන් තෝරාගැනීමේ ප්‍රශ්නය හුදෙක් මතු වන්නේ ම නැත. ආර්ථික තත්වයන් ගැන තකන්නේ නැතිව, චීන පදිංචිකරුවන් සහ සතුරු බලසේනාවන් සිටින හැම තැන ම අපි ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කිරීමට ත් නිත්‍ය හෝ තාවකාලික කඳවුරු ප්‍රදේශ පිහිටුවීමට ත් අප විසින් කළ හැකි වැඩි ම දේ කළ යුත්තෙමු. කෙසේ වෙතත්, දේශපාලන තේරුමකින්, ආර්ථික තත්වයෝ ගැටළුවක්, කඳවුරු ප්‍රදේශ පිහිටුවීම පිණිස මහත් වැදගත්කමක් ඇති ආර්ථික ප්‍රතිපත්තියක් පිළිබඳ ගැටළුවක්, ඉදිරිපත් කරත් ම ය. ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ වල ආර්ථික ප්‍රතිපත්තිය මුදල් කටයුතු පිළිබඳ බර සමාන ලෙස බෙදා හැරීමෙන්

සහ වාණිජ්‍යය ආරක්ෂා කිරීමෙන් ජපන්–විරෝධි ජාතික එක්සත් පෙරමුණේ මූලධර්ම අනුගමනය කළ යුතු ය. ප්‍රාදේශික දේශපාලන බල මණ්ඩල වත් ගොරිල්ලා සේනාංග වත් මේ මූලධර්ම කඩ නො කළ යුතු ය; නො එසේ වුව හොත් කඳවුරු ප්‍රදේශ පිහිටුවීම ත් ගොරිල්ලා සංග්‍රාමය පවත්වාගෙන යාම ත් කෙරෙහි නරක විපාක ඇති වෙනවා ඇත. මුදල් කටයුතු පිළිබඳ බර සමාන ලෙස බෙදා හැරීම යන්නෙන් අදහස් වන්නේ "සල්ලි තිබෙන අය සල්ලි දිය යුතු බව" සහ, ඒ අතර ගොවියන් යම් යම් සීමාවන් ඇතුළත ගොරිල්ලා සේනාංග වලට ධාන්‍ය සැපයිය යුතු බව ය. වාණිජ්‍යය ආරක්ෂා කිරීම යන්නෙන් අදහස් වන්නේ ගොරිල්ලා සේනාංග බෙහෙවින් ම විනය-ගරුක විය යුතු බව සහ, ඔප්පු වූ ද්‍රෝහින් සතු ඒවා හැර, කඩසාප්පු බලෙන් අල්ලාගැනීම තරයේ ම තහනම් කළ යුතු බව ය. මෙය පහසු දෙයක් නො වේ; එහෙත් ප්‍රතිපත්තිය පණවා ඇත, එය ක්‍රියාවට නැඟිය යුතු ම ය.

4. කඳවුරු ප්‍රදේශ තහවුරු කිරීම හා පළල් කිරීම

සතුරා රක්ෂස්ථාන කීපයකට, එනම්, ලොකු නගර වලට සහ ප්‍රධාන ගමනාගමන මාර්ග දිගට, හිර කර තබනු වස්, ගොරිල්ලාභටයෝ තම කඳවුරු ප්‍රදේශ වල සිට හැකි තරම් පුළුල් ලෙස ගොරිල්ලා සංග්‍රාමය ව්‍යාප්ත කිරීමට ත් සතුරාගේ රක්ෂස්ථාන හැම පැත්තෙන් ම කොටු කිරීමට ත් තමන් විසින් කළ හැකි සියල්ල කළ යුත්තාහ; එසේ සතුරාගේ පැවැත්මට තර්ජනය කරන අතර සහ ඔහුගේ චිත්තශක්තිය සොලවන අතර ම කඳවුරු ප්‍රදේශ පළල් කළ යුත්තාහ. මෙය අත්‍යවශ්‍ය ය. මේ අතින්, අපි ගොරිල්ලා සංග්‍රාමයෙහි හණමිටිවාදයට විරුද්ධ විය යුත්තෙමු. හණමිටිවාදය මුලින් ඇති වන්නේ පහසු ජීවිතයක් ගැන ඇති අභිලාෂයෙන් වේවා, නැතහොත් සතුරාගේ ශක්තිය පමණට වඩා වැඩියෙන් තක්සේරු කිරීමෙන් වේවා, එයින් විය හැකි එක ම දෙය විරුද්දකම් පෑමේ යුද්ධයට අලාභහානි සිදු වීම පමණකි; එය ගොරිල්ලා සංග්‍රාමයට සහ කඳවුරු ප්‍රදේශ වලට ම හානිකර ද වේ. ඒ අතර ම, අපි කඳවුරු ප්‍රදේශ තහවුරු කිරීම අමතක නො කළ යුත්තෙමු; ප්‍රධාන කර්තව්‍යය වනුයේ බහුජනයා පුබුදු කොට සංවිධානය කිරීම ත් ගොරිල්ලා සේනාංග සහ ප්‍රාදේශික සන්නද්ධ බලසේනා පුහුණු කිරීම ත් ය. දිග්ගැසුණු සංග්‍රාමය පවත්වාගෙන යාම පිණිස ත් පළල් කිරීම පිණිස ත් එබඳු තහවුරු කිරීමක් උවමනා ය; තහවුරු කිරීමක් නොමැති කල උද්‍යෝග-යෙන් කරන පළල් කිරීමක් කොහෙත් ම නො කළ හැකි ය. අපේ ගොරිල්ලා සංග්‍රාමයේදී අප පළල් කිරීම ගැන පමණක් මිඩංගු වෙමින් තහවුරු කිරීම ගැන අමතක කළ හොත්, සතුරා දෙන ප්‍රහාරයන්ට ඔරොත්තු දී සිටීමට අපට බැරි වෙනවා ඇත, එහි විපාකය වශයෙන් පළල් කිරීමට ඇති ඉඩකඩ නැති වෙනවා පමණක් නො ව කඳවුරු ප්‍රදේශ වල පැවැත්ම ම අනතුරට පත් වෙනවා ද ඇත. නිවැරදි මූලධර්මය නම් තහවුරු කරමින් පළල් කිරීම ය;

https://liberationbase.wordpress.com

හොඳ ක්‍රමයක් වන එය අප තෝරා ගන්නා හැටියකට පහරදීමට බහින්ට හෝ ආරක්ෂාවීමට හැරෙන්ට හෝ අපට ඉඩ සලසයි. දිග්ගැසුණු යුද්ධයක් ඇති කල, කඳවුරු ප්‍රදේශ තහවුරු කිරීමේ ත් පළල් කිරීමේ ත් ගැටළුව හැම ගොරිල්ලා සේනාංගයකට ම මතු වේ. නියම වශයෙන් කරන විසඳුම ඇත්තෙන් ම රඳා පවතින්නේ වටාපිටා තත්වයන් මත ය. එක් අවස්ථාවක අවධාරණය පළල් කිරීම මත, එනම්, ගොරිල්ලා කලාප පළල් කිරීම ත් ගොරිල්ලා භටයන්ගේ ගණන වැඩි කිරීම ත් මත, වැටෙන්ට ඉඩ ඇත. වෙන අවස්ථාවක, අවධාරණය තහවුරු කිරීම මත, එනම්, බහුජනයා සංවිධානය කිරීම ත් භටකණ්ඩායම් පුහුණු කිරීම ත් මත, වැටෙන්ට ඉඩ ඇත. පළල් වීම ත් තහවුරු කිරීම ත් ස්වභාවය අතින් වෙනස් වන හෙයින් ද, යුද්ධමය විධිවිධාන සහ වෙන කර්තව්‍ය ඒ අනුව වෙනස් වන හෙයින් ද, ගැටළුව සාර්ථක ලෙස විසඳනු හැකි වන්නේ අප කාලය ද වටාපිටා තත්වයන් ද අනුව අවධාරණය මාරුවෙන් මාරුවට යොදත හොත් පමණකි.

5. අප ත් සතුරා ත් එකිනෙකා වටලන ආකාරයෝ

විරුද්දකම් පෑමේ යුද්ධය මුළු එකක් වශයෙන් ගත් කල, සතුරා උපාය-මාර්ගික පහරදීමෙහි යෙදී බාහිර පේළි වල සටන් කරන හෙයින් ද, ඒ අතර අප උපායමාර්ගික ආරක්ෂාවීමෙහි යෙදී ඇතුල් පේළි වල සටන් කරන හෙයින් ද, සතුරා විසින් අප උපායමාර්ගික වශයෙන් වටලා ඇති බවට සැකයක් නැත. මෙය සතුරු වටලෑමේ පළමුවැනි ආකාරය වේ. අපි ද, බාහිර පේළි වල සිට අප කරා ඉදිරියට එන සතුරු කොලම් වලට විරුද්ධ ව සංඛ්‍යාත්මක වැඩි–බලය ඇති බලසේනාවන් යෙදීමෙන් යුද්ධව්‍යාපාර සහ සටන් වලදී පහරදීමේ ත් බාහිර–පේළි සටන්ව්‍යාපාර ගෙනයාමේ ත් ප්‍රතිපත්තිය භාවිතාවේ යොදන නිසා, වෙන වෙන මාර්ග ඔස්සේ අප කරා ඉදිරියට එන සතුරු කොලම් වලින් එක එක වටලමු. මෙය අප සතුරා වටලන පළමු-වැනි ආකාරය වේ. ඊළඟට, අප සතුරාගේ පසුමුණෙහි තිබෙන ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ ගැන සිතා බලතොත්, එක් එක් ප්‍රදේශය තනි තනි ව ගත් කල, ඒවා සතුරා විසින්, වූතායි කඳු ප්‍රාන්තය මෙන්, හැම පැත්තෙන් ම වට කර ඇත; නැතහොත්, වයඹදිග ශාන්සි ප්‍රදේශය මෙන්, තුන් පැත්තකින් වට කර ඇත. මෙය සතුරු වටලෑමේ දෙවැනි ආකාරය වේ. කෙසේ වේවා, සියලු ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ එකට එකතු කොට සහ නිත්‍ය බලසේනාවන්ගේ සටන් පෙරමුණු වලට ඇති ඒවායේ සබඳකමින් ගෙන සලකා බලතොත්, අනික් අතට අප ත් සතුරු බලසේනාවන් මහත් රැසක් වට කරන බව පෙනෙනවා ඇත. නිදසුන් වශයෙන්, ශාන්සි පළාතෙහි, තාතුං–පූචව් දුම්රිය මාර්ගය තුන් පැත්තකින් (නැගෙනහිරි සහ බටහිරි අංශ ත්, දකුණු කොණ ත්) ද, තයියුආන් නගරය හැම පැත්තෙන් ම ද අප විසින් වට කර

ඇත; ඒ හා සමාන අවස්ථා රැසක් හෝපෙයි සහ ශාන්තුං පළාත් වල තිබේ. මෙය අප සතුරා වටලන දෙවැනි ආකාරය වේ. මෙසේ සතුරු බලසේනාවන් විසින් වටලනු ලබන ආකාර දෙකක් ද, අපේ බලසේනාවන් විසින් වටලනු ලබන ආකාර දෙකක් ද ඇත — හරියට වෙයිචි[9] ක්‍රීඩාවක් මෙනි. දෙ පාර්ශ්වය විසින් කරනු ලබන යුද්ධව්‍යාපාර සහ සටන් එකිනෙකාගේ ඉත්තන් ඇල්ලීමට සමාන ය, සතුරා විසින් රක්ෂස්ථාන ද අප විසින් ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ ද පිහිටුවීම ලෑල්ලේ ඉඩ අත යට තබා ගැනීමට අදින ඇදීම් වලට සමාන ය. සතුරාගේ පසුමුණෙහි ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ රඟපාන ශ්‍රේෂ්ඨ උපායමාර්ගික කොටස අනාවරණය වන්නේ "ඉඩ අත යට තබා ගැනීම" පිළිබඳ කාරණයෙහි ය. විරුද්දකම් පෑමේ යුද්ධයේදී අප ඉම් ප්‍රශ්නය මතු කරන්නේ ජාතියේ යුද්ධ බලධරයන් සහ සියලු ප්‍රදේශ වල ගොරිල්ලා අණදෙන්නන් සතුරු පේළි වලට පිටිපසින් ගොරිල්ලා සංග්‍රාමය වර්ධනය කිරීම සහ හැකි හැම තැන ම කඳවුරු ප්‍රදේශ පිහිටුවීම න්‍යාය-පත්‍රයට අඩංගු කොට, මෙය උපායමාර්ගික කර්තව්‍යයක් ලෙස කරගෙන යා යුතු නිසා ය. ජාත්‍යන්තර තලාවෙහි චීනය එක් උපායමාර්ගික ඒකකයක් ද, සෝවියට් සංගමය සහ ඊට සම්බන්ධ වීමට ඉඩ තිබෙන සෙසු රටවල් අනික් උපායමාර්ගික ඒකක ද වශයෙන් ඇති ව, පැසිපික් ප්‍රාන්තයෙහි ජපන්-විරෝධී පෙරමුණක් ඇති කරන්ට අපට හැකි වේ නම්, එවිට, අපට විරුද්ධ ව සතුරාට තිබෙනවාට වඩා වටලෑම් ආකාර තව එකක් සතුරාට විරුද්ධ ව අපට තිබෙනවා ඇත, පැසිස්ට් ජපානය වටලා විනාශ කිරීමට පැසිපික් ප්‍රාන්තයෙහි බාහිර–පේළි සටන්ව්‍යාපාර ඇති වෙනවා ඇත. නිසැකයෙන් ම, දැනට මෙහි ඇති ප්‍රායෝගික වැදගත්කම අල්ප ය, එහෙත් එබඳු මතු බලා-පොරොත්තුවක් නො විය හැකි දෙයක් ම නො වේ.

පරිච්ඡේද VII

ගොරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගික ආරක්ෂාවීම සහ උපායමාර්ගික පහරදීම

ගොරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ සිව්වැනි ගැටළුව උපාය-මාර්ගික ආරක්ෂාවීම සහ උපායමාර්ගික පහරදීම පිළිබඳ ය. මෙය, ජපානයට විරුද්ධ අපේ ගොරිල්ලා සංග්‍රාමයේදී, පළමුවැනි ගැටළුව ගැන අප කළ සාකච්ඡාවෙහි අප විසින් සඳහන් කරනලද පහරදීමේ සංග්‍රාමය පිළිබඳ ප්‍රතිපත්තිය, අප ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට ත් අප පහරදීමෙහි යෙදී සිටින විට ත් භාවිතාවේ යොදන්නේ කෙසේ ද යන්න පිළිබඳ ගැටළුව වේ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දේශ-ව්‍යාප්ත උපායමාර්ගික ආරක්ෂාවීම හෝ උපායමාර්ගික පහරදීම (වඩා ත් හරියට ම, උපායමාර්ගික පෙරළා-පහරදීම) ඇතුළත, එක් එක් ගෙරිල්ලා කඳවුරු ප්‍රදේශය තුළ ත් ඒ අවට ත් කුඩා-පරිමාණයේ උපාය-මාර්ගික ආරක්ෂාවීම් සහ පහරදීම් ඇති වේ. උපායමාර්ගික ආරක්ෂාවීම යන්නෙන් අප අදහස් කරන්නේ සතුරා පහරදීමෙහි ද අප ආරක්ෂාවීමෙහි ද යෙදී සිටින විට අපේ උපායමාර්ගික තත්වය සහ ප්‍රතිපත්තිය යි; උපායමාර්ගික පහරදීම යන්නෙන් අප අදහස් කරන්නේ සතුරා ආරක්ෂාවීමෙහි ද අප පහරදීමෙහි ද යෙදී සිටින විට අපේ උපායමාර්ගික තත්වය සහ ප්‍රතිපත්තිය යි.

1. ගෙරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගික ආරක්ෂාවීම

ගෙරිල්ලා සංග්‍රාමය පටන් ගෙන සැලකිය යුතු ප්‍රමාණයකට වැඩුණු පසු, සතුරා, විශේෂයෙන් ම මුළු එකක් වශයෙන් රටට විරුද්ධ ඔහුගේ උපායමාර්ගික පහරදීම අවසානයකට පත් කොට තමා අල්ලාගත් ප්‍රදේශ සුරක්ෂිත කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරන වකවානුවේදී, ගෙරිල්ලා කඳවුරු ප්‍රදේශ වලට නො වැළකිය හැකි ලෙස ම පහර දෙනවා ඇත. එබඳු ප්‍රහාරයන්ගේ අනිවාර්යභාවය පිළිගැනීම අත්‍යවශ්‍ය ය; නො එසේ නම් ගෙරිල්ලා අණදෙන්නෝ කිසි ම සූදානමක් නැති ව සිටියදී ම අසුවෙනවා ඇත; බර සතුරු ප්‍රහාරයන් ඉදිරියේ ඔවුන් නිසැකයෙන් ම තැති ගෙන ලොකු අවුලකට පත් වෙනවා ඇත, ඔවුන්ගේ බලසේනා පළවා හරිනු ලබනවා ඇත.

ගෙරිල්ලාභටයන් සහ ඔවුන්ගේ කඳවුරු ප්‍රදේශ මුල්පිස දමනු පිණිස, සතුරා නිරතුරු ව ම නොයෙක් අතින් පැමිණ එක් තැනකට යොමු කරන ප්‍රහාරයන් දීම පිහිට කොට ගනී. නිදසුන් වශයෙන්, වූතායි කඳු ප්‍රාන්තයට විරුද්ධ ව එල්ල කළ ''දඬුවම් දීමේ යුදගමන්'' හතරේ හෝ පහේ හැම එකකදී ම, සතුරා එක විට ම කොලම් තුනකින්, හතරකින්, නැතහොත් හයකින් හෝ හතකින් පවා සැලැස්ම කොට ඉදිරියට ගමන් කළේ ය. ගෙරිල්ලා සටන් වල පරිමාණය වඩ වඩා විශාල වන පමණට, කඳවුරු ප්‍රදේශ පිහිටි තැන වඩ වඩා වැදගත් වන පමණට, සතුරාගේ උපායමාර්ගික මධ්‍යස්ථාන සහ වැදගත් ගමනාගමන මාර්ග වලට එල්ල වූ තර්ජනය වඩ වඩා ලොකු වන පමණට, සතුරාගේ ප්‍රහාර වඩ වඩා දරුණු වෙනවා ඇත. එහෙයින්, ගෙරිල්ලා ප්‍රදේශයකට දෙන සතුරු ප්‍රහාර වඩ වඩා දරුණු වන කල, එහි ගෙරිල්ලා සංග්‍රාමය සාර්ථක වී ඇති බව, නිත්‍ය සටන් හා විපාකදයක ලෙස සම්බන්ධ වී ඇති බව, වඩ වඩා පෙනී යන්නේ ය.

සතුරා කොලම් කීපයක් යොදමින් එක ම තැනට යොමු කළ ප්‍රහාරයක් දියත් කරන කල, ගෙරිල්ලා ප්‍රතිපත්තිය විය යුත්තේ පෙරළා-පහරදීමකින් එය සිඳ බිඳ දැමීම ය. ඉදිරියට ගමන් කරන එක් එක් සතුරු කොලම ලොකු හෝ කුඩා එක් සේනාංගයකින් පමණක් සමන්විත වේ නම් ද,

පස්සෙන් එන සේනාංග ඊට නොමැත්තේ නම් ද, ඉදිරියට ගමන් කරන මග දිගට භටකණ්ඩායම් නතර කර තබන්ට, මුරගෙවල් ඉදි කරන්ට හෝ මෝටර්රථ පාරවල් තනන්ට ඊට නො හැකි නම් ද, ඒ කොලම පහසුවෙන් සිඳ බිඳ දමනු හැකි ය. සතුරා එක තැනකට යොමු කළ ප්‍රහාරයක් දියත් කරන කල, ඔහු පහරදීමෙහි යෙදී සිටී, බාහිර පේළි වල සටන් කරයි; ඒ අතර අපි ආරක්ෂාවීමෙහි යෙදී සිටිමු, ඇතුල් පේළි වල සටන් කරමු. අපේ විධිවිධාන සම්බන්ධයෙන්, අප විසින් සතුරු කොලම් කීපයක් සිටින තැන ම හිර කර තබනු පිණිස අපේ ද්විතීයක බලසේනාවන් යෙදිය යුතු වන අතර, අපේ ප්‍රධාන බලසේනාව තනි සතුරු කොලමකට විරුද්ධ ව, ඒ කොලම ගමන් කරමින් සිටින විට ඊට පහර ගසමින්, යුද්ධව්‍යාපාරයකදී හෝ සටනකදී උන්හිටිගමන් දෙන ප්‍රහාර (ප්‍රධාන වශයෙන් සැඟවී සිට හදිස්සියේ දෙන ප්‍රහාර වල ආකාරයෙන්) දියත් කළ යුතු ය. සතුරා ප්‍රබල නමුත් නැවත නැවත ත් උන්හිටිගමන් දෙන හදිස්සි ප්‍රහාර නිසා දුර්වල වෙනවා ඇත, බොහෝ විට මගින් අඩක් ගිය තැන ඉවත් වී යනවා ඇත; එවිට ලුහුබඳින අතර තව තවත් හදිස්සි ප්‍රහාර දී, ඔහු තවදුරට ත් දුර්වල කරන්ට ගෙරිල්ලා සේනාංග වලට හැකි ය. සතුරා සාමාන්‍යයෙන් ඔහුගේ පහරදීම නතර කරන්ට හෝ ඉවත් වී යාමට පටන් ගන්ට පෙර අපේ කඳවුරු ප්‍රදේශ වල උප-පළාත් සුළු-නගර සහ වෙනත් සුළු-නගර අල්ලාගනී; අපි, ඔහුට ධාන්‍ය සැපයීම කපා දමමින් සහ ඔහුගේ ගමනාගමන හා පණිවිඩ හුවමාරු මාර්ග සිඳ දමමින්, මේ සුළු-නගර වැටලිය යුත්තෙමු; එසේ ඔහු අල්ලාගෙන සිටින්ට බැරි ව පසුබසින්ට වන් කල, ඔහු ලුහුබඳිමින් පහර දීමට ඒ ඉඩප්‍රස්තාව ඩැහැගන්ට අපට හැකි වේ. එක් කොලමක් සිඳ බිඳ දැමූ පසු, අපි අනිකක් සිඳ බිඳ දැමීම පිණිස අපේ බලසේනා අන් තැනකට මාරු කළ යුත්තෙමු; ඒවා එකින් එක සිඳ බිඳ දැමීමෙන්, එක ම තැනට යොමු කළ ප්‍රහාරය සුණුවිසුණු කර දැමිය යුත්තෙමු.

වූතායි කඳු ප්‍රාන්තය වැනි ලොකු කඳවුරු ප්‍රදේශයක්, එක් එක් උප-ප්‍රදේශය ඊට ම අයත් ස්වාධීන ව ක්‍රියා කරන සන්නද්ධ බලසේනා සිටින උප යුද්ධ ප්‍රදේශ හතරකට, පහකට හෝ වැඩි ගණනකට පවා බෙදනලද, යුද්ධ ප්‍රදේශයක් සකස් කරයි. ඉහතින් විස්තර කළ උපක්‍රම යෙදීමෙන්, මේ බලසේනා බොහෝ විට එක වර ම හෝ එකකට පසු එකක් වශයෙන් හෝ සතුරාගේ ප්‍රහාර සිඳ බිඳ දමා ඇත.

සතුරා විසින් දෙන එක ම තැනකට යොමු කළ ප්‍රහාරයකට විරුද්ධ සටන්ව්‍යාපාර පිළිබඳ අපගේ සැලැස්මේදී, අපි සාමාන්‍යයෙන් අපේ ප්‍රධාන බලසේනාව ඇතුල්-පේළි වල තබමු. එහෙත් අපට ශක්තිය වැඩිපුර තිබෙන විට, අපි සතුරාගේ ගමනාගමන සහ පණිවිඩ හුවමාරු මාර්ග කඩා බිඳ දැමීමට සහ ඔහුගේ අතිරේක බලසේනා සිටින තැන ම හිර කර තැබීමට, (උප-පළාත් හෝ දිස්ත්‍රික්ක ගෙරිල්ලා සේනාංග, නැතහොත් ප්‍රධාන බලසේනාවේ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

බලඇණි පවා වැනි) අපේ ද්විතීයක බලසේනා බාහිර පේළි වල යෙදිය යුත්තෙමු. සතුරා අපේ කඳවුරු ප්‍රදේශය තුළ ම ලගින්ට වුව හොත්, අපේ උපක්‍රම අනික් අතට හරවන්ට අපට ඉඩ තිබේ; එනම්, අපේ බලසේනාවන් ගෙන් කොටසක් සතුරා මැදි කරගන්නා පිණිස කඳවුරු ප්‍රදේශය තුළ නවත්වා තබා, ඒ අතර, සතුරා යම් ප්‍රාන්තයක සිට පැමිණියේ ද ඒ ප්‍රාන්තයට පහර දෙනු පිණිස ත් එහි අපේ වැඩකටයුතු අධික කරනු පිණිස ත් අපේ ප්‍රධාන බලසේනාව යෙදිය යුතු ය; ඒ ඉවත් වී අවුත් අපේ ප්‍රධාන බලසේනාවට පහර දීමට සතුරා පොළඹවනු වස් ය. මෙය "වෙයි රජය වට කිරීමෙන් චාඕ රජය නිදහස් කිරීමේ"[10] උපක්‍රමය වේ.

එක ම තැනට යොමු කළ ප්‍රහාරයකට විරුද්ධ සටන්ව්‍යාපාර ගෙන යන අතර, ප්‍රාදේශික ජපන්-විරෝධී ආත්මාරක්ෂක බළකාය සහ සියලු බහුජන සංවිධාන ක්‍රියාව පිණිස උනන්දු වෙමින්, සතුරා හා සටන් කිරීමට අපේ භටකණ්ඩායම් වලට හැම අතින් ම උදව් කළ යුතු ය. සතුරා හා සටන් කිරීමේදී, ප්‍රාදේශීක යුද්ධ නීතිය ක්‍රියාවේ යෙදීම ත්, හැකි තරම් දුරට, "අපේ ආරක්ෂණ වැඩ ශක්තිමත් කිරීම සහ කෙත්වතු එළි කිරීම" ත් යන දෙක ම වැදගත් ය. මුලින් කී එකේ අභිප්‍රාය ද්‍රෝහීන් මර්දනය කිරීම සහ සතුරාට තොරතුරු ලැබීම වැළැක්වීම ය; පසු ව කී එකේ අභිප්‍රාය (අපේ ආරක්ෂණ වැඩ ශක්තිමත් කිරීමෙන්) අපේ ම සටන්ව්‍යාපාර වලට ආධාර කිරීම සහ (කෙත්වතු එළි කිරීමෙන්) සතුරාට ආහාර ලැබීම වැළැක්වීම ය. "කෙත්වතු එළි කිරීම" යන්නෙන් අදහස් කරන්නේ අස්වනු පැසුණු වහා ම කපාගැනීම ය.

සතුරා පසුබසින කල, ඔහු බොහෝ විට, ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ විනාශ කිරීමේ අභිප්‍රායයෙන්, ඔහු අල්ලාගෙන සිටි නගර වල සහ සුළු-නගර වල ගෙවල්-දොරවල් ගිනි තබයි, ඔහුගේ මග දිගට ඇති ගම් දනව් වනසා පාළු කරයි; එහෙත් එසේ කිරීමෙන් ඔහු තමාගේ ඊළඟ පහරදීමේදී තමාට ම ඉන්නහිටින්න තැන් සහ කෑම බීම නැති කර ගනී; කළ හානිය ආපසු ඔහුගේ ම හිස පිට කඩා වැටේ. මෙය එක ම දේ ට ප්‍රතිවිරුද්ධ පැති දෙකක් ඇතැ'යි යන්නෙන් අප අදහස් කරන දෙය පිළිබඳ නියම නිදසුනකි.

නැවත නැවත ත් සටන්ව්‍යාපාර ගෙනගිය පසු ත් සතුරා එක ම තැනට යොමු කොට දෙන බර ප්‍රහාර සිඳ බිඳ දමන්ට කොහෙත් ම බැරි බව ඔප්පු වුව හොත් මිස, ගොරිල්ලා අණදෙන්නෙක් තමාගේ කඳවුරු ප්‍රදේශය අත හැර දමා, වෙන තැනකට මාරු වෙන්ට කල්පනා නො කළ යුතු ය. මේ වටාපිටා තත්වයන් තුළ, ඔහු අශුභවාදයට විරුද්ධ ව පරෙස්සම් විය යුතු ය. නායකත්වය මූලධර්මය පිළිබඳ කරුණු වලදී වැරදි නො කරන තුරු, කඳුකර ප්‍රාන්තයන්හි එක ම තැන ට යොමු කළ ප්‍රහාර සිඳ බිඳ දමා කඳවුරු ප්‍රදේශ අල්ලාගෙන සිටින්ට සාමාන්‍යයෙන් හැකි ය. එක ම තැනට යොමු කළ බර ප්‍රහාරයකට අභිමුඛ ව සිටින කල, ගොරිල්ලා අණදෙන්නකු විශේෂිත

වටාපිටා තත්වයන් තුළ වෙන පියවර ගැනීමට, එනම්, සතුරාගේ ප්‍රධාන බලසේනා යන්ට ගිය කල ආපසු ඇවිත් තැනි වල තම වැඩකටයුතු නැවත පටන් ගත හැකි වන සේ, විශාල ගොරිල්ලා සේනා තාවකාලික වශයෙන් කිසියම් කඳුකර ප්‍රාන්තයකට මාරු කරන අතර තැන් තැන් වල විසිරී සිටිමින් සටන්ව්‍යාපාර ගෙනයනු සඳහා කුඩා සේනාංග රැසක් නවත්වා යාමට, කල්පනා කළ යුත්තේ තැනි වල පමණකි.

සාමාන්‍යයෙන් කියන කල, චීනයේ සුවිසාල භූමිප්‍රදේශය හා සබඳ කොට බලන විට ජපනුන්ගේ බලසේනා ප්‍රමාණවත් නො වන හෙයින්, සිවිල් යුද්ධ කාලයේ කුඔමින්තාං ආණ්ඩුව විසින් යොදනලද යුදමුරගෙවල් සංග්‍රාමය පිළිබඳ මූලධර්මය යොදන්නට ජපනුන්ට බැරි ය. කෙසේ වේවා, ඔවුන්ගේ ඉතා වැදගත් තැන් වලට විශේෂ තර්ජනයක් ඉදිරිපත් කරන ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ වලට විරුද්ධ ව ඔවුන් එක්තරා ප්‍රමාණයකට එය යොදන්ට ඇති ඉඩකඩ අප විසින් ගණන් ගත යුතු ය; එහෙත් එබඳු වටාපිටා තත්වයන් තුළ පවා ඒ ප්‍රදේශ වල ගොරිල්ලා සංග්‍රාමය නඟා තබා ගන්ට අපි සූදනම් ව සිටිය යුත්තෙමු. සිවිල් යුද්ධය පැවති කාලයේ ගොරිල්ලා සංග්‍රාමය පවත්වා-ගෙන යාමේ අත්දැකීම අප ලබා ඇති හෙයින්, ජාතික යුද්ධයේදී එසේ කරන්ට අපට ඊට වඩා ලොකු හැකියාවක් තිබෙන බවට පොඩ්ඩක් වත් සැකයක් නැත. පරස්පර යුද්ධමය ශක්තිය පිළිබඳ කරුණ අතින්, ප්‍රමාණය ත් එසේ ම තත්වය ත් යන දෙකෙන් ම ඉමහත් ලෙස වඩා උසස් වූ බල-සේනා අපේ කඳවුරු ප්‍රදේශ අතුරෙන් සමහරකට විරුද්ධ ව යොදන්නට සතුරාට හැකි ය; එහෙත් අප ත් සතුරා ත් අතර නො විසඳිය හැකි ජාතික ප්‍රතිවිරෝධය ද ඔහුගේ විධානයේ නො වැළැක්විය හැකි දුර්වලතා ද ඒ සමග ම ඇත්තේ ය. අපේ ජයග්‍රහණයන්ට පදනම වන්නේ බහුජනයා අතර කරන අනූන වැඩ සහ අපේ සටන්ව්‍යාපාර වලදී යොදන නැමෙන සුළු උපක්‍රම ය.

2. ගොරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගික පහරදීම

අප සතුරු පහරදීමක් සිඳ බිඳ දැමූ පසු සහ සතුරා අළුත් පහරදීමක් පටන් ගැනීමට පෙර, ඔහු සිටින්නේ උපායමාර්ගික ආරක්ෂාවීමෙහි ය, අප සිටින්නේ උපායමාර්ගික පහරදීමෙහි ය.

එබඳු කාලයන්හි අපේ සටන්ව්‍යාපාර පිළිබඳ ප්‍රතිපත්තිය වන්නේ ආරක්ෂක ස්ථාන වල අගල් කැණ ගෙන බලපවුරු බැඳගෙන සුරක්ෂිත ව සිටින්නා වූ ත් පරාජය කළ හැකි ය'යි අපට සහතික නැත්තා වූ ත් සතුරු බලසේනාවන්ට පහර දීම නො වේ; මෙල්ල කරන්නට තරම් සෑහෙන ශක්තියක් අපේ ගොරිල්ලා සේනාංග වලට ඇත්තා වූ, යම් යම්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රදේශ වල සිටින සතුරු සේනාංග සහ රූකඩ බලසේනා ක්‍රමානුකූලව විනාශ කිරීම හෝ පන්නා දැමීම ත් අපේ ප්‍රදේශ පළල් කිරීම, ජපානයට විරුද්ධ ව අරගල කරන්ට බහුජනයා පුබුදු කිරීම, අපේ හටකණ්ඩායම් අඩුපාඩු සපුරා පුහුණු කිරීම සහ අළුත් ගොරිල්ලා සේනාංග සංවිධානය කිරීම ත් ය. මේ වැඩ කරගෙන යද්දී සතුරා තවම ආරක්ෂාවීමෙහි ම යෙදී සිටී නම්, අපේ අළුත් ප්‍රදේශ තවදුරට ත් පළල් කරන්නට ද, දුර්වල ලෙස ගැරිසන් කර තිබෙන නගර සහ ගමනාගමන මාර්ග වලට පහර දී වටාපිටා තත්වයන් ගෙන් අවසර ලැබෙන තරම් කල් ඒවා අල්ලාගෙන සිටින්නට ද අපට හැකි ය. මේ සියල්ල ම උපායමාර්ගික පහරදීමට අයත් කර්තව්‍ය වේ; අභිප්‍රාය වනුයේ අපට අපේ ම යුද්ධමය සහ බහුජන ශක්තිය සාර්ථක ලෙස ගොඩනගා ගත හැකි වන සේ ත්, සතුරාගේ ශක්තිය සාර්ථක ලෙස හීන කළ හැකි වන සේ ත්, සතුරා යළි ත් පහරදීමක් පටන් ගත් කල ක්‍රමානුකූල සහ වේගබල සම්පන්න ලෙස ඔහු සිඳ බිඳ දැමීමට සූදනම් වන සේ ත්, සතුරා ආරක්ෂාවීමෙහි යෙදී සිටී යන සත්‍ය කාරණයෙන් ප්‍රයෝජන ගැනීම ය.

අපේ හටකණ්ඩායම් වලට විවේක දීම සහ ඔවුන් පුහුණු කිරීම අත්‍යවශ්‍ය ය; එසේ කිරීමට ඉතා ම හොඳ කාලය සතුරා ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට ය. එය විවේකය සහ පුහුණුව පිණිස වෙන හැම දෙයකින් ම අප වසා තබා ගැනීමේ ප්‍රශ්නයක් නො වේ; අපේ ප්‍රදේශ පළල් කරන අතර ම, කුඩා සතුරු සේනාංග පිස දමන අතර ම, ජනතාව පුබුදු කරන අතර ම, විවේකය ත් පුහුණුව ත් පිණිස කාලයක් සොයාගැනීමේ ප්‍රශ්නයකි. සිරිත් පරිදි මෙය කන බොන දේ, ඇඳ ඇකිරිලි, රෙදිපිළි යනාදිය සපයා ගැනීමේ දුෂ්කර ගැටළුව ගැන ක්‍රියා කිරීමට ද කාලය වේ.

එය, සතුරාගේ ප්‍රවාහණ කටයුතු වලට අවහිර කරමින් සහ නිත්‍ය බල-සේනාවන්ට ඔවුන්ගේ යුද්ධව්‍යාපාර වලදී කෙළින් ම අනුබල දෙමින්, සතුරාගේ ගමනාගමන මාර්ග විශාල පරිමාණයකින් විනාශ කිරීමට ද කාලය වේ.

එබඳු කාලයන්හි, ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ, ගොරිල්ලා කලාප සහ ගොරිල්ලා සේනාංග මහත් ප්‍රබෝධයෙන් පසුවන්නේ ය, සතුරා විසින් ආල-පාළු කරනලද ප්‍රදේශ අනුක්‍රමයෙන් පුනරුත්ථානයට පත් වන්නේ ය, නැවත ප්‍රාණවත් වන්නේ ය. සතුරා අල්ලාගෙන සිටින භූමිප්‍රදේශ වල ජනතාව ද ප්‍රීතියට පත් ව සිටින්නේ ය, ගොරිල්ලාභටයන්ගේ යසගොස හැම තැන ම රැව් පිළිරැව් දෙන්නේ ය. අනික් අතට සතුරාගේ ත් ඔහු පස්සේ දුවන බල්ලන් වන ද්‍රෝහීන්ගේ ත් කඳවුරෙහි සන්ත්‍රාසය ත් කැඩී බිඳී විසිරී යාම ත් වන්නේ ය. ඒ අතර ම ගොරිල්ලාභටයන් සහ ඔවුන්ගේ කඳවුරු ප්‍රදේශ කෙරෙහි වෛරය ලියලන්නේ ය, ඔවුන් ගැන ක්‍රියා කරන්ට සූදනම වැඩි වන්නේ ය. එහෙයින්, උපායමාර්ගික පහරදීම පවතින අතර, සතුරා සුළු කොට සලකන තරම් සහ තමන්ගේ ම ශ්‍රේණීන් තුළ සමගිය ශක්තිමත්

කිරීම ත් තම කඳවුරු ප්‍රදේශ සහ තම බලසේනා තහවුරු කිරීම ත් අමතක කරන තරම් ප්‍රීතියෙන් මත් වීමට ගොරිල්ලා අණදෙන්නන් හට අවසර දිය නො හැකි ය. එබඳු කාලයන්හි, ඕවිහු, අළුත් පහරදීමක් එන මොහොතේ ම තම උපායමාර්ගික පහරදීම නිසි පිළිවෙලක් ඇතිව සමාප්ත කරමින්, උපායමාර්ගික ආරක්ෂාවීමට හැරී, එමගින් සතුරාගේ පහරදීම සිඳ බිඳ දමන්ට තමන්ට හැකි වන සේ, අපට විරුද්ධ ව අරඹන කිසියම් අළුත් පහරදීමක සලකුණු සඳහා සතුරා කරන කියන හැම දෙයක් ම දක්ෂ ලෙස බලාගෙන සිටිය යුත්තාහ.

පරිච්ඡේද VIII

ගොරිල්ලා යුද්ධය ජංගම යුද්ධය බවට වර්ධනය කිරීම

ජපානයට විරුද්ධ ගොරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ පස්වැනි ගැටළුව නම්, එය ජංගම යුද්ධය බවට වර්ධනය කිරීම ය; මෙය යුද්ධය දිග්ගැසුණු සහ දරුණු යුද්ධයක් වන නිසා අවශ්‍ය වූ ත් විය හැකි වූ ත් වර්ධනයකි. ඉක්මනින් ම ජපන් ආක්‍රමණිකයන් පරාජය කොට තම නැති වූ භූමිප්‍රදේශ ආපසු ලබා ගන්ට චීනයට හැකි නම් ද, යුද්ධය දිග්ගැසුණු එකක් වත් දරුණු එකක් වත් නො වී නම් ද, මෙය අවශ්‍ය නො වෙනවා ඇත. එහෙත්, එසේ නො ව, යුද්ධය දිග්ගැසුණු සහ දරුණු එකක් වන හෙයින්, ජංගම යුද්ධය බවට වර්ධනය වීමෙන් විනා එබඳු යුද්ධ-යකට ගැලපෙන්නට ගොරිල්ලා සංග්‍රාමයට බැරි ය. යුද්ධය දිග්ගැසුණු සහ දරුණු එකක් වන බැවින්, ගොරිල්ලා සේනාංග සටන් කරන පිළිවෙල අනු-ක්‍රමයෙන් නිත්‍යභාවයට පත් කරන සේ ත් ගොරිල්ලා සංග්‍රාමය ජංගම සංග්‍රාමය බවට වර්ධනය වන සේ ත්, අවශ්‍ය අයෝමයභාවයට පත් වීමට ද අනුක්‍රමයෙන් නිත්‍ය බලසේනා බවට විපර්යාස වීමට ද ගොරිල්ලා සේනාංග වලට පුළුවන්කම තිබේ. ගොරිල්ලා අණදෙන්නන් ගොරිල්ලා සංග්‍රාමය ජංගම සංග්‍රාමය බවට හැරවීමේ ප්‍රතිපත්තිය අත නැර ගෙන සිටීමට සහ ක්‍රමානුකූල ව ක්‍රියාවේ යෙදීමට නම්, මේ වර්ධනයේ අවශ්‍යතාව ත් ඊට ඉඩකඩ ඇති බව ත් ඔවුන් විසින් පැහැදිලි ලෙස තේරුම් ගත යුතු ය.

වූතායි කඳු ප්‍රාන්තය වැනි බොහෝ තැන් වල, වර්තමාන ගොරිල්ලා සංග්‍රාමය එහි වැඩීම ගැන නිත්‍ය බලසේනාවන් විසින් එහි එවනලද ප්‍රබල බලඇණි වලට ණය ගැති ය. එහි සටන්ව්‍යාපාර, සාමාන්‍යයෙන් ගොරිල්ලා ලක්ෂණයකින් යුක්ත වුව ද, ආරම්භයේ සිට ම ජංගම සංග්‍රාමයේ මූල-ද්‍රව්‍යයක් අඩංගු කරගෙන ඇත. යුද්ධය කරගෙන යන කල මේ මූලද්‍රව්‍යය අනුක්‍රමයෙන් වැඩි වෙනවා ඇත. වේගයෙන් ව්‍යාප්ත වීමට ත් ශීඝ්‍රයෙන්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

වඩා උසස් මට්ටමකට වර්ධනය වීමට ත් වර්තමාන ජපන්-විරෝධි ගොරිල්ලා සංග්‍රාමයට හැකි කරන වාසිය රැඳී ඇත්තේ මෙහි ය; මෙසේ ගොරිල්ලා සංග්‍රාමය සඳහා තිබෙන තත්වයෝ ඊසානදිග පළාත් තුනේ තිබුණු තත්වයන්ට වඩා බෙහෙවින් උසස් ය.

ගොරිල්ලා සංග්‍රාමය කරගෙන යන ගොරිල්ලා සේනාංග ජංගම සංග්‍රාමය කරගෙන යන නිත්‍ය බලසේනා බවට විපර්යාස කිරීම පිණිස, කරුණු දෙකක් අවශ්‍ය ය — ගණනින් වැඩිවීමක් සහ තත්වයෙන් දියුණු වීමක් ය. බලසේනාවන්ට බැඳෙන ලෙස ජනතාව කෙළින් ම උනන්දු කිරීම හැරුණු කල, කුඩා සේනාංග එකට ඈඳීමෙන් ගණනින් වැඩිවීම මුදුන්පත් කළ හැකි වන අතර, වඩා හොඳ තත්වයකට පත් වීම යුද්ධය කරගෙන යන අතර සටන්කරුවන් අයෝමයභාවයට පත් කිරීම ත් ඔවුන්ගේ ආයුධ දියුණු කිරීම ත් මත රඳා පවතී.

කුඩා සේනාංග එකට ඈඳීමේදී, අපි, එක් අතකින්, අවධානය තනිකර ම ප්‍රාදේශික පලප්‍රයෝජන කෙරෙහි පමණක් යොමුකරන්නා වූ ද මධ්‍යගත කිරීමට බාධා කරන්නා වූ ද ප්‍රාදේශිකවාදයට විරුද්ධ ව පරෙස්සම් විය යුත්තෙමු; අනික් අතින් ප්‍රාදේශික පලප්‍රයෝජන අහකට තල්ලු කර දමන්නා වූ හුදු යුද්ධමය යොමුවීමට විරුද්ධ ව පරෙස්සම් විය යුත්තෙමු.

පොදු පලප්‍රයෝජන නො තකා හරිමින් ප්‍රාදේශික කල්පනාවල් ගැන ම නිතර දෙවේලේ සිත කය යොමු වී ඇති, නැතහොත් වඩා විශාල කණ්ඩායම් තුළ වැඩ කොට පළපුරුද්දක් නැති නිසා තම තමා රිසි සේ ක්‍රියා කරන්ට ම වඩා කැමති, ප්‍රාදේශික ගොරිල්ලා සේනාංග තුළ ත් ප්‍රාදේශික ආණ්ඩු තුළ ත් ප්‍රාදේශිකවාදය පවතී. ප්‍රධාන ගොරිල්ලා සේනාංගයන්ගේ හෝ ගොරිල්ලා සේනාවන්ගේ අණදෙන්නෝ මේ කාරණය ගණනට ගෙන, ප්‍රදේශ වල බලසේනාවන් ගෙන් කොටසක් ඒ ඒ ප්‍රදේශ වල ම තබාගෙන තම ගොරිල්ලා සංග්‍රාමය පළල් කරගන්ට ඒ ප්‍රදේශ වලට ඉඩ දෙමින්, ප්‍රාදේශික සේනාංග වලින් කොටසක් පමණක් අනුක්‍රමයෙන් ඈඳා ගැනීමේ ක්‍රමය යෙදිය යුත්තාහ; අණදෙන්නෝ මේ සේනාංග දෙගොල්ල එකතු ව කරන සටන්ව්‍යාපාර වලට ඈඳගත යුත්තාහ; ඉක්බිති, කුඩා කණ්ඩායම් සන්සුන් ලෙස ලොකු කණ්ඩායම් වලට සමස්ත විය හැකි වන සේ, ඒ කුඩා කණ්ඩායම් වල මුල් සංවිධානය කඩා දමන්නේ වත් ඒවායේ කාඩර්වරුන් එහෙ මෙහෙ මාරු කරන්නේ වත් නැති ව, ඒවා ඈඳා ගැනීම කළ යුත්තාහ.

ප්‍රාදේශිකවාදයට පටහැනි ව, හුදු යුද්ධමය යොමුවීම තමන්ගේ ම ශක්තිය පළල් කරන්නට නැමී සිටින සහ ප්‍රාදේශික සන්නද්ධ සේනාංග වලට උදව් දීම නො සලකා හරින අය විසින් ප්‍රධාන බලසේනාවන් තුළ දරන වැරදි මතයක් නියෝජනය කරයි. ගොරිල්ලා සංග්‍රාමය ජංගම සංග්‍රාමය බවට වර්ධනය කිරීමේ තේරුම ගොරිල්ලා සංග්‍රාමය අත හැර

දැමීම නො ව, දසත පැතුරුණු ගොරිල්ලා සංග්‍රාමය මැද්දේ ම ජංගම සංග්‍රාමය කරගෙන යාමට හැකි ප්‍රධාන බලසේනාවක්, ව්‍යාප්ත ගොරිල්ලා සටන්ව්‍යාපාර ගෙනයන ගණන් නැති ගොරිල්ලා සේනාංග තවම තමා වටා සිටිය යුතු බලසේනාවක්, අනුක්‍රමයෙන් සකස් කිරීම බව ඔවුන්ට නො තේරේ. මේ ගොරිල්ලා සේනාංගයෝ ප්‍රධාන බලසේනාවට සිටින බලවත් උපස්ථම්භක සේනාවෝ වෙති, ප්‍රධාන බලසේනාව දිගට ම වැඩෙනු පිණිස සිටින ඉවර නො වන අතිරේක සේනාවන් සේ සේවය කරති. එහෙයින් ප්‍රධාන බලසේනාවක අණදෙන්නෙක් හුදෙක් යුද්ධමය වශයෙන් යොමුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශික ජනගහණයේ ත් ප්‍රාදේශික ආණ්ඩුවේ ත් පලප්‍රයෝජන ගැන නො සලකා හැරීමේ වරද කර සිටී නම්, ඔහු, ප්‍රධාන බලසේනාව පළල් කිරීම ත් ප්‍රාදේශික සන්නද්ධ සේනාංග ගණනින් වැඩි කිරීම ත් යන දෙකට ම නිසි ලෙස අවධානය යොමු කරන සේ ඒ වරද හරි ගැස්සිය යුතු ය.

ගොරිල්ලා සේනාංගයන්ගේ තත්වය උසස් කරනු පිණිස, ඔවුන් අනුක්‍රමයෙන් නිත්‍ය බලසේනාවන්ගේ මෝස්තරයට හැඩ ගැසෙන සේ ත් තම ගොරිල්ලා විධි ඉවත ලන සේ ත්, ඔවුන්ගේ දේශපාලන සහ සංවිධානාත්මක මට්ටම් උසස් කිරීම ද ඔවුන්ගේ උපකරණ, යුද්ධ ශිල්පය, උපක්‍රම සහ විනය දියුණු කිරීම ද අත්‍යවශ්‍ය ය. දේශපාලන වශයෙන්, අණදෙන්නන් සහ සටන්කරුවන් යන දෙගොල්ලන් ම විසින් ගොරිල්ලා සේනාංග නිත්‍ය බලසේනා වල මට්ටමට එසවීමේ අවශ්‍යතාව වටහා ගන්ට සැලසීම ත්, මේ අන්තය දෙසට පරිශ්‍රම දැරීමට ඔවුන් හට දිරි දීම ත්, දේශපාලන වැඩ මගින් එය මුදුන්පත් කරනු ලැබීම සහතික කිරීම ත් අත්‍යවශ්‍ය වේ. සංවිධානාත්මක වශයෙන්, යුද්ධ සහ දේශපාලන මණ්ඩල, සෙනෙවිමණ්ඩල සහ වැඩ කරන ක්‍රම, නිත්‍ය සැපයීම් ක්‍රමයක්, වෛද්‍ය සේවයක් යනාදි අංගයන් අතින් නිත්‍ය සේනාවකට උවමනා කරන සියලු දේ අනුක්‍රමයෙන් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ. උපකරණ පිළිබඳ කාරණයේදී, වඩා හොඳ සහ වඩා විවිධ ආයුධ ලබා ගැනීම ත් අවශ්‍ය පණිවිඩ හුවමාරු උපකරණ සැපයීම වැඩි කිරීම ත් අත්‍යවශ්‍ය වේ. යුද්ධ ශිල්පය සහ උපක්‍රම පිළිබඳ කාරණයේදී, ගොරිල්ලා සේනාංග නිත්‍ය සේනාවකින් බලාපොරොත්තු වන මට්ටමට එසවීම අත්‍යවශ්‍ය වේ. විනය පිළිබඳ කාරණයේදී, එක්වැනි ප්‍රඥප්ති පිළිපදින සේ, හැම අණක් ම නො වරදවා ඉටු කරන සේ, සියලු නොසැලකිලිමත් ගති නැති කරන සේ, මට්ටම එසවීම අත්‍යවශ්‍ය වේ. මේ සියලු කර්තව්‍ය මුදුන්පත් කරනු පිණිස දිගින් දිගට පරිශ්‍රම දැරීම අවශ්‍ය ය; එය එක රැයින් නො කළ හැකි ය; එහෙත් අප වර්ධනය විය යුතු අත එය යි. එසේ පමණකි එක් එක් ගොරිල්ලා කඳවුරු ප්‍රදේශයෙහි ප්‍රධාන බලසේනාවක් ගොඩනැඟිය හැකි වන්නේ ත්, සතුරාට වඩා ත් විපාකදායක ප්‍රහාරයන් දීම පිණිස ජංගම සංග්‍රාම ඇති විය හැක්කේ ත්. නිත්‍ය බලසේනාවන් විසින් යවනලද බලඇණි හෝ කාඩර්වරුන් සිටින තැන් වල,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මේ එල්ලය වඩා පහසුවෙන් අත්පත් කරගත හැකි ය. එහෙයින් නිත්‍ය සේනාංග බවට වර්ධනය වීමට ගොරිල්ලා සේනාංග වලට ආධාර කිරීමේ වගකීම සියලු ම නිත්‍ය බලසේනාවන්ට ඇත්තේ ය.

පරිච්ඡේද IX

විධානයේ සම්බන්ධතාව

ජපානයට විරුද්ධ ගොරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ අන්තිම ගැටළුව විධානයේ සම්බන්ධතාවට අදාළ වේ. ගොරිල්ලා සංග්‍රාමය අවහිරයක් නැති ව වර්ධනය වීම පිණිස කලින් තිබිය යුතු එක් දෙයක් නම් මේ ගැටළුව පිළිබඳ නිවැරදි විසඳුමකි.

ගොරිල්ලා සේනාංග යනු විසිරී සිටිමින් සටන්ව්‍යාපාර ගෙනයාමේ ලක්ෂණයෙන් යුත්, සන්නද්ධ සංවිධානයේ පහළ මට්ටමක් වන හෙයින්, ගොරිල්ලා සංග්‍රාමයෙහි විධාන ක්‍රම නිත්‍ය සංග්‍රාමයෙහි තරම් ම උසස් ප්‍රමාණයකට මධ්‍යගත කරන්නට ඉඩ නො ලැබේ. නිත්‍ය සංග්‍රාමයෙහි විධාන ක්‍රම ගොරිල්ලා සංග්‍රාමයට යෙදීමට කිසියම් ප්‍රයත්නයක් දැරුවොත්, ගොරිල්ලා සංග්‍රාමයේ මහත් නැමෙන සුලු ගුණය නො වැළකිය හැකි ලෙස ම සීමා වෙනවා ඇත, එහි ජීවශක්තිය සිඳී යනවා ඇත. බෙහෙවින් ම මධ්‍යගත කළ විධානයක් ගොරිල්ලා සංග්‍රාමයේ මහත් නැමෙන සුලු ගුණයට කෙළින් ම ප්‍රතිවිරුද්ධ ය, ඊට නො යෙදිය යුතු ය, යොදන්ට බැරි ය.

කෙසේ වෙවා, කිසියම් මධ්‍යගත කළ විධානයක් නැති ව ගොරිල්ලා සංග්‍රාමය සාර්ථක ලෙස වර්ධනය කරන්ට බැරි ය. ව්‍යාප්ත නිත්‍ය සංග්‍රාමය ත් ව්‍යාප්ත ගොරිල්ලා සංග්‍රාමය ත් එක විට ම පවතින විට, ඒවායේ සටන්-ව්‍යාපාර උචිත ලෙස සම්බන්ධ කළ යුතු ය; එහෙයින් ය දෙක උචිත ලෙස සම්බන්ධ කරන විධානයක් සඳහා, එනම්, ජාතික මහ සෙනෙවිමණ්ඩලය ද යුද්ධ-කලාප අණදෙන්නන් ද විසින් කරන එක්සත් උපායමාර්ගික විධානයක් සඳහා, ඇති උවමනාව. ගොරිල්ලා සේනාංග රාශියක් සිටින ගොරිල්ලා කලාපයක හෝ ගොරිල්ලා කඳවුරු ප්‍රදේශයක හෝ, සාමාන්‍යයෙන් ප්‍රධාන බලසේනාව තනන (සමහර විට නිත්‍ය සේනාවන් සමග එක් වූ) ගොරිල්ලා සේනා එකක් හෝ වැඩි ගණනක් ද, අතිරේක බලසේනාව වශයෙන් සිටින, ලොකු හෝ කුඩා, වෙන ගොරිල්ලා සේනාංග ගණනක් ද, නිෂ්පාදන වැඩ වලින් ඉවත් නො කළ මිනිසුන් ගෙන් සැදුණු බොහෝ සන්නද්ධ ඒකක ද ඇත; එහි සිටින සතුරු බලසේනාවෝ සාමාන්‍යයෙන් ගොරිල්ලාභටයන්ට විරුද්ධ ව කරන තම සටන්ව්‍යාපාර එකමුතු ව කර-ගෙන යනු පිණිස එක්සත් සංකීර්ණයක් වශයෙන් සකස් වෙති. ඒ කරණකොට

ගෙන, එබඳු ගොරිල්ලා කලාප වල හෝ කඳවුරු ප්‍රදේශ වල, එක්සත් කළ හෝ මධ්‍යගත කළ විධානයක් පිහිටුවීමේ ගැටළුව පැනනඟී.

එහෙයින්, ඒකාන්ත මධ්‍යගත කිරීම ත් ඒකාන්ත විමධ්‍යගත කිරීම ත් යන දෙකට ම පටහැනි ව, ගොරිල්ලා යුද්ධයෙහි විධානය පිළිබඳ මූල-ධර්මය විය යුත්තේ උපායමාර්ගයේදී මධ්‍යගත කළ විධානය ත් යුද්ධ-ව්‍යාපාර වලදී සහ සටන් වලදී විමධ්‍යගත කළ විධානය ත් ය.

මූළු එකක් වශයෙන් ගොරිල්ලා සංග්‍රාමය රජය විසින් සැලැස්ම කිරීම හා මගපෙන්වනු ලැබීම ත්, එක් එක් යුද්ධ කලාපයෙහි ගොරිල්ලා සංග්‍රාමය නිත්‍ය සංග්‍රාමය සමග උචිත ලෙස සම්බන්ධ කිරීම ත්, එක් එක් ගොරිල්ලා කලාපයෙහි හෝ කඳවුරු ප්‍රදේශයෙහි සියලු ජපන්-විරෝධී සන්නද්ධ බලසේනාවන් එක්සත් කිරීම සහ ඒවාට මගපෙන්වීම ත් මධ්‍යගත කළ උපායමාර්ගික විධානයට ඇතුළත් ය. මෙහිදී සමගිසම්පන්නතාව, එක්සත්කම සහ මධ්‍යගත කිරීම නොමැති වීම හානිකර ය, ඒ තුන ම සහතික කරනු පිණිස හැම පරිශ්‍රමයක් ම දැරිය යුතු ය. සාමාන්‍ය කටයුතු වලදී, ඒ කියන්නේ, උපායමාර්ගය පිළිබඳ කටයුතු වලදී, එකමුතු ව ක්‍රියා කරන බව සහතික කරන සේ පහළ මට්ටම් ඉහළ මට්ටම් වලට වාර්තා කොට, ඒවායේ උපදෙස් අනුගමනය කළ යුතු ය. කෙසේ වෙවා, මධ්‍යගත කිරීම මෙතැනදී නතර වේ; ඉන් ඔබ්බට යමින්, යුද්ධව්‍යාපාරයක් හෝ සටනක් සඳහා නියම වශයෙන් ම යොදන විධිවිධාන වැනි විස්තර විභාගයන් පිළිබඳ කටයුතු වලදී පහළ මට්ටම් වලට ඇඟිලි ගැසීම ද එසේ ම හානිකර වෙනවා ඇත. කවර හෙයින් ද යත් එබඳු විස්තර විභාග, කලින් කල සහ තැනින් තැන වෙනස් වන්නා වූ ත් ඈත සිටින ඉහළ විධාන මට්ටම් විසින් වටහා ගත නො හැක්කා වූ ත්, නියම වශයෙන් පවත්නා තත්වයන් අනු ව නිශ්වය කළ යුතු නිසා ය. යුද්ධව්‍යාපාර සහ සටන් වලදී විමධ්‍යගත කළ විධානය යන්නෙන් අදහස් කරන්නේ මෙය යි. නිත්‍ය සටන්ව්‍යාපාර වලදී ත්, විශේෂයෙන් ගමනාගමනය සහ පණිවිඩ හුවමාරුව ප්‍රමාණවත් නො වන කල, සාමාන්‍යයෙන් මේ මූලධර්මය ම යෙදේ. කොටින්, එහි තේරුම එක්සත් කළ උපායමාර්ගයක රාමුව තුළ ස්වාධීන ව ත් මූලපිරුම ඇති ව ත් කරන ගොරිල්ලා සංග්‍රාමය යි.

ගොරිල්ලා කඳවුරු ප්‍රදේශයක්, එක් එක් උප-පළාත දිස්ත්‍රික්ක වලට බෙදන ලද්දවූ ද, එක් එක් උප-ප්‍රදේශය එබඳු උප-පළාත් කීපයකින් සමන්විත වූ ද, උප-ප්‍රදේශ වලට බෙද තිබෙන යුද්ධ ප්‍රදේශයක් සකස් කරන තැන් වල, යුද්ධ ප්‍රදේශයේ සහ උප-ප්‍රදේශයේ මූලස්ථාන වල සිට පහළට උප-පළාත් සහ දිස්ත්‍රික්ක ආණ්ඩු තෙක් විවිධ මට්ටම් අතර සම්බන්ධතාව අනුපිළිවෙලින් අවනත වීම පිළිබඳ එකකි; හැම සන්නද්ධ බලසේනාවක් ම, එහි ස්වභාවය අනුව, කෙළින් ම මේවායින් එකක

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

විධානය යටතේ සිටිය යුතු ය. පැහැදිලි කර තිබෙන මූලධර්මය උඩ, මේ මට්ටම් වල විධානයේ සම්බන්ධතාවේදී පොදු ප්‍රතිපත්තිය පිළිබඳ කටයුතු උසස් මට්ටම් තුළ මධ්‍යගත කළ යුතු ය; ඒ අතර, ඇත්ත වශයෙන් කරන සටන්ව්‍යාපාර, ස්වාධීන ව ක්‍රියා කිරීමේ අයිතිය තිබිය යුතු පහළ මට්ටම් විසින් නියම වශයෙන් තිබෙන වටාපිටා තත්වයන් අනු ව කරගෙන යා යුතු ය. පහළ මට්ටමක ඇත්ත වශයෙන් ම කරගෙන යන සටන්ව්‍යාපාර ගැන කීමට කිසිවක් ඉහළ මට්ටමකට තිබේ නම්, ඒ ඉහළ මට්ටම තම අදහස් ''උපදෙස්'' වශයෙන් ඉදිරිපත් කළ හැකි ය, ඉදිරිපත් කළ යුතු ය; එහෙත් දැඩි ''විධානයන්'' නිකුත් නො කළ යුතු ය. ප්‍රදේශයක් වඩ වඩා ව්‍යාප්ත වන පමණට, තත්වය වඩ වඩා සංකීර්ණ වන පමණට, ඉහළ සහ පහළ මට්ටම් අතර දුරප්‍රමාණය වඩ වඩා විශාල වන පමණට, ස්වාධීන ව වැඩ කිරීමට ත්, ව්‍යාකූල තත්වයන් ගැන ක්‍රියා කිරීමට ත්, ගොරිල්ලා සංග්‍රාමය සාර්ථක ලෙස ව්‍යාප්ත කිරීමට ත් හැකියාව වර්ධනය කර ගන්ට පහළ මට්ටම් වලට සහ ප්‍රාදේශික කාර්යභාරපුද්ගලයන්ට පුළුවන් වන සේ, පහළ මට්ටම් ඇත්ත වශයෙන් ගෙනයන සටන්ව්‍යාපාර වලදී ඒ මට්ටම් වලට වැඩි ස්වාධීනත්වයක් දීම ද, එසේ ඒ ඒ ප්‍රදේශ වල අවශ්‍යතාවන්ට වඩා ත් කිට්ටුවෙන් අනුරූප වන ලක්ෂණයක් ඒ සටන්ව්‍යාපාර වලට දීම ද වඩ වඩා නුවණට හුරු වේ. ඒකරාශි කළ සටන්ව්‍යාපාරයක යෙදී සිටින සන්නද්ධ සේනාංගයක් හෝ වඩා ලොකු සේනාවක් සඳහා ක්‍රියාවේ යෙදිය යුතු මූලධර්මය නම්, එහි විධානයේ අභ්‍යන්තර සම්බන්ධතාව තුළ මධ්‍යගත කිරීමේ මූලධර්මයකි; ඉහළ විධානයට තත්වය පැහැදිලි හෙයිනි. එහෙත් මේ සේනාංගය හෝ සේනාව විසිරී සිටිමින් ක්‍රියා කරනු පිණිස බිඳී ගිය මොහොතේ ම, සාමාන්‍ය කටයුතු වලදී මධ්‍යගත කිරීමේ ත් විස්තර විභාග වලදී විමධ්‍යගත කිරීමේ ත් මූලධර්මය යෙදිය යුතු ය; කවර හෙයින් ද යත් නියම වශයෙන් පවතින තත්වය ඉහළ විධානයට පැහැදිලි නො විය හැකි නිසා ය.

උවමනා කරන තැන මධ්‍යගත කිරීම නො තිබීමේ තේරුම ඉහළ මට්ටම් වල නොසැලකිලිමත්කම හෝ පහළ මට්ටම් විසින් බලය අයුතු ලෙස පැහැරගැනීම ය; එයින් එකක් වත්, විශේෂයෙන් යුද්ධමය පරිමණ්ඩල-යෙහි, ඉහළ සහ පහළ මට්ටම් අතර සම්බන්ධතාවේදී ඉවසිය නො හැකි ය. ක්‍රියාවේ යෙදිය යුතු තැන විමධ්‍යගත කිරීම ක්‍රියාවේ යොදනු නො ලැබේ නම්, එහි තේරුම ඉහළ මට්ටම් විසින් බලය ඒකාධිකාරයක් කර ගෙන තිබීම සහ පහළ මට්ටම් වල පැත්තෙන් මූලපිරුමේ ගුණයක් නො තිබීම ය; එයින් එකක් වත්, විශේෂයෙන් ගොරිල්ලා සංග්‍රාමයට විධානය දීමේදී, ඉහළ සහ පහළ මට්ටම් අතර සම්බන්ධතාවේදී ඉවසිය නො හැකි ය. ඉහතින් සඳහන් කළ මූලධර්ම විධානයේ සම්බන්ධතාව පිළිබඳ ගැටළුව විසඳනු පිණිස තිබෙන එක ම නිවැරදි ප්‍රතිපත්තිය සම්පාදනය කරයි.

ස ට හ න්

[1]වාංපායි කඳු වැටිය චීනයේ ඊසානදිග දේශසීමාවේ පිහිටියේ ය. 1931, සැප්තැම්බර් 18වැනි ද කළ ජපන් ආක්‍රමණයට පසු, මේ ප්‍රාන්තය චීන කොමියුනිස්ට පක්ෂය විසින් නායකත්වය දෙනලද ජපන්-විරෝධී ගොරිල්ලාභටයන් සඳහා කඳවුරු ප්‍රදේශයක් බවට පත් විය.

[2]වූතායි කඳු වැටිය ශාන්සි සහ හෝපෙයි පළාත් අතර දේශසීමාවන්හි පිහිටියේ ය. 1937 ඔක්තෝබරයේදී චීන කොමියුනිස්ට පක්ෂය විසින් නායකත්වය දෙනලද අටවැනි මාර්ග හමුදාව වූතායි කඳු ප්‍රාන්තය මධ්‍යස්ථානය කරගෙන ශාන්සි-චහාර්-හෝපෙයි ජපන්-විරෝධී කඳවුරු ප්‍රදේශය ගොඩනඟන්ට විය.

[3]තායිහාං කඳුවැටිය ශාන්සි, හෝපෙයි, හෝනාන් පළාත් අතර දේශසීමාවන්හි පිහිටියේ ය. 1937 නොවැම්බරයේදී අටවැනි මාර්ග හමුදාව තායිහාං කඳු ප්‍රාන්තය මධ්‍යස්ථානය වශයෙන් ඇති ව ගිනිකොන්දිග ශාන්සි ජපන්-විරෝධී කඳවුරු ප්‍රදේශය ගොඩනඟන්නට විය.

[4]තායිශාන් කන්ද මධ්‍යම ශාන්තුං පළාතේ තායි-යි කඳුවැටියේ ප්‍රධාන ශිඛරයන් අතුරෙන් එකකි. 1937 සීතසෘතුවේදී කොමියුනිස්ට පක්ෂය විසින් නායකත්වය දෙනලද ගොරිල්ලා හමුදාවෝ තායි-යි කඳු ප්‍රාන්තය මධ්‍යස්ථානය වශයෙන් ඇති ව මධ්‍යම ශාන්තුං ජපන්-විරෝධී කඳවුරු ප්‍රදේශය ගොඩනඟන්නට වූහ.

[5]යෙන්ශාන් කඳු වැටිය හෝපෙයි පළාතේ ඊසානදිග කොටසෙහි පිහිටියේ ය. 1938 ග්‍රීෂ්මසෘතුවේදී අටවැනි මාර්ග හමුදාව යෙන්ශාන් කඳු ප්‍රාන්තය මධ්‍යස්ථානය වශයෙන් ඇති ව නැගෙනහිර හෝපෙයි ජපන්-විරෝධී කඳවුරු ප්‍රදේශය ගොඩනඟන්ට විය.

[6]මාඕශාන් කඳු පිහිටියේ දකුණු වියාංසු පළාතෙහි ය. 1938 ජූනියෙහි කොමියුනිස්ට පක්ෂය විසින් නායකත්වය දෙනලද අළුත් සිව්වැනි හමුදාව මාඕශාන් කඳු ප්‍රාන්තය මධ්‍යස්ථානය වශයෙන් ඇති ව දකුණු වියාංසු ජපන්-විරෝධී කඳවුරු ප්‍රදේශය ගොඩනඟන්ට විය.

[7]තැනි වල දීර්ඝකාලීන සහ, බොහෝ තැන් වල, ස්ථාවර කඳවුරු ප්‍රදේශ පිහිටුවන්ට හැකි බව විරුද්දකම් පැමේ යුද්ධයේදී ලත් අත්දැකීමෙන් ඔප්පු විය. මෙය ඒ තැනි වල සුවි-ශාලත්වය සහ ලොකු ජනගහණය ත්, කොමියුනිස්ට පක්ෂයේ ප්‍රතිපත්ති වල නිවැරදිකම ත්, ජනතාව පුළුල් ලෙස ක්‍රියාවට උනන්දු කිරීම සහ සතුරාට හටකණ්ඩායම් හිඟ වීම ත් හේතු කොට ගෙන විය. සහෝදර මාඕ සේතුං පසු කාලයේ නිර්දේශයන්හි මේ පුළුවන්කම ස්ථිර කළේ ය.

[8]IIවැනි ලෝක යුද්ධය අවසන් වූ ද සිට, ජාතික සහ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලව ව්‍යාපාරය ආසියාවෙහි, අප්‍රිකාවෙහි සහ ලතින් ඇමරිකාවෙහි නැඟී නැඟී ඉදිරියට යන්ට වී ඇත. බොහෝ රටවල් වල ජනතාව, ඔවුන්ගේ ම විප්ලවවාදී සහ ප්‍රගතිශීලී බලවේගයන් විසින් නායකත්වය දෙනු ලැබ, අධිරාජ්‍යවාදයේ ත් ප්‍රතිගාමිත්වයේ ත් අඳුරු පාලනය පෙරළා දමනු පිණිස කලක් තිස්සේ ම දරා සිටින සන්නද්ධ අරගල කරගෙන ගොස් ඇත. මෙය—සමාජවාදී කඳවුර ත්, විජිත රටවල් වල ජනතාවගේ විප්ලවවාදී බලවේග ත්, සියලු රටවල් වල ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රගතිය උදෙසා පරිශ්‍රම දරන්නා වූ ජනතා බලවේග ත් යෝධ පියවරින් ඉදිරියට යමින් සිටින, ලෝක ධනවාදී ක්‍රමය තවදුරට දුර්වල වෙමින් යන සහ, අධිරාජ්‍යවාදයේ විජිත පාලනය කැඩී බිඳී විසිරී යාම පිණිස වේගයෙන් ඇදී යන—අළුත් ඉතිහාසීය තත්වයන් යටතේ, අද විවිධ රටවල් වල ජනතාව ගොරිල්ලා සංග්‍රාමය කරගෙන යන තත්වයන් චීන ජනතාව ජපානයට විරුද්ද ගොරිල්ලා සංග්‍රාමය කරගෙන ගිය දින වල අවශ්‍ය ව තිබුණු තත්වයන් ම විය යුතු නො වන බව පෙන්නුම් කරයි. වෙන වචන වලින්, භූමිප්‍රදේශය විශාල

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නො වූ රටක ත්, නිදසුන් වශයෙන්, කියුබාවෙහි, ඇල්ජීරියාවෙහි, ලාඕසයෙහි සහ දකුණු වියට්නාමයෙහි මෙන්, ගෙරිල්ලා යුද්ධය ජයග්‍රාහී ලෙස කළ හැකි වේ.

[9] වෙයිචී යනු ක්‍රීඩකයන් දෙදෙනා ලෑල්ල මත තිබෙන එකිනෙකාගේ ඉත්තන් වට කරන්ට උත්සාහ කරන පැරණි චීන සෙල්ලමකි. ක්‍රීඩකයකුගේ ඉත්තන් වට කරනු ලැබූ කල, ඒවා "මළ" (අල්ලාගත්) ඉත්තන් සේ සලකනු ලැබේ. එහෙත් වට කළ ඉත්තන් අතර හිස් අල්ලි සෑහෙන ගණනක් තව ම තිබේ නම්, එවිට ඒ ඉත්තෝ තවම ත් "පණ ඇති" (අල්ලා නො ගත්) ඉත්තෝ වෙති.

[10] ක්‍රි: පූ: 353දී වෙයි රජය චාඕ රජයේ අගනුවර වන හාන්තාන් වට කළේ ය. චාඕ රජයේ මිත්‍රපාක්ෂිකයකු වූ චී රජයේ රජ තම හටකණ්ඩායම් යොදා චාඕ රජයට ආධාර කරන ලෙස ඔහුගේ සෙනෙවියන් වූ තියන් චීට සහ සුන් පින්ට අණ කළේ ය. වෙයි රජයේ ඉතා ම දක්ෂ බලසේනාවන් චාඕ රජයට පිවිසී සිටින බව ත්, තමන්ගේ ම භූමිප්‍රදේශය රකින්ට දුර්වල සේනාවක් ඉතිරි කර ගොස් සිටින බව ත් දැන, සුන් පින් සෙනෙවියා වෙයි රජයට පහර ගැසී ය; එවිට වෙයි රජයේ හටසේනාවෝ තමන්ගේ රට රකින්ට ඉවත් වී ගියහ. ඔවුන් විඩාවට පත් වී සිටීම වාසියක් කරගනිමින්, චී රජයේ හටසේනාවෝ (වර්තමාන ශාන්ටුං පළාතේ හොටසේ උප-පළාතට ඊසාන දිගින්) කුඑයිලිංහිදී ඔවුන් හා සටන් වැදී ඔවුන් පළවා හැරියහ. හාන්තාන් නගරයේ වැටලීම අවසන් විය. එතැන් සිට චීන යුද්ධෝපායඥයන් ඒ හා සමාන උපක්‍රම "වෙයි රජය වට කිරීමෙන් චාඕ රජය නිදහස් කිරීම" වශයෙන් හඳුන්වා ඇත.

දිග්ගැසුණු යුද්ධය ගැන

1938 මැයි

ගැටළුවේ විස්තරය

1. නොබෝ දිනකින් ජපානයට විරුද්දකම් පෑමේ ශ්‍රේෂ්ඨ යුද්ධයේ පළමුවැනි සංවත්සරය වන ජූලි 7 එළඹෙයි. සමගියෙන් එක්රොක් වී, විරුද්දකම් පෑමෙහි අත නෑර යෙදී සිටිමින්, එක්සත් පෙරමුණෙහි අත නෑර යෙදී සිටිමින්, මුළු ජාතියේ ම බලවේගයෝ පුරා අවුරුද්දක් පමණ ම සතුරා සමග අභීත ලෙස සටන් කර සිටිති. මුළු ලොවේ ම ජනතාව පෙරදිග ඉතිහාසයෙහි මීට පෙර වූ එවැන්නක් නොමැත්තා වූ ත් ශ්‍රේෂ්ඨ යුද්ධයක් වශයෙන් ලෝක ඉතිහාසයට ද ඇතුළත් වනු ඇත්තා වූ ත් මේ යුද්ධය සිදු වෙමින් යන ආකාරය මහත් ඕනෑකමින් බලා සිටී. යුද්ධයෙන් සිදු වන ව්‍යසනයන් ගෙන් පීඩා විඳින්නා වූ ද, තම ජාතියේ වීර ජීවනය සඳහා සටන් කරන්නා වූ ද, හැම චීන ජාතිකයෙක් ම දිනක් පාසා ම ජයග්‍රහණය පතමින් සිටී. එහෙත් ඇත්ත වශයෙන් ම යුද්ධය කුමන මගක් ගනීවි ද? අපට ජය ගත හැකි ද? අපට ඉක්මනින් ජය ගත හැකි ද? බොහෝ දෙනා දිග්ගැසුණු යුද්ධයක් ගැන කතා කරති; එහෙත් එය දිග්ගැසුණු යුද්ධයක් වන්නේ මන්ද? දිග්ගැසුණු යුද්ධයක් කරගෙන යන්නේ කෙසේ ද? බොහෝ දෙනා අවසාන ජයග්‍රහණය ගැන කතා කරති; එහෙත් අවසාන ජයග්‍රහණය අප සතු වන්නේ මන්ද? අවසාන ජයග්‍රහණය පිණිස අපි කෙසේ පරිශ්‍රම දරමු ද? හැම කෙනෙක් ම මේ ප්‍රශ්න වලට පිළිතුරු සොයා ගෙන නැත; ඇත්ත වශයෙන්, මේ දක්වා වැඩි දෙනා එසේ කර නැත. එහෙයින් ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායය අටුවා කොට දක්වන පරාජයවාදියෝ චීනය යටත් කරනු ලැබේ ය'යි ද, අවසාන ජයග්‍රහණය චීනය සතු නො වේ ය'යි ද මිනිසුන්ට කීමට ඉදිරියට අවුත් සිටිති. අනික් අතින්, ඇතැම් ඉක්මන්කාර මිතුරෝ එතරම් ලොකු පරිශ්‍රමයක් දරන්ට සිදුවන්නේ නැති ව ම චීනය ඉතා ඉක්මනින් ජය ගන්නවා ඇතැ'යි

මේ දේශන මාලාව සහෝදර මාඕ සේතුං විසින් 1938 මැයි 26වැනි දින සිට ජූනි 3වැනි දින තෙක් ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය අධ්‍යයනය කරන යෙන්ආන් සංගමයේදී පවත්වනලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මිනිසුන්ට කීමට ඉදිරියට අවුත් සිටිති, එහෙත් මේ මත නිවැරදි ද? ඒවා නිවැරදි නො වේ ය'යි අප විසින් මුල සිට දිගට ම කියා ඇත; කෙසේ වේවා, බොහෝ දෙනා අප කියා තිබෙන දේ තවම හොඳින් තේරුම් ගෙන නැත. මෙය එක් කොටසකින් ප්‍රචාරක වැඩ ත් පැහැදිලි කිරීමේ වැඩ ත් උවමනා තරම් අප විසින් නො කළ නිසා ය; කොටසකින් විෂයමූල සිද්ධීන්ගේ වර්ධනය එතෙක් ම ඒ සිද්ධීන්ගේ නෛසර්ගික ස්වභාවය ත් අංගලක්ෂණ ත් සම්පූර්ණයෙන් සහ පැහැදිලි ලෙස ජනතාවට අනාවරණය කර නො තිබුණු නිසා ය; එසේ ඒ ජනතාව හැම දෙයක් ම බර වෙිගෙන යන අත සහ එහි ප්‍රතිඵලය කල්තබා දකින්ට ත් එහෙයින් ප්‍රතිපත්ති සහ උපක්‍රම සම්පූර්ණ මාගයක් ගැන තීරණය කරන්ට ත් හැකි තත්වයක නො සිටියේ ය. දැන් කරුණු වඩා හොඳ ය; ජාතික පරාධීනත්වය පිළිබඳ අත්‍යන්තයෙන් ම පදනම් රහිත න්‍යායය පුපුරවා හැරීමට ත්, අපේ ඉක්මන්කාර මිතුරන් ඉක්මනින් ලබන ජයක් පිළිබඳ ඔවුන්ගේ න්‍යායයෙන් මැත් කරලීමට ත් දස මසක යුද්ධයේ අත්දැකීම හොඳට ම ප්‍රමාණවත් වී ඇත. මේ වටපිටා තත්වයන් යටතේ බොහෝ දෙනා විස්තීර්ණ පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිති. දිග්ගැසුණු යුද්ධය සම්බන්ධයෙන් වඩාත් ම එසේ ඉල්ලා සිටිති; ඒ ජාතික පරාධීනත්වය ත් ඉක්මනින් ලබන ජයග්‍රහණය ත් පිළිබඳ එකිනෙකට පටහැනි න්‍යායයන් නිසා ම පමණක් නො ව, යුද්ධයේ ස්වභාවය ගැන ඇති නොගැඹුරු අවබෝධය නිසා ත් ය. "අපේ හතළිස් කෝටියක් ජනතාව ලූගොළුචියාඕ සිද්ධියේ[1] සිට එකමුතු කමින් පරිශ්‍රමයක් දරා ඇත, අවසාන ජයග්‍රහණය චීනය සතු වෙනවා ඇත." මේ සූත්‍රය බෙහෙවින් ප්‍රචලිත ය. එය නිවැරදි සූත්‍රයකි; එහෙත් ඊට තවත් කරුණු අඩංගු කළ යුතු ව තිබේ. විරුද්දකම් පෑමේ යුද්ධය ත් එක්සත් පෙරමුණ ත් අත නැර අල්ලා ගෙන සිටීමට අපට හැකි වී තිබෙන්නේ බොහෝ සාධක නිසා ය. අභ්‍යන්තර වශයෙන් මේ සාධකයෝ කොමියුනිස්ට් පක්ෂයේ සිට කුඕමින්තාං පක්ෂය තෙක් රටේ තිබෙන සියලු දේශපාලන පක්ෂ වලින් ද, කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ සිට ධනේශ්වරපංක්තිය තෙක් සියලු ජනතාව ගෙන් ද, නිත්‍ය බලසේනාවන්ගේ සිට ගොරිල්ලාභටයන් තෙක් සියලු සන්නද්ධ බලවේගයන් ගෙන් ද සමන්විත වෙති; ජාත්‍යන්තර වශයෙන්, මේ සාධකයෝ සමාජවාදයේ දේශයේ සිට සියලු රටවල් වල යුක්තිකාමී මිනිසුන් තෙක් පැතිරී සිටිති; සතුරාගේ කඳවුර තුළ, ඔව්හු ජපානයේ සිටින යුද්ධයට විරුද්ධ මිනිසුන්ගේ සිට පෙරමුණේ සිටින යුද්ධයට විරුද්ධ ජපන් සෙබළුන් තෙක් පැතිරී සිටිති. කොටින්, මේ සියලු බලවේගයෝ අපේ විරුද්දකම් පෑමේ යුද්ධයට නොයෙක් ප්‍රමාණයෙන් සේවයක් ඉටු කර ඇත. හෘදය-සාක්ෂියක් ඇති හැම මිනිසා ම ඔවුන්ට ආචාර කළ යුතු ය. කොමියුනිස්ට්-වාදීන් වන අපට, සෙසු සියලු ජපන්-විරෝධී දේශපාලන පක්ෂ ත් මුළු ජනතාව ත් සමග එක් ව, භීෂණ ජපන් ආක්‍රමණිකයන් පරාජය කරනු පිණිස සියලු බලවේගයන් එක්සත් කිරීමට වෙර දැරීම විනා වෙන මගක් ගන්ට නැත. මේ අවුරුද්දේ ජූලි 1වැනි ද චීන කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කිරීමේ 17වැනි සංවත්සරය වේ. විරුද්දකම් පෑමේ යුද්ධයේදී වඩා හොඳ සහ වඩා ශ්‍රේෂ්ඨ කොටසක් රඟපෑමට හැම කොමියුනිස්ට්වාදියකුට ම හැකි වනු පිණිස දිග්ගැසුණු යුද්ධය ගැන බැරෑරුම් අධ්‍යයනයක් කිරීම අවශ්‍ය ය. එහෙයින් මගේ දේශන එබඳු අධ්‍යයනයකට කැප වනු ඇත. මම දිග්ගැසුණු යුද්ධයට අදාළ සියලු ගැටළු ගැන කතා කරන්ට උත්සාහ කරමි; එහෙත් එක් දේශන මාලාවකදී හැම දේට ම බහින්ට මට පුළුවන්-කමක් නැත.

2. දස මසක යුද්ධයේ සියලු අත්දැකීම් චීනයේ අනිවාර්ය පරා-ධීනත්වය පිළිබඳ න්‍යායය ත් චීනය ඉක්මනින් ම ජය ලැබීම පිළිබඳ න්‍යායය ත් යන දෙකේ ම වරද ඔප්පු කරයි. මුලින් කී එක සමගිසම්මුතියකට එළඹීමට බර වෙන ගතිය හටගන්වයි, පසුව කී එක සතුරා අඩුවෙන් තක්සේරු කිරීමට බර වෙන ගතිය හටගන්වයි. ගැටළු වෙත යොමු වන මේ විධි දෙක ම මනෝමූල ය, එක පැත්තකට සීමා වී ඇත; නැතහොත්, කොටින් ම, අවිද්‍යාත්මක ය.

3. විරුද්දකම් පෑමේ යුද්ධයට කලින්, ජාතික පරාධීනත්වය ගැන කළ කතා හුඟක් ම තිබුණි. "චීනය ආයුධ අතින් පහත් ය, යුද්ධයකදී පරදිනවා නියත ය," යි සමහරු කීහ. "චීනය සන්නද්ධ විරුද්දකම් පෑමක් කළ හොත්, ඇ තවත් ඇබිසීනියාවක් වෙනවා සිකුරු ය," යි අන් සමහරු කීහ. යුද්ධය පටන් ගත් ද සිට, ජාතික පරාධීනත්වය ගැන එළිපිට කරන කතා අතුරුදන් වී ඇත; එහෙත් රහසේ කරන කතා, ඒවා හුඟක් ම පවා, තවම පවති. නිදසුන් වශයෙන්, කලින් කල සමගිසම්මුතියක් පිළිබඳ වාතා-වරණයක් පැනනඟී; සමගිසම්මුතිය වෙනුවෙන් කතාකරන්නෝ "යුද්ධය දිගට ම කරගෙන යාමේ අනිවාර්ය තේරුම වන්නේ පරාධීන වීම ය,"[2] යි තර්ක කරති. හුනාන් පළාතෙන් ලැබුණු ලියුමක ශිෂ්‍යයකු මෙසේ ලියා ඇත:

> ගම්බද ව හැම දෙයක් ම දුෂ්කර සේ පෙනෙයි. මගේ ම කැමැත්-තෙන් ප්‍රචාරක වැඩ කරන මට, මිනිසුන් හමුවන විට සහ හමුවන තැනදී ඔවුන්ට කතා කරන්ට සිදු වී ඇත. මා කතා කර තිබෙන මිනිස්සු කිසි ම ලෙසකින් පල් මෝඩයෝ නො වෙත්; ඒ සියලු දෙනා ම සිදු වෙිගෙන යන දේ ගැන කිසියම් අවබෝධයක් ඇත්තෝ ය, මට කියන්ට තිබෙන දේ ගැන මහත් උනන්දුවක් දක්වන්නෝ ය. එහෙත් මා මගේ ම නෑයන් අතරට ගිය කල, ඔව්හු සැම විට ම මෙසේ කියති: "චීනයට දිනන්ට බැරි ය, චීනයේ ඉරණම තීන්දු වී ඇත." ඔව්හු අයකු කල-කිරවති! වාසනාවකට මෙන් ඔව්හු තම මත පතුරුවමින් ඇවිදින්නේ නැත; නො එසේ නම් කරුණු ඇත්තට ම නරක් වෙනවා ඇත. ගොවියෝ ස්වභාවයෙන් ම ඔවුන් කියන දේ වැඩියෙන් අගය කොට සලකනවා ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

චීනයේ අනිවාර්ය පරාධීනත්වය පිළිබඳ න්‍යායය අටුවා කර දක්වන එබඳු පුද්ගලයෝ සමගිසම්මුතියක් ඇති කර ගැනීම දෙසට බර වෙන ගතියේ සමාජ පදනම සකස් කරති. ඔව්හු චීනයේ හැම තැන ම දක්නට ලැබෙත්; එහෙයින් සමගිසම්මුතියක් පිළිබඳ ගැටළුව කොයි වේලාවේ හෝ ජපන්-විරෝධී පෙරමුණ තුළ මතු වෙන්ට ඉඩ තිබේ; එය බාගවිට යුද්ධයේ අවසානය තෙක් ම අප අතර ඉතිරි වී පවතිනවා ඇත. දැන් හ්සූචව් නුවර වැටී ඇති හෙයින් සහ වූහාන් නුවර අනතුරට ලක් වී තිබෙන හෙයින්, ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායයෙන් පල්ල බිඳ දැමීම නිෂ්ඵල නො වේ ය'යි මම සිතමි.

4. යුද්ධය කරගෙන ගිය මේ දස මස තුළ ඉක්මන්කාරකම පෙන්නුම් කරන නොයෙක් වර්ගයේ මත ද පහළ වී ඇත. නිදසුන් වශයෙන්, යුද්ධය පටන්ගන්නා විට ම බොහෝ දෙනා, ජපානය අඩුවෙන් තක්සේරු කරමින්, ජපනුන්ට ශාන්සි පළාත දක්වා වත් ළඟා වෙන්ට බැරි වේ ය'යි විශ්වාස කරමින් පවා, හේතු විරහිත ලෙස ශුභවාදි වූහ. සමහරු විරුද්දකම් පෑමේ යුද්ධයේදී ගොරිල්ලා සංග්‍රාමය සතු උපායමාර්ගික කොටස සුළු කොට සලකමින්, ''මුළු එක සම්බන්ධයෙන්, ජංගම සංග්‍රාමය ප්‍රාථමික ය, ගොරිල්ලා සංග්‍රාමය අතිරේක ය; කොටස් සම්බන්ධයෙන්, ගොරිල්ලා සංග්‍රාමය ප්‍රාථමික ය, ජංගම සංග්‍රාමය අතිරේක ය'' යන උක්තිය සැක කළහ, ඔව්හු, ''යාන්ත්‍රික'' ලෙස යොමු වන පිළිවෙලක් ය'යි ඔවුන් විසින් සලකනලද, ''ගොරිල්ලා සංග්‍රාමය මූලික ය, එහෙත් හිතකර තත්වයන් යටතේ ජංගම සංග්‍රාමය පිණිස ලැබෙන ඉඩප්‍රස්තා අත නාරින්න'' යන අටවැනි මාර්ග හමුදාවේ උපායමාර්ගයට එකඟ නුවූහ.[3] ශැංහයි නුවර සටන පැවති කාලයේ සමහර අය මෙසේ කීහ: ''අපට තුන් මාසයක් සටන් කරගෙන යන්ට පුළුවන් නම්, ජාත්‍යන්තර තත්වය වෙනස් වෙනවා නියත ය, සෝවියට් සංගමය හටකණ්ඩායම් එවනවා නියත ය, එතකොට යුද්ධය ඉවර යි.'' ඔව්හු විරුද්දකම් පෑමේ යුද්ධයේ අනාගතය ගැන තම බලාපොරොත්තු ප්‍රධාන වශයෙන් විදේශ ආධාර මත රැඳවූහ.[4] තායිඅර්චුආං ජයග්‍රහණයට[5] පසු, හ්සූචව් යුද්ධව්‍යාපාරය ''තීරණාත්මක ස්වරූපයේ යුද්ධව්‍යාපාරයක්'' වශයෙන් කරගෙන යා යුතු ය'යි ද, දිග්ගැසුණු යුද්ධයක් පිළිබඳ ප්‍රතිපත්තිය වෙනස් කළ යුතු ය'යි ද ඇතැම් අය කියා සිටියහ. ''මේ යුද්ධව්‍යාපාරය සතුරාගේ අවසාන වියරු අරගලය සලකුණු කරයි''; නැතහොත් ''අප දිනුවොත්, ජපන් යුදදෙටුවෝ චිත්තශක්තියෙන් පිරිහෙනවා ඇත, ඔවුන්ට හැකි වන්නේ දේව විනිශ්චය දිනය එන තුරු බලා සිටීම පමණකි'' වැනි දේ ඔව්හු කීහ.[6] පිංශිංකුආන්හිදී ලැබූ ජයග්‍රහණය ඇතැම් අයගේ ඔළු නරක් කළේ ය, තායිඅර්චුආංහිදී තවදුරටත් ලැබූ ජයග්‍රහණය තවත් මිනිසුන්ගේ ඔළු නරක් කළේ ය. සතුරා වූහාන් නගරයට පහර දේවි ද'යි සැක පහළ වී තිබේ. ''නො දෙන්ට පුළුවනි,''යි බොහෝ අය සිතති; ''නිශ්චය වශයෙන් ම

දෙන්නේ නැතැ,''යි තවත් බොහෝ අය සිතති. එබඳු සැක සියලු මුඛ්‍ය ප්‍රශ්න කෙරෙහි බලපාන්ට ඉඩ තිබේ. නිදසුන් වශයෙන්, අපේ ජපන්-විරෝධී ශක්තිය දැනට ම ප්‍රමාණවත් ද? සමහර අය අපේ වර්තමාන ශක්තිය සතුරාගේ ඉදිරිගමන ඇණහිටවන්ට දැනට ම ප්‍රමාණවත් නිසා, ඔව් ය'යි පිළිතුරු දෙන්ට ඉඩ තිබේ; එහෙයින් එය කුමට වැඩි කරන්ට ද? නැතහොත්, නිදසුන් වශයෙන්, ''ජපන්-විරෝධී ජාතික එක්සත් පෙරමුණ තහවුරු කොට පළල් කරන්න'' යන සටන්පාඨය තවම නිවැරදි ද? සමහර අය, එක්සත් පෙරමුණ එහි වර්තමාන තත්වයෙන් සතුරා පළවා හරින්ට උවමනා තරම් දැනට ම ප්‍රබල නිසා, නැතැ'යි පිළිතුරු දෙන්ට ඉඩ තිබේ; එහෙයින් එය කුමට තහවුරු කොට පළල් කරන්ට ද? නැතහොත් නිදසුන් වශයෙන්, රාජ්‍යදූතතන්ත්‍රයෙහි සහ ජාත්‍යන්තර ප්‍රචාරයෙහි ලා අපේ පරිශ්‍රම දැඩි කළ යුතු ද? මෙහිදී යළිත් පිළිතුර නැතැ'යි වීමට ඉඩ තිබේ. නැතහොත්, නිදසුන් වශයෙන්, අපි හමුද ක්‍රමය සහ ආණ්ඩු ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට, බහුජන ව්‍යාපාරය වර්ධනය කිරීමට, ජාතික ආරක්ෂණය පිණිස අධ්‍යාපනය ක්‍රියාවේ යෙදීමට, ද්‍රෝහීන් සහ ට්‍රොට්ස්කිවාදීන් මර්දනය කිරීමට, යුද්ධ කර්මාන්ත වර්ධනය කිරීමට සහ ජනතාවගේ දිවිපෙවෙත දියුණු කිරීමට ඕනෑකමින් ක්‍රියා කරගෙන යා යුතු ද? නැතහොත්, නිදසුන් වශයෙන්, වූහාන් නගරය, කැන්ටන් නගරය සහ වයඹදිග පෙදෙස ආරක්ෂා කරන ලෙස ත් සතුරාගේ පසුමුණෙහි ගොරිල්ලා සංග්‍රාමය වේගබලසම්පන්න ලෙස වර්ධනය කරන ලෙස ත් ඉල්ලා සිටින සටන්පාඨ තවම නිවැරදි ද? පිළිතුරු සියල්ල ම නැතැ'යි කියා වෙන්ට ඉඩ තිබේ. යුද්ධ තත්වය යන්තම් හිතකර අතට හැරුණු මොහොතෙහි ම, අවධානය බාහිර කරුණු වලින් අභ්‍යන්තර කරුණු වලට යොමු කරමින්, කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් අතර ''ඝට්ටණය'' දැඩි කිරීමට පවා සූදනම් ව සිටින සමහර අය සිටිති. සංසන්දනාත්මක වශයෙන් ලොකු සටන් දිනාගත් හෝ සතුරාගේ ඉදිරිගමන තාවකාලික වශයෙන් නතර වීමකට පත් වන හෝ හැම විට ම මෙය එක්වැනි ව ම පාහේ සිදු වේ. ඉහතින් සඳහන් කළ සියල්ල දේශපාලන සහ යුද්ධමය කෙටි-කල්පනාව ය'යි නම් කළ හැකි ය. කොතරම් පිළිගත හැකි සේ පෙනෙතත්, එබඳු කතා ව්‍යාජ කතා ය, ප්‍රතිෂ්ඨා විරහිත කතා ය. එබඳු ප්‍රලාප අහකට අතුගා දැමීම විරුද්දකම් පෑමේ යුද්ධය ජයග්‍රාහී ලෙස කරගෙන යාමට උදව්වක් විය යුතු ය.

5. දැන් තිබෙන ප්‍රශ්නය මෙය යි: චීනය යටත් කරනු ලබයි ද? පිළිතුර, නැත, ඈ යටත් කරනු ලබන්නේ නැත, අවසාන ජයග්‍රහණය දිනා ගන්නවා ඇත යනු යි. චීනයට ඉක්මනින් දිනන්ට පුළුවන් ද? පිළිතුර, නැත, ඈට ඉක්මනින් දිනන්ට බැරි ය, විරුද්දකම් පෑමේ යුද්ධය දිග්ගැසුණු යුද්ධයක් වෙනවා ඇත යනු යි.

6. අවුරුදු දෙකක් පමණ උඩදී ම, අපි මේ ප්‍රශ්න උඩ ප්‍රධාන තර්ක සූළල් ලෙස දැක්වීමු. සියාන් සිද්ධියට[7] පස් මසකට කලින් ද, ලූගොළචියාඕ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සිද්ධියට දෙළොස් මසකට කලින් ද, 1936 ජූලි 16වැනි ද, ඇමරිකන් වාර්තාකරුවකු වූ එඩ්ගාර් ස්නෝ මහතා සමග කළ සම්මුඛසාකච්ඡාවකදී, මම චීනය ත් ජපානය ත් අතර පවතින යුද්ධය සම්බන්ධයෙන් තත්වය ගැන සාමාන්‍ය තක්සේරුවක් කළෙමි, ජය දිනා ගනු පිණිස විවිධ මූලධර්ම ඉදිරිපත් කළෙමි. මතු දක්වන උපුටා ගත් කොටස් මතකය අළුත් කරන දෙයක් වශයෙන් ප්‍රයෝජනවත් වෙනවා ඇත:

ප්‍රශ්නය: කවර තත්වයන් යටතේ ජපානයේ බලසේනා පරාජය කොට විනාශ කරන්ට චීනයට හැකි වේ ය'යි සිතන්නෙහි ද?

පිළිතුර: තත්ව තුනක් අවශ්‍ය ය: පළමුවැනි ව චීනයෙහි ජපන්–විරෝධී එක්සත් පෙරමුණක් පිහිටුවීම; දෙවැනි ව, ජාත්‍යන්තර ජපන්–විරෝධී එක්සත් පෙරමුණක් සකස් කිරීම; තුන්වැනි ව, ජපානයෙහි ත් ජපන් විජිත වල ත් ජනතාවගේ විප්ලවවාදී ව්‍යාපාරය නැඟීම. චීන ජනතාවගේ මතයේ සිට බලන කල, චීනයේ ජනතාවගේ සමඟිය මේ තත්ව තුනෙන් ඉතා ම වැදගත් එක ය.

ප්‍රශ්නය: එබඳු යුද්ධයක් කොපමණ කල් පවතී ද'යි ඔබ සිතන්නෙහි ද?

පිළිතුර: එය චීනයේ ජපන්–විරෝධී එක්සත් පෙරමුණේ ශක්තිය ත් චීනය සහ ජපානය සම්බන්ධ කර ගන්නා වූ වෙනත් බොහෝ හේතු එල හටගන්වන සාධක ත් මත රඳා පවතී. ඒ කියන්නේ මෙය යි: ප්‍රධාන දෙය වන චීනයේ ම ශක්තිය හැරුණු කල, චීනයට ලැබෙන ජාත්‍යන්තර ආධාරය ත් ජපානයෙහි විප්ලවයෙන් දෙන ආධාරය ත් වැදගත් ය. චීනයේ ජපන්–විරෝධී එක්සත් පෙරමුණ බෙහෙවින් පුළුල් කරනු ලැබේ නම් සහ දිගින් පළලින් උසින් මහතින් සාර්ථක ලෙස සංවිධානය කරනු ලැබේ නම් ද, තමන්ගේ ම පලප්‍රයෝජන වලට ඇති ජපන් අධිරාජ්‍යවාදී තර්ජනය පිළිගන්නා ආණ්ඩු සහ ජනතාවන් විසින් චීනයට අවශ්‍ය ආධාර දෙනු ලැබේ නම් ද, ජපානයෙහි විප්ලවය ඉක්මනින් එන්නේ නම් ද, යුද්ධය සීඝ්‍රයෙන් අවසානයකට ගෙනෙනු ලබනවා ඇත, චීනය සීඝ්‍රයෙන් ජය දිනා ගන්නවා ඇත. මේ තත්වයෝ ඉක්මනින් මුදුන්පත් නො වෙත් නම්, යුද්ධය දිග්ගැසෙනවා ඇත. එහෙත් ඒ එසේ වුවත්, අන්තිමේදී, ජපානය සත්තකින් ම පරාජය කරනු ලබනවා ඇත, චීනය සත්තකින් ම ජයග්‍රාහී වෙනවා ඇත. පරිත්‍යාගයන් මහත් වෙනවා පමණකි, ඉතා වේදනාදායක කාලපරිච්ඡේදයක් ඇති වෙනවා ඇත.

ප්‍රශ්නය: එබඳු යුද්ධයක් දේශපාලන වශයෙන් සහ යුද්ධමය වශයෙන් වර්ධනය වීමට පුළුවන් මග ගැන ඔබගේ අදහස කුමක් ද?

පිළිතුරු: ජපානයේ මහාවීපික ප්‍රතිපත්තිය දැනට ම නියම කරගෙන ඉවර ය; චීනයේ භූමිප්‍රදේශ සහ ස්වාධිපති අයිතිවාසිකම් තව තව ත් බිල්ලට දී ජපානය සමග සමගිසම්මුති වලට එළඹීමෙන් ජපානය ඉදිරියට යන ගමන නතර කළ හැකි වේ ය'යි සිතන අය කරන්නේ හුදු විචිත්‍ර කල්පනා වල නිරත වීම පමණකි. පහළ යැංසී මිටියාවත සහ අපේ දකුණු මුහුදු වරායවල් ජපන් අධිරාජ්‍යවාදයේ මහාද්වීපික වැඩසටහනට දැනට ම ඇතුළත් කර තිබෙන බව අපි නිශ්චය වශයෙන් ම දනිමු. එමතු නො ව, සෙසු රටවල් චීනයෙන් කපා දමා, නිරිතදිග පැසිපික් ප්‍රදේශය ඒකාධිකාරයක් කර ගනු වස්, පිලිප්පීන් දූපත්, සියම, ඉන්දු–චීනය, මලයා අර්ධ–ද්වීපය සහ ඕලන්ද නැගෙනහිර ඉන්දියා කොදෙව් අල්ලාගන්ට ජපානයට උවමනා ය. ජපානයේ මූදුකර ප්‍රතිපත්තිය මෙය යි. එබඳු වකවනුවකදී, චීනය නිසැකයෙන් ම අතිශයින් ම දුෂ්කර තත්වයකට පත් වෙනවා ඇත. එහෙත් එබඳු දුෂ්කරතා ජය ගත හැකි බව චීන ජනතාව අතර වැඩි පිරිස විශ්වාස කරති; පරාජයවාදියෝ ලොකු වරාය නගර වල සිටින ධනවත් අය පමණකි; ඒ තමන්ගේ දේපොළ නැති වේ ය'යි ඔවුන් බිය වන නිසා ය. ජපානය විසින් චීනයේ මුහුදුකරය අවහිර කළ විට, යුද්ධය දිගට ගෙනයන්ට චීනයට කොහෙත් ම බැරි වේ ය'යි බොහෝ දෙනා සිතති. මෙය නන්දෙඩවිල්ලකි. ඔවුන් නිශ්ප්‍රභ කරනු පිණිස අප විසින් කළ යුත්තේ රතු හමුදාවේ යුද්ධ ඉතිහාසය ගෙනහැර පෑම පමණකි. ජපානයට විරුද්දකම් පාන වර්තමාන යුද්ධයේදී, චීනයේ තත්වය සිවිල් යුද්ධයේදී රතු හමුදාව සිටි තත්වයට වඩා බෙහෙවින් උසස් ය. චීනය සුවිසාල රටකි; චීනයෙන් මිනිසුන් 10 කෝටියක් 20 කෝටියක් තරම් සිටින කොටසක් අල්ලා ගැනීමට ජපානය සමත් වුණත්, එවිට පවා අප පැරදුණා ය'යි කොහෙත් ම කියන්ට බැරි ය. එවිට පවා ජපානයට විරුද්ධ ව සටන් කිරීමට අපට ඕනෑ තරම් ශක්තිය තිබෙනවා ඇත; ඒ අතර යුද්ධය පවතින තාක් තම පසුමුණෙහි ආරක්ෂාවීමේ සටන් කිරීමට ජපානයට සිදු වෙනවා ඇත. චීනයේ ආර්ථිකයේ විවිධාකාරත්වය ත් අසම වර්ධනය ත් විරුද්දකම් පෑමේ යුද්ධයේදී වාසිදායක ය. උදාහරණ වශයෙන්, ශැංහයි නගරය චීනයේ අනික් හරියෙන් වෙන් කිරීම, නිශ්චිත වශයෙන් ම, නිව් යෝක් නගරය එක්සත් ජනපදයේ අනික් හරියෙන් වෙන් කිරීම එක්සත් ජනපදයට විපතක් වන තරම් ම, චීනයට විපතක් නො වේ. ජපානය චීනයේ මූදුකරය අවහිර කළත්, චීනයේ වයඹදිග, නිරිතදිග සහ බටහිර අවහිර කරන්ට ඇට කොහෙත් ම බැරි ය. මෙසේ, යළි ත් වරක් ගැටළුවේ කේන්ද්‍රීය කරුණ වනුයේ සමස්ත චීන ජනතාවගේ සමගිය සහ දේශ–ව්‍යාප්ත ජපන්–විරෝධී පෙරමුණක් ගොඩනැඟීම ය. අප බොහෝ කලක සිට කියාගෙන එන්නේ මෙය ම යි.

LIBERATION BASE

https://liberationbase.wordpress.com

ප්‍රශ්නය: යුද්ධය බොහෝ කලක් ඇදී ඇදී යතොත් සහ ජපානය සම්පූර්ණයෙන් පරාජය නො කරනු ලැබුවොත්, ජපානය සමග සාමයක් ගැන සාකච්ඡා පවත්වන්ට ත් ඊසානදිග චීනයෙහි ඇගේ පාලනය පිළිගන්ට ත් කොමියුනිස්ට් පක්ෂය එකඟ වෙනවා ද?

පිළිතුර: නැත. මුළු රටේ ජනතාව මෙන් ම, චීන කොමියුනිස්ට් පක්ෂය චීන භූමිප්‍රදේශයෙන් එක අඟලක් වත් තබා ගන්ට ජපානයට ඉඩ දෙන්නේ නැත.

ප්‍රශ්නය: ඔබගේ අදහස අනුව, මේ විමුක්ති යුද්ධයේදී අනුගමනය කළ යුතු ප්‍රධාන උපායමාර්ගය සහ උපක්‍රම මොනවා ද?

පිළිතුර: අපේ උපායමාර්ගය විය යුත්තේ ව්‍යාප්ත සහ අනිස්ථිර පෙරමුණක ක්‍රියා කරගෙන යාමට අපේ ප්‍රධාන බලසේනාවන් යෙදීම යි. සාර්ථකභාවය අත්පත් කරගැනීමට, චීන භටකණ්ඩායම්, සීඝ්‍රයෙන් ඉදිරියට යමින් සහ ඉවත් වී යමින් ද, සීඝ්‍රයෙන් ඒකරාශි වෙමින් සහ විසිරී යමින් ද, පැතුරුණු යුදබිම් වල උසස් ප්‍රමාණයක ජංගමභාවයෙන් යුතු ව තම සංග්‍රාමය කරගෙන යා යුතු ය. මෙහි තේරුම විශාල පරිමාණයේ ජංගම සංග්‍රාමය යි; ගැඹුරු අගල්, උස බලකොටු සහ පෙළින් පෙළට තැනූ ආරක්ෂාවීමේ ස්ථාන සහිත ආරක්ෂණ කටයුතු මත තනිකර ම රඳා පවතින ස්ථානගත සංග්‍රාමය නො වේ. ප්‍රයෝජනවත් ව පවතින තාක් කල් ස්ථානගත සංග්‍රාමයෙන් ආරක්ෂා කළ යුතු යුද කටයුතු අතින් ඉතා ම වැදගත් තැන් අතහැර දැමීම එයින් අදහස් නො වේ. එහෙත් කඩඇණය වැනි උපායමාර්ගය විය යුත්තේ ජංගම සංග්‍රාමය යි. ස්ථානගත සංග්‍රාමය ද අවශ්‍ය ය, එහෙත් උපායමාර්ගය වශයෙන් එය උපකාරක සහ ද්විතියක වේ. භූගෝලවිද්‍යාත්මක වශයෙන් යුද්ධය පවතින භූමිභාගය ඉතා විශාල හෙයින්, ජංගම සංග්‍රාමය ඉතා ම ඵලදායක ලෙස කරගෙන යන්ට අපට පුළුවනි. අපේ බලසේනාවන්ගේ වේගබල සම්පන්න ක්‍රියාවන් ඉදිරියෙහි පරෙස්සම් වීමට ජපන් හමුදාවට සිදු වෙනවා ඇත. එහි යුද්ධ–යන්ත්‍රය ස්ථූල ය, යන්නේ හෙමින් ය, ඊට ඇත්තේ සීමා සහිත කාර්යක්ෂමතාවකි. වැහැරීම පිළිබඳ ආරක්ෂාවීමේ යුද්ධයක් පිණිස අප අපේ බලසේනාවන් පටු පෙරමුණක ඒකරාශි කරතොත්, අප කරන්නේ අපේ භූගෝලවිද්‍යාවේ සහ ආර්ථික සංවිධානයේ වාසි ඉවත විසි කර දැමීම ත් ඇබිසීනියාව කළ වරද ම කිරීම ත් වෙනවා ඇත. යුද්ධයේ මුල් වකවානුව තුළ අපි තීරණාත්මක සටන් කිසිවක් නො කර මග හැරිය යුත්තෙමු, සතුරු භටකණ්ඩායම් වල චිත්තශක්තිය ත් සටන් ක්ෂමතාව ත් අනුක්‍රමයෙන් බිඳිනු පිණිස පළමුකොට ජංගම සංග්‍රාමය යෙදිය යුත්තෙමු.

ජංගම සංග්‍රාමය කරගෙන යාමට පුහුණු හමුදාවන් යෙදීම හැරුණු කල, අපි ගොවියන් අතර ගොරිල්ලා සේනාංග මහත් ගණනින්

සංවිධාන කළ යුත්තෙමු. ඊසානදිග පළාත් තුනේ සිටින ජපන්–විරෝධී ස්වේච්ඡා සේනාංග තුන, මුළු රටේ ම ගොවියන් අතුරෙන් උනන්දු කොට ක්‍රියාවට යෙදිය හැකි දැනට අක්‍රියාකාරී ව පවතින විරුද්ධකම් පෑමේ බලය සුළු වශයෙන් ප්‍රදර්ශනය කිරීමක් බව අයෙක් දත යුතු ය. චීන ගොවියන් තුළ සැඟවී අක්‍රියාකාරී ව පවතින ඉතා විශාල බලයක් ඇත; නිසි ලෙස සංවිධානය කොට මග පෙන්වතොත්, ජපන් හමුදාව පැය විසිහතර ම කාර්යබහුල ව තබන්ට ත් ඊට මැරෙන තරම් කරදර කරන්ට ත් ඔවුන්ට හැකි ය. යුද්ධය කරන්නේ චීනයෙහි බව මතක තබා ගත යුතු ය; ඒ කියන්නේ මෙය යි; ජපන් හමුදාව පසමිතුරු චීන ජනතාව විසින් මුළුමනින් ම වට කරනු ලබනවා ඇත, තම කෑම බීම සියල්ල ම පිටින් ගෙනවුත් රැක ගන්නට ඒ හමුදාවට බලෙන් ම සිදු වෙනවා ඇත; එය තම ගමනාගමන සහ පණිවිඩ හුවමාරු මාර්ග සුරක්ෂිත කිරීමට භටකණ්ඩායම් මහත් සංඛ්‍යාවක් යෙදිය යුතු ය, නිරතුරු ව ම ප්‍රහාරයන් ගැන පරෙස්සමෙන් සිටිය යුතු ය. එසේ ම මැන්චූරියාව සහ ජපානය ගැරිසන් කරනු පිණිස විසාල බලසේනා ඊට උවමනා ය.

යුද්ධය කරගෙන යන අතර, බොහෝ ජපන් සෙබළුන් අල්ලාගැනීමට ත්, තමා සන්නද්ධ කර ගැනීම පිණිස බොහෝ ආයුධ සහ වෙඩිබෙහෙත් උපකරණ අල්ලා ගැනීමට ත් චීනයට හැකි වෙනවා ඇත; ඒ අතර ම චීනය තමාගේ භටකණ්ඩායම් සජ්ජිත කිරීම අනුක්‍රමයෙන් තර කරනු පිණිස විදේශ ආධාර දිනා ගන්නවා ඇත. එහෙයින් යුද්ධයේ පසු වකවානුවේදී ස්ථානගත සංග්‍රාමය කරගෙන යාමට ත් ජපනුන් අල්ලාගත් ප්‍රදේශ වලට ස්ථානගත ප්‍රහාරයන් දීමට ත් චීනයට හැකි වෙනවා ඇත. එසේ චීනයේ දීර්ඝ විරුද්ධකම් පෑම නිසා ඇති වන අධික පීඩාව යටතේ ජපානයේ ආර්ථිකය ඉරිතලනවා ඇත, ගණන් නැති සටන් වල අධික දුක යටතේ ජපන් බලසේනාවන්ගේ චිත්තශක්තිය බිඳෙනවා ඇත. ඒ එසේ වුව ද, චීන ජනයාගේ පැත්තෙහි, වැඩෙන විරුද්ධකම් පෑමේ සැඟවුණු බලය නිරතුරු ව ම ක්‍රියාකාරිත්වයට පත් කරනු ලබනවා ඇත, විප්ලවවාදී මිනිස්සු මහත් ගණනින් තම නිදහස පිණිස සටන් කිරීමට පෙරමුණු පේළි වලට ගලා එනවා ඇත. මේ සියලු සාධක ත් සෙසු සාධක ත් එකතු වූ කල, ජපනුන් අල්ලාගෙන සිටින ප්‍රදේශ වල බලකොටු වලට සහ කඳවුරු වලට අන්තිම සහ තීරණාත්මක ප්‍රහාරයන් දී, ජපන් ආක්‍රමණයේ බලසේනාවන් චීනයෙන් පන්නා දමන්ට අපට හැකි වෙනවා ඇත.

ඉහත සඳහන් මත දස මසක යුද්ධයේ අත්දැකීම අනුව නිවැරදි බව ඔප්පු වී ඇත, අනාගතයේදී ද සනාථ වෙනවා ඇත.

7. ලූගොඋචියාඕ සිද්ධියට දෙ මසකට ත් අඩු කලකට පසු, 1937, **අගෝස්තු 25** තරම් උඩදී, චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

''වර්තමාන තත්වය සහ පක්ෂය සතු කර්තව්‍යයන් ගැන යෝජනාව'' නමැති තම යෝජනාවෙහි පැහැදිලි ලෙස මෙසේ පෙන්වා දුන්නේ ය:

> ජපන් ආක්‍රමණිකයන් විසින් ලූගොඋවියාඕහිදී කළ යුද්ධමය කුපිත කිරීමෙන් ද, ඔවුන් විසින් පිපිං සහ තියන්සින් අල්ලා ගැනීමෙන් ද පෙන්නුම් කරන්නේ ඔවුන් මහා ප්‍රාකාරයට දකුණෙන් චීනය විශාල පරිමාණයකින් අතික්‍රමණය කිරීමේ ආරම්භය පමණකි. ඔවුන් දැනට ම යුද්ධය පිණිස ඔවුන්ගේ ජාතිය උනන්දු කිරීමට පටන් ගෙන ඇත. ''තත්වය උග්‍ර කිරීමේ අභිලාෂයක්'' ඔවුන්ට නැතැ'යි ඔවුන් කරන ප්‍රචාරය තවදුරට ත් පහර දීම පිණිස දමන දුම්පැලැල්ලක් පමණි.
>
> ජූලි 7වැනි ද ලූගොඋවියාඕහිදී කළ විරුද්දකම් පෑම චීනයේ විරුද්දකම් පෑමේ යුද්ධය පටන් ගත් තැන සලකුණු කළේ ය.
>
> මෙසේ චීනයේ දේශපාලන තත්වයෙහි නව අවස්ථාවක්, නියම විරුද්දකම් පෑම පිළිබඳ අවස්ථාව, ආරම්භ වී ඇත. විරුද්දකම් පෑමට සූදානම් වීමේ අවස්ථාව ඉවර ය. වර්තමාන අවස්ථාවෙහි කේන්ද්‍රීය කර්තව්‍යය වනුයේ විරුද්දකම් පෑමේ යුද්ධයේදී ජය ලබනු පිණිස ජාතියේ සියලු බලවේග උනන්දු කිරීම ය.
>
> යුද්ධයේදී ජය ලැබීමට යතුර දැන් තිබෙන්නේ දැනට ම පටන්ගෙන තිබෙන විරුද්දකම් පෑම මුළු ජාතිය විසින් කරන සම්පූර්ණ විරුද්දකම් පෑමේ යුද්ධයක් බවට වර්ධනය කිරීමෙහි ය. එබඳු සම්පූර්ණ විරුද්දකම් පෑමේ යුද්ධයක් මගින් පමණකි අවසාන ජයග්‍රහණය දිනා ගත හැකි වන්නේ.
>
> විරුද්දකම් පෑමේ යුද්ධයෙහි බරපතල දුබලකම් පැවතීම නිසා බොහෝ ඇබැද්දි, පසුබැසීම්, අභ්‍යන්තර භේද, ද්‍රෝහිකම්, තාවකාලික සහ අඩාල සමගිසම්මුති සහ එබඳු වෙනත් අකරතැබ්බ කරා මග පෑදෙන්ට ඉඩ තිබේ. එහෙයින් යුද්ධය දුෂ්කර සහ දිග්ගැසුණු යුද්ධයක් වන බව වටහාගත යුතු ය. එහෙත්, අපේ පක්ෂයේ සහ මුළු ජනතාවගේ පරිශ්‍රමයන් මගින්, දැනට ම පටන්ගෙන තිබෙන විරුද්දකම් පෑම සියලු බාධක පසෙකට පිස දමා, දිගට ම ඉදිරියට යමින් වර්ධනය වන බව අපට හොඳට ම විශ්වාස ය.

ඉහත සඳහන් තීසිසය ද නිවැරදි බව දස මසක යුද්ධයේ අත්දැකීම අනුව ඔප්පු වී ඇත, අනාගතයේදී ද සනාථ වෙනවා ඇත.

8. දැනුම පිළිබඳ න්‍යායයට අනු ව කතා කරන කල, යුද්ධය ගැන සියලු වැරදි මත වල මුල රැඳී තිබෙන්නේ මේ ප්‍රශ්නය උඩ විඥානවාදී අතට සහ යාන්ත්‍රිකවාදී අතට බර වෙන ගති වල ය. එබඳු බර වෙන ගති ඇති මිනිස්සු ගැටළු වෙත යොමු වන තම පිළිවෙලේදී මනෝමූල වෙති, එක පැත්තකට සීමා වෙති. ඔව්හු එක්කෝ ප්‍රතිෂ්ඨා විරහිත සහ හුදු කතා වල නිරත වෙති; නැතහොත්, එක ම එක අංගයක් හෝ තාවකාලික ව පෙනෙන දෙයක් තම පදනම කර ගනිමින්, එය එබඳු ම මනෝමූලභාවයෙන් යුතු ව මුළු ගැටළුව බවට විශාල කරති. එහෙත් වැරදි මත දෙ වර්ගයක් තිබේ; එක් වර්ගයක් නිවැරදි කරන්ට අමාරු මූලික, එහෙයින් ස්ථිර, වැරදි වලින් යුක්ත ය; අනික් වර්ගය නිවැරදි කරන්ට පහසු අහම්බෙන් ඇති වන, එහෙයින් තාවකාලික, වැරදි වලින් යුක්ත ය. දෙක ම වැරදි නිසා, දෙක ම නිවැරදි කිරීම අවශ්‍ය ය. එහෙයින් යුද්ධ ප්‍රශ්නය ගැන නිවැරදි නිගමනයන් ඇති කර ගැනීමට අපට හැකි වන්නේ යුද්ධය ගැන අධ්‍යයනයක් කිරීමේදී විඥානවාදී අතට සහ යාන්ත්‍රිකවාදී අතට බර වෙන ගති වලට විරුද්ධ වීමෙන් සහ විෂයමූල වූ ත් හැම පැත්ත ම සැලකිල්ලට ගන්නා වූ ත් මතයක් ගැනීමෙන් පමණකි.

ගැටළුවේ පදනම

9. ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය දිග්ගැසුණු යුද්ධයක් වන්නේ මන්ද? අවසාන ජයග්‍රහණය චීනය සතු වෙනවා ඇත්තේ මන්ද? මේ ප්‍රකාශයන්ට පදනම වන්නේ කුමක් ද?

චීනය සහ ජපානය අතර යුද්ධය නිකම් මොකක් හරි යුද්ධයක් නො වේ; එය නියතයෙන් ම නවසිය තිස්වැනි වර්ෂයන්හි අර්ධ–විජිත, අර්ධ-රදළ චීනය ත් අධිරාජ්‍යවාදී ජපානය ත් අතර කෙරෙන ජීවිතය ත් මරණය ත් පිළිබඳ යුද්ධයකි. මුළු ගැටළුවේ ම පදනම රැඳී තිබෙන්නේ මෙහි ය. යුද වැදී සිටින දෙ පාර්ශ්වයට බොහෝ විසදෘශ අංගලක්ෂණ ඇත; ඒවා මෙහි පහත එකින් එක වශයෙන් සලකා බලනු ලැබේ.

10. **ජපන් පැත්ත.** පළමුවැනි ව, ජපානය යුද්ධමය, ආර්ථික සහ දේශපාලන–සංවිධානාත්මක බලය අතින් පෙරදිග මුල් තැන ගන්නා වූ බලවත් අධිරාජ්‍යවාදී රටකි, ලෝකයේ ප්‍රධාන ම පෙළේ අධිරාජ්‍යවාදී රටවල් පහ හෝ හය අතුරෙන් එකකි. මේවා ජපානයේ ආක්‍රමණ යුද්ධයෙහි මූලික සාධක වේ. යුද්ධයේ අනිවාර්යතාව ත් චීනයට ඉක්මනින් ජය ලබන්ට කොහෙත් ම බැරි වීම ත් ජපානයේ අධිරාජ්‍යවාදී ක්‍රමය ද ඇගේ යුද්ධමය, ආර්ථික සහ දේශපාලන–සංවිධානාත්මක මහා බලය ද හේතු කොට ගෙන වේ. දෙවැනි ව, එසේ ද වුව, ජපානයේ සමාජ ආර්ථිකයේ අධිරාජ්‍යවාදී ලක්ෂණය ප්‍රතිගාමී හා ම්ලේච්ඡ යුද්ධයක් වන ඇගේ යුද්ධයේ අධිරාජ්‍යවාදී ලක්ෂණය නිශ්චය කරයි. නවසිය තිස්වැනි වර්ෂයන්හි, ජපන් අධිරාජ්‍ය-වාදයේ අභ්‍යන්තර සහ බාහිර ප්‍රතිවිරෝධයෝ පරිමාණයෙන් අතුල්‍ය වූ සාහසිකවාදී යුද්ධයකට බසින්ට පමණක් නො ව ඇගේ අවසාන ඇදවැටීම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කරා ළඟා වීමට ද ඈ පන්නා ඇත. සමාජ වර්ධනය පිළිබඳ අදහසින්, ජපානය තව දුරටත් දියුණු වන රටක් නො වේ; යුද්ධය ඇගේ පාලක පංක්ති විසින් සොයනු ලබන සෞභාග්‍යය කරා නො ව එහි අනික් පැත්ත, එනම් ජපන් අධිරාජ්‍යවාදයේ විනාශය, කරා මග පාදනවා ඇත. ජපානයේ යුද්ධයේ ප්‍රතිගාමී ස්වභාවය යන්නෙන් අප අදහස් කරන්නේ මෙය යි. ජපානයේ යුද්ධයේ සුවිශේෂ ම්ලේච්ඡභාවය හටගන්වන්නේ ජපන් අධිරාජ්‍යවාදයේ යුද්ධමය-රදළ ලක්ෂණය හා එක් වූ මේ ප්‍රතිගාමී ගුණය යි. මේ සියල්ල ජපානය තුළ පංක්ති ප්‍රතිඝට්ටණ, ජපන් සහ චීන ජාතීන් අතර ප්‍රතිඝට්ටණය සහ, ජපානය සහ ලෝකයේ සෙසු රටවල් බොහෝවක් අතර ප්‍රතිඝට්ටණය උපරිම තත්වයට අවුස්සනවා ඇත. ජපානයේ යුද්ධයේ ප්‍රතිගාමී සහ ම්ලේච්ඡ ලක්ෂණය ඇගේ අනිවාර්ය පරාජය පිණිස ප්‍රාථමික හේතුව වේ. තුන්වැනි ව, ජපානයේ යුද්ධය කරගෙන යන්නේ ඇගේ යුද්ධමය, ආර්ථික සහ දේශපාලන-සංවිධානාත්මක මහා බලයේ පදනම මත ය; එහෙත් ඒ අතර ම එය රැඳී තිබෙන්නේ ප්‍රමාණවත් නො වන ස්වාභාවික සම්පත් උරුමයක් උඩ ය. ජපානයේ යුද්ධමය, ආර්ථික සහ දේශපාලන-සංවිධා-නාත්මක බලය මහත් ය, එහෙත් ප්‍රමාණාත්මක වශයෙන් නො සෑහේ. ජපානය, මිනිස්බලයෙන් ද යුද්ධමය, මුදල් සහ ද්‍රව්‍යමය වත්කම් අතින් ද හිඟපාඩුකම් ඇති, තුලනාත්මක වශයෙන් කුඩා රටකි; දීර්ඝ යුද්ධයක් උහුලන්ට ඈට බැරි ය. ජපානයේ පාලකයෝ මේ දුෂ්කරතාව යුද්ධය තුළින් විසඳීමට මහන්සි ගනිති; එහෙත් යළි ත් ඔවුන්ට ලැබෙනවා ඇත්තේ ඔවුන් පතන දේට හාත්පසින් ම වෙනස් දේ ය; ඒ කියන්නේ මෙය යි: මේ දුෂ්කර-තාව විසඳීමට ඔවුන් දියත් කර තිබෙන යුද්ධය අන්තිමේදී ඒ දුෂ්කරතාව උග්‍ර කොට, ජපානයේ මුල් වත්කම් පවා ක්ෂය කරනවා ඇත. සිව්වැනි ව සහ අවසාන වශයෙන්, පැසිස්ට් රටවල් වලින් ජාත්‍යන්තර අනුබලය ලබා ගන්ට ජපානයට හැකි වෙනවා ඇති නමුත්, ඈට නියතයෙන් ම මූණ පාන්ට සිදු වන ජාත්‍යන්තර විරෝධය ඈට ලැබෙන ජාත්‍යන්තර අනුබලයට වඩා ලොකු වෙනවා ඇත. මේ විරෝධය අනුක්‍රමයෙන් වැඩී, අන්තිමේදී අනුබලය අව-ලංගු කර දමනවා පමණක් නො ව ජපානය කෙරෙහි ම බරක් වෙනවා ඇත. අයුක්ති සහගත ව්‍යායාමයකට ලැබෙන්නේ අල්ප අනුබලයකි යන නීතිය එබඳු ය, ජපානයේ යුද්ධයේ ස්වභාවයේ ම ප්‍රතිවිපාකය එබඳු ය. සම්පිණ්ඩනය කරන කල, ජපානයට ඇති වාසිය රැඳී තිබෙන්නේ යුද්ධය කරන්නට ඈට තිබෙන මහත් හැකියාවෙහි ය, ඈට ඇති අවාසි ඇගේ යුද්ධයේ ප්‍රතිගාමී සහ ම්ලේච්ඡ ස්වභාවයෙහි, ඇගේ මිනිස්බලය සහ ද්‍රව්‍යමය වත්කම් ප්‍රමාණවත් නො වීමෙහි සහ, අල්ප වූ ජාත්‍යන්තර අනුබලයෙහි රැඳී තිබේ. ජපන් පැත්තෙහි අංගලක්ෂණ මේවා ය.

11. චීන පැත්ත. පළමුවැනි ව, අපි අර්ධ-විජිත, අර්ධ-රදළ රටක් වෙමු. අබිං යුද්ධය[8], තායිපිං විප්ලවය[9], 1898වෙ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය[10],

1911ගේ විප්ලවය[11] සහ උතුරු යුදගමන[12] යන, චීනය ඇගේ අර්ධ-විජිත අර්ධ-රදළ තත්වයෙන් මුදා ගැනීම අරමුණ කර ගත් විප්ලවවාදි හෝ ප්‍රතිසංස්කරණ ව්‍යාපාර සියල්ල ම බරපතල ඇබැද්දි වලට මුහුණ පෑවේ ය, චීනය අර්ධ-විජිත අර්ධ-රදළ රටක් ව ම පවතී. අපි තවම දුර්වල රටක් වෙමු. ප්‍රකට ලෙස ම යුද්ධමය, ආර්ථික සහ දේශපාලන-සංවිධානාත්මක බලය අතින් සතුරාට වඩා පහළ වෙමු. මෙහි යළි ත් යුද්ධයේ අනිවාර්ය-භාවයට ත් ඉක්මනින් ජය ලබන්ට චීනයට කොහෙත් ම බැරි වීමට ත් පදනම අයකුට දක්නට ලැබේ. දෙවැනි ව, එසේ ද වුව, ඉකුත් සියවස මුළුල්ලෙහි සංචිත වූ වර්ධනයක් ඇති චීනයේ විමුක්ති ව්‍යාපාරය, දැන්, මීට පෙර කවර වකවනුවක හෝ තිබුණු ව්‍යාපාරයකට වඩා වෙනස් ය. මේ ව්‍යාපාරයට විරෝධය පාන දේශීය හා විදේශීය බලවේග විසින් ඊට බරපතල ඇබැද්දි සිදු කර තිබෙන නමුදු, ඒ අතර ම ඒ බලවේග චීන ජනතාවට පන්නරය දී ඇත. අද චීනය යුද්ධමය වශයෙන්, ආර්ථික වශයෙන්, දේශපාලන වශයෙන් සහ සංස්කෘතික වශයෙන් ජපානය තරම් ප්‍රබල නො වන නමුදු, ඇගේ ඉතිහාසයෙහි අන් කිසි ම වකවනුවක හෝ තිබුණාට වඩා ප්‍රගතිශීලි වූ සාධක චීනයෙහි ඇත්තේ ය. චීන කොමියුනිස්ට් පක්ෂය ත් එහි නායකත්වය යටතේ පවතින හමුදාව ත් මේ ප්‍රගතිශීලි සාධක නියෝජනය කරයි. මේ ප්‍රගතියේ පදනම මත ය චීනයේ වර්තමාන විමුක්ති යුද්ධයට දිග්ගැසුණු යුද්ධයක් විය හැකි වන්නේ ත්, අවසාන ජයග්‍රහණය දිනා ගන්ට හැකි වන්නේ ත්. වැටීගෙන යන ජපන් අධිරාජ්‍යවාදය හා සසඳන විට, චීනය උදය හිරු මෙන් නැඟී එන රටකි. චීනයේ යුද්ධය ප්‍රගතිශීලි ය, එහෙයිනි එහි යුක්ති සහගත ලක්ෂණය. එය යුක්ති සහගත යුද්ධයක් වන නිසා, එය ජාතිය සමගි වනු පිණිස අවදි කරන්ට, ජපානයෙහි ජනතාවගේ අනුකම්පාව උපදවන්ට සහ ලෝකයේ බොහෝ රටවල් වල අනුබලය දිනා ගන්ට සමත් ය. තුන්වැනි ව, යළි ත් ජපානය හා සසඳන විට, චීනය සුවිශාල භූමිප්‍රදේශයක්, ආඪ්‍ය වත්කම් සහ විශාල ජනගහණයක් ඇති, ඕනෑ තරම් සෙබළුන් සිටින රටකි, දීර්ඝ යුද්ධයක් දරා සිටින්ට සමත් ය. සිව්වැනි ව සහ අවසාන වශයෙන්, චීනයට ඇගේ යුද්ධයේ ප්‍රගතිශීලි සහ යුක්ති සහගත ලක්ෂණ-යෙන් ඇති වන පුළුල් ජාත්‍යන්තර අනුබලය ඇත්තේ ය; එය යළි ත් හරියට ම ජපානයේ අයුක්ති සහගත ව්‍යායාමයට ලැබෙන අල්ප අනුබලයේ අනික් පැත්ත ය. සම්පිණ්ඩනය කරන කල, චීනයට ඇති අවාසිය රැඳී තිබෙන්නේ ඇගේ යුද්ධමය දුර්වලතාවෙහි ය, ඈට ඇති වාසි ඇගේ යුද්ධයේ ප්‍රගතිශීලි සහ යුක්ති සහගත ලක්ෂණයෙහි, ඇගේ විශාල ප්‍රමාණයෙහි සහ ඈට ලැබෙන සුලබ ජාත්‍යන්තර අනුබලයෙහි රැඳී තිබේ. චීනයේ අංගලක්ෂණ මේවා ය.

12. මෙසේ ජපානයට මහත් යුද්ධමය, ආර්ථික සහ දේශපාලන-සංවිධානාත්මක බලයක් තිබෙන නමුත්, ඇගේ යුද්ධය ප්‍රතිගාමී සහ ම්ලේච්ඡ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බව, ඇගේ මිනිස්බලය සහ ද්‍රව්‍යමය වත්කම් ප්‍රමාණවත් නො වන බව සහ ඇ ජාත්‍යන්තර වශයෙන් අහිතකර තත්වයක සිටින බව පෙනී යයි. අනික් අතට, චීනයට ඇත්තේ ඊට වඩා අඩු යුද්ධමය, ආර්ථික සහ දේශපාලන–සංවිධානාත්මක බලයක් නමුත්, ඇ සිටින්නේ ඇගේ ප්‍රගතිය පිළිබඳ යුගයෙහි ය; ඇගේ යුද්ධය ප්‍රගතිශීලී ය, යුක්ති සහගත ය; එමතු නො ව ඇ ලොකු රටකි, එය දිග්ගැසුණු යුද්ධයත් දරා සිටින්ට ඇට හැකි කරන සාධකයකි; ඇට බොහෝ රටවල් අනුබල දෙනවා ඇත. ඉහතින් දක්වූ දේ චීන–ජපන් යුද්ධයේ මූලික වූ ත් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රති-විරුද්ධ වූ ත් අංගලක්ෂණ වේ. ඒවා දෙ පාර්ශ්වයේ දේශපාලන ප්‍රතිපත්ති ත් යුද්ධ උපායමාර්ගය සහ උපක්‍රම ත් යන සියල්ල නිශ්චය කර ඇත, නිශ්චය කරනවා ඇත; ඒවා යුද්ධයේ දිග්ගැසුණු ලක්ෂණය ත් එහි ප්‍රතිඵලය ත්, එනම්, අවසාන ජයග්‍රහණය ජපානයට නො ව චීනයට යන බව, නිශ්චය කර ඇත, නිශ්චය කරනවා ඇත. යුද්ධය මේ අංගලක්ෂණ අතර තරගයකි. යුද්ධය කරගෙන යන අතර, මේ අංගලක්ෂණ, එක් එක් අංගලක්ෂණය ඒ එක එකේ ස්වභාවයට අනුව, වෙනස් වෙනවා ඇත; මෙයින් සෙසු සියල්ල ඇති වෙනවා ඇත. මේ අංගලක්ෂණ විෂයමූල වශයෙන් පවතී, මිනිසුන් මුළා කිරීමට අමුතුවෙන් මවනලද දේ නො වේ; ඒවා යුද්ධයේ පදනම් මූලද්‍රව්‍ය සියල්ල ම වේ, අසම්පූර්ණ කැබලි නො වේ; ඒවා දෙ පාර්ශ්වයේ ම සියලු ප්‍රධාන සහ අප්‍රධාන ගැටළු ත් යුද්ධයේ සියලු අවස්ථා ත් පුරා පැතිරී යයි, ඒවා වැදගැම්මක් නැති කරුණු නො වේ. චීන–ජපන් යුද්ධය අධ්‍යයනය කරන විට යම්කිසි-වෙක් මේ අංගලක්ෂණ අමතක කරන්නේ නම්, ඔහු සත්තකින් ම වැරදි පාරේ යනවා ඇත; ඔහුගේ අදහස් වලින් සමහරක් කලකට විශ්වාසය දිනා ගත්තත්, හරි මෙන් පෙනෙන්ට ඉඩ ඇතත්, ඒවා වැරදි බව යුද්ධය කරගෙන යන විට අනිවාර්ය ලෙස ම ඔප්පු වෙනවා ඇත. මේ අංගලක්ෂණ පදනම කරගෙන, අපි දැන් සාකච්ඡා කරන්ට තිබෙන ගැටළු පැහැදිලි කිරීමට බහිමු.

ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායය බිඳ හෙළීම

13. සතුරාගේ ශක්තිය ත් අපේ දුර්වලතාව ත් අතර වෙනස විනා අන් කිසිවක් නො දකින, ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායය ඉදිරිපත් කරන න්‍යායාචාර්යවරු "විරුද්දකම් පෑමේ තේරුම පරාධීනත්වය ය", යි කියන්ට පුරුදු ව සිටියහ; දැන් ඔව්හු "යුද්ධය දිගට ම ගෙනයාමේ ප්‍රතිඵලය වන්නේ පරාධීන වීම ය," යි කියති. හුදෙක් ජපානය ප්‍රබල නමුත් කුඩා ය, ඒ අතර චීනය දුබල නමුත් ලොකු ය'යි කීමෙන් පමණක් ඔවුන්ට ඒත්තු ගන්-වන්ට අපට පුළුවන් වන්නේ නැත. කුඩා නමුත් ප්‍රබල රටකට ලොකු නමුත් දුබල රටක් පරදන්ට හැකි ය'යි ද, එමතු නො ව, දියුණු රටක් පරදන්ට

නොදියුණු රටකට හැකිය ය'යි ද ඔප්පු කරනු පිණිස, යුආන් රජපෙළපත විසින් සුං රජපෙළපත විනාශ කරනු ලැබීම ත්, චිං රජපෙළපත විසින් මිං රජපෙළපත විනාශ කරනු ලැබීම ත් වැනි, ඉතිහාසීය නිදසුන් ඉදිරිපත් කරන්ට ඔවුන්ට හැකි ය. මේ සිද්ධි ඇති වූයේ බොහෝ කලකට පෙර ය, ඒවා කාරණය ඔප්පු නො කරන්නේ ය'යි අප කීවොත්, කුඩා නමුත් ප්‍රබල ධනවාදී රටකට ලොකු නමුත් දුබල සහ නොදියුණු රටක් පරදන්ට හැකි ය'යි ඔප්පු කරනු පිණිස බ්‍රිතාන්‍යය විසින් ඉන්දියාව යටත් කිරීම ගෙන හැර පාන්ට ඔවුන්ට හැකි ය. එහෙයින්, පරාධීනත්වවාදීන් සියලු දෙනා ම නිහඬ කොට ඔවුන්ට ඒත්තු ගන්වන්ට අපට හැකි වීමට පෙර, වෙන ප්‍රතිෂ්ඨාවන් ඉදිරිපත් කරන්ට ත්, තවම වික්ෂිප්ත ව සහ අනිස්ථිර ව සිටින අය හරවා ගෙන, එසේ විරුද්දකම් පෑමේ යුද්ධය කෙරෙහි ඔවුන්ගේ භක්තිය තර කරන සේ ප්‍රමාණවත් තර්ක ප්‍රචාරක වැඩෙහි යෙදී සිටින හැම දෙනාට ම සපයන්ට ත් අපට සිදු වී තිබේ.

14. එසේ නම් අප විසින් ඉදිරිපත් කළ යුතු ප්‍රතිෂ්ඨා මොනවා ද? යුගයේ අංගලක්ෂණ ය. මේ අංගලක්ෂණ ජපානයේ ප්‍රතිගාමිත්වයෙහි සහ අනුබල හීනත්වයෙහි ද චීනයේ ප්‍රගතියෙහි සහ අනුබල සුලභත්වයෙහි ද වාස්තුවික ලෙස පිළිබිඹු වේ.

15. අපේ යුද්ධය නිකම් මොකක් හරි යුද්ධයක් නො වේ, එය නියම වශයෙන් ම නවසිය තිස් ගණන් වලදී චීනය සහ ජපානය අතර කරනු ලබන යුද්ධයකි. අපේ සතුරා වන ජපානය, පළමුවෙන් ම, මැරිගෙන යන අධි-රාජ්‍යවාදී බලයකි; ඇ දැනට ම සිටින්නේ ඇගේ බහින කලාවෙහි ය; ඇ බ්‍රිතාන්‍ය ධනවාදය එතෙක් තම නහින කලාවෙහි පවතිද්දී ඉන්දියාව යටත් කළ කාලයේ තිබුණු බ්‍රිතාන්‍යයට වෙනස් ය; එපමණක් නො ව, විසි වසකට උඩදී 1වැනි ලෝක යුද්ධය පැවති කාලයේ ජපානය ම සිටි තත්වයට ද වෙනස් ය. වර්තමාන යුද්ධය දියත් කරනලද්දේ ලෝක අධිරාජ්‍යවාදය, ඊට ත් වඩා, පැසිස්ට් රටවල්, පොදු වශයෙන් ඇදවැටීගෙන යන්ට හොඳට ම කිට්ටු අවධියක ය; සතුරා, අන්තිම වියරු අරගලයක ස්වභාවයෙන් වන මේ සාහසිකවාදී යුද්ධය දියත් කර තිබෙන හේතුව එය ම ය. එහෙයින්, යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් විනාශ වන්නේ චීනය නො ව ජපන් අධිරාජ්‍යවාදයේ පාලක කව ය යනු ගැලවෙන්ට බැරි නිශ්චිත දෙයකි. එමතු නො ව, ජපානය මේ යුද්ධය කරන්ට පටන් ගෙන තිබෙන්නේ බොහෝ රටවල් යුද්ධ කරදරයේ පටලැවී සිටින හෝ පටලැවෙන්ට යන කලෙක ය, අප සියලු දෙනා ම ම්ලේච්ඡ ආක්‍රමණයට විරුද්ධ ව සටන් කරමින් සිටින හෝ සටන් කරන්ට සූදානම් වන කලෙක ය; වැලිත් චීනයේ දෛවය ලෝකයේ බොහෝ රටවල් වල සහ ජනතාවන්ගේ දෛවයන් හා එකට ඈඳී තිබේ. ජපානය ඒ රටවල් සහ ජනතාවන් අතර අවුස්සා තිබෙන, ඉස්සරහට ත් වැඩි වැඩියෙන් අවුස්සන, විරෝධයේ මුල් හේතුව මෙය යි.

https://liberationbase.wordpress.com

16. චීනය ගැන කෙසේ ද? අද චීනය අන් කිසි ම ඉතිහාසීය වකවනුවකට අයත් චීනය හා සමාන කළ නො හැකි ය. ඈ අර්ධ–විජිතයකි, අර්ධ–රදළ සමාජයකි, එහි විපාකය වශයෙන් ඈ දූර්වල රටක් ලෙස සලකනු ලබයි. එහෙත් ඒ අතර ම, ඉතිහාසීය වශයෙන් චීනය සිටින්නේ ඇගේ ප්‍රගතිය පිළිබඳ කාලපරිච්ඡේදයෙහි ය; ජපානය පරාජය කරන්ට ඇට පුළුවන් වන ප්‍රාථමික හේතුව මෙය යි. ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය ප්‍රගතිශීලි ය'යි අප කියන කල, සාමාන්‍ය හෝ පොදු තේරුමෙන් ප්‍රගතිශීලි බවක් අපි අදහස් නො කරමු; ඉතාලියට විරුද්ධ ඇබිසීනියන් යුද්ධය, නැතහොත් තායිපිං විප්ලවය හෝ 1911හේ විප්ලවය ප්‍රගතිශීලි වූ තේරුමෙන් ප්‍රගතිශීලි වන බවක් ද අපි අදහස් නො කරමු; චීනය අද ප්‍රගතිශීලි ය යන තේරුමෙන් ප්‍රගතිශීලි වන බව අපි අදහස් කරමු. අද චීනය ප්‍රගිතිශීලි වන්නේ මොන අයුරින් ද? ඈ ප්‍රගතිශීලි වන්නේ ඈ තවදුරට ත් සම්පූර්ණයෙන් ම රදළ රටක් නො වන නිසා ය; එසේ ම චීනයෙහි අපට දැනට ම ධනවාදය තරමක් තිබෙන නිසා, අපට ධනේශ්වරපංක්තියක් සහ නිර්ධනපංක්තියක් සිටින නිසා, පුබුදු වී සිටින හෝ පුබුදු වෙමින් සිටින මිනිසුන් විසාල ගණනින් අපට සිටින නිසා, අපට කොමියුනිස්ට පක්ෂයක් තිබෙන නිසා, අපට දේශපාලන වශයෙන් ප්‍රගතිශීලි වූ හමුදවක් — කොමියුනිස්ට පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන චීන රතු හමුදව — සිටින නිසා සහ දශක බොහෝ ගණනක විප්ලවය පිළිබඳ සම්ප්‍රදය සහ අත්දැකීම, වෙසෙසින් චීන කොමියුනිස්ට පක්ෂය පිහිටුවූ තැන් සිට දහහත් අවුරුද්දේ අත්දැකීම අපට තිබෙන නිසා ය. මේ අත්දැකීම චීනයේ ජනතාවට සහ දේශපාලන පක්ෂ වලට උගෙනීමක් දී තිබේ; ජපානයට විරුද්ධ වර්තමාන සමගිය පිණිස පදනම සකස් කරන්නේ එය ම ය. රුසියාවෙහි 1905හේ අත්දැකීම නො තිබෙන්නට 1917තේ ජයග්‍රහණය කොහෙත් ම ලැබිය නො හැකි වන්නට තිබුණේ ය'යි කියනු ලැබේ නම්, එවිට ඉකුත් දහහත් අවුරුද්දේ අත්දැකීම නොමැතිව අපේ විරුද්දකම් පෑමේ යුද්ධය ජය ගන්නට කොහෙත් ම බැරි වෙනවා ඇතැ'යි කියන්නට අපට ත් පුළුවන්කම තිබේ. අභ්‍යන්තර තත්වය එබඳු ය.

දැනට තිබෙන ජාත්‍යන්තර තත්වය තුළ, චීනය මේ යුද්ධයේදී තනි වී නැත; මේ සාධකය ද ඉතිහාසයෙහි මීට පෙර වූ එවැන්නක් නැති එකකි. අතීතයේදී, චීනයේ යුද්ධ, එසේ ම ඉන්දියාවේ යුද්ධ ද, කරනලද්දේ හුදකලාබවෙහි ය. පැනනැඟී ඇත්තා වූ හෝ පැනනැඟීගෙන එන්නා වූ ත්, චීනයට අනුබල දෙන්නා වූ ත්, පුළුලින් සහ ගැඹුරින් අසාමාන්‍ය වූ ලෝකවිශ්‍රැත මහජන ව්‍යාපාර අපට හමුවන්නේ අද පමණකි. 1917තේ රුසියන් විප්ලවයට ද ජාත්‍යන්තර අනුබලය ලැබුණේ ය, රුසියන් කම්කරුවන් සහ ගොවියන් ජය ගත්තේ එසේ ය; එහෙත් ඒ අනුබලය අද අපට ලැබෙන අනුබලය මෙන් පරිමාණයෙන් පුළුල් හෝ ස්වභාවයෙන් ගැඹුරු හෝ නො වී ය. අද ලොවේ මහජන ව්‍යාපාර පෙර නුවූ විරූ පරිමාණයකින් සහ

ගැඹුරකින් වර්ධනය වේ. සෝවියට් සංගමය තිබීම අද–දවසේ ජාත්‍යන්තර දේශපාලනයෙහි වෙසෙසින් ම පරම වැදගත් සාධකයක් වේ; සෝවියට් සංගමය සත්තකින් ම ඉමහත් ම උද්‍යොගයෙන් චීනයට අනුබල දෙනවා ඇත; මෙවැනි දෙයක් මීට විසි වසකට උඩදී තිබුණේ නැත. මේ සියලු සාධක චීනයේ අවසාන ජයග්‍රහණය පිණිස නැතිව ම බැරි වැදගත් තත්වයන් ඇති කර තිබේ, ඇති කරගෙන යයි. කෙළින් ම දෙන විශාල–පරිමාණයේ ආධාර තවම ලැබෙන්නේ නැත, ලැබෙනවා ඇත්තේ අනාගතයේදී පමණකි; එහෙත් චීනය ප්‍රගතිශීලි ය, ලොකු රටක් ය; යුද්ධය දිග්ගැස්සීමට ත් එමෙන් ම ජාත්‍යන්තර උපකාරය ලැබෙන තැනට කටයුතු කිරීමට මෙන් ම ලැබෙන තුරු බලා සිටීමට ත් ඇට හැකි කරන සාධක මේවා ය.

17, ජපානය කුඩා භූමිප්‍රදේශයක්, වත්පොහොසත්කම් ස්වල්පයක්, කුඩා ජනගහණයක් සහ සෙබළුන් සීමාසහිත ගණනක් ඇති රටක් වන අතර, චීනය සුවිශාල භූමිප්‍රදේශයක්, ආඪ්‍ය වත්පොහොසත්කම්, විශාල ජනගහණයක් සහ ඕනෑ තරම් සෙබළුන් ඇති ලොකු රටක් වන හෙයින්, ශක්තිය සහ දූර්වලකම අතර ඇති වෙනස හැරුණු කල, කුඩා රටක්, ප්‍රතිගාමිත්වය සහ අල්ප අනුබලය ත් ලොකු රටක්, ප්‍රගතිය සහ සුලබ අනුබලය ත් අතර ඇති වෙනස ද ඇත්තේ ය යන අමතර සාධකය ද තිබේ. චීනය කිසි කලක යටත් කරන්ට බැරි වෙන හේතුව මෙය යි. එක්තරා කලකට සහ එක්තරා පමණකට චීනය හිතුමතයට පාගන්නට ජපානයට හැකි වෙන බව, චීනය නො වැළකිය හැකි ලෙස ම පාරේ අමාරු හරියක් ගමන් කළ යුතු වන බව, විරුද්දකම් පෑමේ යුද්ධය දිග්ගැසුණු යුද්ධයක් වන බව සහ ඉක්මනින් විසඳුමක් ලබා ගත හැකි යුද්ධයක් නො වන බව ශක්තිය ත් දූර්වලකම ත් අතර ඇති වෙනසින් නිගමනය වේ; ඒ එසේ වුව ද, කාල නියමයක් නැතිව චීනය හිතුමතයට පාගන්නට ජපානයට බැරි වන බව සහ ජපානය අවසාන පරාජයට මූණ පානවා සිකුරු බව ද, ඒ අතර චීනය යටත් කරන්නට කිසි කලෙක බැරි බව සහ චීනය අවසාන ජයග්‍රහණය දිනා ගන්නවා සිකුරු බව ද ලොකු රටකට, ප්‍රගතියට සහ සුලබ අනුබලයට විරුද්ධ ව කුඩා රටක්, ප්‍රතිගාමිත්වය සහ අල්ප අනුබලය යන අනික් වෙනසින් නිගමනය වේ.

18. ඇබිසීනියාව පරදවනු ලැබුවේ මන්ද? පළමුවැනි ව, ඈ දූර්වල පමණක් නො ව කුඩා ද විය. දෙවැනි ව, ඈ චීනය තරම් ප්‍රගතිශීලි නො වී ය; ඈ වහල් ක්‍රමයෙන් ප්‍රවේණිදස ක්‍රමයට මාරු වෙන පරණ රටක්, කිසි ම ධනවාදයක් හෝ, කොමියුනිස්ට පක්ෂයක් තබා ධනේශ්වර දේශපාලන පක්ෂ වත් නැති, අටවැනි මාර්ග හමුදව වැන්නක් තබා චීන හමුද වැනි හමුදවක් වත් නැති, රටක් විය. තුන්වැනි ව, ජාත්‍යන්තර ආධාරය ලැබෙන තුරු අල්ලාගෙන සිටින්නට ඈ අසමත් විය, ඇගේ යුද්ධය හුදකලා ව ම කරන්නට ඇට සිදු විය. සිව්වැනි ව, සියල්ලට ම වඩා වැදගත් එක වශයෙන්, ඉතාලියට විරුද්ධ ඇගේ යුද්ධයට කළ මගපෙන්වීමෙහි වැරදි තිබුණේ ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එහෙයින් ඇබිසීනියාව යටත් කරනු ලැබී ය. එහෙත් උදක් පුළුල් ලෙස පැතුරුණු ගොරිල්ලා සංග්‍රාමය ඇබිසීනියාවෙහි තවම තිබේ; එය අත නෑර ගෙන ගියොත්, ලෝක තත්වය වෙනස් වන කල තම රට ආපසු ලබා ගන්ට ඇබිසීනියන්වරුන්ට හැකි වෙනවා ඇත.

19. පරාධීනත්වවාදීන් පළමුකොට ''විරුද්දකම් පෑමේ තේරුම පරාධීනත්වය ය'', ඊළඟට ''යුද්ධය දිගට ම ගෙනයාමේ ප්‍රතිඵලය වන්නේ පරාධීන වීම ය'' යන ඔවුන්ගේ ස්ථිර කියමන ඔප්පු කරනු පිණිස නූතන චීනයේ විමුක්ති ව්‍යාපාර ව්‍යර්ථ වීමේ ඉතිහාසය උපුටා දක්වත් නම්, මෙහිදී ද අපේ පිළිතුර ''කාලය වෙනස් ය'' යනු යි. චීනය ම ද, ජපානයෙහි අභ්‍යන්තර තත්වය ද, ජාත්‍යන්තර වටාපිටාව ද යන සියල්ල ම දැන් වෙනස් ය. ඇගේ නො වෙනස් වූ අර්ධ–විජිත, අර්ධ–රදළ තත්වයෙහි සිටින චීනය තවම තරමක් දුර්වල වන අතර, ජපානය කලින්ට වඩා ප්‍රබල ය යන්න බැරෑරුම් කරුණකි. චීනය අතික්‍රමණය කරනු වස් දනට සියරටෙහි තම ජනතාව ග්‍රහණය කරගෙන සිටීමට ත් ජාත්‍යන්තර ප්‍රතිවිරෝධයන් ගෙන් ප්‍රයෝජන ගැනීමට ත් තවම ජපානයට හැකි ය යනු ද සත්‍ය කාරණයකි. එහෙත් දීර්ඝ යුද්ධයක් කරගෙන යන විට, මේ දේවල් අනික් අතට වෙනස් වෙනවා නියත ය. එබඳු වෙනස්වීම්, මෙතෙක් ම, සිදු වී තිබෙන සත්‍ය කරුණු නො වේ; එහෙත් අනාගතයේදී ඒවා එසේ වෙනවා ඇත. පරාධීනත්වවාදියෝ මේ කරුණ බාර නො ගනිති. චීනය සම්බන්ධයෙන්, අපට දනට ම අළුත් මිනිස්සු සිටිති, අළුත් දේශපාලන පක්ෂයක්, අළුත් හමුදවක් සහ ජපානයට විරුද්දකම් පෑමේ අළුත් ප්‍රතිපත්තියක් ඇත; මෙය දශකයකට වැඩි කලකට උඩදී තිබුණාට වඩා බෙහෙවින් ම වෙනස් තත්වයකි; ඊටත් වඩා මේ සියල්ල නො වැළකිය හැකි ලෙස ම තව දුරට ත් දියුණු වෙනවා ඇත. ඉතිහාසිය වශයෙන් විමුක්ති ව්‍යාපාර යළි යළි ත් ඇබෑද්දි වලට මුහුණ පෑ බව ත් එහි ප්‍රතිඵලය වශයෙන් වර්තමාන විරුද්දකම් පෑමේ යුද්ධය සඳහා මීට වඩා විශාල ශක්තියක් රැස් කරගන්ට චීනයට බැරි වූ බව ත් සැබෑ ය — මෙය ඉතා වේදනාදායක ඉතිහාසිය පාඩමකි; යළි ත් කිසි කලෙක අපි අපේ විප්ලවවාදි බලවේග අතුරෙන් කිසිවක් විනාශ නො කළ යුත්තෙමු. එසේ ද වුව වර්තමාන පදනම මත පවා, මහත් පරිශ්‍රම දැරීමෙන් අනුක්‍රමයෙන් ඉස්සරහට ම තෙරපී යන්නට ත් අපේ විරුද්දකම් පෑමේ ශක්තිය වැඩි කර ගන්නට ත් අපට සත්තකින් ම පුළුවනි. එබඳු සියලු පරිශ්‍රම ශ්‍රේෂ්ඨ ජපන්-විරෝධි ජාතික එක්සත් පෙරමුණ වෙත ම යොමු විය යුතු ය. ජාත්‍යන්තර අනුබලය සම්බන්ධයෙන්, කෙළින් ම දෙන විශාල–පරිමාණයේ ආධාර තවම පෙනෙන තෙක් මානයේ නැති නමුදු, ජාත්‍යන්තර තත්වය කලින්ට වඩා මූලික වශයෙන් වෙනස් හෙයින්, ජාත්‍යන්තර අනුබලය සකස් වෙමින් තිබේ. නූතන චීනයේ විමුක්ති ව්‍යාපාරයෙහි වූ ගණන් නැති ව්‍යර්ථවීම් වලට ඒවාට ම අයත් මනෝමූල සහ විෂයමූල හේතු තිබුණේ ය; එහෙත් අද

තත්වය මුළුමනින් ම වෙනස් ය, අද විරුද්දකම් පෑමේ යුද්ධය ආයාශකර එකක් කරන්නා වූ — සතුරාගේ ශක්තිය සහ අපේ දුර්වලකම ත්, අපේ ම ප්‍රගතිය කොහෙත් ම ප්‍රමාණව ත් නො වන අතර සතුරාගේ දුෂ්කරතා මේ දැන් පටන් ගන්නවා පමණකි යන සත්‍ය කාරණය ත් වැනි — බොහෝ දුෂ්කරතා තිබෙන නමුදු, සතුරා පරාජය කරනු පිණිස හිතකර වූ බොහෝ තත්වයෝ ද පවතිත්; අප විසින් කළ යුතු ව තිබෙන්නේ අපේ මනෝමූල පරිශ්‍රමයන් ඒවාට එකතු කිරීම ය; එවිට දුෂ්කරතා මැඩපවත්වා ජයග්‍රහණය කරා යන්නට අපට හැකි වෙනවා ඇත. මේවා අපේ ඉතිහාසයෙහි පෙර කිසි ම වකවනුවක නො තිබුණු විධියේ හිතකර තත්වයෝ වෙත්; ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය, අතීතයේ විමුක්ති ව්‍යාපාර මෙන් නො ව, ව්‍යර්ථ වීමෙන් කෙළවර නො වන්නේ ඒ නිසා ය.

සමගිසම්මුතිය ද විරුද්දකම් පෑම ද?
දූෂණය ද ප්‍රගතිය ද?

20. ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායය ප්‍රතිෂ්ඨා විරහිත බව ඉහතින් සම්පූර්ණයෙන් ම පැහැදිලි කර ඇත. එහෙත් මේ න්‍යායයට එකඟ නො වන බොහෝ අය සිටිති; ඔව්හු අවංක දේශප්‍රේමියෝ ය. එසේ ද වුව වර්තමාන තත්වය ගැන ගැඹුරු ලෙස ම සිතින් කරදර වන අය ය. කරුණු දෙකක් ඔවුන්ට කරදර කරයි; ජපානය හා සමගිසම්මුතියක් ඇති විය හැකි ය යන බිය ත් දේශපාලන ප්‍රගතිය සලසා ගත හැකි වේ දෝ හෝ'යි ඇති සැක ත් ය. මේ කරදරකාර ප්‍රශ්න දෙක පුළුල් ලෙස සාකච්ඡාවට පාත්‍ර වී ඇත, ඒවා විසඳීමට යතුරක් සොයාගෙන නැත. අපි දැන් ඒවා පරීක්ෂා කර බලමු.

21. කලින් පැහැදිලි කළ පරිද්දෙන් ම, සමගිසම්මුතියක් පිළිබඳ ප්‍රශ්නයට ඊට අයත් සමාජ මුල් ඇත්තේ ය; මේ මුල් යම් තාක් කල් පවතී ද ඒ තාක් කල් ප්‍රශ්නය පැනනගිනවා නියත ය. එහෙත් සමගිසම්මුතිය පලක් නො වෙනවා ඇත. මේ කරුණු ඔප්පු කිරීමට හේතු සාධක සෙවීම පිණිස අප යළි ත් කළ යුත්තේ ජපානය, චීනය සහ ජාත්‍යන්තර තත්වය දෙස බැලීම පමණකි. පළමුකොට, ජපානය ගනිමු. සමගිසම්මුතියක් ඇති කර ගැනීමට ඉඩකඩ සැලසෙන වාතාවරණයක් පැනනගින කාලයක් එනවා ඇති බව, වෙන වචන වලින්, උතුරු චීනය, චියාංසු පළාත සහ චෙචියාං පළාත අල්ලා ගත් පසු ජපානය බාගවිට චීනය යටත් වීමට පෙළඹීමේ ප්‍රයෝගය පිහිට කොට ගත හැකි බව, විරුද්දකම් පෑමේ යුද්ධය පටන් ගත් දින වල ම අපි තක්සේරු කළෙමු. ඇත්ත වශයෙන් ම, ඈ ඒ ප්‍රයෝගයේ පිහිට සෙවූ නමුත් අර්බුද අවස්ථාව ඉක්මනින් පහවී ගියේ ය; එක් හේතුවක් වූයේ සතුරා හැම තැන ම ම්ලේච්ඡ ප්‍රතිපත්තියක් ලුහුබැඳීම සහ නග්න ලෙස කොල්ලකෑමෙහි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යෙදීම ය. චීනය යටත් වූවා නම්, හැම චීන ජාතිකයකු ම රටක් නැති වහලකු වෙන්ට ඉඩ තිබුණි. සතුරාගේ කොල්ලකාර ප්‍රතිපත්තියට, චීනය යටත් කර ගැනීමේ ප්‍රතිපත්තියට, ද්‍රව්‍යමය සහ ආධ්‍යාත්මික වශයෙන්, අංග දෙකක් තිබේ; ඒ දෙක ම විශ්ව වශයෙන් සියලු ම චීන ජාතිකයින්ට, පහළ තට්ටු වල ජනතාවට පමණක් නො ව ඉහළ තට්ටු වල සාමාජිකයින්ට ද යොදනු ලැබේ; සත්තකින් ම පසු ව කී අයට ටිකක් වැඩියෙන් විනීත ලෙස සංග්‍රහ කරනු ලැබේ; එහෙත් වෙනස ප්‍රමාණය පිළිබඳ එකකි, මූලධර්මය පිළිබඳ එකක් නො වේ. මුඛ්‍ය වශයෙන් සතුරා ඊසානදිග පළාත් තුනෙහි තමා විසින් යොදනලද පරණ පියවර ම චීනයේ ඇතුල් කොටසට ද මාරු කරගෙන යයි. ද්‍රව්‍යමය වශයෙන්, ඔහු සාමාන්‍ය ජනතාව ගෙන් ඔවුන්ගේ ආහාර සහ වස්ත්‍ර පවා සොරා ගනිමින්, ඔවුන් කුසගින්නෙන් සහ සීතලෙන් කැගාන්නට සලසයි; ඔහු නිෂ්පාදන මාර්ග කොල්ලකයි, එසේ චීනයේ ජාතික කර්මාන්ත විනාශ කරයි, වහල් කර ගනියි. ආධ්‍යාත්මික වශයෙන්, ඔහු චීන ජනතාවගේ ජාතික හැඟීම විනාශ කරන්ට වැඩ කරගෙන යයි. ''පායන හිරු'' කොඩිය යටතේ, සුවච කීකරු යටත්වැසියන් වීමට, චීන ජාතික ජීවගුණය පොඩ්ඩක් වත් පෙන්වීම තහනම් කරනු ලැබූ බර අදින සතුන් වීමට, සියලු ම චීන ජාතිකයෝ බල කරනු ලබත්. මේ ම්ලේච්ඡ සතුරු ප්‍රතිපත්තිය චීනයේ ඇතුල් කොටසෙහි තව තව ත් ගැඹුරට ගෙනයනු ලබනවා ඇත. හරි ම කැදරකමකින් පෙළෙන ජපානය යුද්ධය නතර කරන්ට අකැමති ය. නො වැළකිය හැකි වූ ලෙස ම, ජපන් කැබිනට් මණ්ඩලය 1938, ජනවාරි 16වැනි ද කළ ප්‍රකාශයෙහි පණවා ඉදිරිපත් කළ ප්‍රතිපත්තිය[13] තවම මුරණ්ඩු ලෙස ක්‍රියාවේ යොදගෙන යනු ලැබේ; එය චීන ජනතාව අතර සියලු ම තට්ටු කුපිත කොට ඇත. මේ ප්‍රකෝපය හට ගන්වන්නේ ජපානයේ යුද්ධයේ ප්‍රතිගාමී සහ ම්ලේච්ඡ ලක්ෂණය විසින් ය — ''ඉරණමෙන් ගැලවීමක් නැත''. එහෙයින් ඒකාන්ත සතුරුකමක් කැටි වී ඇත. අනාගතයේදී කිසියම් අවස්ථාවක සතුරා යළි ත් වරක් චීනය යටත් වීමට පෙළඹීමේ ප්‍රයෝගය පිහිට කොට ගන්නවා ඇතැ'යි ද, ඇතැම් පරාධීනත්වවාදින් යළිත් එළියට බඩගා, (බ්‍රිතාන්‍යයෙහි, එක්සත් ජනපදයෙහි සහ ප්‍රන්සයෙහි, වෙසෙසින් බ්‍රිතාන්‍යයෙහි ඉහළ තට්ටුව අතර, දක්නට ලැබෙන) යම් යම් විදේශීය කොටස් සමග අපරාධයට කොටස්කරුවන් වශයෙන් එකතු වීමට හොඳට ම ඉඩ තිබේ ය'යි ද බලාපොරොත්තු විය හැකි ය. එහෙත් සිද්ධීන් සාමාන්‍යයෙන් බර වේගෙන යන අත යටත් වීමට අවසරයක් නො දෙනවා ඇත; ජපානයේ යුද්ධයේ මුරණ්ඩු සහ විශේෂයෙන් ම ම්ලේච්ඡ ලක්ෂණය ප්‍රශ්නයේ මේ අංගය තීරණය කර ඇත.

22. දෙවැනි ව, අපි චීනය ගනිමු. විරුද්දකම් පෑමේ යුද්ධයේදී චීනය විසින් දූඩි උත්සාහයක් දැරීමට ආධාරයක් වන සාධක තුනක් තිබේ. පළමුකොට, ජපානයට විරුද්දකම් පෑම පිණිස ජනතාවට නායකත්වය දෙන

විශ්වාස කටයුතු බලවේගය වන කොමියුනිස්ට් පක්ෂය. ඊළඟට, බ්‍රිතාන්‍යය සහ එක්සත් ජනපදය මත රැඳී සිටින, එහෙයින් ඔවුන් කීවොත් මිස ජපානයට යටත් නො වන, කුඹමින්තාං පක්ෂය. අවසාන වශයෙන්, වැඩි ගණනක් සමගිසම්මුතියකට විරුද්ධ වන සහ විරුද්දකම් පෑමේ යුද්ධයට අනුබල දෙන අනික් දේශපාලන පක්ෂ සහ කණ්ඩායම්. මේ තුන අතර සමගීය ඇති කල, යමෙක් සමගිසම්මුතියට එළඹෙයි ද ඔහු ද්‍රොහින් සමග එකට සිටිනවා ඇත, ඔහුට දඬුවම් දීමේ අයිතිය කවරකුට හෝ තිබෙනවා ඇත. ද්‍රෝහින් වීමට අකැමති සියලු දෙනාට ම, සමගි වී විරුද්දකම් පෑමේ යුද්ධය කෙළවර තෙක් ගෙන යනවා විනා, තෝරා ගන්ට වෙන දෙයක් නැත; එහෙයින් සමගිසම්මුතිය සාර්ථක වෙන්ට අමාරු ය.

23. තුන්වැනි ව, ජාත්‍යන්තර අංගය ගනිමු. ජපානයේ මිත්‍රපාක්ෂිකයන් ද සෙසු ධනවාදි රටවල් වල ඉහළ පෙළේ ඇතැම් කොටස් ද හැර, මුළු ලොව ම කැමති වන්නේ චීනය සමගිසම්මුතියක් ඇති කර ගන්නවාට නො ව විරුද්දකම් පානවාට ය. මේ සාධකය චීනයේ බලාපොරොත්තු තර කරයි. අද රට පුරා ම සිටින ජනතාව ජාත්‍යන්තර බලවේගයෝ අනුක්‍රමයෙන් චීනයට වැඩි වැඩියෙන් උදව් දෙනවා ඇත යන බලාපොරොත්තුව ආදරයෙන් සිත් තුළ රැකගෙන සිටිති. එය නිෂ්ඵල බලාපොරොත්තුවක් නො වේ; විශේෂයෙන් සෝවියට් සංගමයේ පැවැත්ම චීනයේ විරුද්දකම් පෑමේ යුද්ධයේදී ඇට ධෛර්‍යය දෙයි. දැන් පෙර කිසි කලෙක නො වූ සේ ප්‍රබල ව සිටින සමාජවාදි සෝවියට් සංගමය සැම විට ම චීනයේ දුක සැප දෙකට හවුල් වී ඇත. ලාභය ම විනා අනිකක් නො සොයන ධනවාදි රටවල් වල ඉහළ තට්ටු වල සියලු සාමාජිකයන්ට හාත්පසින් ම වෙනස් ලෙස, සෝවියට් සංගමය සියලු දුර්වල ජාතින්ට සහ සියලු විප්ලවවාදි යුද්ධ වලට උදව් දීම තම යුතුකම සේ සලකයි. චීනය ඇගේ යුද්ධය කරන්නේ හුදකලාව නො වේ යන්නට පදනම තිබෙන්නේ සාමාන්‍ය වශයෙන් ලැබෙන ජාත්‍යන්තර අනුබලය තුළ ම පමණක් නො වේ, විශේෂ වශයෙන් සෝවියට් අනුබලය තුළ ය. චීනය ත් සෝවියට් සංගමය ත් පිහිටා තිබෙන්නේ භූගෝලවිද්‍යාත්මක වශයෙන් එකිනෙක ආසන්නයෙහි ය; එය ජපානයේ අර්බුදය උග්‍ර කරයි, චීනයේ විරුද්දකම් පෑමේ යුද්ධය පහසු කරයි. ජපානයට භූගෝලවිද්‍යාත්මක වශයෙන් ආසන්න වීම චීනයේ විරුද්දකම් පෑමට ඇති දුෂ්කරතා වැඩි කරයි. සෝවියට් සංගමයට ආසන්න වීම, අනික් අතට, විරුද්දකම් පෑමේ යුද්ධයට හිතකර තත්වයකි.

24. එහෙයින් සමගිසම්මුතියක් ඇති වීමේ අනතුර පවතින නමුත් එය මැඩපැවැත්විය හැකි ය'යි අප විසින් නිගමනය කරන්ට ඉඩ තිබේ. තම ප්‍රතිපත්තිය එක්තරා ප්‍රමාණයකට ලිහිල් කරන්ට සතුරාට හැකි වුව ත්, එය මූලික වශයෙන් වෙනස් කරන්ට ඔහුට බැරි ය. චීනයෙහි සමගිසම්මුතියේ සමාජ මුල් තිබේ, එහෙත් සමගිසම්මුතියට විරුද්ධ අය වැඩි ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජාත්‍යන්තර වශයෙන් ද, සමහර බලවේග සමගිසම්මුතියට කැමති ය, එහෙත් ප්‍රධාන බලවේග විරුද්දකම් පෑමට කැමති ය. මේ සාධක තුන එක්වීම සමගිසම්මුතියේ අනතුර මැඩපැවැත්වීමට ත් විරුද්දකම් පෑමේ යුද්ධය කෙළවර තෙක් අත නැර ගෙනයාමට ත් පුළුවන් කරයි.

25. දැන් අපි දෙවැනි ප්‍රශ්නයට පිළිතුරු දෙමු. සියරටෙහි දේශාලන ප්‍රගතිය ත් විරුද්දකම් පෑමේ යුද්ධයෙහි ලා දැඩි උත්සාහය ත් වෙන් නො කළ හැකි ය. දේශපාලන ප්‍රගතිය වැඩි වන පමණට, යුද්ධයෙහි ලා අප විසින් දැරිය හැකි දැඩි උත්සාහය වැඩි වේ; යුද්ධයෙහි ලා අප දැඩි උත්සාහ දැරීම වැඩි වන පමණට, දේශපාලන ප්‍රගතිය වැඩි වේ. එහෙත්, මූලික වශයෙන්, හැම දෙයක් ම රඳා පවතින්නේ විරුද්දකම් පෑමේ යුද්ධයේදී අප දරන දැඩි උත්සාහය මත ය. කුඕමින්තාං පාලනය යටතේ විවිධ ක්ෂේත්‍රයන්හි විද්‍යාමාන අයහපත් දේ ඉතා බරපතල ය; මේ අප්‍රසන්න සාධක අවුරුදු ගණන් තිස්සේ සංචය වීමෙන් අපේ දේශප්‍රෙමීන්ගේ පුළුල් ශ්‍රෙණී අතර සිත් නොසන්සුන්කම ත් සිත් තැවුල ත් ඇති වී තිබේ. එහෙත් අශුභවාදය පිණිස හේතුවක් නැත; චීන ජනතාව අතීතයෙහි අවුරුදු බොහෝ ගණනක් මුළුල්ලෙහි යම් තරමක ප්‍රගතියක් ඇති කර ගත්තේ ද ඒ තරම් ම ප්‍රගතියක් ඉකුත් දස මස තුළ ඇති කරගෙන තිබෙන බව විරුද්දකම් පෑමේ යුද්ධයේදී ලැබුණු අත්දැකීම මගින් ඔප්පු වී තිබෙන නිසා ය. අවුරුදු ගණන් තිස්සේ කරගෙන එන දූෂිත වැඩ වල සංචිත විපාකයන්, යුද්ධයේදී අපේ ජයග්‍රහණයන්ගේ ප්‍රමාණය හීන කරමින් සහ අපට අලාභයන් සිදු කරමින්, ජපානයට විරුද්දකම් පෑමට අපේ ජනතාවට තිබෙන ශක්තියේ වැඩීම බරපතල ලෙස බාල කරන නමුදු, චීනයෙහි, ජපානයෙහි සහ ලෝකයෙහි සාමාන්‍ය තත්වය කෙබඳු ද යත් චීන ජනතාව ප්‍රගතිය කරා නො ගොස් බැරි ය. මේ ප්‍රගතිය, ප්‍රගතියට බාධා කරන දූෂණ සාධකය නිසා, අසීඝ්‍ර වෙනවා ඇත. ප්‍රගතිය ත් ප්‍රගතියේ අසීඝ්‍ර වේගය ත් වර්තමාන තත්වයේ අංගලක්ෂණ දෙකකි, දෙවැනි අංගලක්ෂණය යුද්ධයේ අත්‍යවශ්‍ය උවමනාවන් හා සමග යෙහෙන් ගැලපෙන්නේ නැත; එය දේශප්‍රෙමීන් හට බලවත් සංවේගයට මූලක් වේ. එහෙත් අප සිටින්නේ විප්ලවවාදි යුද්ධයක් මැද්දේ ය; විප්ලවවාදි යුද්ධය සතුරු විස ඉවත් කරන, එමතු නො ව අප ත් අපගේ ම අපවිත්‍ර දෙයින් තොර කරන, විෂනාශකයකි. යුක්තිසහගත වූ ත් විප්ලවවාදි වූ ත් හැම යුද්ධයක් ම, බොහෝ දේ විපර්යාස කරන්ට හෝ ඒවා විපර්යාස කිරීම පිණිස මග හෙළි කරන්ට හෝ සමත්, ඉමහත් බලයකින් උපයුක්ත ය. චීන–ජපන් යුද්ධය චීනය ත් ජපානය ත් යන දෙක ම විපර්යාස කරනවා ඇත; චීනය විරුද්දකම් පෑමේ යුද්ධය ත් එක්සත් පෙරමුණ ත් අත නැර ගෙන ගියොත්, ඇත්තෙන් ම පරණ ජපානය නව ජපානයක් බවට ත්, පරණ චීනය නව චීනයක් බවට ත් විපර්යාස වෙනවා ඇත, චීනය ත් ජපානය ත් යන දෙකේ ම මිනිසුන් සහ අන් හැම දෙයක් ම යුද්ධය පවතින

අතර ත් ඉන් පසු ත් විපර්යාස වෙනවා ඇත. අප විසින් ජපන්–විරෝධි යුද්ධය ත් අපේ ජාතික සංවර්ධනය ත් පරස්පර–සම්බන්ධිත සේ සැලකීම උචිත ය. ජපානය ත් විපර්යාස කළ හැකි ය'යි කීම ඇගේ පාලකයන් විසින් කරගෙන යන ආක්‍රමණ යුද්ධය පරාජයෙන් අවසන් වෙනවා ඇති බව ත් එයින් ජපන් ජනතාව විසින් කරන විප්ලවයක් කරා මග පැදෙන්ට ඉඩ තිබෙන බව ත් කීම ය. ජපන් ජනතාවගේ විප්ලවය ජය ගන්නා දිනය ජපානය විපර්යාස කරනු ලබන දිනය වෙනවා ඇත. මේ සියල්ල චීනයේ විරුද්දකම් පෑමේ යුද්ධය හා කිට්ටුවෙන් පිරිද්දී තිබේ; අප විසින් ගණනට ගත යුතු මතු බලාපොරොත්තුවක් වේ.

ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායය වැරදි ය, ඉක්මනින් ජය ලැබීම පිළිබඳ න්‍යායය ද එසේ ම ය

26. පරස්පර ශක්තිය, පරස්පර ප්‍රමාණය, ප්‍රගතිය හෝ ප්‍රතිගාමිත්වය සහ, අනුබලය ලැබෙන පරස්පර ප්‍රමාණය වැනි, මූලික ප්‍රතිවිරෝධි අංගලක්ෂණ සම්බන්ධයෙන් සතුරා ත් අප ත් ගැන කළ අපේ තුලනාත්මක අධ්‍යයනයේදී, ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායය අප විසින් දැනට ම බිඳ හෙළා ඇත, සමගිසම්මුතියක් ඇති නො වෙන්ට පුළුවන් මන්ද යනු ත් දේශපාලන ප්‍රගතිය සලසා ගත හැකි මන්ද යනු ත් අප විසින් පැහැදිලි කර ඇත. පරාධීනත්වවාදියෝ ශක්තිය ත් දුර්වලකම ත් අතර ප්‍රතිවිරෝධය අවධාරණය කරති; එය, සෙසු සියලු ප්‍රතිවිරෝධයන් නො තකමින්, මේ ප්‍රශ්නය ගැන ඔවුන්ගේ මුළු තර්කයේ පදනම වන තුරු පුම්බති. ඔවුන් ශක්තිය අතින් ඇති වෙනස ගැන ම පමණක් සිත සිතා සිටීමෙන් පෙනී යන්නේ ඔවුන් එක පැත්තකට පමණක් සීමා වී සිටින බව යි; ඔවුන් කාරණයේ මේ එක පැත්ත මුළු එක බවට ලොකු කිරීමෙන් පෙනී යන්නේ ඔවුන්ගේ මනෝමූලවාදය යි. මෙසේ, අයකු මුළු එකක් වශයෙන් ගෙන කාරණය දෙස බලතොත්, ඔවුන්ට නැඟී සිටීමට ප්‍රතිෂ්ඨාවක් නැති බව ත් ඔවුන් වැරදි බව ත් පෙනෙනවා ඇත. පරාධීනත්වවාදීන් වත් දරදඬු අශුභවාදීන් වත් නො වන, එක්තරා අවස්ථාවකදී සහ යම් යම් අංග අතින් අපේ ශක්තිය ත් සතුරාගේ ශක්තිය ත් අතර ඇති අසමානකම නිසා හෝ රටේ පවතින දූෂණය නිසා හෝ හුදෙක් තමන් වික්ෂිප්ත වී සිටින හෙයින් ඒ මොහොතට පමණක් අශුභවාදි මනෝ–විලාශයකින් යුක්ත ව සිටින්නන් වන අය සම්බන්ධයෙන්, ඔවුන්ගේ යොමුවීමේ පිළිවෙල ත් එක පැත්තකට සීමා වන බව සහ මනෝමූල වීමේ අතට බර වන බව අප විසින් ඔවුන්ට පෙන්වා දිය යුතු ය. එහෙත් ඔවුන්ගේ ප්‍රශ්නයේදී නිවැරදි කිරීම සංසන්දනාත්මක වශයෙන් පහසු ය; ඔවුන් අවදියෙන් සිටින්නට සැලසූ කල, ඔවුන්

LIBERATIONBASE

දේශප්‍රේමීන් වන නිසා ත් ඔවුන්ගේ වරද හුදෙක් ක්ෂණික එකක් වන නිසා ත්, ඔවුන්ට වැටහෙනවා ඇත.

27. ඉක්මනින් ම ජය ලැබීම ගැන කතා කරන්නෝ ද එසේ ම වැරදි ය. එක්කෝ ඔව්හු, සෙසු ප්‍රතිවිරෝධයන් පමණක් මතක තබාගෙන, ශක්තිය ත් දුර්වලකම ත් අතර ප්‍රතිවිරෝධය සම්පූර්ණයෙන් ම අමතක කරති; නැතහොත් ඔව්හු චීනයට තිබෙන වාසි සත්තාවට පොඩ්ඩක්වත් සමාන නැති ලෙස සහ හඳුනා ගත නො හැකි වන තරමට ලොකු කර පෙන්වති; නැතහොත් ඔව්හු, ''ඇහැ ඉදිරිපිට ඇති කොළයක් තායි කන්ද වහයි'' යන පැරණි කියමනෙහි එන්නාක් මෙන්, එක් අවස්ථාවක සහ ස්ථානයක ඇති බලවේගයන්ගේ සමබරතාව මුළු තත්වය වශයෙන් පමණට වඩා ලොකු කොට ගනිති. කොටින්, අප දුර්වල වන අතර සතුරා ප්‍රබල බව පිළිගන්ට ඔවුන්ට ධෛර්යය නැත. ඔවුහු බොහෝ විට මේ කරුණ නො පිළිගනිති, විපාකය වශයෙන් සත්‍යයේ එක් අංගයක් නො පිළිගනිති. අපට තිබෙන වාසි වල සීමාවන් පිළිගන්ට ද ධෛර්යය නැති ඔව්හු, එසේ සත්‍යයේ තවත් අංගයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කරති, ප්‍රතිඵලය නම් ඔවුන් ලොකු වැරදි ත් කුඩා වැරදි ත් කිරීම යි; මෙහිදී යළි ත් තක්කඩිකම කරන්නේ මනෝමූලවාදය සහ එක පැත්තකට සීමා වූ ගුණය යි. මේ මිතුරන්ගේ හදවත් නියම තැන තිබේ; ඔව්හු ද දේශප්‍රේමීයෝ වෙති. එහෙත් ''මහතුන්ගේ අපේක්ෂාවන් ඇත්තෙන් ම උත්තුංග වන'' අතර, ඔවුන්ගේ මත වැරදි ය; ඒ මත අනුව ක්‍රියා කිරීම සත්තකින් ම දුවගෙන ගොස් ගල් බිත්තියක හැපීම වෙනවා ඇත. කවර හෙයින් ද යත් තක්සේරුව සත්තාව හා අනුරූප නො වේ නම්, සිය අරමුණ මුදුන්පත් කරන්ට ක්‍රියාවට බැරි වෙන නිසා ය; ඒ නො තකා ක්‍රියා කිරීමේ තේරුම හමුදාවේ පරාජය ත් ජාතියේ පරාධීනත්වය ත් වෙනවා ඇත; එසේ හෙයින් ප්‍රතිඵලය පරාජයවාදීන් ලබන ප්‍රතිඵලය සේ ම වෙනවා ඇත. එහෙයින් ඉක්මනින් ජය ලැබීම පිළිබඳ මේ න්‍යායය ද හරි යන්නේ නැත.

28. අප ජාතික පරාධීනත්වයේ අනතුර නැතැ'යි කියනවා ද? නැත, අප එසේ කියන්නේ නැත. චීනය සිදු විය හැකි දේවල් දෙකකට, විමුක්තියට හෝ පරාධීනත්වයට, මුහුණ පා සිටින බව ත්, මේ දෙක චණ්ඩ ලෙස සටටණය වෙමින් තිබෙන බව ත් අපි පිළිගනිමු. අප සතු කර්තව්‍යය විමුක්තිය අත්පත් කර ගැනීම සහ පරාධීනත්වය වැළැක්වීම ය. විමුක්තිය පිණිස ඇති තත්වයෝ, මූලික එක වන, චීනයේ ප්‍රගතිය ත්, සතුරාගේ දුෂ්කරතා සහ ජාත්‍යන්තර අනුබලය ත් වෙති. අපි පරාධීනත්වවාදීන් ගෙන් වෙනස් වෙමු. විෂයමූල වූ ත් හැම පැත්ත ම ඇතුළත් වූ ත් දෘෂ්ටිය ගනිමින්, අපි ජාතික පරාධීනත්වය ත් විමුක්තිය ත් යන විය හැකි දේවල් දෙක පිළිගනිමු, විමුක්තිය විය හැකි ප්‍රධාන දෙය බව අවධාරණය කරමු, එය මුදුන්පත් කිරීමට තිබෙන තත්වයන් පෙන්වා දෙමු, ඒ තත්වයන් අත් කර ගැනීමට වෙර දරමු. අනික් අතට, පරාධීනත්වවාදීයෝ, මනෝමූල වූ ත් එක පැත්තකට සීමා වූ ත් දෘෂ්ටියක් ගනිමින්, විය හැකි එක් දෙයක් පමණක්, එනම් පරාධීනත්වය පමණක් පිළිගනිති; ඔව්හු විමුක්තිය විය හැකි දෙයක් වශයෙන් බාර නො ගනිති; විමුක්තිය සඳහා අවශ්‍ය තත්වයන් පෙන්වා දීම වත් ඒවා අත් කර ගැනීමට වෙර දැරීම වත් ඒ තරම් වත් නො කරති. එමතු නො ව, සමගිසම්මුතියකට එළඹීමට බර වෙන ගතිය සහ දූෂණය පිළිගන්නා අතර ම අපි වෙනත් බර වෙන ගති සහ ප්‍රපංච (විද්‍යමාන දේ) ද දකිමු; ඒවා අනුක්‍රමයෙන් ඉස්මතු වෙනවා ඇති බව ත්, දැනට ම කලින් කී ඒවා සමග දරුණු ලෙස සට්ටණය වෙමින් පවතින බව ත් අපි පෙන්වා දෙමු; ඊට අමතර ව, අපි හොඳ අතට බර වෙන ගති සහ යහපත් ප්‍රපංච ඉස්මතු වීමට අවශ්‍ය තත්වයන් පෙන්වා දෙමු; අපි සමගිසම්මුතියකට එළඹීමට බර වෙන ගතිය මැඩපැවැත්වීමට ත් දූෂිත තත්වය වෙනස් කිරීමට ත් වෙර දරමු. එහෙයින්, අශුභවාදීන් මෙන් නො ව, අපි කොහෙත් ම උකටලී නො වෙමු.

29. අප ඉක්මනින් ලබන ජයට කැමැති නැතුවා නො වේ, එක රැයින් ම ''යකුන්'' පන්නා දමන්ට කවුරු ත් කැමැති වෙනවා ඇත. එහෙත් යම් යම් නිශ්චිත තත්වයන් නොමැති විට, ඉක්මනින් ලබන ජය යනු විෂයමූල සත්තාවෙහි නො ව අයකුගේ සිතෙහි පමණක් පවතින දෙයක් වන බව ද, එය හුදු මායාවක්, බොරු න්‍යායයක් බව ද අපි පෙන්වා දෙමු. ඒ අනුව, සතුරා ගැන ත් අප ගැන ත් සියලු වටාපිටා තත්වයන් පිළිබඳ විෂයමූල සහ විස්තීර්ණ තක්සේරුවක් කොට, අපි අවසාන ජයග්‍රහණය පිණිස තිබෙන එක ම මග දිග්ගැසුණු යුද්ධයේ උපායමාර්ගය පමණක් බව පෙන්වා දෙමු, අපි ඉක්මනින් ජය ලැබීම පිළිබඳ ප්‍රතිෂ්ඨා විරහිත න්‍යායය ප්‍රතික්ෂේප කරමු. අවසාන ජයග්‍රහණය පිණිස නැති ව ම බැරි සියලු ම තත්වයන් අත් කර ගැනීමට අප වෙර දැරිය යුතු බව ත්, මේ තත්වයෝ යම් පමණක් සම්පූර්ණ ලෙස ත් යම් පමණක් ඉක්මනට ත් අත් කරගනු ලබත් ද, එපමණකින් අපට ජය ලැබීම නිසැක වන බව ත් එපමණකින් ඉක්මනට අප විසින් එය දිනා ගනු ලබන බව ත් අපි කියා සිටිමු. යුද්ධයේ මග කෙටි කළ හැකි වන්නේ මේ අයුරින් පමණක් බව අපි විශ්වාස කරමු, නිකම් අනම් මනම් සහ කොයි දේ ත් ලේසියට පහසුවට ලබා ගන්ට දරන ප්‍රයත්නයක් වන ඉක්මනින් ජය ලැබීමේ න්‍යායය අපි ප්‍රතික්ෂේප කරමු.

දිග්ගැසුණු යුද්ධයක් ඇයි?

30. අපි දැන් දිග්ගැසුණු යුද්ධය පිළිබඳ ගැටළුව පරීක්ෂා කර බලමු. ''දිග්ගැසුණු යුද්ධයක් ඇයි?'' යන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් කරා එළඹෙනු හැක්කේ චීනය ත් ජපානය ත් අතර ඇති මූලික වෙනස්කම් සියල්ල පදනම

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

කරගෙන පමණකි. නිදසුන් වශයෙන්, අප දුර්වල අර්ධ–විජිත, අර්ධ–රදළ රටක් වන අතර සතුරා ප්‍රබල අධිරාජ්‍යවාදී රටක් වේ ය'යි අප නිකම් ම කියතොත්, අපි ද ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායයට වැටීමේ අනතුරෙහි සිටිමු. කවර හෙයින් ද යත්, හුදෙක් ප්‍රබලයාට විරුද්ධ ව දුර්වලයා පොරට තිබීමෙන් ම අරගලයක් දිග්ගැසුණු එකක් වන්නට න්‍යායයෙන් වත් භාවිතාවෙන් වත් බැරි නිසා ය. කුඩා එකට විරුද්ධ ව ලොකු එක, ප්‍රතිගාමී එකට විරුද්ධ ව ප්‍රගතිශීලී එක, හෝ අල්ප අනුබලයට විරුද්ධ ව සුලබ අනුබලය පොරට තිබීමෙන් වත් එය දිග්ගැසුණු එකක් වන්නට බැරි ය. ලොකු රටක් විසින් කුඩා රටක් හෝ කුඩා රටක් විසින් ලොකු රටක් හෝ ඈඳා ගනු ලැබීම සාමාන්‍යයෙන් සිදු වන දෙයකි. ප්‍රබල නො වන ප්‍රගතිශීලි රටක් ලොකු, ප්‍රතිගාමී රටක් විසින් විනාශ කරනු ලැබීම බොහෝ විට සිදු වේ; එය ම ප්‍රගතිශීලි නමුත් ප්‍රබල නො වන හැම දෙයක් සම්බන්ධයෙන් ම සැබෑ වේ. සුලබ හෝ අල්ප අනුබලය වැදගත් නමුත් අප්‍රධාන සාධකයකි, එහි විපාකයේ ප්‍රමාණය රඳා පවතින්නේ දෙ පැත්තේ ම ඇති මූලික සාධක මත ය. එහෙයින් ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය දිග්ගැසුණු යුද්ධයක් වේ ය'යි අප කියන කල, අපේ නිගමනය ඇති කරගෙන තිබෙන්නේ දෙ පැත්තේ ම ක්‍රියාවේ යෙදී පවතින සියලු සාධකයන්ගේ පරස්පරසම්බන්ධනයන් ගෙන් ය. සතුරා ප්‍රබල ය, අපි දුර්වල ය, පරාධීන වීමේ අනතුර ඇත්තේ ය. එහෙත් වෙනත් කරුණු අතින් සතුරාට අඩුපාඩුකම් තිබේ, අපට වාසි තිබේ. අපේ පරිශ්‍රමයන් මගින් සතුරාගේ වාසි අඩු කළ හැකි ය, ඔහුගේ අඩුපාඩුකම් උග්‍ර කළ හැකි ය. අනික් අතට, අපේ පරිශ්‍රමයන් මගින් අපේ වාසි වැඩි කර ගත හැකි ය, අපේ අඩුපාඩුකම් වලට පිළියම් කළ හැකි ය. එහෙයින් අපට අවසාන ජයග්‍රහණය දිනා ගන්ට සහ පරාධීන වීම වළකන්ට හැකි වන අතර, සතුරා අන්තිමේදී පරාජය කරනු ලබනවා ඇත, ඔහුගේ මුළු අධිරාජ්‍යවාදී ක්‍රමය ම බිඳ වැටීම වළකන්ට ඔහුට බැරි වෙනවා ඇත.

31. සතුරාට එක් අංගයකින් පමණක් වාසි ඇති නමුත් සෙසු සියලු අංග වලින් අඩුපාඩුකම් තිබෙන හෙයින් ද, අපට එක් අංගයකින් පමණක් අඩුපාඩුකම් තිබෙන නමුත් සෙසු සියලු අංග වලින් වාසි තිබෙන හෙයින් ද, මෙය සමබරතාවක් ඇති කර නැත්තේ ත්, එසේ නැතිවා පමණක් නො ව, වර්තමාන අවස්ථාවෙහි ඔහුට වැඩි–බලයක් තිබෙන තත්වයක් සහ අපට අඩු–බලයක් තිබෙන තත්වයක් ඇති කර තිබෙන්නේ ත් මන්ද? උදක් ම පැහැදිලි ලෙස, මේ ප්‍රශ්නය එබඳු බාහිර ස්වරූපයට සීමා වූ අයුරකින් ගෙන සලකා බලන්ට අපට බැරි ය. සත්‍ය කාරණය නම් සතුරාගේ ශක්තිය ත් අපේ ම ශක්තිය ත් අතර අසමානකම දැනට කොතරම් මහත් ද යත්, සතුරාගේ අඩුපාඩුකම් ඔහුගේ ශක්තියට හිලව් වෙන ප්‍රමාණයකට වර්ධනය වී නැති අතර සහ දැනට වර්ධනය වෙන්ට බැරි අතර, අපට තිබෙන වාසි අපේ දුර්වලකම පිරිමහන්ට සෑහෙන ප්‍රමාණයකට වර්ධනය වී නො තිබීම සහ දැනට වර්ධනය

වෙන්ට බැරි වීම ය. එහෙයින් තවම තිබිය හැක්කේ සමබරතාව නො වේ, අසමබරතාව පමණකි.

32. විරුද්දකම් පෑමේ යුද්ධය ත් එක්සත් පෙරමුණ ත් අතනැර ගෙන යාමට අප දරන පරිශ්‍රමයන් නිසා අපේ දුර්වලකමට සහ අඩු–බලයට පටහැනි ව තිබෙන සතුරාගේ ශක්තිය සහ වැඩි–බලය තරමක් වෙනස් වී තිබෙන නමුත්, තවම මූලික වෙනස්වීමක් නම් සිදු වී නැත. එහෙයින් යුද්ධයේ එක්තරා අවස්ථාවකදී, එක්තරා ප්‍රමාණයකට සතුරා ජයග්‍රාහී වෙනවා ඇත, අප පරාජයට පත් වෙනවා ඇත. එහෙත් මේ අවස්ථාවේදී සතුරාගේ ජයග්‍රහණයන් සහ අපේ පරාජයන් ප්‍රමාණය අතින් නිශ්චිත ලෙස ම සීමා වන්නේ ත්, ඒ සීමාවන් ඉක්මවා පූර්ණ ජයග්‍රහණය හෝ පූර්ණ පරාජය කරා යා නො හැකි වන්නේ ත් මන්ද? හේතුව නම්, පළමුකොට, මුල පටන් ම සතුරාගේ ශක්තිය ත් අපේ දුර්වලකම ත් ඒකාන්ත නො ව සාපේක්ෂක වී පැවතීම ය; දෙවැනි ව විරුද්දකම් පෑමේ යුද්ධය ත් එක්සත් පෙරමුණ ත් අත නැර ගෙන යාමට අප දරන පරිශ්‍රම මේ සාපේක්ෂකතාව තව දුරට ත් වැඩි කර තිබීම ය. මුලදී තිබුණු තත්වය හා සසඳන කල, සතුරා තවම ප්‍රබල නමුත්, අහිතකර සාධකයන් ඔහුගේ ශක්තිය හීන කර ඇත; එහෙත් ඔහුගේ වැඩි–බලය විනාශ කර දැමීමට සෑහෙන ප්‍රමාණයකට තවම එය හීන වී නැත; එපරිද්දෙන් ම, අප තවම දුර්වල නමුත්, හිතකර සාධකයන් අපේ දුර්වලකමේ පාඩුව පිරිමසා ඇත; එහෙත් අපේ අඩු–බලය විපර්යාස කිරීමට සෑහෙන ප්‍රමාණයකට තවම එය පිරිමසා නැත. මෙසේ සතුරා සාපේක්ෂක වශයෙන් ප්‍රබල බව සහ අප සාපේක්ෂක වශයෙන් දුර්වල බව ත්, සතුරා සාපේක්ෂක වශයෙන් වැඩි–බලය ඇති තත්වයක සහ අප සාපේක්ෂක වශයෙන් අඩු–බලය ඇති තත්වයක සිටින බව ත් පෙනෙයි. දෙ පැත්තෙහි ම, ශක්තිය සහ දුර්වලකම ද, වැඩි–බලය සහ අඩු–බලය ද, කිසි විටෙක ඒකාන්ත වී නැත; හැර ද, යුද්ධය කරගෙන යන අතර ජපානයට විරුද්දකම් පෑම ත් එක්සත් පෙරමුණ ත් අත නැර ගෙන යාමට අප දරන පරිශ්‍රමයන් නිසා අප ත් සතුරා ත් අතර මුලදී තිබුණු බලවේගයන්ගේ සමබරතාව තව දුරට වෙනස් වී ඇත. එහෙයින්, මේ අවස්ථාවේදී සතුරාගේ ජයග්‍රහණය ත් අපේ පරාජය ත් නිශ්චිත වශයෙන් ම ප්‍රමාණයෙන් සීමා සහිත වේ; එහෙයින් යුද්ධය දිග්ගැසුණු එකක් වේ.

33. එහෙත් වටාපිටා තත්වයෝ දිගට ම වෙනස් වෙති. යුද්ධය කරගෙන යන අතර, අප නිවැරදි යුද්ධමය සහ දේශපාලන උපක්‍රම යොදතොත්, මූලධර්මය පිළිබඳ වැරදි නො කරතොත් සහ අපේ හොඳ ම පරිශ්‍රමයන් දරතොත්, සතුරාට ඇති අවාසි ත් චීනයට ඇති වාසි ත් යන දෙක ම යුද්ධය ඇද්දි ඇද්දී යන අතර වැඩෙනවා ඇත; එහි නො වැළැක්විය හැකි ප්‍රතිඵලය වශයෙන්, සංසන්දනාත්මක ශක්තිය අතින් ඇති වෙනසෙහි ද,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එහෙයින් දෙ පැත්තේ පරස්පර තත්වයෙහි ද දිගට ම වෙනස්වීමක් සිදු වෙනවා ඇත. අළුත් අවස්ථාවකට එළඹී කල, සතුරා පරාජය වීමේ ත් අපට ජය ලැබීමේ ත් ප්‍රතිඵලය ඇති කරමින්, බලවේගයන්ගේ සමබරතාවෙහි මහත් වෙනසක් සිදු වෙනවා ඇත.

34. දැනට තම ශක්තියෙන් ප්‍රයෝජන ගන්ට සතුරාට තවම පුළුවන්කම තිබේ; අපේ විරුද්දකම් පෑමේ යුද්ධය තවම ඔහු මූලික වශයෙන් දුර්වල කර නැත, ඔහුගේ මිනිස්බලයේ ත් ද්‍රව්‍යමය වත්පොහොසත්කම් වල ත් මදිකම තවම ඔහුගේ පහරදීම වළකන තරම් නො වේ; එසේ නො වෙනවා මතු නො ව, ඒ පහරදීම එක්තරා පමණකට නඩත්තු කරන්ට ද තවම ඒවාට හැකි ය. ජපානය තුළ ම තිබෙන පංක්ති ප්‍රතිඝට්ටණ ත් චීන ජාතියේ විරුද්දකම් පෑම ත් යන දෙක ම අධික කරන සාධකයක් වන, ඔහුගේ යුද්ධයේ ප්‍රතිගාමී සහ ම්ලේච්ඡ ස්වභාවය ඔහුගේ ඉදිරිගමනට එකහෙළා ම බාධා කරන තත්වයක් තවම ඇති කර නැත. සතුරා ජාත්‍යන්තර වශයෙන් තනි වීම වැඩි වේගෙන යයි, එහෙත් තවම සම්පූර්ණ වී නැත. අපට උදව් දෙනවා ය'යි අඟවා ඇති බොහෝ රටවල් වල, යුද්ධෝපකරණ සහ යුද්ධ ද්‍රව්‍ය නිපදවීම සහ විකිණීම කරන්නා වූ ද හුදෙක් ලාභ ලැබීමට ම නැමී සිටින්නා වූ ද ධනහිමියෝ තවම ජපානයට යුද්ධෝපකරණ සහ ද්‍රව්‍ය විශාල තොග සපයති[14], ඒ රටවල් වල ආණ්ඩු[15] ජපානයට දඬුවම් කරන ප්‍රායෝගික පියවර ගැනීමෙහි ලා සෝවියට් සංගමය හා එකතු වීමට තවම අදිමදි කරති. මේ සියල්ලෙන් ම නිගමනය වන්නේ අපේ විරුද්දකම් පෑමේ යුද්ධය ඉක්මනින් ජය ගත නො හැකි බව සහ එය දිග්ගැසුණු යුද්ධයක් පමණක් විය හැකි බව ය. චීනය සම්බන්ධයෙන්, විරුද්දකම් පෑමේ දස මස තුළ යුද්ධමය, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික පරිමණ්ඩලයන්හි ඇගේ අබලදුබලකම අඩු වී කිසියම් දියුණුවක් ඇති වී තිබෙන නමුදු, ඒ දියුණුව සතුරාගේ පහරදීම වැළකීම පිණිස ත් අපගේ පෙරළා–පහරදීම සූදානම් කිරීම පිණිස ත් උවමනා කරන තත්වයෙන් තවම බොහෝ ඈත ය. එමතු නො ව, ප්‍රමාණාත්මක වශයෙන් කතා කරන කල, යම් යම් අලාභ විඳ දරා ගන්ට අපට සිදු වී තිබේ. අපට හිතකර වූ සියලු සාධකයන් සක්‍රිය ප්‍රතිවිපාකයක් ඇති කරන නමුත්, එය, අප සුවිශාල පරිශ්‍රමයක් දරතොත් මිස, සතුරාගේ පහරදීම නතර කරන්ට ත් අපේ පෙරළා–පහරදීම පිණිස සූදානම් වන්ට ත් ප්‍රමාණවත් නො වෙනවා ඇත. සියරටෙහි දූෂණය නැති කිරීම සහ ප්‍රගතිය වේගවත් කිරීම වත්, එතෙර ජපානයට පක්ෂ බලවේග මැඩලීම සහ ජපන්–විරෝධී බලවේග පුළුල් කිරීම වත් තවම මුදුන්පත් කළ සත්‍ය කරුණු නො වේ. මේ සියල්ලෙන් නිගමනය වන්නේ අපේ යුද්ධය ඉක්මනින් ජය ගත නො හැකි බව සහ එය දිග්ගැසුණු යුද්ධයක් පමණක් විය හැකි බව ය.

දිග්ගැසුණු යුද්ධයේ අවස්ථා තුන

35. චීන–ජපන් යුද්ධය දිග්ගැසුණු එකක් වන හෙයින් ද, අවසාන ජයග්‍රහණය චීනය සතු වෙනවා ඇති හෙයින් ද, මේ දිග්ගැසුණු යුද්ධය අවස්ථා තුනක් තුළින් ගමන් කරනවා ඇති බව හේතු සහගත ලෙස කල්පනා කළ හැකි ය. පළමුවැනි අවස්ථාව සතුරාගේ උපායමාර්ගික පහරදීම ත් අපේ උපායමාර්ගික ආරක්ෂාවීම ත් පිළිබඳ වකවනුව ඇතුළත් කර ගනී. දෙවැනි අවස්ථාව සතුරාගේ උපායමාර්ගික තහවුරුවීම ත් අප පෙරළා-පහරදීම පිණිස සූදානම් වීම ත් පිළිබඳ වකවනුව වෙනවා ඇත. තුන්වැනි අවස්ථාව අපේ උපායමාර්ගික පෙරළා–පහරදීම සහ සතුරාගේ උපායමාර්ගික පසුබැසීම පිළිබඳ වකවනුව වෙනවා ඇත. මේ අවස්ථා තුනේදී ඇත්ත වශයෙන් ම ඇති වන තත්වය කල්තබා කියන්ට කොහෙත් ම බැරි ය; එහෙත් යුද්ධයේදී කරුණු බර වන යම් යම් ප්‍රධාන අත් වර්තමාන තත්වය අනුව පෙන්වා දෙන්ට ඉඩ තිබේ. සිද්ධීන් ඇත්තට ම ගමන් කරන මග, බොහෝ හැරීම් සහ පෙරළීම් ඇති ව, අතිශයින් ම ආඪ්‍ය සහ විවිධ වෙනවා ඇත; චීන–ජපන් යුද්ධය සඳහා කේන්ද්‍රයක් හරිගස්සන්ට කිසිවකුට බැරි ය; එසේ ද වුව යුද්ධයේ කරුණු බර වන අත් පිළිබඳ දළ කටුසටහනක් සකස් කිරීම යුද්ධයේ උපායමාර්ගික මගපෙන්වීම පිණිස අවශ්‍ය ය. අපේ කටුසටහන පසු ව ඇති වන සත්‍ය කරුණු හා සම්පූර්ණයෙන් නො ගැලපෙන්නට ඉඩ ඇති නමුත්, ඒ සත්‍ය කරුණු විසින් සංශෝධනය කරනු ලබනවා ඇති නමුත්, ස්ථිර ලෙස ත් අරමුණක් ඇතිව ත් දිග්ගැසුණු යුද්ධයට උපායමාර්ගික මගපෙන්වීම කරනු පිණිස ඒ කටුසටහන සකස් කිරීම අවශ්‍ය ය.

36. පළමුවැනි අවස්ථාව තවම අවසන් වී නැත. සතුරාගේ සැලැස්ම වී ඇත්තේ කැන්ටන්, වූහාන් සහ ලාන්චව් යන නගර අල්ලාගෙන, මේ තුන් තැන එකට යා කිරීම ය. මේ අරමුණ මුදුන්පත් කරනු පිණිස, අඩුම ගණනේ ඩිවිසන් පණහක්, නැතහොත් මිනිසුන් පසළොස් ලක්ෂයක් පමණ, යෙදීමට ත්, අවුරුදු එක හමාරක සිට දෙකක් පමණ වන කාලයක් ගත කිරීමට ත්, යෙන් කෝටි දහසකට වඩා වියදම් කිරීමට ත් සතුරාට සිදු වෙනවා ඇත. එතරම් ඇතුළට කාවැදීමේදී, හිතන්ට පවා බැරි තරම් විනාශදායක ප්‍රතිවිපාකයන් ඇතිව, ඔහු ඉමහත් දුෂ්කරතාවන්ට මුණ පානවා ඇත. කැන්ටන්–හැන්කව් දුම්රිය මාර්ගයේ ත් සියාන්–ලාන්චව් මහා මාර්ගයේ ත් මුළු දිග ම අල්ලා ගැනීමට දරන ප්‍රයත්නය සම්බන්ධයෙන්, භයානක සටන් කරන්ට ඔහුට සිදු වෙනවා ඇත, එසේ පවා තම අරමුණ සපුරා මුදුන්පත් කරගන්ට ඔහුට බැරි වෙන්ට ඉඩ තිබේ. එහෙත් අපේ සටන්ව්‍යාපාරාත්මක සැලැස්ම කෙටුම්පත් කිරීමේදී අපි සතුරා ඒ තුන් තැන සහ යම් යම් අතිරේක ප්‍රදේශ පවා අල්ලාගෙන, ඒවා එකට ඇඳන්නට ඉඩ තිබේ යන අනුමාන කල්පනාව අපේ පදනම කර ගත යුත්තෙමු; අපි, ඔහු එසේ කළත්, ඔහු සමග ඔට්ටු වීමට අපට හැකි

LIBERATION BASE

වන සේ, දිග්ගැසුණු යුද්ධයක් පිළිබඳ කටයුතු පිළියෙළ කළ යුත්තෙමු. මේ අවස්ථාවේදී අප විසින් යෙදිය යුතු සටන් ආකාරය, ගොරිල්ලා සංග්‍රාමය සහ ස්ථානගත සංග්‍රාමය අතිරේක වශයෙන් ඇතිව, ප්‍රාථමික වශයෙන් ජංගම සංග්‍රාමය විය යුතු ය. කුඕමින්තාං යුද්ධපාලකයන්ගේ මනෝමූල වැරදි කරණකොටගෙන, මේ අවස්ථාවේ මුල් අවධියේදී ස්ථානගත සංග්‍රාමයට ප්‍රාථමික කොටස පවරනු ලැබී ය; එහෙත් අවස්ථාව මුළු එකක් වශයෙන් ගෙන බලන කල එය අතිරේක වේ. මේ අවස්ථාවේදී, චීනය දූනට ම පුළුල් එක්සත් පෙරමුණක් ගොඩනඟා, පෙර නුවූ විරූ විධියේ සමගියක් ඇති කරගෙන සිටී. සතුරා ඉක්මනින් විසඳුමක් ලබා ගැනීම පිණිස වන තම සැලැස්ම මුදුන්පත් කර ගැනීම පිණිස ත් වැඩි මහන්සියක් නැතිව මුළු රට ම ජය ගැනීම පිණිස ත් දරණ ප්‍රයත්නයේදී චීනය යටත් වීමට පොළඹනු පිණිස නීච නින්දිත උපායන් යොදු තිබෙන නමුත්, එසේ ම දිගට ම යොදනවා ඇති නමුත්, ඔහුගේ ප්‍රයත්නය මේ වන තුරු ව්‍යර්ථ වී ඇත, අනාගතයේදී සාර්ථක වන පාටක් ද නැත. මේ අවස්ථාවේදී, චීනයට සැලකියයුතු තරම් අලාභහානි විඳින්නට සිදු වන නමුත්, ඈ සැලකියයුතු තරම් ප්‍රගතියක් ද සලසා ගන්නවා ඇත; දෙවැනි අවස්ථාවේදී ඈ දිගට ම කරන විරුද්දකම් පෑමට ප්‍රධාන පදනම වෙනවා ඇත්තේ මේ ප්‍රගතිය යි. වර්තමාන අවස්ථාවෙහි, සෝවියට් සංගමය සැලකියයුතු ප්‍රමාණයක ආධාර දූනට ම චීනයට දී ඇත. සතුරාගේ පැත්තෙහි, පිරිහෙන චිත්තශක්තියක් පිළිබඳ ලකුණු දූනට ම දක්නට තිබේ; ඔහුගේ හමුදුව පහර දෙන වේගය මේ අවස්ථාවේ මැද අවධියේදී මුල් අවධියේදී තිබුණාට වඩා අඩු ය, අවසාන අවධියේදී එය තවත් අඩු වෙනවා ඇත. ඔහුගේ මුදල් කටයුතු වල ත් ආර්ථිකයෙහි ත් හෙම්බත් වීමේ ලකුණු පහළ වෙන්ට පටන් ගෙන ඇත; යුද්ධ–විඩාව ඔහුගේ ජනයා අතර ත් භටකණ්ඩායම් අතර ත් ඇති වෙන්ට පටන් ගෙන ඇත; වැලිත් යුද්ධයේ සුක්කානම බාර ව සිටින කල්ලිය තුළ, ''යුද්ධ කලකිරීම්'' ප්‍රකට වීමට පටන් ගෙන ඇත, යුද්ධයේ මතු බලාපොරොත්තු ගැන අශුභවාදය වැඩෙන්ට වී ඇත.

37. දෙවැනි අවස්ථාව උපායමාර්ගික ඇණහිටීමක් පිළිබඳ අවස්ථාවක් ලෙස නම් කළ හැකි ය. පළමුවැනි අවස්ථාවේ අන්තිම කෙළවරේදී, සතුරාට භටකණ්ඩායම් හිඟ වීම ත් අපේ දැඩි විරුද්දකම් පෑම ත් කරණකොටගෙන තම උපායමාර්ගික පහරදීම නවත්වන යම් යම් තැන් නියම කරන්නට සතුරාට බලෙන් ම සිදු වෙනවා ඇත, මේ නවත්වන තැන් කරා එළඹී කල, ඔහු තම උපායමාර්ගික පහරදීම නතර කොට, තමා අල්ලාගත් ප්‍රදේශ සුරක්ෂිත කිරීමේ අවස්ථාවට පිවිසෙනවා ඇත. දෙවැනි අවස්ථාවේදී, සතුරා, චීන ජනතාව අන්තයට ම කොල්ලකන අතර රූකඩ ආණ්ඩු පිහිටුවීමේ වංචනික ක්‍රමය මගින් මේ ප්‍රදේශ සුරක්ෂිත කර ගැනීමට ත් ඒවා තමාට ම අයත් කර ගැනීමට ත් ප්‍රයත්න දරනවා ඇත; එහෙත් යළි ත් ඔහුට මුරණ්ඩු ගොරිල්ලා සංග්‍රාමයට මුහුණ දෙන්නට

සිදු වේ. සතුරාගේ පසුමුණ අනාරක්ෂිත ය යන සත්‍ය කාරණය වාසියක් කර ගනිමින්, පළමුවැනි අවස්ථාවේදී අපේ ගොරිල්ලා සංග්‍රාමය ව්‍යාප්ත ලෙස වර්ධනය වෙනවා ඇත, සතුරා විසින් ඔහුගේ අල්ලාගත් ප්‍රදේශ තහවුරු කිරීමට බරපතල ලෙස තර්ජනය කරමින්, බොහෝ කඳවුරු ප්‍රදේශ පිහිටුවනු ලබනවා ඇත; එහෙයින් දෙවැනි අවස්ථාවේදී ත් පුළුල් ලෙස පැතුරුණු සටන් දිගට ම පවතිනවා ඇත. මේ අවස්ථාවේදී, අපේ සටන් ආකාරය, ජංගම සංග්‍රාමය අතිරේක ව පවතිමින්, ප්‍රාථමික වශයෙන් ගොරිල්ලා සංග්‍රාමය වෙනවා ඇත. චීනයට මේ අවස්ථාවේදී ත් විශාල නිත්‍ය හමුදුවක් සිටිනවා ඇත; එහෙත්, එක් අතකින්, සතුරා තමා විසින් අල්ලාගෙන තිබෙන මහ නගර වල ත් ප්‍රධාන ගමනාගමන මාර්ග දිගට ත් උපායමාර්ගික වශයෙන් ආරක්ෂාවීමේ තත්වයක් ගන්නවා ඇති නිසා ද, අනික් අතින්, චීනය එතෙක් ම කාර්මික වශයෙන් ප්‍රමාණවත් පරිදි සජ්ජිත වී නො සිටිනවා ඇති නිසා ද, වහා ම උපායමාර්ගික පෙරළා–පහරදීම දියත් කිරීම අමාරු බව ඇට පෙනී යනවා ඇත. සතුරාට විරුද්ධ ව පෙරමුණු ආරක්ෂණයෙහි යෙදී සිටින භටකණ්ඩායම් හැර, අපේ බලසේනාවෝ සංසන්දනාත්මක වශයෙන් විසිරී සිටින ලෙස වින්‍යාස කොට විශාල ගණනින් සතුරාගේ පසුමුණට මාරු කරනු ලබනවා ඇත; සතුරා ඇත්තට ම අල්ලාගෙන නැති සියලු ප්‍රදේශ තම කඳවුරු කර ගනිමින් ද, ජනතාවගේ ප්‍රාදේශික සන්නද්ධ බලසේනාවන් සමග උචිත ලෙස සම්බන්ධ වෙමින් ද, ඔව්හු, දූන් ශාන්සි ප්‍රදේශයෙහි කරගෙන යන්නාක් මෙන්, සතුරා ජංගම සංග්‍රාමයේදී විනාශ කරනු පිණිස හැකි තරම් දුරට ඔහු ගමනෙහි යොදවා තබමින්, සතුරා විසින් අල්ලාගෙන ඇති ප්‍රදේශ වලට විරුද්ධ ව ව්‍යාප්ත දරුණු ගොරිල්ලා සංග්‍රාමය දියත් කරනවා ඇත. දෙවැනි අවස්ථාවෙහි කරන සටන් නිර්දය වෙනවා ඇත, රට බරපතල විනාශයකට භාජන වෙනවා ඇත. එහෙත් ගොරිල්ලා සංග්‍රාමය සාර්ථක වෙනවා ඇත; එය හොඳින් කරගෙන ගියොත්, සතුරාට පුළුවන් වෙනවා ඇත්තේ ඔහු අල්ලාගත් භූමිප්‍රදේශයෙන් තුනෙන් එකක් තරම තබා ගන්ට පමණකි; ඉතිරි තුනෙන් දෙක අපේ අතේ තිබෙනවා ඇත; මෙය සතුරාට ලොකු පරාජයක් ද, චීනයට ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයක් ද වෙනවා ඇත. ඒ වන විට සතුරා අල්ලාගෙන තිබෙන භූමිප්‍රදේශය මුළු එකක් වශයෙන් තුන් ගණයකට වැටෙනවා ඇත; පළමුවැනි ව, සතුරු කඳවුරු ප්‍රදේශ; දෙවැනි ව, ගොරිල්ලා සංග්‍රාමය පිණිස තිබෙන අපේ කඳවුරු ප්‍රදේශ; තුන්වැනි ව, අල්ලා ගැනීමට දෙගොල්ල ම පොර අල්ලන ගොරිල්ලා ප්‍රදේශ. මේ අවස්ථාව පවතින කාලය අප ත් සතුරා ත් අතර බලවේගයන්ගේ සමබරතාවෙහි ඇති වන වෙනසේ ප්‍රමාණය උඩ ත් ජාත්‍යන්තර තත්වයෙහි ඇති වන වෙනස්වීම් උඩ ත් රඳා පවතිනවා ඇත; සාමාන්‍ය වශයෙන් කියන කල, මේ අවස්ථාව සංසන්දනාත්මක වශයෙන් දිගු කලක් පවතිනවා දැකීමට ත් එහි දුක් හිරිහැර විඳ දරා ගැනීමට ත් අපි සූදානම් ව සිටිය යුත්තෙමු. එය චීනයට ඉතා වේදනාදායක වකවානුවක්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

වෙනවා ඇත; ලොකු ගැටළු දෙක වෙනවා ඇත්තේ ආර්ථික දුෂ්කරතා සහ ද්‍රෝහින් කරන භේද භින්න කිරීමේ වැඩකටයුතු ය. සතුරා චීනයේ එක්සත් පෙරමුණ බිඳ දැමීමට මුළු වෙර යොදා උත්සාහ කරනවා ඇත, සතුරා අල්ලාගෙන සිටින සියලු ප්‍රදේශ වල තිබෙන ද්‍රෝහි සංවිධාන ඊනියා ''එක්සත් ආණ්ඩුවක්'' තුළ එකට එකතු වෙනවා ඇත. මහා නගර නැති වීම ත් යුද්ධයේ කම්කටුළු ත් හේතු කොට ගෙන, අපේ ශ්‍රේණි තුළ සිටින වැනෙන සුලු කොටස් සමගිසම්මුතිය පිණිස කෑමොර ගානවා ඇත; අශුභවාදය බරපතල ප්‍රමාණයකට වැඩෙනවා ඇත. එවිට එකා මෙන් එක්සත් වී නොපසුබට උත්සාහයෙන් යුද්ධය අත නැර කරගෙන යාමට මුළු ජනතාව උනන්දු කිරීම ද එක්සත් පෙරමුණ පළල් කිරීම සහ තහවුරු කිරීම, අශුභවාදය සහ සමගිසම්මුතිය පිළිබඳ සියලු අදහස් පිස දැමීම, දුෂ්කර අරගලයක් කරන්ට අධිෂ්ඨානය දියුණු කිරීම සහ අළුත් යුද්ධ–කාල ප්‍රතිපත්ති ක්‍රියාවෙහි යෙදීම සහ, එසේ දුක් හිරිහැර විඳ දරා ගැනීම ද අප සතු කර්තව්‍ය වෙනවා ඇත. දෙවැනි අවස්ථාවේදී, එක්සත් ආණ්ඩුවක් ස්ථිර ලෙස පවත්වාගන්නා ලෙස මුළු රටට ම ආයාචනය කරන්ට අපට සිදු වෙනවා ඇත, භේද ඇති කරනවාට විරුද්ධ වීමට ත් සටන් කිරීමේ ශිල්පක්‍රම ක්‍රමානුකූල ලෙස දියුණු කිරීමට, සන්නද්ධ බලසේනාවන් ප්‍රතිසංස්කරණය කිරීමට, මුළු ජනතාව උනන්දු කිරීමට සහ පෙරළා–පහරදීම පිණිස සූදනම් වීමට ත් අපට සිදු වෙනවා ඇත. ජාත්‍යන්තර තත්වය ජපානයට තව තව ත් අහිතකර වෙනවා ඇත; 'වෙච්ච දේ වෙලා ඉවරයි' යන ධර්මයට හරියන හැටියට හැඩ ගැහෙන චේම්බර්ලේන් වර්ගයේ ''යථාර්ථවාදය'' ගැන කතා තිබෙන්ට පුළුවන් නමුත්, ප්‍රධාන ජාත්‍යන්තර බලවේග චීනයට වැඩි වැඩියෙන් ආධාර දීම දෙසට බර වෙනවා ඇත. අග්නිදිග ආසියාවට ත් සයිබීරියාවට ත් ජපානයේ තර්ජනය වඩා ත් විශාල වෙනවා ඇත, තවත් යුද්ධයක් පවා ඇති වෙන්ට ඉඩ ඇත. ජපානය සම්බන්ධයෙන්, ඇගේ ඩිවිසන් විසි තිස් ගණන් ගොඩගන්ට බැරි තරමට චීනයෙහි එරෙනවා ඇත. පුළුල් ලෙස පැතුරුණු ගොරිල්ලා සංග්‍රාමය ත් ජනතාවගේ ජපන්–විරෝධී ව්‍යාපාරය ත් මේ විශාල ජපන් සේනාව බෙහෙවින් ම හීන කරමින් ද, එසේ ම එහි ගෙදර යන්ට ආසාවෙන් පෙළෙන ගතිය, යුද්ධ–විඩාව සහ යුද්ධ–විරෝධී හැඟීම පවා වැඩීමට රුකුල් දෙමින් එහි චිත්තශක්තිය කඩ කඩ කොට හරිමින් ද, එය වෙහෙසට පත් කරනවා ඇත. චීනය කොල්ල කෑමේදී ජපානය කිසි ම ප්‍රතිඵලයක් කොහෙත් ම අත්පත් නො කර ගන්නවා ඇතැ'යි කීම වැරදි වෙන්ට පුළුවන් නමුත්, ප්‍රාග්ධනය හිඟ වීම ත් ගොරිල්ලා සංග්‍රාමයෙන් හිරිහැර කරනු ලැබීම ත් නිසා, සීඝ්‍ර සහ සැලකිය යුතු තරම් ප්‍රතිඵල අත් කර ගන්ට ඇට පුළුවන්කමක් නැත. මේ දෙවැනි අවස්ථාව සමස්ත යුද්ධයේ සංක්‍රාන්තික අවස්ථාව වෙනවා ඇත; එය ඉතා ම පීඩාකර අවස්ථාව නමුත් ඉතා ම වැදගත් අවස්ථාව ද වෙනවා ඇත. චීනය ස්වාධීන රටක් වෙනවා ද, නැතහොත්

විජිතයක් බවට හෙළනු ලබනවා ද යන්න නිශ්වය කරනු ලබනවා ඇත්තේ පළමුවැනි අවස්ථාවේදී මහ නගර රැකගැනීම හෝ නැතිවීම මගින් නො ව, දෙවැනි අවස්ථාවේදී මුළු ජාතිය ම දරන වෙහෙස මහන්සියේ ප්‍රමාණය මගින් ය. විරුද්දකම් පෑමේ යුද්ධයෙහි, එක්සත් පෙරමුණෙහි සහ දිග්ගැස්සුණු යුද්ධයෙහි අත නැර යෙදී සිටින්නට අපට හැකි වේ නම්, චීනය ඒ අවස්ථාවේදී දුර්වලකමින් ශක්තියට හැරෙන්නට බලය ලබා ගන්නවා ඇත. එය, චීනයේ විරුද්දකම් පෑමේ යුද්ධය නැමති තුන්–ජවනිකා නාට්‍යයේ දෙවැනි ජවනිකාව වෙනවා ඇත. මුළු නළු නිළි පිරිසේ පරිශ්‍රමයන් මගින් ඉතා ම ප්‍රභාමත් අන්තිම ජවනිකාවක් රඟපාන්ට පුළුවන් වෙනවා ඇත.

38. තුන්වැනි අවස්ථාව අපේ නැති වූ භූමිප්‍රදේශ ආපසු ලබා ගැනීමට පෙරළා–පහරදීම කරන අවස්ථාව වෙනවා ඇත. ඒවා ආපසු ලබා ගැනීම ප්‍රධාන වශයෙන් ඊට කලින් අවස්ථාවේදී චීනය විසින් ගොඩනගාගෙන තිබෙන්නා වූ ත් තුන්වැනි අවස්ථාවේදී දිගට ම වැඩෙනවා ඇත්තා වූ ත් ශක්තිය මත රඳා පවතිනු ඇත. එහෙත් චීනයේ ශක්තිය පමණක් ම නො සෑහෙනවා ඇත, ජාත්‍යන්තර බලවේගයන් ගෙන් ලැබෙන අනුබලය මත සහ ජපානය තුළ ඇති වන වෙනස්වීම් මත ද විශ්වාසය තබන්ට අපට සිදු වෙනවා ඇත; නො එසේ නම්, අපට ජය ගන්ට බැරි වෙනවා ඇත; මෙය ජාත්‍යන්තර ප්‍රචාරක කටයුතු සහ රාජ්‍යදූතතන්ත්‍රය අතින් චීනය විසින් කළ යුතු ව තිබෙන වැඩ වැඩි කරයි. තුන්වැනි අවස්ථාවේදී, අපේ යුද්ධය තව දුරට ත් උපායමාර්ගික ආරක්ෂාවීමේ යුද්ධයක් නො වෙනවා ඇත, උපායමාර්ගික පහරදීම් මගින් ප්‍රකටභාවයට පත් වන උපායමාර්ගික පෙරළා–පහරදීමේ යුද්ධයක් බවට හැරෙනවා ඇත; එය තව දුරට ත් උපායමාර්ගික වශයෙන් ඇතුල් පේළි වල නො කරනු ලබනවා ඇත, අනුක්‍රමයෙන් උපායමාර්ගික වශයෙන් බාහිර පේළි වලට මාරු කරනු ලබනවා ඇත. අප යාලූ ගඟ තෙක් ම සටන් කරගෙන යන තුරු මේ යුද්ධය අවසාන ය'යි සැලකිය හැකි නො වේ. තුන්වැනි අවස්ථාව දිග්ගැස්සුණු යුද්ධයේ අන්තිම අවස්ථාව වෙනවා ඇත; කෙළවර තෙක් ම අත නැර යුද්ධය කරගෙන යාම ගැන අප කතා කරන කල, අප අදහස් කරන්නේ මේ අවස්ථාව මුළුමනින් ම ඉක්මවා යාම ය. අපේ සටන් කිරීමේ ප්‍රාථමික ආකාරය තවම ත් ජංගම සංග්‍රාමය වෙනවා ඇත. එහෙත් ස්ථානගත සංග්‍රාමය ද වැදගත් තත්වයකට නඟිනවා ඇත. ඉස්මතු වී පවතින වටාපිටා තත්වයන් නිසා පළමුවැනි අවස්ථාවේදී ස්ථානගත ආරක්ෂණය වැදගත් ලෙස සැලකිය හැකි නො වන නමුදු, වෙනස් වූ තත්වයන් ද කර්තව්‍යයේ උවමනාවන් ද නිසා තුන්වැනි අවස්ථාවේදී ස්ථානගත ප්‍රහරණය උදක් ම වැදගත් වෙනවා ඇත. තුන්වැනි අවස්ථාවේදී ගොරිල්ලා සංග්‍රාමය, ජංගම සහ ස්ථානගත සංග්‍රාමයට අතිරේක ව සිටිමින්, යළි ත් උපායමාර්ගික අනුබලය සපයනවා ඇත; එහෙත් එය දෙවැනි අවස්ථාවේදී මෙන් ප්‍රාථමික ආකාරය නො වෙනවා ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

39. යුද්ධය දිග්ගැසුණු එකක් වන බව ත් එහි විපාකය වශයෙන් ස්වභාවයෙන් නිර්දය වන බව ත් මෙසේ පැහැදිලි වේ. මුළු චීනය ම ගිලගන්ට සතුරාට බැරි වෙනවා ඇත, නමුත් බොහෝ ස්ථාන සැලකිය යුතු කලකට අල්ලාගන්ට ඔහු සමත් වෙනවා ඇත. ජපනුන් ඉක්මනින් පිටමං කරන්ට චීනයට බැරි වෙනවා ඇත, නමුත් චීනයේ භූමිප්‍රදේශයෙන් වඩා ලොකු කොටස ඇගේ අතේ ම තිබෙනවා ඇත. අන්තිමේදී සතුරා පරදිනවා ඇත, අප දිනනවා ඇත; නමුත් අපට ගමන් කරන්නට පාරේ අමාරු හරියක් තිබෙනවා ඇත.

40. මේ දීර්ඝ සහ නිර්දය යුද්ධයේදී චීන ජනතාව පන්නරය තබනු ලබනවා ඇත. යුද්ධයට සහභාගි වන දේශපාලන පක්ෂ ද අයෝමය බවට පත් වෙනවා ඇත, උරගා බලනු ලබනවා ඇත. එක්සත් පෙරමුණ අත නැර ගෙන යා යුතු ම ය; අපට යුද්ධය අත නැර ගෙන යා හැකි වන්නේ එක්සත් පෙරමුණ අත නැර ගෙන යාමෙන් පමණකි; අපට අවසාන ජය දිනා ගත හැකි වන්නේ එක්සත් පෙරමුණ ත් යුද්ධය ත් අත නැර ගෙන යාමෙන් පමණකි. එසේ පමණකි සියලු දුෂ්කරතා ජය ගත හැකි වන්නේ. පාරේ අමාරු හරිය ගමන් කළ පසු අප ජයග්‍රහණයේ මහා මාර්ගයට අවතීර්ණ වෙනවා ඇත. මෙය යුද්ධයේ ස්වාභාවික තර්කශාස්ත්‍රය වේ.

41. අවස්ථා තුනේදී පරස්පර ශක්තියේ වෙනස්වීම් මතු දක්වන මාර්ග ඔස්සේ සිදුවේගෙන යනවා ඇත. පළමුවැනි අවස්ථාවේදී, සතුරා බලයෙන් වැඩි වේ, අපි බලයෙන් අඩු වෙමු. අපේ අඩු–බලය සම්බන්ධයෙන් විරුද්දකම් පැමේ යුද්ධය පටන් ගත් කාලයේ සිට මේ අවස්ථාවේ කෙළවර තෙක් වෙනස් වර්ග දෙකකට අයත් වෙනස්වීම් අපි ගණනට ගත යුත්තෙමු. පළමුවැනි වර්ගය වඩාත් නරක අතට වෙනස්වීමකි. මුලදී ම තිබෙන චීනයේ අඩු–බලය යුද්ධයෙන් සිදුවන අලාභයන්, එනම්, භූමිප්‍රදේශය, ජනගහණය, ආර්ථික ශක්තිය, යුද්ධමය ශක්තිය සහ සංස්කෘතික ආයතන යන මේවායෙහි සිදු වන අඩුවීම්, නිසා වඩා ත් බරපතල වෙනවා ඇත. පළමුවැනි අවස්ථාවේ අවසාන හරිය වන විට, මේ අඩුවීම, වෙසෙසින් ආර්ථික අංශයෙහි, සැලකිය යුතු තරම් විය හැකි ය. මේ කරුණ ඇතැම් මිනිසුන් විසින් ජාතික පරාධීනත්වය ත් සමගිසම්මුතිය ත් පිළිබඳ තම න්‍යායයන්ට පදනම වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබනවා ඇත. එහෙත් දෙවැනි වර්ගයේ වෙනස්වීම, එනම් හොඳ අතට වෙනස්වීම ද සැලකිල්ලට ගත යුතු ය. යුද්ධයේදී ලබන අත්දැකීම, සන්නද්ධ බලසේනාවන් විසින් සලසා ගනු ලබන ප්‍රගතිය, දේශපාලන ප්‍රගතිය, ජනතාව ක්‍රියාවට උනන්දු වීම, සංස්කෘතිය අළුත් අතකට වර්ධනය වීම, ගොරිල්ලා සංග්‍රාමය පහළ වීම, ජාත්‍යන්තර අනුබලය වැඩි වීම යනාදිය ඊට ඇතුළත් වේ. පළමුවැනි අවස්ථාවේදී පල්ලම් බහින දේ නම්, ප්‍රධාන වශයෙන් ප්‍රමාණාත්මක වශයෙන් ප්‍රකට වෙමින්, පරණ ප්‍රමාණය සහ පරණ ගුණය ය; ඉහළ නගින

දේ නම්, ප්‍රධාන වශයෙන් ගුණාත්මක වශයෙන් ප්‍රකට වෙමින්; අළුත් ප්‍රමාණය සහ අළුත් ගුණය ය. දිග්ගැසුණු යුද්ධයක් කිරීමට සහ අවසාන ජයග්‍රහණය දිනා ගැනීමට අපට ඇති හැකියාවට පදනම සපයන්නේ දෙවැනි වර්ගයේ වෙනස්වීම යි.

42. පළමුවැනි අවස්ථාවේදී, සතුරාගේ පැත්තෙහි ද දෙ වර්ගයක වෙනස්වීම් සිදුවේගෙන යයි. පළමුවැනි වර්ගය නරක අතට වෙනස්වීමකි. සිය දහස් ගණන් සෙබළුන් මැරුම් කෑම හා තුවාල ලැබීම, ආයුධ සහ වෙඩි බෙහෙත් කෙළවරක් නැතිව වැය වීම, භටයන්ගේ චිත්තශක්තිය පිරිහීම, සියරටෙහි ජනතාව අතර අතෘප්තිය පැතිරීම, වෙළඳාම පටු වීම, යෙන් කෝටි දහසකට වඩා වියදම් වීම, ලෝක මතය විසින් හෙළා දකිනු ලැබීම යනාදියෙහි එය ප්‍රකට වේ. මේ ප්‍රවණතාව ද දිග්ගැසුණු යුද්ධයක් කිරීමට ත් අවසාන ජයග්‍රහණය දිනා ගැනීමට ත් අපට ඇති හැකියාවට පදනමක් සපයයි. එහෙත් අපි සතුරාගේ පැත්තෙහි ඇති දෙවැනි වර්ගයේ වෙනස්වීම, එනම් හොඳ අතට වෙන වෙනස්වීමක්, ඒ කියන්නේ, ඔහු භූමිප්‍රදේශය, ජනගහණය සහ වත්පොහොසත්කම් අතින් පළල් වීම ද, එසේ ම ගණනට ගත යුත්තෙමු. මෙය ද අපේ විරුද්දකම් පැමේ යුද්ධයේ දිග්ගැසුණු ස්වභාවය ත් ඉක්මනින් ජය ලබන්ට කොහෙත් ම බැරිකම ත් සඳහා පදනමක් වේ; එහෙත් ඒ අතර ම ඇතැම් මිනිසුන් එය ද ජාතික පරාධීනත්වය ත් සමගිසම්මුතිය ත් පිළිබඳ තම න්‍යායයන් සඳහා පදනමක් වශයෙන් පාවිච්චි කරනවා ඇත. කෙසේ වෙතත්, සතුරාගේ පැත්තෙහි මේ හොඳ අතට වන වෙනස්වීමේ අනිස්ථිර සහ අඩාල ලක්ෂණය අප විසින් ගණනට ගත යුතු ය. ජපානය ඇදවැටීම දෙසට වේගයෙන් ඇදී යන අධිරාජ්‍යවාදී බලවතෙකි. ඈ චීනයේ භූමිප්‍රදේශය අල්ලා ගැනීම තාවකාලික ය. චීනයෙහි ගොරිල්ලා සංග්‍රාමය වේගබල සම්පන්න ලෙස වැඩීම ජපානය විසින් ඇත්ත වශයෙන් ම කරන අල්ලාගැනීම පටු කලාප වලට සීමා කරනවා ඇත. එමතු නො ව, ජපානය චීන භූමිප්‍රදේශය අල්ලාගැනීම ජපානය ත් සෙසු විදේශීය රටවලුත් අතර ප්‍රතිවිරෝධයන් ඇති කොට සහ දැඩි කොට තිබේ. හැර ද, සාමාන්‍ය වශයෙන් කියන කල, එබඳු අල්ලාගෙන සිටීමකට, ඊසානදිග පළාත් තුනේ අත්දැකීමෙන් පෙන්නුම් කරන පරිදි, කිසි ම ලාභයක් උපයා නො ගනිමින් ම ප්‍රාග්ධනය යොදවන්ට ජපානයට සිදු වන සැලකියයුතු තරම් දිග වකවනුවක් ඇතුළත් වේ. මේ සියල්ල යළි ත් ජාතික පරාධීනත්වයේ සහ සමගිසම්මුතියේ න්‍යායයන් බිඳ හෙළීම පිණිස ද දිග්ගැසුණු යුද්ධයේ සහ අවසාන ජයග්‍රහණයේ න්‍යායයන් ස්ථාපිත කිරීම පිණිස ද පදනමක් අපට දෙයි.

43. දෙවැනි අවස්ථාවේදී, දෙ පැත්තේ ම ඉහතින් දැක්වූ වෙනස්වීම් දිගට ම වර්ධනය වෙනවා ඇත. තත්වය විස්තර වශයෙන් කල්තබා කියන්ට බැරි නමුදු, මුළු වශයෙන් ජපානය දිගට ම පල්ලම් බහිනවා ඇත, චීනය ඉහළ නගිනවා ඇත.[16] උදාහරණ වශයෙන්, ජපානයේ යුද්ධමය සහ

LIBERATION BASE
https://liberationbase.wordpress.com

මූදල් වත්පොහොසත්කම් චීනයේ ගොරිල්ලා සංග්‍රාමය මගින් බරපතල ලෙස ක්ෂය වී යනවා ඇත, ජපානයෙහි මහජන අතෘප්තිය වැඩෙනවා ඇත, ඇගේ හටකණ්ඩායම් වල චිත්තශක්තිය තව දුරට ත් පිරිහෙනවා ඇත, ඇ ජාත්‍යන්තර වශයෙන් තව තව ත් තනි වෙනවා ඇත. චීනය සම්බන්ධයෙන්, දේශපාලන, යුද්ධමය සහ සංස්කෘතික පරිමණ්ඩලයන්හි ද, ජනතාව උනන්දු කිරීමෙහි ලා ද ඇ තව දුරට ත් ප්‍රගතිය සලසා ගන්නවා ඇත; ගොරිල්ලා සංග්‍රාමය තව දුරට ත් වර්ධනය වෙනවා ඇත; පිටිසර පෙදෙස් වල කුඩා කර්මාන්ත සහ පුළුල් ලෙස පැතුරුණු කෘෂිකර්මය පදනම කරගෙන කිසියම් නව ආර්ථික වැඩීමක් සිදු වෙනවා ඇත; ජාත්‍යන්තර අනුබලය අනුක්‍රමයෙන් වැඩි වෙනවා ඇත; මුළු චිත්‍රය ම එය දැනට තිබෙනවාට වඩා උදක් ම වෙනස් වෙනවා ඇත. මේ දෙවැනි අවස්ථාව තරමක් දිගු කලක් පවතින්ට ඉඩ තිබේ: ඒ අවස්ථාව තුළ චීනය අනුක්‍රමයෙන් නඟිමින් ද, ජපානය අනුක්‍රමයෙන් බහිමින් ද, බලවේගයන්ගේ සමබරතාවෙහි ලොකු අනික් අත හැරීමක් සිදු වෙනවා ඇත. චීනය ඇගේ අඩු–බලය ඇති තත්වයෙන් අත්මිදෙනවා ඇත, ජපානයට ඇගේ වැඩි–බලය ඇති තත්වය නැති වෙනවා ඇත; පළමුකොට දෙ රට සම සම ව සිටිනවා ඇත, ඉක්බිති ඒවායේ පරස්පර තත්වයෝ අනික් අත පෙරළෙනවා ඇත. එතැනදී, චීනය සාමාන්‍යයෙන් උපායමාර්ගික පෙරළා–පහරදීම පිණිස කරන ඇගේ සූදනම සම්පූර්ණ කොට තිබෙනවා ඇත, පෙරළා–පහරදීමේ සහ සතුරා පළවා හැරීමේ අවස්ථාවට පිවිසෙනවා ඇත. අඩු–බලයෙන් වැඩි–බලයට වෙනස් වීම ත් පෙරළා–පහරදීම පිණිස කරන සූදනම ත් කරුණු තුනක් ඇතුළත් කරගන්නා බව යළි ත් කිය යුතු ය; එනම් චීනයේ ම ශක්තියේ වැඩිවීමක්, ජපානයේ දුෂ්කරතාවන් වැඩිවීමක් සහ ජාත්‍යන්තර අනුබලයේ වැඩිවීමක් ය; මේ සියලු බලවේගයන් එකට එකතු වීමෙන් ය චීනයට වැඩි–බලය ලැබීම ත් පෙරළා–පහරදීම පිණිස කරන ඇගේ සූදනම සම්පූර්ණ වීම ත් සිදු වෙනවා ඇත්තේ.

44. චීනයේ දේශපාලන සහ ආර්ථික වර්ධනයේ අසමතාව නිසා, තුන්වැනි අවස්ථාවේ උපායමාර්ගික පෙරළා–පහරදීම එහි මුල් අවධියේදී රට මුළුල්ලේ ම එක්වැනි සහ සම චිත්‍රයක් ඉදිරිපත් නො කරනවා ඇත, මෙතැන නඟිමින් ද එතැන බහිමින් ද, ලක්ෂණයෙන් ප්‍රාන්තික වෙනවා ඇත. මේ අවස්ථාවේදී සතුරා චීනයේ එක්සත් පෙරමුණ බිඳීම පිණිස දරන ඔහුගේ භේදකාරී කපටි ක්‍රියා අඩු නො කරනවා ඇති හෙයින්, චීනයේ අභ්‍යන්තර සමගිය පවත්වාගැනීමේ කර්තව්‍යය වඩා ත් වැදගත් වෙනවා ඇත. අභ්‍යන්තර විමතිය නිසා උපායමාර්ගික පෙරළා–පහරදීම අතර මග කඩා නො වැටෙන බව සහතික කරන්ට අපට සිදු වෙනවා ඇත. මේ වකවනුවේ දීජාත්‍යන්තර තත්වය චීනයට ඉතා හිතකර වෙනවා ඇත. චීනය සතු කර්තව්‍යය නම් පූර්ණ විමුක්තිය අත්පත් කර ගනු වස් සහ ස්වාධීන

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් පිහිටුවනු වස් එයින් ප්‍රයෝජන ගැනීම ය; එය ඒ අතර ම ලෝක පැසිස්ට්–විරෝධී ව්‍යාපාරයට ආධාර දීමක් ද වෙනවා ඇත.

45. චීනය අඩු–බලයේ සිට සම තත්වයට සහ ඉක්බිති වැඩි–බලයට යාම, ජපානය වැඩි–බලයේ සිට සම තත්වයට හා ඉක්බිති අඩු–බලයට යාම; චීනය ආරක්ෂාවීමේ සිට ඇණහිටි තත්වයට සහ ඉක්බිති පෙරළා–පහරදීමට යාම, ජපානය පහරදීමේ සිට තමා දිනා ගත් දේ සුරක්ෂිත කිරීමට සහ ඉක්බිති පසුබැසීමට යාම — චීන–ජපන් යුද්ධය ගමන් කරන මග සහ එය නො වැළකිය හැකි ලෙස ම නැඹුරු වන අත එසේ වෙනවා ඇත.

46. එහෙයින් ප්‍රශ්න සහ නිගමන මතු දක්වන පරිදි වේ: චීනය යටත් කරනු ලබයි ද? පිළිතුර, නැත, ඇ යටත් කරනු ලබන්නේ නැත, අවසාන ජයග්‍රහණය දිනා ගන්නවා ඇත යනුයි. චීනයට ඉක්මනින් ජය ගන්ට පුළුවන් ද? පිළිතුර, බැරි ය, ඇට ඉක්මනින් ජය ගන්ට බැරි ය, යුද්ධය දිග්ගැසුණු එකක් විය යුතු ය යනුයි. මේ නිගමන නිවැරදි ද? නිවැරදි ය'යි මම සිතමි.

47. මෙතැනදී, ජාතික පරාධීනත්වය සහ සමගිසම්මුතිය අටුවා කරන අය යළි ත් දුවගෙන ඇවිත් මෙසේ කියනවා ඇත: ''අඩු–බලයේ සිට සම තත්වයට යන්නට ජපානයේ යුද්ධමය සහ ආර්ථික බලයට සමාන වූ යුද්ධමය සහ ආර්ථික බලයක් චීනයට උවමනා කරයි, සම තත්වයේ සිට වැඩි–බලයට යන්නට ජපානයේ යුද්ධමය සහ ආර්ථික බලයට වඩා ලොකු යුද්ධමය සහ ආර්ථික බලයක් ඇට උවමනා කරයි. එහෙත් මෙය වෙන්ට බැරි ම දෙයකි, එහෙයින් එකී නිගමනය නිවැරදි නො වේ.''

48. මෙය, යුද්ධය පිළිබඳ ප්‍රශ්නය කෙරෙහි යාන්ත්‍රික ලෙස යොමුවීමක් ද මනෝමූල සහ එක පැත්තකට සීමා වූ මතයක් ද වන, ''ආයුධ හැම දෙයක් ම තීරණය කරයි'' යන ඊනියා න්‍යායය වේ.[17] අපේ මතය මීට විරුද්ධ ය; අපට ආයුධ පමණක් නො ව මිනිස්සු ද පෙනෙති. යුද්ධයේදී ආයුධ වැදගත් සාධකයක් වේ, එහෙත් තීරණාත්මක සාධකය නො වේ; තීරණාත්මක වන්නේ, ද්‍රව්‍ය නො ව මිනිස්සු ය. ශක්තියේ තරගය යුද්ධමය සහ ආර්ථික බලයේ තරගයක් පමණක් නො වේ, මිනිස් බලයේ සහ චිත්තශක්තියේ තරගයක් ද වේ. යුද්ධමය සහ ආර්ථික බලය අවශ්‍යයෙන් ම පරිහරණය කරනු ලබන්නේ මිනිසුන් විසින් ය. චීන මිනිසුන් ගෙන්, ජපන් මිනිසුන් ගෙන්, සහ සෙසු රටවල් වල ජනතාව ගෙන් විශාල වැඩි පිරිස ජපානයට විරුද්දකම් පෑමේ අපේ යුද්ධයේ පැත්ත ගෙන සිටිත් නම්, කුඩා අඩු–පිරිසක් විසින් බලහත්කාරකම් කිරීම මගින් පරිහරණය කරනු ලබන ජපානයේ යුද්ධමය සහ ආර්ථික බලය වැඩි–බලය ලෙස ගණන් ගන්නේ කෙසේ ද? වැලිත් එය වැඩි–බලය නො වේ නම්, එවිට චීනය, පරස්පර වශයෙන් අඩු යුද්ධමය සහ ආර්ථික බලයක් පරිහරණය කරන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නමුත්, වැඩි-බලය ඇත්තී නො වේ ද? චීනය විරුද්දකම් පෑමේ යුද්ධය ත් එක්සත් පෙරමුණ ත් අත නැර ගෙන ගියොත්, ඈ අනුක්‍රමයෙන් යුද්ධමය සහ ආර්ථික බලයෙන් වැඩෙන බවට කිසි සැකයක් නැත. අපේ සතුරා සම්බන්ධයෙන්, දීර්ඝ යුද්ධ නිසා ත් අභ්‍යන්තර සහ බාහිර ප්‍රතිවිරෝධයන් නිසා ත් දුර්වල වන්නා වූ ඔහුගේ යුද්ධමය සහ ආර්ථික බලය අනික් අතට වෙනස් වෙනවා නියත ය. මේ වටාපිටා තත්වයන් තුළ, චීනයට වැඩි-බලය ඇත්තී වීමට නො හැකි වන හේතුවක් තිබේ ද? එපමණක් ම නො වේ. සෙසු රටවල් වල යුද්ධමය සහ ආර්ථික බලය එළිපිට ම සහ ඒ තරම් ලොකුවට අපේ පැත්තේ තිබේ ය'යි ගණන් ගන්ට අපට තවම බැරි නමුදු, අනාගතයේදී අපට එසේ ගණන් ගන්ට බැරි වෙන හේතුවක් තිබේ ද? ජපානයේ සතුරා හුදෙක් චීනය ම නො වේ නම් ද, අනාගතයේදී වෙන රටවල් එකක් හෝ වැඩි ගණනක් ජපානයට විරුද්ධ ව ආරක්ෂාවීමෙහි යෙදෙමින් හෝ පහරදීමෙහි යෙදෙමින් ඒවායේ සැලකියයුතු තරම් වන යුද්ධමය සහ ආර්ථික බලයෙන් එළිපිට ම ප්‍රයෝජන ගනිතොත් සහ අපට එළිපිට ම ආධාර දෙතොත්, එවිට අපේ වැඩි-බලය තවත් ලොකු නො වේ ද? ජපානය කුඩා රටකි, ඇගේ යුද්ධය ප්‍රතිගාමී ය, ම්ලේච්ඡ ය; ඈ ජාත්‍යන්තර වශයෙන් තව තව ත් තනි වෙනවා ඇත; චීනය විශාල රටකි, ඇගේ යුද්ධය ප්‍රගතිශීලි ය, යුක්ති සහගත ය; ඈ ජාත්‍යන්තර වශයෙන් තව තව ත් අනුබල ලබනවා ඇත. මේ සාධකයන්ගේ දීර්ඝ-කාල වර්ධනය සතුරා ත් අප ත් අතර ඇති පරස්පර තත්වය නියත වශයෙන් ම වෙනස් නො කිරීමට හේතුවක් තිබේ ද?

49. කෙසේ වේවා, යුද්ධය යනු ශක්තියේ තරගයක් බව ත්, යුද වැදී සිටින්නන්ගේ පරස්පර ශක්තියෙහි එක්තරා වෙනසක් සිදු වීමට පෙර, උපායමාර්ගික වශයෙන් තීරණාත්මක වූ සටන් කරමින් විමුක්තියේ මාර්ගය කෙටි කරන්ට උත්සාහ කිරීමට පදනමක් නොමැති බව ත් ඉක්මනින් ජය ලැබීම අටුවා කර දක්වන අයට නො වැටහේ. ඔවුන්ගේ අදහස් භාවිතාවෙහි යෙදුවොත්, අප නො වැළකිය හැකි ලෙස ම අපේ හිස් ගල්බිත්තියක ඇන ගත යුතු වේ. නැතහොත් බාගවිට ඔවුන් තම අදහස් භාවිතාවේ යෙදීමට ඇත්ත වශයෙන් ම බලාපොරොත්තු නො වමින් තමන්ගේ ම විනෝදය පිණිස කතා කරනවා විය යුතු ය. අන්තිමේදී සත්තාව මහත්මයා ඇවිත්, ඔවුන් ඒ ඒ දේ ලේසියට පහසුවට ලබා ගන්ට උවමනා කරන, ඇඟපතට රිදීමක් නැති ව වාසි ලබා ගන්ට උවමනා කරන නිකම් ම නිකම් බෙලිකටුමළු බව පෙන්වමින්, මේ කටහැකරයන් මත ඇල් වතුර බාල්දියක් හලනවා ඇත. මේ වර්ගයේ නිෂ්ඵල කටහැකර කතා කලින් ද අප අතර තිබුණි; මේ වන තුරු එතරම් හුඟක් නො වෙතත්, දැනුත් අප අතර තිබේ; යුද්ධය ඇණහිටීමේ ද, ඉක්බිති පෙරළා–පහරදීමේ ද තත්වයට වර්ධනය වන විට තව තව ත් ඇති වෙන්ට ඉඩ තිබේ. එහෙත් ඒ අතර, පළමුවැනි අවස්ථාවේදී චීනයට සිදු

වන පාඩු තරමක් බරපතල වේ නම් ද, දෙවැනි අවස්ථාව ඉතා දිගු කලක් ඇද්දි ඇද්දී යයි නම් ද, ජාතික පරාධීනත්වය ත් සමගිසම්මුතිය ත් පිළිබඳ න්‍යාය මහත් ලෙස ප්‍රචලිත වෙන්ට පටන් ගන්නවා ඇත. එහෙයින්, අපේ වෙඩි ප්‍රධාන වශයෙන් එල්ල කළ යුත්තේ ඒවාට විරුද්ධ ව ය; ඉක්මනින් ජය ලැබීම ගැන කරන නිෂ්ඵල කටහැකර කතා වලට විරුද්ධ ව එල්ල කළ යුත්තේ ද්විතීයක වශයෙන් පමණකි.

50. යුද්ධය දිග්ගැසුණු එකක් වන බව සහතික ය, එහෙත් එය හරියට ම මාස හෝ අවුරුදු කීයක් පවතී ද කියා කල්තබා කියන්ට කිසිවකුට බැරි ය: ඒ මෙය මුළුමනින් ම බලවේගයන්ගේ සමබරතාවෙහි ඇති වන වෙනසේ ප්‍රමාණය මත රඳා පවතින නිසා ය. යුද්ධය කෙටි කරන්ට කැමති සියලු දෙනාට ම අපේ ශක්තිය වැඩි කිරීමට ත් සතුරාගේ ශක්තිය අඩු කිරීමට ත් වෙහෙස මහන්සි වී වැඩ කිරීම විනා වෙන කරන්ට දෙයක් නැත. නියම වශයෙන් ම, එක ම මග නම් වඩ වඩා සටන් දිනමින් සතුරාගේ බලසේනාවන් බිඳ වැටවීමට, සතුරා අල්ලාගෙන සිටින භූමිප්‍රදේශය අඩු ම ප්‍රමාණයකට හීන කරනු වස් ගෙරිල්ලා සංග්‍රාමය වර්ධනය කිරීමට, මුළු ජාතියේ ම බලවේගයන් එක්රැස් කරනු පිණිස එක්සත් පෙරමුණ තහවුරු කොට පළල් කිරීමට, අළුත් හමුදවන් ගොඩනැඟීමට සහ අළුත් යුද්ධ කර්මාන්ත වර්ධනය කිරීමට, දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික ප්‍රගතිය ඉදිරියට මෙහෙයවීමට, කම්කරුවන්, ගොවියන්, ව්‍යාපාරහිමියන්, උගතුන් සහ ජනතාව අතර සෙසු කොටස් උනන්දු කිරීමට, සතුරු බලසේනාවන් කඩ කඩ කොට හරිමින් ඔවුන්ගේ සෙබළුන් මේ පැත්තට දිනා ගැනීමට, විදේශීය අනුබලය ලබා ගනු පිණිස ජාත්‍යන්තර ප්‍රචාරක කටයුතු කරගෙන යාමට සහ, ජපන් ජනයාගේ ත් සෙසු පීඩිත ජනතාවන්ගේ ත් අනුබලය දිනා ගැනීමට වෙර දැරීම ය. මේ සියල්ල කිරීමෙන් පමණකි යුද්ධය පවත්නා කාලය අඩු කරන්ට අපට හැකි වන්නේ. ඉන්ද්‍රජාලම් කෙටි පාරක් නැත.

බලු දත් පූට්ටු වන මෝස්තරයේ යුද්ධයක්

51. ජපානයට විරුද්දකම් පෑමේ දිග්ගැසුණු යුද්ධය මිනිස්වර්ගයාගේ යුද්ධ ඉතිහාසයෙහි අසහාය වූ සුවිෂ්ට පිටුවක් ලියන බව නිශ්වය වශයෙන් ම කියන්ට අපට පුළුවනි. මේ යුද්ධයේ එක් විශේෂ අංගලක්ෂණයක් නම් එක් අතකින් ජපානයේ ම්ලේච්ඡභාවය සහ ඇට හටයන් හිඟ වීම ත් අනික් අතින් චීනයේ ප්‍රගතිශීලිභාවය සහ ඇගේ භූමිප්‍රදේශයේ සුවිශාලත්වය ත් වැනි ප්‍රතිවිරුද්ධ සාධක නිසා ඇති වන බලු දත් පූට්ටු වන්නාක් මෙන් එකිනෙකට පූට්ටු වීමේ මෝස්තරය යි. බලු දත් පූට්ටු වන මෝස්තරයේ වෙනත් යුද්ධ ඉතිහාසයෙහි ඇති වී ඇත; ඔක්තෝබර විප්ලවයට පසු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රුසියාවෙහි ඇති වූ තුන් අවුරුදු සිවිල් යුද්ධය නිදසුන් වශයෙන් තිබෙන එක් අවස්ථාවකි. එහෙත් චීනයෙහි පවතින මේ යුද්ධය වෙසෙස් කොට දක්වන දෙය නම්, ඉතිහාසයෙහි වාර්තාවක් පිහිටුවනු ඇත්තා වූ, එහි සුවිශේෂයෙන් ම දිග්ගැසුණු සහ ව්‍යාප්ත ලක්ෂණය යි. එහි බලු දත් පූට්ටු වන්නාක් වැනි මෝස්තරය මතු දක්වන අයුරු ප්‍රකට වේ.

52. **ඇතුල් සහ බාහිර පේළි.** මුළු එකක් වශයෙන් ජපන්-විරෝධී යුද්ධය කරගෙන යන්නේ ඇතුල් පේළි වල ය; එහෙත් ප්‍රධාන බලසේනාවන් සහ ගොරිල්ලා සේනාංග අතර සම්බන්ධයට අදළ වූ පමණකින්, ප්‍රධාන බලසේනාවන් ඇතුල් පේළි වල සිටින අතර ගොරිල්ලා සේනාංගයෝ බාහිර පේළි වල සිටිති; මෙය සතුරා වටේට ඇති අඩු රැසක විශිෂ්ඨ දර්ශනයක් ඉදිරිපත් කරයි. විවිධ ගොරිල්ලා ප්‍රදේශ අතර සබඳතාව ගැන ද එය ම කිව හැකි ය. එක් එක් ගොරිල්ලා ප්‍රදේශය, ඒ ඒ ප්‍රදේශයේ ම පැත්තේ සිට බලන කල, තිබෙන්නේ ඇතුල් පේළි වල ය, අනික් ප්‍රදේශ බාහිර පේළි වල ය; ඒවා එක් වී සතුරා අඩු වලින් අල්ලාගෙන සිටින යුද පෙරමුණු රැසක් සකස් කරයි. යුද්ධයේ පළමුවැනි අවස්ථාවේදී, උපායමාර්ගික වශයෙන් ඇතුල් පේළි වල ක්‍රියා කරන නිත්‍ය හමුදව ඉවත් වී යමින් සිටී; එහෙත් උපායමාර්ගික වශයෙන් බාහිර පේළි වල ක්‍රියා කරන ගොරිල්ලා සේනාංග සතුරාගේ පසුමුණෙහි පිහිටි පැතුරුණු ප්‍රදේශයන් පුරා මහත් පියවරින් ඉදිරියට යයි — ඒවා දෙවැනි අවස්ථාවේදී වඩා ත් දරුණු ලෙස ඉදිරියට යනවා ඇත; එමගින් ඉවත් වී යාම ත් ඉදිරියට යාම ත් යන දෙක ම පිළිබඳ විශිෂ්ට චිත්‍රයක් ඉදිරිපත් කරනු ලැබේ.

53. **පසුමුණු ප්‍රදේශයක් අයත් ව සිටීම හා අයත් ව නො සිටීම.** සතුරා අල්ලාගෙන සිටින ප්‍රදේශ වල බාහිර සීමාවන් තෙක් පෙරමුණු පේළි ව්‍යාප්ත කරන ප්‍රධාන බලසේනාවෝ මුළු එකක් වශයෙන් රටේ පසුමුණු ප්‍රදේශයේ සිට සටන් කරමින් සිටිති. සටන් පේළි සතුරාගේ පසුමුණ තුළට ව්‍යාප්ත කරන ගොරිල්ලා සේනාංග මුළු එකක් වශයෙන් රටේ පසුමුණු ප්‍රදේශයෙන් වෙන් වී සිටී. එහෙත් එක් එක් ගොරිල්ලා ප්‍රදේශයට, එය ස්වකීය අනිස්ථිර සටන් පේළි පිහිටුවීමට හේත්තු වන, ඊට ම අයත් කුඩා පසුමුණක් ඇත්තේ ය. එක ම ප්‍රදේශය තුළ සතුරාගේ පසුමුණෙහි ටික කලක් පවතින සටන්ව්‍යාපාර ගෙන යනු පිණිස ගොරිල්ලා ප්‍රදේශයක් විසින් පිටත් කර යවනු ලබන ගොරිල්ලා බලඇණි සම්බන්ධයෙන් තත්වය වෙනස් ය; එවැනි බලඇණි වලට පසුමුණක් නැත, ඒවාට සටන් පේළියක් ද නොමැත. යම් තැනක සුවිශාල භූමිප්‍රදේශයක්, ප්‍රගතිශීලි ජනතාවක් සහ දියුණු දේශපාලන පක්ෂයක් හා හමුදවක් ඇත්තේ ද, එතැන "පසුමුණු ප්‍රදේශයක් නැතිව සටන් කරගෙන යාම" නව යුගයෙහි විප්ලවවාදී යුද්ධයේ විශේෂ අංගලක්ෂණයක් වේ; එයින් බිය වෙන්ට කිසිවක් නැත, වාසි වෙන්ට

හුහක් ඇත, එගැන සැක ඇති කර ගන්නවා වෙනුවට අපි එය දියුණු කළ යුත්තෙමු.

54. **වටලෑම සහ ආපසු-වටලෑම.** යුද්ධය මුළු එකක් වශයෙන් ගත් කල, අප සතුරා විසින් උපායමාර්ගික වශයෙන් වටලනු ලැබ සිටින බවට කිසි ම සැකයක් නැත; ඒ ඔහු උපායමාර්ගික පහරදීමෙහි යෙදී බාහිර පේළි වල ක්‍රියා කරමින් සිටින අතර, අප උපායමාර්ගික ආරක්ෂාවීමෙහි යෙදී ඇතුල් පේළි වල සටන් කරමින් සිටින නිසා ය. මෙය සතුරු වටලෑමේ පළමුවැනි ආකාරය යි. අපට ත් වෙන වෙන මාර්ග ඔස්සේ අප කරා ඉදිරියට ගමන් කරන සතුරු කොලම් එකක් හෝ වැඩි ගණනක් වටලන්ට හැකි ය; ඒ උපායමාර්ගික වශයෙන් බාහිර පේළි වල සිට අප කරා ඉදිරියට ගමන් කරන මේ සතුරු කොලම් වලට විරුද්ධ ව අප විසින් ගණනින් අධික වූ බලසේනාවන් යොදමින් උපක්‍රමික වශයෙන් බාහිර පේළි වල සිට යුද්ධ-ව්‍යාපාර ගෙනයාමේ සහ සටන් කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදන නිසා ය. මෙය අප විසින් සතුරා ආපසු-වටලෑමේ පළමුවැනි ආකාරය යි. ඊළඟට, අප සතුරාගේ පසුමුණෙහි පිහිටි ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ කල්පනාවට ගනිතොත්, ඒ එක් එක් ප්‍රදේශය තනි කර ගත් කල, වූතායි කඳු මෙන් හැම පැත්තෙන් ම ද, වයඹදිග ශාන්සි ප්‍රදේශය මෙන් තුන් පැත්තකින් ද, සතුරා විසින් වට කර ඇත. මෙය සතුරු වටලෑමේ දෙවැනි ආකාරය යි. එසේ ද වුව, අයකු සියලු ගොරිල්ලා ප්‍රදේශ එකට ගෙන සහ නිත්‍ය බලසේනාවන් සිටින තැන් වලට ඇති ඒවායේ සම්බන්ධයෙන් ගෙන සලකා බලතොත්, අප ද අනික් අතට සතුරු බලසේනාවන් මහත් රැසක් වට කරන බව අයකුට පෙනෙයි. නිදසුන් වශයෙන්, ශාන්සි පළාතෙහි, අප විසින් තාතුං-පූචව් දුම්රියමාර්ගය තුන් පැත්තකින් (නැගෙනහිරි, බටහිරි අංශ වලින් සහ දකුණු කොණින්) ද, තයියුආන් නගරය සියලු ම පැති වලින් ද වට කර ඇත; හෝපෙයි සහ ශාන්ටුං පළාත් වල ත් එබඳු අවස්ථා රැසක් ම ඇත. මෙය අප විසින් සතුරා ආපසු වටලන දෙවැනි ආකාරය වේ. මෙසේ සතුරු බලසේනා-වන් විසින් වටලනු ලැබීමේ ආකාර දෙකක් ද අපේ බලසේනාවන් විසින් වටලනු ලැබීමේ ආකාර දෙකක් ද තිබේ — බොහෝ දුරට වෙයිචී[18] ක්‍රීඩාවක් වගේ ය. දෙ පාර්ශ්වය විසින් කරගෙන යනු ලබන යුද්ධව්‍යාපාර සහ සටන් එකිනෙකාගේ ඉත්තන් ඇල්ලීමට සාමාන ය, (තයියුආන් වැනි) සතුරු රක්ෂස්ථාන සහ (වූතායි කඳු වැනි) අපේ ගොරිල්ලා කඳවුරු ප්‍රදේශ පිහිටුවීම ලැල්ලේ කොටු අත යට තබා ගැනීමට සමාන ය. මේ වෙයිචී ක්‍රීඩාව ලෝකය ම ඇතුළත් වන සේ පුළුල් කරනු ලැබේ නම්, අප ත් සතුරා ත් අතර වටලෑමේ තුන්වැනි ආකාරයක් ද ඇති වේ; එනම්, ආක්‍රමණයේ පෙරමුණ ත් සාමයේ පෙරමුණ ත් අතර ඇති පරස්පරසම්බන්ධය යි. සතුරා ඔහුගේ ආක්‍රමණයේ පෙරමුණෙන් චීනය, සෝවියට් සංගමය, ප්‍රන්සය සහ චෙකොස්-ලොවැකියාව වටලයි; ඒ අතර අපි අපේ සාමයේ පෙරමුණෙන් ජර්මනිය

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ජපානය සහ ඉතාලිය ආපසු වටලමු. එහෙත් අපේ වටලෑම, බුදුන්ගේ අත මෙන්, විශ්වය හරහා වැටුණු පංච මහා භූත පර්වතය බවට හැරෙනවා ඇත, නූතන සුන් වූ-කුං වරු[19] — එනම් පැසිස්ට් ආක්‍රමණිකයෝ — අන්තිමේදී, යළි ත් කිසි කලෙක නොනැඟිටින ලෙස, ඒ පර්වතය යට වැළලෙනවා ඇත. එහෙයින්, චීනය එක් උපායමාර්ගික ඒකකයක් ද, සෝවියට් සංගමය සහ ඊට එකතු වීමට ඉඩ තිබෙන සෙසු රටවල් වෙනත් උපායමාර්ගික ඒකක ද, ජපන් ජනතාවගේ ව්‍යාපාරය තවත් උපායමාර්ගික ඒකකයක් ද වශයෙන් ඇතිව, ජාත්‍යන්තර තලාවෙහි පැසිපික් ප්‍රාන්තය තුළ ජපන්-විරෝධි පෙරමුණක් ඇති කරන්ට, එසේ පැසිස්ට් සුන් වූ-කුංවරුන්ට පැන යාමට තැනක් සොයා ගත නො හැකි දූවැන්ත දැලක් සකස් කරන්ට, අපට හැකි වේ නම්, එවිට එය අපේ සතුරාගේ විනාශය එළඹෙන දිනය වෙනවා ඇත. සත්තකින් ම, මේ දූවැන්ත දැල සකස් කරනු ලබන දිනය නිසැකයෙන් ම ජපන් අධිරාජ්‍යවාදය සම්පූර්ණයෙන් ම පෙරළා දමනු ලබන දිනය වෙනවා ඇත. අප විහිළු කරනවා නො වෙයි; මෙය යුද්ධය නො වැළකිය හැකි ලෙස ම බර වේගෙන යන අත ය.

55. **ලොකු ප්‍රදේශ සහ කුඩා ප්‍රදේශ.** සතුරා මහා ප්‍රාකාරයට දකුණෙන් චීන භූමිප්‍රදේශයෙන් වඩා ලොකු කොටස අල්ලාගැනීමට ත් කුඩා කොටස පමණක් හානියක් නො වී තිබෙන්නට ත් ඉඩ තිබේ. එය තත්වයේ එක් අංගයකි. එහෙත්, ඊසානදිග පළාත් තුන ඇතුළත් නො වන, මේ වඩා ලොකු කොටස ඇතුළත ඇත්ත වශයෙන් ම අල්ලාගෙන සිටීමට සතුරාට හැකි වන්නේ — වැදගත්කම අතින් මුල් තැන ගත හැකි නමුත් ප්‍රමාණය ත් ජනගහණය ත් අතින් අල්ලා ගත් භූමිප්‍රදේශයෙන් වඩා කුඩා කොටස පමණක් විය හැකි — මහ නගර, ප්‍රධාන ගමනාගමන මාර්ග සහ තැනි අතුරෙන් සමහරක් පමණකි; ඒ අතර හැම තැන ම වැඩෙන්නා වූ ගොරිල්ලා ප්‍රදේශ විසින් වඩා ලොකු කොටස යට කර ගන්නවා ඇත. මෙය තත්වයේ තවත් අංගයකි. අප මහා ප්‍රාකාරයට දකුණෙන් පිහිටි පළාත් ඉක්මවා යමින්, මොන්ගෝලියා, සින්චියාං, චිංහායි සහ ටිබෙට් යන පළාත් ද ඇතුළත් කරතොත්, එවිට නො අල්ලා ගත් ප්‍රදේශය චීනයේ භූමිප්‍රදේශයෙන් වඩා ලොකු කොටස වෙනවා ඇත; සතුරා විසින් අල්ලාගෙන තිබෙන කොටස, ඊසානදිග පළාත් තුන ත් සමග ම පවා, වඩා කුඩා කොටස වෙනවා ඇත. එය තත්වයේ තවත් එක් අංගයකි. කිසි හානියක් නො වී තිබෙන ප්‍රදේශය නිසැකයෙන් ම වැදගත් ය; අපි එය දේශපාලන, යුද්ධමය සහ ආර්ථික වශයෙන් පමණක් නො ව, වැදගත් දෙය වන, සංස්කෘතික වශයෙන් ද වර්ධනය කිරීමට මහත් පරිශ්‍රම දැරිය යුත්තෙමු. සතුරා කලින් අප සතු ව තිබුණු සංස්කෘතික මධ්‍යස්ථාන සංස්කෘතික වශයෙන් නොදියුණු ප්‍රදේශ බවට විපර්යාස කර ඇත. අපි කලින් සංස්කෘතික වශයෙන් නො දියුණු ව පැවති ප්‍රදේශ සංස්කෘතික මධ්‍යස්ථාන බවට විපර්යාස කළ යුත්තෙමු. ඒ

අතර ම, සතුරු පේළි පිටිපසින් පුළුල් ගොරිල්ලා ප්‍රදේශ වර්ධනය කිරීමේ වැඩය ද අතිශයින් ම වැදගත් ය; අපි මේ වැඩයේ, සංස්කෘතික අංගය ද ඇතුළුව, හැම අංගයක් ගැන ම මීඩංගු විය යුත්තෙමු. හැම දෙයක් ම ගෙන සලකා බලන විට, චීනයේ භූමිප්‍රදේශයෙන් ලොකු කැබලි, එනම්, ගම්බද ප්‍රදේශ, ප්‍රගතියේ සහ ආලෝකයේ ප්‍රාන්ත බවට විපර්යාස කරනු ලබනවා ඇත; ඒ අතර, කුඩා කැබලි, එනම්, සතුරා අල්ලාගෙන සිටින ප්‍රදේශ, වෙසෙසින් මහ නගර, තාවකාලික වශයෙන් නොදියුණු සහ අඳුරු ප්‍රාන්ත බවට පත් වෙනවා ඇත.

56. ජපානයට විරුද්දකම් පෑමේ දිග්ගැසුණු සහ ඈතට විහිදුණු යුද්ධය යුද්ධමය වශයෙන්, දේශපාලන වශයෙන්, ආර්ථික වශයෙන් සහ සංස්කෘතික වශයෙන් බලුදත්-පූට්ටු මෝස්තරයේ යුද්ධයක් වන බව මෙසේ පෙනෙයි. එය යුද්ධ වෘත්තාන්තයන්හි අපූර්ව දර්ශනයකි, චීන ජාතිය විසින් බාරගෙන තිබෙන වීරෝදර ක්‍රියාවකි, සුවිශිෂ්ට සහ පොළොව කම්පා කරන වික්‍රමයකි. මේ යුද්ධය බලපානවා ඇත්තේ, දෙ රට ම ඉදිරියට යන්ට පොළඹමින්, චීනය සහ ජපානය කෙරෙහි පමණක් නො වේ; සියලු ජාතින්, වෙසෙසින් ඉන්දියාව වැනි පීඩිත ජාතින්, ඉදිරියට ගමන් කරන්ට පොළඹමින්, මුළු ලොව ම කෙරෙහි ද එය බලපානවා ඇත. හැම චීන ජාතිකයෙක් ම බලුදත්-පූට්ටු මෝස්තරයේ මේ යුද්ධයට හැඟීම් සහිත ව පැන්න යුතු ය; කවර හෙයින් ද යත්, චීන ජාතිය තමා නිදහස් කර ගන්නා යුද්ධයේ ආකාරය, ලොකු අර්ධ-විජිත රටක් නවසිය තිස්වැනි සහ නවසිය හතළිස්වැනි අවුරුදු වලදී කරන විමුක්ති යුද්ධයක විශේෂ ආකාරය, මෙය වන නිසා ය.

සදා සාමය පිණිස සටන් කිරීම

57. චීනයේ ජපන්-විරෝධි යුද්ධයේ දිග්ගැසුණු ස්වභාවය චීනයේ ත් මුළු ලොවේ ත් සදා සාමය පිණිස කරන සටන හා නො වෙන් කළ හැකි ලෙස සම්බන්ධ වී ඇත. යුද්ධය සදා සාමයට මෙතරම් කිට්ටු ව පවතින වර්තමානය වැනි ඉතිහාසීය වකවනුවක් කිසි කලෙක තිබී නැත. පංක්ති පහළ වූ තැන් සිට අවුරුදු දහස් ගණනක් ම, මිනිස්වර්ගයාගේ ජීවිතය යුද්ධ වලින් ගහණ ව පැවතී ඇත; හැම ජාතියක් ම, අභ්‍යන්තර වශයෙන් වේවා, නැතහොත් වෙන ජාතින් සමග වේවා, ගණන් නැති යුද්ධ කර තිබේ. ධනවාදි සමාජයේ අධිරාජ්‍යවාදි යුගයේදී, විශේෂයෙන් ම පුළුල් පරිමාණයකින් සහ අසාමාන්‍ය නිර්දයභාවයකින් යුතු ව යුද්ධ කරනු ලැබේ. අවුරුදු විස්සකට උඩදී ඇති වූ පළමුවැනි මහා අධිරාජ්‍යවාදි යුද්ධය ඉතිහාසයෙහි ඒ වර්ගයේ පළමුවැනි යුද්ධය විය, එහෙත් අවසාන එක නො වී ය. අවසාන යුද්ධය වීමට කිට්ටු කර තිබෙන්නේ, ඒ කියන්නේ, මිනිස්වර්ගයාගේ සදා සාමයට කිට්ටු කර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තිබෙන්නේ, දැන් පටන්ගෙන තිබෙන යුද්ධය පමණි. මේ වන විට ලෝකයේ ජනගහණයෙන් තුනෙන්-එක් පංගුවක් යුද්ධයට පිවිසී ඇත. බලන්න! ඉතාලිය, ඊළඟට ජපානය; ඇබිසීනියාව, ඊළඟට ස්පාඤ්ඤය, ඊළඟට චීනය. දැන් යුද වැදී සිටින රටවල් වල ජනගහණය 60 කෝටියක්, නැතහොත් ලෝකයේ මුළු ජනගහණයෙන් තුනෙන් එකක්, පමණ වේ. වර්තමාන යුද්ධයේ අංග-ලක්ෂණ නම් එහි අවිච්ඡින්නභාවය සහ සදා සාමයට ආසන්නභාවය යි. එය අවිච්ඡින්න වනුයේ ඇයි? ඉතාලිය, ඇබිසීනියාවට පහර දීමෙන් පසු, ස්පාඤ්ඤයට පහර දුන්නේ ය; ජර්මනිය ඊට එකතු විය; ඉක්බිති ජපානය චීනයට පහර දුන්නේ ය. මීළඟට කුමක් එනවා ඇද්ද? නිසැකයෙන් ම හිට්ලර් මහ බලවතුන් හා සටන් කරනවා ඇත. ''පැසිස්ට්වාදය නම් යුද්ධය යි''[20] — මෙය සම්පූර්ණයෙන් ම සැබෑ ය. වර්තමාන යුද්ධය ලෝක යුද්ධයක් බවට වර්ධනය වීමේදී විච්ඡින්න වීමක් නො වෙනවා ඇත; යුද්ධ විපත්තියෙන් වැළකී සිටින්නට මිනිස්වර්ගයාට බැරි වෙනවා ඇත. එසේ නම් වර්තමාන යුද්ධය සදා සාමයට ළං වී ඇතැ'යි අප කියන්නේ මන්ද? වර්තමාන යුද්ධය 1වැනි ලෝක යුද්ධය ත් සමග ආරම්භ වූ ලෝක ධනවාදයේ සමස්ත අර්බුදය වර්ධනය වීමේ ප්‍රතිඵලය වේ; මේ සමස්ත අර්බුදය ධනවාදී රටවල් අළුත් යුද්ධයක් තුළට පන්නාගෙන යයි; සියල්ලට ම වඩා, පැසිස්ට් රටවල් අළුත් යුද්ධ සාහසික ක්‍රියාවන්හි යෙදෙන තැනට පන්නාගෙන යයි. මේ යුද්ධය ධනවාදය ගලවා ගන්නේ නැති බව ත්, එහි ඇදවැටීම ඉක්මන් කරනවා ඇති බව ත් අපට කල්තබා ම පෙනෙයි. එය අවුරුදු විස්සකට උඩදී ඇති වූ යුද්ධයට වඩා පරිමාණයෙන් ලොකු වෙනවා ඇත, ඊට වඩා දරුණු වෙනවා ඇත, සියලු ජාතීන් නො වැළකිය හැකි ලෙස ම පටලවා ගන්නවා ඇත, ඉතා දිගු කලක් ඇද්දී ඇද්දී යනවා ඇත, මිනිස්වර්ගයා බෙහෙවින් ම දුක් විඳිනවා ඇත. එහෙත්, සෝවියට් සංගමයේ පැවැත්ම නිසා ත්, ලෝකයේ ජනතාවගේ වැඩෙන දේශපාලන හැඟීම නිසා ත්, සියලු ප්‍රති-විප්ලවවාදී යුද්ධ වලට විරුද්ධ වීම පිණිස ශ්‍රේෂ්ඨ විප්ලවවාදී යුද්ධ නිසැකයෙන් ම මේ යුද්ධයෙන් බිහි වෙනවා ඇත, එසේ මේ යුද්ධයට සදා සාමය පිණිස කරන අරගලයක ලක්ෂණය ලැබෙනවා ඇත. පසු ව තවත් යුද්ධ වකවානුවක් ඇති වුව ත්, සදා ලෝක සාමය එතරම් ඈත නො වෙනවා ඇත. මිනිසා ධනවාදය දුරු කර දැමූ කල, ඔහු සදා සාමයේ යුගයට එළඹෙනවා ඇත, යුද්ධය පිණිස උවමනාවක් තවත් නො තිබෙනවා ඇත. එවිට යුදහමුදා වත්, යුදනැව් වත්, යුද අහස්යානා වත්, විස වායු වත් උවමනා නො වන්නේ ය. ඉන් පසු, සදහට ම, මිනිස්වර්ගයා යළි ත් කිසි කලෙක යුද්ධය යනු කුමක් දැ'යි නො දන්නවා ඇත. දැනට ම පටන්ගෙන තිබෙන විප්ලවවාදී යුද්ධ සදා සාමය පිණිස කරන යුද්ධයේ කොටසකි. 50 කෝටි-යකට වැඩි ඒකාබද්ධ ජනගහණයක් සිටින රටවල් දෙකක් වන චීනය ත් ජපානය ත් අතර යුද්ධය සදා සාමය පිණිස කරන මේ යුද්ධයෙහි වැදගත්

තැනක් ගන්නවා ඇත; එයින් චීන ජාතියේ විමුක්තිය උදා වෙනවා ඇත. අනාගතයේ නිදහස් නව චීනය අනාගතයේ නිදහස් නව ලෝකයෙන් වෙන් කළ හැකි නො වේ. එහෙයින් ජපානයට විරුද්දකම් පෑමේ අපේ යුද්ධය සදා සාමය පිණිස කරන අරගලයක ලක්ෂණය ගනී.

58. යුද්ධ යුක්තිසහගත ය, අයුක්තිසහගත ය කියා දෙ වර්ගයකට බෙදෙන බව ඉතිහාසයෙන් පෙනෙයි. ප්‍රගතිශීලි වූ සියලු යුද්ධ යුක්තිසහගත ය, ප්‍රගතියට බාධා කරන සියලු යුද්ධ අයුක්තිසහගත ය. කොමියුනිස්ට්වාදීන් වන අපි ප්‍රගතියට බාධා කරන සියලු අයුක්තිසහගත යුද්ධ වලට විරුද්ධ වෙමු; එහෙත් අපි ප්‍රගතිශීලි, යුක්තිසහගත යුද්ධ වලට විරුද්ධ නො වෙමු. කොමියුනිස්ට්වාදීන් වන අපි යුක්තිසහගත යුද්ධ වලට විරුද්ධ නො වෙනවා පමණක් නො ව, ඒවාට උනන්දුවෙන් සහභාගි ද වෙමු. අයුක්තිසහගත යුද්ධ සම්බන්ධයෙන්, 1වැනි ලෝක යුද්ධය එක් නිදසුනකි; ඒ යුද්ධයේදී දෙ පැත්ත ම සටන් කළේ අධිරාජ්‍යවාදී පලප්‍රයෝජන සඳහා ය, එහෙයින් මුළු ලොවේ ම කොමියුනිස්ට්වාදියෝ ඒ යුද්ධයට තරයේ ම විරුද්ධ වූහ. මේ වර්ගයේ යුද්ධයකට විරුද්ධ වීමට තිබෙන මග නම් ඒ යුද්ධය ඇති වෙන්ට පෙර එය වැළැක්වීමට කළ හැකි සියල්ල කිරීම ය; එය ඇති වූ කල, හැකි හැම විට ම, යුද්ධයට යුද්ධයෙන් විරුද්ධ වීම ය, අයුක්තිසහගත යුද්ධයට යුක්තිසහගත යුද්ධයෙන් විරුද්ධ වීම ය. ජපානයේ යුද්ධය ප්‍රගතියට බාධා කරන අයුක්තිසහගත යුද්ධයකි, ජපන් ජනතාව ඇතුළු ලෝකයේ ජනතාවෝ ඊට විරුද්ධ විය යුත්තාහ, විරුද්ධ වෙමින් සිටින්නාහ. අපේ රටෙහි ජනතාව සහ ආණ්ඩුව ත්, කොමියුනිස්ට් පක්ෂය සහ කුඕමින්තාං පක්ෂය ත් යන සියල්ලන් ම ආක්‍රමණයට විරුද්ධ ජාතික විප්ලවවාදී යුද්ධයේදී දැහැමිබවේ පතාකය ඔසවා ඇත. අපේ යුද්ධය පරිශුද්ධ ය, යුක්තිසහගත ය; එය ප්‍රගති-ශීලි ය, එහි අරමුණ සාමය ය. අරමුණ හුදෙක් එක් රටක නො ව ලොව මුළුල්ලේ ම සාමය වේ, හුදෙක් තාවකාලික නො ව සර්වකාලික සාමය වේ. මේ අරමුණ අත්පත් කර ගනු පිණිස අපි ජීවිතය ත් මරණය ත් අතර අරගලයක් කළ යුත්තෙමු, කවර පරිත්‍යාගයක් පිණිස හෝ සූදානම් වී සිටිය යුත්තෙමු, කෙළවර තෙක් ම අත නැර උත්සාහ කළ යුත්තෙමු, කිසි කලෙක දිනුම්-කණුවෙන් මෙහාදී නතර නො විය යුත්තෙමු. එය අත්පත් කර ගැනීමට උවමනා කරන පරිත්‍යාගය කොතරම් මහත් වුව ද, කාලය කොතරම් දිගු වුව ද, සදා සාමයේ ත් ආලෝකයේ ත් නව ලෝකයක් පැහැදිලි ලෙස ම අප ඉදිරියේ තිබේ. මේ යුද්ධය කිරීමෙහි ලා අපේ විශ්වාසයට පදනම වී ඇත්තේ අප අත් කර ගැනීමට ආයාස දරන්නා වූ සදා සාමයේ සහ ආලෝකයේ නව චීනය ත් නව ලෝකය ත් ය. පැසිස්ට්වාදය සහ අධිරාජ්‍යවාදය යුද්ධය සදහට ම තබා ගන්ට කැමති ය, එහෙත් අපේ කැමැත්ත එතරම් ඈත නො වන අනාගතයේදී එය අවසන් කර දැමීමට ය. මිනිස්වර්ගයා අතර සුවිසාල වැඩි-පිරිය මේ අභිප්‍රාය උදෙසා තම උපරිම පරිශ්‍රමයන් දැරිය යුතු ය. චීනයේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

45 කෝටියක් වන ජනතාව ලෝකයේ ජනගහණයෙන් හතරෙන් එක් කොටසක් තනති; ඔවුන් තම එකමුතු දැඩි පරිශ්‍රමයන් මගින් ජපන් අධිරාජ්‍යවාදය පෙරළා දමා, නිදහස ත් සමානත්වය ත් ඇති නව චීනයක් නිර්මාණය කළ හොත්, ඔවුන් සත්තකින් ම සදා ලෝක සාමය පිණිස කරන අරගලයට ඉමහත් සේවයක් ඉටු කරනු වෙනවා ඇත. මෙය නිෂ්ඵල බලාපොරොත්තුවක් නො වේ; කවර හෙයින් ද යත් මුළු ලෝකය ම එහි සමාජ සහ ආර්ථික වර්ධනය සිදුවේගෙන යන මාර්ගයේ මේ තැන කරා ළඟා වෙමින් පවතින නිසා ය; වැලිත් මිනිස්වර්ගයා අතර වැඩි–පිරිස එකතු වී වැඩ කරතොත් අපේ එල්ලය දශක කීපයක් ඇතුළත නිසැකයෙන් ම අත් කර ගනු ලබනවා ඇත.

යුද්ධයේදී මිනිසා රඟපාන වේගබලසම්පන්න කොටස

59. මෙතෙක් අප යුද්ධය දිග්ගැසුණු යුද්ධයක් වන්නේ මන්ද, අවසාන ජයග්‍රහණය චීනය සතු වන්නේ මන්ද කියා පහදා දී ඇත; දිග්ගැසුණු යුද්ධය යනු කුමක් ද, දිග්ගැසුණු යුද්ධය නො වන්නේ කුමක් ද යන්න මුඛ්‍ය වශයෙන් සාකච්ඡා කර ඇත. දැන් අපි කළ යුතු කුමක් ද නො කළ යුතු කුමක් ද යන ප්‍රශ්නය දෙසට හැරෙමු. දිග්ගැසුණු යුද්ධය කරගෙන යන්නේ කෙසේ ද, අවසාන ජයග්‍රහණය දිනා ගන්නේ කෙසේ ද? මෙහි පහත පිළිතුරු දී තිබෙන ප්‍රශ්න මේවා ය. එහෙයින් අපි මතු දක්වන ගැටළු එකින් එක සාකච්ඡා කරමු: යුද්ධයෙහි ලා මිනිසා සතු වේගබලසම්පන්න කොටස, යුද්ධය සහ දේශපාලනය, විරුද්දකම් පෑමේ යුද්ධය පිණිස දේශපාලන වශයෙන් උනන්දු කිරීම, යුද්ධයේ පරමාර්ථය, ආරක්ෂණය තුළ ප්‍රහරණය, දිග්ගැසුණු යුද්ධයක් තුළ ඉක්මනින් ලබන විසඳුම්, ඇතුල් පේළි තුළ බාහිර පේළි, මූලපිරුම, නැමෙන සුලු බව, සැලැස්ම කිරීම, ජංගම සංග්‍රාමය, ගොරිල්ලා සංග්‍රාමය, ස්ථානගත සංග්‍රාමය, මූලසුන් කිරීමේ යුද්ධය, වැහැරීමේ යුද්ධය, සතුරා කරන වැරදි වලින් ප්‍රයෝජන ගැනීමට තිබෙන පුළුවන්කම්, ජපන්–විරෝධී යුද්ධයේදී තීරණාත්මක සටන්වැදීම් පිළිබඳ ප්‍රශ්නය සහ, ජයග්‍රහණයේ පදනම වශයෙන් හමුදාව සහ ජනතාව. අපි මිනිසා සතු වේගබලසම්පන්න කොටසින් පටන් ගනිමු.

60. ගැටළු වෙත මනෝමූල ලෙස ළඟා වෙනවාට අපි විරුද්ධ ය'යි අප කියන කල, අප අදහස් කරන්නේ විෂයමූල සත්‍ය කරුණු පදනම නො කර ගත් හෝ ඒවාට අනුරූප නො වන අදහස් වලට අප විරුද්ධ විය යුතු බව ය; ඒ එබඳු අදහස් මතිමාත්‍ර සහ මිථ්‍යා අදහස් වන නිසා ත්, ඒ අදහස් උඩ ක්‍රියා කළොත් අසාර්ථකභාවයට පත් වෙනවා ඇති නිසා ත් ය. එහෙත් කරන්ට තිබෙන කොයි දේ වුව ත් කළ යුතු ව තිබෙන්නේ මනුෂ්‍යයන්

විසින් ය; දිග්ගැසුණු යුද්ධය ත් අවසාන ජයග්‍රහණය ත් මනුෂ්‍යයන් කරන ක්‍රියාව නොමැතිව ඇති වන්නේ නැත. එබඳු ක්‍රියා විපාකදායක වීමට නම් විෂයමූල සත්‍ය කරුණු වලින් අදහස්, මූලධර්ම හෝ මත ලබා ගන්නා වූ ද, සැලැස්ම, නිර්දේශ, ප්‍රතිපත්ති, උපායමාර්ග සහ උපක්‍රම ඉදිරිපත් කරන්නා වූ ද මිනිස්සු සිටිය යුතු ය. අදහස් යනාදිය මනෝමූල වන අතර කාර්ය හෝ ක්‍රියා විෂයමූලකය බවට පරිවර්තනය කළ මනෝමූලකය වේ; එහෙත් ඒ දෙක ම මනුෂ්‍යයන් හට විශේෂ වූ වේගබලසම්පන්න ක්‍රියා කොටස නියෝජනය කරයි. අපි මේ වර්ගයේ වේගබලසම්පන්න ක්‍රියා කොටසට "මිනිසාගේ සවිඥානක වේගබලසම්පන්න ක්‍රියා කොටස" ය'යි කියමු; එය මිනිසා සෙසු සියලු ප්‍රාණීන් ගෙන් ප්‍රභේද කරන අංගලක්ෂණය වේ. විෂයමූල සත්‍ය කරුණු පදනම් කර ගත්තා වූ ත් ඒවාට අනුරූප වන්නා වූ ත් සියලු අදහස් නිවැරදි අදහස් ය; නිවැරදි අදහස් පදනම කර ගත්තා වූ සියලු කාර්ය සහ ක්‍රියා නිවැරදි ක්‍රියා ය. අපි මේ අදහස් වලට සහ ක්‍රියාවන්ට, මේ වේගබලසම්පන්න ක්‍රියා කොටසට, සම්පූර්ණයෙන් ඉඩ දිය යුත්තෙමු. ජපන්-විරෝධී යුද්ධය කරගෙන යන්නේ අධිරාජ්‍යවාදය පන්නා දැමීම ත් පරණ චීනය නව චීනයක් බවට විපර්යාස කිරීම ත් පිණිස ය; මෙය මුදුන්පත් කළ හැකි වන්නේ මුළු චීන ජනතාව ම උනන්දු කොට, ජපානයට විරුද්දකම් පෑමෙහි ලා ඔවුන්ගේ සවිඥනක වේගබලසම්පන්න ක්‍රියා කොටසට සම්පූර්ණයෙන් ඉඩ දුන් කල පමණකි. අප පැත්තකට වී නිකම් වාඩි වී කිසි ක්‍රියාවක් නො කර සිටිතොත්, අපට අයිති වෙන්ට තිබෙන්නේ පරාධීනත්වය පමණකි, දිග්ගැසුණු යුද්ධයක් වත් අවසාන ජයග්‍රහණයක් වත් නො තිබෙනවා ඇත.

61. සවිඥානක වේගබලසම්පන්න කොටසක් ඉටු කිරීම මනුෂ්‍ය චරිතලක්ෂණයකි. මිනිසා යුද්ධයේදී මේ චරිතලක්ෂණය ප්‍රබල ලෙස ප්‍රදර්ශනය කරයි. ඇත්ත, යුද්ධයේදී ජය හෝ පරාජය තීරණය කරනු ලබන්නේ දෙ පැත්තේ ම ඇති යුද්ධමය, දේශපාලන, ආර්ථික සහ භූගෝලවිද්‍යාත්මක තත්වයන් ද, එක් එක් පැත්ත විසින් කරගෙන යන යුද්ධයේ ස්වභාවය ද, එක් එක් පැත්තට ලැබෙන ජාත්‍යන්තර අනුබලය ද මගින් ය; එහෙත් මේවායින් පමණක් ම නො වේ; මේ සියල්ල, තනිකර ගත් කල, ජය ලබන්ට හෝ පරාජය වෙන්ට පුළුවන්කම සලසනවා පමණකි, දෙකින් එක තීරණය නො කරයි; දෙකින් එකක් තීරණය කරනු පිණිස, මනෝමූල ප්‍රයත්නය, එනම්, යුද්ධයට මග පෙන්වීම සහ යුද්ධය කිරීම, යුද්ධයෙහි ලා මිනිසාගේ සවිඥානක වේගබලසම්පන්න කොටස, එකතු කළ යුතු ය.

62. ජය ලබන්ට සොයන විට, විෂයමූල තත්වයන් විසින් පණවා තිබෙන සීමාවන්ට උඩින් පැන යන්ට යුද්ධයකට මග පෙන්වන අයට බැරි ය; කෙසේ වෙවා, මේ සීමාවන් ඇතුළත ජය ලබන්ට ආයාශ දැරීමේදී වේගබලසම්පන්න කොටසක් රඟ පාන්ට ඔවුන්ට හැකි ය, ඔව්හු එවැනි කොටසක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රඟ පෑ යුතු ම ය. යුද්ධයකදී අණදෙන්නන් හට ක්‍රියාව පිළිබඳ වේදිකාව ගොඩනැඟිය යුත්තේ විෂයමූල වශයෙන් පවතින හැකියාවන් මත ය; එහෙත් ඒ වේදිකාව මත නාදයෙන් සහ වර්ණයෙන් ද, බලයෙන් සහ විභූතියෙන් ද පූර්ණ වූ නාටක බොහෝවක් රඟපාන්ට මඟ පෙන්වීමට ඔවුන්ට හැකි ය. විෂයමූල ද්‍රව්‍යමය අඩිතාලම් ඇති කල, ජපන්-විරෝධී යුද්ධයෙහි යෙදී සිටින අණදෙන්නෝ තම ශූරවීරතාව ප්‍රදර්ශනය කරමින්, ජාතික සතුරා තළා දැමීම ත්, අපේ රට සහ සමාජය ආක්‍රමණයෙන් හා පීඩනයෙන් පෙළෙන්නා වූ වර්තමාන තත්වය විපර්යාස කිරීම ත්, නිදහස ත් සමානත්වය ත් සහිත නව චීනයක් නිර්මාණය කිරීම ත් පිණිස තමන්ගේ සියලු බලසේනාවන් නිසි පිළිවෙලට යෙදිය යුතු ය; යුද්ධයට මඟ පෙන්වීම පිණිස අපට තිබෙන මනෝමූල දක්ෂතාවන් ක්‍රියාවේ යෙදිය හැක්කේ ත් යෙදිය යුත්තේ ත් මෙහිදී ය. යුද්ධයෙහි යෙදී සිටින අපේ අණදෙන්නන් අතර කිසිවකු විෂයමූල තත්වයන් කෙරෙන් තමා වියෝග කරගෙන වැරදි කරන හිතුවක්කාරයකු වීම අපට උවමනා නො කරයි; එහෙත් හැම අණදෙන්නකු ම අභීත වූ ත් ප්‍රඥාන්විත වූ ත් සෙනෙවියකු වීම අපට නිශ්චය වශයෙන් ම උවමනා ය. අපේ අණදෙන්නන් හට සතුරා යටපත් කර දමන්නට අභීතභාවය පමණක් නො ව, මුළු යුද්ධය ම වරින් වර වෙනස් වෙමින් ද, වරින් වර නඟිමින් හා බහිමින් ද සිදු වෙමින් යන අතර දිගට ම තත්වයේ ස්වාමීන් වශයෙන් සිටීමට හැකියාව ද තිබිය යුතු ය. යුද්ධය නමැති සාගරයෙහි පිහිනන ඔව්හු, එහි ඒ මේ අත දැහලීම නො ව, නියම පමණට අත් පා ගසමින් පර තෙරට ළඟා වන බව සහතික කළ යුතු ය. යුද්ධයට මඟ පෙන්වන නීති වශයෙන් උපායමාර්ගය සහ උපක්‍රම යුද්ධය නමැති සාගරයෙහි පිහිනීමේ කලාව සම්පාදනය කරයි.

යුද්ධය සහ දේශපාලනය

63. "යුද්ධය යනු දේශපාලනය දිගට ම ගෙනයාම වේ." මේ තේරුමෙන් යුද්ධය දේශපාලනය වේ, යුද්ධය ම දේශපාලන ක්‍රියාවක් වේ; ඉපැරණි කාලයේ සිට ම දේශපාලන ලක්ෂණයක් නො තිබුණු යුද්ධයක් කිසි කලෙක තිබී නැත. ජපන්-විරෝධී යුද්ධය මුළු ජාතිය විසින් කරනු ලබන විප්ලවවාදී යුද්ධයකි: ජයග්‍රහණය යුද්ධයේ දේශපාලන අරමුණෙන්, එනම්, ජපන් අධිරාජ්‍යවාදය පන්නා දමා නිදහස ත් සමානත්වය ත් සහිත නව චීනයක් ගොඩනැඟීමේ අරමුණෙන්, නො වෙන් කළ හැකි ය, විරුද්දකම් පෑමේ යුද්ධය ත් එක්සත් පෙරමුණ ත් අත නැර ගෙන සිටීමේ සාමාන්‍ය ප්‍රතිපත්තියෙන්, සමස්ත ජනතාව උනන්දු කිරීමෙන් සහ, මුලාදැනින් සහ මිනිසුන් අතර සමගිය ත්, හමුදාව සහ ජනතාව අතර සමගිය ත්, සතුරු බලසේනාවන් සීසීකඩ කර යැවීම ත් පිළිබඳ දේශපාලන මූලධර්ම වලින් නො වෙන් කළ හැකි ය, එක්සත් පෙරමුණු ප්‍රතිපත්තිය සාර්ථක ලෙස ක්‍රියාවේ යෙදීමෙන්, සංස්කෘතික පෙරමුණෙහි ඇති කරන ක්‍රියාකාරිභාවයෙන් සහ ජාත්‍යන්තර අනුබලය ත් ජපානය තුළ ජනතාවගේ අනුබලය ත් දිනාගැනීමට දරණ ප්‍රයත්න වලින් නො වෙන් කළ හැකි ය. කොටින්, යුද්ධය එක මොහොතකට හෝ දේශපාලනයෙන් නො වෙන් කළ හැකි ය. යුද්ධය දේශපාලනයෙන් ඈත් කොට තනි කිරීමෙන් සහ එය කේවල දෙයක් වශයෙන් ගන්නා අදහස ඉදිරිපත් කිරීමෙන්, දේශපාලනය සුළු කොට සලකන අතට බර වීමට ජපන්-විරෝධී සන්නද්ධ බලසේනාවන් අතර ඇති වන කවර ගතියක් හෝ වැරදි ය, එය නිවැරදි කළ යුතු ය.

64. එහෙත් යුද්ධයට ඊට ම අයත් විශේෂ අංගලක්ෂණ තිබේ. මේ තේරුමෙන් එය සාමාන්‍ය වශයෙන් දේශපාලනය හා සමාන නො කළ හැකි ය. "යුද්ධය යනු වෙන විධි වලින් දේශපාලනය දිගට ම ගෙන යාම වේ.[21] දේශපාලනය පුරුදු විධි මගින් තවත් ඔබ්බට යා නො හැකි එක්තරා අවස්ථාවකට වර්ධනය වූ කල, මඟ තිබෙන බාධක අහකට අතුගා දමනු පිණිස යුද්ධය ඇති වේ. නිදසුන් වශයෙන්, චීනයේ අර්ධ-ස්වාධීන තත්වය ජපන් අධිරාජ්‍යවාදයේ දේශපාලන වැඩීමට බාධකයකි, එහෙයින් ජපානය ඒ බාධකය අහකට අතුගා දමනු පිණිස ආක්‍රමණ යුද්ධයක් පටන්ගෙන ඇත. චීනය ගැන කෙසේ ද? අධිරාජ්‍යවාදී පීඩනය බොහෝ කලක සිට චීනයේ ධනේශ්වර-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයට බාධකයක් වී ඇත; එහෙයින් එය අහකට අතුගා දමනු පිණිස දරන ප්‍රයත්නයේදී විමුක්ති යුද්ධ බොහෝ ගණනක් කර ඇත. ජපානය දැන් චීනයට පීඩා කිරීමේ ත් චීන විප්ලවයේ ඉදිරිගමනට සම්පූර්ණයෙන් ම අවහිර කිරීමේ ත් අභිප්‍රායයෙන් යුද්ධය උපයෝගී කරගෙන සිටී; එහෙයින් මේ බාධකය අහකට අතුගා දැමීමට ඇති ඇගේ අධිෂ්ඨානයේදී විරුද්දකම් පෑමේ යුද්ධය කරන්ට චීනයට බලෙන් ම සිදු වී ඇත. බාධකය ඉවත් කරනු ලැබූ කල, අපේ දේශපාලන අරමුණ මුදුන්පත් වේ, යුද්ධය අවසන් වේ. එහෙත් බාධකය සම්පූර්ණයෙන් අහකට අතුගා නො දමනලද නම්, අරමුණ සපුරා මුදුන්පත් වන තුරු යුද්ධය දිගට ම කරගෙන යන්ට සිදු වේ. මෙසේ ජපන්-විරෝධී යුද්ධයේ කර්තව්‍ය ඉටු කරන්නට පෙර සමගිසම්මුතියක් සොයන කවරෙක් වේවා එහි ලා අසමත් වනු නියත ය; කවර හෙයින් ද යත්, කිසියම් හේතුවක් නිසා සමගිසම්මුතියක් ඇති වුව ත්, ජනතාව අතර පුළුල් සමූහයන් සත්තකින් ම යටත් නො වී යුද්ධයේ දේශපාලන පරමාර්ථය මුදුන්පත් කරගන්නා තුරු එය කරගෙන යනවා ඇති හෙයින්, යුද්ධය නැවත ඇති විය හැකි නිසා ය. එහෙයින් දේශපාලනය ලේ හැලීමෙන් තොර යුද්ධය වන අතර යුද්ධය ලේ හැලීම සහිත දේශපාලනය වේ ය' යි කිව හැකි ය.

65. යුද්ධයේ විශේෂිත අංගලක්ෂණය කෙරෙන් විශේෂිත සංවිධාන රැසක්, විශේෂිත ක්‍රම මාලාවක් සහ විශේෂිත ක්‍රියාවලි වර්ගයක් උද්ගත

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

වන්නේ ය. සංවිධාන නම් සන්නද්ධ බලසේනා ත් ඒවා කැවුව යන සියල්ල ත් ය. ක්‍රම නම් යුද්ධයකට මග පෙන්වීම පිණිස තිබෙන උපාය-මාර්ගය ත් උපක්‍රම ත් ය. ක්‍රියාවලිය නම් ප්‍රතිවිරුද්ධ සන්නද්ධ බලසේනා-වන්, තමන්ට හිතකර වූ ත් සතුරාට අහිතකර වූ ත් උපායමාර්ගය සහ උපක්‍රම යොදමින්, එකිනෙකාට පහර දෙන හෝ එකිනෙකාට විරුද්ධ ව තමන් ආරක්ෂා කරගන්න සමාජ ක්‍රියාකාරිත්වයේ විශේෂිත ආකාරය යි. එහෙයින් යුද්ධ අත්දැකීම් විශේෂිත අත්දැකීම් වර්ගයකි. යුද්ධයට සහභාගි වන සියලු දෙනා ම තමන්ට ජය ගත හැකි වීමට පෙර තමන්ට හුරු පුරුදු විධි වලින් ඉවත් වී, තමන් යුද්ධයට හුරු පුරුදු කරගත යුක්තාහ.

විරුද්දකම් පෑමේ යුද්ධය පිණිස දේශපාලන වශයෙන් උනන්දු කිරීම

66. අපගේ වැනි විශාල වූ ජාතික විප්ලවවාදි යුද්ධයක් ව්‍යාප්ත ලෙස ත් අනූන ලෙස ත් කරන දේශපාලන උනන්දු කිරීමකින් තොර ව ජය ගත නො හැකි ය. ජපන්–විරෝධි යුද්ධයට පෙර ජපානයට විරුද්දකම් පෑම පිණිස දේශපාලන වශයෙන් උනන්දු කිරීමක් නො වී ය; මෙය ලොකු අඩුපාඩුවක් විය, එහි ප්‍රතිඵලය වශයෙන් චීනය දැනට ම එක් (ඉත්තන්) ඇදීමක් සතුරාට පැරදී සිටී. යුද්ධය පටන් ගත් පසු, දේශපාලන වශයෙන් උනන්දු කිරීම, අනූන වනු තබා, ව්‍යාප්ත වත් නො වී ය. ජනතාව අතර සුවිසාල වැඩි පිරිසට යුද්ධය පිළිබඳ ආරංචිය ගෙනාවේ සතුරාගේ වෙඩි ශබ්දය ත් සතුරු අහස්යානා වලින් හෙළනලද බෝම්බ ත් ය. එය ද එක් වර්ගයක උනන්දු කිරීමකි; එහෙත් එය අප වෙනුවෙන් කළේ සතුරා ය, අපි ම එය අප සඳහා නො කළෙමු. දුන් පවා තුවක්කු හඬ ඇසෙන තෙක් මානයෙන් ඔබ්බෙහි ඇත පිටිසර පෙදෙස් වල සිටින ජනයා සිරිත් පරිදි සන්සුන් ලෙස වැඩ කරගෙන යති. මේ තත්වය වෙනස් විය යුතු ය, නැතහොත් අපේ ජීවිතය ත් මරණය ත් අතර අරගලයේදී අපට ජය ගත නො හැකි ය. අපි ඉත්තකු අදින තව වරක් කිසි විටෙක සතුරාට නො පැරදිය යුත්තෙමු; අප නො පැරදිය යුතුවා පමණක් නො ව, අපි, ඔහු පරදවනු පිණිස, මේ (ඉත්තා) ඇදීමෙන්, එනම් දේශපාලන වශයෙන් උනන්දු කිරීමෙන්, සම්පූර්ණ ප්‍රයෝජනය ගත යුත්තෙමු. මේ ඇදීම තීරණාත්මක ය; ආයුධ සහ වෙනත් දේ අතින් ඇති අපේ අඩු–බලය හුදෙක් ද්විතීය වන අතර, ඒ ඇදීම ප්‍රාථමික වැදගත්කමකින් යුතු ය. රට පුරා ම සාමාන්‍ය ජනතාව උනන්දු කිරීම සතුරා ගිල්වනු පිණිස ලොකු මුහුදක් මවනවා ඇත, ආයුධ සහ වෙනත් දේ අතින් ඇති අපේ අඩු–බලය පිරිමසන තත්වයන් නිර්මාණය කරනවා ඇත, යුද්ධයේදී හැම දුෂ්කර-තාවක් ම මැඩපැවැත්වීම පිණිස කලින් තිබිය යුතු දේ නිර්මාණය කරනවා

ඇත. ජය දිනා ගනු පිණිස, අපි විරුද්දකම් පෑමේ යුද්ධයෙහි, එක්සත් පෙර-මුණෙහි සහ දිග්ගැසුණු යුද්ධයෙහි අත නැර යෙදී සිටිය යුත්තෙමු. එහෙත් මේ සියල්ල සාමාන්‍ය ජනයා උනන්දු කිරීමෙන් වෙන් කළ නො හැකි ය. ජය පතන නමුත් දේශපාලන වශයෙන් උනන්දු කිරීම නො සලකා හැරීම ''රථය උතුරට දක්කමින් දකුණට යන්ට'' පැතීම වැනි ය; ප්‍රතිඵලය නො වැළකිය හැකි ලෙස ම වෙනවා ඇත්තේ ජයග්‍රහණයට අහිමි වීම ය.

67. දේශපාලන වශයෙන් උනන්දු කිරීම යන්නේ තේරුම කුමක් ද? පළමුවැනි ව, එහි තේරුම යුද්ධයේ දේශපාලන අරමුණ හමුදවට ත් ජනතා-වට ත් කියා දීම ය. යුද්ධය කළ යුත්තේ මන්ද යනු ත් එය තමාට අදාළ වන සැටි ත් හැම සෙබළකුට ම හා හැම සාමාන්‍ය රටවැසියකුට ම පෙනී යාම අවශ්‍ය ය. යුද්ධයේ දේශපාලන අරමුණ ''ජපන් අධිරාජ්‍යවාදය පන්නා දැමීම සහ නිදහස ත් සමානත්වය ත් සහිත නව චීනයක් ගොඩනැඟීම'' ය; අපි, ජපන්–විරෝධි නැඟිටීමක් ඇති කරන්ට සහ තමන් සතු සියල්ල යුද්ධය සඳහා පරිත්‍යාග කිරීම පිණිස කෝටි ගණන් මිනිසුන් එකාමෙන් සමගි කරන්ට අපට හැකි වීමට පෙර, සියලු දෙනාට ම, සියලු ම සෙබළුන්ට සහ සාමාන්‍ය වැසියන්ට, මේ දේශපාලන අරමුණ ප්‍රකාශ කළ යුත්තෙමු. දෙවැනි ව, අරමුණ ඔවුන්ට හුදෙක් තෝරා දීම ම ප්‍රමාණවත් නො වේ; ඒ අරමුණ මුදුන්පත් කිරීමේ විධි සහ ප්‍රතිපත්ති ද දිය යුතු ය; ඒ කියන්නේ දේශපාලන වැඩසටහනක් තිබිය යුතු බව ය. ජපානයට විරුද්දකම් පෑම සහ ජාතිය බේරා ගැනීම පිණිස කරුණු–දහයේ වැඩසටහන ද, සන්නද්ධ විරුද්දකම් පෑමේ සහ ජාතික සංවර්ධනයේ වැඩසටහන ද අපට දැනට ම තිබේ; අපි ඒ දෙක ම හමුදව අතර ත් ජනතාව අතර ත් ජනප්‍රිය කළ යුත්-තෙමු, ඒවා ක්‍රියාවේ යෙදීමට හැම එක්කෙනා ම උනන්දු කළ යුත්තෙමු. පැහැදිලි, නියම දේශපාලන වැඩසටහක් නොමැතිව ජපානයට විරුද්ධ යුද්ධය කෙළවර තෙක් ගෙනයාම පිණිස සියලු සන්නද්ධ බලසේනාවන් සහ මුළු ජනතාව උනන්දු කිරීමට කොහෙත් ම බැරි ය. තුන්වැනි ව, අපි ඔවුන් කෙසේ උනන්දු කළ යුත්තෙමු ද? කට වචනයෙන්, පත්‍රිකා සහ ප්‍රවෘත්ති පත්‍රිකා මගින්, පුවත්පත්, පොත් සහ පොඩිපොත් මගින්, නාට්‍ය සහ චිත්‍රපටි මගින්, පාසල් මගින්, බහුජන සංවිධාන මගින් සහ අපේ කාඩර්වරුන් මගින් ය. මෙතෙක් කුඕමින්තාං ප්‍රදේශ වල කර තිබෙන දේ මහ සයුරේ දිය බින්දුවක් පමණි; එමතු නො ව එය කර තිබෙන්නේ ජනතාවගේ රසයට නො ගැලපෙන විධියකට ය, ඔවුන්ට නුහුරු ජීවගුණයකින් ය; මෙය බලවත් ලෙස වෙනස් කළ යුතු ය. සිව්වැනි ව, එක් වරක් උනන්දු කිරීම මදි ය; විරුද්දකම් පෑමේ යුද්ධය පිණිස දේශපාලන වශයෙන් උනන්දු කිරීම දිගට ම කරගෙන යා යුතු ය. අපට අයත් වැඩය අපේ දේශපාලන වැඩසටහන ජනතාවට ඇසෙන්ට කටපාඩමින් කියවීම නො වේ, එසේ කියවන දේට කිසිවෙක් කන් නො දෙනවා ඇත; අපි යුද්ධය පිණිස දේශපාලන වශයෙන්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

උනන්දු කිරීම යුද්ධයේදී සිදු වන දේ සමග ත් සෙබළුන්ගේ සහ ජනතාවගේ ජීවිතය සමග ත් පිරිද්දිය යුත්තෙමු, එය දිගට ම යන ව්‍යාපාරයක් කළ යුත්තෙමු. මෙය යුද්ධයේදී අප ජය ලැබීම ප්‍රාථමික වශයෙන් රඳා පවතින ඉමහත් වැදගත්කමක් ඇති කරුණකි.

යුද්ධයේ පරමාර්ථය

68. මෙහිදී අපි යුද්ධයේ දේශපාලන අරමුණ ගැන කතා නො කරමු; ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයේ දේශපාලන අරමුණ ''ජපන් අධිරාජ්‍යවාදය පන්නා දැමීම සහ නිදහස ත් සමානත්වය ත් සහිත නව චීනයක් ගොඩනැඟීම'' ය' යි ඉහතින් පැහැදිලි කර දී ඇත. මෙහිදී අප කතා කරන්නේ යුද්ධය ''ලේ හැලීම සහිත දේශපාලනය'' වශයෙන්, ප්‍රතිවිරුද්ධ හමුදවන් විසින් කරන අන්‍යොන්‍ය ඝාතනය වශයෙන් ගෙන, යුද්ධයේ මූලික පරමාර්ථය ගැන ය. යුද්ධයේ පරමාර්ථය නියම වශයෙන් ''තමා රැකගැනීම සහ සතුරා විනාශ කිරීම ය'' (සතුරා විනාශ කිරීම යනු ඔහු නිරායුධ කිරීම හෝ ''ඔහු විරුද්දකම් පෑමට ඔහුට ඇති බලයෙන් තොර කිරීම'' ය; ඔහුගේ සේනාවන්ට අයත් හැම සාමාජිකයකු ම කායික වශයෙන් විනාශ කිරීම එයින් අදහස් නො වේ). පුරාණ සංග්‍රාමයන්හිදී, හෙල්ල සහ පළිහ පාවිච්චි කරනු ලැබී ය; හෙල්ල සතුරාට පහර දී ඔහු විනාශ කරනු පිණිස ය, පළිහ තමා ආරක්ෂා කර ගනිමින් රැකෙනු පිණිස ය. අද දක්වා ම, සියලු ම අවි හෙල්ලේ ත් පළිහේ ත් ව්‍යාප්තියක් වේ. බෝම්බ හෙළන අහස්යානය, මැෂින් තුවක්කුව, දුර–වදින තුවක්කුව සහ විස වායු හෙල්ලේ වර්ධනයක් වන අතර, ගුවන්–උවදුරු ආවරණය, වානේ හිස්වැස්ම, කොන්කිරිට් රක්ෂස්ථානය සහ විස–වායු වෙස්මුහුණ පළිහේ වර්ධනයෝ වෙති. යුද්ධටැන්කිය හෙල්ලේ ත් පළිහේ ත් කාර්යයන් බද්ධ කළ අළුත් අවියකි. ප්‍රහරණය සතුරා විනාශ කිරීමේ ප්‍රධාන විධිය වේ; එහෙත් ආරක්ෂණය නැතිව බැරි ය. ප්‍රහරණයේදී ආසන්න පරමාර්ථය වනුයේ සතුරා විනාශ කිරීම යි; එහෙත් ඒ සමඟ ම එය තමා රැකගැනීම ද වේ; කවර හෙයින් ද යත් සතුරා විනාශ කරනු නො ලැබුව හොත්, ඔබ විනාශ කරනු ලබන නිසා ය. ආරක්ෂණයේදී ආසන්න පරමාර්ථය වනුයේ ඔබ රැකගැනීම යි. එහෙත් ඒ සමග ම ආරක්ෂණය ප්‍රහරණයේ අඩුපාඩු සපිරීමේ හෝ ප්‍රහරණයට බහින්ට සූදනම් වීමේ විධියක් ද වේ. පසුබැසීම ආරක්ෂණයේ ගණයට ඇතුළත් ය, ආරක්ෂණය දිගට ම ගෙනයාමක් ය; ඒ අතර ලුහුබැඳීම ප්‍රහරණය දිගට ම ගෙනයාමක් වේ. අයකුට සාර්ථක ලෙස තමා රැකගැනීම කර ගත හැකි වන්නේ සතුරා විශාල සංඛ්‍යාවන් වශයෙන් විනාශ කිරීමෙන් පමණක් ම නිසා, සතුරා විනාශ කිරීම යුද්ධයේ ප්‍රාථමික පරමාර්ථය වන බව ත් තමා

රැකගැනීම ද්විතීය වන බව ත් පෙන්වා දිය යුතු ය. එහෙයින්, සතුරා විනාශ කිරීමේ ප්‍රධාන විධිය වන ප්‍රහරණය ප්‍රාථමික වේ; ඒ අතර සතුරා විනාශ කිරීමේ අතිරේක විධියක් සහ තමා රැකගැනීමේ විධියක් වන ආරක්ෂණය ද්විතීය වේ. ඇත්ත වශයෙන් ම පවතින සංග්‍රාමයේදී කාලයෙන් වැඩි හරියක් ආරක්ෂණය විසින් ද කාලයෙන් ඉතිරි හරිය ප්‍රහරණය විසින් ද ප්‍රධාන කොටස රඟපානු ලැබේ. එහෙත් යුද්ධය මුළු එකක් වශයෙන් ගනු ලැබේ නම්, ප්‍රහරණය ප්‍රාථමික ව පවතී.

69. යුද්ධයේදී වීරෝදර ජීවිත පරිත්‍යාගයට දිරි දීම හරි ය' යි අප කියන්නේ කෙසේ ද? එය ''තමා–රැකගැනීම'' ට පටහැනි නො වේ ද? නැත, එය පටහැනි නො වේ; පරිත්‍යාගය ත් තමා–රැකගැනීම ත් යන දෙක ම එකිනෙකට ප්‍රතිපක්ෂ ය, ඌනපූරක ය. යුද්ධය ලේ හැලීම සහිත දේශපාලනය වේ, බලෙන් ම මිලක් ලබා ගනී. ඇතැම් විට අතිශයින් ම අධික මිලක් ලබා ගනී. අඩාල සහ තාවකාලික පරිත්‍යාගය (නො–රැකගැනීම) පොදු සහ නිත්‍ය රැකගැනීම උදෙසා කරනු ලැබේ. මූලික වශයෙන් සතුරා විනාශ කිරීමේ විධියක් වන ප්‍රහරණයට තමා–රැකගැනීමේ කාර්යය ද තිබේ ය' යි අප කියන්නේ මෙන්න මේ නිසා ම ය. ආරක්ෂණය ප්‍රහරණය සමග ම විය යුතු වූ ත් තනිකර සහ නිකම් ම නිකම් ආරක්ෂණය නො විය යුතු වූ ත් හේතුව ද මෙය ම ය.

70. යුද්ධයේ පරමාර්ථය, එනම් තමා රැක ගැනීම සහ සතුරා විනාශ කිරීම, යුද්ධයේ හරය සහ සියලු යුද්ධ වැඩකටයුතු වල පදනම වේ, කාර්මික වැඩකටයුතු වල සිට උපායමාර්ගික වැඩකටයුතු තෙක් සියලු යුද්ධ වැඩකටයුතු පුරා පැතිරෙන හරයක් වේ. යුද්ධයේ පරමාර්ථය යුද්ධයේ පදනම වශයෙන් තිබෙන මූලධර්මය වේ; මොන ම අයුරකින් වත් එයින් වියෝග වීමට කිසි ම කාර්මික, උපක්‍රමික හෝ උපායමාර්ගික සංකල්පයකට වත් මූලධර්මයකට වත් බැරි ය. නිදසුන් වශයෙන් වෙඩි තිබීමේදී ''ආවරණය වීමේ සහ වෙඩි–ශක්තියෙන් සම්පූර්ණ ප්‍රයෝජනය ගැනීමේ'' මූලධර්මය යන්නෙන් කුමක් අදහස් වේ ද? මුලින් කී එකේ අභිප්‍රාය තමා–රැකගැනීම ය, පසුව කී එකේ අභිප්‍රාය සතුරා විනාශ කිරීම ය. මුලින් කී එක භූමිභාගයෙන් සහ එහි අංගලක්ෂණ වලින් ප්‍රයෝජන ගැනීම, උන්හිටිගමන් නික්මෙමින් ඉදිරියට යාම සහ විසිරී සිටින ආකාරයෙන් පැතිරී යාම වැනි ශිල්පක්‍රම ඇති කරයි. පසුව කී එක පිටිය වෙඩි වලින් තොර කිරීම සහ වෙඩි–දැලක් සංවිධානය කිරීම වැනි, වෙනත් ශිල්පක්‍රම ඇති කරයි. උපායමාර්ගික සටන්ව්‍යාපාරයකදී උන්හිටිගමන් වේගයෙන් පහර දෙන බලසේනාව, (සතුරා) හිර කරගෙන සිටින බලසේනාව සහ අතිරේක බලසේනාව සම්බන්ධයෙන්, පළමුවැන්න සතුරා මුලසුන් කරනු පිණිස ය, දෙවැන්න තමා රැක ගැනීම පිණිස ය, තුන්වැන්න වටාපිටා තත්වයන්ට අනුව දෙකින් කොයි එක හෝ පිණිස ය — එක්කෝ සතුරා මුලසුන් කිරීම පිණිස ය (එහිදී එය වේග-

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

යෙන් පහර දෙන බලසේනාව තර කරයි, නැතහොත් ලුහුබඳින බලසේනාවක් ලෙස සේවය කරයි), නැත්නම් තමා රැක ගැනීම පිණිස ය (එහිදී එය හිර කරගෙන සිටින බලසේනාව තර කරයි, නැතහොත් ආවරණය සලසන බලසේනාවක් ලෙස සේවය කරයි). මෙසේ කිසි ම කාර්මික, උපක්‍රමික හෝ උපායමාර්ගික මූලධර්මයකට වත් සටන්ව්‍යාපාරයකට වත් මොන ම අයුරකින් හෝ යුද්ධයේ පරමාර්ථයෙන් වියෝග විය නො හැකි ය; මේ පරමාර්ථය යුද්ධයක සර්වය පුරා පැතිරෙයි, පටන්ගැන්මේ සිට කෙළවර තෙක් යුද්ධය තුළින් දිව යයි.

71. ජපන්-විරෝධී යුද්ධයට මගපෙන්වීමේදී, විවිධ මට්ටම් වල සිටින නායකයෝ එක් එක් පැත්තේ මූලික සාධක අතර ඇති ප්‍රභේදය වත් මේ යුද්ධයේ පරමාර්ථය වත් නො දැක නො සිටිය යුත්තාහ. යුද්ධමය ව්‍යාපාරයන් ගෙන යන අතර මේ එකිනෙකට ප්‍රභේද වූ මූලික සාධකයෝ තමා රැක ගැනීමට ත් අනිකා විනාශ කිරීමට ත් එක් එක් පැත්ත විසින් කරන අරගලයේදී ක්‍රම ක්‍රමයෙන් අනාවරණය වෙති. අපේ යුද්ධයේදී අපි ලොකු හෝ කුඩා ජයක් දිනා ගැනීමට ත්, සතුරාගේ කොටසක් නිරායුධ කිරීමට සහ ඔහුගේ මිනිසුන් ගෙන් හා ද්‍රව්‍ය වලින් කොටසක් විනාශ කිරීමට ත් හැම පූර්ණ්ඩුවකදී ම ආයාශ දරමු. අපි සතුරාගේ මේ කොටස් වශයෙන් වන විනාශයන්ගේ ප්‍රතිඵල ප්‍රධාන උපායමාර්ගික ජයග්‍රහණ බවට සංචය කොට, එසේ සතුරා නෙරපා දැමීමේ ත්, මව්බිම ආරක්ෂා කිරීමේ ත්, නව චීනයක් ගොඩනැඟීමේ ත් අවසාන දේශපාලන අරමුණ අත්පත් කර ගත යුත්තෙමු.

ආරක්ෂණය තුළ ප්‍රහරණය, දිග්ගැසුණු යුද්ධයක් තුළ ඉක්මනින් ලබන විසඳුම්, ඇතුල් පේළි තුළ බාහිර පේළි

72. දැන් අපි ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධයේ විශේෂිත උපායමාර්ගය පරීක්ෂා කර බලමු. ජපානයට විරුද්ධකම් පෑම පිණිස තිබෙන අපේ උපායමාර්ගය දිග්ගැසුණු යුද්ධයේ උපායමාර්ගය වේ ය'යි අප දැනට ම කියා ඇත; ඇත්තෙන් ම එය හරියට ම හරි ය. එහෙත් මේ උපායමාර්ගය පොදු ය, විශේෂිත නො වේ. විශේෂිත වශයෙන්, දිග්ගැසුණු යුද්ධය කරගෙන යා යුත්තේ කෙසේ ද? අප දැන් මේ ප්‍රශ්නය සාකච්ඡා කරමු. අපේ පිළිතුර මතු දක්වන පරිදි ය. යුද්ධයේ පළමුවැනි සහ දෙවැනි අවස්ථාවන්හිදී, ඒ කියන්නේ සතුරාගේ පහරදීමේ අවස්ථාවේදී සහ ඔහු තමා දිනා ගත් දේ රැකගන්නා අවස්ථාවේදී, අපි උපායමාර්ගික ආරක්ෂාවීම තුළ උපක්‍රමික පහරදීම් ද, උපායමාර්ගික වශයෙන් දිග්ගැසුණු යුද්ධය තුළ ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ යුද්ධව්‍යාපාර සහ සටන් ද, උපායමාර්ගික වශයෙන් ඇතුල් පේළි තුළ බාහිර පේළි වල යුද්ධව්‍යාපාර සහ සටන් ද කරගෙන යා යුත්තෙමු. තුන්වැනි අවස්ථාවේදී, අපි උපායමාර්ගික පෙරළා-පහරදීම ආරම්භ කළ යුත්තෙමු.

73. ජපානය ප්‍රබල අධිරාජ්‍යවාදී බලවතකු වන නිසා ත්, අප දුර්වල අර්ධ-විජිත, අර්ධ-රදළ රටක් වන නිසා ත්, අප උපායමාර්ගික ආරක්ෂාවීමෙහි යෙදී සිටින අතර ඈ උපායමාර්ගික පහරදීමේ ප්‍රතිපත්තිය යොදා ඇත. ජපානය ඉක්මනින් විසඳුමක් ලබන යුද්ධයක උපායමාර්ගය ක්‍රියාවේ යොදන්ට උත්සාහ කරයි. ජපානය ගොඩ ත් මුහුද ත් යන දෙකෙන් ම චීනය වටලා අවහිර කරනු පිණිස තරමක් උසස් සටන් ක්ෂමතාවෙන් යුත් හමුද ඩිවිසන් දුසිම් ගණන් (දැන් ගණනින් තිහකි) සහ ඇගේ නාවිකහමුදවෙන් කොටසක් යොදන්නී ය, චීනයට බෝම්බ හෙළීම පිණිස ඇගේ අහස් සේනාව යොදන්නී ය. ඇගේ හමුදව දැනට ම පාඕතව් නුවර සිට හාංචව් නුවර තෙක් විහිදුණු දිගු පෙරමුණක් පිහිටුවා ඇත, ඇගේ නාවිකහමුදව පූචියන් සහ ක්වංතුං කරා ළඟා වී ඇත; මෙසේ බාහිර-පේළි සටන්ව්‍යාපාර විශාල පරිමාණයකින් හැඩ ගැසී ඇත. අනික් අතට, අප සිටින්නේ ඇතුල් පේළි තුළ සටන් කිරීමේ තත්වයෙහි ය. මේ සියල්ල අප දුර්වල වන අතර සතුරා ප්‍රබල ය යන සත්‍ය කාරණය හේතු කොට ගෙන ය. මෙය තත්වයේ එක් අංගයකි.

74. එහෙත් මීට හරියට ම ප්‍රතිපක්ෂ වූ තවත් අංගයක් තිබේ. ජපානය ප්‍රබල නමුත්, ඈට උවමනා තරම් සෙබළු නැත. චීනය දුර්වල නමුත්, ඈට සුවිසාල භූමිප්‍රදේශයක්, විශාල ජනගහණයක් සහ ඕනෑ තරම් සෙබළු ඇත. මෙයින් වැදගත් විපාක දෙකක් ඇති වේ. පළමුවැනි ව, විසාල රටකට විරුද්ධ ව තම කුඩා බලසේනාවන් යොදන සතුරාට හැකි වන්නේ ඇතැම් ලොකු නගර සහ ප්‍රධාන ගමනාගමන මාර්ග ත් තැනි වලින් කොටසකුත් අල්ලාගැනීමට පමණකි. මෙසේ ඔහු අල්ලාගෙන සිටින භූමිප්‍රදේශයෙහි ගැරිසන් නො කොට හැර දමන්ට ඔහුට සිදු වී ඇති සුවිසාල ප්‍රදේශ තිබේ; ඒවා අපේ ගොරිල්ලා සංග්‍රාමය පිණිස සුවිසාල පොරබිමක් සකස් කර දෙයි. චීනය මුළු එකක් වශයෙන් ගත් කල, සතුරා යම් විදියකින් කැන්ටන්, වූහාන් සහ ලාන්චව් යන නගර සම්බන්ධ කරන පේළිය ද ඊට යාබද ප්‍රදේශ ද අල්ලා ගත්තත්, ඉන් ඔබ්බෙහි ප්‍රාන්ත අල්ලාගැනීම ඔහුට උගහට වේ; මෙය දිග්ගැසුණු යුද්ධය අවසාන ජයග්‍රහණය තෙක් කරගෙන යාමට චීනයට පොදු පසුමුණක් සහ ඉතා වැදගත් කඳවුරු දෙයි. දෙවැනි ව, තම කුඩා බලසේනාවන් විශාල සේනාවන්ට විරුද්ධ ව පොරට තිබීමෙන්, සතුරා අපේ විශාල බලසේනාවන් විසින් වට කරනු ලබයි. සතුරා මාර්ග කීපයක් ඔස්සේ අපට පහර දෙයි, උපායමාර්ගික වශයෙන් අප ඇතුල් පේළි වල සිටින අතර ඔහු බාහිර පේළි වල සිටී, උපායමාර්ගික වශයෙන් අප ආරක්ෂාවීමෙහි යෙදී සිටින අතර ඔහු පහරදීමෙහි යෙදී සිටී; මේ සියල්ල අපට හුහක් ම අවාසියට සිටින්නාක් මෙන් පෙනේ. කෙසේ වේවා, අපට තිබෙන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වාසි දෙකෙන්, එනම්, සුවිසාල භූමිප්‍රදේශයෙන් සහ විසාල බලසේනාවන්ගෙන්, ප්‍රයෝජන ගන්ට ත්, මුරණ්ඩු ලෙස කරන ස්ථානගත සංග්‍රාමය වෙනුවට, එක් සතුරු ඩිවිසනයකට විරුද්ධ ව ඩිවිසන් කීපයක්, සතුරාගේ මිනිසුන් දස දහසකට විරුද්ධ ව අපේ මිනිසුන් දස දහස් කීපයක්, සතුරාගේ එක් කොලමකට විරුද්ධ ව අපේ කොලම් කීපයක් යොදමින් ද, යුදබිමේ බාහිර පේළි වල සිට එක් කොලමක් උන්හිටිගමන් වටලා පහර දෙමින් ද, නැමෙන සුලු ජංගම සංග්‍රාමය කරගෙන යන්ට ත් අපට හැකි ය. මේ අයුරින්, සතුරා උපායමාර්ගික සටන්ව්‍යාපාර වලදී බාහිර පේළි වල ත් පහරදීමෙහි ත් සිටින අතර ම, යුද්ධව්‍යාපාර වලදී සහ සටන් වලදී ඇතුල් පේළි වල සටන් කිරීමට ත් ආරක්ෂාවීමෙහි සිටීමට ත් ඔහුට බලෙන් ම සිදු වෙනවා ඇත. වැලිත් අප හට, උපායමාර්ගික සටන්ව්‍යාපාර වලදී තිබෙන ඇතුල් පේළි සහ ආරක්ෂාවීම යුද්ධව්‍යාපාර වලදී හා සටන් වලදී බාහිර පේළි සහ පහරදීම බවට විපර්යාස වෙනවා ඇත. ඉදිරියට ගමන් කරමින් සිටින සතුරු කොලම් එකක් ගැන හෝ, සත්තකින් ම කවරක් ගැන හෝ, ක්‍රියා කරන්ට තිබෙන පිළිවෙල මෙය ය. ඉහතින් සාකච්ඡා කළ ප්‍රතිවිපාක දෙක ම ඇති වන්නේ අපි ලොකු ය, සතුරා කුඩා ය යන සත්‍ය කාරණයෙන් ය. එමතු නො ව, සතුරු බලසේනාවන් කුඩා නමුත් (ආයුධ වලින් සහ පුහුණුවෙන්) ප්‍රබල වන අතර, අපේ බලසේනාවෝ විසාල නමුත් (ආයුධ වලින් සහ පුහුණුවෙන්) දුර්වල ය (එහෙත් චිත්තශක්තියෙන් දුර්වල නැත); එහෙයින්, යුද්ධව්‍යාපාර වලදී සහ සටන් වලදී, අප විසින් කුඩා බලසේනාවන්ට විරුද්ධ ව ලොකු බලසේනාවන් යෙදීම ත් ඇතුල් පේළි වලට විරුද්ධ ව බාහිර පේළි වල සිට සටන් කරගෙන යාම ත් පමණක් නො ව, ඉක්මනින් විසඳුම් සෙවීමේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම ද කළ යුතු ය. සාමාන්‍ය වශයෙන්, ඉක්මනින් විසඳුමක් ලබා ගැනීම පිණිස, අප විසින් පහර දිය යුත්තේ නතර වී සිටින නො ව ගමනෙහි යෙදී සිටින සතුරකුට ය. අපි කල්තබා ම සතුරා නිසැකයෙන් ම ගන්නට ඉඩ තිබෙන මග දිගට දෙ පස ලොකු බලසේනාවක් ආවරණය කොට ඒකරාශි කළ යුත්තෙමු; ඔහු ගමනේ යෙදී සිටින විට, සිදු වන්නේ කුමක් ද'යි ඔහු දැනගැනීමට පෙර ම උන්හිටිගමන් ඉදිරියට ගමන් කොට ඔහු වටලා පහර දී, එසේ සටන ඉක්මනින් ම නිමවිය යුත්තෙමු. අප හොඳට සටන් කළොත්, මුළු සතුරු බලසේනාව ම හෝ එයින් වඩා ලොකු කොටස හෝ කිසියම් කොටසක් හෝ විනාශ කරන්ට අපට පුළුවන් වෙනවා ඇත; අප එතරම් හොඳට සටන් නො කළත්, බරපතල අලාබහානි සිදු කරන්ට අපට පුළුවන් වෙනවා ඇත. මෙය අපේ සටන් අතුරෙන් කොයි එකකට හෝ හැම එකකට ම යෙදේ. වැඩි ජයක් ගැන කතා නො කර ම, එක් මසකට අපට පිංශිංකුආන්හිදී හෝ තායිඅර්චුආංහිදී අප ලැබූ ජය වැනි තරමක් ලොකු එක් ජයක් ලබන්ට හැකි නම්, එය සතුරා බෙහෙවින් ම චිත්තශක්තියෙන් පිරිහෙළනවා ඇත, අපේ බලසේනාවන්ගේ චිත්තශක්තිය ප්‍රබෝධ කරනවා ඇත, ජාත්‍යන්තර අනුබලය දනවනවා ඇත. මෙසේ අපේ

උපායමාර්ගික වශයෙන් දිග්ගැසුණු යුද්ධය යුදපිටියේදී ඉක්මනින් විසඳුමක් ලැබීමේ සටන් බවට පරිවර්තනය වේ. සතුරා බොහෝ යුද්ධව්‍යාපාර වලදී සහ සටන් වලදී පරාජය කරනු ලැබූ පසු, ඔහුගේ උපායමාර්ගික වශයෙන් ඉක්මනින් විසඳුමක් ලබා ගැනීමේ යුද්ධය දිග්ගැසුණු යුද්ධයක් බවට වෙනස් වනු නියත ය.

75. කොටින්, යුද්ධව්‍යාපාර සහ සටන් කරගෙන යාම පිණිස තිබෙන යථෝක්ත සටන්ව්‍යාපාරික මූලධර්මය "බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය" පිළිබඳ මූලධර්මයක් වේ. එය "ඇතුල් පේළි වල කරන දිග්ගැසුණු ආරක්ෂාවීමේ සංග්‍රාමය" පිළිබඳ අපේ උපායමාර්ගික මූලධර්මයේ ප්‍රතිපක්ෂය වේ; එතෙකුදු වුව, එය මේ උපායමාර්ගය ක්‍රියාවේ යෙදීම පිණිස නැතිව ම බැරි මූලධර්මය වේ. අප, යුද්ධව්‍යාපාර සහ සටන් සඳහා ත්, මූලධර්මය වශයෙන්, විරුද්දකම් පෑමේ යුද්ධයේ ආරම්භයේදී කළාක් මෙන්, "ඇතුල් පේළි වල කරන දිග්ගැසුණු ආරක්ෂාවීමේ සංග්‍රාමය" යෙදිය යුතු වේ නම්, එය අපි ලොකු ය, සතුරා කුඩා ය, අපි දුර්වල ය, සතුරා ප්‍රබල ය යන වටාපිටා තත්වයන්ට මුළුමනින් ම උචිත නො වෙනවා ඇත; එය එසේ වුව හොත්, දිග්ගැසුණු යුද්ධයක් පිළිබඳ අපේ උපායමාර්ගික පරමාර්ථය මුදුන්පත් කර ගැනීමට අපට කිසි කලෙක නො හැකි වෙනවා ඇත, සතුරා විසින් අප පරාජය කරනු ලබනවා ඇත. මුළු රටේ ම බලසේනාවන්, සතුරාගේ එක් ක්ෂේත්‍ර හමුදවක් මෙන් දෙ ගුණයක්, තුන් ගුණයක් හෝ සිව් ගුණයක් ශක්තිමත් විශාල ක්ෂේත්‍ර හමුද ගණනකට සංවිධානය කොට, එකක් එක් සතුරු ක්ෂේත්‍ර හමුදවකට පටහැනි ව සිටින සේ තිබීම ත්, එසේ ඉහතින් සැකෙවින් පැහැදිලි කළ මූලධර්මයට එකඟ ලෙස සතුරා ව්‍යාප්ත යුද්ධ භූමි තුළ පූණ්ඩු කර තිබීම ත් වෙනුවෙන් අප සැම විට ම කතා කර ඇත්තේ අන්න ඒ නිසා ය. "බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය" පිළිබඳ මේ මූලධර්මය නිත්‍ය සංග්‍රාමයේදී මෙන් ම ගොරිල්ලා සංග්‍රාමයේදී ද යෙදිය හැකි ය, යෙදිය යුතු ම ය. එය යෙදිය හැකි වන්නේ යුද්ධයේ කිසියම් එක් අවස්ථාවකට පමණක් නො වේ, මුළු යුද්ධය පවතින තුරු ම එය යෙදිය හැකි ය. අප කාර්මික වශයෙන් වඩා හොඳින් සජ්ජිත වී සිටින්නා වූ ත්, ප්‍රබලයා සමග සටන් කරන දුබලයාගේ තත්වයෙහි නො සිටින්නා වූ ත් උපායමාර්ගික පෙරළා-පහරදීම පිළිබඳ අවස්ථාවේදී, අප බාහිර පේළි වල සිට කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සටන් වලට (සෙබළුන්) වැඩි සංඛ්‍යාවක් යෙදීම දිගට ම කරගෙන යතොත් විශාල පරිමාණයකින් සිරකරුවන් සහ ද්‍රව්‍යෝපකරණ අල්ලාගැනීම වඩා ත් සාර්ථක ලෙස කරන්ට අපට හැකි වෙනවා ඇත. නිදසුන් වශයෙන්, අප සතුරාගේ යාන්ත්‍රික කළ එක් ඩිවිසනයකට විරුද්ධ ව යාන්ත්‍රික කළ ඩිවිසන් දෙකක්, තුනක් හෝ හතරක් යොදතොත්, ඒ ඩිවිසනය විනාශ කිරීම ගැන අපට හොඳට ම විශ්වාසය තිබිය හැකි ය. එකකුට පහර දෙන්ට හැඩිදැඩි හාදයන් කීප දෙනකුන්ට පහසුවෙන් ම හැකි ය යනු සාමාන්‍ය බුද්ධිය යි.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

76. අප යුදබිමකදී "බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය" ස්ථිර ලෙස ක්‍රියාවේ යොදතොත්, ඒ යුදබිමේ බලවේගයන්ගේ සමබරතාව වෙනස් කරන්ට පමණක් නො ව පොදු තත්වය අනුක්‍රමයෙන් වෙනස් කරන්ට ද අපට පුළුවන් වෙනවා ඇත. යුදබිමේදී අප පහර දෙමින් ද, සතුරා ආරක්ෂා වෙමින් ද සිටිනවා ඇත, අප බාහිර පේළි වල වැඩි සංඛ්‍යාවන් ද සතුරා ඇතුල් පේළි වල අඩු සංඛ්‍යාවන් ද යොදනවා ඇත, අප ඉක්මනින් ලබන විසඳුම් සොයන අතර, සතුරා, ඔහු කොතරම් උත්සාහ කළත්, අතිරේක බලසෙන් එති'යි බලාපොරොත්තු වෙමින් සටන දිග්ගස්සන්ට සමත් නො වෙනවා ඇත; මේ සියලු හේතු නිසා, සතුරාගේ තත්වය ප්‍රබලත්වයෙන් දුර්වලත්වයට, වැඩි–බලයෙන් අඩු–බලයට වෙනස් වෙනවා ඇත; ඒ අතර අපේ බලසේනාවන්ගේ තත්වය දුර්වලත්වයෙන් ප්‍රබලත්වයට, අඩු–බලයෙන් වැඩි–බලයට වෙනස් වෙනවා ඇත. එබඳු සටන් බොහෝ ගණනක් ජයග්‍රාහී ලෙස කළ පසු, අප ත් සතුරා ත් අතර පොදු තත්වය වෙනස් වෙනවා ඇත. ඒ කියන්නේ, බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය මගින් බොහෝ යුදබිම් වල ලබන ජයග්‍රහණයන් සංචය වීම තුළින්, අප අනුක්‍රමයෙන් අප ශක්තිමත් කරගන්නවා ඇත, සතුරා දුර්වල කරනවා ඇත; එය බලවේගයන්ගේ පොදු සමබරතාව කෙරෙහි අවශ්‍යයෙන් ම බල පා එහි වෙනස්වීම් සිදු කරනවා ඇත. එය එසේ සිදු වූ කල, මේ වෙනස්වීම්, අපේ පැත්තේ තිබෙන සෙසු සාධක සමග ත්, සතුරු කඳවුර තුළ ඇති වන වෙනස්වීම් සහ හිතකර ජාත්‍යන්තර තත්වයක් සමග ත් එක් වී, අප ත් සතුරා ත් අතර පවතින මුළු තත්වය පළමුකොට සමාන එකක් බවට ද ඉක්බිති අපට වැඩි-බලය ඇති එකක් බවට ද හරවනවා ඇත. එය පෙරළා–පහරදීම දියත් කොට, සතුරා රටින් පන්නා දැමීමට අප හට කාලය වෙනවා ඇත.

77. යුද්ධය ශක්තියේ තරගයකි, එහෙත් යුද්ධය කරගෙන යන අතර ශක්තියේ මුල් රටාව වෙනස් වෙයි. මෙහිදී තීරණාත්මක සාධකය වනුයේ මනෝමූල ප්‍රයත්නය යි — වඩ වඩා ජයග්‍රහණයන් දිනා ගැනීම සහ අඩුවෙන් වැරදි කිරීම යි. විෂයමූල සාධකයෝ එබඳු වෙනසක් සිදු වීමට හැකිකම සලසා දෙති, එහෙත් ඒ හැකිකම ඇත්තට ම තිබෙන දෙයක් බවට හරවනු පිණිස නිවැරදි ප්‍රතිපත්තිය ත් මනෝමූල ප්‍රයත්නය ත් යන දෙක ම අවශ්‍ය ය. මනෝමූලකය තීරණාත්මක කොටස රඟපාන්නේ එවිට ය.

මුලපිරුම, නැමෙන සුලු බව සහ සැලැස්ම කිරීම

78. ඉහතින් සාකච්ඡා කළ පරිදි, බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ යුද්ධව්‍යාපාර සහ සටන් වලදී නිශ්චයාත්මක

කරුණ වනුයේ "පහරදීම" ය; "බාහිර පේළි" යන්නෙන් පහරදීම පවතින පරිමණ්ඩලය (හරිය) ද, "ඉක්මනින් විසඳුමක් ලබන" යන්නෙන් පහරදීම පවතින කාලය ද අදහස් වේ. "බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය" යන නම එහෙයිනි. එය දිග්ගැසුණු යුද්ධයක් කරගෙන යාම සඳහා තිබෙන ඉතා ම හොඳ මූලධර්මය වේ, එය ජංගම සංග්‍රාමය යනුවෙන් දන්නා දෙය සඳහා ද ප්‍රතිපත්තිය වේ. එහෙත් එය මුලපිරුම, නැමෙන සුලු බව සහ සැලැස්ම කිරීම නොමැතිව ක්‍රියාවේ යෙදිය නො හැකි ය. දැන් අපි මේ ප්‍රශ්න තුන අධ්‍යයනය කරමු.

79. අප මිනිසා ඉටු කරන සවිඥානක වේගබලසම්පන්න කොටස ගැන දැනට ම සාකච්ඡා කර තිබේ; එහෙයින් අප යළි ත් මුලපිරුම ගැන කතා කරන්නේ මන්ද? සවිඥානක වේගබලසම්පන්න කොටස යන්නෙන් අප අදහස් කරන්නේ මිනිසා සෙසු සත්වයන් ගෙන් ප්‍රභේද කරන චරිතලක්ෂණයක් වන සවිඥානක ක්‍රියාව සහ පරිශ්‍රමය යි; මේ මනුෂ්‍ය චරිතලක්ෂණය යුද්ධයේදී ඉතා ම ප්‍රබල ලෙස ප්‍රකට වෙයි; මේ සියල්ල දැනට ම සාකච්ඡා කර ඇත. මෙහි මුලපිරුම යන්නේ තේරුම හමුදාවකට ක්‍රියා කිරීමේ නිදහස තිබීම ය; එය නිදහස නැති තත්වයකට බලෙන් ම වැටීමට වෙනස් ය. ක්‍රියා-කිරීමේ නිදහස හමුදාවක ජීවිතය ම වේ; එය නැති වූ කල, හමුදාව පරාජය වීමට හෝ විනාශ වීමට ළඟ ය. සෙබළකු නිරායුධ කිරීම ඔහු බලෙන් ම අක්‍රියාකාරි තත්වයකට පත් කරනු ලැබීමෙන් ඔහුට ක්‍රියාවේ නිදහස නැති වී යාමේ ප්‍රතිඵලයක් වේ. හමුදාවක පරාජය සම්බන්ධයෙන් ද එය ම සැබෑ ය. මේ හේතුව නිසා යුද්ධයේදී දෙ පැත්ත ම මුලපිරුම ලබා ගැනීමට ත් අක්‍රියා-කාරිත්වය වළකා ලීමට ත් තමන් විසින් කළ හැකි සියල්ල ම කරති. අප අනුමත කරමින් කතා කරන බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහර දීමේ සංග්‍රාමය ද එය කරගෙන යාමට අවශ්‍ය නැමෙන සුලු බව සහ සැලැස්ම කිරීම ද යන දෙකේ ම අදහස වනුයේ මුලපිරුම ලබා ගැනීම සහ එසේ සතුරා අක්‍රියාකාරි තත්වයකට වැටෙන්නට බල කිරීම ත්, අප රැක ගැනීමේ සහ සතුරා විනාශ කිරීමේ පරමාර්ථය මුදුන්පත් කර ගැනීම ත් ය. එහෙත් මුලපිරුම හෝ අක්‍රියාකාරිත්වය යුද්ධය කිරීමට තිබෙන හැකියාව අතින් ඇති වැඩි–බලයෙන් හෝ අඩු–බලයෙන් වෙන් නො කළ හැකි ය. ඒ අනුව යුද්ධයට කරන මනෝමූල මගපෙන්වීමේ නිවැරදිකමෙන් හෝ වරදින් ද වෙන් නො කළ හැකි ය. ඊට අමතර ව, මුලපිරුම ලබා ගනු වස් සහ සතුරා අක්‍රියාකාරි තත්වයකට වැටෙන්ට බල කරනු වස් ඔහුගේ වැරදි මත වලින් සහ සූදානම් නැතිකමෙන් ප්‍රයෝජන ගැනීමේ ප්‍රශ්නය ද තිබේ. මේ කරුණු මෙහි පහත විශ්ලේෂණය කරනු ලැබේ.

80. මුලපිරුම යුද්ධ කිරීමට ඇති හැකියාව අතින් තිබෙන වැඩි-බලයෙන් වෙන් කළ නො හැකි වන අතර අක්‍රියාකාරිත්වය යුද්ධ කිරීමට ඇති හැකියාව අතින් තිබෙන අඩු–බලයෙන් වෙන් කළ නො හැකි ය. එබඳු

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

වැඩි-බලය හෝ අඩු-බලය මුලපිරුමේ හෝ අක්‍රියාකාරිත්වයේ විෂයමූල පදනම වේ. උපායමාර්ගික මුලපිරුම උපායමාර්ගික පහරදීම මගින් වඩා හොඳින් පවත්වා ගැනීමට ත් ක්‍රියාවේ යෙදීමට ත් හැකි වීම ස්වාභාවික ය; එහෙත් මූලපිරුම හැම විට ම සහ හැම තැන ම පවත්වා ගැනීමට, ඒ කියන්නේ, ඒකාන්ත මූලපිරුම ඇති ව සිටීමට, පුළුවන් වන්නේ ඒකාන්ත අඩු-බලයට විරුද්ධ ව තරගයට තිබූ ඒකාන්ත වැඩි-බලය තිබෙන විට පමණකි. ශක්තිමත් නිරෝගි මිනිසකු ලෙඩකු හා පොර බදන විට, ඔහුට ඒකාන්ත මූලපිරුම තිබේ. ජපානය නො විසඳිය හැකි ප්‍රතිවිරෝධයන් ගෙන් ගහණ වී නැති නම්, නිදසුන් වශයෙන්, මිනිසුන් දශ ලක්ෂ කීපයකින් හෝ කෝටියකින් සැදුණු දැවැන්ත බලසේනාවක් එක විට ම එවන්ට ඇට හැකි නම්, ඇගේ මුදල් වත්පොහොසත්කම් දැන් තිබෙන්නාක් මෙන් කීප ගුණයක් වේ නම්, ඇගේ ම ජනයා ගෙන් හෝ වෙන රටවල් වලින් නැඟෙන විරෝධයක් ඇට නො තිබුණේ නම්, ඇ චීන ජනතාවගේ දරුණු විරුද්දකම් පෑම අවුස්සන ම්ලේච්ඡ ප්‍රතිපත්ති ලුහුබඳින්නේ නැති නම්, එවිට ඒකාන්ත වැඩි-බලය පවත්වා ගැනීමට ත් හැම විට ම සහ හැම තැන ම ඒකාන්ත මූලපිරුම ඇතිව සිටීමට ත් ඇට පුළුවන් වෙනවා ඇත. ඉතිහාසයෙහි, එබඳු ඒකාන්ත වැඩි-බලය යුද්ධයක හෝ යුද්ධව්‍යාපාරයක හෝ මුල් අවස්ථාවන්හිදී කලාතුරකින් විනා දක්නට නො ලැබේ, දක්නට ලැබෙන්නේ එහි අවසානය දෙසට ය. නිදසුන් වශයෙන්, 1වැනි ලෝක යුද්ධයේදී ජර්මනිය යටත් වීමට ළං වී සිටි කාලයේ, එන්තාන්ත රටවල් ඒකාන්ත වශයෙන් වැඩි-බලය ඇත්තේ විය, ජර්මනිය ඒකාන්ත වශයෙන් අඩු-බලය ඇත්තේ විය; එහෙයින් ජර්මනිය පැරදුණේ ය, එන්තාන්ත රටවල් ජය ගත්තේ ය; මෙය යුද්ධයක අවසානය දෙසට ඇති වන ඒකාන්ත වැඩි-බලය ත් අඩු-බලය ත් පිළිබඳ උදහරණයකි. යළි, තායිඅර්වුආංහි චීන ජයග්‍රහණය ළං ව තිබුණු කාලයේ, එහි සිටි තනි වූ ජපන් බලසේනාවන් දරුණු සටනින් පසු ඒකාන්ත අඩු-බලයට හීන කරනු ලැබූ අතර, අපේ බලසේනාවෝ ඒකාන්ත වැඩි-බලය අත්පත් කර ගත්හ; එසේ සතුරා පරදවනු ලැබී ය, අපි ජයග්‍රාහී වීමු; මෙය යුද්ධව්‍යාපාරයක අවසානය දෙසට ඇති වන ඒකාන්ත වැඩි-බලය ත් අඩු-බලය ත් පිළිබඳ උදහරණයකි. යුද්ධයක් හෝ යුද්ධව්‍යාපාරයක් සාපේක්ෂක වැඩි-බලය ඇති හෝ සම සම ව සිටින තත්වයකින් ද කෙළවර වීමට ඉඩ තිබේ; එසේ වූ කල යුද්ධයෙහි සමගිසම්මුතියක් හෝ යුද්ධව්‍යාපාරයෙහි ඇණහිටි තත්වයක් ඇති වේ. එහෙත් වැඩි ම අවස්ථාවන්හිදී ජය හෝ පරාජය තීරණය කරන්නේ ඒකාන්ත වැඩි-බලය හෝ අඩු-බලය යි. මේ සියල්ල හරි යන්නේ යුද්ධයක හෝ යුද්ධ ව්‍යාපාරයක අවසානය සඳහා ය, ආරම්භය සඳහා නො වේ. චීන-ජපන් යුද්ධයේ ප්‍රතිඵලය වන්නේ ජපානය ඒකාන්ත අඩු-බලයට පත් වී පරාජය කරනු ලැබීම ත් චීනය ඒකාන්ත වැඩි-බලයට පත් වී ජය ලැබීම ත් බව කල් තබා කිව හැකි ය. එහෙත් දැනට වැඩි-බලය හෝ අඩු-බලය කොයි පැත්තේ වේවා ඒකාන්ත නො වේ,

සාපේක්ෂක වේ. තම යුද්ධමය, ආර්ථික සහ දේශපාලන-සංවිධානාත්මක බලයේ වාසි ඇතිව, ජපානය අපේ යුද්ධමය, ආර්ථික සහ දේශපාලන-සංවිධානාත්මක දුර්වලකම සහිත අප කෙරෙහි වැඩි-බලයක් ඇතිව සිටී; මෙය ජපානයේ මූලපිරුමට පදනම නිර්මාණය කරයි. එහෙත් ප්‍රමාණාත්මක වශයෙන් ඇගේ යුද්ධමය සහ සෙසු බලය මහත් නො වන නිසා ත්, වෙනත් අවාසි රැසක් ඇට තිබෙන නිසා ත්, ඇගේ වැඩි-බලය ඇගේ ම ප්‍රතිවිරෝධයන් කරණකොටගෙන හීන වේ. ඇ චීනය අතික්‍රමණය කළ විට, ඇ අපේ සුවිසාල භූමිප්‍රදේශයට, විසාල ජනගහණයට, භටයන් මහත් සංඛ්‍යාවන්ට සහ අධිෂ්ඨාන සහගත දේශ-ව්‍යාප්ත විරුද්දකම් පෑමට අභිමුඛ ව සිටින නිසා ඇගේ වැඩි-බලය තව දුරට ත් හීන වී ඇත. එහෙයින්, ජපානයේ සාමාන්‍ය තත්වය සාපේක්ෂක වැඩි-බලය පමණක් ඇති තත්වයක් බවට පත් වී ඇත, එයින් සීමා සහිත වන්නා වූ මූලපිරුම ක්‍රියාවේ යෙදීමට සහ පවත්වා ගැනීමට ඇට තිබෙන හැකියාව ද එසේ ම සාපේක්ෂක බවට පත් වී ඇත. චීනය සම්බන්ධයෙන්, ඇගේ අඩු ශක්තිය නිසා ඇ උපායමාර්ගික වශයෙන් තරමක් අක්‍රියාකාරි තත්වයක සිටින නමුත්, භූමිප්‍රදේශය, ජනගහණය සහ භටකණ්ඩායම් අතින් ඇ ප්‍රමාණාත්මක වශයෙන් වැඩි-බලය සහිත ය, ඇගේ ජනතාවගේ සහ හමුදාවේ චිත්තශක්තිය ත් සතුරා කෙරෙහි ඇති ඔවුන්ගේ දේශප්‍රේමී වෛරය ත් අතින් ද වැඩි-බලය සහිත ය; මේ වැඩි-බලය, වෙනත් වාසි සමග එක් වී, යුද්ධමය, ආර්ථික සහ සෙසු බලය අතින් ඇති ඇගේ අඩු-බලයේ ප්‍රමාණය හීන කරයි, එය සාපේක්ෂක උපායමාර්ගික අඩු-බලයක් බවට වෙනස් කරයි. මෙය චීනයේ අක්‍රියාකාරිත්වයේ තරම ද හීන කරන හෙයින්, ඇගේ උපායමාර්ගික තත්වය සාපේක්ෂක අක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වයක් පමණක් වේ. කෙසේ වේවා, කවර අක්‍රියාකාරිත්වයක් වුව අවාසියකි, අයෙක් එය ඉවත ගසා දැමීමට වෙහෙස ගෙන වීරිය කළ යුතු ය. යුද්ධමය වශයෙන්, එසේ කරන්ට තිබෙන මග ස්ථිර ලෙස ම බාහිර පේළි වල ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය කරගෙන යාම ය, සතුරාගේ පසුමුණෙහි ගොරිල්ලා සංග්‍රාමය දියත් කිරීම ය, එසේ ජංගම සහ ගොරිල්ලා සංග්‍රාමයේ බොහෝ යුද්ධ ව්‍යාපාරයන්හිදී ප්‍රාදේශික වශයෙන් ඉමහත් වැඩි-බලයක් සහ මූලපිරුමක් අත් කර ගැනීම ය. බොහෝ යුද්ධව්‍යාපාර වලදී ලබන එබඳු ප්‍රාදේශික වැඩි-බලය ත් ප්‍රාදේශික මූලපිරුම ත් මගින්, අනුක්‍රමයෙන් උපායමාර්ගික වැඩි-බලය සහ උපායමාර්ගික මූලපිරුම ඇති කරගෙන, උපායමාර්ගික අඩු-බලයෙන් සහ අක්‍රියාකාරිත්වයෙන් අප මුදා ගන්ට අපට හැකි ය. මූලපිරුම සහ අක්‍රියාකාරිත්වය අතර ත්, වැඩි-බලය සහ අඩු-බලය අතර ත් ඇති පරස්පර-සම්බන්ධනය එබඳු ය.

81. මෙයින් මූලපිරුම හෝ අක්‍රියාකාරිත්වය ත් යුද්ධයකට කරන මනෝමූල මගපෙන්වීම ත් අතර ඇති සබඳකම ද තේරුම් ගන්ට අපට

https://liberationbase.wordpress.com

හැකි වේ. දැනට ම පැහැදිලි කර දී තිබෙන පරිදි, අපේ සාපේක්ෂක උපායමාර්ගික අඩු-බලය ත් අක්‍රියාකාරිත්වය ත් පිළිබඳ තත්වයෙන් මිදෙන්නට පුළුවන්කම තිබේ; ක්‍රමය බොහෝ යුද්ධව්‍යාපාර වලදී ප්‍රාදේශික වැඩි-බලය සහ මුලපිරුම ඇති කරගෙන, එසේ සතුරා ප්‍රාදේශික වැඩි-බලයට සහ මුලපිරුමට අහිමි කොට, ඔහු අඩු-බලයට ත් අක්‍රියාකාරිත්වයට ත් ඇද දැමීම ය. මේ ප්‍රාදේශික සාර්ථකභාවයෝ එකතු වී අප හට උපායමාර්ගික වැඩි-බලය සහ මුලපිරුම බවට ද සතුරා හට උපායමාර්ගික අඩු-බලය සහ අක්‍රියාකාරිත්වය බවට ද පත් වෙනවා ඇත. එබඳු වෙනස්වීමක් නිවැරදි මනෝමූල මගපෙන්වීම මත රඳා පවතී. ඇයි? අප වැඩි-බලය සහ මුලපිරුම ලබා ගන්ට සොයන අතර, සතුරා ද එසේ කරයි; මේ කෝණයෙන් බලන කල, යුද්ධය වනාහි ප්‍රතිවිරුද්ධ හමුදවන්ගේ අණදෙන්නන් යුද්ධමය බලසේනාවන් සහ මුදල් වත්පොහොසත්කම් වැනි ද්‍රව්‍යමය තත්වයන්ගේ පදනම පිට වැඩි-බලය සඳහා ත් මුලපිරුම සඳහා ත් කරන ඔවුන්ගේ අරගලයේදී ඔවුන් අතර පවතින මනෝමූල සමත්කමේ තරගයක් වේ. මේ තරගයෙන් ජයග්‍රාහකයෙක් ද පරාජිතයෙක් ද බිහි වෙති; විෂයමූල ද්‍රව්‍යමය තත්වයන් අතින් ඇති ප්‍රභේදය පසෙකින් තිබූ කල, ජයග්‍රාහකයාගේ සාර්ථිකභාවය අවශ්‍යයෙන් ම ඔහුගේ නිවැරදි මනෝමූල මගපෙන්වීම ද පරාජිතයාගේ පරාජය ඔහුගේ වැරදි මනෝමූල මගපෙන්වීම ද හේතු කොට ගෙන වේ. යුද්ධ ප්‍රපංචය අන් කිසි ම සමාජ ප්‍රපංචයකට වඩා මායාවී බව සහ අවිනිශ්චිතභාවය ලක්ෂණය කොටැති බව, වෙන වචන වලින්, එය වැඩියෙන් ම ''වෙන්ට පුළුවන් දෙයක්'' පිළිබඳ කරුණක් බව, අපි පිළිගනිමු. එසේ ද වුව යුද්ධය කිසිසේත් අලෞකික නො වේ, අවශ්‍යතාව විසින් පාලනය කරනු ලබන ලෞකික ක්‍රියාවලියකි. ''සතුරා ත් දැනගන්න, ඔබ ත් දැනගන්න; එවිට ඔබට පරාජය වීමේ අනතුරක් නොමැතිව සටන් සියයක් වුව ත් කළ හැකි ය''[22] යන සුන් වූ ත්සුගේ උපදේශ-වාක්‍යය විද්‍යාත්මක සත්‍යයක් ව පවතින්නේ ඒ නිසා ය. වැරදි ඇති වන්නේ සතුරා ගැන ත් අප ගැන ත් ඇති නොදැනීමෙන් ය; එමතු නො ව, යුද්ධයේ විශේෂ ස්වභාවය නිසා බොහෝ අවස්ථාවන්හිදී දෙපැත්ත ම ගැන සම්පූර්ණ දැනීමක් ලබාගන්ට කොහෙත් ම බැරි වේ; යුද්ධමය තත්වයන් සහ සටන්ව්‍යාපාර ගැන අවිනිශ්චිතභාවයක් පවතින්නේ එහෙයිනි, වැරදි සිදුවන්නේ සහ පරාජය වන්නේ එහෙයිනි. එහෙත් යුද්ධයකදී ඇති වන තත්වය ත් තබන පියවර ත් කවරක් වුව ද, ඒවායේ සාමාන්‍ය පිළිවෙල සහ අත්‍යවශ්‍ය කරුණු දැනගන්ට අයකුට හැකි ය. පළමුකොට හැම වර්ගයේ ම ඔත්තු සෙවීම මගින් ද, ඉක්බිති බුද්ධිමත් නිගමනය සහ විනිශ්චය මගින් ද වැරදි අඩු කරන්ට ත් සාමාන්‍ය වශයෙන් නිවැරදි මග පෙන්වීමක් කරන්ට ත් අණදෙන්නකුට පුළුවන්කම තිබේ. ''සාමාන්‍ය වශයෙන් නිවැරදි මගපෙන්වීම'' යන ආයුධයෙන් සන්නද්ධ වී වැඩිවැඩියෙන් සටන් දිනීමට ත් අපේ අඩු-බලය වැඩි-බලය බවට සහ අපේ අක්‍රියාකාරිත්වය මුලපිරුම බවට හැරවීමට ත් අපට හැකි ය.

මුලපිරුම හෝ අක්‍රියාකාරිත්වය යුද්ධයක නිවැරදි හෝ වැරදි මනෝමූල මගපෙන්වීමට සම්බන්ධ වන්නේ මෙසේ ය.

82. අප ලොකු බලවත් හමුදවන් විඳ තිබෙන පරාජයන්ගේ ද, කුඩා දුබල හමුදවන් දිනාගෙන තිබෙන ජයග්‍රහණයන්ගේ ද වාර්තාව දෙස බලන කල, වැඩි-බලය සහ මුලපිරුම අඩු-බලය සහ අක්‍රියාකාරිත්වය බවට හරවන්ට වැරදි මනෝමූල මගපෙන්වීමට හැකි ය, අනික් අතට වෙනසක් ඇති කරන්ට නිවැරදි මනෝමූල මගපෙන්වීමට හැකි ය යන තීසිසය වඩාත් ම ඒත්තු යන්නේ ය. චීන සහ විදේශීය ඉතිහාසයෙහි එබඳු නිදසුන් රැසක් ම ඇත. ත්සින් සහ චූ රාජ්‍යයන් අතර ඇති වූ චෙංපූ සටන,[23] චූ සහ හාන් රාජ්‍යයන් අතර ඇති වූ චෙංකාඕ සටන,[24] හාන් ශින් විසින් චාඕ හමුදවන් පරාජය කළ සටන,[25] ශින් සහ හාන් රාජ්‍යයන් අතර ඇති වූ කුන්යාං සටන,[26] යුආන් ශාඕ සහ ත්සාඕ ත්සාඕ අතර ඇති වූ කුආන්තු සටන,[27] වූ සහ වෙයි රාජ්‍යයන් අතර ඇති වූ චිහ්පි සටන,[28] වූ සහ ශු රාජ්‍යයන් අතර ඇති වූ යිලිං සටන,[29] චින් සහ ත්සින් රාජ්‍යයන් අතර ඇති වූ පෙයිශුයි සටන,[30] යනාදිය චීනයෙහි ඇති උදහරණ ය. පිටරට දක්නට තිබෙන උදහරණ අතර නැපෝලියන්ගේ යුද්ධව්‍යාපාර වැඩි ගණනක් ද ඔක්තෝබර විප්ලවයට පසු සෝවියට් සංගමයෙහි ඇති වූ සිවිල් යුද්ධය ද වේ. මේ සියළු ම අවස්ථාවන්හිදී, ලොකු බලසේනාවන් පරදා කුඩා බලසේනාවන් විසින් ද, වැඩි-බලය ඇති බලසේනාවන් පරදා අඩු-බලය ඇති බලසේනාවන් විසින් ද ජය දිනාගනු ලැබී ය. ඒ හැම අවස්ථාවකදී ම, දුර්වල බලසේනාව, සතුරාගේ ප්‍රාදේශික අඩු-බලයට සහ අක්‍රියාකාරිත්වයට විරුද්ධ ව ප්‍රාදේශික වැඩි-බලය ත් මුලපිරුම ත් පොරට තබමින්, පළමුකොට සතුරාට එක් තියුණු පරාජයක් ගෙන දුන්නේ ය, ඉක්බිති ඔහුගේ ඉතිරි බලසේනා වෙත හැරී ඒවා එකින් එක සුණු විසුණු කළේ ය, එසේ මුළු තත්වය වැඩි-බලය ත් මුලපිරුම ත් ඇති එකක් බවට විපර්යාස කළේ ය. මුලදී වැඩි-බලය තිබුණු, මුලපිරුම අතැති ව සිටි සතුරා සම්බන්ධයෙන් තත්වය එහි අනික් පැත්ත විය; මනෝමූල වැරදි සහ අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් කරණකොටගෙන, ඔහු වැඩි-බලය සහ මුලපිරුම ඇතිව සිටි ඉතා කදිම හෝ තරමක් හොඳ තත්වයක් ඔහුට සම්පූර්ණයෙන් ම නැති වී ගොස්, ඔහු හමුදවක් නැති සෙනෙවියකු හෝ රාජ්‍යයක් නැති රජකු හෝ බවට පත්වීම ඇතැම් විට සිදු විය. මෙසේ යුද්ධ කිරීමට ඇති හැකියාව අතින් තිබෙන වැඩි-බලය හෝ අඩු-බලය මුලපිරුම හෝ අක්‍රියාකාරිත්වය නිශ්චය කරන විෂයමූල පදනම වන නමුත්, එය ම නියම මුලපිරුම හෝ අක්‍රියාකාරිත්වය නො වන බව පෙනෙයි; නියම මුලපිරුම හෝ අක්‍රියාකාරිත්වය බිහි විය හැක්කේ අරගලයක්, සමත්කමේ තරගයක්, තුළින් පමණකි. අරගලයේදී අඩු-බලය වැඩි-බලය බවට සහ අක්‍රියාකාරිත්වය මුලපිරුම බවට විපර්යාස කිරීමට නිවැරදි මනෝමූල මගපෙන්වීමට හැකි ය, ඊට ප්‍රතිපක්ෂ දේ කිරීමට

https://liberationbase.wordpress.com

වැරදි මනෝමූල මගපෙන්වීමට හැකි ය. හැම පාලක රජපෙළපතක් ම විප්ලවවාදි හමුදාවන් විසින් පරාජය කරනු ලැබී ය යන සත්‍ය කාරණය ඇතැම් කරුණු අතින් ඇති හුදු වැඩි-බලය මූලපිරුම සහතික නො කරන බව ද, අවසාන ජයග්‍රහණය එතරම් වත් සහතික නො කරන බව ද, පෙන්වයි. නියම වටාපිටා තත්වයන්ට අනුව දරන ක්‍රියාශීලි මනෝමූල පරිශ්‍රමය තුළින් යම් යම් තත්වයන් අත් කරගැනීමෙන් වැඩි-බලය තිබෙන පාර්ශ්වයෙන් මූලපිරුම ත් ජය ත් පැහැර ගන්ට අඩු-බලය තිබෙන පාර්ශ්වයට හැකි වේ.

83. වැරදි මත ඇතිව සිටීමෙන් සහ නො දැනුවත් ව ම අතට අසුවීමෙන් වැඩි-බලය ත් මූලපිරුම ත් නැති වෙන්ට ඉඩ තිබේ. එහෙයින්, උවමනාවෙන් ම සතුරා හට වැරදි මත ඇති කිරීම ත්, ඉක්බිති ඔහුට උන්හිටිගමන් දෙන හදිස්සි ප්‍රහාරයන් දීම ත් වැඩි-බලය අත්පත් කරගැනීමේ ද මූලපිරුම අල්ලාගැනීමේ ද මං දෙකක් — සත්තකින් ම වැදගත් විධි දෙකක් — වේ. වැරදි මත මොනවා ද? "පාකුං කන්දේ හැම පඳුරක් ම හැම ගසක් ම සතුරු සෙබළකු සේ දැකීම"[31] වැරදි මතය ගැන උදාහරණයකි. "නැගෙනහිරට පහර දෙන්ට යන බවක් බොරුවට අඟවා බටහිරට පහර දීම" සතුරා අතර වැරදි මත ඇති කිරීමේ විධියකි. බහුජන අනුබලය ආරංචි හොරෙන් පිටවීම නතර කරන්ට සෑහෙන තරම් හොඳ නම්, සතුරාට ඔහුගේ වැඩි-බලය ත් මූලපිරුම ත් නැති වී යන සේ, නොයෙක් විධියේ රැවටිලි මගින් ඔහු වැරදි විනිශ්චයන් සහ ක්‍රියාවන් නමැති මඩගොහොද්දකට ඇද දමන්ට බොහෝ විට පුළුවන්කම තිබේ. "යුද්ධයේදී කිසි ම විටෙක රැවටීම ඕනෑවට වඩා තිබෙන්ට බැරි ය" යන කියමනෙන් අදහස් වන්නේ මෙය ම යි. "නො දැනුවත් ව ම අතට අසුවීම" යන්නේ තේරුම කුමක් ද? එහි තේරුම සූදානම් නො වී සිටීම යි. සූදානම් වී සිටීමක් නොමැතිව වැඩි-බලය සැබෑ වැඩි-බලය නො වේ. මූලපිරුම ත් තිබෙන්ට බැරි ය. මේ කරුණ හොඳින් වටහා ගත් කල, අඩු-බලය ඇති නමුත් සූදානම් වී සිටින බලසේනාවකට හදිස්සි ප්‍රහාරයන් මගින් වැඩි-බලය ඇති සතුරකු පරාජය කරන්ට බොහෝ විට හැකි ය. ගමනෙහි යෙදී සිටින සතුරකුට පහර දීම පහසු ය'යි අප කියන්නේ ඒ අවස්ථාවෙහි ඔහු රැකවලෙන් තොර ව, එනම්, සූදානම් නො වී, සිටින නිසා ම ය. මේ කරුණු දෙකේ — එනම්, සතුරා අතර වැරදි මත ඇති කිරීමේ සහ ඔහුට උන්හිටිගමන් හදිස්සි ප්‍රහාරයන් දීමේ — තේරුම යුද්ධයේ අවිනිශ්චිතතාවන් සතුරා වෙත මාරු කරන අතර අප හට හැකි තරම් ලොකු ම නිශ්චිතතාවක් ලබා ගැනීම ද, එමගින් වැඩි-බලය, මූලපිරුම සහ ජයග්‍රහණය දිනා ගැනීම ද වේ. මේ සියල්ල මුදුන්පත් කරගැනීමට මුලින් ම කළ යුතු දෙය නම් බහුජනයා ඉතා හොඳින් සංවිධානය කිරීම ය. එහෙයින් අන්තිම මිනිසා තෙක් තමන් සන්නද්ධ වීම ත්, සතුරා වෙත පුළුල් වශයෙන් කඩාපැනීම ත්, එසේ ම ආරංචි හොරෙන් පිටවීම වැළකීම සහ අපේ ම බලසේනාවන් සඳහා කඩතුරාවක් සකස් කිරීම ත් පිණිස සතුරාට විරුද්ධ ව සකල

ජනතාව පුබුදු කිරීම අතිශයින් ම වැදගත් ය; මේ අයුරින් අපේ බලසේනාවන් කොතැනදී කොයි වේලාවේ පහර දෙනවා ඇත්ද යන්න ගැන සතුරා අඳුරේ තබනු ලබනවා ඇත, ඔහුගේ පැත්තෙහි වැරදි මත සහ අසූදානම් බව පිණිස විෂයමූල පදනමක් ඇති වෙනවා ඇත. ඉඩම් ලබා ගැනීමේ විප්ලවවාදි යුද්ධය පැවති කාලයේ බොහෝ සටන් දිනීමට චීන රතු හමුදාවේ දුර්වල, කුඩා බලසේනාවට වැඩි වශයෙන් හැකි වූයේ සංවිධානය කරනලද, සන්නද්ධ කරනලද බහුජන සමූහයන් කරණකොටගෙන ය. තර්කානුකූල ව, ජාතික යුද්ධයක් ඉඩම් ලබාගැනීමේ විප්ලවවාදි යුද්ධයකට වඩා පළල් ලෙස බහුජන අනුබලය දිනාගත යුතු ය; කෙසේ වේවා, අතීත වැරදි[32]වල ප්‍රතිඵලයක් වශයෙන්, ජනතාව සංවිධානය නො කළ තත්වයක සිටිති, ව්‍යායාමයට සේවය කරනු පිණිස යුහු ව ඇදගත නො හැකි වෙති, ඇතැම් විට සතුරා විසින් ප්‍රයෝජනය ගනු ලබති. යුද්ධයේ සියලු ම අවශ්‍යතාවන් පිරිමසා ගනු පිණිස ඉවර නො වන වත්පොහොසත්කම් අත් කරගැනීමට තිබෙන එක ම එක විධිය පුළුල් පරිමාණයකින් ජනතාව ස්ථිර ලෙස එක්රොක් කිරීම ය. එමතු නො ව, එය සතුරා නොමග යැවීමෙන් සහ නො දැනුවත් ව ම අල්ලාගැනීමෙන් ඔහු පරාජය කිරීමේ අපේ උපක්‍රමය ක්‍රියාවේ යෙදීමේදී නියත වශයෙන් ම ලොකු කොටසක් රඟපානවා ඇත. අපි සුංහි ශියාං ඈපා නො වෙමු, ඔහුගේ බූරු ආචාරධර්ම වලින් අපට වැඩක් නැත.[33] ජය අත්පත් කරගනු වස් අපි හැකි තරම් දුරට සතුරාගේ ඇස් සහ කන් වැසීමෙන් ඔහු පොට්ට සහ බිහිරි කළ යුත්තෙමු, ඔහුගේ අණදෙන්නන්ගේ සිත් තුළ ව්‍යාකූලභාවය ඇති කිරීමෙන් ඔවුන් වික්ෂෝභයට පත් කළ යුත්තෙමු. ඉහතින් කී දෙය මූලපිරුම හෝ අක්‍රියාකාරිත්වය යුද්ධයේ මනෝමූල මගපෙන්වීමට සම්බන්ධ වී තිබෙන පිළිවෙලට අදාල ය. ජපානය පරාජය කරනු පිණිස එබඳු මනෝමූල මගපෙන්වීම නැතිව ම බැරි ය.

84. ජපානය, ඇගේ යුද්ධමය බලය ත් ඈ අපේ අතීත සහ වර්තමාන මනෝමූල වැරදි වලින් ප්‍රයෝජන ගැනීම ත් හේතු කොට ගෙන, ඇගේ පහරදීමේ අවස්ථාවේදී, බොහෝ දුරට, මූලපිරුම ඇගේ අතේ තබාගෙන සිට ඇත. එහෙත් ප්‍රකෘතියෙන් ම ඇට ඇති බොහෝ වූ අවාසි නිසා ද යුද්ධය කරගෙන යන විට ඈ විසිනුත් කර තිබෙන මනෝමූල වැරදි (මේ ගැන පසු ව තව දුරට ත් කතා කරමු) නිසා ද, එසේ ම අපට තිබෙන බොහෝ වාසි නිසා ද ඇගේ මූලපිරුම එක්තරා ප්‍රමාණයකට හීන වෙන්ට පටන් ගෙන ඇත. තායිඅර්චුආංහිදී සතුරා ලැබූ පරාජය ත් ශාන්සි පළාතෙහි ඔහු පත් වී සිටින අකරතැබ්බය ත් මෙය පැහැදිලි ලෙස ම ඔප්පු කරයි. සතුරාගේ පසුමුණෙහි ගොරිල්ලා සංග්‍රාමය පුළුල් ලෙස වර්ධනය වීම කරණකොටගෙන අල්ලාගත් ප්‍රදේශ වල සිටින ඔහුගේ ගැරිසන් හමුදා සම්පූර්ණයෙන් ම අක්‍රියාකාරි අඩියකට පත් වී ඇත. ඔහු තවමත් උපායමාර්ගික වශයෙන් පහරදීමෙහි සිටින නමුත් සහ තවමත් මූලපිරුම තම

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

අතේ ඇති ව සිටින නමුත් ඔහුගේ උපායමාර්ගික පහරදීම අවසන් වන විට ඔහුගේ මූලපිරුම ද අවසන් වෙනවා ඇත. මූලපිරුම දිගට ම තබා ගන්ට සතුරාට නුපුළුවන් වන පළමුවැනි හේතුව ඔහුට හටයන් හිඟ වීම නිසා පහරදීම කාල නියමයක් නැතිව ගෙනයන්ට ඔහුට කොහෙත් ම බැරි වීම ය. යුද්ධව්‍යාපාරයන්හිදී අප ගෙනයන පහරදීමේ සංග්‍රාමය ත්, සතුරු පේළි වලට පිටිපසින් ගෙනයන අපගේ ගොරිල්ලා සංග්‍රාමය ත්, ඒ එක්ක ම සෙසු සාධක ත්, එක්තරා සීමාවකදී ඔහුට ඔහුගේ පහරදීම නතර කරන්ට සිදු වෙන සහ ඔහුට තම මූලපිරුම තබා ගන්ට බැරි වෙන දෙවැනි හේතුව වේ. සෝවියට් සංගමය තිබීම සහ ජාත්‍යන්තර තත්වයේ වෙනස්වීම් තුන්වැනි හේතුව වේ. සතුරාගේ මූලපිරුම සීමා සහිත බව ද එය සුණු විසුණු කර දැමිය හැකි බව ද මෙසේ පෙනී යයි. යුද්ධමය ක්‍රියාවන්හිදී, තම ප්‍රධාන බලසේනාවන් විසින් යුද්ධව්‍යාපාර වලදී සහ සටන් වලදී කරන පහරදීමේ සංග්‍රාමය නහා තබා ගැනීමට ත්, සතුරාගේ පසුමුණෙහි ගොරිල්ලා සංග්‍රාමය වේගබලසම්පන්න ලෙස වර්ධනය කිරීමට ත්, ජනතාව දේශපාලන වශයෙන් පුළුල් පරිමාණයකින් උනන්දු කිරීමට ත් චීනයට හැකි වේ නම්, උපායමාර්ගික මූලපිරුම පිළිබඳ තත්වයක් අනුක්‍රමයෙන් ගොඩනගාගන්ට අපට පුළුවනි.

85. අපි දැන් නැමෙන සුලු බව ගැන සාකච්ඡා කරමු. නැමෙන සුලු බව නම් කුමක් ද? එය යුද්ධමය ක්‍රියාවන්හිදී මූලපිරුම ඇත්ත වශයෙන් ම අත්පත් කර ගැනීම ය; එය සන්නද්ධ බලසේනාවන් නැමෙන සුලු ලෙස ක්‍රියාවේ යෙදීම ය. සන්නද්ධ බලසේනාවන් නැමෙන සුලු ලෙස ක්‍රියාවේ යෙදීම යුද්ධයකට මගපෙන්වීමේදී තිබෙන කේන්ද්‍රීය කර්තව්‍යය වේ; එය හොඳින් ඉටු කරන්ට ඉතා ම අමාරු කර්තව්‍යයකි. හමුදාව ත් ජනතාව ත් සංවිධානය කිරීමට සහ ඔවුන්ට අධ්‍යාපනය දීමට අමතර ව, හටයන් සටනට යෙදීම ද යුද්ධ කිරීමේ වැඩයට ඇතුළත් වේ; මේ සියල්ල කරනු ලබන්නේ සටන ජය ගන්නා පිණිස ය. හමුදාවක් සංවිධානය කිරීම යනාදිය සත්තකින් ම අමාරු ය, එහෙත් එය සටනෙහි යෙදීම, විශේෂයෙන් දුර්වල හමුදාවක් ප්‍රබල හමුදාවක් හා සටන් කරන විට, ඊට ත් වඩා අමාරු ය. එසේ කිරීම පිණිස ඉතා උසස් ගණයක මනෝමූල හැකියාවක් උවමනා කරයි, යුද්ධයකට විශේෂ වූ ව්‍යාකූල බව, නොපැහැදිලි බව සහ අවිනිශ්චිත බව පිටුදැකීම ත් එහි ඇති පිළිවෙල, පැහැදිලි බව සහ නිශ්චිත බව අනාවරණය කර ගැනීම ත් උවමනා කරයි; විධානයේදී නැමෙන සුලු බව අත් කර ගත හැකි වන්නේ එසේ පමණකි.

86. ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධය සඳහා තිබෙන ක්ෂේත්‍ර සටන්ව්‍යාපාර පිළිබඳ පදනම් මූලධර්මය බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය වේ. මේ මූලධර්මය ක්‍රියාවට නඟනු පිණිස විවිධ උපක්‍රම සහ ක්‍රම ඇත; බලසේනාවන් විසිරී සිටින්ට සැලසීම සහ ඒකරාශි කිරීම, එක් තැනකින් නික්මී නොයෙක් අතට ඉදිරියට යාම

සහ නොයෙක් අතින් එක් තැනකට යොමු කොට පහර දීම, පහරදීම සහ ආරක්ෂාවීම, උන්හිටිගමන් වේගයෙන් පහර දීම සහ හිර කරගෙන සිටීම, වටලෑම සහ අංශයකින් වට කිරීම, ඉදිරියට යාම සහ පසුබැසීම යනාදිය මෙනි. මේ උපක්‍රම තේරුම් ගැනීම පහසු ය, එහෙත් ඒවා නැමෙන සුලු ලෙස ක්‍රියාවේ යෙදීම ත් වෙනස් කිරීම ත් කොහෙත් ම පහසු නැත. මෙහිදී නිශ්චයාත්මක පුරුක් තුන වනුයේ වේලාව, ස්ථානය සහ හටකණ්ඩායම් ය. වේලාව, ස්ථානය සහ හටකණ්ඩායම් හොඳින් තෝරා ගන්නේ නැත් නම් කිසි ම ජයක් දිනාගන්ට බැරි ය. උදාහරණ වශයෙන්, ගමනෙහි යෙදී සිටින සතුරු බලසේනාවකට පහර දීමේදී, අප පමණට වඩා කලින් පහර දීම කළොත්, අප කරන්නේ අප ම එළිදරව් කරගෙන, සතුරාට සූදානම් වීම පිණිස ඉඩප්‍රස්තාවක් දීම ය; අප පමණට වඩා පමා වී පහර දීම කළොත්, සතුරා කඳවුරු ගසාගෙන, තම බලසේනාවන් ඒකරාශි කරගෙන, අපට බිඳින්ට අමාරු පොලයක් ඉදිරිපත් කරන්ට ඉඩ තිබේ. මෙය වේලාව පිළිබඳ ප්‍රශ්නය යි. අප ඇත්ත වශයෙන් ම සතුරාගේ දුර්වල තැන වන වම් අංශයේ තැනක් උන්හිටිගමන් වේගයෙන් පහර දීම පිණිස තෝරා ගත්තොත්, ජය ලැබීම පහසු වෙනවා ඇත; එහෙත් අප දකුණු අංශය තෝරාගෙන බලාපොරොත්තු නුවූ අමාරු අඩියකට මුහුණ පෑවොත්, කිසිවක් මුදුන්පත් කරන්ට බැරි වේ. මෙය ස්ථානය පිළිබඳ ප්‍රශ්නය යි. අපේ බලසේනාවන්ට අයත් එක්තරා සේනාංගයක් එක්තරා කර්තව්‍යයක් සඳහා යොදනු ලැබේ නම්, ජය ලැබීම පහසු වෙනවා ඇත; එහෙත් ඒ කර්තව්‍යය ම සඳහා වෙන සේනාංගයක් යොදනු ලැබේ නම්, පලක් ලබන්ට අමාරු විය හැකි ය. මෙය හටකණ්ඩායම් පිළිබඳ ප්‍රශ්නය යි. අපි උපක්‍රම ක්‍රියාවේ යොදන සැටි පමණක් නො ව ඒවා වෙනස් කරන සැටි ද දැන සිටිය යුත්තෙමු. විධානයෙහි නැමෙන සුලු බව පිණිස වැදගත් කර්තව්‍ය වනුයේ පහරදීමේ සිට ආරක්ෂාවීමට හෝ ආරක්ෂාවීමේ සිට පහරදීමට, ඉදිරියට යාමේ සිට පසුබැසීමට හෝ පසු-බැසීමේ සිට ඉදිරියට යාමට, හිර කරගෙන සිටීමේ සිට උන්හිටිගමන් වේගයෙන් පහර දීමට හෝ උන්හිටිගමන් වේගයෙන් පහර දීමේ සිට හිර කර-ගෙන සිටීමට, වටලෑමේ සිට අංශයකින් වට කිරීමට හෝ අංශයකින් වට කිරීමේ සිට වටලෑමට යනාදි වශයෙන් මෙන් උපක්‍රම වෙනස් කිරීම සහ, දෙ පැත්තේ ම හටකණ්ඩායම් සහ භූමිභාගය පිළිබඳ වටපිටා තත්වයන්ට අනුරූප ලෙස එබඳු වෙනස්කිරීම් නිසි ලෙස ත් නිසි කල්හි ත් කිරීම ය. මෙය සටන් වල විධානය සම්බන්ධයෙන් මෙන් ම යුද්ධව්‍යාපාර වල විධානය ත් උපායමාර්ගික විධානය ත් සම්බන්ධයෙන් ද සැබෑ ය.

87. පැරැන්නෝ මෙසේ කීහ: ''උපක්‍රම වෙනස් කිරීමේ දක්ෂතාව රඳා තිබෙන්නේ බුද්ධි මාත්‍රාව මත ය''; අප නැමෙන සුලු බව යන්නෙන් අදහස් කරන මේ ''දක්ෂතාව'' බුද්ධිමත් අණදෙන්නකු විසින් එකතු කරන පංගුව වේ. නැමෙන සුලු බව යන්නෙන් අනවධානය අදහස් නො වේ;

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අනවධානය ප්‍රතික්ෂේප කළ යුතු ය. නැමෙන සුලු බව "වෙලාව නිශ්චය කිරීමෙන් සහ තත්වය මැන ගැනීමෙන්" පසු ("තත්වය" යන්නට සතුරාගේ තත්වය, අපේ තත්වය සහ භූමිභාගය ඇතුළත් ය) විෂයමූල තත්වයන්ගේ පදනම මත කලට වේලාවට උචිත පියවර ගැනීමට බුද්ධිමත් අණදෙන්නකුට ඇති හැකියාවෙහි ගැබ් වී පවතී; මේ නැමෙන සුලු බව "උපක්‍රම වෙනස් කිරීමේ දක්ෂතාව" වේ. මේ දක්ෂතාව පදනම කරගෙන, බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමයේදී වඩ වඩා ජයග්‍රහණ දිනා ගන්ට ත්, බලවේගයන්ගේ සමබරතාව අපේ වාසියට සිටින සේ වෙනස් කරන්ට ත්, සතුරාට වඩා මූලපිරුම අත් කරගන්ට ත්, අවසාන ජයග්‍රහණය අප සතු වන සේ ඔහු යට කොට තළා දමන්ට ත් අපට හැකි වේ.

88. දැන් අපි සැලැස්ම කිරීමේ ප්‍රශ්නය සාකච්ඡා කරමු. යුද්ධයට විශේෂ වූ අවිනිශ්චිතභාවය නිසා, සැලැස්මකට අනුව යුද්ධය කරගෙන යාම වෙන වැඩකටයුතු කරගෙන යනවාට වඩා හුඟක් ම අමාරු ය. එසේ ද වුව, "සූදනම්බව සාර්ථකත්වය සහතික කරන නිසා ත්, සූදනම් නැති කමේ ප්‍රතිඵලය අසාර්ථකත්වය වන නිසා ත්" කල්තබා සැලැස්ම කිරීම සහ සූදනම් කිරීම නොමැතිව යුද්ධයේදී ජය ලබන්ට බැරි ය. යුද්ධයේදී ඒකාන්ත නිශ්චිතභාවයක් නොමැත; එහෙත් එය එක්තරා ප්‍රමාණයක සාපේක්ෂක නිශ්චිතභාවයෙන් තොර නො වේ. අපි අපේ ම තත්වය ගැන සංසන්දනාත්මක වශයෙන් නිශ්චිත වෙමු. අපි සතුරාගේ තත්වය ගැන බෙහෙවින් අවිනිශ්චිත වෙමු; එහෙත් මෙහිදී පවා අපට තේරුම් ගැනීමට සලකුණු තිබේ, ඔස්සේ යාමට හෝඩුවා තිබේ, සිතා බැලීමට ප්‍රපංචයන් ඇති වන අනුපිළිවෙලවල් තිබේ. මේවා සාපේක්ෂක නිශ්චිතභාවය'යි අප කියන දේ එක්තරා ප්‍රමාණයකට සම්පාදනය කරයි, එය යුද්ධයේදී සැලැස්ම කිරීම පිණිස විෂයමූල පදනමක් සපයයි. (විදුලිපණිවුඩ ක්‍රමය, රේඩියෝ, අහස්යානා, මෝටර් වාහන, දුම්රිය, දුම්නැව් යනාදි) නූතන කාර්මික වර්ධනයෝ යුද්ධයේදී සැලැස්ම සම්පාදනයට තිබෙන ඉඩකඩ වැඩි කර ඇත. කෙසේ වෙතත්, යුද්ධයෙහි ඇත්තේ ඉතා සීමා සහිත සහ අනිත්‍ය නිශ්චිතභාවයක් පමණක් නිසා අංගසම්පූර්ණ වූ ත් ස්ථාවර වූ ත් සැලැස්ම කිරීමක් දුෂ්කර ය; එබඳු සැලැස්ම කිරීමක් යුද්ධයේ ගමන (ගලාබැසීම හෝ වෙනස්වීම) සමග වෙනස් විය යුතු ය, යුද්ධයේ පරිමාණය අනුව ප්‍රමාණයෙන් වෙනස් විය යුතු ය. කුඩා සේනාවන් හෝ සේනාංග විසින් කරන ප්‍රහරණය හෝ ආරක්ෂණය පිණිස වන සැලැස්ම වැනි, උපක්‍රමික සැලැස්ම බොහෝ විට දවසකට කීප වරක් ම වෙනස් කරන්ට සිදු වේ. යුද්ධව්‍යාපාරයක සැලැස්මක්, ඒ කියන්නේ, විශාල සේනාවන් විසින් කරන ක්‍රියාවේ සලැස්මක්, සාමාන්‍ය වශයෙන් යුද්ධ-ව්‍යාපාරය අවසන් වන තුරු අල්ලා සිටිය හැකි ය; කෙසේ වෙතත්, ඒ යුද්ධ-ව්‍යාපාරය ගෙනයන අතර, එය බොහෝ විට කොටස් වශයෙන් ද, ඇතැම් විට මුළුමනින් ම ද වෙනස් කරනු ලැබේ. යුද වැදී සිටින දෙගොල්ලන්ගේ ම

හැම දේ ම ඇතුළත් තත්වය පදනම කරගත් උපායමාර්ගික සැලැස්මක් වඩාත් ස්ථාවර වේ; එහෙත් එය ද යෙදිය හැක්කේ නිශ්චිත උපායමාර්ගික අවස්ථාවකදී පමණකි, යුද්ධය අළුත් අවස්ථාවක් කරා ගමන් කරන විට වෙනස් කරන්ට සිදු වේ. ඉඩකඩ සහ වටාපිටා තත්වය අනුව උපක්‍රමික, යුද්ධව්‍යාපාරික සහ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම ත් වෙනස් කිරීම ත් යුද්ධයකට මගපෙන්වීමේදී ප්‍රධාන සාධකයක් වේ; එය යුද්ධයෙහි නැමෙන සුලු බව නියම වශයෙන් ම ප්‍රකාශයට පත්වීම වේ; වෙන වචන වලින්, එය උපක්‍රම වෙනස් කිරීමෙහි ලා අයකුට ඇති දක්ෂතාව ද වේ. ජපන්-විරෝධී යුද්ධයෙහි යෙදී සිටින සියලු මට්ටම් වල අණදෙන්නෝ මෙය සැලකිල්ලට ගත යුත්තාහ.

89. යුද්ධයේ අනිස්ථිරතාව නිසා, සමහර අය යුද්ධ සැලැස්ම හෝ ප්‍රතිපත්ති "යාන්ත්‍රික" ය'යි හඳුන්වමින්, ඒ සැලැස්ම හෝ ප්‍රතිපත්ති සාපේක්ෂක වශයෙන් ස්ථාවර විය හැකි බව නො පිළිගනිති. මේ මතය වැරදි ය. යුද්ධයේ වටාපිටා තත්වයන් නිශ්චිත වන්නේ සාපේක්ෂක වශයෙන් පමණක් නිසා ත්, යුද්ධයේ ගලාබැස්ම (ගමන හෝ වෙනස්වීම) සීඝ්‍ර වන නිසා ත්, යුද්ධ සැලැස්ම හෝ ප්‍රතිපත්ති ස්ථාවර විය හැක්කේ සාපේක්ෂක වශයෙන් පමණක් බව ද, වෙනස් වන වටාපිටා තත්වයන් සහ යුද්ධයේ ගලාබැස්ම අනුව කලට වේලාවට වෙනස් කළ යුතු හෝ සංශෝධනය කළ යුතු බව ද මීට කලින් කොටසේදී අපි සම්පූර්ණයෙන් වටහා ගතිමු; නො එසේ නම් අප යාන්ත්‍රිකවාදීන් වෙනවා ඇත. එහෙත් අයෙක් නිශ්චිත වකවනු සඳහා සාපේක්ෂක වශයෙන් ස්ථාවර වූ යුද්ධ සැලැස්ම සහ ප්‍රතිපත්ති උවමනා කරන බව පිළිගැනීම ප්‍රතික්ෂේප නො කළ යුතු ය; මෙය නැතැ'යි කීම යුද්ධය ත්, එසේ ම නැතැ'යි කියන්නා ත් ඇතුළු හැම දෙයක් ම, නැතැ'යි කීම වේ. යුද්ධමය තත්ව සහ ක්‍රියා යන දෙක ම සාපේක්ෂක වශයෙන් ස්ථාවර වන නිසා, ඒවායින් ඇති වන යුද්ධ සැලැස්ම සහ ප්‍රතිපත්ති වල සාපේක්ෂක ස්ථාවරභාවය අප විසින් පිළිගත යුතු ය. උදහරණ වශයෙන්, උතුරු චීනයෙහි යුද්ධයේ වටාපිටා තත්වය ත් අටවැනි මාර්ග හමුදාවේ සටන්ව්‍යාපාර වල විසිරුණු ස්වභාවය ත් යන දෙක ම එක්තරා අවස්ථාවක් සඳහා සාපේක්ෂක වශයෙන් ස්ථාවර වන හෙයින්, මේ අවස්ථා-වේදී අටවැනි මාර්ග හමුදාවේ ක්‍රියාව පිළිබඳ උපායමාර්ගික මූලධර්මයේ, එනම්, "ගෙරිල්ලා සංග්‍රාමය මූලික ය, එහෙත් හිතකර තත්වයන් යටතේ ජංගම සංග්‍රාමය පිණිස ලැබෙන ඉඩප්‍රස්තා අත නාරින්න" යන්නේ, සාපේක්ෂක ස්ථාවරභාවය පිළිගැනීම ඒකාන්තයෙන් ම අවශ්‍ය වේ. යුද්ධ-ව්‍යාපාරයක් පිණිස තිබෙන සැලැස්මක් වලංගු වී පවතින කාලසීමාව උපාය-මාර්ගික සැලැස්මක කාලසීමාවට වඩා කෙටි ය, උපක්‍රමික සැලැස්මක කාලසීමාව ඊට ත් වඩා කෙටි ය; එහෙත් ඒ එක එකක් නිශ්චිත කාලසීමාවක් තුළ ස්ථාවර ව පවතී. මේ කරුණ නැතැ'යි කියන කවරකුට වේවා සංග්‍රාමය

LIBERATION BASE
https://liberationbase.wordpress.com

ගැන ක්‍රියා කරන්ට මගක් නො තිබෙනවා ඇත; ඔහු යුද්ධයේදී නිරවුල් මත නොමැති සාපේක්ෂතාවාදියකු වෙනවා ඇත, ඔහුට එක් මගක් අනික් මග මෙන් ම වැරදි හෝ එමෙන් ම හරි හෝ විය හැකි ය. නිශ්චිත කාලසීමාවක් සඳහා වලංගු වන සැලැස්මක් පවා අනිස්ථිර බව කිසිවෙක් නැතැ'යි නො කියයි; නො එසේ නම් එක් සැලැස්මක්, වෙන සැලැස්මක් ඊට වඩා හොඳ ය'යි සලකමින්, කිසි කලෙක අහක නො දමනවා ඇත. එහෙත් එය අනිස්ථිර වනුයේ සීමාවන් ඇතුළත ය, ඒ සැලැස්ම ක්‍රියාවේ යෙදීමට කරගෙන යන විවිධ යුද්ධ ක්‍රියාවන්ගේ මායිම් ඇතුළත ය; එහෙත් එය එහි හරය අතින් අනිස්ථිර නො වේ; වෙන වචන වලින් එය ප්‍රමාණාත්මක වශයෙන් විනා ගුණාත්මක වශයෙන් අනිස්ථිර නො වේ. එබඳු නිශ්චිත කාල-සීමාවක් ඇතුළත, හරය නියත වශයෙන් ම අනිස්ථිර නො වේ; නිශ්චිත කාලසීමාවක් ඇතුළත පවතින සාපේක්ෂක ස්ථාවරභාවය යන්නෙන් අප අදහස් කරන්නේ මෙය යි. යුද්ධයේ මුල සිට අගට ම පවතින ඒකාන්ත අනිස්ථිරභාවය නමැති මහා ගංගාවෙහි එක් එක් විශේෂිත කොටස් වල සාපේක්ෂක ස්ථාවරභාවය ඇත්තේ ය — යුද්ධ සැලැස්ම හෝ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අපේ මූලික මතය එසේ වේ.

90. උපායමාර්ගයේදී ඇතුල් පේළි වල කරන දිග්ගැසුණු ආරක්ෂාවීමේ සංග්‍රාමය සහ යුද්ධව්‍යාපාර හා සටන් වලදී බාහිර පේළි වල කරන ඉක්-මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය ගැන ත්, එසේ ම මූලපිරුම, නැමෙන සුලු බව සහ සැලැස්ම කිරීම ගැන ත් අප කතා කර තිබෙන හෙයින්, දැන් කෙටියෙන් සම්පිණ්ඩනය කරන්ට අපට පුළුවනි. ජපන්-විරෝධි යුද්ධයට සැලැස්මක් තිබිය යුතු ය. උපායමාර්ගය සහ උපක්‍රම නියම වශයෙන් ක්‍රියාවේ යෙදීම වන යුද්ධ සැලැස්ම යුද්ධයේ වටාපිටා තත්වයන්ට ගැලපිය හැකි වන සේ නැමෙන සුලු විය යුතු ය. අපි සතුරා ත් අප ත් අතර පවතින තත්වය වෙනස් කරන සේ අපේ අඩු-බලය වැඩි-බලය බවට ත්, අපේ අක්‍රියා-කාරිත්වය මූලපිරුම බවට ත් විපර්යාස කිරීමට සැම විට ම මාන බැලිය යුත්තෙමු. මේ සියල්ල යුද්ධව්‍යාපාර සහ සටන් වලදී බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමයෙහි ත් උපායමාර්ගයේදී ඇතුල් පේළි වල කරන දිග්ගැසුණු ආරක්ෂාවීමේ සංග්‍රාමයෙහි ත් ප්‍රකාශයට පත් වේ.

ජංගම සංග්‍රාමය, ගොරිල්ලා සංග්‍රාමය සහ ස්ථානගත සංග්‍රාමය

91. යුද්ධයකට අඩංගු දෙය ඇතුල් පේළි, දිග්ගැසුණු යුද්ධය සහ ආරක්ෂණය පිළිබඳ උපායමාර්ගයේ රාමුව තුළ කරන යුද්ධව්‍යාපාර සහ සටන් වලදී බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ

සංග්‍රාමය වන කල, ඒ යුද්ධය ජංගම සංග්‍රාමයක ආකාරය ගනී. ජංගම සංග්‍රා-මය යනු නිත්‍ය හමුදාවන් පුළුල් පෙරමුණු දිගට ත් ක්‍රියාවේ යෙදෙන ලොකු ප්‍රදේශ පුරා ත් බාහිර පේළි වල ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ යුද්ධව්‍යාපාර සහ සටන් කරගෙන යන ආකාරය වේ. ඒ අතර ම, එබඳු පහරදීමේ සටන් වලට පහසුකම් සලසන්නට අවශ්‍ය වූ විට කරගෙන යන "ජංගම ආරක්ෂණය" ද ඊට ඇතුළත් වේ; තවද අතිරේක කොටසක් ඉටු කරන දෙයක් වශයෙන් ස්ථානගත ප්‍රහරණය ත් ස්ථානගත ආරක්ෂණය ත් ඊට ඇතුළත් වේ. නිත්‍ය හමුදා, යුද්ධව්‍යාපාර සහ සටන් වලදී බලසේනා-වන්ගේ වැඩි-බලය, පහරදීම සහ අනිස්ථිරභාවය එහි අංගලක්ෂණ වේ.

92. චීනයට සුවිශාල භූමිප්‍රදේශයක් තිබේ, සෙබළු මහත් සංඛ්‍යාවක් සිටිති; එහෙත් ඇගේ භටකණ්ඩායම් එතරම් හොඳට සජ්ජිත කොට සහ පුහුණු කොට නැත; අනික් අතට, සතුරාගේ බලසේනාවෝ ගණනින් ප්‍රමාණවත් නො වෙති, එහෙත් වඩා හොඳින් සජ්ජිත කොට සහ පුහුණු කොට සිටිති. මේ තත්වය තුළ, අප අපේ ප්‍රාථමික සංග්‍රාම ආකාරය වශයෙන් පහරදීමේ ජංගම සංග්‍රාමය යොදා ගත යුතු බවට ත්, වෙන ඒවා ඊට අතිරේක වශයෙන් යෙදිය යුතු බවට සහ ඒ සියල්ල ජංගම සංග්‍රාමය බවට සමස්ත කළ යුතු බවට ත් සැකයක් නැත. අපි "පසුබසිනවා පමණයි, කිසි විටෙක ඉදිරියට යන්න එපා" යන්නට විරුද්ධ විය යුත්තෙමු, එය පළායාමේ ධර්මය වේ; ඒ අතර ම අපි "ඉදිරියට යනවා පමණයි, කිසි විටෙක පසුබසින්න එපා" යන්නට ද විරුද්ධ විය යුත්තෙමු, එය වියරු අනවධානය වේ.

93. ජංගම සංග්‍රාමයේ එක් ලක්ෂණයක් නම් අනිස්ථිරභාවය යි; ඒ ලක්ෂණය නිසා මහත් පියවරින් ඉදිරියට යාමට සහ ඉවත් වී යාමට ක්ෂේත්‍ර හමුදාවකට අවසර ලැබෙනවා පමණක් නො වේ, එය එසේ කිරීම අවශ්‍ය ද වේ. කෙසේ වේවා, හාන් පූ-චූ වර්ගයේ පළායාමේ ධර්මය[34] හා පොදු වූ කිසිවක් ඊට නැත. යුද්ධයේ ප්‍රාථමික අවශ්‍යතාව සතුරා විනාශ කිරීම ය, අනික් අවශ්‍යතාව තමා රැකගැනීම ය. තමා රැකගැනීමේ පරමාර්ථය සතුරා විනාශ කිරීම ය; සතුරා විනාශ කිරීම අනික් අතට තමා රැකගැනීමේ ඉතා ම විපාකදායක මාර්ගය වේ. එහෙයින් ජංගම සංග්‍රාමය කිසි ම අයුරකින් හාන් පූ-චූ වැනි මිනිසුන් හට සමාවට කරුණක් නො වේ; හැම විට ම පස්සට යාම ත්, කිසි විටෙක ඉදිරියට නො යාම ත් එයින් කිසි කලෙක අදහස් නො විය හැකි ය; ජංගම සංග්‍රාමයේ මූලික පහරදීමේ ලක්ෂණය නිෂේධ කරන ඒ වර්ගයේ "යාමක්" නිසා, භාවිතාවේදී, සිදු වෙනවා ඇත්තේ චීනය කොතරම් විශාල වුව ත් අභාවයට යාම ය.

94. කෙසේ වේවා, වියරු අනවධානය'යි අප විසින් කියනු ලබන "ඉදිරියට යනවා පමණයි, කිසි විටෙක පසුබසින්න එපා" යන අනික් මතය ද වැරදි ය. අප අනුමත කරමින් කතා කරන ජංගම සංග්‍රාමයේ අඩංගු-දෙය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වනුයේ යුද්ධව්‍යාපාර සහ සටන් වලදී බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය යි; අතිරේක කොටසක් ඉටු කරන දෙයක් වශයෙන් ස්ථානගත සංග්‍රාමය ද, ''ජංගම ආරක්ෂණය'' සහ පසුබැසීම ද ඊට ඇතුළත් ය; මේ සියල්ල ම නැතිව ජංගම සංග්‍රාමය සම්පූර්ණයෙන් කරගෙන යා නො හැකි ය. වියරු අනවධානය යුද්ධමය කෙටිකල්පනාව වේ, එය බොහෝ විට හට ගන්නේ භූමිප්‍රදේශ නැති වී යාමේ භීතියෙන් ය. වියරු අනවධානයෙන් ක්‍රියා කරන මිනිසෙක් ජංගම සංග්‍රාමයේ එක් ලක්ෂණයක් නම් මහත් පියවරින් ඉදිරියට යාමට සහ ඉවත් වී යාමට ක්ෂේත්‍ර හමුදුවකට අවසර දෙන්නා වූ පමණක් නො ව එය එසේ කිරීම අවශ්‍ය කරන්නා වූ අනිස්ථිරභාවය බව නො දනී. සක්‍රිය පැත්තෙන්, සතුරාට අහිතකර වන නමුත් අපට හිතකර වන සටනකට ඔහු ඇද ගනු පිණිස, ඔහු ගමනෙහි යෙදී සිටීම ත්, අපට හිතකර භූමිභාගයක්, පහර දිය හැකි සතුරෙක්, තොරතුරු හොරෙන් පිටවීම වැළැක්විය හැකි ප්‍රාදේශික ජනගහණයක් සහ, සතුරා වෙහෙස වී සහ සූදනම් නො වී සිටීම වැනි වාසි ගණනක් තිබීම ත් සාමාන්‍යයෙන් අවශ්‍ය වේ. මෙය සතුරා ඉදිරියට ගමන් කිරීම ත් අප අපගේ භූමිප්‍රදේශයෙන් කොටසක් තාවකාලික වශයෙන් නැති වීම ගැන අමනාප නො වීම ත් අවශ්‍ය කරයි. අපේ භූමිප්‍රදේශයෙන් කොටසක් තාවකාලික වශයෙන් නැති වී යාම, නැති වූ භූමිප්‍රදේශය ආපසු ලබා ගැනීම ත් ඇතුළු ව, අපේ සියළු ම භූමිප්‍රදේශ නිත්‍ය වශයෙන් රැක ගැනීම පිණිස අප විසින් ගෙවන මිල වන නිසා ය. නිෂ්ක්‍රිය පැත්තෙන්, යම් විටෙක අපේ බලසේනාවන් රැක ගැනීම මූලික වශයෙන් අනතුරට ලක් කරන්නා වූ අවාසිදායක තත්වයකට වැටෙන්ට අපට බලෙන් ම සිදු වේ ද එවිට අපේ බලසේනාවන් රැකගෙන, අළුත් ඉඩප්‍රස්තා එළඹුණු කල සතුරාට පහර ගසන සේ, පසුබසින්නට ධෛර්යයක් අපට තිබිය යුතු ය. මේ මූලධර්මය ගැන නොදත්කම නිසා, වියරු ලෙස ක්‍රියා කිරීම අනුමත කරන අය තත්වය ප්‍රත්‍යක්ෂ ලෙස ත් නිශ්චිත ලෙස ත් අහිතකර වන විට පවා නගරයක් හෝ බිම් කඩක් හෝ සඳහා පොර අල්ලනවා ඇත; එහි ප්‍රතිඵලයක් වශයෙන්, නගරය හෝ භූමිය ඔවුන්ට නැති වෙනවා පමණක් නො ව, තම බලසේනාවන් රැකගැනීමට ද ඔව්හු අසමත් වෙති. අප සැම විට ම ''සතුරා ඇතුළට ම එන්නට පෙළඹවීමේ'' ප්‍රතිපත්තිය වෙනුවෙන් කතා කර තිබෙන්නේ, එය උපායමාර්ගික වශයෙන් ආරක්ෂාවීමෙහි යෙදී සිටින දුර්වල හමුදවක් විසින් බලවත් සතුරකුට විරුද්ධ ව යොදන්ට තිබෙන ඉතා ම විපාකදායක යුද්ධ ප්‍රතිපත්තිය වන නිසා ම ය.

95. ජපන්-විරෝධි යුද්ධයෙහි සංග්‍රාම ආකාරයන් අතර ජංගම සංග්‍රාමය මූලට ද ගොරිල්ලා සංග්‍රාමය දෙවැනි තැනට ද එයි. මුළු යුද්ධයේදී ජංගම සංග්‍රාමය ප්‍රාථමික වේ ය'යි ද ගොරිල්ලා සංග්‍රාමය අතිරේක වේ ය'යි ද අප කියන කල, අප අදහස් කරන්නේ යුද්ධයේ පලවිපාකය ප්‍රධාන වශයෙන්

නිත්‍ය සංග්‍රාමය මත, වෙසෙසින් එහි ජංගම ආකාරය මත, රැඳී තිබෙන බව සහ පලවිපාකය තීරණය කිරීමෙහි ලා ප්‍රධාන වගකීමට උර දෙන්නට ගොරිල්ලා සංග්‍රාමයට බැරි බව ය. කෙසේ වේවා, යුද්ධයේ උපායමාර්ගයේදී ගොරිල්ලා සංග්‍රාමය රඟපාන කොටස නොවැදගත් බවක් එයින් අදහස් නො වේ. ගොරිල්ලා සංග්‍රාමයේ අනුබලය නැතිව සතුරා පරාජය කරන්ට අපට බැරි නිසා, මුළු එකක් වශයෙන් යුද්ධයේ උපායමාර්ගයේදී ගොරිල්ලා සංග්‍රාමය රඟපාන කොටස දෙවැනි වන්නේ ජංගම සංග්‍රාමය රඟපාන කොටසට පමණකි; එහි අනුබලය නොමැතිව සතුරා පරාජය කරන්ට අපට බැරි නිසා ය. මෙසේ කියන කල ගොරිල්ලා සංග්‍රාමය ජංගම සංග්‍රාමය බවට වර්ධනය කිරීමේ උපායමාර්ගික කර්තව්‍යය ද අපේ සිතේ තිබේ. ගොරිල්ලා සංග්‍රාමය මේ දීර්ඝ වූ ත් කෲර වූ ත් යුද්ධය මුළුල්ලේ එලෙස ම නො පවතිනවා ඇත, ඊට වඩා ඉහළ මට්ටමකට නැඟී, ජංගම සංග්‍රාමය බවට වර්ධනය වෙනවා ඇත. මෙසේ ගොරිල්ලා සංග්‍රාමය සතු උපායමාර්ගික කොටස, නිත්‍ය සංග්‍රාමයට අනුබල දීම සහ නිත්‍ය සංග්‍රාමය බවට විපර්යාස වීම වශයෙන්, දෙ-ආකාර වේ. චීනයේ විරුද්දකම් පෑමේ යුද්ධයේදී ගොරිල්ලා සංග්‍රාමය පවතින පෙර නො වූ විරූ ප්‍රමාණය ත් කාලය ත් සැලකිල්ලට ගන්නා කල, එය රඟපාන උපායමාර්ගික කොටස අඩුවෙන් තක්සේරු නො කිරීම වඩාත් ම වැදගත් ය. එහෙයින්, චීනයේ ගොරිල්ලා සංග්‍රාමයට ඊට අයත් උපක්‍රමික ගැටළු පමණක් නො ව, ඊට අයත් විශේෂ උපායමාර්ගික ගැටළු ද තිබේ. මා ''ජපානයට විරුද්ධ ගොරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු'' යන ලිපියෙහි මෙගැන දනට ම සාකච්ඡා කර ඇත. ඉහතින් පෙන්වා දුන් පරිදි, විරුද්දකම් පෑමේ යුද්ධයේ උපායමාර්ගික අවස්ථා තුනෙහි සංග්‍රාම ආකාරයෝ මතු දක්වන පරිදි වෙති. පළමුවැනි අවස්ථාවේදී, ජංගම සංග්‍රාමය ප්‍රාථමික වන අතර, ගොරිල්ලා සහ ස්ථානගත සංග්‍රාමය අතිරේක වේ. දෙවැනි අවස්ථාවේදී ගොරිල්ලා සංග්‍රාමය පළමුවැනි තැනට එනවා ඇත, ජංගම සහ ස්ථානගත සංග්‍රාමය අතිරේක ව සිටිනවා ඇත. තුන්වැනි අවස්ථාවේදී ජංගම සංග්‍රාමය යළි ත් ප්‍රාථමික ආකාරය බවට පත් වෙනවා ඇත, ස්ථානගත සහ ගොරිල්ලා සංග්‍රාමය අතිරේක ව සිටිනවා ඇත. එහෙත් තුන්වැනි අවස්ථාවේ ජංගම සංග්‍රාමය තව දුරට ත් කරනු ලබන්නේ මුලදී සිටි නිත්‍ය බලසේනාවන් විසින් ම පමණක් නො වෙනවා ඇත; කොටසක්, සමහර විට උදක් ම වැදගත් කොටසක්, මුලදී ගොරිල්ලා හටයන් වූ නමුත් ගොරිල්ලා සංග්‍රාමයෙන් ජංගම සංග්‍රාමයට දියුණු වී සිටින්නා වූ බලසේනාවන් විසින් කරනු ලබනවා ඇත. චීනයේ ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයේ අවස්ථා තුන ම ගෙන බලන කල, ගොරිල්ලා සංග්‍රාමය නියත වශයෙන් ම නැති ව ම බැරි ය. අපේ ගොරිල්ලා සංග්‍රාමය යුද්ධ පුරාවෘත්තයන්හි අසමසම වූ ශ්‍රේෂ්ඨ නාටකයක් ඉදිරිපත් කරනවා ඇත. මේ හේතුව නිසා, සතුරා අල්ලාගෙන තිබෙන සියලු ප්‍රදේශ පුරා විසිරී ගොස්, අවි අතට ගන්නා ලෙස බහුජනයා අවදි කොට, බහුජනයා සමග උචිත ලෙස සම්බන්ධ වී

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ගොරිල්ලා සංග්‍රාමය කරගෙන යනු පිණිස, චීනයේ දස ලක්ෂ ගණන් නිත්‍ය භටයන් අතුරෙන් යටත්පිරිසෙයින් සිය දහස් කීපයක් වත් වෙන් කිරීම ඒකාන්තයෙන් ම අවශ්‍ය ය. එසේ වෙන් කරනු ලබන නිත්‍ය බලසේනාවෝ බාරදූර ලෙස මේ පරිශුද්ධ කර්තව්‍යයට උර දිය යුත්තාහ; ඔව්හු, තමන් කරන ලොකු සටන් ගණන අඩු නිසා ත්, දූනට ජාතික වීරයන් ලෙස නො පෙනෙන නිසා ත් තමන්ගේ තත්වය පහළ දමනලදැ'යි නො සිතිය යුත්තාහ. එබඳු කවර සිතීමක් වුව වැරදි ය. ගොරිල්ලා සංග්‍රාමය නිත්‍ය සංග්‍රාමය මෙන් ඉක්මන් ප්‍රතිඵල හෝ එමෙන් විශාල කීර්තියක් හෝ ගෙනෙන්නේ නැත; එහෙත් ''දුර පාරක් අශ්වයාගේ ශක්තිය උරගා බලයි, කල් යන වැඩක් මිනිසකුගේ හදවත ඔප්පු කරයි''; මේ දීර්ඝ වූ ත් කෲර වූ ත් යුද්ධයේදී ගොරිල්ලා සංග්‍රාමය එහි නොහිමි බලය ප්‍රදර්ශනය කරනවා ඇත; එය ඇත්තෙන් ම සුළුපටු වැඩක් නො වේ. එමතු නො ව, අටවැනි මාර්ග හමුදව කරගෙන ආවාක් මෙන්, විසිරී සිටින කල ගොරිල්ලා සංග්‍රාමය කරගෙන යන්ට ත්, ඒකරාශී වූ විට ජංගම සංග්‍රාමය කරගෙන යන්ට ත් එබඳු නිත්‍ය බලසේනාවන්ට හැකි ය. අටවැනි මාර්ග හමුදවේ මූලධර්මය ''ගොරිල්ලා සංග්‍රාමය මූලික ය, එහෙත් හිතකර තත්වයන් යටතේ ජංගම සංග්‍රාමය පිණිස ලැබෙන ඉඩප්‍රස්තා අතනාරින්න'' යනු යි. මේ මූලධර්මය හරියට ම හරි ය; ඊට විරුද්ධ වන අයගේ මත වැරදි ය.

96. චීනයේ වර්තමාන ශිල්පීය මට්ටමේදී, ආරක්ෂාවීමේ හෝ පහරදීමේ හෝ ස්ථානගත සංග්‍රාමය සාමාන්‍යයෙන් අක්‍රියාත්මක ය; අපේ දුර්වලකම ප්‍රකට වන තැන මෙ තැන ය. එමතු නො ව, සතුරා අපේ රක්ෂිත ස්ථාන මග හැර යාම පිණිස අපේ රටේ සුවිශාලත්වයෙන් ප්‍රයෝජන ගනී. එහෙයින් ස්ථානගත සංග්‍රාමය අප හට වැදගත් විධියක් විය නො හැකි ය, ප්‍රධාන විධිය වීමට නම් එතරම් වත් බැරි ය. එහෙත් යුද්ධයේ පළමුවැනි සහ දෙවැනි අවස්ථාවන්හිදී, ජංගම සංග්‍රාමයේ පරිමණ්ඩලය ඇතුළත, ප්‍රාදේශික කළ ස්ථානගත සංග්‍රාමය යුද්ධව්‍යාපාර වලදී අතිරේක කොටසක් රඟපෑමෙහි යොදන්ට පුළුවනි, යෙදීම අවශ්‍ය ය. අර්ධ-ස්ථානගත ''ජංගම ආරක්ෂණය'', හැම පියවරකදී ම සතුරාට විරුද්දකම් පෑමේ ත් එමගින් ඔහුගේ බලසේනා හීන කිරීමේ සහ අතිරේක කාලය ලබාගැනීමේ ත් අභිප්‍රායයෙන් කරනු ලබන, ජංගම සංග්‍රාමයේ වඩා ත් ම අවශ්‍ය කොටසක් වේ. උපායමාර්ගික පෙරළා-පහරදීමේ අවස්ථාවේදී ස්ථානගත ප්‍රහරණය පිළිබඳ කර්තව්‍යයන් සම්පූර්ණයෙන් කරගෙන යාමට චීනයට හැකි වන සේ නවීන අවිආයුධ වැඩි වැඩියෙන් තමාට සපයා ගන්ට චීනය වෙර දැරිය යුතු ය. මේ තුන්වැනි අවස්ථාවේදී ස්ථානගත සංග්‍රාමය නිසැකයෙන් ම වඩා ශ්‍රේෂ්ඨ කොටසක් රඟපානවා ඇත; කවර හෙයින් ද යත්, එවිට සතුරා ඔහුගේ ස්ථානයන් තදින් ම අල්ලාගෙන සිටිනවා ඇති නිසා සහ, අප ජංගම සංග්‍රාමයට අනුබල වශයෙන් බලවත් ස්ථානගත ප්‍රහරණයන් දියත් කළොත් මිස

අපේ නැති වූ භූමිප්‍රදේශ ආපසු ලබාගන්ට අපට නුපුළුවන් වන නිසා ය. ඒ එසේ වුව ද තුන්වැනි අවස්ථාවේදී ත්, ජංගම සංග්‍රාමය ප්‍රාථමික සංග්‍රාම ආකාරය කිරීමට අපි අපේ හැම ප්‍රයත්නයක් ම දැරිය යුත්තෙමු. යුද්ධයට මග පෙන්වීමේ කලාව ත් මිනිසා රඟපාන ක්‍රියාශීලි කොටස ත් Iවැනි ලෝක යුද්ධයේ දෙවැනි භාගයේදී බටහිරී යුරෝපයෙහි කරනලද විධියේ ස්ථානගත සංග්‍රාමයේදී බෙහෙවින් නිෂ්ඵල වන නිසා ය. යුද්ධය කරගෙන යන්නේ චීනයේ සුවිසාල භූමිප්‍රදේශයන්හි නිසා ත්, අපේ පැත්ත සෑහෙන දිගු කලක් ශිල්පීය වශයෙන් දුර්වල ලෙස සජ්ජිත ව සිටිනවා ඇති නිසා ත්, යුද්ධය ''අගල් වලින් පිටට'' ගත යුතු වීම ස්වාභාවික ය. චීනයේ ශිල්පීය තත්වය දූනට වඩා යහපත් විය හැකි තුන්වැනි අවස්ථාවේදී පවා, මේ අතින් ඇගේ සතුරා ඉක්මවන්නට ඇට අමාරු වෙනවා ඇත; එහෙයින්, අවසාන ජයග්‍රහණය අත්පත් කරගන්ට ඇට නැතිව ම බැරි, බෙහෙවින් ම ජංගම වූ සංග්‍රාමය කෙරෙහි සිත කය යොමු කරන්ට ඇට සිදු වෙනවා ඇත. එහෙයින්, විරුද්දකම් පෑමේ යුද්ධය මුළුල්ලේ ම චීනය ස්ථානගත සංග්‍රාමය ප්‍රාථමික වශයෙන් යොදා නො ගන්නවා ඇත; ප්‍රාථමික හෝ වැදගත් ආකාරයෝ ජංගම සංග්‍රාමය ත් ගොරිල්ලා සංග්‍රාමය ත් ය. මේ සංග්‍රාම ආකාර දෙක යුද්ධයට මග පෙන්වීමේ කලාවට ත් මිනිසා රඟපාන ක්‍රියාශීලි කොටසට ත් සම්පූර්ණයෙන් ඉඩ දෙනවා ඇත — අපේ අවාසනාවෙන් මතු වෙන කොතරම් හොඳ පොඩි වාසනාවක් ද!

වැහැරීමේ යුද්ධය සහ මුලසුන් කිරීමේ යුද්ධය

97. අප කලින් කීවාක් මෙන්, යුද්ධයේ හරය නැතහොත් පරමාර්ථය, තමා රැකගැනීම හා සතුරා විනාශ කිරීම ය. මේ පරමාර්ථය මුදුන්පත් කරනු පිණිස ජංගම, ස්ථානගත සහ ගොරිල්ලා ය'යි සංග්‍රාම ආකාර තුනක් තිබෙන නිසා ද, විපාකද්‍රයකත්වයේ ප්‍රමාණයන් අතින් ඒවා එකිනෙකට වෙනස් වන නිසා ද, වැහැරීමේ යුද්ධය ත් මුලසුන් කිරීමේ යුද්ධය ත් අතර පුළුල් ප්‍රභේදය පැනනඟින්නේ ය.

98. පටන්ගැන්මක් වශයෙන්, ජපන්-විරෝධී යුද්ධය එක විට ම වැහැරීමේ යුද්ධයක් ද මුලසුන් කිරීමේ යුද්ධයක් ද වේ ය'යි කියන්නට අපට ඉඩ තිබේ. ඇයි? සතුරා තවම ඔහුගේ ශක්තියෙන් ප්‍රයෝජන ගනිමින්, උපායමාර්ගික වැඩි-බලය සහ උපායමාර්ගික මුලපිරුම තමා අත තබාගෙන සිටින නිසා සහ; එහෙයින්, අප මුලසුන් කිරීමේ යුද්ධව්‍යාපාර සහ සටන් කරතොත් මිස, සාර්ථක ලෙස සහ වේගයෙන් ඔහුගේ ශක්තිය හීන කරන්ට ත් ඔහුගේ වැඩි-බලය සහ මුලපිරුම බිඳින්ට ත් අපට බැරි නිසා ය. තවම අපුට අපේ දුර්වලකම තිබේ, තවම අප අපගේ උපායමාර්ගික

LIBERATION BASE

https://liberationbase.wordpress.com

අඩු-බලයෙන් සහ අක්‍රියාකාරිත්වයෙන් තොර වී නැත; එහෙයින්, අප මුලසුන් කිරීමේ යුද්ධව්‍යාපාර සහ සටන් කරතොත් මිස, අපේ අභ්‍යන්තර සහ ජාත්‍යන්තර තත්වය දියුණු කර ගැනීම ත් අපේ අහිතකර තත්වය වෙනස් කිරීම ත් පිණිස කාලය දිනා ගන්ට අපට බැරි ය. එහෙයින් මුලසුන් කිරීමේ යුද්ධව්‍යාපාර උපායමාර්ගික වැහැරීම පිළිබඳ අරමුණ මුදුන්පත් කර ගැනීමේ විධිය වේ. මේ තේරුමෙන් මුලසුන් කිරීමේ යුද්ධය වැහැරීමේ යුද්ධය ම යි. චීනයට දිග්ගැසුණු යුද්ධය කළ හැකි වන්නේ ප්‍රධාන වශයෙන් මුලසුන් කිරීම මගින් වැහැරීමේ ක්‍රමය යෙදීමෙන් ය.

99. එහෙත් උපායමාර්ගික වැහැරීම පිළිබඳ පරමාර්ථය වැහැරීමේ යුද්ධව්‍යාපාර මගින් ද මුදුන්පත් කර ගැනීමට ඉඩ තිබේ. සාමාන්‍යයෙන් කියන කල, ජංගම සංග්‍රාමය මුලසුන් කිරීමේ කර්තව්‍යය ඉටු කරයි, ස්ථානගත සංග්‍රාමය වැහැරීමේ කර්තව්‍යය ඉටු කරයි, ගොරිල්ලා සංග්‍රාමය මේ දෙක ම එක විට ඉටු කරයි; සංග්‍රාම ආකාර තුන මෙසේ එකිනෙකට ප්‍රභේද වේ. මේ තේරුමෙන් මුලසුන් කිරීමේ යුද්ධය වැහැරීමේ යුද්ධයට වෙනස් ය. වැහැරීමේ යුද්ධව්‍යාපාර දිග්ගැසුණු යුද්ධයේදී අතිරේක වන නමුත් අවශ්‍ය ය.

100. න්‍යායයික වශයෙන් ද චීනයේ උවමනාවන් අනුව ද කතා කරන කල, සතුරාගේ බලසේනාවන් බෙහෙවින් හීන කිරීමේ උපායමාර්ගික පරමාර්ථය මුදුන්පත් කරගනු වස්, චීනය ඇගේ ආරක්ෂාවීමේ අවස්ථාවේදී මූලික වශයෙන් ජංගම සංග්‍රාමය විසින් ද කොටස් වශයෙන් ගොරිල්ලා සංග්‍රාමය විසින් ද ඉටු කරනු ලබන මුලසුන් කිරීමේ කාර්යයෙන් ප්‍රයෝජන ගැනීම පමණක් නො ව, මූලික වශයෙන් (අතිරේක ව සිටින්නක් වූ) ස්ථාන-ගත සංග්‍රාමය විසින් ද කොටස් වශයෙන් ගොරිල්ලා සංග්‍රාමය විසින් ද ඉටු කරනු ලබන වැහැරීමේ කාර්යයෙන් ප්‍රයෝජන ගැනීම ද කළ යුතු ය. ඈණහිටීම පිළිබඳ අවස්ථාවේදී සතුරාගේ බලසේනාවන් තව දුරට ත් විශාල පරිමාණයෙන් හීන කිරීම පිණිස ගොරිල්ලා සහ ජංගම සංග්‍රාමය විසින් ඉටු කරනු ලබන මුලසුන් කිරීමේ සහ වැහැරීමේ කාර්යයන් ගෙන් ප්‍රයෝජන ගැනීම අපි දිගට ම කරගෙන යා යුත්තෙමු. මේ සියල්ලේ අරමුණ වනුයේ යුද්ධය දිග්ගැස්සීම, බලවේගයන්ගේ සාමාන්‍ය සමබරතාව අනුක්‍රමයෙන් වෙනස් කිරීම සහ අපේ පෙරළා-පහරදීම පිණිස තත්වයන් සූදනම් කිරීම ය. උපායමාර්ගික පෙරළා-පහරදීම පවතින අතර, සතුරා අවසාන වශයෙන් ම පන්නා දමනු වස් අපි මුලසුන් කිරීම මගින් වැහැරීමේ ක්‍රමය යෙදීම දිගට ම කරගෙන යා යුත්තෙමු.

101. එහෙත් සත්‍ය කාරණයක් වශයෙන්, ජංගම සංග්‍රාම යුද්ධව්‍යාපාර බොහෝ ගණනක් හෝ වැඩි ම ගණනක් පවා වැහැරීමේ යුද්ධව්‍යාපාර බවට පත් වූ බව ද, ඇතැම් ප්‍රදේශ වල ගොරිල්ලා සංග්‍රාමය එය සතු නිසි

කාර්යය වූ මුලසුන් කිරීම ප්‍රමාණවත් පරිදි ඉටු නො කළ බව ද ඉකුත් දස මස තුළ අපේ අත්දැකීම විය. සක්‍රිය අංගය නම් අප, යටත්පිරිසෙයින්, දිග්ගැසුණු සංග්‍රාමය ත් අපේ අවසාන ජයග්‍රහණය ත් යන දෙකට ම වැදගත් දෙයක් වන, සතුරාගේ බලසේනාවන් හීන කිරීම කළ බව සහ අපේ ලේ පලක් නැතිව නො වගුළ බව ය. එහෙත් අඩුපාඩුකම් නම්, පළමුකොට, අප සෑහෙන තරම් සතුරා හීන නො කිරීම ත්, දෙවැනි ව, අප තරමක් බර අලාභහානි වැළකීමට අසමත් වීම සහ යුද්ධයේදී අල්ලාගත් දේ ස්වල්ප වීම ත් ය. මේ තත්වයේ විෂයමූල හේතුව, එනම්, කාර්මික උපකරණ අතින් සහ භටයන්ගේ පුහුණුව අතින් අප ත් සතුරා ත් අතර ඇති අසමානකම, අප විසින් පිළිගත යුතු නමුත්, වටාපිටා තත්වයන් හිතකර වන සෑම විට ම අපේ ප්‍රධාන බලසේනාවෝ මුලසුන් කිරීමේ බලවත් සටන් කළ යුතු ය'යි තරයේ කියා සිටීම, කුමක් වුවත්, න්‍යායයික වශයෙන් ද ප්‍රායෝගික වශයෙන් ද අවශ්‍ය ය. කඩාකප්පල් කිරීම සහ හිරිහැර කිරීම වැනි විශේෂිත කර්තව්‍යයන් ඉටු කිරීමේදී හුදු වැහැරීමේ සටන් ම කරන්නට අපේ ගොරිල්ලා සේනාංග-යන්ට සිදු වන නමුත්, සතුරාගේ බලසේනාවන් මහත් සේ හීන කරනු වස් සහ අපේ බලසේනාවන් මහත් සේ තර කරනු වස්, තත්වයන් හිතකර වන සෑම විට ම මුලසුන් කිරීමේ යුද්ධව්‍යාපාර සහ සටන් කළ යුතු බව කියා සිටීම ත් බලවත් ලෙස කරගෙන යාම ත් අවශ්‍ය ය.

102. බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමයේදී ''බාහිර පේළි'', ''ඉක්මන් විසඳුම'' සහ ''පහරදීම'' ත්, ජංගම සංග්‍රාමයේදී ''ජංගමතාව'' ත් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක ව ප්‍රකාශයට පත් වන්නේ වටලෑමේ සහ අංශයකින් වටකිරීමේ උපක්‍රම පාවිච්චි කිරීමෙහි ය; වැඩි-බලය ඇති බලසේනාවන් ඒකරාශි කිරීමේ අවශ්‍යතාව එහෙයිනි. ඒ නිසා බලසේනාවන් ඒකරාශි කිරීම ත් වටලෑමේ සහ අංශයකින් වටකිරීමේ උපක්‍රම පාවිච්චි කිරීම ත් ජංගම සංග්‍රාමය පිණිස, ඒ කියන්නේ, බාහිර පේළි වල කරන ඉක්මනින් විසඳුමක් ලබන පහරදීමේ සංග්‍රාමය පිණිස, කලින් ම තිබිය යුතු දේ වේ. මේ සියල්ලේ අරමුණ සතුරු බලසේනාවන් මුලසුන් කිරීම ය.

103. ජපන් හමුදාවේ ශක්තිය පවතින්නේ එහි අවිආයුධ තුළ පමණක් නො වේ; එහි මුලාදෑනින්ගේ සහ භටයන්ගේ පුහුණුව තුළ — එහි සංවිධානයේ ප්‍රමාණය තුළ, කිසි දවසක පරාජය නො වීමෙන් ඇති වන ආත්ම-විශ්වාසය තුළ, මිකාඩෝ කෙරෙහි සහ අලෞකික සත්වයන් කෙරෙහි ඇති එහි මිථ්‍යා විශ්වාසය තුළ, එහි අහංකාරය තුළ, චීන ජනතාව කෙරෙහි ඇති එහි පිළිකුල තුළ සහ එබඳු වෙනත් අංගලක්ෂණ තුළ ද එය පවතී; මේ සියල්ල හට ගන්නේ ජපන් යුදදෙටුවන් විසින් බොහෝ කලක් තිස්සේ නිතර නිතර කියා සිතට කාවද්ද තිබීමෙන් සහ ජපන් ජාතික සම්ප්‍රදායයෙන් ය. අප සතුරු භටයන් ඉතා ලොකු ගණනක් මරා සහ තුවාල කර ඇති නමුත්, අප

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සිරකරුවන් වශයෙන් අල්ලාගෙන ඇත්තේ ඉතා ටික දෙනකුන් වීමේ ප්‍රධාන හේතුව මෙය යි. එය අතීතයේදී බොහෝ දෙනා විසින් අඩුවෙන් තක්සේරු කර තිබෙන කරුණකි. මේ සතුරු අංගලක්ෂණ විනාශ කරලීම දීර්ඝ ක්‍රියාවලියක් වෙනවා ඇත. මුලින් ම කළ යුතු දෙය නම් කාරණය කෙරෙහි බැරෑරුම් ලෙස අවධානය යොමු කිරීම ය; ඉක්බිති දේශපාලන ක්ෂේත්‍රයෙහි ද, ජාත්‍යන්තර ප්‍රචාරය ත් ජපන් ජනතාවගේ ව්‍යාපාරය ත් පිළිබඳ ක්ෂේත්‍රයන්හි ද එගැන ඉවසිල්ලෙන් සහ ක්‍රමානුකූල ලෙස වැඩ කරගෙන යාම ය; යුද්ධමය පරිමණ්ඩලයෙහි මූලසුන් කිරීමේ යුද්ධය සත්තකින් ම එක් විධියක් වේ. මේ සතුරු අංගලක්ෂණ තුළ, අශුභවාදින් ජාතික පරාධීනත්වයේ න්‍යායය පිණිස පදනමක් ද, අක්‍රියාශීලි සිතක් ඇති යුද්ධ පුරුෂයන් මූලසුන් කිරීමේ යුද්ධයට විරුද්ධ වීම පිණිස පදනමක් ද සොයා ගන්ට ඉඩ තිබේ. අපි, එසේ නො ව, ජපන් හමුදාවේ මේ ප්‍රබල අංග විනාශ කළ හැකි බව ත්, ඒවායේ විනාශය දැනට ම ආරම්භ වී ඇති බව ත් තරයේ කියා සිටිමු. ඒවා විනාශ කරන්ට තිබෙන ප්‍රධාන ක්‍රමය ජපන් සෙබළුන් දේශපාලන වශයෙන් අපේ පැත්තට දිනාගැනීම යි. අපි ඔවුන්ගේ ගර්වයට කෙනෙහිලි කරනවාට වඩා එය තේරුම් ගත යුත්තෙමු, එය නිසි අතට හැරවිය යුත්තෙමු, යුද සිරකරුවන්ට ලිහිල් ලෙස සංග්‍රහ කිරීමෙන්, ජපන් පාලකයන් කරන ආක්‍රමණයේ ජනතා–විරෝධී ලක්ෂණය දක්නට ජපන් සෙබළුන්ට මග පෙන්විය යුත්තෙමු. අනික් අතට, අපි චීන හමුදාවේ ත් චීන ජනතාවගේ ත් අදම්‍ය වූ ජීවගුණය ද වීරෝදර, මුරණ්ඩු සටන් හැකියාව ද ජපන් සෙබළුන්ට පෙන්විය යුත්තෙමු; ඒ කියන්නේ, අප මූලසුන් කිරීමේ සටන් වලදී ඔවුන්ට පහර ගැසිය යුතු බව ය. යුද්ධමය සටන් ව්‍යාපාරයන් ගෙනගිය ඉකුත් දස මස තුළ අප ලැබූ අත්දැකීම සතුරු බලසේනාවන් මූලසුන් කළ හැකි බව අපට පෙන්වයි — පිංශිංකුආන් සහ තායිඅර්චුආං යුද්ධව්‍යාපාර නිදසුන් ය. ජපන් හමුදාවේ චිත්තශක්තිය බහින්නට පටන් ගෙන තිබේ, එහි සෙබළුන්ට යුද්ධයේ අරමුණ නො තේරේ; ඔව්හු චීන හමුදාවන් සහ චීන ජනතාව විසින් ගිලගනු ලබති, උන්හිටිගමන් දෙන වේගවත් ප්‍රහාරයන්හිදී ඔව්හු චීන සෙබළුන්ට වඩා හුඟක් අඩු ධෛර්යයක් පළ කරති; මේ ආදී වශයෙනි; මේ සියල්ල මූලසුන් කිරීමේ සටන් කරන්නට හිතකර වූ විෂයමූල සාධක වේ; එමතු නො ව, යුද්ධය දිග්ගැසෙන කල ඒවා ස්ථිර ලෙස ම වර්ධනය වෙනවා ඇත. මූලසුන් කිරීමේ සටන් මගින් සතුරාගේ ඉහවහගිය අහංකාරකම විනාශ කිරීමේ දෘෂ්ටිකෝණයෙන් බලන කල, එබඳු සටන් යුද්ධය කෙටි කිරීම පිණිස ත්, ජපන් සෙබළුන් සහ ජපන් ජනයා නිවහල් කිරීම කඩිනම් කිරීම පිණිස ත් කලින් තිබිය යුතු දේ අතුරෙන් එකක් වේ. බළල්ලු බළලුන් සමග යහළු වෙති; ලොව කිසි තැනක බළල්ලු මීයන් සමග යහළු නො වෙති.

104. අනික් අතට, දැනට අප කාර්මික උපකරණ අතින් ද, හටයන්ගේ පුහුණුව අතින් ද සතුරාට වඩා පහළ බව පිළිගත යුතු ය. එහෙයින්, සතුරු බලසේනාවක් මුළුමනින්ම හෝ එයින් වැඩිකොටසක් හෝ අල්ලාගැනීම වැනි, මූලසුන් කිරීම අතින් වැඩි ම දෙයක් මුදුන්පත් කිරීම, විශේෂයෙන් තැනි වල සටන් කරන කල, බොහෝ විට අමාරු ය. මේ කරුණ සම්බන්ධයෙන් ඉක්මනින් ජය ලැබීමේ න්‍යායය ඉදිරිපත් කරන න්‍යායධරයන්ගේ පමණ ඉකුත් කළ ඉල්ලීම් වැරදි ය. ජපන්–විරෝධී යුද්ධයේදී අපේ බලසේනාවන් ගෙන් ඉල්ලා සිටිය යුත්තේ ඔවුන් හැකි තරම් දුරට මූලසුන් කිරීමේ සටන් කළ යුතු බව ය. හිතකර වටාපිටා තත්වයන් තුළ, අපි හැම සටනකදී ම වැඩි–බලය ඇති බලසේනාවන් ඒකරාශි කළ යුත්තෙමු, වටලෑමේ සහ අංශයකින් වටකිරීමේ උපක්‍රම යෙදිය යුත්තෙමු — සියලු ම සතුරු බලසේනාවන් වටලන්ට බැරි නම් ඔවුන් ගෙන් කොටසක් වටලමු, වට කළ සියලු ම බලසේනාවන් අල්ලාගන්ට බැරි නම් ඔවුන් ගෙන් කොටසක් අල්ලමු, වට කළ බලසේනාවන් අල්ලාගන්ට අපට බැරි නම් ඔවුන් ගෙන් කොටසකට බරපතල හානි සිදු කරමු. මූලසුන් කිරීමේ සටන් වලට අහිතකර වූ වටාපිටා තත්වයන් තුළ, අපි වැහැරීමේ සටන් කළ යුත්තෙමු. හිතකර වටාපිටා තත්වයන් තුළ, අපි බලසේනාවන් ඒකරාශි කිරීමේ මූලධර්මය ද, අහිතකර වටාපිටා තත්වයන් තුළ ඔවුන් විසිරී සිටීමට සැලසීමේ මූලධර්මය ද ක්‍රියාවේ යෙදිය යුත්තෙමු. යුද්ධව්‍යාපාර වල විධානයේ සබඳතාව සම්බන්ධයෙන්, අපි මුලින් කී එකේදී මධ්‍යගත කළ විධානය පිළිබඳ මූලධර්මය ද, පසුව කී එකේදී විමධ්‍යගත කළ විධානය පිළිබඳ මූලධර්මය ද භාවිතාවේ යෙදිය යුත්තෙමු. මේවා ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය සඳහා තිබෙන ක්ෂේත්‍ර ව්‍යාපාරයන්ගේ මූලික මූලධර්ම වේ.

සතුරාගේ වැරදි වලින් ප්‍රයෝජන ගැනීමට තිබෙන ඉඩකඩ

105. සතුරු විධානය විසින් ම ජපානය පරාජය කරන්ට තිබෙන ඉඩකඩට පදනමක් සපයයි. ඉතිහාසය කිසි කලක නො වරදින සුලු සෙනෙවියකු දැන සිට නැත; වැරදි කිරීමෙන් වැළකී සිටින්ට අපට ද යම්සේ අමාරු වේ ද එසේ ම සතුරා ද වැරදි කරයි; එහෙයින්, සතුරාගේ වැරදි වලින් ප්‍රයෝජන ගැනීමට ඉඩකඩ ඇත්තේ ය. තම ආක්‍රමණ යුද්ධයේ දස මස තුළ සතුරා දැනට ම උපායමාර්ගයේදී ත් උපක්‍රම වලදී ත් බොහෝ වැරදි කර ඇත. ප්‍රධාන වැරදි පහක් තිබේ.

පළමුවැන්න, කඩින් කඩ අතිරේක බලසේනා එවීම. මෙය සතුරා චීනය අඩුවෙන් තක්සේරු කිරීම ත් ඔහුට හටයන් හිඟ වීම ත් නිසා ය. සතුරා සැම විට ම අප පහත් කොට සලකා ඇත. පොඩි පාඩුවක් විඳිමින් ඊසානදිග පළාත් හතර පැහැරගත් පසු, ඔහු නැගෙනහිරි හෝපෙයි පළාත ත් උතුරු චහාර් පළාත ත්, හුදෙක් ඒ පෙදෙස් වල යුද්ධ ශක්තිය

LIBERATION BASE

https://liberationbase.wordpress.com

හා විධිවිධාන උපායමාර්ගික වශයෙන් සොයා දැනගැනීම මගින් පමණක්, අල්ලාගත්තේ ය. සතුරා එළඹුණු නිගමනය වූයේ චීන ජාතිය බුරුල් වැලි ගොඩක් බව ය. එසේ, චීනය එක පහරින් ම බිඳ වැටේ ය'යි සිතමින්, ඔහු, ඉතා කුඩා බලසේනාවන් මගින් අප බියපත් කොට හිස් එැ එැ අත පළවා හරින්ට උත්සාහ කරමින්, ''ඉක්මනින් විසඳුමක් කරන'' සැලැස්මක් සකස් කළේ ය. ඔහු, චීනය දැන් ප්‍රගතියේ කාල-පරිච්ඡේදයකට පිවිසී සිටින බව ත්, චීනයට දැන් දියුණු දේශපාලන පක්ෂයක්, දියුණු හමුදාවක් සහ දියුණු ජනතාවක් සිටින බව ත් ඔහුට අමතක වූයෙන්, ඉකුත් දස මස තුළ චීනය විසින් පළ කර තිබෙන්නාක් වැනි මහත් සමගියක් සහ විරුද්ධකම් පෑමේ විශාල බලයක් දකින්ට බලාපොරොත්තු නො වී ය. ඇබැද්දි වලට මුහුණ පාන්නට වූයෙන්, සතුරා එවිට ඩිවිසන් දහයක් දෙළහක් පමණ වූ ඔහුගේ බලසේනාවන් ඩිවිසන් තිහ දක්වා කඩින් කඩ වැඩි කළේ ය. ඔහුට ඉදිරියට ගමන් කරන්ට උවමනා නම් තම බලසේනාවන් තවත් තර කරන්ට ඔහුට සිදු වෙනවා ඇත. එහෙත් සෝවියට් සංගමය සමග ඇති ජපානයේ පසමිතුරු බව ත්, මිනිස්බලය සහ මුදල්හදල් අතින් ඇට නිසර්ගයෙන් ම ඇති අගහිඟකම ත් නිසා, ඈ විසින් එවිය හැකි මිනිසුන්ගේ වැඩි ම ගණන සහ ඇට ඉදිරියට ගමන් කළ හැකි වැඩි ම දුර නො වැළකිය හැකි ලෙස ම සීමා වේ.

දෙවැන්න, පහර දෙන ප්‍රධාන දිසාවක් නොමැතිවීම. තායිඅර්චුආං යුද්ධව්‍යාපාරයට කලින්, සතුරා ඔහුගේ බලසේනා උතුරු සහ මැද චීනය අතර බොහෝ දුරට සමාන ලෙස බෙදා තිබුණේ ය, යළි ඒවා මේ එක් එක් ප්‍රදේශය තුළ ද බෙදා තිබුණේ ය. උතුරු චීනයෙහි, නිදසුන් වශයෙන්, ඔහු ඔහුගේ බලසේනා තියන්සින්–පූකව්, පීපිං–හැන්කව් සහ තාතුං–පූචව් දුම්රිය මාර්ග අතර බෙදා තිබුණි; මේ එක් එක් මාර්ගය ඔස්සේ ඔහු යම් යම් අලාභහානි වින්දේ ය, අල්ලාගත් ස්ථානයන්හි ගැරිසන් සේනා කීපයක් නතර කළේ ය; ඉන් පසු තව දුරට ත් ඉදිරියට ගමන් කරනු පිණිස ඔහුට බලසේනා නැති විය. ඔහු පාඩමක් ඉගෙනගත් තායිඅර්චුආං පරාජයට පසු, සතුරා ඔහුගේ ප්‍රධාන බලසේනාවන් හ්සූචව් දිසාවට ඒකරාශි කළේ ය; එසේ මේ වරද තාවකාලික වශයෙන් නිවැරදි කළේ ය.

තුන්වැන්න, උපායමාර්ගික වශයෙන් උචිත සම්බන්ධය නොමැති-වීම. මූළු වශයෙන් උතුරු චීනයෙහි සහ මැද චීනයෙහි සිටින සතුරු බලසේනා කණ්ඩායම් ඇතුළත උචිත සම්බන්ධයක් පවතී; එහෙත් ඒ දෙක අතර උචිත සම්බන්ධයක් බරපතල ලෙස ම නොමැත්තේ ය. තියන්සින්–පූකව් දුම්රිය–මාර්ගයේ දකුණු කොටසේ සිටි ඔහුගේ බලසේනාවන් ශියාඕපෙංපූවට පහර දුන් අවස්ථාවෙහි, උතුරු කොටසෙහි සිටි

බලසේනාවෝ හෙල වුණේ වත් නැත. උතුරු කොටසෙහි සිටි ඔහුගේ බලසේනාවන් තායිඅර්චුආං වලට පහර දුන් කල, දකුණු කොටසෙහි සිටි බලසේනාවෝ හෙල වුණේ වත් නැත. මේ දෙ තැනදී ම සතුරා විපතට පත් වූ පසු, ජපන් යුද ඇමති පරීක්ෂා කිරීමේ සංචාරයක යෙදෙන්ට ආවේ ය, සෙනෙවි මණ්ඩලයේ ප්‍රධානයා විධානය බාර ගන්ට පැමිණියේ ය; ඒ මොහොතට, උචිත සම්බන්ධයක් තිබෙන ලෙසක් පෙනිණි. ජපානයේ ඉඩම්හිමි පංක්තිය, ධනේශ්වරපංක්තිය සහ යුදදෙටුවන් අතර ඉතා බරපතල අභ්‍යන්තර ප්‍රතිවිරෝධයෝ පවතිත්; ඒ ප්‍රතිවිරෝධයෝ වැඩෙති; යුද්ධමය උචිත සම්බන්ධය නොමැතිවීම මේ සත්‍ය කාරණය නියම වශයෙන් ප්‍රකට වන එක් විධියකි.

සිව්වැන්න, උපායමාර්ගික ඉඩප්‍රස්තා තරයේ අල්ලාගැනීමට අසමත් වීම. නැන්කිං සහ තයියුආන් අල්ලාගත් පසු සතුරාගේ ගමන නතරවීමෙන් මේ අසමත්කම පැහැදිලි ලෙස පෙනී ගියේ ය; එසේ වූයේ ප්‍රධාන වශයෙන් ඔහුට හටකණ්ඩායම් හිඟ වීම නිසා සහ උපායමාර්ගික ලුහුබැඳීමේ බලසේනාවක් ඔහුට නොමැති වීම නිසා ය.

පස්වැන්න, විශාල ගණන් වටලන නමුත් කුඩා ගණන් මුලසුන් කිරීම. තායිඅර්චුආං යුද්ධව්‍යාපාරයට කලින්, ශැංහයි, නැන්කිං, ත්සාංචව්, පාඕතිං, නැන්කව්, ශින්කෞ සහ ලින්පන් යුද්ධව්‍යාපාර වලදී, බොහෝ චීන හටකණ්ඩායම් පළවා හරිනලද නමුදු, සිරකරුවන් වශයෙන් අල්ලාගත්තේ ටික දෙනෙකි. එය සතුරු විධානයේ මෝඩකම පෙන්වයි.

කඩින්කඩ අතිරේක බලසේනාවන් එවීම, පහර දෙන ප්‍රධාන දිසාවක් නොමැති වීම, උපායමාර්ගික උචිත සම්බන්ධය නොමැති වීම, ඉඩප්‍රස්තා තරයේ අල්ලා-ගැනීමට අසමත් වීම සහ, ලොකු ගණන් වටලන නමුත් කුඩා ගණන් මුලසුන් කිරීම යන මේ වැරදි පහ තායිඅර්චුආං යුද්ධව්‍යාපාරයට කලින් ජපන් විධානයෙහි අදක්ෂතාව පිළිබඳ කරුණු විය. සතුරා එතැන් සිට කිසියම් දියුණුවක් සලසාගෙන සිටින නමුත්, ඔහුට හටයන් හිඟවීම, ඔහුගේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් සහ වෙන සාධක නිසා, තම වැරදි නැවත කිරීමෙන් වැළකී සිටීමට ඔහුට පුළුවන්කමක් නැත. ඒ හැර, ඔහු එක් තැනකදී ලබන ලාභය වෙන තැනකදී නැති කර ගනී. නිදසුන් වශයෙන්, ඔහු උතුරු චීනයෙහි සිටි ඔහුගේ බලසේනාවන් හ්සූචව් වෙත ඒකරාශි කළ කල්හි, ඔහු උතුරු චීනයෙහි අල්ලාගෙන සිටි ප්‍රදේශ වල ලොකු හිස් තැනක් ඉතිරි කළේ ය; එය අපට ගෙරිල්ලා සංග්‍රාමය වර්ධනය කරනු පිණිස සම්පූර්ණ ඉඩකඩ සලසා දුන්නේ ය. මේ වැරදි සතුරා විසින් ම කළ දේ විය, අපගේ පෙළඹීමෙන් කළ දේ නො වී ය. අපේ කොටස වශයෙන්, උවමනාවෙන් ම සතුරා ලවා වැරදි කරවන්ට අපට හැකි ය; ඒ කියන්නේ, මැනවින් සංවිධානය කළ ප්‍රාදේශික

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ජනගහණයක ආධාරය ඇතිව දක්ෂ ලෙස ත් සාර්ථක ලෙස ත් සේනාවන් එහා මෙහා කිරීම මගින්, උදහරණ වශයෙන්, ''නැගෙනහිරට පහර දෙන්ට යන බවක් බොරුවට අඟවා බටහිරට පහරදීම'' මගින්, අපට උවමනා කරන තත්වයට සතුරා පත්වන සේ ඔහු නොමග යැවීමට සහ ඔහු හැසිරවීමට අපට හැකි බව ය. මේ පුළුවන්කම දූනට ම සාකච්ඡා කර ඇත. ඉහත කී සියල්ලෙන් පෙනෙන්නේ සතුරාගේ විධානයෙහි ද අපට ජයග්‍රහණය පිණිස පදනමක් සොයා ගත හැකි බව ය. සත්තකින් ම, අප එය අපේ උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කිරීම පිණිස වැදගත් පදනමක් වශයෙන් නො ගත යුතු ය; එසේ නො ගත යුතුවා පමණක් නො ව, අපට තිබෙන එක ම විශ්වාස කටයුතු මග සතුරා වැරදි ටිකක් කරනවා ඇත යන කල්පනාව අපේ සැලැස්ම සම්පාදනය කිරීමට පදනම කරගැනීම ය. හැර ද, සතුරාගේ වැරදි වලින් ප්‍රයෝජන ගන්ට අපට හැකි වන්නා සේ ම, අපේ වැරදි වලින් ප්‍රයෝජන ගන්ට සතුරාට ද හැකි වේ. අපේ විධානය සතු යුතුකම නම් එසේ කිරීමට ඉඩප්‍රස්තා ඔහුට ඉතා ම අඩුවෙන් දීම ය. ඇත්ත වශයෙන්, සතුරු විධානය වැරදි කර තිබේ, යළි ත් ඉදිරියට ත් වැරදි කරනවා ඇත, අපේ ප්‍රයත්නයන් මගින් එසේ කරන්ට සැලසිය හැකි ය. මේ සියලු වැරදි වලින් ප්‍රයෝජන ගන්ට අපට හැකි ය; ඒවා ඩැහැගැනීමට තමන් විසින් කළ හැකි වැඩි ම දේ කිරීම විරුද්දකම් පැමේ යුද්ධයෙහි යෙදී සිටින අපේ සෙනෙවියන්ට අයත් වැඩකි. කෙසේ වෙවා, සතුරාගේ උපායමාර්ගික සහ යුද්ධව්‍යාපාරික විධානයේ බොහෝ දේ අදක්ෂ නමුදු, ඔහුගේ සටන් විධානයෙහි, ඒ කියන්නේ, ඔහුගේ සේනාංග සහ කුඩා සේනා උපක්‍රම වල, කදිම කරුණු සෑහෙන ගණනක් ඇත; මෙහිදී අපි ඔහු ගෙන් ඉගෙනගත යුත්තෙමු.

ජපන්-විරෝධි යුද්ධයේදී තීරණාත්මක සටන්-වැදීම පිළිබඳ ප්‍රශ්නය

106. ජපන්-විරෝධි යුද්ධයේදී තීරණාත්මක සටන්-වැදීම පිළිබඳ ප්‍රශ්නය වෙත අංශ තුනකින් යොමු විය යුතු ය: ජය ගත හැකි බව අපට නිසැක වූ හැම යුද්ධව්‍යාපාරයකදී හෝ සටනකදී ම අපි තීරණාත්මක සටන්-වැදීමක් ස්ථිර ලෙස ම කළ යුත්තෙමු; ජය ගත හැකි බව අපට නිසැක නො වන හැම යුද්ධව්‍යාපාරයකදී හෝ සටනකදී ම අපි තීරණාත්මක සටන්-වැදීමකින් වැළකී සිටිය යුත්තෙමු; අපි මුළු ජාතියේ ම ඉරණම පරදුවට තබා ඇති උපායමාර්ගික වශයෙන් තීරණාත්මක වූ සටන්-වැදීමකින් ඒකාන්ත වශයෙන් ම වැළකී සිටිය යුත්තෙමු. අපේ ජපානයට විරුද්දකම් පැමේ යුද්ධය වෙන බොහෝ යුද්ධ වලට වෙනස් කරන අංගලක්ෂණ ද තීරණාත්මක සටන්-වැදීම පිළිබඳ මේ ප්‍රශ්නයෙහි අනාවරණය වේ. සතුරාගේ ශක්තියෙන් ද අපේ

දුර්වලකමින් ද සලකුණු වී තිබෙන යුද්ධයේ පළමුවැනි සහ දෙවැනි අවස්ථාවන්හි, සතුරාගේ බලාපොරොත්තුව වන්නේ තීරණාත්මක සටන්-වැදීමක් පිණිස අප අපේ ප්‍රධාන බලසේනාවන් ඒකරාශි කිරීම ය. අපේ බලාපොරොත්තුව හරියට ම එහි අනික් පැත්ත වේ. අපට උවමනා කරන්නේ, පිංශිංකුආන්, තායිඅර්චුආං සහ වෙන තැන් වල සටන් වලදී මෙන්, අපට හිතකර වූ තත්වයන් තෝරාගෙන, වැඩි-බලය ඇති බලසේනාවන් ඒකරාශි කොට, ජය ගත හැකි බව අපට නිසැක වන විට පමණක් තීරණාත්මක යුද්ධව්‍යාපාර හෝ සටන් කිරීම ය; ජය ගත හැකි බව අපට නිසැක නො වන විට අහිතකර තත්වයන් යටතේ තීරණාත්මක සටන්-වැදීම් වලින් වැළකී සිටින්ට අපට උවමනා ය; චාංතේ සහ වෙන යුද්ධව්‍යාපාර වලදී අප යොදගත් ප්‍රතිපත්තිය මෙය වේ. මුළු ජාතියේ ම ඉරණම පරදුවට තබා ඇති උපායමාර්ගික වශයෙන් තීරණාත්මක වූ සටන්-වැදීමක් කිරීම සම්බන්ධයෙන්, අපි හුදෙක් එසේ නො කළ යුත්තෙමු; නොබෝද ග්සූචව් වලින් ඉවත් වී ගියාක් මෙනි. ''ඉක්මනින් විසඳුමක්'' ලබා ගැනීම පිණිස වූ සතුරාගේ සැලස්ම එසේ ව්‍යර්ථ කරනු ලැබී ය, දූන් ඔහුට අප සමග දිග්ගැසුණු යුද්ධයක් නො කර බැරි ය. මේ මූලධර්ම කුඩා භූමිප්‍රදේශයක් ඇති රටක ක්‍රියාවේ යොදන්ට බැරි ය, දේශපාලන වශයෙන් ඉතා නොදියුණු රටක ක්‍රියාවේ යොදන්ට අමාරු ය. ඒවා චීනයෙහි ක්‍රියාවේ යොදන්ට හැකි වන්නේ චීනය ලොකු රටක් නිසා සහ ප්‍රගතිය පිළිබඳ යුගයක පවතින නිසා ය. උපායමාර්ගික වශයෙන් තීරණාත්මක වූ සටන්-වැදීම් වලින් වැළකී සිටිතොත්, එවිට ''නිල් කඳුවැටි තිබෙන තුරු, දර සොයාගැනීම ගැන කරදර වෙන්ට උවමනා නැත''; කවර හෙයින් ද යත් අපේ භූමිප්‍රදේශයෙන් කොටසක් නැති වී ගියත්, අපට උපායශීලි ලෙස හැසිරෙන්ට ඕනෑ තරම් ඉඩ තිබෙනවා ඇත, එසේ දේශීය ප්‍රගතිය, ජාත්‍යන්තර අනුබලය සහ සතුරා අභ්‍යන්තර වශයෙන් කැඩී බිඳී යාම ඉදිරියට මෙහෙයවන්ට ත් බලාපොරොත්තුව සිටින්ට ත් අපට පුළුවන් වෙනවා ඇත; ජපන්-විරෝධි යුද්ධයේදී අපට තිබෙන හොඳ ම ප්‍රතිපත්තිය එය යි. දිග්ගැසුණු යුද්ධයක දුක් කරදර විඳ දරා ගැනීමට අසමත් ව, පමා නො වී ලබන ජයග්‍රහණයක් පිණිස ගිජු ව, ඉක්මනින් ජය ගැනීමේ න්‍යායය ඉදිරිපත් කරන කලබලකාර න්‍යායාචාර්යවරු තත්වය පොඩ්ඩක් හිතකර අතට හැරුණු මොහොතේ ම උපායමාර්ගික වශයෙන් තීරණාත්මක වූ සටන්-වැදීමක් කරන්නට ඝෝෂා කරති. ඔවුන්ට උවමනා කරන දේ කිරීම මුළු යුද්ධයට ම මෙ පමණ ය'යි නො කිය හැකි අලාභහානි සිදු කිරීමක්, දිග්ගැසුණු යුද්ධය කම්මුතු කර දූමීමක් සහ, අප සතුරාගේ මර උගුලට වැටීමක් වෙනවා ඇත; ඇත්තෙන් ම, එය ඉතා ම නරක ප්‍රතිපත්තිය වෙනවා ඇත. නිසැකයෙන් ම, අප තීරණාත්මක සටන්-වැදීම් වලින් වැළකී සිටින්ට නම්, භූමිප්‍රදේශ අත්හැර දමන්ට අපට සිදු වෙනවා ඇත; සම්පූර්ණයෙන් ම වළක්වන්ට බැරි තැනට පැමිණි කල (එතැනට පැමිණි කල පමණකි), එසේ භූමිප්‍රදේශ අත් හැර දූමීමට අපට

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ධෛර්යය තිබිය යුතු ය. එබඳු අවස්ථාවන්හි අපි මඳකුදු කණගාටු නො විය යුත්තෙමු; ඉඩ විකුණා කාලය ගැනීමේ වෙළඳ ගනුදෙනුවක් කරන මේ ප්‍රතිපත්තිය නිවැරදි නිසා ය. රුසියාව තීරණාත්මක සටන්-වැදීමක් මගහැරීම පිණිස ධෛර්යසම්පන්න ලෙස පසුබැසීමක් කළ සැටි ත්, ඉක්බිති ඒ කාලයේ භීතිය වී සිටි නැපෝලියන් පරාජය කළ සැටි ත් ඉතිහාසය කියයි. අද චීනය ත් එසේ කළ යුතු ය.

107. අප "විරුද්දකම් නොපාන්නන්" වශයෙන් චෝදනා කොට හෙළා දකිනු ලැබීම ගැන බය නැද්ද? නැත, අපි බය නැත. කොහෙත් ම සටන් නො කොට, සතුරා සමග සමගිසම්මුතියකට එළඹීම — විරුද්දකම් නො පෑම නම් එය යි; චෝදනා කොට හෙළා දැකීම පමණක් නො ව කිසි කලෙක නො ඉවසිය යුතු දෙය එය යි. අපි විරුද්දකම් පෑමේ යුද්ධය ස්ථිර ලෙස ම කළ යුත්තෙමු; එහෙත් සතුරාගේ මර උගුලට අසු නො වී සිටිනු වස්, විරුද්දකම් පෑමේ යුද්ධය දිගට ම කරගෙන යාම අමාරු කළ හැකි, අපේ ප්‍රධාන බලසේනාවන් එක පහරින් ම කම්මුතු කර දැමීමට ඉඩ දීම අප විසින් නො කිරීම ඒකාන්ත වශයෙන් ම අවශ්‍ය ය — කොටින්, ජාතිය පරාධීන වීම වැළැක්වීම ඒකාන්ත වශයෙන් ම අවශ්‍ය ය. මේ කරුණ ගැන සැක ඇති කර ගැනීම යුද්ධය පිළිබඳ ප්‍රශ්නය ගැන අදූරදර්ශී වීම වේ; එය අයකු පරාධීනත්වවාදීන්ගේ ගොඩට පමුණුවනවා නිසැක ය. "ඉදිරියට යනවා පමණ යි, කිසි විටක පසුබසින්න එපා" යන වියරු අනවධානය අප විසින් විවේචනය කළේ, මේ ධර්මය, එය පන්නය බවට පත් වී නම්, විරුද්දකම් පෑමේ යුද්ධය දිගට ම ගෙනයාම කොහෙත් ම නො කළ හැකි දෙයක් කරන්ට පුළුවන් නිසා සහ අන්තිමේදී ජාතිය පරාධීන වීමේ අනතුර කරා පැමිණවිය හැකි නිසා ම ය.

108. සටන්වලදී හෝ ලොකු හෝ කුඩා යුද්ධව්‍යාපාර වලදී හෝ වටාපිටා තත්වයන් හිතකර වන හැම විට ම අපි තීරණාත්මක සටන්-වැදීම් වලට පක්ෂ ය; මේ අතින් අපි කිසි විටෙක අක්‍රියාකාරිත්වය නො ඉවසිය යුත්තෙමු. එබඳු තීරණාත්මක සටන්-වැදීම් මගින් පමණකි සතුරු බල-සේනාවන් මුලසුන් කිරීමේ හෝ හීන කිරීමේ අරමුණ මුදුන්පත් කරන්ට අපට හැකි වන්නේ; ජපන්-විරෝධී යුද්ධයෙහි යෙදී සිටින හැම සෙබළෙක් ම තම කොටස ස්ථිර ලෙස ඉටු කළ යුතු ය. මේ කාරිය පිණිස අඩාල පරිත්‍යාග සැලකිය යුතු ප්‍රමාණයක් කිරීම අවශ්‍ය වේ; කිසි ම පරිත්‍යාගයක් නො කොට මග හැරීම බියසුල්ලන්ගේ ත් ජපානය කෙරෙහි බියෙන් පෙළෙනවුන්ගේ ත් ආකල්පය වේ, ඊට තරයේ ම විරුද්ධ විය යුතු ය. ලි පූ-යිං, හාන් පූ-චූ සහ සෙසු පළායාම්වාදීන් මරණයට පත් කිරීම යුක්ති සහගත විය. නිවැරදි යුද්ධ සැලැස්ම සම්පාදනයේ පරිමණ්ඩලය ඇතුළත, සටනේදී වීරෝදාර ආත්ම-පරිත්‍යාගයේ ජීවගුණයට සහ භාවිතයට ත් අභීත ලෙස ඉදිරියට යාමට ත් දිරි දීම ඒකාන්තයෙන් ම අවශ්‍ය ය, එය දිග්ගැසුණු

යුද්ධය කිරීමෙන් සහ අවසාන ජයග්‍රහණය අත්පත් කරගැනීමෙන් වෙන් කළ නො හැකි ය. අප "පසුබසිනවා පමණයි, කිසි විටෙක ඉදිරියට යන්ට එපා" යන පළායාමේ ධර්මය තරයේ හෙළා දක ඇත්තේ ත්, චීනය දැඩි ලෙස ක්‍රියාවේ යෙදීමට අනුබල දී ඇත්තේ ත්, බලවත් සතුරා පරාජය කරන්ට අපට හැකි වන්නේ නිවැරදි සැලැස්මක් යටතේ කරන වීරෝදාර තීරණාත්මක සටන්-වැදීම් මගින් පමණක් නිසා ය; පළායාමේ ධර්මය, එසේ නො ව, ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායයට කෙළින් ම අනුබල දෙයි.

109. පළමුකොට වීරෝදාර ලෙස සටන් කොට, ඉක්බිති භූමිප්‍රදේශ අත හැර දැමීම ස්වයං-ප්‍රතිවිරෝධී නො වේ ද? අපේ වීරෝදාර සටන්කරුවන් තම ලේ වැගුරුවේ නිෂ්ඵල ලෙස නො වෙනවා ඇද්ද? එය කොහෙත් ම ප්‍රශ්න ඉදිරිපත් කළ යුතු පිළිවෙල නො වේ. කනවා, ඊළඟට ඔබගේ බඩ හිස් කරනවා — මෙය පලක් නැතිව කෑමක් නො වේ ද? නිදගන්නවා, ඊළඟට නැඟිටිනවා — මෙය පලක් නැතිව නිදගැනීමක් නො වේ ද? එබඳු පිළි-වෙලකට ප්‍රශ්න ඉදිරිපත් කළ හැකි ද? බැරි ය'යි මම කල්පනා කරමි. දිගට ම කාගෙන යාම, දිගට ම නිදගෙන සිටීම, නතර වීමක් නැති ව යාලු ගඟ තෙක් මුළු මග දිගට ම වීරෝදාර ලෙස සටන් කරගෙන යාම — මේවා මනෝමූලවාදී සහ ආකාරවාදී මුළාවෝ ය, ජීවිතයේ සත්තාවෝ නො වෙත්. හැම දෙනා ම දන්නා පරිදි, කාලය ලබාගනු වස් සහ පෙරළා-පහරදීම සූදනම් කරනු වස් සටන් කිරීමේදී ත් අපේ ලේ වැගිරීමේදී ත් කිසියම් භූමි-ප්‍රදේශයක් අත හැර දමන්ට අපට සිදු වී ඇති නමුත් ඇත්ත වශයෙන් අප කාලය ලබාගෙන ඇත, සතුරු බලසේනාවන් මුලසුන් කිරීමේ සහ හීන කිරීමේ පරමාර්ථය මුදුන්පත් කරගෙන ඇත, සටන් කිරීමෙහි ලා අත්-දැකීම් ලබාගෙන ඇත, මෙතෙක් අක්‍රියාශීලි ව සිටි ජනයා පුබුදු කර ඇත, අපේ ජාත්‍යන්තර තත්වය දියුණු කරගෙන ඇත. අපේ ලේ වගුරා ඇත්තේ පලක් නැතිව ද? සත්තකින් ම නැත. භූමිප්‍රදේශ අත හැර දමා ඇත්තේ අපේ යුද්ධමය බලවේගයන් රැකගැනීම පිණිස ය, ඇත්තෙන් ම අපේ භූමි-ප්‍රදේශ රැකගැනීම පිණිස ම ය; තත්වයන් අහිතකර වූ කල අපි අපේ භූමිප්‍රදේශයෙන් කොටසක් අත් හැර නො දමා, ජය ගැනීමේ අල්පමාත්‍ර සහතිකයක් හෝ නොමැතිව අන්ධ ලෙස තීරණාත්මක සටන්-වැදීම් කරමු නම්, අපට අපේ යුද්ධමය බලවේග නැති වෙනවා ඇත, ඉක්බිති අපේ සියලු භූමිප්‍රදේශ නැතිවීම වළක්වන්ට බැරි වෙනවා ඇත; දැනට ම නැති වී තිබෙන භූමිප්‍රදේශ ආපසු ලබා ගැනීම ගැන කිව යුතු නො වේ. ධනපතියකුට ඔහුගේ ජාවාරම් කරගෙන යාම පිණිස ප්‍රාග්ධනයක් තිබිය යුතු ය; ඔහුට ඒ මුළු ප්‍රාග්ධනය ම නැති වී ගිය හොත්, ඔහු තව දුරට ත් ධනපතියෙක් නො වේ. සූදුකාරයකුට පවා ඔට්ටු ඇල්ලීමට මුදල් තිබිය යුතු ය, ඔහු එක අතකදී ම ඒ සියල්ල අවදනම් ලෙස ඔට්ටු ඇල්ලුවොත් සහ වාසනාව ඔහුට පිටු පෑවොත්, තව දුරට දූ කෙළින්ට ඔහුට බැරි ය. සිද්ධි ඒවාට ම අයත්

LIBERATION BASE

https://liberationbase.wordpress.com

හැරීම් පෙරළීම් වලින් යුක්ත ය, කෙළින් ඉරක් ඔස්සේ යන්නේ නැත; යුද්ධය ඊට වෙනස් දෙයක් නො වේ; මේ සත්‍යය අවබෝධ කරගන්ට අසමත් වන්නෝ ආකාරවාදියෝ පමණකි.

110. උපායමාර්ගික පෙරළා-පහරදීමේ අවස්ථාවේදී කරන තීරණාත්මක සටන්-වැදීම් සඳහා ද එය ම හරි යනවා ඇතැ'යි මම සිතමි. ඒ වන විට සතුරා අඩු-බලය ඇති තත්වයේ ද අප වැඩි-බලය ඇති තත්වයේ ද සිටිනවා ඇති නමුත්, "පලක් ඇති තීරණාත්මක සටන්-වැදීම් කිරීමේ ත් පලක් නැති ඒවා මගහැරීමේ ත්" මූලධර්මය එතෙක් ම යෙදෙනවා ඇත, අප යාලු ගඟ තෙක් ම සටන් කරමින් අපේ මග ගෙවන තුරු දිගට ම යෙදෙනවා ඇත. මුල සිට අග දක්වා අපේ මූලපිරුම පවත්වාගන්ට අපට හැකි වන්නේ මෙසේ ය; සතුරාගේ "අභියෝග" සහ වෙන මිනිසුන්ගේ "සරදම්" සම්බන්ධයෙන්, අපි කලබල නො වී ඒවා පැත්තකට ගසා දැමිය යුත්තෙමු, ඒවා ගණන් නො ගෙන සිටිය යුත්තෙමු. විරුද්දකම් පෑමේ යුද්ධයේදී ධෛර්යසම්පන්න ය'යි, බුද්ධිමත් ය'යි සැලකිය හැකි වන්නෝ මේ විධියේ තරසර ගුණයක් පළ කළ හැකි සෙනෙවිවරු පමණකි. මෙය "අත ගැවෙන විට උඩ පනින" අයට වටහා ගන්ට බැරි ය. යුද්ධයේ මේ පළමුවැනි අවස්ථාවේදී අප සිටින්නේ උපායමාර්ගික වශයෙන් බෙහෝ දුරට අක්‍රියාකාරි තත්වයක වුව ද, හැම යුද්ධව්‍යාපාරයකදී ම මූලපිරුම අපට තිබිය යුතු ය; සත්තකින් ම පසු ව එළඹෙන අවස්ථාවන් මුළුල්ලේ ද මූලපිරුම අප වෙත තිබිය යුතු ය. අපි දිග්ගැසුණු යුද්ධය සහ අවසාන ජයග්‍රහණය පිණිස වෙමු, අපි සියලු ම දේ එක අතකදී අවදානමට පත් කරගන්නා සූදුකාරයෝ නො වෙමු.

හමුදාව ත් ජනතාව ත් ජයග්‍රහණයේ අත්තිවාරම වෙති

111. විප්ලවවාදි චීනය ආක්‍රමණය කිරීම ත් මර්දනය කිරීම ත් ජපන් අධිරාජ්‍යවාදය විසින් කිසි කලෙක බුරුල් නො කරනවා ඇත; මෙය එහි අධිරාජ්‍යවාදි ස්වභාවය විසින් නිශ්චය කරනු ලැබේ. චීනය විරුද්දකම් නො පෑවේ නම්, ජපානය, ඊසානදිග පළාත් හතර අල්ලාගත්තාක් මෙන්, එක ම වෙඩිල්ලක් වත් නො තබා මුළු චීනය ම පහසුවෙන් ඩැහැ ගන්නවා ඇත. චීනය විරුද්දකම් පාන හෙයින්, ජපානය මේ විරුද්දකම් පෑම මර්දනය කරන්ට උත්සාහ කිරීම වෙනස් නො වන නීතියකි; ඇගේ මර්දනයේ වේගය චීනයේ විරුද්දකම් පෑමේ වේගයෙන් ඉක්මවනු ලබන තුරු ඇ එසේ උත්සාහ කරනවා ඇත. ජපන් ඉඩම්හිමි පංක්තිය ත් ධනේශ්වරපංක්තිය ත් මහත් විජිගීෂාවෙන් පෙළෙන්නේ ය; දකුණට අග්නිදිග ආසියාව තෙක් ද උතුරට සයිබීරියාව තෙක් ද කාගෙන යනු වස්, ඔවුන් පළමුකොට

චීනයට පහර දීමෙන් මැදින් බිඳගෙන යාමේ ප්‍රතිපත්තිය යොදගෙන ඇත. ජපානය නතර විය යුතු තැන දන්නවා ඇතැ'යි ද, උතුරු චීනය ත් චියාංසු පළාත සහ චෙචියාං පළාත ත් අල්ලාගැනීමෙන් තෘප්තියට පත් වෙනවා ඇතැ'යි ද සිතන අය අළුත් අවස්ථාවකට වර්ධනය වී ඇති, අභාවය කරා ළඟා වෙමින් සිටින අධිරාජ්‍යවාදි ජපානය අතීතයේ ජපානයට වෙනස් බව වටහාගන්ට සම්පූර්ණයෙන් ම අසමත් වෙති. ජපානය විසින් එවිය හැකි මිනිසුන්ගේ ගණනට ත් ඇට ඉදිරියට ගමන් කළ හැකි දුර ප්‍රමාණයට ත් නිශ්චිත සීමාවක් ඇතැ'යි අප කියන කල අප අදහස් කරන්නේ, ඇට තිබෙන ශක්තිය අනුව, ඇගේ බලසේනාවන් ගෙන් කොටසක් පමණක් චීනයට විරුද්ධ ව යොදන්නට ත්, ඒ බලසේනාවන්ගේ හැකියාවෙන් ඉඩ ලැබෙන දුරට පමණක් චීනය තුළට කාගෙන යන්නට ත් ජපානයට හැකි වන බව ය; කවර හෙයින් ද යත් වෙනත් දිසාවන්ට පහර දීමට ඇට උවමනා නිසා සහ සෙසු සතුරන්ට විරුද්ධ ව තමා ආරක්ෂා කරගැනීමට ඇට තිබෙන නිසා ය; ඒ අතර ම චීනය ප්‍රගතිය ත් මුරණ්ඩු ලෙස විරුද්දකම් පෑමට තිබෙන හැකියාව ත් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කර ඇත; චීනය නො වැළැක්විය හැකි ලෙස ම විරුද්දකම් පාන්නේ නැති නම් ජපානය විසින් දරුණු පහරදීම් කළ යුතු වේ ය'යි සිතන්නට බැරි ය. මුළු චීනය ම අල්ලාගන්ට ජපානයට බැරි ය; එහෙත් ඇ ඇට ළඟා විය හැකි සියලු ප්‍රදේශ වල චීනයේ විරුද්දකම් පෑම මැඩීමට දැරිය හැකි හැම ප්‍රයත්නයක් ම දරනවා ඇත, අභ්‍යන්තර සහ බාහිර වර්ධනයන් ජපන් අධිරාජ්‍යවාදය මිනීවළේ ගැට්ට වෙතට ම තල්ලු කරන තුරු ඒ ප්‍රයත්න නතර නො වෙනවා ඇත. ජපානයෙහි දේශපාලන තත්වයෙන් ඇති විය හැක්කේ ප්‍රතිඵල දෙකක් පමණි. එක්කෝ ඇගේ මුළු පාලක පංක්තියේ ඇදවැටීම සීඝ්‍රයෙන් සිදු වී, දේශපාලන බලය ජනතාව අතට ගොස්, එසේ යුද්ධය අවසානයකට පත් වෙයි; මේ මොහොතෙහි එය කොහෙත් ම වෙන්ට බැරි ය; නැතහොත් ඇගේ ඉඩම්හිමි පංක්තිය සහ ධනේශ්වරපංක්තිය වඩ වඩා පැසිස්ට්වාදි වී, ඔවුන් ඇදවැටෙන දිනය එන තුරු යුද්ධය පවත්වාගෙන යයි; දැන් ජපානය ගමන් කරන පාර එය යි. වෙන ප්‍රතිඵලයක් ඇති විය නො හැකි ය. ජපන් ධනේශ්වරපංක්තිය තුළ සිටින මැදහත් අය ඉදිරියට අවුත් යුද්ධය නතර කරනවා ඇතැ'යි බලාපොරොත්තුවන්නන් කරන්නේ මායාවක් වැළඳගෙන සිටීම පමණකි. අවුරුදු බොහෝ ගණනක සිට ජපන් දේශපාලනයේ සත්තාව වී ඇත්තේ ජපානයේ මැදහත් ධනේශ්වරයන් ඉඩම්හිමියන්ගේ සහ මහ ධනහිමියන්ගේ සිරකරුවන් වී සිටීම ය. දැන් ජපානය චීනයට විරුද්ධ ව යුද්ධය දියත් කර තිබෙන නිසා, චීනයේ විරුද්දකම් පෑමෙන් ඇට මරු පහරක් නො වදින තුරු සහ ඇ ප්‍රමාණවත් ශක්තියක් ඉතිරි කරගෙන සිටින තුරු, ඇ අග්නිදිග ආසියාවට හෝ සයිබීරියාවට, නැතහොත් ඒ දෙකට ම, පහර ගසනවා නියත ය. යුරෝපයෙහි යුද්ධය පටන් ගත් වහා ම ඇ එසේ කරනවා ඇත; ජපානයේ පාලකයන්, තම සිතිවිලි මාත්‍ර අනුව ගණන් බලමින්, මහත් සම්පෝරියෙන්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

එය කරන සැටි සිතාමතා තීරණය කර ඇත. ඇත්තෙන් ම, සෝවියට් ශක්තිය ත් චීනයට විරුද්ධ ව කරන ඇගේ යුද්ධය නිසා ජපානය දුර්වල වී සිටින බරපතල ප්‍රමාණය ත් හේතු කොටගෙන, සයිබීරියාව අතික්‍රමණය කිරීමේ ඇගේ මුල් සැලැස්ම අත හැර දමන්ට ත් සෝවියට් සංගමය කෙරෙහි ප්‍රධාන වශයෙන් ආරක්ෂාවීමේ ආකල්පයක් ඇසුරු කරන්ට ත් ජපානයට සිදු වෙන්ට ඉඩ තිබේ. එහෙත් එය එසේ වුව හොත්, එවිට ඇට ඉතිරි වන එක ම මග දුබලයා ගිල ගැනීම පමණක් නිසා, ඇ චීනයට විරුද්ධ ව කර ප්‍ර ආක්‍රමණය කොහෙත් ම බුරුල් නො කරනවා ඇත, එය තව තවත් දැඩි කරනවා ඇත; විරුද්දකම් පෑමේ යුද්ධය ත්, එක්සත් පෙරමුණ ත්, දිග්ගැසුණු යුද්ධය ත් අත නැර අල්ලාගෙන සිටීමේ චීනය සතු කර්තව්‍යය එවිට වඩාත් ම බාරදූර වෙනවා ඇත; අපේ පරිශ්‍රමයන් පොඩ්ඩක් වත් අඩු නො කිරීම වඩාත් ම අවශ්‍ය වෙනවා ඇත.

112. මේ වටාපිටා තත්වයන් යටතේ ජපානය පරාජය කොට චීනය ජය ලැබීම පිණිස කලින් ම තිබිය යුතු ප්‍රධාන දේ අතීතයේදීට වඩා දස ගුණයකින් හෝ සිය ගුණයකින් පවා විශාල වූ පරිමාණයකින් ඇති විය යුතු දේශ–ව්‍යාප්ත සමගිය ත් අංග–සම්පූර්ණ ප්‍රගතිය ත් ය. චීනය දැනට ම ප්‍රගතිය පිළිබඳ යුගයක සිටී, විශිෂ්ට සමගියක් ඇති කරගෙන සිටී; එහෙත් ඇගේ ප්‍රගතිය ත් සමගිය ත් තවම කොහෙත් ම ප්‍රමාණවත් නො වේ. එතරම් විශාල ප්‍රදේශයක් ජපානය විසින් අල්ලාගෙන තිබෙන්නේ ඇගේ ශක්තිය නිසා ම නො වේ, චීනයේ දුර්වලත්වය නිසා ද වේ; මේ දුර්වලත්වය මුළු-මනින් ම, ප්‍රගතිය එහි වර්තමාන මායිම් වලට සීමා කර තිබෙන ඉකුත් සිය වසේ, වෙසෙසින් ඉකුත් දස වසේ, විවිධ ඉතිහාසීය වැරදි වල සංචිත විපාකය වේ. දිගු කලක් තිස්සේ විශාල ප්‍රයත්නයක් නො දරා එතරම් ශක්ති සම්පන්න සතුරකු පරාජය කිරීමට කොහෙත් ම බැරි ය. අප විසින් වෙහෙස මහන්සි වී කළ යුතු බොහෝ දේ තිබේ; මෙහිදී මා කතා කරන්නේ මූලික අංග දෙකක් ගැන පමණකි; හමුදාවේ ප්‍රගතිය ත් ජනතාවගේ ප්‍රගතිය ත් ය.

113. අපේ යුද්ධමය ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට එය නවීන කිරීම ත් කාර්මික වශයෙන් සජ්ජිත කිරීම දියුණු කිරීම ත් අවශ්‍ය ය; එසේ නො කොට සතුරා යාලු ගඟ හරහා පන්නා දමන්ට අපට බැරි ය. අප අපේ භටයන් සටනට යොදන විට ප්‍රගතිශීලී, නැමෙන සුලු උපායමාර්ගයක් සහ උපක්‍රම අපට උවමනා ය; ඒවා නොමැතිව ජය ලබන්ට අපට එසේ ම නො හැකි ය. එහෙත්, සෙබළු හමුදාවක අත්තිවාරම වෙති; ප්‍රගතිශීලි දේශපාලන ජීවගුණයක් ඔවුන් තුළ කාවැද්දුවොත් මිස, ප්‍රගතිශීලි දේශපාලන වැඩ මගින් එබඳු ජීවගුණයක් පෝෂණය කළොත් මිස, නිලධාරීන් සහ භටයන් අතර අව්‍යාජ සමගිය ඇති කරන්ට කොහෙත් ම බැරි වෙනවා ඇත, විරුද්දකම් පෑමේ යුද්ධය සඳහා ඔවුන්ගේ උද්‍යෝගය සම්පූර්ණයෙන් පුබුදු කරන්ට කොහෙත් ම බැරි වෙනවා ඇත, අපේ සියලු කාර්මික සජ්ජිතයෙන් සහ

උපක්‍රම වලින් ඉතා ම සාර්ථක ලෙස ප්‍රයෝජන ගැනීමට හොඳ පදනමක් සපයන්ට කොහෙත් ම බැරි වෙනවා ඇත. ජපානයේ කාර්මික වැඩි–බලය කොතරම් වුව ත් අන්තිමේදී ඇ පරාජය කරනු ලබන්නී ය'යි අප කියන කල අප අදහස් කරන්නේ, අප විසින් කරන අලාභහානි හැරුණු කල, මුලසුන් කිරීම සහ වැහැරීම මගින් අප විසින් දෙන පහරවල් තම අවි දේශපාලන වශයෙන් හැඟීම් සහිත වූ සෙබළුන් අත නොමැත්තා වූ සතුරු හමුදාවේ චිත්තශක්තිය අවසානයේදී සොලවනවා ඇති බව ය. අපේ පැත්තේ, එසේ නො ව, නිලධාරි ත් භටයෝ ත් විරුද්දකම් පෑමේ දේශපාලන අරමුණ ගැන එක් සිත් ඇත්තෝ වෙති. මෙය ජපන්–විරෝධී සියලු බලවේගයන් අතර දේශපාලන වැඩ කිරීම සඳහා අප හට අත්තිවාරම සපයයි. ප්‍රධාන වශයෙන් භටයන්ට හිරිහැර කිරීමේ හා ගැසීමේ රදළ පුරුද්ද නැති කර දැමීමෙන් ද, නිලධාරීන් සහ භටයන් දුක සැප දෙකට එක සේ හවුල් වීමට සැලසීමෙන් ද, ප්‍රජාතන්ත්‍රවාදය නිසි පමණකින් හමුදාව තුළ ක්‍රියාවේ යෙදිය යුතු ය. මෙය කළ හොත්, නිලධාරීන් සහ භටයන් අතර සමගිය ඇති වෙනවා ඇත, හමු-දාවේ සටන් ක්ෂමතාව බෙහෙවින් වැඩි වෙනවා ඇත, දීර්ඝ, කටුක යුද්ධය දරා සිටීමට අපට ඇති හැකියාව ගැන කිසි ම සැකයක් නො තිබෙනවා ඇත.

114. යුද්ධ කිරීමට බලය ලැබෙන ඉතා ම ආඪ්‍ය උල්පත තිබෙන්නේ බහුජන සමූහයන් තුළ ය. ජපානය අපට හිරිහැර කරන්ට එඩිතර වී ඇත්තේ ප්‍රධාන වශයෙන් චීන බහුජන සමූහයන් සිටින සංවිධානය නො වූ තත්වය නිසා ය. මේ අඩුපාඩුවට පිළියම් කළ කල, ජපන් ආක්‍රමණිකයා, ගිනිදැල් වළල්ලකට කඩා වදින පිස්සු ගොනකු මෙන්, කෙළින් නැඟී සිටින කෝටි ගණන් අපේ මිනිසුන් විසින් වට කරනු ලබනවා ඇත, හුදෙක් ඔවුන්ගේ කටහඬේ ශබ්දය ම ඔහු තුළ භීතිය හටගන්වනවා ඇත, ඔහු පුළුස්සා මරා දමනවා ඇත. චීනයේ හමුදාවන්ට අතිරේක බලසේනාවන් නො කඩවා ගලා ඒමක් තිබිය යුතු ය; පහළ මට්ටම් වල දැනට පවතින බලෙන් අල්ලාගෙන ගොස් හමුදාවට බැඳවීමේ සහ වෙනුවට බඳවන අය මිලයට ගැනීමේ[35] දූෂිත වැඩ වහා ම තහනම් කොට, ඒ වෙනුවට දේශපාලන වශයෙන් උනන්දු කිරීම පුළුල් ලෙස ත් උද්‍යොගයෙනුත් කළ යුතු ය; එයින් දස ලක්ෂ ගණන් මිනිසුන් හමුදාවට බන්දා ගැනීම පහසු වෙනවා ඇත. යුද්ධය සඳහා මුදල් එකතු කිරීම අතින් දැන් අපට මහත් දුෂ්කරතා තිබේ; එහෙත් ජනතාව උනන්දු කළ විට, මුදල් කටයුතු ද ගැටළුවක් නො වෙනවා ඇත. චීනය මෙන් විශාල වූ ත් ජනාකීර්ණ වූ ත් රටක් අරමුදල් නැති කමෙන් පීඩා විඳිය යුත්තේ ඇයි? හමුදාව තමන්ගේ ම හමුදාව මෙන් ජනතාවට පෙනී යන සේ හමුදාව ත් ජනතාව ත් එකක් බවට පත් විය යුතු ය. එබඳු හමුදාවක් අනභිභවනීය වෙනවා ඇත, ජපානය වැනි අධිරාජ්‍යවාදි බලයක් ඊට සම දෙයක් නො වෙනවා ඇත.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

115. නිලධාරීන් සහ භටයන් අතර ත්, හමුදාව සහ ජනතාව අතර ත් සබඳකම් නරක් කරන්නේ වැරදි ක්‍රම ය'යි බොහෝ දෙනා සිතති; එහෙත් එය මූලික ආකල්පය (හෝ මූලික මූලධර්මය) පිළිබඳ, සෙබළුන් සහ ජනතාව කෙරෙහි ගෞරවය තිබීම පිළිබඳ, ප්‍රශ්නයක් ය'යි මම සැම විට ම ඔවුන්ට කියමි. විවිධ ප්‍රතිපත්ති, ක්‍රම සහ විධි ඇති වන්නේ මේ ආකල්පයෙන් ය. අප මේ ආකල්පයෙන් ඉවත් වුව හොත්, එවිට ප්‍රතිපත්ති, ක්‍රම සහ විධි සත්තකින් ම වැරදි වෙනවා ඇත, නිලධාරීන් සහ භටයන් අතර ත් හමුදාව සහ ජනතාව අතර ත් සබඳකම් අසතුටුදායක වෙනවා නියත ය. හමුදාවේ දේශපාලන වැඩ සඳහා අපේ ප්‍රධාන මූලධර්ම තුන මේවා ය: පළමුවැනි ව, නිලධාරීන් සහ භටයන් අතර සමගිය; දෙවැනි ව, හමුදාව සහ ජනතාව අතර සමගිය; තුන්වැනි ව, සතුරු බලසේනාවන් බිඳ විසුරුවා හැරීම. මේ මූලධර්මයන් විපාකදායක ලෙස ක්‍රියාවේ යොදනු පිණිස, අපි සෙබළුන් සහ ජනතාව කෙරෙහි ගෞරවය පිළිබඳ වූ ද, යුද සිරකරුවන් ඔවුන්ගේ අවි බිම තිබූ කල ඔවුන්ගේ මානුෂික ගරුත්වයට ගෞරව කිරීම පිළිබඳ වූ ද මේ මූලික ආකල්පයෙන් පටන්ගත යුත්තෙමු. මේ සියල්ල මූලික ආකල්පය පිළිබඳ කරුණක් නො ව නීතිය හෝ රීතිය පිළිබඳ කරුණක් ලෙස ගන්නා අය සත්තකින් ම වැරදි ය, ඔවුන් තම මතය නිවැරදි කර ගත යුතු ය.

116. ව්‍යුහානය සහ වෙනත් තැන් ආරක්ෂා කිරීම ඉතා හදිස්සි වී තිබෙන මේ මොහොතෙහි, යුද්ධයට අනුබල දීමෙහි ලා මුළු හමුදාවේ ත් මුළු ජනතාවේ ත් මුලපිරුම සහ උද්‍යෝගය සම්පූර්ණයෙන් ම ප්‍රබෝධ කිරීම ඉතා ම වැදගත් කර්තව්‍යයක් වේ. ව්‍යුහානය සහ වෙනත් තැන් ආරක්ෂා කිරීමේ කර්තව්‍යය බැරෑරුම් ලෙස ඉදිරිපත් කළ යුතු බවට ත් බැරෑරුම් ලෙස ඉටු කළ යුතු බවට ත් කිසි සැකයක් නැත. එහෙත් ඒවා නිසැක ලෙස ම අල්ලාගෙන සිටීමට අපට හැකි වේ ද යනු රඳා පවත්නේ අපේ මනෝමූල අභිලාෂයන් මත නො ව ඇත්තට ම පවතින තත්වයන් මත ය. මේ තත්වයන් අතර ඉතා ම වැදගත් තත්වයන් අතරට ගැනෙන්නකි අරගලය පිණිස මුළු හමුදාව ත් ජනතාව ත් දේශපාලන වශයෙන් උනන්දු කිරීම. අවශ්‍ය සියලු ම තත්වයන් ඇති කරලීමට දැඩි පරිශ්‍රමයක් නො දැරුවොත්, සත්තකින් ම මේ එක් තත්වයක් හෝ අඩු වුව හොත්, නැන්කිං සහ වෙනත් තැන් අහිමිවීම වැනි විපත්ති නැවත සිදු වනු නියත ය. තත්වයන් ඇති තැන් වල චීනයට ඇගේ මැඩ්රිඩ් නගර තිබෙනවා ඇත. මේ දක්වා චීනයට මැඩ්රිඩ් නගරයක් තිබී නැත, මෙතැන් සිට අපි කීපයක් ඇති කිරීමට වෙහෙස වී වැඩ කළ යුත්තෙමු; එහෙත් සියල්ල රඳා පවතින්නේ තත්වයන් මත ය. මේ තත්වයන් අතුරෙන් ඉතා ම මූලික එක මුළු හමුදාව ත් ජනතාව ත් පුළුල් ලෙස දේශපාලන වශයෙන් උනන්දු කිරීම යි.

117. අප කරන සියලු ම වැඩ වලදී අපි සාමාන්‍ය ප්‍රතිපත්තිය වශයෙන් ජපන්-විරෝධී ජාතික එක්සත් පෙරමුණ අත නැර ගෙනයා යුත්තෙමු. කවර

හෙයින් ද යත්, විරුද්දකම් පෑමේ යුද්ධය සහ දිග්ගැසුණු යුද්ධය අත නැර ගෙන යන්ට ත්, නිලධාරීන් සහ භටයන් අතර ද හමුදාව සහ ජනතාව අතර ද සබඳකම් වල පුළුල් සහ ගැඹුරු දියුණුවක් ඇති කර ලන්ට ත්, තවම අපේ අතේ තිබෙන සියලු භූමිප්‍රදේශ ආරක්ෂා කිරීම සහ අපෙන් නැති වී ගිය භූමි-ප්‍රදේශ ආපසු ලබා ගැනීම පිණිස කරන සටනේදී මුළු හමුදාවේ සහ මුළු ජනතාවගේ මුලපිරුම හා උද්‍යෝගය සම්පූර්ණයෙන් පුබුදු කරන්ට ත්, එසේ අවසාන ජයග්‍රහණය දිනා ගන්ට ත්, අපට හැකි වන්නේ මේ ප්‍රතිපත්තිය මගින් පමණක් නිසා ය.

118. හමුදාව ත් ජනතාව ත් දේශපාලන වශයෙන් උනන්දු කිරීම පිළිබඳ මේ ප්‍රශ්නය සත්තකින් ම ඉතා ම වැදගත් ය. අප පුන පුනා කීමේ වරදට වැටෙන්ට ඉඩ ඇතිව පවා ඒ ගැන කතා කරන්නේ එය නොමැතිව ජය ගන්ට කොහොමත් ම බැරි නිසා ම ය. ජයග්‍රහණය පිණිස නැතිව ම බැරි තවත් තත්ව ඇත්තෙන් ම බොහෝ ගණනක් තිබේ; එහෙත් දේශපාලන වශයෙන් උනන්දු කිරීම ඉතා ම මූලික එක වේ. ජපන්-විරෝධී ජාතික එක්සත් පෙරමුණ මුළු හමුදාවේ ත් මුළු ජනතාවගේ ත් එක්සත් පෙරමුණකි, එය සහතික වශයෙන් ම හුදෙක් දේශපාලන පක්ෂ කීපයක ප්‍රධානකාර්යාල වල සහ සාමාජිකයන්ගේ එක්සත් පෙරමුණක් නො වේ; ජපන්-විරෝධී ජාතික එක්සත් පෙරමුණට මුලපිරීමෙන් අප මූලික වශයෙන් අරමුණු කළේ ඊට සහභාගි වන පිණිස මුළු හමුදාව ත් මුළු ජනතාව ත් උනන්දු කිරීම ය.

නිගමන

119 අපේ නිගමන මොනවා ද? ඒවා මෙසේ ය:

"කවර තත්වයන් යටතේ ජපානයේ බළමුළු පරාජය කොට විනාශ කරන්ට චීනයට හැකි වේ ය'යි ඔබ සිතන්නෙහිද?" "තත්ව තුනක් අවශ්‍ය ය: පළමුවැනිව, චීනයෙහි ජපන්-විරෝධී එක්සත් පෙරමුණක් පිහිටුවීම; දෙවැනිව, ජාත්‍යන්තර ජපන්-විරෝධී එක්සත් පෙරමුණක් සකස් කිරීම; තුන්වැනිව, ජපානයෙහි ත් ජපන් විජිත වල ත් ජනතාවගේ විප්ලවවාදී ව්‍යාපාරය නැඟීම. චීන ජනතාවගේ මතයේ සිට බලන කල, චීනයේ ජනතාවගේ සමගිය මේ තත්ව තුනෙන් ඉතා ම වැදගත් එක ය."

"එබඳු යුද්ධයක් කොපමණ කල් පවතී ද'යි ඔබ සිතන්නෙහි ද? "එය චීනයේ ජපන්-විරෝධී එක්සත් පෙරමුණේ ශක්තිය ත් චීනය සහ ජපානය සම්බන්ධ කර ගන්නා වූ වෙනත් බොහෝ හේතු ඵල හටගන්-වන සාධක ත් මත රඳා පවතී."

LIBERATION BASE

https://liberationbase.wordpress.com

''මේ තත්වයෝ ඉක්මනින් මුදුන්පත් නො වෙත් නම්, යුද්ධය දිග්ගැසෙනවා ඇත. එහෙත් ඒ එසේ වුවත්, අන්තිමේදී, ජපානය සත්තකින් ම පරාජය කරනු ලබනවා ඇත, චීනය සත්තකින් ම ජයග්‍රාහී වෙනවා ඇත. පරිත්‍යාගයන් මහත් වෙනවා පමණකි, ඉතා වේදනාදයක කාලපරිච්ඡේදයක් ඇති වෙනවා ඇත.''

''අපේ උපායමාර්ගය විය යුත්තේ ව්‍යාප්ත සහ අනිස්ථිර පෙරමුණක ක්‍රියා කරගෙන යාමට අපේ ප්‍රධාන බලසේනාවන් යෙදීම යි. සාර්ථක-භාවය අත්පත් කරගැනීමට, චීන හටකණ්ඩායම් පැතුරුණු යුදබිම් වල උසස් ප්‍රමාණයක ජංගමභාවයෙන් යුක්ත ව තම සංග්‍රාමය කරගෙන යා යුතු ය.''

''ජංගම සංග්‍රාමය කරගෙන යාමට පුහුණු හමුදවන් යෙදීම හැරුණු කල, අපි ගොවියන් අතර ගොරිල්ලා සේනාංග මහත් ගණනින් සංවිධානය කළ යුත්තෙමු.''

''යුද්ධය කරගෙන යන අතර, . . . තමාගේ හටකණ්ඩායම් සජ්ජිත කිරීම අනුක්‍රමයෙන් තර කරන්නට චීනයට හැකි වෙනා ඇත. එහෙයින් යුද්ධයේ පසු වකවනුවේදී ස්ථානගත සංග්‍රාමය කරගෙන යාමට සහ ජපනුන් අල්ලාගත් ප්‍රදේශ වලට ස්ථානගත ප්‍රහාරයන් දීමට චීනයට හැකි වෙනවා ඇත. එසේ චීනයේ දීර්ඝ විරුද්දකම් පෑම නිසා ඇති වන අධික පීඩාව යටතේ ජපානයේ ආර්ථිකය ඉරිතලනවා ඇත, ගණන් නැති සටන් වල අධික දුක යටතේ ජපන් බලසේනාවන්ගේ චිත්තශක්තිය බිඳෙනවා ඇත. ඒ එසේ වුව ද, චීන ජනයාගේ පැත්තෙහි, සැඟවී පවතින විරුද්දකම් පෑමේ බලය වැඩෙමින් නිරතුරු ව ම ක්‍රියාකාරිත්වයට පත් වෙනවා ඇත, විප්ලවවාදි මිනිස්සු මහත් ගණනින් තම නිදහස පිණිස සටන් කිරීමට පෙරමුණු පේළි වලට ගලා එනවා ඇත. මේ සියලු සාධක ත් සෙසු සාධක ත් එකතු වූ කල, ජපනුන් අල්ලාගෙන සිටින ප්‍රදේශ වල බලකොටු වලට සහ කඳවුරු වලට අන්තිම සහ තීරණාත්මක ප්‍රහාරයන් දී, ජපන් ආක්‍රමණයේ බලසේනාවන් චීනයෙන් පන්නා දමන්ට අපට හැකි වෙනවා ඇත.'' (1936 ජූලි මාසයෙහි එඩ්ගාර් ස්නෝ සමග කළ සම්මුඛසාකච්ඡාවෙනි.)

''මෙසේ චීනයේ දේශපාලන තත්වයෙහි නව අවස්ථාවක් . . . විවෘත වී ඇත . . . වර්තමාන අවස්ථාවෙහි කේන්ද්‍රීය කර්තව්‍යය වන්නේ විරුද්දකම් පෑමේ යුද්ධයේදී ජය ලබනු පිණිස ජාතියේ සියලු බලවේග උනන්දු කිරීම ය.''

''යුද්ධයේදී ජය ලැබීමට යතුර දැන් තිබෙන්නේ දැනට ම පටන්ගෙන තිබෙන විරුද්දකම් පෑම මුළු ජාතිය විසින් කරන සම්පූර්ණ විරුද්දකම් පෑමේ යුද්ධයක් බවට වර්ධනය කිරීමෙහි ය. එබඳු සම්පූර්ණ විරුද්දකම් පෑමේ යුද්ධයක් මගින් පමණකි අවසාන ජයග්‍රහණය දිනාගත හැකි වන්නේ''.

''විරුද්දකම් පෑමේ යුද්ධයෙහි බරපතල දුබලකම් තිබෙන නිසා බොහෝ ඇබැද්දි, පසුබැසීම්, අභ්‍යන්තර භේද, ද්‍රොහිකම්, තාවකාලික සහ අඩාල සමගිසම්මුති සහ එබඳු වෙනත් ආපසු හැරීම් කරා මග පැදෙන්ට ඉඩ තිබේ. එහෙයින් යුද්ධය දුෂ්කර සහ දිග්ගැසුණු යුද්ධයක් වන බව වටහා ගත යුතු ය. එහෙත්, අපේ පක්ෂයේ සහ මුළු ජනතාවගේ පරිශ්‍රමයන් මගින්, දැනට ම පටන්ගෙන තිබෙන විරුද්දකම් පෑම සියලු බාධක පසෙකට පිස දමා, දිගට ම ඉදිරියට යමින් වර්ධනය වන බව අපට හොඳට ම විශ්වාස ය.'' (1937 අගෝස්තු මාසයේදී චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් සම්මත කළ ''වර්තමාන තත්වය සහ පක්ෂය සතු කර්තව්‍යයන් ගැන යෝජනාව''.)

අපේ නිගමන මේවා ය. පරාධීනත්වවාදීන්ගේ ඇස් වලට පෙනෙන හැටියට සතුරා උත්තර-මනුෂ්‍යයෝ වෙති, චීන ජාතිකයන් වන අපි වැදගැම්මකට නැත; ඒ අතර ඉක්මනින් ජය ලැබීමේ න්‍යායය ඉදිරිපත් කරන න්‍යායාචාර්ය-වරුන්ගේ ඇස් වලට පෙනෙන හැටියට චීන ජාතිකයන් වන අපි උත්තර-මනුෂ්‍යයෝ වෙමු, සතුරා වැදගම්මකට නැත. දෙ ගොල්ල ම වැරදි ය. අපි වෙනස් මතයක් ගනිමු; ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය දිග්ගැසුණු යුද්ධයකි, අවසාන ජයග්‍රහණය චීනය සතු වේ. මේවා අපේ නිගමන ය.

120. මගේ දේශන මෙතැනින් අවසන් වේ. ජපානයට විරුද්දකම් පෑමේ ශ්‍රෙෂ්ඨ යුද්ධය අනුක්‍රමයෙන් දියුණු වෙමින යයි; බොහෝ දෙනා පූර්ණ ජයග්‍රහණය දිනා ගැනීම පහසු වනු පිණිස අත්දැකීම් සම්පිණ්ඩනය කිරීමක් ගැන බලාපොරොත්තු වෙති. මා සාකච්ඡා කළ දේ ඉකුත් දස මසේ සාමාන්‍ය අත්දැකීම ය; එය බාගවිට එක් විධියක සම්පිණ්ඩනයක් විය හැකි ය. දිග්ගැසුණු යුද්ධය පිළිබඳ ගැටළුව පුළුල් අවධානයට සහ සාකච්ඡාවට භාජන වීමට නිසි ය; මා දී තිබෙන්නේ කටුසටහනක් පමණකි; ඔබ එය පරීක්ෂා කරනවා සහ සාකච්ඡා කරනවා ඇතැ'යි, සංශෝධනය කරනවා සහ විස්තාර කරනවා ඇතැ'යි, මම බලාපොරොත්තු වෙමි.

ස ට හ න්

[1]1937, ජූලි 7වැනි ද, අතික්‍රමණය කරන ජපන් බලසේනාවෝ, පීකිං නුවර සිට නිරිත-දිගට කිලෝමීටර් දහයක් ඇතින් පිහිටි ලූගෞචියාඕහි සිටි චීන ගැරිසන් හමුදවට පහර දුන්හ. දැඩි දේශ-ව්‍යාප්ත ජපන්-විරෝධී ව්‍යාපාරයේ බලපෑම යටතේ, චීන හටකණ්ඩායම් විරුද්දකම් පෑහ. මේ සිද්ධිය පුරා අට වසක් පැවති ජපානයට විරුද්දකම් පෑමේ චීන ජනතාවගේ වීරෝදාර යුද්ධයේ ආරම්භය සලකුණු කළේ ය.

[2]ජාතික පරාධීනත්වය පිළිබඳ මේ න්‍යායය කුඕමින්තාං පක්ෂය දැරූ මතය විය. කුඕමින්තාං පක්ෂය ජපානයට විරුද්දකම පෑමට කැමති නො වී ය, ජපානය හා සටන්

https://liberationbase.wordpress.com

කළේ බල කිරීම යටතේ පමණකි. ලූගෞචියාඕ සිද්ධියට (1937, ජූලි 7) පසු, චියාං කායි-ෂෙක් කල්ලිය අදිමදි කරමින් විරුද්ධකම් පෑමේ යුද්ධයට හවුල් විය; ඒ අතර වොං චිං-වෙයි කල්ලිය ජාතික පරාධීනත්වය පිළිබඳ න්‍යායය වෙනුවෙන් පෙනී සිටින්නෝ වූහ, ජපානයට යටත් වීමට සූදනම් ව සිටියහ, පසුව ඇත්ත වශයෙන් එසේ කළහ. කෙසේ වෙවා, ජාතික පරාධීනත්වය පිළිබඳ මතය පැවතියේ කුඕමින්තාං පක්ෂය තුළ ම පමණක් නො වේ; එය සමාජයේ මැද තට්ටුවේ ඇතැම් කොටස් කෙරෙහි, වැඩකරන ජනතාව අතර ඇතැම් නොදියුණු කොටස් කෙරෙහි පවා, බලපෑවේ ය. විරුද්ධකම් පෑමේ යුද්ධයේ මුල් වර්ෂය තුළ දූෂිත සහ බෙලහීන කුඕමින්තාං ආණ්ඩුව එක් සටනකට පසු අනිකක් පැරදුණු නිසා ද, ජපන් හටකණ්ඩායම් බාධා රහිත ව වූහානය අසළට ඉදිරියට ගමන් කළ නිසා ද, ඇතැම් නොදියුණු පුද්ගලයෝ ගැඹුරු ලෙස ම අශුභවාදී වූහ.

[3]මේ මතය කොමියුනිස්ට් පක්ෂය තුළ දක්නට ලැබිණි. විරුද්ධකම් පෑමේ යුද්ධයේ මුල් හය මස තුළ, එක පහරින් ම ජපානය පරාජය කළ හැකි ය යන මතය දැරූ ඇතැම් පක්ෂ සාමාජිකයන් අතර සතුරා සුළු කොට සලකන අතට බර වෙන ගතියක් තිබුණි. ඒ, කොමියුනිස්ට් පක්ෂය විසින් නායකත්වය දෙනලද හටකණ්ඩායම් සහ සංවිධානය වූ ජනතා බලසේනාවන් එතෙක් ම කුඩා වූ බව ඔවුන් දන සිටි හෙයින්, ඔවුන් අපේ බලසේනාවෝ එතරම් ශක්තිමත් ය'යි සිතූ නිසා නො වේ, කුඕමින්තාං පක්ෂය ජපානයට විරුද්ධකම් පෑමට පටන්ගෙන සිටි නිසා ය. ඔවුන්ගේ මතය අනුව, කුඕමින්තාං පක්ෂය හොඳට ම බලවත් විය, කොමියුනිස්ට් පක්ෂය සමග උචිත ලෙස සම්බන්ධ වී, ජපානයට රිදෙන පහරවල් ගැසීමට සමත් විය. ඔවුන් මේ වැරදි තක්සේරුව කළේ ඔවුන් කුඕමින්තාං පක්ෂයේ එක පැත්තක් පමණක්, එනම් එය ජපානයට විරුද්ධකම් පාන බව, දුටු නිසා සහ, අනික් පැත්ත, එනම් එය ප්‍රතිගාමී සහ දූෂිත බව, නුදුටු නිසා ය.

[4]චියාං කායි-ශෙක් සහ සමාගමේ මතය එබඳු විය. ජපානයට විරුද්ධකම් පාන්ට ඔවුන් හට බලෙන් ම සිදු වූ නමුදු, චියාං කායි-ෂෙක් සහ කුඕමින්තාං පක්ෂය තම බලාපොරොත්තුව හුදෙක් වහා ම ලැබෙන විදේශ ආධාර මත ම රැඳ විය, තමන්ගේ ම ශක්තිය කෙරෙහි කිසි විශ්වාසයක් නැති විය, ජනතාවගේ ශක්තිය කෙරෙහි එතරම් වත් විශ්වාසයක් නො තිබී ය.

[5]තායිඅර්චුආං දකුණු ශාන්තුං පළාතේ ටවුමකි; චීන හමුදව 1938 මාර්තුවේදී ජපන් අතික්‍රමණිකයන්ට විරුද්ධ ව එහිදී සටනක් කළේ ය. ජපානයේ මිනිසුන් 70,000 සිට 80,000 තෙක් ගණනකට විරුද්ධ ව මිනිසුන් 4,00,000ක් පොරව තිබීමෙන්, චීන හමුදව ජපනුන් පරාජය කළේ ය.

[6]මේ මතය එකල කුඕමින්තාං පක්ෂය තුළ සිටි දේශපාලන විද්‍යා කණ්ඩායමේ පුවත්පත වූ, තා කුං පාඕ පත්‍රය විසින් කතුවැකියකින් ඉදිරියට දමනලදී. ප්‍රණීත සිතිවිලි මාත්‍ර වල නිමග්න වෙමින්, මේ කල්ලිය තායිඅර්චුආං වර්ගයේ ජයග්‍රහණ තව කීපයකින් ජපානයේ ඉදිරිගමන නතර වේ ය'යි ද, තම පංක්තියේ ම සුරක්ෂිතභාවයට තර්ජනයක් විය හැකි දිග්-ගැසුණු යුද්ධයක් පිණිස ජනතාව උනන්දු කිරීම අවශ්‍ය නො වේ ය'යි ද බලාපොරොත්තු වූහ. මේ ප්‍රණීත සිතිවිලි මාත්‍රය එකල මුළු එකක් වශයෙන් කුඕමින්තාං පක්ෂය පුරා පැතිරී තිබුණි.

[7]චීන රතු හමුදවේ ත් ජනතාවගේ ජපන්-විරෝධී ව්‍යාපාරයේ ත් බලපෑම යටතේ, චාං ශුඑ-ලියාං ප්‍රමුඛ කුඕමින්තාං පක්ෂයේ ඊසානදිග හමුදව ත් යාං හු-චෙං ප්‍රමුඛ කුඕමින්තාං පක්ෂයේ 17වැනි මාර්ග හමුදව ත් චීන කොමියුනිස්ට් පක්ෂය විසින් යෝජනා කළ ජපන්-විරෝධී ජාතික එක්සත් පෙරමුණ පිළිබඳ ප්‍රතිපත්තිය පිළිගෙන, චියාං කායි-ශෙක් ජපානයට විරුද්ධකම් පෑම පිණිස කොමියුනිස්ට් පක්ෂය සමග එක්සත් විය යුතු ය'යි ඉල්ලා

සිටියහ. චියාං කායි-ශෙක් ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා පමණක් නො වේ, වඩාත් ආඩම්බර වී ''කොමියුනිස්ට්වාදීන් මර්දනය කිරීම'' පිණිස වූ තම යුද්ධමය සූදනම තව තව ත් වැඩි කළේ ය, සියාන් නුවර ශිෂ්‍යයන්ගේ ජපන්-විරෝධී ව්‍යාපාරය මැඩලී ය. 1936, දෙසැම්බර් 12වැනි ද, චාං ශුඑ-ලියාං සහ යාං හු-චෙං සියාන් සිද්ධිය ඇති කොට, චියාං කායි-ශෙක් සිරඅඩස්සි කළහ. සිද්ධිය වූ පසු, චීන කොමියුනිස්ට් පක්ෂය චාං ශුඑ-ලියාංගේ ත් යාං හු-චෙංගේ ත් දේශප්‍රේමී ක්‍රියාවට ස්ථිර අනුබලය ප්‍රකාශ කළේ ය, ඒ අතර ම සමගියේ ත් ජපානයට විරුද්ධකම් පෑමේ ත් පදනම පිට සිද්ධිය බේරුම් කළ යුතු ය යන මතය පළ කළේ ය. දෙසැම්බර් 25වැනි ද ජපානයට විරුද්ධ ව කොමියුනිස්ට් පක්ෂය සමග සමගි වීමේ කොන්දේසි පිළිගැනීමට චියාං කායි-ශෙක්ට බලෙන් ම සිදු විය; එවිට ඔහු නිදහස් කරනු ලැබ ආපසු නැන්කිං නුවරට ගියේ ය.

[8]18වැනි සියවසේ අවසාන හරියේ සිට පටන්ගනිමින්, දශක බොහෝ ගණනක් ම බ්‍රිතාන්‍යය එන්ට එන්ට ප්‍රමාණය වැඩි කරමින් චීනයට අබිං අපනයනය කළේ ය. මේ ජාවාරම චීන ජනතාව මත්ද්‍රව්‍ය පාවිච්චියට ඇබ්බැහි කළා පමණක් නො වේ. චීනය සතු රිදී කොල්ලකෑම ද කළේ ය. එයින් චීනයෙහි දරුණු විරෝධයක් පැනනැංගේ ය. 1840දී, චීනය සමග ස්වකීය වෙළඳාම සුරක්ෂිත කිරීමේ ව්‍යාජයෙන්, බ්‍රිතාන්‍යය ඇට විරුද්ධ ව සන්නද්ධ ආක්‍රමණයක් දියත් කළේ ය. ලින් ත්සේ-ශු විසින් නායකත්වය දෙනලද චීන භටසේනාවෝ විරුද්ධකම් පෑවෝ ය, කැන්ටන් නුවර ජනයා ඉබේ ඉබේ ම ''බ්‍රිතාන්‍යයන් මඩින බළකාය'' සංවිධානය කළහ; එය බ්‍රිතාන්‍ය ආක්‍රමණ සේනාවන්ට බරපතල පහරවල් දුනි. එසේ ද වුව, 1842දී, දූෂිත චිං ආණ්ඩුව බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයන් සමග නැන්කිං ගිවිසුම අත්සන් කළේ ය. මේ ගිවිසුම බ්‍රිතාන්‍යයට වන්දි ගෙවීමට සහ හොංකොං දූපත පවරා දීමට නියම කළේ ය, ශැංහයි, පූචව්, ඇමෝයි, නිංපො සහ කැන්ටන් යන වරාය නගර බ්‍රිතාන්‍ය වෙළඳාම සඳහා විවෘත කළ යුතු ය'යි ද චීනයට ආනයනය කරන බ්‍රිතාන්‍ය භාණ්ඩ සඳහා තීරු ගාස්තු චීනය ත් බ්‍රිතාන්‍යය ත් එකතු වී නියම කළ යුතු ය'යි ද පැණවී ය.

[9]තායිපිං දිව්‍ය රාජ්‍ය ව්‍යාපාරය 19වැනි සියවස මැද හරියේදී චිං රජපෙළපතේ රදළ පාලනයට සහ ජාතික පීඩනයට විරුද්ධ ව ඇති වූ විප්ලවවාදී ගොවි ව්‍යාපාරය යි. 1851 ජනවාරියේදී, හුං ශියු-චුආන්, යාං ශියු-චිං සහ වෙනත් නායකයෝ ක්වාංසි පළාතේ කුඑයිපිං කෝරළයේ චින්තියන් ගමේදී කැරැල්ලක් පටන් ගෙන, තායිපිං දිව්‍ය රාජ්‍යය පිහිටුවීම ප්‍රකාශයට පත් කළහ. ක්වාංසි පළාතේ සිට උතුරු දෙසට ගමන් කරමින්, ඔවුන්ගේ ගොවි හමුදව 1852දී හුනාන් සහ හූපේ පළාත් වලට පහර දී ඒවා අල්ලා ගත්තේ ය. 1853දී, ඒ හමුදව චියාංසි සහ අන්හ්වෙයි පළාත් මැදින් ගමන් කොට, නැන්කිං නුවර අල්ලා ගත්තේ ය. බලසෙන් අතුරෙන් කොටසක් ඉක්බිති දිගට ම උතුරට ගමන් කරමින්, තියන්සින් නුවර අසල මානයට තෙරපී ගියේ ය. කෙසේ වෙවා, තායිපිං හමුදව අල්ලාගත් තැන් වල තරසර කඳවුරු ප්‍රදේශ පිහිටුවීමට ඒ හමුදවට බැරි විය; එමතු නො ව, නැන්කිං වල තම අගනුවර පිහිටුවීමෙන් පසු, එම හමුදවේ නායක කණ්ඩායම දේශපාලන සහ යුද්ධමය වැරදි රැසක් කළේ ය. එහෙයින්, චිං ආණ්ඩුවේ ත් බ්‍රිතාන්‍ය, එක්සත් ජනපද සහ ප්‍රන්ස ආක්‍රමණිකයන්ගේ ත් ප්‍රති-විප්ලවවාදී බලසේනාවන් එකතු වී දුන් ප්‍රහාරයට ඔරොත්තු දිය නො හැකි වූ එම හමුදව අන්තිමේදී 1864දී පරාජය කරනු ලැබී ය.

[10]1898වෙ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය නිදහස් ධනේශ්වරපංක්තියේ සහ ප්‍රබුද්ධ ඉඩම්-හිමියන්ගේ පලප්‍රයෝජන නියෝජනය කළේ ය; එහි නායකයන් වශයෙන් ක්‍රියා කළේ කාං යූ-වෙයි, ලියාං චි-චාඕ සහ තාන් ස්සු-තුං ය. කුඅාං හ්සූ අධිරාජයා විසින් අනුමත කරනලද සහ අනුබල දෙනලද නමුදු, මේ ව්‍යාපාරයට බහුජන පදනමක් නො තිබුණේ ය. තම පිටිපසින් හමුදවක් සිටි යුආන් ශි-කායි ප්‍රතිසංස්කාරකයන් දුර්දන්තයන්ගේ නායිකාව වූ ත්සූ හ්සි වැන්දඹු අධිරාජිනියට පාවා දුන්නේ ය. යළි ත් බලය අල්ලාගත් ඈ කුඅාං හ්සූ අධිරාජයා

LIBERATION BASE

https://liberationbase.wordpress.com

හිර කොට, තාන් ස්සු-තුංගේ සහ තව අය පස් දෙනකුන්ගේ හිස් ගසා දමමවී ය. මෙසේ ව්‍යාපරය බෙදනීය පරාජයකට පත් විය.

[11]1911හේ විප්ලවය චිං රජපෙළපතේ සෛචරී ආණ්ඩුව පෙරළා දමූ ධනේශ්වර විප්ලවය විය. ඒ අවුරුද්දේ ඔක්තෝබර 10වැනි ද, විප්ලවවාදි බලපෑමට හසු වී සිටි චිං රජපෙළපතේ අළුත් හමුදාවේ කොටසක් හූපේ පළාතේ වූචාං නුවරදී පැනනැඟීමක් කළේ ය. එකල පැවති ධනේශ්වර සහ සුළු-ධනේශ්වර විප්ලවවාදි සමිති ත් කම්කරු, ගොවි, සෙබල පුළුල් බහුජනතාව ත් උද්‍යොගයෙන් ඊට අනුකූලතාව දක්වූහ; ඉතා ඉක්මනින් ම චිං රජපෙළපත බිඳ වැටුණි. 1912 ජනවාරියේදී, චීන සමූහාණ්ඩුවේ තාවකාලික ආණ්ඩුව, සුන් යත්-සෙන් තාවකාලික ජනාධිපති වශයෙන් ඇති ව, නැන්කිං නුවරදී පිහිටුවනු ලැබී ය. මෙසේ අවුරුදු දෙදහසකට වැඩි කලක් පැවති චීනයේ රදළ රාජාණ්ඩු ක්‍රමය අවසන් විය. ප්‍රජාතන්ත්‍රවාදි සමූහාණ්ඩුවක් පිළිබඳ අදහස ජනතාවගේ හදවත් තුළට ගැඹුරට ම වැදී තිබුණි. එහෙත් විප්ලවයට නායකත්වය දුන් ධනේශ්වරපංක්තිය එහි ස්වභාවයෙන් බෙහෙවින් ම සමාදනවාදි විය. එම නායකත්වය ගම්බද පෙදෙසෙහි ඉඩම්හිමි පංක්තියේ රදළ පාලනය සුණුවිසුණු කර දමනු පිණිස ගොවි බහුජනයා පුළුල් පරිමාණයකින් ක්‍රියාකාරිභාවයට පත් නො කළේ ය; ඒ වෙනුවට එය කළේ අධිරාජ්‍යවාදි සහ රදළ පීඩනය යටතේ රාජ්‍ය බලය උතුරු යුදදෙටුවකු වූ යුආන් ශි-කායි අතට පවරා දීම ය. ප්‍රතිඵලයක් වශයෙන්, විප්ලවය පරාජයෙන් අවසන් විය.

[12]මේ පොතේ "චීනයෙහි විප්ලවවාදි යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු" නමැති ලිපියේ 1වැනි සටහන බලන්න; 165වැනි පිටුව.

[13]1936, ජනවාරි 16වැනි ද, ජපන් කැබිනට් මණ්ඩලය ජපානය බලය පෑව්ව්වී කොට චීනය යටත් කරනවා ය' යි ප්‍රතිපත්ති ප්‍රකාශයක් මගින් පැවසුවේ ය. ඒ අතර ම එය, කුඕමින්තාං ආණ්ඩුව "විරුද්දකම් පෑමට දිගට ම සැලැස්ම කරගෙන යතොත්" ජපන් ආණ්ඩුව චීනයෙහි අළුත් රූකඩ පාලනයක් ඇති කරනවා ය'යි ද, සාකච්ඡා පවත්වන විට "අනික් පාර්ශ්වය" වශයෙන් තව දුරට ත් කුඕමින්තාං ආණ්ඩුව පිළිගන්නේ නැතැ'යි ද පවසමින්, තර්ජන සහ චාටුකම් මගින් කුඕමින්තාං ආණ්ඩුව යටත් වීමට සලසන්නට වෑයම් කළේ ය.

[14]මෙහි සඳහන් වන ධනපතියෝ ප්‍රධාන වශයෙන් එක්සත් ජනපදයේ ධනපතියෝ ය.

[15]"ඒවායේ ආණ්ඩු" යන්නෙන් සහෝදර මාඕ සේතුං මෙහිදී සඳහන් කරන්නේ බ්‍රිතාන්‍යය, එක්සත් ජනපදය සහ ප්‍රන්සය යන අධිරාජ්‍යවාදි රටවල් වල ආණ්ඩු ය.

[16]ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයේ ඇණහිටීමක් ඇති වන අවස්ථාවේදී චීනයෙහි නැඟීමක් සිදු විය හැකි ය යන සහෝදර මාඕ සේතුංගේ අනාවැකිය චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ පැවති නිදහස් ප්‍රදේශ වල සම්පූර්ණයෙන් ම ස්ථිර විය. එහෙත් චියාං කායි-ශෙක් ප්‍රමුඛ පාලක කල්ලිය ජපානයට විරුද්දකම් පෑමෙහි ලා අක්‍රියාකාරි වූයෙන් සහ කොමියුනිස්ට් පක්ෂයට ත් ජනතාවට ත් විරුද්ධ වීමෙහි ලා ක්‍රියාශීලී වූයෙන් කුඕමින්තාං ප්‍රදේශ වල ඇත්ත වශයෙන් නැඟීමක් වෙනුවට බැහීමක් සිදු විය. මෙය ජනතාව අතර පුළුල් සමූහයන් අතර විරෝධය ඇවිස්සී ය, ඔවුන්ගේ දේශපාලන හැඟීම නැංවී ය.

[17]"ආයුධ හැම දෙයක් ම තීරණය කරයි" යන න්‍යායය අනුව අවිආයුධ අතින් ජපානයට වඩා බලයෙන් අඩු ව සිටි චීනය යුද්ධයේදී පරාජය වීම නියත විය. මේ මතය, චියාං කායි-ශෙක් ඇතුළු කුඕමින්තාං ප්‍රතිගාමිත්වයේ සියලු ම නායකයන් අතර ප්‍රචලිත ව තිබුණි.

[18]මේ පොතේ "ජපානයට විරුද්ධ ගෙරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු" නමැති ලිපියේ 9වැනි සටහන බලන්න. 214වැනි පිටුව.

[19]සුන් වූ-කුං යනු ශි යූ චි (බටහිරට ගිය වන්දනාගමන) නමැති චීන නවකතාවෙහි එන වඳුරු රජා ය; මේ නවකතාව 16වැනි සියවසේ ලියනලද්දකි. එක කරණමක් ගැසීමෙන් ලී 1,08,000ක් පනින්ට ඔහුට හැකි විය. එහෙත් වරක් බුදුන්ගේ අත්ල මත සිටි ඔහුට, ගණනාතරම් කරණම් ගැසුවත්, ගැලවී යන්ට බැරි විය. අත්ල සෙලවූ පමණකින් බුදුන් තම ඇඟිලි පංච-කූට පංච මහා භූත පර්වතය බවට විපර්යාස කොට, සුන් වූ-කුං වැළලී ය.

[20]"පැසිස්ටවාදය සීමාන්ත දේශානුරාගය සහ කොල්ලකාර යුද්ධය වේ", යි සහෝදර ගජ්ජී ඩිමිට්‍රොෆ් 1935 අගෝස්තුවේදී කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ හත්වැනි ලෝක සම්මේලනයට ඉදිරිපත් කළ "පැසිස්ටවාදි ප්‍රහාරය සහ කොමියුනිස්ට් ජාත්‍යන්තරය සතු කර්තව්‍යයෝ" නමැති තම වාර්තාවෙහි කීවේ ය. (බලන්න, තෝරාගත් ලිපි සහ කථා, ඉංග්‍රීසි මුද්‍රණය, ලෝරන්ස් සහ විශාට්, ලන්ඩන්, 1951, 44වැනි පිටුව) 1937 ජූලියේදී සහෝදර ඩිමිට්‍රොෆ් "පැසිස්ටවාදය නම් යුද්ධය යි" නමැති ලිපියක් පළ කළේ ය.

[21]වී. අයි. ලෙනින්, "සමාජවාදය සහ යුද්ධය", එකතු කළ කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, ප්‍රගති ප්‍රකාශකයෝ, මොස්කව්, 1964, XXIවැනි කාණ්ඩය, 304වැනි පිටුව.

[22]මේ පොතේ "චීනයේ විප්ලවවාදි යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු" නමැති ලිපියේ 3වැනි සටහන බලන්න. 165වැනි පිටුව.

[23]ශාන්තුං පළාතේ වර්තමාන වූආන්චෙං උප-පළාතට නිරිතදිගින් පිහිටි චෙංපූ ක්‍රි: පූ: 632 දී ත්සින් සහ චූ රාජ්‍යයන් අතර ලොකු සටනක් ඇති වූ තැන විය. සටනේ ආරම්භයේදී චූ හටකණ්ඩායම් වලට වාසි විය. ත්සින් හටකණ්ඩායම, ලි 90ක පසුබැසීමක් කොට, චූ හටකණ්ඩායම් වල දුර්වල තැන් වූ ඔවුන්ගේ දකුණු සහ වම් අංශ තෝරාගෙන, ඔවුන්ට බර පරාජයන් සිදු කළහ.

[24]මේ පොතේ "චීනයේ විප්ලවවාදි යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු" නමැති ලිපියේ 25වැනි සටහන බලන්න. 169වැනි පිටුව.

[25]ක්‍රි: පූ: 204දී, හාන් රාජ්‍යයේ සෙනෙවියකු වූ හාන් ශින්, චිංශිං නමැති ස්ථානයේදී චාඕ ශියේ සමග ලොකු සටනක් කරන්නට තම මිනිසුන් ගෙනගියේ ය. 2,00,000කින් ප්‍රබල ය'යි කියනලද චාඕ ශියේගේ හමුදාව හාන්ගේ හමුදාව මෙන් කීප ගුණයක් විය. ගඟකට පිටු පා සිටින සේ තම සේනාවන් වින්‍යාස කළ හාන් ශින් ඔවුන් අභීත ලෙස සටන් කරන්නට මෙහෙයවී ය; ඒ අතර ම සතුරාගේ දුර්වල ලෙස ගැරිසන් කළ පසුමුණට පහර දී අල්ලාගැනීම පිණිස සේනාංග කීපයක් යැවී ය. අඩුවකට අසු වූ චාඕ ශියේගේ හටකණ්ඩායම් අන්ත පරාජයට භාජන කරනු ලැබී ය.

[26]මේ පොතේ "චීනයේ විප්ලවවාදි යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු" නමැති ලිපියේ 26වැනි සටහන බලන්න. 170වැනි පිටුව.

[27]එම ලිපිය, 27වැනි සටහන, 170වැනි පිටුව.

[28]එම ලිපිය, 28වැනි සටහන, 170වැනි පිටුව.

[29]එම ලිපිය, 29වැනි සටහන, 170වැනි පිටුව.

[30]එම ලිපිය, 30වැනි සටහන, 170වැනි පිටුව.

[31]ක්‍රි: ව: 383දී, චින් රාජ්‍යයේ පාලකයා වී සිටි පූ චියන්, ත්සින් රාජ්‍යයේ බලසේනාවන් සුළු කොට සලකා ඔවුන්ට පහර දුන්නේ ය. ත්සින් බලසේනාවෝ ආන්හ්වෙයි පළාතේ, ශෞයාං උප-පළාතේ, ලෝචියන්හිදී සතුරාගේ පෙරටු සේනාංග පරාජය කොට, ගොඩින්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සහ දියෙන් ඉදිරියට ගමන් කළහ. ශෞයාං නගර ප්‍රකාරය මත නැඟුණු පූ වියන් ක්සින් හටකණ්ඩායම් පෙළගස්වා සිටි කදිම පිළිවෙල දිටී ය; පාකුං කන්දේ තිබුණු වනරොදවල් සහ පඳුරු සතුරු සෙබළුන් සේ වරදවා ගෙන, ඔහු සතුරාගේ පෙනීමට තිබුණු ශක්තිය ගැන බියපත් විය. මේ පොතේ "චීනයේ විප්ලවවාදි යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු" නමැති ලිපියේ, 170වැනි පිටුවේ, 30වැනි සටහන සමග සසඳා බලන්න.

[32]සහෝදර මාඕ සේතුං මෙහිදී සඳහන් කරන්නේ චියාං කායි-ශෙක් සහ වෝං චිං-වෙයි, 1927දී කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් අතර වූ පළමුවැනි ජාතික ප්‍රජාතන්ත්‍රවාදි එක්සත් පෙරමුණට ද්‍රෝහි වී, ජනතාවට විරුද්ධ ව දස-අවුරුදු යුද්ධයක් දියත් කොට, එසේ විශාල පරිමාණයකින් සංවිධානය වීමට චීන ජනතාවට කොහෙත් ම නුපුළුවන් කළහ යන සත්‍ය කාරණය ගැන ය. මෙ ගැන වග කිව යුත්තෝ චියාං කායි-ශෙක් ප්‍රමුඛ කුඕමින්තාං ප්‍රතිගාමියෝ ය.

[33]සුංහි ශියාං ඇපා වසන්ත සහ සරත් සමයෙහි පාලනය කළේ ය. ක්‍රි: පූ: 638දී, සුං රාජ්‍යය බලවත් වූ රාජ්‍යය හා සටන් කළේ ය. වූ හටකණ්ඩායම් ගඟ තරණය කරමින් සිටියදී සුං බලසේනාවෝ සටන් කරන තැන් වල වින්‍යාස කරනු ලැබ සිටියහ. වූ හටකණ්ඩායම් ගණනින් තමන්ට වඩා ප්‍රබල වූ හෙයින්, පහර දිය යුතු මොහොත මෙය ය'යි එක් සුං මුලාදැනියෙක් යෝජනා කළේ ය. "නැත, මහත්මයෙක් කිසි කලෙක සූදනම් නැති කෙනකුට පහර නො දිය යුතු ය,"යි ඇපා කීවේ ය. වූ හටකණ්ඩායම් ගඟ තරණය කොට අවසන් වූ නමුත් තම සටන් පෙළගැස්ම සම්පූර්ණ නො කොට සිටියදී, වහා ම පහර දෙන්නට මුලාදැනියා යළි ත් යෝජනා කළේ ය, "නැත, මහත්මයෙක් කිසි කලෙක තම සටන් පෙළගැස්ම සම්පූර්ණ කර නැති හමුදවකට පහර නො දිය යුතු ය," යි ඇපා යළි ත් වරක් කීවේ ය. ඇපා පහර දෙන්ට අණ දුන්නේ වූ හටකණ්ඩායම් සම්පූර්ණයෙන් සූදනම් වූ පසු පමණකි. ප්‍රතිඵලයක් වශයෙන්, සුං හටකණ්ඩායම් විනාශදායක පරාජයකට භාජන විය, ඇපා ද තුවාල ලැබී ය.

[34]කුඕමින්තාං යුදදෙටුවකු වූ හාන් පූ-චූ අවුරුදු ගණනක් ම ශාන්ටුං පළාතේ ආණ්ඩුකාරයා විය. 1937දී ජපන් අතික්‍රමණිකයන් පීපිං සහ තියන්සින් නගර අල්ලාගෙන තියන්සින්-පූකව් දුම්රිය-මාර්ගය ඔස්සේ දකුණු දෙසට ශාන්ටුං පළාත දක්වා තල්ලු වී ආ කල, හාන් පූ-චූ එක ම සටනක් වත් නො කොට ශාන්ටුං පළාතේ සිට හෝනාන් පළාත තෙක් ම පළා ගියේ ය.

[35]කුඕමින්තාං ආණ්ඩුව මිනිසුන් බලයෙන් අල්ලාගෙන ගොස් බන්ද ගැනීමෙන් තම හමුදව විශාල කළේ ය. එම ආණ්ඩුවේ යුද හමුදව සහ පොලිසිය හැම තැනදී ම මිනිසුන් අල්ලාගෙන, වරදකරුවන් මෙන් ඔවුන් ලණු වලින් බැඳගෙන ගෙන ගියේ ය. සල්ලි තිබුණු අය කුඕමින්තාං මුලාදැනින්ට අල්ලස් දී බේරුණෝ ය; නැතහොත් තමන් වෙනුවට යාම පිණිස වෙන අය මිලයට ගත්හ.

යුද්ධය සහ උපායමාර්ගය පිළිබඳ ගැටළු

1938, නොවැම්බර් 6

1. චීනයේ අංගලක්ෂණ සහ විප්ලවවාදි යුද්ධය

සන්නද්ධ ශක්තියෙන් බලය අල්ලාගැනීම, යුද්ධය මගින් දෙකින් එක බේරුම් කර ගැනීම, විප්ලවයේ ප්‍රධාන කර්තව්‍යය ත් උසස් ම ආකාරය ත් වේ. විප්ලවය පිළිබඳ මේ මාක්ස්–ලෙනින්වාදි මූලධර්මය විශ්ව වශයෙන්, චීනය සඳහා ත්, සෙසු සියලු රටවල් සඳහා ත්, වලංගු වන්නේ ය.

එහෙත් මූලධර්මය එක ම වන අතර, නිර්ධනපංක්තියේ පක්ෂය විසින් එය ක්‍රියාවේ යොදන පිළිවෙල වෙනස් තත්වයන්ට අනුව වෙනස් වන විධි මගින් ප්‍රකාශයට පත් වේ. අභ්‍යන්තර වශයෙන්, ධනවාදි රටවල්, ඒවා පැසිස්ට්වාදි නො වන විට හෝ යුද වැදී නො සිටින විට, (රදළවාදය නො ව) ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය භාවිතාවේ යොදයි; බාහිර සබඳකම් වලදී, ඒ රටවල් වෙන ජාතින් විසින් පෙළනු නො ලබයි, එහෙත් වෙන ජාතින් පෙළයි. මේ අංගලක්ෂණ නිසා, බොහෝ කලක් තිස්සේ කරන නීත්‍යනුකූල අරගලය මගින් කම්කරුවන්ට අධ්‍යාපනය දෙමින් ශක්තිය ගොඩනඟා ගැනීම ත් එසේ ධනවාදය අවසාන වශයෙන් පෙරළා දැමීමට කටයුතු සූදනම් කිරීම ත් ධනවාදි රටවල් වල නිර්ධනපංක්තියේ පක්ෂය සතු කර්තව්‍යය වේ. මේ රටවල් වල, ප්‍රශ්නය දීර්ඝ නීත්‍යනුකූල අරගලයක් පිළිබඳ, වේදිකාවක් වශයෙන් පාර්ලිමේන්තුව පාවිච්චි කිරීම පිළිබඳ, ආර්ථික සහ දේශපාලන වැඩ-නතරකිරීම් පිළිබඳ, වෘත්තීය සමිති සංවිධානය කිරීම සහ කම්කරුවන්ට අධ්‍යාපනය දීම පිළිබඳ ප්‍රශ්නයකි. එහි සංවිධාන ආකාරය නීත්‍යනුකූල ය,

මේ ලිපිය පක්ෂයේ හයවැනි මධ්‍යම කාරකසභාවේ හයවැනි පූර්ණ සැසියේදී සහෝදර මාඕ සේතුං කළ අවසන් කතාවේ කොටසකි. "ජපානයට විරුද්ධ ගෙරිල්ලා යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු" සහ "දිග්ගැසුණු යුද්ධය ගැන" යන තම ලිපි වල, සහෝදර මාඕ සේතුං ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයේදී පක්ෂය සතු නායකත්වය දීමේ කොටස පිළිබඳ ප්‍රශ්නය බේරුම් කර තිබුණේ ය. එහෙත් ඇතැම් සහෝදරවරු, දක්ෂිණ අවස්ථාවාදි වැරදි කරමින්, පක්ෂය එක්සත් පෙරමුණ තුළ ස්වාධීනත්වය සහ මූලපිරුම පවත්වා ගත යුතු බව ප්‍රතික්ෂේප කළහ, එසේ යුද්ධය ගැන ත් උපායමාර්ගය ගැන ත් තිබුණු පක්ෂයේ ක්‍රියාමාර්ගය සැක කිරීම පමණක් නො ව ඊට විරුද්ධ වීම පවා කළහ. මේ දක්ෂිණ අවස්ථාවාදය

https://liberationbase.wordpress.com

අරගල ආකාරය ලේ හැලීමෙන් තොර (නිර්-යුද්ධමය) ය. යුද්ධ ප්‍රශ්නය උඩ ධනවාදී රටවල් වල කොමියුනිස්ට් පක්ෂ තමන්ගේ ම රටවල් විසින් කරන අධිරාජ්‍යවාදී යුද්ධ වලට විරුද්ධ වේ; එබඳු යුද්ධ ඇති වුව හොත්, මේ පක්ෂ වල ප්‍රතිපත්තිය වන්නේ තමන්ගේ ම රටවල් වල ප්‍රතිගාමී ආණ්ඩු වල පරාජය ඇති කර ලීම ය. ඒවාට කරන්ට උවමනා කරන එක ම යුද්ධය ඒවා කරන්ට සූදනම් වෙමින් සිටින සිවිල් යුද්ධය යි.[1] එහෙත් මේ කැරැල්ල සහ යුද්ධය ධනේශ්වරපංක්තිය ඇත්ත වශයෙන් ම අසරණ වන තුරු, නිර්ධනපංක්ති-යෙන් වැඩි කොටස අවි අතට ගෙන නැඟී සිට සටන් කරන්ට අධිෂ්ඨාන සහගත වන තුරු සහ, ගම්බද බහුජනයා කැමැත්තෙන් ම නිර්ධනපංක්තියට ආධාර දෙන තුරු දියත් නො කළ යුතු ය. වැලිත් එබඳු කැරැල්ලක් සහ යුද්ධයක් දියත් කරන්ට කාලය එළඹුණු විට, පළමුවැනි පියවර වන්නේ නගර අල්ලාගෙන, ඉක්බිති ගම්බද පෙදෙස බලා ඉදිරියට ගමන් කිරීම ය; අනික් අතට නො වේ. මේ සියල්ල ධනවාදී රටවල් වල කොමියුනිස්ට් පක්ෂ විසින් කර ඇත; එය නිවැරදි බව රුසියාවේ ඔක්තෝබර විප්ලවයෙන් ඔප්පු වී ඇත.

කෙසේ වෙතත් චීනය වෙනස් ය. චීනයේ අංගලක්ෂණ නම් ඈ ස්වාධීන සහ ප්‍රජාතන්ත්‍රවාදී නො ව අර්ධ–විජිත සහ අර්ධ–රදළ වීම ය, අභ්‍යන්තර වශයෙන් ඈට ප්‍රජාතන්ත්‍රවාදය නො තිබීම සහ රදළ පීඩනය යටතේ පැවතීම ය, ඇගේ බාහිර සබඳකම් වලදී ඈට ජාතික ස්වාධීනත්වය නො තිබීම සහ අධිරාජ්‍යවාදය විසින් පෙළනු ලැබීම ය. ඒ අනුව අපට ප්‍රයෝජන ගැනීමට පාර්ලිමේන්තුවක් වත්, වැඩ නතර කිරීම පිණිස කම්කරුවන් සංවිධානය කිරීමට නීත්‍යානුකූල අයිතියක් වත් නැත. මූලික වශයෙන්, මෙහි කොමියුනිස්ට් පක්ෂය සතු කර්තව්‍යය වන්නේ කැරැල්ලක් සහ යුද්ධයක් දියත් කිරීමට පෙර දිගු කලක් නීත්‍යානුකූල අරගලය තුළින් යාම නො වේ, පළමුකොට මහ නගර අල්ලාගෙන, ඉක්බිති ගම්බද පෙදෙස අල්ලාගැනීම නො වේ; එහි අනික් පැත්ත ය.

අධිරාජ්‍යවාදය අපේ රටට සන්නද්ධ ප්‍රහාරයන් දෙමින් නො සිටින විට, චීන කොමියුනිස්ට් පක්ෂය එක්කෝ, 1924–27 කාලයේදී ක්වංතුං පළාතේ යුද්ධ වලදී[2] සහ උතුරු යුදගමනේදී කළාක් මෙන්, (අධිරාජ්‍යවාදයේ ගැත්තන් වූ) යුදදෙටුවන්ට විරුද්ධ ව ධනේශ්වරපංක්තිය සමග එකමුතු වී සිවිල් යුද්ධය කරයි; නැත්නම්, 1927–36 කාලයේ ඉඩම් ලබාගැනීමේ විප්ලව

මැඩ පවත්වා, චීන විප්ලවයේදී යුද්ධය සහ උපායමාර්ගය පිළිබඳ ගැටළු වල මූලික වැදගත්කම ගැන වඩා පැහැදිලි වැටහීමක් මුළු පක්ෂයට ම ලබා දී, පක්ෂය මේ සම්බන්ධයෙන් බැරෑරුම් ලෙස වැඩ කිරීමට උනන්දු කරනු වස්, සහෝදර මාඕ සේතුං, මේ පූර්ණ රැස්වීමේදී, චීනයේ දේශපාලන අරගල වල ඉතිහාසයේ දෘෂ්ටිකෝණයෙන් මේ විෂය කෙරෙහි යොමුවෙමින්, එහි වැදගත්කම යළි ත් අවධාරණය කළේ ය, පක්ෂයේ යුද්ධමය වැඩ වල වර්ධනය සහ උපාය-මාර්ගයෙහි නියම වශයෙන් ඇති වන වෙනස්වීම් විශ්ලේෂණය කළේ ය. ප්‍රතිඵලය වූයේ පක්ෂ නායකත්වය තුළ සිතීමේ එකමුතුකම සහ පක්ෂය පුරා ක්‍රියාවේ එකමුතුකම ඇති වීම යි.

යුද්ධයේදී කළාක් මෙන්, (අධිරාජ්‍යවාදයේ ගැත්තන් ම වූ) ඉඩම්හිමි පංක්-තියට සහ කොම්ප්‍රදෝරු ධනේශ්වරපංක්තියට විරුද්ධ ව සිවිල් යුද්ධය කරනු පිණිස ගොවියන් සහ නාගරික සුළු ධනේශ්වරපංක්තිය සමග එක්සත් වෙයි. අධිරාජ්‍යවාදය චීනයට සන්නද්ධ ප්‍රහාරයන් දියත් කරන කල, පක්ෂය විදේශීය සතුරාට විරුද්ධ ව ජාතික යුද්ධයක් කරනු පිණිස විදේශීය ආක්‍ර-මණිකයන්ට විරුද්ධ වන රටේ සියලු පංක්ති සහ තට්ටු එක්සත් කරයි; වර්තමාන ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධයේදී එය කරන්නාක් මෙනි.

මේ සියල්ල චීනය සහ ධනවාදී රටවල් අතර ඇති වෙනස පෙන්වයි. චීනයෙහි ප්‍රධාන අරගල ආකාරය යුද්ධය යි, ප්‍රධාන සංවිධාන ආකාරය හමුදාව යි. බහුජන සංවිධානය සහ බහුජන අරගලය වැනි වෙනත් ආකාර ද අතිශයින් ම වැදගත් ය, ඇත්තෙන් ම නැති ව ම බැරි ය, කිසි ම කරුණක් නිසා වත් නො තකා නො සිටිය යුතු ය; එහෙත් ඒවායේ අභිප්‍රාය යුද්ධයට සේවය කිරීම යි. යුද්ධයක් පටන් ගැනීමට කලින් සංවිධානය ත් අරගලය ත් සියල්ල ම යුද්ධයට සූදනම් වනු පිණිස ය; 1919 මැයි 4 ව්‍යාපාරයේ[3] සිට 1930 මැයි 30 ව්‍යාපාරය[4] තෙක් වකවනුව තුළදී මෙන් ය. යුද්ධය පටන්ගත් පසු, සංවිධානය ත් අරගලය ත් සියල්ල ම එක එල්ලේ ම හෝ වටින් පිටින් හෝ යුද්ධය සමග උචිත ලෙස සම්බන්ධ කරනු ලැබේ; නිදසුන් වශයෙන් උතුරු යුදගමන පැවති වකවනුවෙහි විප්ලවවාදී හමුදාවේ පසුමුණු ප්‍රදේශ වල සියලු සංවිධානය ත් අරගලය ත් එක එල්ලේ ම යුද්ධය සමග උචිත ලෙස සම්බන්ධ කර තිබුණාක් මෙන් සහ උතුරු යුදදෙටු ප්‍රදේශ වල සියලු සංවිධානය ත් අරගලය ත් වටින් පිටින් යුද්ධය සමග උචිත ලෙස සම්බන්ධ කර තිබුණාක් මෙන් ය. යළි ඉඩම් ලබාගැනීමේ විප්ලව යුද්ධය පැවති වකවනුවෙහි, රතු ප්‍රදේශ තුළ සියලු සංවිධානය ත් අරගලය ත් එක එල්ලේ ම ද, රතු ප්‍රදේශ වලින් පිට ඒවා වටින් පිටින් ද යුද්ධය සමග උචිත ලෙස සම්-බන්ධ කර තිබුණේ ය. යළි ත් වර්තමාන වකවනුවේදී, විරුද්ධකම් පෑමේ යුද්ධයේදී, ජපන්-විරෝධී බලසේනාවන්ගේ පසුමුණු ප්‍රදේශ වල සහ සතුරා අල්ලාගෙන තිබෙන ප්‍රදේශ වල සියලු සංවිධානය ත් අරගලය ත් එක එල්ලේ ම හෝ වටින් පිටින් හෝ යුද්ධය සමග උචිත ලෙස සම්බන්ධ වී පවතී.

''චීනයෙහි සන්නද්ධ විප්ලවය සන්නද්ධ ප්‍රති–විප්ලවය සමග සටන් කරයි, එය චීන විප්ලවයේ විශේෂ අංග අතුරෙන් එකක් ද වාසි අතුරෙන් එකක් ද වේ.''[5] සහෝදර ස්ටැලින්ගේ මේ තීසිසය හරියට ම හරි ය, උතුරු යුදගමනට ත්, ඉඩම් ලබාගැනීමේ විප්ලව යුද්ධයට ත්, වර්තමාන ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධයට ත් එක හා සමාන ලෙස වලංගු ය. ඒ සියල්ල ම විප්ලවවාදී යුද්ධ ය, සියල්ල ම එල්ල කර ඇත්තේ ප්‍රති–විප්ලවවාදීන්ට විරුද්ධ ව ය, සියල්ල ම කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් විප්ලවවාදී ජනතාව විසින් ය; වෙනසක් ඇත්තේ සිවිල් යුද්ධයක් ජාතික යුද්ධයකින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වෙනස් වන තේරුමෙන්, කොමියුනිස්ට් පක්ෂය විසින් කරගෙන යන යුද්ධයක් ඒ පක්ෂය කුඕමින්තාං පක්ෂය ත් සමග එකමුතු වී කරගෙන යන යුද්ධයකින් වෙනස් වන තේරුමෙන්, පමණකි. සත්තකින් ම මේ වෙනස්කම් වැදගත් ය. යුද්ධයෙහි ප්‍රධාන බලවේගයන්ගේ පුළුල්බව ත් (එනම් කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ සන්ධානයක් ද, හෝ කම්කරුවන්ගේ, ගොවියන්ගේ සහ ධනේශ්වරපංක්තියේ සන්ධානයක් ද යන වග ත්), යුද්ධයේදී අපට සිටින්නේ අභ්‍යන්තර පසමිතුරෝ ද හෝ බාහිර පසමිතුරෝ ද යන වග ත් (එනම් යුද්ධය කරන්නේ දේශීය හෝ විදේශීය සතුරන්ට විරුද්ධ ව ද, දේශීය නම් උතුරු යුද්දෙටුවන්ට විරුද්ධ ව ද, හෝ කුඕමින්තාං පක්ෂයට විරුද්ධ ව ද යන වග ත්) ඒවායින් පෙන්නුම් කරනු ලැබේ; චීනයේ විප්ලවවාදි යුද්ධයේ අඩංගු-දෙය එහි ඉතිහාසයේ විවිධ අවස්ථාවන්හි විවිධ වන බව ද ඒවායින් පෙන්නුම් කරනු ලැබේ. එහෙත් මේ සියලු යුද්ධ සන්නද්ධ විප්ලවය සන්නද්ධ ප්‍රති-විප්ලවය සමග සටන් කරන අවස්ථා ය, සියල්ල ම චීන විප්ලවයේ විශේෂ අංග සහ වාසි ප්‍රදර්ශනය කරයි. විප්ලවවාදි යුද්ධය "චීන විප්ලවයේ විශේෂ අංග අතුරෙන් එකක් ද වාසි අතුරෙන් එකක් ද වේ" යන තීසිසය චීනයේ තත්වයන්ට හරියට ම ගැලපේ. චීන නිර්ධනපංක්තියේ පක්ෂය සතු ප්‍රධාන කර්තව්‍යය වී ඇත්තේ හැකි තරම් වැඩි ම ගණනක් මිත්‍රපාක්ෂිකයන් සමග එක්සත් වීම ත්, වටාපිටා තත්වයන්ට අනුව, අභ්‍යන්තර වේවා, බාහිර වේවා සන්නද්ධ ප්‍රති-විප්ලවයට විරුද්ධ ව ජාතික සහ සමාජ විමුක්තිය පිණිස සන්නද්ධ අරගල සංවිධානය කිරීම ත් ය; මෙය පක්ෂයේ ආරම්භයේ සිට ම පාහේ එය ඉදිරියේ තිබෙන කර්තව්‍යයකි. සන්නද්ධ අරගලය නොමැතිව නිර්ධනපංක්තියට ත් කොමියුනිස්ට් පක්ෂයට ත් චීනයෙහි නැඟී සිටින්ට ඉඩක් කොහෙත් ම නැති වෙනවා ඇත, කිසි ම විප්ලවවාදී කර්තව්‍යයක් ඉටු කරන්ට කොහෙත් ම බැරි වෙනවා ඇත.

අපේ පක්ෂය එය ආරම්භ කළ පසු මුල් අවුරුදු පහ හෝ හය තුළ, ඒ කියන්නේ, 1921 සිට 1926දී එය උතුරු යුදගමනට සහභාගි වීම තෙක්, මේ කාරණය සම්පූර්ණයෙන් වටහා ගත්තේ නැත. එකල එය චීනයෙහි සන්නද්ධ අරගලයේ පරම වැදගත්කම තේරුම් ගත්තේ වත්, බැරෑරුම් ලෙස යුද්ධය පිණිස සූදනම් වුණේ සහ සන්නද්ධ සේනාවන් සංවිධානය කළේ වත්, යුද්ධමය උපායමාර්ගය සහ උපක්‍රම අධ්‍යයනය කිරීමට යෙදුණේ වත් නැත. උතුරු යුදගමන පවතින අතර එය හමුදාව තම පැත්තට දිනා ගැනීම නො සලකා හැරියේ ය, එක පැත්තකට සීමා වී බහුජන ව්‍යාපාරය ම පමණක් අවධාරණය කළේ ය; එහි ප්‍රතිඵලය වශයෙන් කුඕමින්තාං පක්ෂය ප්‍රතිගාමී බවට හැරුණු මොහොතේ ම මුළු බහුජන ව්‍යාපාරය බිඳ වැටුණේ ය. 1927ට පසු දිගු කලක් ම බොහෝ සහෝදරවරු නගර වල කැරලි ගැසීම පිණිස කටයුතු සූදනම් කිරීම ත් සුදු ප්‍රදේශ වල වැඩ කිරීම ත් දිගට ම පක්ෂයේ ප්‍රධාන කර්තව්‍යය කරගෙන ගියහ. ඇතැම් සහෝදරවරුන් මේ ප්‍රශ්නය

උඩ තමන් ගෙන සිටි ආකල්පය මූලික වශයෙන් වෙනස් කළේ 1931දී සතුරාගේ තුන්වැනි "වටලීමේ සහ මැඩලීමේ" යුද්ධව්‍යාපාරය පළවා හැරීමෙන් අප ලැබූ ජයග්‍රහණයට පසු ව පමණකි. එහෙත් මෙය මුළු පක්ෂය ගැන ම සැබෑ නො වී ය. මෙහි ඉදිරිපත් කළ මාර්ග ඔස්සේ කල්පනා නො කළ වෙනත් සහෝදරවරු සිටියහ.

සන්නද්ධ ශක්තිය නොමැතිව චීනයේ ගැටළු බේරුම් නො කළ හැකි බව අත්දැකීම අපට කියයි. මේ කාරණය තේරුම් ගැනීම මෙතැන් සිට ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධය සාර්ථක ලෙස කරගෙන යාමට අපට ආධාරයක් වෙනවා ඇත. ජපානයට විරුද්ධ යුද්ධයේදී මුළු ජාතිය ම සන්නද්ධ විරුද්ධකම් පෑමෙහි යෙදීමට නැඟී එන්නේ ය යන සත්‍ය කාරණය මේ ප්‍රශ්නයේ වැදගත්කම ගැන දනට වඩා හොඳ අවබෝධයක් මුළු පක්ෂයේ ම සිතට වැද්දිය යුතු ය; හැම පක්ෂ සාමාජිකයෙක් ම අවි අතට ගෙන, කවර මොහොතක හෝ පෙරමුණට යාමට සූදනම් ව සිටිය යුතු ය. එමතු නො ව, අපේ වර්තමාන සැසිය පක්ෂයේ ප්‍රධාන වැඩ ක්ෂේත්‍ර තිබෙන්නේ සටන් කලාප වල ත් සතුරාගේ පසුමුණෙහි ත් බව තීරණය කිරීමෙන් අපේ පරිශ්‍රමයන් මෙහෙයවිය යුතු අත පැහැදිලි ලෙස පහදා දී තිබේ. මෙය ඇතැම් පක්ෂ සාමාජිකයන් පක්ෂ සංවිධානයන්හි සහ බහුජන ව්‍යාපාරයෙහි පමණක් වැඩ කරන්ට කැමැති වන සහ සංග්‍රාමය අධ්‍යයනය කරන්ට හෝ ඊට සහභාගි වෙන්ට අකැමැති වන අතට බර වෙන ගතියට විරුද්ධ ව ත්, ඇතැම් පාසල් පෙරමුණට යන ලෙස ශිෂ්‍යයන්ට දිරි දීමට අසමත් වීමට විරුද්ධ ව සහ එබඳු වෙන ප්‍රපංචයන්ට විරුද්ධ ව ත් තිබෙන කදිම විෂ-නාශකයක් ද වෙයි. චීනයේ වැඩි හරියක, පක්ෂ සංවිධානාත්මක වැඩ සහ බහුජන වැඩ එක එල්ලේ ම සන්නද්ධ අරගලය සමග ඈඳී ඇත; හුදකලා වූ ත් තනි ව පවතින්නා වූ ත් කිසි ම පක්ෂ වැඩක් හෝ බහුජන වැඩක් ඇත්තේ නැත, තිබෙන්ට බැරි ය. (යුන්නාන්, ක්වෙයිචව් සහ සෙචුආන් වැනි) සටන් කලාප වලින් ඉතා ඈත පිහිටි ප්‍රදේශ වල සහ (පීපිං, තියන්සින්, නැන්කිං සහ ශැංහයි වැනි) සතුරා අල්ලාගෙන තිබෙන ප්‍රදේශ වල පවා, පක්ෂ සංවිධානාත්මක වැඩ ත් බහුජන වැඩ ත් යුද්ධය සමග උචිත ලෙස සම්බන්ධ වී ඇත, ඒවා තනිකර ම පෙරමුණේ උවමනාවන්ට සේවය කළ යුතු ය, යුතු ම ය. කොටින්, මුළු පක්ෂය ම යුද්ධය කෙරෙහි මහත් අවධානය යොමු කළ යුතු ය, යුද්ධමය කටයුතු හැදෑරිය යුතු ය, සටන් කරනු පිණිස තමා සූදනම් කළ යුතු ය.

II. කුඕමින්තාං පක්ෂයේ යුද්ධ ඉතිහාසය

කුඕමින්තාං පක්ෂයේ ඉතිහාසය දෙස ඇස් යොමු කොට, එය යුද්ධය ගැන දක්වන සැලකිල්ල කුමක් ද'යි සොයා බැලීම අප හට ප්‍රයෝජනවත් වෙනවා ඇත.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සුන් යත්-සෙන්, පටන්ගැන්මේ සිට ම, කුඩා විප්ලවවාදි කණ්ඩායමක් සංවිධානය කළ විට, චිං රජපෙළපතට විරුද්ධ ව සන්නද්ධ කැරලිගැසීම් කළේ ය.[6] 1911හේ විප්ලවය මගින් චිං රජපෙළපත සන්නද්ධ බලයෙන් පෙරළා දැමූ තැන දක්වා ම, තුං මෙං හුයි (චීන විප්ලවවාදි සමාජයේ) වකවානුව සන්නද්ධ කැරලිගැසීම් වලින් ගහණ ය.[7] ඉක්බිති, චීන විප්ලවවාදි පක්ෂයේ වකවානුවේදී, ඔහු යුආන් ශි-කායිට විරුද්ධ ව යුද්ධමය ව්‍යාපාරයක් ගෙන-ගියේ ය.[8] නාවික සේනාංග වල දකුණුදිග ව්‍යාපාරය[9], ක්වෙයිලින් වලින් පටන් ගත් උතුරු යුදගමන[10] සහ වාම්පෝ යුද්ධ විද්‍යායතනය ආරම්භ කිරීම[11] වැනි ඊට පසු සිද්ධි සියල්ල ම සුන් යත්-සෙන් කරගෙනගිය යුද්ධමය කටයුතු අතර විය.

සුන් යත්-සෙන් ඇවැමෙන් චියාං කායි-ශෙක් ආවේ ය; ඔහු කුඕමින්තාං පක්ෂයේ යුද්ධමය බලය එහි මස්තකයට ම ගෙනාවේ ය. ඔහු තම ජීවිතය මෙන් ම හමුදාව අගය කරයි; උතුරු යුදගමන, සිවිල් යුද්ධය සහ ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය යන යුද්ධ තුනක අත්දැකීම ලබාගෙන සිටී. පසුගිය දස වස ම චියාං කායි-ශෙක් ප්‍රති-විප්ලවවාදියකු වී සිටී. ඔහු ප්‍රති-විප්ලවවාදි කටයුතු පිණිස දැවැන්ත ''මධ්‍යම හමුදාවක්'' ඇති කර තිබේ. ඔහු හමුදාවක් ඇත්තේ කා හට ද බලය ඇත්තේ ඔහුට ය, යුද්ධය සියල්ල තීරණය කරයි යන ඉතා වැදගත් කරුණ තරයේ පිළිගෙන ඇත. මේ අතින් අපි ඔහු ගෙන් ඉගෙනගත යුත්තෙමු. මේ අතින් සුන් යත්-සෙන් සහ චියාං කායි-ශෙක් යන දෙ දෙනා ම අපේ ගුරුවරු වෙති.

1911හේ විප්ලවයේ සිට, සියලු ම යුදදෙටුවෝ, ''හමුදාවක් ඇත්තේ කා හට ද බලය ඇත්තේ ඔහුට ය'' යන මූලධර්මය මහත් අගය කොට සලකමින්, තම හමුදාවන් පණ වගේ බදාගෙන සිටිති.

සුව දුක් දෙකින් ම ගහණ කලක් ගෙවූ දක්ෂ නිලධාරියකු වූ තාන් යෙන්-කායි[12] කිසි කලෙක තනිකර ම සිවිල් ආණ්ඩුකාරයෙක් නො වී ය, යුද්ධ ආණ්ඩුකාරයකු ද සිවිල් ආණ්ඩුකාරයකු ද වශයෙන් සිටීමට සැම විට ම එක පයින් සිටියේ ය. ඔහු පළමුකොට කැන්ටන් නුවර ත් ඉක්බිති වූහාන් නුවර ත් ජාතික ආණ්ඩුවේ ජනාධිපති වූ විට පවා, ඔහු ඒ අතර ම 2වැනි හමු-දාවේ අණදෙන්නා ද විය. චීනයේ මේ විශේෂතාව තේරුම් ගත් එබඳු යුද-දෙටුවෝ බොහෝ ගණනක් සිටිති.

හමුදාවක් තබා ගන්ට උවමනා නො කළ පක්ෂ ද, විශේෂයෙන් ප්‍රගතිශීලි පක්ෂය[13], චීනයෙහි තිබී ඇත; එතෙකුදු වුව කිසියම් යුදදෙටු පිටුබලයක් නො-මැතිව තමාට ආණ්ඩුවේ තැන් ලබා ගන්ට බැරි බව මේ පක්ෂය පවා පිළිගත්තේ ය. එකකුට පසු එකකු වශයෙන් එහි අනුග්‍රාහකයන් වූ අය අතර යුආන් ශි-කායි,[14] තුආන් චී-ජුයි[15] සහ (ප්‍රගතිශීලි පක්ෂයේ කොටසකින් සකස් වූ දේශපාලන විද්‍යා කණ්ඩායම[16] සම්බන්ධ වී සිටින) චියාං කායි-ශෙක් යන මොවුහු සිටියෝ ය.

කෙටි ඉතිහාසයක් තිබෙන කුඩා දේශපාලන පක්ෂ කීපයකට, උදාහරණ වශයෙන්, තරුණ පක්ෂයට[17], හමුදාවක් නැත, එසේ හෙයින් කිසි ම තැනකට යා ගන්ට පුළුවන් වී නැත.

වෙන රටවල් වල එක් එක් ධනේශ්වර පක්ෂයට කෙළින් ම තම තමාගේ විධානය යටතේ පවතින සන්නද්ධ බලසේනාවක් තබා ගන්ට උවමනා නැත. එහෙත් චීනයෙහි කරුණු වෙනස් ය; එහි රටේ රදළවාදි බෙදීම නිසා, තුවක්කු තිබෙන ඉඩම්හිමි හෝ ධනේශ්වර කණ්ඩායම් වලට නැතහොත් පක්ෂ වලට බලය ඇත්තේ ය, වැඩියෙන් තුවක්කු තිබෙන අයට වැඩියෙන් බලය ඇත්තේ ය. එබඳු පරිසරයක සිටිද්දී, නිර්ධනපංක්තියේ පක්ෂය කාරණයේ හරය ම පැහැදිලි ලෙස බැලිය යුතු ය.

කොමියුනිස්ටවාදියෝ පුද්ගලික යුද්ධමය බලය පිණිස සටන් නො කරති (ඔවුහු කිසි ම වටාපිටා තත්වයක් යටතේ එසේ නො කළ යුත්තාහ, කිසිවෙක් යළි කිසි කලෙක චාං කුඕ-තාඕගේ ආදර්ශය අනුගමනය නො කළ යුතු ය); එහෙත් ඔවුහු පක්ෂය සඳහා යුද්ධමය බලය පිණිස, ජනතාව සඳහා යුද්ධමය බලය පිණිස, සටන් කළ යුත්තාහ. විරුද්දකම් පෑමේ ජාතික යුද්ධයක් කර-ගෙන යන හෙයින්, අපි ජාතිය සඳහා යුද්ධමය බලය පිණිස ද සටන් කළ යුත්තෙමු. යම් තැනක යුද්ධමය බලය පිළිබඳ මේ ප්‍රශ්නය ගැන බොළඳකම පවතී ද, එතැන කිසි ම දෙයක් මුදුන්පත් කළ නො හැකි ය. අවුරුදු දහස් ගණන් මුළුල්ලෙහි ප්‍රතිගාමී පාලක පංක්ති විසින් රවටනු ලැබ සහ බිය වද්දනු ලැබ සිටින වැඩ කරන ජනයාට තමන්ගේ ම අත් වල තුවක්කු තබා ගැනීමේ වැදගත්කම ගැන ඇහැ ඇරීම ඉතා දුෂ්කර ය. දැන් ජපන් අධිරාජ්‍යවාදි පීඩනය ත් ඊට ඇති දේශ-ව්‍යාප්ත විරුද්දකම් පෑම ත් අපේ වැඩ කරන ජනතාව යුද්ධයේ රඟමඩල තුළට තල්ලු කර තිබෙන හෙයින්, කොමියුනිස්ට-වාදියෝ මේ යුද්ධයෙහි දේශපාලන වශයෙන් ඉතා ම හැඟීම් සහිත නායකයන් තමන් බව ඔප්පු කළ යුත්තාහ. හැම කොමියුනිස්ටවාදියෙක් ම ''දේශපාලන බලය වැඩෙන්නේ තුවක්කු කාණුවෙන් ය'' යන සත්‍යය තරයේ වටහා ගත යුතු ය. අපේ මූලධර්මය පක්ෂය තුවක්කුවට අණ දෙයි, පක්ෂයට අණ දෙන්නට තුවක්කුවට කිසි කලෙක ඉඩ නො දිය යුතු'යි යනු ය. එහෙත්, තුවක්කු ඇති කල, පක්ෂ සංවිධාන ඇති කරන්ට අපට පුළුවනි; අටවැනි මාර්ග හමුදාව උතුරු චීනයෙහි ඇති කර තිබෙන ප්‍රබල පක්ෂ සංවිධාන ඊට සාක්සි ය. අපට එසේ ම කාඩර්වරුන් ඇති කරන්ට, පාසල් ඇති කරන්ට, සංස්කෘතිය ඇති කරන්ට, බහුජන ව්‍යාපාර ඇති කරන්ට පුළුවනි. යෙන්ආනයෙහි තිබෙන සියල්ල ම ඇති කර තිබෙන්නේ තුවක්කු ඇති ව සිටීමෙන් ය. තුවක්කු කාණුවකින් සියලු ම දේ වැඩෙයි. රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදි න්‍යායය අනුව, හමුදාව රාජ්‍ය බලයේ ප්‍රධාන අවයවය වේ. රාජ්‍ය බලය අල්ලාගන්ට සහ තබාගන්ට උවමනා කරන කවරකුට වේවා, බලවත් හමුදාවක් සිටිය යුතු ම ය. ඇතැම් මිනිස්සු ''යුද්ධයේ සර්වබලධාරිත්වය'' වෙනුවෙන් කතා කරන්නෝ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ය'යි අපට උසුළු විසුළු කරති. ඔව්, අපි විප්ලවවාදි යුද්ධයේ සර්වබලධාරිත්වය වෙනුවෙන් කතා කරන අය වෙමු; එය හොඳ ය, නරක නැත; එය මාක්ස්වාදි ය. රුසියන් කොමියුනිස්ට් පක්ෂයේ තුවක්කු සමාජවාදය ඇති කළේ ය. අපි ප්‍රජාතන්ත්‍රවාදි සමූහාණ්ඩුවක් ඇති කරමු. සන්නද්ධ ධනේශ්වරපංක්තිය සහ ඉඩම්හිමියන් පරාජය කරන්ට කම්කරු පංක්තියට ත් වැඩකරන බහුජනයාට ත් හැකි වන්නේ තුවක්කුවේ බලයෙන් පමණක් බව අධිරාජ්‍යවාදයේ යුගයේ පංක්ති සටනේදී ලත් අත්දැකීම අපට උගන්වයි; මේ තේරුමෙන් මුළු ලොව ම විපර්යාස කළ හැක්කේ තුවක්කු වලින් පමණක් ය'යි කියන්ට අපට ඉඩ තිබේ. අපි යුද්ධය නැති කිරීම වෙනුවෙන් කතා කරන අය වෙමු, අපට යුද්ධය උවමනා නැත; එහෙත් යුද්ධය නැති කළ හැක්කේ යුද්ධය මගින් පමණකි; තුවක්කුව පිටු දකිනු පිණිස තුවක්කුව අතට ගැනීම අවශ්‍ය ය.

III. චීන කොමියුනිස්ට් පක්ෂයේ යුද්ධ ඉතිහාසය

අවුරුදු තුනක් හෝ හතරක් වූ කාලයක්, ඒ කියන්නේ, (චීන කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කළ) 1921 සිට (කුඕමින්තාං පක්ෂයේ පළමුවැනි ජාතික සම්මේලනය පැවැත්වූ) 1924 තෙක්, අපේ පක්ෂය යුද්ධය පිණිස සූදනම් වීමට ත් සන්නද්ධ බලසේනාවන් සංවිධානය කිරීමට ත් කෙළින් ම බැහීමේ වැදගත්කම වටහා ගන්ට අසමත් විය; 1924–27 කාලයේදී සහ ඊට පසු ව පවා මේ ප්‍රශ්නය ගැන ප්‍රමාණවත් අවබෝධයක් පක්ෂයට තිබුණේ නැත; එසේ ද වුව, 1924ට පසු, එය වාම්පෝ යුද්ධ විද්‍යායතනයට සහභාගි වෙන්ට පටන් ගත් කල, එය නව අවස්ථාවකට පිවිසියේ ය, යුද්ධ කටයුතු වල වැදගත්කම දක්නට වූයේ ය. ක්වංතුං පළාතේ යුද්ධ වලදී කුඕමින්තාං පක්ෂයට ආධාර කිරීම මගින් සහ උතුරු යුදගමනට සහභාගි වීම මගින්, පක්ෂය ඇතැම් සන්නද්ධ බලසේනාවන් කෙරෙහි නායකත්වය දිනා ගත්තේ ය.[18] ඉක්බිති, විප්ලවය අසාර්ථක වීමෙන් කටුක පාඩමක් ඉගෙනගෙන, පක්ෂය නාන්චාං පැනනැඟීම,[19] සරත් අස්වනු පැනනැඟීම[20] සහ කැන්ටන් පැනනැඟීම[21] සංවිධානය කළේ ය, රතු හමුදාව පිහිටුවීමේ අළුත් වකවානුවකට පිවිසියේ ය. එය අපේ පක්ෂය හමුදාවේ වැදගත්කම ගැන අනූන අවබෝධයක් කරා එළඹුණු තීරණාත්මක වකවානුව විය. මේ වකවානුවෙහි රතු හමුදාව නො තිබුණේ නම් සහ රතු හමුදාව යුද්ධ නො කළේ නම්, ඒ කියන්නේ, කොමියුනිස්ට් පක්ෂය චෙන් තු–ශියුගේ දියකරහැරීම්–වාදය බාර ගත්තේ නම්, වර්තමාන විරුද්දකම් පෑමේ යුද්ධය ඇති වේ ය'යි සිතන්ට වත් බැරි වෙනවා ඇත, නැතහොත් එය වැඩි කලක් දරා සිටින්ට නුපුළුවන් වෙනවා ඇත.

1927, අගෝස්තු 7වැනි දින පවත්වනලද තම හදිස්සි රැස්වීමේදී, පක්ෂයේ මධ්‍යම කාරකසභාව දේශපාලන පරිමණ්ඩලයෙහි දක්ෂිණ අවස්ථාවාදයට විරුද්ධ ව සටන් කළේ ය, එසේ ලොකු පියවරක් ඉස්සරහට තබන්ට පක්ෂයට

හැකි කළේ ය. 1931 ජනවාරියේදී තම සිව්වැනි පූර්ණ සැසියේදී, හයවැනි මධ්‍යම කාරකසභාව දේශපාලන පරිමණ්ඩලයෙහි "වාම" අවස්ථාවාදයට විරුද්ධ ව නමට පමණක් සටන් කළේ ය, නමුත් ඇත්ත වශයෙන් එය ම "වාම" අවස්ථාවාදයේ වරද අළුතෙන් කළේ ය. රැස්වීම් දෙක ඒවායේ අඩංගු–දෙයින් සහ රඟපෑ ඉතිහාසීය කොටසින් වෙනස් විය; එහෙත් ඒ එකක් වත් යුද්ධය සහ උපායමාර්ගය පිළිබඳ ගැටළුව ගැන බැරෑරුම් ලෙස ක්‍රියා නො කළේ ය යන සත්‍ය කාරණයෙන් පෙනී ගියේ යුද්ධය ඒ වන තුරු ත් පක්ෂයේ වැඩ වල ගුරුත්ව කේන්ද්‍රය කර නො තිබුණු බව ය. පක්ෂයේ මධ්‍යම නායකත්වය 1933දී රතු ප්‍රදේශ වලට මාරු වූ පසු, මේ තත්වය මූලික වෙනසකට භාජන විය; එහෙත්, විප්ලවවාදි යුද්ධයට බරපතල අලාබ හානි සිදු කරමින්, යුද්ධය පිළිබඳ ගැටළුව (සහ සෙසු සියළු ප්‍රධාන ගැටළු) උඩ මූලධර්මය අතින් වැරදි යළි කරනු ලැබි ය.[22] 1935 ත්සුන්යී රැස්වීම, අනික් අතට, ප්‍රධාන වශයෙන් යුද්ධමය පරිමණ්ඩලයෙහි අවස්ථාවාදයට විරුද්ධ සටනක් විය, යුද්ධ ප්‍රශ්නයට ඉහළ ම මුල් තැන දුන්නේ ය; මෙය ඒ කාලයේ යුද්ධ තත්වයන් පිළිබිඹු වීමක් විය. ඉකුත් දහහත් අවුරුද්දේ අරගල වලදී චීන කොමියුනිස්ට් පක්ෂය ස්ථිර මාක්ස්වාදි දේශපාලන ක්‍රියාමාර්ගයක් පමණක් නො ව ස්ථිර යුද්ධමය ක්‍රියාමාර්ගයක් ද හැඩතලා ඇති බව අද අපට විශ්වාස සහගත ව කිය හැකි ය. දේශපාලන ගැටළු පමණක් නො ව යුද්ධමය ගැටළු ද විසඳීමෙහි ලා මාක්ස්වාදය යොදන්නට අපට පුළුවන් වී තිබේ; අප විසින් පක්ෂය සහ රජය පවත්වාගෙන යාමට සමත් කාඩර්වරුන් ගෙන් සැදුණු ලොකු අරටුවක් පමණක් නො ව හමුදාව පවත්වාගෙන යාමට සමත් කාඩර්වරුන් ගෙන් සැදුණු ලොකු අරටුවක් ද පුහුණු කර ඇත. මේ ජයග්‍රහණ, ගණන් නැති දිවි පිදූ වීරයන්ගේ ලෙයින් දිය වක්කරනලද, විප්ලවයේ සුපිපි කුසුම් වේ, චීන කොමියුනිස්ට් පක්ෂයට සහ චීන ජනතාවට පමණක් නො ව මුළු ලොවේ ම කොමියුනිස්ට් පක්ෂ වලට සහ ජනතාවන්ට ද අයත් කීර්තියක් වේ. නිර්ධනපංක්තියට සහ වැඩකරන ජනයාට අයත් යුද හමුද මුළු ලොවේ තවම ඇත්තේ තුනක් පමණි; එනම් සෝවියට් සංගමයේ, චීනයේ සහ ස්පාඤ්ඤයේ කොමියුනිස්ට් පක්ෂ විසින් නායකත්වය දෙනු ලබන හමුද ය; සෙසු රටවල් වල කොමියුනිස්ට් පක්ෂ මෙතෙක් ම යුද්ධමය අත්දැකීම් ලබා නැත; එහෙයින් අපේ හමුදාව ත් අපේ යුද්ධමය අත්දැකීම ත් වඩා ත් ම අනගි ය.

ජපානයට විරුද්දකම් පෑමේ වර්තමාන යුද්ධය ජයග්‍රහණය කරා ගෙනයනු වස්, පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන අටවැනි මාර්ග හමුදාව ත්, අළුත් සිව්වැනි හමුදාව ත්, සියලු ගොරිල්ලා බලසේනා ත් පුළුල් කිරීම සහ තහවුරු කිරීම අතිශයින් ම වැදගත් ය. මේ මූලධර්මය උඩ ක්‍රියා කරමින්, පක්ෂය තම ඉතා ම හොඳ සාමාජිකයන් සහ කාඩර්වරුන් අතුරෙන් සෑහෙන සංඛ්‍යාවක් පෙරමුණට පිටත් කළ යුතු ය. හැම දෙයක් ම පෙරමුණේදී ජය

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ලැබීම පිණිස සේවය කළ යුතු ය, සංවිධානාත්මක කර්තව්‍යය දේශපාලන කර්තව්‍යයට යටත් කළ යුතු ය.

IV. සිවිල් යුද්ධයේදී සහ ජාතික යුද්ධයේදී පක්ෂයේ යුද්ධමය උපායමාර්ගයෙහි වෙනස්වීම්

අපේ පක්ෂයේ යුද්ධමය උපායමාර්ගයෙහි වෙනස්වීම් අධ්‍යයනය කිරීම වටී. අපි ක්‍රියාවලි දෙක, එනම් සිවිල් යුද්ධය සහ ජාතික යුද්ධය, ගැන වෙන වෙන ම කතා කරමු.

සිවිල් යුද්ධය දළ වශයෙන් උපායමාර්ගික වකවානු දෙකකට බෙදිය හැකි ය. පළමුවැනි වකවානුවේදී ගොරිල්ලා සංග්‍රාමය ද, දෙවැනි වකවානුවේදී නිත්‍ය සංග්‍රාමය ද ප්‍රාථමික විය. එහෙත් මේ නිත්‍ය සංග්‍රාමය චීන වර්ගයට අයත් විය, නිත්‍ය වූයේ ජංගම සංග්‍රාමය පිණිස බලසේනාවන් ඒකරාශි කිරීම අතින් ද, විධානයේදී සහ සංවිධානයේදී එක්තරා ප්‍රමාණයකට මධ්‍යගත කිරීම හා සැලැස්ම කිරීම අතින් ද පමණකි; එය, වෙනත් අංග වලින් ගොරිල්ලා ලක්ෂණය තබා ගත්තේ ය, නිත්‍ය සංග්‍රාමය වශයෙන් පහළ මට්ටමක විය, විදේශීය හමුදාවන්ගේ නිත්‍ය සංග්‍රාමය හෝ, ඇතැම් විධි වලින්, කුඕමින්තාං හමුදාවේ නිත්‍ය සංග්‍රාමය සමග පවා, සම කළ නො හැකි විය. මෙසේ, එක් තේරුමකින්, මේ වර්ගයේ නිත්‍ය සංග්‍රාමය උසස් මට්ටමකට නංවනලද ගොරිල්ලා සංග්‍රාමය විය.

ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය ද අපේ පක්ෂයේ යුද්ධමය කර්තව්‍යයන්ට අදළ වූ පමණකින්, දළ වශයෙන් උපායමාර්ගික වකවානු දෙකකට බෙදිය හැකි ය. (උපායමාර්ගික ආරක්ෂාවීමේ ත් උපායමාර්ගික ඇණහිටීමේ ත් අවස්ථා ඇතුළත්) පළමුවැනි වකවානුවේදී ප්‍රාථමික වන්නේ ගොරිල්ලා සංග්‍රාමය යි; ඒ අතර (උපායමාර්ගික පෙරළා–පහරදීමේ අවස්ථාව ඇතුළත්) දෙවැනි අවස්ථාවේදී ප්‍රාථමික වෙනවා ඇත්තේ නිත්‍ය සංග්‍රාමය යි. කෙසේ වෙතත්, විරුද්දකම් පෑමේ යුද්ධයේ මුල් වකවානුවේ ගොරිල්ලා සංග්‍රාමය අඩංගු–දෙය අතින් සිවිල් යුද්ධයේ මුල් වකවානුවේ ගොරිල්ලා සංග්‍රාමයට සැලකියයුතු තරමක් වෙනස් ය; තැන් තැන් වල විසිරී කරන ගොරිල්ලා කර්තව්‍යයන් නිත්‍ය වූ (එනම්, එක්තරා ප්‍රමාණයකට නිත්‍ය වූ) අටවැනි මාර්ග හමුදාව විසින් කරගෙන යනු ලබන නිසා ය. එමෙන් ම, විරුද්දකම් පෑමේ යුද්ධයේ දෙවැනි වකවානුවේ නිත්‍ය සංග්‍රාමය සිවිල් යුද්ධයේ දෙවැනි වකවානුවේ නිත්‍ය සංග්‍රාමයට වෙනස් වෙනවා ඇත; කලට ඔබින උපකරණ දුන්නොත්, හමුදාව සහ එහි සටන්–ව්‍යාපාර යන දෙකේ ම මහත් වෙනසක් සිදු වනු ඇතැ' යි අපට සිතා ගත හැකි නිසා ය. අපේ හමුදාව එවිට උසස් ප්‍රමාණයක

මධ්‍යගතතාවක් සහ සංවිධානයක් ඇති කර ගන්නවා ඇත, එහි සටන්–ව්‍යාපාර ඒවායේ ගොරිල්ලා ලක්ෂණයෙන් වැඩි හරියක් අහෝසි වී උසස් ප්‍රමාණයක නිත්‍යතාවට පත් වෙනවා ඇත; දැනට පහළ මට්ටමක තිබෙන දේ එවිට ඉහළ මට්ටමකට නැඟෙනවා ඇත, චීන වර්ගයේ නිත්‍ය සංග්‍රාමය සාමාන්‍ය වර්ගයේ නිත්‍ය සංග්‍රාමය බවට වෙනස් වෙනවා ඇත. එය උපායමාර්ගික පෙරළා–පහරදීමේ අවස්ථාවේදී අප විසින් කළ යුතු වැඩ කොටස වන්නේ ය.

ක්‍රියාවලි දෙක, එනම් සිවිල් යුද්ධය සහ ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය ත්, ඒවායේ උපායමාර්ගික වකවානු හතර ත්, උපායමාර්ගයෙහි වෙනස්වීම් තුනක් අඩංගු කර ගන්නා බව මෙසේ අපට පෙනෙයි. පළමුවැන්න, සිවිල් යුද්ධයේදී, ගොරිල්ලා සංග්‍රාමයෙන් නිත්‍ය සංග්‍රාමයට වෙනස් වීම විය. දෙවැන්න, විරුද්දකම් පෑමේ යුද්ධයේදී, සිවිල් යුද්ධයේ නිත්‍ය සංග්‍රාමයෙන් ගොරිල්ලා සංග්‍රාමයට වෙනස් වීම ය. තුන්වැන්න, විරුද්දකම් පෑමේ යුද්ධයේදී, ගොරිල්ලා සංග්‍රාමයෙන් නිත්‍ය සංග්‍රාමයට වෙනස් වීම වෙනවා ඇත.

වෙනස්වීම් තුනෙන් පළමුවැන්න මහත් දුෂ්කරතාවන්ට මුහුණ පෑවේ ය. ඊට දෙආකාර කර්තව්‍යයක් ඇතුළත් විය. එක් අතකින්, අපේ කාඩර්වරුන් සතුරාගේ තත්වයෙහි ද අපේ ම කර්තව්‍යයන්හි ද ඇති වූ වෙනස්වීම් අඩුවෙන් තක්සේරු කළ හෙයින් පැනනැඟුණු ගතියක් වූ, ගොරිල්ලා ඇබ්බැහි වල එල්ලී සිටීම ත් නිත්‍යභාවයට හැරීම ප්‍රතික්ෂේප කිරීම ත් යන මෙයින් යුක්ත වූ ප්‍රාදේශිකවාදය සහ ගොරිල්ලාවාදය නමැති දකුණට බර වීමේ ගතියට විරුද්ධ ව සටන් කරන්ට අපට සිදු විය. මධ්‍යම රතු ප්‍රදේශයෙහි මේ අතට බර වීමේ ගතිය අනුක්‍රමයෙන් නිවැරදි කරනු ලැබුවේ වෙහෙස විඳිමින් අධ්‍යාපනය දීමේ වැඩ හුඟක් කළ පසු පමණකි. අනික් අතින්, නායක කාඩර්වරුන් අතර සමහරුන් සතුරා පමණට වැඩියෙන් තක්සේරු කිරීම ත්, කළ යුතු වැඩ උවමනාවට වඩා ඉහළින් නියම කිරීම ත්, නියම තත්වයන් ගැන නො තකා විදේශීය අත්දැකීම් යාන්ත්‍රික ලෙස යෙදීම ත් නිසා පැනනැඟුණු ගතියක් වූ, නිත්‍යභාවයට පත් කිරීම නො නිසි ලෙස අවධාරණය කළ පමණට වඩා මධ්‍යගත කිරීම ත් සාහසිකවාදය ත් යන ''වාම'' බර වීමේ ගතියට විරුද්ධ ව සටන් කරන්ට අපට සිදු විය. (ත්සුන්යී රැස්වීමට පෙර) පුරා තුන් වසක් ම, මේ බර වීමේ ගතිය මධ්‍යම රතු ප්‍රදේශය මත මහත් දුක්ගැහැට අලාභ හානි පැමෙව්වේ ය, එය නිවැරදි කරනු ලැබුවේ අප අපේ ලෙයින් මිල ගෙවා පාඩම් ඉගෙනගත් පසු පමණකි. එය නිවැරදි කිරීම ත්සුන්යී රැස්වීමේ ජයග්‍රහණය විය.

උපායමාර්ගයෙහි දෙවැනි වෙනස සිදු වූයේ (ලූගෞචියාඕ සිද්ධියට පසු) 1937 සරත් සමයෙහි, වෙනස් යුද්ධ දෙකේ සන්ධිස්ථානයේදී ය. අපි අළුත් සතුරකුට, එනම් ජපන් අධිරාජ්‍යවාදයට, මුහුණ පෑවෙමු, අපට අපේ පරණ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සතුරා, එනම් (එතෙකුත් අපට සතුරු ව සිටි) කුඕමින්තාං පක්ෂය අපේ මිත්‍රපාක්ෂිකයා වශයෙන් සිටියේ ය; (තාවකාලික වශයෙන් අපේ සතුරාගේ පෙරමුණ වී තිබුණු, එහෙත් ඉක්මනින් ම සතුරාගේ පසුමුණ වෙන්නට ත්, බොහෝ කලක් එසේ පවතින්නට ත් ඉඩ ඇති) උතුරු චීනයේ සුවිශාල ප්‍රදේශය රණ මණ්ඩලය වූයේ ය. මේ විශේෂ තත්වය තුළ, අපේ උපායමාර්ගයෙහි වෙනස්වීම අතිශයින් ම බැරෑරුම් එකක් විය. මේ විශේෂ තත්වය තුළ, අපට මුහුණ ලා සිටින සතුරාගේ වර්ගයට ත් අප ඉදිරියේ තිබෙන කර්තව්‍යයන්ට ත් ගැලපෙන්ට අපට හැකි වන සේ, අතීතයෙහි අපට සිටි නිත්‍ය හමුදාව (එහි සංවිධාන හැඟීම ත් එහි විනය ත් සම්බන්ධයෙන් නො ව) එය විසිරී සිටිමින් කරන සටන්ව්‍යාපාර සම්බන්ධයෙන් ගොරිල්ලා හමුදාවක් බවට විපර්යාස කරන්ට ත්, අතීතයේ ජංගම සංග්‍රාමය ගොරිල්ලා සංග්‍රාමය බවට විපර්යාස කරන්ට ත් අපට සිදු විය. එහෙත් මේ වෙනස්වීම, පෙනුණු හැටියට නම්, පස්සට තිබූ අඩියක් විය, එහෙයින් ඉතා දුෂ්කර විය යුතු විය. එබඳු කාලයක ඇති වෙන්ට ඉඩ තිබෙන ජපානය අඩුවෙන් තක්සේරු කරන අතට බර වෙන ගතිය සහ ජපානය ගැන නොතරම් ලෙස බිය වන අතට බර වන ගතිය යන දෙක ම කුඕමින්තාං පක්ෂය තුළ ඇත්තෙන් ම ඇති විය. කුඕමින්තාං පක්ෂය සිවිල් යුද්ධයෙන් ජාතික යුද්ධයට හැරුණු කල, ප්‍රධාන වශයෙන් එය සතුරා අඩුවෙන් තක්සේරු කළ නිසා නමුත්, (හාන් පූ-චූගේ සහ ලියූ චිගේ[23] උදාහරණයෙන් පෙනී යන පරිදි) ජපානය කෙරෙහි ඇති කර ගත් නොතරම් බිය නිසා ද අනවශ්‍ය අලාභ හානි රැසක් වින්දේ ය. අනික් අතට, අපි මේ වෙනස්වීම බොහෝ දුරට සන්සුන් ලෙස කර සිටිමු, අලාබ හානි විඳිනවා වෙනුවට, ලොකු ජයග්‍රහණ දිනාගෙන සිටිමු. හේතුව නම්, මධ්‍යම කාරකසභාව ත් ඇතැම් හමුද කාඩර්වරු ත් අතර බැරෑරුම් තර්ක විතර්ක තිබුණේ වී නමුත්, අපේ කාඩර්වරුන් අතුරෙන් විසාල වැඩිපිරිස මධ්‍යම කාරකසභාවේ නිවැරදි මගපෙන්වීම යථා කාලයෙහි පිළිගෙන, නියම තත්වය දක්ෂ ලෙස මැනගැනීම ය. මුළු එකක් වශයෙන් විරුද්දකම් පෑමේ යුද්ධය අත නැර ගෙනයාම, වර්ධනය කිරීම සහ දිනීම සඳහා ත්, එසේ ම චීන කොමියුනිස්ට් පක්ෂයේ අනාගතය සඳහා ත්, මේ වෙනස්වීම අතිශයින් ම වැදගත් බව චීනයෙහි ජාතික විමුක්ති අරගලයේ ඉරණම නිශ්චය කිරීමෙහි ලා ජපන්-විරෝධී ගොරිල්ලා සංග්‍රාමයට තිබෙන ඓතිහාසික වැදගත්කම ගැන අප කල්පනා කර බලතොත් වහා ම පෙනෙනවා ඇත. එහි සුවිශේෂ පුළුල් බව සහ දිග්ගැසුණු බව අතින්, චීනයේ ජපන්-විරෝධී ගොරිල්ලා යුද්ධය පෙරදිග පමණක් නො ව බාගවිට මිනිස්වර්ගයාගේ මුළු ඉතිහාසයෙහි ම මීට කලින් වූ එවැන්නක් නැති දෙයකි.

ජපානයට විරුද්ධ ව ගොරිල්ලා සංග්‍රාමයෙන් නිත්‍ය සංග්‍රාමයට හැරීම වන තුන්වැනි වෙනස්වීම යුද්ධයේ අනාගත වර්ධනයට අයත් ය; එය,

අනුමාන කළ හැකි ලෙස, අළුත් වටාපිටා තත්වයන් සහ අළුත් දුෂ්කරතා හට ගන්වනවා ඇත. අප දැන් එය සාකච්ඡා කිරීම උවමනා නැත.

V. ජපානයට විරුද්ධ ගොරිල්ලා සංග්‍රාමය සතු උපායමාර්ගික කොටස

මුළු එකක් වශයෙන් ජපන්-විරෝධී යුද්ධයේදී, නිත්‍ය සංග්‍රාමය ප්‍රාථමික ය, ගොරිල්ලා සංග්‍රාමය අතිරේක ය; යුද්ධයේ අවසාන ප්‍රතිඵලය තීරණය කළ හැක්කේ නිත්‍ය සංග්‍රාමයට පමණක් නිසා ය. මුළු එකක් වශයෙන් රටේ මුළු යුද්ධ ක්‍රියාවලියෙහි (ආරක්ෂාවීම, ඇණහිටීම සහ පෙරළා-පහරදීම යන) උපායමාර්ගික අවස්ථා තුනෙන්, පළමුවැන්න සහ අවසාන එක නිත්‍ය සංග්‍රාමය ප්‍රාථමික වූ ත් ගොරිල්ලා සංග්‍රාමය අතිරේක වූ ත් අවස්ථා වේ. අතරමැද අවස්ථාවේදී, සතුරා තමා අල්ලාගත් ප්‍රදේශ වල එල්ලී සිටිනවා ඇති නිසා ත්, අප පෙරළා-පහරදීමට සූදානම් වන නමුත් එය දියත් කිරීමට එතෙක් ම ලෑස්ති වී නො සිටිනවා ඇති නිසා ත්, ගොරිල්ලා සංග්‍රාමය ප්‍රාථමික සහ නිත්‍ය සංග්‍රාමය අතිරේක වෙනවා ඇත. මේ අවස්ථාව ඉතා ම දිගු එක වෙන්ට ඉඩ තිබෙන නමුත්, එය ඒ වුණත් මුළු යුද්ධයේ අවස්ථා තුනෙන් එකක් පමණකි. එහෙයින්, අප යුද්ධය මුළු එකක් වශයෙන් ගතිතොත්, නිත්‍ය සංග්‍රාමය ප්‍රාථමික ද ගොරිල්ලා සංග්‍රාමය අතිරේක ද වේ. අප විසින් මෙය තේරුම් ගතිතොත් මිස, යුද්ධයේ අවසාන ප්‍රතිඵලය තීරණය කරනවා ඇත්තේ නිත්‍ය සංග්‍රාමය බව අප විසින් පිළිගතිතොත් මිස, නිත්‍ය හමුදාවක් ගොඩනැඟීම ත් නිත්‍ය සංග්‍රාමය හැදෑරීම සහ ඊට මග පෙන්වීම ත් කෙරෙහි අප අපේ අවධානය යොමු කරතොත් මිස, ජපානය පරාජය කරන්ට අපට බැරි වෙනවා ඇත. මෙය කාරණයේ එක් අංගයකි.

ඒ එසේ වන නමුත්, යුද්ධය පවතින තාක් ගොරිල්ලා සංග්‍රාමයට ඊට අයත් උපායමාර්ගික වශයෙන් වැදගත් තැන තිබේ. ගොරිල්ලා සංග්‍රාමය නොමැතිව ද, ගොරිල්ලා සේනාංග සහ ගොරිල්ලා හමුද ගොඩනැඟීම ත් ගොරිල්ලා සංග්‍රාමය හැදෑරීම සහ ඊට මග පෙන්වීම ත් කෙරෙහි නිසි අවධානය යොමු කරන්නේ නැතිව ද, ජපානය පරාජය කරන්ට අපට එසේ ම බැරි වෙනවා ඇත. හේතුව නම්, චීනයෙන් වැඩි කොටස සතුරාගේ පසුමුණ බවට පරිවර්තනය විය හැකි හෙයින්, ඉතා ම ව්‍යාප්ත වූ ත් අත නැර ම ගෙනයන්නා වූ ත් ගොරිල්ලා සංග්‍රාමය නොමැති කල සතුරා පිටිපසින් වදින පහර ගැන බියක් නැතිව කඳවුරු බැඳගෙන තමා හොඳට සුරක්ෂිත කර ගන්නවා ඇත, පෙරමුණේ සටන් කරන අපේ ප්‍රධාන සේනාවන්ට බර හානි සිදු කරනවා ඇත, වඩ වඩා දරුණු වන පහරදීම් දියත් කරනවා ඇත යනු යි; ඒ නිසා ඇණහිටි තත්වයක් ඇති කරලීම අපට අමාරු වෙනවා ඇත,

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

විරුද්දකම් පෑමේ යුද්ධය දිගට ම ගෙන යාම ම අනතුරට පත් වෙනවා ඇත. එහෙත් කරුණු ඒ විධියට ම සිදු නො වුණ ත් අපේ පෙරළා-පහරදීම පිණිස ගොඩනගන ශක්තිය මදි වීම, පෙරළා–පහරදීම කරගෙන යන අතර අනුබල දීමේ ක්‍රියාවන් නොමැති වීම සහ, තමාට සිදු වන අලාබ හානි වල පාඩුව හරිගස්සා ගන්ට සතුරාට හැකි වීම වැනි වෙනත් අහිතකර වටාපිටා තත්වයෝ ඇති වෙනවා ඇත. මේ වටාපිටා තත්වයන් පැනනැංගොත් සහ ව්‍යාප්ත වූ ත් අතනෑර ගෙන යන්නා වූ ත් ගොරිල්ලා සංග්‍රාමය කලට වේලාවට වර්ධනය කිරීමෙන් ඒවා නො මැඩ පැවැත්තුවොත්, එවිට ද ජපානය පරාජය කිරීමට කොහෙත් ම නුපුළුවන් වෙනවා ඇත. එහෙයින්, මුළු එකක් වශයෙන් යුද්ධයෙහි ගොරිල්ලා සංග්‍රාමයට ඇත්තේ අතිරේක තැනක් වුව ද, උපාය-මාර්ගයෙහි අතිශයින් ම වැදගත් තැනක් ඊට ඇත්තේ ම ය. ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය කිරීමේදී, ගොරිල්ලා සංග්‍රාමය නො සලකා හැරීම නිසැකයෙන් ම බරපතල වරදක් වේ. මෙය කාරණයේ අනික් අංගය යි.

ලොකු රටක් තිබෙන කල, ගොරිල්ලා සංග්‍රාමය කළ හැකි ය; එහෙයින් අතීතයේදී ත් ගොරිල්ලා සංග්‍රාමය තිබුණේ ය. එහෙත් ගොරිල්ලා සංග්‍රාමය අත නෑර ගෙන ගිය හැක්කේ කොමියුනිස්ට් පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන කල පමණකි. අතීතයේදී ගොරිල්ලා සංග්‍රාමය සාමාන්‍යයෙන් ව්‍යර්ථ වූයේ ත්, වර්තමාන කාලයන්හි පමණක් සහ සිවිල් යුද්ධ කාලයේ සෝවියට් සංගමයේ ද දැන් චීනයේ ද මෙන් කොමියුනිස්ට් පක්ෂ බිහි වී තිබෙන ලොකු රටවල් වල පමණක් එය ජයග්‍රාහි විය හැක්කේ ත් ඒ නිසා ය. යුද්ධය පිළිබඳ වර්තමාන වටාපිටා තත්වයන් සහ සාමාන්‍ය තත්වය කල්පනාවට ගන්නා කල, කුඔමින්තාං පක්ෂය පෙරමුණේ නිත්‍ය සංග්‍රාමය කරගෙන යමින් ද, කොමියුනිස්ට් පක්ෂය සතුරු පේළි වලට පිටිපසින් ගොරිල්ලා සංග්‍රාමය කරගෙන යමින් ද, මේ දෙ පක්ෂය අතර පවතින ශ්‍රම භේදය අවශ්‍ය ය, නිසි ය; එය අන්‍යොන්‍ය උවමනාව, අන්‍යොන්‍ය උචිත සම්බන්ධය සහ අන්‍යොන්‍ය ආධාරය පිළිබඳ කරුණක් ය.

අපේ පක්ෂය තම යුද්ධමය උපායමාර්ගය සිවිල් යුද්ධයේ පසු වකවනුවෙහි පැවති නිත්‍ය සංග්‍රාමයේ සිට විරුද්දකම් පෑමේ යුද්ධයේ මුල් වකවනුවේදී ගොරිල්ලා සංග්‍රාමය බවට වෙනස් කිරීම කොතරම් වැදගත් සහ අවශ්‍ය වී ද යනු මෙසේ පෙනී යයි. මේ වෙනසෙන් ඇති වූ හිතකර විපාක පහත සඳහන් කරුණු දහඅටෙහි සම්පිණ්ඩනය කළ හැකි ය:

(1) සතුරු බලසේනාවන් විසින් අල්ලාගෙන තිබෙන ප්‍රදේශ අඩුවීම;

(2) අපේ බලසේනාවන්ගේ කඳවුරු ප්‍රදේශ පළල් වීම;

(3) ආරක්ෂාවීමේ අවස්ථාවේදී, සතුරා එක තැන ම හිර කර තබන සේ, නිත්‍ය පෙරමුණේ කරන සටන්–ව්‍යාපාර සමග උචිත ලෙස සම්බන්ධ වීම;

(4) ඇණහිටීමේ අවස්ථාවේදී, නිත්‍ය පෙරමුණෙහි භටකණ්ඩායම් පුහුණු කිරීම ත් ප්‍රති-සංවිධානය කිරීම ත් පහසු වන සේ, සතුරු පේළි පිටිපසින් පිහිටි කඳවුරු ප්‍රදේශ තරයේ අල්ලාගෙන සිටින්ට හැකි වීම;

(5) පෙරළා–පහරදීමේ අවස්ථාවේදී, නැති වූ භූමිප්‍රදේශ ආපසු ලබාගැනීමෙහි ලා නිත්‍ය පෙරමුණ සමග උචිත ලෙස සම්බන්ධ වීම;

(6) අපේ බලසේනාවන් ඉතා ම ඉක්මනින් සහ ඉතා ම සාර්ථක ලෙස පළල් වීම;

(7) හැම ගමක ම පක්ෂ ශාඛාවක් සංවිධානය කළ හැකි සේ, කොමියුනිස්ට් පක්ෂය ඉතා ම පුළුල් ලෙස ව්‍යාප්ත වීම;

(8) සතුරාගේ රක්ෂස්ථාන වල සිටින්නන් හැර, සතුරු පේළි පිටිපසින් සිටින සියලු ජනයා සංවිධානය කළ හැකි වන සේ බහුජන ව්‍යාපාරය ඉතා ම පළල් ලෙස වර්ධනය වීම;

(9) ජපන්–විරෝධි ප්‍රජාතන්ත්‍රවාදි දේශපාලන බල මණ්ඩල ඉතා ම ව්‍යාප්ත ලෙස පිහිටුවීම;

(10) ජපන්–විරෝධි සංස්කෘතික සහ අධ්‍යාපන වැඩ ඉතා ම පළල් ලෙස වර්ධනය වීම;

(11) ජනතාවගේ දිවිපෙවෙත ඉතා ම ව්‍යාප්ත ලෙස දියුණු වීම;

(12) සතුරු භටකණ්ඩායම් ඉතා ම සාර්ථක ලෙස කඩා බිඳ විසුරුවා යැවීම;

(13) ජනතාවගේ හැඟීම කෙරෙහි ඉතා ම ව්‍යාප්ත වූ ත් කල් පවත්නා වූ ත් ගැටීමක් ඇති වීම සහ රට මුළුල්ලේ ම චිත්තශක්තිය ප්‍රබෝධ වීම;

(14) මිත්‍ර හමුද සහ පක්ෂ තුළ ප්‍රගතියට ඉතා ම ව්‍යාප්ත රුකුලක් ලැබීම;

(15) අප අඩුවෙන් අලාබ හානි විඳිමින් වැඩියෙන් ජය ලබන සේ, සතුරා ප්‍රබල ව සහ අප දුර්වල ව සිටින තත්වයට අප ගලපා ගැනීම;

(16) සතුරා වැඩියෙන් අලාබ හානි විඳිමින් අඩුවෙන් ජය ලබන්නට සලසන සේ, චීනය විශාල ය, ජපානය කුඩා ය යන සත්‍ය කාරණයට අප ගලපා ගැනීම;

(17) නායකත්වය පිණිස කාඩර්වරුන් විශාල සංඛ්‍යාවක් ඉතා ම ඉක්මනින් සහ ඉතා ම සාර්ථක ලෙස පුහුණු කිරීම සහ,

(18) කෑම බීම පිළිබඳ ගැටළුව ඉතා ම සාර්ථක ලෙස විසඳීම.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

දීර්ඝ අරගලයේ මාර්ගයේදී ගොරිල්ලා සේනාංග සහ ගොරිල්ලා සංග්‍රාමය තිබෙන සැටියෙන් ම නො තිබෙන බවට සහ උසස් අවස්ථාවකට වර්ධනය වී, අනුක්‍රමයෙන් නිත්‍ය සේනාංග සහ නිත්‍ය සංග්‍රාමය බවට පරිණාමය වන බවට ද කිසි ම සැකයක් නැත. ගොරිල්ලා සංග්‍රාමය තුළින්, අපි අපේ ශක්තිය ගොඩනගාගෙන, ජපන් අධිරාජ්‍යවාදය තළා දැමීමෙහි ලා තීරණාත්මක සාධකයක් බවට අප හරවා ගනිමු.

VI. යුද්ධ කටයුතු හැදෑරීම කෙරෙහි මහත් අවධානය යොමු කරන්න

සතුරු හමුදු දෙකක් අතර ඇති සියලු ම ප්‍රශ්න ඒවායේ විසඳුම පිණිස යුද්ධය මත රඳා පවතී; චීනය පැවතීම හෝ නැති වීම වර්තමාන යුද්ධයේදී ඇ ජය ලැබීම හෝ පරාජය වීම මත රඳා පවතී. එහෙයින් අප විසින් යුද්ධමය න්‍යායය ත්, උපායමාර්ගය සහ උපක්‍රම ත්, හමුදු දේශපාලන වැඩ ත් හැදෑරීම මොහොතක් වත් පමා කළ නො හැකි ය. අපේ උපක්‍රම අධ්‍යයනය තවම ප්‍රමාණවත් නො වන නමුදු, යුද්ධමය වැඩ වල නිරත වී සිටින අපේ සහෝදරවරු ඉකුත් දස අවුරුද්ද තුළ බොහෝ දේ මුදුන්පත් කර ඇත; චීන තත්වයන්ගේ පදනම මත, අළුත් දේ රැසක් ඉදිරියට ගෙනවුත් ඇත; මෙහි ඇති අඩුපාඩුව නම් සාමාන්‍ය සම්පිණ්ඩනයක් කර නො තිබීම ය. එහෙත් මේ දක්වා උපායමාර්ගය පිළිබඳ ගැටළු සහ යුද්ධ න්‍යායය හදරන්නට පටන්ගෙන සිටින්නේ මිනිසුන් ටික දෙනෙක් පමණකි. අපේ දේශපාලන වැඩ පිළිබඳ අධ්‍යයනයේදී ඉස්තරම් ප්‍රතිඵල අත්පත් කරගෙන ඇත; ලබාගෙන තිබෙන අත්දැකීම් සම්භාරය අතින් ද, ඇති කර තිබෙන අළුත් විධි වල ගණන හා තත්වය අතින් ද දෙවැනි වන්නේ සෝවියට් සංගමයේ දේශපාලන වැඩ වලට පමණකි; මෙහි ද අඩුපාඩුව නම් සංශ්ලේෂණය ත් ක්‍රමානුකූලකරණය ත් ප්‍රමාණවත් නො වීම ය. යුද්ධමය දැනුම මහජනයා අතර පතුරුවා හැරීම පක්ෂයට ත් මුළු රටට ත් තිබෙන අත්‍යවශ්‍ය කර්තව්‍යයකි. දැන් අපි මේ හැම දේට ම, එහෙත් වැඩියෙන් ම යුද්ධ න්‍යායයට සහ උපායමාර්ගයට, මහත් අවධානය යොමු කළ යුත්තෙමු. අප යුද්ධමය න්‍යායය හැදෑරීම ගැන උනන්දුවක් ඇවිස්සීම ත් යුද්ධමය කරුණු හැදෑරීම කෙරෙහි මුළු සාමාජික-පිරිසේ අවධානය යොමු කරවීම ත් ඉතා ම අවශ්‍ය ය'යි මම කල්පනා කරමි.

ස ට හ න්

[1]බලන්න වී. අයි. ලෙනින්ගේ "යුද්ධය සහ රුසියන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය" (එකතු කළ කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, ප්‍රගති ප්‍රකාශකයෝ, මොස්කව්, 1964, XXIවැනි කාණ්ඩය, පිටු 27-34) "එතෙර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදි කම්කරු පක්ෂ කණ්ඩායම් වල සාකච්ඡාසභාව"

(එම පොත, පිටු 158-64), "අධිරාජ්‍යවාදි යුද්ධයේදී තමාගේ ම ආණ්ඩුවේ පරාජය" (එම පොත, පිටු 275-80), "රුසියාවේ පරාජය සහ විප්ලවවාදි අර්බුදය" (එම පොත, පිටු 378-82); 1914-15 කාලයේ ලියනලද මේ ලිපි වෙසෙසින් ඒ කාලයේ අධිරාජ්‍යවාදි යුද්ධය ගැන සාකච්ඡා කරයි. සෝවියට් සංගමයේ (බොල්ශෙවික්ස්) කොමියුනිස්ට් පක්ෂයේ ඉතිහාසය, කෙටි පාඩම්-මාලාව ද බලන්න, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. ප්‍ර. ම., මොස්කව්, 1951, පිටු 258-67.

[2]1924දී, දෙස්තර සුන් යත්-සෙන්, කොමියුනිස්ට් පක්ෂය ද විප්ලවවාදි කම්කරුවන් සහ ගොවියන් ද සමග සන්ධාන වී, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදින් හා හවුල් ව කැන්ටන් නුවර ප්‍රති-විප්ලවවාදි වැඩකටයුතු වල යෙදී සිටි කොම්ප්‍රදෝරුවන්ගේ සහ ඉඩම්හිමියන්ගේ සන්නද්ධ බලසේනාවක් වූ "වෙළඳුන්ගේ බළකාය" පරාජය කළේ ය. කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් අතර සහයෝගය පදනම කරගෙන ඇති කර තිබුණු විප්ලවවාදි හමුදව 1925 මුල් හරියේදී කැන්ටන් නුවරින් පිටත් වී ගොස්, නැගෙනහිරි යුද්ධව්‍යාපාරය ගෙනගියේ ය, ගොවියන්ගේ අනුබලය ඇති ව වෙන් චියුං-මිං නමැති යුදදෙටුවාගේ භට-කණ්ඩායම් පරාජය කළේ ය. ඉක්බිති ඒ හමුදව පෙරළා කැන්ටනයට පැමිණ, එහි කඳවුරු බැඳගෙන ආරක්ෂා වී සිටි යුන්නාන් සහ ක්වාංසි යුදදෙටුවන් පෙරළාදැමී ය. ඒ සරත් සමයෙහි එය දෙවැනි නැගෙනහිරි යුද්ධව්‍යාපාරය ගෙනගොස්, වෙන් චියුං-මිංගේ බලසේනාවන් අවසාන වශයෙන් මුල්පිය දැමී ය. කොමියුනිස්ට් පක්ෂයේ ත් කොමියුනිස්ට් තරුණ සංගමයේ ත් සාමාජිකයන් වීරවික්‍රමවත් ලෙස පෙරමුණේ ම සටන් කළ මේ යුද්ධව්‍යාපාර ක්වාංතුං පළාතේ දේශපාලන එක්සත්කම ඇති කළේ ය, උතුරු යුදගමන පිණිස මග සකස් කළේ ය.

[3]මැයි 4 ව්‍යාපාරය 1919යේ මැයි 4වැනි ද පටන් ගත් අධිරාජ්‍ය-විරෝධි, රදළ-විරෝධි විප්ලවවාදි ව්‍යාපාරයක් විය. ඒ අවුරුද්දේ මුල් භාගයේදී, 1වැනි ලෝක යුද්ධයේ ජයග්‍රාහකයෝ, එනම්, බ්‍රිතාන්‍යය, ප්‍රන්සය, එක්සත් ජනපදය, ජපානය, ඉතාලිය සහ වෙනත් අධිරාජ්‍යවාදි රටවල්, යුද්ධයේදී කොල්ලකාගත් දේ බෙද ගැනීමට පැරිස් නුවරදී හමු වී, කලින් ජර්මනිය විසින් චීනයේ ශාන්තුං පළාතෙහි බුක්තිවිඳිනලද සියලු වරප්‍රසාද ජපානයට පැවරීමට තීරණය කළහ. පීකිං නුවර ශිෂ්‍යයෝ, මැයි 4වැනි ද රැස්වීම් සහ පෙළපාලි පවත්වමින්, මේ කූට වැඩපිළිවෙලට අධිෂ්ඨාන සහගත විරෝධය පළ කළ පළමුවැන්නෝ වූහ. උතුරු යුදදෙටු ආණ්ඩුව මේ විරෝධය මර්දනය කිරීමට ප්‍රයත්න දරමින්, ශිෂ්‍යයන් තිස් දෙනකුන්ට වඩා සිරභාරයට ගත්තේ ය. ඊට විරුද්ධත්වය පළ කිරීම පිණිස, පීකිං නුවර ශිෂ්‍යයෝ වැඩ වර්ජනයක් ආරම්භ කළහ; රටේ සෙසු කොටස් වල ශිෂ්‍යයෝ ද විශාල සංඛ්‍යාවන් වශයෙන් ඊට අනුකූලතාව දැක්වූහ. ජූනි 3වැනි ද, උතුරු යුදදෙටු ආණ්ඩුව පීකිං නුවර ශිෂ්‍යයන් සමූහයා වශයෙන් සිරභාරයට ගැනීමට පටන් ගත්තේ ය; දෙ දිනක් ඇතුළත දහසක් පමණ අත්අඩංගුවට ගනු ලැබූහ. මෙයින් රට පුරා ම වඩාත් ලොකු උදහසක් ඇවිස්සිණි. ජූනි 5වැනි ද පටන්, ශැංහයි නුවර සහ වෙනත් බොහෝ නගර වල කම්කරුවෝ වැඩවර්ජනයෙහි යෙදෙන්නට වූහ; මේ ස්ථාන වල වෙළෙන්දෝ තම කඩසාප්පු වැසූහ. මෙසේ, මුලදී ප්‍රධාන වශයෙන් උගතුන් ගෙන් පමණක් සමන්විත දේශප්‍රෙමී ව්‍යාපාරයක් වූ දෙය ඉක්මනින් ම නිර්ධන-පංක්තිය, නගරබද සුළු ධනේශ්වරපංක්තිය සහ ධනේශ්වරපංක්තිය වැළඳගත් ජාතික දේශප්‍රෙමී ව්‍යාපාරයක් බවට වර්ධනය විය. මේ දේශප්‍රෙමී ව්‍යාපාරයේ වැඩීම ත් සමග ම, රදළවාදයට විරුද්ධ ව සහ විද්‍යාව ත් ප්‍රජාතන්ත්‍රවාදය ත් දියුණු කිරීම සඳහා ගෙනයන ව්‍යාපාරයක් ලෙස මැයි 4ට පෙර පටන්ගෙන තිබුණු නව සංස්කෘතික ව්‍යාපාරය ද මාක්ස්-ලෙනින්වාදය ප්‍රචාරය කිරීම ප්‍රධාන ප්‍රවාහය කරගත් වේගබලසම්පන්න විප්ලවවාදි සංස්කෘතික ව්‍යාපාරයක් බවට වැඩුණේ ය.

[4]"මැයි 30 ව්‍යාපාරය" සඳහා, බලන්න මේ පොතේ "එක ගිනිපුපුරකින් ලැව්ගින්නක් අවුළුවන්ට පුළුවනි" නමැති ලිපියේ 3වැනි සටහන; 78වැනි පිටුව.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

[5]ජේ. වී. ස්ටැලින්, ''චීනයෙහි විප්ලවයේ මතු බලාපොරොත්තු'', කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි.භා.ප්‍ර.ම., මොස්කව්, 1954, VIIIවැනි කාණ්ඩය, 379වැනි පිටුව.

[6]1894දී, දෙස්තර සුන් යත්-සෙන් හොනොලුලු දූපතේදී, ශිං චුං හුයි (චීන නවජීවන සමාජය) නම් වූ කුඩා විප්ලවවාදි සංවිධානයක් සකස් කළේ ය. 1895දී චිං ආණ්ඩුව චීන-ජපන් යුද්ධයෙන් පැරදුණු පසු, ඔහු, ජනතාව අතර වූ රහස් සමාගම් වල අනුබලය ඇති ව, චිං ආණ්ඩුවට විරුද්ධ ව ක්වංතුං පළාතෙහි සන්නද්ධ කැරලි දෙකක් ඇති කළේ ය; එකක් 1895දී කැන්ටන් නුවර ය, අනික 1900දී හුයිචව් නුවර ය.

[7](චිං ආණ්ඩුවට විරුද්ධ ව සිටි ධනේශ්වරපංක්තියේ, සුළු ධනේශ්වරපංක්තියේ සහ ඉඩම්හිමි වංශවතුන් කොටසකගේ එක්සත් පෙරමුණු සංවිධානයක් වූ) තුං මෙං හුයි හෙවත් චීන විප්ලවවාදි සමාජය, 1905දී ශිං චුං හුයි (මීට කලින් ඇති සටහන බලන්න) සහ වෙනත් කණ්ඩායම් දෙකක්, එනම්, හුආ ශිං හුයි (චීන නවජීවන සමාජය) සහ කුආං ෆු හුයි (විදේශීය වියගහ බිඳින සමාජය), එකට එකතු කිරීමෙන් පිහිටුවනු ලැබී ය. එය ''ටාටර්වරුන් (මැංචූවරුන්) පළවා හැරීම, චීනය ආපසු ලබා ගැනීම, සමූහාණ්ඩුවක් පිහිටුවීම සහ ඉඩම් අයිතිය සමාන බවට පත් කිරීම'' අනුමත කරමින් ධනේශ්වර විප්ලවය පිණිස වැඩසටහනක් ඉදිරියට දැමී ය. චීන විප්ලවවාදි සමාජය පැවති කාලයේදී, දෙස්තර සුන් යත්-සෙන්, රහස් සමාගම් සහ චිං ආණ්ඩුවේ අළුත් හමුදාවේ කොටසක් සමග සන්ධාන වී, චිං පාලනයට විරුද්ධ ව සන්නද්ධ කැරලි ගණනක් දියත් කළේ ය; 1906දී (චියාංසි පළාතේ) පිංශියාංහිදී ත් (හුනාන් පළාතේ) ලියුයාංහිදී සහ ලිලිංහිදී ත්, 1907දී (ක්වංතුං පළාතේ) හුආංකාං, චාඕචව් සහ චින්චව් යන ස්ථානයන්හිදී ත් (ක්වාංසි පළාතේ) චෙන්ආන්කුආන්හිදී ත් (දැන් කියන්නේ යූයිකුආන් ය - පරිවර්තක), 1908දී (යුන්නාන් පළාතේ) හෝකෞහිදී ත්, 1911දී කැන්ටන්හිදී ත් ඇති කළ කැරලි විශේෂ ය. අන්තිම එකට පසු ඒ අවුරුද්දේ ම වූචාං පැනනැඟීම ඇති වී, එහි ප්‍රතිඵලය වශයෙන් චිං රජපෙළපත ඇදවැටුණේ ය.

[8]1912දී, චීන විප්ලවවාදි සමාජය කුඕමින්තාං පක්ෂය බවට ප්‍රතිසංවිධානය කරනු ලැබ, යුආන් ශි-කායි ප්‍රමුඛ උතුරු යුදදෙවු පාලනය සමග සමගිසම්මුතියක් ඇති කර ගත්තේ ය. 1913දී යුආන්ගේ හටකණ්ඩායම් 1911හේ විප්ලවය පැවති කාලයේ චියාංසි, ආන්හ්වෙයි සහ ක්වංතුං යන පළාත් වල බිහි වී සිටි බලවේගයන් මඩිනු පිණිස දකුණු දෙසට ගමන් කළේ ය. දෙස්තර සුන් යත්-සෙන් සන්නද්ධ විරුද්ධකම් පෑම් සංවිධානය කළ නමුත් එය ඉක්මනින් මඩිනු ලැබී ය. 1914දී, කුඕමින්තාං පක්ෂයේ සමගිසම්මුති ප්‍රතිපත්තියේ වරද වටහාගෙන, දෙස්තර සුන්, තමාගේ සංවිධානය එකල පැවති කුඕමින්තාං පක්ෂයෙන් වෙසෙස් කරනු පිණිස, ජපානයේ ටෝකියෝ නුවරදී චුං හුආ කෝ මිං තාං (චීන විප්ලවවාදි පක්ෂය) සකස් කළේ ය. අළුත් පක්ෂය ඇත්ත වශයෙන් යුආන් ශි-කායිට විරුද්ධ සුළු ධනේශ්වරපංක්තියේ කොටසකගේ ත් ධනේශ්වරපංක්තියේ කොටසකගේ ත් දේශපාලන නියෝජිතයන්ගේ සන්ධානයක් විය. මේ සන්ධානය මගින්, දෙස්තර සුන් 1914දී ශැංහයි නුවර කුඩා කැරැල්ලක් ඇති කළේ ය. 1915දී, යුආන් ශි-කායි තමා අධිරාජයා වශයෙන් ප්‍රකාශ කර ගත් කල, ත්සායි න්ගෝ සහ වෙන අය ඔහුට විරුද්ධ ව ක්‍රියා කරනු පිණිස යුන්නාන් පළාතේ සිට නික්ම ගියහ; දෙස්තර සුන් ද මහත් උනන්දුවෙන් යුආන් ශි-කායිට සන්නද්ධ විරෝධය පෑම වෙනුවෙන් කතා කරමින් ද එය දියුණු කරන්ට වැඩ කරමින් ද සිටියේ ය.

[9]1917දී දෙස්තර සුන් යත්-සෙන් තම බලපෑම යටතේ සිටි නාවික සේනාවක් පිරිවරා ශැංහයි නුවරින් කැන්ටන් නුවරට ගියේ ය. ක්වංතුං පළාත කඳවුරු ප්‍රදේශයක් වශයෙන් පාවිච්චි කරමින් සහ උතුරු යුදදෙවුවා වූ තුආන් චි-ජුයිට විරුද්ධ ව සිටි නිරිතදිග යුදදෙවුවන් සමග සහයෝග වෙමින් ද, ඔහු තුආන් චී-ජුයිට විරුද්ධ යුද්ධ ආණ්ඩුවක් පිහිටුවී ය.

[10]1921දී දෙස්තර සුන් යත්-සෙන් ක්වාංසි පළාතේ ක්වෙයිලින්හි සිට උතුරු යුදගමනක් සැලැස්ම් කළේ ය. එහෙත් උතුරු යුදදෙවුවන් සමග සමාගම් වී සිටි ඔහුගේ දෙවැනියා වූ චෙන් චියුං-මිංගේ කැරලි ගැසීම නිසා ඔහුගේ සැලැස්ම ව්‍යර්ථ විය.

[11]කැන්ටන් නුවර අසළ වාම්පෝහි පිහිටුවා තිබුණු වාම්පෝ යුද්ධ ඇකඩමිය, දෙස්තර සුන් යත්-සෙන් විසින්, චීන කොමියුනිස්ට්වාදීන්ගේ සහ සෝවියට් සංගමයේ ආධාර ඇති ව, 1924දී පිහිටුවනු ලැබී ය. ඒ කාලයේ, එය කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් විසින් එකමුතු වී පවත්වනු ලැබී ය. එක් එක් අවස්ථාවන්හි, චෞ එන්-ලායි, සුන් තායි-යිං, ශියාඕ චු-නූ, ශියුං ශියුං සහ වෙන සහෝදරවරු මේ ඇකඩමියෙහි දේශපාලන සහ වෙනත් වැඩ කළහ. ඔව්හු විප්ලවවාදි සන්නද්ධ සේනාවන් සඳහා කාඩර්වරුන් විශාල සංඛ්‍යාවක් විප්ලවවාදි ජීවගුණයෙන් යුක්ත කොට පුහුණු කළහ; මේ කාඩර්වරුන් අතර කොමියුනිස්ට් පක්ෂයේ සහ කොමියුනිස්ට් තරුණ සංගමයේ සාමාජිකයෝ බොහෝ ගණනක් වූහ. කෙසේ වෙතත්, ඇකඩමියේ ප්‍රධානයා වූයේ චියාං කායි-ශෙක් ය. තම පදවියේ බලය පාවිච්චි කරමින්, ඔහු කොමියුනිස්ට්වාදින් පසෙකට තල්ලු කර දැමී ය, තමාගේ ම අනුගාමිකයන් ඇති කර ගත්තේ ය, අන්තිමේදී, 1927, අප්‍රේල් 12වැනි ද ප්‍රති-විප්ලවවාදි කුදෙතාවට පසු, ඇකඩමිය ප්‍රති-විප්ලවවාදි සංවිධානයක් බවට හැරවී ය.

[12]හුනාන් පළාතේ උපන් කෙනකු වූ තාන් යෙන්-කායි හාන්ලින් කෙනෙක්, එනම් චිං රජපෙළපත යටතේ උසස් ම නිල පණ්ඩිත සභාවේ සාමාජිකයෙක්, විය. ඔහු පළමුකොට ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් වෙනුවෙන් කතා කොට, ඉක්බිති 1911හේ විප්ලවයට සහභාගි වූ බඩවඩාගන්නෙක් විය. පසු ව ඔහු කුඕමින්තං පක්ෂයට ඇලී සිටීමෙන් පිළිබිඹු වූයේ හුනාන් ඉඩම්හිමියන් සහ උතුරු යුදදෙවුවන් අතර පැවති ප්‍රතිවිරෝධය යි.

[13]ප්‍රගතිශීලි පක්ෂය සමූහාණ්ඩුවේ මුල් වර්ෂයන් තුළ යුආන් ශි-කායිගේ රැකවරණ යටතේ ලියාං චි-චාඕ සහ වෙන අය විසින් සංවිධානය කරනලදී.

[14]යුආන් ශි-කායි චිං රජපෙළපතේ අවසාන වර්ෂයන්හි උතුරු යුදදෙවුවන්ගේ ප්‍රධානයා විය. චිං රජපෙළපත 1911හේ විප්ලවයෙන් පෙරළාදමනු ලැබූ පසු, ඔහු සමූහාණ්ඩුවේ ජනාධිපති ධුරය අයුත්තෙන් පැහැර ගෙන, මහ ඉඩම්හිමි පංක්තිය ත් මහ කොම්ප්‍රදෝරු පංක්තිය ත් නියෝජනය කළ උතුරු යුදදෙවුවන්ගේ පළමුවැනි ආණ්ඩුව සංවිධානය කළේ ය. ඔහු මෙය කළේ ප්‍රති-විප්ලවවාදි සන්නද්ධ බලය සහ අධිරාජ්‍යවාදීන්ගේ අනුබලය මත හේත්තු වීමෙන් සහ, එකල විප්ලවයට නායකත්වය දෙමින් සිටි ධනේශ්වරපංක්තියේ සමාදනකාමී ලක්ෂණය වාසියක් කර ගනිමින් ය. 1915දී තමා අධිරාජයා වීමට ඔහුට උවමනා විය; ඊට ජපන් අධිරාජ්‍යවාදීන්ගේ අනුබලය ලබා ගනු පිණිස, ඔහු මුළු චීනය තම තනි ග්‍රහණයට පත් කර ගැනීමට අරමුණු කරගෙන ජපානය ඉදිරිපත් කළ ඉල්ලීම් විසිඑක පිළිගත්තේ ය. ඒ අවුරුද්දේ ම දෙසැම්බර් මාසයෙහි ඔහු සිහසුන ගැනීමට විරුද්ධ ව යුන්නාන් පළාතෙහි පැනනැඟීමක් ඇති වී, යුහු ව දේශ-ව්‍යාප්ත අනුකූලතාව ත් අනුබලය ත් දිනා ගත්තේ ය. යුආන් ශි-කායි 1916 ජූනියේදී පීකිං නුවරදී මළේ ය.

[15]තුආන් චි-ජුයි යුආන් ශි-කායිගේ පරණ අතවැසියකි. උතුරු යුදදෙවුවන් අතර අන්හ්වෙයි කල්ලියේ ප්‍රධානයා වූ ඔහු, යුආන්ගේ මරණින් පසු එක් වරකට වඩා පීකිං ආණ්ඩුව ග්‍රහණය කරගෙන සිටියේ ය.

[16]සීමාන්තික දක්ෂිණ-අංශ දේශපාලන විද්‍යා කණ්ඩායම 1916දී ප්‍රගතිශීලි පක්ෂයේ කොටසක් සහ කුඕමින්තාං පක්ෂයේ කොටසක් විසින් සකස් කරනු ලැබී ය. එය ආණ්ඩුවේ පදවි අල්ලා ගැනීම පිණිස වරක් දකුණු යුදදෙවුවන්ට ද වරක් උතුරු යුදදෙවුවන්ට ද ඔටවූ අල්ලමින් සූදු කෙළීමක් කළේ ය. 1926-27 තේ උතුරු යුදගමන පවතින අතර, එහි ජපානයට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පක්ෂ සාමාජිකයෝ, එනම් හුආං පූ, වාං චුන් සහ යාං යුං-තායි වැනි අය, චියාං කායි-ශෙක් සමග හවුල් වී ක්‍රියා කරන්ට වූහ, තම ප්‍රතිගාමී දේශපාලන අත්දැකීම් පාවිච්චි කරමින්, ප්‍රති-විප්ලවවාදි පාලනයක් ගොඩනැඟීමට ඔහුට ආධාර කළහ.

[17]චීන තරුණ පක්ෂය හෝ එතාතිස්ත පක්ෂය'යි ද කියනු ලබන තරුණ පක්ෂය බියසැක නැති පැසිස්ට්වාදි දේශපාලකයන් අතලොස්සක් විසින් සකස් කරනු ලැබී ය. ඔව්හු කොමියුනිස්ට් පක්ෂයට ත් සෝවියට් සංගමයට ත් විරුද්ධ වීමෙන් තමන්ට ප්‍රති-විප්ලවවාදි බඩවඩාගැනීමේ ජීවනෝපායයන් සාදා ගත්හ; බලයෙහි සිටි විවිධ ප්‍රතිගාමී කණ්ඩායම් වලින් ද අධිරාජ්‍යවාදීන් ගෙන් ද ආධාර මුදල් ලැබූහ.

[18]සහෝදර මාඕ සේතුං මෙහිදී සඳහන් කරන්නේ ප්‍රධාන වශයෙන්, උතුරු යුදගමන පැවති කාලයේ, කොමියුනිස්ට්වාදියකු වූ සෙනෙව් යේ තිං විසින් අණ දෙනු ලැබූ ස්වාධීන රෙජමේන්තුව ගැන ය. මේ පොතේ 49වැනි පිටුවේ, "චිංකාං කඳු වල කළ අරගලය" නමැති ලිපියේ 15වැනි සටහන බලන්න.

[19]නාන්චාං පැනනැඟීම ගැන දැනගැනීමට, මේ පොතේ 171වැනි පිටුවේ, "චීනයෙහි විප්ලවවාදි යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ගැටළු" නමැති ලිපියේ 31වැනි සටහන බලන්න.

[20]සරත් අස්වනු පැනනැඟීම ගැන දැනගැනීමට, මේ පොතේ 47වැනි පිටුවේ, "චිංකාං කඳු වල අරගලය" නමැති ලිපියේ 4වැනි සටහන බලන්න.

[21]කැන්ටන් පැනනැඟීම ගැන දැනගැනීම පිණිස, මේ පොතේ 11වැනි පිටුවේ, "චීනයෙහි රතු දේශපාලන බලය පවතින්නට හැකි වන්නේ ඇයි?" නමැති ලිපියේ 8වැනි සටහන බලන්න.

[22]මේ පොතේ "චීනයෙහි විප්ලවවාදි යුද්ධයේ උපායමාර්ගය පිළිබඳ ගැටළු" නමැති ලිපිය, පිටු 80-172, සසඳා බලන්න.

[23]හාන් පූ-චූ ශාන්ටුං පළාතේ කුඕමින්තාං යුද දෙටුවෙක් විය. හෝනාන් පළාතේ චියාං කායි-ශෙක්ගේ පුද්ගලික හටකණ්ඩායම් වලට අණදීම කළ තවත් යුදදෙටුවකු වූ ලියු චි ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය ඇති වූ පසු හෝපෙයි පළාතේ පාඕතිං ප්‍රදේශය ආරක්ෂා කිරීම ගැන වගකීම භාර ව සිටියේ ය. ඒ දෙ දෙනා ම ජපන් සේනාවන් එන විට එක වෙඩිල්ලක් වත් නො තබා පළා ගියහ.

දෙවැනි කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාරය පළවා හැරීම ගැන නිගමන

1941, මැයි 8

1941, මාර්තු 18වැනි දින මධ්‍යම කාරකසභාවේ නිර්දේශය පැවසූ පරිදි ම, දෙවැනි කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාරය අවසානයකට පත් වී ඇත. එතැන් සිට සිදු වී තිබෙන්නේ ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය, දේශීය මෙන් ම ජාත්‍යන්තර වූ ත්, අළුත් වටාපිටා තත්වයන් තුළ දිගට ම ගෙනයාම ය. මේ අළුත් වටාපිටා තත්වයන්හි තිබෙන අමතර සාධක නම් අධිරාජ්‍යවාදි යුද්ධය පැතිරී යාම, ජාත්‍යන්තර විප්ලවවාදි ව්‍යාපාරය නැඟීම, සෝවියට් සංගමය සහ ජපානය අතර මධ්‍යස්ථතා ගිවිසුම[1], කුඕමින්තාං පක්ෂයේ දෙවැනි කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාරයේ පරාජය සහ, එහි විපාකය වශයෙන් කුඕමින්තාං පක්ෂයේ දේශපාලන තත්වය පිරිහීම හා කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන තත්වය නැඟීම ද, එපමණක් නො ව, චීනයට විරුද්ධ ව විශාල පරිමාණයේ අළුත් පහරදීමක් දියත් කරනු පිණිස ජපානය කරගෙන යන අළුත් ම ලකලෑස්ති කිරීම් ද, වේ. විරුද්දකම් පෑමේ යුද්ධය අත නැර ගෙන යාම පිණිස රට මුළුල්ලේ ම ජනතාව එක්සත් කිරීමේ අභිප්‍රාය උදෙසා ද, සතුරාට යටත්වීමේ අනතුර ත් මහ ඉඩම්හිමියන්ගේ සහ මහ ධනේශ්වර-පංක්තියේ කොමියුනිස්ට්-විරෝධි ප්‍රති-ප්‍රවාහය ත් දිගට ම සාර්ථක ලෙස මැඩපැවැත්වීමේ අභිප්‍රාය උදෙසා ද, නොබෝද ඇති වූ කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාරයට විරුද්ධ ව අපේ පක්ෂය කළ වීරෝදාර සහ විජයග්‍රාහි අරගලයේ පාඩම් හැදෑරීම සහ උගෙනීම ඒකාන්තයෙන් ම අවශ්‍ය ය.

1. චීනයේ ප්‍රධාන ප්‍රතිවිරෝධ දෙක අතුරෙන්, චීනය ත් ජපානය ත් අතර තිබන ජාතික ප්‍රතිවිරෝධය තවම ප්‍රාථමික ය, චීනයෙහි අභ්‍යන්තර පංක්ති ප්‍රතිවිරෝධය තවම අප්‍රධාන ය. ජාතික සතුරෙක් අපේ රට ඇතුළට ම කාගෙන ඇවිත් සිටී යන සත්‍ය කාරණය සියල්ල තීරණය කරන සුලු ය. චීනය ත් ජපානය ත් අතර ප්‍රතිවිරෝධය උග්‍ර ව පවත්නා තුරු, මුළු මහ ඉඩම්හිමි පංක්තිය ත් මහ ධනේශ්වරපංක්තිය ත් ද්‍රෝහී බවට හැරී යටත්

මේ පක්ෂ-අභ්‍යන්තර නිර්දේශය සහෝදර මාඕ සේතුං විසින් චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව සඳහා ලියනලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වුණත්, 1927තේ අප්‍රේල් 12වැනි දින සිද්ධිය[2] සහ මැයි 21වැනි දින සිද්ධිය[3] නැවත ඇති කරමින්, ඒ අවුරුද්දේ පැවති තත්වය යළි ත් ඇති කරන්ට ඔවුන්ට කිසි කලෙක බැරි ය. පළමුවැනි කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාරය[4] තවත් මැයි 21 සිද්ධියක් වශයෙන් ද, දෙවැනි ප්‍රහාරය තවත් අප්‍රේල් 12 සිද්ධියක් සහ මැයි 21 සිද්ධියක් වශයෙන් ද ඇතැම් අහෝදරවරුන් විසින් තක්සේරු කරනලදී; එහෙත් මේ තක්සේරු කිරීම වැරදි බව විෂයමූල සත්‍ය කරුණු වලින් ඔප්පු වී ඇත. මේ සහෝදරවරුන්ගේ වරද තිබෙන්නේ ප්‍රාථමික ප්‍රතිවිරෝධය ජාතික ප්‍රතිවිරෝධය බව අමතක කිරීමෙහි ය.

2. මේ වටාපිටා තත්වයන් තුළ, කුඕමින්තාං ආණ්ඩුවේ සකල ප්‍රතිපත්තිය විධානය කරන බ්‍රිතාන්‍යයට පක්ස වූ ත් ඇමරිකාවට පක්ස වූ ත් මහ ඉඩම්හිමියෝ ත් මහ ධනේශ්වරපංක්තිය ත් දෙබිඩි චරිතයක් ඇති පංක්ති වශයෙන් පවතිත්. එක් අතකින් ඔව්හු ජපානයට විරුද්ධ ය, අනික් අතින් ඔව්හු කොමියුනිස්ට් පක්ෂයට ත් කොමියුනිස්ට් පක්ෂය විසින් නියෝජනය කරනු ලබන පුළුල් බහුජන සමූහයන්ට ත් විරුද්ධ ය. ඔවුන් ජපානයට පාන විරුද්දකම ත් ඔවුන්ගේ කොමියුනිස්ට්-විරෝධය ත් යන දෙක ම දෙයාකාර ලක්ෂණයක් දරයි. ඔවුන් ජපානයට පාන විරුද්දකම සම්බන්ධයෙන්, ඔව්හු, ජපානයට විරුද්ධ ව සිටින අතර ම, උනන්දුවෙන් යුද්ධ නො කරති, උනන්දුවෙන් වොං විං-වෙයිට සහ සෙසු දේශද්‍රොහීන්ට විරුද්ධ ව වැඩ නො කරති, ඇතැම් විට ජපානයේ සාම දූතයන් සමග උකුළු මුකුළු පවා කරති. ඔවුන්ගේ කොමියුනිස්ට්-විරෝධය සම්බන්ධයෙන්, ඔව්හු, දකුණු අන්හ්වෙයි සිද්ධිය[5] ඇති කරන සහ ජනවාරි 17වැනි දින නියෝගය නිකුත් කරන තරම් දුරට ගොස් සිටින හෙයින්, කොමියුනිස්ට් පක්ෂයට විරුද්ධ ය; එහෙත් ඒ අතර ම ඔව්හු අවසාන වශයෙන් ම බිඳී යාමකට ද අකැමැති ය, මට්ටු කිරීමෙන් සහ රැවටිල්ලෙන් වැඩය කරගැනීමේ තම ප්‍රතිපත්තිය තවම ගෙන යති. මේ සත්‍ය කරුණු නොබෝද ඇති වූ කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාරයේදී යළි ත් වරක් ස්ථිර වී ඇත. අතිශයින් ම සංකීර්ණ වූ චීන දේශපාලනය අපේ සහෝදරවරුන්ගේ ඉතා ම ගැඹුරු අවධානය ඉල්ලා සිටී. බ්‍රිතාන්‍යයට පක්ස වූ ත් ඇමරිකාවට පක්ස වූ ත් මහ ඉඩම්හිමියන් සහ මහ ධනේශ්වරපංක්තිය තවම ජපානයට විරුද්දකම් පාන හෙයින් ද අපේ පක්ෂය ගැන ක්‍රියා කිරීමේදී තවම මට්ටු කිරීම ත් රැවටිල්ල ත් පාවිච්චි කරන හෙයින් ද, අපේ පක්ෂයේ ප්‍රතිපත්තිය වන්නේ ''ඔව්හු අපට යම් සේ කරත් ද ඔවුන්ට ත් එසේ ම කිරීම''[6] ය, මට්ටුවට මට්ටුව සහ රැවටිල්ලට රැවටිල්ල ය. විප්ලවවාදි දෙයාකාර ප්‍රතිපත්තිය එබඳු ය. මහ ඉඩම්හිමියන් සහ මහ ධනේශ්වරපංක්තිය සම්පූර්ණයෙන් ම ද්‍රෝහීන් බවට නො හැරෙන තුරු, අපේ මේ ප්‍රතිපත්තිය වෙනස් නො වේ.

කුඕමින්තාං පක්ෂයේ චීන-විරෝධි ප්‍රතිපත්තියට විරුද්ධ ව සටන් කිරීමට උපක්‍රම මුළු මාලාවක් ම අවශ්‍ය ය, නොසැලකිලිමත් බවක් හෝ අතපසු

කරන ගතියක් හෝ කොහෙත් ම නො තිබිය යුතු ය. ජනතාවගේ විප්ලවවාදි බලවේගයන් කෙරෙහි චියාං කායි-ශෙක් විසින් නියෝජනය වන මහ ඉඩම්හිමියන්ගේ ත් මහ ධනේශ්වරපංක්තියේ ත් වෛරය සහ කෲරභාවය ප්‍රදර්ශනය වූයේ දස අවුරුදු කොමියුනිස්ට්-විරෝධි යුද්ධයෙන් පමණක් ම නො වේ; ජපානයට විරුද්ධ ව යුද්ධය කරගෙන යද්දී දුන් කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාර දෙකෙන් ද, වෙසෙසින් දෙවැනි කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාරයේදී ඇති වූ දකුණු අන්හ්වෙයි සිද්ධියෙන් ද, ඒවා ප්‍රදර්ශනය වී ඇත. ජනතාවගේ විප්ලවවාදි බලවේගයක් චියාං කායි-ශෙක් අතින් විනාශ නො වී සිටින්ට නම්, එසේ ම තම පැවැත්ම පිළිගැනීමට ඔහුට බල කරන්ට නම්, ඔහුගේ ප්‍රති-විප්ලවවාදි ප්‍රතිපත්ති වලට විරුද්ධ ව පහරට පහර දෙන අරගලයක් කරනවා විනා වෙන කළ හැකි දෙයක් ඊට නැත. නොබෝද ඇති වූ කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාරයේදී සහෝදර ශියාං යිංගේ අවස්ථාවාදයේ[7] ප්‍රතිඵලය වශයෙන් අත්පත් වූ පරාජය මුළු පක්ෂයට ම බරපතල අනතුරු-ඇඟවීමක් විය යුතු ය. එහෙත් යුක්ති සහගත ප්‍රතිෂ්ඨාවන් මත, අපට වාසි වන සේ, ආත්ම-දමනයෙන් යුතු ව, අරගලය කරගෙන යා යුතු ය; එකී තුනෙන් එකක් වත් නැති වුව හොත්, අප ඇබැද්දි වලට භාජන වෙනවා ඇත.

4. කුඕමින්තාං ඇට්ටරයන්ට විරුද්ධ ව කරන අරගලයේදී, මහ ධනේශ්වරපංක්තිය කොම්ප්‍රදෝරු ලක්ෂණය ඇති නැති තරම් වන ජාතික ධනේශ්වරපංක්තියෙන් වෙන් කොට සැලකිය යුතු ය, ඉතා ම ප්‍රතිගාමී මහ ඉඩම්හිමියෝ ප්‍රබුද්ධ වංශවත් පෙළැන්තියෙන් සහ සාමාන්‍ය ගණයේ ඉඩම්හිමියන් ගෙන් වෙන් කොට සැලකිය යුතු ය. මෙය අතරමැද කොටස් අපේ පැත්තට දිනා ගැනීමට සහ ''තුනෙන් එකේ පංගු ක්‍රමය''[8] උඩ දේශපාලන බල මණ්ඩල පිහිටුවීමට අපේ පක්ෂය දරන ප්‍රයත්නයේ න්‍යායාත්මක පදනම වේ; එය ගිය අවුරුද්දේ මාර්තු මාසයේ සිට මධ්‍යම කාරකසභාව විසින් යළි යළි ත් අවධාරණය කර ඇත. එහි නිවැරදිබව නොබෝද ඇති වූ කොමියුනිස්ට්-විරෝධි ප්‍රහාරයේදී අළුතෙන් ඔප්පු විය. අපේ නොවැම්බර් 9වැනි දින විදුලි සංදේශයෙහි[9] ප්‍රකාශ කළ පරිදි, දකුණු අන්හ්වෙයි සිද්ධියට කලින් අප ගත් මග ඒ සිද්ධියට පසු අප දේශපාලන වශයෙන් පෙරළා-පහරදීමට මාරු වීම පිණිස මුළුමනින් ම අවශ්‍ය විය; නො එසේ නම්, අපට අතරමැද කොටස් අපේ පැත්තට දිනාගන්ට බැරි වෙන්ට ඉඩ තිබුණි. අත්දැකීම් මගින් ඔවුන්ට නැවත නැවත ත් උගන්වා තිබුණු නිසා මිස, අපේ පක්ෂය කුඕමින්තාං ඇට්ටරයන්ට විරුද්ධ ව ස්ථිර අරගල කළ යුත්තේ මන්ද, සමගිය ඇති කළ හැක්කේ අරගලය තුළින් පමණක් වන්නේ මන්ද, අරගලය අත හැර දැමුවොත් කිසි ම සමගියක් තිබිය නො හැකි වන්නේ මන්ද කියා තේරුම් ගන්ට අතරමැද කොටස් වලට නුපුළුවන් වෙන්ට ඉඩ තිබුණි. ප්‍රාන්තික බල කණ්ඩායම් වල නායකත්වයේ සිටින කොටස් මහ ඉඩම්හිමි පංක්තියට සහ මහ ධනේශ්වරපංක්තියට අයත් වන නමුදු, සාමාන්‍යයෙන් ඔවුන්ට ද අතරමැද

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොටස් වශයෙන් සලකා සංග්‍රහ කළ යුතු ය; ඔවුන් ද මධ්‍යම ආණ්ඩුව ග්‍රහණය කරගෙන සිටින මහ ඉඩම්හිමියන් සහ මහ ධනේශ්වරයන් ද අතර ප්‍රතිවිරෝධයන් තිබෙන නිසා ය. පළමුවැනි කොමියුනිස්ට්-විරෝධී ප්‍රහාරයේදී ඉතා ම උනන්දුවෙන් වැඩ කළ යෙන් ශි-ශාන් දෙවැන්නේදී ඉද පැත්තට ම නැතිව සිටියේ ය; පළමුවැනි ප්‍රහාරයේදී දෙ පැත්තට ම නැතිව සිටි ක්වාංසි කල්ලිය දෙවැන්නේදී කොමියුනිස්ට්-විරෝධී පැත්ත ගෙන පැමිණියේ වී නමුත්, ඒ කල්ලිය තවම ත් චියාං කායි-ශෙක් කල්ලිය සමග ප්‍රතිවිරෝධයෙහි සිටී, ඒ කල්ලිය ත් මේ කල්ලිය ත් එක ම ය'යි සැලකිය යුතු නො වේ. මෙය සෙසු ප්‍රාන්තික බල කණ්ඩායම් වලට ඊට ත් වඩා බලවත් ලෙස යෙදේ. එසේ ද වුව, අපේ සහෝදරවරු බොහෝ දෙනා තවම ත්, මුළු ඉඩම්හිමි පංක්තිය ත් ධනේශ්වරපංක්තිය ත් දකුණු අන්හ්වෙයි සිද්ධියට පසු ද්‍රෝහී බවට හැරී සිටින්නා සේ, විවිධ ඉඩම්හිමි සහ ධනේශ්වර කණ්ඩායම් එක ගොඩට දමා සලකති; මෙය චීනයේ සංකීර්ණ දේශපාලනය පමණට වඩා සරල කොට සැලකීමක් වේ. අප මේ මතය පිළිගෙන, සියලු ම ඉඩම්හිමියන් සහ ධනේශ්වර පංක්තිය කුඕමින්තාං ඇට්ටරයන් හා එක් කොට සැලකුව හොත් අප අප ම තනි කර ගන්නවා ඇත. චීන සමාජය මැදින් ලොකු බව සහ දෙ කොණින් කුඩා බව[10] ත්, කොමියුනිස්ට් පක්ෂය අතරමැද පංක්ති වල සමූහයන් තම පැත්තට දිනා ගත්තොත් මිස, ඔවුන්ගේ වටාපිටා තත්වයන්ට අනුව ඔවුන්ට අයත් නිසි කොටස රහපාන්ට ඔවුන්ට ඉඩ සලසා දුන්නොත් මිස, චීනයේ ප්‍රශ්න විසඳන්ට කොමියුනිස්ට් පක්ෂයට බැරි බව ත් තේරුම් ගත යුතු ය.

5. ඇතැම් සහෝදරවරුන් චීනය ත් ජපානය ත් අතර ප්‍රතිවිරෝධය ප්‍රාථමික ප්‍රතිවිරෝධය වේ යන සත්‍ය කාරණය ගැන දෙගිඩියාවෙන් පසු වී සිටින නිසා ද, එහෙයින් ඔවුන් චීනයෙහි පංක්ති සබඳකම් වැරදි ලෙස තක්සේරු කර ඇති නිසා ද, ඔව්හු ඇතැම් විට පක්ෂයේ ප්‍රතිපත්තිය ගැන දෙගිඩියාවෙන් පසු වී සිටිති. දකුණු අන්හ්වෙයි සිද්ධිය අප්‍රේල් 12 සිද්ධිය ත් මැයි 21 සිද්ධිය ත් යළි ත් සිදුවීමකි යන ඔවුන්ගේ තක්සේරුවෙන් පටන් ගෙන ඉදිරියට යමින්, ගිය අවුරුද්දේ දෙසැම්බර් 25වැනි දින මධ්‍යම කාරක-සභාවේ ප්‍රතිපත්ති නිර්දේශය තව දුරට ත් යෙදෙන්නේ නැතැ'යි, නැතහොත් යටත්පිරිසෙයින් සම්පූර්ණයෙන් ම නම් යෙදෙන්නේ නැතැ'යි මේ සහෝදර-වරුන් දූන් සිතන්නාක් සේ පෙනෙයි. විරුද්දකම් පෑම ත් ප්‍රජාතන්ත්‍රවාදය ත් වෙනුවෙන් නැඟී සිටින සියලු දෙනා ම ඇතුළත් කර ගන්නා වර්ගයේ රාජ්‍ය බලයක් අපට තව දුරට ත් උවමනා නැතැ'යි ද, උවමනා කරන්නේ කම්කරු-වන්ගේ, ගොවියන්ගේ සහ සුළු ධනේශ්වරපංක්තියේ රාජ්‍ය බලය කියන දෙයක් ය'යි ද, විරුද්දකම් පෑමේ යුද්ධ වකවනුවට අයත් එක්සත් පෙරමුණු ප්‍රතිපත්තිය අපට තව දුරට ත් උවමනා නැතැ'යි ද, උවමනා කරන්නේ දස අවුරුදු සිවිල් යුද්ධ කාලයේදී මෙන් ඉඩම් ලබාගැනීමේ විප්ලවය පිළිබඳ

ප්‍රතිපත්තියක් ය'යි ද ඔව්හු විශ්වාස කරති. පක්ෂයේ නිවැරදි ප්‍රතිපත්තිය මේ සහෝදරවරුන්ගේ සිත් වල, අඩු ගණනේ දැනට වත්, අඳුරු බවට පත් වී ඇත.

6. කුඕමින්තාං පක්ෂය විසින් ඇති කරන්ට ඉඩ තිබෙන භේදයක් ගැන, ඒ කියන්නේ, වෙන්නට ඉඩ තිබෙන නරක ම දේ ගැන, සූදානමින් සිටින්නට ය'යි අපේ පක්ෂයේ මධ්‍යම කාරකසභාව මේ සහෝදරවරුන්ට උපදෙස් දුන් විට, වෙන්නට ඉඩ තිබෙන අතික් දේ ඔවුන්ට අමතක විය. වෙන්නට ඉඩ තිබෙන නරක ම දේ ගැන සූදානම් වීම ඒකාන්ත වශයෙන් ම අවශ්‍ය වන අතර, වෙන්නට ඉඩ තිබෙන හිතකර දේ නො තකා හැරීම එයින් අදහස් නො වන බව ඔවුන්ට නො තේරේ; එසේ නො වෙනවා පමණක් නො ව, නරක ම දේ සඳහා එසේ සූදානම් වීම වෙන්නට ඉඩ තිබෙන හිතකර දේ ඇති කර ලීම ත් ඒවා සත්තාව බවට හැරවීම ත් පිණිස හේතු වන කාරණයක් වන්නේ ය. මේ අවස්ථාවෙහි, අපි කුඕමින්තාං පක්ෂය විසින් ඇති කරන භේදයකට විරුද්ධ ව සම්පූර්ණයෙන් සූදානම් වී සිටියෙමු;, එහෙයින් කුඕමින්තාං පක්ෂය සැහැල්ලු ලෙස භේදයක් ඇති කරන්ට එඩිතර නො වී ය.

7. ජාතික සටනේ සහ පංක්ති සටනේ ඒකීයභාවය තේරුම් ගන්ට අසමත් වන්නා වූ ත්, එක්සත් පෙරමුණු ප්‍රතිපත්තිය සහ පංක්ති ප්‍රතිපත්තිය තේරුම් ගන්ට අසමත් වන්නා වූ සහ එහි විපාකය වශයෙන් එක්සත් පෙරමුණු අධ්‍යාපනයේ සහ පංක්ති අධ්‍යාපනයේ ඒකීයභාවය තේරුම් ගන්ට අසමත් වන්නා වූ ත් සහෝදරවරු ඊට ත් වඩා සිටිති. දකුණු අන්හ්වෙයි සිද්ධියට පසු විශේෂයෙන් අවධාරණය කළ යුත්තේ එක්සත් පෙරමුණු අධ්‍යාපනයට වෙනස් වූ පංක්ති අධ්‍යාපනය ය'යි යන මතය ඔව්හු දරති. මහ ඉඩම්හිමි පංක්තියට සහ මහ ධනේශ්වරපංක්තියට අයිති අය වුව ත්, නැතහොත් අතරමැද පංක්තියට අයිති අය වුව ත්, තවම ජපානයට විරුද්දකම් පාමින් සිටින ඉහළ සහ මැද සමාජ-තට්ටු වලට අයිති සියල්ලන් කෙරෙහි ජපන්-විරෝධී යුද්ධයේ මුළු වකවනුව ම සඳහා පක්ෂයට තිබෙන්නේ එක ම එක අඛණ්ඩ ප්‍රතිපත්තියක් බව — එනම්, සමගිය සහ අරගලය යන අංග දෙක සමස්ත කරන (දෙයාකාර ප්‍රතිපත්තියක් වන) ජාතික එක්සත් පෙරමුණු ප්‍රතිපත්තිය බව — දූන් පවා ඔවුන්ට නො වැටහේ. මේ දෙයාකාර ප්‍රතිපත්තිය, අප විසින් නිර්දය ලෙස තළා දැමිය යුතු කොහෙත් ම පසුතැවිලි නො වන අය හැර, රූකඩ හටයන්ට, දේශද්‍රෝහීන්ට සහ ජපානයට පක්ෂ කොටස් වලට පවා යෙදිය යුතු ය. අපේ පක්ෂය ස්වකීය සාමාජිකයන් අතර ත් පොදුවේ ජනතාව අතර ත් ගෙනයන අධ්‍යාපනය මේ අංග දෙක ම වැළඳගනී; ඒ කියන්නේ මෙය යි: එය ජපානයට විරුද්දකම් පෑම පිණිස ධනේශ්වරපංක්තියේ ත් ඉඩම්හිමි පංක්තියේ ත් විවිධ තට්ටු සමග විවිධ අයුරින් එක්සත් වන්නේ කෙසේ ද කියා ත්, ඒ අතර ම ඔවුන් යම් පමණකට සතුරා සමග සමගිසම්මුතියට එළඹෙත් ද, වැනෙන සුලු වෙත් ද, කොමියුනිස්ට්-විරෝධී වෙත් ද, එපමණකට ඔවුන්ට විරුද්ධ ව අරගල කරන්නේ කෙසේ ද කියා ත් නිර්ධනපංක්තියට සහ ගොවිජනතාවට ත් සුළු ධනේශ්වරපංක්තියේ සෙසු

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

කොටස් වලට ත් උගන්වයි. එක්සත් පෙරමුණු ප්‍රතිපත්තිය පංක්ති ප්‍රතිපත්තිය ම යි; ඒ දෙක වෙන් කළ නො හැකි ය; මේ කරුණ පැහැදිලි ව නො වැටහෙන කවරකුට වේවා වෙන බොහෝ ප්‍රශ්න ද පැහැදිලි ව නො වැටහෙනවා ඇත.

8. ශෙන්සි-කාන්සු-නිංසියා දේශසීමා ප්‍රාන්තයේ ත් උතුරු සහ මැද චීනයේ ජපන්-විරෝධී කඳවුරු ප්‍රදේශ වල ත් සමාජ ලක්ෂණය දැනට ම නව-ප්‍රජාතන්ත්‍රවාදී බව වෙනත් සහෝදරවරුන්ට නො වැටහේ. කිසියම් ප්‍රදේශයක් ලක්ෂණයෙන් නව-ප්‍රජාතන්ත්‍රවාදී ද කියා නිශ්චය කරන්නට තිබෙන ප්‍රධාන මිනුම්-දණ්ඩ එහි ජනතාව අතර පුළුල් සමූහයන්ගේ නියෝජිතයෝ දේශපාලන බලයට සහභාගී වෙත් ද, මේ දේශපාලන බලය කොමියුනිස්ට් පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන්නේ ද යන්න ය. එහෙයින්, කොමියුනිස්ට් නායකත්වය යටතේ පවතින එක්සත් පෙරමුණු දේශපාලන බලය නව-ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ප්‍රධාන සලකුණ වේ. නව ප්‍රජාතන්ත්‍රවාදය මුදුන්පත් වී ඇතැ'යි සැලකිය හැකි වන්නේ දස අවුරුදු සිවිල් යුද්ධයේදී තිබුණාක් වැනි ඉඩම් ලබාගැනීමේ විප්ලවයක් ඇතොත් පමණකි'යි සමහර අය කල්පනා කරති; එහෙත් ඔවුන්ගේ කල්පනාව වැරදි ය. දැනට කඳවුරු ප්‍රදේශ වල තිබෙන දේශපාලන ක්‍රමය (ජපානයට) විරුද්දකම් පෑමට සහ ප්‍රජාතන්ත්‍රවාදයට පක්ස සියලු දෙනාගේ එක්සත් පෙරමුණේ දේශපාලන ක්‍රමයකි, අර්ථක්‍රමය අර්ධ-විජිතවාදයේ ත් අර්ධ-රදළවාදයේ ත් ප්‍රධාන කොටස් මූලික වශයෙන් ඉවත් කර තිබෙන අර්ථක්‍රමයකි, සංස්කෘතිය ජනතාව අතර පුළුල් සමූහයන්ගේ අධිරාජ්‍ය-විරෝධී, රදළ-විරෝධී සංස්කෘතියකි. එහෙයින්, දේශපාලන වශයෙන් බැලුවත්, ආර්ථික වශයෙන් බැලුවත්, සංස්කෘතික වශයෙන් බැලුවත්, බදු සහ පොලී අඩු කිරීම පමණක් ක්‍රියාවේ යොදා තිබෙන ජපන්-විරෝධී කඳවුරු ප්‍රදේශ ද අනූන ඉඩම් ලබාගැනීමේ විප්ලවයක් තුළින් ගොස් තිබෙන ශෙන්සි-කාන්සු-නිංසියා දේශසීමා ප්‍රාන්තය ද යන දෙක ම ලක්ෂණයෙන් නව-ප්‍රජාතන්ත්‍රවාදී වේ. ජපන්-විරෝධී කඳවුරු ප්‍රදේශ වල ආදර්ශය රට පුරා ම ව්‍යාප්ත කරනු ලැබූ කල, එවිට මුළු චීනය ම නව-ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් බවට පත් වෙනවා ඇත.

ස ට හ න්

[1]1941, අප්‍රේල් 13වැනි දින නිමවනලද සෝවියට් සංගමය ත් ජපානය ත් අතර මධ්‍යස්ථතා ගිවිසුම සෝවියට් සංගමයේ නැගෙනහිරි දේශසීමාවෙහි සාමය සහතික කළේ ය; එසේ සෝවියට් සංගමයට ඒකාබද්ධ ජර්මන්, ඉතාලි සහ ජපන් ප්‍රහාරයක් දෙන්නට කළ කුමන්ත්‍රණය බිඳිනු ලැබී ය. එය සෝවියට් සංගමයේ සාමකාමී විදේශ ප්‍රතිපත්තියට ලැබුණු ප්‍රධාන ජයග්‍රහණයක් විය.

[2]අප්‍රේල් 12වැනි දින සිද්ධිය යනු 1927, අප්‍රේල් 12වැනි ද ශැංහයි නුවරදී චියාං කායි-ශෙක් විසින් කරලිබස්සවනලද ප්‍රති-විප්ලවවාදී කුදෙතාවයි; මේ කුමන්ත්‍රණයේදී කොමියුනිස්ටවාදියෝ ද විප්ලවවාදී කම්කරුවන්, ගොවියන්, ශිෂ්‍යයන් සහ උගත්තු ද මහත් සංඛ්‍යාවක් සමූහඝාතනය කරනලදහ.

[3]මැයි 21වැනි දින සිද්ධිය ගැන දැනගැනීම පිණිස, මේ පොතේ 49වැනි පිටුවෙ, ''චිංකාං කඳු වල අරගලය'' නමැති ලිපියේ 17වැනි සටහන බලන්න.

[4]ජපන්-විරෝධී යුද්ධය පවතින අතර පළමුවැනි කොමියුනිස්ට්-විරෝධී ප්‍රහාරය චියාං කායි-ශෙක් විසින් ගෙනගියේ 1939 සීතසෘතුවේදී සහ 1940 වසන්තයේදී ය.

[5]1941 ජනවාරියේදී, චීන කොමියුනිස්ට් පක්ෂය විසින් නායකත්වය දෙනලද අළුත් සිවවැනි හමුදාවේ මූලස්ථානය ත්, කෙළින් ම මේ මූලස්ථානයේ විධානය යටතේ සිටි සේනාංග ත්, චියාං කායි-ශෙක් විසින් ඉල්ලා සිටි පරිදි, යැංසී ගඟ තරණය කරනු පිණිස දකුණු අන්හ්වෙයි පළාතේ සිට උතුරට ගමන් කළේ ය. ගමන් කරමින් සිටියදී, ඔවුහු චියාං කායි-ශෙක්ගේ හටකණ්ඩායම් විසින් වට කොට, සැහවී සිට පහර දෙනු ලැබූහ; මිනිසුන් 9000කට වැඩි ගණනක් මරනු ලැබූහ, තුවාල කරනු ලැබූහ, අල්ලාගනු ලැබූහ. අනතුරු ව චියාං කායි-ශෙක් අළුත් සිවවැනි හමුදාවේ නිල නාමය අවලංගු කළ බව ප්‍රකාශ කොට, එහි සෙසු සේනාංග වලට පහර දෙන්ට අණ දුන්නේ ය. මේ සිද්ධිය දකුණු අන්හ්වෙයි සිද්ධිය'යි කියනු ලැබී ය.

[6]මේ පාඨය උපුටාගෙන තිබෙන්නේ සුං රජපෙළපත් කාලයේ විසූ දර්ශනිකයකු වූ චූ ශී (1130-1200) විසින් මධ්‍යස්ථභාවය පිළිබඳ කොන්ෆියුසියස් ධර්මය ගැන ලියා තිබෙන අටුවාවේ, 13වැනි පරිච්ඡේදයෙනි.

[7]දකුණු අන්හ්වෙයි සිද්ධිය ඇති වූ කාලයේ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ ගිනිකොන්දිග බියුරෝ මණ්ඩලයේ ලේකම් ව සිටි සහෝදර ශියාං යිං ජපන්-විරෝධී ජාතික එක්සත් පෙරමුණ පිළිබඳ ප්‍රශ්නය ගැන බලවත් දක්ෂිණවාදී මත ඇතිව සිටියේ ය. ඔහු මධ්‍යම කාරකසභාවේ ප්‍රතිපත්ති ස්ථිර ලෙස ක්‍රියාත්මක නො කළේ ය. ඔහු බහුජනයා සම්පූර්ණයෙන් ප්‍රබුද්ධ කරන්නට, නිදහස් ප්‍රදේශ ව්‍යාප්ත කරන්නට සහ ජපනුන් අල්ලාගෙන සිටි ප්‍රදේශ වල ජනතාවගේ සන්නද්ධ බලසේනාවන් පළල් කරන්නට බිය විය, වදින්නට තිබුණු කුඕමින්තාං පක්ෂයේ ප්‍රතිගාමී ප්‍රහාරයේ බරපතලකම ප්‍රමාණවත් පරිදි වටහා නො ගත්තේ ය; එහෙයින් මානසික වශයෙන් සහ සංවිධානාත්මක වශයෙන් ඊට සූදානම් ව නො සිටියේ ය. 1940, මැයි 4වැනි ද, සහෝදර මාඕ සේතුං, මධ්‍යම කාරකසභාව වෙනුවෙන්, ''ජපන්-විරෝධී බලසේනාවන් නිදහසේ පළල් කරන්න, කොමියුනිස්ට්-විරෝධී ඇට්ටරයන්ගේ ප්‍රහාරයට විරුද්දකම් පාන්න'' යන නිර්දේශය ලීවේ ය (බලන්න මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං, 1965, IIවැනි කාණ්ඩය, පිටු 431-36). මේ නිර්දේශය ගිනිකොන්දිග බියුරෝ මණ්ඩලයට ලැබුණු කල, බියුරෝ සාමාජිකයකු සහ අළුත් සිවවැනි හමුදාවේ Iවැනි බළඇණියේ අණදෙන්නා වී සිටි සහෝදර චෙන් යී වහා ම එය ක්‍රියාත්මක කළේ ය; එහෙත් සහෝදර ශියාං යිං එය ක්‍රියාවේ යොදන්නට අකැමති විය. ඔහු දිගට ම කුඕමින්තාං පක්ෂයේ ප්‍රහාරයට මුහුණ දීම පිණිස කිසි ම සූදානමක් නො කර සිටියේ ය; එහෙයින් 1941 ජනවාරියේදී චියාං කායි-ශෙක් දකුණු අන්හ්වෙයි සිද්ධිය කරලිබැස්සවූ කල ශියාං යිං යටතේ සිටි බලසේනාවෝ බලයෙන් තොර වූහ. අපේ මිනිස්සු නව දහසක් දකුණු අන්හ්වෙයි පළාතේදී මුලසුන් කරනලදහ, සහෝදර ශියාං යිං ද මරනු ලැබී ය.

[8]''තුනෙන් එකේ පංගු ක්‍රමය'' ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලයේ නිදහස් ප්‍රදේශ වල එක්සත් පෙරමුණු දේශපාලන බල මණ්ඩල සඳහා චීන කොමියුනිස්ට්

LIBERATIONBASE

පක්ෂයේ ප්‍රතිපත්තිය විය; මේ ප්‍රතිපත්තිය අනුව, ජපන්-විරෝධී ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මණ්ඩල වලට පත් කළ නියෝජිතයන්ගේ සමානුපාතය කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන් සඳහා එක් පංගුවක් ද, වාමාංශික ප්‍රගතිශීලීන් සඳහා එක් පංගුවක් ද, මැද කොටස් සහ අන්‍යයන් සඳහා එක් පංගුවක් ද වශයෙන් දළ වශයෙන් තුනෙන් එක් පංගුව බැගින් විය.

[9]1940, නොවැම්බර් 9වැනි දින විදුලිසංදේශය යවනලද්දේ, හෝ යිං-චින් සහ පායි චුං-ශි නමැති කුඕමින්තාං සෙනෙවියන්ගේ 1940, ඔක්තෝබර 19වැනි දින විදුලිසංදේශයට පිළිතුරු වශයෙන්, දහඅටවැනි කණ්ඩායම් හමුදාවේ (අටවැනි මාර්ග හමුදාවේ) ප්‍රධාන අණදෙන්නා සහ නියෝජ්‍ය ප්‍රධාන අණදෙන්නා වූ චූ තේ සහ පෙං තේ-හුආයි ද, අළුත් සිව්වැනි හමුදාවේ අණදෙන්නා සහ නියෝජ්‍ය අණදෙන්නා වූ යේ තිං සහ ශියාං යිං ද විසිනි. කොමියුනිස්ට් පක්ෂයට පහර දීමට සහ ජපානයට යටත් වීමට කුඕමින්තාං ප්‍රතිගාමීන් කරන කුමන්ත්‍රණය එළිදරව් කරමින්, ඔව්හු අළුත් සිව්වැනි හමුදාව ත් අටවැනි මාර්ග හමුදාව ත් කහ ගඟෙහි දකුණේ සිට උතුරට තැන් මාරු කළ යුතු ය'යි හෝ යිං-චින් සහ පායි චුං-ශි කළ විකාර යෝජනාව හෙළා දුටුවෝ ය. කෙසේ වෙතත්, ජපානයට විරුද්ධ ව සමගිය පවත්වා ගැනීම උදෙසා සමාදානයට සහ සමගි සම්මුතියට කැමති වීමේ ජීවගුණයකින් යෙදී, ඔව්හු, කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් අතර නො විසඳී පැවති ප්‍රධාන ප්‍රශ්න ගණනක් විසඳීමට ඉල්ලා සිටින අතර ම, තම බලසේනාවන් යැංසී ගඟෙහි දකුණේ සිට උතුරට තැන් මාරු කිරීමට එකඟ වූහ. මේ විදුලිසංදේශය අතරමැද කොටස් වල අනුකූලතාව දිනා ගත්තේ ය, චියාං කායි-ශෙක් තනි කරන්නට උපකාරවත් විය.

[10]චීන සමාජය ගැන සහෝදර මාඕ සේතුංගේ මේ කියමනේ තේරුම විප්ලවයට නායකත්වය දුන් චීන කර්මාන්තමය නිර්ධනපංක්තිය, ප්‍රතිගාමී මහ ඉඩම්හිමියන් සහ මහ ධනේශ්වරපංක්තිය මෙන් ම, චීනයේ ජනගහණයෙන් සුළු පිරිසක් පමණක් වූ බව ය.

IIවැනි ලෝක යුද්ධයෙහි හැරෙන තැන

1942, ඔක්තෝබර 12

ස්ටැලින්ග්රැඩ් සටන බ්‍රිතාන්‍ය සහ ඇමරිකන් පුවත්පත් විසින් වර්ඩන් සටන හා සසඳා ඇත; ''රතු වර්ඩන්'' දැන් ලොව පුරා පතළ ය. මේ සැසඳීම කොහෙත් ම සුදුසු නො වේ. ස්ටැලින්ග්රැඩ් සටන ස්වභාවය අතින් Iවැනි ලෝක යුද්ධයේදී කළ වර්ඩන් සටනට වෙනස් ය. එහෙත් ඒවාට පොදු වූ දෙයක් ද ඇත — එනම්, එකල මෙන් දැන් ද, බොහෝ දෙනා ජර්මනියට යුද්ධය දිනන්ට තවම පුළුවන් ය'යි සිතීමට ජර්මන් පහරදීම මගින් නොමග යවනු ලැබ සිටිති යන්නයි. Iවැනි ලෝක යුද්ධය 1918වේ සීතසෘතුවේදී අවසන් වීමට දැවුරුද්දකට පෙර, 1916දී ජර්මන් බලසේනාවෝ වර්ඩන්හි ප්‍රන්ස බලකොටුවට ප්‍රහාර කීපයක් ම දියත් කළහ. වර්ඩන්හි ප්‍රධාන අණදෙන්නා වූයේ ජර්මන් ඔටුන්න හිමි කුමාරයා ය; සටනට යවනලද බලසේනාවෝ ජර්මන් හමුදාවේ ඉස්තරම් ම කොටස වූහ. සටන තීරණාත්මක වැදගත්කමකින් යුක්ත විය. රුදුරු ජර්මන් වේගවත් ප්‍රහාරයන් ව්‍යර්ථ වූ පසු, මුළු ජර්මන්–ඔස්ට්‍රියන්–තුර්කි–බුල්ගේරියානු පිලට අනාගතයක් නැති විය; එතැන් සිට ඒ පිලේ දුෂ්කරතා වැඩි වෙන්ට විය, එය එහි අනුගාමිකයන් විසින් අත් හරිනු ලැබී ය, එය කැඩී බිඳී විසිරී ගොස්, අන්තිමේදී ඇද වැටුණි. එහෙත් ඒ කාලයේ, ඉංග්‍රීසි–ඇමරිකන්–ප්‍රන්ස පිල, ජර්මන් හමුදාව තවම ඉතා බලවත් ය'යි විශ්වාස කරමින්, මේ තත්වය තරයේ වටහා නො ගත්තේ ය; ඔව්හු තමන්ගේ ජයග්‍රහණය ළං ළං ව එන බව නො දත්හ. ඉතිහාසීය වශයෙන්, විනාශ වීමට ළං වී සිටින සියලු ප්‍රතිගාමී බලවේගයෝ එක්වැනිව ම විප්ලවවාදී බලවේගයන්ට විරුද්ධ ව අවසාන වියරු අරගලයක් කරති; ඇතැම් විප්ලවවාදියෝ, තමන් ජයග්‍රහණය කරා ළඟා වමින් සිටින අතර සතුරා අභාවයට කිට්ටු වමින් සිටී යන අවශ්‍ය සත්‍ය කාරණය වටහාගැනීමට අසමත් ව, පිටතින් ශක්තිය නමුත් ඇතුළතින් දුර්වලත්වය පිළිබඳ මේ ප්‍රපංචය විසින් කලකට මුළා කරනු ලබන සුලු වෙති. පැසිස්ට්වාදයේ බලවේගයන්ගේ නැඟීම ත් ඔවුන් විසින් අවුරුදු කීපයක් තිස්සේ කරගෙන යන ආක්‍රමණ යුද්ධය ත් එබඳු අවසාන වියරු

මේ කතුවැකිය සහෝදර මාඕ සේතුං විසින් යෙන්ආන් නුවර විමුක්ති දිනපතා පුවත්පත සඳහා ලියනලදී.

LIBERATION BASE

https://liberationbase.wordpress.com

අරගලයක් ප්‍රකාශයට පත්වීම ම වේ; මේ වර්තමාන යුද්ධයේදී ස්ටැලින්ග්‍රැඩ් නගරයට දුන් ප්‍රහාරය පැසිස්ට්වාදයේ ම අවසාන වියරු අරගලය ප්‍රකාශයට පත්වීම වේ. ඉතිහාසයෙහි මේ හැරෙන තැනදී ත්, ලෝක පැසිස්ට්-විරෝධී පෙරමුණේ සිටින බොහෝ අය පැසිස්ට්වාදයේ රුදුරු පෙනුමෙන් මුළාවට පත් වී, එහි හරය දක්නට අසමත් වී සිටිති. මුළු ජර්මන් බලසේනාව ඩොන් නදියේ වංගුව පැන, ස්ටැලින්ග්‍රැඩ් නගරයට මුළු වෙර යොදා දුන් ප්‍රහාරය පටන් ගත් අගෝස්තු 23වැනි ද සිට, ජර්මන් සේනාංග සමහරක් නගරයේ වයඹදිග කොටසේ කර්මාන්ත දිස්ත්‍රික්කය තුළට කඩා වැදුණු සැප්තැම්බර් 15වැනි ද තුළින්, රතු හමුදව ඒ දිස්ත්‍රික්කයෙහි ජර්මන් වට වළල්ල බිඳ ඇතැ'යි සෝවියට් ප්‍රවෘත්ති බියුරෝව ප්‍රකාශ කළ ඔක්තෝබර 9වැනි ද තෙක් ම, පූරා දින හතළිස්අටක්, මිනිස්වර්ගයාගේ ඉතිහාසයෙහි අසමසම වූ, පෙර නුවූ විරූ විධියේ දරුණු සටනක් එහි ඇවිලුණේ ය. අන්තිමේදී මේ සටන සෝවියට් බලසේනාවන් විසින් ජය ගනු ලැබී ය. ඒ දින හතළිස්අට තිස්සේ, ඒ නගරයෙන් ආ එක් එක් අසිරුව හෝ ජය පිළිබඳ පුවත්, අපමණ වූ දස ලක්ස ගණන් මිනිසුන් වෙත වරෙක සිත් තැවුල ගෙනෙමින් ද, වරෙක ඔවුන් මහත් ප්‍රමෝදයෙන් කළඹමින් ද, ඔවුන්ගේ හදවත් තරයේ ම ග්‍රහණය කර ගත්තේ ය. මේ සටන සෝවියට්-ජර්මන් යුද්ධයේ හැරෙන තැන පමණක්, එසේ ත් නැතහොත් වර්තමාන පැසිස්ට්-විරෝධී ලෝක යුද්ධයේ ම හැරෙන තැන පමණක්, නො වේ; එය සකල මිනිස්වර්ගයාගේ ඉතිහාස-යෙහි ම හැරෙන තැන වේ. මේ දින හතළිස්අට මුළුල්ලෙහි, ලෝකයේ ජනතාව, පසුගිය ඔක්තෝබරයේදී ඔවුන් මොස්කව් නුවර දෙස බලා සිටියාට ත් වඩා මහත් ඕනෑකමින්, ස්ටැලින්ග්‍රැඩ් නුවර දෙස බලා සිටියහ.

බටහිරි පෙරමුණෙහි තමාට ජය අත් වන තුරු, හිට්ලර් පරෙස්සමින් වැඩ කළා සේ පෙනෙයි. ඔහු පෝලන්තයට පහර දුන් කල, ඔහු නෝර්වේ රටට පහර දුන් කල, ඔහු ඕලන්දයට, බැල්ජියමට හා ප්‍රන්සයට පහර දුන් කල සහ, ඔහු බෝල්කන් රටවල් වලට පහර දුන් කල, ඔහු, තම අවධානය හැම අතට ම විසුරුවන්නට එඩිතර නො වමින්, එක් වරකට එක් අරමුණක් වෙත පමණක් තම මුළු ශක්තිය ඒකරාශි කළේ ය. බටහිරි පෙරමුණෙහි ඔහුගේ ජයග්‍රහණයට පසු, ඔහු ජයෙන් කුල්මත් වී, තුන් මසකින් සෝවියට් සංගමය පරාජය කරන්ට උත්සාහ කළේ ය. ඔහු මේ ඉමහත් සහ බලවත් සමාජවාදි රටට විරුද්ධ ව උතුරේ මුර්මාන්ස්ක්හි සිට දකුණේ ක්‍රිමියාව තෙක් විහිදුණු මුළු පෙරමුණ දිගට ම පහරදීමක් දියත් කළේ ය; එසේ කිරීමේදී තම බලසේනාවන් විසිරී සිටින්ට සැලසුවේ ය. පසුගිය ඔක්තෝ-බරයෙහි මොස්කව් යුද්ධව්‍යාපාරය ව්‍යර්ථ වීම සෝවියට්-ජර්මන් යුද්ධයේ පළමුවැනි අවස්ථාවේ අවසානය සලකුණු කළේ ය; හිට්ලර්ගේ පළමුවැනි උපායමාර්ගික සැලැස්ම ව්‍යර්ථ විය. රතු හමුදව ගිය අවුරුද්දේ ජර්මන්

පහරදීම නතර කොට, සීතසෘතුවේදී සියලු ම පෙරමුණු වල පෙරළා-පහරදීමක් දියත් කළේ ය; එය, හිට්ලර් පසුබැසීමට ත් ආරක්ෂා වීමට ත් හැරුණු, සෝවියට්-ජර්මන් යුද්ධයේ දෙවැනි අවස්ථාව විය. මේ වකවනු-වේදී, තම ප්‍රධාන අණදෙන්නා වූ බ්‍රෝකිට්ශ් නිලයෙන් පහ කිරීමෙන් පසු, විධානය තමාට ම පවරාගෙන, ඔහු මුළු වෙර යොද හැම තැන ම එක විට කරන පහරදීමක් කිරීම පිණිස වූ සැලැස්ම අත හැර දමන්ට තීරණය කළේ ය, යුරෝපය පීරා එකතු කර ගත හැකි සියලු බලසේනා එකතු කර ගත්තේ ය, දකුණු පෙරමුණට සීමා වූ නමුත්, සෝවියට් සංගමයේ මර්-මස්ථාන වලට පහර වදිනවා ඇතැ'යි ඔහු සිතින් සිතා ගත් අන්තිම පහරදීමක් සූදනම් කළේ ය. එය පැසිස්ට්වාදයේ ඉරණම එල්බී තිබුණු අන්තිම පහරදීමක ස්වභාවයෙන් වූ නිසා, හිට්ලර් ඒකරාශි කළ හැකි බලසේනා වැඩි ම ගණන ඒකරාශි කළේ ය, උතුරු අප්‍රිකානු සටන් පෙරමුණෙන් ඔහුගේ අහස්යානා සහ යුද-ටැන්කි කොටසක් පවා ගෙනාවේ ය. මේ අවුරුද්දේ මැයි මාසයෙහි කර්ච් සහ සෙවැස්ටපොල් නගර වලට දුන් ජර්මන් ප්‍රහාරය ත් සමග, යුද්ධය එහි තුන්වැනි අවස්ථාවට ඇතුල් විය. තම අහස් සහ යුද-ටැන්කි සේනාවන් ගෙන් වැඩි කොටස විසින් අනුබල දෙනලද, 15,00,000කට වැඩි හමුදවක් එක්රැස් කරමින්, හිට්ලර් ස්ටැලින්ග්‍රැඩ් නගරයට සහ කෝකේසස් ප්‍රදේශයට පෙර නුවූ විරූ ලෙස දරුණු වූ පහරදීමක් දියත් කළේ ය. ඔහු වොල්ගා නදිය කපා දැමීමේ ත් බාකු නගරය පැහැර ගැනීමේ ත් උභය අභිප්‍රාය සඳහා ඒ අරමුණු දෙක මහත් වේගයෙන් අල්ලාගැනීමට ප්‍රයත්න දැරී ය; අනතුරුව මොස්කව් නුවරට විරුද්ධ ව උතුරට කාගෙන යන්ට ත් දකුණෙහි පර්සියන් බොක්ක වෙත කඩා බිඳගෙන යන්ට ත් ඔහු අදහස් කළේ ය; ඒ අතර ම ඔහු ස්ටැලින්-ග්‍රැඩ් වැටුණු පසු සයිබීරියාවට පහරක් දීමට සූදනම් ව තම හටකණ්ඩායම් මැන්චූරියාවෙහි එක්රැස් කර තබන ලෙස ජපන් පැසිස්ට්වාදීන් මෙහෙයවී ය. ජර්මන් සහ ජපන් යන හමුද දෙකේ ම පසුමුණ සුරක්ෂිත ව ඇතිව, බටහිරි පෙරමුණෙහි ඉංග්‍රීසි-ඇමරිකන් ප්‍රහාරයක් ගැන ක්‍රියා කරනු පිණිස ත් මැත පෙරදිග ධන-නිධාන අල්ලාගැනීම පිණිස සහ ජපනුන් සමග සන්ධි වීමක් කරනු පිණිස ත් ජර්මන් හමුදවේ ප්‍රධාන බලසේනාවන් සෝවියට් රණ මණ්ඩලයෙන් නිදහස් කර ගත හැකි වන තරම් දුරට ද, ඒ අතර චීනයට විරුද්ධ ව බස්නාහිරට ත් බ්‍රිතාන්‍යයට සහ එක්සත් ජනපදයට විරුද්ධ ව දකුණට ත් ගමන් කරනු පිණිස ජපන් හමුදවේ ප්‍රධාන බල-සේනාවන් උතුරෙන් නිදහස් කර ගත හැකි වන තරම් දුරට ද, සෝවියට් සංගමය දුබල කිරීමට හිට්ලර් නිෂ්ඵල ලෙස බලාපොරොත්තු විය. පැසිස්ට් කඳවුරට ජය දිනා ගන්ට හිට්ලර් ගණන් බැලූ සැටි එසේ ය. එහෙත් මේ අවස්ථාවේදී කරුණු සිදු වුණේ කෙසේ ද? ඔහුගේ ඉරණම තීන්දු කළ සෝවියට් උපක්‍රම වලට මුහුණ පාන්ට හිට්ලර්ට සිදු විය. සෝවියට් සංගමය පළමුකොට සතුරා ඇතුළට ම එන්නට පොළඹා,

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ඉක්බිති මුරණ්ඩු ලෙස විරුද්දකම් පෑමක් කිරීමේ ප්‍රතිපත්තිය යෙදුවේ ය. පස් මසක් සටන් කොට ත් ජර්මන් හමුදව කොකේසියානු තෙල්–ආකර කරා කාගෙන යන්ට වත් ස්ටැලින්ග්රැඩ් පැහැරගන්ට වත් අසමත් වී සිටී; එහෙයින්, ඉදිරියට යන්ට ත් බැරි ව, පසුබසින්ට ත් බැරි ව, ඉමහත් අලාබ හානි විඳිමින්, හරි ම අවුල් ජාලයකට වැටෙමින්, උස් කඳු ඉදිරියෙහි සහ නො බිඳිය හැකි නුවරක් පිටතෙහි තම හටකණ්ඩායම් නතර කරගෙන සිටින්නට හිට්ලර්ට බලෙන් ම සිදු වී ඇත. දනට ම ඔක්තෝබරය ඇවිත් ය, සීතසෘතුව ළං වන්නේ ය; කල් නො යාදී ම යුද්ධයේ තුන්වැනි අවස්ථාව අවසන් වී, සිව්වැනි අවස්ථාව ඇරඹෙනවා ඇත. සෝවියට් සංගමයට පහර දීමට හිට්ලර් සකස් කළ එක ම උපායමාර්ගික සැලැස්මක් වත් සාර්ථක වී නැත. මේ වකවනුවේදී, ගිය අවුරුද්දේ ග්‍රීෂ්මසෘතුවේදී තම බලසේනාවන් බෙදනු ලැබ සිටියදී තමා ලත් පරාජය සිත තබා ගනිමින්, හිට්ලර් ඔහුගේ ශක්තිය දකුණු පෙරමුණ වෙත ඒකරාශි කළේ ය. එහෙත් නැගෙනහිරෙහි වොල්ගා නදිය කපා දැමීම ත් දකුණෙහි කෝකේසස් පැහැරගැනීම ත් යන උභය අභිප්‍රාය එක පහරින් ම මුදුන්පත් කර ගැනීමට ඔහුට එතෙක් ම උවමනා වූ නිසා, ඔහු යළි ත් තම බලසේනාවන් බෙදුවේ ය. ඔහුගේ ශක්තිය ඔහුගේ ලොකු බලාපොරොත්තු වලට සරි නො වන බව ඔහුට නො තේරුණේ ය, දැන් ඔහුගේ විනාශය කෙටී ඉවර ය — "කද් ලීයේ දෙ කොණ හොඳට ගැට ගසා නැත් නම්, එල්ලා තිබෙන කද් ලිස්සා වැටෙයි." සෝවියට් සංගමය ගැන කියන්ට තිබෙන්නේ, ඈ වඩ වඩා සටන් කරන කල ඈ වඩ වඩා ශක්තිමත් වන බව ය. ස්ටැලින්ගේ දීප්තිමත් උපායමාර්ගික මගපෙන්වීම මුලපිරුම සම්පූර්ණයෙන් ම අත් කරගෙන ඇත, හැම තැන ම හිට්ලර් විනාශය දෙසට ඇදගෙන යයි. මේ සීතසෘතුවේදී පටන්ගන්නා යුද්ධයේ සිව්වැනි අවස්ථාව හිට්ලර්ගේ විනාශය ළඟා වීම සලකුණු කරනවා ඇත.

යුද්ධයේ පළමුවැනි සහ තුන්වැනි අවස්ථාවන්හි හිට්ලර්ට තිබුණු සහ තිබෙන තත්වය සසඳන කල, ඔහු සිටින්නේ අවසාන පරාජයේ එළිපත්ත උඩ බව අපට පෙනෙයි. ස්ටැලින්ග්රැඩ් නුවර ත් කෝකේසස් ප්‍රදේශය ත් යන දෙ තැන ම දැන් රතු හමුදව ඇත්ත වශයෙන් ම ජර්මන් පහරදීම නවත්වා ඇත; හිට්ලර්, ස්ටැලින්ග්රැඩ් නුවරට ත් කෝකේසස් ප්‍රදේශයට ත් දැන් තම ප්‍රහාරයන් ව්‍යර්ථ වූයෙන්, දැන් හෙම්බත් වීමට ළං වී සිටී. පසුගිය දෙසැම්බරයේ සිට මේ අවුරුද්දේ මැයි තෙක්, සීතසෘතුව මුළුල්ලේ ම එක්රැස් කරගන්ට ඔහුට හැකි වූ බලසේනා දනට ම පාවිච්චි කර ඉවර ය. මසකට ත් අඩු කාලයකින් සෝවියට්–ජර්මන් පෙරමුණට සීතසෘතුව එළඹෙනවා ඇත, කඩිමුඩියේ ආරක්ෂාවීමට හැරෙන්නට හිට්ලර්ට සිදු වෙනවා ඇත. ඩොන් නදියට බටහිරින් සහ දකුණෙන් මුළු බිම් පටිය ම ඔහු වැඩියෙන් ම පහර කන තත්වයක සිටින ප්‍රදේශය වේ; රතු හමුදව එහි පෙරළා–පහරදීමට බහිනවා

ඇත. මේ සීතසෘතුවේදී, කඩා වැටෙන්ට යන තම විනාශය ගැන ඇති බියෙන් පෙළඹී, හිට්ලර් යළි ත් වරක් තම බලසේනාවන් ප්‍රතිසංවිධානය කරනවා ඇත. නැගෙනහිරි සහ බටහිරි යන පෙරමුණු දෙකේ ම තිබෙන අනතුරු වලට මුහුණ දෙනු පිණිස, තම බලසේනාවන්ගේ සුන්බුන් අතපතගා එකතු කරගෙන, ඔවුන් සජ්ජිත කොට, අළුත් ඩිවිසන් කීපයක් බවට සකස් කරන්නට බාගවිට ඔහුට පුළුවන් වෙනවා ඇත; ඊට අමතර ව, ඔහු උදව් ලබා ගන්ට ඔහුගේ පැසිස්ට් කොටස්කරුවන් වන ඉතාලිය, රුමේනියාව සහ හංගේරියාව වෙත හැරී, කාලතුවක්කු–බිලි තව ටිකක් ඔවුන් ගෙන් බලහත්-කාරයෙන් ම ලබා ගන්නවා ඇත. කෙසේ වේවා, නැගෙනහිරෙහි සීතසෘතු යුද්ධව්‍යාපාරයකින් සිදු වන අති විශාල අලාබ හානි වලට මුණ පාන්ට ත්, බටහිරෙහි දෙවැනි පෙරමුණ ගැන ක්‍රියා කරන්නට සූදනම් වී සිටින්ට ත් ඔහුට සිදු වෙනවා ඇත; ඒ අතර ඉතාලිය, රුමේනියාව සහ හංගේරියාව, හිට්ලර්ගේ කෙරුම් සියල්ල ඉවර බව පෙනෙන නිසා අශුභවාදී වෙමින්, වැඩි වැඩියෙන් ඔහු ගෙන් ඈත් වෙනවා ඇත. කොටින්, ඔක්තෝබර 9වැනි දට පසු හිට්ලර්ට විවෘත ව තිබෙන්නේ එක් පාරක් පමණකි, එනම් අභාවයට යන පාර යි.

මේ දින හතළිස්අට තුළ රතු හමුදව විසින් ස්ටැලින්ග්රැඩ් නගරය ආරක්ෂා කිරීම ත් ගිය අවුරුද්දේ මොස්කව් නගරය ආරක්ෂා කිරීම ත් අතර එක්තරා සමානකමක් ඇත. ඒ කියන්නේ, මේ අවුරුද්ද සඳහා වූ හිට්ලර්ගේ සැලැස්ම ගිය අවුරුද්ද සඳහා වූ ඔහුගේ සැලැස්ම මෙන් ම ව්‍යර්ථ කර දමනලද බව ය. කෙසේ වේවා, ඇති වෙනස නම් සෝවියට් ජනතාව මොස්කව් නුවර ආරක්ෂා කිරීමට පසු එතැනින් නතර නො වී සීතසෘතුවේදී පෙරළා–පහරදීමක් දිගට ම ගෙනගිය නමුත්, මේ අවුරුද්දේ ග්‍රීෂ්මසෘතුවේදී ජර්මන් හමුදව කළ පහරදීමට මූණ දෙන්නට ඔවුන්ට සිදු වීම ය; ඒ එසේ වූයේ එක් කොටසකින් ජර්මනියට ත් ඈගේ යුරෝපීය හවුල්කාරයන්ට ත් එතෙක් ම කිසියම් සටන් ශක්තියක් ඉතිරි වී තිබුණු නිසා ය, තවත් කොටසකින් බ්‍රිතාන්‍යය ත් එක්සත් ජනපදය ත් දෙවැනි පෙරමුණ විවෘත කිරීම ප්‍රමාද කළ නිසා ය. එහෙත් දැන්, ස්ටැලින්ග්රැඩ් නගරය ආරක්ෂා කිරීමට කළ සටනට අනතුරුව, තත්වය ගිය අවුරුද්දේ තත්වයට වඩා මුළුමනින් ම වෙනස් වෙනවා ඇත. එක් අතකින්, සෝවියට් සංගමය දෙවැනි සීතසෘතු පෙරළා–පහරදීමක් විශාල පරිමාණයකින් දියත් කරනවා ඇත, (නියම දිනය තවම කල්තබා කියන්ට බැරි නමුත්) දෙවැනි පෙරමුණ විවෘත කිරීම තව දුරට ත් පමා කරන්ට බ්‍රිතාන්‍යයට සහ එක්සත් ජනපදයට බැරි වෙනවා ඇත, යුරෝපයේ ජනතාව අනුකූලතාව දක්වමින් නැඟී සිටින්ට සූදනම් ව සිටිනවා ඇත. අනික් අතින්, විශාල–පරිමාණයේ පහරදීම් අරඹන්ට ශක්තියක් ජර්මනියට සහ ඈගේ යුරෝපීය හවුල්කාරයන්ට තව දුරට ත් නො තිබෙනවා ඇත, තම මුළු ප්‍රතිපත්ති මාර්ගය උපායමාර්ගික ආරක්ෂාවීමට හරවනවා විනා වෙන කළ හැකි දෙයක් හිට්ලර්ට නො තිබෙනවා ඇත. උපායමාර්ගික ආරක්ෂාවීමට බහින්නට හිට්ලර්ට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බලෙන් ම සිදු වූ කල, පැසිස්ට්වාදයේ ඉරණම තීන්දු වුණා වේ. එහි බිහිවීමේ පටන් ම, හිට්ලර්ගේ වැනි පැසිස්ට් රජයක් තම දේශපාලන සහ යුද්ධමය ජීවිතය ගොඩනඟන්නේ පහරදීම කරමින් ය; එහි පහරදීම නතර වූ කල එහි ජීවිතය ම නතර වේ. ස්ටැලින්ග්රෑඩ් සටන පැසිස්ට්වාදයේ පහරදීම නතර කරනවා ඇත; එහෙයින් එය තීරණාත්මක සටනකි. එය මුළු ලෝක යුද්ධයට ම තීරණාත්මක වේ.

හිට්ලර්ට අභිමුඛ ව බලවත් සතුරෝ තුන් දෙනෙක් සිටිති; එනම් සෝවියට් සංගමය ත්, බ්‍රිතාන්‍යය හා එක්සත් ජනපදය ත්, ජර්මනිය විසින් අල්ලාගෙන තිබෙන ප්‍රදේශ වල ජනතාව ත් ය. නැගෙනහිරි පෙරමුණෙහි, පර්වතයක් මෙන් අචල ව, රතු හමුදාව සිටී; එහි පෙරළා-පහරදීම් දෙවැනි සීතසෘතුව මුළුල්ලේ ම ත් ඉන් ඔබ්බට ත් දිගට ම පවතිනවා ඇත; මුළු යුද්ධයේ ප්‍රතිඵලය ත් මිනිස්වර්ගයාගේ ඉරණම ත් තීරණය කරන්නේ මේ බලවේගය යි. බටහිරි පෙරමුණෙහි, බ්‍රිතාන්‍යය ත් එක්සත් ජනපදය ත් නිකම් බලා සිටීමේ සහ උවමනාවෙන් ම පමා කිරීමේ තම ප්‍රතිපත්තිය දිගට ම ගෙනගියත්, මැරු කොට්යාට තඩිබාන්ට කාලය පැමිණි විට, අන්තිමේදී දෙවැනි පෙරමුණ විවෘත කරනවා ඇත. ඊළඟට හිට්ලර්ට විරුද්ධ අභ්‍යන්තර පෙරමුණ, එනම් ජර්මනියෙහි, ප්‍රන්සයෙහි සහ යුරෝපයේ සෙසු කොටස් වල ඇතිවෙමින් එන ජනතාවගේ මහා නැඟීසිටීම, තිබේ; සෝවියට් සංගමය මුළු වෙර යොද කරන පෙරළා-පහරදීම දියත් කළ මොහොතේ ම සහ දෙවැනි පෙරමුණේ ගජනා ගිගුම් දෙන්ට පටන් ගන්නා මොහොතේ ම, ඒ ජනතාව තුන්වැනි පෙරමුණකින් පිළිතුරු දෙනවා ඇත. මෙසේ, තුන් පෙරමුණකින් වදින ප්‍රහාරයක් හිට්ලර් වෙත එක විට එල්ල වෙනවා ඇත — ස්ටැලින්ග්රෑඩ් සටනට පසු ඇති වන මහා ඉතිහාසීය ක්‍රියාවලිය එබඳු ය.

නැපෝලියන්ගේ දේශපාලන ජීවිතය අවසන් වූයේ වෝටලූවේදී ය; එහෙත් හැරෙන තැන වූයේ මොස්කව් නුවරදී ඔහු ලැබූ පරාජය යි. හිට්ලර් අද නැපෝලියන් ගිය පාරේ ම පිය නඟයි; ඔහුගේ විනාශය තීන්දු කර ඇත්තේ ස්ටැලින්ග්රෑඩ් සටන ය.

මේ වර්ධනයෝ ඈත පෙරදිගට කෙළින් ම බල පානවා ඇත. එන අවුරුද්ද ජපන් පැසිස්ට්වාදයට ත් වගතුවක් ඇති අවුරුද්දක් නො වෙනවා ඇත. කල් යන විට එය එහි මිනීවළට පාත් වෙන තුරු එහි හිසරද වැඩෙනවා ඇත.

ලෝක තත්වය ගැන අශුභවාදී මතයක් ගන්නා සියලු දෙනා ම තම අදහස වෙනස් කළ යුත්තාහ.

සභාග ආණ්ඩුව ගැන

(උපුටා ගත් කොටස්)

1945, අප්‍රේල් 24

මහජන යුද්ධය

ඒ කාලයේදී ම[1] වයඹදිග චීනයට ගමන් කර සිටි කොමියුනිස්ට් නායකත්වය යටතේ වූ රතු හමුදාවේ ප්‍රධාන බලසේනාවන් චීන ජාතික විප්ලවවාදී හමුදාවේ අටවැනි මාර්ග හමුදාව වශයෙන් අළුතෙන් නම් කරනු ලැබූ අතර, යැංසී ගංගාවේ දෙ පැත්තේ නොයෙක් තැන් වල නතර වී සිටි චීන රතු හමුදාවේ ගොරිල්ලා සේනාංග චීන ජාතික විප්ලවවාදී හමුදාවේ අළුත් සිව්වැනි හමුදාව වශයෙන් අළුතෙන් නම් කරනු ලැබී ය. මුලින් කී හමුදාව උතුරු චීන පෙරමුණේ ද, පසු ව කී එක මැද චීන පෙරමුණේ ද සටන් කරන්ට ගියේ ය. සිවිල් යුද්ධය පැවති වකවානුවේදී, වාම්පෝ යුද්ධ විද්‍යායතනයේ ත් උතුරු යුදගමනේ දින වල ජාතික විප්ලවවාදී හමුදාවේ ත් ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය රැකගෙන සහ දියුණු කරගෙන සිටි චීන රතු හමුදාව එක් කලෙක මිනිසුන් ලක්ෂ ගණනකට වැඩී තිබුණේ ය. එහෙත් ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධය පටන් ගන්නා කාලය වන විට, කුඕමින්තාං ආණ්ඩුව විසින් අපේ දකුණු කඳවුරු ප්‍රදේශයන්හි කරනලද නිර්දය විනාශයේ ත්, දීර්ඝ ගමනේදී අපට සිදු වූ අලාබ හානි වල ත් ප්‍රතිඵලයක් වශයෙන් සහ වෙනත් හේතු කරණකොටගෙන, එය මිනිසුන් දස දහස් කීපයකට හීන වී තිබුණි. ඒ හේතු කොටගෙන මේ හමුදාව පහත් කොට සැලකුවා වූ ද, ජපානයට විරුද්ධකම් පෑම පිණිස ප්‍රධාන වශයෙන් විශ්වාසය තිබිය යුත්තේ කුඕමින්තාං පක්ෂය කෙරෙහි ය'යි කල්පනා කළා වූ ද ඇතැම් අය සිටියහ. එහෙත් හොඳ ම විනිශ්චයකාරයෝ ජනතාව ය. අටවැනි මාර්ග හමුදාව ත් අළුත් සිව්වැනි හමුදාව ත්, එවකට ඒවා සංඛ්‍යාවෙන් කුඩා වූ නමුත්, ගුණයෙන් උසස් වූ බව ද, නියම මහජන යුද්ධයක් කරන්ට පුළුවන් වන්නේ

මේ ලිපිය සහෝදර මාඕ සේතුං විසින් චීන කොමියුනිස්ට් පක්ෂයේ හත්වැනි ජාතික සම්මේලනයට ඉදිරිපත් කළ දේශපාලන වාර්තාව වූ "සභාග ආණ්ඩුව ගැන" යන ලියවිල්ලෙන් උපුටා ගත් කොටස් දෙකකින් යුක්ත ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඒ හමුදාවන්ට පමණක් බව ද, ඒ හමුදා ජපන්-විරෝධී පෙරමුණු කරා සේන්දු වී එහි පුළුල් බහුජන සමූහයන් සමග එක් වූ කල ඒවා ඉදිරියෙහි නිම්හිම් නැති මතු-බලාපොරොත්තු විවෘත වන බව ද ජනතාව දැන සිටියෝ ය. වැලිත් ජනතාව නිවැරදි වූහ. මේ වන විට, මා මේ වාර්තාව ඉදිරිපත් කරද්දී, අපේ හමුදාව දැනට ම මිනිසුන් 9,10,000ට පළල් වී ඇත, සාමාන්‍යයෙන් කරන නිෂ්පාදන වැඩ වලින් ඉවත් කරගෙන නැති අපේ ගම්බද ජනභටයන්ගේ ගණන 22,00,000ට වැඩි වී ඇත. අපේ නිත්‍ය හමුදාව තවම (මධ්‍යම පාලනය යටතේ මෙන් ම ප්‍රාදේශික පාලනය යටතේ ද සිටින කුඕමින්තාං සේනාංග ගණනට ගන්නා කල) කුඕමින්තාං පක්ෂයේ නිත්‍ය හමුදාවට වඩා ගණනින් කුඩා ය යනු සත්‍ය කාරණය වුව ද, එය සටනට පටලවාගෙන සිටින ජපන් හා රූකඩ බලසේනාවන්ගේ ගණන සහ එහි යුද පෙරමුණු පැතිරී තිබෙන තරම අනුව ත්, එහි සටන් ක්ෂමතාව අනුව ත්, තම සටන්ව්‍යාපාර වලදී එයට ලැබෙන බහුජන අනුබලය අනුව ත්, එහි දේශපාලන තත්වය, බද්ධතාව සහ සමගිය අනුව ත් විනිශ්චය කරන කල, එය දැනට ම චීනයේ විරුද්දකම් පෑමේ යුද්ධයේ ප්‍රධාන බලවේගය බවට පත් වී ඇත.

මේ හමුදාව එහි සාමාජිකයන් සියලු දෙනාට ම දේශපාලන හැඟීම පදනම කරගත් විනයක් තිබෙන නිසා බලවත් ය; ඔවුන් එකට එකතු වී සිටින්නේ ත් ඔවුන් සටන් කරන්නේ ත් පුද්ගලයන් කිහිප දෙනකුන්ගේ හෝ පටු කල්ලියක හෝ පෞද්ගලික පලප්‍රයෝජන උදෙසා නො ව, පුළුල් බහුජන සමූහයන්ගේ ත් මුළු ජාතියේ ත් පලප්‍රයෝජන උදෙසා ය. මේ හමුදාවේ එක ම අභිප්‍රාය චීන ජනතාව සමග අවල ලෙස එක් ව නැඟී සිටීම ත් ඔවුන්ට මුළු හිතින් සේවය කිරීම ත් ය.

මේ අභිප්‍රායයෙන් මග පෙන්වනු ලබමින්, මේ හමුදාව දමනය කළ නො හැකි ජීවගුණයකින් යුක්ත ව සිටී, සියලු සතුරන් පරාජය කරන්ට ත් කිසි කලෙක පස්සට නො යන්ට ත් අධිෂ්ඨාන කරගෙන සිටී. විඳින්ට සිදු වන අමාරුකම් සහ හිරිහැර කොතරම් වුව ද, එක ම එක මිනිසකු හෝ ඉතිරි වී සිටින තාක්, ඔහු සටන් කරනවා ඇත.

මේ අභිප්‍රායයෙන් මග පෙන්වනු ලබමින්, මේ හමුදාව ස්වකීය ශ්‍රේණි තුළ ත් ස්වකීය ශ්‍රේණි වලින් පිටස්තර අය සමග ත් විශිෂ්ට සමගියක් ඇති කර ගෙන සිටී. අභ්‍යන්තර වශයෙන්, නිලධාරීන් සහ භටයන් අතර ද, ඉහළ සහ පහළ ශ්‍රේණි අතර ද, යුද්ධ වැඩ, දේශපාලන වැඩ සහ පසුමුණු සේවා වැඩ අතර ද සමගිය ඇත්තේ ය; බාහිර වශයෙන්, හමුදාව සහ ජනතාව අතර ද, හමුදාව සහ ආණ්ඩුවේ සංවිධාන අතර ද, අපේ හමුදාව සහ මිත්‍ර හමුදා අතර ද සමගිය ඇත්තේ ය. මේ සමගියට හානියක් කරන කවරක් වුව ද මැඩලීම අත්‍යවශ්‍ය ය.

මේ අභිප්‍රායයෙන් මග පෙන්වනු ලබමින්, මේ හමුදාවට, සතුරු නිලධාරීන් සහ භටයන් මේ පැත්තට දිනා ගැනීම පිණිස ත් යුද සිරකරුවන් ගැන ක්‍රියා කිරීම පිණිස ත් නිවැරදි ප්‍රතිපත්තියක් තිබේ. යටත්වන්නා වූ ත් අපේ පැත්තට එන්නා වූ ත්, නැතහොත්, තම අවි බිම තිබීමෙන් පසු පොදු සතුරා හා සටන් කරන්ට කැමැත්ත දක්වන්නා වූ ත් සතුරු බලසේනාවන්ට අයත් සියලු සාමාජිකයෝ කිසි ම විශේෂයක් නැතිව සාදරයෙන් පිළිගෙන, නිසි අධ්‍යාපනයක් දෙනු ලබති. කිසි ම යුද සිරකරුවකු මැරීම ත්, කිසිවකුට නරකට සංග්‍රහ කිරීම හෝ අපහාස කිරීම ත් තහනම් ය.

මේ අභිප්‍රායයෙන් මග පෙන්වනු ලබමින්, මේ හමුදාව මහජන යුද්ධයට පරම අවශ්‍ය වූ උපායමාර්ග සහ උපක්‍රම පද්ධතියක් ගොඩනගාගෙන ඇත. එය ඇත්ත වශයෙන් පවතින වෙනස් වන තත්වයන්ට අනුරූප ලෙස කරගෙන යන නැමෙන සුලු ගෙරිල්ලා සංග්‍රාමයෙහි ප්‍රවීණ ය, ජංගම සංග්‍රාමයෙහි ද ප්‍රවීණ ය.

මේ අභිප්‍රායයෙන් මග පෙන්වනු ලබමින්, මේ හමුදාව මහජන යුද්ධයට පරම අවශ්‍ය වූ ද, තමාගේ ම ශ්‍රේණි තුළ සමගිය, මිත්‍ර හමුදා සමග සමගිය හා ජනතාව සමග සමගිය දියුණු කිරීම ත්, සතුරු බලසේනාවන් කඩා බිඳ විසුරුවා හැරීම ත්, සටනේදී ජයග්‍රහණය සහතික කිරීම ත් අරමුණු කර ගත්තා වූ ද දේශපාලන වැඩ පද්ධතියක් ගොඩනගාගෙන ඇත.

මේ අභිප්‍රායයෙන් මග පෙන්වනු ලබමින්, මේ හමුදාව, ගෙරිල්ලා සංග්‍රාමයේ තත්වයන් යටතේ සටන් කරමින්, ආර්ථික දුෂ්කරතා ජය ගැනීමට ත්, ජීවන තත්වයන් දියුණු කිරීමට ත්, ජනතාව මත පැටවෙන බර අඩු කිරීමට ත් හැකි වන සේ, සම්පූර්ණයෙන් ම හෝ, අඩකින් හෝ, යටත්පිරිසෙයින් කොටසකින් වත්, ස්වයං–පෝෂිත වෙමින් ධාන්‍ය සහ සෙසු අවශ්‍ය දේ නිපදවීම පිණිස සටන් අතර ත් පුහුණු වීමේ වකවනු අතර ත් ඇති විවේක කාලයන් ප්‍රයෝජනයට ගැනීමට සමත් ය, ඇත්ත වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත. විවිධ යුද කඳවුරු ප්‍රදේශ වල කුඩා පරිමාණයේ අවිආයුධ කම්හල් ගණනක් පිහිටුවීම පිණිස තිබෙන හැම ඉඩකඩක් ම ප්‍රයෝජනයට ගෙන ඇත.

එමතු නො ව, මේ හමුදාව එය සමග උචිත ලෙස සම්බන්ධ වී සටන් කරන — බහුජනයාගේ සුවිශාල සන්නද්ධ සංවිධානයන් වන — මහජන ආත්මාරක්ෂක බළකායයක් සහ ජනභට හමුදාවක් ඊට සිටින නිසා ද බලවත් ය. චීනයේ නිදහස් ප්‍රදේශ වල තරුණ වියේ සිට මැදි විය තෙක් සියලු පිරිමි ත් ගැහැණු ත් සවච්ඡන්ද සහ ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් මත, නිෂ්පාදනයෙහි ලා තමන් සතු වැඩ ද අත නාරිමින් ම, ජනතාවගේ ජපන්-විරෝධී ආත්මාරක්ෂක බළකායයන්හි සංවිධානය වී සිටිති. හමුදාවට හෝ ගෙරිල්ලා සේනාංග වලට බැඳෙන අය හැර, ආත්මාරක්ෂක බළකාය වල

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉස්තරම් ම කොටස් ජනහට හමුදවට ගනු ලැබේ. බහුජනයාගේ මේ සන්නද්ධ බලසේනාවන්ගේ සහයෝගය නොමැතිව සතුරා පරාජය කිරීම කොහෙත් ම නො කළ හැකි දෙයක් වෙනවා ඇත.

අවසාන වශයෙන්, මේ හමුදව අවශ්‍ය වන ඕනෑ ම විටෙක කවර ප්‍රාන්තයක හෝ සටන් කිරීම පිණිස ලබා ගත හැකි ප්‍රධාන බලසේනා ය, ප්‍රාදේශික ජනහට හමුදවන් සහ ආත්මාරක්ෂක බළකායයන් සමග උචිත ලෙස සම්බන්ධ වී තමන්ගේ ම ප්‍රදේශ ආරක්ෂා කිරීමට ත් එහි සතුරාට පහර දීමට ත් ඒකරාශි වී සිටින ප්‍රාන්තීය බලසේනා ය'යි කොටස් දෙකකට බෙදී ඇති නිසා ද බලවත් වේ. මේ ශ්‍රම භේදය ජනතාව මුළු හිතින් දෙන අනුබලය දිනාගෙන ඇත. මේ නිවැරදි ශ්‍රම භේදය නොමැතිව — උදහරණ වශයෙන්, ප්‍රාන්තීය බලසේනා රඟපාන කොටස නො තකා හරින අතර ප්‍රධාන බල–සේනා රඟපාන කොටස ගැන පමණක් අවධානය යොමු කරන ලද නම් — චීනයේ නිදහස් ප්‍රදේශ වල පවතින තත්වයන් යටතේ සතුරා පරාජය කිරීම එපරිද්දෙන් ම කොහෙත් ම නුපුළුවන් වෙනවා ඇත. ප්‍රාන්තීය බලසේනාව යටතේ, ගණන් නැති සන්නද්ධ වැඩ කණ්ඩායම්[2] සංවිධානය කර ඇත; මැනවින් පුහුණු කර ඇති හෙයින් ඒ කණ්ඩායම් යුද්ධමය, දේශ-පාලන සහ බහුජන වැඩ සඳහා වඩා ත් යෝග්‍ය ය; මේ කණ්ඩායම් සතුරු පෙළි පිටිපසින් පිහිටි ඉතා ම ඈත පසුමුණු ප්‍රදේශ වලට රිංගාගෙන යමින්, සතුරාට පහර දෙයි, ජපන්–විරෝධි අරගලය සඳහා බහුජනයා අවදි කරයි, එසේ නිදහස් ප්‍රදේශ වල පෙරමුණේ කරන යුද්ධ ක්‍රියාවන්ට අනුබල දෙයි. මේ සියල්ලේදී ඒවා මහත් සාර්ථකභාවයක් අත්පත් කරගෙන ඇත.

තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩු වල නායකත්වය යටතේ, සන්නද්ධ බලසේනාවන්ට අනුබල වශයෙන් විවිධ කර්තව්‍ය මුළු හිතින් ඉටු කරන්නා වූ කම්කරු, ගොවි, තරුණ සහ කාන්තා සංවිධාන වලට ත්, සංස්කෘතික, වෘත්තීය සහ වෙන සංවිධාන වලට ත් බැඳෙන ලෙස චීනයේ නිදහස් ප්‍රදේශ වල සියලු ජපන්–විරෝධි ජනයා ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ කර්-තව්‍ය හමුදවට බැඳෙන ලෙස මිනිසුන් උනන්දු කිරීම, හමුදව සඳහා ධාන්‍ය ප්‍රවාහණය කිරීම, සෙබළුන්ගේ පවුල් ගැන සොයා බලා උදව් උපකාර කිරීම සහ තම ද්‍රව්‍යමය ඕනෑඑපාකම් පිරිමසා ගැනීමට හටකණ්ඩායම් වලට උදව් දීම යන මේවාට සීමා වී නැත. හැම තැන ම උන්හිටිගමන් සතුරා වෙත කඩා පැනීම සහ, ගොඩ පුපුරන–වෙඩි වැළලීම, සතුරා ගැන තොරතුරු රැස් කිරීම, ද්‍රොහින් සහ ඔත්තුකාරයන් සොයා එළියට ඇද දැමීම, තුවාල-කාරයන් ගෙන යාම සහ ආරක්ෂා කිරීම, හමුදවේ සටන්–ව්‍යාපාර වලට කෙළින් ම සහභාගි වීම යන මේවා පිණිස ගෝරිල්ලා සේනාංග, ජනහට හමුදවන් සහ ආත්මාරක්ෂක බළකායයන් උනන්දු කිරීම ද ඒ කර්තව්‍ය-යන්ට ඇතුළත් ය. ඒ අතර ම, සියලු ම නිදහස් ප්‍රදේශ වල ජනයා නොයෙක් වර්ගයේ දේශපාලන, ආර්ථික, සංස්කෘතික සහ සෞඛ්‍ය වැඩ මහත්

උද්‍යෝගයෙන් බාර ගනිති. මේ අතින් ඉතා ම වැදගත් දෙය නම් හමුදව ත් ජනතාව ත් තමන්ට උවමනා දේ තමන් ම සපයා ගැනීමට ගෙනයන නිෂ්-පාදක ව්‍යාපාර වල මදිපාඩු පිරිමසනු වස් සහ එසේ දිග්ගැසුණු විරුද්දකම් පෑමේ යුද්ධය දරා සිටීම පිණිස නිෂ්පාදනයෙහි මහත් උන්නතියක් ඇති කිරීමට උදව් කරනු වස්, ධාන්‍ය සහ සෙසු අවශ්‍ය දේ නිෂ්පාදනය කිරීමට හැම දෙනා ම උනන්දු කිරීම ද, විශේෂ අවස්ථාවන්හි හැර, සියලු ආණ්ඩුවේ ආයතන සහ පාසල් තමන්ගේ ම යැපීම සඳහා තම නිදහස් කාලය නිෂ්පාදනය පිණිස කැප කරන බවට වගබලා ගැනීම ද වේ. චීනයේ නිදහස් ප්‍රදේශ වල, සතුරා මහත් නැස්පැත්තියක් කර ඇත; ජලගැලීම්, නියං සහ කෘමි වසංගත වලින් සිදු වන හානි නිතර නිතර සිදු වී ඇත. කෙසේ වෙවා, එහි ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩු සංවිධානය කළ අයුරකින් මේ දුෂ්කරතා ජය ගැනීමෙහි ලා ජනතාවට නායකත්වය දී ඇත, වසංගත වඳ කිරීම, ජලගැලීම් පාලනය කිරීම සහ විපත් වලදී සහනදයක කටයුතු සැලසීම පිණිස ගෙන යන විශාල බහුජන ව්‍යාපාර මගින් පෙර නුවූ විරූ විධියේ ප්‍රතිඵල අත්පත් කරගෙන ඇත, එසේ දිග්ගැසුණු විරුද්දකම් පෑමේ යුද්ධයෙහි අත නැර යෙදී සිටීමට හැකි කර ඇත. කොටින්, හැම දෙයක් ම පෙරමුණ සඳහා ය, හැම දෙයක් ම ජපන් ආක්‍රමණය පරාජය කිරීම සඳහා සහ චීන ජනතාවගේ විමුක්තිය සඳහා ය — මෙය චීනයේ නිදහස් ප්‍රදේශ වල මුළු හමුදව ත් මුළු ජනතාව ත් සඳහා සාමාන්‍ය සටන්පාඨය, සාමාන්‍ය ප්‍රතිපත්තිය වේ.

නියම මහජන යුද්ධයක් එබඳු ය. එබඳු මහජන යුද්ධයක් කිරීමෙන් පමණකි ජාතික සතුරා පරාජය කරන්ට අපට හැකි වන්නේ. කුඕමින්තාං පක්ෂයට බැරි වී තිබෙන්නේ එය මහජන යුද්ධයකට වියරු ලෙස විරුද්ධ නිසා ම ය.

නවීන ආයුධ වලින් සජ්ජිත කරනු ලැබූ කල, චීනයේ නිදහස් ප්‍රදේශ වල හමුදව වඩා ත් බලවත් වෙනවා ඇත, ජපන් ආක්‍රමණිකයන්ගේ අවසාන පරාජය සිදු කරන්නට සමත් වෙනවා ඇත.

. . . .

මහජන හමුදව

ජනතාවගේ පැත්ත ගෙන සිටින හමුදවක් නොමැතිව, නිදහස සහ එක්සත්කම දිනා ගන්ට ත්, සහාග ආණ්ඩුවක් පිහිටුවන්ට ත්, ජපන් ආක්‍රමණිකයන් නිරවශේෂයෙන් ම පරාජය කරන්ට ත්, නව චීනයක් ගොඩ නඟන්ට ත් චීන ජනතාවට කොහෙත් ම බැරි ය. දැනට මුළුමනින් ම ජනතාවගේ පැත්තේ සිටින එක ම සන්නද්ධ බලසේනාවෝ නිදහස් ප්‍රදේශ වලට අයත් එතරම් සුවිශාල නුවූ අටවැනි මාර්ග සහ අළුත් සිව්වැනි හමුදවෝ ය;-

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

මේ හමුදාවෝ කොහෙත් ම ප්‍රමාණ නො වෙත්. එසේ නමුත් ජනතාවට විරුද්ධ ව සිටින කුඕමින්තාං කණ්ඩායම නිදහස් ප්‍රදේශ වල හමුදාවන් දුබල කොට විනාශ කරන්ට නිරන්තරයෙන් ම කුමන්ත්‍රණය කරයි. 1944දී කුඕමින්තාං ආණ්ඩුව කොමියුනිස්ට් පක්ෂය නිදහස් ප්‍රදේශ වල සන්නද්ධ බලසේනාවන් ගෙන් පහෙන් හතර කොටසක් "නිශ්චිත කාල සීමාවක් ඇතුළත විසුරුවා හැරිය" යුතු ය'යි ඉල්ලා සිටිමින් ඊනියා සන්දේශයක් ඉදිරිපත් කළේ ය. 1945දී, ඉතා ම මෑතදී පැවැත්වූ සාකච්ඡාවන්හිදී, එය කොමියුනිස්ට් පක්ෂය විසින් නිදහස් ප්‍රදේශ වල සියලු ම සන්නද්ධ බලසේනා බාර දිය යුතු ය'යි තව දුරට ත් ඉල්ලා සිටියේ ය; එය කොමියුනිස්ට් පක්ෂයට "නීත්‍යනුකූල තත්වය" පවරා දෙන්නේ ඊට පසු ව ලු.

මේ මිනිස්සු කොමියුනිස්ට්වාදින්ට මෙසේ කියති: "නුඹලාගේ හට-කණ්ඩායම් බාර දීපල්ලා, අපි නුඹලාට නිදහස පවරා දෙමු." ඔවුන්ගේ න්‍යායය අනුව, කිසි ම හමුදාවක් නැති දේශපාලන පක්ෂයක් නිදහස භුක්ති විඳිය යුතු ය. එසේ ද වුව චීන කොමියුනිස්ට් පක්ෂයට කුඩා සන්නද්ධ බලසේනාවක් පමණක් සිටි 1924–27 කාලයේ ඒ පක්ෂය භුක්ති විඳිමින් සිටි කිසියම් නිදහසක් වී ද, ඒ නිදහස කුඕමින්තාං ආණ්ඩුවේ "පක්ෂය පවිත්‍ර කිරීමේ" සහ සමූහඝාතනයේ ප්‍රතිපත්ති ඇති වෙනවාත් සමග ම අතුරුදහන් විය. වැලිත් අද, සන්නද්ධ බලසේනාවන් නොමැති චීන ප්‍රජාතන්ත්‍රවාදි සංගමයට ත් කුඕමින්තාං පක්ෂය තුළ සිටින ප්‍රජාතන්ත්‍රවාදින්ට ත් නිදහසක් නැත. අපි කුඕමින්තාං පාලනක්‍රමය යටතේ සංස්කෘතික, අධ්‍යාපන සහ කර්මාන්තමය කවයන් තුළ සිටින කම්කරුවන්, ගොවියන් සහ ශිෂ්‍යයන් ද ප්‍රගතිශීලි අතට නැඹුරු වූ මිනිසුන් ද ගනිමු — ඉකුත් දහඅට අවුරුද්ද තිස්සේ ම ඔවුන් ගෙන් කිසිවකුට කිසි ම සන්නද්ධ බලසේනාවක් නො සිටියේ ය, ඔවුන් ගෙන් කිසිවකුට කිසි ම නිදහසක් නො තිබුණේ ය. මේ සියලු ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂ වලට ත් මිනිසුන්ට ත් නිදහස ප්‍රතික්ෂේප කර තිබෙන්නේ ඔවුන් හමුදාවන් සංවිධානය කළ නිසා, "රදළ වෙන්වීම්වාදය" ක්‍රියාවේ යෙදූ නිසා, "ද්‍රෝහි ප්‍රදේශ" ඇති කළ නිසා සහ "ආණ්ඩුවේ සහ යුදහමුදාවේ නියෝග" කඩ කළ නිසා විය හැකි ද? පොඩ්ඩක් වත් නැත. එසේ නැතුවා පමණක් නො ව, ඔවුන්ට නිදහස නො දී තිබෙන්නේ ඔවුන් මේ දේවල් එකක් වත් නො කළ නිසා ම ය.

"හමුදාව අයිති රජයට ය" — එය හරියට ම හරි ය; රජයකට අයත් නො වන හමුදාවක් ලෝකයේ නැත. එහෙත් කුමන වර්ගයේ රජයක් ද? මහ ඉඩම්හිමියන්ගේ, මහ බැංකුකාරයන්ගේ සහ මහ කොම්ප්‍රදෝරුවන්ගේ රදළ සහ පැසිස්ට් ආඥාදායකත්වය යටතේ පවතින රජයක් ද, නැතහොත් ජනතාව අතර පුළුල් සමූහයන්ට අයත් නව–ප්‍රජාතන්ත්‍රවාදි රජයක් ද? චීනය විසින් පිහිටුවිය යුතු ව තිබෙන එක ම රාජ්‍ය වර්ගය නව–ප්‍රජාතන්ත්‍රවාදි රජයකි; මේ පදනම පිට, ඇ නව–ප්‍රජාතන්ත්‍රවාදි සහාග ආණ්ඩුවක් පිහිටුවිය යුතු ය; චීනයේ

සියලු ම සන්නද්ධ බලසේනාවන් ජනතාවගේ නිදහස සුරක්ෂිත කරන සේ ත් විදේශීය ආක්‍රමණිකයන් සමග සාර්ථක ලෙස සටන් කරන සේ ත්, ඒ සියලු බලසේනාවෝ එබඳු රජයක එබඳු ආණ්ඩුවකට අයත් විය යුත්තාහ. චීනයෙහි නව–ප්‍රජාතන්ත්‍රවාදි සහාග ආණ්ඩුවක් ඇති වූ වහා ම, චීනයේ නිදහස් ප්‍රදේශ තම සන්නද්ධ බලසේනාවන් ඒ ආණ්ඩුවට බාර දෙනවා ඇත. එහෙත් සියලු කුඕමින්තාං සන්නද්ධ බලසේනාවන් ද ඒ සමග ම ඒ ආණ්ඩුවට බාර දෙන්ට සිදු වෙනවා ඇත.

1924දී දොස්තර සුන් යත්–සෙන් මෙසේ කීවේ ය: "අදින් ජාතික විප්ලවයේ නව කාලපරිච්ඡේදයක් සලකුණු විය යුතු ය.... පළමුවැනි පියවර සන්නද්ධ බලසේනාවන් ජනතාව සමග එක්සත් කිරීම ය, ඊළඟ පියවර ඒ බලසේනාවන් ජනතාවගේ බලසේනාවන් බවට හැරවීම ය."[3] අටවැනි මාර්ග හමුදාව ත් අළුත් සිව්වැනි හමුදාව ත් මේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොද තිබෙන නිසා ම ය ඒ හමුද "ජනතාවගේ සන්නද්ධ බලසේනාවන්", ඒ කියන්නේ, මහජන හමුදාව, බවට පත් වී ඇත්තේ ත්, ජය දිනා ගන්ට ඒ හමුද සමත් වී ඇත්තේ ත්. උතුරු යුදගමනෙන් මුල් වකවනුවේදී, කුඕමින්තාං හමුදාවෝ දොස්තර සුන්ගේ "පළමුවැනි පියවර" ගත්හ, එහෙයින් ජය දිනා ගත්හ. උතුරු යුදගමනෙන් පසු වකවනුවේදී ඔව්හු "පළමුවැනි පියවර" පවා අත හැර දැමූහ, ජනතාවට විරුද්ධ මගක් ගත්හ; එහෙයින් ඒ කාලයේ සිට අද දක්වා ම ඔව්හු වඩ වඩා දූෂිත වී සිටිති, පිරිහී සිටිති; අභ්‍යන්තර යුද්ධ කරන කල තම පියවි තත්වයෙහි වන ඔවුන්, බාහිර යුද්ධ කරන්ට සිදු වූ කල තම පියවි තත්වයෙන් තොර නො වී බැරි ය. කුඕමින්තාං හමුදාවේ සිටින හෘදයසාක්ෂියක් ඇති හැම දේශප්‍රේමි නිලධාරියෙක් ම සුන් යත්–සෙන් ජීවගුණය නැවත පණ ගැන්වීමට ත් තම හටකණ්ඩායම් විපර්යාස කිරීමට ත් වැඩ කරන්ට පටන් ගත යුතු ය.

පරණ හමුදාවන් විපර්යාස කිරීමේ වැඩයේදී, අළුතෙන් අධ්‍යාපනය දී හැඩ ගැසිය හැකි සියලු නිලධාරින් හට, ඔවුන් මහජන හමුදාවේ නතර වී සේවය කරන සේ, තම යල්පැනපු දෘෂ්ටිය දුරුකර දමා, නිවැරදි දෘෂ්ටියක් ඇති කර ගැනීමට ආධාර කරනු පිණිස සුදුසු අධ්‍යාපනයක් දිය යුතු ය.

චීන ජනතාවගේ හමුදාව ඇති කිරීම පිණිස අරගල කිරීම මුළු ජාතියේ ම යුතුකම වේ. මහජන හමුදාවක් නොමැත්තේ නම් මහජනයාට කිසිවක් නැත. මේ ප්‍රශ්නය ගැන මොනම අන්දමක වත් පුහු මත ඉදිරිපත් කිරීමක් නො විය යුතු ය.

කොමියුනිස්ට්වාදින් වන අපි චීන හමුදාව විපර්යාස කිරීමේ කර්තව්‍යයට අපේ අනුබලය දීමට සූදානමින් සිටිමු. චීන නිදහස් ප්‍රදේශ වල සන්නද්ධ බලසේනාවන්ට විරුද්ධ වෙනවා වෙනුවට ජනතාව සමග එක්සත් වීමට සහ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ජපන් ආක්‍රමණිකයන්ට විරුද්ධ වීමට කැමති සියලු යුද්ධ බලසේනාවෝ අටවැනි මාර්ග සහ අළුත් සිව්වැනි හමුදාවන් විසින් මිත්‍ර භටකණ්ඩායම් ලෙස සලකා නිසි ආධාර දෙනු ලැබිය යුත්තාහ.

ස ට හ න්

[1]මෙ වකවානුව ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයේ ආරම්භය සලකුණු කළ 1937, ජූලි 7වැනි දින ලූගෞචියාඕ සිද්ධියේ සිට 1938 ඔක්තෝබරයේදී වූහාන් නගරය වැටීම තෙක් විය.

[2]සන්නද්ධ වැඩ කණ්ඩායම් බහුජනයා සංවිධානය කිරීම පිණිස ත් සතුරාට පහර ගැසීම පිණිස ත් සතුරා අල්ලාගෙන සිටි ප්‍රදේශ වල ඇතුළට ම ගිය කුඩා වැඩ කණ්ඩායම් විය. එබඳු කණ්ඩායමක් කොමියුනිස්ට් පක්ෂය, නිදහස් ප්‍රදේශ වල ආණ්ඩු, මහජන හමුදාව සහ බහුජන සංවිධාන යන විවිධ සංවිධාන වලින් ගත් කාඩර්වරුන් ගෙන් යුක්ත විය, ආයුධ ස්වල්පයකින් සජ්ජිත කරනු ලැබී ය. මෙය සතුරා අල්ලාගෙන සිටි ප්‍රදේශ වල වැඩකටයුතු කරගෙන යාමට පහසු වූ සංවිධාන ක්‍රමයක් විය.

[3]දෙස්තර සුන් යත්-සෙන්ගේ 1924 නොවැම්බර් 10වැනි දිනය දරන "මා උතුරෙන් වෙන් වී යාම ගැන ප්‍රකාශය" යන්නෙනි.

තමාගේ ම යැපීම සඳහා හමුදාව විසින් කරන නිෂ්පාදනය ගැන සහ වැරදි හරිගැස්සීම පිණිස ත් නිෂ්පාදනය පිණිස ත් ගෙනයන ශ්‍රේෂ්ඨ ව්‍යාපාර වල වැදගත්කම ගැන

1945, අප්‍රේල් 27

දැනට පවතින්නේ අපේ හමුදාව අධික ද්‍රව්‍යමය දුෂ්කරතාවන්ට මුහුණ පා සිටින්නා වූ ත් විසිරී සිටිමින් කරන සටන්ව්‍යාපාර වල යෙදී සිටින්නා වූ ත් වටාපිටා තත්වයකි; මේ තත්වය තුළ, හමුදාවට කෑම බීම සැපයීමේ සම්පූර්ණ වගකීම පවරා ගැනීම බාර ගන්ට නායක මණ්ඩල වලට කොහෙත් ම නො හැකි ය; මන්ද යත් එසේ කිරීමෙන් පහළ මට්ටම් වල සිටින නිලධාරින් සහ භටයන් මහත් සංඛ්‍යාවන්ගේ මුලපිරුමේ ශක්තියට අවහිර කිරීම ත් ඔවුන්ගේ ඕනෑඑපාකම් පිරිමසන්ට බැරි වීම ත් යන දෙක ම සිදු විය හැකි නිසා ය. අප විසින් කිව යුත්තේ "සහෝදරවරුනි, අපි සියලු දෙනා ම ක්‍රියාවට බැස, අපේ දුෂ්කරතා ජය ගනිමු!" කියා යි. ඉහළ මට්ටම් වල සිටින නායකයන් කරන්ට තිබෙන වැඩ මැනවින් පණවා, තමන්ගේ ම පරිශ්‍රමයන් මගින් දුෂ්කරතා ජය ගැනීම පිණිස නිදහසේ වැඩ කරන්ට පහළ මට්ටම් වලට ඉඩ දෙතොත්, ගැටළුව විසදෙනවා ඇත, සත්තකින් ම, වඩා සතුටුදායක අන්දමකට විස-දෙනවා ඇත. එහෙත්, එසේ කරනවා වෙනුවට, ඉහළ මට්ටම් හැම විට ම තමන්ට ඇත්ත වශයෙන් ගෙනයන්ට හැකිවාට වඩා ලොකු බරකට කර දෙතොත්, නිදහසේ වැඩ කරන්ට පහළ මට්ටම් වලට ඉඩ දීමට එඩිතර නො වෙතොත්, පුළුල් බහුජන සමූහයන් අතර ස්ව-ශක්තිය කෙරෙහි විශ්වාසය තබා වැඩ කිරීම පිණිස උද්‍යොගයක් පුබුදු නො කරතොත්, එවිට ඉහළ මට්ටම් කොපමණ පරිශ්‍රම දැරුවත් ප්‍රතිඵලය වෙනවා ඇත්තේ ඉහළ මට්ටම් සහ පහළ මට්ටම් යන දෙක ම අමාරු අඩියකට වැටීම ය; පවත්නා වටාපිටා

මෙය සහෝදර මාඕ සේතුං විසින් යෙන්ආන් නුවර විමුක්ති දිනපතා පුවත්පත සඳහා ලියනලද කතුවැකියක් විය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

තත්වය තුළ ගැටළුව කිසි කලෙක විසඳෙන්නේ නැත. ඉකුත් අවුරුදු කීපයේ අත්දැකීම් වලින් මෙය ඕනෑ තරම් ඔප්පු වී ඇත. ''ඒකීභූත කළ නායකත්වය සහ විමධ්‍යගත කළ පරිපාලනය'' පිළිබඳ මූලධර්මය වර්තමාන වටාපිටා තත්වය තුළ අපේ නිදහස් ප්‍රදේශ වල සියලු ආර්ථික වැඩකටයුතු සංවිධානය කිරීම පිණිස තිබෙන නිවැරදි මූලධර්මය බව ඔප්පු වී තිබේ.

නිදහස් ප්‍රදේශ වල සන්නද්ධ බලසේනාවෝ දැනට ම මුළු ගණනින් මිනිසුන් 9,00,000ට වැඩි ය. ජපන් ආක්‍රමණිකයන් පරාජය කිරීම පිණිස, අපි ඔවුන් මේ ගණන මෙන් කීප ගුණයකට වැඩි කළ යුත්තෙමු. එහෙත් අපට මේ දක්වා බැහැරින් කිසි ආධාරයක් ලැබී නැත. අනාගතයේදී අපට ආධාර ලැබුණත්, දිවිපෙවෙත පිණිස අපේ ම මාර්ග සකස් කර ගන්ට අපට සිදු වෙනවා ඇත; ඒ කරුණ ගැන කිසි ම මුළාවක් නො තිබිය යුතු ය. නුදුරු අනාගතයේදී අවශ්‍ය යුද්ධ සේනා සංඛ්‍යාවක්, ඒවා දැනට විසිරී සිටිමින් කරන සටන්ව්‍යාපාර වල යෙදී සිටින ප්‍රදේශ වලින් මෑත් කොට ගෙන, නිශ්චිත සතුරු ස්ථාන වලට පහර දීම පිණිස ඒකරාශි කරන්ට අපට සිදු වෙනවා ඇත. ඒකරාශි කළ සටන්ව්‍යාපාර පිණිස යොදන එතරම් ලොකු සේනාවන්ට තමන්ගේ යැපීමට අවශ්‍ය දේ සඳහා තමන් ම නිෂ්පාදනයෙහි යෙදෙන්ට බැරි වෙනවා ඇත; ඊටත් වඩා, පසුමුණෙන් සපයන–දේ විශාල වශයෙන් ඔවුන්ට උවමනා වෙනවා ඇත; කලින් මෙන් ම සටන් කරන්ට ත් නිෂ්පාදනයෙහි යෙදෙන්ට ත් පුළුවන් වන්නේ දැනට සිටින තැන් වල ම නතර වී සිටින ප්‍රාදේශික භටකණ්ඩායම් වලට සහ ප්‍රාන්තීය සේනාවන්ට පමණකි (වැලිත් ඔවුන්ගේ ගණන තවම සැලකියයුතු තරම් වෙනවා ඇත). තත්වය එසේ වන හෙයින්, සටන් කිරීමට ත් පුහුණු වීමට ත් බාධා නො වන තාක්, කිසි විශේෂයක් නැතිව සියලු ම භටකණ්ඩායම් නිෂ්පාදනය මගින් තමන්ට උවමනා දෙයින් කොටසක් වත් තමන් විසින් ම සපයා ගන්නා සැටි උගෙනීමට වර්තමාන ඉඩප්‍රස්තාව උපයෝගි කර ගත යුතු බවට කිසි සැකයක් තිබෙන්ට පුළුවන් ද?

අප සිටින වටාපිටා තත්වයන් තුළ, හමුදාව තමාගේ ම යැපීමට අවශ්‍ය දේ සපයා ගැනීම පිණිස නිෂ්පාදනය කිරීම, ආකාරයෙන් නොදියුණු හෝ ප්‍රතිගාමී වුව ද, හරයෙන් ප්‍රගතිශීලි ය, මහත් ඓතිහාසික වැදගත්කමකින් යුක්ත ය. නියම අන්දමට කතා කරන කල, අපි ශ්‍රම භේදය පිළිබඳ මූලධර්මය කඩ කරමු. කෙසේ වෙවා, අප සිටින වටාපිටා තත්වයන් තුළ — එනම්, (කුඕමින්තාං පක්ෂයේ ප්‍රධාන පාලක කල්ලියේ අපරාධ වල ප්‍රතිඵලය වශයෙන් ඇති වී තිබෙන) රටේ දිළිඳුකම සහ අසමගිය ත්, දිග්ගැසුණු සහ විසිරී පවතින ගෙරිල්ලා යුද්ධය ත් තුළ — අප කරන දේ ප්‍රගතිශීලි ය. කුඕමින්තාං සෙබළු කොතරම් පාණ්ඩු පාට ද කෙට්ටු ද කියා ත්, නිදහස් ප්‍රදේශ වල සිටින අපේ සෙබළු කොතරම් පුෂ්ටිමත් ද ශක්තිමත් ද කියා ත් බලන්න! අපේ ම යැපීම පිණිස අප නිෂ්පාදනය කරන්ට පටන්ගැනීමට කලින් අපට මොන තරම්

අමාරුකම් තිබුණා ද කියා ත්, ඊට පස්සේ සිට අපට කොතරම් හොඳ ද කියා ත් බලන්න! ක්‍රම දෙකෙන් එකක්, ඒ කියන්නේ, තමන්ගේ දිවිපෙවෙතට අවශ්‍ය සියල්ල ම ඉහළ මට්ටම් වලින් සැපයීම ත්, ඉහළ මට්ටම් යමක් දෙන හෝ නො දෙන නමුත් තමන්ට උවමනා කරන සියල්ල ම, නැතහොත් ඉන් වැඩි කොටස, නැතහොත් අඩක්, එසේ ත් නැතහොත් අඩකට ත් අඩුවෙන් වුවත් තමන් විසින් ම නිෂ්පාදනය කර ගැනීමට තමන්ට ඉඩ දීම ත් යන ක්‍රම දෙකෙන් එකක් තෝරා ගන්ට මෙහිදී අපි හමුදා ඒකක දෙකකින්, කොම්පඤ්ඤ දෙකකින් ය'යි කියමු, ඉල්ලමු. වඩා හොඳ ප්‍රතිඵල ගෙන දෙනවා ඇත්තේ කොයි ක්‍රමය ද? ඔවුන් වඩා කැමති වෙනවා ඇත්තේ කොයි එකට ද? තමන්ගේ ම යැපීම සඳහා කරන නිෂ්පාදනයෙහි යෙදෙමින් අවුරුද්දක් ම බැරෑරුම් ලෙස අත්හදා බැලීමෙන් පසු, දෙවැනි ක්‍රමයෙන් වඩා හොඳ ප්‍රතිඵල ලැබෙන බව ඔවුන් නිසැකයෙන් ම පිළිතුරු දෙනවා ඇත, ඒ ක්‍රමය පිළිගන්ට කැමති වෙනවා ඇත; තවද පළමුවැනි ක්‍රමයෙන් ලැබෙන ප්‍රතිඵල දිළිඳු ය'යි ඔවුන් නිසැකයෙන් ම පිළිතුරු දෙනවා ඇත, ඒ ක්‍රමය පිළිගන්ට කැමති නො වෙනවා ඇත. හේතුව නම් හමුදාවෙහි හැම අයකුගේ ම ජීවන තත්වයන් දියුණු කිරීමට දෙවැනි ක්‍රමයට හැකි වන නමුත්, ඉහළ මට්ටම් කොයි තරම් වෙහෙස මහන්සි ගත්තත්, වර්තමාන දුෂ්කර ද්‍රව්‍යමය වටාපිටා තත්වයන් තුළ ඔවුන්ගේ ඕනෑ එපාකම් පිරිමසන්ට කිසි දවසක පළමුවැනි ක්‍රමයට බැරි වීම ය. අප ''නොදියුණු'' සහ ''ප්‍රතිගාමී'' ක්‍රමයක් මෙන් පෙනෙන දෙයක් පිළිගෙන තිබෙන නිසා, දිවිපෙවෙත පිණිස අවශ්‍ය දේ අතින් තිබෙන අගහිඟකම් පිටුදකින්ට ත් තම ජීවන තත්වයන් දියුණු කරගන්ට ත් අපේ භටකණ්ඩායම් වලට හැකි ය; එහෙයින් හැම සෙබළෙක් ම පුෂ්ටිමත් ව සහ ශක්තිමත් ව සිටී; ප්‍රතිඵලයක් වශයෙන්, දුෂ්කරතා විඳිමින් සිටින කොටසක් ම වන ජනතාව මත පැටවෙන බදු බර පහසු කොට, එසේ ඔවුන්ගේ අනුබලය දිනාගන්ට අපට හැකි වී ඇත; එසේ ම දිග්ගැසුණු යුද්ධය කරගෙන යන්ට සහ අපේ සන්නද්ධ බලසේනාවන් පළල් කරන්ට ත්, එමගින් නිදහස් ප්‍රදේශ ව්‍යාප්ත කිරීමට, සතුරා අල්ලාගෙන සිටින ප්‍රදේශ අඩු කිරීමට සහ ආක්‍රමණිකයා පරදා අවසාන ජයග්‍රහණය දිනා ගැනීමේ සහ මුළු චීනයේ ම විමුක්තිය අත්පත් කරගැනීමේ අරමුණ මුදුන්පත් කිරීමට ත් අපට හැකි වී තිබේ. මෙය මහත් ඓතිහාසික වැදගත්කමක් ඇති දෙයක් නො වේ ද?

හමුදාව තමාගේ ම යැපීම පිණිස කරන නිෂ්පාදනයෙන් හමුදාවේ ජීවන තත්වයන් දියුණු කොට සහ ජනතාව මත පැටවෙන බර අඩු කොට, එමගින් හමුදාව පළල් කරන්ට හැකි වී තිබෙනවා පමණක් නො වේ. ඊට අමතර ව, වහා ම ඵල දෙන විපාක බොහෝ ගණනක් ද ඊට ඇත්තේ ය. ඒවා මතු දක්වන පරිදි ය:

(1) නිලධාරීන් සහ භටයන් අතර සබඳකම් දියුණු වීම. නිලධාරී ත් භටයෝ ත් නිෂ්පාදනයේදී එක් වී වැඩ කරමින්, සහෝදරයන් සේ වෙති.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

(2) ශ්‍රමය කෙරෙහි වඩා යහපත් ආකල්පයක්. දැන් අපට තිබෙන්නේ කුලියට හේවාකම් කරන පරණ ක්‍රමය වත්, සර්වජන යුද්ධ සේවය වත් නො ව තුන්වැනි ක්‍රමයකි; එනම් ස්වෙච්ඡාභටයන් සේවයට ගැනීමේ ක්‍රමය යි. එය රස්තියාදුකාරයන් ඒ තරම් අධික ගණනක් ඇති නො කරන නිසා කුලියට හේවාකම් කරන ක්‍රමයට වඩා හොඳ ය; එහෙත් එය සර්වජන යුද්ධ සේවය තරම් ම හොඳ නැත. එසේ ද වුව, අපේ වර්තමාන තත්වයන් ගෙන් අපට ඉඩ ලැබෙන්නේ සර්වජන යුද්ධ සේවා ක්‍රමය නො ව ස්වෙච්ඡාභටයන් සේවයට ගැනීමේ ක්‍රමය යොදා ගැනීමට පමණකි. සේවයට බන්ද ගත් සෙබළුන්ට දිගු කලක් හමුදා ජීවිතයක් ගත කරන්ට සිදු වන හෙයින්, එයින් ශ්‍රමය කෙරෙහි ඔවුන්ගේ ආකල්පය නරක් විය හැකි ය, එසේ ඔවුන් අතුරෙන් සමහරුන් රස්තියාදු-කාරයන් බවට හැරෙන්ට හෝ ඔවුන් යුදදෙටු හමුදාවන්ගේ ලක්ෂණය වී පවතින යම් යම් නරක ගතිගුණ වලින් කිලිටි වෙන්ට හෝ ඉඩ ඇත. එහෙත් හමුදාව තම යැපීම පිණිස නිෂ්පාදනය කරන්ට පටන් ගත් තැන් සිට, ශ්‍රමය කෙරෙහි ආකල්පය දියුණු වී තිබේ, රස්තියාදුකාර විධි පිටුදැක තිබේ.

(3) විනය ශක්තිමත් වීම. නිෂ්පාදනයේදී තිබෙන ශ්‍රම විනය සටනේදී සහ හමුදා ජීවිතයේදී විනය දුර්වල කිරීමක් කොහෙත් ම නො කරයි, ඇත්ත වශයෙන් එය ශක්තිමත් කරයි.

(4) හමුදාව ත් ජනතාව ත් අතර සබඳකම් දියුණු වීම. සන්නද්ධ බලසේනාවක් තමා සඳහා ''ගෘහපාලනය කරන්නට'' පටන් ගත් කල, ජනතාවගේ දේපොළ තමන්ගේ ප්‍රයෝජනයට ගැනීමක් කලාතුරකින් විනා සිදු නො වේ, නැතහොත් කිසි කලෙක සිදු නො වේ. නිෂ්පාදනයේදී හමුදාව ත් ජනතාව ත් ශ්‍රමය හුවමාරු කර ගනිමින් එකිනෙකාට උදව් කරන නිසා, ඔවුන් අතර මිත්‍රත්වය ශක්තිමත් වේ.

(5) හමුදාව තුළ ආණ්ඩුව ගැන මැසිවිලි කීම අඩු වේ, ඒ දෙක අතර සබඳකම් දියුණු වේ.

(6) ජනතාවගේ මහා නිෂ්පාදන ව්‍යාපාරයට රුකුලක්. හමුදාව නිෂ්පාදනයෙහි යෙදුණු කල, ආණ්ඩුව ත් සෙසු සංවිධාන ත් එසේ කිරීමේ අවශ්‍යතාව වඩා ත් පැහැදිලි වේ; ඒවා වඩා ත් උද්‍යොගයෙන් සහ උත්සාහයෙන් එසේ කරයි; එමෙන් ම, නිෂ්පාදනය වැඩි කිරීම පිණිස මුළු ජනතාවගේ සර්වව්‍යාපී ව්‍යාපාරයක් සඳහා තිබෙන අවශ්‍යතාව වඩාත් පැහැදිලි වේ; මෙය ද වඩා ත් උද්‍යොගයෙන් සහ උනන්දුවෙන් ගෙනයනු ලැබේ.

වැරදි හරිගැස්සීම පිණිස ත් නිෂ්පාදනය පිණිස ත් 1942දී සහ 1943දී පටන්ගත් බහුල ව පැතුරුණු ව්‍යාපාර, පිළිවෙලින් එකක් අපේ මතවාදී

ජීවිතයෙහි ද අනික අපේ ද්‍රව්‍යමය ජීවිතයෙහි ද, තීරණාත්මක කොටසක් රඟපා ඇත, තවම රඟපාන්නේ ය. අපි නිසි වේලාවට මේ පුරුක් දෙක ග්‍රහණය කර ගත්තොත් මිස, විප්ලවය නමැති මුළු දම්වැල ම ග්‍රහණය කරගන්ට අපට බැරි වෙනවා ඇත, අපේ අරගලය ඉදිරියට නො යනවා ඇත.

අප දන්නා පරිදි, 1937ට පෙර පක්ෂයට බැඳුණු සාමාජිකයන් අතුරෙන්, ඉතිරි වී සිටින්නේ දස දහස් කීපයක් පමණි; 12,00,000ක් වන අපේ වර්තමාන සාමාජික පිරිසෙන් වැඩි දෙනා ගොවිජනතාව සහ සුළු ධනේශ්වරපංක්තියේ සෙසු කොටස් අතුරෙන් පැමිණි අය වෙති. මේ සහෝදරවරුන්ගේ විප්ලවවාදී උද්‍යොගය අභිවාදනීය ය, මාක්ස්වාදී පුහුණුවක් ලැබීමට ඔව්හු කැමැත්තෝ ය; එහෙත් ඔවුන් මාක්ස්වාදය හා නො ගැලපෙන, එසේ ත් නැතහොත් සම්පූර්ණයෙන් ම නො ගැලපෙන අදහස් තමන් කැටුව පක්ෂය තුළට ගෙනවුත් ඇත. 1937ට පෙර පක්ෂයට බැඳුණු ඇතැම් අය සම්බන්ධයෙන් ද එය ම සැබෑ ය. එය අතිශයින් ම බැරෑරුම් ප්‍රතිවිරෝධයක්, ඉමහත් දුෂ්කරතාවක්, වේ. මේ වටාපිටා තත්වයන් තුළ, බහුල ව පැතුරුණු මාක්ස්වාදී අධ්‍යාපන ව්‍යාපාරයක්, ඒ කියන්නේ, වැරදි හරිගැස්සීමේ ව්‍යාපාරය, අප විසින් ආරම්භ නො කරනලද නම්, අපට සන්සුන් ලෙස ඉදිරියට යන්ට හැකි වේවි ද? ප්‍රත්‍යක්ෂ ලෙස ම නැත. කාඩර්වරුන් මහත් සංඛ්‍යාවන් අතර ඇති මේ ප්‍රතිවිරෝධය — පක්ෂය තුළ, නිර්ධනපංක්ති මතවාදය ත් (සුළු ධනේශ්වර-පංක්තියේ, ධනේශ්වරපංක්තියේ සහ එසේ ම ඉඩම්හිමි පංක්තියේ මතවාද, එහෙත් ප්‍රධාන වශයෙන් සුළු ධනේශ්වරපංක්තියේ මතවාදය ඇතුළු ව) නිර්ධනපංක්ති නො වන මතවාද ත් අතර පවතින ප්‍රතිවිරෝධය, එනම්, මාක්ස්වාදී මතවාදය සහ මාක්ස්වාදී නො වන මතවාදය අතර පවතින ප්‍රතිවිරෝධය — අප විසින් විසඳා තිබෙන නිසා, නැතහොත් විසඳාගෙන යමින් තිබෙන නිසා, (සම්පූර්ණ නො වූ නමුත්) පෙර නො වූ විරූ මතවාදී, දේශපාලන සහ සංවිධානාත්මක සමගියකින් යුතු ව මහත් තරසර පියවරින් ඉදිරියට යන්ට අපේ පක්ෂයට හැකි ය. මෙතැන් සිට වඩා ත් විශාල ව වැඩෙන්ට අපේ පක්ෂයට හැකි ය, එය එසේ වැඩිය යුතු ය; වැලිත්, මාක්ස්වාදී මතවාදයේ මූලධර්ම වලින් මග පෙන්වනු ලබමින්, එය තව දුරටත් වර්ධනය වන සේ වඩාත් දක්ෂ ලෙස සුක්කානම අල්ලන්ට අපට පුළුවන් වෙනවා ඇත.

අනික් පුරුක නිෂ්පාදනය පිණිස ගෙනයන ව්‍යාපාරය යි. විරුද්දකම් පෑමේ යුද්ධය අට අවුරුද්දක් ම කරගෙන ගොස් ඇත. එය පටන් ගන්නා විට අපට ආහාර සහ වස්ත්‍ර තිබුණේ ය. එහෙත් අපට ධාන්‍ය හිඟ වෙමින්, පිසින තෙල් සහ ලුණු හිඟ වෙමින්, ඇඳ–ඇතිරිලි කොට්ට මෙට්ට සහ රෙදිපිළි හිඟ වෙමින්, අරමුදල් හිඟ වෙමින් අප මහත් අමාරුවට වැටෙන තුරු කරුණු ක්‍රමක්‍රමයෙන් වඩ වඩා නරක් විය. මේ මහත් දුෂ්කරතාව, මේ මහත් ප්‍රතිවිරෝධය, පැමිණියේ ජපනුන්ගේ ලොකු පහරදීම් සහ 1940–43 කාලයේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කුඕමින්තාං ආණ්ඩුව ජනතාවට ගැසූ විශාල පරිමාණයේ පහරවල් (''කොමියුනිස්ට්-විරෝධී ප්‍රහාර'') තුන පසුපස්සේ ය. අප මේ දුෂ්කරතාව මැඩපැවැත්තුවේ නැත්නම් මේ ප්‍රතිවිරෝධය විසඳුවේ නැත්නම්, මේ පුරුක ග්‍රහණය කර ගත්තේ නැත්නම්, අපේ ජපන්-විරෝධී අරගලය දියුණු වෙන්ට පුළුවන්කමක් තිබුණේ ද? ප්‍රත්‍යක්ෂ ලෙස ම නැත. එහෙත් අපි නිෂ්පාදනය දියුණු කරන්ට ඉගෙනගෙන සිටිමු, තවම ත් ඉගෙනගනිමින් සිටිමු; එහෙයින් අපි යළිත් උනන්දුවෙන් සහ ජීවශක්තියෙන් පිරී සිටිමු. කිසි ම සතුරකුට බිය නො වන අපි, අවුරුදු කීපයකින් ඔවුන් සියලු දෙනා ම අභිභවනය කරමු.

මෙසේ වැරදි හරිගැස්සීම ත් නිෂ්පාදනය ත් පිණිස ගෙනයන මහා ව්‍යාපාර දෙකේ ඓතිහාසික වැදගත්කම ගැන කිසි ම සැකයක් තිබෙන්නට බැරි ය.

අපේ අරගලයේ අවශේෂ කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස අඩිතාලමක් වශයෙන්, අපි ඉදිරියට යමින් මේ ශ්‍රේෂ්ඨ ව්‍යාපාර දෙක හැම තැන ම පතුරුවා හරිමු. එසේ කරන්ට අපට හැකි වේ නම්, චීන ජනතාවගේ පූර්ණ විමුක්තිය සහතික වෙනවා ඇත.

දැන් වසන්තයේ සීසෑම පිණිස සෘතුව වේ; හැම නිදහස් ප්‍රදේශයක ම නායක සහෝදරවරුන්, වැඩ කරන කාර්යභාර-පුද්ගලයන් සහ බහුජන සමූහයන් යථා කාලයෙහි නිෂ්පාදනය නමැති පුරුක ග්‍රහණය කරගෙන, ගිය අවුරුද්දේ මුදුන්පත් කළ දේටත් වැඩියෙන් මුදුන්පත් කරන්ට වෙර දරනවා ඇතැ'යි බලාපොරොත්තු වනු ලැබේ. විශේෂයෙන් නිෂ්පාදනය වර්ධනය කරන්ට මෙතෙක් ම ඉගෙනගෙන නැති ප්‍රදේශ වල, මේ අවුරුද්දේ වඩා ත් විශාල පරිශ්‍රම දැරිය යුතු ය.

සතුරු බලසේනා එකින් එක විනාශ කිරීම පිණිස වැඩි-බලය ඇති බලසේනාවක් ඒකරාශි කරන්න

1946, සැප්තැම්බර් 16

1. සතුරු බලසේනා එකින් එක විනාශ කිරීම පිණිස වැඩි-බලය ඇති බලසේනාවක් ඒකරාශි කිරීමෙන් සටන් කරන ක්‍රමය[1] යුද්ධව්‍යාපාරයක් සඳහා හටකණ්ඩායම් පිළිවෙල කොට යෙදීමේදී පමණක් නො ව සටනක් පිණිස හටකණ්ඩායම් පිළිවෙල කොට යෙදීමේදී ද යෙදිය යුතු ය.

2. යුද්ධව්‍යාපාරයක් සඳහා සේනාවන් පිළිවෙල කොට යෙදීම සම්බන්ධයෙන්, සතුරා බ්‍රිගේඩ[2] (හෝ රෙජමේන්තු) රැසක් යොදා, දිසා කීපයක සිට කොලම් කීපයකින් අපේ හමුදාවට විරුද්ධ ව ඉදිරියට එන කල, අපේ හමුදාව — සතුරාගේ ශක්තිය මෙන් හය ගුණයක්, පස් ගුණයක්, සිව් ගුණයක් හෝ යටත්පිරිසෙයින් තුන් ගුණයක් වත් වන — ඒකාන්ත වැඩි-බලය ඇති බලසේනාවක් ඒකරාශි කොට, පළමුකොට එක් සතුරු බ්‍රිගේඩයක් (හෝ රෙජමේන්තුවක්) වට කොට මුල්පිස දැමීමට නිසි මොහොත තෝරා ගත යුතු ය. එය සතුරාගේ වඩා දුර්වල බ්‍රිගේඩ (හෝ රෙජමේන්තු) අතුරෙන් එකක්, නැතහොත් අනුබල ලැබීම අඩු එකක්, නැතහොත් භූමිභාගය සහ ජනතාව අපට ඉතා ම හිතකර වූ ත් සතුරාට අහිතකර වූ ත් තැනෙක නතර කර සිටින එකක්, විය යුතු ය. අපි අප විසින් වටලා පහර දෙමින් සිටින බ්‍රිගේඩය (හෝ රෙජමේන්තුව) පළමුකොට අප විසින් විනාශ කළ හැකි වන සේ, සෙසු සතුරු බ්‍රිගේඩ (හෝ රෙජමේන්තු) විසින් ඒ බ්‍රිගේඩයට (හෝ රෙජමේන්තුවට) අතිරේක ආධාර බලසේනාවන් ඉක්මනට එවීම වළකනු පිණිස කුඩා බලසේනාවන් යොදා ඒවා සිටින තැන ම සිටින සේ බැඳ තිබිය යුත්තෙමු. මෙය මුදුන්පත් කළ කල්හි, අපි, වටාපිටා තත්වයන්ට අනුව, සතුරු බ්‍රිගේඩ අතුරෙන් තව එකක් හෝ කීපයක් මුල්පිස දැමිය යුත්තෙමු, නැතහොත් තව දුරට ත් සටන් කිරීම පිණිස විවේක ගැනීම සහ තහවුරු වීම සඳහා ඉවත් වී යා යුත්තෙමු. (කලින් කී එක ගැන උදාහරණ දෙකක්

මේ පක්ෂ-අභ්‍යන්තර නිර්දේශය චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ විප්ලවවාදී යුද්ධ අධිකාරිය සඳහා සහෝදර මාඕ සේතුං විසින් කෙටුම්පත් කරනලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙන්න. සූ යූගේ සහ තාන් චෙන්-ලින්ගේ විධානය යටතේ සිටි අපේ හටකණ්ඩායම් අගෝස්තු 22වැනි ද ජූකාඕ අසළදී සතුරාගේ මංමාවත් පොලිස් බළකායයට[3] අයත් පන් දහසක් ද, අගෝස්තු 26වැනි ද එක් සතුරු බ්‍රිගේඩයක් ද, අගෝස්තු 27වැනි ද බ්‍රිගේඩ එක හමාරක් ද මුල්පිස දැමී ය.[4] ලියු පෝ-චෙං සහ තෙං ශියාඕ-පිං යටතේ සිටි අපේ හටකණ්ඩායම් සැප්තැම්බර් 3 සහ 6 අතර තිංකාඕ අසළදී එක් සතුරු බ්‍රිගේඩයක් ද, සැප්තැම්බර් 6වැනි ද හවස්වරුවෙහි තවත් එකක් ද, සැප්තැම්බර් 7වැනි ද සහ 8වැනි ද තව දෙකක් ද මුලසුන් කළේ ය.[5]) යුද්ධව්‍යාපාරයක් සඳහා සේනාවන් පිළිවෙල කොට යෙදීමේදී සතුරා අඩුවෙන් තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සතුරු කොලම් සියල්ල ම ගැන එක විට ක්‍රියා කරනු පිණිස අප අපේ බලසේනාවන් බෙදමින් සටන් කරන වැරදි ක්‍රමය ප්‍රතික්ෂේප කළ යුත්තෙමු; කවර හෙයින් ද යත්, මේ ක්‍රමයෙන් එක ම සතුරු කොලමක් වත් විනාශ කරන්ට අපට බැරි වන අතර අප අක්‍රියාකාරි තත්වයකට වැටෙන නිසා ය.

3. සටනක් සඳහා සේනාවන් පිළිවෙල කොට යෙදීමේදී, අප ඒකාන්ත වැඩි-බලය ඇති බලසේනාවක් ඒකරාශි කොට සතුරාගේ කොලම් අතුරෙන් එකක් (එක් බ්‍රිගේඩයක් හෝ රෙජමේන්තුවක්) වට කළ විට, අපේ පහර දෙන සේනාවෝ (හෝ සේනාංගයෝ) වට කර සිටින සියලු ම සතුරන් එක විට එක පහරින් ම මුල්පිස දැමීමට උත්සාහ කරමින්, එසේ තමන් බෙද ගෙන, කාලය ත් නාස්ති කරමින් හා ප්‍රතිඵල ලැබීම අමාරු කර ගනිමින්, එක ම තැනෙක වත් සෑහෙන තරම් ශක්තියක් නැතිව හැම තැනට ම පහර නො දිය යුත්තාහ. ඒ වෙනුවට, අප විසින් කළ යුත්තේ ඒකාන්ත වැඩි-බලය ඇති බලසේනාවක්, ඒ කියන්නේ සතුරාගේ බලසේනාව මෙන් හය ගුණයක්, පස් ගුණයක්, සිව් ගුණයක් හෝ යටත්පිරිසෙයින් තුන් ගුණයක් වත් වන බලසේනාවක් ඒකරාශි කොට, අපේ කාලතුවක්කු හමුදව මුළුමනින් ම හෝ ඉන් වැඩි කොටස හෝ ඒකරාශි කොට, සතුරු ස්ථාන අතර වඩා දුබල තැන් වලින් එක් තැනක් (දෙකක් නො වේ) තෝරාගෙන, ඊට දරුණු ලෙස පහර දෙමින්, නිසැක ව ම ජය දිනාගන්නා බවට වග බලා ගැනීම ය. මෙය මුදුන්පත් කළ විට, හනික ඒ ජයග්‍රහණයෙන් ප්‍රයෝජන ගනිමින්, සතුරු බලසේනා එකින් එක විනාශ කළ යුතු ය.

4. සටන් කරන මේ ක්‍රමයේ විපාක නම්, පළමුව, සම්පූර්ණයෙන් මුලසුන් කිරීම ය; දෙවැනි ව, ඉක්මනින් විසඳුමක් ලැබීම ය. සතුරාට ඉතා ම රිදෙන පහරවල් ගැසිය හැක්කේ සම්පූර්ණයෙන් මුලසුන් කිරීම මගින් පමණකි; කවර හෙයින් ද යත් අප එක් රෙජමේන්තුවක් මුල්පිස දැමූ කල, ඔහුට එක් රෙජමේන්තුවක් අඩු වේ; අප එක් බ්‍රිගේඩයක් මුල්පිස දැමූ කල, ඔහුට එක් බ්‍රිගේඩයක් අඩු වේ; ඒ නිසා ය. මේ ක්‍රමය දෙවැනි-පේළියක හටකණ්ඩායම් නැති සතුරකුට විරුද්ධ ව යෙදූ කල ඉතා ම ප්‍රයෝජනවත් ය.

අපේ ම බලසේනාවන්ට සිදු වන පාඩු හැකි තරම් වැඩි ම දුරට පිරිමැසිය හැක්කේ සම්පූර්ණ මුලසුන් කිරීම මගින් පමණකි. එය දැන් අපට අපේ අවිආයුධ සහ වෙඩිබෙහෙත් සපයන ප්‍රධාන මාර්ගය පමණක් නො ව අපට අපේ මිනිස්බලය සපයන වැදගත් මාර්ගයක් ද වේ. සම්පූර්ණ මුලසුන් කිරීම සතුරාගේ හටකණ්ඩායම් වල චිත්තශක්තිය පිරිහෙළයි, ඔහුගේ අනුගාමිකයන් කලකිරවයි; එය අපේ හටකණ්ඩායම් වල චිත්තශක්තිය වැඩි කරයි, අපේ ජනතාව ප්‍රබෝධ කරයි. ඉක්මනින් ලබන විසඳුමක් නිසා සතුරාගේ අතිරේක ආධාර බලසේනා එකින් එක මුල්පිස දැමීමට හෝ ඒවා මග ඇර යාමට හෝ අපේ හටකණ්ඩායම් වලට හැකි වේ. සටනේදී හෝ යුද්ධව්‍යාපාරයේදී හෝ ඉක්මනින් විසඳුමක් ලැබීම දිග්ගැසුණු යුද්ධයක උපායමාර්ගයේදී අවශ්‍ය කාරණයක් වේ.

5. ක්‍රියාවෙහි නො යෙදී සිටින විට සතුරු බලසේනා එකින් එක මුල්පිස දැමීම පිණිස අපේ බලසේනා ඒකරාශි කිරීමේ මූලධර්මය අනුමත කරන්නා වූ ද, එහෙත් ක්‍රියාවෙහි යෙදී සිටින විට ඒ මූලධර්මය භාවිතාවෙහි යෙදීමට බොහෝ විට අසමත් වන්නා වූ ද බොහෝ දෙනා අපේ යුද්ධ කාඩර්වරුන් අතර තවම සිටිති. එය සතුරා අඩුවෙන් තක්සේරු කිරීම ත් අධික අධ්‍යාපනයක් සහ අධ්‍යයනයක් නොමැතිවීම ත් හේතු කොට ගෙන ය. සටන් කරන මේ ක්‍රමයේ ඇති වාසි නැවත නැවත ත් පැහැදිලි කිරීම පිණිස ද චියාං කායි-ශෙක්ගේ ප්‍රහාරයන් පරාජය කිරීමට තිබෙන ප්‍රධාන ක්‍රමය එය බව පෙන්වා දීම පිණිස ද අතීත සටන් වලට අයත් අවස්ථා විස්තර වශයෙන් ගෙනහැරපෑම අවශ්‍ය ය. මේ ක්‍රමය ප්‍රයෝජනයට ගනිමු නම්, අපි දිනන්නෙමු. ඊට පටහැනි ව ක්‍රියා කරමු නම්, අපි පරදින්නෙමු.

6. සතුරු බලසේනා එකින් එක මුල්පිස දැමීම පිණිස අපේ බලසේනා ඒකරාශි කිරීමේ මූලධර්මය දශකයකට වැඩි කලකට පෙර අපේ හමුදව ආරම්භ කළ තැන් සිට ම එහි කදිම සම්ප්‍රදායයක් වී ඇත; එය ඉදිරිපත් කර තිබෙන පළමුවැනි වතාව මෙය නො වේ. කෙසේ වේවා, ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලයේ, ගොරිල්ලා සංග්‍රාමය පිණිස අපේ බලසේනා විසිරී සිටින්ට සැලසීම ප්‍රාථමික විය, ජංගම සංග්‍රාමය පිණිස අපේ බලසේනා ඒකරාශි කිරීම අතිරේක විය. වර්තමාන සිවිල් යුද්ධයේදී, තත්වයන් වෙනස් වී තිබෙන නිසා, සටන් කරන ක්‍රමය ද වෙනස් විය යුතු ය. ජංගම සංග්‍රාමය පිණිස අපේ බලසේනා ඒකරාශි කිරීම ප්‍රාථමික විය යුතු ය, ගොරිල්ලා සංග්‍රාමය පිණිස අපේ බලසේනා විසිරී සිටින්ට සැලසීම අතිරේක විය යුතු ය. දැන් චියාං කායි-ශෙක්ගේ හමුදව වඩා ත් බලවත් ආයුධ අත් කරගෙන සිටින හෙයින්, සතුරු බලසේනා එකින් එක මුල්පිස දැමීම පිණිස වැඩි-බලය ඇති බලසේනාවක් ඒකරාශි කිරීමේ ක්‍රමය විශේෂයෙන් අවධාරණය කිරීම අපේ හමුදවට අවශ්‍ය ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

7. මේ ක්‍රමය යෙදිය යුත්තේ සතුරා පහරදීමෙහි යෙදී සිටින විට සහ අප ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට ය. කෙසේ වේවා, සතුරා ආරක්ෂාවීමෙහි යෙදී සිටින විට සහ අප පහරදීමෙහි යෙදී සිටින විට, අපි ඒ තත්ව දෙ වර්ගය වෙන් කර සලකමින්, වෙනස් ක්‍රම යෙදිය යුත්තෙමු. අපේ බලසේනාව ලොකු එකක් වන විට සහ ප්‍රදේශයෙහි සිටින සතුරා තරමක් දුර්වල වන විට, නැතහොත් අප සතුරාට උන්හිටිගමන් දෙන හදිස්සි ප්‍රහාරයක් දෙමින් සිටින විට, අප විසින් ඔහුගේ සේනාංග කීපයකට එක විට පහර දීමට ඉඩ තිබේ. උදහරණ වශයෙන්, ජූනි 5වැනි ද සහ 10වැනි ද අතර, ශාන්ටුං පළාතේ සිටින අපේ හටකණ්ඩායම් ත්සිංතාඕ-ත්සිනාන් සහ තියන්සින්-පූකව් දුම්රියමාර්ග වල පිහිටි සුළු නගර දහයකට වැඩි ගණනකට එක විට පහර දී අල්ලා ගත්තේ ය.[6] නැතහොත්, තවත් උදහරණයක් ගනිමු; අගෝස්තු 10වැනි ද සහ 21වැනි ද අතර, ලියු පෝ-චෙං සහ තෙං ශියාඕ-පිං යටතේ සිටි අපේ හටකණ්ඩායම් කායිපෙං සහ හ්සූචව් අතර ලුංහායි දුම්රියමාර්ග කොටස දිගට පිහිටි සුළු නගර දහයකට වැඩි ගණනකට පහර දී අල්ලාගත්තේ ය.[7] අනික් අතට, අපට උවමනා තරම් බලසේනා නොමැති විට, අප සතුරා අල්ලාගෙන සිටින සුළු නගර පැහැර ගත යුත්තේ එකින් එක ය, සුළු නගර කීපයක සිටින සතුරාට එක විට පහර නො දිය යුතු ය. ශාන්සි පළාතේ සිටින අපේ බලසේනා තාතුං-පූචව් දුම්රියමාර්ගය ඔස්සේ පිහිටි සුළු නගර අල්ලාගත්තේ එසේ ය.[8]

8. අපේ හටකණ්ඩායම් වල ප්‍රධාන බලසේනාව සතුරා මුලසුන් කිරීමට ඒකරාශි කර සිටින විට, එය ස්වකීය සටන්ව්‍යාපාර ප්‍රාන්තීය සේනාවන්, ප්‍රාදේශික ගොරිල්ලාභටයන් සහ ජනතාවගේ ජනභට සේනාවන් විසින් කරන වේගවත් වැඩකටයුතු සමග උචිත ලෙස සම්බන්ධ කළ යුතු ය. ප්‍රාන්තීය සේනා (හෝ සේනාංග) සතුරු රෙජමේන්තුවකට, බැටැලියමකට හෝ කොම්පඤ්ඤයකට පහර දෙන විට, ඒවා ද සතුරු බලසේනා එකින් එක මුලසුන් කිරීමට තම බලසේනා ඒකරාශි කිරීමේ මූලධර්මය පිළිපැදිය යුතු ය.

9. සතුරු බලසේනා එකින් එක මුල්පිස දැමීම පිණිස අපේ බලසේනා ඒකරාශි කිරීමේ මූලධර්මයේ අරමුණ වන්නේ ප්‍රධාන වශයෙන් සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදෙන ශක්තිය මුලසුන් කර දැමීම ය, ස්ථානයක් අල්ලාගෙන සිටීම හෝ පැහැර ගැනීම නො වේ. ඇතැම් වටාපිටාතත්වයන් තුළ, සතුරා මුල්පිස දැමීම පිණිස අපේ බලසේනා ඒකරාශි කිරීමේ, නැතහොත් බර සතුරු ප්‍රහාර වලින් මග ඇර යන්ට ත් තව දුරට සටන් කිරීම පිණිස විවේක ගැනීමට සහ තහවුරු වීමට ඉඩකඩ ලබා ගන්ට ත් අපේ ප්‍රධාන බලසේනාවට හැකි කිරීමේ අභිප්‍රාය උදෙසා ඇතැම් ස්ථාන අත හැර දමන්ට අවසර දිය හැකි ය. සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදෙන ශක්තිය විශාල පරිමාණයකින් මුල්පිස දමන්ට අපට පුළුවන් වන තාක්

කල්, නැති වූ භූමිප්‍රදේශ ආපසු ලබාගන්ට ත් අළුත් භූමිප්‍රදේශ අල්ලාගන්ට ත් පුළුවන් වෙනවා ඇත. එහෙයින්, සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදෙන ශක්තිය විනාශ කිරීමට සමත් වන සියලු දෙනා ම ප්‍රශංසා කටයුතු වෙති. මෙය යෙදෙන්නේ සතුරාගේ නිත්‍ය බලසේනා විනාශ කරන අයට පමණක් ම නො වේ; ඔහුගේ සාම සංරක්ෂණ බළකායයන්, ගෙදර-යන බළඇණි[9] සහ සෙසු ප්‍රතිගාමී ප්‍රාදේශික සන්නද්ධ නඩ විනාශ කරන අයට ත් එය යෙදේ. කෙසේ වේවා, යම් තැනක බලවේගයන්ගේ සමබරතාව අනුව භූමිප්‍රදේශයක් අල්ලාගෙන සිටීම හෝ පැහැර ගැනීම කළ හැකි වේ ද එතැන ත්, යම් තැනක භූමිප්‍රදේශය අපේ යුද්ධව්‍යාපාර සඳහා හෝ සටන් සඳහා හෝ වැදගත් වේ ද එතැන ත්, අපි භූමිප්‍රදේශය අල්ලාගෙන සිටීම හෝ පැහැරගැනීම කළ යුත්තෙමු; එසේ නො කිරීම වරදක් වෙනවා ඇත. එහෙයින්, එබඳු භූමිප්‍රදේශ අල්ලාගෙන සිටීමට හෝ පැහැරගැනීමට සමත් වන අය ද ප්‍රශංසා කටයුතු වෙති.

LIBERATIONBASE

ස ට හ න්

[1]"සතුරා විනාශ කිරීම පිණිස", "සතුරා මුල්පිස දැමීම පිණිස" සහ "සතුරා මුලසුන් කිරීම පිණිස" යන ප්‍රකාශ මේ පොතෙහි යොදා ඇත්තේ සමාන තේරුම් ඇති පාඨ වශයෙනි. මරන, තුවාල කරන සහ අල්ලාගනු ලබන සතුරු භටයෝ ඒ සියල්ලට ඇතුළත් වෙති. සතුරු බලසේනාවක් මුල්පිස දැමීම (මුලසුන් කිරීම, විනාශ කිරීම) යනු එය මුළුමනින් ම මුල්පිස දැමීම හෝ ඒ බලසේනාවේ ප්‍රධාන කොටස මුල්පිස දැමීම ය.

[2]කුඕමින්තාං හමුදාවේ නිත්‍ය බළකායයක් මුලදී එක් ඩිවිසනයක් රෙජමේන්තු තුනකින් සමන්විත ඩිවිසන් තුනකින් (ඇතැම් විට දෙකකින්) යුක්ත විය. 1946 මැයි මස සිට පටන් ගනිමින්, කහ ගඟට දකුණෙන් සිටි කුඕමින්තාං නිත්‍ය බළකායයෝ අවස්ථාවෙන් අවස්ථාවට ප්‍රතිසංවිධානය කරනලදහ; බළකායයක් ව තිබුණු දෙය ප්‍රතිසංවිධානය කළ ඩිවිසනයක් බවට පත් විය; කලින් තිබුණු ඩිවිසන, එකක් රෙජමේන්තු තුනකින් (ඇතැම් විට දෙකකින්) සමන්විත, බ්‍රිගේඩ බවට පත් විය. කහ ගඟට උතුරෙන් සිටි කුඕමින්තාං හටකණ්ඩායම් වලින් කොටසක් ප්‍රතිසංවිධානය නො කරනලදී; ඒවායේ නම් ද පෙර සේ ම පැවතුණි. ප්‍රතිසංවිධානය කළ ඩිවිසන් අතුරෙන් සමහරක් පසුව බළකාය යන ඒවායේ මුල් නමට ම ආපසු පෙරළුණේ ය.

[3]කුඕමින්තාං පක්ෂයේ මංමාවත් පොලිස් බළකාය 1945 මාර්තුවේදී සකස් කරනු ලැබී ය. ජපානය යටත් වූ ඉක්බිති, මේ බළකාය දුම්රියමාර්ග මුර කිරීමේ ව්‍යාජයෙන් නමුත් ඇත්ත වශයෙන් රහස් පොලිස් වැඩකටයුතු කරගෙන යාම පිණිස ගමනාගමන මාර්ග දිගට "ගැරිසන් රාජකාරි" සඳහා නතර කරනු ලැබී ය. එය සිවිල් යුද්ධය කරන්නට කුඕමින්තාං පක්ෂය විසින් යොදා ගත් බලසේනා අතුරෙන් එකක් විය.

[4]1946 ජූලි මාසයේදී, කුඕමින්තාං බලසේනාවෝ කියාංසු-අන්හ්වෙයි නිදහස් ප්‍රදේශය විශාල පරිමාණයකින් අතික්‍රමණය කරන්ට වූහ, අපේ හමුදාව ආත්මාරක්ෂාව පිණිස අභීත ලෙස සටන් කළේ ය. මධ්‍යම කියාංසු නිදහස් ප්‍රදේශයට පහර දුන් කුඕමින්තා

https://liberationbase.wordpress.com

හටකණ්ඩායම තාං එන්-පෝ යටතේ සිටි හටයන් 1,20,000කින් සමන්විත බ්‍රිගේඩ පහළොවකින් යුක්ත විය. ජූලි 13වැනි ද සිට අගෝස්තු 27වැනි ද තෙක්, සූ යූ, තාන් චෙන්-ලින් සහ වෙන සහෝදරවරුන් විසින් අණදෙනු ලැබූ නැගෙනහිරි චීන මහජන විමුක්ති හමුදාවේ ෆෙරජමේන්තු දහඅටක් වැඩි-බලය ඇති බලසේනා ඒකරාශි කොට, මධ්‍යම කියාංසූ පළාතේ තායිශිං, ජූකාඕ, හායි-ආන් සහ ශාඕපායි ප්‍රාන්තයේ පිටපිට ම සටන් හතක් කළේ ය. අපේ බලසේනාවෝ සතුරු බ්‍රිගේඩ හයක් සහ සතුරාගේ මංමාවත් පොලිස් බළකායයේ බැටෑලියන් පහක් මුල්පිස දැමූහ. මේ පාඨය සඳහන් කරන්නේ මේ සටන් දෙකක ප්‍රතිඵල ගැන ය.

[5]1946 අගෝස්තුවේදී කුඕමින්තාං බලසේනාවෝ ත්සූචව් සහ චෙංචව් කොටස් වල සිට මාර්ග දෙකක් ඔස්සේ ඉදිරියට ගමන් කොට, ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් නිදහස් ප්‍රදේශයට පහර දුන්හ. ලියු පෝ-චෙං, තෙං ශියාඕ-පිං සහ වෙන සහෝදරවරුන්ගේ විධානය යටතේ සිටි මේ ප්‍රදේශයේ මහජන විමුක්ති හමුදාව චෙංචව්හි සිට ඉදිරියට ගමන් කරමින් සිටි සතුරු කොලම හා සටන් වැදීමට වැඩි-බලය ඇති බලසේනාවන් ඒකරාශි කළේ ය. සැප්තැම්බර් 5 ත් 8 ත් අතර ඔවුහු ශාන්ටුං පළාතේ හොත්සේ, තිංතාඕ සහ ත්සාඕශියන් ප්‍රාන්තයේදී පිටපිට ම සතුරු බ්‍රිගේඩ හතරක් මුල්පිස දැමූහ.

[6]1946 ජූනි මුලදී ශාන්ටුං මහජන විමුක්ති හමුදාව ත්සිංතාඕ-ත්සිනාන් සහ තියන්සින්-පූකව් දුම්රියමාර්ග ඔස්සේ සිටි රූකඩ හටකණ්ඩායම් වලට විරුද්ධ ව යුද සේනාවක් යවා, චියාඕශියන්, චාංතියන්, චෞත්සූන්, තේචව්, තායි-ආන් සහ ත්සාඕචුආං ඇතුළු සුළු නගර දහයකට වැඩි ගණනක් නිදහස් කළේ ය.

[7]1946 අගෝස්තු 10වැනි ද සිට 21වැනි ද තෙක්, ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් මහජන විමුක්ති හමුදාව, මැද තැනි සහ නැගෙනහිර චීන මහජන විමුක්ති හමුදාවන්ට අනුබල දෙමින්, මාර්ග කීපයකින් ගමන් කොට, ලූංහායි දුම්රියමාර්ගයේ කායිපෙං-ත්සූචව් කොටස දිගේ නතර කර සිටි සතුරු හටකණ්ඩායම් වලට පහර දී, තාංශාන්, ලාන්ෆෙං, හුආංකෞ, ලිවුආං සහ යාංචි ඇතුළු සුළු නගර දහයකට වැඩි ගණනක් අල්ලාගත්තේ ය.

[8]1946 ජූලියේදී හූ ත්සුං-නාන් සහ යෙන් ශි-ශාන් යටතේ සිටි කුඕමින්තාං බලසේනාවෝ එකතු වී දකුණු ශාන්සි නිදහස් ප්‍රදේශයට පහර දුන්නෝ ය. ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් මහජන විමුක්ති හමුදාවේ තායියුවේ සේනාංග ද ශාන්සි-සුයියුආන් මහජන විමුක්ති හමුදාවේ කොටසක් ද ප්‍රති-ප්‍රහාර දී දකුණු ශාන්සි පළාතෙහි සතුරා පසුබැස්සුවේ ය. අගෝස්තුවේදී ඔවුහු තාතුං-පූචව් දුම්රියමාර්ගය දිගේ ලින්ෆන් සහ ලිංශි අතර සතුරාට විරුද්ධ ව පහරදීමක් පටන් ගෙන, හුංතුං, චාඕචෙං, හුඕශියන්, ලිංශි සහ ෆෙන්ශි යන සුළු නගර නිදහස් කළෝ ය.

[9]මහජන විමුක්ති යුද්ධය කරගෙන යන අතර, නිදහස් ප්‍රදේශ වල සිටි ඇතැම් ඉඩම් හිමියෝ ත් ප්‍රාදේශික කෲර පාලකයෝ ත් කුඕමින්තාං ප්‍රදේශ වලට පළා ගියහ. ඔවුහු, කුඕමින්තාං පක්ෂය විසින්, කුඕමින්තාං හටකණ්ඩායම් සමග එක් වී නිදහස් ප්‍රදේශ වලට පහර දෙනු පිණිස ''ගෙදර-යන බලඇණි'', ''ගෙදර-යන මහ හමුද'' සහ වෙනත් ප්‍රතිගාමී සන්නද්ධ නඩ බවට සංවිධානය කරනලදහ. හැම තැන ම ඔවුහු හොරකම් කිරීම, මිනීමැරීම සහ හැම වර්ගයේ ම දරුණු අපරාධ කළෝ ය.

තුන් මසක ලුහුඬු විස්තරය

1946, ඔක්තෝබර් 1

1. දැනට පවතින තත්වය ගැන ජූලි 20වැනි දින නිකුත් කළ මධ්‍යම කාරකසභාවේ නිර්දේශය[1] මෙසේ පැවසුවේ ය: ''අපට චියාං කායි-ශෙක් පරාජය කරන්ට පුළුවනි. මුළු පක්ෂය ම මෙගැන සම්පූර්ණයෙන් ම විශ්වාස සහගත විය යුතු ය.'' ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාස වල කළ සටන් මේ විනිශ්චය නිවැරදි බව ඔප්පු කර තිබේ.

2. විසඳන්නට චියාං කායි-ශෙක්ට නො හැකි වන්නා වූ ත්, අපේ ජයග්‍රහණය සහතික කරන සහ චියාංගේ පරාජය නො වැළකිය හැකි කරන මූල හේතුව වන්නා වූ ත් මූලික දේශපාලන සහ ආර්ථික ප්‍රතිවිරෝධයන් හැරුණු කල, යුද්ධ පරිමණ්ඩලයෙහි ද තියුණු ප්‍රතිවිරෝධයක් පැනනැඟී තිබේ; එනම් චියාංගේ පමණට වඩා ව්‍යාප්ත වූ සටන් පෙළ සහ ඔහුට හටකණ්ඩායම් හිඟ වීම අතර ඇති ප්‍රතිවිරෝධය යි. ඒ ප්‍රතිවිරෝධය කෙළින් ම අපේ ජයග්‍රහණයේ ත් චියාං කායි-ශෙක්ගේ පරාජයේ ත් හේතුව වෙනවා නියත ය.

3. නිදහස් ප්‍රදේශ වලට පහර දෙමින් සිටින චියාං කායි-ශෙක්ගේ නිත්‍ය හටකණ්ඩායම් වල මුළු ගණන බ්‍රිගේඩ 190කට වැඩි ය; ඒ රූකඩ හටකණ්ඩායම්, සාම සංරක්ෂණ බළකායයන් සහ මංමාවත් පොලිස් බළකායයන් ගණනට ගන්නේ නැතිව ය. මේ මුළු ගණන හැරුණු කල, ඔහු විසින් කළ හැකි වැඩි ම දෙය අතිරේක බලපිරිස් වශයෙන් දකුණේ සිටින ඔහුගේ හටකණ්ඩායම් වලින් කොටසක් නැවත උතුරට ගමන් කරවීම ය; එහෙත් ඊට පසු තවත් අතිරේක බලපිරිස් කිසිවක් එවීම ඔහුට අමාරු වෙනවා

මේ පක්ෂ-අභ්‍යන්තර නිර්දේශය චීන කොමියුනිස්ට පක්ෂයේ මධ්‍යම කාරකසභාව සඳහා සහෝදර මාඕ සේතුං විසින් කෙටුම්පත් කරනලදී. එය 1946 ජූලි මාසයේදී දේශ-ව්‍යාප්ත සිවිල් යුද්ධය ආරම්භ වීම ත් සමග පටන්ගත් තුන් මසක සටන් වලදී ලැබුණු ආඪ්‍ය අත්දැකීම් විස්තර සහිත ව සංක්ෂේප කළේ ය, මහජන විමුක්ති හමුදාවේ අනාගත උපායමාර්ගය සහ සටන් කර්තව්‍ය ඉදිරියට දැම්මේ ය, දුෂ්කරතා සහිත වකවානුවක් ජය ගැනීමෙන් පසු මහජන විමුක්ති යුද්ධයේදී අප නිසැකයෙන් ම ජය දිනා ගන්නා බව පෙන්වා දුන්නේ ය. මේ නිර්-දේශය මහජන විමුක්ති යුද්ධයට අනුබල දීම සඳහා ද ඒ සමග උචිත ලෙස සම්බන්ධ කොට ද විසඳිය යුතු ව තිබුණු, ඉඩම් ප්‍රතිසංස්කරණය, නිදහස් ප්‍රදේශ වල නිෂ්පාදනය වර්ධනය කිරීම, කුඕමින්තාං ප්‍රදේශ වල බහුජන අරගල වල නායකත්වය ශක්තිමත් කිරීම සහ වෙනත් අදාළ ප්‍රශ්න වැනි ප්‍රශ්න මූලධර්මයන්ගෙන් පැහැදිලි කළේ ය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ඇත. 190 ගණනක් වන බ්‍රිගේඩ අතුරෙන් 25ක් ඉකුත් තුන් මස තුළ අපේ හමුදුව විසින් මුල්පිස දමා ඇත. මේ අවුරුද්දේ පෙබරවාරියේ සිට ජූනි තෙක් ඊසානදිගදී අප විසින් මුල්පිස දමනලද බලසේනාවෝ මීට ඇතුළත් නො වෙති.

4. චියාං කායි-ශෙක්ගේ 190කට වැඩි බ්‍රිගේඩ අතුරෙන් අඩක් පමණ ගැරිසන් රාජකාරි ඉටු කළ යුතු ය; පිටියට බැස්සිය හැක්කේ අඩකට වඩා ටිකක් පමණකි. මේ ක්ෂේත්‍ර බලසේනා යම් යම් ප්‍රාන්ත කරා ඉදිරියට ගමන් කළ විට, ඉන් කොටසකට හෝ වැඩි කොටසකට ගැරිසන් රාජකාරි වලට මාරු වෙන්ට සිදු වෙනවා ඇත. සටන් කරගෙන යන කල සතුරාගේ ක්ෂේත්‍ර බලසේනා ක්ෂය වෙනවා නියත ය; ඒ, පළමුකොට, ඔවුන් අප විසින් දිගට ම මුල්පිස දමනු ලබන නිසා ය; දෙවැනිව, ගැරිසන් රාජකාරි ඉටු කරන්ට ඉන් බොහෝවකට සිදු වන නිසා ය.

5. ඉකුත් තුන් මස තුළ අප විසින් විනාශ කරනලද බ්‍රිගේඩ 25 අතුරෙන්, 7ක් තාං එන්-පෝගේ විධානය යටතේ (කලින් ලි මෝ-ආන් යටතේ) ද, 2ක් ශූඒ යූඒ යටතේ ද, 7ක් කූ චූ-තුං යටතේ (කලින් ලියු චි යටතේ) ද, 2ක් හූ ත්සුං-නාන් යටතේ ද, 4ක් යෙන් ශි-ශාන් යටතේ ද, 2ක් වොං යාඕ-වූ යටතේ ද, 1ක් තු යූ-මිං යටතේ ද විය. තවම අපේ හමුදුව අතින් බැට කා නැත්තේ ලි ත්සුං-රන්, පූ ත්සෝ-යි, මා හුං-කුඑයි සහ වෙං චියන් යටතේ සිටින කණ්ඩායම් 4 පමණකි; ඉතිරි කණ්ඩායම් 7 ම බරපතල පහරවල් හෝ මුල් පහරවල් හෝ කා ඇත. බරපතල පහරවල් කා සිටින්නෝ (මේ අවුරුද්දේ පෙබරවාරියේ සිට ජූනි තෙක් ඊසානදිග කළ සටන් ගණනට ගනිමින්) තු යූ-මිං, තාං එන්-පෝ, කූ චූ-තුං සහ යෙන් ශි-ශාන් යන මොවුහු ය. මුල් පහරවල් කා සිටින්නෝ ශූඒ යූඒ, හූ ත්සුං-නාන් සහ වොං යාඕ-වූ යන මොවුහු ය. මේ සියල්ලෙන් ඔප්පු වන්නේ චියාං කායි-ශෙක් පරාජය කරන්ට අපේ හමුදවට පුළුවන් බව ය.

6. ඉදිරි වකවනුවේදී අප සතු කර්තව්‍යය නම් සතුරු බ්‍රිගේඩ තව 25ක් තරම මුල්පිස දැමීම ය. මේ කර්තව්‍යය සම්පූර්ණ කිරීමෙන් චියාං කායි-ශෙක්ගේ පහරදීම නතර කරන්ට සහ අපේ නැති වූ භූමිප්‍රදේශයෙන් කොටසක් ආපසු ලබාගන්ට අපට පුළුවන් වෙනවා ඇත. බ්‍රිගේඩ 25ක මේ දෙවැනි කට්ටිය මුල්පිස දැමූ පසු, උපායමාර්ගික මුලපිරුම අල්ලා ගන්ට ත් ආරක්ෂා වීමෙන් පහරදීමට හැරෙන්ට ත් අපේ හමුදවට සත්තකින් ම පුළුවන් වන බව කල්තබා කිව හැකි ය. එවිට අප සතු කර්තව්‍යය වන්නේ සතුරු බ්‍රිගේඩ 25ක තුන්වැනි කට්ටියක් විනාශ කිරීම ය. අප එය මුදුන්පත් කළ හොත්, නැති වූ භූමිප්‍රදේශ වැඩි හරියක් හෝ සියල්ල ම පවා ආපසු ලබා ගන්ට ත් නිදහස් ප්‍රදේශ ව්‍යාප්ත කරන්ට ත් අපට හැකි ය. ඒ කාලය වන විට කුඕමින්තාං පක්ෂයේ ත් කොමියුනිස්ට් පක්ෂයේ ත් පරස්පර යුද්ධ ශක්තියෙහි

ඉමහත් වෙනස්වීමක් නිසැක ව ම සිදු වී තිබෙනවා ඇත. මෙය මුදුන්පත් කර ලීමට අපි, ඉකුත් තුන් මස තුළ බ්‍රිගේඩ 25ක් මුල්පිස දැමීමෙන් අප ලබාගෙන තිබෙන ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයෙන් නතර නො වී ඒ ඔස්සේ යමින්, ඉදිරියට එන තුන් මස හෝ ඊට කිට්ටු කාලය තුළ තව බ්‍රිගේඩ 25ක් විනාශ කළ යුත්තෙමු. සතුරා ත් අප ත් අතර පවතින තත්වය වෙනස් කිරීමට තිබෙන යතුර මෙය වේ.[2]

7. ඉකුත් තුන් මස තුළ හුආයියින්, හොත්සේ, වෙංතේ සහ චිනිං වැනි මධ්‍යම තරමේ සහ කුඩා නගර ගණනාවක් අපට නැති විය. මේ සුළු නගර වැඩි ගණනක් අත හැර දැමීම නො වැළකිය හැකි විය, අපේ ම මුලපිරුම පිට ඒවා තාවකාලික වශයෙන් අත හැර දැමීම හරි ය. වෙනත් ඒවා අප හොඳින් සටන් නො කළ නිසා අත හැර දමන්ට අපට බලෙන් ම සිදු විය. ඒ මේ කුමක් වුව ද, මෙතැන් සිට අප හොඳින් සටන් කළොත්, අපේ නැති වූ භූමිප්‍රදේශ ආපසු ලබා ගන්ට අපට පුළුවන් වෙනවා ඇත. අනාගතයේදීත් සතුරා විසින් අල්ලාගනු ලැබීම වළකන්ට අපට බැරි වෙන ස්ථාන තිබෙන්ට පුළුවනි; එහෙත් පසුව ඒ සියල්ල ආපසු ලබාගන්ට අපට හැකි වෙනවා ඇත. සියලු ම ප්‍රදේශ තම අත්දැකීම් වලින් පාඩම් ඉගෙනගෙන නැවත වැරදි කිරීමෙන් වැළකී සිටිනු වස් තම අතීත සටන් විචාරපූර්වක ව සමාලෝචනය කළ යුතු ය.

8. ඉකුත් තුන් මස තුළ අපේ මධ්‍යම තැනි විමුක්ති හමුදුව අමාරුකම් සහ හිරිහැර ජය ගැනීමෙහි ලා අසහාය විඳ දරා ගැනීමේ ශක්තියක් පෙන්වා ඇත; පරණ නිදහස් ප්‍රදේශ වලට ගමන් කර සිටින ඒ හමුදවේ කොටස හැර, ප්‍රධාන බලසේනාව දකුණු ශෙන්සි පළාතෙහි සහ බටහිරි හූපේ පළාතෙහි ගොරිල්ලා කඳවුරු දෙකක් පිහිටුවා තිබේ.[3] එමතු නො ව, අපේ හටකණ්ඩායම් හූපේ පළාතේ නැගෙනහිර සහ මැද යන කොටස් දෙකේ ම ගොරිල්ලා සංග්‍රාමය අත නැර ගෙනයමින් සිටී. මේ සියල්ල පරණ නිදහස් ප්‍රදේශ වල කරන සටන් වලට බෙහෙවින් ආධාර වී ඇත, තවම ආධාරයක් වේ; එය ඉස්සරහට තිබෙන දීර්ඝ යුද්ධයේදී වඩා ත් ශ්‍රේෂ්ඨ කොටසක් රඟපානවා ඇත.

9. ඉකුත් තුන් මස තුළ කළ යුද්ධයේදී ඊසානදිගට එවීමට චියාං කායි-ශෙක් විසින් මුලින් ම සැලැස්ම කරනු ලැබ සිටි ඔහුගේ ඉතා ම දක්ෂ බලසේනාවන් අතුරෙන් කීපයක් අප විසින් මහා ප්‍රාකාරයට දකුණෙන් සිටින තැන ම සිටින ලෙස හිර කර තබා ඇත; එසේ අපේ හටකණ්ඩායම් වලට විවේක දීමට සහ ඒවා තහවුරු කිරීමට ද ඊසානදිග බහුජනයා පුබුදු කිරීමට ද කාලය ලබාගෙන ඇත. මෙය ද අපේ අනාගත අරගල සඳහා මහත් වැදගත්කමක් සහිත ය.

10. සතුරු බලසේනා එකින් එක මුල්පිස දැමීම පිණිස වැඩි-බලය ඇති බලසේනාවක් ඒකරාශි කිරීම සටන් කිරීමේ එක ම නිවැරදි ක්‍රමය, සතුරු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බ්‍රිගේඩ 25ක් විනාශ කිරීම පිණිස ඉකුත් තුන් මස තුළ අප විසින් යොදනලද ක්‍රමය, වේ. සතුරාගේ බලසේනාව මෙන් හය ගුණයක්, පස් ගුණයක්, සිව් ගුණයක් හෝ යටත්පිරිසෙයින් තුන් ගුණයක් වත් ශක්තිමත් බලසේනාවක් ඒකරාශි කිරීමෙන් පමණකි ඒ සතුරු බලසේනාව සාර්ථක ලෙස මුල්පිස දමන්ට අපට හැකි වන්නේ. මෙය යුද්ධව්‍යාපාර සහ සටන් යන දෙකේදී ම කළ යුතු ය. සටන් කරන මේ ක්‍රමය ඉහළ-පෙළේ අණදෙන්නන් විසින් පමණක් නො ව, මැද සහ පහළ-පෙළේ කාඩර්වරුන් සියලු දෙනා විසින් ද හොඳින් අවබෝධ කර ගත යුතු ය.

11. ඉකුත් තුන් මස තුළ, සතුරාගේ නිත්‍ය බ්‍රිගේඩ 25ට අමතර වශයෙන්, රූකඩ හටකණ්ඩායම්, සාම සංරක්ෂණ බළකායයන් සහ මංමාවත් පොලිස් බළකායයන් වැනි වෙනත් ප්‍රතිගාමී බලසේනා සෑහෙන ගණනක් ද අපේ හමුදව විසින් විනාශ කර ඇත; මෙය ද ශ්‍රෙෂ්ඨ ජයග්‍රහණයකි. අපි දිගට ම එබඳු හටකණ්ඩායම් විශාල ගණනින් මුලසුන් කළ යුත්තෙමු.

12. සතුරු හටයන් 10,000ක් මුල්පිස දැමීම පිණිස අපේ හටයන් 2000ක් 3000ක් මැරුම් කෑමෙන් හෝ තුවාල වීමෙන් මිලක් ගෙවීමට අපට සිදු වන බව ඉකුත් තුන් මස තුළ අත්දැකීමෙන් ඔප්පු වී තිබේ. මෙය වළක්වන්ට බැරි ය. දීර්ඝ යුද්ධයක් සමග හරි පොර ඇල්ලීම පිණිස (හැම තැන ම හැම දෙයක් ගැන ම සලකා බැලිය යුත්තේ එබඳු යුද්ධයක් සිතේ තබා ගෙන ය), අපි සැලැස්ම කළ අයුරකින් අපේ හමුදව පළල් කළ යුත්තෙමු, අපේ ප්‍රධාන බලසේනා හැම විට ම සම්පූර්ණ ශක්තියෙන් යුතු ව තබා ගන්නා බවට වග බලා ගත යුත්තෙමු, යුද්ධ කාඩර්වරුන් විශාල ගණනින් පුහුණු කළ යුත්තෙමු. අපි සැලැස්මක් අනුව නිෂ්පාදනය වර්ධනය කිරීම ත් මුදල් කටයුතු ක්‍රමානුකූල කිරීම ත් කළ යුත්තෙමු, අපේ අර්ථක්‍රමය වර්ධනය කිරීම සහ සැපයිය යුතු දේ සැපයීම නො වරදවා කැරෙන බවට වග බලා ගැනීම පිළිබඳ වූ ද, ඒකීභූත කළ නායකත්වය සහ විමධ්‍යගත කළ පරිපාලනය පිළිබඳ වූ ද, හමුදව සහ ජනතාව යන දෙ පක්ෂය ම ත් මහජන පලප්‍රයෝජන සහ පුද්ගලික පල-ප්‍රයෝජන යන දෙක ම ත් සැලකිල්ලට ගැනීම පිළිබඳ වූ ද මූලධර්ම ක්‍රියාවෙහි යෙදිය යුත්තෙමු.

13. (හටයන් පුහුණු කිරීම ත්, නිෂ්පාදනය ත්, ඉඩම් ප්‍රතිසංස්කරණය ත් තම ප්‍රධාන කර්තව්‍ය තුන ලෙස සලකන මෙන් විවිධ ප්‍රදේශ වලට යළි යළි ත් උපදෙස් දුන්) මධ්‍යම කාරකසභාවේ නිර්දේශයන් අනුව, ජනවාරියේ සිට ජූනි තෙක් තාවකාලික වශයෙන් සටන් නවත්වා තිබුණු වකවනුව තුළ තම යුද්ධ අභ්‍යාසය දැඩි කළ සියලු හටකණ්ඩායම් විසින් වඩා උසස් සටන් ක්ෂමතාවක් පෙන්වා ඇති බව මේ තුන් මසේ අත්දැකීමෙන් ඔප්පු වී තිබේ. එසේ පුහුණු නො කළ සියලු හටකණ්ඩායම් පෙන්වූ සටන් ක්ෂමතාව ඊට වඩා බොහෝ පහළ වූ බව ද එයින් ඔප්පු වී තිබේ. මෙතැන් සිට, සියලු ම ප්‍රදේශ සටන් අතර ඇති විවේක කාල දැඩි යුද්ධ අභ්‍යාසය පිණිස පාවිච්චි කළ යුතු ය. සියලු ම හමුද සේනාංග තම දේශපාලන වැඩ ශක්තිමත් කළ යුතු ය.

14. යම් තැනෙක මධ්‍යම කාරකසභාවේ මැයි 4වැනි ද නිර්දේශය[4] ස්ථිර ලෙස ත් අප්‍රමාද ව ත් ක්‍රියාවේ යොදනලද්දේ ද, ඉඩම් ප්‍රශ්නය අත්‍යන්තයෙන් සහ නිරවශේෂයෙන් විසඳනලද්දේ ද, ඒ හැම තැන ම ගොවියන් චියාං කායි-ශෙක්ගේ හටකණ්ඩායම් දුන් ප්‍රහාරයන්ට විරුද්ධ ව අපේ පක්ෂය ත් අපේ හමුදව ත් සමග එක් ව නැඟී සිටි බව මේ තුන් මසේ අත්දැකීමෙන් ඔප්පු වී තිබේ. යම් තැනෙක "මැයි 4 නිර්දේශය" ස්ථිර ලෙස ක්‍රියාවේ නො යොදනලද්දේ ද, හෝ ඕනෑවට වඩා පමා වී ලකලෑස්ති කිරීම කරනලද්දේ ද, එසේ ත් නැතහොත් යම් තැනෙක මේ වැඩය යාන්ත්‍රික ලෙස අවස්ථා වලට බෙදනලද්දේ ද, හෝ යුද්ධය ගැන ම සිත කය යොමු වී තිබීම නිදහසට කරුණක් කර ගනිමින් ඉඩම් ප්‍රතිසංස්කරණය නො සළකා හරින-ලද්දේ ද, ඒ හැම තැන ම ගොවියෝ ටිකක් නැවතිලා බලා සිටීමේ ආකල්-පයක් ගත්හ. ඉදිරියට එන මාස කීපය තුළ සියලු ප්‍රදේශ, ඒවා යුද්ධය නිසා කොතරම් කටයුතු බහුල ව සිටියත්, ඉඩම් ප්‍රශ්නය විසඳීම පිණිස ගොවි බහුජනතාවට ස්ථිර ලෙස ම නායකත්වය දිය යුතු ය; ඉඩම් ප්‍රතිසංස්කරණය පදනම කරගෙන, ලබන අවුරුද්දේ විශාල-පරිමාණයේ නිෂ්පාදන වැඩ පිණිස කටයුතු සූදනම් කළ යුතු ය.

15. යම් තැනෙක මහජනයාගේ ජනහට හමුදව ගොරිල්ලාහටයන් සහ සන්නද්ධ වැඩ කණ්ඩායම්[5] ඇතුළු ව ප්‍රාන්තීය සන්නද්ධ බලසේනා මැනවින් සංවිධානය කර සිටී ද, ඒ හැම තැන ම, බොහෝ තැන් සහ මාර්ග තාවකාලික වශයෙන් සතුරා අතට පත් වී තිබෙතත්, සුවිශාල ගම්බද ප්‍රදේශ ග්‍රහණය කරගෙන සිටින්ට අපට හැකි වී තිබෙන බව මේ තුන් මසේ අත්-දැකීමෙන් ඔප්පු වී තිබේ. එහෙත් යම් තැනෙක ප්‍රාන්තීය සන්නද්ධ බලසේනා දුර්වල ද, නායකත්වය දිළිඳු ද, ඒ හැම තැන ම හුඟක් ම පහසු කාලයක් සතුරාට ලැබේ. මෙතැන් සිට, සතුරා විසින් තාවකාලිකව අල්ලාගෙන තිබෙන ප්‍රදේශ වල, අපි පක්ෂයේ නායකත්වය ශක්තිමත් කළ යුත්තෙමු; ප්‍රාන්තීය සන්නද්ධ බලසේනා වර්ධනය කළ යුත්තෙමු, ගොරිල්ලා සංග්‍රාම-යෙහි අත නෑර යෙදී සිටිය යුත්තෙමු, බහුජනයාගේ පලප්‍රයෝජන සුරක්ෂිත කළ යුත්තෙමු, ප්‍රතිගාමීන්ගේ වැඩකටයුතු වලට පහර ගැසිය යුත්තෙමු.

16. තුන් මසක යුද්ධය කුඕමින්තාං පක්ෂයේ රිසව් බලසේනා (විශේෂ අවස්ථාවන්හි යෙදීමට වෙන් කර සිටින බලසේනා) හෙම්බත් වූ තරම් තත්වයකට පත් කර ඇත, ඒ පක්ෂයට අයත් ප්‍රදේශ වල ම ඒ පක්ෂයේ යුද්ධ ශක්තිය බරපතල ලෙස දුර්වල කර ඇත. ඒ අතර ම, කුඕමින්තාං පක්ෂය බලෙන් යුද සේවයට බන්ද ගැනීම ත් ධාන්‍ය බදු[6] අය කිරීම ත් නැවත පටන් ගැනීම නිසා මහජනයාගේ අසහනය ඇවිස්සී, බහුජන අරගල වර්ධනය කිරීම

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

පිණිස හිතකර තත්වයක් ඇති වී තිබේ. මූළ පක්ෂය ම කුඔමින්තාං ප්‍රදේශ වල බහුජන අරගල වල තම නායකත්වය ශක්තිමත් කළ යුතු ය, කුඔමින්තාං හමුදුව සිඳ බිඳ විසුරුවා හැරීමේ වැඩය වේගවත් කළ යුතු ය.

17. කුඔමින්තාං ප්‍රතිගාමීයෝ, එක්සත් ජනපදයේ විධානය යටතේ, තාවකාලිකව සටන් නැවැත්වීමේ එකඟත්වය ත් මේ අවුරුද්දේ ජනවාරියේ දේශපාලන සාකච්ඡාසභාවේ යෝජනා ත් උල්ලංඝනය කර ඇත, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී බලවේග විනාශ කිරීමට ඔවුන් දරන ප්‍රයත්නයේදී සිවිල් යුද්ධය කරන්ට ඉටාගෙන සිටිති. ඔවුන්ගේ කදිම වචන සියල්ල ම කපටි කතා මිසක් වෙන කිසිවක් නො වේ; අපි එක්සත් ජනපදයේ ත් චියාං කායි–ශෙක්ගේ ත් සියලු කුමන්ත්‍රණ එළිදරව් කළ යුත්තෙමු.

18. මේ තුන් මස තුළ, ජාතික ධනේශ්වරපංක්තිය[7] ඇතුළු ව කුඔමින්තාං ප්‍රදේශ වල සිටින ජනතාව අතර ඉතා ම පුළුල් තට්ටු, කුඔමින්තාං පක්ෂය ත් එක්සත් ජනපද ආණ්ඩුව ත් රහසේ සන්ධි වී වැඩ කරන්නේ ය, සිවිල් යුද්ධය පටන්ගෙන ඇත, ජනතාව පෙළන්නේ ය යන සත්‍ය කාරණය ගැන වඩා හොඳ අවබෝධයක් කරා යුහුව එළඹී සිටී. වියවුල බේරුම් කිරීමට මාෂල් මැදිහත්වීම වංචා සහගත ක්‍රියාවක් ය, සිවිල් යුද්ධයේ දරුණු අපරාධකාරයා කුඔමින්තාං පක්ෂය ය යන සත්‍යය දැන් වැඩි වැඩියෙන් මිනිසුන්ට වැටහී තිබේ. එක්සත් ජනපදය ත් කුඔමින්තාං පක්ෂය ත් ගැන තිබුණු මුළාවන් දුරු වී සිටින පුළුල් බහුජන සමූහයෝ දැන් අපේ පක්ෂයේ ජයග්‍රහණය මත තම බලාපොරොත්තු රඳවති. මේ දේශීය දේශපාලන තත්වය අතිශයින් ම හිතකර ය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ප්‍රතිගාමී ප්‍රතිපත්තිය සියලු රටවල් වල ජනතාවට අයත් පුළුල් සමූහයන් අතර වැඩි වැඩියෙන් අසහනය අවුස්සන්නේ ය. සියලු රටවල් වල ජනතාවගේ දේශපාලන හැඟීමේ මට්ටම දිනක් පාසා ඉහළ යයි. සියලු ධනවාදී රටවල් වල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අරගලය නැඟගෙන යන්නේ ය, බොහෝ රටවල් වල කොමියුනිස්ට් පක්ෂ වල ශක්තිය බෙහෙවින් වැඩි වී ඇත, ඒවා යටත් වන තත්වයකට පහත හෙළන්ට ප්‍රතිගාමීන්ට කොහෙත් ම බැරි වෙනවා ඇත. සෝවියට් සංගමයේ බලපරාක්‍රමය ත් ජනතාවන් අතර එහි ගරුත්වය ත් දිනපතා ම වැඩෙන්නේ ය. එක්සත් ජනපද ප්‍රතිගාමීන් ද වෙන රටවල් වල ඔවුන් විසින් අනුබල දෙනු ලබන ප්‍රතිගාමීන් ද තව තව ත් තනි වෙනවා නියත ය. ජාත්‍යන්තර දේශ–පාලන තත්වය අතිශයින් ම හිතකර ය. සිය රටෙහි ත් එතෙර ත් පවතින තත්වය Iවැනි ලෝක යුද්ධයට පසු පැවති තත්වයට වඩා බෙහෙවින් වෙනස් ය. විප්ලවවාදී බලවේගයෝ IIවැනි ලෝක යුද්ධයේ සිට ඉමහත් ලෙස වැඩී සිටිති. චීන සහ විදේශීය ප්‍රතිගාමීන් කොතරම් ඔළමොළ ලෙස හැසුරුණත් ඔවුන් පරාජය කරන්ට අපට හැකි ය (මේ ඔළමොළ හැසිරීම ඉතිහාසීය වශයෙන් නො වැළකිය හැකි ය, කිසිසේත් පුදුමයක් නො වේ). සියලු ප්‍රදේශ වල නායක සහෝදරවරු සියරටෙහි ත් එතෙර ත් පවතින මේ

හිතකර තත්වය ගැන තිබෙන අවබෝධය ප්‍රමාණවත් නො වන නිසා අරගලයේ අනාගතය ගැන කනස්සලු ගතියෙන් පසුවෙන පක්ෂයේ සහෝදර-වරුන්ට මේ කාරණය සම්පූර්ණයෙන් පැහැදිලි කර දිය යුත්තාහ. සතුරාට තවම ශක්තිය තිබෙන බව ත්, අපට ද තවම යම් යම් දුර්වලකම් තිබෙන බව ත්, අරගලය තවම දීර්ඝ සහ කෲර එකක් බව ත් පැහැදිලි කළ යුතු ය. එහෙත් කිසි ම සැකයක් නැතිව අපට ජය දිනා ගත හැකි ය. මේ අවබෝධය සහ විශ්වාසය පක්ෂය පුරා ම තරයේ ඇති කළ යුතු ය.

19. ඉදිරියට එන මාස කීපය වැදගත් සහ අමාරු වකවනුවක් වෙනවා ඇත. අපි වෙහෙස මහන්සි වී මුළු පක්ෂය ම ක්‍රියාවට උනන්දු කළ යුත්තෙමු, මහත් පරීක්ෂාවෙන් සැලැස්ම කළ යුද්ධ සටන්ව්‍යාපාර බාරගත යුත්තෙමු, යුද්ධ තත්වය අත්‍යන්තයෙන් ම වෙනස් කළ යුත්තෙමු. සියලු ප්‍රදේශ ඉහතින් සඳහන් කළ ප්‍රතිපත්ති ස්ථිර ලෙස ක්‍රියාවේ යොදමින්, යුද්ධ තත්වයෙහි අත්‍යන්ත වෙනසක් ඇති කර ලීමට වෙර දැරිය යුතු ය.

LIBERATIONBASE

ස ට හ න්

[1] "ආත්මාරක්ෂා යුද්ධයකින් චියාං කායි-ශෙක්ගේ පහරදීම පොඩිපට්ටම් කරන්න" නමැති ලිපිය බලන්න, මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං, 1961, IVවැනි කාණ්ඩය, පිටු 89-95.

[2] ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් මහජන විමුක්ති හමුදුව කහ ගඟ බලෙන් ම තරණය කොට, තාපියේ කඳු දෙසට ගමන් කරන්ට වූ කල, සතුරා ත් අප ත් අතර පැවති තත්වය 1947 ජූලියේදී වෙනස් වන්ට පටන් ගත් බව පසු ව සිදු වූ දෙයින් පෙනී ගියේ ය. ඒ කාලය වන විට මහජන විමුක්ති හමුදුව දෙළොස් මසක් සටන් කොට, සාමාන්‍ය ගණනින් මසකට අටක් බැගින් සතුරු බ්‍රිගේඩ සියයක් පමණ මුල්පිස දමා සිටියේ ය. මෙය මේ ලිපියෙහි ගණන් බැලූ ප්‍රමාණය ඉක්මවී ය; චියාං කායි-ශෙක්, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අනුබලය ඇතිව, යෙදිය හැකි ඔහුගේ සියලු බලසේනා පහරදීමට යොද සිටි නිසා ය.

[3] 1946 ජූනි අවසානයේදී ලි ශියන්-නියන්, වෙං වෙයි-සාන් සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද මැද තැනි මහජන විමුක්ති හමුදුව ස්වකීය බලසේනාවන්ගේ උපායමාර්ගික තැන් මරු කිරීමක් මුලපුරා, කුඔමින්තාං භටයන් 300,000ක් විසින් කර තිබුණු වටලෑමක් ජයග්‍රාහී ලෙස බිඳගෙන පැනගියේ ය. පරණ නිදහස් ප්‍රදේශ වලට ගමන් කළේ ය'යි සහෝදර මාඕ සේතුං විසින් සඳහන් කර තිබෙන සේනාංග වෙං වෙන් සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද ඒවා ය; මේ සේනාංග වටලෑම බිඳගෙන පැනගත් පසු ශෙන්සි-කාන්සු-නිංසියා දේශසීමා ප්‍රදේශයට පිවිසියේ ය. දකුණු ශෙන්සි පළාතේ ගොරිල්ලා කඳවුර මැද තැනි මහජන විමුක්ති හමුදුවේ ප්‍රධාන බලසේනාවේ කොටසක් විසින් පිහිටුවනු ලැබී ය; බටහිරි හෝනාන් පළාතේ ලූශි සහ ශීචුආන් ද දකුණු ශෙන්සි පළාතේ ලෝනාන් සහ ශාන්යාං ද ඊට ඇතුළත් විය. බටහිරි හූපේ පළාතේ ගොරිල්ලා කඳවුර ඒ හමුදුවේ ම තවත් කොටසක් විසින් වයඹදිග හූපේ පළාතේ පිහිටි වූතාං කඳු එහි මධ්‍යස්ථානය වශයෙන් ඇතිව පිහිටුවනු ලැබී ය.

[4]මෙයින් සඳහන් වන්නේ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් 1946 මැයි 4වැනි දින නිකුත් කළ "ඉඩම් ප්‍රශ්නය ගැන නිර්දේශය" යි. ජපනුන් යටත් වූ පසු, ගොවියන් මහත් ඕනෑකමින් ඉඩම් ඉල්ලා සිටි නිසා, විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලයේ තිබුණු ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කිරීමට, ඒ කියන්නේ, බදු සහ පොලී අඩු කිරීමේ සිට ඉඩම්හිමියන්ගේ ඉඩම් රජය සතු කොට ගොවියන් අතර බෙදා දීමට වෙනස් කිරීමට, මධ්‍යම කාරකසභාව තීරණය කළේ ය. "මැයි 4 නිර්දේශය" මේ වෙනස් කිරීම සලකුණු කළේ ය.

[5]මේ පොතේ 354වැනි පිටුවේ "සභාග ආණ්ඩුව ගැන" නමැති ලිපියේ 2වැනි සටහන බලන්න.

[6]මෙයින් සඳහන් වන්නේ ධාන්‍ය වර්ග වලින් ම ගෙවිය යුතු වූ ඉඩම් බදු ය.

[7]ජාතික ධනේශ්වරපංක්තිය යනු අධිරාජ්‍යවාදය මත කිච්චුවෙන් ම රැඳී සිටින්නා වූ ද ලක්ෂණයෙන් කොම්ප්‍රදෝරු වූ ද ධනේශ්වරපංක්තියේ කොටසට, ඒ කියන්නේ මහ ධනේශ්වරපංක්තිය හෝ නිලධාරි-ධනපතියෝ යන කොටසට වෙනස් ව සිටින, අධිරාජ්‍යවාදය සමග එතරම් සම්බන්ධයක් නැති ධනේශ්වරපංක්තියේ කොටස ය.

වයඹදිග රණ මණ්ඩලය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය

1947, අප්‍රේල් 15

1. සතුරා දැන් හොඳට ම හෙම්බත් වී සිටී, එහෙත් තවම කිසිවක් කර කියා ගන්ට බැරි තරමට හෙම්බත් වී නැත. ඔහු තම කෑම බීම සපයා ගැනීම අතින් තරමක් අමාරුවේ වැටී සිටී, එහෙත් තවම හොඳට ම අමාරුවේ වැටී නැත. අපේ හමුදාව සතුරාගේ 31වැනි බ්‍රිගේඩය[1] මුල්පිස දැමූ තැන් සිට සතුරු බලසේනා එතරම් විශාල ගණනක් විනාශ කරදමා නැති නමුත්, ඉකුත් දවස් විස්ස තුළ අප විසින් ඔහු වෙහෙසට පත් කිරීමේ ත්, ඔහුට කෑම බීම සැපයීම සැලකියයුතු තරම් අඩු කිරීමේ ත් අරමුණ මුදුන්පත් කර ඇත, එසේ ඔහු කිසිවක් කර කියා ගත නො හැකි වන සේ සම්පූර්ණයෙන් ම හෙම්බත් කිරීම ත්, ඔහුට ඔහුගේ කෑම බීම සැපයීම මුළුමනින් ම කපා හැරීම ත්, අන්තිමේදී ඔහු මුල්පිස දැමීම ත් පිණිස හිතකර තත්වයන් ඇති කර ඇත.

2. දැනට, සතුරා වෙහෙස වී සිටිතත්, ඔහුට කෑම බීම හිඟ වුව ත්, ඔහුගේ ප්‍රතිපත්තිය අපේ ප්‍රධාන බලසේනාව කහ ගඟ හරහා නැගෙනහිරට පන්නා දැමීම, සුයිතේ සහ මයිචි වසා දැමීම සහ "අතුගාදැමීමේ" සටන්ව්‍යාපාර සඳහා ඔහුගේ බලසේනාවන් බෙදීම ය. සතුරු හටකණ්ඩායම් මාර්තු 31වැනි ද චිංචියන් කරා සේන්දු වූ නමුත්, වහා ම උතුර බලා ඉදිරියට ගමන් නො කළේ ය; ඔවුන්ගේ අභිප්‍රාය වූයේ අපේ පාර අවහිර නො කොට ඉතිරි කිරීම ය. ඔවුන් වායාඕපාඕ දෙසට බටහිරට ඉදිරියට යාමේ අදහස වූයේ අප සුයිතේ සහ මයිචි කරා පන්නා දැමීම ය. අපේ හටකණ්ඩායම් සිටින තැන දැනගෙන, ඔව්හු දැන් වායාඕපාඕ නුවරින් දකුණට සහ බටහිරට හැරෙමින් සිටිති; ඊට පසු ඔවුන් අප උතුරු දෙසට පන්නා දමනු පිණිස යළි ත් ඒ සූළු නගරය දෙසට ඉදිරියට ගමන් කරනවා ඇත.

මේ විදුලිසංදේශය එකල ශෙන්ශි-කාන්සු-නිංසියා සහ ශාන්සි-සුයියුආන් නිදහස් ප්‍රදේශ වල මහජන විමුක්ති හමුදාවේ බලසේනාවන් ගෙන් සමන්විත වූ ද, පෙං තේ-හුආයි, හෝ ලුං, ශි චුං-ශුන් සහ වෙනත් සහෝදරවරුන් විසින් අණ දෙනලද්ද වූ ද වයඹදිග ක්ෂේත්‍ර හමුදාවට සහෝදර මාඕ සේතුං විසින් යවනලදී.

https://liberationbase.wordpress.com

3. අපේ ප්‍රතිපත්තිය අපේ කලින් ක්‍රමය දිගට ම ගෙනයාම ය; ඒ කියන්නේ, කලකට (තව මසක් පමණ) සතුරා මේ ප්‍රදේශයෙහි දුව පැන ඇවිදිමින් සිටින්ට සැලසීම ය; එහි අභිප්‍රාය ඔහුට කිසිවක් කර කියා ගන්ට බැරි වන තරමට ඔහු සම්පූර්ණයෙන් ම හෙම්බත් කිරීම, ඔහුට කෑම බීම සැපයීම හොඳට ම අඩු කිරීම සහ ඉක්බිති ඔහු විනාශ කිරීමට ඉඩප්‍රස්තාවක් සොයා ගැනීම ය. අපේ ප්‍රධාන බලසේනාව යූලින් නුවරට පහර දෙනු පිණිස උතුරට වත් සතුරාගේ පසුබැසීම කපා හරිනු පිණිස දකුණට වත් කඩිමු-ඩියේ ගමන් කරන්ට උවමනාවක් නැත. සතුරා අවසාන වශයෙන් පරාජය කිරීමට අවශ්‍ය පාර අපේ හමුදාවේ මේ ක්‍රමය බව අණදෙන්නන්ට සහ සටන්කරුවන්ට ත් එසේ ම බහුජනයාට ත් පැහැදිලි කළ යුතු ය. අප බෙහෙවින් ම වෙහෙසට පත් වූ ත්, සම්පූර්ණයෙන් ම කුසගින්නේ සිටින්ට සිදු වන්නා වූ ත් අඩියකට සතුරා පත් කරතොත් මිසක්, අවසාන ජය දිනා ගන්ට අපට බැරි ය. මෙය "හම යන තුරු පාච්චි කිරීමේ" උපක්‍රමය ය'යි කියන්ට ඉඩ තිබේ; ඒ කියන්නේ, සතුරා සම්පූර්ණයෙන් ම හෙම්බත් වන තුරු වෙහෙසීමේ සහ ඉක්බිති ඔහු මුල්පිස දැමීමේ උපක්‍රමය යි.

4. දැන් ඔබ වායාඕපාඕ නුවරින් නැගෙනහිරට සහ උතුරට පිහිටි ප්‍රදේශ වල සිටින නිසා, සතුරා වායාඕපාඕ නුවරින් උතුරට ගමන් කරන්ට පෙළඹවීම ඉතා ම හොඳ දෙය වෙනවා ඇත; ඉක්බිති ඔබ ලියාඕ ආංගේ[2] බලසේනාවන්ගේ වඩා දුර්වල කොටසට පහර දී, සතුරා නැගෙනහිරට ගමන් කරන්ට පෙළඹවීම කළ හැකි ය; ඉන් පසු ඔබ අන්සායි දෙසට හැරී, සතුරා යළි ත් බටහිරට ගමන් කරන්ට පොළඹවනු හැකි ය.

5. එහෙත් යෙන්චාං–යෙන්ආන් පේළියට දකුණෙන් සහ යිචුආන්–ලෝචුආන් පේළියට උතුරෙන් පිහිටි ප්‍රදේශයට උන්හිටිගමන් පහරක් දී සතුරාගේ කෑම බීම ප්‍රවාහණය කරන මාර්ගය කපා දමනු පිණිස දැන් සිට සතියකින් මුළු 359වැනි බ්‍රිගේඩය ම දකුණු දෙසට හැරවිය හැකි වන සේ දින කීපයක් ඇතුළත සම්පූර්ණයෙන් ම සූදානම් වී සිටින ලෙස ඔබ ඒ බ්‍රිගේඩයට අණ කළ යුතු ය.

6. ඉහත සඳහන් අදහස් හොඳ යි කියා ඔබ සිතනවා දැ'යි කරුණාකර පිළිතුරක් එවන්න.

ස ට හ න්

[1] තම මුලපිරුම පිට යෙන්ආනයෙන් ඉවත් වී ගිය වයඹදිග මහජන විමුක්ති හමුදාව, සතුරාගේ ප්‍රධාන බලසේනාව යෙන්ආනයේ සිට වයඹදිගින් පිහිටි අන්සායි දක්වා රවටා ගෙන ඒම පිණිස කුඩා බලසේනාවක් යවා, සැඟවී සිට සතුරාට පහර දීම පිණිස යෙන්ආනයේ සිට ඊසානදිගින් පිහිටි චිංහුආපියන් කොටසෙහි තම ප්‍රධාන බලසේනාව නතර කළේ ය. 1947, මාර්තු 25වැනි දා, බ්‍රිගේඩ මූලස්ථානය විසින් ම නායකත්වය දෙනලද, හූ ත්සුං-නාන්ගේ ප්‍රතිසංවිධානය කළ 27වැනි ඩිවිසනයේ 31වැනි බ්‍රිගේඩයට අයත් කුඕමින්තාං රෙජමේන්තුවක් කෙළින් ම මේ උගුලට ගමන් කළෙත්, පැයකට ටිකක් වැඩි වේලාවක් පැවති සටනකදී මුළුමනින් ම විනාශ කරනු ලැබී ය.

[2] හූ ත්සුං-නාන් යටතේ සිටි කුඕමින්තාං බලසේනාවන්ට අයත් ප්‍රතිසංවිධානය කළ 76වැනි ඩිවිසනයේ අණදෙන්නා වූ ලියාඕ ආං, පසුව 1947, ඔක්තෝබර 11වැනි දා චිංචියන්හි කළ සටනකදී අල්ලාගනු ලැබී ය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

විමුක්ති යුද්ධයේ දෙවැනි අවුරුද්ද සඳහා උපායමාර්ගය

1947, සැප්තැම්බර් 1

1. පළමුවැනි අවුරුද්දේ (එනම්, ගිය අවුරුද්දේ ජූලි සිට මේ අවුරුද්දේ ජූනි තෙක්) කළ සටනේදී අපි නිත්‍ය බ්‍රිගේඩ 97½ ක් හෙවත් මිනිසුන් 7,80,000ක් ද, මුළු ගණනින් 3,40,000ක් වන රූකඩ භටයන්, සාම සංරක්ෂණ බළකායයන් සහ වෙනත් අය ද මුල්පිස දැමීමු — සියල්ල එකතු වූ කල සතුරාගේ මිනිස්සු 11,20,000ස් දෙනෙකි. මෙය ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයක් විය. එය සතුරාට බර පහරක් දුන්නේ ය, මුළු සතුරු කඳවුරේ ම විශාල පරාජිත-හැඟීමක් ඇති කළේ ය, රට පුරා ම ජනතාව ප්‍රමෝදයට පත් කළේ ය, අපේ හමුදව විසින් සතුරා සම්පූර්ණයෙන් ම මුලසුන් කිරීම සඳහා ත් අවසාන ජයග්‍රහණය සඳහා ත් අඩිතාලම දැම්මේ ය.

2. පළමුවැනි අවුරුද්දේ කළ සටනේදී, සතුරා ඔහුගේ නිත්‍ය බ්‍රිගේඩ 248න් 218ක් හෙවත් මිනිසුන් 16,00,000කට වැඩි ගණනක් ද, (නාවික-හමුදව, අහස් හමුදව, කාලතුවක්කු හමුදව, ඉංජිනේරු බළකාය සහ සන්නද්ධ වාහන සේනාංග යන) විශේෂ හමුද ශාඛා වලින් සහ රූකඩ භටකණ්ඩායම්, මංමාවත් පොලිස් බළකාය සහ සාම සංරක්ෂණ බළකාය යන මේවායින් මිනිසුන් 10,00,000ක් පමණ ද යොදමින්, නිදහස් ප්‍රදේශ වලට විරුද්ධ ව විශාල–පරිමාණයේ පහරදීමක් දියත් කළේ ය. අපේ හමුදව ඇතුල් පේළි වල

මේ පක්ෂ-අභ්‍යන්තර නිර්දේශය සහෝදර මාඕ සේතුං සහ චීන කොමියුනිස්ට පක්ෂයේ මධ්‍යම කාරකසභාව උතුරු ශෙන්සි පළාතේ චියාශියන් උප-පළාතේ චූකුආන්චායි නුවර සිටි දින වල ඔහු විසින් මධ්‍යම කාරකසභාව සඳහා කෙටුම්පත් කරනලදී. මේ නිර්දේශය විමුක්ති යුද්ධයේ දෙවැනි අවුරුද්ද සඳහා මූලික කර්තව්‍යය පිළියෙළ කළේ ය. මේ කර්තව්‍යය අපේ බලසේනාවන් ලවා යුද්ධය කුඕමින්තාං ප්‍රදේශ තුළට ගෙනයාම සහ ඇතුල් පේළි වල සටන් කිරීමේ සිට බාහිර පේළි වල සටන් කිරීමට හැරීම විය; ඒ කියන්නේ. උපායමාර්ගික ආරක්ෂාවීමේ අවස්ථාවෙන් උපායමාර්ගික පහරදීමේ අවස්ථාවට මාරු වීම ය. සහෝදර මාඕ සේතුං විසින් පණවනලද උපායමාර්ගික සැලැස්ම අනුව, මහජන විමුක්ති හමුදව 1947 ජූලි-සැප්තැම්බර් කාලය තුළ දේශ-ව්‍යාප්ත පරිමාණයකින් පහරදීමට බැස්සේ ය. ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් ක්ෂේත්‍ර හමුදව ජූනි 30වැනි ද නිරිතදිග ශාන්ටුං පළාතේදී කහ ගඟ බලෙන් තරණය කොට, අගෝස්තු මුලදී ලුංහායි දුම්රියමඟ හරහා ගමන් කොට, තාපියේ කඳු අතරට තල්ලු වී ගියේ ය. ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් ක්ෂේත්‍ර

සටන් කිරීමේ උපායමාර්ගය නිවැරදි ලෙස යෙදුවේ ය; හැම විට ම ත් හැම තැන ම ත් මුලපිරුම අතේ තබා ගැනීම පිණිස එය 3,00,000කට වැඩි ගණනක් මැරුම්කෑමේ සහ තුවාල ලැබීමේ ද, විශාල භූමිභාග සතුරා විසින් අල්ලාගනු ලැබීමේ ද මිල ගෙවීමට පැකිළුණේ නැත. එහි විපාකය වශයෙන්, අපි සතුරු භටයන් 11,20,000ක් මුල්පිස දමන්ට සමත් වීමු, තම බලසේනාවන් විසිරී සිටින්ට සැලසීමට සතුරාට බල කළෙමු, අපේ බලසේනාවන් අයෝමයභාවයට පත් කොට ශක්තිමත් කළෙමු, ඊසානදිග, ජෙහොල්, නැගෙනහිරි හෝපෙයි, දකුණු ශාන්සි සහ උතුරු හෝනාන් යන පළාත් වල උපායමාර්ගික පෙරළා–පහරදීම් දියත් කළෙමු, විශාල භූමිප්‍රදේශ ආපසු ලබා ගතිමු, අළුත් ප්‍රදේශ නිදහස් කළෙමු.[1]

3. දෙවැනි අවුරුද්දේ කරන සටනේදී අපේ හමුදව සතු මූලික කර්තව්‍යය වන්නේ දේශ–ව්‍යාප්ත පෙරළා–පහරදීමක් දියත් කිරීම ය; ඒ කියන්නේ, බාහිර පේළි කරා සටන් කරගෙන යාමට, යුද්ධය කුඕමින්තාං ප්‍රදේශ තුළට ගෙනයාමට, බාහිර පේළි වලදී සතුරන් විශාල ගණනින් මුල්පිස දැමීමට සහ, කුඕමින්තාං පක්ෂයේ ප්‍රති–විප්ලවවාදි උපායමාර්ගය, එනම් දිගට ම නිදහස් ප්‍රදේශ තුළට යුද්ධය ගෙනයාමේ ත්, අපේ මිනිස්බලයට සහ ද්‍රව්‍යමය වත්කම් වලට තව දුරට අලාබ හානි කර ඒවා හීන කර දැමීමේ ත්, බොහෝ කලක් අල්ලාගෙන සිටීමට අපට කොහෙත් ම බැරි කිරීමේ ත් ප්‍රති–විප්ලවවාදි උපායමාර්ගය, සම්පූර්ණයෙන් කඩාකප්පල් කිරීමට අපේ ප්‍රධාන බලසේනාවන් යෙදීම ය. දෙවැනි අවුරුද්දේ කරන සටනේදී, අපේ හමුදව සතු කර්තව්‍යයේ එක් කොටසක් වන්නේ දිගට ම ඇතුල් පේළි වල සටන් කරගෙන යමින් එහි සතුරා මුල්පිස දමනු පිණිස සහ නැති වූ භූමිප්‍රදේශය

හමුදවේ තායියුප් හමුදව අගෝස්තු අග හරියේදී දකුණු ශාන්සි පළාතෙන් කහ ගඟ බලෙන් තරණය කොට, බටහිරි හෝනාන් පළාතට තල්ලු වී ගියේ ය. නැගෙනහිරි චීන ක්ෂේත්‍ර හමුදව සැප්තැම්බර් මුලදී සතුරා ඒකරාශි වී දුන් ප්‍රහාරයක් සුණුවිසුණු කොට නිරිතදිග ශාන්ටුං පළාතට තල්ලු වී ගියේ ය. ඒ මාසයේදී ම නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදවේ ශාන්ටුං හමුදව නැගෙනහිර ශාන්ටුං පළාතේදී සතුරාට විරුද්ධ ව පහරදීමක් ආරම්භ කළේ ය. වයඹදිග ක්ෂේත්‍ර හමුදව අගෝස්තු මාසයේදී පහරදීමට බැස්සේ ය. ශාන්සි-චහාර්-හෝපෙයි ක්ෂේත්‍ර හමුදව සැප්තැම්බර් මුලදී පීපිං-හැන්කව් දුම්රියමගේ උතුරු කොටස දිගට සතුරාට විරුද්ධ ව පහරදීමක් පටන්ගත්තේ ය. ඊසානදිග ක්ෂේත්‍ර හමුදව, ඊසානදිග කොටස පුරා ගෙනගිය තම ග්‍රීෂ්මසෘතු පහරදීමට පසු වහා ම, සැප්තැම්බරයේදී පටන් ගනිමින්, චාංචුන්-කිරින්-සපිංකායි ප්‍රාන්තයෙයි සහ පීපිං-ලියාඕනිං දුම්රියමග දිගේ චින්ශි-අයිශියන් කොටසෙහි විශාල පරිමාණයේ සරත් කාල පහරදීමක් දියත් කළේ ය. මේ රණ මණ්ඩල සියල්ලේ ම කළ පහරදීම් මුළු මහජන විමුක්ති හමුදව විසින් කළ සමස්ත පහරදීමක් විය. මේ විශාල-පරිමාණයේ පහරදීම, යුද්ධ තත්වයෙහි බලවත් වෙනස්වීමක් සලකුණු කරමින්, විමුක්ති යුද්ධය හැරෙන තැනක් කරා ගෙනගියේ ය. බලන්න, "වර්තමාන තත්වය සහ අප සතු කර්තව්‍යයෝ", මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං, 1961, VIවැනි කාණ්ඩය, 157-76වැනි පිටු.

LIBERATION BASE

https://liberationbase.wordpress.com

ආපසු ලබා ගනු පිණිස අපේ ප්‍රධාන බලසේනා අතුරෙන් සමහරක් සහ අපේ ප්‍රාන්තික හටකණ්ඩායම් විශාල සංඛ්‍යාවක් යෙදීම ය.

4. බාහිර පේළි වල සටන් කිරීමේ ත් යුද්ධය කුඕමින්තාං ප්‍රදේශ තුළට ගෙනයාමේ ත් ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදන විට අපේ හමුදුවට සත්තකින් ම බොහෝ අමාරුකම් වලට මූණ පාන්ට සිදු වෙනවා ඇත. කවර හෙයින් ද යත්, කුඕමින්තාං ප්‍රදේශ වල අළුත් කඳවුරු ගොඩනඟන්ට කල් යන නිසා ය; ස්ථාවර කඳවුරු ගොඩනඟන්ට අපට හැකි වන්නේ අප විසින් පස්සට යමින් ඉස්සරහට යමින් කරන ජංගම සටන්ව්‍යාපාර බොහෝවකදී සතුරන් විශාල ගණනින් මුල්පිස දමූ කල, බහුජනයා අවදි කළ කල, ඉඩම් බෙදා දුන් කල, අපේ දේශපාලන බලය පිහිටුවූ කල සහ ජනතාවගේ සන්නද්ධ බලසේනාවන් ගොඩනැගූ කල පමණකි. එසේ කරන තුරු, හුඟක් අමාරුකම් විඳින්ට සිදු වෙනවා ඇත. එහෙත් ඒවා මැඩපැවැත්විය හැකි ය, මැඩපැවැත්විය යුතු ම ය. කවර හෙයින් ද යත්, තව තව ත් තම බලසේනාවන් විහිදුවන්නට සතුරාට බලෙන් ම සිදු වී, තව තව ත් සුවිශාල භූමිප්‍රදේශ ජංගම සටන්ව්‍යාපාර සඳහා යුදබිම් වශයෙන් අපේ හමුදුවට ලැබෙනවා ඇති නිසා ත්, එහෙයින් ජංගම සංග්‍රාමය කරන්ට අපට පුළුවන් වන නිසා ත් ය; ඒ භූමිප්‍රදේශ වල වෙසෙන පුළුල් බහුජන සමූහයෝ කුඕමින්තාං පක්ෂයට වෛර කරති, අපට අනුබල දෙති; සතුරු බලසේනාවන් අතුරෙන් කොටසකට තවම සංසන්දනාත්මක වශයෙන් උසස් සටන් ක්ෂමතාවක් තිබෙන නමුත්, මුළු වශයෙන් ගත් කල සතුරාගේ චිත්තශක්තිය ත් සටන් ක්ෂමතාව ත් ගිය අවුරුද්දේ තිබුණාට වඩා හුඟක් පහළ ය.

5. කුඕමින්තාං ප්‍රදේශ වල කරන සටනේදී ජය ලබන්ට තිබෙන යතුරු මේවා ය: පළමුකොට, සටන් කිරීමට ලැබෙන ඉඩප්‍රස්තා ඩැහැගැනීමට හපන් වීම, නිර්භීත සහ අධිෂ්ඨාන සහගත වීම, හැකි තරම් වැඩි ගණනක් සටන් ජය ගැනීම; දෙවැනිව, බහුජනයා අපේ හමුදුවේ පැත්ත ගන්නා සේ, බහුජනයාගේ හිත දිනාගැනීමේ ප්‍රතිපත්තිය ස්ථිර ලෙස ක්‍රියාත්මක කිරීම සහ පුළුල් බහුජන සමූහයන්ට පලප්‍රයෝජන ලබන්ට ඉඩ සැලසීම. මේ කරුණු දෙක ඉටු කරතොත්, අප ජය ගන්නවා ම ය.

6. මේ අවුරුද්දේ අගෝස්තු අන්තිම තෙක්, මුල්පිස දමා සිටී හෝ පොඩිපට්ටම් වන පහරවල් කා සිටි බලසේනාවන් ද ඇතුළු ව සතුරු බලසේනාවන් බෙදා සිටි අයුරු මෙසේ ය: දකුණු පෙරමුණෙහි බ්‍රිගේඩ 157කි, උතුරු පෙරමුණෙහි බ්‍රිගේඩ 70කි, කුඕමින්තාං පසුමුණු ප්‍රදේශ වල 21 කි. මුළු රටේ ම සිටි මුළු ගණන එතෙක් ම බ්‍රිගේඩ 248ක් විය; හටයන්ගේ නියම ගණන 15,00,000ක් පමණ විය. විශේෂ හමුදා ශාඛා, රැකඩ හටසේනා, මංමාවත් පොලිස් හමුදුව සහ සාම සංරක්ෂණ බළකාය යන මේවායේ

සිටි හටයෝ 12,00,000ක් පමණ වූහ. සතුරාගේ පසුමුණෙහි යුද්ධ ආයතනයන්හි සිටි සටන්කරුවන් නොවන්නන්ගේ ගණන 10,00,000ක් පමණ විය. මෙසේ මුළු සතුරු බලසේනාවෝ මුළු ගණනින් මිනිස්සු 37,00,000ක් පමණ වූහ. දකුණු පෙරමුණේ සිටින හටසේනාවන් අතුරෙන්, බ්‍රිගේඩ 117ක් කූ චූ–තුංගේ කණ්ඩායමට ද, 7ක් වෙං චීයන්ගේ කණ්ඩායමට සහ වෙන අයට ද, 33ක් හූ ත්සුං–නාන්ගේ කණ්ඩායමට ද අයත් වේ. කූ චූ–තුංගේ කණ්ඩායමට අයත් බ්‍රිගේඩ 117න් 63ක් මුල්පිස දමා ඇත, නැතහොත් පොඩිපට්ටම් වන පහරවල් කා ඇත. මේවායින් සමහරක් වෙනුවට අළුත් බ්‍රිගේඩ එවා නැත; අන් සමහරක් වෙනුවට අළුත් ඒවා එවාගෙන යන නමුත්, ඒවායේ සිටින්නේ මිනිස්සු ටික දෙනෙකි, ඒවායේ සටන් ක්ෂමතාව අඩු ය; තව සමහරක්, ඒවායේ මිනිස්බලය ත් අවිආයුධ ත් තරමක් හොඳින් අළුතෙන් සපයා ඇතත්, ඒවායේ සටන් ක්ෂමතාව එක්තරා ප්‍රමාණයකට නැවත ඇති කර ඇතත්, තවම ත් කලින්ට වඩා බෙහෙවින් දුර්වල ය. මුල්පිස දමා හෝ පොඩිපට්ටම් වන පහරවල් කා නැති බ්‍රිගේඩ තිබෙන්නේ 54ක් පමණි. කූ චූ–තුංගේ සියලු බලසේනාවන් අතුරෙන්, බ්‍රිගේඩ 82ක සිට 85 තෙක් ගණනක් ගැරිසන් රාජකාරි සඳහා යොදා ඇත; ඒවා යැවිය හැක්කේ ප්‍රාදේශික යුද කටයුතු පිණිස පමණකි; උපායමාර්ගික යුදකටයුතු පිණිස යැවිය හැකි බ්‍රිගේඩ ගණන 32කට 35කට වැඩි නො වේ. වෙං චීයන්ගේ කණ්ඩායමට සහ වෙන අයට අයත් බ්‍රිගේඩ 7 ප්‍රධාන වශයෙන් යෙදිය හැක්කේ ගැරිසන් රාජකාරි සඳහා පමණකි; එක් බ්‍රිගේඩයක් දැනට ම පොඩිපට්ටම් වන පහරක් කා ඇත. (ලාන්චව් නුවරින් නැගෙනහිරට ත්, නිංසියා නුවරින් සහ යූලින් නුවරින් දකුණට ත්, ලින්පන් නුවරින් සහ ලෝයාං නුවරින් බටහිරට ත් සිටින්නන් ඇතුළු ව) හූ ත්සුං–නාන්ගේ කණ්ඩායමට අයත් බ්‍රිගේඩ 33 අතුරෙන්, 12ක් මුල්පිස දමා ඇත, නැතහොත් පොඩිපට්ටම් වන පහරවල් කා ඇත; උපායමාර්ගික යුදකටයුතු පිණිස යැවිය හැක්කේ 7ක් පමණි; සෙස්ස ගැරිසන් රාජකාරි වල යෙදී සිටී. උතුරු පෙරමුණෙහි සතුරාට සියල්ල එකතු වූ කල බ්‍රිගේඩ 70ක් සිටී. මේවා අතුරෙන්, ඊසානදිග කණ්ඩායමට බ්‍රිගේඩ 26ක් ඇත; ඒවායින් 16ක් මුල්පිස දමා ඇත, නැතහොත් පොඩිපට්ටම් වන පහරවල් කා ඇත; සුන් ලියන්–චුංගේ කණ්ඩායමට බ්‍රිගේඩ 19ක් සිටී; ඒවායින් 8ක් මුල්පිස දමා ඇත, නැතහොත් පොඩිපට්ටම් වන පහරවල් කා ඇත; පූ ත්සෝ–යීට බ්‍රිගේඩ 10ක් සිටී; ඒවායින් 2ක් පොඩිපට්ටම් වන පහරවල් කා ඇත; යෙන් ශි–ශාන්ට බ්‍රිගේඩ 15ක් සිටී; ඒවායින් 9ක් මුල්පිස දමා ඇත, නැතහොත් පොඩිපට්ටම් වන පහරවල් කා ඇත. මේ සතුරු හටසේනාවන් දැන් ප්‍රධාන වශයෙන් සිටින්නේ ආරක්ෂාවීමෙහි ය, ජංගම සටන්ව්‍යාපාර පිණිස ලබා ගත හැක්කේ ඔවුන් ගෙන් කුඩා කොටසක් පමණකි. කුඕමින්තාං පසුමුණු ප්‍රදේශ වල ගැරිසන් රාජකාරියෙහි යෙදුණු බ්‍රිගේඩ ඇත්තේ 21ක් පමණි. මේවායින්, බ්‍රිගේඩ 8 ක් සින්චියාං සහ බටහිරි කාන්සු පළාත් වල ද, 7ක්

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සෙවුආන් සහ සිකාං පළාත් වල ද, 2ක් යුන්නාන් පළාතෙහි ද, 2ක් ක්වංතුං පළාතෙහි ද (ඒ කියන්නේ, මුල්පිස දමනලද 69වැනි ඩිවිසනය යි), 2ක් තායිවානයෙහි ද සිටී. හුනාන්, ක්වාංසි, ක්වෙයිචව්, පූචියන්, චෙචියාං සහ චියාංසි යන පළාත් හයේ නිත්‍ය හටසේනා කොහෙත් ම නැත. කුඕමින්තාං පක්ෂය, එක්සත් ජනපදයේ ආධාර ඇතිව, පෙරමුණේ මදිපාඩු සම්පූර්ණ කිරීම පිණිස ත්, අළුත් බ්‍රිගේඩ සහ විනාශ වූ ඒවා වෙනුවට යවන රෙජමේන්තු ගණනක් පුහුණු කිරීම පිණිස ත් මේ අවුරුද්දේ මිනිසුන් 10,00,000ක් අළුතෙන් බන්ද ගැනීමට සැලැස්ම කරගෙන යයි. කෙසේ වේවා, මුල් අවුරුද්දේ සටන් වලදී අපේ හමුදව කළාක් මෙන්, දෙවැනි අවුරුද්දේදී ත්, මසකට සාමාන්‍ය ගණනින් බ්‍රිගේඩ 8 බැගින් මුල්පිස දමමින්, තව බ්‍රිගේඩ 96යේ සිට 100 තෙක් ගණනක් මුල්පිස දමන්ට ඊට හැකි වේ නම් (ජූලි සහ අගෝස්තු මාස තුළ දැනට ම බ්‍රිගේඩ 16½ක් මුල්පිස දමා ඇත), එවිට සතුරු හමුදව තව දුරට ත් බෙහෙවින් ම දුර්වල වෙනවා ඇත, එහි උපායමාර්ගික රිසව් සේනාවන්ගේ ගණන ඉතා ම අඩු වෙනවා ඇත, එය රටේ සියලු ම කොටස් වල ආරක්ෂාවීමේ තත්වයකට බලෙන් ම වැටෙනවා ඇත, හැම තැනදී ම අපෙන් පහර කනවා ඇත. මිනිසුන් 10,00,000ක් අළුතෙන් බන්ද ගැනීමේ ත් අළුත් බ්‍රිගේඩ සහ වෙනුවට යවන රෙජමේන්තු පුහුණු කිරීමේ ත් මේ සැලැස්ම කුඕමින්තාං පක්ෂයට තිබෙන නමුත්, එයින් ලැබෙන පලක් නැත. එය අළුතෙන් මිනිසුන් බන්ද ගන්නා එක ම ක්‍රමය බලෙන් අල්ලාගෙන යාම හෝ කුලියට ගැනීම වන හෙයින්, දස ලක්ෂයක් සපයා ගැනීම සත්තකින් ම අමාරු වෙනවා ඇත, බොහෝ දෙනා පැන යනවා ඇත. එමතු නො ව, බාහිර පේළි වල සටන් කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදීමෙන්, සතුරාගේ මිනිස්බලය ද ද්‍රව්‍යමය වත්කම් ද හීන කරන්ට අපේ හමුදව සමත් වෙනවා ඇත.

7. අපේ හමුදවේ සටන්ව්‍යාපාරික මූලධර්ම කලින් පණවා තිබෙන ඒවා පරිදි ම වේ:

පළමුකොට, විසිරී සිටින, තනි වී සිටින සතුරු බලසේනාවන්ට පහර දෙන්න (මෙය මේ අවුරුද්දේ පෙබරවාරියෙහි ලායිවූ යුද්ධව්‍යාපාරය[2] ද, ජූලියෙහි නිරිතදිග ශාන්ටුං යුද්ධව්‍යාපාරය[3] ද වැනි, බ්‍රිගේඩ කිහිපයකට විරුද්ධ ව එල්ල කළ විශාල–පරිමාණයේ මුලසුන් කිරීමේ යුද්ධව්‍යාපාර වලට ද යෙදේ); පසුව ඒකරාශි වී සිටින ප්‍රබල සතුරු බලසේනාවන්ට පහර දෙන්න.

පළමුකොට, මධ්‍යම සහ කුඩා ප්‍රමාණයේ නගර ත් පැතුරුණු ගම්බද ප්‍රදේශ ත් අල්ලා ගන්න; පසුව ලොකු නගර අල්ලා ගන්න.

සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදිය හැකි ශක්තිය මුල්පිස දැමීම අපේ ප්‍රධාන පරමාර්ථය කර ගන්න; ස්ථානයක් අල්ලාගෙන සිටීම

හෝ අත්පත් කර ගැනීම අපේ ප්‍රධාන පරමාර්ථය නො කර ගන්න. ස්ථානයක් අල්ලාගෙන සිටීම හෝ අත්පත් කර ගැනීම සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදිය හැකි ශක්තිය මුල්පිස දැමීමේ ප්‍රතිඵලයක් වේ. බොහෝ විට ස්ථානයක් සදහට ම අල්ලාගෙන සිටීමට හෝ අත්පත් කර ගැනීමට හැකි වන්නේ එය කීප වරක් අතින් අතට මාරු වූ පසුව පමණකි.

හැම සටනකදී ම, ඒකාන්ත වැඩි–බලයක් ඇති බලසේනාවක් ඒකරාශි කරන්න, සතුරු බලසේනාවන් සම්පූර්ණයෙන් ම වට කරන්න, ඔවුන් නිරවශේෂයෙන් ම මුල්පිස දමන්ට මහන්සි ගන්න, කිසිවකුට දැලෙන් බේරී යාමට ඉඩ නො දෙන්න. විශේෂ වටාපිටා තත්වයන්හිදී, සතුරාට පොඩිපට්ටම් වන පහරවල් දීමේ ක්‍රමය යොදන්න; ඒ කියන්නේ මෙය යි: වෙනත් සතුරු බලසේනාවන් සුණුවිසුණු කිරීම සඳහා තම බළඇණි යුහුව වෙන තැන් වලට ගමන් කරවීමට අපේ හමුදවට හැකි වන සේ, සතුරාගේ එක් කොටසක් මුල්පිස දැමීමේ සහ තවත් කොටසක් පළවා හැරීමේ අරමුණ ඇතිව, සතුරාගේ ඉස්සරහට ම දෙන පහරක් සහ ඔහුගේ අංශ දෙකින් එකකට හෝ දෙකට ම හෝ දෙන පහරක් දීම පිණිස අපේ මුළු ශක්තිය ම ඒකරාශි කොට යොදන්න.

එක් අතකින්, සූදනම් නො වී කිසි ම සටනක් නො කිරීමට, ජය ගත හැකි බව ඔබට නිසැක නැති කිසි ම සටනක් නො කිරීමට වග බලා ගන්න. එක් එක් සටන පිණිස හොඳින් සූදනම් ව සිටීමට හැම පරිශ්‍රමයක් ම දරන්න, සතුරා ත් අප ත් අතර නිශ්චය වශයෙන් පවතින තත්වයන් රැසක් තුළ ජය ගැනීම සහතික කිරීමට හැම පරිශ්‍රමයක් ම දරන්න. අනික් අතට, අපේ සටන් කිරීමේ පන්නය — එනම්, සටනේදී ධෛර්යය, පරිත්‍යාගයට බිය නො වීම, වෙහෙස ගැන බිය නො වීම සහ දිගට ම සටන් කිරීම (එනම්, කෙටි කාලසීමාවක් ඇතුළත විවේකයක් නොමැතිව පිට පිට ම සටන් කරගෙන යාම) — සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදන්න.

සතුරා ජංගම සංග්‍රාමයට ඇදගැනීමට මහන්සි ගන්න; එහෙත් ඒ අතර ම සතුරු රක්ෂිත ස්ථාන සහ නගර විශාල පරිමාණයකින් අල්ලාගැනීම සඳහා ස්ථානගත ප්‍රහරණයේ උපක්‍රම ඉගෙනගැනීම ත් කාලතුවක්කු සහ ඉංජිනේරු බළකාය වැඩිවැඩියෙන් ගොඩනැඟීම ත් ඉතා වැදගත් කොට සලකන්න.

දුර්වල ලෙස ආරක්ෂා කර ඇති සියලු සතුරු රක්ෂිත ස්ථාන වලට සහ නගර වලට ස්ථිර සිතින් පහර දී ඒවා අත්පත් කර ගන්න; නිසි මොහොතෙහි, වටාපිටා තත්වයන් ගෙන් අවසර ලැබේ නම්, තරමක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ශක්තියක් ඇතිව ආරක්ෂා කර ඇති සියලු සතුරු රක්ෂිත ස්ථාන වලට සහ නගර වලට පහර දී ඒවා අත්පත් කර ගන්න. ප්‍රබල ලෙස ආරක්ෂා කර ඇති සියලු සතුරු රක්ෂිත ස්ථාන සහ නගර එසේ ම තිබෙන්නට ඉඩ හරින්න.

සතුරා ගෙන් අල්ලා ගත් සියලු අවිආයුධ ත් සෙබළුන් වැඩි ම දෙනා ත් (භටයන් ගෙන් සියයට 80ක් 90ක් පමණ සහ කනිෂ්ඨ නිල-ධාරීන් සුළු ගණනක්) ප්‍රයෝජනයට ගනිමින් අපේ ශක්තියේ අඩුපාඩු සම්පූර්ණ කරගන්න. අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට ප්‍රධාන වශයෙන් සෙවිය යුත්තේ සතුරා ගෙන් සහ කුඕමින්තාං ප්‍රදේශ වලින් ය; කොටසක් පමණක් පරණ නිදහස් ප්‍රදේශ වලින් සෙවිය යුතු ය; මෙය දකුණු පෙරමුණේ සිටින හමුදවන්ට විශේෂයෙන් ම යෙදේ.

සියලු ම අළුත් සහ පරණ නිදහස් ප්‍රදේශ වල, අපි (දීර්ඝ යුද්ධයකට ආධාර අනුබල දීම ත් දේශ-ව්‍යාප්ත ජයග්‍රහණය දිනාගැනීම ත් පිණිස ඉතා ම මූලික අවශ්‍යතාව වන) ඉඩම් ප්‍රතිසංස්කරණය ස්ථිර ලෙස කරගෙන යා යුත්තෙමු, නිෂ්පාදනය වර්ධනය කළ යුත්තෙමු, අරපිරිමැස්මෙන් වැඩ කළ යුත්තෙමු, යුද්ධ කර්මාන්ත ඉදි කිරීම තර කළ යුත්තෙමු — මේ සියල්ල පෙරමුණේදී ජය ලැබීම පිණිස ය. මේ දේ කිරීමෙන් පමණකි දීර්ඝ යුද්ධයකට ආධාර අනුබල දෙන්ට ත් මුළු රටේ ම ජය දිනාගන්ට ත් අපට හැකි වන්නේ. අප එසේ කරතොත්, දීර්ඝ යුද්ධයකට ආධාර අනුබල දීමට ත් රට පුරා ම ජය දිනාගැනීමට ත් අපට සත්තකින් ම හැකි වෙනවා ඇත.

8. ඉහතින් කී දේ මේ අවුරුද්දේ කළ සටන් සම්පිණ්ඩනය කරයි, ඉදිරියට කරන්ට තිබෙන සටන් සඳහා මූලධර්ම ඉදිරිපත් කරයි. හැම එක්-කෙනා ම තමතමාට අයත් වැඩය තේරුම් ගෙන, එය ස්ථිර ලෙස ත් අචල ලෙස ත් කරන සේ, මෙහි අඩංගු දේ රෙජමේන්තු තත්වයේ සහ ඊට ඉහළ, කොට්ඨාශ-පක්ෂ කොමිටි මට්ටමේ සහ ඊට ඉහළ, කොට්ඨාශ කොමසාරිස් කාර්යාල මට්ටමේ සහ ඊට ඉහළ සියලු ම කාඩර්වරුන් අතට පත් කරන ලෙස සියලු ම ප්‍රදේශ වල නායක සහෝදරවරුන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ස ට හ න්

[1] ඊසානදිග, ජෙහොල් සහ නැගෙනහිරි හෝපෙයි පළාත් වල කළ මේ උපායමාර්ගික පෙරළා-පහරදීම ඊසානදිග මහජන විමුක්ති හමුදව 1947තේ ග්‍රීෂ්මඍතුවේදී කළ පහරදීම විය. මැයි 13වැනි ද මහජන විමුක්ති හමුදව මේ පෙරමුණු වල එක විට ම පහරදීම කරන්ට පටන්ගෙන, ජූලි 1වැනි ද වන විට සතුරු භටයන් 80,000කට වඩා මුල්පිස දමා, උප-පළාත් සුළු නගර හතළිහකට වැඩි ගණනක් ආපසු අල්ලාගෙන තිබුණි. ඊසානදිග චීනයේ නිදහස් ප්‍රදේශ එකිනෙකින් කපා දැමීමේ සතුරු සැලැස්ම මෙසේ සම්පූර්ණයෙන් ම කඩා බිඳ දමනලදී. චීන චාංචුන් දුම්රියමග ත් පීපිං-ලියාඕනිං දුම්රියමග ත් දිගට පටු තීරු දෙකක් තුළට පළවා හරිනු ලැබූ සතුරු භටකණ්ඩායම් "ප්‍රධාන ස්ථාන ආරක්ෂා කරන" තත්ව-යකට බලෙන් ම වැටුණි. මෙය ඊසානදිග චීනයෙහි මුළු තත්වය ම වෙනස් කළේ ය. දකුණු ශාන්සි සහ උතුරු හෝනාන් පළාත් වල කළ උපායමාර්ගික පෙරළා-පහරදීමට ඇතුළත් වූයේ ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් මහජන විමුක්ති හමුදව විසින් 1947 මාර්තු සහ මැයි අතර උතුරු හෝනානයෙහි ත් දකුණු ශාන්සියෙහි තාතුං-පූචව් දුම්රියමගේ අංශ වල ත් දියත් කරනලද පහරදීම් ය. උතුරු හෝනානයෙහි සිටි අපේ හමුදව මාර්තු 23වැනි ද පහර දෙන්ට පටන් ගත්තේ ය. එකකට පසු එකක් වශයෙන් යෙන්චින්, යාංචූ, පූයාං සහ පෙංචියු අල්ලාගැනීමෙන් පසු, අපේ හමුදව මේ සාර්ථකභාවයන් ගෙන් තව තව වාසි ගැනීම පිණිස උතුරට හැරුණි. මැයි 28වැනි ද වන විට, ඒ හමුදව ත්සිශියන්, චුන්ශියන්, හුආශියන් සහ තාංයින් අල්ලාගෙන තිබුණි, සතුරු භටයන් 45,000කට වඩා මුල්පිස දමා තිබුණි. දකුණු ශාන්සියෙහි සිටි අපේ භටකණ්ඩායම් අප්‍රේල් 4වැනි ද පහරදීමේ සටන්ව්‍යාපාර පටන් ගත්තේ ය. මැයි 4වැනි ද වන විට, ඔව්හු චූවෝ, ශින්චියාං සහ යුංත්සි ඇතුළු උප-පළාත් නගර විසිදෙකක් ද කහ ගඟේ වැදගත් තොටුපොළවල් දෙකක් වූ යූමන්කෞ සහ ෆෙංලිංතු ද අල්ලාගෙන සිටියහ, සතුරු භටයන් 18,000කට වඩා මුල්පිස දමා සිටියහ.

[2] ලායිවූ යුද්ධව්‍යාපාරය නැගෙනහිර චීන මහජන විමුක්ති හමුදව විසින් ශාන්ටුං පළාතේ ත්සිනාන් නුවරට ගිනිකොන් දිගින් ලායිවූ ප්‍රාන්තයෙහි කරනලද ජංගම සංග්‍රාම යුද්ධව්‍යාපාරයක් විය. 1947 ජනවාරි අග හරියේදී, කුඕමින්තාං භටකණ්ඩායම් ශාන්ටුං නිදහස් ප්‍රදේශයට විරුද්ධ ව උතුරෙනුත් දකුණෙනුත් පහරදීමක් දියත් කළේ ය. දකුණේ සිට, කුඕමින්තාං ප්‍රතිසංවිධිත ඩිවිසන් අටක් යීහෝ සහ ශුහෝ ගංගාවන් ඔස්සේ මාර්ග තුනක් දිගේ ලින්යී දෙසට උතුරට කාගෙන ආවේ ය; උතුරේ සිට, ඒ ඩිවිසන් අට සමග උචිත ලෙස සම්බන්ධ වී, ලි ශියන්-චෞ කණ්ඩායමට අයත් කුඕමින්තාං බළකාය තුනක් මිංශුයි, ත්සේචු-ආන් සහ පෝශාන් යන නගර වල සිට ලායිවූ සහ ශින්තායි කරා දකුණු දිගට ඉදිරියට ගමන් කළේ ය; මේ සේනාවන් ආවේ යී-මෙං කඳු ප්‍රදේශයේදී නැගෙනහිර චීන මහජන විමුක්ති හමුදවේ ප්‍රධාන බලසේනාව තීරණාත්මක සටනකට යොමු කරගන්නා අටියෙනි. අපේ හමුදව දකුණෙන් ආ සතුරාට මග අවුරන පිණිස තම බලසේනාවන් ගෙන් කොටසක් යොදා, ලි ශියන්-චෞ කණ්ඩායම විනාශ කරනු පිණිස තම ප්‍රධාන බලසේනාව ලායිවූ බලා උතුරු දෙසට ගමන් කරවී ය. මිනිසුන් 60,000කට වඩා සිටි සියලු ම සතුරු භටකණ්ඩායම් පෙබර-වාරි 20වැනි ද ආරම්භ වී පෙබරවාරි 23වැනි ද සවස්වරුවෙහි අවසන් වූ සටනකදී මුල්පිස දමනු ලැබී ය. කුඕමින්තාං පක්ෂයේ හ්සුචව් අස්වැසීමේ මූලස්ථානයට අයත් 2වැනි අස්-වැසීමේ කලාපයේ නියෝජ්‍ය අණදෙන්නා වූ ලි ශියන්-චෞ අල්ලා ගනු ලැබී ය, සුළු නගර දහතුනක් ආපසු ගනු ලැබී ය.

[3] මේ නිරිතදිග ශාන්ටුං යුද්ධව්‍යාපාරය ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් මහජන විමුක්ති හමුදව විසින් 1947 ජූලියේදී නිරිතදිග ශාන්ටුං පළාතේ හොත්සේ, යූන්චෙං, චූයේ, තිංතාඕ, චින්ශියාං සහ ත්සාඕශියන් ප්‍රාන්තයෙහි කළ යුද්ධව්‍යාපාරය විය. මේ යුද්ධව්‍යා-පාරයේදී, මුළු ගණනින් මිනිසුන් 56,000කට වඩා සිටි කුඕමින්තාං ඩිවිසන් මූලස්ථාන 4ක් සහ බ්‍රිගේඩ 9 1/2ක් මුල්පිස දමන ලදී.

LIBERATION BASE

https://liberationbase.wordpress.com

චීන මහජන විමුක්ති හමුදාවේ ප්‍රකාශනය

1947, ඔක්තෝබර්

චීන මහජන විමුක්ති හමුදාව, චියැං කායි–ශෙක්ගේ පහරදීම සුණුවිසුණු කොට, දැන් විශාල පරිමාණයක පෙරළා–පහරදීමක් දියත් කර ඇත. දකුණු පෙරමුණේ සිටින අපේ හමුදාවෝ යැංසි ගංගා මිටියාවතෙහි ඉදිරියට ගමන් කරමින් සිටිති; උතුරු පෙරමුණෙහි සිටින අපේ හමුදාවෝ චීන චාංචුන් දුම්රියමග සහ පීපිං–ලියාඕනිං දුම්රියමග වෙත ඉදිරියට ගමන් කරමින් සිටිති. අපේ භටකණ්ඩායම් යන යන තැන, සතුරා අප දකින කොට ම හිස් එැ එැ අත පළා යයි, ජනතාව ගිගුම් දෙන ඔල්වරසන් නගයි. මුළු තත්වය ම අවුරුද්දකට කලින් පැවති තත්වය හා සසඳන කල මූලික වශයෙන් වෙනස් වී ඇත.

මේ යුද්ධයේදී අපේ හමුදාවේ අරමුණ, ජාතියට ත් ලෝකයට ත් නොයෙක් වර ප්‍රකාශ කර තිබෙන පරිදි ම, චීන ජනතාවගේ ත් චීන ජාතියේ ත් විමුක්තිය යි. වැලිත් අද, අපේ අරමුණ මුළු රටේ ම ජනතාවගේ බලවත් ඉල්ලීම ඉටු කිරීම ය; ඒ කියන්නේ, සිවිල් යුද්ධයේ මහා අපරාධකාරයා වන චියැං කායි–ශෙක් පෙරළා දමා, ජනතාව ත් ජාතිය ත් නිදහස් කිරීමේ පොදු එල්ලය අත්පත් කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් සකස් කිරීම ය.

පුරා අට අවුරුද්දක් ම චීන ජනතාව තමන්ගේ ම විමුක්තිය ත් ජාතික ස්වාධීනත්වය ත් පිණිස ජපන් අධිරාජ්‍යවාදයට විරුද්ධ ව වීරෝදාර ලෙස සටන් කළෝ ය. ජපනුන් යටත් වූ පසු ජනතාව සාමය උදා වේ ය'යි මහත් ආසාවෙන් බලා සිටියහ; එහෙත් චියැං කායි–ශෙක් ඔවුන්ගේ සියලු සාම

මේ දේශපාලන ප්‍රකාශනය සහෝදර මාඕ සේතුං විසින් චීන මහජන විමුක්ති හමුදාවේ ප්‍රධාන මූලස්ථානය සඳහා කෙටුම්පත් කරනලදී. එය එකල චීනයේ පැවති දේශපාලන තත්වය විශ්ලේෂණය කළේ ය, "චියැං කායි-ශෙක් පෙරළා දමා, මුළු චීනය ම නිදහස් කරන්න!" යන සටන්පාඨය නැඟුවේ ය, චීන මහජන විමුක්ති හමුදාවේ මූලික ප්‍රතිපත්ති අට ප්‍රකාශ කළේ ය; ඒ අට චීන කොමියුනිස්ට් පක්ෂයේ මූලික ප්‍රතිපත්ති අට ද විය. 1947, ඔක්තෝබර 10වැනි දින නිකුත් කරනලද මේ ප්‍රකාශනය "ඔක්තෝබර් 10වැනි ද ප්‍රකාශනය" වශයෙන් ප්‍රකට විය. එය කෙටුම්පත් කළේ උතුරු ශෙන්සි පළාතේ, චියාශියන් උප-පළාතේ, ශෙන්චුආන්පාඕ වලදී ය.

පරිශ්‍රමයන් කඩා බිඳ දමා, පෙර නුවූ විරූ විධියේ සිවිල් යුද්ධයක විපත්තිය ඔවුන් මත බලහත්කාරයෙන් ම පැටෙව්වේ ය. එහෙයින් චියැං කායි–ශෙක් පෙරළා දමන්ට එක්සත් වීම විනා වෙන කරන්ට දෙයක් රට පුරා ම සියලු ම සමාජ තට්ටු වලට අයත් ජනතාවට තිබුණේ නැත.

චියැං කායි–ශෙක්ගේ වර්තමාන සිවිල් යුද්ධ ප්‍රතිපත්තිය අහම්බෙන් ඇති වූ දෙයක් නො වේ; එය ඔහු ත් ඔහුගේ ප්‍රතිගාමී කල්ලිය ත් ස්ථිර ලෙස ම අනුගමනය කර තිබෙන ජනතාවට විරුද්ධ ප්‍රතිපත්තියේ නො වැළකිය හැකි ප්‍රතිඵලය වේ. 1927 තරම් උඩදී, චියැං කායි–ශෙක්, කිසි ම කෙළෙහිගුණයක් නැතිව, කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් අතර පැවති විප්ලවවාදී මිතුරු–හවුලට ද්‍රෝහී වූයේ ය,[1] සුන් යත්–සෙන්ගේ විප්ලවවාදී ත්‍රිවිධ ජනතා මූලධර්ම සහ ත්‍රිවිධ ශ්‍රෙෂ්ඨ ප්‍රතිපත්ති පාවා දුන්නේ ය;[2] ඉක්බිති ඔහු ඒකාධිපති බලයක් පිහිටෙව්වේ ය, අධිරාජ්‍යවාදයට යටත් වූයේ ය, දස අවුරුද්දක් සිවිල් යුද්ධය කළේ ය, එසේ ජපන් පල්හොරුන්ගේ ආක්‍රමණය ඇති වෙන්ට සැලසුවේ ය. 1936යේ සියාන් සිද්ධියේදී,[3] චීන කොමියුනිස්ට් පක්ෂය අයහපතට යහපත කරමින්, චියැං කායි–ශෙක් පසුතැවිලි වී, අළුත් පිටුවක් හරවා, ජපන් ආක්‍රමණිකයන්ට විරුද්ධ සටනට සම්බන්ධ වෙනවා ඇතැ'යි බලාපොරොත්තු වෙමින්, ඔහු නිදහස් කර හැරීමේ තීරණයට එළඹෙන්නට චාං ශුඑ–ලියාං සහ යාං හූ–චෙං සෙනෙවියන් හට උදව් කළේ ය. එහෙත් යළි ත් වරක් ඔහු කිසි ම කෙළෙහිගුණයක් නැති බව ඔප්පු කළේ ය; ඔහු ජපන් අතික්‍රමණිකයන්ට විරුද්ධ ව අක්‍රියාශීලි විය, ජනතාව මර්දනය කිරීමට ක්‍රියාශීලි විය, කොමියුනිස්ට් පක්ෂයට බෙහෙවින් ම සතුරු විය. ගිය අවුරුද්දට කලින් අවුරුද්දේ (1945), ජපානය යටත් විය; චීන ජනතාව තව වරක් චියැං කායි–ශෙක්ට සමාව දී, ඔහු එවකට ත් ඔහු විසින් පටන් ගෙන තිබුණු සිවිල් යුද්ධය නතර කළ යුතු ය'යි ද, ප්‍රජාතන්ත්‍රවාදය භාවිතාවේ යෙදිය යුතු ය'යි ද, සාමය ත් ජාතික සංවර්ධනය ත් සඳහා සියලු පක්ෂ සහ කණ්ඩායම් සමග එක්සත් විය යුතු ය'යි ද ඉල්ලා සිටියහ. එහෙත් තාවකාලිකව සටන් නතර කිරීමේ ගිවිසුම අත්සන් කිරීම ත්, දේශපාලන සාකච්ඡාසභාවේ යෝජනා සම්මත කිරීම ත්, ප්‍රතිඥා හතර[4] ප්‍රකාශයට පත් කිරීම ත් කළා විතරයි, කිසි ම විශ්වාසයක් තබන්ට බැරි චියැං කායි–ශෙක් ඔහුගේ වචනය සම්පූර්ණයෙන් ම කඩ කළේ ය. නොයෙක් වර ජනතාව පොදු යහපත පෙරදැරි කරගෙන තමන් ඉවසන සුලු බව ත් සමගියට කැමති බව ත් පෙන්නුම් කළහ; එහෙත්, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් ආධාර අනුබල දෙනු ලැබ, චියැං කායි–ශෙක්, රටට ජාතියට සිදු වන විපත ගැන කිසි ම තැකීමක් නො කරමින්, ජනතාවට විරුද්ධ ව පෙර නුවූ විරූ ලෙස මුළු වෙර යොදා කරන පහරදීමක් දියත් කිරීමට ඉටා ගත්තේ ය. තාවකාලිකව සටන් නතර කිරීමේ ගිවිසුම ප්‍රකාශයට පත් කළ, ගිය අවුරුද්දේ (1946) ජනවාරියේ සිට මේ දක්වා, චියැං කායි–ශෙක්

https://liberationbase.wordpress.com

ඔහුගේ නිත්‍ය හටකණ්ඩායම් වලින් සැදුණු බ්‍රිගේඩ 220කට වැඩි ගණනක් සහ නානාවිධ හටයන්[5] දස ලක්ෂයක් පමණ ක්‍රියාකාරි සේවයට කැඳවා, චීන ජනතාව ලේ හලමින් කළ සටන් වලින් පසු බොහෝ දුකසේ ජපන් අධිරාජ්‍යවාදයෙන් පැහැර ගත් නිදහස් ප්‍රදේශ වලට විරුද්ධ ව විශාල පරිමාණයේ ප්‍රහාර දියත් කර ඇත; ඔහු පිටපිට ම ශෙන්යාං, පූශන්, පෙන්කි, සපිංකායි, චාංචුන්, යුංචි, චෙංතේ, චිනිං, චාංචියාකෞ, හුආයියින්, හොත්සේ, ලින්යි, යෙන්ආන් සහ යෙන්තායි යන නගර ද, විසාල ගම්බද ප්‍රදේශ ද අත්පත් කරගෙන ඇත. චියාං කායි–ශෙක්ගේ හටයෝ යන යන තැන මිනීමරති, ගිනි තබති, තනිස් කරති, කොල්ල කති, ත්‍රිවිධ කෘෘර ක්‍රියා පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදමින් හරියට ම ජපන් පල්හොරුන් මෙන් ම හැසිරෙති.[6] ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයෙහි, චියාං කායි–ශෙක් බොරු ජාතික මන්ත්‍රීමණ්ඩලය කැඳවා, බොරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කළේ ය. මේ අවුරුද්දේ මාර්තුවේදී, ඔහු කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිතයන් කුඕමින්තාං ප්‍රදේශ වලින් පැන්නුවේ ය. ජූලියේදී ඔහු ජනතාවට විරුද්ධ ව සමස්ත ක්‍රියාකාරි යුද සේවය පිණිස කැඳවීමේ නියෝගයක් නිකුත් කළේ ය.[7] රටේ විවිධ කොටස් වල ජනතාව සිවිල් යුද්ධයට විරුද්ධ ව, කුසගින්නට විරුද්ධ ව සහ එක්සත් ජනපද අධිරාජ්‍යවාදී ආක්‍රමණයට විරුද්ධ ව ගෙනයන සාධාරණ ව්‍යාපාරය කෙරෙහි ද, කම්කරුවන්, ගොවියන්, ශිෂ්‍යයන්, නගරබද මිනිසුන්, ආණ්ඩුවේ සේවකයන් සහ ගුරුවරුන් විසින් පණ රැක ගැනීම පිණිස කරන අරගලය කෙරෙහි ද, චියාං කායි–ශෙක් අනුගමනය කරන්නේ මර්දනය කිරීම, හිරබාරයට ගැනීම සහ සමූහඝාතනය පිළිබඳ ප්‍රතිපත්තියකි. අපේ රටේ සුළු ජාතීන් කෙරෙහි, ඔහු අනුගමනය කරන්නේ හැන් ජාතිවාදය පිළිබඳ, හැකි හැම අයුරකින් ම වධ හිංසා කිරීම සහ මර්දනය කිරීම පිළිබඳ ප්‍රතිපත්තියකි. චියාං කායි–ශෙක්ගේ පාලනය යටතේ පවතින සියලු ම ප්‍රදේශ වල දූෂණය බහුල ව පැතිරී ඇත, රහස් ඒජන්තවරු ඔළමොළ ලෙස හැසිරෙති, පණවා ඇති බදු ගණන් නැත, උහුලන්ට බැරි තරම් බර ය, බඩු මිල අහස උසට නඟී, ආර්ථිකය බංකලොත් ය, සියලු ම ජාවාරම් අඩ පණ වී ඇත, බලෙන් යුද සේවයට ගැනීම ත් ධාන්‍ය බද්ද ත් පටවා ඇත, හැම තැන ම නොරිස්සුම් හඬ ඇසේ; මේ සියල්ල රට පුරා ම ජනතාව අතර ඉමහත් වැඩි–පිරිස දුක් වේදනා නැමති ප්‍රපාතයකට ඇද හෙළා ඇත. ඒ අතර පාලක කල්ලියට අයත් මහ මුදල්හිමියෝ, දූෂිත නිලධාරියෝ, ප්‍රාදේශික කෲර පාලකයෝ, වංශවත් පෙළැන්තියේ නරක මිනිස්සු — චියාං කායි–ශෙක් පෙරටු කොට ගත් මේ හැමෝ ම — මහත් ධනස්කන්ධ ගොඩ ගසාගෙන සිටිති. චියාං කායි–ශෙක් සහ ඔහු වැනි අය මේ ධනස්කන්ධ සපයාගෙන තිබෙන්නේ බදු සහ ගාස්තු බලෙන් අය කර ගැනීම පිණිස ත් මහජනයාට සේවය කරන වෙසින් තම පුද්ගලික ඵලප්‍රයෝජන වැඩිදියුණු කර ගැනීම පිණිස ත් තමන්ගේ ඒකාධිපති බලතල පාවිච්චි කිරීමෙන් ය. තම ඒකාධිපති

පාලනය පවත්වා ගැනීම පිණිස ත් සිවිල් යුද්ධය කරගෙන යාම පිණිස ත්, චියාං කායි–ශෙක් කිසි ම පැකිළීමක් නැතිව අපේ රටේ ස්වාධිපති අයිතිවාසිකම් විදේශීය අධිරාජ්‍යවාදයට විකුණා ඇත, එක්සත් ජනපද සන්නද්ධ සේනාවන් ත්සිංතාඕ නුවර සහ වෙන තැන් වල නතර කර තබන සේ ඔවුන් සමග එක් ව කුමන්ත්‍රණය කර ඇත, ඔහුගේ ම සහෝදර–රටවැසියන් ඝාතනය කිරීම සඳහා සිවිල් යුද්ධයට සහභාගි වීම ත් හටයන් පුහුණු කිරීම ත් පිණිස එක්සත් ජනපදයෙන් උපදේශකයන් ලබා ගෙන ඇත. සිවිල් යුද්ධය සඳහා අහස්යානා, යුදටැන්කි, තුවක්කු සහ වෙඩි බෙහෙත් මහත් තොග වශයෙන් එක්සත් ජනපදයෙන් නැව් වල පටවා එවනු ලැබේ. සිවිල් යුද්ධය සඳහා මුදල් විශාල පරිමාණයකින් එක්සත් ජනපදයෙන් ණයට ගනු ලැබේ. එක්සත් ජනපදයෙන් ලැබෙන මේ අනුග්‍රහයන්ට හිලව් වශයෙන්, චියාං කායි–ශෙක් යුද කඳවුරු ත් අහස් ගමන් සහ නැව් ගමන් පිළිබඳ අයිතිවාසිකමුත් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට පඩුරු පාක්කුඩම් ලෙස පුද ඇත, රට වහල් කරන වෙළඳ ගිවිසුමක් නිමවා ඇත,[8] මේ ආදි දේ කර ඇත — මේවා යුආන් ශී–කායි කළ දේට වඩා බොහෝ වරක් නරක රට ජාතිය පාවා දෙන ද්‍රෝහි ක්‍රියා ය.[9] කොටින් ම, චියාං කායි–ශෙක්ගේ විසි–අවුරුදු පාලනය ද්‍රෝහි, ඒකාධිපති, ජනතා–විරෝධී පාලනයක් වී ඇත. අද රටේ හැම තැන ම, උතුරේ ත් දකුණේ ත්, ජනතාව අතර ඉමහත් වැඩි–පිරිස, තරුණ අය ත් මහළු අය ත්, ඔහුගේ මහා අපරාධ දනිති, අපේ හමුදාව ඉක්මනින් ම පෙරළා–පහරදීම දියත් කොට, චියාං කායි–ශෙක් පෙරළා දමා, මුළු චීනය ම නිදහස් කරනවා ඇතැ'යි බලාපොරොත්තු වෙති.

අපි චීන ජනතාවගේ හමුදාව වෙමු, හැම දෙයකදී ම අපි චීන ජනතාවගේ කැමැත්ත අපේ කැමැත්ත ලෙස ගනිමු. අපේ හමුදාවේ ප්‍රතිපත්ති චීන ජනතාවගේ අත්‍යවශ්‍ය ඉල්ලීම් නියෝජනය කරයි; ඒවා අතර ප්‍රධාන වන්නේ මතු දක්වන ඒවා ය:

(1) කම්කරුවන්, ගොවියන්, සෙබළුන්, උගතුන් සහ ජාවාරම්හිමියන් ද, සියලු පීඩිත පංක්ති, සියලු මහජන සංවිධාන, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ, සුළු ජාතීන්, එතෙර වැසි චීන ජාතිකයන් සහ වෙනත් දේශප්‍රේමීන් ද එක්සත් කිරීම; ජාතික එක්සත් පෙරමුණක් පිහිටුවීම; ඒකාධිපති චියාං කායි–ශෙක් ආණ්ඩුව පෙරළා දැමීම; ප්‍රජාතන්ත්‍රවාදි සභාග ආණ්ඩුවක් පිහිටුවීම.

(2) චියාං කායි–ශෙක් ප්‍රමුඛ සිවිල් යුද්ධ අපරාධකාරයන් සිරබාරයට ගෙන, නඩු අසා, දඬුවම් කිරීම.

(3) චියාං කායි–ශෙක් ඒකාධිපති බලය නැති කිරීම, මහජන ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමය ක්‍රියාවේ යෙදීම සහ කතා කිරීමේ, පුවත්පත් පළ කිරීමේ, රැස්වීම් පැවැත්වීමේ සහ සමාගම් සෑදීමේ නිදහස ජනතාව සඳහා සහතික කිරීම.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

(4) චියාං කායි–ශෙක් පාලන ක්‍රමයට අයත් සියලු ම කබල් ආයතන නැති කොට, සියලු ම දූෂිත නිලධාරීන් දෙවටට ඇද දමා, පවිත්‍ර ආණ්ඩුවක් පිහිටුවීම.

(5) චියාං කායි–ශෙක්, ටී. වී. සූං, එච්. එච්. කුං සහ චෙන් සහෝදරයෝ යන මහ පවුල් හතර[10] සතු වස්තුව සහ වෙනත් ප්‍රධාන යුද්ධ අපරාධකාරයන් සතු වස්තුව බලෙන් රජය සතු කිරීම; නිලධාරි–ප්‍රාග්ධනය බලෙන් රජය සතු කිරීම, ජාතික ධනේශ්වරපංක්තියේ කර්මාන්ත සහ වාණිජ්‍යය දියුණු කිරීම, කම්කරුවන්ගේ සහ සේවකයන්ගේ දිවිපෙවෙත වැඩිදියුණු කිරීම සහ, විපත්ති වලට ගොදුරු වූ අයට ත් දිළිඳුකමින් පෙළෙන අයට ත් සහනය සැලසීම.

(6) රදළ සූරාකෑමේ ක්‍රමය නැති කිරීම සහ ගොවිතැන් කරන අයට ඉඩම් දීමේ ක්‍රමය ක්‍රියාවෙහි යෙදීම.

(7) චීනයේ දේශසීමා ඇතුළත සුළු ජාතීන් හට සමානතාව සහ ස්වතන්ත්‍රතාව පිණිස තිබෙන අයිතිය පිළිගැනීම.

(8) ඒකාධිපති චියාං කායි–ශෙක් ආණ්ඩුවේ දේශද්‍රෝහි විදේශ ප්‍රතිපත්තිය ඉවත දැමීම, සිවිල් යුද්ධ කාලයෙහි චියාං කායි–ශෙක් විසින් ඇති කර ගත් රට ජාතිය පාවා දෙන ද්‍රෝහි ගිවිසුම් සියල්ල අවලංගු කර දැමීම සහ ලබා ගත් සියලු ම විදේශ ණය (ගෙවීම) ප්‍රතික්ෂේප කිරීම. චීනයේ ස්වාධීනත්වයට තර්ජනයක් වන සේ චීනයෙහි නතර කර සිටින ස්වකීය භටසේනාවන් ඉවත් කර ගන්නා ලෙස එක්සත් ජනපද ආණ්ඩුවෙන් තරයේ ම ඉල්ලා සිටීම සහ, කිසි ම විදේශ රටක් සිවිල් යුද්ධය කරගෙන යාමට චියාං කායි–ශෙක්ට ආධාර කරනවාට හෝ ජපන් ආක්‍රමණයේ බලවේගයන් නැවත පණ ගැන්වීමට උත්සාහ කරනවාට විරුද්ධ වීම. සමානතාවේ සහ අන්‍යොන්‍යතාවේ පදනම පිට විදේශ රටවල් සමග වෙළඳ සහ මිත්‍ර ගිවිසුම් නිමවීම. පොදු අරගලයක් තුළ අපට සමානයන් ලෙස සලකන සියලු ජාතීන් සමග එක්සත් වීම.

ඉහත සඳහන් කළ දේ අපේ හමුදාවේ මූලික ප්‍රතිපත්ති වේ. අපේ හමුදාව යන හැම තැනක ම ඒවා වහා ම ක්‍රියාවෙහි යොදනු ලැබේ. මේ ප්‍රතිපත්ති අපේ රටේ ජනතාව අතර සියයට 90කට වැඩි දෙනකුන් කරන ඉල්ලීම් වලට අනුරූප වේ.

අපේ හමුදාව චියාං කායි–ශෙක්ගේ කාර්යභාරපුද්ගලයන් සියලු දෙනා ම අහක දමන්නේ නැත; එක් එක් ප්‍රශ්නයේ සුදුසුකම් උඩ ඒ එක එක ගැන ක්‍රියා කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා ඇත. ඒ කියන්නේ මෙය යි: ප්‍රධාන අපරාධකාරයන්ට නො වරදවා ම දඬුවම් දෙනු ලැබේ, බල කිරීම නිසා අත්උදව්කාරයන් වී සිටින අයට දඬුවම් කරන්නේ නැත, හොඳ වැඩ කරන අයට හොඳ සැලකිලි ලැබෙනවා ඇත. සිවිල් යුද්ධය පටන් ගත් මහා

අපරාධකාරයා වූ ත් ඉතා ම භීෂණ අපරාධ කර සිටින මහා අපරාධකාරයා වූ ත් චියාං කායි–ශෙක් සම්බන්ධයෙන් ද, ජනතාව පයින් පාගාගෙන සිටින්නන් වූ ත් පූළුල් බහුජන සමූහයන් විසින් යුද්ධ අපරාධකාරයන් වශයෙන් හංවඩු ගසා සිටින්නන් වූ ත් ඔහුගේ හැඩිදැඩි අත්උදව්කාරයන් සම්බන්ධයෙන් ද, අපේ හමුදාව, පොළොවේ හතර කොණට ම වුවත් යමින්, ඔවුන් සොයා අල්ලාගෙන ඇවිත් නඩු අසා ඔවුන්ට දඬුවම් කරනවා ඇත. මේ අපරාධකාරයන් කරන දුෂ්ට ක්‍රියා වලදී ඔවුන්ට එකතු වීමෙන් තරයේ ම වැළකී සිටින ලෙස, අහිංසක මිනිසුන්ගේ ලෙයින් තම අත් තවම කිලිටි කරගෙන නැති චියාං කායි–ශෙක්ගේ හමුදාවේ සිටින සියලු ම මුලාදෑනින්ට සහ භටයන්ට ත්, ඔහුගේ ආණ්ඩුවේ සිටින සියලු ම නිලධාරීන්ට ත්, ඔහුගේ පක්ෂයේ සියලු ම සාමාජිකයන්ට ත් අපේ හමුදාව අවවාද කරයි. දුෂ්ට වැඩ කර සිටින අය වහා ම ඒවා නතර කොට, පසුතැවිලි වී, අළුත් දිවියක් අරඹමින්, චියාං කායි–ශෙක් ගෙන් බිඳී යා යුතු ය; තමන් කළ අපරාධ වලින් සිදු වී ඇති වරද හොඳ ක්‍රියා වලින් පිරිමහන්ට ඉඩප්‍රස්තාවක් අපි ඔවුන්ට දෙමු. අපේ හමුදාව තම අවි බිම තබන චියාං කායි–ශෙක්ගේ හමුදාවේ මුලාදෑනින් සහ භටයන් අතර කිසිවකු මරන්නේ වත් ඔවුන්ට නින්ද අපහාස කරන්නේ වත් නැත, ඔවුන් අප සමග සිටින්ට කැමති නම් ඔවුන් අපේ සේවයට බාර ගන්නවා ඇත, ඔවුන් සේවය හැර යන්ට කැමති නම් ඔවුන් ගෙදර යවනවා ඇත. කැරලි ගසමින් නැඟී සිට අපේ හමුදාවට බැඳෙන චියාං කායි–ශෙක් භටයන් සහ එළිපිට ම හෝ රහසින් හෝ අපේ හමුදාව සඳහා වැඩ කරන අය සම්බන්ධයෙන්, ඔවුන්ට හොඳ සැලකිලි කරනු ලැබේ.

කල් නැර ම චියාං කායි–ශෙක් පෙරළා දමා ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් පිහිටුවීම සඳහා, අපේ හමුදාව යන යන තැන ප්‍රතිගාමී බලවේගයන් ඉවත් කර දැමීමට ත් ප්‍රජාතන්ත්‍රවාදී පටිපාටියක් ඇති කිරීමට ත් උනන්දුවෙන් අප සමග සහයෝග වී වැඩ කරන ලෙස අපි හැම තරාතිරමක අපේ සහෝදර රටවැසියන් ගෙන් ඉල්ලා සිටිමු. අප තවම ළඟා වී නැති තැන් වල, ඔව්හු තමන්ගේ ම මනාපයෙන් අවි අතට ගත යුත්තාහ, බලෙන් අල්ලාගෙන ගොස් හමුදාවට බන්දනවාට සහ ධාන්‍ය බද්දට විරුද්ධකම් පෑ යුත්තාහ, ඉඩම් බෙදා දිය යුත්තාහ, ණය ගෙවීම ප්‍රතික්ෂේප කළ යුත්තාහ, ගොරිල්ලා සංග්‍රාමය දියුණු කිරීම පිණිස සතුරා ඉතිරි කර තිබෙන කපොලු වලින් ප්‍රයෝජන ගත යුත්තාහ.

කල් නැර ම චියාං කායි–ශෙක් පෙරළා දමා ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුවක් පිහිටුවීම සඳහා, ඉඩම් ප්‍රතිසංස්කරණය අවසානය තෙක් කරගෙන යන ලෙස ත්, ප්‍රජාතන්ත්‍රවාදයේ අඩිතාලම් තහවුරු කරන ලෙස ත්, නිෂ්පාදනය දියුණු කරන ලෙස ත්, අරපිරිමැස්මෙන් වැඩ කරන ලෙස ත්, මහජන සන්නද්ධ සේනාවන් ශක්තිමත් කරන ලෙස ත්, ඉතිරි වී තිබෙන සතුරු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රක්ෂස්ථාන නැති කර දමන ලෙස ත්, පෙරමුණේ සටන් වලට අනුබල දෙන ලෙස ත් අපි නිදහස් ප්‍රදේශ වල ජනතාව ගෙන් ඉල්ලා සිටිමු.

අපේ හමුදාවේ සියලු ම සහෝදර අණදෙන්නන් සහ සටන්කරුවනි! අපි අපේ රටේ විප්ලවයේ ඉතිහාසයෙහි ඉතා ම වැදගත්, ඉතා ම උදාරතර කර්තව්‍යයට උර දී සිටිමු. අපි අපේ කර්තව්‍යය මුදුන්පත් කරන්ට මහත් පරිශ්‍රම දැරිය යුත්තෙමු. අප දරන පරිශ්‍රම අපේ ශ්‍රේෂ්ඨ මව්බිම අඳුරෙන් ආලෝකයට පිවිසෙන, අපේ ආදරණීය සහෝදර–රටවැසියන්ට මනුෂ්‍යයන් ලෙස ජීවත් වීමට ත් තමන් කැමති ආණ්ඩුව තෝරා ගැනීමට ත් හැකි වන, දිනය නිශ්චය කරනවා ඇත. අපේ හමුදාවේ සියලු ම මුලාදෑනින් සහ සටන්කරුවෝ තමන්ගේ යුද්ධ ශිල්පය දියුණු කරගත යුත්තාහ, යුද්ධයේදී නියත ජයග්‍රහණය කරා ධෛර්යසම්පන්න ලෙස ඉදිරියට ගමන් කළ යුත්තාහ, සියලු සතුරන් ස්ථිර ලෙස, අනූන ලෙස, මුළුමනින් සහ සම්පූර්ණයෙන් ම මුල්පිස දැමිය යුත්තාහ. ඔවුන් සියලු දෙනා ම තමන්ගේ දේශපාලන හැඟීමේ මට්ටම උසස් කරගත යුත්තාහ, සතුරු බලසේනා මුල්පිස දැමීමේ ත් බහුජනයා අවදි කිරීමේ ත් දස්කම් දෙක උගත යුත්තාහ, බහුජනයා සමග කුළුපග ලෙස එක්සත් විය යුත්තාහ, අළුත් නිදහස් ප්‍රදේශ ස්ථාවර ප්‍රදේශ බවට සීඝ්‍රයෙන් ගොඩනැඟිය යුත්තාහ. ඔව්හු — හමුදාව සහ ජනතාව එක්සත් ව, හමුදාව සහ ආණ්ඩුව එක්සත් ව, මුලාදෑනින් සහ සෙබළුන් එක්සත් ව, මුළු හමුදාව ම එක්සත් ව — විනය ගරුකභාවය පිළිබඳ තම හැඟීම තියුණු කරගෙන ස්ථිර ලෙස අණ පිළිපැද්ද යුත්තාහ, අපේ ප්‍රතිපත්තිය පිළිපැද්ද යුත්තාහ, ප්‍රධාන විනය නීති තුන සහ අවධානය පිණිස කරුණු අට පිළිපැද්ද යුත්තාහ; විනය කඩ කරන්ට අවසර නො දිය යුත්තාහ. අප ශ්‍රේෂ්ඨ මහජන විමුක්ති හමුදාව බව, අප ශ්‍රේෂ්ඨ චීන කොමියුනිස්ට් පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන හටකණ්ඩායම් බව, අපේ සියලු ම මුලාදැනි ත් සටන්කරුවෝ ත් සැම විට ම සිතේ තබා ගත යුත්තාහ. අප නිරතුරු ව ම පක්ෂයේ නිර්දේශ පිළිපදිතොත්, අප ජය ගන්නවා සිකුරු ය.

චියාං කායි–ශෙක් හංග කරව්!
නව චීනයට ජය වේවා!

ස ට හ න්

[1]1924දී, චීන කොමියුනිස්ට් පක්ෂයේ ආධාරය ඇතිව, සුන් යත්-සෙන් කුඕමින්තාං පක්ෂය ප්‍රතිසංවිධානය කොට, කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් අතර සහයෝගය ඇති කළේ ය. 1924-27තේ විප්ලවවාදි යුද්ධය දියත් කරනලද්දේ මේ සහයෝගයේ පදනම උඩ ය. කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් අතර පැවති මේ පළමුවැනි සහයෝගය 1927දී චියාං කායි-ශෙක් සහ වෝං චිං-වෙයි විසින් කරනලද ද්‍රෝහිකම් වල ප්‍රතිඵලයක් වශයෙන් බිඳී ගියේ ය.

[2]ත්‍රිවිධ ජනතා මූලධර්ම චීනයේ ධනේශ්වර-ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවයේදී ජාතිකවාදය, ප්‍රජාතන්ත්‍රවාදය සහ ජනතාවගේ දිවිපෙවෙත පිළිබඳ ප්‍රශ්න ගැන සුන් යත්-සෙන් විසින් ඉදිරිපත් කරනලද මූලධර්ම සහ වැඩසටහන විය. 1924දී පැවැත්වූ තම පළමුවැනි ජාතික සම්මේලනයේදී කුඕමින්තාං පක්ෂය විසින් සම්මත කළ ප්‍රකාශනයෙහි, සුන් යත්-සෙන් මේ ත්‍රිවිධ ජනතා මූලධර්ම අළුතෙන් තේරුම් කොට ප්‍රකාශ කළේ ය. ජාතිකවාදය අධිරාජ්‍යවාදයට විරුද්ධ වීම වශයෙන් තේරුම් කරනු ලැබී ය, කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ව්‍යාපාර වලට උනන්දුවෙන් අනුබල දෙන බව ප්‍රකාශ කරනු ලැබී ය. මෙසේ පරණ ත්‍රිවිධ ජනතා මූලධර්ම ත්‍රිවිධ ශ්‍රේෂ්ඨ ප්‍රතිපත්ති වලින් උපලක්ෂිත වූ අළුත් ත්‍රිවිධ ජනතා මූලධර්ම බවට විපර්යාස කරනු ලැබී ය; ඒ ප්‍රතිපත්ති තුන රුසියාව සමග හවුල් වීම, කොමියුනිස්ට් පක්ෂය සමග සහයෝගය සහ ගොවියන්ට ත් කම්කරුවන්ට ත් ආධාර දීම විය. අළුත් ත්‍රිවිධ ජනතා මූලධර්ම පළමුවැනි විප්ලවවාදි සිවිල් යුද්ධ වකවානුවේදී චීන කොමියුනිස්ට් පක්ෂය ත් කුඕමින්තාං පක්ෂය ත් අතර සහයෝගයට දේශපාලන පදනම සකස් කළේ ය.

[3]සියාන් සිද්ධිය ගැන දැනගැනීම පිණිස මේ පොතේ 308වැනි පිටුවේ, "දිග්ගැස්සුණු යුද්ධය ගැන" යන ලිපියට යොදා තිබෙන 7වැනි සටහන බලන්න.

[4]"ප්‍රතිඥා හතර" 1946දී දේශපාලන සාකච්ඡාසභාව විවෘත කළ සැසියේදී චියාං කායි-ශෙක් විසින් දෙනු ලැබී ය. ඒවා, ජනතාවගේ නිදහස සහතික කිරීම, දේශපාලන පක්ෂ වල නීත්‍යානුකූල තත්වය සහතික කිරීම, මහ මැතිවරණයක් පැවැත්වීම සහ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම විය.

[5]නානාවිධ භටයන් යන්නෙන් අදහස් කළේ කුඕමින්තාං පක්ෂයේ අනිත්‍ය භට-කණ්ඩායම් ය; ඊට ප්‍රාදේශික සාම සංරක්ෂණ බළකාය, මංමාවත් පොලිස් බළකාය, පොලිස්-භටපිරිස, කුඕමින්තාං පක්ෂය විසින් බාරගෙන ප්‍රතිසංවිධානය කරනලද (ජපනුන්ගේ) රූකඩ භටකණ්ඩායම් ආදිය ඇතුළත් විය.

[6]ජපන් අතික්‍රමණිකයෝ චීනයේ නිදහස් ප්‍රදේශ වලට විරුද්ධ ව සියල්ල ම ගිනි තබනු, සියල්ලන් ම මරනු, සියල්ල ම කොල්ල කනු යන කෲර ක්‍රියා තුන පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදූහ.

[7]1947, ජූලි 4වැනි ද, ප්‍රතිගාමි කුඕමින්තාං ආණ්ඩුව චියාං කායි-ශෙක්ගේ "සමස්ත ක්‍රියාකාරි යුද සේවය පිණිස කැඳවීමේ පණත" සම්මත කළේ ය; ඊට පසු වහා ම "කොමියු-නිස්ට් පල්හොරුන්ගේ කැරැල්ල මර්දනය කිරීම පිණිස සමස්ත ක්‍රියාකාරි යුද සේවය පිණිස කැඳවීමේ නියෝගය" නිකුත් කළේ ය. ඇත්ත වශයෙන්, චියාං කායි-ශෙක් ඊට හුඟක් කලින් ම ඔහුගේ ප්‍රති-විප්ලවවාදී සිවිල් යුද්ධය සඳහා සමස්ත ක්‍රියාකාරි යුද සේවය පිණිස කැඳවීමක් කර තිබුණේ ය. ඒ කාලය වන විට චීන මහජන විමුක්ති හමුදාව රට පුරා ම පතළ පහරදීමකට මාරු වෙන්ට පටන් ගෙන තිබුණි. තමාගේ ආණ්ඩුව "බරපතල අර්බුදයකට" වැටී සිටී බව චියාං කායි-ශෙක් ම පිළිගත්තේ ය. "සමස්ත ක්‍රියාකාරි යුද සේවය පිණිස කැඳවීමේ නියෝගය" හුදෙක් ඔහු පණ අදිමින් ගැසූ පා පහර විය.

[8]මෙයින් සඳහන් වන්නේ 1946, නොවැම්බර් 4වැනි ද නැන්කිං නුවරදී චියාං කායි-ශෙක් ආණ්ඩුව ත් එක්සත් ජනපද ආණ්ඩුව ත් අතර නිමවනලද "චීන-එක්සත් ජනපද වාණිජ්‍ය ගිවිසුම" හෙවත් "චීන-එක්සත් ජනපද මිත්‍රත්වය, වාණිජ්‍යය සහ නෞකාගමනය පිළිබඳ ගිවිසුම" ය. චීනයේ ස්වාධිපත්‍යයෙන් විශාල කොටසක් එක්සත් ජනපදයට විකුණා දැමූ මේ ගිවිසුම වගන්ති තිහකින් යුක්ත ය; ඒවායේ අඩංගු ප්‍රධාන කරුණු මෙසේ ය:

(1) එක්සත් ජනපද ජාතිකයෝ චීනයේ "....භූමිප්‍රදේශ වලට අයත් මුළු හරියේ" පදිංචි වීමට, ගමන් කිරීමට, වාණිජ්‍ය, භාණ්ඩ තනන, සකස් කරන, විද්‍යාත්මක, අධ්‍යා-පනික, ආගමික සහ පරාර්ථසේවා වැඩකටයුතු කරගෙන යාමට, ඛණිජ නිධාන සෙවීමට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ ප්‍රයෝජන ගැනීමට, ඉඩම් බදු ගැනීමට සහ අයිති ව සිටීමට ද, විවිධ රැකියාවන්හි සහ ව්‍යාපාර වල යෙදීමට ද අයිතිය බුක්ති විඳින්නාහ. ආර්ථික අයිතිවාසිකම් සම්බන්ධයෙන්, චීනයෙහි සිටින එක්සත් ජනපද ජාතිකයන්ට ද චීන ජාතිකයන්ට කරන සංග්‍රහය ම කළ යුතු ය.

(2) චීනයේදී බදු අය කිරීම, විකිණීම, බෙදා හැරීම සහ පාවිච්චි කිරීම සම්බන්ධයෙන්, එක්සත් ජනපද භාණ්ඩ වලට කවර තුන්වැනි රටක භාණ්ඩ වලට හෝ චීන භාණ්ඩ වලට හෝ කරන සංග්‍රහයට වඩා අඩු නො වන හිතකර සංග්‍රහයක් කළ යුතු ය. එක්සත් ජනපදයෙහි වවනලද, නිපදවනලද හෝ තනනලද කවර භාණ්ඩයක් හෝ එක්සත් ජනපදයෙන් ආනයනය කිරීම කෙරෙහි වත්, කවර චීන භාණ්ඩයක් හෝ එක්සත් ජනපදයට අපනයනය කිරීම කෙරෙහි වත් චීනය විසින් "කිසි ම තහනමක් හෝ සීමා කිරීමක් පැණවිය නො හැකි ය."

(3) චීනයෙහි විදේශීය වාණිජ්‍යයට හෝ නෞකාගමනයට විවෘත ව තිබෙන වරාය, ස්ථාන හෝ ජලාශ අතුරෙන් කවරක හෝ යාත්‍රා කිරීමේ නිදහස එක්සත් ජනපද යාත්‍රාවන්ට ඇත්තේ ය; "ඉතා ම පහසු මාර්ග ඔස්සේ" චීන භූමිප්‍රදේශය තුළින් සංක්‍රමණය වීමේ නිදහස ඒ යාත්‍රා වල කාර්යභාරපුද්ගලයන්ට සහ බඩු වලට ඇත්තේ ය. "කවර හෝ . . . කරදරයක්" යන ව්‍යාජය පිට, "විදේශීය වාණිජ්‍යයට හෝ නෞකාගමනයට විවෘත නැති" චීනයේ "කවර වරායකට, ස්ථානයකට හෝ ජලාශයකට" යාත්‍රා කරන්ට, යුදනැව් ඇතුළු ව, එක්සත් ජනපද යාත්‍රාවන්ට හැකි ය.

මේ ගිවිසුමෙන් අදහස් කළේ "චීනයේ මුළු භූමිප්‍රදේශය ම එක්සත් ජනපද වෙළඳුන්ට විවෘත කිරීම ය"යි එකල එක්සත් ජනපදයෙහි සිටි වියාං කායි-ශෙක්ගේ තානාපති වූ වෙලිංටන් කු ලජ්ජා නැතිව එළිපිට ම කීවේ ය.

[9]මේ පොතේ 331 පිටුවේ "යුද්ධය සහ උපායමාර්ගය පිළිබඳ ගැටළු" යන ලිපියට යොද තිබෙන 14වැනි සටහන බලන්න.

[10]මෙයින් සඳහන් වන්නේ වියාං කායි-ශෙක්, ටී. වී. සුං, එච්. එච්. කුං සහ චෙන් සහෝදරයෝ (චෙන් ලි-ෆූ සහ චෙන් කුඕ-ෆූ) යන මහ ඒකාධිකාරී ධනහිමියන් කණ්ඩායම් හතර ය. සසඳා බලන්න, "වර්තමාන තත්වය සහ අප සතු කර්තව්‍යයෝ" යන ලිපියේ VIවැනි කොටස, මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං, 1961, IVවැනි කාණ්ඩය, 167-69වැනි පිටු.

ප්‍රධාන විනය නීති තුන සහ අවධානය පිණිස කරුණු අට නැවත නිකුත් කිරීම ගැන —චීන මහජන විමුක්ති හමුදාවේ ප්‍රධාන මූලස්ථානයේ උපදේශය

1947, ඔක්තෝබර් 10

1. අපේ හමුදාවේ ප්‍රධාන විනය නීති තුන සහ අවධානය පිණිස කරුණු අට[1] අවුරුදු බොහෝ ගණනක සිට භාවිතාවේ යොදගෙන ඇවිත් තිබෙන නමුත්, ඒවායේ අඩංගු දේ එක් එක් ප්‍රදේශ වල හමුද ඒකකයන්හි මඳ වශයෙන් වෙනස් ය. ඒවා දැන් ඒකාබද්ධ කර ඇත, මේ මඟින් නැවත නිකුත් කරනු ලැබේ. මේ පිටපත හමුදාවෙහි අනූන අධ්‍යාපනය පිණිස ත් දැඩි ලෙස ක්‍රියාවේ යෙදීම පිණිස ත් පිළිගත් පිටපත වශයෙන් ගන්නවා ඇතැ'යි අපේක්ෂා කරනු ලැබේ. අවධානය යොමු වීම උවමනා කරන වෙන කරුණු සම්බන්ධයෙන්, ඒ ඒ ප්‍රදේශ වල සන්නද්ධ බලසේනාවන්ගේ උසස් අණදෙන–මණ්ඩලය විශේෂිත තත්වයන්ට අනුරූප වන ලෙස අතිරේක කරුණු නියම කොට, ඒවා ක්‍රියාවේ යොදන්ට අණ කළ හැකි ය.

2. ප්‍රධාන විනය නීති තුන මෙසේ ය:

(1) ඔබගේ සියලු ම ක්‍රියාවන්හිදී අණට කීකරු වන්න.

(2) බහුජනයා ගෙන් එක ම එක ඉදිකට්ටක් වත් නූල් කැල්ලක් වත් නො ගන්න.

(3) අල්ලාගත් හැම දෙයක් ම ගෙනත් බාර දෙන්න.

3. අවධානය පිණිස කරුණු අට මෙසේ ය:

(1) විනීත ලෙස කතා කරන්න.
(2) ඔබ මිලයට ගන්නා දේට සාධාරණ ලෙස ගෙවන්න.
(3) ඔබ ණයට ඉල්ලාගන්නා හැම දේ ම ආපසු දෙන්න.
(4) ඔබ හානි කරන කවරක් සඳහා වුව ද මිල ගෙවන්න.
(5) මිනිසුන්ට ගැහීම වත් බැණීම වත් නො කරන්න.
(6) වගාවන්ට හානි නො කරන්න.
(7) ස්ත්‍රීන් සමග අයුතු හාදකම් ඇති නො කර ගන්න.
(8) සිරබාරයට ගත් අයට හිරිහැර නො කරන්න.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ස ට හ න්

[1]ප්‍රධාන විනය නීති තුන සහ අවධානය පිණිස කරුණු අට දෙවැනි විප්ලවවාදි සිවිල් යුද්ධ කාලයේදී චීන කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ රතු හමුදව සඳහා සහෝදර මාඕ සේතුං විසින් පණවනලද විනය නීති ය. ඒවා රතු හමුදවේ දේශපාලන වැඩ අතර වැදගත් කොටසක් සකස් කළේ ය, මහජන සන්නද්ධ සේනාවන් ගොඩනැඟීමේදී ත්, හමුදව තුළ සබඳකම් ගැන නිවැරදි ලෙස ක්‍රියා කිරීමේදී ත්, බහුජන සමූහයන් සමග සමගිය හැඩතලා ගැනීමේදී ත්, සිරබාරයට ගත් අය කෙරෙහි මහජන හමුදවේ නිවැරදි ප්‍රතිපත්තිය පැණවීමේදී ත් මහත් කොටසක් රඟපෑවේ ය. රතු හමුදවේ මුල් ම දවස් වල සිට ම, සෙබළුන් බහුජනයාට විනීත ලෙස කතා කිරීම ත්, මිලයට ගන්නා සියල්ල ම සඳහා සාධාරණ ලෙස ගෙවීම ත්, කිසි ම විටෙක මිනිසුන් ලවා බලෙන් වැඩ ගැනීම හෝ මිනිසුන්ට ගැහීම හා බැණීම නො කිරීම ත් සහෝදර මාඕ සේතුංට උවමනා කළේ ය. 1928වේ වසන්තයේදී, කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ රතු හමුදව චිංකාං කඳු වල සිටි කාලයේ, සහෝදර මාඕ සේතුං විනය නීති තුනක් පැණවී ය: (1) ඔබ කරන ක්‍රියාවන්හිදී අණට කීකරු වන්න; (2) කම්කරුවන් ගෙන් සහ ගොවියන් ගෙන් කිසිවක් නො ගන්න; (3) ප්‍රාදේශික කෘෂර පාලකයන් ගෙන් අල්ලාගන්නා සියලු ම දේ ගෙනත් භාර දෙන්න. 1928වේ ග්‍රීෂ්ම සෘතුවේදී ඔහු අවධානය පිණිස කරුණු හයක් ඉදිරිපත් කළේ ය: (1) ඇඳ-ලෑලි පිණිස ඔබ ගලවා ගත් දොරවල් ආපසු දමන්න; (2) ඇඳ-ඇතිරිලි පිණිස ඔබ පාවිච්චි කළ පිදුරු ආපසු දමන්න; (3) විනීත ලෙස කතා කරන්න; (4) ඔබ මිලයට ගන්නා දේට සාධාරණ ලෙස ගෙවන්න; (5) ඔබ ණයට ඉල්ලාගන්නා හැම දේ ම ආපසු දෙන්න; (6) ඔබ හානි කරන කවරක් සඳහා වුව ද මිල ගෙවන්න. 1929ට පසු සහෝදර මාඕ සේතුං මතු දක්වන වෙනස්කම් කළේ ය: 2වැනි නීතිය "බහුජනයා ගෙන් එක ම එක ඉදිකට්ටක් වත් නූල් කැල්ලක් වත් නො ගන්න" බවට පත් විය; 3වැනි නීතිය පළමුකොට "එකතු කරන මුදල් සියල්ල ම ගෙනත් භාර දෙන්න" යි ද, ඊට පසු "අල්ලාගත් හැම දෙයක් ම ගෙනත් භාර දෙන්න"යි ද වෙනස් කරනු ලැබී ය. අවධානය පිණිස කරුණු හයට ඔහු තව දෙකක් එකතු කළේ ය: "ස්ත්‍රීන්ට පෙනෙන තැනක නෑම නො කරන්න" සහ "සිරබාරයට ගත් අයගේ සාක්කු සෝදිසි නො කරන්න" යනු යි. ප්‍රධාන විනය නීති තුනේ සහ අවධානය පිණිස කරුණු අටේ මුල මෙසේ විය.

වර්තමාන තත්වය සහ අප සතු කර්තව්‍යයෝ

උපුටාගත් කොටස්

1947, දෙසැම්බර් 25

I

චීන ජනතාවගේ විප්ලවවාදි යුද්ධය දැන් හැරෙන තැනකට එළඹී ඇත. ඒ කියන්නේ, චීන මහජන විමුක්ති හමුදව, ඇමරිකා එක්සත් ජනපදයේ පස්සෙන් දුවන බල්ලා වන චියාං කායි-ශෙක්ගේ ප්‍රතිගාමී හටයන් දස ලක්ෂ කීපයක් විසින් කළ පහරදීම ගසා පසුබස්වා, පහරදීමට බැස සිටින බව ය. වර්තමාන යුද්ධයේ මුල් අවුරුද්ද තුළ ම, එනම් 1946 ජූලි සිට 1947 ජූනි තෙක්, මහජන විමුක්ති හමුදව පෙරමුණු කීපයක ම චියාං කායි-ශෙක්ගේ පහරදීම ගසා පසුබස්වා, ඔහුට ආරක්ෂා වීමේ තත්වය ගන්නට බල කළේ ය. යුද්ධයේ දෙවැනි අවුරුද්දේ මුල් කාර්තුවේ සිට, එනම් 1947 ජූලි-සැප්තැම්බර් සිට, පටන් ගනිමින්, මහජන විමුක්ති හමුදව ජාතික පරිමාණයකින් පහරදීම කරන්නට වී නිදහස් ප්‍රදේශයන් සම්පූර්ණයෙන් ම විනාශ කරන පිණිස යුද්ධය ඒ ප්‍රදේශයන් තුළට දිගට ම ගෙන යාමේ චියාං කායි-ශෙක්ගේ ප්‍රති-විප්ලවවාදි සැලැස්ම කඩා බිඳ දැම්මේ ය. දැන් යුද්ධය ප්‍රධාන වශයෙන් කරන්නේ නිදහස් ප්‍රදේශ වල නො ව කුඕමින්තාං ප්‍රදේශ වල ය; මහජන විමුක්ති හමුදවේ ප්‍රධාන බලසේනාවන්

මේ වාර්තාව 1947 දෙසැම්බර් 25වැනි දින සිට 28වැනි දින තෙක් උතුරු ශෙන්සි පළාතේ මියිචි කෝරළයේ යාංචියාකෞ නම් ස්ථානයේදී පවත්වනලද චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ රැස්වීමකට සහෝදර මාඕ සේතුං විසින් ඉදිරිපත් කරනලද්දකි. රැස්වීමට පැමිණීමට බලය ඇති මධ්‍යම කාරකසභාවේ සාමාජිකයන්ට සහ වෛකල්පික සාමාජිකයන්ට අමතර ව, ශෙන්සි-කාන්සු-නිංසියා දේශසීමා ප්‍රාන්තයේ ත් ශාන්සි-සුයියුආන් දේශසීමා ප්‍රාන්තයේ ත් වගකිවයුතු සහෝදරවරු ද පැමිණ සිටියහ. මේ රැස්වීම මේ වාර්තාව ත් සහෝදර මාඕ සේතුං විසින් ලියනලද "වර්තමාන ජාත්‍යන්තර තත්වය තක්සේරු කිරීමේ කරුණු වගයක්" (බලන්න **මාඕ සේතුංගේ තෝරාගත් කෘති**, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං, 1961, IVවැනි කාණ්ඩය, 87-88වැනි පිටු) නැමති තවත් ලිපියකුත් සාකච්ඡා කොට පිළිගත්තේ ය. සහෝදර මාඕ සේතුංගේ වාර්තාව සම්බන්ධයෙන්, රැස්වීමේදී සම්මත වූ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කුඕමින්තාං ප්‍රදේශ තුළට ම සටන ගෙන ගොස් ඇත.[1] මේ චීන දේශයෙහි, මහජන විමුක්ති හමුදව — එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ත් එහි ගැත්තා වන චියාං කායි-ශෙක් පල්හොර මුලේ ත් — ප්‍රති-විප්ලවයේ රෝදය ආපසු කරකවා, එය විනාශයේ මග දිගේ පල්ලමට යවා ඇත, විප්ලවයේ රෝදය ජයග්‍රහණය කරා යන මග දිගේ ඉස්සරහට තල්ලු කර ඇත. මෙය ඉති-හාසයෙහි හැරෙන තැනකි. එය චියාං කායි-ශෙක්ගේ විසි-අවුරුද්දක ප්‍රති-විප්ලවවාදි පාලනයට වර්ධනයෙන් අභාවයට හැරෙන තැන වේ. එය දැනට අවුරුදු සියයකට වඩා පරණ, චීනයෙහි අධිරාජ්‍යවාදි පාලනයට වර්ධනයෙන් අභාවයට හැරෙන තැන වේ. මෙය භාරදූර සිද්ධියකි. එය භාරදූර වන්නේ එය 47 කෝටි 50 ලක්ෂයක ජනගහණයක් සහිත රටක සිදු වන නිසා ය; සිදු වූ කල, එය සත්තකින් ම රට මුළුල්ලෙහි ජයග්‍රහණ-යෙන් කුළුගැන්වෙන නිසා ය. එමතු නො ව, එය භාරදූර වන්නේ එය — මිනිස්වර්ගයා ගෙන් අඩක් වන — මිනිසුන් කෝටි 100ක් අධිරාජ්‍යවාදි පීඩනයට යට වී දුක් විඳින පෙරදිග සිදු වන නිසා ය. චීන ජනතාවගේ විමුක්ති යුද්ධය ආරක්ෂාවීමේ තත්වයේ සිට පහරදීමේ තත්වයට හැරීම මේ පීඩිත ජාතීන් ප්‍රීතියට ත් උද්‍යොගයට ත් පත් නො කොට නො හැකි ය. එය යුරෝපයෙහි ත් ඇමරිකාවෙහි ත් බොහෝ රටවල් වල දූන් අරගල කරමින් සිටින පීඩිත ජනයාට ද ආධාරයක් වේ.

II

චියාං කායි-ශෙක් ඔහුගේ ප්‍රති-විප්ලවවාදි යුද්ධය පටන් ගත් ද සිට ම, අප ඔහු පරාජය කළ යුතු බව ත් අපට ඔහු පරාජය කළ හැකි බව ත් අපි කීවෙමු. අප ඔහු පරාජය කළ යුත්තේ ඔහු පටන් ගත් යුද්ධය චීන ජාතියේ

තීරණය මෙසේ පැවසී ය: ''මේ වාර්තාව ප්‍රතිගාමී චියාං කායි-ශෙක් පාලක කල්ලිය පෙරළා දැමීමේ ත් නව-ප්‍රජාතන්ත්‍රවාදි චීනය පිහිටුවීමේ ත් මුළු වකවනුව සඳහා දේශපාලන, යුද්ධමය සහ ආර්ථික ක්ෂේත්‍රයන්හි වැඩසටහන වන ලියවිල්ලකි, මුළු පක්ෂය ත් මුළු හමුදව ත් මේ ලියවිල්ල සහ, ඊට සම්බන්ධ කොට, 1947, ඔක්තෝබර 10 වැනි දින ප්‍රසිද්ධ කළ ලියවිලි [එනම්, 'චීන මහජන විමුක්ති හමුදවේ ප්‍රකාශනය', 'චීන මහජන විමුක්ති හමුදවේ සටන්පාඨ', 'ප්‍රධාන විනය නීති තුන සහ අවධානය පිණිස කරුණු අට නැවත නිකුත් කිරීම ගැන උපදේශය', 'චීනයේ සංක්ෂේප ඉඩම් නීතිය' සහ 'චීනයේ සංක්ෂේප ඉඩම් නීතිය ප්‍රකා-ශයට පත් කිරීම ගැන චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ යෝජනාව'] වටා අධික අධ්‍යාපනයක් දීගෙන යා යුත්තාහ, ඒ ලියවිලි දැඩි ලෙස භාවිතාවේ යෙදිය යුත්තාහ. විවිධ ස්ථාන වල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරගෙන යාමේදී වාර්තාවෙහි පණවා ඇති මූලධර්ම වලින් කිසියම් පිටපැනීමක් වේ නම් එය වහා ම හරිගැස්සිය යුතු ය.'' එම රැස්වීමේදී ගත් සෙසු වැදගත් තීරණ මේවා ය:

(1) චීන මහජන විප්ලවවාදි යුද්ධය පූර්ණ ජයග්‍රහණය කරා නො කඩවා ගෙන යාමට හැම පරිශ්‍රමයක් ම දැරිය යුතු බව සහ, විවේක ගැනීමට සහ ජනතාවට අළුත්

ස්වාධීනත්වයට ත් චීන ජනතාවගේ විමුක්තියට ත් විරුද්ධ ව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ විධානය පිට පටන් ගත් ප්‍රති-විප්ලවවාදි යුද්ධයක් නිසා ය. දෙවැනි ලෝක යුද්ධය නිම වූ පසු සහ ජපන් අධිරාජ්‍යවාදය පෙරළාදැමූ පසු, චීන ජනතාව සතු කර්තව්‍යය වූයේ නව-ප්‍රජාතන්ත්‍රවාදි විපර්යාසය දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වශයෙන් සම්පූර්ණ කිරීම ත්, ජාතික එක්සත්බව සහ ස්වාධීනත්වය අත්පත් කර ගැනීම ත්, චීනය කෘෂිකාර්මික රටකින් කර්මාන්තමය රටක් බවට වෙනස් කිරීම ත් ය. එහෙත් ඒ අවස්ථාවේ, පැසිස්ට්-විරෝධී දෙවැනි ලෝක යුද්ධය ජයග්‍රාහී ලෙස නිම වූ පසු, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ත් විවිධ රටවල් වල සිටි එහි ගැත්තෝ ත් ජර්මන් සහ ජපන් අධිරාජ්‍යවාදයේ සහ එහි ගැත්තන්ගේ තැන් වලට රිංගාගෙන, සෝවියට් සංගමයට විරුද්ධ ව, යුරෝපයෙහි මහජන ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍ය වලට විරුද්ධ ව, ධනවාදි රටවල් වල කම්කරු ව්‍යාපාර වලට විරුද්ධ ව, විජිතයන්හි හා අර්ධ-විජිතයන්හි ජාතික ව්‍යාපාර වලට විරුද්ධ ව සහ චීන ජනතාවගේ විමුක්තියට විරුද්ධ ව ප්‍රතිගාමී කඳවුරක් සකස් කළහ. ඒ අවස-ථාවේ චියාං කායි-ශෙක් ප්‍රමුඛ චීන ප්‍රතිගාමීයෝ — වොං චිං-වෙයි ජපන් අධිරාජ්‍යවාදය වෙනුවෙන් කළාක් මෙන් — එක්සත් ජනපද අධිරාජ්‍යවාදය වෙනුවෙන් පස්සෙන් දුවන බල්ලා මෙන් ක්‍රියා කළහ, චීනය එක්සත් ජන-පදයට විකුණා දැමූහ, චීන ජනතාවගේ විමුක්තිය ඉදිරියට යාම මැඩලනු පිණිස ඔවුන්ට විරුද්ධ ව යුද්ධයක් මුදා හළහ. ඒ අවස්ථාවේ, අප දුර්වල බවක් පෙන්නුවා නම් හෝ ඉඩ දුන්නා නම් ද, ප්‍රති-විප්ලවවාදි යුද්ධයට විප්ලවවාදි යුද්ධයෙන් විරුද්ධ වීම පිණිස ස්ථිර සිතින් නැඟී සිටීමට එඩිතර වුණේ නැත් නම් ද, චීනය අඳුරු ලොවක් වන්නට ඉඩ තිබුණේ ය, අපේ ජාතියේ අනාගතය කැප වන්නට ඉඩ තිබුණේ ය. චීන කොමියුනිස්ට් පක්ෂය චියාං කායි-ශෙක්ගේ පහරදීමට විරුද්ධ ව දේශප්‍රේමී, යුක්ති සහගත, විප්ලව-වාදි යුද්ධයක් ස්ථිර ලෙස කිරීමට චීන මහජන විමුක්ති හමුදවට නායකත්වය

ප්‍රහාරයක් දීම සඳහා ප්‍රතිසංවිධානය වීමට කාලය ගැනීම පිණිස ඇනහිටවීමේ උපක්‍රම (සාම සාකච්ඡා) පාවිච්චි කිරීමට සතුරාට ඉඩ නො දිය යුතු බව.

(2) අපේ හමුදව වඩා ත් විශාල ජයග්‍රහණයන් දිනා ගත් කල්හි පමණක් සලකා බැලිය යුතු විප්ලවවාදි මධ්‍යම ආණ්ඩුවක් සකස් කිරීම පිණිස කාලය තව ම මෝරා නැති බව සහ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීම ඊට ත් වඩා අනාගතයට අයත් ප්‍රශ්නයක් බව.

රැස්වීම පක්ෂය තුළ එවකට පැවති බරවීමේ ගති සහ ඉඩම් ප්‍රතිසංස්කරණයෙහි හා බහුජන ව්‍යාපාරයන්හි ඇතැම් විශේෂිත ප්‍රතිපත්ති ද සවිස්තර ලෙස සාකච්ඡා කළේ ය. මේ සාකච්ඡා වල ප්‍රතිඵල ඊට පසු සහෝදර මාඕ සේතුං විසින් ''පක්ෂයේ වර්තමාන ප්‍රතිපත්තියේ යම් යම් වැදගත් ප්‍රශ්න ගැන'' නැමති ලිපියෙහි ඉදිරිපත් කරනලදී. (බලන්න, **මාඕ සේතුංගේ තෝරාගත් කෘති**, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං, 1961, IVවැනි කාණ්ඩය, 181-89 වැනි පිටු.) මෙහි දී තිබෙන්නේ මේ වාර්තාවේ මුල් කොටස් තුන පමණකි.

LIBERATION BASE
https://liberationbase.wordpress.com

දුන්නේ ය. චීන කොමියුනිස්ට් පක්ෂය, මාක්ස්-ලෙනින්වාද විද්‍යාවේ පදනම මත ජාත්‍යන්තර සහ දේශීය තත්වය ගැන පැහැදිලි හිසින් තක්සේරුවක් කොට, සියරටේ ත් එතෙර ත් ප්‍රතිගාමීන් දෙන සියලු ප්‍රහාරයන් පරාජය කළ යුතු බව ද පරාජය කළ හැකි බව ද වටහා ගත්තේ ය. අඳුරු වලාකුල් අහසෙහි පහළ වූ විට, ඒවා තාවකාලික දෙයක් පමණක් බව ත්, අඳුර ඉක්මනින් පහවී ගොස් ඉර පායන බව ත් අපි පෙන්වා දුනිමු. චියාං කායි-ශෙක් පල්හොර මුල 1946 ජූලියේදී දේශ-ව්‍යාප්ත ප්‍රති-විප්ලවවාදී යුද්ධය දියත් කළ විට, ඔවුන් සිතුවේ මහජන විමුක්ති හමුදාව පරාජය කරන්නට ඔවුන්ට ගත වන්නේ තුන් මසක් හෝ හය මසක් පමණකි කියා ය. හතළිස් ලක්ෂයකට වැඩි ගණනක මුළු යුද්ධමය ශක්තියක් තනන, විසි ලක්ෂයක නිත්‍ය හමුදාවක් ද, නිත්‍ය නො වන භටයන් දස ලක්ෂයකට වැඩි ගණනක් ද, යුද්ධමය සංස්ථාවන්හි සහ පසුමුණෙහි සන්නද්ධ ඒකකයන්හි තවත් මිනිසුන් දස ලක්ෂයක් හෝ ඊට වඩා ද තමන්ට සිටින බව ත්, පහරදීම සඳහා සූදනම් වීම සම්පූර්ණ කිරීමට තමන් කාලය ගෙන තිබුණු බව ත්, මහ නගර වල පාලනය යළි ත් තමන් අතට ගෙන තබුණු බව ත්, 30 කෝටියකට වැඩි ජනගහණයක් තමන්ට සිටින බව ත්, ජපන් ආක්‍රමණික භටයන් දස ලක්ෂයක් සතු උපකරණ සියල්ල තමන්ට පවරාගෙන තිබුණු බව ත්, එක්සත් ජනපද ආණ්ඩුවෙන් සුවිශාල යුද්ධමය සහ ආර්ථික ආධාර තමන්ට ලැබී තිබුණු බව ත් ඔව්හු ගණනට ගත්හ. මහජන විමුක්ති හමුදාව ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයෙහි යෙදී අට වසක් සටන් කොට වෙහෙසට පත් වී සිටි බව සහ සංඛ්‍යාවන් හා උපකරණ අතින් කුඕමින්තාං හමුදාවට වඩා පහළ බව ත් නිදහස් ප්‍රදේශ වල සිටියේ දස කෝටියකට ටිකක් වැඩි ජනගහණයක් පමණක් බව ත්, මේ ප්‍රදේශ බොහෝවක ප්‍රතිගාමී රදළ බලවේග එතෙක් ම නැති කර දමා නො තිබුණු බව සහ ඉඩම් ප්‍රතිසංස්කරණය එතෙක් ම හැම තැන ම සහ අනූන ලෙස කරගෙන ගොස් නො තිබුණු බව, එනම්, මහජන විමුක්ති හමුදාවේ පසුමුණු ප්‍රදේශය එතෙක් ම තහවුරු කර නො තිබුණු බව ත් ඔව්හු එසේ ම ගණනට ගත්හ. මේ තක්සේරුවෙන් පටන් ගෙන ඉදිරියට යමින්, චියාං කායි-ශෙක් පල්හොර මුල සාමය සඳහා චීන ජනතාවගේ අභිලාෂය නො තකා හැරී ය, 1946 ජනවාරියේදී කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් අතර අත්සන් කරනලද තාවකාලිකව සටන් නතර කිරීමේ ගිවිසුම මෙන් ම සියලු පක්ෂ වල දේශපාලන සාකච්ඡා සභාව විසින් සම්මත කළ යෝජනා ද අන්තිමේදී ඉරා දමා, සාහසිකවාදී යුද්ධයක් දියත් කළේ ය. යුද්ධ සේනාවන් අතින් චියාං කායි-ශෙක්ට තිබුණු වැඩි-බලය හුදෙක් අනිස්ථිර ය'යි, තාවකාලික කොටසක් පමණක් රඟපෑ හැකි සාධකයක් ය'යි ද, එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන් දෙන ආධාර ද එසේ ම තාවකාලික කොටසක් පමණක් රඟපෑ හැකි සාධකයක් ය'යි ද, ඒ එසේ වන අතර චියාං කායි-ශෙක්ගේ යුද්ධයේ ජනතා-විරෝධී ලක්ෂණය හා ජනතාවගේ හැඟීම් නිත්‍ය කොටසක් රඟපාන සාධක වේ ය'යි ද, මේ අතින් මහජන විමුක්ති හමුදාව

වැඩි බලය ඇති තත්වයක සිටී ය'යි ද අපි ඒ අවස්ථාවෙහි කීවෙමු. ලක්ෂණයෙන් දේශප්‍රෙමී, යුක්තිසහගත සහ විප්ලවවාදී වූ හෙයින්, මහජන විමුක්ති හමුදාව කළ යුද්ධය මුළු රටේ ම ජනතාවගේ අනුබලය දිනා ගන්නවා නියත විය. චියාං කායි-ශෙක් ජය ගැනීම සඳහා තිබුණු දේශපාලන අත්තිවාරම එය විය. දහඅට මසක යුද්ධය පිළිබඳ අත්දැකීම අපේ නිගමනය සපුරා සනාථ කර ඇත.

III

සටන් කළ දහහත් මසක් තුළ (එනම් 1946 ජූලි සිට 1947 නොවැම්බර් තෙක්; දෙසැම්බරයේ ගණන් තවම ලැබී නැත), අපි චියාං කායි-ශෙක්ගේ නිත්‍ය සහ නිත්‍ය නො වන භටයන් 16,90,000ක් මැරුවෙමු, තුවාල කළෙමු, අල්ලාගතිමු; — 6,40,000ක් මරනලදහ, හෝ තුවාල කරනලදහ; 10,50,000ක් අල්ලාගන්නාලදහ. එසේ චියාං කායි-ශෙක්ගේ පහරදීම ගසා පසුබස්සන්නට, නිදහස් ප්‍රදේශ වල ප්‍රධාන භූමිප්‍රදේශ රැකගන්නට සහ පහරදීමට බහින්නට අපට හැකි විය. යුද්ධමය අංශයෙන් කතා කරන කල, අපට මෙය කළ හැකි වූයේ අප නිවැරදි උපායමාර්ගය යෙදූ නිසා ය. අපේ සටන් මූලධර්ම මේවා ය:

(1) පළමුකොට විසුරුණු, තනි වූ සතුරු සේනාවන්ට පහර දෙන්න, පසු ව එක්රැස් කර සිටින බලවත් සතුරු සේනාවන්ට පහර දෙන්න.

(2) පළමුකොට කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ නගර ත් පැතුරුණු ගම්බද ප්‍රදේශ ත් අල්ලාගන්න; පසුව ලොකු නගර අල්ලාගන්න.

(3) සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදිය හැකි ශක්තිය මුල්පිස දැමීම අපේ ප්‍රධාන පරමාර්ථය කරගන්න; නගරයක් හෝ ස්ථානයක් අල්ලාගෙන සිටීම හෝ අත්පත් කරගැනීම අපේ ප්‍රධාන පරමාර්ථය නො කරගන්න. නගරයක් හෝ ස්ථානයක් අල්ලාගෙන සිටීම හෝ අත්පත් කරගැනීම සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදිය හැකි ශක්තිය මුල්පිස දැමීමේ ප්‍රතිඵලය වේ; බොහෝ විට නගරයක් හෝ ස්ථානයක් සදහට ම අල්ලාගෙන සිටීමට හෝ අත්පත් කර ගැනීමට හැකි වන්නේ එය කීප වරක් අතින් අතට මාරු වූ පසු පමණකි.

(4) හැම සටනකදී ම, (සතුරාගේ ශක්තිය මෙන් දෙ ගුණයක්, තුන් ගුණයක්, සිව් ගුණයක් සහ ඇතැම් විට පස් හෝ හය ගුණයක් පවා ශක්තිමත්) ඒකාන්තයෙන් ම වඩා බලවත් බලසේනාවක් ඒකරාශි කරන්න, සතුරු බලසේනාවන් සම්පූර්ණයෙන් ම වට කරන්න, ඔවුන් නිරවශේෂයෙන් ම මුල්පිස දමන්නට මහන්සි ගන්න, කිසිවකුට දැලෙන්

https://liberationbase.wordpress.com

බේරී යාමට ඉඩ නො දෙන්න. විශේෂ වටාපිටා තත්වයන්හිදී සතුරාට පොඩිපට්ටම් වන පහරවල් දීමේ ක්‍රමය යොදන්න; ඒ කියන්නේ, වෙනත් සතුරු බලසේනාවන් සුණුවිසුණු කිරීම සඳහා ස්වකීය බළඇණි යුහුව වෙන තැන් වලට ගමන් කරවීමට අපේ හමුදවට හැකි වන සේ, සතුරාගේ එක් කොටසක් මුල්පිස දැමීමේ සහ තවත් කොටසක් පළවා හැරීමේ අරමුණ ඇතිව, සතුරාගේ ඉස්සරහට ම දෙන පහරක් සහ ඔහුගේ අංශ දෙකින් එකකට හෝ දෙකට ම හෝ දෙන පහරක් දීම පිණිස අපේ මුළු ශක්තිය ම එක්රැස් කොට යොදන්න. අපට ලාභයට වඩා අලාභ සිදුවන, නැතහොත් සම සම ව බිඳී යන වැහැරීමේ සටන් වලින් මග අරින්නට මහන්සි ගන්න. මේ අයුරින්, මුළු එකක් වශයෙන් (සංඛ්‍යාවන් අතින්) බලයෙන් අඩු වුව ද, අපි හැම කොටසකදී ත් හැම නියම සටන්ව්‍යාපාරයකදී ත් ඒකාන්තයෙන් ම වඩා බලවත් වන්නෙමු; මෙය සටන්ව්‍යාපාරයේදී ජයග්‍රහණය සහතික කරයි. කල් යන විට, අප මුළු එකක් වශයෙන් වඩා බලවත් වෙනවා ම ය, අන්තිමේදී සියලූ සතුරන් මුල්පිස දමනවා ම ය.

(5) සූදනම් නො වී කිසි ම සටනක් නො කරන්න, ජය ගත හැකි බව ඔබට නිසැක නැති කිසි ම සටනක් නො කරන්න; එක් එක් සටන පිණිස හොඳින් සූදනම් ව සිටීමට හැම පරිශ්‍රමයක් ම දරන්න, සතුරා ත්, අප ත් අතර නිශ්චය වශයෙන් පවතින තත්වයන් රැසක් තුළ ජය ගන්නා බව සහතික කිරීමට හැම පරිශ්‍රමයක් ම දරන්න.

(6) අපේ සටන් කිරීමේ පන්නය — එනම් සටනේදී ධෛර්යය, පරිත්‍යාගයට බිය නො වීම, වෙහෙස ගැන බිය නො වීම සහ, දිගට ම සටන් කිරීම (එනම්, කෙටි කාලසීමාවක් ඇතුළත විවේකයක් නොමැතිව පිට පිට ම සටන් කරගෙන යාම) — සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදන්න.

(7) සතුරා ගමනෙහි යෙදී සිටින විට ඔහු මුල්පිස දැමීමට මහන්සි ගන්න; ඒ අතර ම, එක් තැනක රැඳී සිට පහර දීමේ උපක්‍රමයන් කෙරෙහි අවධානය යොමු කරන්න, සතුරාගේ රක්ෂිත ස්ථාන සහ නගර අල්ලාගන්න.

(8) නගර වලට පහර දීම සම්බන්ධයෙන්, දුර්වල ලෙස ආරක්ෂා කර ඇති සියලු සතුරු රක්ෂිත ස්ථාන සහ නගර ස්ථිර ලෙස ම අත්පත් කරගන්න; නිසි මොහොතෙහි, වටාපිටා තත්වයන් ගෙන් අවසර ලැබෙනවා නම්, තරමක ශක්තියක් ඇතිව ආරක්ෂා කර ඇති සියලු සතුරු රක්ෂිත ස්ථාන සහ නගර අත්පත් කර ගන්න. ප්‍රබල ලෙස ආරක්ෂා කර ඇති සතුරු රක්ෂිත ස්ථාන සහ නගර සම්බන්ධයෙන්, තත්වයන් මෝරන තුරු බලා සිට, ඉක්බිති ඒවා ත් අල්ලාගන්න.

(9) සතුරා ගෙන් අල්ලාගත් සියලු අවි වලින් ද පුද්ගලයන් වැඩි ම දෙනා ගෙන් ද අපේ ශක්තිය නැවත තර කරන්න. අපේ හමුදවේ මිනිස්-බලයේ ත් ද්‍රව්‍යොපකරණ වල ත් ප්‍රධාන උල්පත ඇත්තේ යුද පෙරමුණෙහි ය.

(10) විවේක ගැනීමට, පුහුණු වීමට හා අපේ බළඇණි තහවුරු කිරීමට සටන්ව්‍යාපාර අතර විවේක කාලයන් ගෙන් හොඳට ප්‍රයෝජන ගන්න. විවේක ගැනීමේ, පුහුණු වීමේ සහ තහවුරු කිරීමේ කාලසීමා සාමාන්‍යයෙන් ඉතා දිගු නො විය යුතු ය; හැකි තරම් දුරට සතුරාට හුස්ම ගැනීමට කාලයක් නො දිය යුතු ය.

චියාං කායි-ශෙක් පරාජය කිරීමේදී මහජන විමුක්ති හමුදව යෙදූ ප්‍රධාන ක්‍රම මේවා ය. ඒවා අවුරුදු බොහෝ ගණනක් දේශීය හා විදේශීය සතුරන්ට විරුද්ධ ව කළ සටන් වලදී මහජන විමුක්ති හමුදව ලැබූ පන්නරයේ ප්‍රතිඵලය වේ, අපේ වර්තමාන තත්වයට සම්පූර්ණයෙන් සුදුසු වේ. චියාං කායි-ශෙක් පල්හොර මුල ත් චීනයෙහි සිටින එක්සත් ජනපද අධිරාජ්‍යවාදි යුද්ධමය කාර්යභාරපුද්ගලයෝ ත් අපේ මේ යුද්ධමය ක්‍රම ගැන ඉතා හොඳින් දනිති. ඒවාට ප්‍රතිවිරුද්ධ වීමට මං සොයමින්, චියාං කායි-ශෙක් බොහෝ විට තම සෙනෙවියන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණුව සඳහා රැස් කොට, යුද්ධයේදී අල්ලාගත් අපේ යුද්ධමය පොතපත සහ ලියකියවිලි ඔවුන්ට අධ්‍යයනය කිරීම පිණිස බෙදා දුන්නේ ය. එක්සත් ජනපද යුද්ධ කාර්යභාරපුද්ගලයන් මහජන විමුක්ති හමුදව විනාශ කරනු පිණිස එක් වර්ගයක උපායමාර්ගයකට හා උපක්‍රම වලට පසු තවත් වර්ගයක උපායමාර්ගයක් සහ උපක්‍රම චියාං කායි-ශෙක්ට අනුමත කර ඇත; ඔවුන් චියාං කායි-ශෙක්ගේ භටසේනාවන් පුහුණු කොට, ඔවුන්ට යුද්ධොපකරණ සපයා ඇත. එහෙත් මේ එක ම පරිශ්‍රමයකට වත් චියාං කායි-ශෙක් පල්හොර මුල පරාජයෙන් බේරා ගන්නට බැරි ය. හේතුව නම් අපේ උපායමාර්ගය සහ උපක්‍රම මහජන යුද්ධයක් පදනම කර ගෙන තිබීම ය; ජනතාවට විරුද්ධ ව සිටින කිසි ම හමුදවකට අපේ උපායමාර්ගය ත් උපක්‍රම ත් පාවිච්චි කළ නො හැකි ය. මහජන යුද්ධයක ත්, හමුදව සහ ජනතාව අතර සමගිය පිළිබඳ, අණදෙන්නන් සහ සටන්කරුවන් අතර සමගිය පිළිබඳ සහ සතුරු භටසේනාවන් කඩ කඩ කොට විසුරුවා හැරීම පිළිබඳ මූලධර්ම වල ත් පදනම මත, මහජන විමුක්ති හමුදව, සතුරා ජය ගැනීමෙහි ලා වැදගත් සාධකයක් වන, ස්වකීය බලසම්පන්න විප්ලවවාදි දේශපාලන වැඩ වර්ධනය කර ඇත. බලයෙන් වැඩි සතුරු සේනාවන් ගෙන් වැදිය හැකි මාරක පහරවල් මග හරිනු පිණිස ත් සතුරා ගමනෙහි සිටින විට ඔහු වැනසීමට අපේ සේනාවන් හරවනු පිණිස ත් අප අපේ ම මූලපිරුමෙන් බොහෝ නගර අත හැර ගිය කල, අපේ සතුරෝ ප්‍රීතියෙන් ඉපිල ගියෝ ය. ඔව්හු මෙය ඔවුන්ගේ ජය ත් අපේ පරාජය ත් ලෙස ගත්හ. ඔව්හු මේ ක්ෂණික "ජය" නිසා මන්මත් වූහ. චියාං කායි-ශෙක්, ඔහු චාංචියාකෞ අල්ලාගත්

LIBERATION BASE

https://liberationbase.wordpress.com

දවසේ පස්වරුවෙහි, ඒ මොහොතේ සිට තම ප්‍රතිගාමී පාලනය තායි කන්ද මෙන් ස්ථාවර වී ය'යි සිතාගෙන, ඔහුගේ ප්‍රතිගාමී ජාතික මන්ත්‍රණසභාව කැඳවීමට අණ කළේ ය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදියෝ ද, දැන් ඉතින් චීනය එක්සත් ජනපද විජිතයක් බවට හැරවීමේ තම වියරු කූට වැඩපිළිවෙළ බාධා රහිත ව මුදුන්පත් කළ හැකි ය'යි සිතා ගෙන, ප්‍රීතියෙන් නැටූහ. එහෙත් කාලය ගෙවී යත් ම, චියාං කායි-ශෙක් සහ ඔහුගේ එක්සත් ජනපද ස්වාමිවරු ඔවුන්ගේ තාලය වෙනස් කරන්නට වන්නෝ ය. දැන්, අපේ දේශීය සහ විදේශීය සියලු සතුරෝ අශුභවාදයෙන් මිරිකී සිටිති. ඔව්හු මහත් සුසුම් හෙළති, අර්බුදයක් ගැන වැළපෙති, තවදුරට ත් ප්‍රීතියේ කිසි ම ලකුණක් නො පළ කරති. ඉකුත් දහඅට මස තුළ, චියාං කායි-ශෙක්ගේ ඉහළ-පෙළේ අණදෙන්නන් වැඩි ම දෙනා සටන් පැරදුණු හෙයින් ඉවත් කොට වෙන අය පත් කර සිටිති. ඔවුන් අතර ලියු චී (වෙංචව්), ශුඒ යුඒ (සූචව්), වූ චී-වෙයි (උතුරු චියාංසු), තාං එන්-පෝ (දකුණු ශාන්ටුං), වෝං චුං-ලියන් (උතුරු හෝනාන්), තූ යූ-මිං සහ ශියුං ශි-හුයි (ශෙන්යාං) සහ සූන් ලියන්-චුං (පීපිං) යන අය වෙති. චෙන් චෙං ද චියාං කායි-ශෙක්ගේ මහ සෙනෙවි මණ්ඩලයේ ප්‍රධානයා වශයෙන් සියලු සටන්ව්‍යාපාර වලට විධානය දීම බාරව සිටි ඔහුගේ පදවියෙන් අයින් කොට, ඊසානදිග තනි පෙරමුණක් විධානය කිරීමට පහත දමා සිටී.[2] කෙසේ වෙතත්, තත්වය වෙනස් වූයේ ත්, ඔහුගේ හමුදාවන් පහර-දීමේ තත්වයේ සිට ආරක්ෂාවීමේ තත්වයට මාරු වූ අතර මහජන විමුක්ති හමුදාව ආරක්ෂාවීමේ තත්වයේ සිට පහරදීමේ තත්වයට ගියේ ත් චියාං කායි-ශෙක් ම චෙන් චෙංගේ තැන ගෙන සියලු විධානයන් දීම තමාට පවරා ගෙන සිටි වකවානුවේදී ම ය. මේ වන විට, ප්‍රතිගාමී චියාං කායි-ශෙක් කල්ලියට ත් ඒ කල්ලියේ එක්සත් ජනපද ස්වාමිවරුන්ට ත් ඔවුන්ගේ වරද වැටහී තිබිය යුතු ය. චීන කොමියුනිස්ට් පක්ෂය චීන ජනතාවගේ අභිලාෂයන් නියෝජනය කරමින්, ජපානය යටත් වූ පසු බොහෝ කලක් යන තුරු සාමය සඳහා ත් සිවිල් යුද්ධයට විරුද්ධ ව ත් දැරූ සියලු ප්‍රයත්න ඔවුන් විසින් සලකනලද්දේ බියගුලුකමේ ත් දුබලබවේ ත් ලකුණු ලෙස ය. ඔව්හු තමන්ගේ ශක්තිය පමණට වඩා ලොකු කොට කල්පනා කළහ, විප්ලවයේ ශක්තිය පමණට වඩා සුළු කොට කල්පනා කළහ, ඉවබව නැතිව යුද්ධය මුදා හළහ, එසේ තමන් ම අටවාගත් උගුලට අසු වූහ. අපේ සතුරාගේ උපායමාර්ගික ගණන්බැලීම් සම්පූර්ණයෙන් ම ව්‍යර්ථ විය.

ස ට හ න්

[1]මහජන විමුක්ති හමුදාව පිටපිට ම විවිධ පෙරමුණු වල පහරදීමට බැස, යුද්ධය කුඕමින්තාං ප්‍රදේශ තුළට ගෙනගිය ආකාරය පිළිබඳ වටාපිටා තත්වයන් දැනගැනීම පිණිස, මේ පොතේ 413වැනි පිටුවේ "වයඹදිග ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය ගැන සහ විමුක්ති හමුදාවෙහි

අළුත් වර්ගයේ මතවාදි අධ්‍යාපන ව්‍යාපාරය ගැන" යන ලිපියට යොදා තිබෙන 4වැනි සටහන බලන්න.

[2]හෝනාන් පළාතේ චෙංචව් නුවර කුඕමින්තාං ආණ්ඩුවේ අස්වැසීමේ මූලස්ථානයේ අධ්‍යක්ෂ වූ ලියු චි 1946 සැප්තැම්බරයෙහි නිරිතදිග ශාන්ටුං පළාතේ තිංතාඕ වල සටන පැරදුණු නිසා 1946 නොවැම්බරයේදී නිලයෙන් පහ කරනලදී. චියාංසු පළාතේ ශුචව් නුවර කුඕමින්තාං ආණ්ඩුවේ අස්වැසීමේ මූලස්ථානයේ අධ්‍යක්ෂ වූ ශුඒ යුඒ ඔහුගේ විධානය යටතේ සිටි කුඕමින්තාං භටයන් 1946 දෙසැම්බරයේදී චියාංසු පළාතේ සුචියන් නුවරට උතුරෙන් පිහිටි ප්‍රදේශයෙහි කළ සටන්ව්‍යාපාරයේදීත්, 1947 ජනවාරියෙහි දකුණු ශාන්ටුං පළාතෙහි සටන්ව්‍යාපාරයේදීත් 1947 පෙබරවාරියෙහි මධ්‍ය ශාන්ටුං පළාතෙහි ලායිවූ සටන්ව්‍යාපාරයේදීත් එක දිගට ම ලැබූ බර පරාජයන් පෙළක් නිසා 1947 මාර්තුවේදී නිලයෙන් පහකරනු ලැබී ය. ශුචව් නුවර කුඕමින්තාං ආණ්ඩුවේ අස්වැසීමේ මූලස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වූ වූ චී-වෙයි 1946 දෙසැම්බරයෙහි සුචියන් නුවරට උතුරෙන් පිහිටි ප්‍රදේශයෙහි සටන්ව්‍යාපාරයේදී ලැබූ පරාජය නිසා 1947 මාර්තුවේදී නිලයෙන් පහ කරනු ලැබී ය. කුඕමින්තාං ආණ්ඩුවේ 1වැනි හමුදාවේ අණදෙන්නා වූ තාං එන්-පෝ, 1947 මැයි මාසයෙහි දකුණු ශාන්ටුං පළාතේ මෙංලියාංකු වල සටනේදී කුඕමින්තාං ආණ්ඩුවේ ප්‍රතිසංවිධිත 74වැනි ඩිවිසනය මුල්පිස දමනු ලැබූ නිසා, 1947 ජූනි මාසයේදී නිලයෙන් පහ කරනු ලැබී ය. කුඕමින්තාං ආණ්ඩුවේ 4වැනි හමුදාවේ අණදෙන්නා වූ වෝං චුං-ලියන්, 1947 ජූලි මාසයෙහි නිරිතදිග ශාන්ටුං සටන්-ව්‍යාපාරයේදී ලැබූ පරාජය නිසා 1947 අගෝස්තුවේදී නිලයෙන් පහ කරනු ලැබී ය. ඊසානදිග චීනයේ කුඕමින්තාං ආණ්ඩුවේ සාම සංරක්ෂණ මූලස්ථානයේ අණදෙන්නා වූ තූ යූ-මිං ද ඊසානදිග චීනයේ කුඕමින්තාං මහාසේනාධිනායකයාගේ මූලස්ථානයේ අධ්‍යක්ෂ වූ ශියුං ශි-හුයි ද යන දෙදෙනා ම 1947 ජූනියෙහි මහජන විමුක්ති හමුදාවේ ඊසානදිග ග්‍රීෂ්මසෘතු ප්‍රහාරයේදී එම හමුදාව විසින් බරපතල ලෙස පරාජය කරනු ලැබූ නිසා, නිලයෙන් පහ කරනු ලැබූහ. කුඕමින්තාං ආණ්ඩුවේ 11වැනි යුද්ධ කලාපයේ අණදෙන්නා වූ සූන් ලියන්-චුං 1947 ජූනියෙහි චිං-ත්සාන් සටන්ව්‍යාපාරයේදී ත් පාඕතිං නුවරට උතුරෙන් පිහිටි ශුශුයි ප්‍රදේශයෙහි සටන්ව්‍යාපාරයේදී ත් ලැබූ පරාජයන් නිසා, පාඕතිං නුවර අස්වැසීමේ මූලස්ථානයේ අධ්‍යක්ෂ පදවියට පහත දමනු ලැබී ය. චියාං කායි-ශෙක්ගේ මහ සෙනෙවි මණ්ඩලයේ ප්‍රධානයා වූ චෙන් චෙං ඔහු ශාන්ටුං පළාතෙහි විධානය කළ සටන්ව්‍යාපාර පිටපිට ම පරාජය වූ නිසා 1947 අගෝස්තුවෙහි ඊසානදිග චීනයේ අග්‍රාණ්ඩුකාර පදවියට පහත දමනු ලැබී ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හමුදාවෙහි ප්‍රජාතන්ත්‍රවාදි ව්‍යාපාරය

1948, ජනවාරි 30

අපේ හමුදා ඒකක වල දේශපාලන වැඩ සඳහා ප්‍රතිපත්තිය වී තිබෙන්නේ මධ්‍යගත නායකත්වයක් යටතේ ගෙනයන ප්‍රජාතන්ත්‍රවාදි ව්‍යාපාරයක් මගින් උසස් ප්‍රමාණයක දේශපාලන සමගියක්, වඩා යහපත් ජීවන තත්වයන් සහ වඩා යහපත් යුද්ධ ශිල්පයක් හා උපක්‍රම යන ප්‍රධාන අරමුණු තුන මුදුන්පත් කරනු පිණිස සාමාන්‍ය පෙළේ භටයන්, අණදෙන්නන් සහ සියලු වැඩ කරන කාර්යභාරපුද්ගලයන් සම්පූර්ණයෙන් අවදි කිරීම ය. දැනට අපේ හමුදා ඒකක තුළ උද්‍යොගයෙන් කරගෙන යන පරීක්ෂා කිරීම් තුනේ ත් දියුණු කිරීම් තුනේ[1] ත් අදහස දේශපාලන සහ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රම මගින් මේ අරමුණු අතුරෙන් මුල් දෙක අත්පත් කරගැනීම ය.

ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන්, කොම්පඤ්ඤයේ බඩු සැපයීම ත් කෑම බීම සැපයීම ත් පරිපාලනය කිරීමේදී කොම්පඤ්ඤ නායකත්වයට ආධාර කිරීමේ (එය නො තකා ක්‍රියා කිරීමේ නො වේ) අයිතිය සෙබළුන් විසින් තෝරාපත්කරනලද නියෝජිතයන්ට පැවරිය යුතු ය.

යුද්ධමය ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන්, පුහුණු වීමේ කාල වලදී නිලධාරින් සහ සෙබළුන් අතර ද සෙබළුන් ම අතර ද අන්‍යොන්‍ය වශයෙන් උපදෙස් දීම තිබිය යුතු ය; සටන් කරන කාල වලදී පෙරමුණෙහි සිටින කොම්පඤ්ඤ නොයෙක් වර්ගයේ ලොකු කුඩා රැස්වීම් පැවැත්විය යුතු ය. කොම්පඤ්ඤ නායකත්වයේ මගපෙන්වීම යටතේ, සතුරන් සිටින තැන් වලට පහර දී අල්ලා ගන්නේ කෙසේ ද, වෙන සටන් කර්තව්‍ය ඉටු කරන්නේ කෙසේ ද කියා සාකච්ඡා කිරීමට සාමාන්‍ය පෙළේ භටයන් අවදි කළ යුතු ය. සටන් කිරීම දින කීපයක් පවතින විට, එබඳු රැස්වීම් කීපයක් පැවැත්විය යුතු ය. මේ වර්ගයේ යුද්ධමය ප්‍රජාතන්ත්‍රවාදය උතුරු ශෙන්ශි පළාතේ පාන්ලුං සටනේදී[2] ත් ශාන්සි–චහාර්–හෝපෙයි ප්‍රදේශයේ ශිචියාචුආං සටනේදී[3] ත් මහත් සාර්ථකභාවයෙන් යුතු ව භාවිතාවේ යොදනු ලැබී ය. මේ භාවිතාවෙන් හොඳක් ම සිදු විය හැකි බව ත් කිසි ම නරකක් සිදු විය නො හැකි බව ත් ඔප්පු වී තිබේ.

මේ පක්ෂ-අභ්‍යන්තර නිර්දේශය සහෝදර මාඕ සේතුං විසින් චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය සඳහා කෙටුම්පත් කරනලදී.

කාඩර්වරුන් අතර සිටින නරක අයගේ වැරදි සහ නොපණත්කම් එළිදරව් කිරීමේ අයිතිය සාමාන්‍ය පෙළේ සෙබළුන්ට තිබිය යුතු ය. සෙබළුන් හොඳ සහ තරමක් හොඳ කාඩර්වරුන් සියලු දෙනා ම ආදරයෙන් රැකබලාගන්නා බවට අප තුළ විශ්වාසය තිබිය යුතු ය. එමතු නො ව, අවශ්‍ය වූ විට, පහළ-මට්ටමේ කාඩර්පදවි සඳහා, ඉහළ මට්ටම විසින් පත් කරනු ලැබීමට යටත් ව, තමන්ගේ ම ශ්‍රෙණි වලින් තමන් විශ්වාස කරන අය නම් කිරීමේ අයිතිය සෙබළුන්ට තිබිය යුතු ය. පහළ–මට්ටමේ කාඩර්වරුන් හොඳට ම හිඟ වී සිටින විට, මේ විධියට නම් කිරීම ඉතා ප්‍රයෝජනවත් ය. කෙසේ වෙතත්, එය නීතිය නො විය යුතු ය, අවශ්‍ය වූ විට පමණක් කළ යුතු ය.

ස ට හ න්

[1]"පරීක්ෂා කිරීම් තුන" සහ දියුණු කිරීම් තුන" හමුදාවෙහි පක්ෂය තහවුරු කිරීම ත් මතවාදි අධ්‍යාපනය ත් පිණිස වැදගත් ව්‍යාපාරයක් විය; එය මහජන විමුක්ති යුද්ධය පැවති කාලයේ අපේ පක්ෂය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණයට සම්බන්ධ කොට ගෙනයනු ලැබී ය. ප්‍රදේශ වල, "පරීක්ෂා කිරීම් තුන" යන්නෙන් අදහස් කළේ පංක්ති මූල, මතවාදය සහ වැඩ කරන විධිය පරීක්ෂා කර බැලීම ය; සන්නද්ධ ඒකක වල, පරීක්ෂා කිරීම් කළේ පංක්ති මූල, රාජකාරිය ඉටු කිරීම සහ සටන් කරන්ට ඇති කැමැත්ත ගැන ය. "දියුණු කිරීම් තුන" වූයේ සංවිධානාත්මක තහවුරු කිරීම, මතවාදි අධ්‍යාපනය සහ, වැඩ කරන විධියේ වැරදි හරි-ගැස්සීම ය.

[2]යෙන්ආන් නුවරට ඊසානදිගින් පිහිටි පාන්ලුං 1947 මැයි මාසයේදී වයඹදිග මහජන විමුක්ති හමුදාව හූ ත්සුං-නාන්ගේ විධානය යටතේ සිටි කුඕමින්තාං භටයන් 6,700කට වැඩි ගණනක් වට කොට මුල්පිස දැමූ සුළු නගරයක් විය.

[3]ශිචියාචුආං 1947, නොවැම්බර් 12වැනි ද ශාන්සි-චහාර්-හෝපෙයි දේශසීමා ප්‍රාන්තයේ මහජන විමුක්ති හමුදාවේ සේනාංග විසින් නිදහස් කරනු ලැබී ය. එහි සිටි මිනිසුන් 24,000කට වැඩි ගණනකින් සැදුණු සතුරු ගැරිසන් හමුදාව මුළුමනින් ම විනාශ කරනු ලැබී ය. එය මහජන විමුක්ති හමුදාව විසින් උතුරු චීනයෙහි නිදහස් කළ පළමුවැනි වැදගත් මහ නගරය විය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

වයඹදිග ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය ගැන සහ විමුක්ති හමුදාවෙහි අළුත් වර්ගයේ මතවාදී අධ්‍යාපන ව්‍යාපාරය ගැන

1948, මාර්තු 7

වයඹදිග මහජන විමුක්ති හමුදව නොබෝද ලැබූ ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය ගැන අදහස් දක්වමින්, මහජන විමුක්ති හමුදවේ ප්‍රධාන මූලස්ථානයේ නියෝජිත–කථිකයෙක් මෙසේ කීවේ ය: මේ ජයග්‍රහණය වයඹදිග පැවති තත්වය වෙනස් කර ඇත, මධ්‍යම තැනි වල පවතින තත්වය කෙරෙහි බල පානවා ඇත. "දුක්ගැනවිලි කියා පෑමේ" සහ "පරීක්ෂා කිරීම තුනේ" ක්‍රම පාවිච්චි කරමින් හමුදවෙහි ගෙනයන අළුත් වර්ගයේ මතවාදී අධ්‍යාපන ව්‍යාපාරය මගින් මහජන විමුක්ති හමුදව අනභිභවනීය බවට පත් වන බව එයින් ඔප්පු වී ඇත.

නියෝජිත–කථිකයා මෙසේ ද කීවේ ය: මේ අවස්ථාවෙහි, වයඹදිග මහජන විමුක්ති හමුදව යීචුආන්හිදී උන්හිටිගමන් සතුරු බ්‍රිගේඩයක් වට කළේ ය; හූ ත්සුං-නාන් යීචුආනයට සහනය සලසනු පිණිස ලෝචුආන්–යීචුන් පේළියේ සිට ප්‍රතිසංවිධානය කළ ඩිවිසන් 2කින් බ්‍රිගේඩ 4ක් වහා ම එවන ලෙස ඔහුගේ 29වැනි බළකායයේ අණදෙන්නා වූ ලියු කාන්ට අණ කළේ ය. ඒවා මුළු ගණනින් මිනිසුන් 24,000කට වැඩි වූ, ප්‍රතිසංවිධානය කළ 27වැනි ඩිවිසනයට අයත් 31වැනි සහ 47වැනි බ්‍රිගේඩ ද, ප්‍රතිසංවිධානය කළ 90වැනි

මේ විවේචනාත්මක විස්තරය සහෝදර මාඕ සේතුං විසින් චීන මහජන විමුක්ති හමුදවේ ප්‍රධාන මූලස්ථානයේ නියෝජිත-කථිකයා සඳහා කෙටුම්පත් කරනලදී. ඒ අවස්ථාවෙහි වයඹදිග රණ මණ්ඩලයෙහි සතුරු පහරදීම සුණු විසුණු කර තිබිණි, අපේ හමුදව තම පහරදීමට බැස සිටියේ ය. මේ විවේචනාත්මක විස්තරය වයඹදිග රණ මණ්ඩලයෙහි තත්වය විශ්ලේෂණය කළේ ය, වෙන රණ මණ්ඩල වල පැවති තත්වයන් ලුහුඬින් විස්තර කළේ ය. වඩාත් වැදගත් දෙය නම්, එය "දුක්ගැනවිලි කියා පෑමේ" ත් "පරීක්ෂා කිරීම තුනේ" ත් ක්‍රම මගින් හමුදව තුළ ගෙනගිය අළුත් වර්ගයේ මතවාදී අධ්‍යාපන ව්‍යාපාරයේ මහත් අගය අවධාරණය කිරීම ය. මේ අළුත් වර්ගයේ ව්‍යාපාරය මහජන විමුක්ති හමුදවෙහි දේශපාලන වැඩ වල ත් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයෙහි ත් වැදගත් වර්ධනයක් විය. එය එකල ඉඩම් ප්‍රතිසංස්කරණය ත් පක්ෂය තහවුරු කිරීම ත් පිණිස සියලු ම නිදහස් ප්‍රදේශ වල වේගබල සම්පන්න ලෙස ගෙනයමින් තිබුණු ව්‍යාපාරය හමුදව තුළ පිළිබිඹු වීම විය. මේ ව්‍යාපාරය සියලු නිල-

ඩිවිසනයට අයත් 53වැනි සහ 61වැනි බ්‍රිගේඩ ද විය; ඒවා පෙබරවාරි 28වැනි ද යීචුආනයට නිරිතදිගින් පිහිටි ප්‍රදේශයට ළඟා විය. වයඹදිග මහජන විමුක්ති හමුදව මුලසුන් කිරීමේ සටනක් පටන්ගෙන, පෙබරවාරි 29වැනි ද සහ මාර්තු 1වැනි ද පැය තිහක් තුළ කළ සටනේදී, කිසිවකුට දැලෙන් බේරී යන්ට ඉඩ නො දෙමින්, මේ අතිරේක ආධාර බලසේනා සම්පූර්ණයෙන් ම මුල්පිස දැම්මේ ය. මිනිස්සු 18,000කට වැඩි ගණනක් අල්ලාගනු ලැබූහ, 5000කට වැඩි ගණනක් මරනලදහ, හෝ තුවාල කරනලදහ; ලියු කාන් ද, 90වැනි ඩිවිසනයේ අණදෙන්නා වූ යෙන් මිං ද, වෙනත් නිලධාරී ද මරනලදහ. ඉක්බිති මාර්තු 3වැනි ද අපි යීචුආන් ඇල්ලුවෙමු; යළිත් මෙහිදී නගරය ආරක්ෂා කරමින් සිටි සතුරාගේ ප්‍රතිසංවිධානය කළ 76වැනි ඩිවිසනයට අයත් 24වැනි බ්‍රිගේඩයේ මිනිසුන් 5000කට වැඩි ගණනක් මුල්පිස දැමීමු. මේ යුද්ධව්‍යාපාරයේදී අපි, සියල්ල ම ගත් කල, සතුරාගේ බළකාය මූලස්ථාන 1ක්, ඩිවිසන් මූලස්ථාන 2ක් සහ බ්‍රිගේඩ 5ක්, මුළු ගණනින් මිනිසුන් 30,000ක්, මුල්පිස දැමීමු. මෙය වයඹදිග රණ මණ්ඩලයෙහි අපේ පළමුවැනි ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය විය.

වයඹදිග රණ මණ්ඩලයෙහි තත්වය විග්‍රහ කරමින්, නියෝජිත–කථිකයා මෙසේ කීවේ ය: හූ ත්සුං-නාන් විසින් කෙළින් ම අණ දෙනු ලැබූ ඊනියා "මධ්‍යම හමුදව" ට අයත් බ්‍රිගේඩ 28 අතුරෙන්, බ්‍රිගේඩ 8ක් ඔහුගේ අති දක්ෂ ඩිවිසන් 3 වූ ප්‍රතිසංවිධානය කළ 1වැනි, 36වැනි සහ 90වැනි ඩිවිසන් වලට අයත් විය. මේ ඩිවිසන් අතුරෙන්, ප්‍රතිසංවිධානය කළ 1වැනි ඩිවිසනයට අයත් 1වැනි බ්‍රිගේඩය අප විසින් මීට කලින් වරක්, 1946 සැප්තැම්බරයේදී, දකුණු ශාන්සි පළාතේ පූශාන්හිදී මුලසුන් කර තිබිණි[1]; ඒ ඩිවිසනයේ ම 167වැනි බ්‍රිගේඩයේ ප්‍රධාන බලසේනාව වරක්, ගිය අවුරුද්දේ මැයි මාසයෙහි, උතුරු ශෙන්සි පළාතේ පාන්ලුං සුළු නගරයේදී මුලසුන් කර තිබුණි; ප්‍රතිසංවිධානය කළ 36වැනි ඩිවිසනයට අයත් 123වැනි සහ 165වැනි බ්‍රිගේඩ වරක්, ගිය අවුරුද්දේ අගෝස්තුවේදී, උතුරු ශෙන්සි පළාතේ, මයිචි උප-පළාතේ ශාචියාතියන්හිදී මුලසුන් කර තිබුණි; මේ වතාවේ ප්‍රතිසංවිධානය කළ 90වැනි ඩිවිසනය ද සම්පූර්ණයෙන් ම මුල්පිස දමනලදී, හූ ත්සුං–නාන්ගේ

ධාරින්ගේ ත් සෙබළුන්ගේ ත් දේශපාලන හැඟීම, විනය සහ සටන් ක්ෂමතාව බෙහෙවින් දියුණු කළේ ය. ඒ අතර ම එය අල්ලාගත් කුඔමින්තාං සෙබළුන් මහත් සංඛ්‍යාවන් විමුක්ති හමුද සටන්කරුවන් බවට විපර්යාස කිරීමේ ක්‍රියාවලිය ඉතා ම සාර්ථක ලෙස වේගවත් කළේ ය. මෙසේ එය මහජන විමුක්ති හමුදව තහවුරු කිරීමෙහි සහ පුළුල් කිරීමෙහි ලා ත්, යුදබිමේදී ජය ලැබීම සහතික කිරීමෙහි ලා ත් වැදගත් කොටසක් රඟපෑවේ ය. මේ ව්‍යාපාරයේ වැදගත්කම තේරුම් ගැනීම පිණිස, මේ පොතේ 406-07වැනි පිටු වල පළවන "හමුදවෙහි ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය" යන ලිපිය ද, "ශාන්සි-සුයියුආන් නිදහස් ප්‍රදේශයෙහි කාඩර්වරුන්ගේ සාකච්ඡාසභාවකදී කළ කථාව" සහ "සැප්තැම්බර් රැස්වීම ගැන — චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ චක්‍රලේඛය" යන ලිපි ද (මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං 1967, IVවැනි කාණ්ඩය, පිටු 227-39 සහ 269-77) බලන්න.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ප්‍රධාන බලසේනාවේ ඉතිරි කොටසෙන්, තවම මුල්පිස දමා නැත්තේ ප්‍රති-සංවිධානය කළ 1වැනි ඩිවිසනයට අයත් 78වැනි බ්‍රිගේඩය ත් ප්‍රතිසංවිධානය කළ 36වැනි ඩිවිසනයට අයත් 28වැනි බ්‍රිගේඩය ත් පමණකි. එහෙයින් හූ ත්සුං–නාන්ගේ මුළු හමුදුව ම කොයි අතින් බැලුවත් තව දුරට ත් අති දක්ෂ සේනාංග නො වේ ය'යි කිව හැකි ය. යීවුආන්හි මුලසුන් කිරීමේ සටනේ ප්‍රතිඵලයක් වශයෙන්, කලින් කෙළින් ම හූ ත්සුං–නාන්ගේ විධානය යටතේ තිබුණු නිත්‍ය බ්‍රිගේඩ 28න් ඉතිරි වී තිබෙන්නේ 23ක් පමණකි. මේ බ්‍රිගේඩ 23 මතු සඳහන් ප්‍රදේශ වල බෙදු හැර ඇත: දකුණු ශාන්සි පළාතේ ලින්පන්හි සිටින බ්‍රිගේඩ 1 අක්‍රියාකාරී තත්වයට පත් ව විනාශයට ඉරණම කෙටී ඇත; බ්‍රිගේඩ 9ක් චෙන් කෙං සහ ශියේ පූ–චි යටතේ සිටින අපේ ක්ෂේත්‍ර හමුදුව සමග ඔට්ටු වීම පිණිස ශෙන්සි–හෝනාන් දේශසීමාවෙහි සහ ලෝයාං-තුංකුආන් පේළිය දිගේ සිටී; දකුණු ශෙන්සි පළාතෙහි සිටින තව බ්‍රිගේඩයක් හාන්චුං ප්‍රදේශය රකිමින් සිටී. ඉතිරි බ්‍රිගේඩ 12 තුංකුආන්හි සිට පාඕකි දක්වා ත් ශියන්යාංහි සිට යෙන්ආන් දක්වා ත් T අකුරේ හැඩයට වැටී ඇති ගමනාගමනමාර්ග දිගේ බෙදු හැර ඇත. මේවා අතුරෙන්, 3ක් මුළුමනින් ම අළුතෙන් බන්ද ගත් අය ගෙන් සැදුණු "නැවත සම්පූර්ණ කළ බ්‍රිගේඩ" ය, 2ක් අපේ හමුදුව විසින් සම්පූර්ණයෙන් ම මුල්පිස දමනු ලැබ සිට, ළඟදී නැවත සම්පූර්ණ කර ඇත, තවත් 2ක් අපෙන් පොඩිපට්ටම් වන පහරවල් කා ඇත, 5ක් ලබා ඇත්තේ සංසන්දන වශයෙන් පහරවල් ටිකකි. මේ බලසේනා ඉතා දුර්වල බව පමණක් නො ව වැඩි වශයෙන් ගැරිසන් රාජකාරියෙහි යෙදී සිටින බව ද පෙනී යයි. හූ ත්සුං–නාන්ගේ හමුදුවට අමතර ව, යූලින් රකිමින් තෙං පාඕ–ශාන් යටතේ බ්‍රිගේඩ 2ක් සිටින අතර, නිංසියා පළාතේ මා හුආං–කුළුයි යටතේ සහ චිංහායි පළාතේ මා පූ–පාං යටතේ සිටින බ්‍රිගේඩ 9ක් සාන්පියන් සහ ලුංතුං ප්‍රදේශ වල බෙදු හැර ඇත.[2] හූ ත්සුං–නාන්, තෙං පාඕ–ශාන් සහ මා දෙ දෙනා යටතේ සිටින සියලු ම නිත්‍ය හටකණ්ඩායම් වල මුළු ගණන දැන්, වරක් හෝ දෙ වරක් මුලසුන් කරනු ලැබීමෙන් පසු නැවත සම්පූර්ණ කර ඇති සේනාංග ද ඇතුළු ව, බ්‍රිගේඩ 34කි.

මේ වයඹදිග කොටසේ සතුරාට කරුණ පවතින සැටි ය. T හැඩය ඇති ගමනාගමනමාර්ග වෙත ආපසු හැරී බලන කල, සංසන්දනාත්මක වශයෙන් පහරවල් ටිකක් කා සිටින ඒ බ්‍රිගේඩ 5 අතුරෙන්, 2ක් යෙන්ආන් නුවර හිර වී සිටී, 3ක් මහා කුආන්චුං ප්‍රදේශයෙහි[3] සිටී. එහි සිටින සෙසු බ්‍රිගේඩ සම්බන්ධයෙන්, ඒවායින් වැඩි හරියක් ළඟදී නැවත සම්පූර්ණ කර ඇත, කීපයක් පොඩිපට්ටම් වන පහරවල් කා ඇත. වෙන විධියකට කියනවා නම්, මුළු මහා කුආන්චුං ප්‍රදේශයෙහි, වෙසෙසින් කාන්සු පළාතෙහි, සිටින සතුරාගේ බලසේනා ඉතා විරල ය, දුර්වල ය; මහජන විමුක්ති හමුදුවේ පහරදීම නතර කරන්ට ඒවාට පුළුවන්කමක් නැත. මේ තත්වය දකුණු පෙරමුණෙහි චියාං කායි–ශෙක්ගේ බලසේනා වින්‍යාසයන් අතර සමහරක්

කෙරෙහි, පළමුවෙන් ම, හෝනාන්–ශෙන්සි දේශසීමාවෙහි චෙන් කෙං සහ ශියේ පූ–චි යටතේ සිටින අපේ ක්ෂේත්‍ර හමුදුවට මුහුණට මුහුණ ලා සිටින සේ කර තිබෙන ඔහුගේ සේනා වින්‍යාසයන් කෙරෙහි, බලපානවා නියත ය. දකුණ බලා කාගෙන යන ස්වකීය වර්තමාන ගමනේදී, වයඹදිග මහජන විමුක්ති හමුදුව තම පතාකය ප්‍රදර්ශනය කළ වහා ම ජය දිනාගෙන ඇත, රැව් පිළිරැව් දෙන කිත්ගොස ලබාගෙන ඇත, වයඹදිග පෙදෙසෙහි අප ත් සතුරා ත් අතර බලවේගයන්ගේ සබඳකම වෙනස් කර ඇත; මෙතැන් සිට දකුණු පෙරමුණු වල සිටින මහජන විමුක්ති හමුදුවේ බලසේනා සමග උචිත ලෙස සම්බන්ධ වී, වඩාත් සාර්ථක ලෙස සටන් කරන්ට ඒ හමුදුව සමත් වෙනවා ඇත.

නියෝජිත–කථිකයා මෙසේ කීවේ ය: ඉකුත් ග්‍රීෂ්මඍතුවේ සහ සරත්–ඍතුවේ සිට, පිළිවෙලින් ලියු පෝ–චෙං සහ තෙං ශියාඕ–පිං විසින් ද, චෙන් යී සහ සූ යූ විසින් ද, චෙන් කෙං සහ ශියේ පූ–චි විසින් ද අණදෙනු ලබන අපේ ක්ෂේත්‍ර හමුද තුන කහ ගඟ හරහා දකුණු දෙසට ඉදිරියට ගොස්, යැංසී, හුආයි, කහ සහ හැන් ගංගාවන් ගෙන් වට වූ භූමිප්‍රදේශය දිගට හරහට පිසගෙන යමින්, සතුරු හටකණ්ඩායම් මහත් සංඛ්‍යාවන් මුල්පිස දමා, උපායශීලී ව ක්‍රියා කොට, දකුණු පෙරමුණෙහි චියාං කායි–ශෙක්ට සිටින බ්‍රිගේඩ 160 ගණනින් 90ක් පමණ තමන් දෙසට ඇදගෙන, ඔහුගේ හමුදුවන් අක්‍රියාකාරී තත්වයකට වැටෙන්ට බලෙන් ම සලසා, තීරණාත්මක උපායමාර්ගික කොටසක් රඟපා, රට පුරා ම ජනතාව ගෙන් පැසසුම් දිනාගත්තේ ය.[4] සීතඍතුවේදී කළ තම පහරදීමේදී අපේ ඊසානදිග ක්ෂේත්‍ර හමුදුව බින්දුවෙන් පහළ අංශක 30හේ සීතලට පවා බය නැතිව මුහුණ දෙමින්, සතුරු හට-කණ්ඩායම් වැඩි ගණනක් මුලසුන් කළේ ය, සුප්‍රකට නගර එකකට පසු එකක් අල්ලාගත්තේ ය, රට පුරා ම පිළිරැව් දෙන කීර්තියක් දිනාගත්තේ ය.[5] ගිය අවුරුද්දේ කළ වීර වික්‍රමාන්විත සටන් වලදී සතුරු හටකණ්ඩායම් මහත් සංඛ්‍යාවන් මුල්පිස දැමීමෙන් පසු[6], ශාන්සි–චහාර්–හෝපෙයි ප්‍රදේශයෙහි ද, ශාන්ටුං පළාතෙහි ද, උතුරු චියාංසු පළාතෙහි ද, ශාන්සි–හෝපෙයි–ශාන්ටුං–හෝනාන් ප්‍රදේශයෙහි ද සිටින අපේ ක්ෂේත්‍ර හමුදවෝ ගිය සීතඍතුවේදී තම පුහුණුවීම සහ තහවුරුවීම සම්පූර්ණ කළහ; ඔවුන් ඉක්මනින් ම ඔවුන්ගේ වසන්ත පහරදීම අරඹනවා ඇත.[7] මුළු තත්වය ම ගැන කරන සමාලෝචන-යකින් එක් සත්‍යයක් ඔප්පු වේ. අප හණමිටිවාදයට ත්, සතුරා කෙරෙහි බියට ත්, දුෂ්කරතා ගැන ඇති බියට ත් තරයේ විරුද්ධ වෙනවා නම් ද, අප පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් ඉදිරිපත් කර තිබෙන සාමාන්‍ය උපාය-මාර්ගය ත්, සටන්ව්‍යාපාර පිළිබඳ ප්‍රධාන මූලධර්ම දහය ගැන මධ්‍යම කාරකසභාව දී තිබෙන නිර්දේශය[8] ත් අනුගමනය කරනවා නම් ද, අපේ පහරදීම අරඹා, සතුරු හටකණ්ඩායම් විසාල ගණනින් මුල්පිස දමා, චියාං කායි–ශෙක් පල්හොර මූලේ බලසේනාවන්ට බර පහරවල් ගසන්ට අපට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හැකි ය; ඔවුන්ට හැකි වන්නේ ආපසු පහර ගසන්ට පුළුවන්කමක් නැතිව ඒ පහරවල් වලින් තාවකාලිකව මග අරින්ට පමණකි; එසේ ත් නැතහොත් ඒවායින් මග අරින්ට පවා ඔවුන්ට බැරි වෙනවා ඇත; ඔව්හු, එකකුට පසු එකකු වශයෙන්, සම්පූර්ණයෙන් ම මුල්පිස දමනු ලබනවා ඇත.

නියෝජිත-කපීකයා මෙසේ බර කොට කීවේ ය: අපේ වයඹදිග ක්ෂේත්‍ර හමුදුවේ සටන් ක්ෂමතාව ගිය අවුරුද්දේ කවර අවස්ථාවකදීට ත් වඩා උසස් ය.[9] ගිය අවුරුද්දේ කළ සටන් වලදී වයඹදිග ක්ෂේත්‍ර හමුදුවට පුළුවන් වුණේ එක වරකට වැඩි ම ගණනින් සතුරු බ්‍රිගේඩ දෙකක් විනාශ කරන්ට ය; දැන් යීචුආන් යුද්ධව්‍යාපාරයේදී එක් වරකට සතුරු බ්‍රිගේඩ පහක් මුල්පිස දැමීමට ඊට පුළුවන් වී ඇත. මේ විශිෂ්ට ජයග්‍රහණයට හේතු බොහෝ විය; ඒ හේතු අතර පෙරමුණේ සිටින නායකත්වය දෙන සහෝදරවරුන්ගේ ස්ථිර නමුත් නැමෙන සුලු විධානය, පසුමුණෙහි සිටින නායක සහෝදරවරුන් සහ පුළුල් බහුජනයා උදෙ‍්‍යාගයෙන් දුන් අනුබලය, සතුරු භටකණ්ඩායම් බොහෝ දුරට තනි වීම සහ අපට හිතකර වූ භූමිභාග යන මේවා අප විසින් පෙන්වා දිය යුතු ය. කෙසේ වෙතත්, බෙහෙවින් ම සැලකිල්ලට ගත යුතු දෙය නම්, පසුගිය සීතසෘතුවේදී දෙ මසකට වැඩි කලක් දුක්ගැනවිලි කියා පෑමේ සහ පරීක්ෂා කිරීම් තුනේ ක්‍රම මගින් හමුදුව තුළ ගෙනගිය අළුත් වර්ගයේ මතවාදී අධ්‍යාපන ව්‍යාපාරය යි. දුක්ගැනවිලි (එනම් පරණ සමාජය විසින් සහ ප්‍රතිගාමීන් විසින් වැඩ කරන ජනතාවට කර තිබෙන වැරදි) කියා පෑම පිණිස ත් (පංක්ති මූල, රාජකාරිය ඉටු කිරීම සහ සටන් කිරීමට ඇති කැමැත්ත ගැන කරන) පරීක්ෂා කිරීම් තුන පිණිස ත් ව්‍යාපාරය නිවැරදි ලෙස ප්‍රසාරණය කිරීම සූරාකනු ලබන වැඩ කරන බහුජනයා නිවහල් කිරීම සඳහා ත්, දේශ-ව්‍යාප්ත ඉඩම් ප්‍රති-සංස්කරණය සඳහා ත්, ජනතාවගේ පොදු සතුරා වන චියාං කායි-ශෙක් පල්හෝර මූල විනාශ කිරීම සඳහා ත් කරන සටනේදී හමුදුව පුරා ම අණදෙන්නන්ගේ සහ සටන්කරුවන්ගේ දේශපාලන හැඟීම බෙහෙවින් ම උසස් කළේ ය. එය කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ සිටින සියලු අණදෙන්නන්ගේ සහ සටන්කරුවන්ගේ දැඩි සමගිය ද බෙහෙවින් ම උසස් කළේ ය. මේ පදනම උඩ, හමුදුව ස්වකීය ශ්‍රේණි තුළ වඩා විශාල පවිත්‍රතාවක් ඇති කර ගත්තේ ය, විනය ශක්තිමත් කළේ ය, පුහුණුවීම පිණිස සමූහ ව්‍යාපාරයක් ප්‍රසාරණය කළේ ය, සම්පූර්ණයෙන් ම ඉතා හොඳට මගපෙන්වනුලැබූ ක්‍රමවත් පිළිවෙලකට ස්වකීය දේශපාලන, ආර්ථික සහ යුද්ධමය ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් වර්ධනය කළේ ය. මෙසේ මේ හමුදුව, හැම එක්කෙනා ම තම අදහස් සහ තම ශක්තිය තම කොටස වශයෙන් දෙමින්, එකා මෙන් සමගි වී ඇත, පරිත්‍යාගයට බිය නො වන්නා වූ සහ ද්‍රව්‍යමය දුෂ්කරතා ජය ගැනීමට සමත් වූ ද, සතුරා විනාශ කිරීමේදී සමූහ වීරත්වය සහ එඩිතරකම පළකරන්නා වූ ද හමුදුවක් වී ඇත. එබඳු හමුදුවක් අනභිභවනීය වන්නේ ය.

නියෝජිත-කපීකයා මෙසේ කීවේ ය: හමුදුව තුළ මේ අළුත් වර්ගයේ මතවාදී අධ්‍යාපන ව්‍යාපාරය ගෙනගොස් තිබෙන්නේ වයඹදිග පෙදෙසෙහි පමණක් නො වේ; එය රට මුළුල්ලෙහි ම මහජන විමුක්ති හමුදුව තුළ ගෙනගොස් ඇත, හෝ ගෙනයමින් තිබේ. සටන් අතර කාලය තුළ ගෙනයනු ලබන මේ ව්‍යාපාරය සටන් කිරීමට අවහිරයක් නො කරයි. අපේ පක්ෂය විසින් දැන් නිවැරදි ලෙස ගෙනයමින් තිබෙන පක්ෂය තහවුරු කිරීමේ ව්‍යාපාරය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය සමග බද්ධ කළ විට, අධිරාජ්‍ය-වාදයට, රදළවාදයට සහ නිලධාරි-ධනවාදයට පමණක් විරුද්ධ වීමෙන් ද, කිසි ම වෙනසක් සලකන්නේ නැතිව ගැහීම සහ මැරීම තරයේ ම තහනම් කිරීමෙන් ද (මැරීම අඩු කරන තරමට වඩා හොඳ ය), රටේ ජනගහණයෙන් සියයට 90කට වඩා තනන බහුජනතාව සමග ස්ථිර ලෙස එක්සත් වීමෙන් ද පහර දිය යුතු කොටස් වල ප්‍රමාණය පටු කිරීමට අපේ පක්ෂය අනුගමනය කරන නිවැරදි ප්‍රතිපත්තිය සමග බද්ධ කළ විට සහ, අපේ පක්ෂයේ නිවැරදි නාගරික ප්‍රතිපත්තිය ත් ජාතික ධනේශ්වරපංක්තියේ කර්මාන්ත සහ වාණිජ්‍යය ස්ථිර ලෙස ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම පිළිබඳ පක්ෂයේ ප්‍රතිපත්තිය ත් ක්‍රියාවේ යෙදීම සමග බද්ධ කළ විට, මේ මතවාදී අධ්‍යාපන ව්‍යාපාරය මහජන විමුක්ති හමුදුව අනභිභවනීය හමුදුවක් කරනවා නියත ය. චියාං කායි-ශෙක් පල්හෝර මූල ත් එහි ස්වාමියා වන එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ත් චීන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ ශ්‍රේෂ්ඨ අරගලයට විරුද්ධ ව කොතරම් වියරු ලෙස දඟලුවත්, ජයග්‍රහණය සත්තකින් ම අප සතු වන්නේ ම ය.

සටහන්

[1]මේ පොතේ 365 පිටුවේ ''සතුරු බලසේනා එකින් එක විනාශ කිරීම පිණිස වැඩි-බලය ඇති බලසේනාවක් ඒකරාශි කරන්න'' යන ලිපියට යොදා තිබෙන 1වැනි සටහන බලන්න.

[2]සාන්පියන් යනු වයඹදිග ශෙන්සි පළාතෙහි ප්‍රදේශයකි. ලුංතුං යනු කාන්සු පළාතේ නැගෙනහිරි කොටස ය. සාන්පියන් සහ ලුංතුං යන දෙක ම එකල ශෙන්සි-කාන්සු-නිංසියා නිදහස් ප්‍රදේශයේ කොට්ඨාශ දෙකක් විය.

[3]මෙයින් සඳහන් වන්නේ මධ්‍යම ශෙන්සි පළාත ය.

[4]1947, ජූනි 30වැනි දින සිට පටන් ගනිමින්, ලියු පෝ-ශෙං, තෙං ශියාඕ-පිං සහ වෙනත් සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් ක්ෂේත්‍ර හමුදුවේ කොලම් 7ක් බලෙන් ම කහ ගඟෙන් එතෙර වී, තාපියේ කඳු දෙසට තල්ලු වී ගියහ; එසේ මහජන විමුක්ති හමුදුවේ උපායමාර්ගික පහරදීම ආරම්භ කළහ. 1948 මාර්තු අවසන් වන විට, සතුරු භටයෝ 100,000ට වඩා මුල්පිස දමන ලදහ; හූපේ-හෝනාන් දේශසීමාවෙහි, බටහිරි අන්හ්වෙයි පළාතෙහි, හූපේ-හෝනාන් දේශසීමාවේ තුංපායි පර්වත ප්‍රදේශයෙහි, යැංසී සහ හැන් ගංගා අතර මිටියාවත් වල සහ වෙනත් තැන් වල අළුත් කඳවුරු ප්‍රදේශ පිහිටුවනු ලැබී ය. චෙන් යී, සු යු සහ වෙනත් සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද නැගෙනහිර

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

චීන ක්ෂේත්‍ර හමුදවේ කොලම් අටක්, 1947 අගෝස්තුවේදී සතුරා ශාන්ටුං පළාතට දුන් ඒකරාශි කළ ප්‍රහාරය සුණුවිසුණු කර දමා, නිරිතදිග ශාන්ටුං පළාතට සහ හෝනාන්-අන්හ්වෙයි-චියාංසු දේශසීමා ප්‍රාන්තයට වේගයෙන් ගමන් කොට, සතුරු භටයන් 100,000ට වඩා මුල්පිස දමූහ, හෝනාන්-අන්හ්වෙයි-චියාංසු නිදහස් ප්‍රදේශ ගොඩනැගූහ. කායිපං සහ ශෙංචව් යන සතුරාගේ උපායමාර්ගික මධ්‍යස්ථාන තනි කළහ. චෙන් කෙං, ශියේ ෆූ-චී සහ වෙනත් සහෝදරවරුන් විසින් විධානය කරනු ලැබූ ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් ප්‍රදේශයේ තායියුඑ හමුදවේ කොලම් දෙකක් සහ එක් බළකායයක්, 1947 අගෝස්තුවේදී දකුණු ශාන්සි පළාතේදී බලෙන් ම කහ ගඟෙන් එතෙර වී, බටහිරි හෝනාන් පළාත තුළට ඉදිරියට ගොස්, සතුරු භටයන් 40,000ට වැඩි ගණනක් මුල්පිස දමූහ, බටහිරි හෝනාන් පළාතේ සතුරාගේ උපායමාර්ගික මධ්‍යස්ථානය වූ ලෝයාං සම්පූර්ණයෙන් ම තනි කරමින් ද, තුංකුආන් නුවරට තර්ජනය කරමින් ද හෝනාන්-ශෙන්සි-හූපෙ දේශසීමාවෙහි සහ දකුණු ශෙන්සි පළාතෙහි කඳවුරු ප්‍රදේශ ගොඩනැගූහ.

[5]1947, දෙසැම්බර් 15වැනි ද සිට 1948, මාර්තු 15වැනි ද තෙක් දවස් අනූවක් ම දිගට ම සටන් කරමින්, ලින් පියාඕ, ලෝ ජුං-හුආන් සහ වෙනත් සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද ඊසානදිග ක්ෂේත්‍ර හමුදවේ කොලම් 10ක් සහ ස්වාධීන ඩිවිසන් 12ක් චීන චාංචුන් දුම්රියමගේ සපිංකායි-තාශිචියාඕ කොටස සහ පීපිං-ලියාඕනිං දුම්රියමගේ ශාන්හායිකුආන්-ශෙන්යාං කොටස ඔස්සේ පෙර නුවූ විරූ පරිමාණයකින් සීතසෘතු පහරදීමක් කළේ ය; ඒ සේනාවෝ සතුරු භටයන් 1,56,000කට වඩා මුල්පිස දමූහ, සතුරාගේ බලවත් ලෙස රක්ෂිත කොට තිබුණු උපායමාර්ගික මධ්‍යස්ථානය වූ සපිංකායි සහ තව නගර දහඅටක් ඇල්ලූහ. යිංකව් නගරය රකිමින් සිටි එක් සතුරු ඩිවිසනයක් කැරලි ගසා අපේ පැත්තට ආවේ ය. කිරින් නගරය රකිමින් සිටි සතුරු බලසේනාව චාංචුන් නගරය දෙසට පළා ගියේ ය. මීට පසු, ඊසානදිග ප්‍රදේශයෙහි සතුරු ග්‍රහණය යටතේ වූ භරිය මුළු ප්‍රදේශයෙන් සියයට 1ක් පමණක් වන තුරු කුඩා විය, චාංචුන්-ශෙන්යාං-චින්චව් පෙළිය දිගට වූ සතුරු තිප්පොළවල් තනි විය.

[6]1947 සැප්තැම්බර් මුල සිට නොවැම්බර් මැද දක්වා, නියේ ජුං-චෙන් සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද ශාන්සි-චහාර්-හෝපෙයි ක්ෂේත්‍ර හමුදවේ කොලම් 5ක් තාචිං ගංගාවට උතුරෙන් පිහිටි ප්‍රදේශයෙහි සහ චිංපෙංතියන් ප්‍රදේශයෙහි පිටපිට ම කළ සටන් ද ශිචියාචුආං නගරය නිදහස් කළ සටන ද කොට, සතුරු භටයන් මුළු ගණනින් 50,000ක් පමණ මුල්පිස දැමී ය, එසේ ශාන්සි-චහාර්-හෝපෙයි සහ ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් යන නිදහස් ප්‍රදේශ එකට ම යාවූ භූමිප්‍රදේශයක් බවට ඇඳුවේ ය. 1947 සැප්තැම්බරයේ සිට දෙසැම්බරය තෙක්, නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදවට අයත් ශාන්ටුං හමුදවේ කොලම් 3ක් සහ ප්‍රාන්තීය සන්නද්ධ බලසේනා හ්සූ ශි-යූ, තාන් චෙන්-ලින් සහ වෙනත් සහෝදරවරුන්ගේ විධානය යටතේ නැගෙනහිරි ශාන්ටුං යුද්ධව්‍යාපාරය කොට, සතුරු භටයන් 63,000කට වඩා මුල්පිස දැමී ය, උප-පළාත් සුළු නගර දහයකට වඩා ආපසු අල්ලා ගත්තේ ය; මෙය ශාන්ටුං පළාතෙහි මුළු තත්වය ම වෙනස් කළේ ය. 1947 අගෝස්තුවේ සිට දෙසැම්බර තෙක්, උතුරු චියාංසු පළාතෙහි සිටි නැගෙනහිරි චීන ක්ෂේත්‍ර හමුදවේ සේනාංග යෙන්චෙං, ලීපාඕ සහ වෙනත් තැන් වල පිටපිට ම කළ සටන්වලදී, සතුරු භටයන් 24,000කට වඩා මුල්පිස දමා, උතුරු චියාංසු පළාතෙහි පුළුල් ප්‍රදේශයක් ආපසු අල්ලාගත්තේ ය. 1947 දෙසැම්බරයේදී, හ්සූ ශියාං-චියන් සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් ක්ෂේත්‍ර හමුදවේ සේනාංග වයඹදිග ක්ෂේත්‍ර හමුදව සමග උචිත ලෙස සම්බන්ධ වී සටන් කොට, සතුරු භටයන් 13,000කට වැඩි ගණනක් විනාශ කරමින්, යුන්චෙං නගරය අල්ලා ගත්තේ ය; ඔව්හු නිරිතදිග ශාන්සි පළාතෙහි සිටි සියලු ම සතුරු බලසේනා මුල්පිස දමා, ලින්පන් නුවර සිටි සතුරා තනි කළහ.

[7]ඉකුත් සීතසෘතුවේදී පුහුණුවීමේ සහ තහවුරුවීමේ කාලසීමාවකට පසු, 1948 වසන්තයේදී, මහජන විමුක්ති හමුදවේ ක්ෂේත්‍ර හමුදවෝ පිටපිට ම පහරදීම් දියත් කළෝ ය. මාර්තු

සහ මැයි අතර, ශාන්සි-චහාර්-හෝපෙයි ක්ෂේත්‍ර හමුදව ද, ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් සහ ශාන්සි-සුයියුආන් ක්ෂේත්‍ර හමුද වල සේනාංග ද දකුණු චහාර් පළාතෙහි, නැගෙනහිර සුයියුආන් පෙදෙසෙහි සහ ශාන්සි පළාතේ ලින්පන් ප්‍රදේශයෙහි යුද්ධව්‍යාපාර ගෙනයමින්, සතුරු භටයන් 43,000කට වැඩි ගණනක් මුල්පිස දමා, බොහෝ භූමිප්‍රදේශ ආපසු අත්පත් කර ගත්තේ ය. මාර්තු 8 සහ මැයි 29 අතර, මධ්‍යම තැනි සහ නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදවන්ට අයත් සේනාංග ලෝයාං සහ සුංහෝ නගර වෙත ද, නාන්යාං නගරයට බටහිරින් සහ නැගෙනහිරින් පිහිටි කොටස් වල ද පිටපිට සටන් කරමින්, සතුරු භටයන් 56,000කට වඩා මුල්පිස දැමී ය, එසේ මධ්‍යම තැනි වල සතුරාගේ ආරක්ෂණ ක්‍රමය පොඩිපට්ටම් කොට, එහි නිදහස් ප්‍රදේශ ව්‍යාප්ත කොට තහවුරු කළේ ය. මාර්තු 11 සහ මැයි 8 අතර, නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදවේ ශාන්ටුං හමුදව පළමුකොට ත්සිංතාඕ-ත්සිනාන් දුම්රියමගේ බටහිරි කොටසෙහි ද, ඉක්බිති වෙයිශියන්හිදී ද සටන් කොට, සතුරු භටයන් 84,000කට වැඩි ගණනක් මුල්පිස දැමී ය. එසේ, කුඕමින්තාං පක්ෂය විසින් අත් කරගෙන සිටි ත්සිනාන්, ත්සිංතාඕ, ලින්යී සහ යෙන්චව් වැනි රක්ෂස්ථාන කීපයක් හැර, ශාන්ටුං පළාත නිදහස් කරනු ලැබී ය. මාර්තුවේදී උතුරු චියාංසු හමුදව යීලින්හිදී සාර්ථක සටනක් කළේ ය.

[8]සටන්ව්‍යාපාර ගෙනයාමේ ප්‍රධාන මූලධර්ම දහය දැනගැනීම පිණිස, මේ පොතේ 401-04වැනි පිටු වල පළ වන "වර්තමාන තත්වය සහ අප සතු කර්තව්‍යයෝ", IIIවැනි කොටස බලන්න.

[9]පෙං තේ-හුආයි, හෝ ලුං, ශි චුං-ශුන් සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද වයඹදිග ක්ෂේත්‍ර හමුදව 1947 ග්‍රීෂ්මසෘතුවේදී උතුරු ශෙන්සි පළාතෙහි කළ සටන් වලදී, මුළු ගණනින් මිනිසුන් 25,000ට වඩා සිටී, කොලම් 2කින් සහ බ්‍රිගේඩ 2කින් යුත් ප්‍රධාන බලසේනාවක් යෙදී ය. 1948 වසන්තය වන විට, ප්‍රධාන බලසේනාව, මුළු ගණනින් මිනිසුන් 75,000කට වඩා සිටී, කොලම් 5කට වැඩි වී තිබුණි. පූරා අවුරුද්දක් කළ සටනින් ද 1947 සීතසෘතුවෙහි හමුදව තුළ ගෙනගිය අළුත් වර්ගයේ මතවාදී අධ්‍යාපන ව්‍යාපාරයෙන් ද පන්නරය තබනු ලැබීමෙන් පසු, නිලධාරින් සහ සෙබළුන් මහත් සමූහයාගේ දේශපාලන හැඟීම ත්, යුද්ධ සේනාංග වල සටන් ක්ෂමතාව ත් පෙර නුවූ විරූ මස්තකයන්ට නැඟුණේ ය. මෙය 1948 මාර්තුවේදී වයඹදිග ක්ෂේත්‍ර හමුදව බාහිර පෙළි වල සටන් කිරීමට හැරෙන්නට අවශ්‍ය තත්වයන් නිර්මාණය කළේ ය. අප්‍රියෙල් 12වැනි ද, යිචුආන්හිදී ලත් තම ප්‍රධාන ජයග්‍රහණයට පසු, වයඹදිග ක්ෂේත්‍ර හමුදව (සියාන් නුවරට බටහිරින් ද, චිංසුයි සහ වෙයිශුයි ගංගා අතර ද පිහිටි ප්‍රදේශය වූ) ශීදූ ප්‍රදේශයෙහි සහ නැගෙනහිරි කාන්සු පළාතෙහි, යුද්ධව්‍යාපාරයක් දියත් කළේ ය, චිංසුයි සහ වෙයිශුයි ගංගා අතර පුළුල් ප්‍රදේශය තුළට ඉදිරියට තල්ලු වී ගියේ ය, සියාන්-ලාන්චව් මහා මාර්ගය කපා වෙන් කළේ ය, අප්‍රියෙල් 22වැනි ද යෙන්ආන් නගරය ආපසු අත්පත් කර ගත්තේ ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය

1948, සැප්තැම්බර් සහ ඔක්තෝබර්

1. සැප්තැම්බර් 7වැනි ද විදුලිසංදේශය

අපි 1946 ජූලි මස[2] සිට ගණන් ගනිමින්, පස් අවුරුද්දකදී පමණ කුඕමින්තාං ආණ්ඩුව පෙරළා දැමීමට මූලික වශයෙන් සූදනම් වී සිටිමු. මෙය කළ හැකි ය. අප හැම අවුරුද්දක ම කුඕමින්තාං නිත්‍ය භටයන් බ්‍රිගේඩ 100ක් පමණ, නැතහොත් පස් අවුරුද්ද ඇතුළත බ්‍රිගේඩ 500ක් තරම, විනාශ කර දමතොත්, අපේ අරමුණ මුදුන්පත් කළ හැකි ය. ඉකුත් අවුරුදු දෙක තුළ, අපේ හමුදව සතුරු නිත්‍ය භටයන් මුළු ගණනින් බ්‍රිගේඩ 191ක්, සාමාන්‍ය ගණනින් අවුරුද්දකට බ්‍රිගේඩ 95½ක්, නැතහොත්, මසකට බ්‍රිගේඩ 8ක් පමණ, මුලසුන් කර ඇත. මීළඟ අවුරුදු තුන තුළ, අපේ හමුදව සතුරු නිත්‍ය භටයන් බ්‍රිගේඩ 300ක් හෝ ඊට වඩා මුල්පිස දැමීම අවශ්‍ය ය. මේ අවුරුද්දේ ජූලි සහ ලබන අවුරුද්දේ ජූනි අතර, සතුරු නිත්‍ය භටයන් බ්‍රිගේඩ 115ක් තරම විනාශ කරන්ට අපි බලාපොරොත්තු වෙමු. මේ මුළු ගණන අපේ විවිධ ක්ෂේත්‍ර හමුද සහ හමුද[3] අතර පංගු කොට බෙද ඇත. නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදව (ජූලි මාසයේදී දැනට ම මුල්පිස දමා ඇති 7ත් ඇතුළු ව) බ්‍රිගේඩ 40ක් පමණ මුල්පිස දැමීම ත් ත්සිනාන් නගරය ද උතුරු චියාංසු, නැගෙනහිරි හෝනාන් සහ උතුරු අන්හ්වෙයි පළාත් වල ලොකු තරමක් ලොකු සහ කුඩා නගර ගණනක් ද ඇල්ලීම ත් උවමනා කරයි. මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදව (ජූලියේදී මුල්පිස දැමූ බ්‍රිගේඩ 2ත්. ඇතුළු ව) බ්‍රිගේඩ 14ක් පමණ මුල්පිස දැමීම ත්, හූපේ, හෝනාන් සහ අන්හ්වෙයි පළාත් වල නගර ගණනක් ඇල්ලීම ත් උවමනා කරයි. වයඹදිග ක්ෂේත්‍ර හමුදව (අගෝස්තුවේදී මුල්පිස දැමූ බ්‍රිගේඩ 1½ ත් ඇතුළු ව) බ්‍රිගේඩ 12ක් පමණ මුල්පිස දැමීම උවමනා කරයි. හ්සූ ශියාං–චියන් සහ චෞ ශී–තී විසින් අණ දෙනු ලබන උතුරු චීනයෙහි සිටින හමුදව (ජූලියේදී මුලසුන් කළ බ්‍රිගේඩ 8 ත් ඇතුළු ව) යෙන් ශී–ශාන් යටතේ සිටින බ්‍රිගේඩ 14 ක් පමණ මුල්පිස දැමීම ත් තායියුආන් නගරය ඇල්ලීම ත් උවමනා කරයි. ඔබ, ලෝ ජුයි–චිං සහ යාං චෙං–චූ විසින් අණ දෙනු ලබන හමුද 2 ත් සමග උචිත ලෙස සම්බන්ධ වී, (යාං චෙං–චූ විසින් ජූලියේදී මුල්පිස දමනලද බ්‍රිගේඩ 1 ත් ඇතුළු ව) වෙයි ලි–හුආං සහ පූ ත්සෝ–යී යටතේ සිටින හමුද කණ්ඩායම් 2ට අයත් බ්‍රිගේඩ 35 ක් පමණ මුල්පිස දැමීම ත්, පීපිං, තියන්සින් සහ ශෙන්යාං නගර හැර, පීපිං–ලියාඕනිං, පීපිං–සුයියුආන්, පීපිං–චෙංතේ සහ පීපිං–පාඕතිං දුම්රියමාර්ග ඔස්සේ පිහිටි සියලු නගර ඇල්ලීම ත් උවමනා කරයි. මේ අරමුණ මුදුන්පත් කිරීමට තිබෙන තීරණාත්මක සාධක නම් යුද්ධව්‍යාපාර වලදී භටකණ්ඩායම් නිසි ලෙස වින්‍යාස කිරීම සහ විධානය කිරීම ත්, සටන් කිරීම සහ විවේක ගැනීම අතර නිසි සමබරතාවක් තිබීම ත් ය. සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස දෙක ඇතුළත හෝ ඊට ටිකක් වැඩි කලක් ඇතුළත, චින්චව් සිට තාංශාන් තෙක් පේළිය ඔස්සේ සිටින සතුරා මුල්පිස දමා, චින්චව්, ශාන්හායිකුආන් සහ තාංශාන් අල්ලාගන්ට ඔබට හැකි වේ නම්, ඔබ සතුරු බ්‍රිගේඩ 18ක් තරම මුල්පිස දැමීමේ කර්තව්‍යය මුදුන්පත් කරනවා ඇත. එසේ කරනු පිණිස, ඔබ දැන්, චාංචුආන්හි සහ ශෙන්යාංහි සිටින සතුරු බලසේනාවන් එහි සිටින්ට ඉඩ හැර, ඔබගේ ප්‍රධාන බලසේනාව මේ පේළියෙහි යොදන්ට සූදනම් විය යුතු ය. ඔබ චින්චව් නුවරට පහර දෙන කල, එය බේරා ගන්ට චාංචුන් නුවරින් සහ ශෙන්යාං නුවරින් එන්ට ඉඩ තිබෙන සතුරු බලසේනාවන් මුල්පිස දමන්ට ද සූදනම් ව සිටින්න. චින්චව්, ශාන්හායිකුආන් සහ තාංශාන් යන නගර තුළ ත්

ලින් පියාඕ, ලෝ ජුං-හුආන් සහ වෙනත් සහෝදරවරුන් වෙත යවනලද මේ විදුලි-සංදේශය සහෝදර මාඕ සේතුං විසින් චීන කොමියුනිස්ට පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය සඳහා කෙටුම්පත් කරනලදී. ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරය සඳහා ඔහු විසින් මෙහි ඉදිරිපත් කරනලද සටන්ව්‍යාපාර සංකල්පය පසුව සම්පූර්ණයෙන් ම ක්‍රියාවේ යොදනු ලැබී ය. යුද්ධව්‍යාපාරයේ ප්‍රතිඵල මෙසේ විය:

(1) සතුරු භටයන් 4,70,000ක් විනාශ කිරීම ද, ඊට ම එකතු ව ඒ වකවනුව තුළ වෙන රණ මණ්ඩල වල ලැබූ ජයග්‍රහණයන් ද නිසා, ගුණාත්මක වශයෙන් වඩා බලවත් මහජන විමුක්ති හමුදව සංඛ්‍යාවෙන් අතින් ද කුඕමින්තාං හමුදවට වඩා බලවත් විය.

(2) ඊසානදිග චීනයේ මුළු භූමිප්‍රදේශය ම නිදහස් කරනු ලැබී ය, පීපිං, තියන්සින් සහ මුළු උතුරු චීනය ම නිදහස් කිරීමට තත්වයෝ ඇති වූහ.

(3) අපේ හමුදව විශාල පරිමාණයේ මුලසුන් කිරීමේ යුද්ධව්‍යාපාර කරන්නට අත්දැකීම් ලබා ගත්තේ ය.

(4) ඊසානදිග චීනය නිදහස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, විමුක්ති යුද්ධය පිණිස තරමක් හොඳ කර්මාන්තමය කඳවුරක් සහිත උපායමාර්ගික වශයෙන් සුරක්ෂිත පසුමුණු ප්‍රදේශයක් දිනා ගනු ලැබී ය; අනුක්‍රමයෙන් ආර්ථික පුනරුත්ථානය දෙසට හැරෙන්නට හිතකර තත්ව පක්ෂයට ත් ජනතාවට ත් ලැබුණි.

ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරය චීන මහජන විමුක්ති යුද්ධයෙහි ශ්‍රේෂ්ඨතම තීරණාත්මක යුද්ධව්‍යාපාර තුනෙන් පළමුවැන්න විය. අනික් දෙක හුආයි-හායි සහ පීපිං-තියන්සින් යුද්ධ-ව්‍යාපාර විය. මාස හතරකුත් දවස් දහනවයක් පැවති මේ ශ්‍රේෂ්ඨ යුද්ධව්‍යාපාර තුනේදී, සතුරාගේ නිත්‍ය භටසේනාවන් ගෙන් ඩිවිසන් (බ්‍රිගේඩ) 144ක් සහ ඔහුගේ නිත්‍ය නො වන භටසේනාවන් ගෙන් ඩිවිසන් 29ක්, නැතහොත් මුළු ගණනින් මිනිසුන් 15,40 000කට වැඩි

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ඒ අසළ ත් සිටින සතුරු බලසේනා එකිනෙකා ගෙන් තනි වී සිටින නිසා ඔවුන්ට පහර දී මුල්පිස දැමීම සාර්ථක වන බව හොඳට ම නිසැක ය; චින්චව් අල්ලාගැනීම ත් සතුරු අතිරේක බලසේනාවන්ට පහර දීම ත් සාර්ථක වීමේ තරමක බලාපොරොත්තුවක් ද ඇත. කෙසේ වෙතත්, ඔබ වාංචුන් නුවරින් සහ ශෙන්යාං නුවරින් එළියට පැනගෙන ආ හැකි සතුරු බලසේනාවන්ට පහර දෙන්ට සූදනම් ව ඔබගේ ප්‍රධාන බලසේනාව ශින්මින් නුවර වෙත සහ එහි උතුරු අසල් පෙදෙසෙහි වින්‍යාස කළොත්, එවිට ඔබ පමණට වඩා ලොකු තර්ජනයක් විය හැකි හෙයින් සතුරා කොහෙත් ම එළියට එන්ට එඩිතර නො වෙනවා ඇත. එක් අතකින්, වාංචුන් නුවර ත් ශෙන්යාං නුවර ත් සිටින සතුරා එළියට නො එන්ට පුළුවනි. අනික් අතින්, ඔබ චින්චව්, ශාන්හායිකුආන් සහ තාංශාන් නගර දෙසට පිටත්කර යවන බලසේනා පමණට වඩා කුඩා විය හැකි හෙයින්, මේ නගර තුනේ ත් ඒ අවට ත් සිටින (බ්‍රිගේඩ 18කින් සමන්විත) සතුරා බාගවිට චින්චව් සහ තාංශාන් නගර තුළට වදින්නට ඉඩ තිබේ; එවිට ඔවුන්ට පහර දීම දුෂ්කර වුව ත් අවශ්‍ය බව ඔබට පෙනී යනවා ඇත, ඊට කාලය සහ ශක්තිය නාස්ති වෙනවා ඇත, එසේ බාගවිට ඔබ අක්‍රියාකාරී තත්වයකට වැටෙන්ට ඉඩ ඇත. මේ හේතු නිසා, වාංචුන් නුවර ත් ශෙන්යාං නුවර ත් සිටින සතුරාට එසේ සිටින්ට ඉඩ හැර, චින්චව්, ශාන්හායිකුආන් සහ තාංශාන් නගර වල සිටින සතුරා කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම වඩා හොඳ වෙනවා ඇත. තවත් කරුණක්: ඔබ සැප්තැම්බරයේ සිට ලබන ජූනි තෙක් දස මස තුළ ලොකු යුද්ධව්‍යාපාර තුනක් කරන්ට ත්, විවේකය පිණිස මාස හතරක් ඉතිරි කරමින්, මුළු ගණන මාස හයක් වන සේ එක් එක් යුද්ධව්‍යාපාරය සඳහා මාස දෙකක් පමණ බැගින් ගත කරන්ට ත්, සූදනම් විය යුතු ය. (පළමුවැනි ලොකු යුද්ධව්‍යාපාරය වන) චින්චව්-ශාන්හායිකුආන්-තාංශාන් යුද්ධව්‍යාපාරය පවතින අතර, වාංචුන් නුවර සහ ශෙන්යාං නුවර සිටින සතුරා චින්චව් බේරාගන්ට තම මුළු ශක්තියෙන් එළියට පැනගෙන ආවොත් (ඔබගේ ප්‍රධාන බලසේනාව ශින්මින් නුවර වෙත නො ව චින්චව් නුවර

ගණනක්, මුල්පිස දමනලදහ. මේ වකවානුව තුළ මහජන විමුක්ති හමුදව වෙන පෙරමුණු වල ද පහරදීම දියත් කොට, සතුරන් විශාල ගණනින් විනාශ කළේ ය. යුද්ධයේ මුල් අවුරුදු දෙක තුළ, මහජන විමුක්ති හමුදව සාමාන්‍ය ගණනින් මසකට සතුරු බ්‍රිගේඩ 8 පමණ බැගින් මුල්පිස දමා තිබුණි. දන් මහජන විමුක්ති හමුදව විසින් විනාශ කළ සතුරු භටකණ්ඩායම් වල ගණන තව දුරට ත් සාමාන්‍ය ගණනින් මසකට 8 ක් නො වී ය, 38ක් විය. මේ ප්‍රධාන යුද්ධව්‍යාපාර තුන ප්‍රති-විප්ලවවාදී සිවිල් යුද්ධය කිරීමට කුඕමින්තාං පක්ෂය විශ්වාසය තබාගෙන සිටි අති දක්ෂ භටකණ්ඩායම් සියල්ල ම පාහේ මුලසුන් කළ තරම් විය; රට පුරා ම විමුක්ති යුද්ධයෙහි ජයග්‍රහණය බෙහෙවින් ඉක්මන් කළේ ය. හුආයි-හායි සහ පිපිං-තියන්සින් යුද්ධව්‍යාපාර ගැන දනගැනීමට, මේ පොතේ 424-27වැනි පිටු වල පළ වන "හුආයි-හායි යුද්ධව්‍යාපාරය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය" යන ලිපිය ත්, 431-36වැනි පිටු වල පළ වන "පිපිං-තියන්සින් යුද්ධව්‍යාපාරය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය" යන ලිපිය ත් බලන්න.

අවට වින්‍යාස කර සිටින නිසා, වෙයි ලි-හුආං චින්චව් බේරා ගන්ට එන්නට එඩිතර වෙනවා ඇත), එවිට, චින්චව්-ශාන්හායිකුආන්-තාංශාන් පේළිය හැර යන්නේ නැති ව ම, එතැනදී ම සතුරු අතිරේක ආධාර බලසේනාවන්ට විශාල-පරිමාණයේ මුලසුන් කිරීමේ ප්‍රහාරයන් දෙන්ට වහා ම පටන්ගෙන, වෙයි ලි-හුආංගේ භටකණ්ඩායම් සියල්ල ම මුල්පිස දැමීමට මහන්සි ගන්ට ඔබට හැකි ය. මෙය ඉතා ම හොඳ තත්වය වෙනවා ඇත. එහෙයින්, ඔබ මතු දක්වන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය:

(1) චින්චව්, ශාන්හායිකුආන් සහ තාංශාන් නගර වලට පහර දී අල්ලාගැනීමට ත් මුළු පේළිය ම ග්‍රහණය කර ගැනීමට ත් ඔබ කරන අධිෂ්ඨානයේදී ස්ථිර වන්න.

(2) ඔබ මීට පෙර කවදාවත් කර නැති තරම් විශාල පරිමාණයකින් මුලසුන් කිරීමේ සටනක් කිරීමට කරන ඔබගේ අධිෂ්ඨානයේදී ස්ථිර වන්න; ඒ කියන්නේ, වෙයි ලි-හුආංගේ හමුදව උදව්වට ආ කල ඒ මුළු හමුදව ම සමග සටන් කරන්ට ඔබ එඩිතර විය යුතු බව ය.

(3) මේ අධිෂ්ඨාන දෙකට එකඟ ව, ඔබගේ සටන්ව්‍යාපාර සැලැස්ම ගැන නැවත කල්පනා කර බලන්න, ඔබගේ මුළු බලසේනාවේ ම (කැමබීම, වෙඩිබෙහෙත්, අළුතෙන් බන්දගන්නා භටයන්, යනාදි) යුද්ධමය අවශ්‍යතාවන් පිරිමසා ගැනීම පිණිස ත් අල්ලාගනු ලබන සෙබළුන් ගැන ක්‍රියා කිරීම පිණිස ත් වැඩපිළිවෙලවල් සකස් කරන්න.

කරුණාකර ඉහත සඳහන් දේ ගැන සලකා බලා ඔබගේ පිළිතුර විදුලි-පණිවිඩ මගින් එවන්න.

II. ඔක්තෝබර 10වැනි ද විදුලිසංදේශය

1. ඔබ චින්චව් නගරයට පහර දෙන්ට පටන් ගන්නා දවසේ සිට, උපක්‍රමික තත්වය කුමකින් කුමක් වේ දෝ හෝ'යි ඉතා අවිනිශ්චිත වන වකවානුවක් ඇති වෙනවා ඇත. ඔබ දවස් දෙකකට හෝ තුනකට වරක් සතුරාගේ තත්වය (චින්චව් නුවර ආරක්ෂා කරන ඔහුගේ බලසේනාවන් පාන විරුද්දකමේ ශක්තිය, හුලුතාඕ නුවරින් සහ චින්ශි නුවරින් ද ශෙන්යාං නුවරින් ද ඔහුට අතිරේක ආධාර බලසේනාවන් ලැබෙන ප්‍රමාණය හා පිළිවෙල, වාංචුන් නුවර සිටින ඔහුගේ භටකණ්ඩායම් විසින් ගන්නට ඉඩ තිබෙන ක්‍රියාමාර්ගය) ද, අපේ ම තත්වය (නගරයට දෙන අපේ ප්‍රහාරය දියුණු වන පිළිවෙල සහ නගරයට පහර දීමේදී හා සතුරු අතිරේක ආධාර බලසේනා පසුබස්වා තබා ගැනීමේදී සිදු වන මරණ සහ තුවාල) ද රේඩියෝ මගින් අප වෙත දනුම් දෙනවා ඇතැ'යි අපි බලාපොරොත්තු වෙමු.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

2. ඔබ කීවාක් මෙන් ම, ඓ වකවනුව තුළ උපක්‍රමික තත්වය ඉතා ම හිතකර ලෙස වර්ධනය වෙන්ට බෙහෙවින් ම ඉඩ තිබේ; ඒ කියන්නේ මෙය යි: චින්චව් නුවර ආරක්ෂා කරමින් සිටින සතුරාගේ බලසේනාවන් පමණක් නො ව, හුලූතාඕ නුවරින් සහ චින්ශි නුවරින් එන ඔහුගේ අතිරේක ආධාර බලසේනාවන් ගෙන් කොටසක් ද, වාංචුන් නුවරින් පළා යන ඔහුගේ බලසේනාවන් ගෙන් සමහරක් හෝ වැඩි ගණනක් ද මුල්පිස දමන්ට ඔබට පුළුවන් වෙනවා ඇත. ශෙන්යාං නුවරින් එන සතුරාගේ අතිරේක ආධාර බලසේනාවන් ඔබ චින්චව් නගරය අත්පත් කරගෙන ඉවර වෙනවා ත් එක්ක ම සහ එසේ ඔවුන් වට කිරීමට ඔබේ බලසේනාවන් මාරු කරන්ට ඔබට හැකි වන විට තාලිං ගංගාවෙන් උතුරට පිහිටි ප්‍රදේශය කරා ඉදිරියට ගමන් කළොත්, එවිට මේ අතිරේක ආධාර බලසේනාවන් ද එසේ ම මුල්පිස දමන්ට පුළුවන් වෙනවා ඇත. මේ සියල්ල සඳහා යතුර තිබෙන්නේ චින්චව් නගරය සතියකින් පමණ ඇල්ලීමට මහන්සි වීමෙහි ය.

3. සතුරු අතිරේක ආධාර බලසේනාවන්ගේ ගමන ඇණහිටවීම පිණිස ඔබගේ හටකණ්ඩායම් විනාාස කිරීම ඔබ චින්චව් නගරයට දෙන ප්‍රහාරය දියුණු වන අන්දම අනුව ත්, නැගෙනහිර සහ බටහිර යන දෙ පැත්තෙන් ම ඔවුන් ඉදිරියට ගමන් කිරීම දියුණු වන අන්දම අනුව ත් තීරණය කරන්න. (ඔබ චින්චව් නගරයට පහර දීගෙන යන අතර, වාංචුන් නුවර වටලනු ලැබ සිටින සතුරා වටලෑම බිඳගෙන එළියට පනින නමුත් අපේ 12වැනි කොලම සහ වෙන බලසේනාවන් අතට අසු වී පොඩිපට්ටම් කරනු ලැබුවොත්, ශෙන්යාං නුවරින් එන සතුරු අතිරේක ආධාර බලසේනාවන් බෙහෙවින් ම අන්දුන්කුන්දුන් වී තරමක් සෙමින් ඉදිරියට ගමන් කරන්ට හෝ නතර වෙන්ට, එසේ ත් නැතහොත් වාංචුන් බලසේනාවන් බේරා ගැනීම පිණිස ආපසු හැරෙන්ට ඉඩ තිබෙන හෙයින් සිදු විය හැකි පරිදි) ශෙන්යාං නුවරින් එන සතුරු අතිරේක ආධාර බලසේනාවන් තරමක් සෙමිහිට ඉදිරියට ගමන් කරන අතර හුලූතාඕ නුවරින් සහ චින්ශි නුවරින් එන සතුරු අතිරේක ආධාර බලසේනාවන් තරමක් ඉක්මනට ඉදිරියට ගමන් කළොත්, පසුව කී අතිරේක ආධාර බලසේනාවන් ගෙන් කොටසක් මුල්පිස දැමීම පිණිස, සියල්ලට පළමුව, ඔවුන්ගේ ඉදිරි ගමන ඇණහිටවීම පිණිස, 4වැනි සහ 11වැනි කොලම් වලට උදව් දෙනු වස් ඔබගේ සාමාන්‍ය රිසව් සේනා යවන්නට ඔබ සූදනම් ව සිටිය යුතු ය. හුලූතාඕ නුවරින් සහ චින්ශි නුවරින් එන සතුරු අතිරේක ආධාර බලසේනාවන් අපේ 4වැනි සහ 11වැනි කොලම් විසින් ද වෙන බලසේනාවන් විසින් ද ගමන් කරන්ට ඉඩ නො දී ඇණහිටවනු ලබතොත් සහ එහෙයින් හෙමින් හෙමින් ඉදිරියට ගමන් කරතොත් හෝ නතර වෙතොත්, වාංචුන් නුවර සිටින සතුරු බලසේනාවන් වටලෑම බිඳගෙන එළියට නො පනිතොත්, ශෙන්යාං නුවරින් එන සතුරු අතිරේක ආධාර බලසේනාවන් තරමක් ඉක්මනට ඉදිරියට

ගමන් කරතොත් සහ, චින්චව් සතුරු බලසේනාවන් ගෙන් වැඩි හරියක් මුල්පිස දමනු ලැබ, නගරය ඇල්ලීම ඔන්න මෙන්න කියා තිබෙතොත්, එවිට, ශෙන්යාං නුවරින් එන සතුරු බලසේනාවන් වට කරනු පිණිස ඔබගේ බලසේනාවන් නියම වේලාවට එහි යවා ඔබට පහසු පිළිවෙලට ඔවුන් මුල්පිස දමන්ට ඔබට හැකි වන සේ, තාලිං ගංගාවට උතුරෙන් පිහිටි ප්‍රදේශය තුළට ගැඹුරට ම ඉදිරියට ගමන් කරන්ට ඔබ ඔවුන්ට ඉඩ හැරිය යුතු ය.

4. ඔබ චින්චව් නගරයෙහි සටන්ව්‍යාපාර කෙරෙහි ඔබගේ අවධානය යොමු කොට, හැකි තරම් ඉක්මනට මේ නගරය ඇල්ලීමට මහන්සි ගත යුතු ය. සෙසු අරමුණු එකක් වත් අත්පත් කර නො ගෙන, චින්චව් නගරය පමණක් ම අල්ලා ගත්තත්, ඔබ මුලපිරුම දිනා ගත්තා වෙනවා ඇත, එය ම ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයක් වෙනවා ඇත. ඔබ ඉහත සඳහන් කරුණු සියල්ල ම කෙරෙහි යුතු සේ අවධානය යොමු කරනවා ඇතැ'යි බලාපොරොත්තු වනු ලැබේ. විශේෂයෙන් චින්චව් සඳහා කරන සටනේ මුල් දවස් කීපයේදී, නැගෙනහිර සහ බටහිර යන දෙකෙන් ම සතුරු අතිරේක ආධාර බලසේනාවන් කිසි ම ලොකු ක්‍රියාවක් නො කරනවා ඇත, ඔබ චින්චව් පෙරමුණේ සටන්ව්‍යාපාර කෙරෙහි ඔබගේ සියලු ම ශක්තීන් යොමු කළ යුතු ය.

ස ට හ න්

[1] ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරය 1948 සැප්තැම්බර් 12 ත් නොවැම්බර් 2 ත් අතර කාලය තුළ ඊසානදිග මහජන විමුක්ති හමුදව විසින් ලියාඕනිං පළාතේ බටහිරි කොටසෙහි ද, ශෙන්යාං-චාංචුන් ප්‍රදේශයෙහි ද කළ අතිවිශාල යුද්ධව්‍යාපාරයක් විය. යුද්ධව්‍යාපාරය අරඹන දවස් වල, ඊසානදිග චීනයෙහි සිටි කුඕමින්තාං බලසේනාවන්ගේ මුළු ශක්තිය බළකාය 14කින් හෙවත් ඩිවිසන් 44කින් සැදුණු හමුද 4කින් සමන්විත විය. මේ බලසේනාවෝ ඔවුන්ගේ පේළි කොට කරගෙන, එකිනෙකින් තනි වූ කොටස් තුනක, එනම් චාංචුන්, ශෙන්යාං සහ චින්චව් යන තුන් තැන, බලකොටු බැඳගෙන ආරක්ෂා වී සිටියහ. ඊසානදිග සිටි සතුරු හටකණ්ඩායම සම්පූර්ණයෙන් ම මුල්පිස දැමීමේ ද මුළු ඊසානදිග ම ඉක්මනින් නිදහස් කිරීමේ ද අරමුණ ඇතිව, මේ ප්‍රාන්තයේ මහජන විමුක්ති හමුදව, කොලම් 12ක් සහ කාලතුවක්කු කොලම් 1ක් සිටි ප්‍රධාන බලසේනාවකුත් ප්‍රාන්තික සන්නද්ධ බලසේනා ත් ඇතිව, ඒ කියන්නේ මුළු ගණනින් ඩිවිසන් 53ක් හෝ මිනිසුන් 7,00,000ට වඩා ඇතිව, ප්‍රාදේශික ජනතාව අතර පුළුල් බහුජන සමූහයන්ගේ අනුබලය ලබමින්, 1948 සැප්තැම්බරයේදී ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරය පටන් ගත්තේ ය. පිපිං-ලියාඕනිං දුම්රිය මාර්ගයේ පිහිටි චින්චව් නගරය ඊසානදිග සහ උතුරු චීනය අතර උපායමාර්ගික පුරුක විය. චින්චව් කොටස රකිමින් සිටි සතුරු බලසේනාවෝ, කුඕමින්තාං පක්ෂයේ ඊසානදිග "පල්හොරුන් මඩින" මූලස්ථානයේ නියෝජ්‍ය ප්‍රධාන අණදෙන්නා වූ ෆාන් හාන්-චියේ යටතේ සිටි මිනිසුන් 100,000කට වැඩි ගණනකින් යුත් ඩිවිසන් 8කින් සමන්විත වූහ. චින්චව් නගරය ඇල්ලීම ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරය සර්ථක වීමට යතුර විය. සහෝදර මාඕ සේතුංගේ නිර්දේශ උඩ ක්‍රියා කරමින්, ඊසානදිග මහජන විමුක්ති හමුදව චාංචුන් නුවරට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විරුද්ධ ව වටලාගෙන සිටීමෙ සටන්ව්‍යාපාර දිගට ම ගෙන යාම පිණිස කොලම් 1ක් සහ ස්වාධීන ඩිවිසන් 7ක් යෙදී ය; චින්චව් නුවර වට කර පහර දීම පිණිස කොලම් 6 ක්, කාලතුවක්කු කොලම් 1 ක් සහ ටැන්කි බැටැලියන් 1ක් යෙදී ය; චින්චව් නුවරට සහනය පිණිස සතුරා විසින් චින්ශි නුවරින් සහ හුලුතාඕ නුවරින් ද ශෙන්යාං නුවරින් ද එවන්ට ඉඩ තිබුණු අතිරේක ආධාර බලසේනාවන්ට හරස් කැපීම පිණිස හෙයිශාන්-තහුශාන්-වාංවූ කොටසෙහි කොලම් 3ක් සමග, චින්චව් නුවරට නිරිතදිගින් තාශාන්-කාඕචියාඕ කොටසෙහි නතර කළ කොලම් 2ක් යෙදී ය. චින්චව් ප්‍රදේශයෙහි සටන් කිරීම සැප්තැම්බර් 12වැනි ද ආරම්භ විය. අපේ හමුදාව අයිශියන් ගැනීමෙන් පසු චින්චව් නගරය අවට හරියේ සතුරා පිසදමමින් සිටියදී, චියාං කායි-ශෙක් පුද්ගලික ව ම සටන්ව්‍යාපාර බාර ගැනීම පිණිස කඩ්-මුඩියේ ගුවනින් ඊසානදිගට අවුත්, පීපිං-ලියාඕනිං දුම්රියමාර්ගයේ පිහිටි උතුරු චීන "පල්හොරුන් මඩින" මූලස්ථානයෙන් ඩිවිසන් 5ක් ද ශාන්තුං පළාතෙන් ඩිවිසන් 2ක් ද චින්ශි නුවර සිටි ඩිවිසන් 4ට එකතු වීම පිණිස හදිස්සියේ ම කැඳවී ය; මෙ ඩිවිසන් 11 ම ඔක්තෝබර 10වැනි ද තාශාන් නුවර අප සිටි තැන් වලට දරුණු පහරක් දෙන්ට පටන්ගත් නමුත් බිඳගෙන රිංගන්ට අසමත් විය. ඒ අතර, චින්චව් නගරය බේරා ගන්ට ශෙන්යාං නුවරින් නික්ම ආ ලියාඕ යාඕ-ශියාං යටතේ සිටි ඩිවිසන් 11කින් සහ අශ්වාරෝහකසේනා බ්‍රිගේඩ 3කින් යුත් කුඕමින්තාං 9වැනි හමුදාව හෙයිශාන් සහ තාහුශාන් නගර වලට ඊසාන දිගදී අපේ හමුදාව විසින් හරස් කපනු ලැබී ය. අපේ හමුදාව ඔක්තෝබර් 14වැනි ද චින්චව් නුවරට වැරෙන් පහර දීම ආරම්භ කළේ ය; පැය තිස්එකක් දරුණු ලෙස සටන් කළ පසු, මිනිසුන් 100,000කට වැඩි ගණනක් සිටි නගරාරක්ෂක සතුරු බලසේනා සම්පූර්ණයෙන් මුල්පිස දැමී ය, ඊසානදිග "පල්හොරුන් මඩින" මූලස්ථානයේ නියෝජ්‍ය ප්‍රධාන අණ-දෙන්නා වූ පාන් හාන්-චියේ ද, 6වැනි හමුදාවෙ අණදෙන්නා වූ ලූ චුන්-චුආන් ද අල්ලා-ගත්තේ ය. චින්චව් නගරය මුදගැනීම නිසා චාංචුන් නුවර සිටි සතුරු බලසේනාවන් ගෙන් කොටසක් කුඕමින්තාං පක්ෂයට විරුද්ධ ව කැරලි ගසන්ට ද, ඉතිරි කොටස යටත් වෙන්ට ද පෙළඹුණේ ය. එවිට ඊසානදිග සිටි කුඕමින්තාං භටකණ්ඩායම් සම්පූර්ණයෙන් ම බිඳ වැටීම නියත දෙයක් විය. එහෙත් චියාං කායි-ශෙක්, චින්චව් නුවර ආපසු අල්ලාගැනීමට ත් ඊසානදිගු සහ උතුරු චීනය අතර ගමනාගමනමාර්ගය නැවත විවෘත කර ගැනීමට ත් එතෙක් ම සිහින දකිමින්, චින්චව් නුවර දෙසට ඉදිරියට යන ගමන දිගට ම යන ලෙස ලියාඕ යාඕ-ශියාං යටතේ සිටි හමුදාවට දැඩි අණ දුන්නේ ය. චින්චව් නුවර ගැනීමෙන් පසු, මහජන විමුක්ති හමුදාව වහා ම ඊසානදිගට ආපසු හැරී, උතුරෙහි හෙයිශාන් නුවර සිට ද දකුණෙහි තාහුශාන් නුවර සිට ද ලියාඕගේ හමුදාව වට කරමින් ඊට ළං වූයේ ය. ඔක්තෝබර 26වැනි ද මහජන විමුක්ති හමුදාව හෙයිශාන්-තාහුශාන්-ශින්මින් කොටසේදී සතුරා වටකරන්ට සමත් විය; දවස් දෙකකුත් එක් රැයක් පැවති දැඩි සටනින් පසු, අපේ හමුදාව මිනිසුන් 100,000කට වඩා සම්පූර්ණයෙන් මුල්පිස දැම්මේ ය, හමුදා අණදෙන්නා වූ ලියාඕ යාඕ-ශියාං ද බළකාය අණදෙන්නන් වූ ලි තාඕ, ශියාං පෙං-චූ සහ චෙං තිං-චී ද අල්ලා ගත්තේ ය. අපේ හමුදාව වේගයෙන් මෙ ජයග්‍රහණය ලුහුබඳිමින්, නොවැම්බර් 2වැනි ද ශෙන්යාං නගරය ත් යිංකව් නගරය ත් නිදහස් කරමින්, සතුරු භටයන් 1,49,000කට වඩා මුල්පිස දැමී ය. මුළු ඊසාන-දිග ම එසේ නිදහස් කරනු ලැබී ය. මෙ යුද්ධව්‍යාපාරයේදී සතුරු භටයෝ මුළු ගණනින් 4,70,000කට වඩා මුල්පිස දමනලදහ.

[2]ඒ කාලයේ තක්සේරුව වූයේ මුළු කුඕමින්තාං හමුදාව ම අවුරුදු පහකදී පමණ මුල්පිස දමන්ට පුළුවන් වන බව ය. තක්සේරු කර තිබුණු කාලය පසුව අවුරුදු තුන හමාරකට අඩු කරනු ලැබී ය. මෙ පොතේ 428-30වැනි පිටු වල පළවන "චීනයේ යුද්ධ තත්වයේ බාරදූර වෙනස්වීම" නමැති ලිපිය බලන්න.

[3]1948, නොවැම්බර් 1වැනි ද, චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය මධ්‍යම කාරකසභාවේ දේශපාලන බ්‍යුරෝවේ සැප්තැම්බර්

රැස්වීමේදී කළ තීරණයන් අනුව, ලොකු උපායමාර්ගික ප්‍රදේශ වල සිටි සියලු භටකණ්ඩායම් ක්ෂේත්‍ර, ප්‍රාන්තීය සහ ගොරිල්ලා බලසේනා බවට වර්ග කළේ ය. ක්ෂේත්‍ර බලසේනා ක්ෂේත්‍ර හමුදා බවට සංවිධානය කරනු ලැබී ය. ක්ෂේත්‍ර හමුදාවක් හමුදාවන් ගෙන් ද, හමුදාවක් (මුලදී කොලම් ය'යි කියනලද) බළකාය වලින් ද, බළකායක් ඩිවිසන් වලින් ද, ඩිවිසනයක් රෙජමේන්තු වලින් ද සැදුණේ ය. ඒ ඒ ක්ෂේත්‍ර හමුදාව නතර කර සිටි ප්‍රදේශය අනුව, ක්ෂේත්‍ර හමුදා චීන මහජන විමුක්ති හමුදාවේ වයඹදිග ක්ෂේත්‍ර හමුදාව, මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදාව, නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදාව, ඊසානදිග ක්ෂේත්‍ර හමුදාව සහ උතුරු චීන ක්ෂේත්‍ර හමුදාව ය'යි නම් කරනු ලැබී ය. එක් එක් ක්ෂේත්‍ර හමුදාවේ සිටි හමුදා, බළකාය සහ ඩිවිසන් ගණන එක් එක් ලොකු උපායමාර්ගික ප්‍රදේශයෙහි ඇත්ත වශයෙන් පැවති තත්වයන්ට අනුව වෙනස් විය. පසුව, වයඹදිග ක්ෂේත්‍ර හමුදාව හමුදා 2කින් සමන්විත පළමුවැනි ක්ෂේත්‍ර හමුදාව වශයෙන් ද, මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදාව හමුදා 3කින් සමන්විත දෙවැනි ක්ෂේත්‍ර හමුදාව වශයෙන් ද, නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදාව හමුදා 4කින් සමන්විත තුන්වැනි ක්ෂේත්‍ර හමුදාව වශයෙන් ද, ඊසානදිග ක්ෂේත්‍ර හමුදාව හමුදා 4කින් සමන්විත සිව්වැනි ක්ෂේත්‍ර හමුදාව වශයෙන් ද, නැවත නම් කරනු ලැබී ය. උතුරු චීන ක්ෂේත්‍ර හමුදාව තැනූ හමුදා 3 කෙළින් ම චීන මහජන විමුක්ති හමුදාවේ ප්‍රධාන මූලස්ථානයේ විධානය යටතේ තබනලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හුආයි-හායි යුද්ධව්‍යාපාරය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය

1948, ඔක්තෝබර 11

හුආයි-ආයි යුද්ධව්‍යාපාරය[1] සඳහා සේනා වින්‍යාසයන් ගැන ඔබගේ කල්පනාවට භාජන වීම පිණිස කරුණු කිහිපයක් මෙහි ඇත.

1. මේ යුද්ධව්‍යාපාරයේ පළමුවැනි අවස්ථාවේදී, ප්‍රධාන කර්තව්‍යය වන්නේ හුආං පෝ-තාඕගේ හමුදාව මුල්පිස දැමීමට ත්, මැදින් කඩා බිඳගෙන එළියට පැනීමට ත්, ශීනාන්වෙන්, මහ ඇළ දුම්රියපොළ, ත්සාඕපාචි, යීශියන්, ත්සාඕවූආං, ලින්චෙං, හාන්වූආං, ශුයාං, පීශියන්, තාන්චෙං, තායිඅර්චුආං, ලින්යී යනාදි නගර ඇල්ලීමට ත් බලසේනාවන් ඒකරාශි කිරීම ය. මේ අරමුණු මුදුන්පත් කිරීම සඳහා, ඔබ එක් එක් සතුරු ඩිවිසනය මුල්පිස දැමීම පිණිස කොලම් දෙක බැගින් යෙදිය යුතු ය; ඒ කියන්නේ, සතුරාගේ 25වැනි, 63වැනි සහ 64වැනි ඩිවිසන එකිනෙකින් කපා වෙන් කොට මුල්පිස දැමීම පිණිස කොලම් හයක් හෝ හතක් යෙදිය යුතු බව ය. සතුරු අතිරේක ආධාර බලසේනාවන්ට එන්ට නො දී වළකාගෙන සිටීමට සහ ඒවාට පහර දීම පිණිස කොලම් පහක් හෝ හයක් යොදන්න. චියු චිං-චුආන් සහ ලී මී යටතේ සිටින හමුදා දෙක අතිරේක ආධාර බලසේනා වශයෙන් සම්පූර්ණ ශක්තියෙන් යුතු ව නැගෙනහිරට ගමන් කරන්ට එඩිතර නො වන සේ උතුරු දෙසින් හ්සූචව් නුවරට තර්ජනය කරනු වස් ලින්චෙංහි සහ හාන්චුආංහි ලී මී යටතේ සිටින එක් බ්‍රිගේඩය මුලසුන් කර දමා, ඒ සුළු නගර දෙක අල්ලාගන්ට වෙර දරනු පිණිස කොලම් එකක් හෝ දෙකක් යොදන්න. චියු චිං-චුආන්ගේ හමුදාවෙන් කොටසක් බැඳ තබනු සඳහා දුම්රියමාර්ගයේ හ්සූචව්-ශාංචියු කොටසට අංශයකින් පහරක් දීම පිණිස එක් කොලමක් සහ නිරිතදිග ශාන්ටුං පළාතේ

නැගෙනහිර චීන සහ මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදාවන්ට සහ ඒ ප්‍රදේශ දෙකේ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ බියුරෝවලට යවනලද මේ විදුලිසංදේශය පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය සඳහා සහෝදර මාඕ සේතුං විසින් කෙටුම්පත් කරනලදී. හුආයි-හායි යුද්ධව්‍යාපාරය චීන මහජන විමුක්ති යුද්ධයෙහි තීරණාත්මක ශ්‍රේෂ්ඨ යුද්ධව්‍යාපාර තුන අතුරෙන් එකක් විය. මේ යුද්ධව්‍යාපාරය කරනලද්දේ නැගෙනහිර චීන සහ මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදාවන් ද නැගෙනහිර චීන සහ මධ්‍යම තැනි ප්‍රදේශ වල ප්‍රාන්තීය භටසේනාවන් ද එකතු වී ය. මේ යුද්ධව්‍යාපාරයේදී කුඕමින්තාං භටයෝ 5,55,000කට

ප්‍රාන්තීය සේනාව යොදන්න (සුන් යුආන්-ලියාං යටතේ සිටින සතුරු ඩිවිසන් තුනක් නැගෙනහිරට ගමන් කරන්ට සූදානම් ව සිටින නිසා, ලියු පෝ-චෙං, චෙන් යී සහ තෙං ශියාඕ-පිං චෙංචව්-හ්සූචව් මාර්ගයට පහර දී, එසේ සුන් යුආන්-ලියාංගේ හමුදාව බැඳ තබනු පිණිස ඔවුන්ගේ භටකණ්ඩායම් වහා ම යොදනවා ඇතැ'යි බලාපොරොත්තු වනු ලැබේ). ලී මීගේ හමුදාවට එන්ට නො දී වළකාගෙන සිටීම සඳහා සුචියන්-සුයිනිං-ලිංපී ප්‍රදේශයෙහි ක්‍රියා කරන පිණිස කොලම් එකක් හෝ දෙකක් යොදන්න. මේ සේනා වින්‍යාසයන්ගේ තේරුම හුආං පෝ-තාඕගේ හමුදාවේ ඩිවිසන් තුන මුලසුන් කර දැමීමේ අරමුණ මුදුන්පත් කර ගැනීමට හැකි වෙන්ට පෙර, අපේ මුළු බලයෙන් අඩකට වඩා චියු චිං-චුආන් සහ ලී මී යටතේ සිටින හමුදා දෙකෙන් කොටසක් බැඳ තිබීම, අවහිර කිරීම සහ විනාශ කිරීම පිණිස ඒ හමුදා දෙකට විරුද්ධ ව යෙදිය යුතු බව ය. මේ සේනා-වින්‍යාසයෝ, බොහෝ දුරට, පසුගිය සැප්තැම්බරයෙහි ත්සිනාන් නුවර අල්ලාගෙන සතුරාගේ අතිරේක ආධාර බලසේනාවන්ට පහරදීමට කළ සේනා-වින්‍යාසයන්ට සමාන විය යුත්තාහ;[2] නො එසේ නම් හුආං පෝ-තාඕගේ හමුදාවේ ඩිවිසන් තුන මුලසුන් කිරීමේ අරමුණ මුදුන්පත් කරන්ට කොහෙත් ම බැරි වෙනවා ඇත. ඔබ යුද්ධව්‍යාපාරයේ ආරම්භයට සති දෙකකට තුනකට පසු එහි පළමුවැනි අවස්ථාව නිමවන්ට මහන්සි ගත යුතු ය.

2. දෙවැනි අවස්ථාවේදී, හායිචව්, ශින්පූ, ලියන්යුන්කාං සහ කුආන්යුන් යන සුළු නගර වල සිටින සතුරාට පහර දී, ඔහු මුල්පිස දමා, මේ සුළු නගර ඇල්ලීම පිණිස කොලම් පහක් පමණ යොදන්න. ඒ වන විට සතුරාගේ 54වැනි සහ 32වැනි ඩිවිසන ත්සින්තාඕ නුවර සිට හායිචව්-ශින්පූ-ලියන්යුන්කාං ප්‍රදේශයට මුහුදු මගින් ප්‍රවාහණය කරන්ට ඉඩ ඇතැ'යි ගණන් බලා තිබේ.[3] මුළු ගණනින්, දැනට ම එහි සිටින එක් ඩිවිසනය ත් ඇතුළු ව, සතුරු ඩිවිසන් තුනක් ඒ ප්‍රදේශයෙහි සිටිනවා ඇත; එහෙයින් අපි ඔවුන්ට පහර දෙනු පිණිස කොලම් පහක් යෙදිය යුත්තෙමු, ඉතිරි බලසේනා (අපේ ප්‍රධාන ශක්තිය) චියු චිං-චුආන් සහ ලී මී යටතේ සිටින හමුදා දෙක බැඳ තිබීමට යෙදිය යුත්තෙමු; යළි ත් එය කළ යුත්තේ ද ත්සිනාන් නුවර ඇල්ලීම ත් සතුරාගේ අතිරේක ආධාර බලසේනාවන්ට පහර දීම ත් පිණිස සැප්තැම්බරයේදී කළ සේනා-වින්‍යාසයන්ට පදනම වූ මූලධර්මය උඩ ය. ඔබ මේ අවස්ථාව ද සති දෙකකින් තුනකින් නිමවන්ට මහන්සි ගත යුතු ය.

වැඩි ගණනක් මුල්පිස දමනලදහ. සහෝදර මාඕ සේතුං විසින් මේ විදුලිසංදේශයෙහි ඉදිරිපත් කරනලද සටන්ව්‍යාපාර සංකල්පය සම්පූර්ණ ජයග්‍රහණයට මං පෑදුවේ ය; ඇත්ත වශයෙන්, යුද්ධව්‍යාපාරය බලාපොරොත්තු වූණාට වඩා සන්සුන් ලෙස කෙරීගෙන ගියේ ය, එහෙයින් ජයග්‍රහණය වඩා ඉක්මන් සහ වඩා විශාල විය. මේ යුද්ධව්‍යාපාරයට පසු, ප්‍රතිගාමී කුඕමින්තාං ආණ්ඩුවේ අගනුවර වූ නැන්කිං නගරය මහජන විමුක්ති හමුදාවේ තර්ජනයට කෙළින් ම භාජන විය. හුආයි-හායි යුද්ධව්‍යාපාරය 1949, ජනවාරි 10වැනි දින නිම විය; ජනවාරි 21වැනි ද චියාං කායි-ශෙක් ඔහු "විශ්‍රාම ගන්නා බව" ප්‍රකාශ කළේ ය; ඊට පසු, නැන්කිං නුවර සිටි ප්‍රතිගාමී කුඕමින්තාං පාලක කල්ලිය කැඩී බිඳී ගියේ ය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

3. තුන්වැනි අවස්ථාවේදී, සටන හුආයියින් සහ හුආයි–ආන් වටෙ කරනු ලැබේ ය'යි සිතන්ට ඉඩ තිබේ. ඒ කාලය වන විට සතුරා ඔහුගේ ශක්තිය ඩිවිසන් එකකින් පමණ වැඩි කරගෙන තිබෙනවා ඇත (යෙන්තායි නුවර සිටින ප්‍රතිසංවිධානය කළ 8වැනි ඩිවිසනය දකුණට එවීමට නැව් නංවනු ලබමින් ඇත); එහෙයින් අපි යළිත් පහර දෙන බලසේනාව වශයෙන් කොලම් පහක් පමණ යොදන අතර, අපේ ප්‍රධාන බලසේනාවේ ඉතිරි කොටස සතුරාගේ අතිරේක ආධාර බලසේනාවන්ට පහර දී, ඔවුන්ට එන්ට නො දී වළකාගෙන සිටිනු පිණිස යෙදීමට සූදනම් ව සිටිය යුත්තෙමු. මේ අවස්ථාව සඳහා ද සති දෙකක් තුනක් ගත වෙනවා ඇත.

මේ අවස්ථා තුන මාස එක හමාරක් හෝ දෙකක් පමණ ගන්නවා ඇත.

4. ඔබ මාස දෙකක්, නොවැම්බර් සහ දෙසැම්බර්, තුළ හුආයි–හායි යුද්ධව්‍යාපාරය සම්පූර්ණ කළ යුතු ව ඇත. ලබන ජනවාරියේදී ඔබගේ බලසේනාවන්ට විවේක දී ඔවුන් තහවුරු කරන්න. මාර්තුවේ සිට ජූලි තෙක් ඔබ යැංසී ගඟ දිගට තැන් කරා සතුරා එළවා දමනු පිණිස ලියු පෝ–චෙං සහ තෙං ශියාඕ–පිං සමග උචිත ලෙස සම්බන්ධ වී සටන් කරනවා ඇත; සතුරා ඒ තැන් වල අරක් ගන්නවා ඇත. සරත් සෘතුව වන විට ඔබගේ ප්‍රධාන බලසේනාව බාගවිට යැංසී ගඟ තරණය කරන්ට සටන් කරනවා ඇත.

LIBERATIONBASE

ස ට හ න්

[1]හුආයි-හායි යුද්ධව්‍යාපාරය චියාංසු, ශාන්තුං, අන්හ්වෙයි සහ හෝනාන් යන පළාත් වල, හ්සූචව් නුවර කේන්ද්‍රය කොට ගෙන, නැගෙනහිරින් හායිචව් නුවර තෙක් ද, බටහිරින් ශාංචියු නුවර තෙක් ද, උතුරෙන් ලින්චෙං (දූන් ශුචෙචෙං) නුවර තෙක් ද, දකුණෙන් හුආයි ගඟ තෙක් ද පැතුරුණු සුවිශාල භූමිප්‍රදේශයක් පුරා මහජන විමුක්ති හමුදව විසින් කරනලද තීරණාත්මක යුද්ධව්‍යාපාරයක් විය. මේ රණ මණ්ඩලයෙහි එක්රැස් කර සිටි කුඕමින්තාං බලසේනාවෝ හමුද 7කින් සහ අස්වැසීමේ කලාප තුනක හටකණ්ඩායම් වලින් සමන්විත වූහ — එනම්, (පිළිවෙලින් හ්සූචව් නුවර පිහිටුවා තිබුණු කුඕමින්තාං පක්ෂයේ "පල්හොරුන් මර්දන" මූලස්ථානයේ අණදෙන්නා සහ නියෝජ්‍ය අණදෙන්නා වූ) ලියු චී සහ තූ යූ–මිං යටතේ පැවති අස්වැසීමේ කලාප තුනේ හමුද 4 සහ හටසේනා ත්, පසු ව අතිරේක ආධාර බලසේනාවක් වශයෙන් මධ්‍ය චීනයේ සිට එහි යවනලද හුආං වෙයි යටතේ සිටි හමුදව ත් ය. මහජන විමුක්ති හමුදවේ පැත්තෙන්, 6,00,000කට වැඩි ගණනකින් ශක්තිමත් බලසේනාවක් මේ යුද්ධව්‍යාපාරයට සහභාගි විය; නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදවෙන් කොලම් 16ක් ද, මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදවෙන් කොලම් 7ක් ද, නැගෙනහිර චීන යුද්ධ ප්‍රදේශයෙන්, මධ්‍යම තැනි යුද්ධ ප්‍රදේශයෙන් සහ (එකල උතුරු චීන යුද්ධ ප්‍රදේශයේ කොටසක් වූ) හෝපෙයි-ශාන්තුං-හෝනාන් යුද්ධ ප්‍රදේශයෙන් ප්‍රාන්තීය සන්නද්ධ හමුදවෝ ද ඊට ඇතුළත් වූහ. මේ යුද්ධව්‍යාපාරය 1948, නොවැම්බර් 6වැනි ද සිට 1949, ජනවාරි 10වැනි ද තෙක් දින හැටපහක් පැවතුණේ ය; (කැරලි ගසා මේ පැත්තට ආ ඩිවිසන් 4 1/2ක් ද ඇතුළු ව), මිනිසුන් 5,55,000කින් සැදුණු, කුඕමින්තාං පක්ෂයේ අති දක්ෂ බලසේනාවන්ට අයත් බළකාය 22ක් හෙවත් ඩිවිසන් 56ක් සම්පූර්ණයෙන් ම මුල්පිස දමනු ලැබී ය, (නැන්කිං නුවරින් ආ අතිරේක

ආධාර බලසේනාවන් වූ) ලියු ජූ-මිං සහ ලී යෙන්-නියන් යටතේ සිටි හමුද 2ක් පළවා හරිනු ලැබී ය. යුද්ධව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වශයෙන්, යැංසී ගඟට උතුරෙන් පිහිටි නැගෙනහිර චීනයේ කොටස් සහ මධ්‍යම තැනි ප්‍රදේශ මුළුමනින් ම මෙන් නිදහස් කරනලදී. යුද්ධව්‍යාපාරය අවස්ථා තුනකින් ඇති විය. නොවැම්බර් 6 සිට 22 තෙක් වූ පළමුවැනි අවස්ථාවේදී, නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදව, මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදව සමග උචිත ලෙස සම්බන්ධ වී, හ්සූචව් නුවරට නැගෙනහිරින් ශිනාන්චෙන්-නියන්චුආං කොටසෙහි හුආං පෝ-තාඕ යටතේ සිටි හමුදව වටකොට මුල්පිස දමා, හුආං පෝ-තාඕ ද මරා, නියන්චුආං නුවරට නැගෙනහිරින් ලුංහායි දුම්රියමග දෙ පසේ ද, තියන්සින්-පූකව් දුම්රියමගේ හ්සූචව්-පෙංපූ කොටස දෙ පසේ ද, හ්සූචව් නුවරට බටහිරින් සහ උතුරෙන් ද පිහිටි විශාල භූමිප්‍රදේශ නිදහස් කළේ ය. තායිඅර්චුආං-ත්සාඕචුආං කොටසෙහි, කුඕමින්තාං පක්ෂයේ 3වැනි අස්වැසීමේ කලාපයේ, මුළු ගණනින් මිනිසුන් 23,000කට වැඩි ඩිවිසන් 3 1/2ක් කැරලි ගසා අපේ පැත්තට ආවේ ය. නොවැම්බර් 23වැනි ද සිට දෙසැම්බර් 15වැනි ද තෙක් පැවති දෙවැනි අවස්ථාවේදී, මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදව, නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදවේ ප්‍රධාන බලසේනාව සමග උචිත ලෙස සම්බන්ධ වී, සූශියන් නුවරට නිරිතදිගින්, ශුආංතුයිචී නුවරදී සහ ඒ අවට ප්‍රදේශයේදී හුආං වෙයි යටතේ සිටි හමුදව වටකොට මුල්පිස දමා, හමුදවේ අණදෙන්නා සහ නියෝජ්‍ය අණදෙන්නා වූ හුආං වෙයි සහ වූ ශාඕ-චෞ ද අල්ලා ගත්තේ ය; මේ හමුදවේ ඩිවිසන් 1ක් කැරලි ගසා අපේ පැත්තට ආවේ ය. ඒ අතර ම, අපේ බලසේනාවෝ හ්සූචව් නුවර සිට බටහිර දෙසට පළා යමින් සිටි සූන් යුආන්-ලියාං යටතේ වූ හමුදව ද මුල්පිස දමූහ. සූන් යුආන්-ලියාං පමණක් ගැලවී ගියේ ය. 1949, ජනවාරි 6වැනි ද සිට 10වැනි ද තෙක් වූ තුන්වැනි අවස්ථාවේදී, යුංචෙං නුවරට ඊසානදිගින්, චිංලුංචි-චෙන්කුආන්චුආං කොටසේදී, නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදව, මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදව සමග උචිත ලෙස සම්බන්ධ වී, තූ යූ-මිංගේ පුද්ගලික විධානය යටතේ පිළිවෙලින් චියූ චිං-චුආන් සහ ලී මී විසින් අණදෙනලද්දවූ ද, හ්සූචව් නුවර සිට බටහිර දෙසට පළා යමින් සිටියා වූ ද කුඕමින්තාං හමුද 2ක් වටකොට මුලසුන් කළේ ය. තූ යූ-මිං අල්ලාගනු ලැබී ය, චියූ චිං-චුආන් මරනු ලැබී ය, ලී මී යන්තම් ගැලවී ගියේ ය. මෙය ශ්‍රේෂ්ඨ හුආයි-හායි යුද්ධව්‍යාපාරයේ සාර්ථක අවසානය සලකුණු කළේ ය.

[2]"ත්සිනාන් නුවර අල්ලාගෙන සතුරාගේ අතිරේක ආධාර බලසේනාවන්ට පහර දීම" යන්නෙන් සඳහන් වන්නේ 1948 සැප්තැම්බර් මැදදී ත්සිනාන් යුද්ධව්‍යාපාරයේදී මහජන විමුක්ති හමුදව විසින් යොදනලද උපක්‍රමය යි. ශාන්තුං පළාතේ කුඕමින්තාං පක්ෂය සතු යුද්ධෝපායමාර්ගය අතින් වැදගත් තැනක් වූ ත්සිනාන් නුවර කුඕමින්තාං 2වැනි අස්වැසීමේ කලාපයේ 1,10,000කට වැඩි ගණනක් හටයන් විසින් ගැරිසන් කර තිබුණි. ඊට අමතර ව, හ්සූචව් ප්‍රදේශයෙහි වින්‍යාස කොට සිටි, 1,70,000ක් පමණ හටයන් ගෙන් යුක්, කුඕමින්තාං ප්‍රධාන බලසේනාවන්ට අයත් බ්‍රිගේඩ 23ක් ත්සිනාන් නුවර මුදගන්ට උතුරට ගමන් කිරීමට සූදනම් ව සිටියේ ය. අපේ නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදව නගරයට පහර දෙන්ට කොලම් 7කින් යුත් කණ්ඩායමක් ද, සතුරාගේ අතිරේක ආධාර බලසේනාවන්ට පහර දෙන්ට කොලම් 8කින් යුක් තවත් කණ්ඩායමක් ද සකස් කළේ ය. ත්සිනාන් නුවරට වැරෙන් පහර දීම 1948, සැප්තැම්බර් 16වැනි ද සවස ආරම්භ විය. දිවා රෑ අටක් දිගට ම සටන් කළ පසු, සැප්තැම්බර් 24වැනි ද, සතුරු ගැරිසන් හමුදව සම්පූර්ණයෙන් ම මුලසුන් කර දමනලදී (එක් බළකායක් කැරලි ගසා අපේ පැත්තට ආවේ ය), කුඕමින්තාං 2වැනි අස්වැසීමේ කලාපයේ අණදෙන්නා වූ වෑං යාඕ-වූ අල්ලාගනු ලැබී ය. අපේ බලසේනාවන් එතරම් වේගයෙන් ත්සිනාන් ගත් හෙයින්, හ්සූචව් නුවර සිටි සතුරා ත්සිනාන් නුවර බේරා ගැනීම පිණිස උතුරට ගමන් කරන්ට එඩිතර නො වී ය.

[3]ඇත්ත වශයෙන්, මේ සතුරු ඩිවිසන් 2 එන්නට එඩිතර නො වී ය.

https://liberationbase.wordpress.com

චීනයේ යුද්ධ තත්වයෙහි බාරදූර වෙනස්වීම

1948, නොවැම්බර් 14

චීනයෙහි යුද්ධ තත්වය අළුත් හැරෙන තැනකට ඇවිත් ඇත, යුද්ධයෙහි දෙ පැත්ත අතර බලවේගයන්ගේ සමබරතාව මූලික වෙනසකට භාජන වී ඇත. බොහෝ කල් සිට ගුණයෙන් වඩා බලවත් ව සිටින මහජන විමුක්ති හමුදාව දැන් සංඛ්‍යාවෙන් අතින් ද වඩා බලවත් වී සිටී. මෙය චීන විප්ලවයේ ජයග්‍රහණය ත් චීනයෙහි සාමය ඇති වීම ත් අත ළඟට ඇවිත් තිබෙන බවට සලකුණකි.

යුද්ධයේ දෙවැනි අවුරුද්දේ අවසානයේදී, එනම්, මේ අවුරුද්දේ ජූනි අවසානයේදී, කුඕමින්තාං හමුදාවට මුළු ගණනින් භටයෝ 36,50,000ක් තරම සිටියහ. මෙය කුඕමින්තාං පක්ෂය දේශ-ව්‍යාප්ත සිවිල් යුද්ධය පටන්ගත් 1946 ජූලියේදී ඒ පක්ෂයට සිටි භටයන් 43,00,000ට වඩා 6,50,000ක් අඩු ගණනකි. යුද්ධය පැවති දෑවුරුද්ද තුළ කුඕමින්තාං පක්ෂය මිනිසුන් 24,40,000ක් පමණ අළුතෙන් යුද සේවයට බන්දා ගත්තේ ය; ඒ වකවානුව තුළ දළ වශයෙන් මිනිසුන් 30,90,000ක් පමණ මුල්පිස දමනලද හෝ අල්ලා-ගන්නාලද හෝ හමුදාවෙන් පැනගිය නමුත් (26,40,000ක් මුල්පිස දමනලදහ, හෝ අල්ලාගන්නාලදහ), අඩු වීම 6,50,000ක් පමණක් වීමේ හේතුව මෙය යි. නොබෝ දා උන්හිටිගමන් ම වෙනසක් සිදු විය. යුද්ධයේ තුන්වැනි අවුරුද්දේ මුල් හාර මාසය තුළ, ශෙන්යාං නුවර නිදහස් කළ කාලය වන ජූලි 1වැනි ද සිට නොවැම්බර් 2වැනි ද තෙක්, කුඕමින්තාං හමුදාවට මිනිස්සු 10,00,000ක් නැති වූහ. මේ හාර මාසය තුළ ඒ හමුදාව නැති වූ මිනිසුන් වෙනුවට බන්දා ගත් මිනිසුන්ගේ ගණන මෙ පමණ ය'යි තවම නිශ්චය කර නැත; මිනිසුන් 3,00,000ක් අළුතෙන් බන්දා ගන්ට ඒ පක්ෂයට හැකි වී ය'යි අනුමානයෙන් සලකතොත්, එවිට සුද්ද අඩුවීම 7,00,000ක් වෙනවා ඇත. මෙසේ — හමුදාව, නාවිකහමුදාව සහ අහස් සේනාව ද, නිත්‍ය භටයන් සහ අනිත්‍ය භටයන් ද, සටන් කරන භටකණ්ඩායම් සහ පසුමුණු-සේවා ආයතන වල සිටින මිනිසුන් ද යන — කුඕමින්තාං සන්නද්ධ බලසේනාවන්ගේ මුළු ගණන දැන් 29,00,000ක් පමණ වේ. අනික් අතට, 1946 ජූනියේදී මිනිසුන් 12,00,000ක් සිටි මහජන විමුක්ති හමුදාව 1948 ජූනියේදී 28,00,000කට වැඩුණේ ය, දැන් 30,00,000කට වඩා වැඩි වී ඇත. මෙසේ, බොහෝ කල් සිට කුඕමින්තාං හමුදාව භුක්ති විඳිමින් සිටි සංඛ්‍යාත්මක වැඩි-බලය සීඝ්‍ර ලෙස අඩු-බලය බවට හැරී තිබේ. මෙය පසුගිය හාර මාසය තුළ රටේ සියලු ම රණ මණ්ඩල වල මහජන විමුක්ති හමුදාව කළ වීරෝදාර සටන් වල ප්‍රතිඵලය වේ; එය විශේෂයෙන් දකුණු පෙරමුණේ සුයි-කී සහ ත්සිනාන් යුද්ධව්‍යාපාර[1] වල ත්, උතුරු පෙරමුණෙහි චින්චව්, චාංචුන්, ලියාඕශි සහ ශෙන්යාං යුද්ධව්‍යාපාර[2] වල ත් ප්‍රතිඵලය වේ. මේ අවුරුද්දේ ජූනි අග වන තෙක්, කුඕමින්තාං පක්ෂයට ඩිවිසන් 285ක් සඳහා නිල-නාම තිබුණේ ය; ඒ එම පක්ෂය වියරුවෙන් මෙන් තම අනිත්‍ය භටයන් තම නිත්‍ය භටසේනාවන්ට ඇතුළත් කර ගත් නිසා ය. මේ හාර මාසය තුළ මහජන විමුක්ති හමුදාව විසින් මුල්පිස දමනලද බැටැලියන් වල සහ වඩා විශාල සේනාංග වල මුළු ගණන, මුළු ඩිවිසන් 63ක් ද ඇතුළු ව, ඩිවිසන් 83ක් විය.

මේ අනුව, යුද්ධය අප මුලදී තක්සේරු කළාට වඩා බෙහෙවින් කෙටි වෙනවා ඇත. මුලින් කළ තක්සේරුව වූයේ ප්‍රතිගාමී කුඕමින්තාං ආණ්ඩුව 1946 ජූලි මාසයේ සිට අවුරුදු පහකදී පමණ සම්පූර්ණයෙන් ම පෙරළා දැමිය හැකි බව ය. දැන් අපට පෙනෙන හැටියට, එය සම්පූර්ණයෙන් පෙරළා දමන්ට උවමනා වෙනවා ඇත්තේ තව අවුරුද්දක් තරම් කාලයක් පමණකි. එසේ ද වුව, රටේ සියලු ම කොටස් වල සිටින ප්‍රතිගාමී බලවේගයන් තුරන් කර දමා, ජනතාවගේ විමුක්තිය සම්පූර්ණ කිරීම පිණිස ඊට වඩා දිගු කලක් උවමනා වෙනවා ඇත.

සතුරා සීඝ්‍රයෙන් බිඳ වැටීගෙන යයි; එනමුත් රට පුරා ම කොමියුනිස්ට්-වාදියෝ ත්, මහජන විමුක්ති හමුදාව ත් සියලු තරාතිරම් වල ජනයා ත් දිගට ම එකා මෙන් සමගි වී සිටිමින්, තම පරිශ්‍රමයන් දෙ ගුණ කළ යුත්තාහ; එසේ පමණකි ප්‍රතිගාමී බලවේගයන් අවසාන වශයෙන් සහ සම්පූර්ණයෙන් මුල්පිස දමා, මුළු රටෙහි ම එක්සත්, ප්‍රජාතන්ත්‍රවාදී මහජන සමූහාණ්ඩුවක් ගොඩ-නඟන්ට අපට හැකි වන්නේ.

මේ විවේචනය සහෝදර මාඕ සේතුං විසින් ශින්හ්වා ප්‍රවෘත්ති සේවය සඳහා ලියනලදී. මෙහි, සහෝදර මාඕ සේතුං, අළුත් තත්වය, එනම්, ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරයට පසු බලවේගයන්ගේ සමබරතාවෙහි ඇති වූ වෙනස, තම පදනම කර ගනිමින්, මහජන විමුක්ති යුද්ධයේදී ජය දිනා ගැනීමට උවමනා කරන කාලය ගැන අළුත් තක්සේරුවක් කොට, කුඕමින්තාං පක්ෂයේ ප්‍රතිගාමී පාලනය 1948 නොවැම්බරයේ සිට අවුරුද්දකට වැඩි නො වන කාලයක් තුළ පෙරළා දැමිය හැකි බව පෙන්වා දුන්නේ ය. චීනයේ යුද්ධ තත්වයෙහි ඊට පසු ඇති වූ දේ ඔහුගේ අනාවැකිය සම්පූර්ණයෙන් සනාථ කළේ ය.

ස ට හ න්

[1]නැගෙනහිර හෝනාන් යුද්ධව්‍යාපාරය වශයෙන් ද ප්‍රකට, සුයි-කී යුද්ධව්‍යාපාරය කායිපං, සුයිශියන් සහ කිශියන් යන නගර ඇතුළත් කොටසෙහි මහජන විමුක්ති හමුදාව විසින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කරනලදී. මේ යුද්ධව්‍යාපාරය පටන් ගත්තේ 1948, ජූනි 17වැනි ද ය. ජූනි 22වැනි ද අපේ හමුදව කායිපං ඇල්ලුවේ ය. තම උග්‍ර යුද්ධ තත්වය බේරා ගැනීම පිණිස, වියාං කායි-ශෙක් පෙරමුණට ගියේ ය, පුද්ගලික ව ම විධානය බාර ගත්තේ ය, පැති කීපයකින් කායිපං නුවරට පහර දීමක් අරඹනු පිණිස වියු විං-චුආන්, ඕං ශෞ-නියන් සහ හුආං පෝ-තාඕ යටතේ හමුද 3ක් එක්රැස් කළේ ය. අපේ නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදවේ කොලම් 6ක් ද, අපේ මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදවේ කොලම් 2ක් ද, අපේ ක්වංතුං-ක්වාංසි කොලම ද සූයිශියන්-කීශියන් කොටසේදී ඕං ශෞ-නියන් සහ හුආං පෝ-තාඕ යටතේ සිටි හමුද වට කළේ ය; (ජූනි 27 සිට ජූලි 6 තෙක්) දිවා ර. නවයක් තිස්සේ දරුණු ලෙස සටන් කොට, ඔව්හු ඕං ශෞ-නියන්ගේ හමුදවේ ඩිවිසන් 2ක් හෙවත් බ්‍රිගේඩ 6ක් ද හුආං පෝ-තාඕගේ හමුදවේ කොටසක් ද, මුළු ගණනින් මිනිසුන් 90,000කට වඩා, මුල්පිස දමූහ. හමුද අණදෙන්නා වූ ඕං ශෞ-නියන් සහ 75වැනි ප්‍රතිසංවිධානය කළ ඩිවිසනයේ අණදෙන්නා වූ ශෙන් චෙං-නියන් අල්ලා ගනු ලැබූහ. ත්සිනාන් යුද්ධව්‍යාපාරය ගැන දැන ගැනීමට මේ පොතේ 427වැනි පිටුවේ පළවන ''හුආයි-හායි යුද්ධව්‍යාපාරය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය'' නමැති ලිපියට යොද තිබෙන 2වැනි සටහන බලන්න.

[2] ඊසානදිග චීනයෙහි චින්චව්, චාංචුන්, ලියාඕශි සහ ශෙන්යාං යුද්ධව්‍යාපාර එකට ගෙන ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරය'යි කියනලදී. මේ පොතේ 421වැනි පිටුවේ පළවන ''ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරය සඳහා සටන්ව්‍යාපාර සංකල්පය'' නමැති ලිපියට යොද තිබෙන 1වැනි සටහන බලන්න.

පීපිං–තියන්සින් යුද්ධව්‍යාපාරය[1] සඳහා සටන්ව්‍යාපාර සංකල්පය

1948, දෙසැම්බර් 11

1. රක්ෂිත ස්ථාන ආරක්ෂා කිරීම පිණිස තරමක් උසස් සටන් ක්ෂමතාවක් තවම ඇත්තා වූ, 35වැනි, 62වැනි සහ 94වැනි බළකාය වලට අයත් ඇතැම් ඩිවිසන් වැනි, සේනාංග කීපයක් හැර — චාංචියාකෞ, ශින්පාඕ–ආන් සහ හුආයිලායි යන නගර වල ද, පීපිං, තියන්සින්, තාංකු සහ තාංශාන් ඇතුළත් මුළු ප්‍රදේශයෙහි ද සිටින සතුරු බලසේනාවන්ට ඇත්තේ සවල්ප වූ පහරදීමේ උද්‍යොගයකි; ඔව්හු හූදෙක් දුනු–දිය හඬ ඇසීමෙන් ම තැති ගන්නා කුරුල්ලන් වැනි ය. මෙය වෙසෙසින් ඔබ මහා ප්‍රාකාරයෙන් දකුණට ඉදිරියට ගමන් කළ ද සිට තත්වය වේ. ඔබ කිසි ම කරුණක් නිසා වත් සතුරාගේ සටන් ක්ෂමතාව වැඩි කොට ගණන් නො ගත යුතු ය. අපේ සමහර සහෝදරවරු සතුරාගේ සටන් ක්ෂමතාව වැඩි කොට ගණන් ගැනීම නිසා අමාරුවේ වැටුණෝ ය; එහෙත් විවේචනය කරනු ලැබීමෙන් පසු ඔව්හු නිවැරදි ලෙස වටහාගන්ට වී සිටිති. චාංචියාකෞ සහ ශින්පාඕ–ආන් යන දෙ තැන ම සතුරා නිශ්චය වශයෙන් ම වටලනු ලැබ සිටී; කඩා බිඳගෙන එළියට පැන බේරී යාම ඔහුට හොඳට ම අමාරු වෙන්ට පුළුවනි. 16වැනි බළකායයෙන් අඩක් පමණ සීඝ්‍රයෙන් මුල්පිස දමා ඇත. හුආයිලායි නුවර සිටි සතුරාගේ 104වැනි බළකායය කඩිමුඩියේ දකුණ බලා පළා ගොස් ඇත, අද හෝ හෙට මුල්පිස දමනු ලබනවා ඇත. එය කළ පසු, ඔබ නැන්කව් සහ පීපිං අතර පුරුක කපා දමනු පිණිස 4වැනි කොලම නිරිතදිගින්[2] ඊසානදිගට පිටත් කර යැවීමට සූදනම් ව සිටිනවා ඇත. මෙය ඉටු කිරීම පහසු නො

මෙය සහෝදර මාඕ සේතුං විසින් චීන කොමියුනිස්ට පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය සඳහා කෙටුම්පත් කොට, ලින් පියාඕ, ලෝ ජුං-හුආන් සහ වෙනත් සහෝදරවරුන් වෙත යවනලද විදුලිසංදේශයකි. පීපිං-තියන්සින් යුද්ධව්‍යාපාරය චීන මහජන විමුක්ති යුද්ධයේදී කළ ශ්‍රෙෂ්ඨතම තීරණාත්මක යුද්ධව්‍යාපාර තුනෙන් අවසාන එක විය. මේ යුද්ධව්‍යාපාරයේදී අපි කුඕමින්තාං භටයන් 5,20,000කට වැඩි ගණනක් මුල්පිස දැමීමු, නැතහොත් ප්‍රතිසංවිධානය කළෙමු, පීපිං, තියන්සින් සහ චාංචියාකෞ යන වැදගත් නගර නිදහස් කළෙමු, උතුරු චීනය නිදහස් කිරීමට කළ සටන් ප්‍රධාන වශයෙන් අවසන් කළෙමු. මේ යුද්ධව්‍යාපාරය සඳහා සහෝදර මාඕ සේතුං විසින් මෙහි ඉදිරිපත් කරනලද සටන්ව්‍යාපාර සංකල්පය භාවිතාවේදී සම්පූර්ණයෙන් ම මුදුන්පත් විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වෙනවා ඇතැ'යි අපි සිතමු; කවර හෙයින් ද යත්, 94වැනි සහ 16වැනි බළකාය වල ඉතිරි කොටස් හනික පීපිං නුවරට ඉවත් වී යන්ට හෝ 94වැනි, 16වැනි සහ 92වැනි බළකාය ඒකාබද්ධ ආරක්ෂණය පිණිස නැන්කව්–වාංපිං–ශාහෝවන් ප්‍රාන්තයෙහි ඒකරාශි වෙන්ට හෝ ඉඩ තිබෙන හෙයිනි. එහෙත් අපේ 4වැනි කොලමේ මේ ගමන පීපිං නුවරට වයඹදිගින් සහ උතුරෙන් පිහිටි අසල්–පෙදෙස් වලට කෙළින් ම තර්ජනයක් වෙනවා ඇත, ඒ සතුරු බලසේනා කොහේට වත් හෙල වෙන්ට එඩිතර නො වන සේ බැඳ තබනු ලබනවා ඇත. ඔවුන් 35වැනි බළකායයට අතිරේක ආධාර දීම පිණිස තවත් බටහිරට ගමන් කරන්ට එඩිතර වුව හොත්, ඔවුන්ගේ පසුබැසීම කපා දමන්ට හෝ කෙළින් ම පීපිං නුවරට පහරදීමක් දියත් කරන්ට හෝ අපට පුළුවනි; එහෙයින් ඔව්හු තවත් බටහිරට ගමන් කිරීමට එඩිතර නො වන්ට ඉඩ තිබේ. යාං තේ–චී, ලෝ ජුයි–චිං සහ කෙං පියාඕ විසින් අණදෙනු ලබන උතුරු චීනයේ සිටින හමුදාව සතුරාගේ 35වැනි බළකායයේ ඩිවිසන් 3ක් වටකරනු පිණිස ඩිවිසන් 9ක් යොදයි; මෙය ඒකාන්ත වැඩි–බලයක් වේ. මේ සතුරු ඩිවිසන් ඉක්මනින් ම දිනයක මුල්පිස දමන්ට ඔවුන් යෝජනා කර ඇත; එහෙත් පීපිං නුවර සහ තියන්සින් නුවර සිටින සතුරා නිශ්චල කරන සේ ත්, මුහුදු මගින් පළා යාම පිණිස තීරණයකට එළඹීම ඔහුට අමාරු කරන සේ ත් දැනට පහර නො දෙන ලෙස ඔවුන්ට කීමට අපි අදහස් කරමු. ඔවුන් 35වැනි බළකායය වට කරන්ට කොලම් 2ක් ද, 104වැනි බළකායයට අවහිර කරන්ට කොලම් 1ක් ද යොදා, මේ සතුරු බලසේනා දෙක ම ගසා පසුබස්වා ඇත.

2. ඔබ පීපිං, නැන්කව් සහ හුආයිජු යන නගරවල සිටින සතුරාට ඊසානදිගින් තර්ජනය කරනු පිණිස 5වැනි කොලම නැන්කව් අසළට වහා ම යවනවාට අපි දැන් එකඟ වෙමු. පසු ව (දින දහයකින් පහළොවකින් පමණ, ඒ කියන්නේ, යාං තේ–චී, ලෝ ජුයි–චිං සහ කෙං පියාඕ විසින් අණදෙනු ලබන උතුරු චීනයෙහි සිටින හමුදාව 35වැනි බළකායය මුලසුන් කළ විට) ඔබගේ 4වැනි කොලම නැගෙනහිර පෙදෙසෙහි සේවය පිණිස නිදහස් කළ හැකි වන සේ, මේ කොලම එහි නතර වී සිටිනවා ඇත. එහෙයින්, කරුණාකර අද දිගට ම බටහිරට ගමන් කරන ලෙස 5වැනි කොලමට අණ දෙන්න.

3. 3වැනි කොලම මොන ම කරුණක් නිසා වත් නැන්කව් නුවර කරා නො යා යුතු ය; නමුත්, 9වැනි ද එවූ අපේ විදුලිසංදේශය අනුව, නැගෙනහිරින් පීපිං නුවරට තර්ජනය කරනු පිණිස ත්, 4වැනි, 11වැනි සහ 5වැනි කොලම් හා එකතු වී පීපිං නුවර වට කරන වළල්ලක් තැනීම පිණිස ත්, පීපිං නුවරට නැගෙනහිරින් සහ තුංශියන් නුවරට දකුණින් පිහිටි ප්‍රාන්තයට ගමන් කළ යුතු ය.

4. කෙසේ වෙවා, අපේ සැබෑ අරමුණ පළමුකොට පීපිං වටකිරීම නො වේ, පළමුකොට තියන්සින්, තාංකු, ලූතායි සහ තාංශාන් වට කිරීම ය.

5. ඔබගේ 10වැනි, 9වැනි, 6වැනි සහ 8වැනි කොලම් ද, ඔබගේ කාලතුවක්කු කොලම ද, ඔබගේ 7වැනි කොලම ද දෙසැම්බර් 15වැනි ද පමණ වන විට යූතියන් අවට ප්‍රාන්තයෙහි රැස් වී සිටිනවා ඇතැ'යි අපි ගණන් බලමු. තියන්සින්, තාංකු, ලූතායි සහ තාංශාන් යන ස්ථාන වල සතුරාගේ තත්වය දළ වශයෙන් දැනට පවතින පරිද්දෙන් ම වෙතොත්, ඔබ, දෙසැම්බර් 20 සහ 25 අතර දින කීපය තුළ විදුලි වේගයෙන් ගමන් කොට — (පීපිං නුවර නැගෙනහිරි අසල්–පෙදෙස් වල සිට නැගෙනහිරට ගමන් කළ යුතු) 3වැනි කොලම සහ, 6වැනි, 7වැනි, 8වැනි, 9වැනි සහ 10වැනි කොලම් යන — කොලම් 6 තියන්සින්, තාංකු, ලූතායි සහ තාශාන් යන නගර වල සිටින සතුරා වටලනු පිණිස යෙදිය යුතු ය'යි අපි යෝජනා කරමු. ක්‍රමය නම් වූචිං අවට — ලාංපාං, හෝශීවූ සහ යාංත්සුන් වල — කොලම් 2ක් නතර කිරීම සහ කොලම් 5ක් තියන්සින්, තාංකු, ලූතායි, තාංශාන් සහ කූයේ යන නගර වල සතුරා අරක්ගෙන සිටින තැන් අතර ගසන කූඤ්ඤ මෙන් යොදා, සතුරු බලසේනාවන් අතර සබඳකම් කපා දැමීම ය. මේ සියලු ම කොලම් සතුරාට බේරී යන්ට නො හැකි වන බව සහතික කරනු පිණිස දැනට ම අවහිර කරන තත්වයන් ගොඩනැඟිය යුතු ය. ඉක්බිති ඔව්හු විවේක ගෙන තම හට-කණ්ඩායම් තහවුරු කළ යුත්තාහ; මහන්සිය නිවාගත් පසු, යම් යම් කුඩා සතුරු කණ්ඩායම් වලට පහර දී ඒවා මුල්පිස දැමිය යුත්තාහ. ඒ අතර 4වැනි කොලම පීපිං නුවරින් වයඹදිග සිට නැගෙනහිරට ගමන් කළ යුතු ය. 4වැනි කොලම ගමන් කරන්ට පටන් ගැනීමට පෙර, යාං තේ–චී, ලෝ ජුයි–චිං සහ කෙං පියාඕ විසින් අණ දෙනු ලබන උතුරු චීනයේ සිටින හමුදාව ශින්පාඕ–ආන්හි සිටින සතුරා මුල්පිස දැමිය යුතු ය. නැගෙනහිරෙහි, වටාපිටා තත්වයන් ගෙන් ඉඩ ලැබෙන පරිදි, පළමුකොට තාංකු නුවර සිටින සතුරා මුල්පිස දමා, ඒ මුහුදු–වරාය ග්‍රහණය කර ගන්ට හැම පරිශ්‍රමයක් ම දැරිය යුතු ය. මේ දෙ තැන, එනම් (ඉතා ම වැදගත් එක වන) තාංකු සහ ශින්පාඕ–ආන් අල්ලා ගත්තොත්, මුළු දම්වැල්ලේ ම මුලපිරුම ඔබට ලැබෙනවා ඇත. ඉහත සඳහන් සේනා වින්‍යාසයෝ, ඇත්ත වශයෙන්, වාංචියාකෞ, ශින්පාඕ–ආන්, නැන්කව්, පීපිං, හුආයිජු, ශුන්යී, තුංශියන්, වාන්පිං (චෝශියන් සහ ලියාංශියාං අල්ලාගෙන ඇත), පෙංතායි, තියන්සින්, තාංකු, ලූතායි, තාංශාන් සහ කායිපිං යන තැන් වල සිටින සතුරා තොගපිටින් ම වටලැමක් වෙති.

6. මේ ක්‍රමය සාමාන්‍යයෙන් අයිශියන්, චින්චව්, චින්ශි, ශිංචෙං, සුයිචුං, ශාන්හායිකුආන් සහ ලුආන්ශියන් ඔස්සේ පේළිය දිගට සටන් කිරීමේදී ඔබ යෙදූ ක්‍රමය ම වේ.[3]

7. අදින් පටන් ගන්නා දෙ සතිය තුළ (දෙසැම්බර් 11–25), මූලික මූලධර්මය වන්නේ, අපේ සේනා වින්‍යාසයන් සම්පූර්ණ කරන තුරු බලා සිටීම පිණිස සහ ඉක්බිති සතුරු බල සේනාවන් එකින් එක මුල්පිස දැමීම පිණිස, (වාංචියාකෞ සහ ශින්පාඕ–ආන් පිළිබඳ අවස්ථාවේදී) පහර දෙන්නේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නැතිව වටකිරීම ත්, ඇතැම් අවස්ථා වලදී, වට කරන්නේ නැතිව කපා හැරීම ත් ය (පීපිං, තියන්සින් සහ තුංශියන් පිළිබඳ අවස්ථාවේදී, උපායමාර්ගික වටලෑමක් පමණක් කොට, සතුරු බලසේනාවන් අතර පූරුක් කපා දමනවා විනා උපක්‍රමික වටලෑමක් නො කිරීම ය). විශේෂයෙන් ම, ඔබ චාංචියාකෞ, ශින්පාඕ-ආන් සහ නැන්කව් යන තැන් වල සිටින සියලු ම සතුරු බලසේනාවන් මුල්පිස නො දැමිය යුතු ය; එසේ කළොත් ඉක්මනින් ම පැන යන තීරණයක් ගැනීමට නැන්කව් නුවරින් නැගෙනහිර පැත්තේ සිටින සතුරාට බලෙන් ම සිදු විය හැකි නිසා ස. කරුණාකර ඔබ මේ කරුණ නො වරදවා ම ඉතා හොඳින් තේරුම් ගත යුතු ය.

8. පීපිං-තියන්සින් ප්‍රදේශයෙහි සිටින තම භටකණ්ඩායම් මුහුද මගින් දකුණට ගෙන යාමට ඉක්මනින් තීරණයක් ගන්ට චියාං කායි-ශෙක් පෙළඹීම වළක්වනු පිණිස, හුආං වෙයිගේ හමුදාව මුල්පිස දැමූ පසු (අඩක් දැනට ම විනාශ කර දමා ඇති) චියු චිං-චුආන්, ලී මී සහ සුන් යුආන්-ලියාං යටතේ සිටින තු යූ-මිංගේ හමුදාවන් ගෙන් ඉතිරි කොටස් වනසන්නේ නැතිව ඉතිරි කරන ලෙස ත්, දෙ සතියක් යන තුරු ඔවුන් අවසාන වශයෙන් මුලසුන් කර දැමීම පිණිස සේනා විනාසයන් නො කරන ලෙස ත් ලියු පෝ-චෙංට, තෙං ශියාඕ-පිංට, චෙන් යීට සහ සූ යූට අපි අණ කරන්ට යමු.

9. සතුරා ත්සිංතාඕ නුවර දෙසට පළා යාම වළකනු පිණිස, ත්සිනාන් නුවර අසළ කහ ගඟේ කොටසක් පාලනය කරනු පිණිස ත් ත්සිංතාඕ-ත්සිනාන් දුම්රියමග දිගට කටයුතු සූදානම් කරනු පිණිස ත් සමහර බලසේනාවන් රැස් කරන ලෙස අපි ශාන්ටුං පළාතේ සිටින අපේ භටකණ්ඩායම් වලට අණ කරන්ට යමු.

10. සතුරා හ්සූචව්, චෙංචව්, සියාන් හෝ යූයියුආන් දෙසට පළා යන්ට පුළුවන්කමක් ඇති නැති තරම් ය.

11. සැලකිය යුතු ප්‍රධාන දෙය, සත්තකින් ම එක ම දෙය, සතුරා මුහුදෙන් පළා යා හැකි බව ය. එහෙයින්, මීළඟ දෙ සතිය තුළ සාමාන්‍ය ක්‍රමය විය යුත්තේ පහර නො දී වට කිරීම හෝ වට නො කර කපා වෙන් කිරීම ය.

12. මේ සැලැස්ම සතුරා බලාපොරොත්තු විය හැකි දේවල් වලින් පිට ය, ඔබ ඔබගේ අවසාන සේනා විනාසයන් සම්පූර්ණ කරන්ට පෙර එය වටහාගන්ට ඔහුට ඉතා අමාරු වෙනවා ඇත. දැනට, සතුරා කල්පනා කරමින් සිටිනවා ඇත්තේ ඔබ පීපිං නුවරට පහර දෙනවා ඇත කියා ය.

13. සතුරා සැම විට ම අපේ හමුදාවේ උද්‍යොග-ශක්තිය අඩු කොට සලකයි, තමාගේ ම ශක්තිය වැඩි කොට සලකයි; එහෙත් ඒ අතර ම ඔහු සිටින්නේ හුදෙක් දුනු-දිය හඬින් ම තැති ගන්නා කුරුල්ලකු මෙනි. පීපිං නුවර සහ තියන්සින් නුවර සිටින සතුරා ඉහත සඳහන් සේනා විනාසයන්

දෙසැම්බර් 25 වන විට සම්පූර්ණ කරන්ට ඔබට හැකි වේ ය'යි කිසි කලෙක බලාපොරොත්තු වන්නේ නැත.

14. දෙසැම්බර් 25 වන විට මේ සේනා විනාසයන් සම්පූර්ණ කරනු වස්, මීළඟ දෙ සතිය තුළ වෙහෙස ගණන් නො ගන්නට, සංඛ්‍යාවන් අඩු වීම ගැන බිය නො වන්නට සහ සීතල ත් කුසගින්න ත් ගැන බිය නො වන්නට ඔබ ඔබගේ භටකණ්ඩායම් ප්‍රබෝධ කළ යුතු ය; මේ සේනා විනාසයන් කළ පසු, විවේක ගන්ට ත් තහවුරු වෙන්ට ත් පහර දීමට කල් ගන්ට ත් ඔවුන්ට හැකි ය.

15. පහර දෙන අනුපිළිවෙල දළ වශයෙන් මතු දක්වන පරිදි වෙනවා ඇත: පළමුව, තාංකු-ලූතායි කොටස; දෙවැනිව, ශින්පාඕ-ආන්; තුන්වැනිව, තාංශාන් කොටස; සිව්වැනිව, තියන්සින් සහ චාංචියාකෞ කොටස්; අවසාන වශයෙන්, පීපිං කොටස.

16. මේ සැලැස්ම ගැන ඔබගේ අදහස් මොනවා ද? එහි අඩුපාඩුකම් මොනවා ද? එය ක්‍රියාවේ යොදන්ට අමාරුකම් තිබෙනවා ද? කරුණාකර මේ සියල්ල කල්පනා කර බලා, විදුලිපණිවිඩ මගින් පිළිතුරු දෙන්න.

LIBERATIONBASE

ස ට හ න්

[1] ලින් පියාඕ, ලෝ ජුං-හුආන්, නියේ ජුං-චෙන් සහ වෙනත් සහෝදරවරුන්ගේ විධානය යටතේ ඊසානදිග ක්ෂේත්‍ර හමුදාව සහ උතුරු චීන මහජන විමුක්ති හමුදාවේ හමුද දෙකක් විසින් කරනලද පීපිං-තියන්සින් යුද්ධව්‍යාපාරය, ඊසානදිග පෙදෙසෙහි ලියාඕශි-ශෙන්යාං යුද්ධව්‍යාපාරය ජයග්‍රාහී ලෙස නිම වූ පසු වහා ම, 1948 දෙසැම්බර් මුලදී පටන් ගත්තේ ය. සහෝදර මාඕ සේතුංගේ උපදෙස් උඩ ක්‍රියා කරමින්, ඊසානදිග ක්ෂේත්‍ර හමුදාව මුළු ඊසානදිග ම නිදහස් කිරීමේ තම කර්තව්‍යය ජයග්‍රාහී ලෙස ඉටු කිරීමෙන් පසු වහා ම මහා ප්‍රාකාරයෙන් දකුණට පිසගෙන අවුත්, ඒ ප්‍රාන්තයෙහි කුඕමින්තාං භටකණ්ඩායම් වටකොට මුල්පිස දමනු පිණිස උචිත ලෙස සම්බන්ධ කළ ක්‍රියාවන් සඳහා උතුරු චීනයේ මහජන විමුක්ති හමුදාවේ හමුදාවන් සමග එකතු විය. ඊසානදිග පෙදෙසෙහි මහජන විමුක්ති හමුදාව ලත් ජයග්‍රහණයෙන් බෙහෙවින්-ම තැති ගෙන, කුඕමින්තාං පක්ෂයේ උතුරු චීන "පල්හොරුන් මඬින" මූලස්ථානයේ ප්‍රධාන අණදෙන්නා වූ පූ ත්සෝ-යී යටතේ සිටි 6,00,000කට වැඩි කුඕමින්තාං භටයෝ මුහුදු මගින් දකුණට පළා යන්ට හෝ සුයියුආන් පළාත බලා බටහිරට පළා යන්ට හෝ අදහස ඇතිව ඔවුන්ගේ ආරක්ෂණ පේළි කඩිමුඩියේ කෙටි කළහ. විදුලි වේගයෙන් ගමන් කරමින්, අපේ හමුදාව සතුරු බලසේනාවන් කපා වෙන් කොට, ඔවුන් පීපිං, තියන්සින්, චාංචියාකෞ, ශින්පාඕ-ආන් සහ තාංකු යන රක්ෂස්ථාන පහක් වෙත වෙන වෙන ම වට කොට, එසේ දකුණට හෝ බටහිරට පැන යන ඔවුන්ගේ මං අවහිර කළේ ය. දෙසැම්බර් 22වැනි ද, ශින්පාඕ-ආන් නුවර සිටි සතුරාගේ ප්‍රධාන බලසේනාව (ඔහුගේ 35වැනි බළකායයේ මූලස්ථානය සහ ඩිවිසන් දෙකක්) වටලා මුල්පිස දමනු ලැබී ය. 24වැනි ද, චාංචියාකෞ අල්ලා ගනු ලැබී ය, සතුරාගේ 11වැනි හමුදාවේ බළකාය මූලස්ථානයක් සහ ඩිවිසන් 7ක්, මුළු ගණනින් මිනිස්සු 54,000කට වඩා, මුල්පිස දමනලදහ. 1949, ජනවාරි 14වැනි ද, තියන්සින් නුවර වට කරගෙන සිටි අපේ භටකණ්ඩායම, සතුරු ගැරිසන් හමුදාවේ අණදෙන්නා වූ චෙන්

https://liberationbase.wordpress.com

චාං-චියේ යටත් වීම ප්‍රතික්ෂේප කළ පසු, නගරයට විරුද්ධ ව සමස්ත ප්‍රහාරයක් දියත් කළේ ය. පැය විසිනවයක් කළ දරුණු සටනකින් පසු නගරය නිදහස් කරනු ලැබී ය, මිනිසුන් 1,30,000කට වඩා සිටි සතුරු ගැරිසන් හමුදව මුල්පිස දමනු ලැබී ය, චෙන් චාං-චියේ අල්ලාගනු ලැබී ය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පීපිං නුවර ගැරිසන් කරමින් සිටි 2,00,000කට වැඩි සතුරු හටයෝ අපේ හටකණ්ඩායම විසින් කිටිකිටියේ වට කරනු ලැබූහ, ඔවුන්ගේ ඉරණම කොටනු ලැබී ය. සතුරාගේ පීපිං ගැරිසන් හමුදව අපේ පැත්තට දිනාගැනීමට අප දරූ පරිශ්‍රමයන් නිසා, ජනරාල් පූ ත්සෝ-යී විසින් අණ දෙනු ලැබූ ඒ හමුදව සමාදනයෙන් ප්‍රතිසංවිධානය වීම පිළිගත්තේ ය. ජනවාරි 31වැනි ද, අපේ හටකණ්ඩායම පීපිං නුවරට ඇතුල් විය, නගරය සාමකාමී ලෙස නිදහස් කරනු ලැබූ බව ප්‍රකාශ කරනු ලැබී ය, පීපිං-තියන්සින් යුද්ධව්‍යාපාරය ජයග්‍රාහී ලෙස අවසන් විය. මේ යුද්ධව්‍යාපාරයේදී, තාංකූ නුවර සිටි මිනිසුන් 50,000කට වැඩි ගණනකින් යුත් සතුරු ගැරිසන් හමුදව මුහුදෙන් පැන ගිය බැවින් ඒ හමුදව හැර, කුඕමින්තාං හටයෝ 5,20,000කට වැඩි ගණනක් අපේ හමුදව විසින් ක්‍රියා විරහිත කරනු ලැබූහ, ප්‍රතිසංවිධානය කරනු ලැබූහ. 1949 සැප්තැම්බරයේදී සුයියුආන් පළාතේ සිටි කුඕමින්තාං හටකණ්ඩායම තමන් කැරලි ගසා ජනතාවගේ පැත්තට ආ බව ත් තමන් ප්‍රතිසංවිධානය වීම පිළිගන්නා බව ත් විදුලිසංදේශයක් මගින් ප්‍රකාශ කළේ ය.

[2]මෙහි නිරිතදිග යන්නෙන් අදහස් කරන්නේ නැන්කව නුවරින් නිරිතදිගට පිහිටි ප්‍රදේශය ය.

[3]1948 සැප්තැම්බරයේදී, අයිශියන්, චින්චව, චින්ශි, ශිංචෙං, සුයිචුං, ශාන්හායිකුආන්, ලූආන්ශියන් සහ චාංලි යන ස්ථාන වල සිටි සතුරු බලසේනාවන් ඔවුන්ගේ පේළි කොට කිරීම සහ ඒකරාශි වීම වළක්වනු පිණිස, ඒ දින වල ඒ දුම්රියමග දිගට ක්‍රියාවේ යෙදී සිටි ඊසානදිග ක්ෂේත්‍ර හමුදව එකී ස්ථාන වල සිටි සතුරු සේනාංග වට කොට එකිනෙකින් කපා හැරීම පිණිස පළමුකොට තම හටකණ්ඩායම වලින් කොටසක් යෙදීමේ ද, ඉක්බිති ඒ සේනාංග එකින් එක මුල්පිස දැමීමේ ද ක්‍රමය අනුගමනය කළේ ය.

විප්ලවය කෙළවර තෙක් ගෙන යන්න

1948, දෙසැම්බර් 30

චීන ජනතාව ශ්‍රේෂ්ඨ විමුක්ති යුද්ධයේදී අවසාන ජයග්‍රහණය දිනා ගන්නවා ඒකාන්ත ය. අපේ සතුරා පවා මේ ප්‍රතිඵලය තව දුරට ත් සැක නො කරයි.

යුද්ධය වක් වූ මගක් ඔස්සේ ගොස් ඇත. ප්‍රතිගාමී කුඕමින්තාං ආණ්ඩුව ප්‍රති-විප්ලවවාදි යුද්ධය පටන් ගන්නා විට, ඒ ආණ්ඩුවට මහජන විමුක්ති හමුදවට සිටියාක් මෙන් තුන් ගුණයකුත් අඩක් පමණ හටයෝ සිටියහ; ඒ ආණ්ඩුවේ හමුදවට තිබුණු උපකරණ, මිනිස්බලය සහ ද්‍රව්‍යමය වත්පොහොසත්කම මහජන විමුක්ති හමුදවට තිබුණාට වඩා බෙහෙවින් උසස් විය; මහජන විමුක්ති හමුදවට නො තිබුණු නවීන කර්මාන්ත සහ නවීන ගමනාගමන හා පණිවුඩ හුවමාරු මාර්ග ඒ ආණ්ඩුවට තිබුණේ ය; ඒ ආණ්ඩුවට එක්සත් ජනපද අධිරාජ්‍යවාදයෙන් විශාල-පරිමාණයේ යුද්ධ සහ ආර්ථික ආධාර ලැබී තිබුණේ ය; ඒ ආණ්ඩුව බොහෝ කලක සිට සූදනම් වී සිටියේ ය. එහෙයින් යුද්ධයේ මුල් අවුරුද්දේදී (1946 ජූලි 1947 ජූනි) කුඕමින්තාං ආණ්ඩුව සිටියේ පහරදීමෙහි යෙදී ය, මහජන විමුක්ති හමුදව සිටියේ අරක්ෂා වෙමින් ය. 1946දී ඊසානදිග පෙදෙසෙහි, කුඕමින්තාං ආණ්ඩුව ශෙන්යාං, සපිංකායි, චාංචුන්, කිරින්, ආන්තුං සහ වෙනත් මහ නගර ද ලියාඕනිං, ලියාඕපෙයි සහ ආන්තුං පළාත්[1] වලින් වැඩි හරියක් ද අල්ලා ගත්තේ ය; කහ ගඟෙන් දකුණට, ඒ ආණ්ඩුව හුආයියින්, හොත්සේ සහ වෙනත් මහ නගර ද හූපේ-හෝනාන්-අන්හ්වෙයි, චියාංසූ-අන්හ්වෙයි, හෝනාන්-අන්හ්වෙයි-චියාංසූ සහ නිරිතදිගු ශාන්තුං යන නිදහස් ප්‍රදේශ වලින් වැඩි හරියක් ද අල්ලා ගත්තේ ය; මහා ප්‍රාකාරයට උතුරෙන්, ඒ ආණ්ඩුව චෙංතේ, චිනිං සහ චාංචියාකෞ සහ වෙනත් මහ නගර ද ජෙහොල්, සුයියුආන් සහ චහාර් යන පළාත් වලින් වැඩි හරියක් ද අල්ලා ගත්තේ ය. කුඕමින්තාං පක්ෂය දිග්විජයයෙහි යෙදුණු වීරයකු මෙන් වහසි බස් කියමින් අහංකාර ලෙස හැසුරුණේ ය. මහජන විමුක්ති හමුදව භූමිප්‍රදේශ අල්ලාගෙන සිටිනවාට වඩා කුඕමින්තාං ආණ්ඩුවේ ක්‍රියාකාරි ශක්තිය මුල්පිස දැමීම ස්වකීය ප්‍රධාන

මේ අළුත් අවුරුදු පණිවිඩය සහෝදර මාඕ සේතුං විසින් ශින්හ්වා ප්‍රවෘත්ති සේවය පිණිස ලියනලද්දකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අරමුණ කොට ගත් නිවැරදි උපායමාර්ගය යෙදී ය, හැම මාසයක ම සාමාන්‍ය ගණනින් කුඕමින්තාං ආණ්ඩුවේ නිත්‍ය භටසේනාවන් ගෙන් බ්‍රිගේඩ අටක් පමණ (වර්තමාන ඩිවිසන් අටකට සමාන ගණනක්) විනාශ කළේ ය. ප්‍රතිඵලයක් වශයෙන්, හැම පැත්තෙන් ම කරන පහර දීමක් පිණිස වූ ස්වකීය සැලැස්ම අත හැර දමන්නට අන්තිමේදී කුඕමින්තාං පක්ෂයට බලෙන් ම සිදු විය; 1947තේ මුල් භාගය වන විට තම ප්‍රහාරයේ ප්‍රධාන ඉලක්ක දකුණු පෙරමුණේ අංශ දෙකට, එනම්, ශාන්ටුං සහ උතුරු ශෙන්සි පළාත් වලට, සීමා කරන්නට ඊට සිදු විය. දෙවැනි අවුරුද්දේදී (1947 ජූලි – 1948 ජූනි) යුද්ධයෙහි මූලික වෙනසක් ඇති විය. කුඕමින්තාං නිත්‍ය භටයන් අතුරෙන් විශාල සංඛ්‍යාවක් මුල්පිස දමා, මහජන විමුක්ති හමුදව දකුණු සහ උතුරු පෙරමුණු වල ආරක්ෂාවීමේ තත්වයේ සිට පහරදීමේ තත්වයට හැරුණේ ය; ඒ අතර පහරදීමේ තත්වයේ සිට ආරක්ෂාවීමේ තත්වයට හැරෙන්නට කුඕමින්තාං ආණ්ඩුවට සිදු විය. මහජන විමුක්ති හමුදව ඊසානදිග චීනයෙහි, ශාන්ටුං පළාතෙහි සහ උතුරු ශෙන්සි පළාතෙහි නැති වූ භූමිප්‍රදේශ වලින් වැඩි හරියක් ආපසු ලබා ගත්තා පමණක් නො වේ; යුද පෙරමුණ යැංසී සහ වෙයිශුයි ගංගා වලින් උතුරෙහි කුඕමින්තාං ප්‍රදේශ තුළට ද ව්‍යාප්ත කළේ ය. එමතු නො ව, ශිව්යාවුආං, යුන්චෙං, සපිංකායි, ලෝයාං, යිචුආන්, පාඕකි, වෙයිශියන්, ලින්පන් සහ කායිපං යන ස්ථාන වලට පහර දී අල්ලා ගැනීමේදී, අපේ හමුදව බෙහෙවින් ම සුරක්ෂිත කළ ස්ථාන වලට වැරෙන් පහර දීමේ උපක්‍රම ඉතා හොඳින් ඉගෙනගත්තේ ය.[2] මහජන විමුක්ති හමුදව තමාගේ ම කාලතුවක්කු සහ ඉංජිනේරු බළකායයන් සකස් කර ගත්තේ ය. මහජන විමුක්ති හමුදවට අහස්යානා වත් යුදටැන්කි වත් නො තිබුණු බව අමතක නො කළ යුතු ය; එහෙත් එය කුඕමින්තාං හමුදවේ බළකායයන්ට වඩා උසස් කාලතුවක්කු බළකායයක් සහ ඉංජිනේරු බළකායයක් සකස් කර ගත් කල, කුඕමින්තාං පක්ෂයේ ආරක්ෂාවීමේ ක්‍රමය, ඊට තිබෙන සියලු ම අහස්යානා ත් යුදටැන්කි ත් සමග ම, සංසන්දන වශයෙන් ගණන් නො ගත යුතු තරම් සේ පෙනිණි. මහජන විමුක්ති හමුදව ඒ වන විට ජංගම සංග්‍රාමය මෙන් ම හොඳින් ස්ථානගත සංග්‍රාමය ද කරගෙන යාමට සමත් විය. යුද්ධයේ තුන්වැනි අවුරුද්දේ මුල් භාගය (1948 ජූලි–දෙසැම්බර්) තුළ, තවත් මූලික වෙනසක් සිදු වී ඇත. එතෙක් කල් සංඛ්‍යාවෙන් අඩු ව සිටි මහජන විමුක්ති හමුදව සංඛ්‍යාත්මක වැඩි–බලය ද දිනාගෙන ඇත. එය කුඕමින්තාං පක්ෂයේ බෙහෙවින් ම සුරක්ෂිත කළ මහ නගර අල්ලා ගැනීමට පමණක් නො ව, කුඕමින්තාං පක්ෂයේ අතිදක්ෂ භටසේනාවන්ට අයත් බලවත් සේනාවන් වරකට ලක්ෂයක් හෝ ලක්ෂ කීපයක් බැගින් වට කොට විනාශ කිරීමට ද සමත් වී ඇත. මහජන විමුක්ති හමුදව කුඕමින්තාං භටසේනාවන් මුල්පිස දමන වේගය බෙහෙවින් ම වැඩි වී ඇත. (කැරලි ගසා අපේ පැත්තට අවුත් සිටින සතුරු භටසේනාවන් ද ඇතුළු ව) අප විසින් විනාශ කර දමා ඇති බැටැලියන් මට්ටමේ සහ ඊට ඉහළ කුඕමින්තාං නිත්‍ය සේනාංග ගණන

ගැන සංඛ්‍යාලේඛන දෙස බලන්න. පළමුවැනි අවුරුද්දේ, මුළු බ්‍රිගේඩ 46ක් ඇතුළු ව, බ්‍රිගේඩ 97කට සමාන ගණනකි; දෙවැනි අවුරුද්දේ, මුළු බ්‍රිගේඩ 50ක් ඇතුළු ව, බ්‍රිගේඩ 94කි; තුන්වැනි අවුරුද්දේ මුල් භාගය තුළ, අසම්පූර්ණ සංඛ්‍යාවන් අනුව, මුළු ඩිවිසන් 111ක් ඇතුළු ව, ඩිවිසන් 147කි.[3] මේ හය මස තුළ, මුළුමනින් ම මුල්පිස දමනලද සතුරු ඩිවිසන් ගණන කලින් අවුරුදු දෙක සඳහා වූ මුළු ගණනට වඩා 15කින් වැඩි විය. සතුරු පෙරමුණ මුළු එකක් වශයෙන් බිඳ වැටී ඇත. ඊසානදිග පෙදෙසෙහි සතුරු භටසේනා මුළුමනින් ම මුල්පිස දමා ඇත; උතුරු චීනයෙහි සිටින සතුරු භටසේනා ඉක්මනින් ම මුළුමනින් මුල්පිස දමනවා ඇත; නැගෙනහිර චීනයෙහි සහ මධ්‍යම තැනි වල ඉතිරි වී සිටින්නේ සතුරු බලසේනා කීපයක් පමණි. යැංසී ගඟට උතුරෙන් කුඕමින්තාං පක්ෂයේ ප්‍රධාන බලසේනාවන් මුලසුන් කර දැමීම නිසා මහජන විමුක්ති හමුදව ළඟදී ම යැංසී ගඟ තරණය කිරීම ත් ඒ හමුදව සකල චීනය නිදහස් කරනු පිණිස දකුණු දිගට ගමන් කිරීම ත් බෙහෙවින් ම පහසු වන්නේ ය. යුද්ධමය පෙරමුණෙහි ලබන ජයග්‍රහණය ත් සමග ම, චීන ජනතාව දේශපාලන සහ ආර්ථික පෙරමුණු වල ද ඉමහත් ජයග්‍රහණ දිනාගෙන ඇත. මේ හේතුව නිසා, අධිරාජ්‍යවාදී ප්‍රවෘත්ති පත්‍ර සියල්ල ද ඇතුළු ව ලොව හැම තැන ම මහජන මතය චීන මහජන විමුක්ති යුද්ධයේ දේශ–ව්‍යාප්ත ජයග්‍රහණය නිසැක ය යන්න ගැන තව දුරට ත් තර්ක කරන්නේ නැත.

සතුරා තමා ම නහින්නේ නැත. චීන ප්‍රතිගාමීන් වත් චීනයෙහි එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ආක්‍රමණකාරී බලවේගයන් වත් තම කැමැත්තෙන් ම ඉතිහාසයේ වේදිකාවෙන් බහින්නේ නැත. චීන මහජන විමුක්ති යුද්ධයේ දේශ–ව්‍යාප්ත ජයග්‍රහණය හුදු යුද්ධමය අරගලය මගින් වළක්වන්ට තව දුරට ත් බැරි බව ඔවුන්ට වැටහෙන නිසා ම, ඔව්හු දිනෙන් දින දේශපාලන අරගලය වඩ වඩා වැදගත් කොට සලකන්නට වී සිටිති. එක් අතකින් චීන ප්‍රතිගාමියෝ ත් එක්සත් ජනපද ආක්‍රමණිකයෝ ත් තමන්ගේ ''සාම'' කුමන්ත්‍රණය සඳහා දැනට තිබෙන කුඕමින්තාං ආණ්ඩුව පාවිච්චි කරති; අනික් අතින්, ඔව්හු කෛරාටික අන්දමින් වැඩ කරමින්, විප්ලවවාදී කඳවුර තුළට රිංගාගෙන ඒ කඳවුර ඇතුළෙන් ඊනියා විරුද්ධ කට්ටියක් ඇති කරන්ට වෙර දැරීම පිණිස තමන් සමග ද විප්ලවවාදී කඳවුර සමග ද සබඳකම් ඇති යම් යම් අය පොළඹවමින් සහ මෙහෙයවමින්, ඒ අය පාවිච්චි කිරීමට කුමන්ත්‍රණය කරති. ඔවුන්ගේ අභිප්‍රාය ප්‍රතිගාමී බලවේගයන් රැක ගැනීම සහ විප්ලවවාදී බලවේගයන් යටින් බිඳීම ය. විශ්වාස කටයුතු ආරංචි අනුව, එක්සත් ජනපද ආණ්ඩුව මේ කූට වැඩපිළිවෙල තීරණය කොට, එය චීනයෙහි ක්‍රියාවේ යොදන්නට පටන් ගෙන ඇත. එක්සත් ජනපද ආණ්ඩුව කුඕමින්තාං ආණ්ඩුවේ ප්‍රති–විප්ලවවාදී යුද්ධයට නිකම් ම අනුබල දීමේ තම ප්‍රතිපත්තිය අරගල ආකාර දෙකක් වැළඳගත් ප්‍රතිපත්තියක් බවට වෙනස් කර ඇත:

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

1. යැංසී ගඟෙන් දකුණෙහි ත් ඇත දේශසීමා පළාත් වල ත් මහජන විමුක්ති හමුදාවට විරුද්දකම් පෑම දිගට ම කරගෙනයාම පිණිස කුඹමින්තාං සන්නද්ධ සේනාවන් ගෙන් සහ ඊනියා ප්‍රාදේශීය සේනාවන් ගෙන් ඉතිරි වී සිටින කොටස් සංවිධානය කිරීම සහ,

2. විප්ලවය දූනට තිබෙන තැන නතර කරවීමට හෝ, එය ඉදිරියට යා යුතු ම නම්, එහි සැර බාල කොට, එය අධිරාජ්‍යවාදීන්ගේ ත් ඔවුන් පස්සේ දුවන බල්ලන්ගේ ත් පලප්‍රයෝජනයන් පමණට වඩා අතික්‍රමණය කිරීම වැළැක්වීමට හැකි තරම් උත්සාහ කරනු පිණිස විප්ලවවාදී කඳවුර ඇතුළෙන් විරුද්ධ කට්ටියක් සංවිධානය කිරීම.

බ්‍රිතාන්‍ය සහ ප්‍රන්ස අධිරාජ්‍යවාදියෝ මේ එක්සත් ජනපද ප්‍රතිපත්තියට අනුබල දෙති. බොහෝ දෙනාට මේ තත්වය තවම පැහැදිලි ව නො පෙනේ; එහෙත් බාගවිට වැඩි කලක් යන්ට මත්තෙන් ඔවුන්ට පෙනෙනවා ඇත.

දූන් චීන ජනතාව ත්, සියලු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ ත්, සියලු මහජන සංවිධාන ත් ඉදිරියේ තිබෙන ප්‍රශ්නය නම් විප්ලවය කෙළවර තෙක් ගෙන යනවා ද, නැතහොත් එය අතර මග අත හැර දමනවා ද යනු යි. විප්ලවය කෙළවර තෙක් ගෙන යන්ට නම්, අපි ප්‍රතිගාමිත්වයේ සියලු බලවේග ස්ථිර ලෙස, අනූන ලෙස, මුළුමනින් ම සහ සම්පූර්ණයෙන් ම මුල්පිස දමනු පිණිස විප්ලවවාදී ක්‍රමය පාවිච්චි කළ යුත්තෙමු; අපි අචල ලෙස අධිරාජ්‍යවාදය, රදළවාදය සහ නිලධාරි–ධනවාදය පෙරළා දැමීමෙහි අත නෑර ම යෙදී සිටිය යුත්තෙමු; අපි කුඹමින්තාං ආණ්ඩුවේ ප්‍රතිගාමී පාලනය දේශ–ව්‍යාප්ත පරිමාණයකින් පෙරළා දමා, නිර්ධනපංක්තියේ නායකත්වය යටතේ පවත්නා වූ ද කම්කරු–ගොවි සන්ධානය ස්වකීය ප්‍රධාන දේහය වශයෙන් ඇත්තා වූ ද මහජන ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වයක් වන සමූහාණ්ඩුවක් පිහිටුවිය යුත්තෙමු. මේ අයුරින්, චීන ජාතිය පීඩකයා සම්පූර්ණයෙන් අහකට තල්ලු කර දමනවා ඇත; රට අර්ධ–විජිතයකින් සැබැවට ම ස්වාධීන වූ රාජ්‍යයක් බවට විපර්යාස කරනවා ඇත; චීන ජනතාව, රදළ පීඩනය ත් නිලධාරි–ප්‍රාග්ධනය (චීන ඒකාධිකාරි ප්‍රාග්ධනය) විසින් කරන පීඩනය ත් යන දෙක ම සදහට ම පෙරළා දමා, පූර්ණ නිවහල්භාවය දිනා ගන්නවා ඇත; ඔව්හු එසේ සමගියේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම මත සාමය අත්පත් කර ගන්නවා ඇත, චීනය කෘෂිකාර්මික රටකින් කර්මාන්තමය රටක් බවට විපර්යාස කිරීම පිණිස කලින් තිබිය යුතු තත්වයන් නිර්මාණය කරනවා ඇත, මිනිසා විසින් මිනිසා සූරාකෑම කැරෙන සමාජයකින් සමාජවාදී සමාජයක් බවට වර්ධනය වීමට ඇට හැකි කරනවා ඇත. විප්ලවය අතරමග අත හැර දැම්මොත්, එහි තේරුම වන්නේ ජනතාවගේ කැමැත්තට විරුද්ධ ව යාම ය, විදේශීය ආක්‍රමණිකයන්ගේ ත් චීන ප්‍රතිගාමීන්ගේ ත් කැමැත්තට හිස නැමීම ය, කවදා හෝ දවසක උන්හිටිගමන් විප්ලවයේ

ගෙල මිරිකන්නට ඉදිරියට පැන, යළි ත් මුළු රට ම අඳුරෙහි ගිල්වන්නට කුඹමින්තාං ආණ්ඩුවට හැකි වන සේ, තම තුවාල සුව කර ගැනීමට ඉඩ-ප්‍රස්තාවක් ඒ ආණ්ඩුවට දීම ය. ප්‍රශ්නය දූන් පැහැදිලි ලෙස ත් තියුණු ලෙස ත් ඉදිරිපත් වී තිබෙන සැටි එසේ ය. මේ පාරවල් දෙකෙන් තෝරා ගත යුත්තේ කොයි එක ද? චීනයෙහි හැම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් ම, හැම මහජන සංවිධානයක් ම මේ ප්‍රශ්නය ගැන සිතා බැලිය යුතු ම ය, තමාගේ පාර තෝරා ගත යුතු ම ය, තමා සිටින තැන පැහැදිලි කළ යුතු ම ය. අතර මගදී වෙන් වී නො ගොස් අවංක ලෙස සහයෝග වන්නට චීනයේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ වලට සහ මහජන සංවිධාන වලට හැකි ද යන්න රඳා පවතින්නේ ඒවා මේ ප්‍රශ්නය උඩ එකඟතාවක් ඇති කරගෙන තිබේ ද, චීන ජනතාවගේ පොදු සතුරා පෙරළා දැමීමට ඒකමතික ව ක්‍රියා කරන්නේ ද යන්න උඩ ය. මෙහිදී උවමනා කරන්නේ ඒකමතිකභාවය සහ සහයෝගය යි, කිසියම් ''විරුද්ධ කට්ටියක්'' ඇති කිරීම හෝ කිසියම් ''මැද පාරක්''[4] ලුහුබැඳීම හෝ නො වේ.

1927, අප්‍රේල් 12වැනි දින ප්‍රති–විප්ලවවාදී කූදෙතාවේ[5] සිට අද දක්වා ගත වී ඇති අවුරුදු විස්සකට වැඩි දීර්ඝ කාලය තුළ, චියැං කායි–ශෙක් සහ ඔහුගේ ගණයේ අය ප්‍රමුඛ චීන ප්‍රතිගාමීන්, ඔවුන් ඇසිපිය නො හෙළා මිනිසුන් ඝාතනය කරන ලේ තවරා ගත් වධකයන් රැලක් බවට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නැද්ද? ඔවුන් වෘත්තියෙන් ම ද්‍රෝහීන් සහ අධිරාජ්‍යවාදය පස්සේ දුවන බල්ලන් රංචුවක් බවට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නැද්ද? හැම දෙනා ම එගැන සිතා බලත්වා! 1936 දෙසැම්බරයේ සියාන් සිද්ධියේ සිට, 1945 ඔක්තෝබරයේ චුංකිං සාකච්ඡා වල සිට සහ 1946 ජනවාරියේ දේශපාලන සාකච්ඡාසභාවේ සිට මේ පල්හොරුන් නඩය සමග අභ්‍යන්තර සාමය අත්පත් කර ගැනීමේ බලාපොරොත්තුවෙන් චීන ජනතාව ඔවුන් කෙරෙහි කොතරම් නම් ත්‍යාගශීලි ලෙස ක්‍රියා කර තිබේ ද! එහෙත් මේ සියලු හොඳහිත නිසා ඔවුන්ගේ පංක්ති ස්වභාවය උකුණු හිසක් තරම් වත් වෙනස් වී තිබේ ද? මේ පල්හොරුන් ගෙන් එකකු වත් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයෙන් වෙන් කළ නො හැකි බව ඔවුන්ගේ ඉතිහාසයෙන් ඔප්පු වේ. එක්සත් ජනපද අධිරාජ්‍යවාදය මත හේත්තු වී, ඔවුන් අපේ රටවැසියන් 47 කෝටි 50 ලක්ෂයක් පෙර නුවූ විරූ ලෙස දරුණු වූ විසාල සිවිල් යුද්ධයකට ඇද දමා, සියල්ල ම එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් සපයනලද දේ වූ බෝම්බ හෙලන අහස්යානා, සටන් අහස්යානා, කාලතුවක්කු, යුදටැංකි, රොකට්–ලෝන්චර, ස්වයං–ක්‍රිය රයිපල් තුවක්කු, ගැසොලින් බෝම්බ, ගෑස් ප්‍රොජෙක්ටයිල සහ වෙනත් ආයුධ වලින් තරුණ සහ මහළු පිරිමින් සහ ගැහැණුන් දස ලක්ෂ ගණන් ඝාතනය කර ඇත. මේ අපරාධකාරයන් මත හේත්තු වී, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ද චීනයට ම අයත් භූමිප්‍රදේශය, මුහුදු සහ අහස් ප්‍රදේශය කෙරෙහි චීනය සතු ස්වාධිපති අයිතිවාසිකම්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පැහැර ගෙන ඇත, රට තුළ යාත්‍රා කිරීමේ අයිතිවාසිකම් සහ විශේෂ වාණිජ්‍ය වරප්‍රසාද පැහැර ගෙන ඇත, චීනයේ දේශීය සහ විදේශීය කටයුතු වලදී විශේෂ වරප්‍රසාද පැහැර ගෙන ඇත, කිසි ම දඬුවමක් හෝ විපාකයක් විඳින්නට සිදු වන්නේ නැතිව මිනිසුන් මැරීමේ, ඔවුන්ට පහර දීමේ, ඔවුන්ගේ ඇඟ උඩින් මෝටර්රිය පැදවීමේ සහ ස්ත්‍රීන් තනිස් කිරීමේ වරප්‍රසාදය පවා පැහැර ගෙන ඇත. එතරම් දීර්ඝ සහ දරුණු යුද්ධයක් කරන්නට බලෙන් ම සිදු වී සිටින චීන ජනතාව මේ ඉතා ම දුෂ්ට සතුරන් වෙත තවම ත් ආදරය සහ දයාව දැක්විය යුතු ය'යි, ඔවුන් සම්පූර්ණයෙන් ම විනාශ කර දැමීම හෝ පළවා හැරීම නො කළ යුතු ය'යි කිව හැකි ද? චීන ප්‍රතිගාමීන් සම්පූර්ණයෙන් ම විනාශ කර දැමීමෙන් සහ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ආක්‍රමණකාරි බලවේගයන් සම්පූර්ණයෙන් ම පළවා හැරීමෙන් පමණකි, චීනයට ස්වාධීනත්වය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සාමය ලබා ගත හැකි වන්නේ. මේ සත්‍යය මේ වන විට උවමනා තරම් පැහැදිලි වී නැද්ද?

අවධානය යොමු විය යුතු කාරණය නම් උන්හිටිහැටියේ ම චීන ජනතාවගේ මේ සතුරන් අහිංසක සහ අනුකම්පා උපදවන සුලු විලාශයක් රුවා ගන්නට තමන්ට හැකි වැඩි ම දේ කරන බව ය (පාඨකයිනි, කරුණාකර මතක තබා ගන්න, ඔවුන් අනාගතයේදී යළිත් අනුකම්පා උපදවන විලාශයෙන් පෙනෙන්නට උත්සාහ කරනවා ඇත). දැන් කුඕමින්තාං ආණ්ඩුවේ විධායක සභාවේ සභාපති වී සිටින සුන් පෝ "අප යුද්ධමය වශයෙන් කෙළවර තෙක් සටන් කරතොත්, අන්තිමේදී බේරුමක් එනවා ඇතැ",යි ගිය අවුරුද්දේ ජූනි මාසයේ කීවේ නැද්ද? එහෙත් මේ වතාවේ, ඔහු නිලය බාර ගත් මොහොතේ ම "නම්බුකාර සාමයක්" ගැන වාචාල ලෙස කතා කරමින්, "ආණ්ඩුව සාමය ඇති කිරීම පිණිස මහන්සි වී ඇත, සටන් කරන්නට වූයේ සාමය මුදුන්පත් කර ගත නො හැකි වූ නිසා පමණි; එහෙත් සටන් කිරීමේ අන්තිම අරමුණ යළිත් සාමය ඇති කිරීම ම වේ", ය'යි කීවේ ය. ඊට පසු වහා ම, දෙසැම්බර් 21වැනි දින, ශැංහයි නුවරින් යැවුණු යුනයිටඩ් ප්‍රස් ප්‍රවෘත්ති වාර්තාවක් සුන් පෝ කළ ප්‍රකාශය එක්සත් ජනපදයේ නිලධාරි කොටස් තුළ ත් කුඕමින්තාං ලිබරල්වරුන් අතර ත් පුළුල් ලෙස අනුමත කරනු ලබනවා ඇතැ'යි අනාවැකි කීවේ ය. දැනට, එක්සත් ජනපද නිලධාරි චීනයෙහි "සාමය" ගැන ලොකු උනන්දුවක් දක්වන්නට පටන් ගෙන සිටිනවා පමණක් නො වෙත්; 1945 දෙසැම්බරයෙහි සෝවියට් සංගමයේ, එක්සත් ජනපදයේ සහ බ්‍රිතාන්‍යයේ විදේශ ඇමතිවරුන්ගේ මොස්කව් සාකච්ඡාසභාවේ සිට, එක්සත් ජනපදය "චීනයේ අභ්‍යන්තර කටයුතු වලට ඇඟිලි නො ගැසීමේ ප්‍රතිපත්තියක" නියැලී සිටී ය'යි යළි යළි ත් තිර කොට කියති. "මහත්තුරුන්ගේ රටෙන්" එන මේ නම්බුකාරයන් ගැන අප ක්‍රියා කළ යුත්තේ කෙසේ ද? මෙහිදී, පැරණි ග්‍රීක උපමාකතාවක් ගෙනහැර පෑම උචිත ය. ශීතසෘතුවේ එක් උදෑසනක, ගොවිකුලීකරුවකුට සීතලෙන් ගල් වී සිටි නයෙක් හමු විය. කරුණාවෙන් හරිත වී,

සහයෝග වෙනවා ඇත. ඔව්හු එළිපිට සහ රහසින් ද, කෙළින් ම සහ වටරවුමෙන් ද යොදන හැම උපාමාරුවක් ම යොදනවා ඇත. එහෙත් ඔවුන්ගේ දේශපාලන කූටෝපක්‍රම ද ඔවුන්ගේ යුද්ධමය ප්‍රහාරයන් මෙන් ම පරාජයට පත් වන බව නිශ්චය වශයෙන් ම කිව හැකි ය. කොපමණ වත් අත්දැකීම් ලබා ඇති හෙයින්, චීන ජනතාව ත් ඔවුන්ගේ මහ සෙනෙවි මණ්ඩලය වන චීන කොමියුනිස්ට් පක්ෂය ත් සතුරාගේ යුද්ධමය ප්‍රහාරයන් සුණුවිසුණු කළාක් මෙන් ම ඔහුගේ දේශපාලන කූටෝපක්‍රම ද පොඩිපට්ටම් කර දමා, මහජන විමුක්ති යුද්ධය කෙළවර තෙක් ගෙන යනවා සහතික ය.

1949දී, චීන මහජන විමුක්ති හමුදාව යැංසී ගඟෙන් දකුණට ඉදිරියට ගමන් කරනවා ඇත, 1948දීට ත් වඩා ලොකු ජයග්‍රහණයන් දිනා ගන්නවා ඇත.

1949දී, ආර්ථික පෙරමුණෙහි, අපි 1948දීට ත් වඩා ලොකු සාර්ථකභාවයන් අත්පත් කර ගනිමු. අපේ කෘෂිකාර්මික සහ කර්මාන්තමය නිෂ්පාදනය කලින්ට වඩා ඉහළ මට්ටමකට නඟිනවා ඇත; දුම්රිය සහ මහා මාර්ග ගමනාගමනය සම්පූර්ණයෙන් ම යථා තත්වයට පත් කරනු ලබනවා ඇත. මහජන විමුක්ති හමුදාවේ ප්‍රධාන සේනාවෝ ස්වකීය සටන්ව්‍යාපාර වලදී ගෙරිල්ලා සංග්‍රාමයේ යම් යම් ඉතුරු කොටස් ඉවත දමා, නිත්‍ය හමුදාවක් වශයෙන් වඩා ඉහළ මට්ටමකට පත් වෙනවා ඇත.

1949දී, දේශපාලන සාකච්ඡාසභාව, කිසි ම ප්‍රතිගාමියකු සහභාගි වන්නේ නැතිව සහ ජනතාවගේ විප්ලවයේ කර්තව්‍යයන් මුදුන්පත් කිරීම ස්වකීය අරමුණ වශයෙන් ඇතිව, කැඳවනු ලබනවා ඇත, චීන මහජන සමූහාණ්ඩුව ප්‍රකාශයට පත් කරනු ලබනවා ඇත, සමූහාණ්ඩුවේ මධ්‍යම ආණ්ඩුව පිහිටුවනු ලබනවා ඇත. මේ ආණ්ඩුව, ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂ සහ මහජන සංවිධාන නියෝජනය කරන උචිත පුද්ගලයන්ගේ සහභාගිත්වය ඇතිව, චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ පවතින ප්‍රජාතන්ත්‍රවාදි සභාග ආණ්ඩුවක් වෙනවා ඇත.

චීන ජනතාව ත්, චීන කොමියුනිස්ට් පක්ෂය ත්, සියලු ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂ සහ මහජන සංවිධාන ත් 1949දී මුදුන්පත් කරන්නට වෙර දැරිය යුතු ඇත්තට ම තිබෙන ප්‍රධාන කර්තව්‍ය මේවා ය. අපි මේ කර්තව්‍යයන් මුදුන්පත් කිරීම පිණිස සියලු දුෂ්කරතාවන්ට අභීත ව මුහුණ දෙමු, එකා මෙන් සමඟි වෙමු.

අපේ අරගලයේදී අපි අවුරුදු දහස් ගණනක රදළ පීඩනය ත් අවුරුදු සියයක අධිරාජ්‍යවාදි පීඩනය ත් සදහට ම පෙරළා දමමු. 1949යේ අවුරුද්ද ඉමහත් ලෙස වැදගත් අවුරුද්දක් වෙනවා ඇත. අපි අපේ පරිශ්‍රමයන් දෙගුණ කළ යුත්තෙමු.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ස ට හ න්

[1]1945දී ජපනුන් යටත් වූ පසු, කුඔමින්තාං ආණ්ඩුව ලියාඕනිං, කිරින් සහ හෙයිලුංචියාං යන ඊසානදිග පළාත් තුන ලියාඕනිං, ලියාඕපෙයි, ආන්තුං, කිරින්, හෝචියාං, සුංචියාං, හෙයිලුංචියාං, නුන්චියාං සහ ශිංආන්'යි පළාත් නවයකට බෙදී ය. 1949දී අපේ ඊසානදිග පරිපාලක මණ්ඩලය මේ ප්‍රදේශය ලියාඕතුං, ලියාඕශි, කිරින්, හෙයිලුංචියාං සහ සුංචියාං'යි පළාත් පහකට නැවත බෙදී ය. ජෙහොල් ද සමග, මේ පළාත් එකල ඊසානදිග පළාත් හය වශයෙන් හඳුන්වනු ලැබී ය. 1954දී මධ්‍යම මහජන ආණ්ඩු මණ්ඩලය ලියාඕතුං සහ ලියාඕශි යන පළාත් දෙක ලියාඕනිං යන එක් පළාත බවට ද සුංචියාං සහ හෙයිලුංචියාං යන පළාත් දෙක හෙයිලුංචියාං යන එක් පළාත බවට ද එකතු කළේ ය; ඒ අතර කිරින් පළාත නො වෙනස් ව එසේ ම තිබෙන්නට හරිනලදී. 1955දී ජෙහොල් පළාත නැති කොට, කලින් එහි අධිකරණ බලය යටතේ පැවති ප්‍රදේශය බෙද, හෝපෙයි සහ ලියාඕනිං යන පළාත් වලට ද ඇතුල් මොන්ගෝලියා ස්වතන්ත්‍ර ප්‍රාන්තයට ද එකතු කරනලදී.

[2]මේ ප්‍රධාන ස්ථාන අල්ලා ගත් දින මෙසේ ය: ශිචියාවුආං, 1947, නොවැම්බර් 12; යුන්චෙං, 1947, දෙසැම්බර් 28; සපිංකායි, 1948, මාර්තු 13; ලෝයාං, පළමු වරට 1948, මාර්තු 14, යළි 1948, අප්‍රේල් 5; යිචුආන්, 1948, මාර්තු 3; පාඕකි, 1948, අප්‍රේල් 26; වෙයිශියන්, 1948, අප්‍රේල් 27; ලින්පන්, 1948, මැයි 17; කායිපං, 1948, ජූනි 22. මේ සියලු ම නගර මුරගෙවල් පේළි රැසකින් වටකොට රැකවල් ලා තිබිණි; ඇතැම් නගර වටා උස මහත නගර පවුරු ද විය; එමතු නො ව අගල් පේළි, කටුකම්බි පේළි සහ දඬුවැට පේළි රැසක් ඇතුළු අතිරේක ආරක්ෂක කටයුතු ද යොද තිබුණි. අපේ හමුදාවට ඒ කාලයේ අහස්යානා වත් ටැන්කි වත් තිබුණේ නැත; කාලතුවක්කු ද තිබුණු නො තිබුණු තරම් ය. මේ නගර වලට පහර දී අල්ලා ගැනීමෙන්, අපේ හමුදාව ශක්තිමත් රක්ෂස්ථාන අල්ලා ගැනීම සඳහා උපක්‍රම මුළු තොගයක් ඉගෙනගත්තේ ය. ඒ උපක්‍රම මෙවා ය:

(1) එක පිට එක කරන බිඳ දැමීම — ආරක්ෂාව සඳහා සතුරා ඉදි කර තිබෙන දේ එක පිට එක බිඳ දැමීම පිණිස පුපුරණ ද්‍රව්‍ය පාවිච්චි කිරීම;

(2) උමං සටන් — සතුරාගේ මුරගෙවල් හෝ නගර පවුරු කරා සහ ඒවා යටින් රහසේ ම උමං හාරා, ඉක්බිති පුපුරන ද්‍රව්‍ය යොද ඒවා පුපුරුවා හැරීම සහ ඊට පසු දරුණු ප්‍රහාරයන් දීම;

(3) ළඟාවන අගල් සටන් — සතුරාගේ රක්ෂස්ථාන දෙසට අගල් හාරා, ඉක්බිති ආවරණය යටතේ සතුරාට ළං වී හදිස්සි ප්‍රහාරයන් දීම;

(4) පුපුරන පොදි විදීම — සතුරාගේ ආරක්ෂාවන් විනාශ කරනු පිණිස මිසයිල-ප්‍රොජෙක්ටර් හෝ මෝටර වලින් පුපුරන ද්‍රව්‍ය අඩංගු පොදි විදීම

(5) "තියුණු පිහි" උපක්‍රම — කඩාබිඳගෙන ඇතුළට වැදීමක් කරනු පිණිස ත් සතුරු සේනා එකිනෙකින් කපා හැරීම පිණිස ත් මිනිස්බලය සහ වෙඩිබලය එක්තැන් කිරීම

[3]මෙහි සඳහන් කර තිබෙන බ්‍රිගේඩ කුඔමින්තාං හමුදාව ප්‍රතිසංවිධානය කළ පසු බ්‍රිගේඩ වශයෙන් නම් කළ ඒවා ය; ඩිවිසන් ප්‍රතිසංවිධානයට පෙර තිබුණු ඩිවිසන් ය (ඒවා බොහෝ දුරට ප්‍රතිසංවිධානය කළ බ්‍රිගේඩ වැනි විය).

[4]"මැද පාර" "තුන්වැනි පාර" වශයෙන් ද හඳුන්වනු ලැබී ය. මහජන විමුක්ති යුද්ධයේ මුල් අවස්ථාවේදී ඇතැම් ප්‍රජාතන්ත්‍රවාදී පුද්ගලයෝ මහ ඉඩම්හිමියන්ගේ සහ මහ ධනේශ්වර-

යන්ගේ කුඔමින්තාං ආඥාදායකත්වය ත් නැතිව, චීන කොමියුනිස්ට පක්ෂයේ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය ත් නැතිව, ඊනියා තුන්වැනි පාරක් සොයා ගන්නට තමන්ට හැකි වේ ය'යි කල්පනා කළහ. මේ තුන්වැනි පාර ඇත්ත වශයෙන් බ්‍රිතාන්‍ය සහ එක්සත් ජනපද මෝස්තරය අනුව සකස් වූ ධනේශ්වරපංක්තියේ ආඥාදායකත්වයක් කරා යන පාරක් විය.

[5]මේ පොතේ 339 පිටුවේ පළ වන "දෙවැනි කොමියුනිස්ට-විරෝධී ප්‍රහාරය පළවා හැරීම ගැන නිගමන" නමැති ලිපියට යොද තිබෙන 2වැනි සටහන බලන්න.

[6]ඊසොප්ගේ උපමාකතා වල එන "හොඳට නරක" යන කථාව.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

හමුදව වැඩ කරන බලපිරිසක් බවට හරවන්න

1949, පෙබරවාරි 8

ඔබගේ 4වැනි ද විදුලිසංදේශය ලැබී තිබේ. ඔබ පුහුණු වීම සහ තහවුරු වීම ඉක්මන් කිරීම ත් නියමිත කාලයට මසකට කලින් ගමන් කරන්ට සූදනම් වීම ත් හොඳ ය.[1] කරුණාකර මේ මං ඔස්සේ දිගට ම යන්න, අතපසු නො කරන්න. කෙසේ වේවා, ඇත්ත වශයෙන්, පුහුණු වීම ත් තහවුරු වීම ත් මාර්තුවෙහි දිගට ම කරගෙන යා යුතු ය; ප්‍රතිපත්තිය හැදෑරීම අවධාරණය කළ යුතු ය, විශාල නගර පවරාගෙන පරිපාලනය කරන්ට කටයුතු සූදනම් කළ යුතු ය. මෙතැන් සිට, ඉකුත් අවුරුදු විස්ස තිස්සේ අනුගමනය කළ සූත්‍රය, එනම් ''පළමුකොට ගම්බද පෙදෙස්, ඉක්බිති නගර'' යන්න, අනික් අතට හරවා ''පළමුකොට නගර, ඉක්බිති ගම්බද පෙදෙස්'' යන සූත්‍රයට වෙනස් කරනවා ඇත. හමුදව සටන් කරන බලපිරිසක් පමණක් නො වේ, එය ප්‍රධාන වශයෙන් වැඩ කරන බලපිරිසකි. සියලු ම හමුද කාඩර්වරු නගර පවරාගෙන පරිපාලනය කරන සැටි උගත යුතු ය. නගරබද වැඩ වලදී, ඔවුහු අධිරාජ්‍යවාදින් සහ කුඕමින්තාං ප්‍රතිගාමීන් ගැන ක්‍රියා කිරීමට හපන් වන සැටි, ධනේශ්වරපංක්තිය ගැන ක්‍රියා කිරීමට හපන් වන සැටි, කම්කරුවන්ට නායකත්වය දීමට සහ වෘත්තීය සමිති සංවිධානය කිරීමට හපන් වන සැටි, තරුණයන් ක්‍රියාකාරී කොට සංවිධානය කිරීමට හපන් වන සැටි, අළුත් නිදහස් ප්‍රදේශ වල කාඩර්වරුන් සමග එක්සත් වීමට සහ ඔවුන් පුහුණු කිරීමට හපන් වන සැටි, කර්මාන්ත සහ වාණිජ්‍යය පාලනය කිරීමට හපන් වන සැටි, පාසල්, පුවත්පත්, ප්‍රවෘත්ති ඒජන්සි සහ ගුවන්විදුලි ප්‍රචාරක ස්ථාන පවත්වාගෙන යාමට හපන් වන සැටි, විදේශ කටයුතු ගැන ක්‍රියා කිරීමට හපන් වන සැටි, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සහ මහජන සංවිධාන පිළිබඳ ප්‍රශ්න ගැන ක්‍රියා

[1] මේ විදුලිසංදේශය දෙවැනි සහ තුන්වැනි ක්ෂේත්‍ර හමුද වලින් ලැබුණු විදුලිසංදේශයකට පිළිතුරු වශයෙන් චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ විප්ලවවාදී යුද්ධ අධිකාරිය සඳහා සහෝදර මාඕ සේතුං විසින් ලියන ලදී. එය අදාළ සෙසු ක්ෂේත්‍ර හමුද වෙත සහ මධ්‍යම කාරකසභාවේ බියුරෝ වෙත ද යවන ලදී. ලියාඕශි-ශෙන්යාං, හුආයි-හායි සහ පීපිං-තියන්ශින් යන මහා යුද්ධව්‍යාපාර තුනට පසු දරුණු සටන් වකවනුව අවසන් වී ඇතැ'යි සලකමින්, සහෝදර මාඕ සේතුං මහජන විමුක්ති හමුදව සටන් කරන බලපිරිසක් පමණක් නො ව ඒ එක්ක ම වැඩ කරන බලපිරිසක් ද වන බව ත්, ඇතැම් තත්වයන් යටතේ එය ප්‍රධාන වශයෙන් වැඩ කරන බලපිරියක් ලෙස ක්‍රියා කළ යුතු බව ත් යථා කාලයෙහි පෙන්වා

කිරීමට හපන් වන සැටි, නගර සහ ගම්බද පෙදෙස් අතර සබඳකම් එකලෙසක් කිරීමට ද ආහාර, බිම්අඟුරු සහ වෙනත් අවශ්‍ය දේ පිළිබඳ ගැටළු විසඳීමට ද හපන් වන සැටි සහ, කාසි සහ මුදල් පිළිබඳ ගැටළු ගැන ක්‍රියා කිරීමට හපන් වන සැටි උගත යුතු ය. කොටින්, ඔබ මෙතැන් සිට, අතීතයේදී අපේ හමුද කාඩර්වරුන් සහ සටන්කරුවන් හුරු පුරුදු වී නො සිටි, සියලු නගරබද ප්‍රශ්න වලට උර දිය යුතු ය. ඔබ ඉදිරියට ගමන් කොට, පළාත් හතරක් හෝ පහක් අල්ලා ගත යුතු ව ඇත; නගර වලට අමතර ව, සුවිශාල ගම්බද පෙදෙස් ගැන ද මිඩංගු වීමට ඔබට සිදු වෙනවා ඇත. දකුණෙහි සියලු ම ගම්බද පෙදෙස් අළුතෙන් ම නිදහස් කරනු ලබන හෙයින්, එහි වැඩ උතුරේ පරණ නිදහස් ප්‍රදේශ වල වැඩ වලට මූලික වශයෙන් වෙනස් වෙනවා ඇත. මුල් අවුරුද්දේදී, බදු සහ පොලී අඩු කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදන්ට බැරි ය; බදු සහ පොලී දළ වශයෙන් කලින් ගෙවූ ලෙස ම ගෙවන්ට සිදු වෙනවා ඇත. අපේ ගම්බද වැඩ කරගෙන යා යුතු වන්නේ මෙන්න මේ තත්වයන් යටතේ ය. එහෙයින්, ගම්බද වැඩ ද අළුතෙන් ම ඉගෙනගත යුතු වේ. කෙසේ වේවා, නගරබද වැඩ හා සසඳන කල, ගම්බද වැඩ ඉගෙනගැනීම පහසු ය. නගරබද වැඩ ඊට වඩා අමාරු ය, එය ඔබ හදාරන ප්‍රධාන විෂයය වේ. අපේ කාඩර්වරුන්ට නගර පරිපාලනය කිරීම ඉක්මනින් ම හොඳට ප්‍රගුණ කරන්ට බැරි වෙතොත්, අපට ලොකු ම අමාරුකම් වලට මුහුණ පාන්ට සිදු වෙනවා ඇත. ඒ නිසා ඔබ පෙබරවාරියේදී සෙසු සියලු ප්‍රශ්න බේරුම් කොට, මුළු මාර්තු මාසය ම නගර වල ත් අළුත් නිදහස් ප්‍රදේශ වල ත් වැඩ කරන සැටි උගෙනීමට මිඩංගු කළ යුතු ය. කුඕමින්තාං පක්ෂයට සිටින්නේ විශාල භූමිප්‍රදේශයක් පුරා විසිරී ගිය භටයන් දස ලක්ෂයකුත් සිය දහස් ගණනක් පමණකි. සත්තකින් ම, සටන් බොහෝ ගණනක් කරන්ට තවම තිබේ; එහෙත් හුආයි–හායි යුද්ධව්‍යාපාරයේදී මෙන් විශාල පරිමාණයේ සටන් ඇති වෙන්ට තිබෙන ඉඩකඩ අල්ප ය; එබඳු ඉඩකඩක් ඇත්තේ ම නැතැ'යි කියා සහ දරුණු සටන් කළ කාලය ඉවර වී ඇතැ'යි කියා පවා කියන්ට ඉඩ තිබේ. හමුදව තවම සටන් කරන බලපිරිසකි, මේ අතින් කිසි ම බුරුලක් ඒකාන්තයෙන් ම නො තිබිය යුතු ය; බුරුල් කිරීම වරදක් වෙනවා ඇත. ඒ එසේ වුව ද, හමුදව වැඩ කරන බලපිරිසක් බවට හැරවීමේ කර්තව්‍යය අපට පණවා ගැනීමට කාලය ඇවිත් තිබේ. අප දැන් ම මේ කර්තව්‍යය අපට පණවාගෙන, එය ඉටු කරන්ට අධිෂ්ඨාන කරගන්නේ නැත් නම්, අප ඉතා ලොකු වරදක්

දුන්නේ ය. මේ ප්‍රතිපත්තිය අළුත් නිදහස් ප්‍රදේශ වල එකල පැවති කාඩර් ප්‍රශ්නය විසඳීමෙහි ලා ත්, ජනතාවගේ විප්ලවවාදී ව්‍යායාමය සන්සුන් ලෙස වර්ධනය වීම සහතික කිරීමෙහි ලා ත් ඉතා වැදගත් කොටසක් රඟපෑවේ ය. සටන් කරන බලපිරිසක් සහ වැඩ කරන බලපිරිසක් යන දෙක ම වශයෙන් මහජන විමුක්ති හමුදවේ ස්වභාවය සම්බන්ධයෙන්, ''චීන කොමියුනිස්ට් පක්ෂයේ හත්වැනි මධ්‍යම කාරකසභාවේ දෙවැනි පූර්ණ සැසියට ඉදිරිපත් කළ වාර්තාවේ'' IIවැනි කොටස ද බලන්න; මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං, 1961, IVවැනි කාණ්ඩය, පිටු 362-63.

LIBERATION BASE

https://liberationbase.wordpress.com

කරනවා ඇත. අපි හමුදව ත් සමග කාඩර්වරුන් 53,000ක් දකුණට එවීමට සූදනම් කරගෙන යමු; එහෙත් මෙය ඉතා කුඩා ගණනකි. පළාත් අටක් හෝ නවයක් ද ලොකු නගර විසි තිස් ගණන් ද අල්ලාගැනීම නිසා වැඩ කරන කාඩර්වරුන් සුවිශාල සංඛ්‍යාවක් අවශ්‍ය වෙනවා ඇත; මේ ගැටළුව විසඳීමට හමුදව ප්‍රධාන වශයෙන් තමා මත ම විශ්වාසය තබා වැඩ කළ යුතු වේ. හමුදව පාසලකි. 21,00,000ක් සිටින අපේ ක්ෂේත්‍ර හමුදාවෝ විශ්වවිද්‍යාල සහ ද්විතීය පාඨශාලා දහස් ගණනකට සම වෙති. අපේ වැඩ කරන කාඩර්වරුන් සැපයීම පිණිස ප්‍රධාන වශයෙන් හමුදව මත විශ්වාසය තබන්ට අපට සිදු වේ. ඔබ මේ කරුණ පැහැදිලි ලෙස තේරුම් ගත යුතු ය. දරුණු සටන් මූලික වශයෙන් අවසන් වී ඇති හෙයින්, හමුදාවේ මිනිස්බලය ත් උපකරණ ත් අතින් තිබෙන අඩුපාඩු සම්පූර්ණ කිරීම නිසි සීමාවන් ඇතුළත තිබිය යුතු ය; ප්‍රමාණය, තත්වය සහ සම්පූර්ණභාවය අතින් උවමනාවට වඩා ඉල්ලා නො සිටිය යුතු ය; නැතහොත්, එයින් මුදල් අර්බුදයක් ඇති වෙන්ට ඉඩ තිබේ. එය ද ඔබ බැරෑරුම් ලෙස සලකා බැලිය යුතු තවත් කරුණකි. ඉහතින් සඳහන් ප්‍රතිපත්ති සිව්වැනි ක්ෂේත්‍ර හමුදාවට ද සම්පූර්ණයෙන් ම යෙදේ; ඒවාට අවධානය යොමු කළ යුතු ය'යි ලින් පියාඕ සහ ලෝ ජුං-හුආන් සහෝදරවරුන් ගෙන් ද එපරිද්දෙන් ම ඉල්ලා සිටිනු ලැබේ. අප සහෝදර කාං ශෙං සමග දිගින් දිගට කතා කර ඇත, ඔබ සමග සාකච්ඡා කරනු පිණිස 12වැනි ද වන විට ඔබ සිටින තැනට කඩිනමින් යන ලෙස ඔහුට කියා ඇත. සාකච්ඡා කළ පසු, ඔබගේ අදහස් ද ඔබ කරන්ට යෝජනා කරන දේ ද කරුණාකර විදුලිපණිවිඩ මගින් වහා ම අපට දන්වා දෙන්න. දකුණට යන ගමන සැලැස්ම කිරීමට ඒකීභූත කළ පරිශ්‍රමයක් දැරීම පිණිස පොදු පෙරමුණු කොමිටිය[2] ත් තුන්වැනි ක්ෂේත්‍ර හමුදාවේ පෙරමුණු කොමිටිය ත් සමග එකතු වී වැඩ කරන්නට නැගෙනහිර චීන බියුරෝව ත් නැගෙනහිර චීන යුද්ධ ප්‍රදේශ මූලස්ථානය ත් වහා ම හ්සූචව් නුවරට යා යුතු ය. ඔබගේ සියලු ම පසුමුණු-ප්‍රදේශ වැඩ ශාන්ටුං උප-බියුරෝවට බාර දෙන්න.

ස ට හ න්

[1]දෙවැනි සහ තුන්වැනි ක්ෂේත්‍ර හමුද යැංසී ගඟ තරණය කිරීම 1949 අප්‍රියෙල් මාසයෙන් මාර්තු මාසයට ඉක්මන් කරන්නට සැලස්ම කර තිබුණි. ප්‍රතිගාමී කුඕමින්තාං ආණ්ඩුව සමග කරමින් තිබුණු සාම සාකච්ඡා නිසා ගඟ තරණය කිරීම අප්‍රෙල් මාසයේ අගට කල් දමනලදී.

[2]1948, නොවැම්බර් 16වැනි ද, හුආයි-හායි යුද්ධව්‍යාපාරයේ උවමනාවන් පිරිමසනු වස්, චීන කොමියුනිස්ට පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය, මධ්‍යම තැනි ක්ෂේත්‍ර හමුදාවේ ත් නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදාවේ ත් ඒකාබද්ධ නායකත්වය බාර ගැනීම සඳහා ද හුආයි-හායි පෙරමුණෙහි යුද්ධ කටයුතු සහ සටන්ව්‍යාපාර කෙරෙහි විධානය ක්‍රියාවේ යෙදීම සඳහා ද ලියු පෝ-චෙං, චෙන් යී, තෙං ශියාඕ-පිං, සූ යූ සහ තාන් චෙන්-ලින් යන සහෝදරවරුන් ගෙන් සැදුණු, සහෝදර තෙං ශියාඕ-පිං ලේකම් වශයෙන් සිටි, පොදු පෙරමුණු කොමිටියක් සකස් කරන්ට තීරණය කළේ ය.

රට පුරා ම ඉදිරියට ගමන් කරන්නට හමුදාවට දුන් ආඥාව

1949, අප්‍රෙල් 21

සියලු ක්ෂේත්‍ර හමුද වල සහෝදර අණදෙන්නන් සහ සටන්කරුවනි, දකුණේ ගෙරිල්ලා ප්‍රදේශ වල මහජන විමුක්ති හමුදාවේ සහෝදරවරුනි!

චීන කොමියුනිස්ට පක්ෂයේ නියෝජිතපිරිස ත් නැන්කිං කුඕමින්තාං ආණ්ඩුවේ නියෝජිතපිරිස ත් අතර පැවති දීර්ඝ සාකච්ඡා වලින් පසු කෙටුම්පත් කළ අභ්‍යන්තර සාමය ගැන සම්මතිය ඒ ආණ්ඩුව විසින් ප්‍රතික්ෂේප කර ඇත.[1] නැන්කිං කුඕමින්තාං ආණ්ඩුවේ වගකිවයුතු සාමාජිකයන් මේ සම්මතිය ප්‍රතික්ෂේප කර තිබෙන්නේ ඔවුන් තවම ත් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ත් කුඕමින්තාං පල්හොර නඩයේ දෙටුවා වන චියාං කායි-ශෙක්ගේ ත් අණ පිළිපදින නිසා සහ ඔවුන් තවම ත් චීන ජනතාවගේ විමුක්ති ව්‍යායාමයේ ප්‍රගතියට බාධා කරන්ට ත් අභ්‍යන්තර ප්‍රශ්නය සාමකාමී විධි මගින් විසඳීම වළකන්ට ත් උත්සාහ කරන නිසා ය. නියෝජිතපිරිස් දෙක විසින් සාකච්ඡා වලදී සකස් කරනලද වගන්ති විසිහතරකින් යුත් කොටස් අටකින් සමන්විත අභ්‍යන්තර සාමය ගැන සම්මතිය, ඒ සියල්ල ජාතියේ ත් ජනතාවගේ ත් පලප්‍රයෝජන මුල් කරගෙන සකස් කර ඇති හෙයින්, යුද්ධ අපරාධකාරයන් පිළිබඳ ප්‍රශ්නය ගැන දයා පරවශ ය, කුඕමින්තාං නිලධාරින්, සෙබළුන් සහ ආණ්ඩුවේ කාර්යභාරපුද්ගලයන් කෙරෙහි දයා පරවශ ය, සෙසු ප්‍රශ්න සඳහා උචිත විසඳුම් සපයන්නේ ය. මේ සම්මතිය ප්‍රතික්ෂේප කිරීමෙන් පෙනී යන්නේ කුඕමින්තාං ප්‍රතිගාමීන් ඔවුන් පටන් ගත් ප්‍රති-විප්ලවවාදි යුද්ධය අවසානය දක්වා ම කරගෙන යන්ට

මේ ආඥාව සහෝදර මාඕ සේතුං විසින් කෙටුම්පත් කරනලදී. ප්‍රතිගාමී කුඕමින්තාං ආණ්ඩුව අභ්‍යන්තර සාමය ගැන සම්මතියට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ පසු, මහජන විමුක්ති හමුදව, සභාපති මාඕ සේතුං සහ ප්‍රධාන අණදෙන්නා චූ තේ විසින් නිකුත් කළ මේ ආඥාව උඩ ක්‍රියා කරමින්, පෙර නො කළ විරූ පරිමාණයකින්, එතෙක් නිදහස් කර නො තිබුණු විසාල ප්‍රදේශ තුළට පොදු වශයෙන් ඉදිරියට ගමන් කිරීම ආරම්භ කළේ ය. 1949, අප්‍රෙල් 21වැනි ද උදේ, ලියු පෝ-චෙං, තෙං ශියාඕ-පිං සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද දෙවැනි ක්ෂේත්‍ර හමුදව ත්, චෙන් යී, සූ යූ, තාන් චෙන්-ලින් සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද තුන්වැනි ක්ෂේත්‍ර හමුදව ත් බටහිරෙහි

https://liberationbase.wordpress.com

අධිෂ්ඨාන කරගෙන සිටින බව ය. මේ සම්මතිය ප්‍රතික්ෂේප කිරීමෙන් පෙනී යන්නේ, මේ අවුරුද්දේ ජනවාරි 1වැනි ද සාම සාකච්ඡා යෝජනා කිරීමෙන් කුඕමින්තාං ප්‍රතිගාමීන් කළේ මහජන විමුක්ති හමුදාවේ ඉදිරිගමන ඇණ-හිටවා, එසේ විප්ලවවාදී බලවේගයන් තළා දැමීම පිණිස පසු ව ආපසු එන අදහසින් හුස්ම ගැනීමට පොඩි විවේකයක් ලබා ගන්ට උත්සාහ කිරීම පමණක් බව ය. මේ සම්මතිය ප්‍රතික්ෂේප කිරීමෙන් පෙනී යන්නේ සාකච්-ඡාවන් සඳහා පදනම වශයෙන් චීන කොමියුනිස්ට් පක්ෂයේ සාම කොන්දේසි අට පිළිගන්නා බව කියා පෑමෙන් නැන්කිං නුවර ලී ත්සුං-රන් ආණ්ඩුව කළේ හරි ම හරි කුහකකමක් බව ය. ලී ත්සුං-රන් ආණ්ඩුව යුද්ධ අපරාධ-කාරයන්ට දඬුවම් දීම, සියලු ප්‍රතිගාමී කුඕමින්තාං හටයන් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම උඩ ප්‍රතිසංවිධානය කිරීම සහ නැන්කිං ආණ්ඩුව ත් එහි සියලු මට්ටම් වල උප ආණ්ඩු ත් විසින් සියලු බලය සහ බලතල පවරා දීම වැනි මූලික කොන්දේසි කලින් ම පිළිගෙන තිබුණු හෙයින්, මේ මූලික කොන්-දේසි පදනම කරගෙන කෙටුම්පත් කළා වූ ද, ඉතා ම දයා පරවශ වූ ද විශේෂිත පියවර ප්‍රතික්ෂේප කිරීමට ඒ ආණ්ඩුවට කිසි ම හේතුවක් නො තිබුණේ ය. මේ වටාපිටා තත්වයන් තුළ, අපි ඔබට මෙහි පහත දක්වන අණ දෙමු:

(කියුච්යාං නුවරට ඊසානදිගින් පිහිටි) හූකෞ නුවර සිට නැගෙනහිරෙහි චියාංයින් නුවර තෙක් කිලෝමීටර් පන්සියයකට වඩා පැතුරුණු පෙරමුණක යැංසී ගඟ බලෙන් තරණය කොට, සතුරා මාස තුන හමාරක් තිස්සේ මහත් වෙහෙස දරා යැංසී ගඟ දිගට ගොඩනඟා තිබුණු ආරක්ෂණ පේළිය සම්පූර්ණයෙන් විනාශ කර දැමී ය. අප්‍රේල් 23වැනි ද මේ බල-සේනාවෝ අවුරුදු විසිදෙකක් ම කුඕමින්තාං පක්ෂයේ ප්‍රති-විප්ලවවාදී පාලනයේ මධ්‍යස්-ථානය වී තිබුණු නැන්කිං නගරය නිදහස් කළෝ ය; මෙය ප්‍රතිගාමී කුඕමින්තාං ආණ්ඩුවේ ඇදවැටීම සැලකෙළේ ය. ඉක්බිති ඒ බලසේනාවෝ වෙන වෙන මාර්ග ඔස්සේ දකුණට කාගෙන යමින්, මැයි 3වැනි ද හැංචව් නුවර ද මැයි 22වැනි ද නාන්චාං නුවර ද නිදහස් කොට, මැයි 27වැනි ද චීනයේ ලොකු ම නගරය වන ශැංහයි ඇල්ලුවෝ ය. ජූනියේදී ඔව්හු පූචියන් පළාත තුළට ඔවුන්ගේ ගමන ඇරඹූහ; ඔව්හු අගෝස්තු 17වැනි ද පූචව් නුවර ද, ඔක්තෝබර් 17වැනි ද ඇමෝයි ද නිදහස් කළහ. මැයි 14වැනි ද, ලින් පියාඕ, ලෝ ජුං-හුආන් සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද සිව්වැනි ක්ෂේත්‍ර හමුදාව වූහාන් නුවරට නැගෙනහිරින් තුආන්පෙං-වූශූජ් කොටසෙහි කිලෝමීටර් සියයකට වැඩි පෙරමුණක යැංසී ගඟ බලෙන් තරණය කළේ ය. මැයි 16වැනි ද ත් 17වැනි ද ත්, ඒ හමුදාව මධ්‍ය චීනයෙහි යුද්ධෝපායමාර්ගය අතින් වැදගත් නගර වූ වූචාං, හාන්යාං සහ හැන්කව් නිදහස් කළේ ය. ඉක්බිති එය දකුණට හුනාන් පළාත තුළට ගමන් කළේ ය. හුනාන් පළාතේ කුඕමින්තාං ආණ්ඩුකාරයා වූ චෙං චියන් ද 1වැනි හමුදාවේ අණදෙන්නා වූ චෙන් මිං-රන් ද අගෝස්තු 4වැනි ද කුඕමින්තාං ආණ්ඩුව කෙරෙහි වූ තම පක්ෂපාතකම ප්‍රසිද්ධියේ අත් හැරියෝ ය; හුනාන් පළාත සාමකාමී ව නිදහස් කරනු ලැබී ය. සිව්වැනි ක්ෂේත්‍ර හමුදාව සැප්තැම්බරයෙහි සහ ඔක්තෝබරයෙහි හෙංයාං-පාඕචිං යුද්ධව්‍යාපාරය කොට, පායි චුං-ශි යටතේ සිටි කුඕ-මින්තාං හටකණ්ඩායම් වල ප්‍රධාන බලසේනාව මුල්පිස දමා, ඉක්බිති ක්වාංතුං සහ ක්වාංසි පළාත් වලට තල්ලු වී ගියේ ය. එය ඔක්තෝබර් 14වැනි ද කැන්ටන් නුවර ද, නොවැම්බර් 22වැනි ද ක්වෙයිලින් නුවර ද, දෙසැම්බර් 4වැනි ද නාන්නිං නුවර ද නිදහස් කළේ ය. දෙවැනි සහ තුන්වැනි ක්ෂේත්‍ර හමුද යැංසී ගඟ බලෙන් තරණය කරන අතර, නියේ ජුං-චෙන්, ශූ ශියාං-චියන් සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද උතුරු චීනයෙහි සිටි

1. නිර්භීත ලෙස ඉදිරියට ගමන් කොට, චීනයේ දේශසීමාවන් ඇතුළත සිටින විරුද්දකම් පෑමට සැහැසි වන්නා වූ සියලු කුඕමින්තාං ප්‍රතිගාමීන් ස්ථිර ලෙස, අනූන ලෙස, මුළුමනින් ම සහ සම්පූර්ණයෙන් ම මුලසුන් කරන්න. මුළු රටේ ම ජනතාව නිදහස් කරන්න. චීනයේ භූමිප්‍රදේශයේ ත් ස්වාධිපත්‍යයේ ත් ස්වාධීනත්වය සහ අඛණ්ඩතාව සුරක්ෂිත කරන්න.

2. නිර්භීත ලෙස ඉදිරියට ගමන් කොට, හික්මවිය නො හැකි සියලු ම යුද්ධ අපරාධකාරයන් හිරබාරයට ගන්න. ඔවුන් කොහේ පැන ගියත්, ඔවුන් අධිකරණය ඉදිරියට පමුණුවා, ඔවුන්ට නීතිය අනුව දඬුවම් දිය යුතු ය. පල්හොර දෙටුවා වන චියාං කායි-ශෙක් හිරබාරයට ගැනීම ගැන විශේෂයෙන් සැලකිලිමත් වන්න.

3. අභ්‍යන්තර සාමය ගැන සම්මතියේ අවසාන සංශෝධිත පිටපත සියලු ම කුඕමින්තාං ප්‍රාදේශික ආණ්ඩු වලට සහ ප්‍රාදේශික යුද්ධ කණ්-ඩායම් වලට ප්‍රකාශ කරන්න. එහි එන සාමාන්‍ය අදහස් වලට එකඟ ව, ඔබ විසින් සටන් නතර කරන්ට ත් සාමකාමී විධි මගින් කරුණු බේරුම් කරගන්ට ත් කැමති අය සමග ප්‍රාදේශික සම්මති නිමවීමට ඉඩ තිබේ.

හමුදාවෝ 1949, අප්‍රේල් 24වැනි ද තායියුආන් ඇල්ලූහ. පෙං තේ-හුආයි, හෝ ලුං සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද පළමුවැනි ක්ෂේත්‍ර හමුදාව මැයි 20වැනි ද සියාන් නුවර නිදහස් කිරීමෙන් පසු, උතුරු චීනයෙන් පැමිණි හමුද දෙකක් ද හා එකතු ව වයඹදිග කොටසේ කුඕමින්තාං ප්‍රදේශ තුළට දිගට ම ගමන් කළේ ය. ඔව්හු අගෝස්තු 20වැනි ද ලාන්චව් නුවර ඇල්ලුවෝ ය; සැප්තැම්බර් 5වැනි ද සිනිං නුවර සහ සැප්තැම්බර් 23වැනි ද යින්චුආන් නුවර නිදහස් කොට, මා පූ-පාං සහ මා හුං-කුළයි යටතේ සිටි කුඕමින්තාං හට-කණ්ඩායම් සම්පූර්ණයෙන් ම මුලසුන් කළෝ ය. සැප්තැම්බර් අගදී, සින්චියාං පළාතේ කුඕමින්තාං ගැරිසන් හමුද වල ප්‍රධාන අණදෙන්නා වූ තාඕ චි-යුඒ ද ආණ්ඩුකාරයා වූ බුර්හාන් ද කුඕමින්තාං ආණ්ඩුව කෙරෙහි වූ තම පක්ෂපාතකම ප්‍රසිද්ධියේ ම අත් හැරියහ; සින්චියාං පළාත සාමකාමී ලෙස නිදහස් කරනු ලැබී ය. නොවැම්බර් මුලදී, ලියු පෝ-චෙං, තෙං ශියාඕ-පිං සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද දෙවැනි ක්ෂේත්‍ර හමුදාව, උතුරු චීන ක්ෂේත්‍ර හමුදාවේ 18වැනි හමුදාව ත් හෝ ලුං, ලී චිං-චුආන් සහ වෙන සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද පළමුවැනි ක්ෂේත්‍ර හමුදාවේ කොටසකුත් සමග එකතු ව, නිරිතදිග චීනය තුළට තම ගමන ආරම්භ කළේ ය. ඔව්හු නොවැම්බර් 15වැනි ද ක්වෙයියාං නුවර ද නොවැම්බර් 30වැනි ද චුංකිං නුවර ද නිදහස් කළහ. දෙසැම්බර් 9වැනි ද, යුන්නාන් පළාතේ කුඕමින්තාං ආණ්ඩුකාරයා වූ ලූ හාන් ද, සිකාං පළාතේ කුඕමින්තාං ආණ්ඩුකාරයා වූ ලියු වෙන්-හුයි ද, නිරිතදිග කොටසේ යුද්ධ සහ පරිපාලන කටයුතු බාර කුඕමින්තාං බියුරෝවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වූ තෙං ශී-හෞ සහ පාන් වෙන්-හුආ ද කුඕමින්තාං ආණ්ඩුව කෙරෙහි වූ තම පක්ෂපාතකම ප්‍රසිද්ධියේ අත් හැරියෝ ය; යුන්නාන් සහ සිකාං යන පළාත් දෙක සාමකාමී ලෙස නිදහස් කරනු ලැබී ය. දෙසැම්බර් අගදී, නිරිතදිග කොටසට ඇතුල් වී සිටි මහජන විමුක්ති හමුදාව චෙංතූ යුද්ධව්‍යාපාරය ගෙනගොස්, හූ ත්සුං-නාන් යටතේ සිටි කුඕමින්තාං හටකණ්ඩායම් සම්පූර්ණයෙන් ම මුල්පිස දමා, දෙසැම්බර් 27වැනි ද චෙංතූ නුවර නිදහස් කළේ ය. 1949 දෙසැම්බර් අවසානය වන විට, මහජන විමුක්ති හමුදාව චීනයේ මහාභූමිය මත සිටි සියලු ම කුඕමින්තාං හටකණ්ඩායම් මුල්පිස දමා තිබුණි, ටිබැටය හැර මුළු මහාභූමිය ම නිදහස් කර තිබුණි.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

4. මහජන විමුක්ති හමුදව නැන්කිං නුවර වට කළ පසු, නැන්කිං නුවර ලී ත්සුං–රන් ආණ්ඩුව ඒ වන විට පළා ගොස් සහ විසිරී ගොස් නො තිබුණොත් සහ සම්මතියට අත්සන් කරන්ට කැමති වෙතොත්, අභ්‍යන්තර සාමය ගැන සම්මතියට අත්සන් කිරීමට තවත් ඉඩප්‍රස්තාවක් ඒ ආණ්ඩුවට දීමට අපි කැමැත්තෙමු.

මාඕ සේතුං
චීන ජනතාවගේ විප්ලවවාදි
යුද්ධ අධිකාරියේ සභාපති

චූ තේ
චීන මහජන විමුක්ති හමුදවේ
ප්‍රධාන අණදෙන්නා

ස ට හ න්

[1] 1949, අප්‍රේල් 1වැනි ද, චාං චී-චුං ප්‍රමුඛ කුඕමින්තාං ආණ්ඩුවේ නියෝජිතපිරිස චීන කොමියුනිස්ට පක්ෂයේ නියෝජිතපිරිස සමග සාම සාකච්ඡා පැවැත්වීම පිණිස පීපිං නුවරට පැමිණියේ ය. අඩ මසක් තිස්සේ පැවති සාකච්ඡා වලින් පසු අභ්‍යන්තර සාමය ගැන සම්ම-තියක් කෙටුම්පත් කරනු ලැබී ය. සම්මතිය (අවසාන සංශෝධිත පිටපත) චීන කොමියුනිස්ට පක්ෂයේ නියෝජිතපිරිස විසින් නැන්කිං ආණ්ඩුවේ නියෝජිතපිරිසට අප්‍රේල් 15වැනි ද බාර දෙනලදී; නැන්කිං ආණ්ඩුව විසින් එය අප්‍රේල් 20වැනි ද ප්‍රතික්ෂෙප කරනලදී. සම්මතියේ (අවසාන සංශෝධිත පිටපතේ) සම්පූර්ණ පෙළ මෙසේ ය:

චීන සමූහාණ්ඩුවේ 35වැනි අවුරුද්දෙහි, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව, ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුවේ ආධාරය ඇතිව, ජනතාවගේ කැමැත්තට පිටුපා, තාවකාලික ව සටන් නතර කිරීමේ සම්මතිය සහ දේශපාලන සාකච්ඡාසභාවේ යෝජනා කඩාකප්පල් කොට, චීන කොමියුනිස්ට පක්ෂයට විරුද්ධ වන ව්‍යාජයෙන්, චීන ජනතාවට ත් චීන මහජන විමුක්ති හමුදවට ත් විරුද්ධ ව දේශ-ව්‍යාප්ත සිවිල් යුද්ධයක් දියත් කළේ ය. මේ යුද්ධය අවුරුදු දෙකකුත් මාස නවය හමාරක් පැවතී ඇත. එය රට මුළුල්ලේ ම ජනතාවට නො කිය හැකි තරම් විපතක් සිදු කර ඇත. රට මුදල් වත්කම් අතින් ද ද්‍රව්‍යමය වත්කම් අතින් ද ඉමහත් අලාභහානි වලට භාජන වී ඇත, රටේ ස්වාධිපත්‍යය තවදුරට ත් කඩ කරනු ලැබ ඇත. නැන්කිං නුවර ජාතික ආණ්ඩුව දෙස්තර සුන් යත්-සෙන්ගේ විප්ලවවාදි ත්‍රිවිධ ජනතා මූලධර්ම ද රුසියාව සමග මිතුරු-හවුලක් ඇති කරගැනීම, කොමියුනිස්ට් පක්ෂය සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම සහ ගොවියන්ට ත් කම්කරුවන්ට ත් ආධාර කිරීම පිළිබඳ ඔහුගේ නිවැරදි ප්‍රතිපත්ති ද කඩ කිරීම නිසා ත්, ඔහුගේ විප්ලවවාදි අන්තිම කැමතිපත්‍රය කඩ කිරීම නිසා ත්, මුළු රටේ ම ජනතාව සෑම විට ම ඒ ආණ්ඩුව ගැන අප්‍රසාදය පළ කර ඇත. වෙසෙසින්, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව විසින් පෙර කිසි කලෙක නුවූ විරූ විශාල පරිමාණයකින් වූ වර්තමාන සිවිල් යුද්ධය දියත් කිරීම ගැන ත්, සිවිල් යුද්ධය කරගෙන යාමේදී ඒ ආණ්ඩුව විසින් යොදා ඇති වැරදි දේශපාලන, යුද්ධමය, මුදල්, ආර්ථික, සංස්-කෘතික සහ විදේශ ප්‍රතිපත්ති හා පියවර ගැන ත් මුළු ජනතාව ම තම විරෝධය හඬ නඟා ඇත. නැන්කිං නුවර ජාතික ආණ්ඩුව සමස්ත ජනතාවගේ විශ්වාසය සම්පූර්ණයෙන් ම

භංග කරගෙන සිටී. වර්තමාන සිවිල් යුද්ධයේදී ඒ ආණ්ඩුවේ හටකණ්ඩායම චීන කොමියුනිස්ට පක්ෂය විසින් නායකත්වය දෙනු ලබන සහ චීන ජනතාවගේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය විසින් අණ දෙනු ලබන මහජන විමුක්ති හමුදව විසින් දැනට ම පරාජය කර ඇත. තමා වැටී සිටින මේ තත්වය දකිමින්, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව සිවිල් යුද්ධය නතර කිරීම පිණිස ත් සාමය ඇති කිරීම පිණිස ත් සාකච්ඡා පැවැත්විය යුතු ය'යි චීන සමූහාණ්ඩුවේ 38වැනි අවුරුද්දේ ජනවාරි 1වැනි ද චීන කොමියුනිස්ට් පක්ෂයට යෝජනා කළේ ය. ඒ අවුරුද්දේ ම ජනවාරි 14වැනි ද, චීන කොමියුනිස්ට් පක්ෂය නැන්කිං නුවර කුඕමින්තාං ආණ්ඩුවේ මේ යෝජනාවට එකඟ වෙමින් සහ දෙ පාර්ශ්වය අතර සාම සාකච්ඡාවන් සඳහා පදනම වශයෙන් කොන්දේසි අටක් ඉදිරිපත් කරමින් ප්‍රකාශයක් නිකුත් කළේ ය. මේ කොන්දේසි මතු දක්වන පරිදි ය: යුද්ධ අපරාධකාරයන්ට දඬුවම් කරනු; බොරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැති කරනු; බොරු "සංස්ථාපිත බලමණ්ඩලය" නැති කරනු; සියලු ප්‍රතිගාමී හටකණ්ඩායම් ප්‍රජාතන්ත්‍රවාදි මූලධර්ම උඩ ප්‍රතිසංස්කරණය කරනු; නිලධාරි-ප්‍රාග්ධනය ජනසතු කරනු; ඉඩම් ක්‍රමය ප්‍රතිසංස්කරණය කරනු; ජාතිද්‍රොහි ගිවිසුම් අවලංගු කරනු; ප්‍රතිගාමී කොටස් සහභාගි නො වන අළුත් දේශපාලන සාකච්ඡාසභාවක් කැඳවා, ප්‍රතිගාමී නැන්කිං කුඕමින්තාං ආණ්ඩුවේ ත් ඒ ආණ්ඩුවේ සියලු මට්ටම් වල උප ආණ්ඩු වල ත් බලය සහ බලතල පවරා ගැනීම පිණිස ප්‍රජාතන්ත්‍රවාදි සභාග ආණ්ඩුවක් සකස් කරනු. මේ මූලික කොන්දේසි අටට නැන්කිං නුවර ජාතික ආණ්ඩුව එකඟ විය. එතැනදී, චීන කොමියුනිස්ට් පක්ෂය ත් නැන්කිං නුවර ජාතික ආණ්ඩුව ත් සාකච්ඡා පවත්වාගෙන යන්ට සහ සම්මතියකට අත්සන් කරන්ට සම්පූර්ණ බලය ඇති තම තමන්ගේ නියෝජිතපිරිස් පත් කළේ ය. පීපිං නුවර රැස් වූ දෙ පක්ෂයේ නියෝජිතවරු වර්තමාන සිවිල් යුද්ධය ගැන ත් එහි වැරදි ප්‍රතිපත්ති ගැන ත් සම්පූර්ණ වගකීම නැන්කිං නුවර ජාතික ආණ්ඩුව විසින් දැරිය යුතු බව පළමුවෙන් ම තරයේ කියා සිටිමින්, මේ සම්මතිය නිමවීමට එකඟ වී සිටිති.

පළමුවැනි කොටස

1වැනි වගන්තිය. හරි වැරදි දෙක තෝරා බෙරා ගැනීම පිණිස ත් වගකීම ස්ථිර කිරීම පිණිස ත්, මූලධර්මය පිළිබඳ කරුණක් වශයෙන්, වර්තමාන සිවිල් යුද්ධය දියත් කිරීම සහ කරගෙන යාම ගැන වග කිව යුතු ය'යි සලකනු ලබන නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ යුද්ධ අපරාධකාරයන්ට දඬුවම් දෙනු ලැබේ ය'යි ද, එහෙත් පහත සඳහන් කොන්දේසි වලට එකඟ ව එක් එක් ප්‍රශ්නයේ සුදුසුකම් උඩ ඔවුන් ගැන ක්‍රියා කරනු ලැබේ ය'යි ද (මෙහි මින්පසු දෙ පාර්ශ්වය වශයෙන් සඳහන් කරනු ලබන) චීන කොමියුනිස්ට පක්ෂයේ නියෝජිතපිරිස ත් නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ නියෝජිතපිරිස ත් සහතික කොට කියා සිටිති:

1වැනි අංකය. කවුරු වෙත්වා සියලු යුද්ධ අපරාධකාරයන්, ඔවුන් වැරදි දෙයින් හරි දෙය තෝරා බෙරා ගැනීමෙහි ලා ත්, තම අතීතයෙන් සම්පූර්ණයෙන් ම කැඩී යාමෙහි ලා ත් තමන් ඇත්තට ම අවංක බව නියම ක්‍රියාවන් මගින් පෙන්නුම් කරනවා නම් ද, එසේ චීන ජනතාවගේ විමුක්ති ව්‍යායාමයේ ප්‍රගතිය සහ අභ්‍යන්තර ප්‍රශ්නය සාමකාමී ලෙස බේරුම් කිරීම පහසු කරනවා නම් ද, යුද්ධ අපරාධකාරයන් විමේ චෝද-නාවෙන් නිදහස් කිරීමට ත් ඔවුන්ට දයා පරවශ ලෙස සංග්‍රහ කිරීමට ත් ඉඩ තිබේ.

2වැනි අංකය. කවුරු වෙත්වා හික්මවිය නො හැකි සියලු යුද්ධ අපරාධකාරයන්ට, ඔවුන් ජනතා විමුක්ති ව්‍යායාමයේ ප්‍රගතියට අවහිර කරතොත්, අභ්‍යන්තර ප්‍රශ්නය සාමකාමී ලෙස බේරුම් කිරීමට බාධා කරතොත්, නැතහොත් කැරලිගැසීම් ඇති කරන තරම් දුරට යතොත්, තදබල දඬුවම් දෙනු ලැබේ. චීන ජනතාවගේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය ඔවුන් විසින් නායකත්වය දෙනු ලැබිය හැකි කවර කැරැල්ලක් හෝ මර්දනය කිරීමේ වගකීම බාර ගන්නවා ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

2වැනි වගන්තිය. චීන සමූහාණ්ඩුවේ 38වැනි අවුරුද්දේ ජනවාරි 26වැනි ද චීනයට විරුද්ධ ව කළ ජපන් ආක්‍රමණයේදී යුද්ධ අපරාධකාරයකු වී සිටි ජනරාල් යසූජි ඔකාමුරා නිවැරදිකාරයා ය'යි ප්‍රකාශ කොට ඔහු නිදහස් කිරීමෙන් ද, ඒ අවුරුද්දේ ම ජනවාරි 31වැනි ද තව ජපන් යුද්ධ අපරාධකාරයන් 260 දෙනකුන් ආපසු ජපානයට යැවීමට අවසර දීමෙන් ද නැන්කිං නුවර ජාතික ආණ්ඩුව කළේ වරදක් බව දෙ පාර්ශ්වය සහතික කොට කියා සිටිති. චීනය පුරා ම ජනතාව නියෝජනය කරන අළුත් මධ්‍යම ආණ්ඩුව වන ප්‍රජාතන්ත්‍රවාදි සභාග ආණ්ඩුව සකස් කළ වහා ම මේ සියලු ජපන් අපරාධකාරයන්ගේ නඩු නැවත විභාගයට ගන්නවා ඇත.

දෙවැනි කොටස

3වැනි වගන්තිය. චීන සමූහාණ්ඩුවේ 35වැනි අවුරුද්දේ නොවැම්බරයෙහි නැන්කිං නුවර කුඔමින්තාං ආණ්ඩුව විසින් කැඳවනලද "ජාතික මන්ත්‍රණසභාව" විසින් සම්මත කළ "චීන සමූහාණ්ඩුවේ ව්‍යවස්ථාව" අවලංගු කරනු ලැබේ ය'යි දෙ පාර්ශ්වය සහතික කොට කියා සිටිති.

4වැනි වගන්තිය. "චීන සමූහාණ්ඩුවේ ව්‍යවස්ථාව" අවලංගු කළ පසු, රජය සහ ජනතාව විසින් පිළිපැදිය යුතු මූලික නීතිය අළුත් දේශපාලන සාකච්ඡාසභාවේ ත් ප්‍රජාතන්ත්‍රවාදි සභාග ආණ්ඩුවේ ත් යෝජනාවන්ට අනුව නිශ්චය කරනු ලැබේ.

තුන්වැනි කොටස

5වැනි වගන්තිය. නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ සංස්ථාපිත බලමණ්ඩලය මුළුමනින් ම අවලංගු කරනු ලැබේ ය'යි දෙ පාර්ශ්වය සහතික කොට කියා සිටිති.

6වැනි වගන්තිය. මහජන විමුක්ති හමුදව ඇතුල් වී පවරාගෙන තිබෙන සියලු ස්ථාන වල ත් ප්‍රජාතන්ත්‍රවාදි සභාග ආණ්ඩුව සකස් කළ පසු ත්, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදි සංස්ථාපිත බලමණ්ඩල වහා ම පිහිටුවනු ලැබේ; සියලු ප්‍රතිගාමී නීති සහ නියෝග අහෝසි කරනු ලැබේ,

සිව්වැනි කොටස

7වැනි වගන්තිය. නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින සියලු සන්නද්ධ බලසේනා (සියලු භෞමික, නාවික, සහ අහස් සේනා, යුද පොලිස්භට පිරිස, මංමාවත් පොලිස් බළකාය, ප්‍රාදේශික භටකණ්ඩායම්, සියලු යුද්ධ ආයතන, විද්‍යායතන, පැක්ටෙරි, පසුමුණු-සේවා සංස්ථා යනාදිය) ප්‍රජාතන්ත්‍රවාදි මූලධර්ම උඩ මහජන විමුක්ති හමුදව තුළට ප්‍රතිසංවිධානය කරනු ලැබේ ය'යි දෙ පාර්ශ්වය සහතික කොට කියා සිටිති. අභ්‍යන්තර සාමය ගැන සම්මතිය අත්සන් කළ පසු, මේ ප්‍රතිසංවිධානය කිරීමේ වැඩය බාර ගැනීම පිණිස ජාතික ප්‍රතිසංවිධාන කොමිටියක් වහා ම පිහිටුවනු ලැබේ. ප්‍රතිසංවිධාන කොමිටිය සාමාජිකයන් හත් දෙනකුන්ගේ සිට නව දෙනකුන් තෙක් ගණනකින් යුක්ත වෙනවා ඇත; ඔවුන් ගෙන් හතර දෙනකුන්ගේ සිට පස් දෙනකුන් තෙක් ගණනක් ජනතාවගේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය විසින් ද, තුන් දෙනකුන්ගේ සිට සිව් දෙනකුන් තෙක් ගණනක් නැන්කිං නුවර ජාතික ආණ්ඩුව විසින් ද පත් කරනු ලබන අතර, ජනතාවගේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය විසින් පත් කළ සාමාජිකයන් අතුරෙන් එක් කෙනෙක් සභාපති වශයෙන් ද, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව විසින් පත් කළ සාමාජිකයන් අතුරෙන් එක් කෙනෙක් උප-සභාපති වශයෙන් ද සේවය කරනවා ඇත. මහජන විමුක්ති හමුදව ඇතුල් වී පවරාගෙන තිබෙන ස්ථාන වල, අවශ්‍ය වන පරිදි ප්‍රතිසංවිධාන කොමිටියේ ප්‍රාන්තිය උප-කොමිටි පිහිටුවන්ට ඉඩ තිබේ. උප-කොමිටි වල දෙ පාර්ශ්වයේ සාමාජිකයන්ගේ අන්‍යොන්‍ය ප්‍රමාණය ද, සභාපති සහ උප-සභාපති පදවි පැවරීම ද ජාතික ප්‍රතිසංවිධාන කොමිටියෙහි මෙන් ම වන්නේ ය. නාවික හමුදව සඳහා ප්‍රතිසංවිධාන කොමිටියක් ද, අහස් සේනාව සඳහා තව එකක් ද පිහිටුවනු

ලැබේ. දනට නැන්කිං නුවර ජාතික ආණ්ඩුව විසින් පරිපාලනය කරනු ලබන ප්‍රදේශ වලට මහජන විමුක්ති හමුදව ඇතුල් වීම ත් ඒ ප්‍රදේශ ඒ හමුදව විසින් පවරාගැනීම ත් පිළිබඳ සියලු කරුණු චීන ජනතාවගේ විප්ලවවාදි යුද්ධ අධිකාරිය විසින් නිකුත් කරන ආඥවන් මගින් තීරණය කරනු ලැබේ. නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ සන්නද්ධ බලසේනාවෝ මහජන විමුක්ති හමුදව ඇතුල් වෙනවාට විරුද්දකම් නො පෑ යුතු ය.

8වැනි වගන්තිය. එක් එක් ප්‍රාන්තයේ ප්‍රතිසංවිධාන සැලැස්ම අවස්ථා දෙකකින් ක්‍රියාවේ යොදනු ලැබේ ය'යි දෙ පාර්ශ්වය එකඟ වෙති:

1වැනි අංකය. පළමුවැනි අවස්ථාව — එක්රැස් කිරීම සහ නැවත කණ්ඩායම් කිරීම:

1වැනි කරුණ. නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින සියලු සන්නද්ධ බලසේනා (භෞමික, නාවික සහ අහස් සේනා, යුදපොලිස්භට පිරිස, මංමාවත් පොලිස් බළකාය, ප්‍රාදේශික භටකණ්ඩායම්, යනාදිය) එක්රැස් කොට, නැවත කණ්ඩායම් කරනු ලැබේ. ප්‍රතිසංවිධානය කිරීමේ මූලධර්මය පහත සඳහන් පරිදි වේ: ප්‍රතිසංවිධාන කොමිටිය, ඇත්තට ම පවතින ප්‍රාදේශික තත්වයන් පදනම කරගෙන, මහජන විමුක්ති හමුදව ඇතුල් වී පවරාගෙන තිබෙන ප්‍රදේශ වල සිටින සන්නද්ධ සේනාවන්ට, ඔවුන්ගේ මුල් නිල-නම්, පිළිවෙල සහ සංඛ්‍යාත්මක ශක්තිය අනුව, එක්රැස්වීම පිණිස සහ නැවත කණ්ඩායම් කිරීම පිණිස, නම් කොට නියම කළ ස්ථාන කරා ප්‍රදේශයෙන් ප්‍රදේශයට සහ අවස්ථාවෙන් අවස්ථාවට ගමන් කරන ලෙස අණ දෙයි.

2වැනි කරුණ. මහජන විමුක්ති හමුදව ඇතුල් වී පවරා ගැනීමට පෙර, නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින සියලු සන්නද්ධ බලසේනා, ලොකු සහ කුඩා නගර වල ත්, වැදගත් ගමනාගමනමාර්ග සහ ගංගාවන් දිගට ත්, මුහුදුවරාය වල සහ ගම් වල ත් ඔවුන් නතර කර සිටින තැන් වල ප්‍රාදේශික මනා පාලනය පවත්වා ගැනීම ත් කිසි ම කඩාකප්පල්කාර ක්‍රියාවකට ඉඩ නො දීම ත් ගැන වග කිව යුතු සේ සලකනු ලැබේ.

3වැනි කරුණ. ඉහතින් සඳහන් කළ තැන් වල, මහජන විමුක්ති හමුදව ඇතුල් වී පවරා ගත් කල, නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින සන්නද්ධ බලසේනා, ප්‍රතිසංවිධාන කොමිටියේ සහ එහි උප-කොමිටි වල ආඥවන් අනුව, ඒ තැන් සාමයෙන් බාර දී, නම් කොට නියම කළ තැන් වලට ගමන් කළ යුතු ය. නම් කොට නියම කළ තැන් වලට ගමන් කරන අතර ත්, ඒ තැන් වලට සේන්දු වූ පසු ත්, නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින සන්නද්ධ බලසේනා දැඩි ලෙස විනයට ගරු කළ යුතු ය, ප්‍රාදේශික මනා පාලනය අවුල් නො කළ යුතු ය.

4වැනි කරුණ. ප්‍රතිසංවිධාන කොමිටියේ සහ එහි උප-කොමිටි වල ආඥවන් පිළිපදිමින්, නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින සන්නද්ධ බලසේනා ඔවුන් මුලින් සිටි තැන් හැර යන කල, ඒ තැන් වල නතර කර සිටින ප්‍රාදේශික පොලිසිය හෝ සාම සංරක්ෂක බළකාය හෝ ඉවත් වී නො යා යුතු ය, ඒවා ප්‍රාදේශික සාමය ත් මනා පාලනය ත් පවත්වාගැනීම ගැන වග කිව යුතු ය, මහජන විමුක්ති හමුදවේ විධානයන්ට සහ ආඥාවන්ට කීකරු විය යුතු ය.

5වැනි කරුණ. ප්‍රතිසංවිධාන කොමිටිය, එහි උප-කොමිටි සහ ප්‍රාදේශික ආණ්ඩු වෙන තැන් වලට යවනු ලබන හෝ එක්රැස් කරනු ලබන නැන්කිං ජාතික ආණ්ඩුවේ සියලු සන්නද්ධ බලසේනාවන්ට ධාන්‍ය, සත්ව කෑම, ඇඳ ඇතිරිලි කොට්ට මෙට්ට සහ රෙදිපිළි වැනි අවශ්‍ය දේ සැපයීම ගැන වග කිව යුතු ය.

6වැනි කරුණ. ප්‍රතිසංවිධාන කොමිටිය සහ එහි උප-කොමිටි, විවිධ ප්‍රදේශ වල ඇත්තට ම පවතින තත්වයන් අනුව, නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින යුද්ධ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

බලධරයන් සතු සියලු යුද්ධ සංස්ථාවන් (ජාතික ආරක්ෂක අමාත්‍යංශයේ සිට ඒකාබද්ධ පසුමුණු-සේවා මූලස්ථාන දක්වා වන ඔවුන්ගේ සියලු සංවිධානයන්ට අයත් ආයතන, පාඨශාලා, පැක්ටෝරි, ගබඩාගෙවල් සහ එවැනි දේ) ද, ඔවුන් සතු යුද්ධ ගොඩනැගිලි (නාවික වරාය, බලකොටු, අහස් තොටුපළවල් සහ එවැනි දේ) ද, ඔවුන් සතු සියලු යුද්ධ භාණ්ඩොපකරණ ද, ප්‍රදේශයෙන් ප්‍රදේශයට සහ අවස්ථාවෙන් අවස්ථාවට, මහජන විමුක්ති හමුදවට සහ විවිධ ප්‍රදේශයන්හි ඒ හමුදවේ යුද්ධ පාලන අධිකාරි වලට බාර දෙන මෙන් ඒ බලධරයන්ට අණ කරනවා ඇත.

2වැනි අංකය. දෙවැනි අවස්ථාව — ප්‍රදේශයෙන් ප්‍රදේශයට ප්‍රතිසංවිධානය කිරීම.

1වැනි කරුණ. නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින භෞමික බලසේනා (පාබලහමුදව, අසරු සේනාව, විශේෂ හමුද ශාඛා, යුදපොලිස්භට පිරිස, මංමාවත් පොලිස් බළකාය සහ ප්‍රාදේශික භටකණ්ඩායම්) ප්‍රදේශයෙන් ප්‍රදේශයට සහ අවස්ථාවෙන් අවස්ථාවට, නම් කොට නියම කළ ස්ථාන වලට ගමන් කළ පසු සහ එක්රැස් කොට නැවත කණ්ඩායම් කළ පසු, ප්‍රතිසංවිධාන කොමිටිය, විවිධ ප්‍රදේශ වල ඇත්තට ම පවතින තත්වයන් අනුව, ප්‍රදේශයෙන් ප්‍රදේශයට ඔවුන් ප්‍රතිසංවිධානය කිරීම පිණිස සැලැස්ම සකස් කොට, වෙසෙසා නියම කළ කාලයන්හිදී මේ සැලැස්ම ක්‍රියාවේ යොදයි. ප්‍රතිසංවිධානය කිරීමේ මූලධර්මය වන්නේ ඉහතින් සඳහන් කළ සියලු භෞමික බලසේනා, එක්රැස් කොට නැවත කණ්ඩායම් කරනු ලැබූ පසු, මහජන විමුක්ති හමුදවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට ත් නිත්‍ය නිර්මිතියට ත් අනුරූප වන ලෙස ඒ හමුදාවේ නිත්‍ය සේනාංග බවට ප්‍රතිසංවිධානය කිරීම ය. ප්‍රතිසංවිධාන කොමිටිය සහ එහි උප-කොමිටි වයස හෝ බැරිකම නිසා විශ්‍රාම ගැන්වීමට සුදුසු ය'යි පෙනීගොස් සිටින්නා වූ ද, විශ්‍රාම ගැනීමට කැමැත්තෙන් සිටින්නා වූ ද සෙබළුන් පිළිබඳ ප්‍රශ්න ගැන ත්, එසේ ම විශ්‍රාම ගැනීමට හෝ වෙන වෘත්තියකට යාමට කැමති නිලධාරින් සහ අධිකාරි-බල නො ලත් නිලධාරින් පිළිබඳ ප්‍රශ්න ගැන ත් ක්‍රියා කිරීම ගැන වග කියයි; හැම දෙනා ම නිසි ලෙස පළපදිංචි කරනු ලබන සේ ත්, කිසිවකු රැකෙන්ට මං නැති නිසා වැරදි වැඩ නො කරන සේ ත්, මේ කොමිටි ඔවුන් හට ආපසු ගෙදර යන්ට පහසුකම් ද ජීවනෝපායයන් ද සපයනවා ඇත.

LIBERATIONBASE

2වැනි කරුණ. නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින නාවික සහ අහස් සේනා ප්‍රදේශයෙන් ප්‍රදේශයට සහ අවස්ථාවෙන් අවස්ථාවට, නම් කොට නියම කළ තැන් වලට ගමන් කළ පසු සහ එක්රැස් කොට නැවත කණ්ඩායම් කරනු ලැබූ පසු, නාවික සහ අහස් සේනා ප්‍රතිසංවිධාන කොමිටි විසින්, මහජන විමුක්ති හමුදවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට අනුරූප වන ලෙස, ඒ සේනා ඒවායේ මුල් නීල-නම්, පිළිවෙළ සහ සංඛ්‍යාත්මක ශක්තිය අනුව ප්‍රතිසංවිධානය කරනු ලැබේ.

3වැනි කරුණ. නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින සියලු ම සන්නද්ධ බලසේනා, මහජන විමුක්ති හමුදව තුළට ප්‍රතිසංවිධානය කරනු ලැබීමෙන් පසු, කිසිවක් කඩ නො කරමින්, මහජන විමුක්ති හමුදවේ ප්‍රධාන විනය නීති තුන ත් අවධානය පිණිස කරුණු අට ත් දැඩි ලෙස පිළිපැදිය යුතු ය, මහජන විමුක්ති හමුදවේ යුද්ධ සහ දේශපාලන ක්‍රමයන් කෙරෙහි භක්තිමත් ව ඒ අනුව ස්ථිර ලෙස ක්‍රියා කළ යුතු ය.

4වැනි කරුණ. ප්‍රතිසංවිධානයට පසු විශ්‍රාම ගිය නිලධාරි ත් භටයෝ ත් ප්‍රාදේශික මහජන ආණ්ඩු වලට ගරු කළ යුතු ය, මහජන ආණ්ඩුවේ නීති වලට සහ නියෝග වලට කීකරු විය යුතු ය. විවිධ ප්‍රදේශ වල මහජන ආණ්ඩු ත් ජනතාව ත් මේ විශ්‍රාම ගිය නිලධාරින් සහ භටයන් ගැන කරුණාවෙන් කටයුතු කළ යුතු ය, ඔවුන්ට වෙනස්කම් නො කළ යුතු ය.

9වැනි වගන්තිය. අභ්‍යන්තර සාමය ගැන සම්මතිය අත්සන් කළ පසු, නැන්කිං ජාතික ආණ්ඩුව යටතේ සිටින සියලු ම සන්නද්ධ බලසේනා සෙබළුන් හෝ වෙන කාර්යභාරපුද්ගලයන් බලෙන් යුද සේවයට බන්ද ගැනීම හෝ අළුතෙන් බන්ද ගැනීම හෝ නතර කළ යුතු ය. ඔව්හු ඔවුන්ගේ සියලු ම ආයුධ සහ වෙඩිබෙහෙත්, උපකරණ, යුද්ධ ආයතන සහ ගොඩනැගිලි සහ ද්‍රව්‍යාපකරණ ආරක්ෂා කිරීම ගැන වග කිව යුතු ය, ඒවා විනාශ කිරීම, සැඟවීම, පවරා දීම හෝ විකිණීම නො කළ යුතු ය.

10වැනි වගන්තිය. අභ්‍යන්තර සාමය ගැන සම්මතිය අත්සන් කළ පසු, නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ සන්නද්ධ බලසේනා අතුරෙන් කිසියම් සේනාවක් ප්‍රතිසංවිධාන සැලැස්ම ක්‍රියාවේ යෙදීම ප්‍රතික්ෂේප කළ හොත්, එවිට ප්‍රතිසංවිධාන සැලැස්ම බලෙන් ක්‍රියාවේ යෙදීමට සහ එය නිරවශේෂයෙන් ඉටු කිරීමට ඒ ආණ්ඩුව මහජන විමුක්ති හමුදවට ආධාර කළ යුතු ය.

පස්වැනි කොටස

11වැනි වගන්තිය. නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ පාලනය පැවති කාලයේ දේශපාලන විශේෂ බලතල සහ තත්වය පාවිච්චි කොට අත් කර ගත් හෝ අල්ලා ගත් (බැංකු, පැක්ටෝරි, පතල්, යන්ත්‍රා, කොම්පැනි සහ සාප්පු ඇතුළු ව) සියලු නිලධාරි-ධනපති ව්‍යාපාර සහ දේපොළ රජය සතු කරනු ලැබේ ය'යි ද, ඒවා රජයේ දේපොළ වන්නේ ය'යි ද දෙ පාර්ශ්වය එකඟ වෙති.

12වැනි වගන්තිය. මෙතෙක් මහජන විමුක්ති හමුදව ඇතුල් වී පවරාගෙන නැති ප්‍රදේශ වල තිබෙන 11වැනි වගන්තියෙහි සඳහන් කළ නිලධාරි-ධනපති ව්‍යාපාර සහ දේපොළ සොරකම් කිරීම හෝ සැඟවීම, අලාබ හානි කිරීම, පවරා දීම හෝ රහසින් විකිණීම සිදු නො වන සේ ඒවා ගැන බලාකියාගැනීම ගැන නැන්කිං නුවර ජාතික ආණ්ඩුව වග කිව යුතු සේ සලකනු ලැබේ. දැනට ම ගෙන ගොස් තිබෙන වත්කම් කොතැනක තිබී හමු වුණත් ප්‍රයෝජනයට ගත නො හැකි වන සේ ක්‍රියා විරහිත කරනු ලැබේ, ඉන් පසු ඒවා ඉවත ගෙනයාමට, පිටරට යැවීමට හෝ අලාබ හානි කිරීමට අවසර නො දෙනු ලැබේ. පිටරට තිබී සොයා ගනු ලබන නිලධාරි-ධනපති ව්‍යාපාර සහ දේපොළ රජය සතු දේපොළ වශයෙන් ප්‍රකාශ කරනු ලැබේ.

13වැනි වගන්තිය. මහජන විමුක්ති හමුදව දැනට ම ඇතුල් වී පවරාගෙන තිබෙන ප්‍රදේශ වල, 11වැනි වගන්තියෙහි සඳහන් කළ නිලධාරි-ධනපති ව්‍යාපාර සහ දේපොළ ප්‍රාදේශික යුද්ධ පාලන අධිකාරි විසින් හෝ ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආණ්ඩුව විසින් බලය පවරනලද ආයතන විසින් හෝ රජය සතු කරනු ලැබේ. ඒවායෙහි පුද්ගලික කොටස් කිසිවක් තිබේ නම්, ඒවා ගැන සෝදිසි කර බලනු ලැබේ; ඒවා රහසින් පවරා දෙනලද නිලධාරි-ප්‍රාග්ධනය නො ව ඇත්ත වශයෙන් ම පුද්ගලික කොටස් බව ඔප්පු වූ පසු, ඒවා පිළිගනු ලැබේ, ඒ කොටස් හිමියන්ට කොටස්කරුවන් ලෙස සිටීමට හෝ ඔවුන්ගේ කොටස් ඉවත් කරගැනීමට හෝ අවසර දෙනු ලැබේ.

14වැනි වගන්තිය. නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ පාලනයට පෙර කාලයේ සිට පැවතෙන නිලධාරි-ධනපති ව්‍යාපාර ද, එසේ ම නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ පාලනයේ කාලයේ සිට පැවතෙන නමුත්, විශාල නුවූ සහ ජාතික ආර්ථිකයට සහ ජනතාවගේ දිවිපෙවෙතට හානිකර නුවූ නිලධාරි-ධනපති ව්‍යාපාර ද රජය සතු කරනු නො ලැබේ. එහෙත් මේවා අතර, ජනතාව විසින් පැමිණිලි කරනු ලැබ ඔප්පු වූ දරුණු අපරාධ කිරීම ගැන වරදකරුවන් වන ප්‍රතිගාමින් වැනි, කිරීමෙනෙල් වැරදි කර සිටින ඇතැම් අයගේ ව්‍යාපාර සහ දේපොළ රජය සතු කරනු ලැබේ.

15වැනි වගන්තිය. මහජන විමුක්ති හමුදව මෙතෙක් ඇතුල් වී පවරාගෙන නැති නගර වල, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව යටතේ තිබෙන පළාත්බද, නාගරික සහ

https://liberationbase.wordpress.com

උප-පළාත්බද ආණ්ඩු ඒ ඒ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී බලවේග සහ ඒවායේ වැඩ-කටයුතු ආරක්ෂා කිරීම ගැන වග කිව යුතු ය, ඒවා මර්දනය කිරීම හෝ ඒවාට හානි කිරීම හෝ නො කළ යුතු ය.

හයවැනි කොටස

16වැනි වගන්තිය. චීනයේ ගම්බද ප්‍රදේශ වල පවතින ඉඩම්අයිතිය පිළිබඳ රදළ ක්‍රමය අඩියෙන් අඩිය ප්‍රතිසංස්කරණය කරනු ලැබේ ය'යි දෙ පාර්ශ්වය සහතික කොට කියා සිටිති. මහජන විමුක්ති හමුදව ඇතුල් වූ පසු, පළමුකොට සාමාන්‍යයෙන් බදු සහ පොලී අඩු කිරීම ද, පසු ව ඉඩම් බෙදා දීම ද කරගෙන යනු ලැබේ.

17වැනි වගන්තිය. මහජන විමුක්ති හමුදව මෙතෙක් ඇතුල් වී පවරාගෙන නැති ප්‍රදේශ වල, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව යටතේ පවතින ප්‍රාදේශික ආණ්ඩු ගොවි බහුජන-යාගේ සංවිධාන සහ ඒවායේ වැඩකටයුතු ආරක්ෂා කිරීම ගැන වග කිව යුතු ය, ඒවා මර්දනය කිරීම හෝ දුර්වල කිරීම හෝ නො කළ යුතු ය.

හත්වැනි කොටස

18වැනි වගන්තිය. නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ පාලන කාලය තුළ විදේශ රජයන් සමග නිමවනලද ප්‍රසිද්ධ හෝ රහස් ගිවිසුම් සහ සම්මති සියල්ල ද, වෙනත් රාජ්‍යදූතසේවා ලියවිලි සහ ලේකම් මීට් ද නැන්කිං නුවර ජාතික ආණ්ඩුව විසින් ප්‍රජාතන්ත්‍රවාදී සහාග ආණ්ඩුවට බාර දෙනු ලැබේ ය'යි සහ ප්‍රජාතන්ත්‍රවාදී සහාග ආණ්ඩුව විසින් පරීක්ෂා කර බලනු ලැබේ ය'යි දෙ පාර්ශ්වය එකඟ වෙති. චීන ජනතාවට සහ ඔවුන්ගේ රජයට හානිකර වූ සියලු ගිවිසුම් හෝ සම්මති, විශේෂයෙන් රජයේ අයිතිවාසිකම් පාවා දෙන ස්වභාවයෙන් යුත් ඒවා, ඒ එක එකේදී කළ යුතු වන හැටියට, අවලංගු හෝ සංශෝධනය කරනු ලැබේ, නැතහොත් ඒවා වෙනුවට අළුත් ගිවිසුම් සහ සම්මති නිමවනු ලැබේ.

අටවැනි කොටස

19වැනි වගන්තිය. අභ්‍යන්තර සාමය ගැන සම්මතිය අත්සන් කළ පසු ත් ප්‍රජාතන්ත්‍රවාදී සහාග ආණ්ඩුව සකස් කිරීමට පෙර ත්, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව සහ එහි විධායක මණ්ඩලය, අමාත්‍යාංශ, අධිකාරි සහ සෙසු මණ්ඩල තාවකාලික වශයෙන් දිගට ම ක්‍රියා කරගෙන යා යුතු නමුත් කටයුතු කිරීමේදී චීන ජනතාවගේ විප්ලවවාදී යුද්ධ අධිකාරියේ අදහස් විමසිය යුතු ය, විවිධ ප්‍රදේශ පවරා ගැනීම සහ බාර දීම පිළිබඳ කරුණු වලදී මහජන විමුක්ති හමුදවට ආධාර කළ යුතු ය. ප්‍රජාතන්ත්‍රවාදී සහාග ආණ්ඩුව සකස් කළ පසු, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව වහා ම ප්‍රජාතන්ත්‍රවාදී සහාග ආණ්ඩුවට බාර දී, ස්වකීය ආණ්ඩුව සමාප්ත කළ බව ප්‍රකාශ කළ යුතු ය.

20වැනි වගන්තිය. නැන්කිං නුවර ජාතික ආණ්ඩුව ද එහි විවිධ මට්ටම් වල ප්‍රාදේශික ආණ්ඩු සහ ඒවායේ උප මණ්ඩල සියල්ල ද බාර දෙනු ලැබූ කල. මහජන විමුක්ති හමුදව ත් ප්‍රාදේශික මහජන ආණ්ඩු ත් චීනයේ ප්‍රජාතන්ත්‍රවාදී සහාග ආණ්ඩුව ත් කලින් ආණ්ඩුවේ කාර්යභාරපුද්ගලයන් අතර සිටින දේශප්‍රෙමී සහ ප්‍රයෝජනවත් පුද්ගලයන් සියලු දෙනා ම ඔවුන් අනාථ සහ ඉන්නහිටින්න තැන් නැති අය නො වන සේ, සේවයට ඇතුළත් කර-ගෙන, ඔවුන්ට ප්‍රජාතන්ත්‍රවාදී අධ්‍යාපනයක් දී, ඔවුන් සුදුසු පදවි වලට පත් කිරීමට සැලකිලිමත් විය යුතු ය.

21වැනි වගන්තිය. මහජන විමුක්ති හමුදව ඇතුල් වී පවරා ගැනීමට පෙර, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව ත් පළාත් වල, නගර වල සහ උප-පළාත් වල තිබෙන එහි උප ප්‍රාදේශික ආණ්ඩු ත්, සියලු ම ආණ්ඩුවේ සංවිධාන සහ (බැංකු, පැක්ටෙරි, පතල්, දුම්රිය-මාර්ග, තැපැල් සහ විදුලිපණිවිඩ කාර්යාල, අහස්යානා, යාත්‍රා, කොම්පැනි, ගබඩාගෙවල්

සහ සෙසු සියලු ගමනාගමන සහ පණිවිඩ හුවමාරු පහසුකම් ඇතුළු ව) රජය සතු ව්‍යාපාර ද, රජයට අයිති වෙනත් චංචල සහ නිශ්චල දේපොළ ද බලා කියා ගනිමින් සහ ආරක්ෂා කරමින්, තමතමන්ගේ ප්‍රදේශ වල සාමය සහ මනා පාලනය පවත්වා ගැනීම ගැන වග කිව යුතු ය; කිසිවක් විනාශ කිරීමට, නැති කිරීමට, ගෙන යාමට, සැඟවීමට හෝ විකිණීමට අවසර නැත. ගෙනගොස් තිබෙන හෝ සඟවා තිබෙන පොත්, ලේකම් මීට්, පෞරාණික භාණ්ඩ, වටිනා වස්තු, රන් රිදී, විදේශීය වලංගු මුදල් සහ සියලු දේපොළ හා වත්කම්, ඒවා කොහේ තිබී හමු වූවත්, ආපසු පවරා ගන්නා තුරු, වහා ම ප්‍රයෝජන ගැනීම තහනම් කොට ක්‍රියා විරහිත කරනු ලැබේ. පිටරට යවා තිබෙන හෝ මුල සිට ම පිටරට තිබුණු දේපොළ සම්බන්ධයෙන්, නැන්කිං නුවර ජාතික ආණ්ඩුව ඒවා ආපසු ලබා ගැනීම ගැන සහ සුරක්ෂිත ව තිබීම ගැන වග කිව යුතු ය, ඒවා බාර දෙන්ට සූදනම් ව සිටිය යුතු ය.

22වැනි වගන්තිය. මහජන විමුක්ති හමුදව දැනට ම ඇතුල් වී පවරාගෙන තිබෙන ප්‍රදේශ වල රජයේ සියලු ම බලතල මෙන් ම දේපොළ හා වත්කම් ප්‍රාදේශික යුද්ධ පාලන අධිකාරි, ප්‍රාදේශික මහජන ආණ්ඩු හෝ සහාග ආණ්ඩුව විසින් බලය පවරනු ලබන ආයතන විසින් පවරාගනු ලැබේ.

23වැනි වගන්තිය. අභ්‍යන්තර සාමය ගැන සම්මතිය නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ නියෝජිතපිරිස විසින් අත්සන් කරනු ලැබූ පසු සහ ඒ ආණ්ඩුව විසින් ක්‍රියාවේ යොදනු ලැබූ පසු, චීන කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිතපිරිස අළුත් දේශපාලන සාකච්ඡාසභාවට නියෝජිතයන් වශයෙන් දේශප්‍රෙමී පුද්ගලයන් ගණනක් එවීමට නැන්කිං නුවර ජාතික ආණ්ඩුවට අවසර දිය යුතු ය'යි ඒ දේශපාලන සාකච්ඡාසභාවේ කාර්යසම්පාදක කොමිටියට යෝජනා කිරීමේ වගකීම බාර ගන්නවා ඇත; කාර්යසම්පාදක කොමිටියේ අනුමතිය ලබා ගත් පසු, නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ නියෝජිතයන්ට අළුත් දේශපාලන සාකච්ඡා-සභාවට පැමිණෙන්ට ඉඩ තිබේ.

24වැනි වගන්තිය. නැන්කිං නුවර ජාතික ආණ්ඩුව ස්වකීය නියෝජිතයන් අළුත් දේශපාලන සාකච්ඡාසභාවට එවූ පසු, චීන කොමියුනිස්ට් පක්ෂය, සහයෝගයේ යහපත උදෙසා, නැන්කිං නුවර ජාතික ආණ්ඩුවේ දේශප්‍රෙමී පුද්ගලයන් ගණනක් ප්‍රජාතන්ත්‍රවාදී සහාග ආණ්ඩුවට ඇතුළත් කළ යුතු ය'යි ඒ සාකච්ඡාසභාවට යෝජනා කිරීමේ වගකීම බාර ගන්නවා ඇත.

දෙ පාර්ශ්වයේ නියෝජිතපිරිස් මෙසේ ප්‍රකාශ කරති: දේශ-ව්‍යාප්ත පරිමාණයකින් නිෂ්පාදනය ත් සංවර්ධනය ත් කරගෙන යාමේ ශ්‍රෙෂ්ඨ කර්තව්‍යය ආරම්භ කිරීම පහසු වන සේ ත්, අපේ රට සහ ජනතාව ස්ථිර ලෙස ම සමෘද්ධිය, ශක්තිය සහ ශුභසිද්ධිය අත් කර ගන්නා සේ ත්, චීන ජනතාවගේ විමුක්තිය සහ චීන ජාතියේ ස්වාධීනත්වය හා නිදහස උදෙසා ද, යුද්ධය ඉක්මනින් නිමවීම සහ සාමය නැවත ඇති කිරීම උදෙසා ද මේ සම්මතිය අත්සන් කිරීම ගැන වගකීම අපි මෙයින් බාර ගනිමු. මුළු රටේ ම ජනතාව මේ සම්මතිය සම්පූර්ණයෙන් ම ඉටු කිරීම පිණිස අරගල කිරීමට එකා මෙන් සමගි වෙනවා ඇතැ'යි බලාපොරොත්තු වනු ලැබේ. මේ සම්මතිය අත්සන් කළ වහා ම වලංගු බවට පත් වන්නේ ය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

චීන මහජන විමුක්ති හමුදාවේ නිලප්‍රකාශය

1949, අප්‍රේල් 25

කුඕමින්තාං ප්‍රතිගාමියෝ සාම කොන්දේසි ප්‍රතික්ෂේප කොට, ජාතියට ත් ජනතාවට ත් විරුද්ධ ව සාපරාධ යුද්ධයක් කිරීමේ තම මග අත නැර ගෙන සිටිති. රට පුරා ම ජනතාව මහජන විමුක්ති හමුදාව කුඕමින්තාං ප්‍රතිගාමීන් ඉක්මනින් ම මුල්පිස දමනවා ඇතැ'යි බලාපොරොත්තු වෙති. ධෛර්යසම්පන්න ලෙස ඉදිරියට ගමන් කිරීමට, විරුද්ධකම් පෑමට සැහැසි වන සියලු ම ප්‍රතිගාමී කුඕමින්තාං හටකණ්ඩායම් මුල්පිස දැමීමට, හික්මවිය නො හැකි යුද්ධ අපරාධකාරයන් සියලු දෙනා ම හිරබාරයට ගැනීමට, මුළු රටේ ම ජනතාව නිදහස් කිරීමට, චීනයේ භූමිප්‍රාදේශික අඛණ්ඩතාව, ස්වාධිපත්‍යය සහ ස්වාධීනත්වය සුරක්ෂිත කිරීමට සහ, මුළු ජනතාව මහත් ආසාවෙන් බලා සිටින රටේ සැබෑ එක්සත්කම ඇති කිරීමට අප විසින් මහජන විමුක්ති හමුදාවට අණ දී තිබේ. මහජන විමුක්ති හමුදාව කොහේ ගියත් සෑම තරාතිරම් වල ජනයා ඒ හමුදාවට ආධාර කරනවා ඇතැ'යි අපි මහත් ඕනෑකමින් බලාපොරොත්තු වෙමු. අපි, මුළු ජනතාව ත් සමග එකතු ව, ස්ථිර ලෙස ම පිළිපදින්නට යන පහත සඳහන් කරුණු–අටේ ප්‍රඥප්තිය මෙයින් නිල වශයෙන් ප්‍රකාශ කරමු.

1. සියලු ජනතාවගේ ජීවිත සහ දේපොළ ආරක්ෂා කරන්න. පංක්තිය, විශ්වාසය හෝ රක්ෂාව කුමක් වුවත්, සියලු තරාතිරම් වල ජනයා මනා පාලනය පවත්වා ගැනීම ත් මහජන විමුක්ති හමුදාව කෙරෙහි සහයෝගි ආකල්පයක් ගැනීම ත් අපේක්ෂා කරනු ලැබේ. මහජන විමුක්ති හමුදාව ද සියලු තරාතිරම් වල ජනයා කෙරෙහි සහයෝගි ආකල්පයක් ගන්නවා ඇත. කලබල ඇති කිරීමට, කොල්ලකෑමට හෝ කඩාකප්පල් කිරීමට ඉඩප්‍රස්තාවෙන් ප්‍රයෝජන ගන්නා වූ ප්‍රති–විප්ලවවාදීන් හෝ වෙන කඩාකප්පල්කාරයන් ගැන තදින් ක්‍රියා කරනවා ඇත.

2. ජාතික ධනේශ්වරපංක්තිය සතු කර්මාන්තමය, වාණිජ්‍ය, කෘෂිකාර්මික සහ සතුන් ඇති කිරීමේ ව්‍යාපාර ආරක්ෂා කරන්න. පුද්ගලික ව අයිති සියලු ම පැක්ටෙරි, සාප්පු, බැංකු, ගබඩාගෙවල්, යාත්‍රා, වාප්පු, ගොවිපොළවල්, සත්ව ගොවිපොළවල් සහ වෙනත් ව්‍යාපාර පැහැරගන්ට නො දී ආරක්ෂා කරනු ලැබේ. සියලු ම රක්ෂා වල නියුක්ත කම්කරුවන්

සහ සේවකයෝ සිරිත් පරිදි නිෂ්පාදනය කරගෙන යනවා ඇතැ'යි ද, සියලු කඩ සාප්පු සිරිත් පරිදි විවෘත කොට තබනවා ඇතැ'යි ද බලාපොරොත්තු වනු ලැබේ.

3. නිලධාරි–ප්‍රාග්ධනය රජය සතු කරන්න. ප්‍රතිගාමී කුඕමින්තාං ආණ්ඩුව සහ ලොකු නිලධාරින් විසින් පවත්වාගෙන යනු ලබන සියලු පැක්ටෙරි, කඩසාප්පු, බැංකු සහ ගබඩාගෙවල් ද, සියලු ජලයාත්‍රා, වාප්පු සහ දුම්රියමාර්ග ද, සියලු තැපැල්, විදුලිපණිවිඩ, විදුලි එළිය, ටැලිෆෝන් සහ ජල සම්පාදන සේවා ද, සියලු ගොවිපොළවල්, සත්ව ගොවිපොළවල් සහ වෙනත් ව්‍යාපාර ද මහජන ආණ්ඩුවට පවරාගනු ලැබේ. එබඳු ව්‍යාපාර වල තිබෙන කර්මාන්ත, වාණිජ්‍යය, කෘෂිකර්මය සහ සතුන් ඇති කිරීම යන මේවායෙහි නියුක්ත ජාතික ධනපතියන්ට අයත් පුද්ගලික කොටස්, ඒවායේ අයිතිය සෝදිසි කර බලා ඔප්පු වීමෙන් පසු, පිළිගනු ලැබේ. නිලධාරි–ධනපති ව්‍යාපාර වල වැඩ කරන සියලු කාර්යභාරපුද්ගලයෝ මහජන ආණ්ඩුව විසින් ඒ ව්‍යාපාර පවරා ගනු ලබන තුරු තම තමන්ගේ පදවි වල සිටිය යුතු ය, පරීක්ෂා කර බලා පවරා ගැනීමට සූදානම් කිරීම් වශයෙන්, සියලු වත්කම්, යන්ත්‍රසූත්‍ර, සටහන්, ගණන් පොත්, වාර්තා යනාදිය සුරක්ෂිත ව තිබීම සඳහා වගකීම බාර ගත යුතු ය. මේ අතින් ප්‍රයෝජනවත් සේවයන් ඉටු කරන අයට තෑගිබෝග දෙනු ලැබේ; අවහිර කරන හෝ කඩාකප්පල් කරන අයට දඬුවම් දෙනු ලැබේ. මහජන ආණ්ඩුව විසින් පවරාගනු ලැබීමෙන් පසු ත් වැඩ කරගෙන යන්ට කැමැති වන අයට, ඔවුන් අනාථ සහ ඉන්නහිටින්න තැන් නැති අය බවට පත් නො වන සේ, ඔවුන්ගේ හැකියාවන්ට අනුරූප වන රක්ෂාවල් දෙනු ලැබේ.

4. සියලු මහජන සහ පෞද්ගලික පාසල්, රෝහල්, සංස්කෘතික සහ ආධ්‍යාපනික ආයතන, ක්‍රීඩා පිට්ටනි සහ වෙනත් මහජන ශුභසාධක සංස්ථා ආරක්ෂා කරන්න. මේ ආයතන වල සිටින සියලු කාර්යභාරපුද්ගලයන් තමන්ගේ පදවි වල සිටිනවා ඇතැ'යි බලාපොරොත්තු වනු ලැබේ; මහජන විමුක්ති හමුදාව ඔවුන්ට හිරිහැරයක් වෙන්ට නො දී ඔවුන් ආරක්ෂා කරනවා ඇත.

5. ඉතා ම දරුණු අපරාධ කර සිටින හික්මවිය නො හැකි යුද්ධ අපරාධකාරයන් සහ ප්‍රති–විප්ලවවාදීන් හැර, කුඕමින්තාං පක්ෂයේ මධ්‍යම, පළාත්බද, නාගරික සහ උප–පළාත්බද ආණ්ඩු වල සිටින, උසස් හෝ පහත්, නිලධාරින්, ''ජාතික මන්ත්‍රණසභාවේ'' නියෝජිතයන්, ව්‍යවස්ථාදයක සහ පාලන යුආන් (විධායක මණ්ඩල) වල සාමාජිකයන්, දේශපාලන සාකච්ඡා මණ්ඩල වල සාමාජිකයන්, පොලිස් නිලධාරින් සහ දිස්ත්‍රික්ක, නියම්ගම්, ගම් සහ පාඕ–චියා[1] මුලාදෑනින් කිසිවකු, ඔවුන් සන්නද්ධ විරුද්ධකම් පෑම් නො කරන තුරු සහ කඩාකප්පල් වැඩ කරන්ට කුමන්ත්‍රණය නො කරන තුරු, මහජන විමුක්ති හමුදාව සහ මහජන ආණ්ඩුව විසින් හිරකරුවන් වශයෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තබා ගන්නේ වත්, හිරබාරයට ගන්නේ වත්, අවමානයට පත් කරන්නේ වත් නැත. පවරා ගැනීම කරන තුරු, තමන්ගේ පදවි වල සිටින ලෙස ද, මහජන විමුක්ති හමුදාවේ ත් මහජන ආණ්ඩුවේ ත් ආඥවන් සහ නියෝග පිළිපදින ලෙස ද, තමන්ගේ කාර්යාල වල තිබෙන වත්කම් සහ වාර්තා සියල්ල සුරක්ෂිත ව තබා ගැනීමේ වගකීම බාර ගන්නා ලෙස ද මේ සියලු පුද්ගලයන්ට නියම කරනු ලැබේ. කිසියම් වැඩක යෙදී ප්‍රයෝජනවත් විය හැකි වූ ද බරපතල ප්‍රතිගාමී ක්‍රියා හෝ වෙන දරුණු වැරදි වැඩ කර නැත්තා වූ ද අය රක්ෂාවෙහි තබා ගැනීමට මහජන ආණ්ඩුව අවසර දෙනවා ඇත. කඩාකප්පල් කිරීමෙහි, සොරකම් කිරීමෙහි හෝ මුදල් වංචා කිරීමෙහි යෙදෙන්ට මේ ඉඩප්‍රස්තාව අල්ලා ගන්නා වූ හෝ, මහජන අරමුදල්, වත්කම් හෝ වාර්තා රැගෙන පැන යන්නා වූ හෝ, විස්තරයක් දීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ අයට දඬුවම් දෙනු ලැබේ.

6. නගරයෙහි ත් ගම්බද පෙදෙසෙහි ත් සාමය සහ සුරක්ෂිතතාව සහතික කරනු පිණිස ත් මහජන මනා පාලනය පවත්වා ගැනීම පිණිස ත්, හමුදාව හැර ගොස් සිටින්නන් සහ විසුරුවා හරිනලද සෙබළුන් සියලු දෙනා ම තමතමන්ගේ ප්‍රදේශ වල මහජන විමුක්ති හමුදාව වෙත හෝ මහජන ආණ්ඩු වෙත පැමිණ පෙනී සිට බාර වීම අවශ්‍ය ය. සිය කැමැත්තෙන් එසේ කරන සහ තම ආයුධ බාර දෙන අයට විරුද්ධ ව ක්‍රියා කරනු නො ලැබේ. පැමිණ පෙනී සිටීම ප්‍රතික්ෂේප කරන හෝ තම ආයුධ සඟවන අය සිරබාරයට ගෙන සෝදිසි කරනු ලබනවා ඇත. හමුදාව හැර ගොස් සිටින්නන් හට සහ විසුරුවා හරිනලද සෙබළුන් හට රැකවරණ සලසන සහ ඔවුන් ගැන පාලකයන්ට දැනුම් නො දෙන අයට නිසි දඬුවම් දෙනු ලැබේ.

7. ගම්බද පෙදෙස් වල පවතින ඉඩම් අයිතිය පිළිබඳ රදළ ක්‍රමය යුක්ති විරෝධ හෙයින් නැති කරනු ලැබේ. කෙසේ වේවා, එය නැති කරන්නේ, නිසි පරිදි කටයුතු සූදානම් කළ පසු, අඩියෙන් අඩියට ය. සාමාන්‍යයෙන් කියන කල, බදු සහ පොලී අඩු කිරීම පළමුව ත් ඉඩම් බෙදා දීම පසු ව ත් ආ යුතු ය; ඉඩම් ප්‍රශ්නය විසඳීම ගැන බැරෑරුම් ලෙස කතා කළ හැකි වන්නේ මහජන විමුක්ති හමුදාව කිසියම් තැනකට සේන්දු වී, එහි සැලකියයුතු කලක් වැඩ කළ පසු පමණකි. ගොවි බහුජනයා සංවිධානය වී, විවිධ මූලික ප්‍රතිසංස්කරණ වැඩ කරගෙන යන්ට මහජන විමුක්ති හමුදාවට ආධාර කළ යුතු ය. ඔවුන් එසේ ම කෘෂිකාර්මික නිෂ්පාදනයේ වර්තමාන මට්ටම පහළ යාම වළකනු පිණිස වෙහෙස මහන්සි වී තම ගොවිතැන් වැඩ කළ යුතු ය, ඉක්බිති තමන්ගේ දිවිපෙවෙත දියුණු කර ගැනීම පිණිස ත් නගර වල ජනයාට විකුණන ධාන්‍ය සැපයීම පිණිස ත් ඒ මට්ටම අඩියෙන් අඩිය නැංවිය යුතු ය. ගම්බද ඉඩම් ප්‍රශ්නය ගැන ක්‍රියා කරන පිළිවෙලට ම නගරබද ඉඩම් සහ ගොඩනැඟිලි ගැන ක්‍රියා නො කරනවා ඇත.

8. විදේශීය ජාතිකයන්ගේ ජීවිත සහ දේපොළ ආරක්ෂා කරන්න. සියලු ම විදේශීය ජාතිකයෝ තමන් සාමාන්‍යයෙන් කරගෙන යන වැඩකටයුතු කරගෙන යනවා ඇතැ'යි ද, මනා පාලනය පිළිපදිනවා ඇතැ'යි ද බලාපොරොත්තු වනු ලැබේ. සියලු විදේශීය ජාතිකයෝ මහජන විමුක්ති හමුදාවේ සහ මහජන ආණ්ඩුවේ ආඥ සහ නියෝග පිළිපැදිය යුත්තාහ, චරපුරුෂ සේවයෙහි නිරත වීම, චීනයේ ජාතික ස්වාධීනත්වය ත් ජනතාවගේ විමුක්තිය ත් පිළිබඳ ව්‍යායාමයට විරුද්ධ ව ක්‍රියා කිරීම, හෝ චීන යුද්ධ අපරාධකාරයන්, ප්‍රති-විප්ලවවාදීන් හෝ වෙනත් නීති කඩන පුද්ගලයන් සඟවා තබා ගැනීම නො කළ යුත්තාහ. නො එසේ නම්, මහජන විමුක්ති හමුදාව සහ මහජන ආණ්ඩුව නීතියට අනුව ඔවුන් ගැන ක්‍රියා කරනවා ඇත.

මහජන විමුක්ති හමුදාව බෙහෙවින් ම විනයගරුක ය; එය මිලයට ගන්නා හැම දේට ම සාධාරණ ලෙස මිල ගෙවයි; ජනතාව ගෙන් ඉඳිකට්ටක් වත් නූල් පොටක් වත් ගන්නට ඊට අවසර නැත. රට මුළුල්ලේ ම ජනතාව සාමයෙන් කලදවස ගෙවමින් වැඩ කරනවා ඇතැ'යි ද, දූසමාන ආරංචි විශ්වාස නො කරනවා ඇතැ'යි සහ බොරු බිය සැක ඇති නො කරනවා ඇතැ'යි ද බලාපොරොත්තු වනු ලැබේ. මේ නිලප්‍රකාශය මහත් අවංකභාවයෙන් සහ බැරෑරුම්කමින් යුතු ව මෙයින් නිකුත් කරනු ලැබේ.

මාඕ සේතුං
චීන ජනතාවගේ විප්ලවවාදී
යුද්ධ අධිකාරියේ සභාපති

චූ තේ
චීන මහජන විමුක්ති
හමුදාවේ ප්‍රධාන අණදෙන්නා

ස ට හ න්

[1]**පාඕ චියා** යනු කුඕමින්තාං ප්‍රතිගාමී කල්ලිය ප්‍රාථමික මට්ටමෙන් තම පැසිස්ට පාලනය ක්‍රියාවේ යෙදූ පරිපාලන ක්‍රමය යි. 1932, අගෝස්තු 1වැනි ද, චියාං කායි-ශෙක්, හුනාන්, හූපෙ සහ අන්හ්වෙයි පළාත් ඇතුළත් කොට, **"පාඕ සහ චියා සංවිධානය කිරීම පිණිස සහ උප-පළාත් වල ජන ලේඛණයක් ගැනීම පිණිස නීතිරීති"** ප්‍රකාශයට පත් කළේ ය. මේ නීතිරීති අනුව, **"පාඕ සහ චියා පවුල් පදනම කරගෙන සංවිධානය කළ යුතු ය; එක් එක් පවුලේ ද, පවුල් දහයකින් සැදෙන එක් එක් චියාවේ ද, චියා දහයකින් සැදෙන එක් එක් පාඕවේ ද ප්‍රධානයෙක් සිටිය යුතු ය."** අසල්වැසියන් එකිනෙකා කරන කියන දේ බලාගෙන සිට ඒවා ගැන පාලකයන්ට වාර්තා කළ යුතු විය; එකකු වරදකරු වූ විට සියල්ලන්ට ම දඬුවම් කළ හැකි විය; බලෙන් වැඩ ගැනීම පිණිස ප්‍රති-විප්ලවවාදී විධිවිධාන ද පණවනලදී. 1934, නොවැම්බර් 7වැනි ද, කුඕමින්තාං ආණ්ඩුව මේ පැසිස්ට පාලන ක්‍රමය තම පාලනය යටතේ පැවති සියලු ම පළාත් වල ත් නාගරික ප්‍රදේශ වල ත් පිහිටුවිය යුතු ය'යි නිල වශයෙන් නිවේදනය කළේ ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

- කෘතිය: සභාපති මාඕ සේතුංගේ තෝරාගත් යුද්ධ ලිපි
- කතෘ/පරිවර්තක: මාඕ සේතුං/ආනන්ද කුමාර
- ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ
- පළමු ඩිජිටල් පළ කිරීම: 2014-09-25
- ඩිජිටල් සංස්කරණයන්: V1:2014-09-25, V2:2019-05-31
- පිටු ගණන: 466
- භාෂා මාධ්‍ය: සිංහල
- ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com